භෞතික, සමාජ සහ මූල්‍ය යටිතල පහසුකම්

	ඒකකය	2021
ප්‍රවාහනය		
මහා මාර්ගවල දිග ප්‍රමාණය (ඒ සහ බී)	කි.මී.	12,225
අධිවේගී මාර්ගවල දිග ප්‍රමාණය	කි.මී.	312.6
මෙහෙයුම් කටයුතු සිදු කෙරෙන දුම්රිය මාර්ගවල දිග ප්‍රමාණය (2020)	කි.මී.	1,648
විදුලිබලය		
විදුලිබලය සඳහා ඇති ප්‍රවේශය (2016)	ප්‍රතිශතය	99.3
ඒක පුද්ගල විදුලිබල පරිභෝජනය	කි.වො.පැ.	686.7
පණිවුඩ හුවමාරුව		
දුරකථන ඝනත්වය		
ස්ථාවර දුරකථන	පුද්ගලයින් 100 කට	12.9
ජංගම දුරකථන ද ඇතුළත්ව	පුද්ගලයින් 100 කට	148.1
අන්තර්ජාල ඝනත්වය (උ)	පුද්ගලයින් 100 කට	100.4
තැපැල් කාර්යාලයකින් සේවාව ලබන පුද්ගලයන්	සංඛ්‍යාව	5,283
මූල්‍ය ආයතන		
බැංකු		
බලපත්‍රලාභී වාණිජ බැංකු ශාඛා (උආ)	සංඛ්‍යාව	2,919
බලපත්‍රලාභී විශේෂිත බැංකු ශාඛා (උආ)	සංඛ්‍යාව	705
භාවිතයේ පවතින ණය කාඩ්පත්	පුද්ගලයින් 100,000 කට	9,275
බැංකු ඝනත්වය	පුද්ගලයින් 100,000 කට බැංකු ශාඛා	16
අනෙකුත් මූල්‍ය සමාගම්		
බලපත්‍රලාභී මුදල් සමාගම් ශාඛා	සංඛ්‍යාව	1,647
විශේෂිත කල්බදු සමාගම් ශාඛා	සංඛ්‍යාව	60
බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් ශාඛා	සංඛ්‍යාව	123
ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATMs), මුදල් ප්‍රතිචක්‍රීයකරණ යන්ත්‍ර (CRMs) සහ මුදල් තැන්පතු යන්ත්‍ර (CDMs)	පුද්ගලයින් 100,000 කට	31

	ඒකකය	2021
ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව		
පිරිසිදු පානීය ජල පහසුකම් සඳහා ප්‍රවේශය	ප්‍රතිශතය	94.4
නළ ජල පහසුකම් සඳහා ප්‍රවේශය	ප්‍රතිශතය	54.3
සාමාන්‍ය අධ්‍යාපනය		
පාසලකින් ආවරණය වන භූමි ප්‍රමාණය (එ)	වර්ග කි.මී.	6.5
ගුරු/ශිෂ්‍ය අනුපාතය (ඒ)	සංඛ්‍යාව	16.0
වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (1-9 ශ්‍රේණි) (2019)	ප්‍රතිශතය	94.8
ප්‍රාථමික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (එ)	ප්‍රතිශතය	94.4
විශ්වවිද්‍යාල අධ්‍යාපනය (ඔ)		
ගුරු/ශිෂ්‍ය අනුපාතය	සංඛ්‍යාව	19.7
වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (වයස අවුරුදු 19-23) (ඕ)	ප්‍රතිශතය	8.7
අ.පො.ස. උසස් පෙළ සිට විශ්වවිද්‍යාලයට ඇතුළත්වීම සඳහා සුදුසුකම් ලැබූ ප්‍රමාණය	ප්‍රතිශතය	62.4
ඇතුළත්වීම් - සුදුසුකම් ලැබූවන්ගේ ප්‍රතිශතයක් ලෙස	ප්‍රතිශතය	22.5
අධ්‍යාපනය සඳහා රජයේ වියදම (ක)	ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස	1.8
මහජන සෞඛ්‍යය		
ආරෝග්‍යශාලා ඇඳන්	පුද්ගලයින් 1,000 කට	3.5
වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින්	සංඛ්‍යාව	1,167
හෙද සේවක	පුද්ගලයින් 10,000 කට	17.5
සෞඛ්‍ය සඳහා රජයේ වියදම	ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස	2.3

සටහන: 2021 වර්ෂය සඳහා වන දත්ත තාවකාලික වේ.
(අ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
(ආ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2019 මත පදනම් වේ.
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2019 ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණ වටයේදී, 2002 සමීක්ෂණ දත්ත මත පදනම්ව ගණනය කළ නිල දරිද්‍රතා රේඛාව, 2012/13 සමීක්ෂණ දත්ත භාවිතයෙන් සංශෝධනය කර ඇත. නිල දරිද්‍රතා රේඛාවේ සංශෝධනය සමග, ජනගහන දරිද්‍රතා දර්ශක දත්ත ද සංශෝධනය කර ඇත.
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය මත පදනම් වේ.
(ඉ) 2021 කාර්තු හතරේ සාමාන්‍යය

මූලයන්: අදාළ ආයතන සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාලේඛන
(ඊ) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණය මත පදනම් වේ.
(උ) ජංගම අන්තර්ජාල සේවා ඇතුළත්ය.
(උආ) සිසු තැන්පතු ඒකක රහිතව සියලු බැංකු ශාඛා
(එ) රජයේ පාසල් පමණි
(ඒ) රජයේ සහ පෞද්ගලික පාසල් පමණි
(ඔ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාලවල තොරතුරු ඇතුළත් වේ.
(ඕ) අභ්‍යන්තර වශයෙන් ලියාපදිංචි සිසුන් පමණක් ඇතුළත් වේ.
(ක) සාමාන්‍ය සහ උසස් අධ්‍යාපනය සඳහා වූ රජයේ වියදම්

1

ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති

1.1 සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකා ආර්ථිකය 2020 වසරේ දී වසංගතයේ බලපෑම හේතුවෙන් සංකෝචනය වීමෙන් අනතුරුව 2021 වසරේ දී යථා තත්ත්වයට පත් වුවද, දශක කිහිපයක් මුළුල්ලේ ගැඹුරින් මුල් බැසගත් ව්‍යුහාත්මක ගැටලු සහ දුර්වලතා කිහිපයක් නැවත ඉස්මතු වීමෙහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේ මුල් කාලයේ දී පෙර නොවූ ආකාරයේ සමාජ-දේශපාලන අර්බුදයන්ට මුහුණ දුන්නේය. කොවිඩ්-19 වසංගතය සහ ගෝලීය හා දේශීය වශයෙන් ඇති වූ අනෙකුත් විවිධ ආකාරයේ බාධා මගින් ආර්ථිකයට බලපෑම් ඇති වන අවස්ථාව වන විටත්, කම්පනවලට ඔරොත්තු දීමට අවශ්‍ය ස්වාරක්ෂක නොමැතිකම හේතුවෙන්, ශ්‍රී ලංකා ආර්ථිකය දුර්වල තත්ත්වයක පැවතුණි. 2019 වසර අවසානයේ දී බදු ව්‍යුහයෙහි සිදු කළ වෙනස්කම් හේතුවෙන් තවදුරටත් සීමා වූ රාජ්‍ය මූල්‍ය අවකාශය, ආර්ථිකයේ එවැනි දුර්වලතාවලට ප්‍රධාන වශයෙන් හේතු විය. ලෝකයේ අනෙකුත් රටවල් මෙන්ම ශ්‍රී ලංකාව ද, ආර්ථිකයේ දිගුකල් පවතින පසුබෑම සහ ජීවනෝපායන් කෙරෙහි ඇතිවන බලපෑම් වළක්වාලමින් ආර්ථිකය සුරක්ෂිත කිරීමේ අරමුණු ඇතිව වසංගතයට මුහුණදීම සඳහා ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීය. කෙසේ වෙතත්, රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රමාණවත් ප්‍රතිපත්තිමය අවකාශයක් නොමැතිකම හෝ රාජ්‍ය මූල්‍ය අංශය තුළින් ප්‍රමාණවත් ඉක්මන් මැදිහත්වීම් සිදු නොවීම හේතුවෙන්, ආර්ථිකයේ පවතින විශේෂිත දුර්වලතා සැලකිල්ලට ගනිමින්, සුවිශේෂී මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම්, වෙළඳපොළට සහ රජයට ප්‍රමාණවත් ද්‍රවශීලතා සැපයීම් සහ විදේශ හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති හරහා ආර්ථිකය ආරක්ෂා කර ගැනීමට දැඩි ලෙස මැදිහත් වීමට ශ්‍රී ලංකා මහ බැංකුවට සිදු විය. මහ බැංකුව සහ රජය විසින් ක්‍රියාත්මක කරන ලද අතිශය ලිහිල් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පැකේජය, 2020 වසරේ දී ඉතිහාසගත ලෙස සංකෝචනය වූ ආර්ථිකය, 2021 වසරේ දී යථා තත්ත්වයට පත් වීම සඳහා සහාය සැලසූ අතර, ආර්ථික පාර්ශ්වකරුවන්ගේ විශාල කොටසකට වසංගතය මගින් වූ බලපෑම අවම කිරීමට සහාය සැලසුණි. රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයටම කාරක ප්‍රාග්ධන සහ ආයෝජන සඳහා අඩු පිරිවැයක් යටතේ අරමුදල් පහසුකම් සැලසුණු අතර, එමගින් මෙම දුෂ්කර කාලය තුළ අඛණ්ඩ රඳා පැවැත්ම තහවුරු කිරීමටත්, යම් වර්ධනයක් ද සමඟින් කර්මාන්ත ක්‍රියාකාරීව පවත්වා ගැනීමටත් උපකාරී වීම හරහා රාජ්‍ය සේවා, උපයෝගිතා සේවා සහ භාණ්ඩ හා සේවා මහජනතාවට මෙන්ම අනෙකුත් අත්‍යවශ්‍ය සැපයුම් දාමයන් සඳහා අඛණ්ඩව සැපයීම සහතික කළේය. කෙසේ වෙතත්, වසංගතයේ උච්චතම අවස්ථාවේ දී ගනු ලැබූ පෙර නොවූ ආකාරයේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමඟ, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය සහාය ප්‍රමාණවත් ලෙස නොලැබීම හේතුවෙන්, ප්‍රතිපත්ති උත්තේජන ක්‍රියාමාර්ගවලින් බැහැර වීමට පැවති අවකාශ සීමා වීමත් සමඟ 2021 වසරේ දී සාර්ව ආර්ථික ස්ථායීතාව කෙරෙහි අනපේක්ෂිත බලපෑම් ඇති වූ අතර, එම බලපෑම් 2022 වසරේ මුල් කාලයේ දී තවදුරටත් උග්‍ර විය. තවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ අඩු ද්‍රවශීලතාව මධ්‍යයේ විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩන 2021 වසරේ දී සහ 2022 මුල් කාලයේ දී තීව්‍ර වීම හමුවේ, විනිමය අනුපාතිකයෙහි සිදු වන විශාල අවප්‍රමාණය වීමක් මගින් සමාජයට අහිතකර ලෙස බලපෑම් ඇති විය හැකි බවට අවධානය යොමු වී තිබුණු පසුබිමක වුවද, වෙළඳපොළ පැවති මට්ටමට සාපේක්ෂව විනිමය අනුපාතිකයේ නිසි ගැළපීමක අවශ්‍යතාවක් ඇති වූ බැවින් 2022 මාර්තු මස මුල් කාලයේ දී එය ක්‍රමානුකූලව සිදු වීමට ඉඩ හැරිණි. කෙසේ වෙතත්, ඉන්පසුව, 2022

1

මාර්තු මස මුල් කාලයේදීම විනිමය අනුපාතිකය නම්‍යශීලිවීමට ඉඩ ලබා දීමෙන් පසුව විනිමය අනුපාතිකය නිසි මට්ටම ඉක්මවා විශාල ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට යම් බාධාවක් ඇති වූ අතර එමගින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ පැවති සැලකිය යුතු ද්‍රවශීලතා පීඩන මෙන්ම වෙළඳපොළ නිවැරදි කිරීමේ ප්‍රමාදය පිළිබිඹු විය.

පසුගිය දශකයකට වැඩි කාලයක් තුළ සාර්ව ආර්ථික ස්ථායීතාව සඳහා ශක්තිමත්ම සාධකය වූ මිල ස්ථායීතාව 2021 වසරේ දෙවන භාගයේ සිට අභියෝගයට ලක්ව ඇති අතර, ඒ සඳහා ගෝලීය හා දේශීය සැපයුම් මත පදනම් වූ හේතු මෙන්ම සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය මධ්‍යයේ පෙර නොවූ පරිදි මහ බැංකුවෙන් ලබා දුන් මූල්‍ය සහාය ඇතුළු සුවිශේෂී මුදල් ලිහිල්කරණයේ පසු බලපෑම මූලික වශයෙන් හේතු කොටගෙන මිල මත අධික ඉල්ලුම් පීඩන ඇති වීමෙහි ඒකාබද්ධ බලපෑම හේතු විය. තවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි විශාල වශයෙන් ද්‍රවශීලතාව හිඟයක් පවතින වාතාවරණයක් තුළ, අත්‍යවශ්‍ය ආනයන මූල්‍යනය කිරීමේ දැඩි අවශ්‍යතාව මෙන්ම සැලකිය යුතු ණය සේවාකරණ වගකීම් හමුවේ ප්‍රමාණවත් නොවන මට්ටමක පැවති නිල සංචිත මගින් පිළිබිඹු වූ ඉහළ යන ගෙවුම් ශේෂ පීඩන හේතුවෙන් 2021 වසර අවසානයේ සිට විදේශීය අංශය දැඩි අවදානම් තත්ත්වයක් ආසන්නයේ පැවතිණි. විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ පවතින ගැටලුකාරී තත්ත්වය සහ අත්‍යවශ්‍ය භාණ්ඩ හා අමුද්‍රව්‍යවල උග්‍ර හිඟය මෙන්ම ආර්ථිකයේ සෑම අංශයකටම මෙමගින් ඇති විය හැකි බලපෑම් යනාදිය කඩිනමින් නොවිසඳන්නේ නම් එමගින් ආර්ථික කටයුතුවලට විශාල ලෙස බාධා ඇති විය හැකිය. මෙම අහිතකර තත්ත්වයන් නිරාකරණය කිරීමට හෝ කල් දැමීමට වරින් වර ගන්නා ලද අසම්පූර්ණ ක්‍රියාමාර්ග සහ ප්‍රතිපත්ති පියවර අසාර්ථක වී ඇති බව හෝ එමගින් නව ගැටලු නිර්මාණය කර ඇති බව පෙනී යයි. ඉතිහාසයේ මෙතෙක් පැවති ඉහළම රාජ්‍ය ණය මට්ටම, රාජ්‍ය මූල්‍ය ශේෂයන් තවදුරටත් දුර්වල වීම සහ අතිශයින් පහළ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් හේතුවෙන්, ආර්ථිකය නැවත සාමාන්‍ය තත්ත්වයට ගෙන ඒම පිණිස ඉහත දැක් වූ දේශීය ආර්ථික තත්ත්වයන් ලිහිල් කිරීම සඳහා සැලකිය යුතු මැදිහත්වීමක් සිදු කිරීමට රාජ්‍ය මූල්‍ය අංශයට ඇති හැකියාව ඉතා සීමිතය. එහි ප්‍රතිඵලයක් ලෙස, සාර්ව ආර්ථික ස්ථායීතාවය තවදුරටත් පිරිහීම වැළැක්වීමට සහ මිල ස්ථායීතාව නැවත ඇති කිරීමට මුදල් ප්‍රතිපත්තිය ඉතා දැඩි කිරීම ආදී ක්‍රියාමාර්ග තුළින් මහ බැංකුව 2022 අප්‍රේල් මස මුල් කාලයේ දී කඩිනම් ක්‍රියාමාර්ග ගත්තේය. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් දිගු කාලීන වශයෙන් ආර්ථිකයේ සෑම අංශයකටම ප්‍රතිලාභ ලැබෙන පරිදි වූ වර්ධනයක් සඳහා අවශ්‍ය සාධකයක්ව පවතින සැලකිය යුතු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම ආරම්භ කිරීම මගින් මැදි කාලයේ සිට දිගු කාලීනව සාර්ව ආර්ථික ස්ථායීතාව යළි ඇති කරනු ඇත.

මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව ක්‍රියාවට නැංවූ ප්‍රතිපත්තිවලට අනුරූපීව රජය විසින් ද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ගණනාවක් මේ මොහොතේ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. දිගු කාලයක් තිස්සේ ප්‍රමාද වූ සහ අතීතයේ බොහෝ විට නැවත හැරවූ ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම මගින්, වර්තමානයේ පවතින සංකීර්ණ ගැටලුකාරී ආර්ථික තත්ත්වයන්හි පැහැදිලි වෙනසක් ඇති කරනු ඇත. රජයේ ආදායම ඉහළ මට්ටමක් කරා වර්ධනය කිරීම සහ රජයේ වියදම් සීමා කිරීම හා ප්‍රමුඛතා හඳුන්වාදීම මගින් අයවැය හිඟය තිරසාර ලෙස අඩු කිරීම, ඉදිරි කාලයේ දී රජයේ ණය ගැනීම් ප්‍රසාරණය වීම අවම කර ගැනීමට උපකාරී වනු ඇත. තවද, වත්මන් ආර්ථික ගැටලුව විසඳීමට ගනු ලබන ඕනෑම ඉදිරි පියවරක් සඳහා රාජ්‍ය ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම සහ පවත්වාගෙන යෑම සඳහා වන පුළුල් සහ පැහැදිලි ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වේ. මෙම අත්‍යවශ්‍ය රාජ්‍ය මූල්‍ය වෙනස්කම් සඳහා, අනෙකුත් ක්‍රියාමාර්ග ගන්නා අතරම, රාජ්‍ය යාන්ත්‍රණය තුළ යහපාලනය සහ වගවීමේ යාන්ත්‍රණ ආයතනගත කිරීම, සමස්ත රාජ්‍ය අංශයේ සැලකිය යුතු ලෙස ඵලදායිතා වැඩිදියුණු කිරීම සහ සේවා සැපයීම, මනාව ඉලක්ක කළ සමාජ ආරක්ෂණ ජාල ශක්තිමත් කිරීම සහ පිරිවැය පිළිබිඹුවන මිල ව්‍යුහයන් හඳුන්වා දීම මගින් ඇතිවන මූල්‍යමය වශයෙන් ස්වාධීන සහ ස්වායත්ත රජය සතු වාණිජ ව්‍යාපාරවල සහාය ලැබිය යුතුය. රාජ්‍ය ආයතනවල මහජන වගවීම සහතික කිරීම සඳහා නීතිමය රාමු ශක්තිමත් කිරීම අවශ්‍ය වන අතරම, අදාළ බලධාරීන් විසින් ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී පවතින නෛතික බලතල ක්‍රියාත්මක කිරීම මගින් රට තුළ කල්පවත්නා ආර්ථික සුබසාධනයක් සහතික කරනු ඇත. මෙම වෙනස්කම් මගින් පෞද්ගලික අංශයේ ඉහළ සහභාගීත්වය සහතික කෙරෙන අතර, රාජ්‍ය අංශය විසින් ආර්ථිකය තුළ පහසුකම් සපයන්නෙකුගේ භූමිකාව අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

ශ්‍රී ලංකාව දිගු කාලයක් තිස්සේ අත්විඳිනු ලබන 'ද්විත්ව හිඟය' මගින් ගෙවුම් තුලනයේ ගැටලු සඳහා තිරසාර විසඳුම් සෙවීමේ වැදගත්කම අවධාරණය කරයි. විදේශීය ජංගම ගිණුමේ හිඟය සහ අයවැය හිඟය කළමනාකරණය කළ හැකි මට්ටමක් දක්වා අඩු කර ගැනීම ඉලක්ක කර ගනිමින් අදාළ පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව සකස් කෙරෙන,

වෙනස්වන දේශපාලන පාලන තන්ත්‍රයන්ගේ බලපෑමෙන් නිදහස් ජාතික ප්‍රතිපත්ති, මෙම ප්‍රයත්නයේදී අත්‍යවශ්‍ය වේ. තවද, ගෙවුම් තුලනයේ විදේශීය ණය මූල්‍යකරණය සඳහා වූ අවශ්‍යතාව අඩු කරන අතරම, විදේශ සංචිත ඉහළ නැංවීම සඳහා වෙනත් ණය නොවන විදේශ විනිමය ඉපැයීමේ මූලාශ්‍ර වෙත අවධානය යොමු කළ යුතු වේ. හිතකර ව්‍යාපාරික පරිසරයක් ගොඩනැංවීම සහ විදේශීය ඍජු ආයෝජන ප්‍රවර්ධනය කිරීම ද මෙම විදේශීය අංශය ස්ථායී කිරීමේ වැඩපිළිවෙළට ඇතුළත් විය යුතුය.

සාර්ව ආර්ථික ස්ථායීතාව, සමාජ සහජීවනය සහ දේශපාලන ස්ථාවරත්වය එකිනෙක හා සම්බන්ධ වී ඇති ආකාරය සහ එක් එක් අංශ මත අනෙක් අංශයෙන් සිදුවන බලපෑම මෑත කාලීනව ශ්‍රී ලංකාව විසින් මුහුණ දෙනු ලබන සිදුවීම්වලින් පෙන්නුම් කරයි. ඒ අනුව, ආර්ථික අස්ථාවරත්වය, සමාජ නොසන්සුන්තාවය සහ දේශපාලන අස්ථාවරත්වය යන දැනට පවත්නා ගැටලු ත්‍රිත්වය සඳහා වන සමස්ත විසඳුම ලෙස ශ්‍රී ලංකා ආර්ථිකය නැවත පණ ගන්වා නව මානයකට ගෙන ඒමට මෙම සියලු අංශ ආවරණය කළ යුතුය. ණය වගකීම් ක්‍රමානුකූලව සහ එකඟතාවයකින් යුතුව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රජය විසින් විදේශීය ණය සේවාකරණ ගෙවීම් යම් කාල සීමාවක් සඳහා අත්හිටුවීම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ආර්ථික ගැළපුම් වැඩසටහනක් කරා එළැඹීම, රජයේ වියදම් අඩු කිරීම හා රජයේ ආදායම ඉහළ නැංවීම සඳහා කැපවීම සහ නොබැඳි දේශපාලන හා ආර්ථික රාජ්‍යතාන්ත්‍රික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම ආදී ආර්ථික ගැටලු විසඳා ගැනීමට දරන අඛණ්ඩ උත්සාහය මගින් ඉදිරි කාලයේ දී සාර්ව ආර්ථික ස්ථායීතාව නැවත ළඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ. සමාජ සහජීවනය නැවත සහතික කිරීම සහ දේශපාලන ස්ථාවරත්වය නැවත ස්ථාපිත කිරීම මෙන්ම අඛණ්ඩ දේශපාලනික සහයෝගය මත මෙම ප්‍රයත්නවල සමස්ත සාර්ථකත්වය රඳා පවතින අතර, එය මෙම ප්‍රතිසංස්කරණ ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා අත්‍යවශ්‍ය වේ.

1.1 සංඛ්‍යා සටහන

සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය (2017-2021)

දර්ශකය	ඒකකය	2017	2018	2019	2020 (අ)	2021 (ආ)
මූර්ත අංශය (ඇ)						
මූර්ත ද.දේ.නි. වර්ධනය	සියයට	3.6	3.3	2.3 (අ)	-3.6 (ආ)	3.7
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	රුපියල් බිලියන	13,328	14,291	14,997 (අ)	15,027 (ආ)	16,809
ඒක පුද්ගල ද.දේ.නි. (ඈ)	එ.ජ. ඩොලර්	4,077	4,057	3,848 (අ)	3,695 (ආ)	3,815
විදේශීය අංශය						
වෙළඳ ශේෂය (ඇ)	ද.දේ.නි.යේ % වශයෙන්	-11.0	-11.8	-9.5	-7.4	-9.6
ජංගම ගිණුමේ ශේෂය (ඇ)	ද.දේ.නි.යේ % වශයෙන්	-2.6	-3.2	-2.2	-1.5	-4.0
සමස්ත ශේෂය	එ.ජ. ඩොලර් මිලියන	2,068	-1,103	377	-2,328	-3,967
විදේශීය නිල සංචිත	එ.ජ. ඩොලර් මිලියන	7,959	6,919	7,642	5,664	3,139
රාජ්‍ය මූල්‍ය අංශය (ඇ) (ඉ)						
වර්තන ගිණුමේ ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-0.7	-1.2	-3.6 (ඊ)	-7.9	-7.7
ප්‍රාථමික ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	0.02	0.6	-3.6 (ඊ)	-4.6	-6.0
සමස්ත අයවැය ශේෂය	ද.දේ.නි.යේ % වශයෙන්	-5.5	-5.3	-9.6 (ඊ)	-11.1	-12.2
මධ්‍යම රජයේ ණය (උ)	ද.දේ.නි.යේ % වශයෙන්	77.9	84.2	86.9 (ඊ)	100.6	104.6
මුදල් අංශය සහ උද්ධමනය						
පුළුල් මුදල් වර්ධනය (M_{2b}) (ඌ)	සියයට	16.7	13.0	7.0	23.4	13.2
පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය (M_{2b} හි) (ඌ)	සියයට	14.7	15.9	4.2	6.5	13.1
වාර්ෂික සාමාන්‍ය උද්ධමන අනුපාතිකය (එ)	සියයට	6.6	4.3	4.3	4.6	6.0

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඈ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඉ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 මාර්තු 29 දින නිකුත් කරන ලද 2019 සහ 2020 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඊ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත්කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.
(උ) 2013 මාර්තු මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගමට ප්‍රාග්ධනය සැපයීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 13,125ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (2018 ජූනි 01 දින කල්පිරුණි) සහ 2012 ජනවාරි මාසයේ දී රජයේ ආයතන විසින් ශ්‍රී ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාවට හිඟව පැවති ණය පියවීම සඳහා නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 56,662කි) ඇතුළත් වේ.
(ඌ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය
(එ) කො.පා.මි. දර්ශකය (2013=100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

1

1.2 2021 වසරේ සාර්ව ආර්ථික ප්‍රවණතා

මූර්ත අංශයේ ප්‍රවණතා සහ උද්ධමනය

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වසරේ දී සංකෝචනය වූ ශ්‍රී ලංකා ආර්ථිකය, ඉන් අනතුරුව 2021 වසරේ දී යථා තත්ත්වයට පත් විය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ජාතික ගිණුම් ඇස්තමේන්තුවලට අනුව, ශ්‍රී ලංකා ආර්ථිකය මූර්ත වශයෙන් පෙර වසරේ දී වාර්තා වූ සියයට 3.6ක සංකෝචනයට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 3.7ක වර්ධනයක් වාර්තා කළේය. 2021 වසර තුළ දී ආර්ථිකයේ සියලුම අංශවල වර්ධනයන් වාර්තා විය (කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය සියයට 2.0ක්, කර්මාන්ත අංශය සියයට 5.3ක් සහ සේවා අංශය සියයට 3.0ක්). කෘෂිකර්මාන්ත, වන වගාව සහ ධීවර කර්මාන්ත අංශයේ වර්ධනයට, ධාන්‍ය වගාව (වී හැර), තෙල් සහිත පලතුරු බෝග සහ තේ වගාව යන උප අංශවල වාර්තා වූ සැලකිය යුතු වර්ධනයන් හේතු වූ අතර, එහි සමස්ත ක්‍රියාකාරීත්වය කෙරෙහි වී වගාව සහ වෙනත් පානීය බෝග වගාව යන උප අංශවල දුර්වල ක්‍රියාකාරීත්වය සෘණ බලපෑමක් එල්ල කළේය. කර්මාන්ත අංශයේ උප අංශවලින් බහුතරයක් ඉහළ වර්ධනයන් වාර්තා කර ඇත. මෙම වර්ධනයන් තුළ එක් කැපී පෙනෙන ව්‍යතිරේකයක් වූයේ ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදුව වරින් වර වසා දැමීම හේතුවෙන් අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන උප අංශයේ කටයුතු වසර තුළ දී සියයට 30.5කින් පහළ යෑමයි. වසංගත තත්ත්වය සහ තොරතුරු තාක්ෂණ - ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණ (IT-BPO) ක්ෂේත්‍රයේ වර්ධනය මධ්‍යයේ විදුලි සංදේශ සේවා භාවිතය ඉහළ යෑම පිළිබිඹු කරමින්, තොරතුරු තාක්ෂණ ක්‍රමලේඛන

1.2 සංඛ්‍යා සටහන

කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2010) යටතේ දළ ජාතික ආදායම (අ)(ආ)

ආර්ථික කටයුතු	රු. මිලියන		ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස (%)		වර්ධනය (%)		වර්ධනය සඳහා දායකත්වය (%)	
	2020 (ඇ)	2021	2020 (ඇ)	2021	2020 (ඇ)	2021	2020 (ඇ)	2021
කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය	**672,930**	**686,478**	**7.1**	**6.9**	**-2.2**	**2.0**	**-0.2**	**0.1**
කෘෂිකර්මාන්තය සහ වන වගාව	578,407	590,632	6.1	6.0	0.6	2.1	0.0	0.1
ධීවර කර්මාන්තය	94,522	95,845	1.0	1.0	-16.6	1.4	-0.2	0.0
කර්මාන්ත	**2,427,872**	**2,556,998**	**25.5**	**25.9**	**-6.9**	**5.3**	**-1.8**	**1.4**
පතල් සහ කැණීම් කර්මාන්ත	202,873	208,505	2.1	2.1	-12.5	2.8	-0.3	0.1
නිෂ්පාදන කර්මාන්ත	1,481,325	1,587,489	15.5	16.1	-3.9	7.2	-0.6	1.1
විදුලිය, ගෑස්, ජලය සහ කසළ කළමනාකරණය	150,702	156,595	1.6	1.6	-0.8	3.9	0.0	0.1
ඉදිකිරීම්	592,972	604,410	6.2	6.1	-13.2	1.9	-0.9	0.1
සේවාවන්	**5,595,176**	**5,760,308**	**58.7**	**58.3**	**-1.6**	**3.0**	**-0.9**	**1.7**
තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම සහ නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන්	2,158,494	2,187,426	22.6	22.1	-5.0	1.3	-1.2	0.3
තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන්	83,444	97,636	0.9	1.0	13.7	17.0	0.1	0.1
මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම	1,470,197	1,552,626	15.4	15.7	4.7	5.6	0.7	0.9
වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන්	1,061,663	1,073,914	11.1	10.9	-5.9	1.2	-0.7	0.1
රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන්	821,378	848,706	8.6	8.6	2.0	3.3	0.2	0.3
මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය	**8,695,978**	**9,003,784**	**91.2**	**91.1**	**-3.2**	**3.5**	**-2.9**	**3.2**
භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු-සහනාධාර	836,931	877,612	8.8	8.9	-8.1	4.9	-0.7	0.4
වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය	**9,532,909**	**9,881,397**	**100.0**	**100.0**	**-3.6**	**3.7**	**-3.6**	**3.7**
විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම	-263,075	-238,607			8.3	9.3		
වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම	**9,269,834**	**9,642,790**			**-3.5**	**4.0**		

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1.1 රූප සටහන

ද.දේ.නි.යෙහි වර්ධනය සඳහා ආංශික දායකත්වය



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

උපදේශනය හා ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ විදුලි සංදේශ සේවා උප අංශ, පිළිවෙළින්, සියයට 21.7ක සහ සියයට 16.2ක සැලකිය යුතු වර්ධනයන් සමඟ සේවා අංශයේ සියලුම උප අංශ වර්ධනයක් වාර්තා කළේය. කොවිඩ්-19 වසංගතයෙන් පසුව ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීමත් සමඟ බදු ආදායම ඉහළ යෑම සහ සහනාධාර පහළ යෑම හේතුවෙන්, දළ දේශීය නිෂ්පාදිතයේ බදු - සහනාධාර සංරචකය 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 4.9කින් වර්ධනය විය.

නාමික අගයයන් සැලකූ විට, ශ්‍රී ලංකා ආර්ථිකය 2020 වසරේ දී වාර්තා කළ සියයට 0.2ක සුළු වර්ධනයට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 11.9ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, සමස්ත ආර්ථිකයේ ප්‍රමාණය, පසුගිය වසරේ පැවති එ.ජ. ඩොලර් බිලියන 81.0ක සිට 2021 වසරේ දී ඩොලර් බිලියන 84.5ක් දක්වා ඉහළ ගියේය. ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය, 2020 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් 3,695ක සිට 2021 වසරේ දී

1.3 සංඛ්‍යා සටහන

පවත්නා වෙළඳපොළ මිල අනුව සමස්ත ඉල්ලුම සහ ඉතුරුම් - ආයෝජන පරතරය (අ)(ආ)

ශීර්ෂය	රුපියල් බිලියන		වර්ධනය (%)		ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස (%)	
	2020 (ඇ)	2021	2020 (ඇ)	2021	2020 (ඇ)	2021
1. දේශීය ඉල්ලුම	**15,993.3**	**18,081.0**	**0.5**	**13.1**	**106.4**	**107.6**
1.1 පරිභෝජනය	12,214.3	13,425.2	2.0	9.9	81.3	79.9
පෞද්ගලික	10,662.0	11,814.9	1.0	10.8	71.0	70.3
රාජ්‍ය	1,552.3	1,610.3	9.9	3.7	10.3	9.6
1.2 ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය)	3,779.1	4,655.8	-4.2	23.2	25.1	27.7
2. ශුද්ධ විදේශීය ඉල්ලුම	**-966.0**	**-1,271.7**	**-5.1**	**-31.6**	**-6.4**	**-7.6**
භාණ්ඩ හා සේවා අපනයන	2,418.5	2,981.6	-30.3	23.3	16.1	17.7
භාණ්ඩ හා සේවා ආනයන	3,384.5	4,253.3	-22.9	25.7	22.5	25.3
3. මුළු ඉල්ලුම (ද.දේ.නි.) (1+2)	**15,027.4**	**16,809.3**	**0.2**	**11.9**	**100.0**	**100.0**
4. දේශීය ඉතුරුම් (3-1.1)	**2,813.1**	**3,384.2**	**-7.0**	**20.3**	**18.7**	**20.1**
පෞද්ගලික	3,993.5	4,674.6	12.2	17.1	26.6	27.8
රාජ්‍ය	-1,180.4	-1,290.4	-121.2	-9.3	-7.9	-7.7
5. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම	**-423.1**	**-406.6**	**4.2**	**3.9**	**-2.8**	**-2.4**
6. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම (ඈ)	**1,150.8**	**1,030.3**	**11.7**	**-10.5**	**7.7**	**6.1**
7. ජාතික ඉතුරුම් (4+5+6)	**3,540.8**	**4,007.9**	**-2.1**	**13.2**	**23.6**	**23.8**
8. ඉතුරුම්-ආයෝජන පරතරය						
දේශීය ඉතුරුම්-ආයෝජන (4-1.2)	-966.0	-1,271.7			-6.4	-7.6
ජාතික ඉතුරුම්-ආයෝජන (7-1.2)	-238.2	-648.0			-1.6	-3.9
9. විදේශීය ජංගම ගිණුම් ශේෂය (2+5+6) (ඈ)	**-238.2**	**-648.0**			**-1.6**	**-3.9**

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
(ඈ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයෙන් කුමන හෝ වෙනසක් වනුයේ ගණනය කිරීමේ දී ඇතිවන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

1

1.2 රූප සටහන
ඉතිරිකිරීම්, ආයෝජන සහ ඉතුරුම්-ආයෝජන පරතරය
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

එ.ජ. ඩොලර් 3,815ක් දක්වා වර්ධනය විය. වියදම් අංශය ගත් කල, පවත්නා මිල ගණන් අනුව පරිභෝජන වියදම්, 2020 වසරේ දක්නට ලැබුණු සියයට 2.0ක සුළු වර්ධනය හා සැසඳීමේ දී, 2021 වසරේ දී සියයට 9.9ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. පසුගිය වසරේ සියයට 1.0කින් පමණක් වර්ධනය වීමට සාපේක්ෂව 2021 වසරේ සියයට 10.8කින් වර්ධනය වූ ගෘහ පරිභෝජන වියදම් මෙම පරිභෝජන වියදම් ඉහළ යෑමට බොහෝදුරට හේතු විය. කෙසේ වෙතත්, පවත්නා මිල ගණන් යටතේ රජයේ පරිභෝජන වියදම් 2020 වසරේ දී දක්නට ලැබුණු සියයට 9.9ක වර්ධනයට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 3.7ක සුළු වේගයකින් වර්ධනය විය. පවත්නා මිල ගණන් යටතේ, ද.දේ.නි. සඳහා පරිභෝජන වියදම්වල දායකත්වය, 2021 වසරේ දී සියයට 79.9ක් විය. මේ අතර, 2020 සහ 2019 වසර දෙක තුළ වාර්තා කරන ලද පහත වැටීම්වලට සාපේක්ෂව, දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය, 2021 වසරේ දී සියයට 23.2ක වර්ධනයක් වාර්තා කළේය. නාමික ද.දේ.නි. සඳහා දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයේ දායකත්වය, 2021 වසරේ දී සියයට 27.7ක් දක්වා සුළු වශයෙන් වැඩි විය. අපනයන වර්ධනය ඉක්මවා ආනයන වර්ධනය වීමත් සමඟ, භාණ්ඩ හා සේවා සඳහා වන ශුද්ධ විදේශ ඉල්ලුම 2021 වසරේ දී සියයට 31.6ක පහළ යෑමක් වාර්තා කරමින් තියුණු ලෙස දුර්වල විය. පුද්ගලික ඉතුරුම් ඉහළ යෑම හේතුවෙන් දේශීය ඉතුරුම් සියයට 20.3ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ අතර, රාජ්‍ය ආදායම අඩුවීම රජයේ නිර්-ඉතුරුම් වැඩිවීමට හේතු විය. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම්, 2020 වසරේ දී වාර්තා වූ සියයට 18.7ට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 20.1ක් විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය 2020 වසරේ දී වාර්තා වූ සියයට -6.4ට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට -7.6ක් දක්වා පුළුල් විය. ආයෝජන වියදම්වල වර්ධනය හේතුවෙන්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය 2020 වසරේ දී වාර්තා වූ සියයට -1.6 සිට 2021 වසරේ දී සියයට -3.9ක් දක්වා වර්ධනය විය.

ආර්ථිකය ස්ථාවරව යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් සේවා වියුක්ති අනුපාතිකය පහළ ගිය අතර, ශ්‍රම බලකාය සහ ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය යන ද්විත්වයෙහිම ඉහළ යෑම වසර තුළ දී ශ්‍රමබලකා සහභාගීත්වය පහත වැටීමට හේතු විය. පසුගිය වසරේ සියයට 5.5ක් ලෙස වාර්තා වූ සේවා වියුක්ති අනුපාතිකය, 2021 වසරේ දී සියයට 5.1ක් දක්වා පහළ ගියේය. එම ප්‍රවණතාවම අනුගමනය කරමින්, 2020 වසරේ දී, පිළිවෙළින්, සියයට 4.0ක් සහ සියයට 8.5ක් වූ පුරුෂ හා ස්ත්‍රී සේවා වියුක්තිය, 2021 වසරේ දී, පිළිවෙළින්, සියයට 3.7ක් සහ සියයට 7.9ක් දක්වා පහළ ගියේය. මේ අතර, රැකියා සෙවීමට ඇති උනන්දුව අඩුවීම සහ සාමාන්‍ය චර්යාවන් සඳහා වසංගතයෙන් ඇති වූ බලපෑම සමඟ ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී මිලියන 8.6ක් දක්වා සියයට 3.7 කින් වැඩි විය. ශ්‍රමබලකායෙහි සිදු වූ සියයට 1.0ක සුළු ඉහළ යෑම සමඟ, එහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතිකය, 2020 වසරේ දී පැවති සියයට 50.6ක සිට 2021 වසරේ දී සියයට 49.9ක් දක්වා පහළ ගියේය. 2020 වසරේ දී, පිළිවෙළින්, සියයට 71.9ක් සහ සියයට 32.0ක් වූ පුරුෂ සහ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතික, 2021 වසරේ දී, පිළිවෙළින්, සියයට 71.0 ක් සහ සියයට 31.8ක් දක්වා

1.3 රූප සටහන
සේවා වියුක්ති අනුපාතිකය



(අ) 2021 කාර්තු හතරෙහි සාමාන්‍යය
මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පහළ ගියේය. කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා අංශ, සමස්ත සේවා නියුක්තියෙන්, පිළිවෙළින්, සියයට 27.3කට 26.0කට සහ 46.7කට දායකත්වය ලබා දී ඇත.

ප්‍රධාන වශයෙන් ගෝලීය සහ දේශීය සැපයුම් අංශයේ බාධා, ගෝලීය භාණ්ඩ මිල ඉහළ යෑම සහ පරිපාලිත මිල ගණන් ඉහළ දමමින් සංශෝධනය කිරීම හේතුවෙන් 2021 වසරේ දී මතුපිට උද්ධමනය ඉහළ ගිය අතර, මුදල් ලිහිල්කරණයේ පසු බලපෑම පිළිබිඹු කරමින් මූලික උද්ධමනය ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) යන ද්විත්වයෙහිම වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස් වීම මගින් පිළිබිඹු වන පරිදි මතුපිට උද්ධමනයේ ඉහළ යෑම සඳහා ආහාර උද්ධමනය විශාල ලෙස දායක වුවත්, ආහාර සහ ආහාර නොවන උද්ධමනය යන ද්විත්වයෙහිම ඉහළ යෑම මේ සඳහා හේතු විය. ජාත්‍යන්තර වෙළඳපොළේ මිල ඉහළ යෑම්වලට සාපේක්ෂව බලශක්ති මිල සහ අනෙකුත් පරිපාලිත මිල ගණන් ඉහළ දැමීම සඳහා සිදු කළ සංශෝධන කිහිපයක් මෙන්ම වසංගතය ආශ්‍රිත සැපයුම් අංශයේ අවහිරතා, සහ ඇතැම් භාණ්ඩ නිෂ්පාදනය පහත වැටීම නිසා ආහාර මිලෙහි සිදු වූ උච්චාවචන, උද්ධමනයේ එවැනි ඉහළ යෑම් සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. ඉහත සඳහන් කළ සංශෝධනවල පසු බලපෑම් සහ උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කිරීම වැනි බාහිර කම්පන අවශෝෂණ ක්‍රම ද උද්ධමනය ඉහළ යෑමට අර්ධ වශයෙන් දායක විය. ඒ අනුව, 2020 වසර අවසානයේ සියයට 4.2ක් ලෙස වාර්තා කළ කො.පා.මි.ද.යේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස් වීම මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2021 වසර අවසන් වන විට සියයට 12.1ක් දක්වා ඉහළ

1.4 රූප සටහන
මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ගොස් සියයට 4-6ක ඉලක්කගත මට්ටම ද ඉක්මවා ගියේය. ඊට සමාන ප්‍රවණතාවක් දක්වමින්, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය ද ඉහළ ගොස්, 2020 වසර අවසානයේ පැවති සියයට 4.6ට සාපේක්ෂව, 2021 වසර අවසානය වන විට සියයට 14.0ක් ලෙස වාර්තා විය. 2022 වසරේ මේ දක්වා උද්ධමනය ඉහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි. ඒ අනුව, 2022 වසරේ මාර්තු මාසයේ දී කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සියයට 18.7ක් දක්වා ඉහළ ගිය අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2022 වසරේ පෙබරවාරි මාසයේ දී සියයට 21.5ක් දක්වා ඉහළ ගියේය. වසංගතය ආශ්‍රිත සැලකිය යුතු මුදල් ප්‍රතිපත්ති ලිහිල්කරණයේ පසු බලපෑම් නිසා ඇති වූ ඉල්ලුම මත පදනම් වූ උද්ධමන පීඩන පිළිබිඹු කරමින්, යටි දැරි ඉල්ලුම් පීඩනය මනින මූලික උද්ධමනය ද 2021 වසර මැද භාගයේ සිට සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 3.5 සිට 2021 වසර අවසන් වන විට සියයට 8.3ක් දක්වා ඉහළ ගියේය. ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2020 වසර අවසානයේ පැවති සියයට 4.7ට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට 10.8ක් දක්වා ඉහළ ගියේය. තවද, එම ප්‍රවණතාවම අනුගමනය කරමින්, 2022 වසරේ මාර්තු වන විට කො.පා.මි.ද. පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය සියයට 13.0ක් දක්වා ඉහළ ගිය අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2022 වසරේ මාර්තු වන විට සියයට 17.3ක් දක්වා ඉහළ ගියේය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලබන ශක්තිමත් පූර්වෝපායික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් ඉල්ලුම මත පදනම් වූ උද්ධමන පීඩන සහ අහිතකර උද්ධමන අපේක්ෂාවන් තවදුරටත් වර්ධනය වීම වැළැක්විය හැකි අතර, එමගින් උද්ධමනය ඉලක්කගත පරාසය වෙත ඉදිරි කාලසීමාව තුළ ආපසු හැරවීමට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විදේශීය අංශයේ ප්‍රවණතා

ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස පුළුල් වීම, මූල්‍ය ගිණුම වෙත ලැබීම් සීමා වීම, ඉහළ ණය සේවාකරණ අවශ්‍යතාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස දළ නිල සංචිත ප්‍රමාණය අඩු වීම සහ ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම ඇතුළුව බොහොමයක් අභියෝගයන්ට ශ්‍රී ලංකාවේ විදේශීය අංශය තවදුරටත් මුහුණ දෙමින් සිටී. පසුගිය වසරට සාපේක්ෂව වෙළඳ භාණ්ඩ අපනයන කැපී පෙනෙන

1

1.5 රූප සටහන
ගෙවුම් තුලනය



වර්ධනයක් වාර්තා කළ ද, වෙළඳ භාණ්ඩ ආනයන මෙම අපනයන වර්ධනය ඉක්මවා ඉහළ යෑම 2021 වසරේ දී වෙළඳ හිඟය පුළුල් වීමට හේතු විය. විශේෂයෙන් ම වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී ප්‍රධාන වශයෙන් ඉන්ධන මිල ඇතුළු භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම, ආර්ථික කටයුතු නැවත යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් ආනයන සඳහා ඉල්ලුම වැඩි වීම, එන්නත් වැනි වෛද්‍ය සැපයුම් සහ ඖෂධ ආනයන ඉහළ යෑම, සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයන සඳහා වන සීමා ලිහිල් කිරීම යනාදියෙහි ඒකාබද්ධ බලපෑම නිසා ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යෑමෙන් ආනයන වියදම ඉහළ ගියේය. පූර්ව වසංගත කාල සීමාවට සාපේක්ෂව සේවා අංශයේ අතිරික්තය තවදුරටත් මන්දගාමී විය. කෙසේ වෙතත්, වසරේ අවසාන කාලපරිච්ඡේදය වන විට සංචාරක අංශයේ ඉපැයීම් ක්‍රමයෙන් ඉහළ යෑමක් සිදු වූ අතර, පරිගණක සේවා අපනයනවල යහපත් වර්ධනයක් නිරීක්ෂණය කළ හැකි විය. පොලී සහ කුපන ගෙවීම් මෙන්ම ලාභාංශ ගෙවීම් පහළ යෑමත් සමඟ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය අඩු වීමක් වාර්තා කළේය. මේ අතර, බැංකු පද්ධතිය වෙත ලැබුණු විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ කැපී පෙනෙන ලෙස අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය අඩු විය. මෙම ප්‍රවණතා සමඟ විදේශීය ජංගම ගිණුමේ හිඟය 2020 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 1.2ට (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.5) සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 3.3ක් දක්වා (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.0) සැලකිය යුතු ලෙස පුළුල් විය. මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඩු වීම සහ අඛණ්ඩ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යයේ දළ නිල සංචිත භාවිත කිරීම තුළින් ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කරන ලදී. විදේශ සෘජු ආයෝජනවලින් සමන්විත වන විදේශීය ආයෝජන තවදුරටත් මධ්‍යස්ථව පැවති අතර, වසර තුළ දී කොටස් වෙළඳපොළ සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජනයන්හි ශුද්ධ ගෙවීම් වාර්තා විය. වසර තුළ දී පියවිය යුතු ඉහළ ණය සේවාකරණ වගකීම් මධ්‍යයේ රජයට සහ මහ බැංකුවට යම් ලැබීම් වාර්තා වූ අතර, එමගින් දළ නිල සංචිත යම් ප්‍රමාණයකට නැවත ගොඩනැංවීමට හැකි විය. ජා.මූ. අරමුදලේ විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම, චීන සංවර්ධන බැංකුවෙන් ලද විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම්, චීන මහජන බැංකුව සහ බංගලාදේශ බැංකුව සමඟ වන විදේශ විනිමය හුවමාරු පහසුකම් මෙම ලැබීම්වලට ඇතුළත් විය. කෙසේ වෙතත්, ණය සේවාකරණ ගෙවීම් මෙන්ම, අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා දේශීය විදේශ විනිමය වෙළඳපොළට විදේශ විනිමය සැපයීම හේතුවෙන් නිල සංචිතවලින් සැලකිය යුතු ලෙස ඉහළ ගෙවීම් වාර්තා විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, දළ නිල සංචිත 2020 වසර අවසානයේ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 5.7ට සාපේක්ෂව 2021 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 3.1ක් දක්වා පහළ ගියේය. ඒ අනුව, 2021 වසරේ දී ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂය එ.ජ. ඩොලර් බිලියන 4.0ක පමණ සැලකිය යුතු හිඟයක් වාර්තා කළේය. මේ අතර, වසර තුළ දී නොපියවා ඉතිරිව ඇති රජයේ විදේශීය ණය ඉහළ යෑමක් වාර්තා කළ ද, ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ මිල පහත වැටීම සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් ආපසු ගෙවීමේ ඒකාබද්ධ බලපෑම හේතුවෙන් වෙළඳපොළ මිලට අනුව රජයේ මුළු විදේශීය ණය සුළු වශයෙන් අඩු විය. තවද, නව විදේශ විනිමය හුවමාරු පහසුකම් ලබා ගැනීම හේතුවෙන් මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සැලකිය යුතු ලෙස වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වසර අවසන් වන විට පැවති රටේ මුළු විදේශීය ණය ප්‍රමාණය, එ.ජ. ඩොලර් බිලියන 49.0ක සිට 2021 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 50.7ක් දක්වා වැඩි විය. ශ්‍රී ලංකාව විසින්, 2021 වසරේ ජූලි මාසයේ දී කල් පිරුණු එ.ජ. ඩොලර් බිලියන 1ක සහ 2022 වසරේ ජනවාරි මාසයේ දී කල් පිරුණු එ.ජ. ඩොලර් මිලියන 500ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයත් පියවන ලදී. ශ්‍රී ලංකා රුපියල 2021 වසරේ දී සහ 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී අර්ධ වශයෙන් ශිෂ්ට ප්‍රයෝගවල ආධාරයෙන් එ.ජ. ඩොලරයට රුපියල් 200කට ආසන්න මට්ටමේ ස්ථාවරව පුළුල් ලෙස පැවතුණි. කෙසේ වෙතත්, බාහිර කම්පනවල බරපතලකම සහ ගෝලීය හා දේශීය අංශවලින් තවදුරටත් ඇතිවිය හැකි අහිතකර වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, විදේශීය අංශය මුහුණ දී සිටින

1.6 රූප සටහන
විනිමය අනුපාතිකය හා දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ මැදිහත්වීම



දුෂ්කර තත්ත්වය සමනය කිරීම සඳහා ප්‍රකාශයට පත් කරන ලද පුළුල් ප්‍රතිපත්ති මාලාවේ කොටසක් ලෙස මහ බැංකුව 2022 වසරේ මාර්තු මාසය ආරම්භයේ සිට යම් නිශ්චිත මට්ටමක රුපියලේ අවප්‍රමාණය පවත්වා ගැනීම අපේක්ෂා කරමින් විනිමය අනුපාතිකය තීරණය කිරීමේ දී නම්‍යශීලිභාවයක් ලබා දුන්නේය. කෙසේ වුවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ දක්නට ලැබූ විශාල පීඩනය හේතුවෙන් විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වසර අවසානයේ දී සියයට 7.0කින් අවප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, 2022 වසරේ මාර්තු මාසය අවසන් වන විට සියයට 33.0කින් සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. ආර්ථිකය තුළ අතීතයේ සිට පවතින දිගු කාලීන ගැටලු නිරාකරණය කර ගැනීම අරමුණු කරගත් පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණවලට අනුපූරකව විදේශීය අංශයේ දුර්වලතා මග හරවා ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය රජය සහ මහ බැංකුව හඳුනාගෙන ඇත. බොහෝ කලාපීය රටවල් සහ ආයතනවලින් විවිධ ණය පහසුකම්, විදේශ විනිමය හුවමාරු පහසුකම්, ඒකාබද්ධ ණය සහ සැලකිය යුතු ජංගම සහ ප්‍රාග්ධන ප්‍රදානයන් ලබා දෙමින් මෙරටට සහාය වී ඇති අතර, සාර්ව ආර්ථික ස්ථායීතාව යථා තත්ත්වයට පත් කිරීම සඳහා රටේ විදේශීය ණයවල තිරසාරභාවය ඇතිකර ගැනීමට ජා.මූ. අරමුදල සහ අනෙකුත් විදේශීය පාර්ශ්වකරුවන් සමඟ ඵලදායී සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට අපේක්ෂා කරයි.

රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රවණතා

රාජ්‍ය වියදම ඉලක්කගත මට්ටම ඉක්මවා යෑම සහ රාජ්‍ය ආදායම අපේක්ෂිත මට්ටමට වඩා අඩු වීම හේතුවෙන් අඛණ්ඩව පවතින ඉහළ ව්‍යුහාත්මක අයවැය හිඟය තුළින් වසර ගණනාවක් පුරා දැඩි බලපෑමට ලක් වූ රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්ය සාධනය රාජ්‍ය ණය තොගය තවදුරටත් ඉහළ නංවමින් 2021 වසරේ දී වඩාත් දුර්වල විය. 2021 වසර සඳහා වූ අයවැයෙහි දක්වා ඇති රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය මගින් ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සහ දිළිඳුබව තුරන් කිරීම මෙන්ම, සාර්ව ආර්ථික ස්ථායීතාව තහවුරු කිරීම අරමුණු කර තිබුණ ද, වඩා ශුභවාදී රාජ්‍ය මූල්‍ය ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට, විශේෂයෙන් ම රාජ්‍ය ආදායම සම්බන්ධයෙන් යෝග්‍ය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හරහා ප්‍රමාණවත් ලෙස සහාය නොලැබීම හේතුවෙන් 2021 වසර තුළ දී අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඉලක්ක ළඟා කර ගැනීමට නොහැකි විය. 2020 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 9.1ක් ලෙස පැවති රාජ්‍ය ආදායම, 2021 වසරේ දී සියයට 8.7ක් දක්වා ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ අවම මට්ටම කරා පහත වැටුණි. 2019 වසර අග භාගයේ දී සහ 2020 වසරේ මුල් භාගයේ දී ක්‍රියාත්මක කරන ලද බදු ලිහිල් කිරීම්, ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම අපේක්ෂිත මට්ටමට වඩා මන්දගාමී වීම සහ ඇතැම් ආනයන සීමා කිරීම් අඛණ්ඩව පැවතීම නිසා ආදායම් ප්‍රවාහ අහිමි වී යෑම හේතුවෙන්, රජයේ ආදායම් ලැබීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 11.1ක් වූ මුල් අයවැය ඇස්තමේන්තුවලින් කැපී පෙනෙන ලෙස විතැන් වී ඇත. කෙසේ වෙතත්, නාමික වශයෙන්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, රාජ්‍ය ආදායම සියයට 6.5ක සුළු වර්ධනයක් වාර්තා කළේය. මූලික වශයෙන් ආනයන සීමා හේතුවෙන් ආනයන බදු, සුරා බදු සහ විශේෂ වෙළඳ භාණ්ඩ බදු තුළින් ඉපැයූ ආදායම පහත වැටුණ ද, ආදායම් බදු, එකතු කළ අගය මත බද්ද (VAT), වරාය සහ ගුවන් තොටුපළ

1.7 රූප සටහන
රාජ්‍ය මූල්‍ය කාර්යසාධනයෙහි සාරාංශය
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



1

විශේෂ සටහන I

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන්වල වැදගත්කම

පසුබිම

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) යනු ගෝලීය මූල්‍ය සහයෝගීතාව ධෛර්යමත් කිරීම, මූල්‍ය ස්ථාවරත්වය සුරක්ෂිත කිරීම, ජාත්‍යන්තර වෙළඳාමට පහසුකම් සැලසීම, ඉහළ රැකියා සහ තිරසාර ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම සහ ලොව පුරා දරිද්‍රතාවය අවම කිරීම සඳහා 1944 වසරේ දී පිහිටුවන ලද සංවිධානයකි. ජා.මූ. අරමුදල සාමාන්‍යයෙන්, ජාත්‍යන්තර සංචිත නැවත ගොඩ නැංවීම, විනිමය අනුපාතිකය ස්ථාවර කිරීම, ආනයන වියදම් සඳහා ගෙවීම් අඛණ්ඩව සහතික කිරීම සහ ආර්ථික වර්ධනය ප්‍රතිස්ථාපනය කිරීම ඇතුළුව මූලික ගැටලු නිරාකරණය කිරීම අරමුණු කර ගනිමින් ගෙවුම් තුලන ගැටලු අත්විඳින සාමාජික රටවලට සහය වීම සඳහා සිය වැඩසටහන් යටතේ ණය ලබා දෙයි. ජා.මූ. අරමුදලේ සියලුම සාමාජිකයන්, ජා.මූ. අරමුදලේ සම්පත් සහනදායී නොවන කොන්දේසි මත සාමාන්‍ය සම්පත් ගිණුම (General Resources Account) යටතේ ලබා ගැනීමට සුදුසුකම් ලබා ඇති අතර, ජා.මූ. අරමුදල විසින් අඩු ආදායම්ලාභී රටවල විවිධත්වය සහ අවශ්‍යතාවලට ගැළපෙන ආකාරයෙන් සකස් කර ඇති දරිද්‍රතාවය අඩු කිරීම සහ වර්ධන භාරය (Poverty Reduction and Growth Trust) හරහා සහනදායී මූල්‍ය ආධාර ද සපයයි. අර්බුදවලට මුහුණදෙන නැගී එන වෙළඳපොළ සහ දියුණු වෙළඳපොල පවතින ආර්ථිකයන්ට, කෙටි කාලීන හෝ අනාගතයේදී සිදුවිය හැකි ගෙවුම් තුලන ගැටලු විසඳා ගැනීම සඳහා ජා.මූ. අරමුදලේ සහාය සමීපස්ථ ණය පහසුකම් (Stand-By Arrangements) හරහා සපයනු ලැබේ. අඩු ආදායම්ලාභී රටවල් සඳහා සමීපස්ථ වගකීම් පහසුකම (Stand-By Credit Facility) ඒ හා සමාන අරමුණක් සපුරනු ඇත. විස්තීර්ණ ණය පහසුකම (Extended Fund Facility) සහ අඩු ආදායම්ලාභී රටවල් සඳහා අනුරූපී වන විස්තීර්ණ වගකීම් පහසුකම (Extended Credit Facility) දිගු කාලීන ගෙවුම් තුලන ගැටලුවලට මුහුණ දෙන රටවලට මැදි කාලීන සහාය ලබා දීම අරමුණු කරගත් ප්‍රධාන පහසුකම් වේ. අර්බුද වැළැක්වීමට හෝ අවම කිරීමට සහ වෙළඳපොළ විශ්වාසය ඉහළ නැංවීමට, දැනටමත් ශක්තිමත් ප්‍රතිපත්ති පවත්වාගෙන යනු ලබන සාමාජිකයන්ට නම්‍යශීලී ණය පහසුකම (Flexible Credit Line) හෝ පූර්වාරක්ෂක සහ ද්‍රවශීලතා පහසුකම (Precautionary and Liquidity Line) භාවිතා කළ හැකිය. කඩිනම් මූල්‍යකරණ පහසුකම (Rapid Financing Instrument) සහ අඩු ආදායම්ලාභී රටවල් සඳහා අනුරූපී කඩිනම් ණය පහසුකම (Rapid Credit Facility) හරහා භාණ්ඩ මිල ඉහළ යෑමෙන් හටගන්නා කම්පන, ස්වභාවික විපත් සහ දේශීය ආර්ථිකයේ දුර්වලතා ඇතුළුව හදිසි ගෙවුම් තුලන අවශ්‍යතා ඇති රටවලට කඩිනමින් ආධාර සපයනු ලබයි. ජා.මූ. අරමුදල යටතේ ලබාදෙන අරමුදල් සැපයීමේ වැඩපිළිවෙලක අරමුණු, ප්‍රතිපත්ති සහ කොන්දේසි රඳා පවතින්නේ රටකට ආවේණික වූ ආර්ථික තත්ත්වයන් පදනම්ව ය.

වැඩසටහනක් සඳහා ජා.මූ. අරමුදල වෙත ප්‍රවේශ වීම සම්බන්ධයෙන් බොහෝ විට ඉස්මතු කරන කාරණය වන්නේ එයට සම්බන්ධ කර ඇති කොන්දේසීන්ය. සාමාන්‍යයෙන්, ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල කොන්දේසි, ප්‍රධාන සාර්ව ආර්ථික සහ ව්‍යුහාත්මක ප්‍රතිපත්ති ගැළපීම් ආවරණය කරයි. මෙම කොන්දේසි 1980 මුල් කාලපරිච්ඡේදය වන තෙක් ම සාර්ව ආර්ථික ප්‍රතිපත්ති කෙරෙහි වැඩි වශයෙන් යොමු වුව ද, අඩු ආදායම්ලාභී සහ සංක්‍රාන්ති රටවල් සමඟ ජා.මූ. අරමුදලේ සබඳතා වර්ධනය වීම පිළිබිඹු කරමින්, පසුකාලීනව එම ව්‍යුහාත්මක කොන්දේසිවල සංකීර්ණත්වය සහ විෂය පථය වර්ධනය විය. මෙම කොන්දේසි මගින් ගෙවුම් තුලනයේ ඇති ගැටලු විසඳා ගැනීමට මෙන්ම එවැනි ගැටලු නැවත නැවත ඇතිවීම වැළැක්වීම බලාපොරොත්තු වේ. තවද, නිවැරදි කිරීමේ පියවරයන් මගින් ආනයන සඳහා වන ගෙවීම් පියවීමට සහ තිරසාර ලෙස විදේශීය ණය ගෙවීමට හැකිවන මට්ටමට රටේ ගෙවුම් තුලනය ශක්තිමත් බව සහතික කිරීම අපේක්ෂා කෙරේ.

රටෙහි බලධාරීන්, ජා.මූ. අරමුදල සමඟ එකඟත්වය ඇතිකර ගන්නා වූ ප්‍රතිපත්තිමය බැඳීම්වලට සාමාන්‍යයෙන් ඇතුළත් වන්නේ:

පූර්ව ක්‍රියාවන්: පූර්ව ක්‍රියාවන් යනු රටක් ජා.මූ. අරමුදලෙහි වැඩසටහනක් යටතේ මූල්‍යකරණය අනුමත කිරීමට පෙර ක්‍රියාත්මක කිරීමට එකඟ වන පියවරයන් ය. වැඩසටහන් ඉලක්ක සාර්ථක ලෙස සපුරා ගැනීම සඳහා රටකට අවශ්‍ය පදනම ඇති බව සහතික කිරීම උදෙසා එවැනි ක්‍රියාවන් සැලසුම් කර ඇත. මිල පාලනයන් ඇත්නම් ඒවා ඉවත් කිරීම, මැදි කාලීන මූල්‍ය රාමුවට අනුකූලව රජයේ අයවැය සකස් කිරීම සහ ණය තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීමට අදාළ පියවර ගැනීම සාමාන්‍යයෙන් පූර්ව ක්‍රියාවන්වලට ඇතුළත් විය හැකිය.

ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක: මෙම නිර්ණායක, මුදල් සහ ණය සමස්තයන්, ජාත්‍යන්තර සංචිත, රාජ්‍ය මූල්‍ය ශේෂයන් සහ විදේශීය ණය ගැනීම් වැනි බලධාරීන්ගේ පාලනය යටතේ පවතින සාර්ව ආර්ථික විචල්‍යයන්ට අදාළ නිශ්චිත, මැනිය හැකි කොන්දේසි වේ. සාමාන්‍යයෙන්

රජයේ ප්‍රාථමික ශේෂයේ අවම මට්ටමක්, රජයේ ණය ගැනීම් මත සීමාවක් සහ ජාත්‍යන්තර සංචිතවල අවම මට්ටමක් පවත්වාගෙන යෑම යනාදිය ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායකවලට ඇතුළත් විය හැකිය.

දර්ශක ඉලක්ක: වැඩසටහන් අරමුණු සපුරාලීමේ ප්‍රගතිය තක්සේරු කිරීමට ප්‍රමාණාත්මක දර්ශක සඳහා දර්ශක ඉලක්ක සැකසිය හැක. ආර්ථික ප්‍රවණතා පිළිබඳ අවිනිශ්චිතභාවය හේතුකොට ගෙන ඇතැම් විට ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක වෙනුවට දර්ශක ඉලක්ක දක්වා ඇත. එමෙන්ම, එවැනි අවිනිශ්චිතභාවයන් අඩු වන විට, මෙම ඉලක්ක සුදුසු ලෙස වෙනස් කිරීම් සහිතව ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක බවට නැවත පත් විය හැකිය. අවම වශයෙන් තිබිය යුතු රජයේ ප්‍රාථමික ශේෂය, දේශීය ආදායම් එකතු කිරීමේ මට්ටම සහ සමාජ සුභසාධන වියදම් ප්‍රමාණය, සාමාන්‍යයෙන් මෙම දර්ශක ඉලක්කවලට ඇතුළත් විය හැකිය.

ව්‍යුහාත්මක මිණුම් දඬු: මේවා බොහෝ විට ප්‍රමාණාත්මක නොවන නමුත් වැඩසටහන් ඉලක්ක සපුරා ගැනීම සඳහා ඉතා වැදගත් වන ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ග වේ. මූල්‍ය අංශයේ මෙහෙයුම් වැඩිදියුණු කිරීම්, සමාජ ආරක්ෂණ ජාල ගොඩ නැංවීම සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම සාමාන්‍යයෙන් ව්‍යුහාත්මක මිණුම් දඬුවලට ඇතුළත් විය හැකිය.

කොන්දේසි සපුරාලීම අනුව ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල සාර්ථකත්වය

ජා.මූ. අරමුදල එහි වැඩසටහන්වල කාර්ය සාධනය වරින් වර සමාලෝචනය කරනු ලැබේ. ජා.මූ. අරමුදලේ වැඩසටහන් නිර්මාණය කර ඇත්තේ ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක සහ දර්ශක ඉලක්ක යනාදිය සපුරාලීම අනුව අරමුදල් මුදා හරින ආකාරයටයි. වැඩසටහනේ සාර්ථකත්වය වැඩි දියුණු කිරීමට සහ අවදානම් අවම කිරීමට, ජා.මූ. අරමුදල විසින් පුරෝකතනවල ප්‍රායෝගිකභාවය වැඩිදියුණු කිරීම, ණය තිරසාරභාවය විශ්ලේෂණය තීව්‍ර කිරීම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ ව්‍යුහාත්මක කොන්දේසි වඩා ගැළපෙන පරිදි වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කරයි. ජා.මූ. අරමුදල විසින් සපයනු ලබන කඩිනම් ණය පහසුකම (RCF) සහ කඩිනම් මූල්‍යකරණ පහසුකම් (RFI) සඳහා, සීමිත සමස්ත කොන්දේසි හැර, පසුවිපරම් වැඩසටහනක් පදනම් කරගත් කොන්දේසි හෝ සමාලෝචන නොමැත. යම් රටක් ප්‍රමාණාත්මක කාර්ය සාධන නිර්ණායක සපුරාලීමට අපොහොසත් වුවහොත්, එම අපගමනය සුළු/තාවකාලික හෝ රටෙහි බලධාරීන් විසින් නිවැරදි ක්‍රියාමාර්ග ගනිමින් සිටින්නේ නම් ද, වැඩසටහන එනමුත් සාර්ථක වන බවට සෑහීමකට පත්වන්නේ නම් ද, ජා.මූ. අරමුදලේ විධායක මණ්ඩලය එම අපගමනයන් සඳහා සහනයක් අනුමත කළ හැකිය. සාක්ෂාත් කරගැනීමට නොහැකි වූ ව්‍යුහාත්මක මිණුම් දඬු සහ දර්ශක ඉලක්ක සඳහා සහනයක් ලබාදීමට අවශ්‍ය නොවන නමුත් සමස්ත වශයෙන් වැඩසටහනේ ක්‍රියාකාරිත්වය තුළ එය තක්සේරු කරනු ලැබේ.

ශ්‍රී ලංකාව සහ ජා.මූ. අරමුදල අතර අතීතයේ සිට පවතින සබඳතාව

1950 වසරේ දී ජා.මූ. අරමුදලේ සාමාජිකත්වය ලබා ගැනීමෙන් පසු ශ්‍රී ලංකාව ජා.මූ. අරමුදලේ වැඩසටහන් දහසයකට සහභාගී වී ඇත. 1965 වසරේ දී ශ්‍රී ලංකාව ජා.මූ. අරමුදලේ පළමු වැඩසටහන හා සම්බන්ධ වූ අතර අවසන් වැඩසටහන 2016 වසරේ දී ආරම්භ විය. ජා.මූ. අරමුදලේ වඩාත්ම සාර්ථකම වැඩසටහන වූයේ 2009 වසරේ දී ආරම්භ කරන ලද සමීපස්ථ ණය පහසුකම වන අතර, මෙහිදී ජා.මූ. අරමුදල විසින් ශ්‍රී ලංකාවට සම්පූර්ණ අරමුදල් ප්‍රතිපාදන ලබා දී තිබේ. පෙර පැවති ජා.මූ. අරමුදලේ වැඩසටහන් මූලික වශයෙන් අවධානය යොමු කරනු ලැබුවේ විදේශ සංචිත වැඩිදියුණු කිරීම සහ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම කෙරෙහිය. ඊට අමතරව, ඉන්ධන මිල සූත්‍රයක් හඳුන්වා දීම, මහ බැංකුවේ ස්වාධීනත්වය වැඩිදියුණු කිරීම, නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය සහ ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇතුළත් අත්‍යවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම කෙරෙහි ද අවධානය යොමු විය. ජා.මූ. අරමුදල සමඟ නිල ගනුදෙනු සඳහා ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කල, ජා.මූ. අරමුදලේ අධිපතිවරයා ලෙස ගරු මුදල් අමාත්‍යවරයා ද, ජා.මූ. අරමුදලේ විකල්ප අධිපතිවරයා ලෙස ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිවරයාද කටයුතු කරයි.

මීට අමතරව, නම්‍යශීලී උද්ධමන ඉලක්ක රාමුව වෙත යොමු වීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීම අරමුණු කරගත් පුරෝකථනය සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය ඇතුළුව ශ්‍රී ලංකා මහ බැංකුවට සහ රජයට බොහෝ තාක්ෂණික සහායන් ජා.මූ. අරමුදල විසින් ලබා දී ඇත.

ශ්‍රී ලංකාව තුළ ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල සමස්ත සාර්ථකත්වය

1965 වසරේ දී ආරම්භ කළ ජා.මූ. අරමුදලේ ප්‍රථම වැඩසටහනේ සිට බොහෝ වැඩසටහන්වලට සහභාගී වුව ද, බලධාරීන් විසින් ශ්‍රී ලංකාව තුළ සාර්ථකව ක්‍රියාත්මක කර ඇත්තේ වැඩසටහන් කිහිපයක් පමණි. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ මෙවැනි වැඩසටහන්වලට සම්බන්ධ, විශේෂයෙන් ම ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණවලට අවශ්‍ය වූ ආර්ථිකයේ දිගුකාලීන ඵලදායීතාවය වැඩිදියුණු

1

කිරීම් ඉලක්ක කරගත් දුෂ්කර සාර්ව ආර්ථික ගැළපීම් සහ ජනප්‍රිය නොවන ප්‍රතිපත්ති හා සම්බන්ධ වූ කොන්දේසි සපුරාලීමට අවශ්‍ය කැපවීමේ දුර්වලතාවයයි. විශේෂයෙන්ම, ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල ද බොහෝ විට ඇතුළත් වන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට ශ්‍රී ලංකාව රටක් ලෙස මුලපිරීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලයක් ලෙස සිය ආර්ථික ප්‍රශ්න සඳහා විදේශයන්ගේ සහාය ලබා ගැනීමේ අවශ්‍යතාවය ඇති වී තිබේ. පෙර පැවති ජා.මූ. අරමුදලේ වැඩසටහන්වලින් හඳුනාගත් බොහෝ ප්‍රතිසංස්කරණ කෙටි කාලීන අරමුණු පමණක් සපුරාලමින්, මූල්‍ය පහසුකම් යටතේ යම් වාරික ලබා ගැනීමෙන් පසු සම්පූර්ණ කර නොමැතිව හෝ හදිසියේ නතරකර දමා ඇත. සංඛ්‍යා සටහන වි.ස. 1.1හි පෙන්වා ඇති පරිදි ජා.මූ. අරමුදලේ වැඩසටහන් සඳහා නිරන්තරයෙන් යොමු වීම් සහ ඉවත්ව යෑමේ චක්‍රීය ප්‍රවණතාවයක් මෙමගින් ඇති කර තිබේ. එසේවුවත්, 1951 වසරේ සිට 1993 වසර දක්වා කාලය තුළ ජා.මූ. අරමුදලෙන් වැඩසටහන් හතක් ලබා ගත් ඉන්දියාව, 1993 වසරේ දී සිය අවසන් වැඩසටහන නිම කිරීමෙන් පසු ජා.මූ. අරමුදලෙහි වැඩසටහනක් වෙත යොමු වී නොමැත. ජා.මූ. අරමුදලේ වැඩසටහනක් සාර්ථකව නිම කළේ නම්, විශේෂයෙන්ම ව්‍යුහාත්මක ගැළපීම් හරහා ආර්ථිකයට දිගුකාලීන ප්‍රතිලාභ ලබා ගැනීමට හැකිව තිබූ අතර, කෙටිකාලීන ආර්ථික ගැටලු හේතුවෙන් අනාගත අවස්ථාවන්හි දී ජා.මූ. අරමුදල වෙත ප්‍රවේශ වීමේ අවශ්‍යතාවය ද අවම වන්නට තිබුණි. මෑතක දී, එනම්, 2009 සහ 2016 වසරවල දී ශ්‍රී ලංකාව වෙත ලබා දුන් ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල කොන්දේසි සපුරාලීමේ සාර්ථකත්වයෙහි සාරාංශයක් පහත දක්වා ඇත.

2009 වසරේ ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකම් වැඩසටහන

සමීපස්ථ ණය පහසුකම යටතේ අටවන සහ අවසාන සමාලෝචනයට අදාළ ජා.මූ. අරමුදලේ නිලධාරීන්ගේ වාර්තාවට අනුව, ශ්‍රී ලංකාව වැඩසටහනට අදාළ ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්ක, ශුද්ධ දේශීය මූල්‍යකරණය සහ සංචිත මුදල් දර්ශක ඉලක්ක සපුරා ඇත. වැඩසටහන අවසන් වීමට පෙර පෞද්ගලික විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා වන නියාමන රාමුව සඳහා වූ යෝජිත ප්‍රතිසංස්කරණ හැර අනෙකුත් සියලු ම ව්‍යුහාත්මක මිණුම් දඬු ද ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කළේය.

2016 වසරේ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන

විස්තීර්ණ ණය පහසුකම යටතේ හයවන සමාලෝචනයට අදාළ ජා.මූ. අරමුදලේ නිලධාරීන්ගේ වාර්තාවට අනුව, 2019 වසරේ අප්‍රේල් මාසයේ පාස්කු ඉරු දින ප්‍රහාරයන්ගෙන් පසුව රාජ්‍ය ආදායම් සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන්, ශ්‍රී ලංකාවට රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට නොහැකි විය. ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්ක සපුරමින් සංචිත යළි ගොඩ නැංවීමට ද, විනිමය අනුපාතිකයෙහි ඉහළ නම්‍යශීලීභාවයක් සැලසීමට ද ශ්‍රී ලංකා මහ බැංකුව කැපවී සිටියේය. නම්‍යශීලී උද්ධමන ඉලක්ක සහ නම්‍යශීලී විනිමය

සංඛ්‍යා සටහන වි.ස. 1.1

ශ්‍රී ලංකාව විසින් ලබාගත් ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල ඉතිහාසය

000′ විශේෂ ගැනුම් හිමිකම්

පහසුකම	ආරම්භ කළ දිනය	කල්පිරෙන දිනය	එකඟ වූ මුදල	ලබාගත් මුදල	නොපියවා ඉතිරිව ඇති මුදල
EFF	2016 ජූනි 03	2020 ජූනි 02	1,070,780	952,230	892,283
SBA	2009 ජූලි 24	2012 ජූලි 23	1,653,600	1,653,600	0
ECF	2003 අප්‍රේල් 18	2006 අප්‍රේ. 17	269,000	38,390	0
EFF	2003 අප්‍රේල් 18	2006 අප්‍රේ. 17	144,400	20,670	0
SBA	2001 අප්‍රේල් 20	2002 සැප්. 19	200,000	200,000	0
ECF	1991 සැප් 13	1995 ජූලි 31	336,000	280,000	0
SAFC	1988 මාර්තු 09	1991 මාර්. 08	156,170	156,170	0
SBA	1983 සැප්. 14	1984 ජූලි 31	100,000	50,000	0
EFF	1979 ජන. 01	1981 දෙසැ. 31	260,300	260,300	0
SBA	1977 දෙසැ. 02	1978 දෙසැ. 01	93,000	93,000	0
SBA	1974 අප්‍රේ. 30	1975 අප්‍රේ. 29	24,500	7,000	0
SBA	1971 මාර්. 18	1972 මාර්. 17	24,500	24,500	0
SBA	1969 අගෝ. 12	1970 අගෝ. 11	19,500	19,500	0
SBA	1968 මැයි 06	1969 මැයි 05	19,500	19,500	0
SBA	1966 ජූනි 15	1967 ජූනි 14	25,000	25,000	0
SBA	1965 ජූනි 15	1966 ජූනි 14	30,000	22,500	0

මූලය: ශ්‍රී ලංකාවට අදාල පිටුව (ජා.මූ. අරමුදලේ වෙබ් අඩවිය)

EFF – විස්තීර්ණ ණය පහසුකම, SBA – සමීපස්ථ ණය පහසුකම, ECF – විස්තීර්ණ වගකීම් පහසුකම, SAFC – ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් කැපවීම

අනුපාතික ක්‍රමය සඳහා පෙර දැක්මක් සකස් කිරීම, බදු වියදම් ප්‍රකාශයක්, 2018 වසරේදී බදු අයකර ගැනීමට අදාළ වියදම් තාර්කීකරණය කිරීමට සැලැස්මක් සහ රජයේ වාණිජ ව්‍යවසායයන් සඳහා වන වාණිජ නොවන වගකීම්වල (සහනාධාර ඇතුළුව) ඇස්තමේන්තුගත මූල්‍ය පිරිවැය ඇතුළුව වැඩසටහන් ඉලක්කවලට අනුකූලව 2018 අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම, ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ඵලදායී උපාය මාර්ගික සැලැස්මක් සහ මෙහෙයුම් ව්‍යාපාර ආකෘතියක් සකස් කිරීම, ආදායම් හිඟය පියවා ගැනීම සඳහා නව ආදායම් මූලාශ්‍ර සමඟින් මැදි කාලීනව තීරු බදු නොවන බදු වර්ග තාර්කික කිරීමේ උපාය මාර්ගයක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සහ ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය එළිදැක්වීම ඇතුළුව අනෙකුත් ප්‍රධාන ව්‍යුහාත්මක මිණුම් දඬු ක්‍රියාත්මක කරමින් ශ්‍රී ලංකාව වැඩසටහන් යටතේ ඇති ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සැලසුම්වල සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත්තේය.

කලාපීය රටවල් නිරත වූ ජා.මූ. අරමුදල සමඟ වැඩසටහන්

කලාපයේ අනෙකුත් රටවල් ද තම ආර්ථික තත්ත්වයන් මත වරින් වර ජා.මූ. අරමුදලේ වැඩසටහන්වල නිරත වී

සංඛ්‍යා සටහන වි.ස. 1.2

තෝරාගත් කලාපීය රටවල් විසින් ජා.මූ. අරමුදලෙන් ලබාගත් නවතම වැඩසටහන්

000′ විශේෂ ගැනුම් හිමිකම්

පහසුකම	ආරම්භ කළ දිනය	කල්පිරෙන දිනය	එකඟ වූ මුදල	ලබාගත් මුදල	නොපියවා ඉතිරිව ඇති මුදල
පකිස්ථානය					
EFF	2019 ජූලි 03	2022 ඔක්. 02	4,268,000	2,144,000	2,144,000
RFI	2020 අප්‍රේ. 16	2020 අප්‍රේ. 20	1,015,500	1,015,500	1,015,500
EFF	2013 සැප්. 04	2016 සැප්. 30	4,393,000	4,393,000	2,244,750
SBA	2008 නොවැ. 24	2011 සැප්. 30	7,235,900	4,936,035	0
ECF	2001 දෙසැ. 06	2004 දෙසැ. 05	1,033,700	861,420	0
ඉන්දියාව					
SBA	1991 ඔක්. 31	1993 ජූනි 30	1,656,000	1,656,000	0
SBA	1991 ජන. 18	1991 අප්‍රේ. 17	551,925	551,925	0
EFF	1981 නොවැ. 09	1984 මැයි 01	5,000,000	3,900,000	0
SBA	1965 මාර්. 22	1966 මාර්. 21	200,000	200,000	0
SBA	1963 ජූලි 09	1964 ජූලි 08	100,000	0	0
බංගලාදේශය					
RCF	2020 මැයි 29	2020 ජූනි 02	177,770	177,770	177,770
RFI	2020 මැයි 29	2020 ජූනි 02	355,530	355,530	355,530
ECF	2012 අප්‍රේ. 11	2015 ඔක්. 29	639,960	639,960	283,411
ECF	2003 ජූනි 20	2007 ජූනි 19	400,330	316,730	0
ECF	1990 අගෝ. 10	1993 සැප්. 13	345,000	330,000	0
නේපාලය					
ECF	2022 ජන. 12	2025 මාර්. 11	282,420	78,500	78,500
RCF	2020 මැයි 06	2020 මැයි 08	156,900	156,900	156,900
RCF	2015 ජූලි 31	2015 අගෝ. 10	35,650	35,650	24,955
ECF	2003 නොවැ. 19	2007 නොවැ. 18	49,900	49,900	0
ECF	1992 ඔක්. 05	1995 ඔක්. 04	33,570	16,785	0
මාලදිවයින					
RCF	2020 අප්‍රේ. 22	2020 අප්‍රේ. 24	21,200	21,200	21,200
SBA	2009 දෙසැ. 04	2012 දෙසැ. 03	49,200	8,200	0
ESF	2009 දෙසැ. 04	2011 දෙසැ. 03	8,200	2,050	0
ඇෆ්ගනිස්ථානය					
ECF	2020 නොවැ. 06	2024 මැයි 05	259,040	184,566	184,566
RCF	2020 අප්‍රේ. 29	2020 ජූනි 23	161,900	161,900	161,900
ECF	2016 ජූලි 20	2019 දෙසැ. 31	32,380	32,380	31,930
ECF	2011 නොවැ. 14	2014 නොවැ. 13	85,000	24,000	1,200
ECF	2006 ජූනි 26	2010 සැප්. 25	81,000	75,350	0

මූලයන්: පකිස්ථානය, ඉන්දියාව, බංගලාදේශය, නේපාලය, මාලදිවයින සහ ඇෆ්ගනිස්ථානය යන රටවල්වලට අදාළ පිටු (ජා.මූ. අරමුදලේ වෙබ් අඩවිය)

EFF – විස්තීර්ණ ණය පහසුකම, RFI – කඩිනම් මූල්‍යකරණ පහසුකම, SBA – සමීපස්ථ ණය පහසුකම, ECF – විස්තීර්ණ වගකීම් පහසුකම, RCF – කඩිනම් ණය පහසුකම, ESF – බාහිර කම්පන පහසුකම

1

ඇත. කොවිඩ්-19 වසංගතය හමුවේ වූ ආර්ථික බිඳවැටීම් සමඟ ජා.මූ. අරමුදලේ වැඩසටහනක් අපේක්ෂා කරන රටවල් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි විය. කලාපීය රටවල් විසින් මෑතක දී ලබාගත් ජා.මූ. අරමුදලේ වැඩසටහන් ලැයිස්තුවක් සංඛ්‍යා සටහන වි.ස. 1.2හි දක්වා ඇත.

ජා.මූ. අරමුදල සමඟ අනාගත වැඩසටහනකින් ශ්‍රී ලංකාවට ඇති බලපෑම්

කලින් සඳහන් කළ පරිදි, ගෙවුම් තුලනයෙහි තත්ත්වය සහ රජයේ ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයට අධාර වීම සඳහා ශ්‍රී ලංකාව වරින් වර ජා.මූ. අරමුදලේ වැඩසටහන්වලට ඇතුළත් වී ඇත. කෙසේ වෙතත්, පෙර අවස්ථා මෙන් නොව, වත්මන් තත්ත්වය සලකා බැලීමේ දී, ජා.මූ. අරමුදලේ වැඩසටහනක් වෙත යොමු වීම රටෙහි පවතින අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් ජය ගැනීම වෙනුවෙන් වූ උපාය මාර්ගවල වැදගත් කොටසක් වනු ඇත. වර්තමානයේ පවතින පහළ විදේශ සංචිත මට්ටම සලකා බැලීමේ දී, කෙටි කාලීනව ගෙවීමට ඇති සැලකිය යුතු ඉහළ ණය සේවාකරණය කිරීම අතිශයින් අභියෝගාත්මක වනු ඇත. ඉහළ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ විදේශ විනිමය ලැබීම් අඩු වීම මධ්‍යයේ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාව පහළ ගොස් ඇති අතර, ඒ හේතුවෙන් දළ නිල සංචිත සැලකිය යුතු ලෙස පහළ ගිය අතර ඉන්ධන, ගෑස්, ගල් අඟුරු, ඖෂධ, සහ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වැනි අත්‍යවශ්‍ය ආනයන සඳහා විදේශ විනිමය ඉල්ලුම සපුරාලීම සඳහා ප්‍රමාණවත් විදේශ විනිමය නොමැති විය. මෙම ප්‍රවණතා හමුවේ, නුදුරු අනාගතයේ දී සැලකිය යුතු විදේශීය මූල්‍යකරණ ප්‍රමාණයක් සුරක්ෂිත කර ගැනීමේ අවශ්‍යතාවයක් පවතී. ජා.මූ. අරමුදලේ වැඩසටහනකට ඇතුළත් වීම තුළින් අමතර මූල්‍යකරණය සඳහා ප්‍රවේශය ලබා දීම පමණක් නොව බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික මූලාශ්‍ර ඇතුළු විදේශීය ආයෝජකයන්ගේ විශ්වාසය ද වර්ධනය කරයි. මෙය ඇතුළු සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මාලාවක් ක්‍රියාත්මක කිරීම තුළින් සමස්ත සාර්ව ආර්ථිකය ස්ථාවර කිරීමට බලාපොරොත්තු වන අතර එමගින් ණය නොවන මූල්‍ය ලැබීම් තවදුරටත් ප්‍රවර්ධනය කෙරෙනු ඇත.

අනාගතයේ ජා.මූ. අරමුදලේ වැඩසටහනක් පිළිබඳ සාකච්ඡාවකදී සලකා බැලිය හැකි ප්‍රධාන ක්ෂේත්‍ර අතරට රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය, සුදුසු මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, විනිමය අනුපාතිකයෙහි නම්‍යශීලීභාවය, මහ බැංකුව රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා මූල්‍යනය ක්‍රමානුකූලව අඩු කිරීම, රජය සතු වාණිජ ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීම, ප්‍රාග්ධන ප්‍රවාහ කළමනාකරණ ක්‍රියාමාර්ග ක්‍රමයෙන් ඉවත් කිරීම, උපයෝගිතා සඳහා වෙළෙඳපොළ පදනම් වූ මිල සූත්‍ර හඳුන්වා දීම සහ සමාජ ආරක්ෂණ ජාල ශක්තිමත් කිරීම මෙන්ම තවත් ක්ෂේත්‍ර ඇතුළත් විය හැකිය. ඉහත සඳහන් ක්‍රියාමාර්ගයන් සමහරක් මහ බැංකුව සහ රජය විසින් දැනටමත් සිදු කර ඇත. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සැලකිය යුතු ලෙස දැඩි කිරීම, විනිමය අනුපාතිකය වැඩි වශයෙන් වෙළඳපොළ බලවේග විසින් තීරණය කිරීම, ඛනිජ තෙල් සහ එල් පී ගෑස්වල දේශීය මිල පිරිවැය පිළිබිඹු වන ලෙස ගැළපීම යනාදිය සිදු කර ඇත. මෙම සාර්ව ආර්ථික ස්ථායීකරණ පියවරයන් ගැළපුම් අවධියේ දී ආර්ථිකයට අසීරු වෙනස්කම් සිදු කළ හැකි නමුත් වත්මන් ආර්ථික අර්බුදය සලකා බැලීමේ දී ඒවා අත්‍යවශ්‍ය වී ඇත. කෙසේ වෙතත්, ජා.මූ. අරමුදලේ වැඩසටහනක් සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා, සුදුසු ක්‍රියාමාර්ග හරහා තිරසාර ලෙස විදේශීය ණය කළමණාකරණය කිරීම රට විසින් සහතික කළ යුතුය. මේ සඳහා, ජා.මූ. අරමුදලේ සහය දක්වන ආර්ථික ගැළපුම් වැඩසටහනකට අනුකූල වන පරිදි, ණය වගකීම් ක්‍රමානුකූලව සහ එකඟතාවයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා, විදේශීය ණය සේවාකරණය කිරීම තාවකාලිකව අත්හිටුවන බව රජය දැනටමත් නිවේදනය කර ඇත. තවද, ජා.මූ. අරමුදලේ වැඩසටහනක් සාර්ථක ලෙස සාකච්ඡා කර ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ සියලුම පාර්ශ්වකරුවන් අතර එකඟතාවක් හරහා දේශපාලන හා සමාජ ස්ථාවරත්වයක් ළඟා කර ගත යුතුය. එහි සාර්ථකත්වය රඳා පවතිනු ඇත්තේ දිගු කලක් තිස්සේ නොසලකා හරින ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ තිරසාර සාර්ව ආර්ථික ස්ථායීතාවයක් සහතික කරන ආකාරයෙන් ක්‍රියාත්මක කරන ප්‍රමාණය මත ය.

මූලාශ්‍ර

1. International Monetary Fund. (2022). Sri Lanka: 2021 Article IV Consultation - Press Release, Staff Report, and Statement by the Executive Director for Sri Lanka. 091. International Monetary Fund, Washington D.C.
2. International Monetary Fund. (2019). Sri Lanka: Sixth Review Under the Extended Arrangement Under the Extended Fund Facility and Requests for Waiver of Nonobservance and Modification of Performance Criterion - Press Release, Staff Report, and Statement by the Executive Director for Sri Lanka. 335. International Monetary Fund, Washington D.C.
3. International Monetary Fund. (2012). Sri Lanka: Eighth and Final Review Under the Stand-By Arrangement - Staff Report, Press Release on the Executive Board Discussion; and Statement by the Executive Director for Sri Lanka, Staff Report, and Statement by the Executive Director for Sri Lanka. 198. IMF.
4. Factsheet - International Monetary Fund Conditionality [Online]. Available at: https://www.imf.org/en About /Factsheets Sheets/2016/08/02/21/28/IMF-Conditionality#:~:text=When%2 a%20 country%20borrows%2 from,able%20to%20repay%20the%20IMF
5. International Monetary Fund's Sri Lanka Country Page [Online]. Available at: https://www.imf.org/en/Countries/LKA

සංවර්ධන බද්ද (PAL) සහ සෙස් බද්ද රාජ්‍ය ආදායමේ නාමික වර්ධනයට දායක විය. ප්‍රධාන වශයෙන් 2019 වසරේ අග භාගයේ සිට හඳුන්වා දුන් බදු ඔස්සේ ලබා දෙන දිරි ගැන්වීම් රාශිය අඛණ්ඩව පවත්වා ගෙන යෑම, වසංගතය ආරම්භයේ සිට සහ 2021 වසරේ අයවැය යෝජනා යටතේ තවදුරටත් හඳුන්වා දුන් ඍජු සහ වක්‍ර බදු සහන ප්‍රතිසංස්කරණ හේතුවෙන්, අතීතයේ සිදු වූ පරිදි ම, 2021 වසරේ දී රාජ්‍ය ආදායම් වර්ධන අනුපාතිකය, ආර්ථිකයේ ආදායම් වර්ධන අනුපාතිකයට සමගාමීව පවත්වා ගෙන යෑමට අපොහොසත් වී ඇත. අනෙක් අතට, නාමික වශයෙන්, 2021 වසරේ දී රජයේ වියදම් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 15.8කින් රුපියල් බිලියන 3,521.7ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, රාජ්‍ය වියදම 2020 වසරේ පැවති සියයට 20.2 සිට 2021 වසරේ දී සියයට 21.0ක් දක්වා ඉහළ ගියේය. 2021 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 11.3ක් සහ රාජ්‍ය ආදායමෙන් සියයට 130.0ක් ලෙස පැවතුණි. වැටුප් හා වේතන සහ පොලී ගෙවීම් සඳහා දැරූ ඉහළ වියදම පුනරාවර්තන වියදම්වල වර්ධනයට හේතු වී ඇත. තවද, 2021 වසරේ දී රාජ්‍ය ආයෝජන සියයට 2.7කින් පහත වැටුණ ද, පෙර වසර සඳහා වාර්තා කරන ලද ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් අඩු වීමේ පදනම් බලපෑම හේතුවෙන්, ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 57.2කින් ඉහළ ගියේය. පහසුවෙන් අඩු කළ නොහැකි පුනරාවර්තන වියදම්, මහජන සෞඛ්‍ය සේවාවන් කෙරෙහි සිදු කළ අතිරේක වියදම් සහ වසංගතයේ බලපෑමට ලක් වූ කුටුම්භ සහ ව්‍යාපාර වෙත ලබා දුන් ඍජු හා වක්‍ර මූල්‍ය සහායන් හේතුවෙන් වියදම් තාර්කීකරණ සැලැස්ම අපේක්ෂිත ඉලක්කයෙන් විතැන් වී ඇත. සමස්ත රාජ්‍ය මූල්‍ය ශේෂය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, පෙර වසරේ දී සියයට 11.1ක් (රුපියල් බිලියන 1,667.7ක්) ලෙස වාර්තා වූ අතර 2021 වසරේ දී සියයට 12.2ක් (රුපියල් බිලියන 2,057.9ක්) දක්වා තවදුරටත් දුර්වල විය. මේ අතර, අවම වශයෙන් වසරේ පොලී නොවන වියදම හෝ සපුරා ගැනීමට රාජ්‍ය ආදායම ප්‍රමාණවත් නොවන බව පිළිබිඹු කරමින්, ප්‍රාථමික හිඟය 2020 වසරේ පැවති රුපියල් බිලියන 687.4ක (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.6ක) අගයේ සිට 2021 වසරේ දී රුපියල් බිලියන 1,009.5ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 6.0ක්) දක්වා ඉහළ ගියේය. රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කරන වර්තන ගිණුමේ හිඟය, නාමික වශයෙන්, 2020 වසරේ පැවති රුපියල් බිලියන 1,180.4 සිට 2021 වසරේ දී රුපියල් බිලියන 1,290.4ක් දක්වා පුළුල් වූ අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වර්තන ගිණුමේ හිඟය, පෙර වසරේ පැවති සියයට 7.9 සිට 2021 වසරේ දී සියයට 7.7ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය. මෙම ප්‍රවණතා සමඟ, 2021 වසර සඳහා ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රාථමික හිඟය, වර්තන ගිණුමේ හිඟය සහ සමස්ත අයවැය හිඟය, 2021 අයවැයෙහි ඇස්තමේන්තු කර තිබූ, පිළිවෙළින්, සියයට 4.0ක්, සියයට 2.9ක් සහ සියයට 8.9ක් යන අපේක්ෂිත මට්ටම්වලින් සැලකිය යුතු ලෙස විතැන් විය. අහිතකර ගෝලීය ප්‍රවණතා සහ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහළ දැමීම්වලින් පසු විදේශීය මූල්‍ය වෙළඳපොළ වෙත පැවති සීමිත ප්‍රවේශය මධ්‍යයේ, අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා විශේෂයෙන්ම බැංකු අංශය ඇතුළු දේශීය මූලාශ්‍ර මත අධික ලෙස රජය රඳා පැවතුණි. ඒ අනුව, 2021 වසර තුළ දී දේශීය මූලාශ්‍ර ඔස්සේ සිදු කළ ශුද්ධ මූල්‍යනය රුපියල් බිලියන 2,071.8ක් වූ අතර, විදේශීය මූලාශ්‍රවලට අදාළව රුපියල් බිලියන 13.9ක ශුද්ධ ආපසු ගෙවීමක් වාර්තා විය. 2021 වසර තුළ දී ඉහළ යන වියදම් අවශ්‍යතා සපුරාලීමට සහ ණය සේවාකරණය පවත්වා ගෙන යෑමට, රජය විශාල වශයෙන් බැංකු අංශය මත, විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව මත, මූල්‍යනය සඳහා යැපුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වසර තුළ දී රජය විසින් ලබා ගන්නා ලද දේශීය බැංකු ණය අතරින් රුපියල් බිලියන 1,225.2ක් සඳහා දායකත්වය ලබා දී ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවයි. රාජ්‍ය මූල්‍ය හිඟය පුළුල් වීම, වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ යෑම මෙන්ම, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම නිසා ඉන් හට ගත් බලපෑම හේතුවෙන් මධ්‍යම රජයේ නොපියවූ ණය 2020 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 15,117.2 සිට 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 17,589.4ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස නොපිය වූ මධ්‍යම රජයේ ණය, පසු ගිය වසර අවසානයේ වාර්තා වූ සියයට 100.6 සිට 2021 වසර අවසානය වන විට සියයට 104.6ක් දක්වා ඉහළ ගියේය. නාමික වශයෙන්, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී දේශීය ණය සහ විදේශීය ණය, පිළිවෙළින්, සියයට 22.4කින් සහ සියයට 7.3කින් ඉහළ ගියේය. භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර හරහා ලබා ගත් දේශීය ණය හේතුවෙන් රජයේ ණය කළඹ තුළ දේශීය ණය ප්‍රතිශතය, 2020 වසරේ පැවති සියයට 60.0ක අගයේ සිට 2021 වසරේ දී සියයට 63.1ක් දක්වා ඉහළ ගියේය. 2020 වසරේ රුපියල් බිලියන 1,941.4ක් වූ සමස්ත ණය සේවාකරණ වියදම්, 2021 වසරේ දී රුපියල් බිලියන 2,375.6ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, ණය සේවාකරණ ගෙවීම්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ වාර්තා වූ

1

1.8 රූප සටහන
මධ්‍යම රජයේ ණය
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 12.9 සිට 2021 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 14.1ක් දක්වා ඉහළ ගියේය. 2021 වසරේ දී පොලී ගෙවීම් සහ ණය ආපසු ගෙවීම්, පිළිවෙළින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 6.2ක් සහ 7.9ක් විය. විදේශීය අංශයේ ද්‍රවශීලතා තත්ත්වය අයහපත් වීම, රාජ්‍ය මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම දුර්වල වීම හා ඉදිරියේ දී පියවීමට ඇති සැලකිය යුතු ණය සේවාකරණ ගෙවීම් පිළිබඳව සලකා බලමින්, 2021 වසර තුළ දී ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළන ලදී. රජයේ සැලකිය යුතු ණය ප්‍රමාණය සහ කෙටි කාලීනව සිට මැදි කාලීනව පියවිය යුතු විදේශීය ණය සේවාකරණ වගකීම් ප්‍රමාණය ඒකරාශී වීම රටේ විදේශීය ණය තිරසාරභාවය සම්බන්ධ බරපතල ගැටලු මතු කරයි. මෙවන් පසුබිමක, දැනටමත් නිවේදනය කර ඇති පරිදි ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රජය දරන උත්සාහය සමඟින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කර ගැනීම සඳහා දැඩි කැපවීමකින් කටයුතු කිරීම සහ විචක්ෂණශීලී වගකීම් කළමනාකරණ ක්‍රමෝපාය යොදා ගැනීම හරහා ඉදිරි කාලයේ දී රාජ්‍ය ණය තිරසාරබව ළඟා කර ගැනීමට හැකි වෙතැයි අපේක්ෂා කෙරේ.

මුදල් අංශයේ ප්‍රවණතා

උද්ධමන පීඩනය වඩාත් තීව්‍ර වීම සහ විදේශීය අංශයේ ගොඩනැගීම සහ විදේශීය අංශයේ හා දේශීය මූල්‍ය වෙළඳපොළ තුළ ඇති වූ අසමතුලිතතා සැලකිල්ලට ගනිමින් 2020 වසරේ සිට පෙර නොවූ ආකාරයේ මුදල් උත්තේජක ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ මහ බැංකුව, 2021 අගෝස්තු මස මැද සිට මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කළේය. 2020 මුල් කාලයේ වසංගතය ආරම්භයේ සිට 2021 අගෝස්තු මස මැද දක්වා මහ බැංකුව විසින් පවත්වාගෙන ගිය අතිශය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මගින් වෙළඳපොළ පොලී අනුපාතික ඉතිහාසයේ මෙතෙක් පැවති අවම මට්ටම් දක්වා අඩු වීමට සහ දේශීය මුදල් වෙළඳපොළට ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් සැපයීමට උපකාරී වූ අතර, එමගින් වසංගතයෙන් පීඩාවට පත් වූ පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා උපකාරී වෙමින් ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම පිණිස පහසුකම් සැලසීය. වසංගත කාලය තුළ රාජ්‍ය ආදායම අඩු වීම සහ වියදම් අධික වීම හේතුවෙන් රජයේ මුදල් ප්‍රවාහවලට සිදු වූ බාධා මධ්‍යයේ රජයේ හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රාථමික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම මෙන්ම භාණ්ඩාගාර බිල්පත් මහ බැංකුව වෙත සෘජුව පැවරීම මගින් මහ බැංකුව විසින් රජයට සුවිශේෂී මූල්‍ය සහායක් අඛණ්ඩව ලබා දෙන ලදී. කෙසේ වෙතත්, මැදි කාලීනව අධික උද්ධමන පීඩන ඇති වීම වැළැක්වීමට සහ විදේශීය අංශයේ හා දේශීය මූල්‍ය වෙළඳපොළ අසමතුලිතතා සඳහා පිළියම් යෙදීමට 2021 අගෝස්තු මාසයේ සිට මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, 2021 අගෝස්තු මස මැද දී, පිළිවෙළින්, සියයට 5.00 සහ සියයට 6.00 දක්වා පදනම් අංක 50කින් ඉහළ නංවන ලද අතර, බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2021 සැප්තැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි සියයට 4.00ක් දක්වා ප්‍රතිශතාංක 2කින් ඉහළ නංවන ලදී. වෙළඳපොළ තත්ත්වයන් වඩාත්

1.9 රූප සටහන
නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ
තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතික



(අ) 2022 අප්‍රේල් 8 වැනි දිනට

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව

හොඳින් පිළිබිඹු කිරීම සඳහා මහ බැංකුව විසින් තවත් නියාමන ක්‍රියාමාර්ග කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී. වෙළඳපොළේ රුපියල් තැන්පතු සහ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සඳහා ලබාදෙන පොලී අනුපාතික අතර පවතින විෂමතා සඳහා පිළියම් යෙදීමට මහ බැංකුව විසින් 2021 අගෝස්තු මාසයේ දී බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සඳහා ලබාදෙන පොලී අනුපාතික මත උපරිම සීමාවක් පනවන ලදී. වැටුප්ලාභී සේවකයන් සඳහා හඳුන්වා දෙනු ලැබූ විශේෂ දේපළ ඇපකර සහිත නිවාස ණය සඳහා ලබා දුන් පොලී අනුපාතිකය 2021 දෙසැම්බර් මාසයේ දී සංශෝධනය කර විචල්‍ය පොලී අනුපාතිකයක් හා සම්බන්ධ කරන ලදී. විදේශීය අංශයෙහි සහ උද්ධමන ප්‍රවණතා හේතුවෙන් අඛණ්ඩව ඇති වූ අභියෝග හමුවේ මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් දැඩි කරමින් 2022 ජනවාරි සහ මාර්තු මාසවල දී නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සමස්තයක් ලෙස පදනම් අංක 150 බැගින් ඉහළ නංවන ලදී. 2022 මාර්තු මාසයේ දී බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු මත පනවන ලද උපරිම පොලී අනුපාතිකය ඉවත් කළ අතර, දේශීය ණය උපකරණ, එනම් ණය කාඩ්පත්, පෙර ගිවිසගෙන ඇති තාවකාලික බැංකු අයිරා සහ උකස් අත්තිකාරම් සඳහා අදාළ වන පොලී අනුපාතික මත පනවන ලද උපරිම පොලී අනුපාතික ඉහළ නංවන ලදී. දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ ඇතැම් බැංකු මුහුණ දී සිටින රුපියල් ද්‍රවශීලතා ගැටලු හේතුවෙන් 2021 වසරේ මුල් භාගයේ දී ඉහළ අතිරික්ත මට්ටමක අඛණ්ඩව පැවති දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව විශාල හිඟ මට්ටමක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. ඉතිහාසයේ මෙතෙක් පැවති අවම මට්ටම් දක්වා අඩු වූ වෙළඳපොළ පොලී අනුපාතික නැවත ක්‍රමයෙන් ඉහළ යෑම ආරම්භ විය. ප්‍රාථමික වෙළඳපොළ රජයේ සුරැකුම්පත් වෙන්දේසියෙහි ලංසු පිළිගැනීම සඳහා වූ උපරිම ඵලදා අනුපාතික ඉවත් කිරීමත් සමඟ රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඉහළ යෑමට ද ඉඩ සලසන ලදී. විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම, ආර්ථිකයේ සමස්ත ඉල්ලුම් පීඩන ගොඩනැගීම, ගෝලීය වශයෙන් වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම සහ දේශීය සැපයුම් අංශයේ බාධා හේතුවෙන් ඇති වූ සැලකිය යුතු උද්ධමන පීඩන සැලකිල්ලට ගෙන අධික ඉල්ලුම මත පදනම් වූ උද්ධමන පීඩන ඇති වීම පාලනය කිරීම හා අහිතකර උද්ධමන අපේක්ෂා වර්ධනය වීම වැළැක්වීම, විනිමය අනුපාතිකය ස්ථාවර කිරීමට අවශ්‍ය පෙළඹවීම සැපයීමට මෙන්ම වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහයේ පැවති විෂමතා නිවැරදි කිරීම සඳහා මහ බැංකුව 2022 අප්‍රේල් මස මුල් කාලයේ දී මෑත ඉතිහාසයේ එක් වරක දී වාර්තා වූ වැඩිම ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සිදු කරමින් පොලී අනුපාතික සැලකිය යුතු ලෙස පදනම් අංක 700කින් ඉහළ නැංවීය. ඒ අනුව, 2022 අප්‍රේල් මස 08 වැනි දින ව්‍යාපාර කටයුතු අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 13.50 සහ සියයට 14.50 දක්වා ඉහළ නංවන ලදී. තෝරාගත් දේශීය ණය උපකරණ මත පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා ද ඉවත් කරන ලදී.

ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට ලබා දුන් ශුද්ධ ණය සැලකිය යුතු ලෙස වැඩි වීම හේතුවෙන් 2021 වසර තුළ දී බැංකු පද්ධතිය විසින් ලබා දුන් දේශීය ණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පහළ යෑම පුළුල් මුදල් සැපයුමේ (M2b) වර්ධනය අඩු වීමට හේතු විය. රාජ්‍ය ආදායම අඩු වීම සහ විදේශීය මූල්‍යනය සඳහා ප්‍රවේශය සීමිත වීම හමුවේ රජයේ ඉහළ අරමුදල් අවශ්‍යතාව දේශීය බැංකු පද්ධතිය මගින් විශාල වශයෙන් සපුරා ගැනුණි. ඒ අනුව, බැංකු පද්ධතිය විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය 2021 වසරේ දී රුපියල් බිලියන 1,284.4කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ඉන් සියයට 95ක පමණ ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයන ලදී. රජය සතු වාණිජ ව්‍යාපාර විසින් බැංකු පද්ධතියෙන් ලබා ගත් ණය ද එම ආයතනවල දුර්වල මූල්‍ය තත්ත්වයන් පිළිබිඹු කරමින් 2021 වසරේ දී රුපියල් බිලියන 185.9කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. අරමුදල් පිරිවැය අඩු වීමේ

1.10 රූප සටහන
වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1

1.11 රූප සටහන
පුළුල් මුදල් වර්ධනය හා තුඩුදුන් සාධක



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සහායයෙන් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ද 2021 වසරේ දී රුපියල් බිලියන 810.5කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පහළ යෑම, විශේෂයෙන්ම රජය වෙනුවෙන් මහ බැංකුව විසින් විදේශීය මුදලින් නාමනය කළ ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම හේතුවෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් පහළ යෑමත් සමඟ M_{2b} පුළුල් මුදල් සැපයුමේ වර්ධනය 2021 වසර අවසාන කාලය වන විට මන්දගාමී වෙමින්, 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 23.4ක වර්ධනයට සාපේක්ෂව, 2021 වසර අවසානය වන විට සියයට 13.2ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය.

මූල්‍ය අංශයේ ප්‍රවණතා

ආර්ථිකය මුහුණ දෙන දැඩි අභියෝග මධ්‍යයේ වුවද, 2021 වසර තුළ ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිවල ස්ථායීතාව ආරක්ෂා විය. ශුද්ධ පොලී ආදායම සහ පොලී නොවන ආදායම් යන දෙඅංශයේම කැපී පෙනෙන ඉහළ යෑම් හේතුවෙන් 2021 වසර තුළ දී බැංකු අංශයේ ලාභදායීතාව පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර බැංකු අංශයේ මූල්‍ය මැදිහත්වීම සතුටුදායක විය. කෙසේ වෙතත්, විදේශ මුදල් ගලා ඒම් අවම වීම හේතුවෙන් බැංකු අංශය දැඩි විදේශ මුදල් ද්‍රවශීලතා හිඟයකට මුහුණ දුන්නේය. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් අංශය ද සිදු කෙරෙමින් පවතින මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන සැලැස්මේ පසුබිම තුළ ණය වර්ධනය සහ ලාභදායීත්වය සම්බන්ධයෙන් කැපී පෙනෙන සමස්ත වර්ධනයක් පෙන්නුම් කළේය. නව සාමාන්‍ය තත්ත්වයට අනුවර්තනය වීමට මහ බැංකුව මූල්‍ය ආයතනවලට අඛණ්ඩව සහාය වූ අතර වසංගතය නිසා බාධා වූ ආර්ථිකයට සහාය දැක්වීමේ අරමුණින් ඇතැම් නියාමන ලිහිල් කරන ලදී. රක්ෂණ අංශය ද වර්ධනයක් වාර්තා කළේය. විදේශ ණය ආපසු ගෙවීම සහ 2021 වසරේ අගෝස්තු මාසයේ සිට ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙනස් කිරීම හේතුවෙන් මුදල් වෙළඳපොළේ ද්‍රවශීලතාව හිඟ මට්ටම් කරා යොමු විය. යළි යථා තත්ත්වයට පත් වීම ප්‍රමාද වූ සංචාරක ඉපැයීම, අපනයන ආදායම් රුපියල් බවට පරිවර්තනය වීම මන්දගාමී වීම, ආනයන වියදම් ඉහළ යෑම මෙන්ම වසර තුළ දී ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් අවස්ථා කිහිපයක දී පහත දැමීම් හේතුවෙන් ඇති වූ අහිතකර වෙළඳපොළ තත්ත්වයන් නිසා දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතාව ඉතා පහළ මට්ටමක පැවතුණි. විදේශීය ආයෝජකයින්ගේ දායකත්වය නොසලකා හැරිය තරම් වුවද 2021 වසරේ දී කොළඹ කොටස් හුවමාරුවේ වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචනය කරනු ලබන කාල සීමාව තුළදී මහ බැංකුව විසින් රටේ ගෙවීම් සහ පියවීම් පද්ධතිය සුමටව ක්‍රියාත්මක කරන ලදී. මේ අතර, නියාමන සහ අධීක්ෂණ රාමුව සඳහා වඩා ශක්තිමත් නෛතික පදනමක් සැපයීමේ අරමුණින් මහ බැංකුව විසින් ප්‍රමුඛ නීති සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම අඛණ්ඩව සිදු කරන ලදී.

1.3 ගෝලීය ආර්ථික පරිසරය සහ ඉදිරි දැක්ම

කොවිඩ්-19 වසංගතයේ බලපෑමෙන් ගෝලීය ආර්ථිකය 2022 වසරේ දී යථා තත්ත්වයට පත්වීම ආරම්භ වීම සමඟ ඇති වූ ප්‍රගතිය, රුසියානු - යුක්‍රේන ගැටුමේ ප්‍රතිවිපාක නිසා දැඩි ලෙස බලපෑමට ලක් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2022 අප්‍රේල් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද ලෝක ආර්ථික ඉදිරි දැක්මට (World Economic Outlook) අනුව, 2020 වසරේ දී සියයට 3.1ක් වූ ආර්ථික සංකෝචනයට සාපේක්ෂව ගෝලීය ආර්ථිකය 2021 වසරේ දී සියයට 6.1කින් වර්ධනය වන බව ඇස්තමේන්තු කර ඇත. 2021 වසර තුළ දී, නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සියයට 6.8කින් සහ දියුණු ආර්ථිකයන් සියයට 5.2කින් වර්ධනය වී ඇති බවට ඇස්තමේන්තු කර ඇත. රුසියාව විසින් යුක්‍රේනය ආක්‍රමණය කිරීම සහ ඒ ආශ්‍රිතව රුසියාව වෙත පනවා ඇති සම්බාධක මගින් ගෝලීය ආර්ථිකය මත ඇතිවන බලපෑම් සැලකිල්ලට ගනිමින් 2022 වසරේ දී ගෝලීය ආර්ථික වර්ධනය සියයට 3.6ක් දක්වා මන්දගාමී වනු ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් පුරෝකථනය කර ඇත. යුද්ධයට අමතරව, චීනයේ නිරන්තරව හා මහා පරිමාණ වශයෙන් සිදු කරනු ලබන සමාජ

1.4 සංඛ්‍යා සටහන

ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම (අ)

ශීර්ෂය	2020 (ආ)	2021 (ඇ)	2022 (ප්‍රලෝකථන)	2023 (ප්‍රලෝකථන)
ලෝක නිෂ්පාදිතය	**-3.1**	**6.1**	**3.6**	**3.6**
සංවර්ධිත ආර්ථික	-4.5	5.2	3.3	2.4
ඇමරිකා එක්සත් ජනපදය	-3.4	5.7	3.7	2.3
යුරෝ කලාපය	-6.4	5.3	2.8	2.3
එක්සත් රාජධානිය	-9.3	7.4	3.7	1.2
ජපානය	-4.5	1.6	2.4	2.3
නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික	-2.0	6.8	3.8	4.4
නැගී එන සහ සංවර්ධනය වන ආසියාව	-0.8	7.3	5.4	5.6
චීනය	2.2	8.1	4.4	5.1
ඉන්දියාව	-6.6	8.9	8.2	6.9
ලෝක වෙළඳ පරිමාව (භාණ්ඩ හා සේවා)	**-7.9**	**10.1**	**5.0**	**4.4**
මිල හැසිරීම				
පාරිභෝගික මිල				
සංවර්ධිත ආර්ථික	0.7	3.1	5.7	2.5
නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථික	5.2	5.9	8.7	6.5
වෙළඳ භාණ්ඩ මිල (එ.ජ. ඩොලර්)				
ඉන්ධන	-32.7	67.3	54.7	-13.3
ඉන්ධන නොවන	6.8	26.8	11.4	-2.5

(අ) වෙනත් සඳහනක් නොමැති විට වාර්ෂික ප්‍රතිශත වෙනස
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: World Economic Outlook (2022 අප්‍රේල්), ජා.මූ. අරමුදල

සහ ආර්ථික කටයුතු සීමා කිරීම් හේතුවෙන් ගෝලීය සැපයුම් දාමයන්ට බාධා වීම, අඛණ්ඩ උද්ධමන පීඩනය හේතුවෙන් බොහෝ රටවල මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමට සිදු වීම, සහ වසංගතයේ බලපෑම් අවම කරගැනීමට මීට පෙර ලොව පුරා ලබා දී තිබූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහායයන් ඉවත් කර ගැනීම ද ගෝලීය ආර්ථික වර්ධන අපේක්ෂා කෙරෙහි අහිතකර ලෙස බලපානු ඇති බවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකථනය කරයි. ඒ අනුව, 2022 වසරේ දී දියුණු ආර්ථිකයන් සහ නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සඳහා, පිළිවෙළින්, සියයට 3.3ක සහ සියයට 3.8ක ආර්ථික වර්ධන අනුපාත පුරෝකථනය කර ඇත. තවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2023 වසර සඳහා වන ආර්ථික වර්ධන පුරෝකථනය, සියයට 3.6ක් දක්වා, 2022 වසරේ ජනවාරි මස ලෝක ආර්ථික ඉදිරි දැක්මෙහි සඳහන් අගයට වඩා ප්‍රතිශතාංක 0.2කින් අඩු අගයකට සංශෝධනය කර ඇත.

දැනට පවතින රුසියානු - යුක්‍රේන ගැටුම මගින් ජීවිත හානි සහ මානුෂීය පීඩාවන්ට අමතරව, මෙම රටවල් දෙකෙන් ඔබ්බට සැලකිය යුතු ආර්ථික අවදානම් ඇති කර ඇති අතර, එමගින් ලොව පුරා රටවල් අතර ආර්ථික ගැටලු නිර්මාණය කර ඇති බවට පොදු පිළිගැනීමක් ඇත. යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස බේදජනක ලෙස ජීවිත අහිමි වීම් සහ මානුෂීය පීඩා ඇති වන අතර, යුක්‍රේනයේ යටිතල පහසුකම් සඳහා සැලකිය යුතු හානියක් සිදු වන බැවින් එහි ප්‍රතිඵලයක් ලෙස 2022 වසරේ දී යුක්‍රේන ආර්ථිකය ප්‍රබල අවපාතයකට මුහුණ දීමට නියමිතය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව, යුක්‍රේන ආර්ථිකය 2022 වසරේ දී සියයට 35කින් සංකෝචනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශාල ආර්ථිකයන් විසින් රුසියාවෙන් තෙල් සහ ගෑස් ආනයනය තහනම් කිරීම, බටහිර රටවල් විසින් රුසියානු මහ බැංකුවේ වත්කම් අත්හිටුවීම සහ අන්තර්ජාතික පියවීම් බැංකුවේ සේවාවන් ලබා ගැනීම තහනම් කිරීම ඇතුළුව රුසියාව මත පනවා ඇති දැඩි වෙළඳ සහ මූල්‍ය සම්බාධක ගෝලීය ආර්ථිකය සහ මූල්‍ය වෙළඳපොළ මත සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලබන අතරතුර, රුසියානු ආර්ථිකය 2022 වසරේ දී සියයට 8.5කින් පමණ තියුණු ලෙස සංකෝචනය වීමට හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වෙළඳාමට සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා බාධක ඇති වීම මෙන්ම සරණාගතයන් විශාල වශයෙන් පැමිණීම හේතුවෙන් විශේෂයෙන්ම, මෙම රාජ්‍යයන් දෙකෙහි අසල්වැසි රටවල් බලපෑමට ලක් වී ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට අනුව යුද්ධයේ බලපෑම ලොව අනෙකුත් රටවල් සඳහා මූලික ප්‍රවාහ පහක් හරහා සම්ප්‍රේෂණය වනු ඇත. බලශක්ති, තිරිඟු, බඩ ඉරිඟු, ලෝහ සහ පොහොර සඳහා යෙදවුම් ආදී වූ වෙනත් භාණ්ඩ ඇතුළුව භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම ප්‍රථම සහ වඩාත්ම ප්‍රබල බලපෑමක් ඇති කළ හැකි ප්‍රවාහය වේ. සැපයුම් දාම අවහිරතා සහ කොවිඩ්-19 වසංගත තත්ත්වයෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් මේ වන විටත් ඉහළ මට්ටමක පවතින උද්ධමන පීඩනයන් මත මෙය තවදුරටත් බලපෑම් ඇති කරයි. ඒ අනුව, 2022 වසර සඳහා උද්ධමනය දියුණු ආර්ථිකයන්හි සියයට 5.7ක් සහ නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි සියයට 8.7ක් ලෙස ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. දෙවනුව, රුසියාව සහ යුක්‍රේනය සමඟ සෘජු හා සැලකිය යුතු වෙළඳාමක් සහ ප්‍රේෂණ සම්බන්ධතා ඇති රටවල් සඳහා අහිතකර බලපෑම් ඇති වනු ඇත. තවද, ආර්ථික අවහිරතා සහ රුසියාවෙන් අන්තර්ජාතික ගෙවීම් සේවා ඉවත් වීම හේතුවෙන් සංචාරකයන්ගේ පැමිණීම අඩු වීමත් සමඟ රුසියානු සහ යුක්‍රේන සංචාරක පැමිණීම් මත බොහෝ සෙයින් යැපෙන රටවල්වල සංචාරක ඉපැයීම් බලපෑමට ලක් වනු ඇත. තෙවනුව, රුසියාව සහ යුක්‍රේනය ගෝලීය අගය දාමයන් සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම සාමාන්‍ය භාණ්ඩ හා නිෂ්පාදන සම්බන්ධතාවලින්

1

ඔබ්බට විහිදෙන බැවින්, අමුද්‍රව්‍ය හිඟයන් නිසා පැන නගින සංරචක නිෂ්පාදන ක්‍රියාවලීන්ට බාධා වීම් රට රටවල් අතර නිෂ්පාදන ජාල හරහා ලොව පුරා පැතිරී යා හැකිය. සිව්වන ප්‍රවාහය වන්නේ දැනටමත් භාණ්ඩ මිල ගණන්වල පීඩනයන් සහ සම්බාධක සමඟ බලපෑමට ලක් වී ඇති ව්‍යාපාරික විශ්වාසය සහ මූල්‍ය තත්ත්වයයි. ඉහළ ගෝලීය ආහාර හා බලශක්ති මිල ගණන්, දැඩි ගෝලීය මූල්‍ය තත්ත්වයන් සහ සංචාරක ඉපැයීම් පහළ යෑම හේතුවෙන් ආසියානු කලාපයේ ඇතැම් තෙල් ආනයනය කරන ආර්ථිකයන්හි වර්ධනය අඩාල කරන අතර, තෙල් අපනයනකරුවන් ඉහළ පොසිල ඉන්ධන මිල ගණන්වලින් වාසි ලබනු ඇත. අනෙක් අතට, පොහොර සහ ධාන්‍ය සඳහා රුසියාව සහ යුක්‍රේනය මත යැපුණු ඇතැම් දකුණු සහ අග්නිදිග ආසියානු රටවල්හි කෘෂිකාර්මික කර්මාන්ත මත සෘණාත්මක බලපෑමක් ඇති වනු ඇත. මූල්‍ය වෙළඳපොළ අවදානම් මගහරවා ගැනීම සමඟ ආසියානු කලාපයෙන් ප්‍රාග්ධන ඉවත්ව යෑම් හට ගනු ඇත. 2022 වසරේ දී සියයට 4.4ක පුරෝකථනය කළ ආර්ථික වර්ධනයක් සහිතව, චීන ආර්ථිකයේ වර්ධනයන් ආසියාවේ ඉදිරි දැක්මෙහි ප්‍රමුඛස්ථානයක් ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. සමස්තයක් වශයෙන්, ගෝලීය බලශක්ති සහ වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් දේශීය උද්ධමනය ඉහළ යෑම සහ වෙළඳ හිඟයන් පුළුල් වීම, ගෝලීය ඉල්ලුම දුර්වල වීම, ප්‍රාග්ධන ප්‍රවාහ උච්චාවචනය වීම, විදේශ විනිමය අනුපාතයේ අස්ථාවරතා, ණය ලබා ගැනීම් පිරිවැය ඉහළ යෑම සහ දියුණු ආර්ථිකයන්හි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග දැඩි කිරීම හේතුවෙන් ගෝලීය මූල්‍ය තත්ත්වයන් දැඩි වීම, ආර්ථික අවපාත, බුන්වත්භාවය සහ ඇතැම් අවස්ථාවන්හි දී සංවර්ධන කටයුතු අඩාල කරමින් සංවර්ධනය වෙමින් පවතින රටවල් තවත් අවදානම් තත්ත්වයන්ට ඇද දමනු ලබයි.

කොවිඩ්-19 සීමා කිරීම් ලිහිල් කිරීමත් සමඟ ගෝලීය ඉල්ලුම නැවත යථා තත්ත්වයට පත් වීමේ පසුබිම මත බලශක්ති සහ ආහාර ද්‍රව්‍යයන්ගේ මිල 2021 වසර පුරා ඉහළ යන ප්‍රවණතාවක පසු වූ අතර, යුරෝපයේ පවතින භූ දේශපාලනික පීඩන සමඟ තවදුරටත් ඉහළ මට්ටමක රැඳෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2020 වසරේ කොවිඩ්-19 ව්‍යාප්තිය සමඟ බොරතෙල් මිල තියුණු ලෙස පහත වැටුණ ද, 2020 වසරේ අප්‍රේල් මාසයේ සිට මිල ක්‍රමයෙන් ඉහළ ගිය අතර, 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී වසර හතකට පසු වාර්තා වූ ඉහළම අගය කරා ළඟා වීමට පෙර, 2021 වසරේ මාර්තු මස වන විට පූර්ව වසංගත මට්ටම වෙත ළඟා වී තිබුණි. රුසියාව සහ යුක්‍රේනය අතර මෑත කාලීනව මතු වූ භූ දේශපාලනික පීඩනයන් මත රුසියාවෙන් බොරතෙල් මිලදී ගැනීමට ගැනුම්කරුවන් පසුබට වීම හේතුවෙන් ගෝලීය බොරතෙල් සැපයුම් තවදුරටත් බලපෑමට ලක් වීමේ අවදානම් තත්ත්වය බොරතෙල් බැරලයක මිල එ.ජ. ඩොලර් 100කට වඩා ඉහළ මට්ටමක පැවතීමට හේතු විය. චීනයේ දකින්නට ලැබුණු ආකාරයේ කොවිඩ්-19 ව්‍යාප්තිය සහ අදාළ සංචරණ සීමා සහ රටවල්වල උපායමාර්ගික සංචිතවලින් අමතර බොරතෙල් සැපයුම් නිකුත් කිරීමේ අපේක්ෂාවක් පැවතීම හේතුවෙන් මිල සඳහා වන පීඩනය අඩු විය හැකි වුවද, බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය 2022 වසර සඳහා එ.ජ. ඩොලර් 106.83ක් ලෙස පවතිනු ඇති බවට 2022 අප්‍රේල් ලෝක ආර්ථික ඉදිරි දැක්ම මගින් පුරෝකථනය කර ඇති අතර, එමගින් වසර පුරා බොරතෙල් මිල ඉහළ අගයක පැවතීමට ඇති ඉහළ සම්භාවිතාව පෙන්නුම් කෙරේ. ආහාර මිල සම්බන්ධයෙන් ගත් කළ, 2021 වසර තුළ දී ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ (Food and Agriculture Organisation) ආහාර මිල දර්ශකය, 2020 වසරේ නිරීක්ෂණය කළ මිලට වඩා සියයට 28.1ක සමස්ත වර්ධනයක් පෙන්නුම් කළේය. ඉහළ යෙදවුම් පිරිවැය, අහිතකර දේශගුණික තත්ත්වයන් සහ කොවිඩ්-19 හා සම්බන්ධ අවිනිශ්චිතතා මත නිෂ්පාදනය ඉහළ නැංවීමට පසුබට වීම මධ්‍යයේ ගෝලීය ආහාර මිල ඉහළ යෑමේ ප්‍රවණතාවයක් පැවතුණි. මෙම ගැටලුකාරී තත්ත්වයන් දිගින් දිගටම පැවතුණ අතර, ප්‍රමුඛ කෘෂිකාර්මික අපනයනකරුවන් ද්විත්වයක් වන රුසියාව සහ යුක්‍රේනය අතර පවතින භූ දේශපාලනික පීඩන මෙම ගැටලු තවදුරටත් උග්‍ර වනු ඇත. 2022 වසරේ පළමු මාස තුන තුළ මෙම දර්ශකය අඛණ්ඩව ඉහළ යෑමට ඉහත සඳහන් ගැටලු හේතු විය.

ලොව පුරා බොහෝ මහ බැංකු 2020 වසර තුළ සහ 2021 වසරේ මුල් කාලයේ දී සැලකිය යුතු ලෙස මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කළ අතර බොහෝ ආර්ථිකයන්හි ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉතිහාසයේ මෙතෙක් පැවති අවම මට්ටම් දක්වා අඩු විය. මුදල් ප්‍රතිපත්ති ඇතුළු විවිධ ප්‍රතිපත්තිමය සහායයන් සහ සාර්ථක එන්නත්කරණ වැඩසටහන්වල දායකත්වය මගින් ලෝක ආර්ථිකය 2021 වසර තුළ යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කිරීම ඇරඹිණි. විශේෂයෙන්ම, බොහෝ රටවල ඉල්ලුම් තත්ත්ව සැපයුම් තත්ත්වයන්ට වඩා වේගයෙන් සාමාන්‍යකරණය වීම ආරම්භ වූ අතර එමගින් විවිධ අංශ හරහා මිල පීඩන ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස, රටවල් කිහිපයක්, විශේෂයෙන්ම සංවර්ධිත ආර්ථිකයන් මේ දක්වා ගෙන ඇති විශාල මුදල් ප්‍රතිපත්ති ලිහිල්

කිරීමේ ක්‍රියාමාර්ග නවතා දැමීමටත් උද්ධමන පීඩන සහ අහිතකර උද්ධමන අපේක්ෂා වර්ධනය වීම හමුවේ මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමත් ආරම්භ කෙරිණි. තවද, මෑතකාලීන රුසියානු-යුක්‍රේන යුද්ධය හේතුවෙන් ඇති වූ ගෝලීය දේශපාලන අවිනිශ්චිතතා සහ සැපයුම් අංශයේ බාධා හමුවේ බොහෝ ආර්ථිකයන්හි මිල මට්ටම් මත අමතර පීඩන ඇති කළ අතර මෑත කාලීනව පුරෝකථනය කළ සහ අත්විඳින ලද මට්ටම්වලට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගිය උද්ධමන අනුපාතික සඳහා පිළියම් යෙදීමට ප්‍රතිපත්තිමය පියවර ගැනීමට බොහෝ රජයන්ට සිදු විය. පසුගිය වසර දෙක තුළදී ඉලක්කගත ෆෙඩරල් අරමුදල් අනුපාතික සියයට 0.00 සහ සියයට 0.25 පරාසයේ පවත්වා ගනු ලැබූ එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව, ඉහළ යන උද්ධමන පීඩන සැලකිල්ලට ගනිමින්, විශේෂයෙන්ම 2022 වසර මුල් කාලයේ දී එක්සත් ජනපදයේ උද්ධමනය වසර 40කට පසු වාර්තා වූ වැඩිම අගයක් දක්වා ඉහළ යෑම මධ්‍යයේ, ඉලක්කගත ෆෙඩරල් අරමුදල් අනුපාතික පරාසය 2022 මාර්තු මාසයේ දී පදනම් අංක 25කින් ඉහළ නංවන ලදී. මෙම ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීමට අමතරව තවදුරටත් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම මගින් මුදල් ප්‍රතිපත්ති දැඩි කරන බවට ද නුදුරු කාලීනව ශේෂ පත්‍රයේ සංකෝචනය කිරීම් සිදු කරන බවට ද ෆෙඩරල් සංචිත බැංකුව විසින් දක්වන ලදී. වසංගතයෙන් පීඩාවට පත් ආර්ථිකයට සහාය වීම සඳහා 2020 වසරේ ආරම්භයේ සිට ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් ක්‍රියාත්මක කළ එංගලන්ත මහ බැංකුව, 2021 වසර අවසාන කාලයේ සිට මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීම ආරම්භ කළේය. 2022 මාර්තු මස අවසානය වන විට එංගලන්ත මහ බැංකුව වසංගත කාලසීමාව තුළ පැවති බැංකු අනුපාතිකයට සාපේක්ෂව සිය බැංකු අනුපාතිකය පියවර තුනකින් පදනම් අංක 65කින් ඉහළ නංවා ඇත. යුරෝපීය මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය අනුපාතිකය ඒ වන විටත් ශූන්‍ය මට්ටමේ පැවතුණු බැවින්, වසංගත කාලය තුළ යුරෝපානු කලාපයේ සිදු කරන ලද ප්‍රතිපත්ති ලිහිල්කරණයන් මූලික වශයෙන් වත්කම් මිලදී ගැනීමේ වැඩසටහන් හරහා සිදු කරන ලදී. කෙසේ වෙතත්, ශුද්ධ වත්කම් මිලදී ගැනීම් ක්‍රමයෙන් අඩු කිරීමට අපේක්ෂිත අතර, ශුද්ධ වත්කම් මිලදී ගැනීම් අවසන් වූ පසු ප්‍රතිපත්ති අනුපාතිකවල යම් වෙනස්කම් කිරීමට අපේක්ෂා කෙරේ. පොලී අනුපාතික පිළිබඳ ඉදිරි මාර්ගෝපදේශ සැපයීම ද යුරෝපීය මහ බැංකුව තහවුරු කර ඇත. මේ අතර, චීනය ඇතුළු ආසියානු ආර්ථිකයන් කිහිපයක් ආර්ථික වර්ධනයට තවදුරටත් සහාය වීම සඳහා ලිහිල් ප්‍රතිපත්ති අනුගමනය කළේය. උද්ධමනය සාමාන්‍ය මට්ටමක පැවතීම මධ්‍යයේ සහ දේපළ අංශයේ ගැටලු සහ ඇතැම් ප්‍රදේශවල කොවිඩ්-19 වසංගතය නැවත පැතිරීම හේතුවෙන් ඇති වූ අහිතකර ආර්ථික වර්ධන ප්‍රවණතා මධ්‍යයේ චීන මහජන බැංකුව 2022 වසරේ මුල් කාලය වන විටත් මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම අඛණ්ඩව සිදු කළේය. ඉන්දියානු සංචිත බැංකුව ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වා ගෙන ගිය අතර, ඉදිරි කාලපරිච්ඡේදයේ දී උද්ධමනය ඉලක්කගත පරාසය තුළ රඳවා ගැනීම සඳහා මූල්‍ය උත්තේජක ඉවත් කර ගැනීමට අවධානය යොමු කර ඇත. 2020 වසරේ මැද වන විට පියවර කිහිපයක දී එක් දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සියයට 1.75ක් දක්වා පහත දැමූ මැලේසියානු මහ බැංකුව, 2021 වසරේ සිට 2022 වසරේ මුල් කාලය දක්වා ප්‍රතිපත්ති අනුපාතිකය නොවෙනස්ව පවත්වා ගනිමින් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගෙන ගියේය. ඉල්ලුම මත පදනම් වූ උද්ධමන පීඩන අඩු මට්ටමක පැවතීමත් බලශක්ති සහ ආහාර මිල ගණන් ස්ථාවර වීමත් සමග මැදි කාලීන උද්ධමන අපේක්ෂා ඉලක්කගත මට්ටම් කරා නැවත පැමිණෙනු ඇතැයි අපේක්ෂා කිරීමත් හේතුවෙන් තායිලන්ත මහ බැංකුව ලිහිල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගනිමින් ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමට සහාය වීම පිළිබඳ අවධාරණය අඛණ්ඩව පවත්වාගෙන ගියේය. ඒ හා සමානව, පිලිපීන මහ බැංකුව ද 2021 වසර තුළ ලිහිල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර, වර්ධනයට සහාය වීම සඳහා 2022 වසරේ මාර්තු මස මැද වන විටත් එම ප්‍රතිපත්ති ස්ථාවරයෙන් බැහැර නොවූ නමුත් උද්ධමන අපේක්ෂා අස්ථාවර වීමට හේතු වන උද්ධමන පීඩන සඳහා පිළියම් යෙදීමට ඔවුන්ගේ සූදානම අවධාරණය කළේය. ඉන්දුනීසියාවේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ද ඉහත සඳහන් කළ අනෙකුත් අග්නිදිග ආසියානු ආර්ථිකයන්හි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට සමාන වූ අතර ඉන්දුනීසියානු මහ බැංකුව විසින් 2021 වසරේ මුල් කාලයේ සිට සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික ස්ථාවරව පවත්වා ගෙන ගියේය. ඒ සමඟම, ඉන්දුනීසියානු මහ බැංකුව විසින් ක්‍රමයෙන් සංචිත අවශ්‍යතා ඉහළ නැංවීම හරහා ද්‍රවශීල තත්ත්ව අඩු කිරීම ද අඛණ්ඩව සිදු කරන ලදී. 2020 වසර තුළ දී කොවිඩ්-19 වසංගතයට ප්‍රතිචාර වශයෙන් ලොව පුරා බොහෝ මහ බැංකු බෙහෙවින් සමාන වූ ලිහිල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගනු ලැබූ නමුත් උද්ධමන පීඩනවල වෙනස්වීම් සහ එම පීඩන සඳහා හේතු වූ සාධක මෙන්ම ආර්ථික වර්ධන ඉදිරි දැක්ම පිළිබඳ ගැටලු හේතුවෙන් ලිහිල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලින් බැහැර වීම රටවල් අතර එකිනෙකට වෙනස් බව පෙනී යයි. ඇතැම් ආර්ථිකයන් අනෙකුත්

1

ආර්ථිකයන්ට වඩා හොඳින්, විශේෂයෙන් සැපයුම් අංශයේ ගැළපීම් සමඟ උද්ධමන පීඩන කළමනාකරණය කර ඇති බව පෙනී යන අතර බොහෝ රටවල් මිල ස්ථායීතාව සහ වසංගතයෙන් පසු ආර්ථික වර්ධනය යථා තත්ත්වයට පත් කිරීම අතර තුලනයකින් යුතුව පවත්වා ගෙන යෑමට උත්සාහ දරමින් සිටියි. කෙසේ වෙතත්, 2022 මාර්තු වන විට, රුසියානු-යුක්රේන යුද්ධය සම්බන්ධ ප්‍රවණතා හේතුවෙන් ගෝලීය ආර්ථික දැක්ම සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතා ඇති වී තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ 2022 අප්‍රේල් ලෝක ආර්ථික ඉදිරි දැක්ම මගින් මෙම යුද්ධයේ බලපෑම් සම්ප්‍රේෂණය වීම ආර්ථිකයන් හරහා විවිධ විය හැකි බැවින් රටවල් අතර සුදුසු මුදල් ප්‍රතිපත්ති ප්‍රතිචාර සැලකිය යුතු ලෙස වෙනස් විය හැකි බවත් ඉදිරි කාලය තුළදී ප්‍රතිපත්ති විශ්වසනීයත්වය පවත්වා ගැනීම සඳහා පැහැදිලි සන්නිවේදනය සහ දත්ත පදනම් වූ ඉදිරි මග පෙන්වීමක වැදගත්කම සඳහන් කරයි.

1.4 සාර්ව ආර්ථික දැක්ම

ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙළක් තුළින් ආර්ථිකය නැවත වෙනස්වීමත් සමඟ නුදුරු කාලීනව ශ්‍රී ලංකාවේ ආර්ථිකය මධ්‍යස්ථව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, දිගු කලක් ප්‍රමාද වී ඇති ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ද සමඟින් ජා.මූ. අරමුදල විසින් සහය දීමට නියමිත ආර්ථික ගැලපුම් වැඩසටහනක් තුළින් මැදිකාලීනව ආර්ථිකය නඟා සිටුවීමට පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදේශීය හා රාජ්‍ය මූල්‍ය යන අංශ දෙකෙහිම උග්‍ර අවදානම්, සමාජ නොසන්සුන්තාවය සහ දේශපාලන අස්ථාවරත්වය ඉහළ යෑම, වසංගතයේ බලපෑම්, දේශීය බලශක්ති අර්බුදය සහ ගෝලීය වශයෙන් සහ දේශීය වශයෙන් ඉහළ ගිය භාණ්ඩ මිල ගණන් හේතුවෙන් ඇති වූ සාර්ව ආර්ථික අස්ථාවරත්වය, 2022 වසරේ අපේක්ෂිත වර්ධනය සැලකිය යුතු ලෙස පහළ දමනු ඇතැයි අපේක්ෂා කරන අතර, නුදුරු අනාගතය මත ද බලපෑම් ඇති කරමින් වර්ධනය මන්දගාමී කරනු ඇත. එසේම, රජය විසින් අන්තර් කාලීනව විදේශ ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවන බවට නිවේදනය කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනක් සඳහා යොමු වීම මධ්‍යයේ ආර්ථික කටයුතු තවදුරටත් මන්දගාමී වීමට ඉඩ ඇත. කෙසේ වෙතත්, දේශීය ආර්ථිකය ස්ථාවර කිරීම අරමුණු කරගත් විචක්ෂණශීලී සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සමඟින් ජා.මූ. අරමුදලේ මැදිහත්වීම සහ මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අතර මනා සම්බන්ධීකරණය ඇති වීම මෙන්ම සිදු කිරීමට අපේක්ෂිත රජය සතු වාණිජ ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීම තුළින් මැදි කාලීනව වර්ධන වේගය යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මුදල් ප්‍රතිපත්තිය සැලකිය යුතු ලෙස දැඩි කිරීම මගින් අධික උද්ධමන පීඩන මැඩපැවැත්වීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් ආයෝජන සඳහා හිතකර පරිසරයක් ස්ථාපිත කිරීමේ දී වැදගත් වන උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, පොලී අනුපාතවල කැපී පෙනෙන වැඩිවීම, ණය දීම අධෛර්යමත් කරන අතර, ඒ හේතුවෙන් ආර්ථික වර්ධනය අඩාල කරනු ඇත. එහෙත් පොලී අනුපාත විෂමතා සහ විනිමය අනුපාතිකයේ පීඩනය යම් දුරකට අඩු කිරීම මැදි කාලීනව සහ දිගු කාලීනව ඵලදායී ආයෝජන ආකර්ෂණය කර ගැනීමට හේතු වනු ඇත. දැඩි කරන ලද මුදල් ප්‍රතිපත්තිය, විදේශ විනිමය ගලා ඒම සඳහා පහසුකම් සලසමින් දේශීය මුදලේ බාහිර අගය ස්ථාවර කිරීමට හිතකර ලෙස බලපානු ඇත. දැඩි මූල්‍ය ප්‍රතිපත්තියේ පසුකාලීන බලපෑම් හේතුවෙන් 2023 වසරේ දී පුද්ගලික අංශයට ලබා දෙන ණය ප්‍රසාරණය මෙන්ම පුළුල් මුදල් සැපයුම තරමක් පහළ යනු ඇතැයි අපේක්ෂා කළ ද, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න ක්‍රියාත්මක වන විට රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ප්‍රසාරණය පහළ යෑම මධ්‍යයේ වුවද 2024 වසරේ සිට මැදි කාලීනව පුළුල් මුදල් සහ පෞද්ගලික අංශයට ලබා දෙන ණය වර්ධනය සාමාන්‍යකරණයට පත්වීම අපේක්ෂා කෙරේ. අපේක්ෂා කරන පරිදි ගෝලීය ඉල්ලුම යථා තත්ත්වයට පත් වීම, හිතකර විනිමය අනුපාත සහ වෙළඳාම් කළ හැකි අංශය වැඩිදියුණු කිරීමේ ප්‍රතිපත්ති සමඟින් අපනයන ඉපැයීම් ඉදිරි කාලය තුළ ශක්තිමත් වීමට පෙර, 2022 වසර තුළ මධ්‍යස්ථව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. දැඩි මුදල් ප්‍රතිපත්තිය සහ 2022 වසරේ දී සහ ඉදිරි කාලය තුළ ආනයන සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ දුෂ්කරතා හේතුවෙන් ආනයන සඳහා ඇති ඉල්ලුම අඩුවනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඉන්ධන ඇතුළු ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ඉහළ යෑම හේතුවෙන්, සාපේක්ෂව ආනයන ඉහළ මට්ටමක පැවතීමට ඉඩ ඇත. අපනයන ඉපැයීම්වල අපේක්ෂිත වර්ධනය, මැදි කාලීනව වෙළඳ හිඟය පහළ යෑමට හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, වර්තමානයේ දක්නට ලැබෙන සමාජ ආර්ථික නොසන්සුන්තාවය අවසන් වූ පසු, ලෝක ආර්ථිකය මෙන්ම ලොව පුරා මිනිසුන් සංචරණය වීම ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීමත් සමඟ ඉදිරි කාලය තුළ ශ්‍රී ලංකාවට සංචාරක කර්මාන්තයෙන් ප්‍රතිලාභ ලැබෙනු ඇත. මෙමගින්, ප්‍රවාහන සේවාවල අපේක්ෂිත ක්‍රියාකාරකම්

1.5 සංඛ්‍යා සටහන

කෙටි කාලීන සාර්ව ආර්ථික රාමුව (අ)

දර්ශකය	ඒකකය	2020 (ආ)	2021 (ඇ)	2022 (ප්‍රක්ෂේපණ)
මූර්ත අංශය (ඈ)				
මූර්ත ද.දේ.නි. වර්ධනය	සියයට	-3.6 (ඇ)	3.7	1.0
පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	රුපියල් ට්‍රිලියන	15.0 (ඇ)	16.8	20.7
ඒක පුද්ගල ද.දේ.නි.	එ.ජ. ඩොලර්	3,695 (ඇ)(ඉ)	3,815	3,041
මුළු ආයෝජන	ද.දේ.නි.යේ % වශයෙන්	25.1 (ඇ)(ඊ)	27.7	28.0
දේශීය ඉතුරුම්	ද.දේ.නි.යේ % වශයෙන්	18.7 (ඇ)(ඊ)	20.1	19.5
ජාතික ඉතුරුම්	ද.දේ.නි.යේ % වශයෙන්	23.6 (ඇ)(ඊ)	23.8	25.4
විදේශීය අංශය				
වෙළඳ ශේෂය (ඈ)	ද.දේ.නි.යේ % වශයෙන්	-7.4	-9.6	-12.4
අපනයන	එ.ජ. ඩොලර් බිලියන	10.0	12.5	13.0
ආනයන	එ.ජ. ඩොලර් බිලියන	16.1	20.6	21.4
ජංගම ගිණුමේ ශේෂය (ඈ)	ද.දේ.නි.යේ % වශයෙන්	-1.5	-4.0	-2.6
විදේශීය නිල සංචිත	ආනයනික මාස වශයෙන්	4.2	1.8	1.5
රාජ්‍ය මූල්‍ය අංශය (ඈ) (උ) (උඅ)				
සමස්ත අයවැය හිඟය	ද.දේ.නි.යේ % වශයෙන්	-11.1 (එ)	-12.2	-10.2
මධ්‍යම රජයේ ණය	ද.දේ.නි.යේ % වශයෙන්	100.6	104.6	108.2
මුදල් අංශය සහ උද්ධමනය				
පුළුල් මුදල් වර්ධනය (M_{2b}) (ඒ)	සියයට	23.4	13.2	12.7
පෞද්ගලික අංශයට ලබාදුන් ණය වර්ධනය (M_{2b} හි) (ඒ)	සියයට	6.5	13.1	10.0
වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (ඔ)	සියයට	4.6	6.0	22.0

(අ) 2022 අප්‍රේල් මැද භාගය වන විට පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ඉ) නවතම ජනගහන සංඛ්‍යා දත්ත අනුව ඇස්තමේන්තු යාවත්කාලීන කර ඇත.
(ඊ) 2020 වසර සඳහා ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින්, 25.2%, 18.9% සහ 23.9%ක් වූ මුළු ආයෝජන, දේශීය ඉතුරුම් සහ ජාතික ඉතුරුම් පිළිබඳ දත්ත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංශෝධනය කරන ලදී.
(උ) රාජ්‍ය මූල්‍ය අංශයට අදාළ ප්‍රක්ෂේපණ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රක්ෂේපන දත්ත මත පදනම් වේ.
(උඅ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 මාර්තු 29 දින නිකුත් කරන ලද 2020 සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(එ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත්කළ පරිදි, 2020 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධනය කර ඇත.
(ඒ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය
(ඔ) කො.පා.මී. දර්ශකය (2013 = 100) මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

නැවත වර්ධනය වීම සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන උප සේවා අංශයේ ඉහළ වර්ධනයක් සමඟ මැදි කාලීනව සේවා ගිණුමේ අතිරික්තය ශක්තිමත් වීම අපේක්ෂා කෙරේ. අන්තර් කාලීනව විදේශ ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීම සහ අපේක්ෂිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනේ ආරම්භය හේතුවෙන් අපේක්ෂිත විදේශ ණය මත පොලී ඉතිරි කිරීම් නිසා ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ඉදිරි කාලය තුළ මධ්‍යස්ථ වනු ඇතැයි බලාපොරොත්තු වේ. තවද, ගෝලීය ගමනාගමනය වැඩිදියුණු වීමත් සමඟ විදේශ රැකියා සඳහා පිටත්වීම් ක්‍රමයෙන් ඉහළ යාමත් සංක්‍රමණික ශ්‍රමිකයින් සඳහා ඇති ඉල්ලුම වැඩිවීම සහ නිල මාර්ග හරහා අපේක්ෂිත විදේශ ප්‍රේෂණ ගලා ඒම යථා තත්ත්වයට පත් වීමත් සමඟ මැදි කාලීනව විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ක්‍රමිකව වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විදේශ ජංගම ගිණුමේ හිඟය, ක්‍රමයෙන් තිරසාර මට්ටමකට අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, කොළඹ වරාය නගර ව්‍යාපෘතියට සහ හම්බන්තොට කාර්මික කලාපය වැනි කාර්මික කලාප සංවර්ධනය කිරීම සඳහා අපේක්ෂිත ණය නොවන ගලා ඒම් සමඟ මැදි කාලීනව මූල්‍ය ප්‍රවාහ ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනෙන් සහ ජා. මූ. අරමුදල විසින් අනුග්‍රහය දක්වන ආර්ථික ගැලපුම් වැඩසටහනෙන් බලාපොරොත්තු වන පරිදි ආයෝජක විශ්වාසය ඉහළ නැංවීම මූල්‍ය ගිණුමට ගලා ඒම් සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, සුදුසු බදු ව්‍යුහයක් සහ ආදායම් ඒකරාශී කිරීම වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග සමඟ මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා

1

රජයේ කැපවීම මෙන්ම ණය නොවන විදේශ ගලා ඒම් ඉහළ නැංවීමේ ප්‍රයත්න ද ආර්ථිකයේ වර්ධනය සඳහා අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, ආර්ථික ස්ථාවරත්වය ඉලක්ක කරගත් දූරදර්ශී සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවල සහාය ඇතිව, දිගුකාලීන ව්‍යුහාත්මක ගැටලුවලට විසඳුම් ලබා දෙමින් ආර්ථිකයේ නිෂ්පාදන විභවය පුළුල් කිරීම තුළින් 2023 වසරේ සිට ශ්‍රී ලංකා ආර්ථිකය ක්‍රමානුකූලව වර්ධනය වී මැදි කාලීනව එහි විභව මට්ටම කරා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මැදි කාලීන සාර්ව ආර්ථික රාමුවේ ප්‍රක්ෂේපණ සිදුකිරීම සඳහා ජා.මූ අරමුදලේ වැඩසටහනක් සඳහා සාකච්ඡා ආරම්භ කිරීම, ඉදිරියේ දී සිදු කිරීමට නියමිත විදේශ ණය වගකීම් ප්‍රතිව්‍යුහගත කිරීම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ශක්තිමත් කිරීම සඳහා දරන ප්‍රයත්න සහ විවිධ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම ඇතුළුව මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද ප්‍රතිපත්ති වෙනස්කම්වල (2022 වසරේ අප්‍රේල් මුලදී) බලපෑම පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු අවශ්‍ය වේ. මෙම ප්‍රතිපත්ති නිවේදන බොහොමයක් දැනට ආරම්භක අදියරේ පවතින බැවින්, මෙම වාර්තාවෙහි සාමාන්‍යයෙන් ප්‍රකාශනය කරනු ලබන මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව නොමැති අතර, ඒ වෙනුවට, 2022 වසර සඳහා පමණක් ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් සඳහා වන පුරෝකථන දක්වනු ලැබේ. යාවත්කාලීන තොරතුරු මත පදනම්ව ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් පිළිබඳ විධිමත් ප්‍රක්ෂේපණ සිදු කිරීමට හැකි වූ පසු, මැදි කාලීන සාර්ව ආර්ථික රාමුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රකාශනවලින් ලබා ගත හැකි වනු ඇත.

1.5 ගැටලු සහ ප්‍රතිපත්ති

දශක කිහිපයක් මුළුල්ලේ ශ්‍රී ලංකා ආර්ථිකය, මෙතෙක් සිදුව ඇති සමාජ සහ ආර්ථික පරිණාමයන්, විශේෂයෙන් ම සාමාන්‍ය මට්ටමේ ආර්ථික වර්ධනය සහ සංවර්ධන දර්ශක මෙන්ම, සමාජ යටිතල පහසුකම් සම්බන්ධයෙන් වන අඛණ්ඩ ආයෝජන මගින් පිළිබිඹු වන පරිදි සම තත්ත්වයේ රටවල් අභිබවා ගිය අතර, අඛණ්ඩව පවතින ව්‍යුහාත්මක ගැටලු මගින් රටේ ආර්ථික අපේක්ෂා යටපත් කර ඇතත්, තිරසාර සාර්ව ආර්ථික ස්ථායීතාව සහ ආර්ථිකයේ සෑම අංශයකටම ප්‍රතිලාභ ලැබෙන වර්ධනයක් සහතික කිරීම සඳහා එම ගැටලුවලට කඩිනමින් පිළියම් යෙදිය යුතුය. නිදහස ලැබුණු සමයේ දී, ශ්‍රී ලංකාව ශීඝ්‍ර ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සඳහා මැනවින් සූදානම්ව සිටි අතර, එය ආසියාවේ වඩාත් කැපී පෙනෙන දේශයන් අතරින් එකක් විය. මෙරටට ආවේණික වූ උපායමාර්ගික භූගෝලීය පිහිටීම, ප්‍රධාන මුහුදු මාර්ගයේ ප්‍රමුඛ සමුද්‍ර හා වාණිජ කේන්ද්‍රස්ථානයක් ලෙස පවතින අනන්‍යතාව, නිදහස[1] දක්වා ක්‍රමයෙන් විකාශනය වීමේ දී උසස් ආදර්ශයක් වීම සහ නොබැඳි රාජ්‍ය තාන්ත්‍රිකත්වය, මනාව ස්ථාපිත ප්‍රජාතන්ත්‍රවාදය, ඉහළ මට්ටමේ සාක්ෂරතාවට හේතුවන නිදහස් අධ්‍යාපනය සහ ඉහළ ගිය ආයු අපේක්ෂාවට හේතු වන නොමිලේ ලබා දෙන සෞඛ්‍යය වැනි මානව ප්‍රාග්ධන සහ සමාජ යටිතල පහසුකම් සඳහා අඛණ්ඩ ආයෝජනය, භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රාග්ධන ආයෝජනය ඇතුළු වෙනත් සාධන කරුණු කිහිපයක් මෙන්ම, නැගී එන වෙනත් ආර්ථිකයන්ට පෙර ක්‍රියාත්මක කරන ලද වෙළඳපොළ දිශානතිය සහ වෙළඳ විවෘතභාවය කෙරෙහි පවතින ප්‍රගතිශීලී ආර්ථික ප්‍රතිපත්ති මගින් ආසියාවේ සමෘද්ධිමත් දේශයක් බවට පත් වීමට ආර්ථිකය සුමට පරිවර්තනයක් සඳහා හිතකර වාතාවරණයක් සැපයිණි. එවැනි ජයග්‍රාහී පසුබිමක් තිබියදීත්, රටේ දිගුකාලීන ආර්ථික ප්‍රගතිය එහි විභවතාවට වඩා සැලකිය යුතු ලෙස පහළ මට්ටමක පවතින අතර, එමගින් ආර්ථික සමෘද්ධිය කරා යන ගමන ප්‍රමාද වී ඇත. ශ්‍රී ලංකා ආර්ථිකයට, නව සහස්‍රයේ දී පමණක් අඩු ආදායම් කාණ්ඩයේ සිට පහළ මැදි ආදායම් කාණ්ඩයේ රටක් ලෙස උසස් වීමට හැකි වුවද එම ප්‍රගතිය පුරවැසියන්ගේ යහපත උදෙසා ඉහළ ආදායම් මට්ටමක් වෙත ළඟා වීමට තරම් තිරසාර තත්ත්වයක නොපැවතුණි. ඒ අනුව, ඉහළ ආදායම් රටක් බවට පත්වීමේ ආර්ථික ප්‍රගතිය අභියෝග රාශියකින් යටපත් විය. නිදහසින් පසු ගෙවී ගිය දශක හතක කාලය තුළ අභ්‍යන්තර ගැටුම්, ස්වභාවික හා මිනිසා විසින් නිර්මාණය කරන ලද ව්‍යසන, රෝග උවදුරු, වරින් වර ඇතිවූ බාහිර කම්පන, දුර්වල ආයතන, වගවීම විනිවිදභාවය සහ යහපාලනය සම්බන්ධ ගැටලු, දූෂණය, නාස්තිය, ඥාති මිත්‍ර සංග්‍රහය හා දේශපාලන අස්ථාවරත්ව ඇති වූ කාලපරිච්ඡේද සහිත පාලනය, සහ අන් සියල්ලටත් වඩා, ඵලදායී ආර්ථික කළමනාකරණයේ දුර්වලතා හේතුවෙන් ආර්ථික කාර්ය සාධනය දුර්වල විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ආර්ථික වර්ධනයේ විචලනයන්, ඉහළ උද්ධමන කාලපරිච්ඡේද, විශේෂයෙන් අඛණ්ඩව පවතින විශාල රාජ්‍ය මූල්‍ය හිඟය සහ ණය බර තුළින් ඇති වන රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා, මෙන්ම රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාව මගින් විදේශීය හා මුදල් අංශයේ ස්ථායීතාවය මත ඇති කරනු ලබන බලපෑම් හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකය අඛණ්ඩව පසුබෑම් මධ්‍යයේ ඉදිරියට ගියේය. ශ්‍රී ලංකා ආර්ථිකයට අභියෝගයක් වූ ද්විත්ව

1 Lee Kuan Yew. 2000. From Third World To First: The Singapore Story: 1965–2000, Singapore: Singapore Press Holdings

හිඟය, එනම් අයවැය හිඟය සහ විදේශීය ජංගම ගිණුමේ හිඟය, රටේ ධාරිතාවට වඩා අධික ලෙස වියදම් කිරීමෙන් ඇති වූ අසමතුලිතතා සහ රාජ්‍ය මූල්‍ය හා විදේශීය අංශයේ අසමතුලිතතා හේතුවෙන් පැන නගින අතර, එය ප්‍රධාන ව්‍යුහාත්මක බාධකයක් ලෙසත් මෙම ශ්‍රී ලංකා ආර්ථිකයේ අවදානම් සහගත තත්ත්වය සඳහා බලපා ඇති මූලික සාධකයක් ලෙසත් පවතී. දිගු කාලීන රාජ්‍ය මූල්‍ය ප්‍රසාරණය ජංගම ගිණුමේ අසමතුලිතතාවයට හේතු වන අතර, එමගින් සාර්ව ආර්ථික ගැටලු හට ගන්නා බව පෙන්වීම සඳහා ද ශ්‍රී ලංකාව සුවිශේෂී උදාහරණයක් වේ. මෙවැනි සන්දර්භයක් තුළ, එවැනි දිගු කාලීන රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා සඳහා විසඳුම් සෙවීමට පැවති රජයන්ගේ රාජ්‍ය මූල්‍ය විචක්ෂණභාවය සඳහා වූ කැපවීම කෙටි කාලීන වූ අතර, එය අයවැය හිඟය ප්‍රසාරණය වීම සහ එමගින් සිදුවන රාජ්‍ය ණය සහ ඒ ආශ්‍රිත පොලී පිරිවැය ඉතා ඉහළ මට්ටමක් දක්වා වර්ධනය වීම මගින් පිළිබිඹු වේ. අනෙක් අතට, සාර්ව ආර්ථික ස්ථායීතාවට අවදානමක් ඇති කරමින්, ඉහළ ආනයන වියදම් හමුවේ දුර්වල අපනයන ක්‍රියාකාරිත්වය, අධික විදේශීය ණය අභියෝග සහ යෝග්‍ය නොවූ විනිමය අනුපාතිකය යනාදිය හේතුවෙන් විදේශීය අංශය පීඩනයට ලක්ව ඇත. දිගුකාලීන ආර්ථික ප්‍රගතිය කෙරෙහි අවධානය යොමු කරමින් ස්ථිරසාර ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම වෙනුවට සමාජීය හා දේශපාලනික වශයෙන් ජනප්‍රිය කෙටි කාලීන අරමුණු විසින් මෙහෙයවනු ලබන අනුචිත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අනුගමනය කිරීම හේතුවෙන් රට තුළ සාර්ව ආර්ථික අරමුණු මෙන්ම, පුරවැසියන්ගේ සමස්ත සුබසිද්ධිය සාක්ෂාත් කර ගැනීම කෙරෙහි අහිතකර ප්‍රතිවිපාක ඇති කර තිබේ. මෙවන් පසුබිමක, සමාජීය සහ ආර්ථික සංවර්ධනය යන දෙඅංශයෙන්ම ශ්‍රී ලංකාව අබිබවා ගිය සම තත්ත්වයේ රටවල් ළඟා කරගත් සාර්ථකත්වය තුළින් පාඩම් උකහා ගනිමින්, තම ආර්ථික සම්පත්වල ශක්තිය උපයෝගී කරගෙන ආර්ථිකයේ පූර්ණ විභව මට්ටම කරා ළඟා වීමට ශ්‍රී ලංකාව බොහෝ විට අසමත් වී ඇත. තවද, වසංගත ව්‍යාප්තිය සහ ඒ හා ආශ්‍රිත අවිනිශ්චිතතා මගින් ශ්‍රී ලංකා ආර්ථිකයේ අතීත ජයග්‍රහණ දැඩි ලෙස යටපත් කර ඇති අතර, සාර්ව ආර්ථික දුර්වලතා තීව්‍ර කර ඇත. වසංගත මගින් ඇති කළ අවහිරතා මධ්‍යයේ මුදල් හා රාජ්‍ය මූල්‍ය අංශ විසින් පෙර නොවූ අන්දමේ මුදල් හා රාජ්‍ය මූල්‍ය සානුබල සැපයුව ද, දිගු කාලයක සිට නොවිසඳුණු සහ අවධානය යොමු නොකළ මෙන්ම, නැවත නැවතත් විසඳීම කල් දැමූ ව්‍යුහාත්මක ගැටලු කිහිපයක් ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමට බාධා කරමින් ඉස්මතුව ඇත. අඛණ්ඩව සහ දැඩි ලෙස, සාර්ව ආර්ථික අසමතුලිතතාවන්ට පිළියම් යෙදීම සඳහා විශ්වසනීය සාර්ව ආර්ථික සැලැස්මක් සහ ජාතික ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයක් තිබීමේ අවශ්‍යතාවය මෙමගින් පිළිඹිබු වේ. එබැවින්, දිගු කාලයක් තිස්සේ පවතින ව්‍යුහාත්මක ගැටලු සහ වසංගතය හේතුවෙන් ඇති වූ නව අභියෝගවලට විසඳුම් සෙවීම සඳහා ශක්තිමත් සාර්ව ආර්ථික කළමනාකරණ රාමුවක් ගොඩනැගීම මගින් සුදුසු සහ ස්ථිරසාර ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහිත අධිෂ්ඨානශීලී සහ ඒකාබද්ධ ප්‍රයත්නයන් කඩිනමින් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. එවැනි ප්‍රයත්නයන්, මැදි කාලීනව අපේක්ෂිත ඉහළ වර්ධන මාවත කරා රට ගමන් කරවීමට මග පාදනු ඇති අතර, ස්ථාවර ආර්ථික තත්ත්වයන් සහතික කරමින්, ජනතාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කරනු ඇත.

ඉහත පසුබිම තුළ, විශේෂයෙන් සහ කඩිනමින් අවධානය යොමු කළ යුතු ආර්ථිකයේ ප්‍රධාන අංශ පෙන්වාදීමේ අරමුණින් ව්‍යුහාත්මක ගැටලු සහ ප්‍රතිපත්ති කිහිපයක් මෙහි දී සාකච්ඡා කර ඇත.

භාණ්ඩ හා සේවා අපනයනවලින් ලැබෙන ශුද්ධ ගලා ඒම් ඉහළ නැංවීමෙන් මෙන්ම සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීම තුළින් ජංගම ගිණුමේ තිරසාර ශේෂයක් සාක්ෂාත් කර ගැනීම, විදේශීය අංශයේ අසමතුලිතතා මගින් පැන නගින උග්‍ර අවදානම් තත්ත්වයන් මඟහරවා ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. දිගුකාලීනව පවතින විදේශීය ජංගම ගිණුමේ හිඟය, ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික පරිසරය තුළ ප්‍රධානතම සහ බොහෝ දුරට අවධානය යොමු නොකළ අවදානම් වලින් එකකි. සේවා සහ ද්විතීයික ආදායම් ගිණුම්වල ඇති අතිරික්තයන් මගින් පියවා ගැනීමට නොහැකි තරම් විශාල වන වෙළඳ සහ ප්‍රාථමික ආදායම් ගිණුම්වල හිඟය අඛණ්ඩව පුළුල් වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ. සීමිත විවිධාංගීකරණය, අගය එකතු කිරීම් අවම වීම, ගෝලීය අගය දාමයන් සමඟ ඒකාබද්ධ වීම මන්දගාමී වීම සහ වෙළඳ අංශයේ ප්‍රමාණවත් නොවන මට්ටමේ ආයෝජන මධ්‍යයේ තරගකාරීව සිටීමට අවශ්‍ය නවීනත්වය නොමැතිකම වැනි දිගුකාලීන ගැටලු හේතුවෙන් පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ අපනයනයන්හි ඉහළ වර්ධන වේගයක් හෝ උත්පාතයක් දක්නට නොලැබුණි. මේ අතර, අත්‍යාවශ්‍ය නොවන සහ හදිසි නොවන ආනයන ඇතුළු ආනයන වියදම් වේගවත්ව ඉහළ යෑම වෙළඳ හිඟය සැලකිය යුතු ඉහළ යෑමට හේතුවිය. 1977 වසරේ දී විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීමේ සහ පෞද්ගලික අංශය පදනම් වූ සංවර්ධනය, අපනයනය පදනම් කරගත් වර්ධනය සහ විදේශීය සෘජු ආයෝජන ප්‍රවර්ධනය වැනි නිදහස් ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය

1

කිරීමේ දී ශ්‍රී ලංකාව කලාපයේ අනෙකුත් රටවල්වලට වඩා ඉදිරියෙන් සිටි අතර, එය විදේශ වෙළඳාමේ කැපී පෙනෙන දියුණුවක් ක්ෂණිකව සාක්ෂාත් කර ගැනීමට හේතු විය. කෙසේ වෙතත්, පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳාමේ ක්‍රියාකාරීත්වය දුර්වල වී ඇති අතර අඛණ්ඩ පසුබෑමකටද ලක් වී ඇත. එය විදේශීය ජංගම ගිණුමේ හිඟය පුළුල් කිරීමට හේතු වී ඇති අතර, සීමිත විදේශ සෘජු ආයෝජන ලැබීම් මධ්‍යයේ ප්‍රධාන වශයෙන් විදේශ ණය ගැනීම් හරහා එම හිඟය මූල්‍යකරණය කර ඇත. විදේශීය ජංගම ගිණුමේ හිඟය පියවා ගැනීමට සහ අයවැය හිඟය පියවා ගැනීම සඳහා වූ මෙම ණය ගැනීම් හේතුවෙන් රජයේ විදේශීය ණය තොගය ඉහළ යෑම පමණක් නොව, පොලී ගෙවීම් ප්‍රමාණය ද ඉහළ ගිය අතර, එමගින් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පුළුල් විය. ණය ආපසු ගෙවීමේ බර අඩු කර ගැනීම සඳහා, විශේෂයෙන් ම විදේශ විනිමය ඉපැයීම් උත්පාදනය කෙරෙන වෙළඳ අංශයේ ආදායම් උත්පාදනය සහ ඵලදායිතාව ඉහළ නැංවීමේ ව්‍යාපාර සඳහා මෙම විදේශ ණය ඵලදායී ලෙස යොදා ගැනීම සහතික කිරීම වැදගත් වේ. එයට සමගාමීව, සේවා ගිණුමේ අතිරික්තය ඉහළ නංවන අතර, විදේශීය ජංගම ගිණුමේ හිඟය පියවීම සඳහා වූ ඕනෑම ප්‍රයත්නයක් වෙළඳ භාණ්ඩ අපනයනයෙන් ඉපැයීම් වැඩි කිරීම හරහා වෙළඳ හිඟය අඩු කිරීමේ උපාය මාර්ග කෙරෙහි ඉලක්කගත විය යුතුය. තවද, නිෂ්පාදන විවිධාංගීකරණය, සිරස් සහ තිරස් ඒකාබද්ධ වීම්, නිෂ්පාදන ක්‍රියාවලියෙහි කාර්යයන් රටවල් අතර බෙදීගිය ජාලයන් තුළ සහභාගීත්වය සහ ගෝලීය අගය දාම තුළ නිෂ්පාදන ඒකක නිෂ්පාදනය හරහා සම්බන්ධ වීම මෙන්ම, නව වෙළඳපළ ගවේෂණය කිරීම මගින් අපනයන ගමනාන්තයන් ලෙස ඇතැම් වෙළඳපළ මත අධික ලෙස රඳා පැවතීම අඩු කිරීම යනාදිය, අහිතකර ගෝලීය බලපෑම්හි අවදානම අවම කරන අතර, සෙසු රටවල් සමඟ ඒකාබද්ධ වීමෙන් අත්කරගනු ලබන ප්‍රතිලාභ උපරිම කිරීම සඳහා වැදගත්වන මූලපිරීම් ලෙස සැලකිය හැකිය. දේශපාලන පාලන තන්ත්‍රවල වෙනස්කම් සිදු වුවද, ජාතික අපනයන උපායමාර්ගයේ දක්වා ඇති ක්‍රියාමාර්ග කඩිනමින් සහ බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම ජාතික අවශ්‍යතා වල අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. අපනයන අංශයේ දේශීය අගය එකතු කිරීම ඉහළ නැංවීම සඳහා ප්‍රධාන අපනයන සඳහා අවශ්‍ය අන්තර් භාණ්ඩ සපයන දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. තවද, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් කරා යොමුවීම සඳහා වන ක්‍රියාමාර්ග මගින් ශ්‍රී ලංකාව පොසිල ඉන්ධන මත යැපීම අඩු කරනු ඇති අතර, එය ඉන්ධන ආනයනය හේතුවෙන් ජංගම ගිණුම මත ඇති කෙරෙන පීඩනය අවම කිරීමට උපකාරී වේ. තවද, විදේශීය ජංගම ගිණුමේ හිඟය පියවීම සඳහා සේවා අපනයන අත්‍යවශ්‍ය වන අතර, එබැවින් සේවා අපනයනවල පවතින පූර්ණ විභවතාව ප්‍රයෝජනයට ගැනීම අත්‍යවශ්‍ය වේ. ඇතැම් සේවා අපනයන, විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණය/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශ, රටට විදේශ විනිමය ආකර්ෂණය කරගැනීමෙහිලා ප්‍රමුඛතම අංශ බවට පත්වීමේ හැකියාව ඇත. රජයේ අවශ්‍ය සහාය ඇතිව තොරතුරු තාක්ෂණය/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශයේ ඉහළ විභවතා ප්‍රයෝජනයට ගනිමින්, වර්තමානයේ වාර්ෂිකව එ.ජ. ඩොලර් බිලියන 1ක පමණ උපයන එම අංශය එ.ජ. ඩොලර් බිලියන 5ක අපනයන කර්මාන්තයක් බවට මැදි කාලීනව පරිවර්තනය කිරීම අරමුණ විය යුතු වේ. කොවිඩ්-19 වසංගත ව්‍යාප්තියත් සමඟ හඳුන්වා දුන් රාජකාරි කිරීමේ නව ක්‍රමවේද මගින් ද, ලොව පුරා ආර්ථිකයන්හි ඩිජිටල්කරණය ඉහළ යෑම සමඟ ද, තොරතුරු තාක්ෂණය/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශවල වර්ධන ඉඩ ප්‍රස්ථා පුළුල් වී ඇත. එබැවින්, ශ්‍රී ලංකාව ඩිජිටල්කරණයට ලක් වූ රටක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා රටෙහි සිටින පුහුණු ශ්‍රම බලකායෙන් සහ පවතින නවීන තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වලින් ප්‍රයෝජන ගත යුතු අතර, එමගින් විදේශ විනිමය වැඩි වශයෙන් ගලා ඒම දිරිමත් කළ යුතුය. එසේම, මෙම අංශයේ වර්ධනයට සමගාමීව අවශ්‍ය කෙරෙන මානව ප්‍රාග්ධනයේ සංවර්ධනයට ගැළපෙන පරිදි තොරතුරු තාක්ෂණ අධ්‍යාපන ප්‍රතිපත්තිය හැඩගැස්වීම කළ යුතු වේ. තවද, ගෝලීය භූ දේශපාලනික අර්බුදයන් හේතුවෙන් ඇතැම් නව අවදානම් මතු වී තිබුණද, සංචරණ සීමා ක්‍රමයෙන් ලිහිල් කිරීම සහ එන්නත්කරණ ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාවට නැංවීමත් සමඟ පශ්චාත් වසංගත කාලය තුළ සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වීමේ සලකුණු පෙන්නුම් කරයි. එබැවින්, සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වීම මගින් අත්වන උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා, වියදම් කිරීමේ ඉහළ හැකියාවක් ඇති සංචාරකයින් ආකර්ෂණය කර ගත හැකි සුවිශේෂී ප්‍රවර්ධන ක්‍රියාමාර්ග සඳහා අවධානය යොමු කෙරෙන පරිදි සංචාරක කර්මාන්තය විවිධාංගීකරණය කිරීම අත්‍යවශ්‍ය වන අතර, එමගින් සාම්ප්‍රදායික නොවන සංචාරක වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමට සහ විවිධ හේතු සඳහා සංචාරය කරන සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා

අවස්ථාව සැලසේ. මේ අතර, විදේශීය ජංගම ගිණුමේ ඇති වෙළඳ හිඟයේ බලපෑම මැඩපැවැත්වීමට අදාලව ශ්‍රී ලංකාව මැදපෙරදිග ආර්ථිකයෙන් ලැබෙන විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මත දැඩි ලෙස විශ්වාසය තබා ඇත. ඒ අනුව, තෙල් මිල වෙනස්වීම් මගින් මැදපෙරදිග කලාපයේ ආර්ථික වර්ධනයෙහි සිදුවන අඩාල වීම් එම කලාපයේ ඇතිවන ඕනෑම භූදේශපාලනික අර්බුයක් හේතුවෙන් ශ්‍රී ලංකාවට ඇතිවන බලපෑම ඉතා ඉහළය. එබැවින්, ජංගම ගිණුමේ හිඟය පියවීම සඳහා මැදපෙරදිග වෙතින් ලැබෙන සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ තවදුරටත් තිරසාර මූලාශ්‍රයක් ලෙස සැලකිය නොහැකිය. මේ අනුව, විශේෂයෙන්ම, දකුණු කොරියාව, සිංගප්පූරුව, ජපානය සහ යුරෝපීය රටවල් වැනි දියුණු ආර්ථිකයන් තුළ නව ශ්‍රම වෙළඳපොළ ගවේෂණය කිරීමෙන් විකල්ප ගමනාන්ත සොයා ගැනීමේ අවශ්‍යතාවක් පවතී. මීට අමතරව, සංක්‍රමණික සේවකයින්ගේ කුසලතා වැඩිදියුණු කිරීම, ඉහළ සහ ස්ථාවර ඉපැයීම් සහිත රැකියා අවස්ථා සුරක්ෂිත කිරීමට ප්‍රයෝජනවත් වේ. වර්තමානයේදී කිසියම් දුරකට අවිධිමත් මාධ්‍යයන් හරහා යොමු කෙරෙන ප්‍රේෂණ විධිමත් බැංකු පද්ධතිය වෙත ඉලක්කගත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හරහා සියලු පාර්ශ්වකරුවන්ගේ සහයෝගය ඇතිව යොමු කරවා ගැනීම, වෙළඳ හිඟය පියවා ගැනීම සඳහා දැනට පවතින හොඳම පියවර වේ. පුළුල් ජංගම ගිණුමේ හිඟය පියවා ගැනීම සඳහා ඉලක්කගත ක්‍රියාමාර්ග යන්ට අමතරව, විදේශීය සෘජු ආයෝජන සහ කළඹ ආයෝජන ආකාරයෙන් ද ණය නොවන ආකාරයේ විදේශ මූල්‍ය ගලා ඒම් ගෙවුම් ශේෂයේ මූල්‍ය ගිණුම තුළට වැඩි වශයෙන් ආකර්ශණය කර ගනිමින් විදේශීය අංශයේ ඉහළ ස්ථාවරත්වය සහ වැඩිදියුණු කළ සාර්ව ආර්ථික ස්ථායීතාවය සහතික කිරීම අවශ්‍ය වේ.

ඉහළ විදේශ විනිමය ණය සේවාකරණ අවශ්‍යතා සහ ණය ආපසු ගෙවීම සඳහා රාජ්‍ය මූල්‍ය අවකාශය අඩු වීම හමුවේ විදේශීය අංශයේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා විදේශීය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමට ඉදිරියේදී ණය නොවන විදේශ මූල්‍ය ලැබීම් ආකර්ෂණය කර ගැනීම දැඩි අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. විදේශ ජංගම ගිණුමේ සහ රාජ්‍ය අයවැයේ හිඟය සමඟ ද්විත්ව හිඟ පවතින රටක් වන ශ්‍රී ලංකාව, එම හිඟයයන් පියවා ගැනීම සඳහා විදේශීය හා දේශීය ණය වෙත යොමු වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව විදේශීය ණයවල අසමානුපාතික වැඩිවීම සහ ණය සේවාකරණ ගෙවීම් ඉහළ යෑම පසුගිය කාලය පුරාවට විදේශීය අංශයේ අසමතුලිතතාවන් සඳහා විශාල වශයෙන් දායක වී ඇත. තවද, මැදි ආදායම් මට්ටමක් කරා යොමු වීමට සමගාමීව, සහනදායී අරමුදල් සඳහා පවතින සීමිත ප්‍රවේශය හේතුවෙන්, වාණිජ ණය සහ ස්වෛරීත්ව ණය නිකුත් කිරීම් හරහා මූල්‍ය අවශ්‍යතා සපුරාලිය යුතුව ඇත. ගෝලීය මූල්‍ය වෙළඳපොළවල දැඩි අවිනිශ්චිතතාවයන් සහ අඛණ්ඩ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම් මගින් එවැනි ප්‍රයත්නයන් සඳහා සීමාවන් ඇති වේ. ඒ අනුව, පසුගිය වසර දෙකක කාලය තුළ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළ තුළින් ප්‍රමාණවත් අරමුදල් ප්‍රමාණයක් රැස්කර ගැනීමට ශ්‍රී ලංකාවට නොහැකි විය. දුර්වල සෘජු විදේශ ආයෝජන ලැබීම් මධ්‍යයේ, වසංගතය හේතුවෙන් ආයෝජන අපේක්ෂා දුර්වල වීම සමඟ කොටස් වෙළඳපොළ සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළ තුළ වූ විදේශීය ආයෝජන, ඇතැම් තාවකාලික ඉහළ යෑම් කිහිපයක් හැරුණු විට සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතියේය. එබැවින්, සැලකිය යුතු විදේශීය මූල්‍ය ලැබීම් නොමැති තත්ත්වයක් තුළ, දේශීය විදේශ විනිමය වෙළඳපොළ ද්‍රවශීලතාව කැපී පෙනෙන ලෙස අඩු වූ අතර, විදේශ සංචිත යොදා ගනිමින් විදේශීය ණය සේවාකරණ ගෙවීම් පියවීම සිදුකොට ඇත. මෙම පසුබිම තුළ, නැවත නැවතත් වැඩි වශයෙන් විදේශීය ණය ගැනීම් වෙත යොමු නොවී, කළඹ ආයෝජන මෙන් ක්ෂණික ආපසු ගැනීමේ අවධානමට ලක් නොවන විදේශීය සෘජු ආයෝජන වැනි දිගු කාලීන, ණය නොවන විදේශ මූල්‍ය ප්‍රවාහ ආකර්ෂණය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ. ජංගම ගිණුමේ හිඟය පියවීම සහ දේශීය ආයෝජන වැඩි කිරීමට සහාය දැක්වීමට අමතරව, අනෙකුත් අංශ සඳහා තාක්ෂණික දැනුම ව්‍යාප්ත කිරීම, මානව ප්‍රාග්ධන සංවර්ධනයට සහාය වීම, ව්‍යාපාර පුළුල්වීම සඳහා සහාය වීම සහ විදේශ වෙළඳපොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීම හරහා ජාත්‍යන්තර වෙළඳ සම්බන්ධතා වැඩිදියුණු කරවීම යනාදිය තුළින් විදේශ සෘජු ආයෝජන ආර්ථික වර්ධනයට දායක වේ. වසංගතය හේතුවෙන් 2020 සහ 2021 වසරවල දී විදේශීය සෘජු ආයෝජන ගෝලීය වශයෙන් පසුබෑමට ලක්වුව ද, පසුගිය දශක කිහිපය තිස්සේ ශ්‍රී ලංකාවේ විදේශීය සෘජු ආයෝජන ලැබීම් කලාපීය සම රටවල් සමඟ සසඳන විට ඉතා පහළ මට්ටමක පැවතුණි. සමහර නීතිමය ව්‍යුහාත්මක සහ ආයතනික දුර්වලතා, එනම් දැඩි ශ්‍රම වෙළඳපොළ නීති, උපයෝගීතා ලබා ගැනීමේ අපහසුතා, සංකීර්ණ සහ අස්ථාවර බදු ව්‍යුහයන්, විශේෂයෙන්ම කොන්ත්‍රාත් බලාත්මක කිරීම, ආනයන අපනයන ලියකියවිලි

1

අවශ්‍යතා, ව්‍යාපාර ආරම්භ කිරීම, අරමුදල් ලබා ගැනීම හා දේපළ අත්පත් කර ගැනීම යනාදිය සම්බන්ධයෙන් පවත්නා වෙහෙසකර නියාමන ව්‍යුහයන්, සහ හොඳින් සංවර්ධිත යටිතල පහසුකම් නොමැතිකම, ඒ සඳහා හේතු වී ඇත. මෙම සාධක හැරුණු විට, ප්‍රතිපත්තිමය අවිනිශ්චිතතාවය, දූෂණය සහ දුර්වල සම්බන්ධීකරණය වැනි ආයතනික සහ පාලන දුර්වලතා ශ්‍රී ලංකාව තුළ හිතකර ආයෝජන වාතාවරණයක් ඇති කිරීමට අඛණ්ඩව බාධා පමුණුවා ඇත. එබැවින්, ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය කිරීම සඳහා, ශ්‍රී ලංකාව විස්තීරණ ආයෝජන ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවමින් විනිවිදභාවයකින් යුතු සහ ඵලදායී ප්‍රතිපත්තිමය පරිසරයක් ස්ථාපිත කළ යුතු අතර, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මානව නිපුණතා සහ ආයතනික හැකියාවන් ගොඩනගා ගැනීම සිදු කළ යුතුය. වෙළඳ හා කාර්මික ප්‍රතිපත්ති වැනි රජයේ අනෙකුත් සංවර්ධන ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සමඟ ආයෝජන ප්‍රතිපත්තිය ඒකාබද්ධව ක්‍රියාවට නැංවීම මෙන්ම, මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී අන්තර් නියෝජිතායතන සම්බන්ධීකරණය ද එකසේ වැදගත් වේ. මෙම ගැටලු නිවැරදි කිරීමෙහිලා අදාල බලධාරීන් දැනටමත් ප්‍රයත්න දරා ඇති අතර, ගෝලීය සෘජු විදේශ ආයෝජන ප්‍රවාහයන් පූර්ව වසංගත මට්ටම්වලට නැවත ළඟාවීමට පෙරාතුව මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, ශ්‍රම හා ඉඩම් වෙළඳපොළ ප්‍රතිසංස්කරණ මෙන්ම බදු රෙගුලාසි සරල කෙරන බදු ප්‍රතිසංස්කරණ හරහා හිතකර නියාමන පරිසරයක් නිර්මාණය කිරීම ද මෙම ප්‍රයත්නයට සහය සපයනු ඇත. ශ්‍රී ලංකාව ආකර්ශනීය ආයෝජන ගමනාන්තයක් බවට පත් කිරීම සඳහා නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීම, දූෂණය පිටුදැකීමේ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම සහ විනිවිදභාවය සහතික කිරීම ද ඉතා වැදගත් වේ. පරිපාලනමය දුර්වලතා සහ නිලධාරිවාදී බාධාවන් අවම කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීම සඳහා නව අවධානයක් යොමු කිරීමද ඉහළ මට්ටමේ විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට සහ එම ආයෝජන රට තුළ රඳවා ගැනීමට ද උපකාරී වනු ඇත. කොළඹ වරාය නගරය සංවර්ධනය කිරීම සහ කොළඹ සහ හම්බන්තොට වරාය භාණ්ඩ වෙළඳ මධ්‍යස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීම තුළින් ඉදිරි කාලය තුළදී රටට සැලකිය යුතු විදේශ ආයෝජන ආකර්ශණය කර ගත හැකිය. විදේශ ආයෝජන ප්‍රවාහයන් වැඩි දියුණු කිරීමට පියවර ගන්නා අතරම, විදේශීය ණය බර අඩු කිරීමේ අරමුණින් ජාත්‍යන්තර ස්වෛරිත්ව බැඳුම්කර නිකුත් කිරීම ක්‍රමයෙන් අඩු කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, උපයෝජනය නොකළ උපායමාර්ගික නොවන වත්කම් තුළින් මුදල් ඉපැයීම ද රටට අවශ්‍ය විදේශ විනිමය ගෙන ඒමට උපකාරී වනු ඇත. ණය ශ්‍රේණිගත කිරීම් ක්‍රියා සහ රට පිළිබඳ සෘණාත්මක ආකල්ප ඇති කරන සමාජ මාධ්‍ය ඇතුළු විවිධ මාධ්‍ය ආවරණය නිසා නිර්මාණය වන අනවශ්‍ය බිය හේතුවෙන් දුර්වල වූ ආයෝජක විශ්වාසය යළි ස්ථාපිත කිරීම කෙරෙහි ඉක්මන් අවධානය යොමු කිරීම වඩාත් වැදගත් වේ. මේ සම්බන්ධයෙන්, දැනට රට තුළ ආයෝජනය කර ඇති ආයෝජකයින් සහ ඉදිරියේ දී ආයෝජනය සඳහා ඉදිරිපත් වීමේ හැකියාවක් ඇති ආයෝජකයින් සමඟ අඛණ්ඩ සංවාදයක නිරත වීම, ආයෝජන අවස්ථා ග්‍රහණය කරගැනීම සඳහා වෙළඳ සහ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පවත්වාගෙන යෑම, කලාපයේ රටවල් සමඟ සම්බන්ධ වී විශේෂිත වෙළඳපොළවල් වෙත පිවිසීම සහ හරිත මූල්‍යකරණ විකල්ප භාවිතා කිරීම සඳහා ආයෝජන අවස්ථා ගවේෂණය කිරීම වාසිදායක වනු ඇත. හරිත හා තිරසාර මූල්‍ය ආයතන බොහොමයක් විසින් හඳුනාගෙන ඇති ප්‍රධාන ගැටලුවක් වන්නේ සම්මත නිර්වචන වර්ගීකරණයක් ගොඩනැගීමේ අවශ්‍යතාවයි. හරිත මූල්‍යකරණ වර්ගීකරණයක් ගොඩනැගීමේ ක්‍රියාවලියේ ශ්‍රී ලංකා මහ බැංකුව නිරත වී සිටින අතර, එමගින් හරිත ව්‍යාපෘති මූල්‍යකරණය කිරීමේ දී බැංකු අංශය සඳහා ආයෝජන විශ්ලේෂණය සඳහා රාමුවක් සපයනු ලබනු ඇත.

බලශක්ති අංශයට අදාළ රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් ධනාත්මක බාහිරතා නිර්මාණය කරමින් ආර්ථික වර්ධනයේ නියමුවන් ලෙස ක්‍රියා කරන අතර, ආර්ථිකයේ බලශක්ති සුරක්ෂිතභාවය සහතික කෙරෙන ආකාරයේ සියලු පැතිකඩ ආවරණය වන සැලැස්මක් බලශක්ති අංශය සඳහා සකස් කිරීමට එම අංශයෙහි සියලුම පාර්ශ්වකරුවන් එක්ව ක්‍රියා කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතී. විදුලිබලය සඳහා ඇති ප්‍රවේශය සියයට 99ක ප්‍රතිශතයක් දක්වා ළඟා කරගනිමින් සහ මෙරට විදුලිබල උත්පාදන යටිතල පහසුකම් පද්ධතිය ප්‍රවර්ධනය කිරීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගනිමින් ශ්‍රී ලංකාවේ බලශක්ති අංශය පශ්චාත් යුධ සමයේ දී ශීඝ්‍ර පරිවර්තනයකට ලක්ව ඇත. විශේෂයෙන්ම, ජල විදුලි උත්පාදනයට බලපානු ලබන කාලගුණය ආශ්‍රිත විචලතාවන් සහ තාප විදුලිය නිෂ්පාදනයට බාධාවක් විය හැකි බලශක්ති භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම වැනි තත්ත්වයන් මධ්‍යයේ, 2030 වසර වන විට රටේ බලශක්ති අවශ්‍යතාවයෙන් සියයට 70ක් පුනර්ජනනීය බලශක්තිය මගින් සපුරාලීමට එම ක්ෂේත්‍රය පුළුල් කිරීම සඳහා වන රජයේ මෑත කාලීන ඉලක්කය මගින් බලශක්ති අංශයේ ඔරොත්තු දීමේ

විශේෂ සටහන 2

මැදි හා දිගු කාලීනව ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ස්ථායීතාව ළඟා කර ගැනීම

හැඳින්වීම

බාහිර අසමතුලිතතා ආර්ථිකයේ සියලුම අංශ හරහා පුළුල් ලෙස පැතිර යන බලපෑම් ඇති කළ හැකි අතර එය සමස්ත සාර්ව ආර්ථික ස්ථාවරත්වයට තර්ජනයක් ඇති කළ හැකි බැවින් විවෘත ආර්ථිකයක් තුළ විදේශීය අංශයේ ස්ථාවරත්වය ඉතා වැදගත් වේ. ගෝලීය ආර්ථිකයේ අහිතකර වර්ධනයන් සහ කොවිඩ්-19 වසංගතය නිසා ඇති වූ බලපෑම් මධ්‍යයේ, ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මෑත වසරවල දී පෙර නොවූ අන්දමේ අභියෝගවලට මුහුණ දෙමින් සිටියි. මෙම වාතාවරණය තුළ, තිරසාර විදේශීය ණය තත්ත්වයකින් සහ කළමනාකරණය කරගත හැකි මට්ටමේ විදේශීය ජංගම ගිණුමේ හිඟයකින් පිළිබිඹු කෙරෙන විදේශීය අංශයේ දිගු කාලීන ස්ථාවරත්වය, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ දී වැදගත් කෙටි හා මැදි කාලීන ප්‍රමුඛතාවයක් ලෙස හඳුනාගෙන ඇත. කෙටි කාලීන ක්‍රියාමාර්ග ද සමඟ, විදේශීය අංශයේ දිගු කාලීන ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවට තිරසාර විසඳුම් අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ විදේශීය අංශයට අදාළ ආර්ථික ප්‍රතිපත්තිවල පරිණාමය

බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබන විට ශ්‍රී ලංකාව කෘෂිකර්මාන්තය මූලික වූ විවෘත ආර්ථිකයක් වූ අතර, එය ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක් සහිත වැවිලි අංශයකින් සහ යැපුම් කෘෂිකාර්මික අංශයකින් සමන්විත විය. අපනයන, තේ, රබර් සහ පොල් යන ප්‍රධාන වැවිලි භෝග තුනක් මත පදනම් වූ අතර, එය සමස්ත අපනයනවලින් සියයට 90ක් පමණ විය.

නිදහසින් පසු යුගයේ පැවති විදේශීය අංශයේ ප්‍රතිපත්ති

1950 දශකයේ මුල් භාගයේ පැවති නිදහස් වෙළඳ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාව නිදහස ලැබූ මුල් අවධියේ නිදහස් වෙළඳ ප්‍රතිපත්තියක් පවත්වා ගෙන ගිය අතර, එය ආසියාවේ වඩාත්ම ලිබරල්කරණය වූ ආර්ථිකයන්ගෙන් එකක් විය. 1950 දශකයේ අග භාගය වන තුරුම, විදේශ සංචිත සැලකිය යුතු ලෙස ගොඩනැංවීමට තුඩු දුන් වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම් ද්විත්වයකින් සහාය ලැබූ විශාල වෙළඳ අතිරික්තයන් සමඟ විවෘත වෙළඳ ප්‍රතිපත්තිය පවත්වා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. කෙසේ වෙතත්, ආනයන වියදම්වල වේගවත් වර්ධනය සහ වෙළඳ මිල අනුපාතය පිරිහීම හේතුවෙන් 1957 සිට වෙළඳ ගිණුමේ සැලකිය යුතු හිඟයන් වාර්තා විය.

1950 දශකයේ මැද භාගයේ සිට 1960 දශකයේ මැද භාගය දක්වා පැවති ආනයන පාලනය

1956න් පසු, දළ නිල සංචිත සැලකිය යුතු ලෙස අඩු වීමට හේතුපාදක වෙමින් විශාල වෙළඳ හිඟයන් ගෙවුම් තුලනය මත පීඩන ඇති කළේය. ඊට ප්‍රතිචාර වශයෙන්, රජය විසින් විදේශ විනිමය අයවැය කමිටුවක් පිහිටුවීම හරහා ආහාර, ඛනිජ තෙල් සහ ඖෂධ ආනයනය හැර අනෙකුත් ආනයන සඳහා ආනයන ප්‍රමාණය මත සීමා පැනවීම, බලපත්‍ර අවශ්‍යතා සහ තීරු බදු පැනවීම ඇතුළු දැඩි ආනයන පාලන ක්‍රියාමාර්ග පනවන ලදී. රජයේ සංවර්ධන උපායමාර්ගය, ආනයන ආදේශන දිරිමත් කිරීම සහ දේශීය කෘෂිකාර්මික කටයුතු පුළුල් කිරීම තුළින් ආනයන වියදම් අඩු කිරීම සහ අත්‍යවශ්‍ය භාණ්ඩවලින් ස්වයංපෝෂිත වීම මත පදනම් විය. 1960 දශකයේ මැද භාගය වන විට, ආරක්ෂණවාදී පියවර සමඟ ආර්ථිකය දැඩි ලෙස නියාමනය කරන ලද අතර, අධි තක්සේරු කරන ලද ස්ථාවර විනිමය අනුපාතිකයක් පවත්වා ගෙන යන ලදී. මේ අතර, ගෙවුම් තුලනයේ ගැටලුවලට විසඳුම් ලෙස අපනයන ප්‍රවර්ධන උපාය මාර්ග ද අනුගමනය කරන ලදී.

1960 දශකයේ අග භාගයේ සිට 1970 දක්වා පැවති ආර්ථිකයේ අර්ධ ලිබරල්කරණය

1967දී මුදල් ඒකකය සියයට 20කින් අවප්‍රමාණය කිරීමත් සමඟ ආනයන සීමා කිරීම් අර්ධ වශයෙන් ලිහිල් කිරීමත්, 1968 වසරේ දී විදේශ විනිමය හිමිකම් සහතික කිරීමේ යාන්ත්‍රණය යටතේ ද්විත්ව විනිමය අනුපාතික ක්‍රමයක් හඳුන්වා දීමත් සමඟ 1966 වසරේ සිට ජාත්‍යන්තර වෙළඳාම අර්ධ වශයෙන් ලිහිල් කිරීමට අවසර දෙන ලදී. එම කාලසීමාව තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි බහුපාර්ශ්වීය ආයතනවලින් විදේශ මූල්‍ය ආධාර ලැබුණද, 1960 දශකයේ දී විදේශීය අංශයේ කාර්ය සාධනය සැලකිය යුතු ලෙස දුර්වල විය.

1970 සිට 1977 දක්වා කාලය තුළ ආනයන පාලනය කිරීම් නැවත ක්‍රියාත්මක කිරීම

1970 වසරේ දී බලයට පත් වූ නව රජය විසින් හඳුන්වා දෙන ලද සමාජවාදී ප්‍රතිපත්ති සමඟ ශ්‍රී ලංකාව මෙම කාල සීමාව තුළ වඩාත්ම දැඩි වෙළඳ හා විනිමය සීමාවන්ට මුහුණ දුන්නේය. සියලුම ආනයන, බලපත්‍ර අවශ්‍යතා මත ගෙන්වනු ලැබූ අතර, සාම්ප්‍රදායික නොවන අපනයන ප්‍රවර්ධනය කිරීම සඳහා දිරි ගැන්වීම් සිදු කරන ලදී. බ්‍රෙටන් වුඩ්ස් (Bretton Woods) විනිමය අනුපාතික ක්‍රමයෙහි බිඳවැටීමට තුඩු දුන් තෙල් අර්බුදයක්, වියට්නාම යුද්ධය සහ එක්සත් ජනපද ආර්ථිකයේ ව්‍යුහාත්මක දුර්වලතා වැනි ගෝලීය බලපෑම්වලට මෙම කාලසීමාව තුළ දී ශ්‍රී ලංකා ආර්ථිකය ද මුහුණ දුන්නේය. බ්‍රෙටන් වුඩ්ස් ක්‍රමය බිඳවැටීම සහ ගෙවුම් තුලන පීඩන හේතුවෙන් එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය වෙනස් වීමත් සමඟ, ජංගම සහ ප්‍රාග්ධන ගිණුම් වලට අදාළ ගනුදෙනු දෙකෙහිම විනිමය සීමා කිරීම් දැඩි කරන ලද අතර, මෙම දැඩි පාලනයන් 1977 වසර දක්වා ක්‍රියාත්මක විය.

1

1977 දී විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීම

නිෂ්පාදනය සහ ආයෝජනය සඳහා පෞද්ගලික අංශයේ ඉහළ සහභාගීත්වයක් සහිත ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීම තුළින් 1977 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය කැපී පෙනෙන සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. ලිබරල් ප්‍රතිපත්ති ක්‍රමයේ වැදගත් අංගයක් ලෙස තනි විනිමය අනුපාතිකයක් ස්ථාපිත කිරීම මගින් ද්විත්ව විනිමය අනුපාතික ක්‍රමය අහෝසි කරන ලදී. ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක සිට වෙළඳපොළ ඉල්ලුම් සහ සැපයුම් බලවේග මත විනිමය අනුපාතිකය තීරණය කෙරෙනු ලබන කළමනාකරණය කරන ලද පාවෙන විනිමය අනුපාතික ක්‍රමයකට මාරුවීම, ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතික ප්‍රතිපත්තියේ කැපී පෙනෙන වෙනසක් සනිටුහන් කළේය. විනිමය පාලන ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග රැසක් ද ක්‍රියාත්මක කරන ලදී. ජංගම ගිණුමට අදාළ ගනුදෙනු මත පැවති සීමා ඉවත් කිරීම, ප්‍රමාණාත්මක ආනයන සීමා ඉවත් කිරීම, ආනයන තීරුබදු ව්‍යුහය තාර්කික කිරීම හා සරල කිරීම සහ මිල පාලන හා බලපත්‍ර අවශ්‍යතා ඉවත් කිරීම මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ඇතුළත් විය. මීට සමගාමීව, රාජ්‍ය මූල්‍ය අංශයේ අසමතුලිතතා හේතුවෙන් පැන නගින ලද අහිතකර බලපෑම් අවම කිරීම සඳහා, ආහාර සහනාධාර ප්‍රතිව්‍යුහගත කිරීම, රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකරණය කිරීම සහ පෞද්ගලික අංශය මූලික කරගත් වර්ධනය ප්‍රවර්ධනය කිරීම වැනි බොහෝ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදී. අපනයන කර්මාන්ත සහ අපනයන සැකසුම් කලාප වෙත විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා දිරිගැන්වීම් ලබා දෙන ලදී. විනිමය සීමා ලිහිල් කිරීමත් සමඟ 1977 වසරෙන් පසු විදේශ මූල්‍ය ප්‍රවාහ ලැබීම් ක්‍රමයෙන් ඉහළ යෑම ඇරඹුණි. ඉන් පසුව, ආර්ථිකය මූලික වශයෙන් කෘෂිකාර්මික ආර්ථිකයක සිට සේවා සහ කාර්මික අංශ මූලික වූ ආර්ථිකයක් දක්වා වෙනස් වීමත් සමඟ, ශ්‍රී ලංකාව කලාපීය රටවල් සමඟ වෙළඳ හා ආයෝජන සබඳතා ශක්තිමත් කරගැනීම සඳහා වරණීය වෙළඳ ගිවිසුම් ගණනාවකට එළඹුණි.

විදේශීය අංශය: වත්මන් තත්ත්වය සහ ගැටළු

අඛණ්ඩව ඉහළ යන ජංගම ගිණුමේ හිඟයන්

වෙළඳ භාණ්ඩ ගිණුමේ සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ විශාල හිඟයන් හේතුවෙන් ශ්‍රී ලංකාව පසුගිය වසර කිහිපය පුරාම අඛණ්ඩව විදේශීය ජංගම ගිණුමේ හිඟයන් අත්විඳිමින් සිටියි. සේවා වෙළඳාම් ගිණුමේ සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සමන්විත ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්ත වාර්තා වුව ද, මෙම අතිරික්ත, ජංගම ගිණුම මත වන වෙළඳ භාණ්ඩ සහ ප්‍රාථමික ආදායම් ගිණුම්වල හිඟයන්ගේ බලපෑම මැඩපැවැත්වීමට ප්‍රමාණවත් නොවීය. අපනයන ඉපැයීම්වල අඩු කාර්ය සාධනය සහ ආනයන වියදම් ඉහළ යෑම වසර ගණනාවක් පුරා වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය පුළුල් වීමට හේතු විය. ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කිරීම ආරම්භ කළ කලාපයේ පළමු රටවල්වලින් එකක් බවට 1977 වසරේ දී ශ්‍රී ලංකාව පත් වුව ද, මෙරට වෙළඳ විවෘතභාවය පහළ මට්ටමක පවතී. රටේ දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව අපනයන හා ආනයනවල මුළු වටිනාකම ලෙස අර්ථ දක්වන වෙළඳ විවෘතභාවය, 1977 වසරේ දී සියයට 36.4ක් වූ අතර එය 1979 වසර වන විට සියයට 72.2ක් දක්වා ආසන්න වශයෙන් දෙගුණයක් බවට පත් විය. කෙසේ වෙතත්, 2019 වසරේ දී ශ්‍රී ලංකාවේ වෙළඳ විවෘතභාවය සියයට 38.0ක් ලෙස ලිබරල්කරණයට පෙර පැවති මට්ටම්වලට පහත වැටුණු අතර, වෙළඳ විවෘතභාවය සම්බන්ධයෙන් සලකා බලන විට ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික වෙළඳාමේ කාර්ය සාධනය සතුටුදායක මට්ටමක නොපවතියි. ජංගම ගිණුම් හිඟයන් පුළුල් කිරීමට දායක වෙමින් 2021 වසරේ මැද භාගයේ සිට විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ද පහත වැටීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත.

පාස්කු ඉරු දින ප්‍රහාර සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ජංගම ගිණුමට ඇති වූ අහිතකර බලපෑම්

ආනයන වියදම් අඩු වීම හේතුවෙන් වෙළඳ හිඟයේ ඇති වූ කැපී පෙනෙන අඩු වීම නිසා ජංගම ගිණුමේ හිඟය 2019 සහ 2020 වසර වල දී සැලකිය යුතු ලෙස අඩු වුවද, පාස්කු ඉරු දින ප්‍රහාර සහ කොවිඩ්19 වසංගතය පැතිරීම හමුවේ සංචරණ සීමා පැනවීම හේතුවෙන් සංචාරක ඉපැයීම් අහිමි වීම සේවා ගිණුමේ අතිරික්තයට වසර දෙකෙහිදී ම දැඩි බලපෑමක් එල්ල කළේය. 2020 වසර අවසානයේ සිට සංචාරක අංශය සැලකිය යුතු ලෙස යථා තත්ත්වයට පත්වීමක් දක්නට ලැබුණ ද, එය තවමත් වසංගතයට පෙර පැවැති මට්ටමට ළඟා වී නොමැත. වසංගත කාලය ආරම්භයේ දී පහත වැටුණු විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2020 වසරේ මැද භාගයේ සිට සීඝ්‍රයෙන් ඉහළ යෑම ඇරඹුණි. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් අවිධිමත් වෙළඳපොළ සහ විධිමත් මාර්ග අතර පවතින විනිමය අනුපාතිකයේ වෙනස්කම් හේතුවෙන්

රූප සටහන වි.ස. 2.1
ජංගම ගිණුමේ සංයුතිය: 1975 - 2021



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2021 වසරේ මැද භාගයේ සිට විධිමත් මාර්ග හරහා ලැබෙන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පහත වැටීම ආරම්භ විය. අපනයන ආදායමේ කැපී පෙනෙන වර්ධනය අභිබවමින්, තෝරා ගත් ආනයන සඳහා ආනයන සීමා පැනවීම අඛණ්ඩව පැවතීම මධ්‍යයේ වුවද ආනයන වියදම් විශාල ලෙස ඉහළ යෑම හේතුවෙන්, පසුගිය වසර දෙක තුළ පහත බැස තිබූ වෙළඳ හිඟය, විශේෂයෙන්ම 2021 වසරේ දෙවන භාගයේ දී සැලකිය යුතු ලෙස පුළුල් විය. වසංගත කාලසීමාවෙන් පසුව සිදු වූ, විශේෂයෙන් ම වෙළඳ හිඟය, සේවා ගිණුම වෙත වූ ලැබීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සම්බන්ධයෙන් වූ මෙම අහිතකර වර්ධනයන් ආදිය දැනටමත් දුර්වලව පවතින විදේශීය අංශයේ අවදානම් තවදුරටත් උග්‍ර කර ඇත.

මූල්‍ය ගිණුමේ දුර්වල කාර්ය සාධනය

විදේශීය සෘජු ආයෝජන සම්බන්ධ ව්‍යුහාත්මක සහ ප්‍රතිපත්තිමය ගැටලු හේතුවෙන් පශ්චාත් යුධ සමය තුළ දී පවා ශ්‍රී ලංකාවට විදේශීය සෘජු ආයෝජන වැනි ණය නොවන විදේශ මූල්‍ය ප්‍රවාහ අපේක්ෂිත මට්ටම් දක්වා ආකර්ෂණය කරගැනීමට නොහැකි වී ඇත. පසුගිය දශකය තුළ, වාර්ෂික විදේශීය සෘජු ආයෝජන ලැබීම් සාමාන්‍ය වශයෙන් එ. ජ. ඩොලර් බිලියන 1.3ක් පමණ වූ අතර එය ද.දේ.නි.යෙන් සියයට 1-2ක් අතර පැවතුණි. ශ්‍රී ලංකාවේ පවතින දුර්වල ආයෝජන වාතාවරණය කෙරෙහි, අවිනිශ්චිත ප්‍රතිපත්ති, සීමාකාරී කම්කරු රෙගුලාසි, ව්‍යාපාර කිරීමේ පහසුවෙහි ප්‍රගතියක් නොමැතිකම, දේපළ හිමිකම් සුරැකීමේ නොගැළපීම් සහ නීතිය හා සාමය පවත්වාගෙන යෑමේ දුර්වලතා ඇතුළු සාධක රාශියක් හේතු වී ඇත. මීට අමතරව, දූෂණය, දුර්වල රෙගුලාසි, ඉහළ නිලධාරිවාදය හා දුර්වල යටිතල පහසුකම් වැනි ආයතනික දුර්වලතා හේතුවෙන් ශ්‍රී ලංකාව එහි සම ආර්ථිකයන්වලට වඩා සැලකිය යුතු ලෙස අඩු විදේශීය සෘජු ආයෝජන ලැබීම් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට හේතු වී ඇත.

විදේශීය ණය මට්ටම ඉහළ යෑම

පසුගිය දශකය තුළ ඉහළ යන ලද විදේශීය ණය සහ ණය සේවාකරණ ගෙවීම් විදේශීය අංශයේ අසමතුලිතතාවයන්ට ප්‍රධාන වශයෙන් හේතු විය. 2007 වසරේ දී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීමෙන් අරමුදල් රැස් කිරීම හරහා, ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමත් සමඟ, විදේශ ණය අඛණ්ඩව ඉහළ යමින් පවතී. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව සහනදායී පොලී අනුපාතවලට ලබා ගැනීමට හුරු වී සිටි සංවර්ධන මූල්‍යාධාරවලට සාපේක්ෂව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ඉහළ පොලී අනුපාතවලට මිල කරනු ලැබීම නිසා එමගින් ණය මූල්‍යයනය කිරීමේ සමස්ත පිරිවැය ඉහළ ගොස් ඇත. තවද, පශ්චාත් යුද ආර්ථික පුනර්ජීවනය සමඟ විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීම හේතුවෙන් පුළුල් වූ රාජ්‍ය මූල්‍ය හිඟය ද මෙම ඉහළ යෑමට දායක විය. ණය සමුච්චය වීමේ ප්‍රවණතාවය අනුව, පසුගිය දශකය තුළ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස විදේශීය ණය මට්ටම ද ක්‍රමයෙන් ඉහළ යමින් පවතින අතර, එය සාමාන්‍ය වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 60ක් පමණ වේ. කලාපයේ රටවල් සමඟ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස විදේශීය ණය සැසඳීමේ දී භූතානය, මාලදිවයින සහ කාම්බෝජයට පසු ඉහළම අනුපාතය ශ්‍රී ලංකාව වාර්තා කර ඇත. මෙම රටවල් හතර හැරුණු විට, ආසියාවේ අනෙකුත් රටවල්හි දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස විදේශීය ණය එම රටවල දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 50කටත් වඩා අඩු මට්ටමක පවතී.

රූප සටහන වි.ස. 2.2
විදේශීය සෘජු ආයෝජන ලැබීම්:
ශ්‍රී ලංකාව සහ තෝරාගත් කලාපීය රටවල් - 2020



මූලයන්: ලෝක බැංකුව
වෙළඳාම සහ සංවර්ධනය පිළිබඳ
එක්සත් ජාතීන්ගේ සමුළුව (UNCTAD)
ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන වි.ස. 2.3
නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය:
ශ්‍රී ලංකාව සහ තෝරාගත් කලාපීය රටවල් - 2020



මූලයන්: ලෝක බැංකුව
ශ්‍රී ලංකා මහ බැංකුව

1

රූප සටහන වි.ස. 2.4
ශ්‍රී ලංකාවේ විදේශීය ණය සේවාකරණ ගෙවීම්: 2000 - 2021



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

විදේශීය ණය සේවාකරණ ගෙවීම්

විදේශීය ණය තත්ත්වය වැඩි වීම මෙන්ම ශ්‍රී ලංකාවේ විදේශීය ණය සංයුතිය සහනදායී ණයවල සිට පිරිවැය අධික සහනදායී නොවන සහ වාණිජ ණය ගැනීම් දක්වා වෙනස් වීම විදේශීය ණය සේවාකරණ ගෙවීම් ඉහළ යෑමට හේතු වී ඇත. විදේශීය ණයවල අධික පිරිවැය, ගෙවුම් තුලනයේ ජංගම ගිණුම මත තවදුරටත් පීඩනයක් ඇති කරමින් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පුළුල් කර ඇත. ශ්‍රී ලංකාවේ වාර්ෂික අපනයන ආදායමෙන් තුනෙන් එකක් පමණ ණය සේවාකරණය සඳහා යෙදවෙන බව පිළිබිඹු කරමින් සමස්ත විදේශීය ණය සේවාකරණ ගෙවීම් වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනවල ප්‍රතිශතයක් ලෙස 2011 වසරේ දී පැවති සියයට 13.2ක සිට 2021 වසර වන විට සියයට 30.0ක් දක්වා වැඩි වී ඇත. තවද, විදේශීය ණය සේවාකරණ ගෙවීම්වලින් සියයට 80කට වඩා වැඩි ප්‍රමාණයක් රජයේ ණය සේවාකරණ ගෙවීම් වන අතර, ඉන් විදේශීය අංශයේ මූල්‍යකරණ ගැටලු ප්‍රධාන වශයෙන් රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා හේතුවෙන් පැන නගින බව පිළිබිඹු කරයි.

දළ නිල සංචිත පහත වැටීම

ප්‍රමාණවත් නොවූ විදේශ විනිමය ලැබීම් හමුවේ ඉහළ විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් 2021 වසර අවසාන වන විට රටේ දළ නිල සංචිත තත්ත්වය තියුණු ලෙස පහළ මට්ටමකට වැටී ඇත. අපනයන ඉපැයීම් රට තුළට ගෙන්වා ගැනීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ විදේශ ප්‍රාග්ධන ප්‍රවාහ යනා දී විදේශ විනිමය ලැබීම් අඩු මට්ටමක පැවතීම නිසා දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතා හිඟයක් ඇති වූ අතර, සංචිත මට්ටම් තවදුරටත් පහළ යෑමට හේතු වෙමින් අත්‍යවශ්‍ය ආනයන මූල්‍යනය කිරීම සඳහා විදේශ විනිමය සැපයීමට මහ බැංකුවට සිදු විය.

විනිමය අනුපාතිකය මත ඇති වූ සැලකිය යුතු පීඩනය

දේශීය විදේශ විනිමය වෙළඳපොළේ සිදී ගිය ද්‍රවශීලතා තත්ත්ව, විනිමය අනුපාතිකය මත සැලකිය යුතු අවප්‍රමාණය වීමේ පීඩනයක් ඇති කළ ජාත්‍යන්තර සංචිතවල අවිනිශ්චිත මට්ටම සහ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහත හෙළීම් යනාදිය මගින් විදේශීය අංශයේ අසමතුලිතතා විශාල ලෙස පිළිබිඹු කෙරේ. ප්‍රධාන වශයෙන්, මහ බැංකුවේ ශිෂ්ට ප්‍රයෝග හරහා 2021 වසරේ බොහෝ කාලයක් තුළ සහ 2022 වසරේ මාර්තු මස මුල දක්වා විනිමය අනුපාතිකය එ.ජ. ඩොලරයට සාපේක්ෂව රු. 200 203ත් අතර අගයක පවත්වා ගනු ලැබූ අතර, විදේශ විනිමය සඳහා කැපී පෙනෙන සමාන්තර අවිධිමත් වෙළඳපොළක් ඇතිවීම දක්නට ලැබුණි. කෙසේ වෙතත්, 2022 වසරේ මාර්තු මස මුල සිට විනිමය අනුපාතිකයේ ඇති වූ ගැළපීම සහ ඉන් අනතුරුව ඇති වූ වෙළඳපොළ පීඩනය සමඟ 2022 වසරේ මාර්තු මස අවසානය වන විට එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 33.0කින් විශාල ලෙස අවප්‍රමාණය විය. කෙසේ වෙතත්, මූල්‍ය හිඟයන් පියවා ගැනීම සඳහා මූල්‍යයන සපයා ගැනීමට අවශ්‍ය සාකච්ඡා ද සමඟ, 2022 වසරේ අප්‍රේල් මස මුල දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සැලකිය යුතු ලෙස දැඩි කිරීම සහ ප්‍රධාන වශයෙන් ආර්ථිකය නැවත සකස් කිරීමේ වැඩසටහනක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා ආරම්භ කිරීම, විදේශීය ණය සේවාකරණය අතුරු කාලපරිච්ඡේදයක් සඳහා නතර කිරීම හරහා ක්‍රමවත්ව සහ එකඟතාවයකින් යුතුව ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියකට යොමු වීම සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය වැනි දැනට සලකා බලමින් පවතින අනෙකුත් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වහාම ක්‍රියාත්මක කිරීම තුළින් විනිමය අනුපාතිකයේ යම් ස්ථාවරත්වයක් ඇති වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

විදේශීය අංශයේ ස්ථාවරත්වය ළඟා කර ගැනීම සඳහා වන මැදි හා දිගු කාලීන ප්‍රතිපත්ති

විදේශීය අංශයේ ගැටලු විසඳීම සඳහා මහ බැංකුව පසුගිය කාලය තුළ කෙටිකාලීන ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත. භාණ්ඩ හා සේවා අපනයනයෙන් ලැබෙන ආදායම අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් මහ බැංකුව විසින් නව නීති නිකුත් කළ අතර, ඒවා දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතා තත්ත්ව ඉහළ නැංවීමට උපකාරී විය. තවද, ණය නොවන මූලාශ්‍ර හරහා දළ නිල සංචිත ගොඩ නැංවීමේ අරමුණින්, එසේ රුපියල්වලට පරිවර්තනය කරන ලද විදේශ විනිමයෙන් කොටසක් මහ බැංකුවට විකිණීමට මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් ලබා දෙන ලදී. මෙම ක්‍රියාමාර්ගය දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතාවයට යම් බලපෑමක් ඇති කළ ද, එමගින් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා වන ඉල්ලුමෙන් කොටසක් මූල්‍යනය කිරීම සඳහා වෙළඳපොළට අවශ්‍ය විදේශ විනිමය සැපයීමට මහ බැංකුවට හැකි විය. බලපත්‍රලාභී බැංකුවලින් රුපියල්වලට

පරිවර්තනය කරනු ලබන විදේශ විනිමය ප්‍රේෂණ සඳහා සාමාන්‍ය විනිමය අනුපාතිකයට වඩා වැඩි දිරිගැන්වීම් ලබාදීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට අදාළ ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කිරීම සහ "ලංකා රෙමිට්" (Lanka Remit) නම් වූ ජාතික ප්‍රේෂණ ජංගම යෙදුම ක්‍රියාත්මක කිරීම හරහා විධිමත් මාර්ග ඔස්සේ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් දිරිමත් කිරීමට පියවර ගන්නා ලදී. තවද, අනේවාසිකයන්ට ලබා දෙන සේවා සඳහා විදේශ විනිමය වශයෙන් පමණක් ගෙවීම් භාර ගැනීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී ඇති හෝටල් සේවා සපයන්නන්ට විධානයන් නිකුත් කරන ලදී. එපමණක් නොව, ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම් මගින් කලාපීය මහ බැංකුවලින් විදේශීය මූල්‍ය ආධාර ලබා ගැනීමට ද මහ බැංකුව සමත් වී ඇත. කෙටි කාලීන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග විදේශීය අංශය නැවත යථා තත්ත්වයට පත් කිරීමට යම් ප්‍රමාණයකට උපකාරී වී ඇතත්, විදේශීය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමට සහ අඛණ්ඩ ස්ථාවරත්වය පවත්වා ගැනීමට මැදි හා දිගු කාලීන ප්‍රතිපත්ති අවශ්‍ය වේ. එවැනි ප්‍රතිපත්ති පහත ප්‍රධාන ක්ෂේත්‍ර මත පදනම් විය යුතුවේ.

මැදි කාලීන ක්‍රියාමාර්ග

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහාය ලබන ආර්ථික ගැළපුම් වැඩසටහනකට අනුකූල වන ලෙස පුළුල් සාර්ව ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම

රට මුහුණ දී ඇති අඛණ්ඩ ආර්ථික ගැටලු සැලකිල්ලට ගනිමින්, සාර්ව ආර්ථික ස්ථාවරත්වය ඉලක්ක කර ගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් මූල්‍යයනය කරනු ලබන වැඩසටහනකට අනාගතයේ දී යොමු වීම සඳහා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා ආරම්භ කිරීමට තීරණය කර ඇත. මෙම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මූල්‍ය වැඩසටහන, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය, රජයේ වාණිජ ව්‍යවසායයන්වල මූල්‍ය කාර්ය සාධනය ශක්තිමත් කිරීම, රාජ්‍ය අයවැය මහ බැංකුව මගින් මූලන්‍ය කිරීම ක්‍රමානුකූලව අඩු කිරීම සහ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන්වල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම වැනි ප්‍රධාන ක්ෂේත්‍රවල පුළුල් ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයක් ඔස්සේ සිදු කළ හැක.

විදේශීය ණය තිරසාර බව සහතික කිරීමේ අවශ්‍යතාවය

රජයේ සහ මහ බැංකුවේ වත්මන් අවධානය යොමු වී ඇත්තේ ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා දිගු කාලීනව රටේ විදේශීය ණයවල තිරසාර බව සහතික කිරීම වෙතයි. මේ සම්බන්ධයෙන්, රජය විසින් තම විදේශීය ණය තිරසාර ලෙස කළමනාකරණය කිරීම සඳහා මූල්‍ය උපදේශකයින් සහ නීති උපදේශකයින් පත් කිරීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් යෝජනා කැඳවීම දැනටමත් ප්‍රකාශයට පත් කර ඇත. එවැනි ණය කළමනාකරණ ක්‍රියාවලියකට, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහනක් සඳහා වන එකඟතාව මත පදනම් වූ පුළුල් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්මක් ඇතුළත් විය හැකිය. ඊට සමගාමීව, එකඟතාවයකින් යුතුව විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමක් සඳහා තාවකාලිකව විදේශීය ණය සේවාකරණය අතුරු කාලපරිච්ඡේදයක් සඳහා අත්හිටුවන බව රජය 2022 වසරේ අප්‍රේල් මස 12 වන දින නිවේදනය කර ඇත. මෙම ක්‍රියාමාර්ග, ඉහළ මට්ටමක පවතින විදේශීය ණය අඩු කිරීම තුළින් විදේශීය ණය තිරසාරභාවය තහවුරු කිරීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

දළ නිල සංචිත යහපත් මට්ටමක පවත්වාගෙන යෑම

විදේශීය අංශයේ ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා, දළ නිල සංචිත යහපත් මට්ටමක පවත්වා ගැනීම ඉතා වැදගත් වන අතර, එය රටෙහි බාහිර කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව මෙන්ම විදේශීය ණය සේවාකරණ ගෙවීම් කිරීමට ඇති හැකියාව පිළිබඳ දර්ශකයකි. එබැවින්, රටේ දළ නිල සංචිත ඉහළ නැංවීම විදේශීය අංශයේ වැදගත්ම මැදි කාලීන අරමුණ වේ. අවම වශයෙන් මාස 4ක වෙළඳ භාණ්ඩ ආනයන ආවරණය වන පරිදි දළ නිල සංචිත ඉහළ නැංවීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි. මෙම ඉලක්ක සැලකිය යුතු ලෙස අභියෝගාත්මක වන අතර, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා දැනට දරන ප්‍රයත්න සහ අපේක්ෂා කරන ලද විදේශ විනිමය ලැබීම් මැදි කාලයේ සිට දිගු කාලීනව ක්‍රමානුකූලව ඉහළ යෑම තුළින් දළ නිල සංචිත ක්‍රමයෙන් ගොඩනගා ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදි කාලීන අරමුණ සංචිත ප්‍රමාණය ක්‍රමානුකූලව ඉහළ නැංවීම වන අතර, ණය නොවන මූලාශ්‍ර හරහා සංචිත ගොඩ නැගීම මගින් එහි සංයුතිය ද වැඩි දියුණු කිරීමට අපේක්ෂා කෙරේ.

කලාපීය සහයෝගීතාව ශක්තිමත් කිරීම

මැදි කාලීනව විදේශීය අංශයේ ස්ථායීතාව තිරසාර කිරීම පිණිස පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය ගොඩනැගීම සඳහා කලාපීය මහ බැංකු, රජයයන්, ව්‍යාපාරික ප්‍රජාවන්, ආයෝජකයින් සහ බහුපාර්ශ්වික නියෝජිතායතන ඇතුළු කලාපීය පාර්ශ්වකරුවන් සමඟ ජාත්‍යන්තර සහයෝගීතාව පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන්, මහ බැංකුව විසින් කලාපීය රටවල් කිහිපයක් සමඟ අනාගත සහයෝගිතා පිළිබඳ සාකච්ඡා අඛණ්ඩව කරගෙන යනු ලබයි.

ණය නොවන විදේශ විනිමය ලැබීම් ශක්තිමත් කිරීම සඳහා වූ දිගු කාලීන ක්‍රියාමාර්ග

වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන අංශ ප්‍රවර්ධනය කිරීම

ඉහළ විදේශ විනිමය ඉපැයීම් ලබා ගැනීම සඳහා භාණ්ඩ හා සේවා අපනයන කර්මාන්ත යන දෙකටම සහාය වීමට ජාතික අපනයන ක්‍රමෝපාය උපකාරී වේ. ශ්‍රී ලංකාව නවෝත්පාදනවලින් සමන්විත අපනයන කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ අරමුණින් දැනට පවතින ජාතික

1

අපනයන ක්‍රමෝපාය සකස් කොට ක්‍රියාත්මක කරන ලද අතර, එය 2018-2022 දක්වා වසර 5 තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලදී. ජාත්‍යන්තර වෙළඳාමේ මෑත කාලීන වර්ධනයන්ට සරිලන පරිදි ජාතික අපනයන ක්‍රමෝපාය නවීකරණය කිරීම සහ අපනයන ක්ෂේත්‍රයට අත්‍යවශ්‍ය ප්‍රතිපත්තිමය සහාය ලබා දීම වැදගත් වන අතර එවැනි ප්‍රතිපත්ති ඕනෑම දේශපාලන තන්ත්‍රයක් යටතේ වුව ද බාධාවකින් තොරව අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය. පුළුල් සහ ස්ථාවර ජාතික අපනයන ක්‍රමෝපායක් ක්‍රියාත්මක කිරීම අපනයනවල ස්ථාවර සහ තිරසාර වර්ධනයක් ඇති කිරීමට අපේක්ෂා කරන අතරම නව රැකියා අවස්ථා නිර්මාණය කිරීමට සහ ගෝලීය අගය දාම සහ නිෂ්පාදන බෙදාහැරීම් ජාලයන්හි වැඩි සහභාගීත්වය තුළින් අගය එකතු කිරීමට පහසුකම් සැලසීමට විභවයක් සහිත අපනයන ක්ෂේත්‍රවලට අවස්ථාව සලසා දෙනු ලැබේ. මේ සමඟ, විශේෂයෙන්ම අපනයන අංශය සඳහා අතරමැදි භාණ්ඩ නිෂ්පාදනය කරන කර්මාන්ත සඳහා සහ ප්‍රධාන වශයෙන් ගෝලීය වෙළඳාම කෙරෙහි යොමු වූ කර්මාන්ත සඳහා වෙළඳ අංශයට ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ ක්‍රියාමාර්ග හඳුන්වා දී අධීක්ෂණය කළ යුතුය.

සාම්ප්‍රදායික වෙළඳ භාණ්ඩ අපනයනවලට වඩා ඉහළ විභවයක් සහිත සහ දේශීය අගය එකතු කරන සේවා අංශයේ අපනයන ප්‍රවර්ධනය කිරීමට සමාන අවධානයක් යොමු කළ යුතුය. පාස්කු ඉරු දින ප්‍රහාරවලින් සහ කොවිඩ්-19 වසංගතයෙන් දැඩි ලෙස පීඩාවට පත් වුව ද මෑත වසරවල දී සේවා ගිණුමේ අතිරික්තයට සංචාරක ඉපැයීම් ප්‍රධාන දායකත්වයක් ලබා දී ඇත. සංචාරක ව්‍යාපාරය එහි විභවයන් කරා ළඟා වීම සඳහා අඛණ්ඩව ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රමුඛත්වය දිය යුතුය. භාණ්ඩ හා සේවා අපනයන ඉපැයීම් ශක්තිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍රවලට පැවරීම, ප්‍රවාහන හා වරාය සේවා වැනි අනෙකුත් සේවා අංශ ද ජාතික සැලැස්මට එක් කළ යුතුය.

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ නැංවීම

කොවිඩ්-19 වසංගතයේ අහිතකර බලපෑම් ක්‍රමයෙන් පහව යෑම සහ ඉලක්කගත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමත් සමඟ, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වර්ධනය වීමේ සලකුණු පෙන්නුම් කර ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වන සංක්‍රමණික ශ්‍රමිකයන් සංඛ්‍යාවේ ඉහළ යෑමෙන් විදේශ රැකියා සඳහා පිටත්ව යෑම ඉහළ යමින් පවතින බව පිළිබිඹු වේ. තවද, නිල විනිමය අනුපාතිකය සහ අවිධිමත් වෙළඳපොළ තුළ පවතින විනිමය අනුපාතිකය අතර වෙනස අඩුවීම නිල මාර්ග තුළින් ඉහළ විදේශ ප්‍රේෂණ ආකර්ෂණය කර ගැනීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. විදේශ රැකියා ප්‍රවර්ධනය, විදේශ රැකියා වෙළඳපොළ විවිධාංගීකරණය කිරීම සහ සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ කුසලතා ඉහළ නැංවීම සඳහා ක්‍රියාකාරී පාර්ශ්වකරුවන්ගේ දායකත්වය හරහා ඉහළ ආදායම් සහිත විදේශ රැකියා අවස්ථා වැඩි ප්‍රමාණයක් සුරක්ෂිත කිරීමට අපේක්ෂා කරන අතර, එමගින් පුළුල් වන වෙළඳ හිඟයේ බලපෑම සමනය කර ගැනීම සඳහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් දක්වන දායකත්වය වැඩි කරගත හැක.

විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම

මැදි කාලීනව විදේශීය සෘජු ආයෝජන වැනි ණය නොවන විදේශ මූල්‍ය ප්‍රවාහ යහපත් මට්ටමක පවත්වා ගැනීම සඳහා, ප්‍රතිපත්ති අනුකූලතාව පවත්වා ගැනීම, ව්‍යාපාර පවත්වාගෙන යෑමට අවශ්‍ය තත්ත්ව වැඩිදියුණු කිරීම, ආයතන ශක්තිමත් කිරීම සහ විදේශීය සෘජු ආයෝජනවලට පහසුකම් සැලසීම සඳහා වූ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම හා අනුමැතිය ලබා දීම කඩිනම් කිරීම වැදගත් වේ. කොළඹ වරාය නගරය සංවර්ධනය කිරීම, කොළඹ සහ හම්බන්තොට වරායන් භාණ්ඩ වෙළෙඳ කේන්ද්‍රස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීම සහ දේශීය හා විදේශීය පෞද්ගලික ආයෝජකයින් සඳහා නවීන ආයෝජන කලාප ඇති කිරීම හරහා ඉදිරි කාලසීමාව තුළ සැලකිය යුතු විදේශීය ආයෝජන මෙරටට ගෙන්වා ගැනීමට අපේක්ෂා කෙරේ. දිගුකාලීන සාර්ව ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම පිණිස එවැනි ආයෝජන සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සමීප සම්බන්ධීකරණ සහ අධීක්ෂණ යාන්ත්‍රණයක් අවශ්‍ය වේ.

සමාප්තිය

ආර්ථික ගැළපුම් වැඩසටහනක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාකච්ඡා ආරම්භ කිරීම, විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා කැපවීම, සැලකිය යුතු ලෙස මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම සහ වඩාත් වෙළඳපොළ මත පදනම් වන ලෙස විනිමය අනුපාතිකය පවත්වා ගැනීම ඇතුළුව රජය සහ මහ බැංකුව විසින් ගනු ලබන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග, ඉදිරි කාලපරිච්ඡේදයේ දී ආර්ථිකය තුළ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය යළි ස්ථාපිත කිරීමට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දශක ගණනාවක් තිස්සේ නැවත නැවතත් ඇති වන විදේශීය අංශයේ අස්ථාවරත්වයට මූලික හේතුව ලෙස පැවති විදේශීය ජංගම ගිණුමේ හිඟය සහ රාජ්‍ය මූල්‍ය හිඟය අවම කිරීම සඳහා දිගු කලක් තිස්සේ නොසලකා හරින ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ නුදුරු අනාගතයේ දී හඳුන්වා දීම අත්‍යවශ්‍ය වේ. විදේශීය අංශයට අහිතකර ලෙස බලපාන ආර්ථික ගැටලුවලට ඔරොත්තු දීම සඳහා හිතකර සංචිත මට්ටමක් පවත්වා ගන්නා අතරම, රටේ විදේශීය ණයවල තිරසාර බව සහතික කිරීම සඳහා තිරසාර මට්ටම්වලින් ද්විත්ව හිඟයන් කළමනාකරණය කිරීම ඉතා වැදගත් වන අතර, එමගින් විදේශීය අංශයේ දිගුකාලීන ස්ථාවරත්වය තහවුරු වනු ඇත.

මූලාශ්‍ර

1. Central Bank of Sri Lanka. (1998). *Economic Progress of Independent Sri Lanka.* Colombo: Central Bank of Sri Lanka

2. Central Bank of Sri Lanka. (2011). *40th Anniversary Commemorative Volume.* Colombo: Central Bank of Sri Lanka

හැකියාව සැලකියයුතු ලෙස වර්ධනය කරනු ඇති හෙයින්, එය සතුටුදායක පියවරක් ලෙස සැලකිය හැක. පසුගිය මාස ගණනාවක සිට සිදුවන දිගු හා අඛණ්ඩ විදුලි කප්පාදු හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් සැලකිය යුතු ලෙස අඩාල වී ඇති අතර, එය දැඩි සමාජ නොසන්සුන්තාවයට මෙන්ම, දේශපාලනික වශයෙන් ව්‍යාකූලභාවයක් ඇතිවීමට පවා හේතු වී ඇත. බලශක්ති අර්බුදයක ස්වරූපයෙන් ඇතිවන එවැනි අහිතකර වර්ධනයන්, ආර්ථිකය යථාතත්ත්වයට පත්වීමේ ක්‍රියාවලියට සහ එහි තිරසාරභාවයට සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇත. සමහර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් මෙවැනි දීර්ඝ කාලීන වශයෙන් සිදුවන විදුලි කප්පාදු හේතුවෙන් විශාල වශයෙන් අවදානමට ලක්වන අතර, ඇඟලුම් සහ සේවා අංශයේ සිටින අපනයනකරුවන් ඇතුළු අපනයනකරුවන් ගණනාවකට සිය තරගකාරිත්වය අහිමි වීමට ඇති ඉඩකඩ තුළින් අනෙකුත් තරගකාරී රටවල් වෙත ඇණවුම් ඇදී යෑම සිදුවිය හැක. 2020 වසරේ දී බොරතෙල් මිල ගණන් ශීඝ්‍රයෙන් පහත වැටීම සහ 2021 වසර පුරාවටම පැවති හිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ඉහළ ජල විදුලි උත්පාදනයක් සිදු වුව ද, එවැනි මිල පහළ යෑම්වල ප්‍රතිලාභ අත්කර ගැනීමට ශ්‍රී ලංකාව අපොහොසත් විය. එසේම, පවතින බලශක්ති අංශයේ අර්බුදය මේ දක්වා වර්ධනය වීමට රජය සතු ප්‍රධාන ව්‍යවසයයන්ගේ අඛණ්ඩව පවතින දුර්වල මූල්‍ය තත්ත්වයන් ද යම්තාක් දුරකට හේතුවිය. බලශක්තිය සඳහා වන ඉල්ලුමෙහි අඛණ්ඩ ඉහළ යෑම මධ්‍යයේ, බලශක්ති භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාව සහ සමස්ත විදේශ විනිමය ද්‍රවශීලතාවයේ හිඟකම හේතුවෙන් එම ව්‍යවසායවල දුර්වල මූල්‍ය තත්ත්වය තවදුරටත් උග්‍ර විය. බලශක්ති සඳහා ඉහළ යන ඉල්ලුම තක්සේරු කිරීම සහ එවැනි ඉල්ලුමක් සපුරාලීමට තිරසාර ක්‍රමවේදයන් හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කෙරෙන දිගුකාලීන බලශක්ති සැලැස්මක් නිර්මාණය කිරීම සඳහා රජය සතු ව්‍යවසායයන් වල ඉදිරි දැක්මකින් යුතු සැලසුම් සකස් කිරීම සහ කළමනාකරණයට අමතරව, ඛනිජ තෙල් නිෂ්පාදන සහ විදුලි ගාස්තු යන දෙඅංශයෙහිම පිරිවැය පිළිබිඹුවන මිලකරණයේ වැදගත්කම මෙම වර්ධනයන් මගින් නැවත අවධාරණය කරයි. රජය සතු ව්‍යවසායයන්හි මූල්‍ය ශක්‍යතාව ශක්තිමත් කිරීම සහ සුරක්ෂිත කිරීම සඳහා පමණක් නොව, බැංකු අංශයෙහි සහ සාර්ව ආර්ථිකයෙහි ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ද පිරිවැය පිළිබිඹුවන මිලකරණ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය කාරණයකි. එවැනි යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම මගින් කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ පුරෝකථනය කිරීමේ හැකියාව වැඩිදියුණු කළ හැකි අතර, එමගින් මිල ගණන් ඉහළ දැමීමේ සංශෝධන මෙන්ම මිල පහළ දැමීමේ සංශෝධන සඳහා ද මහජනතාවගේ පිළිගැනීම ලබාගතහැකි වනු ඇත. එබැවින්, එවැනි වෙළඳපොළ පදනම් වූ යාන්ත්‍රණයකට ඕනෑම මිල ඉහළ යෑමක පිරිවැය සහ ඕනෑම මිල පහත වැටීමක් ආශ්‍රිත ප්‍රතිලාභ ඉක්මනින් ලබා දෙමින් රාජ්‍ය ව්‍යවසායයන් සහ පාරිභෝගිකයින් යන දෙඅංශයේම අභිප්‍රායන් සෑම විටකම සුරක්ෂිත වන බව සහතික කළ හැකිය. මේ සම්බන්ධයෙන්, යෝග්‍ය මිලකරණ යාන්ත්‍රණයක් මෙන්ම, බලශක්ති අංශයෙහි සියලු පැතිකඩ කෙරෙහි නිසි අවධානය යොමු කරමින් තිරසාර දිගුකාලීන උපාය මාර්ග සැලසුම් කිරීම සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර පමණක් නොව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, තිරසාර බලශක්ති අධිකාරිය, ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් සහ අනෙකුත් පෞද්ගලික සහ රාජ්‍ය පාර්ශවකරුවන් වැනි අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ද ශක්තිමත් ඒකාබද්ධ ප්‍රයත්නයන් අවශ්‍ය වේ. ඉදිරියේදී, කොළඹ වරාය නගරය, කර්මාන්ත කලාප සහ අනෙකුත් යටිතල පහසුකම් ව්‍යාපෘතිවල සංවර්ධනයත් සමඟ බලශක්ති ඉල්ලුමෙහි ඇතිවන ඉහළ යෑම හා සමගාමීව රටේ ඵලදායීතාව සහ තරගකාරිත්වය උදෙසා විශ්වාසනීයභාවයෙන් යුතු, ප්‍රමාණවත් සහ දැරිය හැකි මිලකට බලශක්ති උපයෝගිතා සැපයීම සහතික කිරීම සඳහා සුදුසු සැලසුම් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ.

කොළඹ වරාය නගරය ව්‍යාපෘතිය තුළින් ආර්ථිකයට ලැබිය හැකි ප්‍රතිලාභ ප්‍රශස්ත මට්ටමින් අත්කර ගැනීම සඳහා අපේක්ෂිත විදේශීය සෘජු ආයෝජන ලැබීම් කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. පාර්ලිමේන්තු පනතක් ප්‍රකාරව මෑතක දී පිහිටුවන ලද කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව මගින්, ව්‍යාපාරවල නිරත වීම සඳහා ලියාපදිංචි කිරීම්, බලපත්‍ර සහ අවසර නිකුත් කිරීම හෝ ලබා දීම, සමස්ත නියාමන අධීක්ෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ ක්‍රියාත්මක කිරීම කොළඹ වරාය නගරය ආශ්‍රිතව පිහිටි රජයේ අලෙවි කළ හැකි ඉඩම් බදු දීම, යනාදිය හරහා රටට ලැබෙන විදේශ සෘජු ආයෝජන සඳහා පහසුකම් සලසයි. තවද, එය ආයෝජකයන් සමඟ සම්බන්ධ වීමේ එකම ස්ථානය ලෙස තනි ආයෝජන පහසුකම් සපයන්නකු ලෙස ස්ථාපිත කර ඇති අතර, අනුමත කිරීම් කඩිනම් කිරීම, ජාත්‍යන්තර මූල්‍ය හා ව්‍යාපාරික මධ්‍යස්ථාන සමඟ ගිවිසුම්වලට එළඹීම සහ ඕනෑම වාණිජමය ආරවුලක් කඩිනමින් විසඳා ගැනීම හරහා ව්‍යාපාර කිරීමේ පහසුව වැඩිදියුණු

1

කිරීම යනාදිය සිදු කිරීම සඳහා එයට බලය ලබා දී ඇත. ආරම්භක අදියර සඳහා දැනටමත් ඉතා විශාල ආයෝජනයක් යොමු වී ඇති පසුබිමක, වර්තමානයේ ප්‍රධාන වර්ධක සාධකවල පවතින හිඟය සැලකීමේදී, ගෝලීය ආර්ථිකයට ඒකාබද්ධ වීමේ ප්‍රධාන මූලශ්‍රයක් ලෙස වරාය නගරයේ දායකත්වය දේශීය ආර්ථිකයට ඉතා වැදගත් වේ. එසේ වුවද, කොවිඩ්-19 වසංගතය සහ භූදේශපාලනික ගැටලු හමුවේ ඇති වූ අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ මෙන්ම, ඉහළ ගිය දේශීය ආර්ථික දුෂ්කරතා හමුවේ, ව්‍යාපෘතියේ මූලික අදියර අවසන් කිරීමේ කාලයේ දී විදේශීය අයෝජකයන්ගේ පැවති ආකල්ප හිතකර නොවීම හේතුවෙන් කොළඹ වරාය නගරය වෙත විදේශීය සෘජු ආයෝජන ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පවතී. කෙසේ වෙතත්, කොළඹ වරාය නගරය දකුණු ආසියාවේ සහ අග්නිදිග ආසියාවේ ප්‍රධාන නගරවලට ආසන්නව ස්ථානගතවී තිබීමේ වාසියක් ඇති බැවින්, ආයෝජකයන් සඳහා වන පහසුකම් වැඩිදියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම කඩිනමින් ආරම්භ කරන්නේ නම්, මැදි කාලීනව රටට විදේශීය සෘජු ආයෝජන ලැබීම් ඉහළ නංවා ගැනීම සඳහා පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, කොළඹ වරාය නගරය, නිශ්චිත නීති හා නියාමන විධිවිධාන මගින් පාලනය වුවද, ආයෝජන සහ ව්‍යාපාර සඳහා දිගු කාලීනව මුල් බැසගත් ව්‍යුහාත්මක බාධක ලිහිල් කිරීම ද ශ්‍රී ලංකාව වෙත ආයෝජකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා ඉතා වැදගත් වේ. එසේම, ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා විභව ආයෝජකයින් වෙත ප්‍රවේශ වීමට ශක්තිමත් සහ ඒ ඒ ආයෝජකයින්ට අවශ්‍ය පරිදි සකස් කළ උපායමාර්ගයක් සලකා බැලිය යුතුය. තවද, කොළඹ වරාය නගරය තුළ මූල්‍ය නගරයක් ලෙස මූල්‍ය සේවා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට යෝජිත බැවින්, ආර්ථිකයට වරාය නගරයෙන් ලැබෙන දායකත්වය සම්පූර්ණයෙන් පිළිබිඹු කිරීම සඳහා මෙම ආර්ථික ක්‍රියාකාරකම් රටේ දළ දේශීය නිෂ්පාදිතයට ග්‍රහණය කර ගැනීම වැදගත් වේ. වරාය නගරය මූල්‍ය මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම තුළින් මූල්‍ය සේවා, තොරතුරු තාක්ෂණය/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වලට පැවරීම යනාදී අපනයන හරහා සේවා ගිණුමට මුදල් ගලා ඒම ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. එසේම, කොළඹ වරාය නගරය තරගකාරී පරිසරයක් තුළ ගෝලීය ආයෝජකයින් වැඩි අවධානයක් යොමු කරන භූදේශපාලනික හා උපායමාර්ගික වශයෙන් වැදගත් ස්ථානයක පිහිටා ඇති බැවින්, කලාපීය සහ ගෝලීය පාර්ශ්වකාර රටවල් සමඟ වූ විදේශීය සබඳතා ශක්තිමත් කිරීමේ අරමුණින් ඕනෑම විදේශ රටක අවශ්‍යතාවයක් සඳහා ශ්‍රී ලංකාවේ නොබැඳි විදේශ ප්‍රතිපත්තියට අනුකූලව කටයුතු කළ යුතුය. එසේම, කොළඹ වරාය නගරය පාලනය කෙරෙන නෛතික ව්‍යුහය මගින් විදේශීය ආයෝජකයින්ට ඉතා හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කරදෙන බැවින්, එය ප්‍රධාන ආර්ථිකයෙන් විභේදනය නොවීම සහතික කිරීම සඳහා ප්‍රවේශම් සහගත ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතුය. වරාය නගරය සඳහා කරන ලද දැවැන්ත ආරම්භක ආයෝජනය සහ අලුතින් ස්ථාපිත කරන ලද ව්‍යවසායන් ලාභ ලැබීමේ තත්ත්වයට පත් වන තුරු කාලය සඳහා සැලකිය යුතු බදු සහන ලබා දී ඇති තත්ත්වයක් තුළ, ව්‍යාපාරවලින් ලැබෙන බදු සහ වෙනත් අය කිරීම් මත සමස්ත ව්‍යාපෘතියේ සාර්ථකත්වය රඳා පවතින අතර, එය ආර්ථික වාසි ලබා ගැනීම සඳහා භාවිතා කළ හැක. කොළඹ වරාය නගරයේ ස්ථාපිත කිරීමට නියමිත වඩාත් දියුණු ව්‍යවසායන් සඳහා අවශ්‍ය කුසලතා එවැනි ව්‍යවසායන් විසින් පිරිනමනු ලබන වැටුප් වාරිකයෙන් පිළිබිඹු වන අතර, එය ශ්‍රී ලංකාවේ සෙසු ප්‍රදේශවලින් පුහුණු ශ්‍රමිකයන් කොළඹ වරාය නගරය වෙත සංක්‍රමණය වීමට හේතු වේ. ආර්ථිකයක් තුළ නවීන අංශයක් හඳුන්වා දීමකදී ප්‍රධාන බලපෑම් දෙකක් අපේක්ෂා කළ හැකිය. පළමුව, පිරිනැමෙන ඉහළ වැටුප් සඳහා ඉහළ ඉල්ලුමක් ඇති කුසලතා අත්පත් කර ගැනීම දිරිමත් කළ හැකි බැවින් ශ්‍රම ඵලදායිතාවයේ සමස්ත වැඩිදියුණු වීමකට එය හේතු වන අතර, ව්‍යුහාත්මක පරිවර්තනයේ වේගවත් වීමක්ද සිදු වනු ඇත. දෙවනුව, නවීන අංශයේ පිරිනැමෙන ආකර්ෂණීය ඉහළ වැටුප් හේතුවෙන් එය ආදායම් ව්‍යාප්තියේ විෂමතාවන්ට හේතු විය හැක. එසේ වුවද, ඉහළ වැටුප් පරතරය ගතික ශ්‍රම වෙළඳපොළක නවීන තාක්ෂණය හා අවශ්‍යතා සමඟ ගැළපීම සඳහා විශේෂිත කුසලතා වර්ධනය කර ගැනීමට කම්කරුවන්ට දිරිගැන්වීමක් ලබා දෙනු ඇත. එසේම, කොළඹ වරාය නගරයේ පුහුණු ශ්‍රමිකයන්ගේ ඉල්ලුමට සරිලන පරිදි අධ්‍යාපන ක්‍රමය පරිවර්තනය කළ යුතු අතර, විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිත විෂයයන් (STEM) සඳහා වැඩි උපාධිධාරීන් පිරිසක් බිහිකිරීමේ ප්‍රයත්නයන් ශක්තිමත් කළ යුතුය. මෙම ව්‍යාපෘතිය හරහා සංචාරක ව්‍යාපාරය නංවාලීම ද අපේක්ෂා කරන අතර, කොළඹ වරාය නගරය සුඛෝපභෝගී ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ හැකියාව සැලකිල්ලට ගෙන ධනවත් සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට හැකි ක්‍රම ගවේෂණය කිරීමද අවශ්‍ය වේ. කොළඹ වරාය නගරයේ පවතින ක්‍රියාකාරකම් සහ නවාතැන් පහසුකම් මගින් ධනවත් සංචාරකයින් ආකර්ෂණය කරගන්නා වෙළඳපොළක් ලෙස ඉලක්ක කර ගත යුතු අතර, ඉහළ මිලක් නියම කිරීමද අවශ්‍ය වේ.

තවද, කොළඹ වරාය නගරය සඳහා නේවාසික වීසා බලපත්‍රලාභීන් ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කරගනිමින්, නේවාසික ආගන්තුක වීසා වැඩසටහන සහ යෝජිත නව ගෝල්ඩන් පැරඩයිස් නේවාසික වීසා වැඩසටහන විදේශයන්ගේ ප්‍රවර්ධනය කළ හැක. සේවාවලින් හිමිවන ආදායම සහ වරාය නගරයට ගලා එන විදේශ ඍජු ආයෝජන මගින් ගෙවුම් තුලනය සඳහා ඉතා අවශ්‍ය, ණය නොවන මූල්‍ය ප්‍රවාහ, මැදි කාලීනව නිර්මාණය කර දෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය යථා තත්ත්වයට පත් කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ප්‍රයත්නයන් ශක්තිමත් කරනු ඇත.

පසුගිය වසර කිහිපය තුළ අඛණ්ඩව ආදායම් රැස් කිරීම අඩු වීම රාජ්‍ය මූල්‍ය අංශය දුර්වලව පැවතීමට සහ සාර්ව ආර්ථික අසමතුලිතතාවන්ට මූලික වශයෙන් හේතු වී ඇති නිසා, ආදායම් රැස් කිරීම සඳහා තිරසාර ක්‍රියාමාර්ග යොදා ගැනීමේ දැඩි අවශ්‍යතාවය එයින් පෙන්නුම් කෙරේ. කලාපීය අනෙකුත් රටවල් හා සංසන්දනයේ දී, ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදම් මධ්‍යස්ථ මට්ටමක පැවතිය ද, අනෙකුත් සංසන්දනාත්මක ආර්ථිකයන්ට සාපේක්ෂව රාජ්‍ය ආදායම් රැස් කිරීම සැලකිය යුතු අඩු මට්ටමක පවතින අතර, පසුගිය දශක දෙකක කාලය තුළ දී එය තවදුරටත් පහත වැටෙමින් පවතී. 2021 වසරේ දී, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම සියයට 8.7ක් වූ අතර, නැගී එන සහ මැදි ආදායම් රටවල එය සියයට 26ක්ව පැවතුණි. පසුගිය වසර දෙක තුළ දී රාජ්‍ය ආදායම තියුණු ලෙස පහත බැසීමට කොවිඩ්-19 වසංගතය සමඟ ආර්ථිකය පසුබෑමට ලක් වීම සහ 2019 වසර අග භාගයේ දී හඳුන්වා දුන් ලිහිල් බදු ක්‍රමය හේතු විය. තවදුරටත්, ශ්‍රී ලංකාවේ බදු නම්‍යතාව සහ බදු ඉපිලුම එකට වඩා අඩු බව ඇස්තමේන්තු කර ඇති අතර, එමගින් බදු ආදායම් රැස් කිරීමේ වැඩි වීම ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රසාරණයට සමගාමීව සිදු නොවන බව පෙන්නුම් කෙරේ.[2] මීට අමතරව, බදු ආදායමෙන් සියයට 75කට වැඩි ප්‍රමාණයක් වක්‍ර බදු මගින් එකතු කෙරෙන නිසා ශ්‍රී ලංකාවේ බදු ක්‍රමය ප්‍රතිගාමී තත්ත්වයකට පත්ව ඇති අතර, එය අඩු ආදායම්ලාභී පවුල් මත විෂමානුපාතිකව ඉහළ බදු බරක් පටවයි. අපේක්ෂිත ආකාරයට ආර්ථික ක්‍රියාකාරකම්වල වර්ධනයට දායක වී නැති බදු නිදහස් කිරීම් සහ බදු විරාම රැසක් ලබා දීම, නිසි සැලැස්මකින් තොරව බදු අනුපාත අඩු කිරීම් සහ බදු නිදහස් සීමාවන් සහ බදු අය කෙරෙන ආදායම් කාණ්ඩවල අගයන් ඉහළ නංවමින් සංශෝධන සිදු කිරීම, බදු පදනම වැඩි කර ගැනීමේ මන්දගාමී බව, ප්‍රගතිගාමී බදු නොමැති වීම, බදු ගෙවීම සම්බන්ධව අනුකූලතාවය අඩු වීම, බදු පැහැර හැරීම සහ බදු ගෙවීම වළක්වා ගැනීම මෙන්ම දුර්වල බදු පරිපාලනය, ශ්‍රී ලංකාවේ බදු ආදායම් රැස් කිරීම අඩු වීමට හේතු වූ ප්‍රධාන සාධක වේ. නිරන්තරයෙන් බදු වෙනස් කිරීම බදු අනුකූලතාවයට අහිතකර ලෙස බලපාන අතර, එමගින් බදු ව්‍යුහයේ ස්ථාවරභාවයට බාධා ඇති කරමින්, බදු පරිපාලන වියදම වැඩි කරයි. අඛණ්ඩව ආදායම් රැස්කිරීම අඩු වීම සාර්ව ආර්ථිකය මත බරපතල ප්‍රතිවිපාක ඇති කරන අතර, ඉහළ අයවැය හිඟයන් සහ දේශීය හා විදේශීය මූලාශ්‍රවලින් සිදු කළ යුතු මූල්‍යනය ඉහළ යෑම, එමගින් රාජ්‍ය ණය වර්ධනය වීම සහ දේශීය මූල්‍ය පද්ධතිය දුර්වල වීම, උද්ධමන පීඩන ඇති වීම, ගෙවුම් ශේෂ ගැටලු ඇති වීම සහ විනිමය අනුපාතික අවප්‍රමාණ වීමේ පීඩනය ඇති වීමට හේතු වෙයි. ආදායම් රැස් කිරීම අඩු වීම නිසා භෞතික හා සමාජීය යටිතල පහසුකම් සඳහා රාජ්‍ය ආයෝජන සිදු කිරීමට රජයට ඇති හැකියාව සීමා කිරීම මගින් දිගු කාලීන ආර්ථික වර්ධනයට බාධා ඇති වේ. දිගු කාලයක් තිස්සේ පැවත එන මෙවන් ගැටලු මගින්, දිගු කාලීන සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ තිරසාර වර්ධනයක් ලබා දෙන, ස්ථාවර සහ තිරසාරව පවතින ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ක්‍රියාවට නැංවීම කඩිනම් කිරීමේ වැදගත්කම අවධාරණය කරයි. මේ සම්බන්ධයෙන්, ඍජු සහ වක්‍ර බදු අනුපාත ඉහළ නැංවීම මෙන්ම බද්දෙන් නිදහස් සීමාවන් පහත හෙළීම, බදු වලින් නිදහස් කිරීම හා බදු අඩු කිරීම සහ බදු විරාම ඉවත් කිරීම තුළින් බදු පදනම පුළුල් කිරීම හරහා කෙටි කාලීනව රාජ්‍ය ආදායම ඉහළ නැංවිය හැක. ඕනෑම බදු සහනයක් ලබා දීමේ දී, ආර්ථික වර්ධනය සහ සමස්ත සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීම තුළින් දිගු කාලීනව රාජ්‍ය මූල්‍ය ශේෂයන් වැඩිදියුණු කිරීම සඳහා එවැනි ප්‍රතිපත්තිවල ඵලදායීතාවය පිළිබඳව නිසි ඇගයීමක් සිදු කළ යුතුය. අපේක්ෂිත සංවර්ධනයට ක්‍රමානුකූලව සහාය වෙන ආකාරයට, අදාළ කර්මාන්තවල මැනිය හැකි කාර්යසාධනයන් පිළිබඳව සලකා බලා මෙවැනි බදු සහන ලබා දිය යුතු අතර, එම සහන කෙටි කාලීනව ක්‍රියාත්මක විය යුතුය. තවද, අඛණ්ඩව ප්‍රසාරණය වන අයවැය හිඟය සඳහා හේතුවන, ආදායම් ඉලක්ක සපුරා නොගැනීම සහ වියදම් ඉක්මවායාම නිවැරදි කර ගැනීමට, පෙර අත්දැකීම් සහ ආර්ථික තත්ත්ව පිළිබඳව සලකා බලමින් තාත්විකව ආදායම් පුරෝකථන සිදු කිරීම සහ ආදායම්

2 බදු ව්‍යුහය නොවෙනස්ව පවතී යැයි උපකල්පනය කරන විට, ද.දේ.නි.යෙහි වෙනස්වීම්වලට ප්‍රතිචාර ලෙස බදු ආදායමේ සිදු වන ආවේණික වෙනස් වීම බදු නම්‍යතාවය මගින් පිළිබිඹු වේ. ද.දේ.නි. වෙනස් වීමේ දී බදු ආදායමේ සිදු විය හැකි මුළු වෙනස් වීම බදු ඉපිලුම මගින් පිළිබිඹු කෙරෙන අතර, එයට බදු අනුපාතික ඉහළ දැමීම සහ බදු පදනම ප්‍රසාරණය කිරීම වැනි රජයේ අභිමතය පරිදි වෙනස් කරන ප්‍රතිපත්තීන්ගේ බලපෑම් ද ඇතුළත් වේ.

1

ඉලක්ක සැකසීම ඉතා වැදගත් වේ. මීට අමතරව, බදු අනුකූලතාව දිරිමත් කිරීම සහ එමගින් ආදායම් එකතු කිරීම වැඩිදියුණු කිරීම සඳහා ස්ථාවර සහ සරල බදු ව්‍යුහයක් පවත්වාගෙන යෑම අත්‍යවශ්‍යය. මේ අතර, බදු එකතු කිරීම වැඩි කර ගැනීමේ තිරසාර බව ඇති වීම, බදු පරිපාලනයේ ප්‍රතිසංස්කරණ සමඟ සාමාන්‍යයෙන් සමපාත වන බැවින්, බදු පරිපාලනය ශක්තිමත් කිරීම ද රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා ඉතා වැදගත් වේ. බදු පරිපාලන ක්‍රියාකාරකම් එකිනෙකා හා සම්බන්ධ වන බැවින්, සමස්තයක් ලෙස බදු පරිපාලන ක්‍රමයේ ස්ථර ගණනාවක බහුවිධ ප්‍රතිසංස්කරණ සිදු කිරීම මගින් බදු පැහැර හැරීම අවම කෙරෙන අතරතුර, අවසානයේ සිදු විය හැකි දූෂණ මැඩලීමත් බදු පරිපාලනයේ ධාරිතාව සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමත් සිදු කළ හැකිය. මේ අනුව, ලියාපදිංචිය සහ බදු ප්‍රකාශ ගොනු කිරීම සම්බන්ධ නීති දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම, මූල්‍ය ආයතන සමඟ වඩා හොඳ සම්බන්ධීකරණයක් තුළින් විගණන සහ නිවැරදි තොරතුරු සනාථ කර ගැනීමේ ක්‍රියාමාර්ග ශක්තිමත් කිරීම, ආයතන අතර ඉහළ සම්බන්ධීකරණයක් සඳහා තොරතුරු තාක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම සහ බදු ප්‍රකාශ ගොනු කිරීම, බදු ගෙවීම සහ වාර්තා කිරීම සඳහා වූ ක්‍රියාපටිපාටි සරල කිරීම, බදු පරිපාලනය දියුණු කිරීමේ දී ඉතා වැදගත් වේ. තවද, කාර්යමණ්ඩලයේ තාක්ෂණික කුසලතා වැඩිදියුණු කිරීම, ආයතනවල කාර්යය සාධනය අධීක්ෂණය, දූරදර්ශී උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ බදු නීති ශක්තිමක් කිරීම තුළින් ආදායම් එකතු කරන ආයතන සවිබල ගැන්වීම මගින් බදු පරිපාලන අයතනවල කළමනාකරණය, පාලනය සහ මානව සම්පත් වැඩිදියුණු කිරීම කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය. විශාල වශයෙන් බදු ගෙවන්නන් රජයේ බදු ආදායම් එකතු කිරීම සඳහා ඉහළ දායකත්වයක් ලබා දෙන බැවින්, ඔවුන් ඉලක්ක කර ගනිමින් බදු පරිපාලන ප්‍රයත්නයන් පුළුල් කිරීම, නියමිත වේලාවට බදු ගොනු කිරීම සහ ගෙවීම සහතික කිරීම සඳහා ඉතා වැදගත් වේ. එපමණක් නොව, ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම ඵලදායී වීමට, ඉහළ දේශපාලනික අභිමතයක් සහ කැපවීමක් සමඟ ප්‍රබල සහ ගැඹුරු සමාජ කතිකාවක් ඇති කර ගැනීම ප්‍රධාන වශයෙන් වැදගත් වේ. ඉහළ බදු අනුකූලතා සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය බදු ගෙවීම් දිරි ගැන්වීම සඳහා රාජ්‍ය වියදම්වල සඵලත්වය සහ කාර්යක්ෂමතාව සහ රාජ්‍ය මූල්‍යනයේ විනිවිදභාවය ද පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ.

රජයේ මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක සාක්ෂාත් කර ගැනීම රඳා පවතින්නේ, රජයේ අරමුණු හා ගැලපෙන, නොවෙනස්ව පවතින, මැනවින් සම්බන්ධීකරණය කළ සහ සාක්ෂි මත පදනම් කර ගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම මතය. පසුගිය වසරවල දී බොහෝ දුරට රාජ්‍ය වියදම් ඇස්තමේන්තු ගත මට්ටම් අභිබවා යමින්, ආදායම් රැස් කිරීම් ඉලක්කගත මට්ටම් සපුරා නොගත් පසුබිමක, පසුගිය කාලසීමාවන්ට අදාළ දත්ත මගින් පෙන්නුම් කරන්නේ, දිගින් දිගටම පැවති රජයන්ගේ රාජ්‍ය මූල්‍ය කටයුතු අයවැය පුරෝකථන සහ මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය නීතිවලින් සැලකිය යුතු ලෙස අපගමනය වී ඇති බවයි. සමස්ත රාජ්‍ය මූල්‍ය සහ සාර්ව ආර්ථික අරමුණුවලට නොගැළපෙන, සැලසුම් නොකළ හදිසියෙන් ගන්නා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙම විචලනයන් සඳහා තුඩු දුන් ප්‍රධාන සාධක අතරින් එකකි. මෙම සැලසුම් නොකළ ප්‍රතිපත්ති මගින් රජයේ ආදායම් සහ වියදම් ශීර්ෂ මෙන්ම, හිඟ මූල්‍යන විධික්‍රම මත ඍජු හෝ වක්‍රාකාරව බලපෑම් ඇති කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාජීය සහ දේශපාලනික වශයෙන් ජනතාවාදී කෙටි කාලීන අරමුණු මුල් කර ගනිමින් ගනු ලබන, සැලසුම් නොකළ හදිසියෙහි ගන්නා ලද රාජ්‍ය ප්‍රතිපත්ති මගින් රජයේ අනාගත අයවැය මත පවා බලපෑම් ඇති කරන අතර, එමගින් ඇති කරනු ලබන දීර්ඝ කාලීන රාජ්‍ය වියදම් වගකීම් නිසා රාජ්‍ය මූල්‍ය අරමුණු සහ පුරවැසියන්ගේ සමස්ත සුභසාධනය සාක්ෂාත් කර ගැනීමේ දී අහිතකර තත්ත්වයක් උදා විය හැකිය. උදාහරණයක් ලෙස, සේවක සංඛ්‍යා අවශ්‍යතාවය නොසලකා හරිමින් රාජ්‍ය අංශය වෙත සිදු කරන මහා පරිමාණ බඳවා ගැනීම්, වේතන වැඩි කිරීමේ දී ඵලදායීත්වය වැඩි කිරීම පිළිබඳව නොසලකා හැරීම සහ ජනතාව අතර නොසන්සුන්කාරී තත්ත්වයක් ඇති කිරීමකින් තොරව අනාගතයේ දී ඉවත් කළ නොහැකි දීමනා/සහනාධාර ලබා දීම නිසා පුනරාවර්තන වියදම් කළමනාකරණය කිරීම සහ තාර්කීකරණය අපහසුදායී කාර්යයක් වී ඇත. ප්‍රකාශිත අයවැයෙන් පරිබාහිරව ප්‍රතිපත්ති සෑදීම, රාජ්‍ය මූල්‍ය හැසිරවීමේ විනයානුකූල බවක් නැතිවීමට සහ පාරදෘශ්‍යභාවය හා වගවීමක් නොමැති වීමට මග පාදන අතර, එය අවිනිශ්චිත ව්‍යාපාර පරිසරයකට හේතු වේ. ඒ අතර, රජයේ කෙටි කාලීන ආදායම් හිඟයන් සපුරා ගැනීමට නිසි සැලසුමකින් තොරව, අතීතය සඳහා බලපාන පරිදි බදු පැනවීම මගින් බදු පද්ධතියේ අස්ථාවර බවක් නිර්මාණය වීම, ව්‍යාපාර සඳහා අවිනිශ්චිත තත්ත්ව ඇති වීම සහ දේශීය සහ විදේශීය ආයෝජකයන්ගේ විශ්වාසය පළුදු වීම මෙන්ම, වැඩි වූ බදු වියදම අවසානයේ දී පාරිභෝගිකයන් මත පැටවෙන නිසා පොදු ජනතාව පීඩාවට පත් වීම සිදු විය හැක. තවද, එක් අංශයක යහපත පිණිස ගන්නා ලද රාජ්‍ය ප්‍රතිපත්ති අනෙකුත්

අංශ කෙරෙහි අයහපත් බලපෑම් ඇති කළ හැකි අතර, එය වක්‍රාකාරව අයවැය මත ද බලපෑමක් ඇති කරයි. එබැවින්, සාක්ෂි පදනම් කර ගත් සහ මනා ලෙස සම්බන්ධීකරණය කළ, සමස්තය පිළිබඳ දැක්මක් සහිතව ප්‍රතිපත්ති සෑදීම, රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සහ රාජ්‍ය මූල්‍ය විනය මත එල්ල විය හැකි අනපේක්ෂිත බලපෑම් අවම කිරීමට අතිශය වැදගත් කාරණයකි. තවද, කෙටි කාලීනව නිසි ඉලක්කයක් නොමැතිව සහනාධාර ලබා දීම් සහ විනයක් නොමැති රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, දීර්ඝ කාලීන රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවන් ඇති වීම සඳහා හේතු වන අතර, එමගින් අවසානයේ දී සාර්ව ආර්ථික ස්ථායීභාවය සහ තිරසාර වර්ධනයට ද බලපෑම් ඇති කර, අනාගත පරම්පරාව මත අධික බදු බරක් පැටවීම සිදු වන බව පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම ඉතා වැදගත් වේ. දිගු කාලීන සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමේ ඵලදායීත්වය මත රජයේ කාර්යසාධනය තක්සේරු කිරීම සම්බන්ධව මහජනතාවගේ ආකල්පමය වෙනසක් ඇති කිරීම සඳහා ද මෙවැනි දැනුම්වත් කිරීම් වැදගත් වේ. මහජනතාව තුළ මෙවැනි ආකල්පමය වෙනසක් ඇති කිරීම තුළින් අදූරදර්ශී සහ ජනප්‍රිය, එහෙත් නිසි පරිදි සැලසුම් නොකළ හදිසි තීරණ මත ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති වෙනුවට, දිගු කාලීන සංවර්ධන අරමුණු සහ සුබසාධනය උපරිම කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛත්වය දීම සඳහා නැවත අවධානය යොමු කිරීමට බලධාරීන් දිරි ගැන්වෙනු ඇත.

ආයෝජකයින්, ණය හිමියන් සහ ශ්‍රේණිගත කිරීමේ ආයතන සඳහා ගැටලු මතු කරමින්, පසුගිය දශක කිහිපය පුරා රාජ්‍ය අංශයේ දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් මධ්‍යම රජයේ ණය ප්‍රමාණය තියුණු ලෙස ඉහළ යෑම රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රධාන ගැටලුවක් ලෙස තවදුරටත් පවතී. දීර්ඝ කාලයක් තිස්සේ පවතින ව්‍යුහාත්මක අයවැය හිඟය, වියදම් අපේක්ෂිත මට්ටම ඉක්මවා යෑම, රජයේ ආදායම නොකඩවා අපේක්ෂිත මට්ටමට වඩා අඩු වීම, ඉහළ යන දළ මූල්‍යන අවශ්‍යතා සහ දිගින් දිගටම බලයට පැමිණෙන රජයන් විසින් සිදු කරන ලද අධික ණය ගැනීම්, රජයේ ණය මට්ටම් සැලකිය යුතු ලෙස ඉහළ යෑමට හේතු වී ඇත. තවද, පසුගිය වසර කිහිපයෙහි වාර්තා වූ මන්දගාමී ආර්ථික වර්ධනය සහ වසංගත තත්ත්වය හේතුවෙන් බලාපොරොත්තු නොවූ ලෙස ආර්ථිකය පසුබෑමකට ලක්වීම නිසා ප්‍රධාන රාජ්‍ය මූල්‍ය අනුපාත පිරිහීමට ලක් වීමෙන් රටේ ණය ගැටලුව තවදුරටත් උග්‍ර වී ඇත. සාර්ව ආර්ථික අභියෝග රැසක් මතු කරමින්, පසු ගිය කාලයේ දී සෑම වසර පහ හයකට වරක්, නාමික වශයෙන්, ණය ප්‍රමාණය දෙගුණ වෙමින්, 2021 වසර අවසානය වන විට, ද. දේ. නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ණය ප්‍රමාණය ඓතිහාසික වශයෙන් වාර්තා වූ දෙවන ඉහළතම අගය වන සියයට 106.8ක් වෙත ළඟා විය. ඉහළ මට්ටමේ රාජ්‍ය ණය ප්‍රමාණයක් පැවතීම, සාර්ව ආර්ථික කම්පනයන් දරා ගැනීමට ආර්ථිකයේ ඇති හැකියාව අඩු වීමේ අවදානම උත්සන්න කරයි. වර්ධනය වන රාජ්‍ය ණය මගින් ආර්ථිකය සමතුලිතතාවයේ පවත්වා ගැනීමට ව්‍යාපාර චක්‍රයට ප්‍රතිරූපීව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම සඳහා පවතින ඉඩකඩ සීමා කරන අතර, පහළ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් හා බැඳුණු ඉහළ ගිය අවදානම් වාරික (risk premia) සහ ණය ගැනීමේ පිරිවැය හරහා පුද්ගලික අංශය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරනු ලබයි. මෙමගින් ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් වීම බරපතල ලෙස සීමා විය හැකි අතර, තවදුරටත් ආර්ථිකය සංකෝචනය වීමට ද එය හේතු විය හැකිය. එම නිසා, අපේක්ෂිත මට්ටමට වඩා ආර්ථික වර්ධනය දුර්වලව පවතින කාල සීමාවන්හි වුවද ණය ප්‍රමාණය අඩු කර ගනිමින් ණය කළමනාකරණය කර ගත හැකි මට්ටමකට ස්ථායී කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය දැඩිව ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පැන නැඟී ඇත. මීට අමතරව, දිගු කාලීනව ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා සෞඛ්‍ය, අධ්‍යාපනය සහ යටිතල පහසුකම් ආදී වූ අවශ්‍ය අංශ සඳහා ආයෝජනය කිරීමට රජයට ඇති ශක්‍යතාව අඩු වීම සහ විශේෂයෙන් රජයේ වියදම් වැඩි වීම නිසා ආර්ථිකයේ ඇති අරමුදල් සීමා වීමෙන් පෞද්ගලික ආයෝජන සිදු කිරීමට ඇති හැකියාව සීමා වීම නිසා, අධික ණය බර රටේ දිගු කාලීන ආර්ථික වර්ධනයට අහිතකර බලපෑම් කළ හැකිය. ඒ අතර, රාජ්‍ය මූල්‍ය හිඟය අධික ලෙස මුදල් අධිකාරිය මගින් මූල්‍යනය කරනු ලබන විට, රටේ ඉහළ ණය මට්ටම් හා ඉහළ ණය සේවාකරණ වියදම් පැවතීම බොහෝ විට මූල්‍ය ප්‍රතිපත්තියේ සාර්ථකත්වය සඳහා අභියෝග මතු කරයි. තවද, ණය මට්ටම ඉහළ යාම නිසා අනාගත බදු ව්‍යුහයේ විෂමතාවන් ඇති වීම, අවිනිශ්චිතතා ඇති වීම සහ මූල්‍ය පද්ධතිය අස්ථාවරත්වයට පත් වීමේ හැකියාව වර්ධනය වේ. මුළු ණය ප්‍රමාණයට සාපේක්ෂව විදේශ ණය ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතීම සහ අහිතකර කල් පිරීම් ව්‍යුහය හේතුවෙන් ඉදිරි වසර කිහිපය තුළ විදේශ ණය සේවාකරණ වගකීම් රැසක් කල් පිරීමේදී ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය බර විදේශීය අංශයේ අවදානම් සහගත තත්ත්වය වැඩි වීමට හේතු වී ඇත. පමණට වඩා සුබවාදී ආදායම් ඉලක්ක සහ දුර්වල ආදායම් රැස් කිරීම්, දිගින් දිගටම ඇති වන ප්‍රාථමික හිඟයන්, අපේක්ෂිත මට්ටමට ළඟා නොවූ ආර්ථික වර්ධනය, සහනදායී මූල්‍ය ප්‍රවාහ නොලැබීම

1

සහ විදේශීය ණය ගැනීම් විදේශ විනිමය ඉපයිය හැකි ඵලදායී ව්‍යාපෘති සඳහා යොදා නොගැනීම නිසා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ඉලක්කයන් සපුරාලීම දුර්වලව වීම, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ගමන්මග ඉහළ මට්ටමක පැවතීම කෙරෙහි හේතු වී ඇත. ණය වර්ධනය වීම අඩු කිරීමට, දේශීය සහ විදේශීය ණයවලට අදාළව ණය පොලී ගෙවීම් සඳහා අමතර ණය ගැනීම් ක්‍රමවත්ව අඩු කිරීම සඳහා රජයේ මූල්‍ය කළමනාකරණය ක්‍රමානුකූලව යහපත් අතට පත් කිරීම අත්‍යවශ්‍යය. එබැවින්, රාජ්‍ය මූල්‍ය විනයක් ඇති කර ගැනීමට කැප වීම සහ දැඩි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් ඇති කර ගැනීම ඔස්සේ, ප්‍රාථමික ශේෂයේ සැලකිය යුතු අතිරික්තයක් ඇති කිරීම හරහා ණය තිරසාරබව ආරක්ෂා කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම අතිශය වැදගත් වේ. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතෙහි දක්වා ඇති රාජ්‍ය මූල්‍ය නීතිවලට එනම්, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය ඇති කර ගැනීමට අවශ්‍ය රාජ්‍ය මූල්‍ය සමාහාර මත දිගු කල් පවත්නා සීමා පැනවීමට අනුකූල වීම සඳහා විශ්වාසනීය කැපවීමක් අවශ්‍ය වේ. එමගින් අධික වියදම් සිදු කිරීමට පෙළඹීම අඩු කිරීම සහ රාජ්‍ය මූල්‍ය පාරදෘශ්‍යභාවය සහ වගවීම තහවුරු කිරීම සිදු වේ. ස්වෙච්ඡා සහ වගකීම් බැඳීමකින් තොරව ඇති කර ගන්නා රාජ්‍ය මූල්‍ය නීති වෙනුවට, වගකීමක් සහිත බැඳීමක් ඇති රාජ්‍ය මූල්‍ය නීති ක්‍රියාත්මක කිරීම මගින් රාජ්‍ය මූල්‍ය විනය තවදුරටත් ශක්තිමත් කළ හැකිය. තවද, මූර්ත ආර්ථික කටයුතුවලට අදාළව මුහුණ දී තිබෙන කෙටි කාලීන දුෂ්කරතා නොතකමින්, විදේශ ව්‍යවහාර මුදල් ලැබීම් සහ ගෙවීම් කළමනාකරණය කිරීමෙන් සංචිත යළි ඉහළ නැංවීමට ප්‍රයත්න දැරීමට කටයුතු කළ යුතු වේ. අකාර්යක්ෂම රාජ්‍ය ව්‍යවසායයන්වල දිගු කලක් තිස්සේ පවතින අලාභ රජයේ අසම්භාව්‍ය වගකීම් බවට පරිවර්තනය වීමේ වැඩි ඉඩකඩක් පවතින හෙයින්, පිරිවැය පිළිබිඹු වන මිල යාන්ත්‍රණ සහ කාර්යක්ෂම පාලන ව්‍යුහයක් ඇති කිරීම වැනි රාජ්‍ය ව්‍යවසායයන්ට අදාළව දිගු කලක සිට සිදු කළ යුතුව පවතින ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. මීට අමතරව, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ණය අනුපාතය අවම කිරීම සඳහා දිගු කාලීන ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය අතර, තිරසාර ආර්ථික වර්ධනය ඇති කර ගැනීම සඳහා පවතින බාධක ඉවත් කර ගැනීමට ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ වැදගත් වේ. පවතින සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය පිළිබඳව සලකා බලන විට, අනාගතයේ මධ්‍යම රජයේ ණය වර්ධනය සීමා කර ගැනීමට, පාරදෘශ්‍ය සහ කාර්යක්ෂම අරමුදල් භාවිතය තහවුරු කරමින් ඉහළ ආර්ථික ඵලදායී අනුපාතික ලබා ගැනීමට අවධානය යොමු කරමින්, දැනට සැලසුම් කෙරෙමින් පවතින විදේශ අරමුදලින් ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති ආර්ථික ප්‍රමුඛතාවලට අනුකූලව විධිමත් කළ යුතුය. තවද, සහනදායී මූල්‍යන මූලාශ්‍ර යොදා ගැනීම මගින් රජයේ ණය තිරසාර බවට අදාළ ඉලක්ක සපුරා ගැනීමට සහ සාර්ව ආර්ථික පදනම ශක්තිමත් කර ගැනීමට උපකාරී විය හැකිය. උදාහරණයක් ලෙස, තිරසාර යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා හරිත/නීල මූල්‍යන විකල්ප භාවිත කිරීමෙන් අඩු පොලී අනුපාතික සහ ආපසු ගෙවීමේ කාල සීමා දිගු කර ගැනීම වැනි ණය ගැනීම සඳහා වඩා හිතකර කොන්දේසි යටතේ ණය ලබා ගැනීමට හැකි වනු ඇත.

කොවිඩ්-19 වසංගතය නිසා රටේ ආර්ථිකයේ ඇති වූ පසු බැසීමත් සමඟ කටයුතු කරන අවස්ථාවක, ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය කිරීම උදෙසා, ගුණාත්මක බව සහ කාර්යක්ෂමතාවය සම්බන්ධයෙන් රාජ්‍ය අංශයේ සේවා සැපයීම වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පෙරට වඩා තීරණාත්මක සාධකයක් බවට පත් වී ඇත. අත්‍යවශ්‍ය පොදු භාණ්ඩ හා සේවා සැපයීම, යටිතල පහසුකම් සඳහා සාර්වසහභාගී සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම, සහ පුද්ගලික අංශයේ ආයෝජන හා ආර්ථික වර්ධනය ධෛර්යමත් කිරීමේ අරමුණින් හිතකර ව්‍යාපාරික පරිසරයක් නිර්මාණය කිරීම හරහා රාජ්‍ය අංශය ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාදාමයේ අනිවාර්ය අංගයක් බවට පත් වී ඇත. විශේෂයෙන් මෑත අතීතයේ කොවිඩ්-19 වසංගතයට එරෙහිව සටන් කිරීම සහ සමාජ ආර්ථික දුෂ්කරතා අවම කිරීම සඳහා රාජ්‍ය අංශයේ ඇතැම් උප අංශ විසින් ඉටු කරන ලද කාර්යභාරය නිසා, රාජ්‍ය අංශයේ වැදගත්කම යළිත් පැහැදිලි විය. වසංගතය මධ්‍යයේ ආර්ථිකය ක්‍රමයෙන් 'නව සාමාන්‍ය' තත්ත්වයට අනුගත වෙමින් වර්ධන වේගයක් නැවත අත්කර ගනිමින් සිටින බැවින්, වසංගතයෙන් පීඩාවට පත් පුද්ගලයන්ට සහ දේශීය සහ විදේශීය ආයෝජකයින් ඇතුළු ව්‍යාපාරික ප්‍රජාවට සහාය වීම සඳහා රාජ්‍ය අංශයේ සම්පත් කාර්යක්ෂමව බෙදා යාම සහ රාජ්‍ය පරිපාලනය හා ව්‍යාපාර සඳහා පහසුකම් සැපයීම සම්බන්ධ රාජ්‍ය නිලධාරිවාදය අවම කිරීම වැදගත් වේ. කෙසේ වෙතත්, පෞද්ගලික අංශය විසින් කාර්යක්ෂමව යොදා ගැනීමට ඉඩ තිබූ මූල්‍ය සහ ශ්‍රම සම්පත්වලින් සැලකිය යුතු කොටසක් රාජ්‍ය අංශය විසින් භාවිතා කරන බැවින්, රාජ්‍ය අංශයේ වර්ධනය වන අකාර්යක්ෂමතාවය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වන රාජ්‍ය මූල්‍ය බර, ප්‍රතිපත්ති සමාලෝචනවල දී සාකච්ඡා කෙරෙන දිගුකාලීන ගැටලුවක් බවට පත් වී ඇත. මේ අතර රටෙහි පවත්නා වසංගත තත්ත්වය හමුවේ

විශේෂ සටහන 3
රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය : සාර්ව ආර්ථික රාජ්‍ය මූල්‍ය ස්ථායීතාව සඳහා ගමන්මග

වසංගත කාලය තුළ රාජ්‍ය මූල්‍ය තත්ත්වය

කොවිඩ්-19 වසංගතයට ප්‍රතිචාර ලෙස ලොව පුරා ක්‍රියාත්මක වූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් වසංගතයෙන් ආර්ථිකයන් මත දිගු කාලීන අහිතකර බලපෑම් ඇති වීම පාලනය කර, පශ්චාත් වසංගත කාලපරිච්ඡේදය තුළ දී ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීම සඳහා අවකාශය සලසා දී ඇත. එනමුත්, එම ප්‍රතිපත්ති නිසා රාජ්‍ය මූල්‍ය තත්ත්ව කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති වී, අදාළ රටවලට මූල්‍ය දුෂ්කරතාවලට මුහුණදීමට සිදු වී තිබේ. අනපේක්ෂිත සහ පෙර නොවූ පරිදි ඇතිවූ ප්‍රධාන ආර්ථික අභියෝගයට ප්‍රතිචාර වශයෙන් විවිධ රටවල ක්‍රියාත්මක කෙරුණු කඩිනම් රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග, ප්‍රමාණය, වර්ගය සහ ආවරණය කල පුද්ගලයන් සංඛ්‍යාව අනුව එකිනෙකට අසමාන වූ අතර, මෙම රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග එක් එක් ආර්ථිකයේ නිශ්චිත ව්‍යුහාත්මක, ආවේණික සාධක සහ රාජ්‍ය මූල්‍ය අවකාශය මත රඳා පැවතුණි. නැගී එන කුඩා වෙළඳපොළ ආර්ථිකයන් සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් හා සසඳන විට, නැගී එන විශාල වෙළඳපොළ ආර්ථිකයන් සහ සංවර්ධිත ආර්ථිකයන් තුළ එවැනි රාජ්‍ය මූල්‍ය සානුබල ලබා දීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය අවකාශයක් සහිත, වඩා යහපත් වාතාවරණයක් පැවතුණි. රටවල් බොහොමයක පොදුවේ ක්‍රියාත්මක කෙරුණු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අතරට සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා දරන වියදම් වැඩි කිරීම, විරැකියා ප්‍රතිලාභ සහ වෙනත් සහන සැපයීම, බදු සහන සහ බදු කල්දැමීම්, ද්‍රවශීලතා සහාය සැපයීම්, ප්‍රාග්ධනය යෙදවීම් වැනි රජයේ අය වැය හරහා සෘජුව ක්‍රියාත්මක කෙරුණු මෙන්ම පියවීම කල් දැමූ ණය සඳහා ඇපකර සැපයීම වැනි වක්‍ර ක්‍රියාමාර්ග ද ඇතුළත් වේ. දිගින් දිගට ම අය වැය හිඟ පවත්වා ගැනීම හරහා රාජ්‍ය මූල්‍ය සානුබල ලබා දීම සහ වසංගතයේ දිගු කාලයක් පුරා වට පවතින බලපෑම් මෙන්ම, ආර්ථික වර්ධනය මන්දගාමී වීම හේතුවෙන් බොහෝ ආර්ථිකයන්හි රාජ්‍ය මූල්‍ය මෙහෙයුම්වලට පීඩනයන් ඇති වී ඇති අතර, එය ඔවුන්ගේ සාර්ව ආර්ථික ස්ථායීතාවයට තර්ජනයක් වී ඇත.

අනෙකුත් පහළ මැදි ආදායම් සහ වෙළඳපොළ ප්‍රවේශයක් සහිත බොහෝ රටවල වාර්තා වූ අන්දමටම, වසංගත ව්‍යාප්තිය සහ ඒ ආශ්‍රිත අවිනිශ්චිතතා හේතුවෙන්, මූලික වශයෙන් රාජ්‍ය මූල්‍ය අංශය ද ඇතුළුව ශ්‍රී ලංකා ආර්ථිකයටම දැඩි බලපෑමක් ඇති වී තිබේ. විශාල වශයෙන් රාජ්‍ය මූල්‍ය මැදිහත්වීමක් සිදු කිරීමට තරම් ප්‍රමාණවත් මූල්‍ය අවකාශයක් නොතිබුණ ද, වසංගතය ආරම්භයේ සිට ම ප්‍රමුඛතාවය ලැබිය යුතු ගැටලු විසඳීම සඳහා රාජ්‍ය මූල්‍ය සානුබල ගණනාවක් සැපයීමට ශ්‍රී ලංකා රජය කැපවී සිටියේය. සෞඛ්‍ය සේවා සහ වසංගත පාලන ක්‍රියාමාර්ග මෙන්ම අවදානමට ලක්විය හැකි කණ්ඩායම් වෙත මූල්‍යමය හා ද්‍රව්‍යමය වශයෙන් සහනාධාර ලබා දීම සඳහා විශාල වියදමක් දැරීමට සිදු වීමත් සමඟ, 2020 සහ 2021 යන වසරවල දී රජය විසින් අවම වශයෙන්, පිළිවෙළින්, රුපියල් බිලියන 117.5ක් සහ රුපියල් බිලියන 165.6ක් වසංගතය ආශ්‍රිත වියදම් ලෙස වැය කර ඇත. මන්දගාමී ආර්ථික කටයුතු නැවත වර්ධනය කිරීම සඳහා රජය විසින් 2019 වසර අග භාගයේ සිට ලිහිල් බදු ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලද අතර, මෙම අවම බදු පරිසරය වසංගත කාලපරිච්ඡේදය තුළ දී ද පවත්වාගෙන යනු ලැබිණි. මෙම කාලය තුළ දී ඖෂධ වැනි ඇතැම් අත්‍යවශ්‍ය ආනයන සඳහා බදු සහන කිහිපයක් ද ලබා දෙන ලදී. අඩු බදු අනුපාතික පැවතීම සහ බද්දෙන් නිදහස් සීමාවන් ඉහළ දැමීම හේතුවෙන් බදු පදනම පහළ යෑම මෙන්ම, ආර්ථික වර්ධනයේ අඩු ක්‍රියාකාරිත්වය හේතුවෙන් වසංගත කාලය තුළ දී රාජ්‍ය ආදායම තියුණු ලෙස පහළ ගියේය. ඒ අනුව, 2020 සහ 2021 යන වසරවල දී රාජ්‍ය මූල්‍ය හිඟය, පිළිවෙළින්, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 11.1ක් සහ සියයට 12.2ක් දක්වා වර්ධනය විය. මේ අතර, 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී ප්‍රකාශයට පත් වූ, කොවිඩ්-19 වසංගතය සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිමය ප්‍රතිචාර පිළිබඳ රාජ්‍ය මූල්‍ය අධීක්ෂණ දත්ත පද්ධතියට (Fiscal Monitor Database of Fiscal Policy Responses to COVID-19 Pandemic - October 2021) අනුව, ශ්‍රී ලංකා රජය විසින් වසංගතය ආශ්‍රිතව සිදු කරන ලද අතිරේක වියදම සහ අය නොකර අත්හැර දැමූ ආදායමේ මුළු අගය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.1ක් පමණ වූ අතර, එය ඉන්දියාව (සියයට 4.1), පාකිස්තානය (සියයට 2.0), බංගලාදේශය (සියයට 2.3) සහ මාලදිවයින (සියයට 8.0) වැනි ඇතැම් කලාපීය සම රාජ්‍යයන් හා සසඳා බැලීමේ දී පහළ අගයක් විය. මීට අමතරව, පැවති සීමිත රාජ්‍ය

රූප සටහන වි.ස. 3.1
රාජ්‍ය වියදම සහ රාජ්‍ය ආදායම



මූලය: මුදල් අමාත්‍යාංශය

1

මූල්‍ය අවකාශයත් සමඟ කළහැකි දේ සීමා වීම හමුවේ ශ්‍රී ලංකාවේ වසංගතයෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා ප්‍රධාන වශයෙන්ම ලිහිල් මුදල් ප්‍රතිපත්තිය ඔස්සේ සහාය ලබා දෙන ලදී. තවද, වසංගතය මධ්‍යයේ විදේශ විනිමය ගලා ඒම් පහළ යෑම සහ සැලකිය යුතු අන්දමේ ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් රාජ්‍ය මූල්‍ය සහ විදේශ අංශ මත තවදුරටත් පීඩනයක් ඇති විය. නව විදේශීය මූල්‍යන මූලාශ්‍ර සඳහා පැවති මාර්ග සීමිත වීම, ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළෙහි ද්‍රවශීලතාව සීමා වීම මෙන්ම, ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහළ දැමීම සමඟ, රාජ්‍ය මූල්‍ය පරතරය පියවීම සඳහා විශේෂයෙන්ම මහ බැංකුව සහ බැංකු අංශය ඔස්සේ වැඩි වශයෙන් දේශීය ණය ලබා ගැනීමට රජයට සිදු විය. එවැනි රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා හේතුවෙන් රාජ්‍ය ණය, 2020 වසර සහ 2021 වසර අවසානය වන විට, පිළිවෙළින්, ද.දේ.නි.යෙන් සියයට 100.6ක් සහ 104.6ක් දක්වා ඉහළ ගියේය.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ වත්මන් දුර්වල රාජ්‍ය මූල්‍ය තත්ත්වය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වී තිබෙන සාර්ව ආර්ථික ගැටලු සම්පූර්ණයෙන්ම වසංගත තත්ත්වය හේතුවෙන් පමණක් නිර්මාණය වී නොමැති අතර, එම ගැටලු රාජ්‍ය මූල්‍ය අංශයෙහි දිගු කාලයක සිට පවතින සහ නොවිසඳුනු ගැටලුවල පිළිබිඹුවක් වේ. ශ්‍රී ලංකාව දශක කිහිපයක සිට, දිගින් දිගටම පවත්නා රාජ්‍ය මූල්‍ය හිඟයන්ගෙන් පීඩාවට පත් ව ඇති අතර, එම තත්ත්වය හමුවේ දේශීය සහ විදේශීය වෙළඳපොළෙන් අඛණ්ඩව ණය ලබා ගැනීමට රජයට සිදුවී ඇත. රාජ්‍ය ණය විශාල ලෙස වර්ධනය වීමට එම තත්ත්වය හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඵලදායී ආයෝජන සඳහා ඇති අවස්ථාව සීමා කරමින්, රාජ්‍ය ආදායමෙහි සහ රට වෙත ගලා එන විදේශ ව්‍යවහාර මුදල්වල විශාල කොටසක් ණය සේවාකරණ ගෙවීම් සඳහා යොමු කිරීමට සිදු වී ඇත. 1994 වසරේ සිට, අවම වශයෙන් රජයේ වර්තන වියදමවත් සපුරා ගැනීමට රජයේ ආදායම් සහ ප්‍රදාන ප්‍රමාණවත් වී නොමැති අතර, ඒ හේතුවෙන් අනාගත ආර්ථික වර්ධනයට සහ ණය ආපසු ගෙවීම සඳහා රටේ පවතින ශක්‍යතාවට සාමාන්‍යයෙන් දායකත්වයක් නොදක්වන වර්තන වියදම් පියවා ගැනීම සඳහාත් රජයට ණය ලබා ගැනීමට සිදු විය. තවද, ගැටලුවේ බරපතල බව වඩාත් තීව්‍ර කරමින්, රූප සටහන වි.ස.3.1හි දක්වා ඇති පරිදි, 2020 සහ 2021 යන වසරවල දී වැටුප්, විශ්‍රාම වැටුප් සහ පොලී ගෙවීම් ඇතුළත් පහසුවෙන් අඩු කළ නොහැකි වියදම්වලට සාපේක්ෂව රජයේ ආදායම් සහ ප්‍රදාන බෙහෙවින් පහළ අගයක පැවතිණි. 2019 වසර අවසානයේ දී ප්‍රකාශයට පත් කරන ලද පෙර නොවූ අන්දමේ විශාල බදු අඩු කිරීම් හේතුවෙන් රජයට ලැබෙන ආදායම අඩු වීමේ ගැටලුව තවදුරටත් උග්‍ර වූ අතර, ඒ හේතුවෙන් 2020 සහ 2021 කාලපරිච්ඡේදය තුළ දී අයවැය හිඟය පියවීම සඳහා රජයට මුදල් සැපයීමට මහ බැංකුවට සිදු විය.

පසුගිය වසර ගණනාවක් පුරාවට සමස්ත අයවැය හිඟය සහ ණය මට්ටම් තිරසාර මට්ටමක් දක්වා අවම කිරීම සඳහා වන රජයේ ඉලක්කයන් පැහැදිලි කරමින් අයවැය කතාව සමඟ ඉදිරිපත් කෙරෙන මැදි කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව මින් පෙර යථාර්ථයක් බවට පත් වී නොමැති බව සැබෑ දත්ත සහ ඇස්තමේන්තුවල වෙනස මගින් පිළිබිඹු වේ. රාජ්‍ය ආදායම සම්බන්ධයෙන් අයවැය තුළ ප්‍රකාශිත පහසුවෙන් ළඟා කරගත නොහැකි ඉලක්ක සහ එම අධි තක්සේරු කළ ආදායම් පුරෝකථනවලට අනුකූලව වාර්ෂික වියදම් සැලසුම් කිරීම හේතුවෙන් සෑම විටම අයවැය හිඟය අපේක්ෂිත අගයට වඩා පුළුල් වී ඇත. මේ අතර, 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත බලාත්මක කිරීම මගින් වගකීම් සහිතව රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, විචක්ෂණ ණය කළමනාකරණය සහ ජනතාව සඳහා රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ නිරීක්ෂණයට ඇති අවස්ථාව තහවුරු කරන රාජ්‍ය මූල්‍ය නීති ඉදිරිපත් කර තිබුණ ද, ඒවා වගකීමෙන් බැඳෙන නීති නොවේ.

රූප සටහන වි.ස. 3.2
රාජ්‍ය ආදායම - අයවැය ඇස්තමේන්තු සහ සැබෑ ආදායම

මූලය: මුදල් අමාත්‍යාංශය

රූප සටහන වි.ස. 3.3
රාජ්‍ය වියදම - අයවැය ඇස්තමේන්තු සහ සැබෑ වියදම



මූලය: මුදල් අමාත්‍යාංශය

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතෙහි නියම කර ඇති රජයේ අය වැය හිඟය, රාජ්‍ය ණය සහ රජයේ අසම්භාව්‍ය බැරකම් මත පැන වූ සීමාවලට අදාළ මෙම රාජ්‍ය මූල්‍ය නීති සංඛ්‍යා සටහන වි.ස.3.1 හි දක්වා ඇති පරිදි පසු කාලීනව සංශෝධනය කර ඇත. දිගින් දිගටම බලයට පත් සෑම රජයක්ම අය වැය හිඟය සම්බන්ධ රාජ්‍ය මූල්‍ය නීති අනුව කටයුතු කර නොමැති අතර, රාජ්‍ය ණය අවම කිරීම සහ අසම්භාව්‍ය බැරකම් මත පැනවූ සීමාවලට අදාළ රාජ්‍ය මූල්‍ය නීති ඉලක්ක නිශ්චිත සන්ධිස්ථානවල දී සපුරා නොමැත. ඒ වෙනුවට, ඉලක්ක සැපිරිය යුතු කාලසීමාව කිහිපවරක් දීර්ඝ කරමින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත සංශෝධනය කර ඇති අතර, අවස්ථා කිහිපයක දී පරිපූරක අයවැය සඳහා අනුමැතිය ලබා ගෙන ඇත. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා යෝජිත දැක්මක් තිබුණ ද, විචක්ෂණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් ඇති කිරීම සඳහා දැඩි කැපවීමක් නොපැවතුණි.

දුර්වල රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය මගින් මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව මත ඇති කරන බලපෑම

සාජන්ට් සහ වොලස්ට (1981) අනුව, රාජ්‍ය මූල්‍ය ආධිපත්‍යය මධ්‍යයේ, රජයේ අයවැය හිඟය ඉහළ මට්ටමක පවත්වා ගනිමින් රාජ්‍ය මූල්‍ය කටයුතු සිදු කරන විට, රජයේ ණය ගෙවීමට ඇති හැකියාව තහවුරු කිරීම සඳහා මුදල් අච්චු ගැසීමෙන් රජය වෙත ආදායම් උත්පාදනයක් කිරීමට මහ බැංකුවට සිදු වේ. ඉහළ ණය බරක් සහිත පසුබිමක මුදල් ප්‍රතිපත්තිය ඔස්සේ පමණක් උද්ධමනය ඉලක්ක කිරීම සාර්ථක නොවනු ඇති බව බ්ලැන්චර්ඩ් (2004) විසින් ද පැහැදිලි කරනු ලබයි. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් ඇති කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය අධිකාරය එකඟ නොවේ නම්, උද්ධමනය ඉලක්කගත මට්ටමක පවත්වා ගෙන යාමේ අරමුණ ඇතිව මූර්ත පොලී අනුපාතිකය ඉහළ නැංවීමට මුදල් අධිකාරය දරන ප්‍රයත්නය හේතුවෙන් ණය ලබා ගැනීමේ පිරිවැය ඉහළ යෑම නිසා රජයේ ණය මට්ටම ඉහළ යෑමේ ගැටලුව තවදුරත් උග්‍ර වනු ඇත. තවද, ඉහළ යන ණය මට්ටම මගින් ස්වෛරීත්ව ණය පැහැර හැරීමේ අවදානම ඉහළ නැංවීමටත්, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ පීඩනය ඇති කිරීමටත් ඉඩ ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අඩු උද්ධමනයක් වෙනුවට වඩා ඉහළ උද්ධමනයක් ඇති වනු ඇත. එබැවින්, ඉහළ ණය මට්ටමක් ඇති පසුබිමක, උද්ධමනය පාලනය කිරීමට මුදල් ප්‍රතිපත්තිය පමණක් භාවිත කිරීම වෙනුවට, රජයේ අයවැය හිඟයන් අවම කිරීමටත්, එමගින් රජයේ ණය ප්‍රමාණය අඩු කිරීමටත් උත්සාහ ගැනීම හරහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය ඔස්සේ උද්ධමනය කළමනාකරණය කළ යුතු බව බ්ලැන්චර්ඩ් (2004) අවධාරණය කරයි. මේ අතර, ඇතැම් වියතුන්, රාජ්‍ය ණය ඉහළ යෑම කළමනාකරණය කර ගැනීමට විසඳුම් ලෙස උද්ධමනය සහ මූල්‍ය අවරෝධනය[1] යොදා ගත හැකි බවට තර්ක කර ඇත (Reinhart & Sbrancia, 2011). කෙසේ වෙතත්, දිගු කාලීන මූල්‍ය අවරෝධනය හේතුවෙන් මූල්‍ය පද්ධති ස්ථායීතාව සඳහා හානිකර විය හැකි වන්නේ, විශේෂයෙන්ම රජය විසින් දේශීය බැංකුවලින් පාලනයකින් තොරව අධික ලෙස ණය ලබා ගන්නා විට බැංකුවල ද්‍රවශීලතාව සීමිත වීමේ තත්ත්වයක් ද බැංකුවල ශේෂ පත්‍ර පිරිහීමට ලක් වීමක් ද සිදුවන හෙයිනි. අනෙක් අතට, ආර්ථිකය තුළ උද්ධමනය ඉහළ යෑමට ඉඩ සලසමින් නාමික දළ දේශීය නිෂ්පාදිතය වර්ධනය වීම හරහා අයවැය ශේෂය මෙන්ම, ණය හා ද.දේ.නි. අතර අනුපාතය යහපත් තත්ත්වයකට හැරවීමට උත්සාහ කිරීම මගින් අපේක්ෂිත ප්‍රතිඵලයට විරුද්ධ ප්‍රතිඵලයක් ගෙන දීමට ඉඩ ඇත. විශේෂයෙන්ම වෙළඳපොළ පාර්ශ්වකරුවන් විසින් රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතිකය තීරණය කිරීමේ දී ඉහළ උද්ධමන අපේක්ෂා ද ඇතුළත් කර ගැනීමත්, එමගින් රජයේ ණය ලබා ගැනීම් පිරිවැය ඉහළ යෑමත් ඒ සඳහා, හේතු වේ.

'ආර්ථික සහ මිල ස්ථායීතාව පවත්වා ගැනීම' යන ශ්‍රී ලංකා මහ බැංකුවට නීතියෙන් පැවරී තිබෙන කාර්යභාරයට අනුකූලව යමින්, උද්ධමනය අවම සහ ස්ථායී මට්ටම්වල පවත්වා ගෙන යෑමේ අරමුණ ඇතිව, වර්තමානයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව (FIT) යටතේ මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලබයි. කෙසේ වෙතත්, අඛණ්ඩව පවතින රාජ්‍ය අයවැය හිඟය, රජයේ ණය ඉහළ මට්ටමක පැවතීම සහ මෑත කාලීනව රජය විසින් අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා මහ බැංකුව මත ප්‍රධාන වශයෙන් රඳා පැවතීම හේතුවෙන් මූල්‍ය පද්ධති ස්ථායීතාවට තර්ජනයක් ඇති කරමින්, මුදල් ප්‍රතිපත්තිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට බාධා සිදු වී ඇත. 2021 වසර අවසාන භාගය තුළ දී රටෙහි

සංඛ්‍යා සටහන වි.ස. 3.1

ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය නීති රාමුව

රාජ්‍ය මූල්‍ය නීතිය	පනත 2003	2013 සංශෝධනය	2016 සංශෝධනය	2021 සංශෝධනය
අයවැය හිඟය	2006 සහ ඉන් ඔබ්බට සියයට 5ට වඩා අඩුය	නොවෙනස්ව පවතී	නොවෙනස්ව පවතී	නොවෙනස්ව පවතී
රාජ්‍ය ණය (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)	2006 වසර වන විට සියයට 85කට අඩු කිරීම සහ 2013 වසර අවසානය විට සියයට 60කට වඩා අඩු කිරීම	2013 වසර වන විට සියයට 80කට වඩා අඩු කිරීම සහ 2020 වසර වන විට සියයට 60කට වඩා අඩු කිරීම	නොවෙනස්ව පවතී	2030 වසර වන විට සියයට 60කට වඩා අඩු කිරීම
භාණ්ඩාගාර ඇපකර (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)	වසර 3ක චල සාමාන්‍ය ද.දේ.නි.යෙන් සියයට 4.5කට වඩා අඩු වීම	ද.දේ.නි.යෙන් සියයට 7. 5කට වඩා අඩු වීම	ද.දේ.නි.යෙන් සියයට 10කට වඩා අඩු වීම	ද.දේ.නි.යෙන් සියයට 15කට වඩා අඩු වීම

මූලය: 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත සහ එහි පසුකාලීන සංශෝධන

1 පොලී අනුපාතික මත ප්‍රකාශිත හෝ අප්‍රකාශිත උපරිම සීමා පැනවීම, විශ්‍රාම අරමුදල් සහ අර්ථසාධක අරමුදල් වැනි රජය යටතේ පවතින දේශීය මූලාශ්‍ර මගින් රජය වෙත සෘජුව ණය ලබා දීම සහ දේශසීමා හරහා සිදුවන ප්‍රාග්ධන ප්‍රවාහ නියාමනය කිරීම, සහ රජය හා බැංකු අතර ශක්තිමත් සම්බන්ධතාවක් පවත්වා ගැනීම යනාදිය මගින් රජයේ ණය ගැනීමේ පිරිවැය අවම කිරීමට මූල්‍ය අවරෝධනය භාවිත කෙරේ.

1

උද්ධමන ඉලක්කයේ ඉහළ සීමාව පසු කරමින්, උද්ධමනය වේගයෙන් ඉහළ යෑම සඳහා සැපයුම් පාර්ශ්වීය අවහිරතා මූලික වී තිබුණ ද, ප්‍රධාන වශයෙන් බැංකු අංශය විසින් රජය වෙත ලබා දෙන ණය ප්‍රමාණය ඉහළ යෑම නිසා වැඩි වූ ඉල්ලුම ද ඒ සඳහා හේතු වී ඇත. ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය පිළිබඳව සලකා බැලීමේ දී, රාජ්‍ය මූල්‍ය අසමතුලිතතාවලට සමගාමීව රටේ ඉහළ උද්ධමනයක් පැවති කාල වකවානුවක් තිබී ඇති බව පෙනී යයි. එබැවින්, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව දිගු කාලීන මිල ස්ථායිතාව තහවුරු කිරීම සඳහා ප්‍රධාන සාධකයක්ව පවතියි.

ආර්ථික පසුබෑම හමුවේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇති කිරීම

ලොව සෙසු රටවලින් උගත් පාඩම් සලකා බලන විට, දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හමුවේ, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව පරීක්ෂාකාරීව සහ සැලසුම් සහගතව, ඉල්ලුම තියුණු ලෙස පහළ නොයන ආකාරයට ක්‍රියාත්මක කළ යුතු වන්නේ ආර්ථිකය දුර්වල තත්ත්වයක පවතින විට එයට දිගු කාලීන අයහපත් බලපෑමක් ඇති නොවීමටය. සම්මත කේන්සියානු මතයට අනුව, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව කෙටි කාලීනව ආර්ථික කටයුතු මත සංකෝචනීය බලපෑමක් ඇති කරයි. ඒ අනුව, ආර්ථික වර්ධනයේ මන්දගාමී බව නිසා නාමික දළ දේශීය නිෂ්පාදිතය අඩු මට්ටමක පැවතීම මත රජයේ ආදායම පහළ වැටීම හේතුවෙන් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා ගනු ලබන ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයක් ලෙස රටේ රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය තවදුරටත් පිරිහීමට ඉඩ ඇත. එබැවින්, වසංගතය හේතුවෙන් රටේ ආර්ථික වර්ධනය දැනටමත් බලපෑමට ලක්ව ඇති හෙයින්, වසංගතය අතරතුර රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවක් ඇති කිරීමට සිදු වීම ප්‍රතිපත්ති සම්පාදකයන්ට ගැටලුකාරී තත්ත්වයක් වනු ඇත. කෙසේ වෙතත්, අඛණ්ඩව පවතින දුර්වල රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් හේතුවෙන් උද්ධමනය ඉහළ යෑම, දේශීය මුදලේ වටිනාකම දුර්වල වීම සහ බැංකු අංශයේ ද්‍රවශීලතාව සීමා වීම වැනි සාර්ව ආර්ථික අසමතුලිතතා රාශියක් නිර්මාණය වීමෙන් දැඩි අවිනිශ්චිතතා ඇති වීම, ආයෝජක විශ්වාසය පහළ වැටීම හා මූල්‍ය පද්ධතියේ අවදානම් සහගත තත්ත්වයන් උග්‍ර වීම සහ එමගින් ඉහළ සහ තිරසාර ආර්ථික වර්ධනයකට අවහිරතා ඇති වීම සිදු වී තිබේ. එබැවින්, මෙම තීරණාත්මක අවධියේ දී, සාර්ව ආර්ථික අසමතුලිතතා නිරාකරණය කිරීම මගින් සාර්ව ආර්ථික ස්ථායීතාව ළඟා කර ගැනීමේ අරමුණ, නුදුරු කාලීනව ඉහළ ආර්ථික වර්ධනයක් සාක්ෂාත් කර ගැනීමේ අරමුණ අභිබවා යයි. සාම්ප්‍රදායික කේන්සියානු මතයට පටහැනිව යමින් මෑතක දී සිදු කළ අධ්‍යයන මගින් පෙන්වා දී ඇත්තේ, විශේෂයෙන්ම රාජ්‍ය ණය ඉහළ මට්ටමක පවතින විට දී, සැලකිය යුතු අන්දමින් සහ මහජනයාට විශ්වාස කළ හැකි ආකාරයට රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇති කිරීම මගින් ආර්ථිකය සංකෝචනය වීමේ බලපෑම අඩු කිරීමට හැකි බවයි (Giavazzi & Pagano, 1990). එක් අතකට, රජය විසින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් ඇති කිරීමට කැපවී සිටින විට දී රජයේ ණය ගැනීමේ අවශ්‍යතාව තිර ලෙස අඩු වී ඇති බව ගෘහ ඒකක පිළිගන්නේ නම් පෞද්ගලික පාරිභෝජනය ඉහළ යා හැකිය. රජයේ ණය ගැනීම්වල එවැනි අඩු වීමක් මගින් අනාගතයේ දී බදු අය කිරීම අඩු වෙතැයි හැඟෙන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කුටුම්භ සඳහා සිය සම්පූර්ණ ජීවිත කාලය පුරා ලැබෙන ආදායම ඉහළ යා හැකි නිසා එයට අනුරූපව වර්තමානයේ සිටම තම පරිභෝජනය ඉහළ නැංවීම සඳහා ඔවුන් දිරිමත් කෙරෙනු ඇත. අනෙක් අතට, රජයට ණය ලබා ගැනීමට ඇති අවශ්‍යතාව පහළ යෑම මගින් උද්ධමන අපේක්ෂා සහ ආර්ථික අවිනිශ්චිතතා අඩු වීම හේතුවෙන් රාජ්‍ය ණය ලබා ගැනීම්වලට අදාළ උද්ධමන අවදානම් වාරික (inflation risk premia) සහ ගෙවීම් පැහැර හැරීමේ අවදානම් වාරික (default risk premia) අවම වනු ඇත. මෙමගින් මූර්ත පොලී අනුපාතිකවල පහළ වැටීමට සහ වඩා ඵලදායී පෞද්ගලික ආයෝජනවලට අනුබලය ලැබේ. ඒ ආකාරයෙන්, දුර්වල රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් නිසා හට ගන්නා අහිතකර සාර්ව ආර්ථික අසමතුලිතතා නිසාවෙන්, විශේෂයෙන්ම මැදි කාලීනව සිට දිගු කාලීනව දක්වා සාර්ව ආර්ථික ස්ථායිතාව තහවුරු කර ගැනීම සඳහා, මැනවින් සැලසුම් කරන ලද රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග ගැනීම ශ්‍රී ලාංකික ආර්ථිකයට බෙහෙවින් ඵලදායී වනු ඇත. කෙසේ වෙතත්, කෙටි කාලීනව ඇති විය හැකි ආර්ථිකය සංකෝචනය වීමේ බලපෑම් අවම කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රමෝපායන්වල වඩාත් යෝග්‍ය සංකලනය ක්‍රියාත්මක කිරීම අතිශය වැදගත් වන අතර, එමගින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව 'ස්වයංසිද්ධව පරාජයවන ක්‍රමෝපායක්' වීම වැළැක්විය හැක.

ඒ සමගම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව මගින් ආර්ථිකයේ පවතින විෂමතා වඩාත් පුළුල් කරමින් විවිධ ආර්ථික මට්ටම්වල සිටින ජන කොටස් මත විෂමානුපාතික බලපෑම් ඇති කළ හැකිය. කොවිඩ් - 19 මගින් වර්ධනය කෙරුණු දැනට පවතින විෂමතා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව හේතුවෙන් තවදුරටත් උග්‍ර වීමට ඉඩ ඇත. එබැවින්, ආර්ථිකයේ නිමැවුම් මත පමණක් නොව, සමාජ බෙදීම මත ඇති කරන බලපෑම පිළිබඳව ද නිසි අවධානය යොමු කරමින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රමෝපායන් ක්‍රියාත්මක කළ යුතු වේ.

ඉදිරි ගමන්මග

වසංගත ව්‍යාප්තියටත් පෙර සිටම ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් අසතුටුදායක මට්ටමක පැවති අතර, වසංගතය විසින් රාජ්‍ය මූල්‍ය අංශයේ පෙර තිබූ දුර්වලතා වඩාත් උග්‍ර කර ඇත. එබැවින්, ස්ථායීතාව සහ දිගු කාලීන තිරසාර වර්ධනය තහවුරු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ප්‍රමුඛතම අවශ්‍යතාවක්ව පවතී. ආර්ථිකය යථා තත්ත්වයට පත් වෙමින් තිබෙන අවධියක, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රතිපත්ති මාලාව 'ආර්ථික වර්ධන හිතකාමී' ආකාරයකින් සැලසුම් කළ යුතු අතර, එමගින් ආර්ථිකය වෙත වන බලපෑම අවම පිරිවැයක් යටතේ සිදු කිරීම තහවුරු

කිරීම සඳහා ප්‍රමාණාත්මකව කුඩා රාජ්‍ය මූල්‍ය ගුණකයන්[2] සහිත රාජ්‍ය මූල්‍ය උපකරණ භාවිත කළ යුතුය. ආර්ථික නිමැවුම සහ විෂමතා මත විශාල බලපෑමක් ඇති නොකරන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රතිපත්ති මාලාවක් සැලසුම් කිරීමේ දී, ඒ සඳහා එක් එක් ආදායම් සහ වියදම් සංරචකවලට අදාළ වූ රාජ්‍ය මූල්‍ය ගුණකයන්ගේ විශාලත්වය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය පිළිබඳව පැහැදිලි අවබෝධයක් තිබීම අවශ්‍ය වේ.

ආදායම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවට වඩා වියදම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව මගින් ආර්ථිකය සංකෝචනය වීමට පවතින ඉඩකඩ අඩු බව අනෙකුත් රටවල අත්දැටු සාක්ෂිවලින් පෙනී යයි (Alesina, Favero, & Giavazzi, 2019). කෙසේ වෙතත්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම් අනුපාතය අඩු අගයක පැවතීම සලකා බැලීමේ දී, නිමැවුම මත ඇතිවන බාධා අවම කරමින් ආදායම් ප්‍රතිපත්ති ඔස්සේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව හැසිරවීම සඳහා ශ්‍රී ලංකාවට තවමත් ඉඩකඩ ඇත. බ්‍රසීලය, කැනඩාව, ෆින්ලන්තය, නවසීලන්තය සහ දකුණු අප්‍රිකාව වැනි රටවල් විසින් ක්‍රියාත්මක කරන ලද ආදායම මත පදනම් වූ සාර්ථක රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග හරහා බදු පදනම පුළුල් කිරීම සහ බදු පරිපාලනය සරල කිරීමට ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම සඳහා අවධානය යොමු කර ඇත (Okwuokei, 2014). එකතු කළ අගය මත බදු (VAT) වැනි වක්‍ර බදු අනුපාතික ඉහළ දැමීම මගින් මෙවැනි අසීරු කාලවල දී අඩු ආදායම්ලාභී ගෘහ ඒකකවල පරිභෝජනය මත විෂමානුරූපී පීඩනයක් ඇති විය හැකි බැවින්, නිමැවුම මත සහ ආදායම් ව්‍යාප්තිය අනුව ඇතිවන බලපෑම් අවම කරන අතර, රජයේ ආදායම වර්ධනය කිරීම සඳහා එකතු කළ අගය මත බදු පදනම පුළුල් කිරීම (එකතු කළ අගය මත බදු ගෙවන ව්‍යාපාර ගණන ඉහළ නංවා ගැනීම) සුදුසු විකල්පයක් වනු ඇත. මේ සඳහා, එකතු කළ අගය මත බදුවලින් නිදහස් වන සීමාව, එම බද්ද මත අවසන් වරට සිදු කළ සංශෝධනයට පෙර පැවති සීමාව දක්වා පහළ දැමිය හැකිය[3]. මේ අතර, ප්‍රාග්ධන ආදායම් මත පනවන බදු මගින් ආර්ථික වර්ධනය මත හට ගන්නා බලපෑම සුළු වන බැවින්, පුද්ගල මට්ටමෙන් එම බදු ඉහළ නැංවිය හැකිය. සාපේක්ෂව නිතර සංශෝධනයට ලක් නොවන වැටුප් ව්‍යුහයන් සහ ශ්‍රී ලංකාවේ අනම්‍යශීලී සේවා නියුක්ති ගිවිසුම් පිළිබඳව සලකා බැලීමේ දී, ව්‍යාපාරික ආයතනවල පිරිවැය සහ ශ්‍රම යෙදවුම් මත සැලකිය යුතු බලපෑමක් ඇති නොවන අන්දමින් බදුවලින් නිදහස් වන සීමා සහ බදු අය කෙරෙන ආදායම් කාණ්ඩ (Tax brackets) අවසන් වරට සිදු කළ ආදායම් බදු සංශෝධනයට පෙර පැවති මට්ටම් දක්වා සංශෝධනය කර, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (Advance Personal Income Tax)/ පුද්ගල ආදායම් බදු අනුපාතික කලාපීය සම රාජ්‍යයන් සමඟ සංසන්දනය කළ හැකි මට්ටමකට ඉහළ නැංවිය හැකිය. විශේෂයෙන්ම, බදු ගෙවීම් පැහැර හැරීම සහ දූෂණය මැඩපැවැත්වීම මගින් මැදි කාලීනව හා දිගු කාලීනව රජයේ ආදායම වර්ධනය කිරීම සඳහා පරිපාලන සහ බදු අය කිරීම් බලාත්මක කිරීමේ ප්‍රතිසංස්කරණ රාශියක් සිදු කිරීම අතිශයින් ම වැදගත් වේ.

වියදම් කපා හැරීම මගින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා රජයේ ඇති දැඩි කැපවීම සහ රජයේ කාර්යක්ෂමතාවයේ වර්ධනය පිළිබිඹු කෙරෙන හෙයින්, වියදම් අවම කිරීම ඔස්සේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇති කිරීම වඩාත් සාර්ථක බව අනෙකුත් රටවල පසුගිය අත්දැකීම් මගින් පෙනී යයි (Price, 2010). සෙසු රටවල රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇති කිරීමේ දී වැටුප් සහ පැවරුම් අඩු කිරීම වඩාත් සාර්ථක වූ ක්‍රියාමාර්ගයක් වුවත්, ශ්‍රී ලංකාවෙහි ශ්‍රම වෙළඳපොළේ පවතින අනම්‍යශීලී තත්ත්වයන් සහ දේශපාලනික වශයෙන් ඇතිවන අවාසිදායක බව පිළිබඳව සලකා බැලීමේ දී එවැනි ක්‍රියාමාර්ග ගැනීම මෙරට පරිසරය තුළ ක්‍රියාත්මක කිරීම පහසු කර්තව්‍යයක් නොවනු ඇත. එබැවින්, අවම වශයෙන්, රාජ්‍ය සේවයට අලුතින් බඳවා ගැනීමේ දී සහ විශාල වශයෙන් මහජන වැටුප් සංශෝධන සිදු කිරීමේ දී දූරදර්ශීව කටයුතු කළ යුතු අතර, සහනාධාර නිවැරදි ලෙස ඉලක්කගත කිරීම සිදු කළ යුතුය. අනෙක් අතට, විශේෂයෙන්ම භෞතික සහ සමාජ යටිතල පහසුකම් ආශ්‍රිතව රටෙහි පවතින දුබලතා හේතුවෙන්, ප්‍රාග්ධන වියදම් සහ සෞඛ්‍ය හා අධ්‍යාපනය මත සිදු කරන වියදම් අඩු කිරීම මගින් කෙටි කාලීනව මෙන්ම, දිගු කාලීනව ආර්ථිකය සංකෝචනය වීමේ බලපෑම් ඇති විය හැකිය. එබැවින්, පොදුවේ සෑම අංශයකින්ම වියදම් කප්පාදු කිරීමක් සිදු කිරීම වෙනුවට, මුදල සඳහා වැඩි අගයක් ලබා දෙන ක්‍රමෝපායයන් ඔස්සේ සැලකිය යුතු ලෙස ප්‍රාග්ධන වියදම් කපා හැරීම් මගින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව අත්පත් කර ගත යුතුය. මේ සඳහා මධ්‍යම රජය මෙන්ම පළාත් පාලන ආයතන විසින් ඉහළම ආර්ථික වටිනාකමක් සහ අනාගත වර්ධන ශක්‍යතාවක් ඇති කරන යටිතල පහසුකම් ව්‍යාපෘති තෝරා ගැනීම මගින් ප්‍රාග්ධන වියදම් විධිමත් කළ යුතුය. තවද, කාර්යක්ෂම ප්‍රතිලාභ අත් කර ගැනීමට සහ රාජ්‍ය වියදම මත පවතින පීඩනය අවම කිරීම සඳහා රජයේ ක්‍රියාදාම විධිමත් කිරීම හා ඩිජිටල්කරණය මෙන්ම ඵලදායී නොවන පුනරාවර්තන වියදම් කපා හැරීම ද අත්‍යවශ්‍ය වේ.

ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කරන ආයෝජන සහ දිගු කලක සිට ක්‍රියාවට නැංවීමට නියමිත, එහෙත් ක්‍රියාත්මක නොකෙරුණු, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සමඟින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇති කිරීම, ආර්ථික වශයෙන් ඇති වී ඇති දරුණු තත්ත්වය හමුවේ මතු වී ඇති අභියෝගවලට පිළියම් යෙදීමටත් වසංගතය නිසා හට ගත් අවස්ථාවලින් ප්‍රයෝජනය ලැබීමටත් සාධනීය පියවරක් වනු ඇත. අකාර්යක්ෂම, අලාභ ලබන රාජ්‍ය ව්‍යවසායයන්ගේ

2 රාජ්‍ය මූල්‍ය ගුණක මගින් රජයේ වියදම් හෝ බදු මගින් දළ දේශීය නිෂ්පාදිතය මත ඇතිවන බලපෑම මනිනු ලැබේ.

3 2019 දෙසැම්බර් මාසයේ දී එකතු කළ අගය මත පනවන බදුවලින් නිදහස් සීමාව, වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 12ක සිට වාර්ෂික පිරිවැටුම රුපියල් මිලියන 300ක් දක්වා ඉහළ නංවන ලදී.

1

සංඛ්‍යා සටහන වි.ස.2.2

ශ්‍රී ලංකාවේ සහ කලාපීය සමාන ආර්ථිකයන්ගේ පවතින ආදායම් බදු

ශ්‍රී ලංකාව		ඉන්දියාව		පාකිස්තානය		සිංගප්පූරුව		තායිලන්තය	
බදු ආදායම් කාණ්ඩය (රුපියල් මිලියන)	බදු අනුපාතිකය (%)	බදු ආදායම් කාණ්ඩය (ඉන්දීය රුපියල් මිලියන)	බදු අනුපාතිකය (%)	බදු ආදායම් කාණ්ඩය (පාකිස්තාන් රුපියල් මිලියන)	බදු අනුපාතිකය (%)	බදු ආදායම් කාණ්ඩය (සිංගප්පූරු ඩොලර් මිලියන)	බදු අනුපාතිකය (%)	බදු ආදායම් කාණ්ඩය (තායි බාත් මිලියන)	බදු අනුපාතිකය (%)
0-3	0	0-0.25	0	0-0.6	0	0.005-0.02	1	0-0.15	0
3 -6	6	0.25-0.5	5	0.6-1.2	5	0.02-0.035	3	0.15-0.3	5
6-18	12	0.5-0.75	10	1.2-1.8	10	0.035-0.05	8	0.3-0.5	10
18 ඉහළ	18	0.75-1	15	1.8-2.5	15	0.05-0.07	13	0.5-0.75	15
		1-1.25	20	2.5-3.5	17.5	0.07-0.1	21	0.75-1	20
		1.25-1.5	25	3.5-5	20	0.1-0.25	24	1-2	25
		1.5 ඉහළ	30	5-8	22.5	0.25-0.4	24.5	2-5	30
				8-12	25	0.4-0.6	25	5 ඉහළ	35
				12-30	27.5	0.6-1	26		
				30-50	30	1-2	28		
				50-75	32.5	2 ඉහළ	30		
				75 ඉහළ	35				

මූලයඃ ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් - ලෝක බදු සාරාංශය

ණය බර රජයේ අසම්භාව්‍ය වගකීම් බවට පරිවර්තනය වන හෙයින්, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සමඟම රාජ්‍ය ව්‍යවසායයන්ට අදාළ ප්‍රතිසංස්කරණ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු වේ. පිරිවැය පිළිබිඹු කරන මිලකරණ යාන්ත්‍රණ, කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම් සහ වෙළඳපොළ මත පදනම් වූ නිෂ්පාදන සහ සේවා සැපයීම් රාජ්‍ය ව්‍යවසායයන්ට අදාළව දිගු කලක සිට සිදු කළ යුතුව තිබෙන ප්‍රතිසංස්කරණ කිහිපයකි. මීට අමතරව, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවෙහි ප්‍රගතිය අධීක්ෂණය කිරීම, එම ක්‍රියාවලිය පිළිබඳ මහජන නිරීක්ෂණය ශක්තිමත් කිරීම සහ ඒකාග්‍රතා අරමුණු සපුරාලීමේ දී ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ වගවීම තහවුරු කිරීම සඳහා නීතිමය සහ පරිපාලනමය වශයෙන් ප්‍රතිසංස්කරණ අවශ්‍ය වේ. ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්, රාජ්‍ය බැංකු දෙක මත සහ අවසානයේ මහ බැංකු මූල්‍යකරණය මත දිගින් දිගට ම රඳා පැවතීම හමුවේ මිල ස්ථායීතාවයට අභියෝග රාශියක් නිර්මාණය වී ඇති බව සඳහන් කළ යුතුය. එබැවින්, රාජ්‍ය ව්‍යවසායයන් ඔවුන්ගේ මෙහෙයුම් සඳහා වගවිය යුතු අතර, එවැනි ආයතන ඔවුන්ගේ ණය බර වාණිජ බැංකු සහ මහ බැංකුව වෙත පැවරීම සිදු නොකළ යුතුය.

රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව අත්‍යවශ්‍ය වන, තීරණාත්මක අදියරකට ශ්‍රී ලංකාව ළඟා වී ඇති අතර, එය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම තවදුරටත් ප්‍රමාද වීම මගින් ආර්ථිකමය සහ දේශපාලනිකමය වශයෙන් දැඩි අවාසියක් සිදු වනු ඇත. කෙසේ වෙතත්, අපේක්ෂිත ප්‍රතිඵලය සැබෑ ලෙස අත්පත් කරගැනීමට, රාජ්‍ය මූල්‍ය නීති සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ගමන්මගට අනුකූල වෙමින් රජය දැඩි කැපවීමෙන් කටයුතු කිරීම අතිශයින් ම වැදගත් වේ. දේශපාලනික වශයෙන් පොදු එකඟතාවක් නොමැති වීම, මේ සඳහා අදාළ බලධාරීන්ගේ උදාසීන වූ ප්‍රවේශය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ස්ථාවර ලෙස ආර්ථික වර්ධනයක් ඇති නොකරන, කෙටි කාලීන, අදාළ අවස්ථාව පිළිබඳ පමණක් සිතා ක්ෂණිකව ගනු ලබන ප්‍රතිපත්ති හේතුවෙන් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇති කිරීමේ ක්‍රියාවලිය එහි අපේක්ෂිත ගමන්මගින් බැහැර වීම වැළැක්විය යුතුය. ඒ සමඟ ම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියේ සාර්ථකත්වය සහ තිරසාර බව මහජනතාවගේ සහයෝගය මත රඳා පවතින හෙයින්, 'සහනාධාර මානසිකත්වයේ' පසුවිපාක පිළිබඳව මහජනයා අතර දැනුම්වත්භාවය ඇති කිරීම තුළින් ඡන්ද දායක පදනම රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් වඩා විචක්ෂණශීලී පිරිසක් බවට පත් කිරීමටත්, එමගින් රාජ්‍ය මූල්‍ය හැසිරවීමේ දී ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් සම්පත් අපතේ යැවීම වළක්වාලීමටත් හැකි වේ.

මූලාශ්‍ර

1. Alesina, A.,Favero, C., & Giavazzi, F. (2019). Effects of Austerity: Expenditure-and Tax-based Approaches. Journal of Economic Perspectives, 33(2), 141-162.
2. Giavazzi, F., & Pagano, M. (1990), Can Severe Fiscal Contractions Be Expansionary? Tales of Two Small European Countries. NBER Macroeconomics Annual. 5, 75-111.
3. Okwuokei, J. (2014). Fiscal Consolidation: Country Experiences and Lessons from the Empirical Literature. In A.Charles, & T. Turner-Jones, Caribbean Renewal: Tackling Fiscal and Debt Challenges (pp. 103-131). International Monetary Fund.
4. Price, R. (2010). The Political Economy of Fiscal Consolidation. OECD Economics Department Working Paper No.776.
5. Reinhart, C., & Sbrancia, M. (2011). The Liquidation of Government Debt. NBER Working Paper.

රාජ්‍ය අංශයේ සේවා සැපයීම්වල පවත්නා දුර්වලතා මෙන්ම අනම්‍යශීලී බව තවදුරටත් නිරාවරණය වූ අතර, මෙමගින් ද රාජ්‍ය සේවය වැඩිදියුණු කිරීම උදෙසා නව අභියෝග සහ අවස්ථා නිර්මාණය වී ඇත. වසංගතය හමුවේ නිවසේ සිට රාජකාරි කටයුතු කිරීමේ ක්‍රියාවලිය බොහෝ දුරට අනුගමනය වුව ද, මෙම නව ක්‍රම සාර්ථකව ආයතනගත කළ පෞද්ගලික අංශය සමඟ සංසන්දනය කරන කල, නව තත්ත්ව යටතේ රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව පසුගාමී මට්ටමක පැවතුණි. භෞතික යටිතල පහසුකම්වල සහ ස්වයංක්‍රීය පද්ධතිවල සීමාසහිත බව සමඟ, රාජ්‍ය අංශයේ ශ්‍රම බලකාය නව තත්ත්වයන්ට අනුවර්තනය සීමා සහිත වීම, නම්‍යශීලී නොවන රාජකාරි සිදු කිරීමේ වැඩපිළිවෙළ හා ක්‍රියාපටිපාටි සහ දුර්වල අධීක්ෂණ යාන්ත්‍රණය වැනි හේතූන් නිසා වසංගත කාල සීමාව තුළ අඛණ්ඩව සහ සුමට සේවා සැපයීමට බාධා ඇති වී ඇති අතර, ඒ හරහා මහජනතාවට විශාල දුෂ්කරතා ඇති වී තිබේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2016 වසරේ දී පවත්වන ලද රාජ්‍ය හා අර්ධ රාජ්‍ය අංශයේ රැකියා සංගණන වාර්තාවට අනුව, රාජ්‍ය අංශය සේවා නියුක්තිකයින්ගෙන් සියයට 33.2කට පරිගණක භාවිතයට හැකියාව නොමැති බව ද, තවත් සියයට 30.4ක් රාජකාරි අවශ්‍යතා සඳහා පරිගණකයක් භාවිතා නොකරන බව ද ප්‍රකාශ කර ඇත. එමගින් පෙන්නුම් කරන්නේ තාක්ෂණය බහුලව භාවිත වන රාජකාරි පරිසරයකට අනුගත වීමට බාධා ඇති කරන රාජ්‍ය අංශයේ ශ්‍රම බලකායේ නිපුණතා පරතරය යි. කෙසේ වෙතත්, වසංගතය අතරතුර ලබා ගත් අත්දැකීම්වලින් අනාවරණය වන්නේ සරල සහ භාවිතයට පහසු ස්වංක්‍රීය හා අතථ්‍ය පද්ධති හඳුන්වා දීම සහ සේවකයින්ගේ කුසලතා වර්ධනය කිරීම හා නව කුසලතාවයන් ඇති කිරීම මගින් දැනට සිටින ශ්‍රම බලකායෙන් කොටසක් පමණක් භාවිත කර බොහෝ රාජ්‍ය සේවාවන්ට අදාළව කාර්යක්ෂම සේවාවක් ලබා දිය හැකි බවයි. වඩාත් උසස් පාරිභෝගික සම්බන්ධතාවන් ගොඩනැගීම, ආයතනික සම්බන්ධීකරණය වැඩිකර ගැනීම සහ දත්ත කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ සාක්ෂි සාධක මත පදනම්ව දියුණු ක්‍රම ඔස්සේ සිදු කරනු ලබන ප්‍රතිපත්ති සම්පාදන හරහා ජනතාවගේ වෙනස්වන සුළු අවශ්‍යතා සහ බලාපොරොත්තු සපුරාලීම සඳහා නව තාක්ෂණ ක්‍රමවේදයන් ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවයට ඉදිරියේ දී එකතු කර ගැනීමට අවශ්‍ය වේ. නීතිමය හා ක්‍රියා පටිපාටීන්වලට අදාළ සංශෝධන සහ නම්‍යශීලී රාජකාරී කිරීමේ වැඩපිළිවෙළ හඳුන්වා දීම, ඩිජිටල්කරණයට සමගාමීව සිදු කළ යුතු අතර, වසංගත හෝ ස්වභාවික විපත් ඇති තත්ත්ව යටතේ දී බාධාවකින් තොරව සේවා සැපයීම මෙමගින් සහතික කළ හැක. සේවා සැපයීමේ කාර්යක්ෂමතාවය තාක්ෂණික වැඩිදියුණු කිරීම් මතම පමණක් නොව, මානව ප්‍රාග්ධනය, රෙගුලාසි සහ බලාත්මක කිරීමේ ප්‍රතිපත්ති මත ද රඳා පවතී. 2020 වසරේ රජයේ ඵලදායීතා දර්ශකයේ 51වන ප්‍රතිශතකය තුළ ශ්‍රේණිගතව සිටින ශ්‍රී ලංකාවට, එම දර්ශකයේ ඉහළින්ම සිටි සිංගප්පූරුවෙන් රාජ්‍ය අංශයේ ඵලදායීතාවය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති නිර්දේශ ලබා ගත හැක. සාර්ථක ලෙස ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමකට අවශ්‍ය ලෙස සිංගප්පූරුවේ නිලතන්ත්‍රය ඉතා දක්ෂ සේවක මණ්ඩලයකින් සමන්විත වීමට, කුසලතාවන්ට අනුව සිදු කරනු ලබන බඳවා ගැනීම් සහ වෘත්තීය උසස්වීම්, තරගකාරී වෙළඳපොළ වැටුප් සහ නිරන්තර පුහුණුවීම් ආධාර වී ඇත. ඊට අමතරව, දූෂණ විරෝධී ක්‍රියාමාර්ග දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සහ පුද්ගලයින් ප්‍රමාණවත් පරිදි සැපයීම සහ දූෂණයට එරෙහිව පවතින නීතිමය රාමුව ශක්තිමත් කිරීම මගින් දූෂණයට එරෙහිව සාර්ථකව කටයුතු කිරීමට සහ රාජ්‍ය සේවය තුළ ඉහළ කාර්යක්ෂමතාවක් පවත්වා ගෙන යාමට සිංගප්පූරුවට හැකි වී තිබේ. තවද, ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා පරිපාලනමය හා සාර්ව ආර්ථික අවශ්‍යතාවලට අනුකූල වන රාජ්‍ය අංශයේ බඳවා ගැනීම්, ඉලක්කගත ප්‍රවේශයකින් අයවැය සම්පාදනය, අතිරික්ත අංශවලින් අවශ්‍යතා ඇති අංශවලට සම්පත් නැවත යොමු කිරීම, සැලසුම් සහගත ලෙස ශ්‍රම බලකායේ පවතින නිපුණතා වර්ධනය හා නව කුසලතා ඇති කිරීම, සහ සේවකයන්ට රාජ්‍ය සේවයේ විවිධ සේවා අංශ අතර සේවා මාරුවීම්වලට අවකාශ සලසන පරිපාලනමය නම්‍යශීලී බවක් ඇති කිරීම යනා දී ක්‍රියාමර්ග ඇති කිරීම අත්‍යවශ්‍ය වේ.

මූල්‍යනය සඳහා විකල්ප මූලාශ්‍ර හඳුනා ගැනීම මෙන්ම, බැංකු පද්ධතියේ මූල්‍ය ශක්තිය වැඩිදියුණු කිරීමට හැකිවන පරිදි දිගු කාලීන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම හරහා මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ දී රාජ්‍ය අංශය විසින් මහ බැංකුව ඇතුළු බැංකු පද්ධතිය මත අධික ලෙස රඳා පැවතීම අඩු කළ යුතුය. රාජ්‍ය අංශය විසින් ඉපැයූ ආදායමට අමතරව, රජයට සහ රජය සතු වාණිජ ව්‍යාපාර යන දෙඅංශයටම මූල්‍යන සම්පාදනය කිරීමේ ප්‍රධාන මූලාශ්‍රවලින් එකක් වන්නේ බැංකු මගින් මූල්‍යනයයි. මෑත වසරවලදී, විශේෂයෙන්ම වසංගතය ආරම්භයේ සිට රාජ්‍ය අංශය, ප්‍රධාන වශයෙන් සිය මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩි වශයෙන් බැංකු පද්ධතිය මත රඳා පැවතීම හේතුවෙන් බැංකු අංශයට, විශේෂයෙන්ම රාජ්‍ය බැංකුවලට සහ දේශීය මිල ස්ථායීතාවයට විශාල

1

පීඩනයක් එල්ල විය. ණය වැඩි වීම සහ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම මධ්‍යයේ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළට ඇති ප්‍රවේශය අහිමි වීම හේතුවෙන් රජය වෙත අරමුදල් ලැබීම සීමා වී ඇති අතර, නිෂ්පාදිතවල පරිපාලිත මිල ගණන් සහ ගාස්තු ප්‍රමාණවත් ලෙස ගැළපීම් සිදු නොකිරීම හේතුවෙන් රජය සතු වාණිජ ව්‍යාපාරවලට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා බැංකු අංශයෙන් අඛණ්ඩව ණය ලබා ගැනීමට සිදු වී ඇත. බැංකු මූල්‍යනය මත රාජ්‍ය අංශයේ එවැනි අධික ලෙස රඳා පැවතීම, දේශීය බැංකු අංශයට සහ සමස්ත දේශීය මූල්‍ය වෙළඳපොළට පීඩනයක් එල්ල කර ඇති අතර, මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පිළිබඳ ගැටලු ද වැඩි වී ඇත. තවද, ඵලදායීතාවය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමකින් තොරව රාජ්‍ය අංශය අඛණ්ඩව මූල්‍යනය කිරීම මගින් වඩා ඉහළ උද්ධමන පීඩන ඇති වෙමින්, රජයට සහ බදු ගෙවන්නන් මත වැඩි වශයෙන් පීඩා ඇති කෙරෙයි. එසේම, මෙමගින් ඉහළ ඵලදායීතාවක් සහිත පෞද්ගලික අංශයේ ආයෝජන අධෛර්යමත් කරනු ලබන අතර, එමගින් ආර්ථිකයේ දිගු කාලීන වර්ධන අපේක්ෂා කෙරෙහි අහිතකර බලපෑම් ඇති කළ හැකිය. බදු ලිහිල් කිරීම් සහ නිදහස් කිරීම් මෙන්ම, බදු එකතු කිරීම සඳහා වන සීමා හේතුවෙන් රජයේ මුදල් ප්‍රවාහ දැඩි බලපෑම්වලට ලක් වී ඇත. එමෙන්ම, විශේෂයෙන්ම අනෙකුත් රාජ්‍ය ආයතනවලින් සහ රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්වලින් ඇතැම් රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් වෙත අය විය යුතු විශාල හිඟ ගෙවීම් මගින් මුදල් ප්‍රවාහ වෙත බලපෑම් ඇති කිරීම හේතුවෙන් මෙම ව්‍යවසායයන්ට ඉහළ පොලී අනුපාතික යටතේ ණය සහ බැංකු අයිරා පහසුකම් ලබා ගැනීමට සිදුව ඇති අතර, එමගින් ලාභදායීත්වයට බලපෑම් ඇති කර තිබේ. මෙමගින් බැංකු නොවන මූලාශ්‍රවලින් මුදල් උපයා ගැනීමේ ක්‍රියාමාර්ග රජය විසින් සක්‍රීයව හඳුනා ගැනීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ. රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් සම්බන්ධයෙන් සැලකීමේ දී, පිරිවැය පිළිබිඹු වන පරිදි විකුණුම් මිල සංශෝධනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර, ඵලදායීතාව ඉහළ නැංවීම, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, සමස්ත නිෂ්පාදන පිරිවැය අඩු කරගැනීම සඳහා ඒ ආශ්‍රිත අපතේ යෑම් අවම කිරීම සහ ස්වාධීන ආයතන ලෙස වැඩිදියුණු කිරීම මගින් රජයේ අයවැය හරහා සහායක් නොමැතිව ඔවුන්ට ස්වාධීනව ක්‍රියා කිරීමට අවස්ථාව සැලසෙනු ඇත. තවද, ගාස්තු එකතු කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම තුළින් රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්වල මූල්‍ය ශක්‍යතාවය ඉහළ නැංවීමට කඩිනමින් අවධානය යොමු කළ යුතු අතර, එමගින් මුදල් ප්‍රවාහ කළමනාකරණය වැඩිදියුණු කිරීම මෙන්ම, අඩු පිරිවැයක් සහිත දිගු කාලීන මූල්‍යන විකල්ප හඳුනා ගැනීම ද කළ යුතු වේ. යෝජිත ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම තුළින් රාජ්‍ය අංශයේ කාර්ය සාධනය ඉහළ නැංවිය හැකි අතර, එමගින් රාජ්‍ය අංශයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා බැංකුවල සහාය අවශ්‍ය වීම සීමා කිරීම, මැදි හා කෙටි කාලීන ආර්ථික ස්ථායීතාව මෙන්ම දිගු කාලීන තිරසාර වර්ධනය සඳහා පහසුකම් සැලසීම සිදු කළ හැක.

ආහාර උද්ධමනය නිසා ඇති වන සාමාන්‍ය මිල මට්ටම් නිරන්තර උච්ඡාවචනය වීම සහ එය යම් කාලයක් ඒකාකාරීව පැවතීම නිසා උද්ධමනය ඉලක්කගත පරාසය තුළ පවත්වා ගැනීමට සහ උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට මහ බැංකුව දරන උත්සාහයන් දුර්වල කරන බැවින් කාලෝචිත සහ තිරසාර පදනමක් මත රජයේ මැදිහත් වීම මගින් එය පාලනය කළ යුතුය. ශ්‍රී ලංකාවේ භාණ්ඩ හා සේවාවල පාරිභෝගික මිල පැසෙහි විශාල කොටසක් ආහාර ද්‍රව්‍ය වලින් සමන්විත වන බැවින්, ආහාර මිලෙහි නිරන්තර හා සැලකිය යුතු වෙනස්කම් උද්ධමනයේ උච්ඡාවචනයට හේතු වේ. ආහාර උද්ධමනය හේතුවෙන්, උද්ධමනය එහි ඉලක්කයෙන් වෙනස්වීම සහ කාලයක් පුරා එලෙස පැවතීම මගින් උද්ධමන අපේක්ෂාවන්ට බාධා කළ හැකි අතර, එමගින් නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයෙහි අරමුණු වළක්වනු ලැබේ. සැපයුම් අංශයේ සාධක බොහෝ දුරට රටක ආහාර මිල ඉහළ යෑම්වලට හේතු වන අතර, ඉල්ලුම් අංශයේ සාධක ද එවැනි මිල ඉහළ යෑම් සඳහා දායක විය හැකිය. ශ්‍රී ලංකාව තුළ වසංගත සහ කාලගුණය ආශ්‍රිත සැපයුම් අංශයේ බාධා ඇතුළු සැපයුම් මත පදනම් වූ සාධක මෙන්ම ගෝලීය ආහාර සහ වෙළඳ භාණ්ඩ මිලෙහි විශාල ඉහළ යෑම් වැනි බාහිර සාධක මෑත කාලීන ආහාර උද්ධමනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, කාබනික කෘෂිකාර්මික ක්‍රමවේදයන් වෙත ගමන් කිරීමේ දී වූ සංක්‍රාන්ති කාලපරිච්ඡේදය තුළ පැවති ඵලදායිතා අලාභ සහ පසු අස්වනු සැපයුම් දාම ගැටලු, සීමිත ගබඩා පහසුකම්, මෙන්ම අගය එකතු කිරීම් සහ සංරක්ෂණ ක්‍රමවේද වැනි ආවේණික ගැටලු ද ආහාර මිල ගණන් ඉහළ යෑමට හේතු විය හැකිය. ආහාර මිල නිසා උද්ධමන ඉහළ යෑම් සමාජයේ අඩු ආදායම් පවුල්වලට අසමාන ලෙස බලපාන අතර එය දුගී ජනතාවගේ ජීවන තත්ත්වයන් පිරිහීමට ලක් කරයි. ප්‍රධාන වශයෙන් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හරහා එවැනි සැපයුම මත පදනම් වූ උද්ධමනය පාලනය කිරීමට දරන උත්සාහයන් ඵල රහිත මෙන්ම, අකාර්යක්ෂම ද විය හැකිය. එබැවින්, දේශීය ආහාර සැපයුම් දාමවල මනා ක්‍රියාකාරිත්වය සහතික කිරීම සහ ගෝලීය මිල ගණන් ඉහළ යෑම්හි බලපෑම අවම

කිරීම සඳහා රජය විසින් කෙටි කාලීන සිට දිගු කාලීන දක්වා හොඳින් සැලසුම් කළ සැපයුම් අංශයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය වැදගත් වේ. මෙම ප්‍රතිපත්ති සඳහා දේශීය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම, කන්නයෙන් පිට වගා කිරීම, ආහාර ගබඩා යටිතල පහසුකම්, සංරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම, ප්‍රවාහන වියදම් අවම කිරීම, නිෂ්පාදනයේදී භාවිතා කරන තාක්ෂණය වැඩි දියුණු කිරීම සහ ලාභදායී ආනයන ආදේශන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම ඇතුළත් විය යුතුය. උද්ධමන ඉලක්කකරණ රාමුව සාර්ථකව ක්‍රියාත්මක කිරීමට සමගාමීව තොග සීමා පැනවීම, ආනයන සීමා ලිහිල් කිරීම, මූලික ආනයන බදු අඩු කිරීම යනාදී කෙටි කාලීන සැපයුම් අංශයේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් ඉන්දියාව වැනි රටවල් තම ඉහළ ආහාර උද්ධමනය අඩු කරගැනීමට සමත් වී ඇත. විශේෂයෙන්ම තාවකාලික ආහාර මිල ඉහළ යෑම් සම්බන්ධ සැපයුම් අංශයේ ගැටලු විසඳීම සඳහා, පවතින සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය තුළ ශ්‍රී ලංකාව ද එවැනි කෙටි කාලීන ප්‍රතිපත්ති ගෙන ඇතත්, රට තුළ ශක්තිමත් සහ තිරසාර ආහාර සැපයුම් දාමයක් පවත්වාගෙන යෑමට වැඩිදුර ක්‍රියාමාර්ග ගත යුතු වේ. වසංගත කාල කාලපරිච්ඡේදය තුළ, ආහාර සැපයුම් දාමයේ යෙදී සිටින අයට ඔවුන්ගේ සේවාවන් දිගටම කරගෙන යාම සඳහා සංචරණ සීමාවන් ඉවත් කිරීම වැනි කෙටි කාලීන පියවර කිහිපයක් රජය විසින් ගෙන ඇත. දිගු කාලීනව, කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීම සහ ආහාර සුරක්ෂිතතා ගැටලු කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා සුදුසු ප්‍රතිපත්ති සහ යටිතල පහසුකම් සකස් කළ හැකිය. මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී පෞද්ගලික අංශයේ සහාය ලබා ගැනීම ද වැදගත් වනු ඇත. ආනයන ආදේශක ලෙස හඳුනාගත හැකි කෘෂිකාර්මික හා කාර්මික භාණ්ඩ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කරන අතරම ආහාර නිෂ්පාදනය වැඩිදියුණු කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රජය "වාරි සෞභාග්‍ය" වැනි යටිතල පහසුකම් සහ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම දැනටමත් ආරම්භ කර ඇත. තවද, පසු අස්වනු අලාභ අවම කිරීම සඳහා මෙන්ම අවාරයේ ගබඩා කිරීම සඳහා පාලිත පරිසර තත්ත්ව සහිත නිසි ගබඩා පද්ධති තිබීම වැදගත් වේ. ජාත්‍යන්තර සහ දේශීය පෞද්ගලික අංශයේ ආයෝජන මගින් රට තුළ ගබඩා සහ භාණ්ඩ ප්‍රවාහන පහසුකම් පුළුල් වන අතර, ආහාර බැංකු පිහිටුවීම, හදිසි අවස්ථාවලදී කලාපීය වශයෙන් ආහාර සංචිත ප්‍රයෝජනයට ගැනීමට උපකාරී වේ. අනෙකුත් ක්‍රියාමාර්ග අතර, අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය හිඟයට තුඩු දිය හැකි වර්ධනයන් කල්තියා හඳුනා ගැනීම සහ ආහාර සැපයුමේ ඇති විය හැකි කම්පනවලට මුහුණ දීම සඳහා ආර්ථිකය සූදානම් කිරීම සඳහා රජයට පූර්වෝපායික ප්‍රතිපත්ති නිර්දේශ කිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙන්ම සමන්විත විශේෂිත සූදානම් කණ්ඩායමක් සිටීම ප්‍රයෝජනවත් වනු ඇත. තවද, ඒකාධිකාරීන් සහ තොග අනවශ්‍ය ලෙස බැහැර කිරීම සහ පසුව ඇති වන්නා වූ මිල ඉහළ යෑම් වළක්වා ගනිමින්, ආහාර මිල උච්චාවචන වීම අඩු කර ගැනීම සඳහා කෘෂිකාර්මික අංශයේ සිට සිල්ලර අංශය දක්වා ආහාර සැපයුම් දාමවල ක්‍රියාකාරිත්වය පිළිබඳ ශක්තිමත් නියාමන රාමුවක් තිබීම අත්‍යවශ්‍ය වේ. උද්ධමන අපේක්ෂා පාලනය කිරීම තුළින් උද්ධමන ගතිකයන් හැඩගැස්වීමේදී ආහාර උද්ධමනයේ අඩු උච්චාවචනය, මිල ස්ථායීතාවය ළඟා කර ගැනීමට සහ පවත්වා ගෙන යෑමට උපකාරී වේ.

අපනයන කර්මාන්ත වර්ධනය සහ විවිධාංගීකරණය කිරීමට උපාය මාර්ග සකස් කරන අතරම, වසංගත තත්ත්වය මගින් ඇති වූ අවදානම්වලට සහ ගෝලීය වෙළඳපොළ සහ භාණ්ඩ මිල ගණන්වලට බලපාන ගෝලීය ගැටලුවලට ඔරොත්තු දීමේ හැකියාව සහ ධාරිතාව ගොඩනඟා ගත යුතුය. 2020 වසරේ දී වසංගතය ආරම්භයත් සමඟ, සැලකිය යුතු ලෙස බලපෑමකට ලක්වූ අපනයන කර්මාන්ත, කෙටි කාලයක් තුළ යථා තත්ත්වයට පත්වූ අතර, 2021 වසරේ දී ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම අපනයන ඉපැයීම් වාර්තා කරමින් සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. වසංගතය උග්‍ර වීම හා අඛණ්ඩව පැවතීමත් සමඟ අපනයන අංශය සඳහා ප්‍රධාන වශයෙන් බලපෑ කරුණු අතර, ඉල්ලුම් රටා වෙනස්වීම්, යාත්‍රා සහ බහාලුම් හිඟයත් සමඟ ජාත්‍යන්තර සමුද්‍රීය අවහිරතාවල ප්‍රතිඵලයක් ලෙස පිරිවැය සීඝ්‍ර ලෙස වැඩිවීම, සංචරණ සීමා හේතුවෙන් නිෂ්පාදන සහ ප්‍රවාහන කටයුතුවලට බාධා ඇතිවීම, ඇතැම් යෙදවුම් සපයා ගැනීමේ දුෂ්කරතාවයන් සහ අමුද්‍රව්‍යවල පිරිවැයෙහි කැපී පෙනෙන ඉහළයෑම ප්‍රධාන විය. කෙසේවෙතත්, සමහර අපනයන කාණ්ඩ (ප්‍රධාන වශයෙන්, කෘෂිකාර්මික අපනයන) 2020 වසර අග භාගයේ සිට යහපත් කාර්ය සාධනයක් වාර්තා කළ අතර, අනෙකුත් අපනයන කාණ්ඩද මේ වන විට යම් තරමකට යථා තත්ත්වයට පත් වී ඇත. එසේ වුවද, වසංගතය අඛණ්ඩව පැවතීම, ප්‍රධාන ආර්ථිකයන්හි මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම, වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම, බලශක්ති වෙළඳපොළ ගැටලු සහ මෑතකාලීන භූදේශපාලනික අර්බුද ආදී හේතු මගින් පැන නැගුණු අවිනිශ්චිතතා තවමත් ජාත්‍යන්තර ආර්ථිකයෙහි පවතී. මෙම දුෂ්කරතා මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකාව, ණය නොවන ගලා ඒම් ඉහළ නංවා ගැනීමට

1

සහ ආර්ථිකයේ ඵලදායී වෙළඳ අංශයට සම්පත් වෙන් කිරීම තුළින් සංවර්ධනය වේගවත් කිරීමට සහාය විය හැකි ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාවයක් ලෙස 'නව සාමාන්‍ය' තත්ත්වය තුළ අපනයන අංශය සංවර්ධනය කිරීම හඳුනා ගත යුතුය. විදේශීය අංශයේ ප්‍රතිපත්ති, අපනයන වෙළඳපොළ විවිධාංගීකරණය කිරීම පිළිබඳව පමණක් නොව, උසස් තාක්ෂණයෙන්, තත්ත්වයෙන් උසස් සහ ඉහළ වටිනාකමක් ඇති භාණ්ඩ හා සේවා බවට අපනයන නිෂ්පාදනවල සංකීර්ණත්වය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. දේශීය අගය එකතු කිරීම සඳහා ඉහළ විභවතාවයක් ඇති තොරතුරු සහ විදුලි සංදේශ තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම වැනි සේවා විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික භාණ්ඩ, සැකසූ ආහාරපාන වර්ග, කුළුබඩු හා සාන්ද්‍රමය ද්‍රව්‍ය, බෝට්ටු තැනීම හා අලෙවියෙන් පසු සේවා, සහ ඖෂධ වැනි අපනයන අංශ වෙත අපනයන විවිධාංගීකරණය කිරීම සඳහා සොයා බැලිය යුතු අතර, ප්‍රතිපත්ති තුළින් ඒ සඳහා සහාය ලබා දිය යුතුය. රටේ හිතකර සාර්ව ආර්ථික ප්‍රතිපත්ති මගින්, විශේෂයෙන්ම, නම්‍යශීලී විනිමය අනුපාතිකයක්, ස්ථාවර බදු සහ ආයෝජන ප්‍රතිපත්ති සහ අත්‍යවශ්‍ය යටිතල පහසුකම් පවත්වාගෙන යෑම මගින් අපනයන අංශයට සහාය විය යුතුය.

අත්‍යවශ්‍ය භාණ්ඩ රට තුළ පවත්වාගෙන යෑම සහතික කිරීමට, ආනයන ආදේශන කර්මාන්ත දියුණු කිරීමට සහ අපනයන ආදායම ඉහළ නැංවීමට, වඩා ශක්තිමත් කාර්මික ප්‍රතිපත්ති සහ උපාය මාර්ග අනුගමනය කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව පසුගිය දශක කිහිපය තුළ වෙළඳාම මත යැපෙන ආර්ථිකයක් ලෙස පැවතියද, සාර්ව ආර්ථික අවදානම්වලින් පීඩා විඳින රටකට, විශේෂයෙන්ම අර්බුදකාරී අවස්ථාවන්හිදී, ජාත්‍යන්තර වෙළඳාම හරහා ආහාර සහ අත්‍යවශ්‍ය භාණ්ඩවල අඛණ්ඩ සැපයුම තහවුරු කිරීමට අනෙකුත් රටවල් මත දැඩි ලෙස රඳා පැවතීම දුෂ්කර විය හැකි බව වසංගත තත්ත්වය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ ගෝලීය සැපයුම් දාම ගැටලු මෙන්ම මෑතකදී ඇතිවූ භූදේශපාලනික අර්බුද ආදී තත්ත්වයන් මගින් පෙන්නුම් කළේය. ආනයනය සඳහා ඇතිවූ දුෂ්කරතා සහ දේශීය වෙළඳපොළ භාණ්ඩ හිඟකම මධ්‍යයේ, අවම වශයෙන් තෝරාගත් අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා හෝ ආනයන ආදේශක දේශීයව නිපදවීමේ අවශ්‍යතාව දැඩි ලෙස දැනුණි. එවැනි අත්‍යවශ්‍ය භාණ්ඩ අතරට ආහාර සහ ඖෂධ මෙන්ම, කර්මාන්ත සඳහා අවශ්‍ය යෙදවුම්ද, ඉදිකිරීම් ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණද ඇතුළත් වේ. ආනයනය අධෛර්යමත් කිරීම හරහා කෘෂිකාර්මික ක්ෂේත්‍රය දියුණු කිරීම, ඖෂධ නිෂ්පාදන කලාපයක් පිහිටුවීම, රෙදිපිළි නිෂ්පාදන උද්‍යානයක් පිහිටුවීම සඳහා සැලසුම් සකස් කිරීම වැනි රජයේ ප්‍රයත්නයන් මේ සම්බන්ධයෙන් ප්‍රශංසනීය වේ. මෙම ප්‍රතිපත්තියට, ප්‍රධාන අපනයන අංශවල අගය දාමයන්ගේ පෙර මෙහෙයුම් හා ඒකාබද්ධ වීම ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිපත්තිද සහාය වේ. අනෙක් අතට, සුපරීක්ෂාකාරීව සැලසුම් කරන ලද සහ උපාය මාර්ගික ආදේශන ප්‍රතිපත්ති මගින් රටට විදේශ විනිමය ඉතිරි කර ගත හැකිය. මෙම පසුබිම තුළ, විශේෂයෙන්ම ගෝලීය වසංගතයෙන් පසුව, වෙනත් බොහෝ රටවල්ද ආනයන ආදේශන ප්‍රතිපත්ති අනුගමනය කිරීමේ ප්‍රවණතාවක් පවතී. මෑතකදී, චීනය, ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය වැනි විශාල ආර්ථිකයන් සහ ඇතැම් අප්‍රිකානු රටවල් ආනයනය අධෛර්යමත් කරමින් දේශීය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමට උත්සාහ දැරූ බව දක්නට ලැබුණි. තවද, අපනයනය ඉලක්ක කරගත් නිෂ්පාදන සඳහා පමණක් නොව, අගය දාමයන්ගේ හඳුනාගත් පෙර මෙහෙයුම් හා ඒකාබද්ධ වීම සඳහා ද විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම, ආනයන සඳහා ඵලදායී ලෙස ආදේශන සිදු කරන අතරම අගය දාමයන් හොඳින් කළමනාකරණය කිරීමට ද සහාය වනු ඇත. කෙසේ වෙතත්, කෘෂිකාර්මික ප්‍රතිපත්ති සමඟ ද ඒකාබද්ධ වුණු, විස්තීරණ සහ දිගුකාලීන කාර්මික ප්‍රතිපත්තියක් යටතේ කාර්මීකරණය ඉලක්ක කරගත් ශක්තිමත් සහ අඛණ්ඩ ප්‍රයත්න දැරීම වැදගත් වන අතර, එය කඩිනම්ව සිදු කළ යුතුය.

අපනයන අංශ, සංවර්ධනය, නිදහස්/වරණීය වෙළඳ ගිවිසුම් මත දැඩි ලෙස පදනම් නොවිය යුතුය. ශ්‍රී ලංකාවට වරණීය වෙළඳාම් පිළිබඳ පොදු (ජී.එස්.පී.) ක්‍රම 11ක් යටතේ (යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් ඇතුළුව) විදේශ වෙළඳපොළ ගණනාවකට වරණීය අපනයන පිවිසුම් අවස්ථා ඇත. මේ අතර, ශ්‍රී ලංකාව, විදේශ වෙළඳපොළ වෙත වරණීය පිවිසුම් අවස්ථා සහිත සහන ලබා දෙන බහුපාර්ශ්වික සහ ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම් 7කට එළැඹී ඇත. එසේම, චීනය, ජපානය, ඉන්දුනීසියාව, සිංගප්පූරුව සහ බංගලාදේශය වැනි ඉහළ අනාගත විභවතා ඇති ඇතැම් වෙළඳ හවුල්කරුවන් සමඟ සාකච්ඡා කිරීමට සහ නිදහස්/වරණීය වෙළඳ ගිවිසුම්වලට එළඹීමට ප්‍රයත්න දරමින් සිටී. සාමාන්‍යයෙන්, වෙළඳ ගිවිසුම් මගින් තීරුබදු සහ භාණ්ඩ සලාකකරණය (Quota) කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු වුවද, මෑතකදී, සේවා අපනයන, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් සහ පේටන්ට් නීති, සෞඛ්‍ය සහ ආරක්ෂක රෙගුලාසි, කම්කරු සහ පාරිසරික ප්‍රමිතීන්, ආයෝජන සහ බැංකුකරණය ඇතුළත් වන පරිදි ඒවායේ විෂය පථය පුළුල් වී ඇත. ජී.එස්.පී. යෝජනා ක්‍රම සම්බන්ධයෙන්

ගත් කල, රටවල් විසින් තෝරාගත් ප්‍රතිපාර්ශ්වික රටවල්වලට ඒකපාර්ශ්වික වරණීය වෙළඳපොළ පිවිසුම් අවස්ථා ලබා දෙන අතර, ශ්‍රී ලංකාව ද එවැනි යෝජනා ක්‍රමවල ප්‍රතිලාභියෙක් වෙයි. ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය පහළ මට්ටමක පැවතීම වැනි නිර්ණායක මෙන්ම යහපාලනය, ශ්‍රමය සම්බන්ධ ප්‍රමිතීන් සහ පාරිසරික සාධක වැනි වෙළඳපොළ පිවිසුම් ප්‍රදානය කරන රට විසින් නියම කර ඇති ඇතැම් කොන්දේසි සපුරාලීමේ අවශ්‍යතාව මත සමහර ජී.එස්.පී. යෝජනා ක්‍රමවල ප්‍රතිලාභ අත්විඳිය හැකිය. ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යන විට මෙම යෝජනා ක්‍රමවලින් ප්‍රතිලාභ ලැබීම සඳහා වන සුදුසුකම් ශ්‍රී ලංකාවට අහිමි වී යා හැක. වෙළඳ ගිවිසුම් සහ ජී.එස්.පී. යෝජනා ක්‍රම සඳහා නිෂ්පාදන සම්භවයට අදාලව දැඩි නීති පවතින බැවින්, ශ්‍රී ලංකාව තුළ ඉහළ අගය එකතු කිරීමක් තිබිය යුතුය. එම නිසා, මෙම වෙළඳ ගිවිසුම් හරහා සිදු කරන අපනයන බොහෝ දුරට කෘෂිකාර්මික අපනයනවලට සහ රබර් නිෂ්පාදන වැනි දේශීය යෙදවුම් යොදා ගන්නා කාර්මික භාණ්ඩවලට සීමා වේ. ආනයනික යෙදවුම් විශාල වශයෙන් යොදා ගන්නා අපනයන සඳහා සම්භවය සම්බන්ධව පවතින දැඩි නීති සපුරාලීම අපහසුය. එබැවින්, රබර් නිෂ්පාදන, සෙල්ලම් බඩු සහ කෘෂිකාර්මික අපනයන වැනි භාණ්ඩ හා සසඳන විට ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන නිෂ්පාදනය වන ඇඟලුම් සම්බන්ධයෙන් වුවද, යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් වැනි යෝජනා ක්‍රමවල උපයෝගිතා අනුපාතය ඉහළ මට්ටමක නොපවතී. 2010 වසරේ අගෝස්තු මාසයේ සිට 2017 වසරේ මැයි මස දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවට යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් ප්‍රතිලාභය අහිමිවූ අවස්ථාවේ දී යුරෝපා සංගමයට කරන ලද අපනයන සැලකිය යුතු ලෙස පහළ නොයෑම මගින් මෙම තත්ත්වය පැහැදිලි වේ. මෙම ගැටලු මධ්‍යයේ වුවද, මෙම යෝජනා ක්‍රම/ගිවිසුම් මගින් ලබා දෙන අඩු තීරුබදු තුළින් සමහර අපනයන සැලකිය යුතු ප්‍රතිලාභ අත්කරගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජී.එස්.පී. යෝජනා ක්‍රම ඇතුළුව වරණීය වෙළඳ ගිවිසුම් යටතේ 2021 වසරේ සමස්ත අපනයන ඉපැයීම්වලින් සියයට 43ක් උපයා තිබේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව අපනයන ඉපැයීම්වලින් විශාල කොටසක් වෙළඳ ගිවිසුම් යටතේ උපයා තිබීමෙන්, අපනයනවල වාර්තා වූ ඉහළ යෑම සඳහා එවැනි ගිවිසුම් ප්‍රධාන ම හේතුව වූ බව අදහස් නොවේ. අපනයනය කරනු ලබන සමාගම, දේශීය ආර්ථික සාධක සහ ගෝලීය වෙළඳපොළ සාධකවලට අදාළ වෙනත් සාධක මගින් එවැනි අපනයන ධෛර්යමත් විය හැකිය. මේ අතර, කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරීත්වය (RCEP) නැගෙනහිර ආසියාවේ, අග්නිදිග ආසියාවේ සහ ඕෂනියාවේ රටවල් 30ක් විසින් අත්සන් කර ඇති) වැනි අනෙකුත් රටවල්වල වෙළඳ ගිවිසුම් ද ශ්‍රී ලංකාවේ අනාගත තරඟකාරීත්වයට ගැටලු මතු කරයි. ශ්‍රී ලංකාවේ අපනයන සඳහා වෙළඳ ගිවිසුම් සහ ජී.එස්.පී. යෝජනා ක්‍රම මගින් සැලකිය යුතු, ප්‍රතිලාභ අත් වී තිබුණ ද, අපනයන වෙළඳපොළ පුළුල් කරන අතර, අපනයන භාණ්ඩ විවිධාංගීකරණය කිරීම සහ ගෝලීය අගය දාමයන්ට සාර්ථක ලෙස ඒකාබද්ධ කිරීම, පිළිබඳව සලකා බලමින් එවැනි වෙළඳ ගිවිසුම් හෝ යෝජනා ක්‍රම මත රඳා පැවතීම අවම කිරීමට කටයුතු කිරීම දූරදර්ශී වනු ඇත. කෙසේ වෙතත්, නිදහස්/වරණීය වෙළඳ ගිවිසුම්වලට එළඹිය යුත්තේ අපනයනවල විභවතාව වැඩිවීම හෝ ආනයන පිරිවැය අවම වීම පිළිබඳව තාර්කිකව හඳුනාගත හැකි නම් පමණි. කෙසේ වෙතත්, තීරුබදු සහන මත දැඩි ලෙස රඳා පැවතීමට වඩා පර්යේෂණ හා සංවර්ධනය මූලික කර ගත් නවෝත්පාදන තුළින් අඩු නිෂ්පාදන පිරිවැයක් යටතේ ඉහළ අගයක් එකතු කරමින් වැඩි දියුණු කළ ගුණාත්මක භාණ්ඩ අපනයනය කිරීම කෙරෙහි අපනයන ප්‍රවර්ධන ප්‍රතිපත්ති මගින් අවධානය යොමු කළ යුතුය.

විදේශයන්හි උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා ඉහළගිය ඉල්ලුම සහ සැලකිය යුතු ලෙස ඉහළ විදේශ විනිමය වියදම් හේතුවෙන් දේශීය වශයෙන් පවතින උසස් අධ්‍යාපන අවස්ථා සම්බන්ධ ගැටලු කඩිනමින් විසඳා ගැනීමේ අවශ්‍යතාව ඉස්මතු කෙරෙයි. නිදහස් අධ්‍යාපනය ලබා දීමට සහ උසස් අධ්‍යාපනයට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට අනුප්‍රාප්තික රජයන් කැපවී සිටිය ද, උපාධි හා පශ්චාත් උපාධි මට්ටමින් සුදුසුකම්ලත් සිසුන් විශාල සංඛ්‍යාවක් රාජ්‍ය අධ්‍යාපන පද්ධතියෙන් බැහැරව සිටී. 2020 වසරේ දී අ.පො.ස. උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුන්ගෙන් දළ වශයෙන් සියයට 63ක් රාජ්‍ය අංශයේ තෘතීයික අධ්‍යාපන ක්‍රමයට ඇතුළත් වීමට සුදුසුකම් ලැබුව ද, මෑත කාලීනව බඳවා ගන්නා සංඛ්‍යාව ඉහළ ගොස් තිබියදීත්, පද්ධතියට ඇතුළත් කර ගෙන ඇත්තේ සුදුසුකම් ලත් සිසුන්ගෙන් සියයට 22ක් පමණි. ඒ අනුව, දේශීය වශයෙන් ස්ථාපනය කර ඇති රාජ්‍ය හා පෞද්ගලික උසස් අධ්‍යාපන ක්‍රමවල පවතින සීමිත අවස්ථා හේතුවෙන් උසස් අධ්‍යාපනය හැදෑරීම සඳහා සිසුන් ඉහළ සංඛ්‍යාවක් ක්‍රමයෙන් විදේශ රටවලට ඇදී යෑම ආරම්භ වී ඇත. මේ සම්බන්ධයෙන් පවතින ප්‍රධාන ගැටලුවක් වන්නේ සැලකිය යුතු විදේශ විනිමය ප්‍රමාණයක් රටින් පිටතට ගලායෑම වන අතර, එමගින් විදේශීය අංශයේ පවතින අසමතුලිතතාවයට පීඩනයක් එක් කළ හැකිය. තවද, දේශීය ආර්ථිකය ගෝලීය ආර්ථිකයට වැඩි වශයෙන් ඒකාබද්ධ වනවිට,

1

නවීන සේවා පරිසරයක ගතික ඉල්ලුමට සරිලන පරිදි දේශීය ශ්‍රම බලකායට පරිවර්තනය වීමට සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම, තොරතුරු තාක්ෂණය/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශය එ.ජ. ඩොලර් බිලියන 5ක කර්මාන්තයක් දක්වා පුළුල් කිරීමට අපේක්ෂා කරන තත්ත්වයකදී සහ ශ්‍රී ලංකාව විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට උත්සාහ දරන තත්ත්වයක් තුළ, ජාත්‍යන්තරව පිළිගත් සුදුසුකම් සහිත පුහුණු ශ්‍රම සංචිතයක් තිබීම අත්‍යවශ්‍ය වේ. එසේම, කොළඹ වරාය නගරයේ සහ ජාත්‍යන්තර මූල්‍ය නගරයේ බිහිවන නව රැකියා අවස්ථා සඳහාද එවැනි පුහුණු පුද්ගලයින්ගෙන් සමන්විත සංචිතයක් අවශ්‍ය වේ. ඒ අනුව, සේවා අංශය තවදුරටත් පුළුල් වීමත් සමඟම ජාත්‍යන්තර ප්‍රමිතියෙන් හෙබි දේශීය අධ්‍යාපනය සඳහා ඇති අවස්ථා වැඩිදියුණු කිරීම මගින් දක්ෂතා යම් ප්‍රමාණයකට රට තුළ රඳවා ගැනීමට හැකිවන අතරම, ශ්‍රම බලකායේ අවශ්‍ය කුසලතා වැඩිදියුණු කිරීමට ද උපකාරී වේ. එබැවින්, දේශීය විශ්ව විද්‍යාලයන්හී ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සඳහා යොමු වූ ප්‍රතිපත්තිමය මුලපිරීම් සහ ධාරිතා වැඩිදියුණු කිරීම්, දේශීය සිසුන් රඳවා තබා ගැනීමට පමණක් නොව, විදේශයන් වෙතින් ජාත්‍යන්තර සිසුන් ආකර්ෂණය කර ගැනීම සඳහා ද අත්‍යවශ්‍ය වේ. තවද, නවාතැන් පහසුකම්, සමාජ ක්‍රියාකාරකම්, විශේෂිත පර්යේෂණ සහ රසායනාගාර පහසුකම් ආදියෙන් සමන්විත විශ්ව විද්‍යාලයකට අවශ්‍ය යටිතල පහසුකම් ගොඩනැගීම කෙරෙහි පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන අවධානය යොමු කිරීම ද වැදගත් වේ. එවැනි ක්‍රියාමාර්ග ඉගැනුම් ප්‍රමිතීන් වැඩිදියුණු කිරීමට පමණක් නොව, දැනට උසස් අධ්‍යාපනය සඳහා විදේශගත වන සිසුන් ආකර්ශණය කර ගැනීමේ ප්‍රධාන සාධකයක් වන සමස්ත ඉගෙනුම් අත්දැකීම්ද වැඩිදියුණු කිරීමට දායක වනු ඇත. ජාත්‍යන්තර ප්‍රතීතනය හා අනුකූලව අන්තර්ජාතික මට්ටමේ විශ්ව විද්‍යාල සමඟ ඉහළ සහයෝගීතාවයකින් කටයුතු කරමින් පෞද්ගලික උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය පුළුල් කිරීම සඳහා පහසුකම් සැලසීම පිළිබඳව රජයට සලකා බැලිය හැකිය. තවද, විදේශීය විශ්වවිද්‍යාලවලට ශ්‍රී ලංකාවේ එම විශ්වවිද්‍යාලවල ශාඛා පිහිටුවීමට පහසුකම් සැලසීම මගින්, විදේශීය අධ්‍යාපන ගමනාන්තයක් ලෙස ජාත්‍යන්තර සිසුන් රට වෙත ආකර්ශණය කර ගැනීමට හැකි වනු ඇති අතර, දේශීය සිසුන් සඳහා සිය රටෙහිදී ම කීර්තිමත් විදේශීය ආයතනවලින් අධ්‍යාපනය ලැබීමට පහසුකම් සැලසේ. ජාත්‍යන්තරව පිළිගත් අධ්‍යාපන ආයතන මගින් අධ්‍යාපනය ලබා දීමේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා නේවාසික වීසා යෝජනා ක්‍රමය යටතේ ලෝකයේ ඉහළ මට්ටමේ පීඨ සාමාජිකයින් ආකර්ෂණය කර ගැනීම ද අවශ්‍ය වේ. එවැනි පියවර මගින්, විදේශීය සෘජු ආයෝජන ප්‍රවාහයන් වැඩිදියුණු කරන අතර, කාර්මික හා තාක්ෂණික දැනුම ගෙන එනු ඇත. තවද, එවැනි වැඩපිළිවෙලක් මගින්, තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ අංශයට පහසුකම් සැලසීම සඳහා පුහුණුකෙරෙන ශ්‍රමයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක ඉහළ නැංවීමක් ඇති කිරීමට සහ පසුකාලීනව මෙරට දී ඩිජිටල් නොමැඩ්වරු (දුර ස්ථානවල සිට තාක්ෂණය හරහා වැඩ කරන පිරිස්) ලෙස කටයුතු කළ හැකි ජාත්‍යන්තර සිසුන් ආකර්ෂණය කර ගැනීමට හැකි වීම තුළින් තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමට අදාළ විසඳුම් සපයන ප්‍රමුඛ පෙළේ සැපයුම්කරුවෙකු ලෙස නැගී සිටීමට රට දරන උත්සාහයට පහසුකම් සැලසිය හැකිය. මෙවැනි වර්ධනයක සමස්ත පීඩනය රජය වෙත පැවරීමකින් තොරව, උසස් අධ්‍යාපනය සඳහා වූ ප්‍රවේශයෙහි සමස්ත දියුණුවක් සඳහා මෙමගින් මග පෑදිය හැකි අතර, අනාගතයේ දී උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට විදේශ විනිමය උපයන ප්‍රධාන අංශයක් ලෙස නැගී සිටීමට ද මෙමගින් හැකියාව ලැබෙනු ඇත.

නිදහස ලැබීමෙන් පසුව කෘෂිකාර්මික අංශයේ පරිවර්තන සිදු වුවද, එම අංශයේ සමස්ත ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ආහාර සුරක්ෂිතතාව සහ කාර්යක්ෂම පරිසර පද්ධති කළමනාකරණය සහතික කරමින් හිතකර මට්ටමේ ආදායම් උත්පාදනය කෙරෙන තිරසාර කෘෂිකාර්මික අංශයක් නිර්මාණය කිරීමේ අඛණ්ඩ අරගලයක ශ්‍රී ලංකාව පසුවේ. ආර්ථිකය තුළ වර්ධනය වන ඉල්ලුම සපුරාලිය හැකි කෘෂි අංශයක් සංවර්ධනය කිරීම සඳහා 1960 දශකයේ දී ක්‍රියාත්මක වූ කෘෂි ව්‍යාපාරය යටතේ, ඉහළ අස්වැන්නක් ලබා දෙන බෝග ප්‍රභේද ශීඝ්‍රයෙන් හඳුන්වා දීම සහ පොහොර සහනාධාර ක්‍රමය යටතේ රසායනික පොහොර භාවිතය මෙන්ම අනෙකුත් කෘෂි රසායන යෙදවුම් භාවිතය ද ඉහළ ගියේය. පසුකාලීනව, නිෂ්පාදනවල තිරසාර වර්ධනයක් සහතික කිරීමේ අදහසින් ගොවීන්ට මුදල් ප්‍රදාන හෝ නොමිලයේ හෝ වෙළඳපොළ මිලට වඩා අඩු මිලකට පොහොර නිකුත් කිරීම මගින් ගොවීන්ට පොහොර මත සහනාධාර අඛණ්ඩව ලබා දුන්නේය. ඒ අනුව, දුර්වල මට්ටමේ පවතින ව්‍යාප්ති සේවා සහ ගොවීන්ගේ අඩු දනුම්වත්භාවය සමඟ එවැනි සහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම, කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලියේ දී රසායනික හෝ අකාබනික ද්‍රව්‍ය අධික ලෙස භාවිතා කිරීමට හේතු වී ඇති අතර, එමගින් රාජ්‍ය මූල්‍ය ආශ්‍රිත වියදම් වලට අමතරව මිනිසාගේ යහපැවැත්මට, සෞඛ්‍යයට සහ පරිසර පද්ධතිවලට දිගුකාලීන අහිතකර බලපෑම් ඇති කර ඇත. එසේම,

අඩු පිරිවැයක් සහිත රසායනික පොහොර වෙළඳපොළ මිල ගණන්වලට වඩා අඩුවෙන් මිල දී ගත හැකිවීම හේතුවෙන්, ශ්‍රමය සහ කාලය වැඩි වශයෙන් වැයවන කාබනික පොහොර මෙන්ම, අනෙකුත් කාබනික සහ තිරසාර කෘෂිකාර්මික ක්‍රම, වගාවන් සඳහා භාවිතා කිරීමෙන් ගොවීන් ඉවත් වී ඇත. කාබනික පොහොර භාවිතය මගින් සෑමවිටම වගාකරුවන්ට, පරිභෝජකයින්ට මෙන්ම පරිසරයට ද විවිධ ප්‍රතිලාභ අත්වේ. මෙමගින් පාංශු ජෛව විවිධත්වය පවත්වා ගනිමින් පෝෂක හා ජලය පසෙහි රඳවා තබා ගැනීමට සහ එමගින් පසේ සාරවත් බව පවත්වා ගැනීම සඳහා ද දායක වේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික පද්ධතිවල අධික ලෙස රසායනික පොහොර භාවිතය සහ කාබනික පොහොර සහ පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතා නොකිරීම හේතුවෙන් පාංශු හායනය, භූගත හා මතුපිට ජලය දූෂණය, ජලය මතුපිට අධික ලෙස ශාක හා ඇල්ගී වර්ධනය සහ ජලජ පරිසර පද්ධතිවලට හානි සිදුවීම තුළින් ස්වභාවික පරිසරයට අහිතකර බලපෑම් ඇති වී තිබේ. මේ අතර, කෘෂිරසායන ද්‍රව්‍ය අධික ලෙස භාවිතය ජෛව විවිධත්වය කෙරෙහි සැලකිය යුතු ලෙස අහිතකර බලපෑම් ඇති කරන අතර, සෘජු හා වක්‍ර ලෙස සෞඛ්‍ය ගැටලු නිර්මාණය කිරීමටද හේතු වේ. ඒ අනුව, ආර්ථික ලාභදායිත්වය, සමාජීය හා ආර්ථික සමානාත්මතාවය මෙන්ම පාරිසරික සෞඛ්‍යය සහතික කෙරෙන තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරගත් දිගුකාලීන ප්‍රතිපත්ති රාමුවක් සැකසීමේ හදිසි අවශ්‍යතාවක් පවතී. කෘෂිකර්මාන්තයේ දී කෘත්‍රිම පොහොර අධික ලෙස භාවිතය සීමා කිරීමේ අරමුණින් කාබනික පොහොර ප්‍රවර්ධනය කිරීමට රජය දරන උත්සාහය අගය කරන අතරම, තිරසාර ලෙස කෘෂිකර්මික කටයුතු කරගෙන යෑමට අදාළ සියලුම අංග ඇතුළත් පරිපූර්ණ උපාය මාර්ගයකින් පමණක් අනාගත පරපුරේ අවශ්‍යතාවලට හානියක් නොවන පරිදි වර්තමාන පරපුරේ අවශ්‍යතා සපුරාලීම සහතික කළ හැකි බව අවධාරණය කළ යුතුය. ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් තුනෙන් එකක් පමණ කෘෂිකාර්මික අංශයේ නියැලී සිටීම සහ කම්පනවලට ඔරොත්තු දීමේ කෘෂි අංශයේ පවතින අඩු හැකියාව හේතුවෙන් ඔවුන් බොහෝ දෙනාගේ ජීවනෝපායන් අඛණ්ඩව අවදානමට ලක්වන තත්ත්වය පිළිබඳව සැලකීමේදී මෙම පියවර අත්‍යවශ්‍ය වේ. ඊට අදාළව, තිරසාර හා දේශගුණික වශයෙන් හිතකර සුහුරු කෘෂිකාර්මික භාවිතයන් ප්‍රයෝජනයට ගැනීමට ගොවීන්ට හැකි වන පරිදි තිරසාර කෘෂිකාර්මික පදනමක් නිර්මාණය කිරීමට රජය පහසුකම් සැලසිය යුතුය. ඒ අනුව, කෘෂිකාර්මික යෙදවුම් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම දිරිගන්වන කෘෂිකාර්මික ක්‍රමයක් ස්ථාපිත කිරීම කෙරෙහි අවධානය යොමු කරන කඩිනම් ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. එවැනි ප්‍රවේශයක් යටතේ, කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කරන අතරම රසායනික පොහොර කාර්යක්ෂම හා ප්‍රශස්ත ලෙස භාවිතය දිරිමත් කිරීම ඉතා වැදගත් වේ. මෑත කාලයේ දී නිරන්තරයෙන් රටට බලපෑ නියඟ සහිත කාලගුණික තත්ත්වයන් පිළිබඳව අවධානය යොමු කර, අඩු ජල පරිමාවක් භාවිතා කරන බිංදු වාරි තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම සහ නියඟයට ඔරොත්තු දෙන බෝග විශේෂ හඳුන්වාදීම වැනි කාර්යක්ෂම ජල කළමනාකරණ ක්‍රම ප්‍රවර්ධනය කළ යුතුය. එසේම, කෘෂිකාර්මික ඉඩම්වල දිගුකාලීන පාංශු ඵලදායිතාව සහතික කිරීම සහ නාය යෑමේ ආපදා අවම කිරීම සඳහා පාංශු සංරක්ෂණ උපාය මාර්ග කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. එසේම, ආහාර සඳහා වන ඉල්ලුම වර්ධනය වීම, දේශගුණික විපර්යාස මෙන්ම වගා කළ හැකි ඉඩම් ප්‍රමාණය සීමිත වීම වැනි ගැටලුවලට පිළියම් යෙදීමේ දී, සාම්ප්‍රදායික කෘෂිකාර්මික අංශයේ කටයුතු සඳහා යන්ත්‍රසූත්‍ර භාවිතා කරන අතර, සිරස් ගොවිතැන (vertical farming) සහ නාගරික ගොවිතැන (urban farming) ඇතුළු නව්‍ය ගොවිතැන් ක්‍රම ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. මේ අතර, රටෙහි කෘෂිකාර්මික අංශය ආනයනික බීජ, පොහොර සහ කෘෂිරසායන ද්‍රව්‍ය මත බෙහෙවින් රඳා පවතින බැවින් කෘෂිකර්මාන්තයේ තිරසාර බව ළඟා කර ගැනීම සඳහා දේශීය වශයෙන් පොහොර, කෘෂි රසායන මෙන්ම බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. තිරසාර කෘෂිකාර්මික අංශයක් කඩිනමින් ගොඩනැගීම සඳහා තිරසාර, දේශගුණික වශයෙන් හිතකර සුහුරු සහ යහපත් කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳව සියලු පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම අවශ්‍යය වේ. තවද, ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ පවතින කෘෂිකාර්මික ක්‍රමය තිරසාර ක්‍රමයක් බවට පරිවර්තනය කිරීම සඳහා මනාව සංවර්ධනය වූ ඒකාබද්ධ යාන්ත්‍රණයක් අත්‍යවශ්‍ය වන අතර, එමගින් මෙවැනි පරිවර්තනයක සම්පූර්ණ ප්‍රතිලාභ කෘෂිකාර්මික සැපයුම් දාමයේ නියැලී සිටින සියලුම දෙනා වෙත ලබා දීම සහතික කිරීමද අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වන අතර එම ව්‍යාපාර තවදුරටත් වර්ධනය වීම සඳහා වැඩි හැකියාවක් පැවතිය ද, එම ව්‍යාපාර නොයෙකුත් බාධාවන්ට මුහුණ දෙන බැවින් ඒ සඳහා ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ප්‍රමුඛතා ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නොවන අංශයේ ආයතනවලින් සියයට 99කට වැඩි ප්‍රමාණයක් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය

1

පරිමාණ ව්‍යාපාර බව සොයාගෙන ඇති අතර, එමගින් කෘෂිකාර්මික නොවන අංශය තුළ සේවා නියුක්තියෙන් සියයට 75කට පමණ දායකත්වයක් සපයයි.[3] ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික කටයුතු වෙත ලබා දෙන දායකත්වය සියයට 50කට වඩා වැඩි බව විවිධ අධ්‍යයන මගින් පෙන්වා දෙයි. කෙසේ වෙතත්, මෙම දායකත්වය සංවර්ධිත රටවල් සහ ඇතැම් සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සමඟ සැසඳූ විට සාපේක්ෂව අඩු අගයකි. ශ්‍රී ලංකාවෙහි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විශාල සංඛ්‍යාවක් පැවතිය ද, එම ව්‍යාපාර මගින් ආර්ථිකයට වන දායකත්වය එහි උපරිම විභව හැකියාව කරා ළඟා වී නොමැති බව මෙම නිරීක්ෂණ මගින් පෙන්නුම් කරයි. දශක කිහිපයක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ස්වභාවික විපත්, ත්‍රස්තවාදී ක්‍රියාකාරකම්, සෞඛ්‍ය ගැටලු ආදිය ඇතුළු විවිධ හේතු නිසා දුෂ්කර තත්ත්වයන්ට මුහුණ දුන්නේය. වසංගත තත්ත්වයන් වැනි කාල පරිච්ඡේද තුළ දී ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට සහාය ලබා දීම සඳහා රජය සහ මහ බැංකුව විසින් වෙනත් බොහෝ රටවල් මෙන් මූල්‍ය සහ මූල්‍ය නොවන සහන ගණනාවක් ලබා දෙන ලදී. කෙසේ වෙතත්, මෙම අංශයේ ව්‍යාපාර සහ පුද්ගලයන් ගණනාවක් එවැනි සහන යෝජනා ක්‍රම හරහා යථා තත්ත්වයට පත් නොවීමට හෝ ඒවායේ උපරිම හැකියාව කරා ළඟා වී නොතිබිය හැකිය. මූල්‍යන සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක් නොමැතිකම මෙන්ම, දුර්වල මූල්‍ය සාක්ෂරතාව ඇතුළු ගැටලු කිහිපයක් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ප්‍රගතියට බාධා කර ඇති බව හඳුනාගෙන ඇත. මූල්‍ය ආයතනවලට අවශ්‍ය ප්‍රමාණවත් තොරතුරුවලින් සමන්විත ව්‍යාපෘති යෝජනා සකස් කිරීමට අවැසි මූල්‍ය සාක්ෂරතාව බොහෝ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සතුව නොමැති අතර, මෙම ව්‍යවසායකයින් අතර මූල්‍ය තොරතුරු වාර්තා කිරීම සාපේක්ෂව දුර්වල මට්ටමක පවතී. මේ හේතුවෙන් ණය ලබා දීමේ දී මූල්‍ය ආයතනවලට ඇපකර මත පදනම් වූ ණය දීම් සඳහා යොමු වීමට සිදු වන අතර, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ආවේණික වූ කුඩා වත්කම් පදනම හේතුවෙන් ණය ලබා ගැනීමේ හැකියාව සීමා වන හෙයින් ඔවුන් අවිධිමත් ණය දෙන්නන්ගේ සේවා ලබා ගැනීමට ද පෙළඹවීමක් ඇති කරයි. ප්‍රමාණවත් පිළිගත හැකි ඇපකර නොමැතිකම මධ්‍යයේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තම ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ දී මුහුණ දෙන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, රජය විසින් පාර්ශ්වයන් කිහිපයක් සමඟ සාකච්ඡා කර දීර්ඝ කාලයක් මුළුල්ලේ අවශ්‍යතාවක්ව පැවති ණය ඇපකර ආයතනයක් පිහිටුවීම ආරම්භ කළේය. ණය ඇපකර ආයතනයක් ආරම්භ කිරීමත් සමඟ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අරමුදල් සම්බන්ධ ගැටලු යම්තාක් දුරකට ලිහිල් කිරීමටත් ඉදිරි කාලයේ දී ඔවුන්ගේ අපේක්ෂා මෙන්ම, සමස්ත ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ඔවුන්ගේ දායකත්වය වැඩිදියුණු කිරීමටත් අපේක්ෂා කෙරේ. ණය ඇපකර ආයතනයෙහි කඩිනම් ක්‍රියාකාරීත්වය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ පැවැත්ම සඳහා ඉමහත් සහායක් ලබා දෙනු ඇත. මේ අතර, මෙරට කුඩා ව්‍යාපාරවලට සහාය දැක්වීම සඳහා මනාව ක්‍රියාත්මක වන සංවර්ධන බැංකුවක් පිහිටුවීම ද අවශ්‍යතාවයක් වන අතර, මෙම කාරණය වසර කිහිපයක සිට අවධාරණය කෙරෙමින් පවතී. තවද, සමූහ අරමුදල්, ව්‍යාපාර ප්‍රාග්ධන ආයෝජන, නව ව්‍යවසායකයින් දිරිමත් කිරීම සඳහා වන වැඩසටහන් (pitch competitions) වැනි විවිධ රටවල සාර්ථක වූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා විකල්ප අරමුදල් මාර්ග අනුගමනය කිරීමේ සහ ජනප්‍රිය කිරීමේ හැකියාව ද සොයා බැලිය යුතුය. ඒ අතරම, කොළඹ කොටස් වෙළඳපොළහි සවිබල ගැන්වීමේ මණ්ඩලය (Empower Board) හරහා පහසුකම් සපයනු ලබන හිමිකම් කොටස් මූල්‍යනය කර ගැනීමේ ඉඩ ප්‍රස්ථා පිළිබඳ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම මගින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ප්‍රතිලාභ ලැබිය හැකිය. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඔවුන්ගේ සැබෑ විභව හැකියාව කරා ළඟා වීම සීමා කරන අනෙකුත් බාධා අතර අඩු කළමනාකරණ කුසලතා, යල් පැන ගිය තාක්ෂණ භාවිතය හා එහි ප්‍රතිඵලයක් ලෙස ගුණාත්මක බවින් අඩු නිෂ්පාදන, සීමිත වෙළඳපොළ දැනුම, තොරතුරු අසමමිතිකතාවය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා හිතකර බවින් අඩු ඇතැම් සංස්කෘතිකමය අවබෝධයන් යනාදිය වේ. මේවායින් ඇතැම් සාධක දෙස සමීපව නිරීක්ෂණය කර බැලීමෙන් පෙනී යන්නේ මේවා එකිනෙකට සම්බන්ධ බවත් මෙම සම්බන්ධතා තුළින් ගැටලු තවදුරටත් උග්‍ර වන බවත්, එබැවින් ඒවා සාර්ථකව තුරන් කිරීමට සාමූහික ප්‍රයත්න අවශ්‍ය බවත්ය. රජය සහ අනෙකුත් ආයතන විසින් ගනු ලැබූ විවිධ වූ ක්‍රියාමාර්ග රාශියක් මගින් බොහෝ පුද්ගලයන්ට සහ ව්‍යාපාරවලට ඇතැම් ගැටලු විසඳා ගැනීමට උපකාර වී ඇතත්, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වැඩිදියුණු වීම සඳහා තවමත් සැලකිය යුතු ඉඩ ප්‍රස්ථාවක් පවතී. ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අතර කළමනාකරණ සහ ව්‍යවසායකත්ව කුසලතා ශක්තිමත් කිරීමට සහ මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු

3 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2013/2014 වසරවල පවත්වන ලද ආර්ථික සමීක්ෂණයට අනුව

කිරීමට ගන්නා ප්‍රයත්න අඛණ්ඩව පවත්වාගෙන යෑම වැදගත් වේ. රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන විසින් ව්‍යාපාර උපදේශන සහ ණය උපදේශන සේවා සැපයීම වැඩිදියුණු කළ යුතු අතර, මූල්‍ය ආයතනවල විශේෂ ඒකක හරහා ද එවැනි සේවා පිරිනැමීම සහ ප්‍රචලිත කිරීම සිදුකළ හැකි අතර, ඒවා අවසානයේ දී මූල්‍ය එකඟතාවලට මගපාදනු ලැබේ. තවද, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් අලෙවිකරණ අවස්ථා වර්ධනය කිරීම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය වන අතර, විශාල ව්‍යාපාර සමඟ සැපයුම් දාම හරහා ඒකාබද්ධ කිරීම මගින් මෙම අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු වේ. මේ අතරම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නව තාක්ෂණ භාවිතය වැඩිදියුණු කිරීම සඳහා සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්න අවශ්‍ය වන අතර, එමගින් ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩිදියුණු වන අතර, වෙළඳපොළ ප්‍රවේශය වැඩි වේ. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා සහාය ලබා දෙන රජයේ විවිධ ආයතන සහ රාජ්‍ය නොවන ආයතන අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම ද වැදගත් වේ. ව්‍යාපාරවලට සහ පුද්ගලයන්ට අවශ්‍ය වූ විට පහසුවෙන් ඔවුන් වෙත ළඟා විය හැකි වන පරිදි මෙම විවිධ සහාය ලබා දෙන අංශ පිළිබඳ දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අතරට, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ක්‍රියාත්මක වන මනා සම්බන්ධීකරණයක් සහිත දුක් ගැනවිලි හැසිරවීමේ යාන්ත්‍රණයක් තුළින් සමස්ත ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ප්‍රතිලාභ ලැබෙනු ඇති අතර, එමගින් ඔවුන් විසින් මුහුණ දෙන මෙහෙයුම් දුෂ්කරතා ලිහිල් කිරීමට දායක වීමට මෙන්ම, සුදුසු ප්‍රතිපත්ති හරහා පිළියම් සැපියිය හැකි ඕනෑම ප්‍රධාන ගැටලුවක් වෙත ඉහළ අවධානයක් යොමු කළ හැකිය. තවද, මෙරට ව්‍යාපාර සිදු කරගෙන යෑමේ පරිසරය තුළ පවතින දීර්ඝ කාලීන අවහිරතා අවම කිරීමට ගත් ප්‍රයත්න ආර්ථිකයේ සියලුම ව්‍යාපාරික කටයුතුවල වැඩිදියුණුවීම් සඳහා පහසුකම් සපයන අතරම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ද නිසැකයෙන්ම උපකාරී වනු ඇත.

ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන තිබුණද, කොවිඩ්-19 වසංගතය විසින් තවදුරටත් උග්‍ර කර ඇති අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලු මගින් ශ්‍රී ලංකාව අඛණ්ඩව දුෂ්කරතාවයට පත්ව සිටී. විශේෂයෙන්ම, 2017 වසරේ දී මීතොටමුල්ල කසළ අංගනය නාය යෑමේ ව්‍යසනය සහ විවෘත කසළ අංගන හේතුවෙන් වන සතුන්ට සිදුව ඇති බලපෑම් ආදී මෑත කාලීන සිදුවීම් මුල් කර ගනිමින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුවිය. අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් ජාතික හා ක්ෂුද්‍ර මට්ටමේ ක්‍රියාමාර්ග සහ ඉලක්ක ගණනාවක් තිබුණද, එවැනි ක්‍රියමාර්ග ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ දී අඛණ්ඩ පසුගාමී බවක් දක්නට ලැබේ. තවද, කොවිඩ්-19 වසංගතය ව්‍යාප්තිය එහි ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍ය සේවා ආයතන, නිරෝධායන මධ්‍යස්ථාන, සහ නිවෙස්වලින් බැහැර කරන ලද මුඛ ආවරණ, පුද්ගලික ආරක්ෂක උපකරණ, අත්වැසුම්, ලේන්සු, අත්පිස්නා, සනීපාරක්ෂක තුවා, ඩයපර සහ රෝගීන්ගේ සිරුරු වලින් නිකුත් කරන අපද්‍රව්‍යවලින් අපවිත්‍ර වුණු අනෙකුත් ද්‍රව්‍ය වැනි සෞඛ්‍ය සේවා ආශ්‍රිත අපද්‍රව්‍ය ඉහළ යෑම පිළිබඳව දැඩි අවධානයකට ලක්ව ඇත්තේ එවැනි "එක් වරක් පමණක් භාවිතා කල හැකි" ද්‍රව්‍ය ඉදිරි කාලයේ දී අඩු වීමේ ප්‍රවණතාවක් නොමැති බැවිනි. 2019 වසරෙහි සිදු කරන ලද සෞඛ්‍ය සේවා ආශ්‍රිත අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික විගණන වාර්තාව අනුව, විගණනය කරන ලද රෝහල්වලින් දළ වශයෙන් සියයට 70ක් පමණ පූර්ව වසංගතය කාලපරිච්ඡේදය තුළ දී සෞඛ්‍ය සේවා ආශ්‍රිත අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රමිතීන්ට අනුකූල නොවූ බව අවධාරණය කර ඇත. සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රමිතීන්ට අනුකූල නොවී කටයුතු කිරීම සහ අනතුරුදායක හා ආසාදනය වියහැකි අපද්‍රව්‍ය අක්‍රමවත් ලෙස බැහැර කිරීම මගින් පරිසරයට, මහජන සෞඛ්‍යයට සහ ජෛව විවිධත්වයට බරපතල තර්ජන ඇති කරන බැවින් එය වර්තමානයේදී සැලකිය යුතු අවදානමක් ඇති කරන තත්ත්වයට පත්ව ඇත. කොවිඩ් -19 ප්‍රතිකාර සඳහා වෙන් කරන ලද රෝහල්වල සහ ප්‍රතිකාර මධ්‍යස්ථානවල සායනික අපද්‍රව්‍ය ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ යෑමට අමතරව, වසංගත කාල සීමාව තුළ සායනික අපද්‍රව්‍ය විවෘතව දහනය කිරීම ද ඉහළ ගොස් තිබේ. සෞඛ්‍ය සේවා පහසුකම් වලට අදාළව මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ සායනික අපද්‍රව්‍ය පාලනය සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් යෙදවීම තුළින් මෙම ගැටලු නිරාකරණයට රජය විසින් පියවර ගෙන ඇති නමුත්, අපද්‍රව්‍ය ගබඩාකරණ පහසුකම්, ප්‍රවාහනය සහ දහනය කිරීමේ පහසුකම් සීමිත වීම වැනි සැලකිය යුතු මට්ටමේ සම්පත් සහ තාක්ෂණිකමය සීමාවන්ට සෞඛ්‍ය සේවා පහසුකම් තවමත් මුහුණ දෙමින් සිටී. කොළඹ අගනගර ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීමට අමතරව, අපද්‍රව්‍ය මගින් බලශක්තිය නිපදවීම කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වන අතර, මෙගාවොට් 10ක ජනන ධාරිතාවකින් යුක්තව එවැනි එක් බලාගාරයක් 2021 වසර මුල් භාගයේ දී ආරම්භ

1

කරන ලදී. ව්‍යාපෘති ආශ්‍රිතව පවතින අධික ප්‍රාග්ධන වියදම් හේතුවෙන් එවැනි බලාගාර ඉදිකිරීම ප්‍රමාද වී ඇත. කෙසේ වෙතත්, මෙම ව්‍යාපෘති කාලෝචිත ලෙස ස්ථාපිත කිරීම රටේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලුවලට පමණක් නොව විදුලි අවශ්‍යතාවයන් සඳහා ද මූලික විසඳුමක් විය හැකිය. ගෝලීය ප්‍රවණතා අනුව, ආයෝජකයින් සහ අනුග්‍රාහක ආයතන හරිත ව්‍යාපෘති හරහා ගෝලීය තිරසාර බව ඇතිකිරීම සඳහා ද දායකවන අතරම, ප්‍රතිලාභ ලබා ගැනීමේ අවස්ථාවන් පිළිබඳව විමසිලිමත් වන බැවින්, අපද්‍රව්‍ය කළමනාකරණය සහ ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපෘති සඳහා විදේශීය සෘජු ආයෝජන සහ බහුපාර්ශ්වික අරමුදල් වුවද ආකර්ෂණය කර ගැනීමේ ඉහළ ශක්‍යතාවක් ඇති බව පෙන්නුම් කෙරේ. රටේ වර්ධනය වෙමින් පවතින අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලුව විසඳීම සඳහා, කාර්යක්ෂම කසළ එකතු කිරීමේ යාන්ත්‍රණයක් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම, පවතින කසළ බැහැර කිරීමේ පිළිවෙත් වැඩිදියුණු කිරීම මෙන්ම ප්‍රමාණවත් යාන්ත්‍රික හා ජීව විද්‍යාත්මක පිරිපහදු පහසුකම් සැපයීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය සහ කොම්පෝස්ට් බවට පත්කිරීම පමණක් නොව, අපද්‍රව්‍ය අවම කිරීම සහ නැවත භාවිතය දිරිමත් කිරීම ද ඉලක්කගත කෙරෙන බහුවිධ අංශයන් ආවරණය කෙරෙන පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අඛණ්ඩව කැපවීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින අතර, එමඟින් කෙටි කාලීනව තිරසාර සංවර්ධනයක් ඇති කිරීමටත් දිගු කාලීනව චක්‍රීය ආර්ථිකයක් වෙත ගමන් කිරීමටත් මඟ පාදනු ඇත.

ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් මනා ලෙස සංරක්ෂණය කිරීම සහ ආර්ථිකයට පරිසර පද්ධතියේ ඉහළම විභවතාව අත් කර ගැනීමට හැකි වන පරිදි ස්වභාවික සම්පත් යථා තත්ත්වයට පත් කිරීම සඳහා 'හරිත' සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් කාලීන අවශ්‍යතාවයක් ලෙස පවතී. සම්පත් භාවිතය තුළින් ලබා ගන්නා ආර්ථික වර්ධනය සහ පවතින ස්වභාවික සම්පත් ආරක්ෂා කෙරෙන පරිසර සංරක්ෂණය අතර සමතුලිතතාවයක් ඇති කර ගැනීම හරහා දේශගුණික විපර්යාස පිළිබඳ ගැටලුව විසඳීමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය බවට පුළුල් එකඟතාවයක් පවතී. මෑත වසරවලදී ඇතිවූ ගංවතුර සහ නායයෑම් සහ නියඟ තත්ත්වයන් වැනි නිරන්තරයෙන් ඇතිවන ස්වාභාවික විපත් හේතුවෙන් දේශගුණික විපර්යාසවල බලපෑම පිළිබඳව සැලකිය යුතු අවධානයක් යොමු වී ඇත. මෑතකදී, ලෝක බැංකුව විසින් කරන ලද අධ්‍යයනයකින් පෙන්වා දී ඇති පරිදි, ශ්‍රී ලංකාවේ උෂ්ණත්වය ඉහළ යෑම ගෝලීය සාමාන්‍යයට වඩා අඩු වන්නේ ඉතා සුළු වශයෙන් බව පුරෝකථනය කර ඇති අතර, අනාගතයේදී අධික උණුසුම් කාලපරිච්ඡේදයන් අඛණ්ඩව පවතිනු ඇති බවට ඉන් ගම්‍යමාන වේ. මෙවැනි උෂ්ණත්වය ඉහළ යෑම්, විශේෂයෙන් ම වියළි ප්‍රදේශ වල ජනතාවගේ යහපැවැත්මට තර්ජනයක් විය හැකි අතර, කෘෂිකාර්මික ඵලදායිතාව, ශ්‍රම ඵලදායිතාවය සහ බලශක්ති සුරක්ෂිතතාව සම්බන්ධයෙන් ආර්ථිකයට සෘජු බලපෑම් ඇති කරනු ඇත. ගංවතුර සහ නායයෑම් හේතුවෙන් ජීවිත, ජීවනෝපාය සහ යටිතල පහසුකම් සඳහා සැලකිය යුතු අවදානමක් ඇති කළ හැකි, ධාරානිපාත වර්ෂාව වැනි අධික වර්ෂාපතන ලැබීමේ වාර ගණන සහ තීව්‍රතාවයේ වැඩිවීමකට ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදුවීමේ ඇති අවදානමද මෙම අධ්‍යයනයෙන් පෙන්වා දෙයි. ස්වාභාවික පරිසරයෙන් පැන නඟින එවැනි අස්ථාවරත්වයන්හි වැඩිම බලපෑම දිළිඳු සහ අවදනමට ලක් විය හැකි කාණ්ඩ වෙත ඇති වන අතර, විශේෂයෙන්ම ඉන් විශාල පිරිසක් කෘෂිකර්මාන්තයේ නියැලී සිටින්නන් වේ. එවැනි ගැටලු මධ්‍යයේ, දශක ගණනාවක් තිස්සේ පවතින අලි මිනිස් ගැටුම්, වැලි ගොඩ දැමීම, කර්මාන්ත මගින් අන්තරාදායක අපද්‍රව්‍ය ජලාශ්‍රවලට මුදා හැරීම, වන හායනය සහ මෑත කාලීනව එක්ස්ප්‍රස් පර්ල් සමුද්‍ර ව්‍යසනය වැනි තවත් කරුණු කිහිපයක් රටේ ස්වභාවික පරිසරයේ ගුණාත්මක භාවය කෙරෙහි අඛණ්ඩව අහිතකර බලපෑම් එල්ල කර ඇත. මෙම සියලුම පාරිසරික ගැටලු මගින් දිගුකාලීන, අඛණ්ඩ සහ යළි යළිත් ඇතිවීමේ ඉඩකඩ පවතින ඍණාත්මක සමාජ ආර්ථික බලපෑම් ඇති කරනු ලබයි. තිරසාර ස්වභාවික සම්පත් කළමනාකරණය සඳහා මඟ පාදනු ලබන ඉදිරි දැක්මක් සහිත සියලු පැතිකඩ ආවරණය වන ප්‍රතිපත්තිමය පියවරයන් සඳහා කැපවීමේ කඩිනම් අවශ්‍යතාවය මෙයින් අවධාරණය කරයි. ස්වාභාවික සම්පත්වල තත්ත්වය අඛණ්ඩව අධීක්ෂණය කිරීම අත්‍යවශ්‍ය අංගයක් වන අතර, එය නීති විරෝධී ලෙස දැව කැපීම, සතුන් දඩයම් කිරීම, නිතී විරෝධී වාර්තා නොකළ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීම වැනි නිතර නඩු පැවරීමක් සිදු නොවන පාරිසරික හා ස්වාභාවික සම්පත් අපරාධ වැළැක්වීම සහතික කරන දැඩි නියාමන සහ නීතිමය රාමුවක් හරහා ශක්තිමත් කළ යුතුය. පාරිසරික වශයෙන් හිතකාමී ව්‍යාපාර සඳහා ණය ලබා දීම තුළින් ශ්‍රී ලංකාව තුළ තිරසාර මූල්‍ය භාවිතයන් ප්‍රවර්ධනය කිරීමට රජය සහ මහ බැංකුව එක්ව කටයුතු කළ යුතුය.

තිරසාර සංවර්ධන ඉලක්ක යටතේ ප්‍රකාශයට පත් කර ඇති පරිදි, 2030 වසර වන විට සියලු ආකාරයේ මන්දපෝෂණය තුරන් කිරීමේ සිය ඉලක්කය සපුරා ගැනීම සඳහා රජය ප්‍රයත්න දැරූව ද, කොවිඩ්-19 වසංගතය සහ කෘෂිකාර්මික භාණ්ඩ සම්බන්ධයෙන් මෑතක දී දක්නට ලද සැපයුම් අංශයේ

කම්පන හේතුවෙන් වන බලපෑම් මගින් රට මෙතෙක් අත්කරගෙන ඇති ප්‍රගතියට තර්ජනයක් එල්ල විය හැකි අතර, දිගු කාලීන සංවර්ධනය කෙරෙහි ද බලපෑම් ඇති කළ හැකිය. 2015 වසර වන විට ජනතාවගේ සමාජ ආර්ථික යහපැවැත්ම නංවාලීම සඳහා සහශ්‍ර සංවර්ධන ඉලක්ක යටතේ ජාතික මට්ටමේ ඉලක්ක බොහොමයක් සපුරා ගැනීමෙහිලා ශ්‍රී ලංකාව කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ඇතත්, භූගෝලීය ප්‍රදේශ සහ ආර්ථික අංශ අතර පෝෂණය සම්බන්ධයෙන් පවතින විෂමතා පිළිබිඹු කරමින්, පෝෂණය සඳහා වන ඉලක්ක දිගින් දිගටම සාක්ෂාත් කර ගැනීමට නොහැකිව පවතී. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2016 වසරේ සිදු කරන ලද ජන විකාශ හා සෞඛ්‍යය සමීක්ෂණයට අනුව, දරුවන්ගේ වයසට අනුව නිසි උස හා කෘෂබව (උසට සරිලන බර) සහ ස්ථූලතාවය (වයසට සරිලන බර) මෙන්ම, අඩු උපත් බර වැනි මන්දපෝෂණය සම්බන්ධ ඇතැම් දර්ශක, මාතෘ, ළදරු සහ ළමා පෝෂණය වැඩිදියුණු කිරීම සඳහා වන ජාතික ඉලක්කවලට සාපේක්ෂව අඛණ්ඩව සාක්ෂාත් කර ගැනීමට නොහැකි වී ඇති අතර, වතු අංශයේ පෝෂණ දර්ශක දුර්වලම මට්ටමක පවතී. එවැනි විෂමතා සහ ගැටලු, කොවිඩ්-19 වසංගතය මගින් තවදුරටත් උග්‍ර වීමට ඉඩ ඇත. 2021 වසරේ දී, ශ්‍රී ලංකාවේ ළමා බහුමාන දරිද්‍රතා දර්ශකය අනුව වයස අවුරුදු 0-4 අතර ළමුන්ගෙන් සියයට 42.2ක් පමණ බහුමාන වශයෙන් දරිද්‍රතාවයෙන් පෙළෙන අතර, සියයට 33.4ක් පෝෂණය සම්බන්ධයෙන් ඌණතාවයන්ට මුහුණපානබව පෙන්වා දේ. තවද, ගෝලීය සහ දේශීය යන දෙඅංශයෙන්ම ප්‍රවනතා තුළින් ඇතිවන ආහාර සැපයුම හා ආහාර ලබා ගැනීමේ හැකියාවට අදාලව මෑත කාලීනව දක්නට ලද සැපයුම් අංශයේ කම්පන මගින් ජනගහනයේ, විශේෂයෙන්ම ළමුන්ගේ සහ කාන්තාවන්ගේ පෝෂණ ප්‍රතිඵල කෙරෙහි දිගු කාලීනව ඇති කෙරෙන බලපෑම් පිළිබඳ ගැටලු මතු කරයි. වරින් වර සිදුවන ආහාර උද්ධමනයෙහි ඉහළ යෑම අඛණ්ඩව පැවතීමට ඉඩ හැරියහොත් එමගින්, ජනගහනයේ අනාගත ඵලදායිතාවයට සැලකිය යුතු බලපෑම් ඇති විය හැක. දරිද්‍රතා රේඛාවට පහළින් සිටින ගෘහ ඒකක ඉලක්ක කර ගනිමින් රජය විසින් ලබාදෙන මුදල් පැවරුම් සහ ආහාර බෙදා හැරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් එවැනි ගෘහ ඒකකවල පෝෂණ තත්ත්වය කෙරෙහි ඇති කෙරෙන ඍණාත්මක බලපෑම් යම් දුරකට සමනය කිරීමට අපේක්ෂා කරන බව සඳහන් කළ යුතුය. ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා කෙටිකාලයේ සිට දිගුකාලය දක්වා වූ උපාය මාර්ග ඇතුළත් සියලු පැතිකඩ ආවරණය වන ප්‍රතිපත්ති ප්‍රවේශයක් අනුගමනය කිරීමේ වැදගත්කම මෙමගින් නැවත අවධාරණය කරයි. එවැනි ප්‍රතිපත්තිමය පියවර මගින් කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාව වැඩිදියුණු කිරීම හරහා ආහාර සුලබතාව පමණක් නොව, පසු අස්වනු අලෙවිකරණය සහ බෙදා හැරීම සම්බන්ධයෙන් ද අවධානය යොමු කළ යුතුය. දේශීය නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති පියවරවල කොටසක් ලෙස, විශේෂයෙන්ම අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සඳහා වූ ජාතික ඉල්ලුම සහ දේශීය සැපයුම යන දෙකටම අදාළ දත්ත සමුදායන් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවයක් පවතී. ආහාර සුරක්ෂිතතාව සහ ජනගහනයේ සමස්ත යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා පිළියම් ක්‍රියාමාර්ග පූර්වෝපායිකව සැලසුම් කිරීමට හා කාලානුරූපව ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකාර්මික අංශයේ අදාළ ආයතන මගින් ප්‍රායෝගික සහ කාලෝචිත ඉදිරි දැක්මක් සහිත තක්සේරු කිරීම් අත්‍යවශ්‍ය වේ. අතීතයේ දී ශ්‍රී ලංකාවට කෘෂිකර්ම ක්ෂේත්‍රය සහ රටේ ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සඳහා බහුපාර්ශ්වික ආයතනවල ආධාර හිමිවිය. ශ්‍රී ලංකාව මැදි ආදායම් කාණ්ඩය කරා ගමන් ගනිමින් සිටියද, මේ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වැනි ආයතනවල බහුපාර්ශ්වික ආධාර විශාල වශයෙන් ලබාගැනීමේ හැකියාවක් පවතී. දත්ත රැස් කිරීම, විශ්ලේෂණය සහ අධීක්ෂණයට අදාළව අරමුදල් සපයාගැනීම සහ තාක්ෂණික ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා එවැනි මූලාශ්‍රවලට යොමු වීම තුළින් ජනගහනයේ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීමට පමණක් නොව, කෘෂිකර්මාන්ත අංශයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට සහ දිගු කාලීනව රටේ ආහාර සුරක්ෂිතතා තත්ත්වය ඉහළ නැංවීමට දායක විය හැකිය.

කොවිඩ්-19 වසංගතයේ බලපෑම්වලින් මිදී ආර්ථිකය වේගයෙන් යථා තත්ත්වයට පත් වීමට සහ ඉහළ වර්ධන මාවතක් කරා යොමු වීමට දරන ප්‍රයත්නය හමුවේ ශ්‍රම බලකායෙන් සැලකිය යුතු කොටසක් ආර්ථිකයේ වර්ධන හා සංවර්ධන ක්‍රියාවලියෙහි විෂය පථයෙන් පිටත රැඳී සිටින බව පසුගිය දශක තුනක කාලය පුරා ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වයේ විශාල වර්ධනයක් නොතිබීම මගින් පෙන්නුම් කරයි. 1952 වසරේ දී පැවති සියයට 19ක පමණ ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය, 1990 වසරේ දී සියයට 36ක් දක්වා දෙගුණ වීමට දශක හතරකට ආසන්න කාලයක් ගත විය. එතැන් සිට, කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකයේ සාමාන්‍යය සියයට 33ක් පමණක් වී ඇති අතර, එම අනුපාතිකය මෑත වසරවල දී පහළ යෑමේ ප්‍රවණතාවයක පවතී. දකුණු ආසියානු කාන්තා

1

ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකයේ සාමාන්‍යය වන සියයට 24ක් සමඟ සැසඳීමේ දී ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටිය ද, ඉහළ මැදි ආදායම් කාණ්ඩයේ පසුවන රටවල සියයට 56ක් වන සාමාන්‍යයට වඩා මෙරට කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය බෙහෙවින් අඩු මට්ටමක පවතී. ජනගහනය ශීඝ්‍රයෙන් වයස්ගත වීම, ශ්‍රම ඵලදායිතා ගැටලු සහ විශේෂයෙන් ම පුහුණු හා අර්ධ පුහුණු ශ්‍රමිකයන් රැකියා සඳහා විදේශගත වීම ඉහළ යෑම හේතුවෙන් ආර්ථිකයට බාධා එල්ල වී ඇති බැවින්, කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය අඛණ්ඩව එකම මට්ටමක රැඳී තිබීම සාර්ථකව විසඳිය යුතු ප්‍රධාන ප්‍රතිපත්තිමය ගැටලුවකි. සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය මධ්‍යයේ පසුගිය දශක හත තුළ බලයට පත් රජයන් විසින් අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ සිදු කර ඇති සැලකිය යුතු ආයෝජන පිළිබඳව අවධානය යොමු කිරීමේ දී, එවැනි ආයෝජනවල කාර්යක්ෂමතාව ද සහතික කරමින් ශ්‍රම බලකාය තුළ කාන්තා සහභාගීත්වය වැඩි කිරීම සහ එමගින් ශ්‍රම බලකාය පුළුල් කිරීම තුළින් ආර්ථික වර්ධන ක්‍රියාවලියට සැලකිය යුතු ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි බව සඳහන් කළ යුතුය. මේ සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීමේ දී, තිරසාර සංවර්ධන ඉලක්කවල දක්වා ඇති පරිදි කාන්තාවන් 'සුදුසු රැකියාවක' යෙදවීම සහතික කිරීම කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය. සේවා හෝ කෘෂිකාර්මික අංශ තුළ අවදානමට ලක්විය හැකි රැකියාවල නියුක්ත වීමේ ප්‍රවණතාවක් තිබීම මෙන්ම, අඩු වැටුප් ගෙවීමට හෝ අඩු වාසිදායක සේවා කොන්දේසි යටතේ රැකියාවල නියැලීමට කාන්තාවන් යොමු විය හැකි බැවින්, කාන්තාවන්ගේ සමාජ හා ආර්ථික අවදානම ඉහළ යෑමට හේතු වී ඇති කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වන ප්‍රවණතා මගින් කාන්තාවන් 'සුදුසු රැකියාවක'[4] යෙදවීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ. කාන්තාවන් විසින් සිදු කරන ගෙදරදොර වැඩ කටයුතු, රාජකාරීමය වැඩ කටයුතු සහ සමාජ සුබසාධන වැඩ කටයුතු යන භූමිකාවන් තුළින් දැරීමට සිදුවන ත්‍රිත්ව වගකීම සමනය කිරීම සහ එමගින් කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කළ ප්‍රතිපත්ති ශ්‍රී ලංකාව තුළ නොමැති බවට දීර්ඝ කාලයක සිට පිළිගන්නා කරුණකි. දැරිය හැකි සහ නියාමනය කරන ලද ළමා ආරක්ෂණ හෝ වැඩිහිටි සත්කාර පහසුකම්වල හිඟතාව, නම්‍යශීලී සේවා විධිවිධාන නොමැතිකම සහ විශ්වාසදායක හා ආරක්ෂිත පොදු ප්‍රවාහන ක්‍රම නොමැතිකමෙන් මෙය පැහැදිලි වන අතර, කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය වර්ධනය කිරීම සඳහා මෙම විධිවිධාන අත්‍යවශ්‍ය බව ජාත්‍යන්තර අත්දැකීම් මගින් පෙන්වා දෙනු ලබයි. මෙවැනි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් කාන්තාවන් වැඩි පිරිසක් ශ්‍රම බලකාය වෙත, අන්තර්ග්‍රහණය කරගත හැකි අතර, එමගින් ආර්ථිකයේ ඵලදායී සම්පත් පදනම ඉහළ නංවා ගැනීම හරහා ඉහළ සමස්ත සුබසාධනයක් ළඟා කර ගත හැක. මැදි කාලීනව, ඉහළ මට්ටමේ ගෘහ ඒකක ආදායම් අනාගත පරම්පරාවේ අධ්‍යාපනික සහ යහපත් ප්‍රතිඵල වර්ධනය කිරීම සඳහා උපයෝගී කරගත හැකි අතර, එමගින් ශ්‍රම බලකායේ ඵලදායීත්වය ඉහළ නංවා ගැනීමට අඛණ්ඩව දායක කර ගත හැකි වේ. ඒ අනුව, ස්ත්‍රී පුරුෂ සමාජභාවයට සංවේදී වන ආකාරයෙන් ශක්තිමත් විවිධාංගීකරණයකට සහ ආර්ථිකයේ සිටින සියලු පාර්ශ්වයන්ට ප්‍රතිලාභ ලැබීම සඳහා සහාය වන ඉලක්කගත, සියලු පැතිකඩ ආවරණය කෙරෙන සහ බහු ආංශික ප්‍රතිපත්ති සැලසුමක් සැකසීම අත්‍යවශ්‍ය වේ.

මෙවැනි පසුබිමක් තුළ, ඉදිරියේ දී ඇති විය හැකි අහිතකර ආර්ථික ප්‍රතිවිපාකවලට මුහුණ දෙමින් හදිසි අවස්ථාවන්ට අනුරූපීව ආර්ථිකය පවත්වාගෙන යෑම සඳහා රජය සහ සියලුම පාර්ශ්වකරුවන්ගේ සාමූහික ප්‍රයත්න අවශ්‍ය වන අතර, ව්‍යුහාත්මක ගැටලු සඳහා තිරසාර වර්ධනයක් අත්කර ගැනීම සහ ඉදිරියේ දී සාර්ව ආර්ථික ස්ථායීතාව ආරක්ෂා කිරීම සඳහා පිළියම් යෙදීම, කඩිනම් අවශ්‍යතාවක්ව පවතී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සහාය දක්වන ආර්ථික ගැළපුම් වැඩසටහනක් වැනි බාහිර අනුග්‍රහයක ආධාරයෙන් සැලකිය යුතු ඒකාබද්ධ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ වඩාත් නිවැරදිව ක්‍රියාත්මක කිරීම සඳහා වන පෙර නොවූ අන්දමේ ඉඩ ප්‍රස්ථාවන් කොවිඩ්-19 වසංගතය මගින් අනාවරණය කරගෙන ඇති අතර, සාර්ව ආර්ථික ස්ථායීතාව සහ ආර්ථික වර්ධනය සඳහා ආර්ථිකය වෙත නිත්‍ය සහ පුළුල් ප්‍රතිලාභ ලබා ගැනීමට නව අභියෝග හඳුනා ගැනීම සහ එවැනි අභියෝගවලට අප්‍රමාදව මුහුණ දීම සඳහා අවශ්‍ය ඒකාබද්ධ ප්‍රයත්න මෙවැනි තීරණාත්මක අවස්ථාවක අතිශයින් වැදගත් වන අතර, එමගින් පුරවැසියන්ගේ අපේක්ෂා ඉටු කිරීම බොහෝදුරට සහතික කෙරේ.

4 ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිර්වචනයට අනුව සුදුසු රැකියාව යනු ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම ස්වාධීනත්වය සමානාත්වය, ආරක්ෂාව හා මානව ගරුත්වය යන තත්ත්වයන් යටතේ ඵලදායී සේවාවක් සිදු කිරීමයි.

2

ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය

2.1 සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකා ආර්ථිකය, කොවිඩ්-19 වසංගත තත්ත්වයේ දැඩි බලපෑම් හේතුවෙන් 2020 වසරේ දී වාර්තා කළ සියයට 3.6ක පහත වැටීමෙන් මිදී, 2021 වසරේ දී වසංගත තත්ත්වයේ නව ප්‍රභේදවල අහිතකර බලපෑම හමුවේ වුව ද, සියයට 3.7ක වර්ධනයක් වාර්තා කරන ලදී. මෙහිදී, කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන ප්‍රධාන ආර්ථික කටයුතු ත්‍රිත්වයෙහිම මෙම වර්ධනය දක්නට ලැබුණි. මේ සඳහා ඉල්ලුමෙහි ඉහළ යෑම සහ වසංගත තත්ත්වය හා සම්බන්ධ අවහිරතා ක්‍රමයෙන් ලිහිල් වීම මෙන්ම, 2020 වසරේ දී ආර්ථිකය සැලකිය යුතු ලෙස පහත වැටීම තුළින් පදනම් අගය මගින් ඇති වූ සංඛ්‍යානමය බලපෑම ද හේතු විය. කෙසේ වුව ද, විශේෂයෙන්ම වසරේ තෙවන කාර්තුවේ දී මෙම වසංගතයේ ඩෙල්ටා ප්‍රභේදය ශීඝ්‍රයෙන් පැතිර යෑම හේතුවෙන් ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලියට බාධා ඇතිවූ අතර, එමගින් සේවා සහ කර්මාන්ත කටයුතු කෙරෙහි වඩාත් අහිතකර බලපෑම් ඇතිවිය. මෙම නව අභියෝග හමුවේ වුව ද, වඩාත් ඉලක්කගතව සංචරණ සීමා පැනවීම මෙන්ම, ප්‍රතිපත්තිමය සානුබල සහ දීප ව්‍යාප්ත එන්නත්කරණ වැඩසටහන ද වසරේ අවසාන භාගය වන විට රට සාමාන්‍යකරණය වීමට අනුබල දුන් අතර, එමගින් ආර්ථික කටයුතු සඳහා වැඩි ඉඩප්‍රස්ථා විවර විය. මේ අතර, නව සාමාන්‍යකරණයට ඉක්මනින් අනුවර්තනය වීම හමුවේ 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී බොහෝ ශ්‍රම වෙළඳපොළ දර්ශකවල වර්ධනයක් දක්නට ලැබුණ ද, වරින්වර ඇති වූ වසංගත තත්ත්වයේ උත්සන්න වීම්වල බලපෑම හේතුවෙන් ශ්‍රම වෙළඳපොළ 2019 වසරේ දී පැවති පූර්ව වසංගත මට්ටමට තවමත් ළඟා වී නොමැත. මෙහිදී, පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී ශ්‍රම බලකාය මෙන්ම විශේෂයෙන්ම සේවා සහ කෘෂිකාර්මික අංශවල සේවා නියුක්ත ජනගහනය වර්ධනය වූ අතර, සේවා වියුක්ත අනුපාතිකයෙහි පහළ යෑමක් දක්නට ලැබුණි. මෙම පසුබිම තුළ, ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා සහ තොග හා සිල්ලර වෙළඳාම් කටයුතුවල දක්නට ලැබුණු වර්ධනය හේතුවෙන් සේවා කටයුතු වර්ධනය විය. මේ අතර, දේශීය මෙන්ම ගෝලීය වශයෙන් ද පැවති ඉහළ ඉල්ලුම හේතුවෙන් නිෂ්පාදන කර්මාන්තවල ඇති වූ යහපත් වර්ධනය සමස්ත කර්මාන්ත කටයුතුවල වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. එමෙන්ම, සමස්තයක් ලෙස ගත්කල කෘෂිකාර්මික කටයුතුවල ද වර්ධනයක් දක්නට ලැබුණි. කෙසේ වුව ද, විශේෂයෙන්ම වසරේ දෙවන භාගයේ දී, අමුද්‍රව්‍ය සැපයුම් හා සම්බන්ධව පැවති අවහිරතා හේතුවෙන් ඇතැම් කෘෂිකාර්මික සහ කර්මාන්ත කටයුතු කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය. හිතකර කාලගුණික තත්ත්වයක් පැවතිය ද වගා කටයුතු සඳහා අවශ්‍ය පෝෂණ සංඝටක සහ කෘෂිරසායනික ද්‍රව්‍ය ප්‍රමාණවත් ලෙස නොලැබීම කෘෂිකාර්මික භෝගවල අස්වැන්න අඩු වීමට එක් හේතුවක් විය. තවද, ව්‍යාපාර සමීක්ෂණ මගින් ද අනාවරණය වූ පරිදි ශීඝ්‍රයෙන් අමුද්‍රව්‍ය මිල ඉහළ යෑම, නැව්බඩු තොග ප්‍රමාදවීම මෙන්ම විදේශ විනිමය හිඟය ද සැපයුම් දාම සඳහා අවහිරතා ඇති කරවමින්, නිෂ්පාදන සැලසුම් කෙරෙහි බාධා ඇති කරන ලදී. විශේෂයෙන්ම, ප්‍රධාන අමුද්‍රව්‍යවල සැපයුම් හිඟතාවය ඉදිකිරීම් කර්මාන්තයේ අත්කර ගත හැකිව තිබූ වර්ධනය අඩපණ කිරීමට හේතු විය. මේ අතර, වියදම් ප්‍රවේශය සැලකීමේ දී, 2021 වසරේ දී ආර්ථික කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟම පරිභෝජන සහ ආයෝජන වියදම්වල ඉහළ යෑමක් දක්නට ලැබුණි. කෙසේ වුව ද, ආනයනවල ඉහළ යෑම අපනයනවල වර්ධනය ඉක්මවා යෑම හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුම තවදුරටත් පහත වැටුණි. මේ අතර, වසර තුළ දී ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය පුළුල් වූ අතර, මේ සඳහා ආයෝජන වියදම්හි ඉහළ වර්ධනය ප්‍රධාන වශයෙන් හේතු විය.

2

2.2 දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)[1], දළ ජාතික ආදායම (ද.ජා.ආ.) සහ ඒක පුද්ගල ද.දේ.නි.

2021 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) පවත්නා වෙළඳපොළ මිල (පවත්නා මිල) අනුව මෙන්ම ස්ථාවර වෙළඳපොළ මිල (ස්ථාවර මිල) අනුව ද, 2020 වසරේ දී වසංගත තත්ත්වයෙහි බලපෑම හේතුවෙන් ඇතිවූ පහත වැටීමෙන් මිදී වර්ධනය විය. ඒ අනුව, ස්ථාවර මිල යටතේ 2020 වසරේ දී සියයට 3.6කින් පහත වැටුණු ද.දේ.නි. 2021 වසරේ දී රුපියල් බිලියන 9,881.4ක් දක්වා සියයට 3.7කින් වර්ධනය විය. මේ අතර, පවත්නා මිල අනුව ද.දේ.නි., 2021 වසරේ දී රුපියල් බිලියන 16,809.3 (එ.ජ. ඩොලර් බිලියන 84.5)ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 2020 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 15,027.4 (එ.ජ.ඩොලර් බිලියන 81.0)ක අගයට සාපේක්ෂව සියයට 11.9ක

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදන, වියදම් සහ ආදායම් යන ප්‍රවේශ තුන යටතේ ද.දේ.නි. ඇස්තමේන්තු කරනු ලබයි.

2.1 සංඛ්‍යා සටහන

කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2010 ස්ථාවර මිල අනුව) (අ)(ආ)

ආර්ථික කටයුතු	වර්ධනය (%)		ද.දේ.නි. හි වර්ධනයට දායකත්වය (%)		ද.දේ.නි. ට දායකත්වය (%)	
	2020 (ඇ)	2021	2020 (ඇ)	2021	2020 (ඇ)	2021
කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය	**- 2.2**	**2.0**	**- 0.2**	**0.1**	**7.1**	**6.9**
ධාන්‍ය වගාව (වී හැර)	44.8	9.7	0.05	0.02	0.2	0.2
වී වගාව	7.0	- 6.7	0.05	- 0.06	0.8	0.7
එළවළු වගාව	7.6	- 2.5	0.04	- 0.02	0.6	0.6
උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග	19.3	- 7.4	0.00	- 0.00	0.0	0.0
පලතුරු වගාව	6.2	- 7.8	0.04	- 0.05	0.7	0.6
තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් ෆාම් වගාව)	- 10.4	11.2	- 0.07	0.07	0.6	0.7
තේ වගාව	- 7.1	7.4	- 0.05	0.05	0.6	0.7
වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී)	21.7	- 15.6	0.00	- 0.00	0.0	0.0
කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව	3.3	4.5	0.02	0.03	0.7	0.7
රබර් වගාව	4.6	- 1.7	0.01	- 0.00	0.2	0.2
වෙනත් බහුවාර්ෂික භෝග වගාව	1.6	- 4.8	0.00	- 0.01	0.2	0.2
කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන්	- 2.8	9.7	- 0.02	0.06	0.7	0.7
පැල බෝකිරීම සහ කෘෂිකාර්මික (ඉහතින් සඳහන්) කටයුතු සඳහා වන ආධාරක කාර්යයන්	- 0.4	10.6	- 0.00	0.01	0.1	0.1
වන වගාව, ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන	- 7.9	5.1	- 0.05	0.03	0.6	0.6
ධීවර කර්මාන්තය	- 16.6	1.4	- 0.19	0.01	1.0	1.0
කර්මාන්ත	**- 6.9**	**5.3**	**- 1.8**	**1.4**	**25.5**	**25.9**
පතල් හා කැණීම් කර්මාන්තය	- 12.5	2.8	- 0.29	0.06	2.1	2.1
නිෂ්පාදන කර්මාන්ත	- 3.9	7.2	- 0.60	1.11	15.5	16.1
විදුලිය, ගෑස්, වාෂ්ප හා වායුසමීකරණ සැපයීම	- 1.6	6.1	- 0.02	0.07	1.1	1.1
ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම	4.8	4.3	0.01	0.01	0.2	0.2
මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය	- 1.0	- 3.3	- 0.00	- 0.01	0.3	0.3
ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන්	- 13.2	1.9	- 0.91	0.12	6.2	6.1
සේවාවන්	**- 1.6**	**3.0**	**- 0.9**	**1.7**	**58.7**	**58.3**
වෙළඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන්	- 5.0	1.3	- 1.16	0.30	22.6	22.1
තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන්	13.7	17.0	0.10	0.15	0.9	1.0
මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම	4.7	5.6	0.67	0.86	15.4	15.7
වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන්	- 5.9	1.2	- 0.67	0.13	11.1	10.9
රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන්	2.0	3.3	0.17	0.29	8.6	8.6
මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය	**- 3.2**	**3.5**	**- 2.9**	**3.2**	**91.2**	**91.1**
භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු - සහනාධාර	- 8.1	4.9	- 0.7	0.4	8.8	8.9
වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)	**- 3.6**	**3.7**	**- 3.6**	**3.7**	**100.0**	**100.0**
විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම	8.3	9.3				
වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම	**- 3.5**	**4.0**				

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2.1 රූප සටහන

2021 වසරේ ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය සංක්ෂිප්තයක් ලෙස



නිෂ්පාදන ප්‍රවේශය



සේවා 3.0% ↑
මූල්‍ය කටයුතු ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

කර්මාන්ත 5.3% ↑
නිෂ්පාදන කටයුතු ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

කෘෂිකර්මාන්තය 2.0% ↑
තෙල් සහිත පලතුරු භෝග වගා කටයුතු ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

බදු-සහනාධාර 4.9% ↑

වියදම් ප්‍රවේශය



පෞද්ගලික පරිභෝජනය 10.8% ↑
ආහාර සඳහා වූ වියදම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.

රාජ්‍ය පරිභෝජනය 3.7% ↑
ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය සඳහා වූ වියදම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.

[illegible]දේශීය ප්‍රාග්ධන සම්පාදනය 23.2% ↑
[illegible] දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් [illegible] විය.

[illegible] අපනයන -31.6% ↓
[illegible]යන වටිනාකම වැඩි වශයෙන් [illegible] යෑම බලපාන ලදී.

භාණ්ඩ හා සේවා අපනයන 23.3% ↑

භාණ්ඩ හා සේවා ආනයන 25.7% ↑

ආදායම් ප්‍රවේශය



සේවක ආදායම් 8.5% ↑

දළ මෙහෙයුම් අතිරික්තය 13.6% ↑

[illegible] මෙහෙයුම් අතිරික්තය 14.0% ↑

[illegible] ආදායම් 11.9% ↑

[illegible] ප්‍රාග්ධන පරිභෝජනය 12.4% ↑

[illegible]දනය මත වෙනත් බදු-සහනාධාර 4.2% ↑

ශ්‍රම වෙළඳපොළ දර්ශක

ශ්‍රම බලකාය
මිලියන 8.467 (2020)
මිලියන 8.553 (2021)

[illegible] සක්‍රීය නොවන ජනගහනය
මිලියන 8.273 (2020)
මිලියන 8.581 (2021)

ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය
50.6% (2020)
49.9% (2021)

සේවා නියුක්ත ජනගහනය
මිලියන 7.999 (2020)
මිලියන 8.114 (2021)

සේවා වියුක්ති අනුපාතිකය
5.5% (2020)
5.1% (2021)

විදේශ [illegible] සඳහා පිටත්ව යෑම්
53,711 (2020)
121,795 (2021)

2

2.1 රූප සටහන
වාර්ෂික ද.දේ.නි. වර්ධන අනුපාතිකය (අ)



(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ
මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කැපී පෙනෙන වර්ධනයකි. පවත්නා මිල අනුව ද.දේ.නි.හි මෙම ඉහළ වර්ධනය මගින් වසර තුළ දී මිල මට්ටම් ඉහළ යෑමේ බලපෑම ද පිළිබිඹු වේ. ඒ අනුව, ද.දේ.නි. ගම්‍ය මිල අවධමනකය 2020 වසරේ දී වාර්තා කළ සියයට 4.0ක සිට 2021 වසරේ දී සියයට 7.9ක් දක්වා ඉහළ යන ලදී.

ද.දේ.නි.ට ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම ගැලපීම මගින් ඇස්තමේන්තු කරනු ලබන දළ ජාතික ආදායම (ද.ජා.ආ), පවත්නා මිල අනුව 2020 වසරේ දී වාර්තා කළ සියයට 0.3ක සුළු වර්ධනයට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 12.3ක වර්ධනයක් වාර්තා කරන ලදී. ද.ජා.ආ.හි දක්නට ලැබුණු මෙම වර්ධනය කෙරෙහි 2021 වසරේ දී පෙර වසරට සාපේක්ෂව ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායමේ සෘණ ශේෂය අඩු වීම මෙන්ම පවත්නා මිල අනුව ද.දේ.නි.හි ඉහළ යෑමද බලපාන ලදී.

ඒක පුද්ගල ද.දේ.නි. 2020 වසරේ දී පැවති රු.685,587 (එ.ජ. ඩොලර් 3,695) ට සාපේක්ෂව, 2021 වසරේ දී රුපියල් 758,680 (එ.ජ. ඩොලර් 3,815)ක් දක්වා වර්ධනය විය. රුපියල් වටිනාකම අනුව ඒක පුද්ගල ද.දේ.නි.හි ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් පවත්නා මිල අනුව ද.දේ.නි.හි දක්නට ලැබුණු වර්ධනය බලපාන ලද අතර, එ.ජ. ඩොලර් අගය අනුව ගණනය කරන ලද ඒක පුද්ගල ද.දේ.නි.හි සාපේක්ෂව අඩු වර්ධනයට වාර්ෂික සාමාන්‍ය පදනම මත එ.ජ. ඩොලරයට සාපේක්ෂව දේශීය මුදල් ඒකකය අවප්‍රමාණය වීම බලපාන ලදී. මේ අතර, 2020 වසරේ දී රු. 666,285 (එ.ජ. ඩොලර් 3,591)ක් ලෙස පැවති ඒක පුද්ගල ද.ජා.ආ., 2021 වසරේ දී රුපියල් 740,328 (එ.ජ. ඩොලර් 3,722)ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

2.3 ආයතනික අංශයන්හි දායකත්වය

පවත්නා වෙළඳපොළ මිල අනුව ඇස්තමේන්තු කර ඇති ආර්ථිකයේ සමස්ත එකතු කළ අගය සඳහා විශාලතම දායකත්වය 2021 වසරේ දී ද ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශයෙන් දක්වා ඇත. මෙහිදී, කෘෂිකාර්මික හා සේවා කටයුතු සඳහා ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය තවදුරටත් විශාලතම දායකත්වයක් සපයනු ලැබූ අතර, කර්මාන්ත කටයුතු කෙරෙහි වැඩිම දායකත්වයක් දරණු ලැබුවේ මූල්‍ය නොවන ආයතනික අංශයෙනි. ඒ අනුව, ආර්ථිකයේ සමස්ත එකතු කළ අගයෙන් සියයට 48.0ක් නියෝජනය කරමින්, ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 10.2කින් වර්ධනය විය. මේ අතර, මූල්‍ය නොවන ආයතනික අංශය ද සියයට 15.2කින් වර්ධනය විය. තවද, රාජ්‍ය අංශය සහ මූල්‍ය ආයතන අංශය 2021 වසරේ දී පිළිවෙළින් සියයට 5.4කින් සහ සියයට 19.0කින් වර්ධනය විය.

2.3 රූප සටහන
2021 වසර තුළදී ආයතනික අංශ අනුව සමස්ත එකතු කළ අගයෙහි ප්‍රතිශතාත්මක දායකත්වය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)



(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි ඇස්තමේන්තු මත පදනම් වේ.
මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2.4. නිමැවුම, ප්‍රතිපත්ති, ආයතනික පහසුකම් සහ ගැටලු

කෘෂිකර්මාන්තය

2020 වසරේ දී සියයට 2.2කින් පහත වැටුණු කෘෂිකාර්මික කටයුතුවල එකතු කළ අගය 2021 වසරේ දී සියයට 2.0ක වර්ධනයක් වාර්තා කරන ලදී. වසර තුළ දී පොල් ඇතුළුව තෙල් සහිත පලතුරු භෝග වගාවේ දක්නට ලැබුණු සැලකිය යුතු වර්ධනය මෙන්ම සත්ත්ව නිෂ්පාදන ආශ්‍රිත කටයුතුවල ඉහළ යෑම කෘෂිකාර්මික කටයුතුවල මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. තවද, තේ වගාව, කුළුබඩු භෝග වගාව, වන වගාව මෙන්ම අනෙකුත් ධාන්‍ය වගාවෙහි දක්නට ලැබුණු වර්ධනය ද, සමස්ත කෘෂිකාර්මික කටයුතුවල වර්ධනය කෙරෙහි හිතකර ලෙස දායක විය. මේ අතර, 2020 වසරේ දී සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කළ ධීවර කර්මාන්තයේ සුළු වර්ධනයක් 2021 වසරේ දී දක්නට ලැබුණි. කෙසේ වුව ද, වී, පලතුරු, එළවළු, වෙනත් බහු වාර්ෂික භෝග, රබර් සහ වෙනත් පානීය භෝග (කෝපි, කොකෝවා ආදී) වගා කටයුතුවල පහළ යෑමක් 2021 වසරේ දී වාර්තා විය. මෙහිදී, 2021 වසර තුළ කෘෂිකාර්මික කටයුතුවල සමස්ත වර්ධනයක් දක්නට ලැබුණ ද, විශේෂයෙන්ම වසරේ දෙවන භාගයේ දී වගා කටයුතු සඳහා අවශ්‍ය පෝෂණ සංඝටක සහ කෘෂිරසායනික ද්‍රව්‍ය ප්‍රමාණවත් ලෙස නොලැබීම හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවලට අත්කරගත හැකිව තිබූ වර්ධනයට ළඟාවීමට නොහැකි විය.

2.4 රූප සටහන
2021 වසරේ කෘෂිකාර්මික කටයුතුවල වර්ධන වේගයන් (අ)



(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ
මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය

කෘෂිකාර්මික හා මත්ස්‍ය අංශයේ නිමැවුම මනිනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය,[2] 2021 වසරේ දී මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය. වී, තේ, පොල්, පශු සම්පත් සහ ධීවර කටයුතු ඇතුළු බොහෝ උප දර්ශකවල වර්ධන හේතුවෙන්, කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය 2020 වසරේ සියයට 2.7ක වර්ධනයට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 3.0කින් ඉහළ ගිය අතර, රබර් උප දර්ශකය පෙර වසරට සාපේක්ෂව පහළ යෑමක් පෙන්නුම් කළේය.

වී

2021 වසරේ යල කන්නයේ වාර්තා වූ ඉහළ අස්වැන්නත් සමඟ, වී නිෂ්පාදන අංශය 2021 වසරේ දී ඉහළ නිෂ්පාදන මට්ටමක් වාර්තා කළේය. හිතකර කාලගුණික තත්ත්වයන් සහ අස්වැන්න නෙළා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයේ වැඩිවීම, 2021 වසර තුළ නිෂ්පාදනය ඉහළ යෑමට දායක විය. ඒ අනුව, පෙර වසරට සාපේක්ෂව අස්වැන්නෙහි සුළු වර්ධනයක් වාර්තා කරමින්, සමස්ත වී නිෂ්පාදනය 2021 වසරේ දී, අඛණ්ඩව දෙවන වසරටත් ඉහළ අස්වැන්නක් වාර්තා කළේය. 2021 වසර තුළ දී, වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 5.1ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 0.6කින් වර්ධනය විය. 2020/2021 මහ කන්නයේ නිෂ්පාදනයෙහි සිදු වූ සියයට 4.2ක පහත වැටීම, 2021 වසරේ යල කන්නයේ වාර්තා වූ සියයට 8.5ක වර්ධනය මගින් විශාල වශයෙන් පියවා ගැනීමට සමත් විය. අස්වැන්න නෙළා ගන්නා ලද

2 කෘෂිකාර්මික නිෂ්පාදක දර්ශකය මගින් වන වගාව, ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන අංශය ආවරණය නොවේ.

2.2 සංඛ්‍යා සටහන
කෘෂිකර්මාන්ත නිෂ්පාදන දර්ශක
(2007-2010 = 100)

අයිතමය	2020 (අ)	2021 (ආ)	වර්ධන වේගය (%) 2019/20 (අ)	2020/21 (ආ)
කෘෂිකාර්මික සහ මත්ස්‍ය	129.4	133.3	2.7	3.0
1. කෘෂිකාර්මික	129.6	133.8	7.3	3.2
1.1 කෘෂිකාර්මික බෝග	123.7	126.9	9.2	2.5
වී	136.9	137.7	11.5	0.6
තේ	89.5	96.1	-7.1	7.4
රබර්	58.3	57.3	4.6	-1.7
පොල්	98.6	110.1	-9.5	11.7
අනෙකුත් බෝග	167.1	166.9	22.6	-0.1
එයින්, එළවළු	142.7	141.4	16.0	-0.9
පලතුරු	199.6	169.3	33.0	-15.2
වෙනත් ක්ෂේත්‍ර බෝග	141.1	165.5	18.6	17.3
1.2 පශු සම්පත්	176.4	188.7	-2.3	7.0
2. මත්ස්‍ය	128.5	130.7	-15.2	1.7

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2

2.3 සංඛ්‍යා සටහන

වී වගා අංශය පිළිබඳ සංඛ්‍යාන

අයිතමය	ඒකකය	2020 (අ)			2021 (ආ)		
		මහ	යල	එකතුව	මහ	යල	එකතුව
වපුරන ලද දළ බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	752	456	1,208	770	501	1,272
අස්වැන්න නෙළාගන්නා ලද දළ බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	740	451	1,191	762	497	1,259
අස්වැන්න නෙළාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	663	403	1,066	682	445	1,127
නිෂ්පාදනය	මෙ. ටො. දහස්	3,197	1,924	5,121	3,061	2,088	5,150
	බුසල් දහස්	153,188	92,206	245,395	146,702	100,067	246,769
හෙක්ටයාරයකට ඵලදාව (ඇ)	හෙක්ටයාරයට කි.ග්‍රෑ.	4,821	4,770	4,802	4,492	4,692	4,571
දෙන ලද ණය ප්‍රමාණය	රුපියල් මිලියන	5,605	4,096	9,701	8,603	4,449	13,052
සහල් ආනයනය (ඈ)	මෙ. ටො. දහස්	-	-	16	-	-	147
සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය (ඈ)	මෙ. ටො. දහස්	-	-	23	-	-	216

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුළු නිෂ්පාදනය අස්වැන්න නෙලාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයකට ඵලදාව ගණනය කර ඇත.
(ඈ) වාර්ෂික අගය

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ශුද්ධ බිම් ප්‍රමාණය, 2020/2021 මහ කන්නයේදී සහ 2021 වසරේ යල කන්නයේදී, පිළිවෙළින්, හෙක්ටයාර 681,521ක් දක්වා සියයට 2.8කින් සහ හෙක්ටයාර 445,084ක් දක්වා සියයට 10.3කින් ඉහළ ගොස් ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසරට සාපේක්ෂව අස්වැන්න නෙළා ගන්නා ලද මුළු ශුද්ධ බිම් ප්‍රමාණය සියයට 5.6ක සමස්ත වර්ධනයක් වාර්තා කළේය. 2021 වසර තුළ දී නිෂ්පාදනයේ සමස්ත වර්ධනයක් පැවතියද, පොහොර හා අනෙකුත් කෘෂිරසායන ද්‍රව්‍ය ඇතුළු යෙදවුම්වල සැපයුමෙහි ප්‍රමාණවත්භාවය සහ දුර්වල පාංශු හා බෝග කළමනාකරණ පිළිවෙත් පිළිබඳ ගැටලු මතු කරමින්, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදවලට සාපේක්ෂව, 2020/2021 මහ කන්නයේ සහ 2021 වසරේ යල කන්නයේ වී ඵලදාව, පිළිවෙළින්, හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,492ක් දක්වා සියයට 6.8කින් සහ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,692 දක්වා සියයට 1.6කින් අඩු විය. මහ සහ යල කන්න දෙකෙහිම සමස්ත වී නිෂ්පාදනය සහල් මෙට්‍රික් ටොන් මිලියන 3.3කට සමාන වූ අතර, එය ආසන්න වශයෙන් මාස 17ක දේශීය සහල් ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.[3] ප්‍රමාණවත් දේශීය නිෂ්පාදනයක් පැවතියද, සහල් ආනයනය 2020 වසරේ දී මෙට්‍රික් ටොන් 15,770ක සිට 2021 වසරේ දී මෙට්‍රික් ටොන් 147,091ක් දක්වා කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ අතර, ඉන් සහල් මෙට්‍රික් ටොන් 134,716ක් පමණ 2021 වසරේ නොවැම්බර් සහ දෙසැම්බර් යන මාසවල දී ආනයනය කර ඇත. දේශීය වෙළඳපොළ තුළ දක්නට ලැබෙන සහල් මිලෙහි ඉහළ උච්චාවචනයන් ස්ථාවර කිරීම සහ ප්‍රමාණවත් ස්වාරක්ෂක සහල් තොගයක් පවත්වාගෙන යාම සහතික කිරීමේ අරමුණින් වැඩි වශයෙන් සහල් ආනයනය සිදු කරන ලදී.

ප්‍රමාණවත් වී නිෂ්පාදන මට්ටමක් සහ ඉහළ සහල් ආනයන ප්‍රමාණයක් පැවතියද, වී සහ සහල් වර්ගවල මිල ගණන් වසර පුරා කැපී පෙනෙන ලෙස ඉහළ මට්ටමක පැවතිණි. පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී, සම්බා වී සඳහා සාමාන්‍ය මිල කිලෝග්‍රෑමයකට රුපියල් 65.32ක් දක්වා සියයට 29.2ක කැපී පෙනෙන වැඩිවීමක් වාර්තා කළ අතර, නාඩු වී සඳහා සාමාන්‍ය මිල ද කිලෝග්‍රෑමයකට රුපියල් 57.61ක් දක්වා සියයට 20.7කින් ඉහළ ගියේය. ගොවීන් සඳහා සාධාරණ මිලක් ලබා දීම තහවුරු කිරීම සඳහා

2.5 රූප සටහන

සහල්: සැපයුම සහ ඉල්ලුම



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

3 දේශීය ගෘහස්ථ සහල් ඉල්ලුම, එම අරමුණ සඳහා නවතම දත්ත සපයන ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය-2016 මත පදනම්ව, ගෘහ ඒකකයන්ගේ සාමාන්‍ය සහල් පරිභෝජනය සහ 2021 මධ්‍ය වාර්ෂික ජනගහනය භාවිත කරමින් ගණනය කෙරේ.

වී අලෙවි මණ්ඩලයේ මූලිකත්වයෙන් යුතුව රජය වී මිලදී ගැනීමේ වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කළේය. ඒ අනුව, 2021 වසරේ මාර්තු මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි, වී අලෙවි මණ්ඩලය සියලුම වී වර්ග කිලෝග්‍රෑමයකට රුපියල් 56.50ක මිලකට මිලදී ගත් අතර, පසුව එම මිල 2021 වසරේ ජූලි මාසයේ දී නාඩු සඳහා කිලෝග්‍රෑමයකට රුපියල් 50.00ක්, සම්බා සඳහා කිලෝග්‍රෑමයකට රුපියල් 52.00ක් සහ කීරි සම්බා සඳහා කිලෝග්‍රෑමයකට රුපියල් 55.00ක් ලෙස සංශෝධනය කරන ලදී. තවද, 2021 වසරේ සැප්තැම්බර් මාසයේ දී නාඩු සඳහා සහතික මිල රුපියල් 55.00ක් දක්වා ඉහළ දමන ලදී. වී අලෙවි මණ්ඩලය 2020/2021 මහ කන්නයේ අස්වැන්නෙන් වී තොග මෙට්‍රික් ටොන් 44,948ක් පමණ මිලදී ගත් අතර, 2021 වසරේ යල කන්නයේ දී මෙට්‍රික් ටොන් 7,728ක් පමණ මිලදී ගත්තේය. තවද, වී ගොවීන්ට තරගකාරී මිලක් ලබාදීමේ අරමුණින්, 2021/2022 මහ කන්නය සඳහා, නාඩු කිලෝග්‍රෑමයකට රුපියල් 90.00ක්ද, සම්බා කිලෝග්‍රෑමයකට රුපියල් 92.00ක්ද, කීරි සම්බා කිලෝග්‍රෑමයකට රුපියල් 95.00ක්ද, වශයෙන්, වී මිලදී ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය 2022 වසරේ පෙබරවාරි මාසයේ දී ලබා දෙන ලදී. 2021/2022 මහ කන්නයේ දී වී මෙට්‍රික් ටොන් 300,000ක් පමණ මිලදී ගැනීමට වී අලෙවි මණ්ඩලය අපේක්ෂා කරන අතර, 2022 වසරේ මාර්තු මැද භාගය වන විට වී මෙට්‍රික් ටොන් 70,000ක් පමණ වී අලෙවි මණ්ඩලය මිලදී ගෙන ඇත. කෙසේ වෙතත්, ගබඩා පහසුකම්, වියළීමේ පහසුකම් සහ ප්‍රවාහන පහසුකම් ඇතුළු යටිතල සහ සැපයුම් පහසුකම් අඩු මට්ටමකින් පැවතීම වැනි සාධක රාශියක් හේතුවෙන් වී අලෙවි මණ්ඩලයේ වී මිලදී ගැනීමේ වැඩසටහනේ කාර්යක්ෂමතාව සීමා වී ඇති බැවින්, පෞද්ගලික සහල් මෝල් හිමියන්හට සැලකිය යුතු මට්ටමේ ඉහළ වී ප්‍රමාණයක් විවෘත වෙළඳපොළ තුළ තරගකාරී මිල ගණන් යටතේ මිලදී ගැනීමට හැකි විය. 2021 වසර තුළ සම්බා සහල් සඳහා සාමාන්‍ය සිල්ලර මිල, පෙර වසරට සාපේක්ෂව සියයට 30.8ක ඉහළ යෑමක් පෙන්නුම් කරමින් කිලෝග්‍රෑමයකට රුපියල් 136.52ක් වූ අතර, නාඩු සහල් සඳහා සාමාන්‍ය සිල්ලර මිල පෙර වසරේ පැවති කිලෝග්‍රෑමයකට රුපියල් 100.01ක මිලට සාපේක්ෂව කිලෝග්‍රෑමයකට රුපියල් 116.56ක් ලෙස වාර්තා විය. ඉහළ මිල විචලනය සහ මෙම වර්ධනයන් මධ්‍යයේ පාරිභෝගිකයින් සූරා කෑම වළක්වාලීම සඳහා, 2021 වසරේ සැප්තැම්බර් 02 වන දින සම්බා සහල් සඳහා උපරිම සිල්ලර මිල කිලෝග්‍රෑමයකට රුපියල් 103.00ක් සහ නාඩු සහල් කිලෝග්‍රෑමයකට රුපියල් 98.00ක් ලෙස නියම කරමින් ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. කෙසේ වෙතත්, මෙම ගැසට් පත්‍රය, පසුව 2021 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට අහෝසි කරන ලද අතර, ඉන් අනතුරුව මිල අඛණ්ඩව ඉහළ යෑම සිදු විය. මේ අතර, වෙළඳපොළ තුළ ප්‍රමාණවත් සහ අඛණ්ඩ ලෙස සහල් සැපයීම සහතික කිරීමේ අරමුණින්, 2021 වසරේ ඔක්තෝබර් මාසයේ සිට 2022 වසරේ ජූනි මාසය දක්වා කාලය සඳහා, ආනයනික සම්බා, නාඩු සහ කැකුළු සහල් සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, කිලෝග්‍රෑමයකට රුපියල් 65.00 සිට ශත 25ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු කරන ලදී.

රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව තිරසාර ලෙස ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ පියවර කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. කෘෂිරසායන ද්‍රව්‍ය අධික ලෙස භාවිත කිරීමේ අහිතකර ප්‍රතිවිපාක සැලකිල්ලට ගනිමින්, 2021 වසරේ මැයි මාසයේ දී රසායනික පොහොර, පළිබෝධනාශක සහ වල්නාශක ආනයනය කිරීම තහනම් කරන ලදී. ඊට අදාළව, තිරසාර කෘෂිකාර්මික පිළිවෙත් භාවිතය කඩිනම් කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරමින්, දේශීය කාබනික පොහොර නිෂ්පාදනය දිරිමත් කරන ලද අතර, එම දේශීය කාබනික පොහොර නිෂ්පාදනය ක්‍රමයෙන් වේගවත් විය. කෙසේ වෙතත්, මෙම කඩිනම් ප්‍රතිපත්තිමය පියවරෙහි ප්‍රතිඵලයක් ලෙස අකාබනික හා කාබනික පොහොර සීමා සහිත වීම, වී වගාවේ ඵලදාව සැලකිය යුතු අඩුවීම සඳහා හේතු වී ඇති අතර, එමගින් වී මිල ගණන් ඉහළ යෑමක් සිදුව ඇත. එබැවින්, වී වගාව සඳහා ස්වභාවික කාබනික පොහොර, ඛණිජ ලවණ සහ ක්ෂුද්‍ර පෝෂක ආනයනය කිරීමට පියවර ගන්නා ලදී. 2022 වසරේ යල කන්නයේ වී වගාව සඳහා මියුරියේට් ඔෆ් පොටෑෂ් (Muriate of potash) ආනයනය කිරීමට ද රජය සැලසුම් කර ඇත. කාබනික කෘෂිකාර්මික පිළිවෙත් දිරිගැන්වීමේ තවත් ප්‍රධාන මූලපිරීමක් ලෙස, 2021/2022 මහ කන්නයේ, තම වී වගාව සඳහා කාබනික පොහොර ස්වයං නිෂ්පාදනයෙහි නිරත වන ගොවීන්ට, උපරිම වශයෙන් හෙක්ටයාරයක සීමාවකට යටත්ව, හෙක්ටයාරයකට රුපියල් 12,500ක දිරි දීමනාවක් ලබා දීමට කටයුතු සලසා ඇත. තවද, කුඹුරු ඉඩම්වල පාංශු පෝෂක ඌනතා මඟහරවා ගැනීම සඳහා, 2021/2022 මහ කන්නයේ දී සහනාධාර වශයෙන් කාබනික සහ ජෛව පොහොර ලබා දුන් අතර ම, ගොවීන්ට තම ගොවිතැන් භාවිතය සඳහා කොම්පෝස්ට් පොහොර ස්වයංව නිෂ්පාදනය කර ගැනීමට ද සහාය සපයන ලදී. මේ සම්බන්ධයෙන් කොම්පෝස්ට් පොහොරවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා රසායනාගාර පහසුකම් ද ස්ථාපිත කර ඇත. ප්‍රචලිත ප්‍රභේද 10ක් සහ සාම්ප්‍රදායික ප්‍රභේද 4ක් යොදා ගනිමින්, කාබනික වගාව සඳහා හොඳම ක්‍රියාකාරී ප්‍රභේද තෝරා ගැනීම

සඳහා සහල් ප්‍රභේද පිරික්සීම සිදු කරන ලදී. බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ නව දෙමුහුම් ප්‍රභේදයන් නිර්මාණය කිරීම සහ අභිජනන ප්‍රභේද ඇගයීම ද සිදු කරන ලද අතර, බිම් සැකසීමේ සිට අස්වනු නෙළීම දක්වා සමස්ත වගා ක්‍රියාවලිය පුරාවටම කෘෂිකාර්මික තාක්ෂණයන් මාලාවක් යොදා ගැනීමේ අරමුණින් යුතුව වී නිෂ්පාදනය සහ ඵලදායීතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

තේ

2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ කොවිඩ්-19 වසංගතය ආරම්භ වීමත් සමඟ නිෂ්පාදනය අඩුවීමෙන් වූ පදනම් බලපෑම මුල් කොටගෙන, 2021 වසරේ පළමු භාගය තුළ තේ නිෂ්පාදනයේ වර්ධනයක් ඇති වීම හේතුවෙන් මෙම වසරේ දී සමස්ත තේ නිෂ්පාදනය සියයට 7.4ක වර්ධනයක් වාර්තා කළේය. 2021 වසරේ පළමු භාගයේ වාර්තා වූ සියයට 24.0ක සැලකිය යුතු වර්ධනයෙන් අනතුරුව, නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන වසර අවසාන භාගයේ දී තේ නිෂ්පාදනය සියයට 7.2කින් තියුණු ලෙස පසුබෑමකට ලක් විය. 2021 වසරේ දී සමස්ත තේ නිෂ්පාදනයෙන් සියයට 22ක්, සියයට 17ක් සහ සියයට 61ක් පමණ වූ උඩරට, මැදරට හා පහතරට තේ නිෂ්පාදනය, පිළිවෙළින්, සියයට 5.0කින්, සියයට 9.1කින් සහ සියයට 7.8කින් ඉහළ ගියේය. මේ අතර, කුඩා වතු හිමියන්ගේ තේ අස්වැන්නේ සාමාන්‍යය ඵලදාව 2020 වසරේ දී වාර්තා වූ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,766 හා සාපේක්ෂව මෙම වසරේ දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,880ක් දක්වා ඉහළ ගිය අතර, මහා පරිමාණ වතු අංශයේ සාමාන්‍යය ඵලදාවට වඩා ඉහළ මට්ටමක පැවතුණි.

වසංගතයට පෙර පැවති මට්ටම්වලට සාපේක්ෂව 2021 වසරේ දී කොළඹ තේ වෙන්දේසියේ මිල ගණන් ඉහළ මට්ටමක පැවතුණ ද, 2020 වසරේ දක්නට ලැබුණු මිල ගණන්වලට සාපේක්ෂව මෙම මිල ගණන් පහළ මට්ටමක පැවතුණි. 2020 වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට රුපියල් 633.85ක් වූ තේ මිලෙහි සාමාන්‍යය 2021 වසර තුළ දී කිලෝග්‍රෑමයකට රුපියල් 619.15ක් දක්වා සියයට 2.3කින් පහළ ගියේය. ඒ අනුව, 2021 වසරේ දී මැදරට තේ සහ පහතරට තේ සඳහා වූ සාමාන්‍ය මිල ගණන්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 1.0කින් සහ සියයට 3.5කින් පහත වැටුණු අතර, උඩරට තේ සඳහා වූ සාමාන්‍ය මිල ගණන්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 0.6ක සුළු වර්ධනයක් වාර්තා කළේය. තවද, අමු තේ දලු සඳහා කුඩා වතු හිමියන් ලද මිල ගණන්වල සාමාන්‍යය 2020 වසරේ දී පැවති කිලෝග්‍රෑමයකට රුපියල් 94.36ක සිට 2021 වසර තුළ දී කිලෝග්‍රෑමයකට රුපියල් 93.67ක් දක්වා පහළ ගියේය. 2021 වසරේ දී තේ අපනයන මිලෙහි (නැ.වි.ස) සාමාන්‍යය කිලෝග්‍රෑමයකට රුපියල් 920.76ක් දක්වා සියයට 6.2කින් ඉහළ ගිය ද, එ.ජ. ඩොලර් වටිනාකම අනුව, තේ අපනයන මිලෙහි සාමාන්‍යය 2021 වසරේ දී සියයට 0.9කින් පහළ ගියේය. තේ නිෂ්පාදනය ඉහළ යෑම මෙන්ම, 2021 වසර තුළ දී කොළඹ තේ වෙන්දේසිය වෙත සපයනු ලැබූ තේ ප්‍රමාණය ඉහළ යෑම ද 2021 වසර තුළ දී තේ සඳහා වූ සාමාන්‍ය මිල ගණන් පහත වැටීම සඳහා කිසියම් දුරකට හේතු වී ඇත. තවද, භාණ්ඩ ප්‍රවාහන වියදම් තියුණු ලෙස ඉහළ යෑම සහ ඇසුරුම් ද්‍රව්‍ය වැනි අනෙකුත් යෙදවුම් පිරිවැයන් වසර තුළ පැවති තේ මිල ගණන් කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය.

2021 වසරේ දී, තේ කර්මාන්තය ශක්තිමත් කිරීම සඳහා රජය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. 2021 වසර තුළ දී ශ්‍රී ලංකාවේ තේ අංශය සඳහා වන පස් අවුරුදු උපායමාර්ගික සහ ක්‍රියාකාරී සැලැස්ම (2021-2025) අවසන් කළ අතර, සැලසුම් කළ පරිදි අදාළ ක්‍රියාමාර්ග ද ක්‍රියාත්මක කරන ලදී. 2020 වසරේ කොවිඩ්-19 වසංගත කාලය තුළ ප්‍රධාන පියවරක් ලෙස තේ වෙළඳාම සඳහා හඳුන්වා දුන් විද්‍යුත් වෙන්දේසි ක්‍රමය සාර්ථකව 2021 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, එම විද්‍යුත් වෙන්දේසි ක්‍රමයෙහි වෙළඳ සහ දත්ත මෙවලම් ශක්තිමත් කිරීමත් සමඟ *'SmartAuction'* සුහුරු විද්‍යුත් වෙන්දේසියක් ලෙස එය 2021 වසරේ දී වැඩිදියුණු කරන ලදී. නැවත වගා කිරීම, අලුතින් වගා කිරීම සහ පාළු පැළ සිටුවීමේ සහනාධාර වැඩසටහන යටතේ, තේ ඉඩම්වල ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ වගා කරන භූමි ප්‍රදේශ හෙක්ටයාර 263ක් සඳහා රුපියල් මිලියන 79.8ක් බෙදා දෙන ලදී. ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මධ්‍යම පරිමාණයේ තේ වතු සඳහා වන ආදර්ශ තේ වතු ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කරමින්, තේ තවාන් 138ක් ස්ථාපිත කිරීමේ අපේක්ෂාව ඇතිව ඉඩම් 17ක් සඳහා රුපියල් මිලියන 2.3ක් ලබා දීමට කටයුතු කළ අතර, එයින් තේ තවාන් 113ක් වසර අවසානය වන විට ස්ථාපිත කරන ලදී. *සුපිරිසිදු සිලෝන්* තේ (Pure Ceylon Tea) අපනයනය සඳහා සන්නාම ප්‍රවර්ධන යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන තේ අපනයනකරුවන් සඳහා ප්‍රදානයක් ලබාදීමට ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන හා අලෙවිකරණ අරමුදලෙන් රුපියල් බිලියනයක් යොදා ගැනීමට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනවල ආවේණික ලක්ෂණ සහ නිෂ්පාදන ගුණාත්මකභාවය හඳුනා ගැනීමට උපකාරී විය හැකි, සිලෝන් තේ සඳහා භූගෝලීය දර්ශක (GI) සහතිකයක් ලබා ගැනීමට අදාළව මූල්‍ය සහ

තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් යූරෝ මිලියනයක වටිනාකමකින් යුත් ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක් අත්සන් කරන ලදී. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය තේ පැළ නැවත සිටුවීමේ සහ නව වගා වැඩසටහන් මෙන්ම, තේ වගා නැවත නගා සිටුවීමේ සහනාධාර වැඩසටහන් සම්බන්ධයෙන් සිය ප්‍රයත්නයන් අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය. 2021 වසරේ දී තේ ඉඩම් හෙක්ටයාර 849ක් පමණ නැවත වගා කිරීමට සහ නව ඉඩම් හෙක්ටයාර 678ක් පමණ තේ ඉඩම් බවට පරිවර්තනය කිරීමට කටයුතු කරන ලද අතර, තේ ඉඩම්වල පාළු සිටුවීම සඳහා තේ පැළ මිලියන 3.3ක් භාවිත කරන ලදී. වසර පහකට පමණ වැඩි කාලයකින් පසුව, 2021 වසර තුළ දී හෙක්ටයාරයකට රුපියල් 500,000ක්ව පැවති කුඩා තේ වතු හිමියන් සඳහා ලබා දෙන තේ පැළ නැවත සිටුවීම සඳහා වූ සහනාධාරය රුපියල් 630,000ක් දක්වා ඉහළ නැංවූ අතර, හෙක්ටයාරයකට රුපියල් 400,000ක්ව පැවති අලුතින් තේ පැළ සිටුවීම සඳහා ලබා දෙන සහනාධාරය රුපියල් 500,000ක් දක්වා ඉහළ නැංවීය. තිරසාර සංවර්ධන ඉලක්ක, තේ අංශය සඳහා වන පස් අවුරුදු උපායමාර්ගික සහ ක්‍රියාකාරී සැලැස්ම සහ රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව අනුව යමින්, තේ වගා අංශය ශක්තිමත් කිරීම සඳහා වන සිය උපායමාර්ගික සැලැස්මට (2019-2023) අනුකූලව තේ පර්යේෂණායතනය පර්යේෂණ හා සංවර්ධන කටයුතු සහ සේවා ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.

රබර්

රබර් වගා කරන ප්‍රදේශවල අඛණ්ඩව වැසි තත්ත්වයක් පැවතීම නිසා කිරි කැපීමේ කටයුතුවලට බාධා සිදුවීම සහ දිලීර රෝගයක් පැතිරීම හේතුවෙන් 2021 වසරේ දී රබර් නිෂ්පාදනය අඛණ්ඩව පහළ ගියේය. ඒ අනුව, රබර් නිෂ්පාදනය 2020 වසර තුළ දී වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 78.2ක සිට 2021 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 76.9ක් දක්වා සියයට 1.7කින් පහත වැටුණි. 2021 වසරේ පළමු භාගය තුළ දී රබර් නිෂ්පාදනය ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ ද, ඉන් අනතුරුව සැලකිය යුතු ලෙස පහළ ගියේය. රබර් වගාවේ උපරිම අස්වැන්නක් ලැබෙන කාලය ලෙස සාමාන්‍යයෙන් සලකනු ලබන වසරේ අවසාන කාර්තුව තුළ වැසි දින ගණන ඉහළ යෑමෙන් සිදු වූ නිෂ්පාදනය පහත වැටීම මේ සඳහා හේතු විය. සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 50ක් පමණ වන ෂීට් රබර් නිෂ්පාදනය, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී සියයට 1.7කින් පහත වැටුණු අතර, ක්‍රේප් රබර් නිෂ්පාදනය සියයට 7.4ක වර්ධනයක් වාර්තා කළේය. සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 32ක් පමණ වන අනෙකුත් කාණ්ඩවල රබර් නිෂ්පාදනය පෙර වසරේ නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 6.2කින් පහත වැටුණි. කර්මාන්ත අංශය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ දේශීය කාර්මික අංශයේ රබර් පරිභෝජනය 2021 වසරේ දී කිලෝග්‍රෑම් මිලියන 133.9ක් දක්වා සියයට 19.4කින් ඉහළ ගියේය. මේ අතර, අඩු නිෂ්පාදනය හේතුවෙන් 2021 වසරේ දී සකස් නොකළ රබර් අපනයනය කිලෝග්‍රෑම් මිලියන 15.5ක් දක්වා සියයට 1.7කින් සුළු වශයෙන් පහළ ගියේය.

ගෝලීය වෙළඳපොළෙහි ස්වභාවික රබර් සඳහා වූ මිල ගණන් ඉහළ යෑම පිළිබිඹු කරමින්, 2021 වසර තුළ දී දේශීය වෙළඳපොළෙහි රබර් මිල ගණන් ද ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. 2020 වසරට සාපේක්ෂව, 2021 වසරේ දී කොළඹ රබර් වෙන්දේසියේ දුම් ගැසූ දාර ෂීට් රබර් (RSS1) මිලෙහි සාමාන්‍යය කිලෝග්‍රෑමයකට රුපියල් 460.78ක් දක්වා සියයට 31.1කින් ඉහළ ගිය අතර, ලේටෙක්ස් ක්‍රේප් මිලෙහි සාමාන්‍යය කිලෝග්‍රෑමයකට රුපියල් 626.32ක් දක්වා සියයට 74.4කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, 2021 වසරේ දෙසැම්බර් මාසය අවසානය වන විට දුම් ගැසූ දාර ෂීට් රබර් (RSS1) සහ ක්‍රේප් රබර් වෙන්දේසි මිල ගණන්වල සාමාන්‍යය, පිළිවෙළින්, කිලෝග්‍රෑමයකට රුපියල් 475.00ක් සහ රුපියල් 696.58ක් විය. රබර්වල අපනයන මිලෙහි (නැ.වි.ස.) සාමාන්‍යය, 2020 වසරේ දී වාර්තා වූ කිලෝග්‍රෑමයකට එ.ජ. ඩොලර් 1.91ක සිට 2021 වසරේ දී එ.ජ. ඩොලර් 2.72ක් දක්වා ඉහළ ගියේය. නැගෙනහිර ආසියානු කලාපයේ ඉහළ යන ඉල්ලුම මධ්‍යයේ, සෘතුමය නොවන සහ අධික වැසි තත්ත්වයන් හේතුවෙන් රබර් නිෂ්පාදකයින්ගේ කිරි කැපීමේ ක්‍රියාවලියට ඇති වූ අවහිරතා සමඟ ගෝලීය වෙළඳපොළ සැපයුම් හිඟයක් ඇති වීම හේතුවෙන් වසරේ අග භාගයේදී ජාත්‍යන්තර මිල ගණන්වල ඉහළ යෑමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණි.

රබර් අංශයේ ඵලදායීතාවය ඉහළ නැංවීම මෙන්ම, රබර් කර්මාන්තයේ අගය එකතු කිරීම ඉහළ නැංවීම අරමුණු කර ගනිමින්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව සහ රබර් පර්යේෂණ ආයතනය විසින් රබර් අංශයේ සංවර්ධනය සඳහා ගෙන ගිය උපාය මාර්ගික කටයුතු 2021 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියට අනුකූලව, දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ස්වභාවික රබර් ආශ්‍රිත නිෂ්පාදනවල නිරත වීමට සහ ආදායම් මාර්ග විවිධාංගීකරණය කිරීම දිරිමත් කරමින් කුඩා රබර් ඉඩම් ලාභදායී වාණිජ ඒකක බවට පත් කිරීම සඳහා සහනාධාර ලබාදීමට, 2021 වසර සඳහා වූ අයවැය මගින් රුපියල් මිලියන 60ක් වෙන් කර ඇත. කුඩා වතු අංශය ඉලක්ක කර ගනිමින් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2020 වසරේ දී ආරම්භ කරන ලද ඵලදායීතාවය

2

2.4 සංඛ්‍යා සටහන

ප්‍රධාන කෘෂි බෝගවල උපනති

අයිතමය	ඒකකය	2020 (අ)	2021 (ආ)	වාර්ෂික වෙනස්වීම (%)	
				2019/20 (අ)	2020/21 (ආ)
1. තේ					
1.1 නිෂ්පාදනය (ඇ)	කි.ග්‍රෑ. මිලියන	278.9	299.5	-7.1	7.4
- පහතරට	කි.ග්‍රෑ. මිලියන	169.9	183.2	-10.5	7.8
- මැදරට	කි.ග්‍රෑ. මිලියන	46.7	51.0	-0.9	9.1
- උඩරට	කි.ග්‍රෑ. මිලියන	62.2	65.3	-1.3	5.0
1.2 මුළු වගා බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	266	267	33.0	0.3
1.3 දලු කැඩීම සිදු කරන ලද බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	266	267	37.7	0.3
1.4 නිෂ්පාදන පිරිවැය (ඈ)	රුපියල්/කි.ග්‍රෑ.	492.48	533.13	1.8	8.3
1.5 සාමාන්‍ය මිල					
- කොළඹ වෙන්දේසිය	රුපියල්/කි.ග්‍රෑ.	633.85	619.15	15.9	-2.3
- අපනයන (නැ.වි.ස.)	රුපියල්/කි.ග්‍රෑ.	866.70	920.76	5.4	6.2
1.6 නැවත වගා කිරීම	හෙක්ටයාර	812	1,123	-22.0	38.3
1.7 අලුතින් වගා කිරීම	හෙක්ටයාර	424	696	-61.6	64.2
1.8 එකතු කළ අගය (ඉ)	ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන්	0.6	0.7		
2. රබර්					
2.1 නිෂ්පාදනය	කි.ග්‍රෑ. මිලියන	78.2	76.9	4.6	-1.7
- ෂීට් රබර්	කි.ග්‍රෑ. මිලියන	39.1	38.4	4.6	-1.7
- ක්‍රේප් රබර්	කි.ග්‍රෑ. මිලියන	13.0	13.9	-10.2	7.4
- වෙනත්	කි.ග්‍රෑ. මිලියන	26.1	24.5	14.0	-6.2
2.2 මුළු වගා බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	138	139	0.2	0.6
2.3 කිරි කපන ලද බිම් ප්‍රමාණය (ඊ)	හෙක්ටයාර දහස්	121	113	6.1	-6.0
2.4 නිෂ්පාදන පිරිවැය	රුපියල්/කි.ග්‍රෑ.	213.50	221.00	1.7	3.5
2.5 සාමාන්‍ය මිල					
- කොළඹ වෙන්දේසිය (RSS 1)	රුපියල්/කි.ග්‍රෑ.	351.46	460.78	21.8	31.1
- අපනයන (නැ.වි.ස.)	රුපියල්/කි.ග්‍රෑ.	353.84	540.77	6.5	52.8
2.6 නැවත වගා කිරීම (ඊ)	හෙක්ටයාර	976	1,470	-6.2	50.6
2.7 අලුතින් වගා කිරීම (ඊ)	හෙක්ටයාර	751	1,185	-31.9	57.8
2.8 එකතු කළ අගය (ඉ)	ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන්	0.2	0.2		
3. පොල්					
3.1 නිෂ්පාදනය	ගෙඩි මිලියන	2,792	3,120	-9.5	11.7
- දිසඳි පොල්	ගෙඩි මිලියන	226	298	-41.5	31.8
- පොල් තෙල්	ගෙඩි මිලියන	48	211	-81.0	340.6
- වෙනත්	ගෙඩි මිලියන	2,516	2,607	2.9	3.6
3.2 මුළු වගා බිම් ප්‍රමාණය	හෙක්ටයාර දහස්	505	505	0.2	0.2
3.3 නිෂ්පාදන පිරිවැය	ගෙඩියකට රුපියල්	21.81	21.25	19.0	-2.6
3.4 සාමාන්‍ය මිල					
- නිෂ්පාදන මිල	ගෙඩියක් රුපියල්	61.05	71.88	45.7	17.7
- අපනයන (නැ.වි.ස.) (උ)	ගෙඩියක් රුපියල්	52.61	65.36	40.4	24.2
3.5 නැවත වගා කිරීම/ යටි වගාව (ඌ)	හෙක්ටයාර	5,333	7,647	-10.1	43.4
3.6 අලුතින් වගා කිරීම (එ)	හෙක්ටයාර	8,000	1,387	16.9	-82.7
3.7 එකතු කළ අගය (ඉ)	ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන්	0.6	0.7		

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දලු සැපයුම්කරුවන්ගේ ලාභාංශද ඇතුළත් වේ
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි
(ඊ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(උ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි
(ඌ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් ආවරණය වේ
(එ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් බෙදා හරින ලද බීජ පැල සංඛ්‍යාව අනුව අළුතින් වගා කල බිම් ප්‍රමාණය ගණනය කර ඇත. මෙහිදී පොල් බීජ පැල 158ක් සඳහා හෙක්ටයාර එකක් යනුවෙන් අනුපාතය යොදා ගෙන ඇත.

මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
වැවිලි අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ, අලුතින් වගා කිරීම, නැවත වගාකිරීම, අතහැර දැමූ රබර් ඉඩම් කිරි කැපීම සඳහා නැවත සකස් කිරීම සහ ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීම සම්බන්ධ කටයුතු 2021 වසරේ දී අඛණ්ඩව කරගෙන ගිය අතර, අතහැර දැමූ රබර් ඉඩම් නැවත වගා කිරීම, වැසි ආවරණ සහ වල් නෙලීමේ උපකරණ මිලදී ගැනීම සඳහා සහනාධාර ද ලබා දෙන ලදී. තවද, *කුඩා පරිමාණ තේ හා රබර් වතු නැවත නගා සිටුවීමේ ව්‍යාපෘතිය* (STaRR) යටතේ මොණරාගල සහ අම්පාර දිස්ත්‍රික්ක ඇතුළු සාම්ප්‍රදායික නොවන රබර් වගාකරන ප්‍රදේශවල අලුතින් රබර් වගා කිරීමට අදාළ ප්‍රයත්න අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත. රබර් පර්යේෂණ ආයතනය විසින් එහි පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස, පුස්සැල්ලාව, අගලවත්ත, කැලණිවැලි සහ කෑගල්ල වැවිලි සමාගම් ආශ්‍රිතව වතු 14ක සහ කුඩා වතු හිමියන් සතු වතු 6ක් තුළ බෝගවල කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා පරිසර හිතකාමී සහ ආර්ථික වශයෙන් ශක්‍යතාවයක් සහිත බෝග සඳහා පොහොර සෙමින් නිදහස් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. රබර් පර්යේෂණ ආයතනය විසින්, කළුතර, කුරුණෑගල, මාතලේ, කෑගල්ල, මාතර, ගාල්ල, කොළඹ සහ රත්නපුර දිස්ත්‍රික්කවල අක්කර 131.8ක මුළු භූමි ප්‍රමාණයක් ආවරණය කරමින් කොම්පෝස්ට් යෙදීම සඳහා ගොවිපොළවල සහභාගීත්වය සහිත පර්යේෂණ 64ක් ද පවත්වන ලදී. තවද, රබර් කර්මාන්තය සහ ඒ සඳහා අදාළ අගය දාමයන් දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රතිපත්ති සැකසීමේ අරමුණින් යුතුව වැවිලි අමාත්‍යාංශය විසින් අදාළ අමාත්‍යාංශ සහ ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත අන්තර් ආයතනික සම්බන්ධීකරණ කමිටුවක් පිහිටුවන ලදී.

පොල්

2021 වසරේ දී සමස්ත පොල් නිෂ්පාදනය, ගෙඩි මිලියන 3,120ක් ලෙස සනිටුහන් කරමින් මෙතෙක් වාර්තා වූ ඉහළම අගය වාර්තා කළේය. ඒ අනුව, පොල් නිෂ්පාදනය 2020 වසරේ දී වාර්තා වූ සියයට 9.5ක පහළ යෑමට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 11.7ක වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනය සඳහා, ප්‍රධාන පොල් වගා කරන ප්‍රදේශවල පැවති හිතකර වායුගෝලීය උෂ්ණත්වයට අමතරව, 2020 වසරේ අග භාගයේ සිට 2021 වසර පුරාවට ප්‍රමාණවත් ලෙස ව්‍යාප්ත වූ වර්ෂාපතනයක් ලැබීම නිසා පැවති හිතකර කාලගුණික තත්ත්වයන් විශාල වශයෙන් හේතු විය. 2020 වසරේ දී පොල් නිෂ්පාදනය පෙන්නුම් කළ අඩු කාර්ය සාධනයෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන්, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී ප්‍රධාන පොල් මද ආශ්‍රිත නිෂ්පාදනය ඉහළ ගියේය. ඒ අනුව, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී දිසිදි පොල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 33,289ක් දක්වා සියයට 31.8කින් ඉහළ ගිය අතර, පොල් තෙල් නිෂ්පාදනය සියයට 117.8කින් කැපී පෙනෙන ලෙස වර්ධන විය. පාම් තෙල් ආනයනය හා පරිභෝජනය සහ වෙනත් ආහාරයට ගත හැකි තෙල් වර්ග ආනයනය අධෛර්යවත් කරමින්, දේශීය පොල් තෙල් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස පොල් තෙල් නිෂ්පාදනය ඉහළ ගියේය. 2021 වසරේ දී පොල් ක්‍රීම්, පොල් කිරි සහ පිටිකළ පොල් කිරි නිෂ්පාදන ද ඉහළ ගියේය. සමස්ත පොල් නිෂ්පාදනය ඉහළ ගියද, සකස් කළ නිෂ්පාදන සඳහා කාර්මික අංශයේ ඉල්ලුම ඉහළ යෑම මධ්‍යයේ 2021 වසරේ දී කොප්පරා සහ පොල් ගෙඩි අපනයන පහළ ගියේය. මේ අතර, කාර්මික අංශය සඳහා ඉහළ යන ඉල්ලුම සපුරාලීමට දේශීය නිෂ්පාදනය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා ශීතකළ පොල් මද ආනයනය කිරීමට පියවර ගැනුණි.

පොල් නිෂ්පාදනය ඉහළ මට්ටමක පැවතිය ද, පොල් ආශ්‍රිත කර්මාන්තවලින් ඇති ඉහළ ඉල්ලුම පිළිබිඹු කරමින්, 2021 වසර තුළ දී පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල ගණන් ඉහළ මට්ටමක පැවතුණි. ඒ අනුව, කොළඹ පොල් වෙන්දේසියේ පොල් ගෙඩියක වෙන්දේසි මිලෙහි සාමාන්‍යය 2020 වසරේ දී පැවති රුපියල් 48.89ක සිට 2021 වසරේ දී රුපියල් 56.51ක් දක්වා ඉහළ ගියේය. පොල් ගෙඩියක සිල්ලර මිලෙහි සාමාන්‍යය 2020 වසරට සාපේක්ෂව රුපියල් 83.90ක් දක්වා සියයට 13.7කින් ඉහළ ගියේය. රජය විසින් 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී, පොල් ගෙඩිවල වට ප්‍රමාණය මත පදනම්ව, ගෙඩියකට රුපියල් 60.00 සිට 70.00ක් දක්වා උපරිම සිල්ලර මිලක් නියම කළ ද, මෙම පාලිත මිලට වඩා ඉහළ මිලකට දේශීය වෙළඳපොළෙහි පොල් අලෙවි වීම හේතුවෙන් 2021 වසරේ ජූනි මාසයේ දී එම මිල පාලනය ඉවත් කරන ලදී. ආහාරයට ගත හැකි තෙල් වර්ග ආනයනය සැලකිය යුතු ලෙස පහළ යෑම සහ ගෝලීය වෙළඳපොළ තුළ මෙම තෙල් වර්ග සඳහා වන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ දී දේශීය වෙළඳපොළෙහි පොල්තෙල් මිලි ලීටර් 750ක බෝතලයක මිලෙහි සාමාන්‍යය රුපියල් 443.42ක් දක්වා සියයට 29.2කින් ඉහළ ගියේය. දේශීය වෙළඳපොළෙහි දිසිදි පොල් සඳහා කිලෝග්‍රෑමයක මිලෙහි සාමාන්‍යය පෙර වසරේ දී වාර්තා වූ රුපියල් 447.56ක සිට මෙම වසර තුළ දී රුපියල් 537.25ක් දක්වා තවදුරටත් ඉහළ ගියේය.

2

තිරසාර පොල් වගා කිරීමේ ක්‍රමයක් නිර්මාණය කිරීම සඳහා වන ක්‍රියාමාර්ග හරහා පොල් ඉඩම්වල ඵලදායීතාවය ඉහළ නැංවීමට රජය පියවර රැසක් ක්‍රියාවට නැංවීය. ඒ අනුව, 2021 වසරේ දී, කාබනික පොහොර යෙදීම, පසට කොළ රොඩු යෙදීම සහ තෙතමනය සංරක්ෂණය කිරීමේ ක්‍රම යොදා ගනිමින් දැනට පවතින පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලය විශේෂ සහනාධාර ක්‍රමයක් හඳුන්වා දුන්නේය. එසේම, ක්‍රමානුකූල වගා කටයුතු සඳහා සහන මිලට පොල් පැළ ලබාදීමේ වැඩසටහන 2021 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය. පොල් ඉඩම්වල ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධතිය, නළ වාරි පද්ධතිය සහ ජල මූලාශ්‍ර ඉදිකිරීම සඳහා සහාය වන නව සහනාධාර ක්‍රමයක් තුළින් පොල් ඉඩම්වල කාර්යක්ෂම වාරි පද්ධති ස්ථාපිත කිරීමට ද පියවර ගෙන ඇත. එමගින් පොල් වගාවට අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ඇති වන බලපෑම් අවම කිරීමට අපේක්ෂා කරයි. 2021 වසර තුළ දී, පොල් පර්යේෂණ ආයතනය විසින් ජානමය වශයෙන් උසස් දෙමුහුන් පොල් බීජ නිෂ්පාදනය හා ඉහළ අස්වැන්නක් ලබා දෙන *කප්සුවය* දෙමුහුන් පොල් ප්‍රභේදය නිෂ්පාදනය කිරීම සඳහා නව පොල් බීජ වගාවක් ස්ථාපිත කිරීමට අදාළ කටයුතු කිහිපයක ද නිරත විය. පොල් පර්යේෂණ ආයතනය, පොල් වගාව සඳහා කාබනික පොහොර අවශ්‍යතා ඇස්තමේන්තු කිරීම සහ ඝන හා ද්‍රව කාබනික පොහොර ප්‍රමිතිකරණයට අදාළ මූලික කටයුතුවල ද නිරත විය. පොල් සංවර්ධන අධිකාරිය විසින් විවිධාංගීකරණය සහ එකතු කළ අගය සහිත පොල් නිෂ්පාදන අඛණ්ඩව වැඩිදියුණු කිරීම සහතික කරමින්, පොල් ආශ්‍රිත නිෂ්පාදන කරනු ලබන නිපැයුම්කරුවන්ට සහාය ව්‍යවසායකයින්ට මූල්‍යමය සහය ලබා ගැනීම සඳහා පහසුකම් සලසමින් පොල් ආශ්‍රිත කර්මාන්ත සඳහා අඛණ්ඩව සහයෝගය ලබා දෙන ලදී.

සුළු අපනයන බෝග

කොවිඩ්-19 ආශ්‍රිත ගෝලීය සැපයුම් දාමයේ අවහිරතා මධ්‍යයේ වුව ද, සුළු අපනයන බෝගවල වර්ධන වේගය 2021 වසරේ දී අඛණ්ඩව පැවතුණි. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, සුළු අපනයන බෝග නිෂ්පාදනය 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 28.6කින් ඉහළ ගියේය. කුළුබඩු ආනයනය සම්බන්ධයෙන් රජය විසින් පනවා ඇති සීමා හේතුවෙන් වගා කටයුතුවල නියැලීම සඳහා ගොවීන් දිරිමත් වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම අංශයේ කාර්ය සාධනය වර්ධනය වී ඇත. කුරුඳු, ගම්මිරිස්, කරාබු නැටි, එනසාල්, කෝපි, කොකෝවා සහ සාදික්කා නිෂ්පාදන 2021 වසරේ දී වර්ධනයන් වාර්තා කළ අතර, බුලත් නිෂ්පාදනය 2021 වසරේ දී සුළු වශයෙන් පහළ ගියේය. තවද, 2016 වසරේ සිට ගම්මිරිස් සඳහා ලැබුණු මිල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පීඩාවට පත් වූ වගාකරුවන් සඳහා මූල්‍ය සහන සලසමින්, ගම්මිරිස් සඳහා වන ගෝලීය ඉල්ලුම ඉහළ යෑමත් සමඟ මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. රජය විසින් ආරම්භ කරන ලද *කහ වගා කිරීමේ කඩිනම් සංවර්ධන වැඩසටහනත්* සමඟ, කහ බෝග නිෂ්පාදනයෙන් මෙරට ස්වයංපෝෂිත කිරීමේ රජයේ ඉලක්කවලට අනුකූලව 2021 වසර තුළ දී කහ වගාව සැලකිය යුතු ලෙස වර්ධනය විය. අපනයන බෝග නිෂ්පාදනය ඉහළ යෑම පිළිබිඹු කරමින්, මෙම අංශයේ සමස්ත අපනයන ප්‍රමාණය සියයට 20.4ක වර්ධනයක් සමඟ අපනයන කෘෂිකාර්මික බෝග අංශය 2021 වසරේ දී එහි ඉහළම අපනයන කාර්ය සාධනය වාර්තා කළ අතර, 2021 වසර තුළ දී අපනයන ආදායම රුපියල් වටිනාකම අනුව සියයට 41.0කින් ඉහළ ගියේය.

අපනයන කෘෂිකාර්මික අංශයේ කාර්ය සාධනය ඉහළ නංවාලීම සඳහා අපනයන කෘෂිකාර්මික බෝගවල ගුණාත්මකභාවය සහ ඵලදායීතාව ඉහළ නැංවීම මගින් විදේශ විනිමය ඉපැයීම් උත්පාදනය ඉලක්ක කරගත් ක්‍රියාමාර්ග කිහිපයක් අනුගමනය කර ඇත. අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර, වව්නියාව සහ යාපනය වැනි සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල ගම්මිරිස්, පුවක්, ඉඟුරු, කහ සහ බුලත් වගා ව්‍යාප්ත කිරීමට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු 2021 වසරේ දී අඛණ්ඩව සිදු කෙරිණි. කාබනික බෝග වගාව හඳුන්වාදීම සහ ප්‍රචලිත කිරීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහ යහපත් නිෂ්පාදන පිළිවෙත් (GMP) ඇතුළු බෝග නිෂ්පාදනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කිහිපයක් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ක්‍රියාවට නංවන ලදී. තවද, 2021 වසරේ දී ආර්ථිකමය වශයෙන් ඵලදායී වගාවන් ස්ථාපිත කිරීමට සහාය සැලසීම සඳහා, ඵලදායීතාව වර්ධනය කිරීමේ වැඩසටහන්, බෝග විශේෂිත සංවර්ධන වැඩසටහන් සහ කාබනික වගා ප්‍රවර්ධන වැඩසටහන් වැනි සංවර්ධන වැඩසටහන් ගණනාවක් පවත්වා ඇත. පසු අස්වනු පිළිවෙත් වැඩිදියුණු කිරීම සහ සුදුසු තාක්ෂණික ක්‍රම භාවිත කරමින් එම පිළිවෙත් අගය එකතු කිරීමේ ක්‍රියාකාරකම් බවට පරිවර්තනය කිරීමේ අරමුණින් තාක්ෂණය ආශ්‍රිත මාර්ගෝපදේශ සහ සහාය ගොවීන් වෙත ලබා දී ඇත. කාබනික බෝග වගා ප්‍රවර්ධන වැඩසටහන හරහා තත්ත්ව සහතික සහ කාබනික සහතික ලබා ගැනීමට ද වගාකරුවන් සඳහා සහාය සපයන ලදී.

වෙනත් ක්ෂේත්‍ර බෝග

ආනයන තහනම් කිරීම් මධ්‍යයේ, හිතකර කාලගුණික තත්ත්ව සහ දේශීය නිෂ්පාදන සඳහා ඉල්ලුම වර්ධනය වීම හේතුවෙන් වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය ඉහළ ගියේය. ඒ අනුව, 2021 වසරේ දී, වෙනත් ක්ෂේත්‍ර බෝගවල සමස්ත නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 843,297ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 27.3කින් ඉහළ ගොස් ඇති අතර, 2020/2021 මහ කන්නයේ නිෂ්පාදනයෙහි වාර්තා වූ සියයට 41.9ක වර්ධනය මේ සඳහා සැලකිය යුතු ලෙස දායක විය. එසේම, 2021 වසරේ යල කන්නය පසුගිය යල කන්නයට වඩා සියයට 2.0ක වර්ධනයක් වාර්තා කළේය. බඩ ඉරිඟු, කුරක්කන්, අර්තාපල්, ලොකු ළූණු, මුං ඇට, උඳු, රටකජු සහ තල වැනි වෙනත් ක්ෂේත්‍ර බෝගවල දේශීය නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ඉහළ යෑමක් වාර්තා කර ඇති අතර, රතු ළූණු, අමු මිරිස්, කව්පි, සෝයා බෝංචි සහ සෝගම් නිෂ්පාදනය පහත වැටීමක් වාර්තා කර ඇත. දේශීය බඩ ඉරිඟු නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරන ලද සවිබල ගැන්වීමේ වැඩසටහන්වල ප්‍රතිඵලයක් ලෙස, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී බඩ ඉරිඟු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 472,444ක් දක්වා සියයට 50.7කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, බඩඉරිඟු ආනයන සීමා කරමින් ගනු ලැබූ පියවර හේතුවෙන්, බඩ ඉරිඟු ආනයනය 2021 වසරේ දී සියයට 47.8කින් අඩු විය. 2020 වසරේ දී සියයට 36.0කින් පහත වැටුණු අර්තාපල් නිෂ්පාදනය, 2021 වසරේ දී සියයට 16.6ක වර්ධනයක් සමඟ යථා තත්ත්වයට පත් වූ අතර, අර්තාපල් ආනයනය 2020 වසරට වඩා සියයට 8.0කින් පහත වැටුණි. තවද, පසුගිය වසරට සාපේක්ෂව ලොකු ළූණු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 65,907ක් දක්වා සියයට 53.2කින් ඉහළ ගොස් ඇති අතර, 2021 වසරේ ලොකු ළූණු ආනයනය මෙට්‍රික් ටොන් 257,421ක් දක්වා සියයට 3.2කින් පහළ ගියේය. මේ අතර, බීජ සහ පැළෑටි බෙදා දීම හරහා අඛණ්ඩව සහාය සලසන අතර, නිෂ්පාදනය වැඩිදියුණු කිරීම සඳහා වූ විශේෂිත ක්‍රියාමාර්ග තුළින් වෙනත් ක්ෂේත්‍ර බෝගවල දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමට රජය විසින් පියවර කිහිපයක් ක්‍රියාවට නංවන ලදී. ඒ අනුව, බෝග සඳහා නිසි මිලක් සහතික කරමින්, ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා වූ ජාතික වැඩසටහන යටතේ ගොවීන්ට කෙටි කාලීන ගබඩා පහසුකම් ලබා දීමේ අරමුණ ඇතිව, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා දීප ව්‍යාප්තව ගබඩා 102ක් ඉදිකිරීමේ කටයුතු 2021 වසර තුළ දී අඛණ්ඩව සිදු කරන ලද අතර, ඉන් ව්‍යාපෘති 76ක් 2021 වසර අවසන් වන විට නිම කරන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ජල කළමනාකරණය වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරන අතර, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම, වෙනත් ක්ෂේත්‍ර බෝග වගා භූමි ප්‍රමාණය පුළුල් කිරීම, පළිබෝධ කළමනාකරණ ශිල්පීය ක්‍රම වැඩිදියුණු කිරීම සහ ඉහළ අස්වැන්නක් ලබා දෙන බීජ භාවිතය ඉහළ නැංවීම සඳහා ද අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී. දේශීය ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම සඳහා බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම, පොහොර සහ පළිබෝධනාශක වැනි කෘෂිකාර්මික යෙදවුම්වල ප්‍රශස්ත භාවිතය, ගබඩා ධාරිතාව පුළුල් කිරීම, දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන කෘෂිකර්මාන්තයක් සඳහා සුදුසු පිළිවෙත් අනුගමනය කිරීම සහ අගය දාමයන් සමඟ ඒකාබද්ධ වීම ඉහළ නැංවීම මෙන්ම, නව අලෙවිකරණ ක්‍රම ස්ථාපිත කිරීම යනාදී පියවර හරහා සියලුම වෙනත් ක්ෂේත්‍ර බෝග සැපයුම වැඩිදියුණු කිරීමට තවදුරටත් ප්‍රයත්න දැරිය යුතුය.

එළවළු

අයහපත් කාලගුණික තත්ත්වයන්, පොහොර හිඟය සහ යන්ත්‍රෝපකරණ හා ප්‍රවාහන වියදම්වල ඉහළ යෑමේ ඒකාබද්ධ බලපෑම් හේතුවෙන් 2021 වසරේ එළවළු සැපයුම පහළ ගියේය. සමස්ත එළවළු නිෂ්පාදනය, 2020 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 1,693,095ට සාපේක්ෂව, 2021 වසරේ දී මෙට්‍රික් ටොන් 1,669,515ක් දක්වා සියයට 1.4කින් පහළ ගියේය. 2020/2021 මහ කන්නයේ එළවළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 871,729ක් දක්වා පසුගිය මහ කන්නයට සාපේක්ෂව සියයට 2.5කින් පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, 2021 වසරේ යල නිෂ්පාදනය ද 2020 වසරේ අනුරූප කන්නයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 797,786ක් දක්වා සියයට 0.2කින් සුළු වශයෙන් පහළ ගියේය. නිෂ්පාදනය අඩු වීම සහ සැපයුම් දාමවලට ඇති වූ අවහිරතා හේතුවෙන් වසර මුළුල්ලේම එළවළු මිල ගණන්වල උච්චාවචන ඇති විය. ඒ අනුව, කන්න අස්වැන්න ඉහළ යෑම හේතුවෙන් මාර්තු සහ සැප්තැම්බර් මාසවල දක්නට ලැබුණු සුළු පහත වැටීම් හැරුණුවිට එළවළු මිල ගණන් 2021 වසර තුළ දී ඉහළ මට්ටමක පැවතුණි. කෘෂි රසායන ද්‍රව්‍ය හිඟය හේතුවෙන් පළිබෝධ හා රෝග පැතිරී යෑම, පොහොර හිඟය, සහ දැඩි වර්ෂාපතනය සමඟ සිදු වූ බෝග හානි සහ සැපයුම් දාමවල අවහිරතා හේතුවෙන් වසර අවසානයේ දී එළවළු මිල ගණන් ඍතුමය වශයෙන් දක්නට ලැබෙන මිල ප්‍රවණතා අභිබවමින් ශීඝ්‍ර ලෙස ඉහළ ගියේය. මේ අතර, 2021 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 28.5ක වටිනාකමින් යුත් එළවළු මෙට්‍රික් ටොන් 21,540ක් අපනයනය කර ඇති අතර, එ.ජ. ඩොලර් මිලියන 384.3ක වටිනාකමින් යුතු එළවළු මෙට්‍රික් ටොන් 697,144ක් ආනයනය

2

කර ඇත. තවද, 2021 වසර තුළ දී දේශීය එළවළු නිෂ්පාදනය ප්‍රවර්ධනය සහ ශක්තිමත් කිරීම සඳහා රජයේ ආයතන කිහිපයක් අඛණ්ඩව පියවර ගෙන ඇත. කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය විසින් විවිධ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති, පුහුණු හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ තාක්ෂණය භාවිතය වැඩිදියුණු කිරීම සඳහා උපදේශන සේවාවන් සිදු කරන ලද අතර, එවැනි තාක්ෂණ කේන්ද්‍රීය ශිල්පීය ක්‍රම මගින් පසු අස්වනු කළමනාකරණය කෙරෙහි ඇති කරන බලපෑම සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය ශක්තිමත් කිරීම හා ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම කෙරෙහි ඉන් ඇති කරන බලපෑම තක්සේරු කරන ලදී. 2022 වසරේ මුල් භාගයේ දී, එළවළු සහ පලතුරු නිෂ්පාදනය ඉහළ නැංවීම, සහ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා රජයේ ආයතන අටක සහයෝගය ඇතිව ගෙවතු වගාව සඳහා ජාතික මට්ටමේ වැඩසටහනක් ආරම්භ කිරීමට රජය විසින් පියවර ගන්නා ලදී.

පලතුරු

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, 2021 වසරේ දී පලතුරු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 3.3ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ දී, එ.ජ. ඩොලර් මිලියන 38.0ක වටිනාකමින් යුතු පලතුරු මෙට්‍රික් ටොන් 43,426ක් අපනයනය කරන ලද අතර, එ.ජ. ඩොලර් මිලියන 67.6ක් වටිනා පලතුරු මෙට්‍රික් ටොන් 55,725ක් ආනයනය කරන ලදී. අපනයනය කරන ලද පලතුරු අතර කෙසෙල්, පැපොල් සහ අන්නාසි ප්‍රධානතම පලතුරු ත්‍රිත්වය වූ අතර, ඇපල්, මිදි සහ දොඩම් ප්‍රධාන ආනයනික පලතුරු වර්ග තුන විය. දේශීය පලතුරු සඳහා ඉහළ ඉල්ලුමක් පැවතියද, රටේ සමස්ත ඉල්ලුම සපුරාලීම සඳහා දේශීය නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන ධාරිතාවය ප්‍රමාණවත් නොවීය. ඒ අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පසු අස්වනු හානි අවම කිරීම සහතික කරන අතරම, ඵලදායීතාව, ගබඩාකරණ හා බෙදා හැරීමේ පහසුකම් සහ කෘෂි යෙදවුම් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම වැඩිදියුණු කිරීම සඳහා පියවර කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. සංචරණ සීමා පැනවීම් හේතුවෙන්, පහසුවෙන් අලෙවි කර ගැනීමට නොහැකි වූ එළවළු සහ පලතුරු තොග දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ රජයේ ආයතන වෙත මිලදී ගැනීමේ වැඩසටහනක්, කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් 2021 වසරේ ජූනි මාසයේ දී ක්‍රියාත්මක කරන ලදී. එළවළු සහ පලතුරු අදාළ දිස්ත්‍රික් මිල කමිටුව විසින් තීරණය කරනු ලබන මිල ගණන් යටතේ මිලදී ගත යුතු වූ අතර, එමගින් ගොවීන්ට සිය නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබාදීම තහවුරු කෙරිණි. අත්‍යවශ්‍ය නොවන ආනයන සඳහා වන අධික වියදම් සීමා කිරීම සඳහා වූ ක්‍රියාමාර්ගවල කොටසක් ලෙස දොඩම්, මැන්ඩරින්, මිදි සහ ඇපල් ඇතුළු පලතුරු කිහිපයක් ආනයනය සීමා කිරීමට 2022 වසරේ මාර්තු මාසයේ දී රජය විසින් පියවර ගන්නා ලදී.

සීනි

හිතකර වර්ෂාපතන රටාවන් පැවතීම සහ වගා කරන ලද භූමි ප්‍රමාණය පුළුල් කිරීම හේතුවෙන්, සීනි නිෂ්පාදනයෙහි ඉහළ යෑමේ ප්‍රවණතාව 2021 වසරේ දී අඛණ්ඩව පැවතුණි. *සෙවනගල, පැල්වත්ත සහ ගල්ඔය* සීනි කර්මන්තශාලාවන්හි නිෂ්පාදනය කරන ලද සමස්ත සීනි ප්‍රමාණය 2020 වසරේ දී වාර්තා වූ සියයට 14.5ක වර්ධනයට සාපේක්ෂව 2021 වසරේ දී මෙට්‍රික් ටොන් 70,606ක් දක්වා සියයට 17.9කින් තවදුරටත් ඉහළ ගියේය. ඒ අනුව, සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ දී *සෙවනගල, පැල්වත්ත සහ ගල්ඔය* සීනි කර්මන්තශාලාවන්හි නිෂ්පාදනය, පිළිවෙළින්, සියයට 10.4කින්, සියයට 28.8කින් සහ සියයට 11.2කින් වර්ධනය විය. කර්මාන්තශාලා විසින් පවත්වාගෙන යනු ලබන උක් වගාවන් (නිරි වගාව ඇතුළත්ව) යටතේ ඇති මුළු වගා බිම් ප්‍රමාණය ද 2021 වසර තුළ දී සියයට 3.5කින් ඉහළ ගියේය. තවද, නිෂ්පාදන කටයුතු ආරම්භ කර ඇති ඇතිමලේ වතු සමාගම විසින් නුදුරු අනාගතයේ දී දේශීය සීනි නිෂ්පාදනය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, නීතිමය ගැටලු හේතුවෙන් මන්දගාමී ලෙස වුව ද, කන්තලේ සීනි කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු සහ උක් වගාව නැවත ආරම්භ කිරීමට අදාළ කටයුතු 2021 වසර තුළ දී සිදුවෙමින් පැවතුණි. 2021 වසරේ දී සමස්ත සීනි නිෂ්පාදනය සහ සාමාන්‍ය ඵලදාව ඉහළ ගියද, සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය[4] අනුව මනිනු ලබන සීනි ඵලදායීතාව පහළ ගියේය. විශේෂයෙන්ම අස්වනු නෙළන කාලය තුළ පැවති දුර්වල වාරි කළමනාකරණය සහ සීනි කර්මාන්තශාලාවල පැවති නුසුදුසු නියැදිකරණ පද්ධතීන් සහ ගුණාත්මකභාවය පදනම් කරගත් උක් දඬු මිලකරණය කිරීමේ ක්‍රමවේදයේ අකාර්යක්ෂමතාව මේ සඳහා හේතු වී ඇත.

පවතින වගා කටයුතුවල ඵලදායීතාව ඉහළ නැංවීම සහ උක් වගාව ව්‍යාප්ත කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් උපායමාර්ග කිහිපයක් 2021 වසර තුළ දී ක්‍රියාත්මක කර ඇත. දේශීය නිෂ්පාදනයට වඩා සීනි ආනයනය ඉහළ මට්ටමක පැවතීම පිළිබඳව සැලකිල්ලට ගනිමින්, බීජ සැපයීම, උක් වගා කරන විවිධ ප්‍රදේශවල බීජ ගුණන තවාන් (multiplication plots) හා පැල තවාන් පිහිටුවීම සහ බෝග වැඩිදියුණු කිරීමේ

4 සීනි ලබා ගැනීමේ ප්‍රතිශතය = $\frac{\text{සීනි නිෂ්පාදනය}}{\text{අඹරන ලද උක් ප්‍රමාණය}} \times 100$

හා සම්පත් කළමනාකරණ පිළිවෙත් හරහා උක් වගාවන් ව්‍යාප්ත කිරීමේ ප්‍රයත්නයන් වසර පුරා අඛණ්ඩව සිදු විය. රජයේ ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අනුකූලව, අකාබනික කෘෂිකාර්මික පිළිවෙත්වලින් ඉවත් වෙමින් කාබනික කෘෂිකාර්මික පිළිවෙතකට යොමු වීමට අදාළ සංවර්ධන වැඩසටහන් කිහිපයක් 2021 වසර තුළ දී ක්‍රියාවට නැංවුණි. කාබනික පොහොර හා ජෛව රසායන, සහ ජෛව පාලන ක්‍රම හඳුන්වා දීම, උක් වගා කරන පස සඳහා භූමියට විශේෂිත වූ පොහොර නිර්දේශ කිරීමේ ආකෘතියක් සම්පාදනය කිරීම ද මේ ක්‍රියාමාර්ග අතරට ඇතුළත් වේ. මේ අතර, උක් පර්යේෂණ ආයතනය විසින් වැලිඔය, හොරොව්පතාන සහ බිබිල යන ප්‍රදේශවල නව උක් කර්මාන්ත ශාලා පිහිටුවීමට අදාළ මූලික පියවර ගන්නා ලද අතර ම, කිලිනොච්චිය, ස්කන්ධපුරම් ප්‍රදේශයෙහි උක් වගාව ව්‍යාප්ත කිරීමට ද අඛණ්ඩව පියවර ගන්නා ලදී. 2016 වසරේ දී කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද *සීනි නිෂ්පාදන අංශයේ ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය*, වත්මන් ගෝලීය සහ දේශීය තත්ත්වය පිළිබිඹු වන පරිදි යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියෙහි උක් පර්යේෂණ ආයතනය සක්‍රීයව නිරත විය. ගෝලීය සීනි මිල ශීඝ්‍ර ලෙස ඉහළ යෑම සහ සීනි ආනයනය සඳහා වැය වන සැලකිය යුතු විදේශ විනිමය සැලකිල්ලට ගනිමින්, වැඩිදියුණු කළ ප්‍රභේද, වඩාත් හොඳ කෘෂි ආර්ථික ක්‍රමෝපායන් සහ නවීන තාක්ෂණය භාවිතය හරහා නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීමේ හැකියාව පිළිබඳව අවධානය යොමු කරන අතරම, සීනි කර්මාන්තය නිසි කාලීනව ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු කිරීම සඳහා රජය විසින් මෙම ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

පශු සම්පත්

2021 වසරේ දී පශු සම්පත් අංශයේ කාර්ය සාධනය වර්ධනය වන ලකුණු පෙන්නුම් කළේය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව, 2021 වසරේ සමස්ත දේශීය කිරි නිෂ්පාදනය ලීටර් මිලියන 513ක් දක්වා සියයට 4.4කින් වර්ධනය විය. එළකිරිවල නිෂ්පාදක මිලෙහි සාමාන්‍යය ඉහළ යෑම, එකතු කරන ලද කිරි ප්‍රමාණය ඉහළ යෑම සහ නව කිරි ගොවිපළවල් නිෂ්පාදනයට සම්බන්ධ වීම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන නිෂ්පාදනය ඉහළ ගියේය. සාන්ද්‍රණ සත්ව ආහාරවල මිල ගණන් සහ ශ්‍රම පිරිවැය ඉහළ යෑම හේතුවෙන්, කිරි ලීටරයක් සඳහා වන නිෂ්පාදන සාමාන්‍ය පිරිවැය, පෙර වසරේ දී වාර්තා වූ රුපියල් 49.28 සිට 2021 වසරේ දී රුපියල් 69.30ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, ආනයනික සහ දේශීය කිරිපිටි හිඟතාව හේතුවෙන් දියර කිරි සඳහා වන ඉල්ලුම ඉහළ යෑම සහ කිරිපිටි මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන්, දේශීයව නිපදවන දියර කිරි සඳහා ගොවීන්ට ලැබුණු මිල ද 2021 වසර තුළ දී සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. ඒ අනුව, එළකිරි ලීටරයක් සඳහා ගොවිපළ මිලෙහි සාමාන්‍යය, 2020 වසරේ පැවති රුපියල් 82.00 සිට 2021 වසරේ දී රුපියල් 98.00ක් දක්වා ඉහළ ගියේය. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අනුව, 2021 වසරේ දී රටේ සමස්ත අවශ්‍යතාවය සපුරාලීම සඳහා දේශීය කිරි නිෂ්පාදනයේ දායකත්වය සියයට 38ක් පමණ විය. කුකුළු මස් හා බිත්තර කර්මාන්තය සම්බන්ධයෙන් ගත් කල, බිත්තර නිෂ්පාදනය පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 4.5ක වර්ධනයක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, සතුන්ට ලබා දෙන ආහාර ද්‍රව්‍ය සීමිත වීම සහ සත්ව ආහාර පිරිවැය ඉහළ යෑම හේතුවෙන්, බිත්තරයෙහි ප්‍රමාණය සහ එක් සත්වයෙකු නිපදවන බිත්තර සංඛ්‍යාව අඩු විය. තවද, 2021 වසර තුළ දී කුකුළු මස් නිෂ්පාදනය සියයට 9.5කින් ඉහළ ගිය අතර, කුකුළු මස් කිලෝග්‍රෑමයක් සඳහා නිෂ්පාදන පිරිවැය, රුපියල් 342.07ක සිට රුපියල් 434.19ක් දක්වා ඉහළ ගියේය. බ්‍රොයිලර් මාපිය සත්වයින් දේශීය වශයෙන් බිහි කිරීම පෙර පැවති මට්ටමේ වූ අතර, බ්‍රොයිලර් මාපිය සත්වයින් ආනයනය ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ දී දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් සංඛ්‍යාව ඉහළ අගයක් ගත්තේය. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී, හරක් මස්, ඌරු මස් සහ එළුමස් නිෂ්පාදනය, පිළිවෙළින්, සියයට 4.4කින්, සියයට 4.9කින්, සහ සියයට 1.0කින් ඉහළ ගියේය.

2.5 සංඛ්‍යා සටහන

පශු සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යාන

උප අංශය	2020 (අ)	2021 (ආ)	වාර්ෂික වෙනස්වීම (%)	
			2019/20 (අ)	2020/21 (ආ)
1. මුළු ගවයන් සංඛ්‍යාව (මිලියන)	1.4	1.5	3.0	2.6
එළ ගවයන්	1.1	1.1	1.6	2.5
මී ගවයන්	0.3	0.3	8.2	3.2
2. ජාතික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන)	491.5	513.3	9.8	4.4
එළ කිරි	413.6	425.4	10.6	2.8
මී කිරි	77.9	87.9	5.9	12.9
3. කිරි ආශ්‍රිත නිෂ්පාදන (ලීටර් මිලියන) (ඇ)	ලැ.නො.	ලැ.නො.	-	-
4. නිෂ්පාදන මිල - එළකිරි (රු./ලීටර්)	82.00	98.00	17.2	19.5
5. බිත්තර නිෂ්පාදනය (මිලියන)	1869.7	1953.7	-10.3	4.5
6. කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.දහස්)	216.2	236.7	-3.5	9.5

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දත්ත මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

2021 වසර තුළ දී අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවමින් සහ ප්‍රතිපත්තිමය සහාය සපයමින් පශු සම්පත් අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා රජය අඛණ්ඩව කටයුතු කළේය. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු සම්පත් අභිජනන ව්‍යාපෘතිය යටතේ, 2021 වසර තුළ දී ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල හරහා එළ ගවයන් සහ මී ගවයන් සඳහා කෘත්‍රිම සිංචන 196,364ක් පමණ සිදු කර ඇත. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී, කෘත්‍රිම සිංචනය මගින් උපදින වැස්සි පැටවුන්ගේ පෝෂණය වැඩිදියුණු කිරීම සඳහා ගව ආහාර සැපයීම සහ විවිධ සත්ව රෝගවලට එරෙහිව එන්නත්කරණ කටයුතු ද අඛණ්ඩව සිදු කර ඇත. තවද, *විස්තීර්ණ බුරුළු ප්‍රදාහය පාලනය කිරීමේ පුළුල් වැඩසටහන* යටතේ, රටේ සමස්ත ගව ගහනය තුළ දක්නට ලැබෙන සායනික සහ උප සායනික ආකාරයේ බුරුළු ප්‍රදාහය රෝගය පාලනය කිරීම සහ වැළැක්වීම සඳහා, දේශීයව බුරුළු ප්‍රදාහ පාලන එන්නත් නිෂ්පාදනය කර කිරි ගොවීන් වෙත නිකුත් කර ඇත. කිරි නිෂ්පාදන කර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන තිබියදීත්, දේශීය කිරි කර්මාන්තය තවමත් කුඩා පරිමාණයේ කිරි නිෂ්පාදකයින් මත පදනම් වන අතර, කිරි නිෂ්පාදන මට්ටමේ සාමාන්‍යය දිනකට ලීටර් 2-3 දක්වා පරාසයක වේ. දේශීය වශයෙන් නිෂ්පාදිත සත්වයින්ට ලබාදෙන ආහාර ද්‍රව්‍ය අඩුවීම, පැටවුන් බිහි කිරීමේ කාල පරතරයන් විශාල වීම හා අභිජනනය ආශ්‍රිත ගැටලු, කිරි ගබඩා කිරීම, සිසිලනය, ප්‍රවාහනය හා සැකසීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිවීම සහ ගවයින්ගේ දුර්වල සෞඛ්‍ය තත්ත්වය මෙන්ම, දුර්වල මට්ටමේ පවතින සත්ව ආහාර ලබා දීමේ පිළිවෙත් කිරි නිෂ්පාදනයේ ඵලදායීතාව පහළ යෑමට අඛණ්ඩව හේතු විය. කිරි නිෂ්පාදන අංශය සංවර්ධනය කිරීම සඳහා රට තුළ පවතින කඩිනම් අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින්, කිරි නිෂ්පාදන කර්මාන්තය මධ්‍යම හා මහා පරිමාණයේ ගොවිපළවල් දක්වා වැඩිදියුණු කිරීම මෙන්ම, උසස් තත්ත්වයේ සත්ව ආහාර දැරිය හැකි මිලකට ලබා ගැනීම සහතික කිරීම, කිරි සහ කිරි නිෂ්පාදන සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ දැනට පවතින ගව පට්ටිවල ඵලදායීතාව ඉහළ නැංවීම තුළින් කිරි සහ කිරි නිෂ්පාදන සඳහා වන දේශීය ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය පහසුකම් සැලසෙනු ඇත. අනෙක් අතට, දේශීය කුකුළු ආහාර නිෂ්පාදනය සඳහා මූලික අමුද්‍රව්‍යක් ලෙස වැඩි වශයෙන් භාවිත කරන දේශීය බඩඉරිඟු නිෂ්පාදනය, සමස්ත ඉල්ලුම සපුරාලීම සඳහා තවමත් ප්‍රමාණවත් නොවීම හේතුවෙන්, කුකුළු ආහාර නිෂ්පාදකයින්ට අධික පිරිවැයක් සහිත ආදේශක ආහාර ද්‍රව්‍ය වෙත යොමු වීමට හා අවශ්‍ය සත්ව ආහාර ලබා ගැනීමේ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සත්වයින්ට ලබාදෙන ආහාර මිල ගණන් ඉහළ උච්චාවචනයන්ට ලක් වීමත් සමඟ එම ආහාර නිෂ්පාදනයේ සැලකිය යුතු පහත වැටීමක් සිදුව ඇත. ඒ අනුව, කුඩා පරිමාණයේ කුකුළු මස් නිෂ්පාදකයින් වෙළඳපොළ පීඩනවලට ලක් වීමේ ඉහළ අවදානමක් පවතී. එමනිසා, තාවකාලික සැපයුම් හිඟතාවන් නිසිකලට විසඳා ගැනීම සහතික කරමින්, කුකුළු මස් නිෂ්පාදන අංශයේ දිගුකාලීන ශක්‍යතාව සහතික කිරීම සඳහා දේශීය බඩඉරිඟු වගාව දිරිමත් කිරීම සහ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා තාක්ෂණය හඳුන්වා දීම ඉතා වැදගත් වේ.

ධීවර

2020 වසරේ දී ධීවර අංශය දැඩි පසුබෑමකට ලක් වීමෙන් අනතුරුව 2021 වසරේ දී එම අංශයේ නිෂ්පාදන කටයුතු පහළ මට්ටමක පැවතුණි. ඒ අනුව, සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 76ක් පමණ වන වෙරළ ආශ්‍රිත සහ ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම යන උප අංශවලින් සමන්විත වන මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය සියයට 1.5කින් ඉහළ ගියේය. ජලජීවී වගා අංශයේ පිළිවෙත් වැඩිදියුණු කිරීමත් සමඟ ඉස්සන් වගා අංශයේ නිෂ්පාදනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සියයට 2.4කින් ඉහළ ගියේය. මේ අතර, 2021 වසරේ දෙවන සහ තුන්වන කාර්තු තුළ දී, එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ සිදුවීම සමඟ ධීවර කටයුතුවලට ඇති වූ අවහිරතා හේතුවෙන් මත්ස්‍ය නිෂ්පාදන කටයුතුවලට සැලකිය යුතු බලපෑම් එල්ල විය. ධීවර ප්‍රජාවගේ සහ පාරිභෝගික ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා කළුතර සිට මීගමුව දක්වා බලපෑමට ලක් වූ ප්‍රදේශවල තාවකාලිකව ධීවර කටයුතු සඳහා තහනමක් පැනවීමට බලධාරීන් විසින් කඩිනමින් පියවර ගන්නා ලදී. පසුව, රජය විසින් ධීවර ප්‍රජාවගේ ජීවනෝපායන් සුරක්ෂිත කිරීම සඳහා හානියට පත් ධීවර ආම්පන්න සඳහා නව

2.6 සංඛ්‍යා සටහන

මත්ස්‍ය නිෂ්පාදනය

මෙ.ටො.දහස්

උප අංශය	2020	2021 (අ)	වාර්ෂික වෙනස්වීම (%)	
			2019/20	2020/21 (අ)
මුහුදු මත්ස්‍ය	327	332	-21.3	1.5
වෙරළ හා කලපු ආශ්‍රිත	183	178	-24.7	-2.4
ගැඹුරු මුහුදු මත්ස්‍ය	144	153	-16.5	6.3
මිරිදිය මත්ස්‍ය	102	104	12.7	2.4
මිරිදිය ජලාශ	84	81	15.1	-4.3
ජලජීවී වගාව	10	9	-5.3	-10.2
ඉස්සන් වගාව	7	14	15.0	95.8
එකතුව	**429**	**436**	**-15.2**	**1.7**

(අ) තාවකාලික

මූලය: ධීවර අමාත්‍යාංශය

2.7 සංඛ්‍යා සටහන

ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන්ගේ සුලබතාවය

අයිතමය		ඒකකය	2010			2020 (අ)			2021 (ආ)		
			නිෂ්පාදනය	ආනයන	ඒක පුද්ගල ආහාර සුලබතාවය (වසරකට කි.ග්‍රෑ.)	නිෂ්පාදනය	ආනයන	ඒක පුද්ගල ආහාර සුලබතාවය (වසරකට කි.ග්‍රෑ.)	නිෂ්පාදනය	ආනයන	ඒක පුද්ගල ආහාර සුලබතාවය (වසරකට කි.ග්‍රෑ.)
1.	සහල් (ඇ)	මෙ.ටො.දහස්	3,011	126	152	3,482	16	164	3,502	147	165
2.	ඉරිඟු	මෙ.ටො.දහස්	162	16	9	314	44	16	472	23	22
3.	තිරිඟු	මෙ.ටො.දහස්	-	1,051	51	-	1,404	64	-	1,307	59
4.	ලොකු එෑණු	මෙ.ටො.දහස්	59	158	10	43	266	14	66	257	15
5.	සීනි	මෙ.ටො.දහස්	31	548	28	60	683	34	71	582	29
6.	අර්තාපල්	මෙ.ටො.දහස්	52	130	9	65	127	9	76	117	9
7.	මාළු	මෙ.ටො.දහස්	385	14	19	429	13	20	436	10	20
8.	එළකිරි	ලීටර් මිලියන	192	-	9 (ඈ)	414	-	19 (ඈ)	425	-	19 (ඈ)
9.	පොල්තෙල්	මෙ.ටො.දහස්	65	3	3	20	79	5	43	99	6

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) වී මෙට්‍රික් ටොන් 1ක්, සහල් මෙට්‍රික් ටොන් 0.68 කට සමාන වේ.
(ඈ) වසරකට ලීටර්

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම - සෙවනගල ඒකකය
සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම - පැල්වත්ත ඒකකය
සීමාසහිත ගල්ඔය (හිඟුරාන) සීනි කර්මාන්තායතනය
ධීවර අමාත්‍යාංශය
පොල් සංවර්ධන අධිකාරිය

ආම්පන්න ලබා දුන් අතර, විපතට පත් සෑම පවුලකටම රුපියල් 5,000 බැගින් වූ දීමනාවක් ලබා දෙන ලදී. කෙසේ වෙතත්, 2021 වසරේ සිව්වන කාර්තුවේ දී මත්ස්‍ය නිෂ්පාදනයෙහි සහ පරිභෝජනයෙහි යථා තත්ත්වයට පත් වීමක් දක්නට ලැබුණි. මසුන් ඇල්ලීමේ කටයුතුවලට ඇති වූ අවහිරතා සහ සැපයුම් පිරිවැය ඉහළ යෑම හේතුවෙන් මත්ස්‍ය වර්ගවල සිල්ලර මිල වසර පුරා නිරන්තර උච්චාවචනයන්ට ලක් විය. ආනයන කරන රටවල් විසින් පනවා ඇති අදාළ රෙගුලාසිවලට අනුකූලව උසස් තත්ත්වයේ මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කිරීම සඳහා පාර්ශ්වකරුවන්ට නිසි මග පෙන්වීමක් සහ සහායක් ලබා දීමට බලධාරීන් ගෙන ඇති ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින්, ධීවර අමාත්‍යාංශයට අනුව මත්ස්‍ය අපනයන ප්‍රමාණය සියයට 25.6කින් සහ එම අපනයනවල රුපියල් වටිනාකම සියයට 58.6කින් ඉහළ ගියේය. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී මත්ස්‍ය ආනයනය කැපී පෙනෙන ලෙස සියයට 34.5කින් පහළ ගියේය.

ජාතික ආර්ථිකය සඳහා ධීවර අංශයේ දායකත්වය ඉහළ නැංවීමේ අරමුණින් රජය සිය ප්‍රයත්නයන් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. සමස්ත නිෂ්පාදනයෙන් සියයට 20-30ක් පමණ වන පසු අස්වනු හානි අවම කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරන අතර, මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ධීවර අමාත්‍යාංශය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. නීති විරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ මසුන් ඇල්ලීමේ කටයුතු වැළැක්වීම සඳහා ද ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. මහා පරිමාණ බහුදින ධීවර යාත්‍රා නවතා තැබීමට හැකිවන පරිදි, නව වරායන් ඉදිකිරීම, දැනට පවතින වරායන් වැඩිදියුණු කිරීම, නැංගුරම් පොළවල් සහ ගොඩබෑමේ පහසුකම් ඉදිකිරීමේ කටයුතු 2021 වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීමේදී අත්‍යවශ්‍ය සැපයුම්දාම සඳහා වන නවීන සිසිලන ක්‍රම, ගබඩා කිරීමේ සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමේ කටයුතු ද 2021 වසර තුළ දී ක්‍රියාත්මක විය. ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය සමඟ ඒකාබද්ධව ධීවර අමාත්‍යාංශය විසින් මිරිදිය මත්ස්‍ය සහ ජලජීවී වගා නිෂ්පාදනය ඉහළ නැංවීම, අපනයනය වර්ධනය කිරීම සහ ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා සාම්ප්‍රදායික නොවන මසුන් ඇති කිරීමේ වැඩසටහන් රාශියක් ක්‍රියාවට නංවන ලදී. ඊට අදාළව, ප්‍රජා මූල මත්ස්‍ය අභිජනන ඒකක පිහිටුවීම, මත්ස්‍ය පැටවුන් මුදා හැරීම සඳහා කුඩා පරිමාණයේ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක වැඩිදියුණු කිරීම සහ මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම හා වැඩිදියුණු කිරීම 2021 වසර තුළදී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ජල ප්‍රතිචක්‍රීකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම, වගා ප්‍රදේශවල ජෛව සුරක්ෂිතතාව ඉහළ නැංවීම, ගුණාත්මක තත්ත්වයේ ජලය ලබා ගැනීම සඳහා පුත්තලම ප්‍රදේශයේ ඕලන්ද ඇළ හෑරීම වැනි විවිධ ක්‍රියාමාර්ග හරහා ඉස්සන් වගාව වැඩිදියුණු කිරීමේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක විය. ඉස්සන් වගාවට අමතරව, මුහුදු පැළෑටි, මෝදා මසුන්, කකුළුවන්, මුහුදු කැකිරි සහ කිරි මත්ස්‍ය වගාව දියුණු කිරීම තුළින්

වාණිජ ජලජීවී වගාව ප්‍රවර්ධනය කිරීමේ කටයුතුවල ද ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය නිරත විය. යාපනය, කිලිනොච්චිය, මන්නාරම සහ පුත්තලම යන මුහුදු ප්‍රදේශවල මුහුදු පැළෑටි වගා කිරීම සහ පුත්තලම ප්‍රදේශයේ කිරි මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ කටයුතු 2021 වසර තුළ දී ක්‍රියාත්මක විය. මුහුදු කැකිරි අපනයනය ඉහළ නැංවීමේ අරමුණින් යාපනය ප්‍රදේශයේ මුහුදු කැකිරි වගාව ව්‍යාප්ත කිරීමට පියවර ගන්නා අතර, මන්නාරම ප්‍රදේශයේ මුහුදු කැකිරි අභිජනනාගාරයේ කටයුතු 2021 වසරේ මාර්තු මාසයේ දී ආරම්භ කිරීම සහ කිලිනොච්චිය ප්‍රදේශයේ මුහුදු කැකිරි ගම්මානයක් පිහිටුවීම 2021 වසර තුළ දී සිදු විය. තවද, විසිතුරු මත්ස්‍ය හා ජලජ ශාක වගාව සහ අපනයන සංවර්ධනයට සහාය වීම සඳහා නව විසිතුරු මත්ස්‍ය ප්‍රභේද වර්ධනය කිරීම, ජලජීවී වගා තාක්ෂණය වැඩිදියුණු කිරීම, සහ මත්ස්‍ය බිත්තර අභිජනනය සඳහා මව් සතුන් සැපයීම හා මත්ස්‍ය රෝග විනිශ්චය කිරීමට අදාළ කටයුතු සිදු කරන ලදී.

කර්මාන්ත

2020 වසරේ දී සියයට 6.9කින් පහළ ගිය කර්මාන්ත කටයුතුවල එකතු කළ අගය, සැපයුම් අංශයේ පැවති අවහිරතා හමුවේ වුව ද, ඉහළ ඉල්ලුමෙන් ප්‍රතිලාභ ලබමින් සහ වසංගත තත්ත්වය තුළ ද මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යමින් 2021 වසරේ දී සියයට 5.3ක වර්ධනයක් අත් වූ අතර, සැපයුම් අංශයේ අවහිරතා කර්මාන්ත අංශයේ වර්ධනයට බාධාවක්ව පැවතුණි. කර්මාන්ත කටයුතුවල දක්නට ලැබුණු මෙම වර්ධනය කෙරෙහි නිෂ්පාදන කර්මාන්ත කටයුතු යහපත් වර්ධනයක් වාර්තා කිරීම ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතුවල ද වර්ධනයක් දක්නට ලැබුණි. මේ

2.6 රූප සටහන
2021 වසරේ කර්මාන්ත කටයුතුවල වර්ධන වේගයන් (අ)



(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ
මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

අතර, විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායුසමීකරණ සැපයීමේ කටයුතු මෙන්ම ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීමේ කටයුතු ද කර්මාන්ත කටයුතුවල සමස්ත වර්ධනයට හිතකර ලෙස දායක වෙමින් 2021 වසර තුළ දී වර්ධනය විය. කෙසේ වුව ද, මලාපවහන කටයුතු, කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ කටයුතු 2021 වසරේ දී පහළ ගියේය. මේ අතර, කර්මාන්ත කටයුතුවල ඉහළ යෑම පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාර්තුමය වශයෙන් පවත්වනු ලබන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ කර්මාන්ත කටයුතුවලට අදාල ඉල්ලුම සහ නිෂ්පාදන යන උපදර්ශක වසර තුළ දී සමස්තයක් ලෙස ඉහළ යෑමක් පෙන්නුම් කළේය.

නිෂ්පාදන කර්මාන්ත

2021 වසරේ දී නව සාමාන්‍යකරණය යටතේ නිෂ්පාදන කර්මාන්ත කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම හේතුවෙන් නිෂ්පාදන කර්මාන්තවල එකතු කළ අගය, 2020 වසරේ දී වාර්තා කළ සියයට 3.9ක පහත වැටීමට සාපේක්ෂව, සියයට 7.2ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. නිෂ්පාදන කර්මාන්ත මෙසේ යථා තත්ත්වයට පත් වීම සඳහා, රට තුළ සාර්ථකව ක්‍රියාත්මක වූ එන්නත්කරණය, සංචරණ සීමා ලිහිල්ව ක්‍රියාත්මක කිරීම, වසංගතය පැවති කාලයේ දී පවා කර්මාන්තශාලා මෙහෙයුම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට ඉඩ සැලසීම මෙන්ම නව සාමාන්‍යකරණය තුළ ආර්ථික කටයුතු පවත්වාගෙන යෑමට හැඩ ගැසීම ද බොහෝ සෙයින් දායක විය. ඒ අනුව, අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන කටයුතු හැර අනෙකුත් සියලු නිෂ්පාදන කර්මාන්ත කටයුතු 2021 වසරේ දී වර්ධනය විය. සපුගස්කන්ද තෙල් පිරිපහදුව තාවකාලිකව වසා දැමීමෙන් ඇති වූ අහිතකර බලපෑම හේතුවෙන් අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන කටයුතුවල විශාල පසුබෑමක් දක්නට ලැබුණි. නිෂ්පාදන කර්මාන්තවල වර්ධනය සඳහා රෙදිපිළි, නිමි ඇඳුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන අංශය ප්‍රධානතම දායකත්වය සැපයූ අතර, මේ සඳහා විදේශීය ඉල්ලුම ඉහළ මට්ටමක පැවතීම මූලිකව හේතු විය. තවද, ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සහ ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන ද නිෂ්පාදන කර්මාන්තවල වර්ධනය සඳහා සැලකිය යුතු ලෙස දායක විය. නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත දර්ශක සලකා බැලීමේ දී, නිෂ්පාදන කර්මාන්තවල යහපත් ප්‍රවණතාව පිළිබිඹු කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන කාර්මික නිෂ්පාදන දර්ශකය 2021 වසරේ දී සමස්තයක් ලෙස ඉහළ ගියේය. තවද, මහ බැංකුව විසින් මාසිකව සම්පාදනය කරනු ලබන

2.7 රූප සටහන
නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)



(අ) ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සලකා බලනු ලබන මාසය තුළ දී සිදු වූ වෙනස්කම් පිළිබඳව විමසීමට ලක් කරනු ලබන සංජානන සමීක්ෂණයක් මත පදනම්ව ඇත. 0 සිට 100 දක්වා පරාසය තුළ විහිදෙන විසරණ දර්ශකයක් (Diffusion Index) වන මෙහි දර්ශක අගය එහි කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50ට වඩා වැඩි නම් අදාල ක්‍රියාකාරකමෙහි වර්ධනයක් ද දර්ශක අගය 50ට වඩා අඩු නම් එහි පහත වැටීමක් ද පෙන්නුම් කෙරේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය ද වසර තුළ නිෂ්පාදන කර්මාන්තවල සමස්ත වර්ධනය පිළිබිඹු කරන ලදී. කෙසේ වුව ද, සැපයුම් දාමවල පැවති ප්‍රමාදයන් හේතුවෙන් නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල පූර්ණ වර්ධන හැකියාව කරා ළඟා වීමට නොහැකි විය.

කාර්මික නිෂ්පාදන දර්ශකය

2020 වසරේ දී කැපී පෙනෙන පසුබෑමක් වාර්තා කළ නිෂ්පාදන අංශය, 2021 වසරේ දී කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතිවූ අභියෝග මධ්‍යයේ වුව ද, වඩාත් ශක්තිමත්ව යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළේය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලබන කාර්මික නිෂ්පාදන දර්ශකය අනුව, උප අංශ බොහොමයක නිෂ්පාදනයේ ඉහළ යෑමත් සමඟ, නිෂ්පාදන අංශය 2020 වසරේ වාර්තා කළ සියයට 10.2ක පහළ යෑමට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 7.3ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. කාර්මික නිෂ්පාදන දර්ශකය එහි ආරම්භයේ සිට වාර්තා වූ ඉහළ ම අගය වන 119.6ක අගය 2021 වසරේ මාර්තු මාසයේ දී වාර්තා කළේය. 2021 වසරේ දී කොවිඩ්-19 වසංගත කාලපරිච්ඡේදය තුළ තෝරා ගත් හා නම්‍යශීලී සංචරණ සීමා ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ප්‍රධාන කාර්මික අංශයේ කටයුතු එතරම් බාධාවකින් තොරව කරගෙන යෑමට හැකියාව ලැබුණි. විශේෂයෙන් ම, වසරේ දෙවන භාගය තුළ දී කොවිඩ්-19ට එරෙහි එන්නත් වැඩසටහන වේගවත්ව ක්‍රියාත්මක වීම, කර්මාන්ත අංශයේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව පවත්වාගෙන යෑමට උපකාරී විය. කාර්මික නිෂ්පාදන දර්ශකයෙහි ධනාත්මක වර්ධනය සඳහා ඇඟලුම්, ලෝහමය නොවන ඛනිජ නිෂ්පාදන, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන, රෙදිපිළි, මූලික ලෝහ සහ බීම වර්ග නිෂ්පාදන යන උප අංශ ප්‍රධාන වශයෙන් දායක විය. කෙසේ වෙතත්, ඛනිජ තෙල් පිරිපහදුව වරින් වර වසා තැබීම හේතුවෙන් අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන උප අංශය මගින් කාර්මික නිෂ්පාදන දර්ශකයෙහි සමස්ත ධනාත්මක වර්ධනයට අහිතකර බලපෑමක් ඇති කළේය.

2021 වසර තුළ දී ආහාර නිෂ්පාදන කටයුතු දුර්වල මට්ටමක පැවතිය ද, බීම වර්ග නිෂ්පාදන කටයුතුවල සැලකියයුතු වර්ධනයක් වාර්තා විය. කාර්මික නිෂ්පාදන දර්ශකයේ විශාලතම උප අංශය වන, ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනවල මන්දගාමී වර්ධනය සඳහා දේශීය හා ගෝලීය සැපයුම් දාමයන්ට ඇති වූ බාධාවන් බොහෝ දුරට හේතුවිය. වසරේ මුල් භාගය තුළ සියයට 0.8ක සුළු පහළ යෑමක් වාර්තා කළ ආහාර උප අංශය, කුකුළු මස් නිෂ්පාදන, ටින් මාළු, ජෑම්, සෝස්, සහ බිස්කට් වර්ග වල නිෂ්පාදනයන්ගේ වර්ධනයත් සමඟ වසරේ දෙවන භාගය තුළ දී ඉහළ ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරමින්, 2021 වසර තුළ දී සියයට 0.2ක සමස්ත වර්ධනයක් වාර්තා කළේය. බීම වර්ග නිෂ්පාදන කටයුතු 2020 වසරේ දී වාර්තා කළ සියයට 6.7ක පහළ යෑමට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 9.8ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ආර්ථිකය සාමාන්‍ය අතට පත් වීමත් සමඟ, උත්සව සහ සමාජ ක්‍රියාකාරකම් සඳහා පනවා තිබූ බොහෝ සීමාවන් ඉවත් කිරීම හේතුවෙන් බීම වර්ග නිෂ්පාදන සඳහා වූ ඉල්ලුමෙහි ඉහළ යෑමක් දක්නට ලැබුණි.

ගෝලීය සැපයුම් දාමයේ ඇති වූ ප්‍රගතිය, වසංගතය ආශ්‍රිත සංචරණ සීමා මධ්‍යයේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව කරගෙන යෑමට පහසුකම් සැපයීමට

2.8 රූප සටහන
කාර්මික නිෂ්පාදන දර්ශකය

මූලයඃ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය සහ 2020 වසරේ අඩු වර්ධනයක් වාර්තා වීම නිසා ඇති වූ පදනම් බලපෑම ද හේතුවෙන් ඇඟලුම් සහ රෙදිපිළි උප අංශ 2021 වසරේ දී ශක්තිමත් ලෙස වර්ධනය විය. කාර්මික

2.8 සංඛ්‍යා සටහන

කාර්මික නිෂ්පාදන දර්ශකය
2015 = 100

කාණ්ඩය	දර්ශකයෙහි බරතැබීම් (%)	2020 (අ)	2021 (ආ)	වාර්ෂික වෙනස්වීම %	
				2019/20 (අ)	2020/21 (ආ)
1. ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය	35.2	109.1	109.3	3.3	0.2
2. බීම වර්ග නිෂ්පාදනය	3.8	96.5	106.0	-6.7	9.8
3. දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය	1.7	72.1	77.9	-11.0	8.0
4. රෙදි නිෂ්පාදනය	3.3	102.2	128.7	-5.6	25.9
5. ඇඟලුම් නිෂ්පාදනය	19.8	81.2	95.4	-30.7	17.5
6. සම් සහ සම්බන්ධ ද්‍රව්‍ය නිෂ්පාදනය	0.3	77.6	78.6	-33.5	1.3
7. ගෘහ භාණ්ඩ හැර, දැව හා ලීයෙන් කරන ලද නිෂ්පාදන, පිදුරුවලින් හා ගොතන ලද ද්‍රව්‍ය නිෂ්පාදනය	0.2	71.8	82.5	-29.5	15.0
8. කඩදාසි සහ කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදනය	1.7	81.8	86.5	-15.4	5.8
9. මුද්‍රණය සහ පටිගත කරන ලද මාධ්‍ය නිෂ්පාදනය	1.4	112.6	117.9	9.4	4.8
10. අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදනය	7.4	97.2	71.1	-9.0	-26.8
11. රසායනික සහ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය	4.1	94.2	89.8	-7.8	-4.7
12. මූලික ඖෂධ සහ ඖෂධ හා සම්බන්ධ සැකසීම් නිෂ්පාදනය	0.1	104.7	117.9	6.6	12.6
13. රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදනය	5.7	75.8	102.9	-28.8	35.7
14. වෙනත් ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය නිෂ්පාදනය	7.8	111.7	137.4	-5.2	23.0
15. මූලික ලෝහ වර්ග නිෂ්පාදනය	2.4	110.7	133.6	-10.9	20.7
16. පිරිසකසන ලද ලෝහ නිෂ්පාදනය (යන්ත්‍රසූත්‍ර සහ උපකරණ හැර)	1.3	100.9	124.6	-8.9	23.5
17. විදුලි උපකරණ නිෂ්පාදනය	2.0	67.5	81.4	-22.3	20.6
18. යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය (වෙනත් තැනක සඳහන් නොවන)	0.7	102.9	122.0	3.6	18.6
19. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය	0.8	77.0	77.5	-14.7	0.7
20. අනෙකුත් නිෂ්පාදන	0.3	65.7	69.6	-0.5	6.0
කාර්මික නිෂ්පාදන දර්ශකය		**97.1**	**104.2**	**-10.2**	**7.3**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

නිෂ්පාදන දර්ශකයේ පහෙන් එකක් පමණ වන ඇඟලුම් නිෂ්පාදන උප අංශය, පෙර වසරේ වාර්තා කළ සියයට 30.7ක තියුණු පහළ යෑමට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 17.5ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. එම ප්‍රවණතාවම අනුගමනය කරමින් රෙදි නිෂ්පාදන උප අංශය, 2020 වසරේ දී වාර්තා කළ සියයට 5.6ක පහළ යෑමට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 25.9ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ගෝලීය ආර්ථිකයේ යථා තත්ත්වයට පත් වීම, විශේෂයෙන් ම ප්‍රධාන අපනයන ගමනාන්තයන්හි අපනයන ඉල්ලුම යථා තත්ත්වයට පත් වීම මෙම උප අංශවල ධනාත්මක වර්ධනයට බෙහෙවින් හේතු විය. අමුද්‍රව්‍ය ලබා ගැනීම කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කළ දේශීය හා ගෝලීය සැපයුම් දාමයන්ට ඇති වූ බාධාකාරී තත්වයන් මඟ හැරී යෑමද, මෙම අංශවල වර්ධන ප්‍රවණතාවයට මඟ සැලසීය. මේ අතර, කොවිඩ්-19 ආශ්‍රිත සංචරණ සීමා මධ්‍යයේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව කරගෙන යෑමට රජය ගත් තීරණය සහ මෙම අංශවල සේවයේ නියැලී සිටින සේවකයින් සඳහා වේගවත් එන්නත්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම හරහා බාධා අවම වීම, ඇඟලුම් සහ රෙදිපිළි නිෂ්පාදන අංශවල කාර්යය සාධනය නැවත යථා තත්ත්වයට පත් වීම සඳහා හේතු විය.

වෙනත් ලෝහ නොවන ඛනිජමය නිෂ්පාදන, මූලික ලෝහ නිෂ්පාදන සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන උප අංශ, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 වසරේ දී වාර්තා කළ අඩුවීමට සාපේක්ෂව, 2021 වසරේ දී, පිළිවෙළින්, සියයට 23.0ක, සියයට 20.7ක සහ සියයට 23.5ක සැලකිය යුතු වර්ධනයන් වාර්තා කළේය. පිඟන් භාණ්ඩ සහ පිඟන් ගඩොල් ආනයන සඳහා සීමා පැනවීම් සිදු කරන අතර ම, දේශීය නිෂ්පාදන ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා රජය ගනු ලැබූ මූලික ක්‍රියාමාර්ග මෙම අංශවල ධනාත්මක කාර්ය සාධනය සඳහා හේතු වී ඇත. වසර තුළ දී ඉදිකිරීම් අංශයේ දක්නට ලද යථා තත්ත්වයට පත් වීම ද මෙම උප අංශවල නිෂ්පාදන සඳහා පැවති ඉල්ලුම ඉහළ යෑමට දායක විය. සිමෙන්ති, පිඟන් ගඩොල්, වීදුරු බෝතල්, සෙවිලි තහඩු සහ පෝසිලේන් පිඟන් බඩු නිෂ්පාදනවල ඉහළ යෑම, වෙනත් ලෝහ නොවන ඛනිජමය නිෂ්පාදන උප අංශය තුළ නිෂ්පාදනය ඉහළ යෑම සඳහා දායක විය. විශේෂයෙන්ම, මූලික ලෝහ නිෂ්පාදන සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන උප අංශවල සමස්ත ඉහළ යෑම සඳහා, ඊයම් හා ඇලුමිනියම්, ඇලුමිනියම් දඬු නිෂ්පාදනය සහ වානේ හා ඇලුමිනියම් නිෂ්පාදනවල ඉහළ යෑම මූලික වශයෙන් හේතු විය.

2020 වසර තුළ දී පහළ යෑමක් වාර්තා කළ අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදනය, ලංකා

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පිරිපහදු මෙහෙයුම් කටයුතුවලට සිදු වූ බාධා හේතුවෙන් මෙම වසර තුළ දී ද දැඩි පසුබෑමකට ලක් විය. අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය පෙර වසරේ වාර්තා කළ සියයට 9.0ක පහළ යෑමට සාපේක්ෂව, 2021 වසර තුළ සියයට 26.8කින් අඩු විය. 2021 වසරේ මුල් භාගයේ දී, නඩත්තු කටයුතු වෙනුවෙන් ඛනිජ තෙල් පිරිපහදුව මාස දෙකකට ආසන්න කාලයක් වසා දැමුණු අතර, විදේශ විනිමය ගැටලු හමුවේ බොරතෙල් ආනයන ප්‍රමාණවත් නොවීම සහ බොරතෙල් මිල ඉහළ යෑම හේතුවෙන් කාලීන ප්‍රසම්පාදනය සඳහා බාධා ඇතිවීම සමඟ 2021 වසරේ සිව්වන කාර්තුවේ දී මාසයකට ආසන්න කාලයක් තාවකාලිකව වසා දමන ලදී. ඒ අනුව, පෙට්‍රල්, සුදු ඩීසල් සහ දැවි තෙල් යන නිෂ්පාදනවල අඩු වීමක් 2021 වසර තුළ දී නිරීක්ෂණය විය.

දේශීය ඖෂධ නිෂ්පාදන අංශය නඟා සිටුවීම සඳහා ක්‍රියාත්මක වන ප්‍රතිපත්තිමය මග පෙන්වීම් සහ කොවිඩ්-19 වසංගතය හමුවේ ඖෂධ නිෂ්පාදනයන්හි අත්‍යවශ්‍ය ස්වභාවය සමඟ මූලික ඖෂධ නිෂ්පාදන සහ ඖෂධ සම්බන්ධ ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය 2021 වසරේ දී එහි වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන ගියේය. ඒ අනුව, මෙම උප අංශය 2020 වසරේ දී වාර්තා කළ සියයට 6.6ක වර්ධනය අඛණ්ඩව පවත්වාගෙන යමින්, 2021 වසරේ දී සියයට 12.6ක වර්ධනයක් වාර්තා කළේය. වසංගත තත්ත්වය හේතු කොටගෙන ආයුර්වේද නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම ඉහළ යෑම මෙම උප අංශයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. රට තුළ පවතින ඖෂධ නිෂ්පාදන ධාරිතාවය ඉහළ නංවාලීම සඳහා රජය ගෙන යන ක්‍රියා පිළිවෙත සමඟ, මෙම වර්ධන වේගය ඉදිරියටත් පවත්වාගෙන යෑමට අපේක්ෂා කෙරේ.

2.9 රූප සටහන
ධාරිතා උපයෝජනය



සටහන: දර්ශකයට අදාළ බර තැබීම් වරහන් තුළ දක්වා ඇත.
මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රබර් හා ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය 2021 වසරේ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. කොවිඩ්-19 හේතුවෙන් වෛද්‍ය රබර් අත්වැසුම් සඳහා ඉල්ලුම ඉහළ යෑම සහ දේශීය ටයර් නිෂ්පාදන ධාරිතාවයේ සැලකිය යුතු වර්ධනය, එම උප අංශයෙහි වාර්තා වූ සියයට 35.7ක වර්ධනය සඳහා හේතු විය. අනෙකුත් නිෂ්පාදන අතරින් සිපර (zippers), ප්ලාස්ටික් බෝතල් සහ ඉලාස්ටෝමෙරික් නූල් (elastomeric yarn) නිෂ්පාදනය ඉහළ යෑම ද උප අංශයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. වසර තුනක කාලයක් තිස්සේ අඛණ්ඩව පසු බෑමට ලක් වූ දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය, 2020 වසරේ දී වාර්තා වූ සියයට 11.0ක පසු බෑමට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 8.0ක වර්ධනයක් වාර්තා කළේය.

සම් නිෂ්පාදනය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන උප අංශය සහ රසායනික ද්‍රව්‍ය සහ රසායනික නිෂ්පාදන උප අංශය ද දුර්වල කාර්ය සාධනයක් පෙන්නුම් කළේය. සම් නිෂ්පාදනය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන උප අංශය 2021 වසරේ දී සියයට 1.3ක සුළු වර්ධනයක් වාර්තා කළ අතර, රසායනික ද්‍රව්‍ය සහ රසායනික නිෂ්පාදන උප අංශයෙහි සමස්ත පහළ යෑම සියයට 4.7ක් ලෙස වාර්තා විය. රසායනික ද්‍රව්‍ය සහ රසායනික නිෂ්පාදන උප අංශයේ නිෂ්පාදනය පහළ යෑම කෙරෙහි රසායනික පොහොර නිෂ්පාදනය අඩු වීම ප්‍රධාන වශයෙන් හේතුවිය. කෙසේ වෙතත්, දේශීය ඉල්ලුම් තත්ත්වයෙහි ඇති වූ ප්‍රගතියත් සමඟ වසර අවසානය වන විට මෙම අංශ දෙක තුළ ම වර්ධනය වීමේ නැඹුරුවක් පෙන්නුම් කෙරිණි.

කාර්මික නිෂ්පාදන දර්ශකයේ අනෙකුත් උප අංශයන් වන දැව නිෂ්පාදන (ගෘහභාණ්ඩ හැර), විදුලි උපකරණ, ගෘහභාණ්ඩ, කඩදාසි හා කඩදාසි ද්‍රව්‍ය, යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය සහ මුද්‍රණ හා පටිගත කරන ලද මාධ්‍ය නිෂ්පාදන කිරීම 2021 වසර තුළ දී වර්ධනයන් වාර්තා කළේය. රැළි සහිත කඩදාසි නිෂ්පාදනය, කඩදාසි බෑග් සහ අභ්‍යාස පොත් නිෂ්පාදනය ඉහළ යෑම කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන උප අංශයේ වර්ධනය සඳහා දායක වූ අතර, නැවතත් සාමාන්‍ය පරිදි පාසල් ආරම්භ කිරීම සහ අධ්‍යාපනික කටයුතු යථා තත්ත්වයට පත්වීමේ ප්‍රතිඵලයක් ලෙස මුද්‍රිත පොත් නිෂ්පාදනය ඉහළ යෑම, මුද්‍රණ සහ පටිගත කරන ලද මාධ්‍ය නිෂ්පාදන උප අංශයෙහි ධනාත්මක ක්‍රියාකාරිත්වය ට හේතු විය. ආනයන සීමා කිරීම් හමුවේ දේශීය නිෂ්පාදන සඳහා ඉල්ලුම ඉහළ යෑමට අනුකූලව ගෘහ උපකරණ කිහිපයක නිෂ්පාදනය ඉහළ යෑම විදුලි උපකරණ උප අංශයේ නිෂ්පාදනය වර්ධනය වීම සඳහා හේතු විය.

2

2.10 රූප සටහන
2021 වසරේදී කාර්මික නිෂ්පාදන දර්ශකයේ ප්‍රධාන කාණ්ඩවල වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස්වීමට දායකත්වය



සටහන: දර්ශකයට අදාළ බරතැබීම් වරහන් තුළ දක්වා ඇත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කාර්මික ප්‍රතිපත්ති සහ ආයතනික සහාය

2021 වසර තුළ දී, දේශීය නිෂ්පාදන පදනම වැඩිදියුණු කිරීම සඳහා කර්මාන්ත අංශය ශක්තිමත් කිරීමේ අරමුණු පෙරදැරිව රජය විසින් පියවර කිහිපයක් අඛණ්ඩව ක්‍රියාවට නැංවූයේය. *කාර්මික සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය* කෙටුම්පත් කිරීම අවසන් කිරීම 2021 වසරේ දී ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. කාර්මික සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීමට පෙරාතුව, කාර්මික සංවර්ධනයේ ප්‍රගතියට බාධා වන සාධක හඳුනා ගනිමින් සවිස්තරාත්මක හා ගැඹුරු විශ්ලේෂණයක් ඇතුළත් කර්මාන්ත ආශ්‍රිත ගැටලු පිළිබඳ විනිශ්චය වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. හරිත සංවර්ධනය සහ ඩිජිටල්කරණයේ ප්‍රගතිය කෙරෙහි අවධානය යොමු කරමින්, තිරසාර සහ සැමට ප්‍රතිලාභ හිමිවන වර්ධනයක් ඇති කිරීම සඳහා ගෝලීය වශයෙන් තරගකාරී කාර්මික අංශයක් ස්ථාපිත කිරීමට කාර්මික සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය මගින් ප්‍රයත්න දරනු ලැබේ. මේ අතර, *ප්‍රාදේශීය කර්මාන්තපුර සංවර්ධන වැඩසටහන* යටතේ කටුනායක කළුදියවෙල ප්‍රදේශයේ කර්මාන්ත කලාපයක් පිහිටුවීමට සහ කළුතර කර්මාන්තපුරය පුළුල් කිරීමට අදාළ කටයුතු ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ඛනිජ උපයෝගී කර ගන්නා කර්මාන්තවල විෂය පථය පුළුල් කිරීම සඳහා වන රජයේ ඉලක්කයට අනුව යමින්, සීමාසහිත ලංකා මිනරල් සෑන්ඩ්ස් සමාගම විසින් කැණීම් සිදු කරන ලද *ඛනිජ වැලි නිෂ්පාදිත සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතියක්* රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස ආරම්භ කිරීමට අදාළ මූලික කටයුතු සිදු විය. මේ අතර, 2021 වසර තුළ දී මෝටර් රථ නිෂ්පාදනය, එකලස් කිරීම සහ අමතර කොටස් නිෂ්පාදන කර්මාන්තය සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටි මාර්ගෝපදේශ ක්‍රියාත්මක කරන ලදී. 2021 වසර අවසානය වන විට, සම්මත මෙහෙයුම් පටිපාටි යටතේ නිෂ්පාදන සමාගම් 13ක් ලියාපදිංචි කර ඇති අතර, වාහන 2,361ක් එකලස් කර ඇත. තවද, දියුණු තාක්ෂණය සහිත, නව ව්‍යාපාර ආකාරයෙන් විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ අරමුණින්, තාක්ෂණ අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ, ගාල්ල, කුරුණෑගල, මහනුවර, නුවරඑළිය සහ හබරණ යන ප්‍රදේශවල තාක්ෂණික උද්‍යාන පහක් පිහිටුවීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි වූ අතර, එමගින් රටේ අපනයන පදනම වැඩිදියුණු කිරීමට හැකියාව ලැබෙනු ඇති මෙන්ම, අනෙකුත් අංශ වෙත දැනුම ගලා යෑම සිදුවිය හැකිය. කාන්තා ව්‍යවසායකයින්ගේ තාක්ෂණික දැනුම ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින්, ආසියානු සංවර්ධන බැංකුවේ සහාය ඇතිව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා මංගත ක්‍රමවේද ස්ථාපිත කිරීම සඳහා ද මුදල් අමාත්‍යාංශය විසින් 2021 වසර තුළ දී කටයුතු ආරම්භ කරන ලදී. ජාතික නවෝත්පාදන පද්ධතියක් වැඩිදියුණු කිරීමේ සහ තිරසාරව පවත්වා ගැනීමේ අදහසින්, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ 2021 වසරේ නොවැම්බර් මාසයේ දී *ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය* පිහිටුවන ලදී. *ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය* මගින් ආර්ථිකයේ සියලුම අංශ තුළ නව නිපැයුම් බිහි කිරීම සහ වාණිජකරණය කිරීම සඳහා කර්මාන්ත, විද්වතුන් සහ රජය අතර සහයෝගීතාව ඇති කරලීම සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂිතය. කාර්මික අංශයේ අධ්‍යාපන අවශ්‍යතා සපුරාලීම සඳහා නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය විවිධ පියවර ගත්තේය. 2021 වසර තුළ දී, අඩු ආදායම්ලාභී පවුල්වල වෘත්තීය පුහුණුලාභීන් වෙත රුපියල් 4,000ක මාසික දීමනාවක් ලබා දීම සඳහා *නිපුණතා සිසු සවිය ශිෂ්‍යාධාර යෝජනා ක්‍රමය* ක්‍රියාත්මක කරන ලදී. තවද, *තාක්ෂණ උද්‍යාන වැඩසටහන* යටතේ කාර්මික විද්‍යාල නවීකරණය කිරීම සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක විය.

දේශීය නිෂ්පාදන කර්මාන්ත සඳහා විදේශීය සහ දේශීය ආයෝජන පහසුකම් සැලසීම සඳහා ආයෝජන මණ්ඩලය සහ අපනයන සංවර්ධන මණ්ඩලය ඒකාබද්ධව විවිධ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කළේය. 2021 වසර තුළ දී, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළට සරිලන සේ ශ්‍රී ලංකාවේ ඖෂධ කර්මාන්තය ශක්තිමත් කිරීමේ අරමුණින්, නවීන ඖෂධ නිෂ්පාදන කලාපයක්

හම්බන්තොට, ආරබොක්ක ප්‍රදේශයේ ස්ථාපිත කර ඇත. ඒ අනුව, අදියර දෙකකින් සමන්විත වන මෙම ව්‍යාපෘතිය යටතේ, එක් එක් අදියර වලදී සමාගම් 20 බැගින් සංවර්ධනය කිරීමට නියමිත වේ. දේශීයව නිපදවන රෙදිපිළි සුලබ කිරීම තුළින් රෙදිපිළි ද්‍රව්‍ය ලබා ගැනීමට ගතවන කාලය සහ යෙදවුම් පිරිවැය අඩු කර ගැනීම සඳහා රෙදිපිළි නිෂ්පාදන කලාපයක් ද 2021 වසර තුළ දී එරාවුර් ප්‍රදේශයේ ස්ථාපිත කරන ලදී. මෙම රෙදිපිළි නිෂ්පාදන කර්මාන්ත උද්‍යානය දැනටමත් එ.ජ. ඩොලර් මිලියන 35ක ආයෝජන ආකර්ෂණය කරගෙන ඇත. තවද, උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හම්බන්තොට ජාත්‍යන්තර වරාය තුළ මහා පරිමාණ ටයර් නිෂ්පාදන කම්හලක් සංවර්ධනය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය. දේශීය රබර් සම්පත් භාවිත කරමින් ටයර් නිෂ්පාදනය කොට අපනයනය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කෙරේ. වසර තුළ දී, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් බෝට්ටු තැනීමේ කර්මාන්තය පවත්වාගෙන යෑම සඳහා වන නියාමන රාමුව සංවර්ධනය කිරීම සම්පූර්ණ කළේය. තවද, 1979 අංක 40 දරන අපනයන සංවර්ධන මණ්ඩල පනත යටතේ, වසර පහක කාලයක් සඳහා ප්‍රධාන අපනයන අංශ 24ක් ආවරණය කරමින්, අපනයන උපදේශක කමිටු පත් කරන ලදී. මෙම උපදේශක කමිටු මගින් තරගකාරිත්වය ශක්තිමත් කිරීමට සහ අවශ්‍ය ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමට කටයුතු කරන අතර, වෙළඳපොළ අභියෝග සහ අවස්ථාවන් හඳුනාගැනීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශය අතර සහයෝගීතාවක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ. තවද, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ එක්ව, ශ්‍රී ලංකාවේ විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික කර්මාන්තයේ නිපුණතා පරතරයන් සහ පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලැස්මක් සකස් කළේය. තවද, අපනයන අභිමුඛ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ සහ එවැනි කාන්තා ව්‍යවසායකයින්ගේ ධාරිතාව ප්‍රවර්ධනය සඳහා සහ ඔවුන් දිරිමත් කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය මංගත වැඩමුළු මාලාවක් සහ ගැණුම්කරුවන් සම්බන්ධීකරණ රැස්වීම් සහ පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කළේය. විවිධ අංශ නඟාසිටුවීමේ වැඩසටහන් සංවර්ධනය කිරීම, විධිමත් සහන මධ්‍යස්ථාන හා අපනයන සංසද මෙන්ම විභව වෙළඳ කටයුතු සඳහා පහසුකම් සැපයීම සඳහා විද්‍යුත් වෙළඳපොළ අවස්ථා සංවර්ධනය හරහා කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක් වූ අපනයන ව්‍යාපාර සඳහා සහාය ලබා දීමට අපනයන සංවර්ධන මණ්ඩලය අඛණ්ඩව කටයුතු කළේය.

කලාපය තුළ ශ්‍රී ලංකාව මැණික් සඳහා ප්‍රමුඛතම මධ්‍යස්ථානයක් ලෙසට කේන්ද්‍රගත කිරීම සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විවිධ පියවර ගත්තේය. ඒ අනුව, නිෂ්පාදන අගය එකතු කිරීම් කටයුතු සඳහා ශ්‍රී ලංකාව වෙත ඔප නොදැමූ මැණික් ආනයනය කිරීමට මැඩගස්කරය, ටැන්සානියාව සහ නේපාලය යන රටවල් සමඟ සාකච්ඡා 2021 වසර තුළ දී පැවැත්විණි. භාවිතයට නොගත් භූගත මැණික් සම්පත් කැණීම සඳහා විවිධ බලපත්‍ර සහ අනුමැතීන් ලබා ගැනීමේ ක්‍රියාවලිය සරල කිරීම සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සේවා කේන්ද්‍රස්ථානයක් (one-stop-shop) ද සාර්ථකව ස්ථාපිත කළේය. එමෙන්ම, මැණික් හා ස්වර්ණාභරණ අලෙවිය ප්‍රවර්ධනය කිරීම සඳහා මැණික් කැණීම් සඳහා වූ සීමා කිරීම් සහ ඒ ආශ්‍රිත ගාස්තු ලිහිල් කිරීමට ද පියවර ගනු ලැබුවේය. තවද, නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා මංගත ක්‍රමවේද හරහා අලෙවි කළ හැකි මැණික්වල වටිනාකම් සීමාව ඉහළ දමන ලද අතර, මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් විසින් ඉපැයූ ලාභ මත පනවා තිබූ සියයට 14ක බද්ද 2021 වසරේ අප්‍රේල් මාසයේ දී ඉවත් කරන ලදී. තවද, රත්නපුර ප්‍රදේශයේ ජාත්‍යන්තර මැණික් කුළුණට අදාළ ඉදිකිරීම් කටයුතු 2021 වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

අනෙකුත් රාජ්‍ය ආයතන කර්මාන්ත අංශයට සහ ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය ආයතනික සහාය අඛණ්ඩව ලබා දුන්නේය. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් 2021 වසරේ දී වෙළඳ ප්‍රදර්ශන කිහිපයක් හරහා *'Made in Sri Lanka'* ලාංඡනය ප්‍රචලිත කිරීමට අදාළ සිය ප්‍රයත්නයන් තවදුරටත් කරගෙන ගියේය. 2021 වසර තුළ දී, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 37 දෙනෙකු සඳහා, ඉහළ අගය එකතු කිරීමක් සහිත ඔවුන්ගේ නිෂ්පාදන පිළිගැනීමට ලක් කිරීමට මෙන්ම, ගෝලීය මට්ටමින් අලෙවි කිරීම සඳහා එවැනි නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සහ නංවාලීමේ අදහසින් මෙම ලාංඡනය භාවිත කිරීමට අවසර ලබා දෙන ලදී. තවද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා දැනට පවතින අලෙවිකරණ අවස්ථා පුළුල් කිරීම උදෙසා ව්‍යාපාර-ව්‍යාපාර අතර කටයුතු සිදු කෙරෙන (Made in Sri Lanka Business to Business) මංගත වෙළඳ පිවිසුමක් 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී ස්ථාපනය කර ඇත. 2021 වසර අවසන් වන විට අලෙවිකරුවන් 346ක් මෙම පිවිසුම යටතේ ලියාපදිංචි වී ඇත. ව්‍යවසායකත්වයන් ප්‍රවර්ධනය කරමින් සහ විශ්වවිද්‍යාල උපාධිධාරීන් සඳහා සාර්ථක ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය වීමට අවශ්‍ය මාර්ගය සකස් කරමින්, *ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන සහ උපාධිධාරී ව්‍යවසායක උද්‍යානය* යන වැඩසටහන් 2021 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව, ප්‍රාදේශීය මට්ටමේ ව්‍යවසායකයින් 5,179ක් පුහුණු කරන ලද අතර, මෙම වැඩසටහන් හරහා විශ්වවිද්‍යාල උපාධිධාරීන් 71ක් සඳහා ප්‍රදාන ලබා දෙන ලදී. මේ අතර, කාර්මික සංවර්ධන මණ්ඩලය දකුණු පළාත තුළ කාර්මික සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කරමින්, ප්‍රදේශයේ ගැටලු සඳහා පහසුකම් සැලසීමට හම්බන්තොට ප්‍රදේශය සඳහා එකම ස්ථානයකින් කර්මාන්ත සඳහා අවශ්‍ය සියලු අනුමැතීන් හා අදාළ පහසුකම් ලබා ගැනීමේ ක්‍රමවේදය සහිත කාර්යාලයක් (Smart One Stop) ස්ථාපිත කළේය. 2021 වසර තුළ දී, කුඩා පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සහ ඔවුන්ට සහාය වීම සඳහා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් *දැයට පුනරුදයක් - කර්මාන්තයට ජීවයක්* වැඩසටහන ද ආරම්භ කළේය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම හරහා ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් නිර්මාණය කිරීම අරමුණු කරගත් දිස්ත්‍රික් මට්ටමේ සහ ආයතනික මට්ටමේ ඵලදායීතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලය අඛණ්ඩව පවත්වාගෙන යෑමට කටයුතු කළේය.

ගතික කාර්මික අංශයක් සඳහා අත්‍යවශ්‍ය ලෙස හඳුනාගෙන ඇති තාක්ෂණික නව නිපැයුම් ඉහළ නැංවීමේ අරමුණින්, ආයතන කිහිපයක් විසින් තාක්ෂණය පදනම් කරගත් කටයුතු සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් කාර්මික අංශය තුළ තාක්ෂණය භාවිත කිරීම සහ පර්යේෂණ සිදු කිරීම සඳහා පහසුකම් සැලසීමට තාක්ෂණ හුවමාරු ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළේය. තවද, 2021 වසර තුළ දී, ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ සහාය ඇතිව, විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය විසින් පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැනුම්වත් කිරීම, තාක්ෂණය හුවමාරුව සහ වාණිජකරණයට අදාළ මංගත පුහුණු සහ අධ්‍යාපන සැසි සංවිධානය කරන ලදී. තවද, වේවැල්, පිත්තල, මැටි, ගෘහ ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව, ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් වසංගතය මධ්‍යයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මංගත තාක්ෂණික ප්‍රචාරණ සම්මන්ත්‍රණ කිහිපයක් පවත්වන ලදී. මේ අතර, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණික ආයතනය විසින් දේශීය මිනිරන් සඳහා අගය එකතු කිරීම, පසු අස්වනු තාක්ෂණය, නැනෝ පොහොර සහ කොවිඩ්-19 වසංගතයට එරෙහි නව සෞඛ්‍ය ආරක්ෂණ උපාංග නිපදවීම ඇතුළු නැගී එන අධ්‍යයන ක්ෂේත්‍රයන්ට අදාළ තාක්ෂණික හුවමාරු සහ වාණිජකරණ කටයුතු අඛණ්ඩව සිදු කළේය. ජාතික විද්‍යා පදනම, සෞඛ්‍ය, කෘෂිකර්මාන්තය, ඉංජිනේරු විද්‍යාව සහ අධ්‍යාපනය ඇතුළු විවිධ ක්ෂේත්‍ර සඳහා නව පර්යේෂණ සහ සංවර්ධන ප්‍රදාන 11ක් ලබා දීම හරහා දේශීය නිෂ්පාදන අංශයේ සංවර්ධනයට පහසුකම් සැලසීය. වසර තුළ දී, කාර්මික තාක්ෂණ ආයතනය විසින් ඖෂධ රසායනාගාරය, ලිහිසි තෙල් සහ ඛනිජ තෙල් පරීක්ෂණ රසායනාගාරය සහ ඇඳුරුම් පරීක්ෂණ රසායනාගාරය ඇතුළු නව රසායනාගාර කිහිපයකට අදාළ පරීක්ෂණ සේවා ආරම්භ කළේය. මෙම කාලපරිච්ඡේදය තුළ දී තාක්ෂණික හවුල්කාරිත්වයන් ඇති කර ගැනීම සහ ඒකාබද්ධ අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීමට විවිධ අමාත්‍යාංශ, කර්මාන්ත, ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සහ අනෙකුත් ආයතන සමඟ කාර්මික තාක්ෂණ ආයතනය අවබෝධතා ගිවිසුම් 10කට එළඹ ඇත.

ශ්‍රී ලාංකීය කර්මාන්ත ක්ෂේත්‍රයෙහි තරගකාරිත්වය ඉහළ නැංවීම සඳහා කර්මාන්ත මණ්ඩල විසින් පුහුණු සහ ප්‍රවර්ධන සහාය ලබා දීම අඛණ්ඩව සිදු කළේය. 2021 වසර තුළ දී, ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් කොවිඩ්-19 වසංගතය මගින් ඇති කළ කාලීන ගැටලු සහ අභියෝග ජය ගැනීම සඳහා ආනයනකරුවන් සහ අපනයනකරුවන්ට පහසුකම් සැලසීමේ අරමුණින් පුහුණුව සහ දැනුම බෙදාගැනීමේ වැඩසටහන් කිහිපයක් පවත්වන ලද අතර, ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් සඳහා වෙළඳ අවස්ථා නිර්මාණය කිරීම සඳහා ව්‍යාපාර-ව්‍යාපාර අතර කටයුතු සිදුකෙරෙන මංගත සැසි සහ ව්‍යාපාරික සංසද ඇතුළු ජාත්‍යන්තර මට්ටමින් ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් ද පවත්වන ලදී. තවද, 2021 වසර තුළ දී කලාපීය සහ ජාත්‍යන්තර ආයතන සමඟ ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය අවබෝධතා ගිවිසුම් කිහිපයකට එළැඹුණු අතර, එමගින් ඊට සම්බන්ධ අනෙකුත් පාර්ශ්ව සමඟ සබඳතා ගොඩ නැංවූයේය. 2021 වසරේ අවසන් භාගයේ දී ජාත්‍යන්තර පාර්ශ්වකරුවෙකුගේ සහයෝගීතාව ඇතිව, ලංකා වාණිජ මණ්ඩලය විසින් *අපනයනකරුවන්ගේ ජීඩනමාන සමීක්ෂණය* (Exporter Barometer Survey) පවත්වන ලදී. අපනයනකරුවන්ගේ අදහස් ලබා ගැනීම සඳහා මෙම සමීක්ෂණය වසරකට දෙවතාවක් සිදු කිරීමට නියමිතය. තවද, වෙළඳාම සහ ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා පහසුකම් සලසමින්, ලංකා වාණිජ මණ්ඩලය ජාත්‍යන්තර මට්ටමේ මංගත සම්මන්ත්‍රණ, ව්‍යාපාර-ව්‍යාපාර අතර කටයුතු සිදුකෙරෙන සැසිවාර, සහ දේශීය හා විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයින් සමඟ රැස්වීම් මාලාවක් පැවැත්වීය. තවද, වසර තුළ දී කාර්මික අංශ අතර ආයතනික සහයෝගීතාව ඉහළ නැංවීමේ අරමුණින්, ලංකා වාණිජ මණ්ඩලය ජාත්‍යන්තර මට්ටමේ කර්මාන්ත මණ්ඩල 6ක් සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹුණි. මේ අතර, ශ්‍රී ලංකා කුඩා හා මධ්‍ය කර්මාන්ත මණ්ඩලය විසින් කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයට සහාය වීම සඳහා ධාරිතා ප්‍රවර්ධනය කිරීමේ සහ අභිප්‍රේරණ වැඩසටහන් පවත්වන ලදී.

2021 වසරේ දී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා අවශ්‍ය මූල්‍ය ආධාර සැපයීම සහතික කිරීමට ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ණය යෝජනා ක්‍රම කිහිපයක් හඳුන්වා දී ඇත. කුඩා හා මධ්‍ය පරිමාණ කිරි ගොවීන් ශක්තිමත් කිරීම ඉලක්ක කර ගනිමින් වාර්ෂිකව සියයට 7.5ක සහනදායී පොලී අනුපාතිකයක් යටතේ රුපියල් මිලියනයක් දක්වා එක් ව්‍යවසායකට ණය ලබා ගත හැකි *කිරි ශක්ති* ණය යෝජනා ක්‍රමය 2021 වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ප්‍රදානය කිරීම් 739ක් සිදු කරන ලද අතර, එමගින් 2021 වසරේ දී රුපියල් මිලියන 400.4ක ණය ලබා දීම සිදු විය. තවද, අමාත්‍ය මණ්ඩලයේ තීරණයට අනුව, කාබනික පොහොර, පළිබෝධනාශක සහ වල්නාශක නිෂ්පාදකයින්ට මූල්‍ය ආධාර ලබාදීම සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී ඇත. මේ අතර, කොවිඩ්-19 වසංගතය මගින් බලපෑමට ලක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ස්වයං රැකියාවල නිරතවූවන් සහ පුද්ගලයින්ගේ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා ණය සහන සහ කාරක ප්‍රාග්ධන ණය පහසුකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මහ බැංකුව විසින් මූල්‍ය ආයතන වෙත මාර්ගෝපදේශ සහ උපදෙස් නිකුත් කරන ලදී. 2021 වසර තුළ දී, මුදල් අමාත්‍යාංශය ද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ශක්තිමත් කිරීම සඳහා ජාතික ණය ඇපකර යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීම කඩිනම් කළේය. තවද, ණය ප්‍රදානය කරන ආයතනයක මූල්‍ය අනුග්‍රහය ඇතිව, *පියැසි මත සූර්ය විදුලි උත්පාදන ණය යෝජනා ක්‍රමය* සහ *කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය* අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත. 2021 වසර අවසන් වන විට, මෙම ණය යෝජනා ක්‍රම දෙක යටතේ රුපියල් බිලියන 23.4ක් ප්‍රදානය කර තිබුණි.

ඉදිකිරීම් සහ පතල් හා කැණීම්

2020 වසරේ දී සියයට 13.2කින් පහත වැටුණු ඉදිකිරීම් කටයුතුවල එකතුකළ අගය, දේපළ සංවර්ධනය සහ නිවාස කටයුතු සඳහා ඇති වූ නව ඉල්ලුම මෙන්ම තාවකාලිකව නවතා තිබූ ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම තුළින් ද ප්‍රතිලාභ ලබමින් 2021 වසරේ දී සියයට 1.9කින් වර්ධනය වුව ද, අමුද්‍රව්‍ය හිඟය ඉදිකිරීම් කටයුතු පූර්ණ වශයෙන් යථා තත්ත්වයට පත්වීම කෙරෙහි බාධා ඇති කරන ලදී. ඉදිකිරීම් කටයුතු හා සම්බන්ධ දර්ශක සැලකීමේ දී, 2021 වසරේ දී රටෙහි සමස්ත සිමෙන්ති උපයෝජ්‍යතාවයෙහි සුළු පහළ යෑමක් දක්නට ලැබුණ අතර, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනවල ඉහළ යෑමක් දක්නට ලැබුණි. මේ අතර, ඉදිකිරීම් කටයුතු සඳහා ලබා දුන් අරමුදල්වල ඉහළ යෑමක් පිළිබිඹු කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් පෞද්ගලික නිවාස ඇතුලුව ඉදිකිරීම් කටයුතු සඳහා ලබා දෙන ලද ණය ප්‍රමාණය 2021 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වුව ද, විශේෂයෙන්ම වසරේ දෙවන සහ තුන්වන කාර්තු තුළ දී නැවත ඇතිවූ වසංගත තත්ත්වය මෙන්ම, එමගින් ගෝලීය සහ දේශීය සැපයුම් ජාල කෙරෙහි ඇති වූ අවහිරතා ද ඉදිකිරීම් කටයුතු සඳහා අහිතකර ලෙස බලපාන ලදී. මහ බැංකුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර සමීක්ෂණ මගින් ද, විශේෂයෙන්ම සිමෙන්ති, වානේ සහ ටයිල් වැනි ප්‍රධාන අමුද්‍රව්‍යවල සැපයුම් හිඟතාවය සහ ශීඝ්‍ර මිල ඉහළ යෑම් වැනි සැපයුම් අංශයේ අවහිරතා ඉදිකිරීම් කර්මාන්තයේ පූර්ණ වර්ධන හැකියාව ළඟාකර ගැනීමට බාධාවක් වූ බව අනාවරණය විය. මේ අතර, ප්‍රධාන වශයෙන් වැලි කැණීම් ඇතුළු, ඉදිකිරීම් කටයුතු සඳහා අමුද්‍රව්‍ය සපයන කැණීම් කටයුතුවලින් සමන්විත වන පතල් හා කැණීම් කටයුතු, 2020 වසරේ දී වාර්තා කළ සියයට 12.5ක පහළ යෑමට සාපේක්ෂව, 2021 වසරේ දී ඉදිකිරීම් කටයුතුවල දක්නට ලැබුණු වර්ධනය තුළින් ප්‍රතිලාභ ලබමින් සියයට 2.8කින් ඉහළ ගියේය. අනෙකුත් කැණීම් කටයුතු හා සම්බන්ධ දර්ශක සැලකීමේ දී, පොස්පේට් නිෂ්පාදනයෙහි ඉහළ යෑමක් දක්නට ලැබුණි. එමෙන්ම, මැණික් කැණීම් කටයුතු හා සම්බන්ධ දර්ශක සලකා බැලීමේ දී 2021 වසරේ දී මැණික් අපනයන පරිමාවන්හි ද ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී.

විදුලිය, ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණය

ප්‍රධාන වශයෙන් විදුලිය සහ ගෑස් සැපයීම ආශ්‍රිත කටයුතුවල දායකත්වයත් සමඟ සමස්ත විදුලිය, ජලය සහ අපද්‍රව්‍ය කළමණාකරන කටයුතුවල එකතු කළ අගය 2020 වසරේ දී වාර්තා කළ සියයට 0.8ක අඩු වීමට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 3.9කින් වර්ධනය විය. මෙම කාණ්ඩයේ වර්ධනයට විශාලතම දායකත්වය සපයන ලද විදුලිය, ගෑස්, වාෂ්ප හා වායුසමීකරණ සැපයීමේ කටයුතු 2020 වසරේ වාර්තා කළ සියයට 1.6ක පහත වැටීමට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 6.1කින් වර්ධනය විය. විදුලිය උත්පාදනයට අදාළ දත්ත සලකා බැලීමේ දී, 2021 වසරේ දී සමස්ත විදුලි උත්පාදනය සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමත් සමඟ කර්මාන්ත අංශයෙන් ඇති වූ ඉහළ ඉල්ලුම හේතු විය. මෙම කාණ්ඩයේ අනෙකුත් උප ආර්ථික කටයුතු අතරින් ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම හා බෙදා හැරීමේ කටයුතු 2020 වසරේ දී වාර්තා කළ සියයට 4.8 ක වර්ධනයට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 4.3කින් වර්ධනය විය. එසේ වුව ද, 2020 වසරේ දී සියයට 1.0 ක පහත වැටීමක් වාර්තා කළ මලාපවහන කටයුතු, කසළ කළමණාකරණය හා එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ කටයුතු 2021 වසරේ දී සියයට 3.3කින් තව දුරටත් පහත වැටුණි.

2

සේවා

2020 වසරේ දී සියයට 1.6කින් පහත වැටුණු සේවා කටයුතුවල එකතු කළ අගය, ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම මෙන්ම කුටුම්බ පරිභෝජනය ඉහළ යෑමත් සමඟම 2021 වසරේ දී සියයට 3.0කින් වර්ධනය විය. මෙම වර්ධනය කෙරෙහි මූල්‍ය සේවාවල දායකත්වය මෙන්ම කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් පනවා තිබූ සීමා කිරීම් සාපේක්ෂව ලිහිල් වීම නිසා දක්නට ලැබුණු තොග හා සිල්ලර වෙළඳාම් සහ දේපළ වෙළඳාම් කටයුතුවල වර්ධනය ද හේතු විය. එසේම, වසංගතයේ බලපෑම නිසා ඉල්ලුම ඉහළ ගිය තොරතුරු තාක්ෂණ, සන්නිවේදන සහ සෞඛ්‍ය සේවා ද මෙම වර්ධනයට බෙහෙවින් උපකාරී විය. තවද, වෙනත් පුද්ගලික සේවා, වෘත්තීයමය සේවා, රක්ෂණය හා ප්‍රවාහන සේවා කටයුතු වසර තුළ දී යථා තත්ත්වයට පත්වීම මෙන්ම රාජ්‍ය පරිපාලනය, අධ්‍යාපනය සහ තැපැල් හා කුරියර් සේවා යන කටයුතුවල ධනාත්මක වර්ධනය ද සමස්ත සේවා කටයුතුවල වර්ධනයට හේතු විය. එමෙන්ම, නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා අඛණ්ඩව වසර දෙකක් පහත වැටීමෙන් පසු 2021 වසරේ දී යම් වර්ධනයක් වාර්තා කරන ලදී. සේවා අංශයේ මෙම ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින් මහ බැංකුව විසින් මාසික පදනමින් සම්පාදනය කරනු ලබන සේවා අංශයේ ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය සමස්තයක් වශයෙන් 2021 වසර තුළ දී ඉහළ යෑමක් වාර්තා කරන ලදී. තවද, මහ බැංකුව විසින් සම්පාදනය කරනු ලබන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ සේවා කටයුතු සඳහා වූ ඉල්ලුම සහ විකුණුම් උපදර්ශක ද සේවා කටයුතුවල වර්ධනය තවදුරටත් පිළිබිඹු කරමින් 2021 වසර තුළදී සමස්තයක් ලෙස ඉහළ යෑමක් වාර්තා කරන ලදී.

2.11 රූප සටහන
2021 වසරේ සේවා කටයුතුවල වර්ධන වේගයන් (අ)



(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ
මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2.12 රූප සටහන
සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)



(අ) ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සලකා බලනු ලබන මාසය තුළ දී සිදු වූ වෙනස්කම් පිළිබඳව විමසීමට ලක් කරනු ලබන සංජානන සමීක්ෂණයක් මත පදනම්ව ඇත. 0 සිට 100 දක්වා පරාසය තුළ විහිදෙන විසරණ දර්ශකයක් (Diffusion Index) වන මෙහි දර්ශක අගය එහි සඩබුම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50ට වඩා වැඩි නම් අදාල ක්‍රියාකාරකමෙහි වර්ධනයක් ද දර්ශක අගය 50ට වඩා අඩු නම් එහි පහත වැටීමක් ද පෙන්නුම් කෙරේ.
මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

තොග සහ සිල්ලර වෙළඳාම

ප්‍රතිපත්තිමය සානුබල මෙන්ම ලිහිල් සංචරණ සීමා හේතුවෙන් පාරිභෝගික වියදම් ඉහළ යෑමත් සමඟ, 2021 වසරේදී තොග හා සිල්ලර වෙළඳාම් කටයුතු 2020 වසරේ වාර්තා කළ සියයට 1.4ක වර්ධනයට සාපේක්ෂව සියයට 2.0කින් තවදුරටත් වර්ධනය විය. රට ක්‍රමක්‍රමයෙන් නව සාමාන්‍යකරණය යටතේ කටයුතු කිරීමට හුරුවීම වෙළඳ කටයුතුවල වර්ධනය අඛණ්ඩව පවත්වා ගැනීමට පිටිවහලක් විය. එසේම, රජය විසින් ද ජනතාව වෙත වරින්වර මූල්‍යාධාර ලබාදීම ද පාරිභෝගිකයින්ගේ වැය කළ හැකි ආදායම යම්තාක් දුරට ඉහළ යෑමට ඉවහල් විය. මේ අතර, ආනයන පරිමා දර්ශකය ද වසර තුළ දී ඉහළ යන ලදී. මේ සඳහා ආයෝජන සහ අතරමැදි භාණ්ඩ ආනයන ප්‍රධාන දායකත්වයක් දක්වන ලද අතර පරිභෝජන භාණ්ඩ ආනයන පරිමාවෙහි සුළු පහත වැටීමක් දක්නට ලැබුණි. තවද, තොග හා සිල්ලර වෙළඳ කටයුතු සඳහා පෞද්ගලික අංශය වෙත බලපත්‍රලාභී වාණිජ බැංකු ලබා දුන් ණය ප්‍රමාණය ද 2020 වසර අවසානයේ පැවති මට්ටමට සාපේක්ෂව, 2021 වසර අවසානය වන විට ඉහළ වර්ධනයක් වාර්තා කර තිබුණි.

ප්‍රවාහනය සහ ගබඩා පහසුකම්

2020 වසරේ දී සියයට 6.8කින් පහත වැටුණු ප්‍රවාහනය ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය, 2021 වසරේ දී සංචරණ සීමා ක්‍රමයෙන් ඉවත් කිරීමත් සමඟ සියයට 0.6ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී. වසංගතය ආරම්භයේ සිටම අයහපත් බලපෑමට ලක් වූ ප්‍රවාහන කටයුතු 2021 වසරේ මුල් භාගයේ දී

වර්ධනයක් පෙන්නුම් කළ ද, කෝවිඩ්-19 වසංගතයේ තෙවන රැල්ල පැතිර යෑමත් සමඟ නැවත වරක් අඩපණ විය. කෙසේ වුව ද, වසරේ සිව්වන කාර්තුව ආරම්භයේ සිට සංචරණ සීමා ලිහිල් කිරීම, ප්‍රවාහන කටයුතු යථා තත්ත්වයට පත්වීමට බෙහෙවින් ඉවහල් විය. වසංගත තත්ත්වය දැඩිව බලපෑ කාලසීමාව තුළ දී මගීන් විසින් පොදු ප්‍රවාහන සේවා භාවිතය සීමා කිරීම මෙන්ම එම සේවා නිසිලෙස ක්‍රියාත්මක නොවීම මගී ප්‍රවාහන කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපෑව ද අත්‍යවශ්‍ය සේවාවක් ලෙස භාණ්ඩ ප්‍රවාහන සේවා පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී බොහෝ දුරට බාධාවකින් තොරව ක්‍රියාත්මක විය. ගෝලීය සැපයුම් දාමවල බිඳ වැටීම් මධ්‍යයේ වුව ද වරාය කටයුතු වර්ධනය වූ අතර, ඒ බව වරාය විසින් හසුරවනු ලැබූ බහාලුම් ප්‍රමාණයේ (අඩි 20ට සමාන බහාලුම් ඒකක වලින්) මෙන්ම නැව් බඩු ප්‍රමාණයේ වර්ධනය මගින් ද පිළිබිඹු විය. තවද, ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් මෙහෙයවන ලද භාණ්ඩ කිලෝමීටර් ප්‍රමාණය ද 2021 වසර තුළ දී වර්ධනය විය. කෙසේ වුව ද, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, පෞද්ගලික බස් රථ ක්‍රියාකරුවන් හා ශ්‍රී ලංකන් ගුවන් සමාගම මගින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් ප්‍රමාණය 2021 වසරේ දී ද පහත වැටුණි.

නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා

2021 වසරේ දී විදේශ සංචාරකයින්ගේ පැමිණීම් හා දේශීය සංචාරකයින්ගේ සංචරණ හේතුවෙන් නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවාවල එකතු කළ අගය, 2020 වසරේ දී වාර්තා කළ සියයට 39.4ක පහත වැටීමට සාපේක්ෂව, සියයට 1.9කින් වර්ධනය විය. දේශීය මෙන්ම ජාත්‍යන්තර සංචරණ සීමා කිරීම් හේතුවෙන් කොවිඩ්-19 වසංගතයේ ආරම්භයේ සිටම සංචාරක කර්මාන්තය ආශ්‍රිත කටයුතු දැඩි බලපෑමකට ලක්විය. කෙසේ වුව ද, සංචරණ සීමා ක්‍රමයෙන් ලිහිල් කරමින් 'ජෛව බුබුලු' තුළ විදේශ සංචාරකයන්ට සංචාරය කිරීමට ඉඩ සැලසීම සහ ආකර්ශනීය චාරිකා පැකේජ ලබා දීම වැනි කටයුතු හේතුවෙන් වසරේ අවසන් භාගය වනවිට විදේශ සංචාරක පැමිණීම්වල සැලකිය යුතු මාසික වර්ධනයක් දක්නට ලැබුණි. මේ අතර, බොහෝ හෝටල් ශ්‍රී ලාංකීය සංචාරකයින් සඳහා විශේෂිත වූ වට්ටම් ලබා දෙනු ලැබූ පසුබිමක් තුළ දේශීය සංචරණවල ද ඉහළ වර්ධනයක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුව ද, කොවිඩ්-19 වසංගතයේ තෙවන රැල්ල මගින් මෙම ක්ෂේත්‍රය යථාවත් වීමට තිබූ හැකියාව කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරන ලදී.

මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම

මූල්‍ය සේවා කටයුතුවල දක්නට ලැබුණු අඛණ්ඩ වර්ධනය හේතුවෙන් මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම් ආශ්‍රිත කටයුතුවල එකතු කළ අගය, 2020 වසරේ දී වාර්තා කළ සියයට 4.7ක වර්ධනයට සාපේක්ෂව, 2021 වසරේ දී ද සියයට 5.6කින් වර්ධනය විය. මෙහිදී, මූල්‍ය හා මූල්‍ය අතරමැදිකරණ සේවා 2020 වසරේ දී වාර්තා කල සියයට 10.9ක වර්ධනයට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 7.5කින් වර්ධනය විය. පැවති අභියෝගාත්මක වාතාවරණය මධ්‍යයේ වුව ද, මූල්‍ය සේවා කටයුතුවල සිදුවූ අඛණ්ඩ වර්ධනය පිළිබිඹු කරමින්, බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ලබා දුන් ණය මෙන්ම ලබා ගත් තැන්පතු ද ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, මහ බැංකුව විසින් කාර්තුමය පදනමෙන් පවත්වනු ලබන ණය සැපයුම පිළිබඳ සමීක්ෂණයේ දී වාර්තා වූ ආකාරයට, පැවති අඩු පොලී අනුපාතික හේතුවෙන් ණය සඳහා වූ ඉල්ලුම ඉතා ඉහළ අගයක පැවති අතර, වසරේ වැඩි කාලයක් තුළ පැවති අතිරික්ත ද්‍රවශීලතාවය හේතුවෙන් ණය ලබා දීම සඳහා ඇති පෙළඹුම ද ඉහළ මට්ටමක පැවතුණි. මේ අතරතුර දී, 2020 වසරේ සියයට 3.3කින් පහත වැටුණු රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණ කටයුතු ද 2021 වසරේ දී සියයට 5.1කින් වර්ධනය විය. තවද, 2020 වසරේ දී සියයට 1.2කින් පහත වැටුණු නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම ආශ්‍රිත කටයුතු ද 2021 වසරේ දී සියයට 3.1කින් වර්ධනය විය.

තොරතුරු සහ සන්නිවේදනය

කොවිඩ්-19 වසංගතය මගින් උදා කරදුන් වාසිදායක ඉඩප්‍රස්ථා හේතුවෙන් විදුලි සංදේශ, තොරතුරු තාක්ෂණ හා ඒ ආශ්‍රිත සේවා කටයුතු 2020 වසරේ දී වාර්තා කළ සියයට 14.1ක ඉහළ වර්ධන ප්‍රවණතාවය තවදුරටත් පවත්වා ගනිමින් 2021 වසරේ දී සියයට 17.5ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය යටතේ සමාජ ආර්ථික අන්තර්ක්‍රියා පවත්වා ගැනීම සඳහා විදුලි සංදේශ සේවා පුළුල් කාර්යභාරයක් ඉටු කරන ලදී. මෙහිදී, ජනතාව නිවසේ සිට රාජකාරී සිදු කිරීම සහ මාර්ගගතව අධ්‍යාපනය හා විනෝදාත්මක කටයුතු සිදු කිරීමට යොමුවීම නිසා දුරකථන ඇමතුම් සඳහා මෙන්ම දත්ත සන්නිවේදනය සඳහා අඛණ්ඩව ඇති වූ අමතර ඉල්ලුම ද හේතුවෙන් විදුලි සංදේශ සේවා 2020 වසරේ දී වාර්තා කළ සියයට 15.4ක වර්ධනයට සාපේක්ෂව, 2021 වසරේ දී තවදුරටත් සියයට 16.2ක ඉහළ වර්ධනයක් වාර්තා

කරන ලදී. මෙම ඉහළ ඉල්ලුම සඳහා, ආවරණ කලාපය පුළුල් කිරීම, ධාරිතා මට්ටම් ඉහළ නැංවීම, සේවාවේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම මෙන්ම නිවසේ සිට රාජකාරී හා අධ්‍යාපන කටයුතු සිදු කිරීම වැනි අවශ්‍යතා සඳහා විශේෂිත පැකේජයන් හඳුන්වා දීම වැනි සාධනීය ප්‍රතිචාර විදුලි සංදේශ සේවා සපයන ආයතන මගින් දක්වන ලදී. මේ අතර, ඩිජිටල් මාධ්‍ය, ජාලකරණය, සයිබර් ආරක්ෂාව, මාර්ගගතව පරිගණක සේවා සැපයීම (Cloud Computing), කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත සේවා සහ මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීයකරණය වැනි තාක්ෂණික සේවා සඳහා ඇති ඉල්ලුම හේතුවෙන් පරිගණක වැඩසටහන් හා තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා කටයුතු ද 2020 වසරේ දී වාර්තා කළ සියයට 10.0ක වර්ධනයට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 21.7කින් තවදුරටත් සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.

අනෙකුත් සේවා කටයුතු

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 වසරේ දී පසුබෑමට ලක් වූ බොහෝ සේවා කටයුතු 2021 වසරේ දී වසංගතය යළි මතු වීමේ බලපෑම හමුවේ වුව ද යථා තත්ත්වයට පත්වීමට සමත් විය. මෙහිදී, නිර්මාණාත්මක කලාවන් හා විනෝදස්වාදය සැපයීමේ සේවා, රෙදිපිළි සේදීම්, කේශාලංකරණය හා වෙනත් රූපලාවණ්‍ය සේවා සහ අවමංගල්‍ය කටයුතු හා සම්බන්ධ කාර්යයන් වැනි කටයුතුවලින් සමන්විත වන වෙනත් පුද්ගලික සේවා, 2020 වසරේ වාර්තා කළ සියයට 6.5ක පසුබෑමෙන් මිදී, සාපේක්ෂව යහපත් වාතාවරණයක් පැවති 2021 වසරේ දී සියයට 1.1කින් වර්ධනය විය. එමෙන්ම, 2020 වසරේ සියයට 2.7කින් පහත වැටුණු වෘත්තීයමය සේවා කටයුතු 2021 වසරේදී සියයට 1.4ක වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණ කටයුතු 2020 වසරේ වාර්තා කළ සියයට 1.6ක වර්ධනයට සාපේක්ෂව 2021 වසරේදී සියයට 1.9කින් වර්ධනය විය. තවද, වසංගත තත්ත්වය තුළ වඩා ක්‍රියාකාරීව පැවති සෞඛ්‍යය සේවා කටයුතු ද 2020 වසරේ දී වාර්තා කළ සියයට 4.3ක වර්ධනයට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 5.7කින් තවදුරටත් වර්ධනය විය. එසේම, අධ්‍යාපනය, තැපැල් හා කුරියර් සේවා මෙන්ම ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශන සහ එම නිෂ්පාදන කටයුතු ද 2021 වසරේ දී සමස්ත ආර්ථික වර්ධනයට ධනාත්මකව දායක විය.

2.5 වියදම

පරිභෝජන මෙන්ම ආයෝජන වියදම්වල ඉහළ යෑමත් සමඟ සමස්ත දළ දේශීය වියදම (ද.දේ.වි), පවත්නා මිල අනුව, 2020 වසරේ දී වාර්තා කළ සියයට 0.5ක වර්ධනයට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 13.1ක ඉහළ වේගයකින් වර්ධනය විය. පරිභෝජන

2.9 සංඛ්‍යා සටහන

සමස්ත ඉල්ලුම (අ)

රුපියල් මිලියන

අයිතමය	පවත්නා වෙළඳපොළ මිල අනුව			2010 ස්ථාවර මිල අනුව		
	2019 (ආ)	2020 (ආ)(ඇ)	2021 (ඇ)	2019 (ආ)	2020 (ආ)(ඇ)	2021 (ඇ)
1. දේශීය ඉල්ලුම						
පරිභෝජනය	11,971,144	12,214,284	13,425,152	7,786,374	7,601,213	7,870,841
(% වෙනස)	8.0	2.0	9.9	4.5	-2.4	3.5
දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය	3,945,423	3,779,064	4,655,829	3,082,250	2,766,593	2,848,458
(% වෙනස)	-7.5	-4.2	23.2	-11.6	-10.2	3.0
මුළු දේශීය ඉල්ලුම	**15,916,567**	**15,993,349**	**18,080,981**	**10,868,624**	**10,367,806**	**10,719,300**
(% වෙනස)	**3.7**	**0.5**	**13.1**	**-0.7**	**-4.6**	**3.4**
2. විදේශීය ඉල්ලුම						
භාණ්ඩ සහ සේවා අපනයන	3,472,337	2,418,541	2,981,613	1,845,686	1,666,522	1,952,033
(% වෙනස)	5.5	-30.3	23.3	7.2	-9.7	17.1
භාණ්ඩ සහ සේවා ආනයන	4,391,746	3,384,516	4,253,285	2,823,843	2,501,420	2,789,936
(% වෙනස)	0.9	-22.9	25.7	-5.8	-11.4	11.5
ශුද්ධ විදේශීය ඉල්ලුම	**-919,410**	**-965,975**	**-1,271,672**	**-978,157**	**-834,898**	**-837,903**
(% වෙනස)	**13.4**	**-5.1**	**-31.6**	**23.3**	**14.6**	**-0.4**
3. මුළු ඉල්ලුම	**14,997,157**	**15,027,374**	**16,809,309**	**9,890,468**	**9,532,909**	**9,881,397**
(% වෙනස)	**4.9**	**0.2**	**11.9**	**2.3**	**-3.6**	**3.7**

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වියදමේ මෙම වර්ධනය කෙරෙහි ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මෙන්ම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිමය සානුබල ද ඉවහල් විය. ඒ අනුව, ද.දේ.වි.හි ප්‍රධාන සංරචකය වන පරිභෝජන වියදම සියයට 9.9කින් වර්ධනය වූ අතර, ආයෝජන වියදම ද සියයට 23.2ක ඉතා ඉහළ වේගයකින් 2021 වසරේ දී වර්ධනය විය. විදේශීය අංශය සැලකූ විට, පවත්නා මිල අනුව ශුද්ධ විදේශීය ඉල්ලුම 2020 වසරේ දී වාර්තා වූ සියයට 5.1ක පහත වැටීමට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 31.6කින් සැලකිය යුතු ලෙස තවදුරටත් පහළ යන ලදී. මේ කෙරෙහි භාණ්ඩ හා සේවා අපනයන වාර්තා කළ සියයට 23.3ක වර්ධනය අභිබවා විශේෂයෙන්ම ආනයන මිල ගණන් ඉහළ යෑමේ බලපෑම හේතුවෙන් භාණ්ඩ හා සේවා ආනයනයේ වාර්තා වූ සියයට 25.7ක ඉහළ වර්ධනය හේතු විය. ඒ අනුව, ද.දේ.වි. සහ ශුද්ධ විදේශීය ඉල්ලුමෙන් සැදුම්ලත් ද.දේ.නි., පවත්නා මිල අනුව, 2020 වසරේ දී වාර්තා කළ සියයට 0.2ක සුළු වර්ධනයට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 11.9ක වර්ධනයක් වාර්තා කළේය. ස්ථාවර මිල අනුව ඇස්තමේන්තු සලකා බැලීමේ දී, 2021 වසරේ දී පරිභෝජන වියදම සියයට 3.5ක සැලකිය යුතු වේගයකින් වර්ධනය වූ අතර ආයෝජන වියදම ද සියයට 3.0කින් වර්ධනය විය. ඒ අනුව, 2020 වසරේ දී සියයට 4.6ක පහත වැටීමක් වාර්තා කරන ලද ද.දේ.වි., 2021 වසරේ දී සියයට 3.4ක වේගයකින් වර්ධනය වන ලදී. මේ අතර, අපනයන පරිමාවෙහි දක්නට ලැබුණු ඉහළ වර්ධනය හේතුවෙන්, ස්ථාවර මිල අනුව, ශුද්ධ විදේශීය ඉල්ලුම 2021 වසරේ දී සියයට 0.4ක සුළු පහත වැටීමක් පමණක් වාර්තා කරන ලදී. ඒ අනුව, ස්ථාවර මිල අනුව ද.දේ.නි., 2020 වසරේ දී වාර්තා කළ සියයට 3.6ක පහත වැටීමට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 3.7ක වර්ධනයක් වාර්තා කරන ලදී.

පරිභෝජනය

ආර්ථිකයේ සමස්ත වියදමෙහි සියයට 74.3ක් නියෝජනය කරන සහ විශාලතම වියදම් කාණ්ඩය වන පරිභෝජන වියදම පවත්නා මිල අනුව, 2020 වසරේ දී වාර්තා කළ සියයට 2.0ක අඩු වර්ධනයට සාපේක්ෂව, පාරිභෝගිකයන්හට වසංගත තත්ත්වය සමනය වීමත් සමඟ වැඩි ඉඩප්‍රස්ථා විවර වීම තුළ පරිභෝජන ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් 2021 වසරේ දී සියයට 9.9ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. මේ සඳහා පරිභෝජන වියදමේ සියයට 88.0කට දායකත්වය දක්වන එහි ප්‍රධානම වියදම් කාණ්ඩය වන පෞද්ගලික පරිභෝජන වියදමෙහි දක්නට ලැබුණු ඉහළ වර්ධනය ප්‍රධාන වශයෙන් දායක විය. පවත්නා මිල අනුව පරිභෝජන වියදම් ඉහළ යෑම මගින් විශේෂයෙන්ම වසරේ අවසාන භාගයේ දී බොහෝ පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම මත ඇතිවූ බලපෑම ද පිළිබිඹු විය. මේ අතරතුර දී, රජයේ පරිභෝජන වියදම පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී අඩු වේගයකින් වර්ධනය විය.

2.10 සංඛ්‍යා සටහන

පවත්නා වෙළඳපොළ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය (අ)

කාණ්ඩය	මුළු පෞද්ගලික පරිභෝජන වියදමට දායකත්වය (%)			වර්ධනය (%)	
	2019 (ආ)	2020 (ආ)(ඇ)	2021 (ඇ)	2020 (ආ)(ඇ)	2021 (ඇ)
1. ආහාරපාන සහ මද්‍යසාර නොවන පානීය ද්‍රව්‍ය	27.9	30.9	31.3	11.6	12.4
2. මද්‍යසාර, දුම්කොළ නිෂ්පාදන සහ වෙනත් මත්ද්‍රව්‍ය	3.4	3.2	3.4	-4.7	15.5
3. ඇඳුම්-පැළඳුම් සහ පාවහන්	4.5	3.7	3.9	-15.6	15.0
4. නිවාස කුලී, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් බලශක්ති භාවිතයන්	10.1	10.4	10.0	3.6	6.7
5. ගෘහභාණ්ඩ, ගෘහ උපකරණ සහ දෛනික නිවාස අලුත්වැඩියාවන්	1.0	1.0	1.1	-2.1	24.3
6. සෞඛ්‍යය	2.8	2.8	3.4	1.7	33.1
7. ප්‍රවාහනය	24.1	20.2	19.3	-15.2	5.9
8. සන්නිවේදනය	0.7	0.7	0.8	0.1	20.9
9. ක්‍රීඩා, විනෝදාංශ සහ සංස්කෘතික කටයුතු	1.6	1.7	1.7	7.6	8.4
10. අධ්‍යාපනය	1.7	1.7	1.6	0.0	3.0
11. හෝටල් සහ ආපනශාලා පහසුකම්	3.9	2.6	2.9	-34.2	24.4
12. වෙනත් තැනක සඳහන් නොවන විවිධ භාණ්ඩ හා සේවා ලබාගැනීම	21.5	21.4	21.4	0.7	10.8
13. ශ්‍රී ලාංකිකයින් එතෙරදී කරන වියදම්	2.9	0.9	0.3	-68.7	-68.4
14. අඩු කළා: විදේශිකයින් මෙතෙරදී කරන වියදම්	6.2	1.2	0.9	-80.1	-17.2
මුළු පෞද්ගලික පරිභෝජන වියදම	**100.0**	**100.0**	**100.0**	**1.0**	**10.8**

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2

පෞද්ගලික පරිභෝජන වියදම, පවත්නා වෙළඳපොළ මිළ අනුව 2020 වසරේ දී වාර්තා කළ සියයට 1.0ක සුළු වර්ධනයට සාපේක්ෂව, වසංගතය සමනය වීමට සමගාමීව ආර්ථිකය නැවත විවෘත කිරීම තුළ පාරිභෝගිකයන් වියදම් කිරීමට යුහුසුළු වීමත් සමඟ 2021 වසරේ දී සියයට 10.8ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. වසංගතය හා සම්බන්ධ සීමාවන් ක්‍රමයෙන් ලිහිල් කිරීම මෙන්ම, රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්තිමය සානුබල ද පාරිභෝගිකයන් නැවත වෙළඳපොළ කරා ඇදී යෑම දිරිමත් කරන ලදී. එමගින් ප්‍රවාහනය, හෝටල් සහ ආපනශාලා මෙන්ම ඇඳුම් පැළඳුම් හා පාවහන් වැනි බොහෝ කාණ්ඩවල පෞද්ගලික පරිභෝජන වියදම්වල ඉහළ යෑමක් දක්නට ලැබුණි. තවද, ආහාර සහ මධ්‍යසාර නොවන පානීය ද්‍රව්‍ය, නිවාස කුලී, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් බලශක්ති, සෞඛ්‍යය හා සන්නිවේදනය වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා ඇතුළත් කාණ්ඩවල ද පෞද්ගලික පරිභෝජන වියදම්වල වර්ධනයක් වසර තුළ දී දක්නට ලැබුණි.

රජයේ සමූහ පරිභෝජන වියදම සහ පුද්ගල පරිභෝජන වියදමෙන් සමන්විත වන රජයේ සමස්ත පරිභෝජන වියදම, 2020 වසරේ දී වාර්තා කළ සියයට 9.9ක වර්ධනයට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 3.7කින් වර්ධනය විය. මෙහිදී, සෞඛ්‍ය සහ අධ්‍යාපනය සඳහා වූ රජයේ වියදම් ඇතුළත් රජයේ පුද්ගල පරිභෝජන වියදම, 2020 වසරේ දී වාර්තා කළ සියයට 17.8ක ඉහළ වර්ධනයට සාපේක්ෂව, 2021 වසරේ දී ද සියයට 1.0කින් වර්ධනය විය. තවද, සමස්තයක් ලෙස ප්‍රජාවටම ප්‍රතිලාභ ගෙන දෙන ආරක්ෂාව, පොදු මහජන සේවා හා සමාජ ආරක්ෂණය වැනි කටයුතු සඳහා වන රජයේ සමූහ පරිභෝජන වියදම, 2020 වසරේ දී වාර්තා කළ සියයට 5.8ක වර්ධනයට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 5.3කින් වර්ධනය විය. මේ අතර, කොවිඩ්-19 වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා රජය දැක්වූ මැදිහත්වීම ද සමස්ත පරිභෝජන වියදම ඉහළ යෑම කෙරෙහි හේතුවක් විය.

ආයෝජන

2020 වසරේ දී පවත්නා මිල අනුව සියයට 4.2කින් පහත වැටුණු ආයෝජන වියදම, 2021 වසරේ දී ආර්ථික කටයුතුවල ක්‍රමික වර්ධනය සහ ඒ සඳහා සානුබල සැපයීමට විශේෂයෙන් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති හේතුවෙන් සියයට 23.2කින් වර්ධනය විය. මේ කෙරෙහි, ප්‍රධාන වශයෙන් 2020 වසරේ දී සියයට 6.0කින් පහළ වැටුණු දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය, 2021 වසරේ දී සියයට 14.5කින් සැලකිය යුතු ලෙස වර්ධනය වීම බෙහෙවින් හේතු විය. ඒ අනුව, 2020 වසරේ දී පහත වැටුණු ඉදිකිරීම්, ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර යන දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ ප්‍රධාන සංරචක, 2021 වසරේ දී හිතකර ලෙස වර්ධනය විය. තවද, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපකරණ සහ බුද්ධිමය

2.11 සංඛ්‍යා සටහන

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායවල ආයෝජන සහ සේවා නියුක්තිය

	ව්‍යාපෘති සංඛ්‍යාව		ඇස්තමේන්තුගත ආයෝජන (රු. මිලියන)						ඇස්තමේන්තුගත සේවා නියුක්තිය	
	2020 (අ)	2021 (ආ)	2020 (අ)			2021 (ආ)			2020 (අ)	2021 (ආ)
			විදේශීය	දේශීය	එකතුව	විදේශීය	දේශීය	එකතුව		
ආයෝජන මණ්ඩලය (1978 අංක 4 දරන පනත යටතේ)										
අනුමත කළ ව්‍යාපෘති	162	144	300,608	123,178	423,786	348,926	168,451	517,377	14,376	26,463
17 වන වගන්තිය යටතේ (ඇ)	161	139	299,236	123,178	422,413	347,933	168,002	515,935	14,256	26,290
16 වන වගන්තිය යටතේ	1	5	1,373	-	1,373	993	449	1,442	120	173
17 වන වගන්තිය යටතේ ගිවිසගත් ව්‍යාපෘති (ඇ)	122	93	131,342	165,858	297,201	42,397	74,144	116,542	15,856	16,477
17 වන වගන්තිය යටතේ දැනට කර ඇති ආයෝජන (ඈ) (ඉ)	1,943	1,875	2,105,156	1,812,278	3,917,434	2,258,989	2,021,406	4,280,395	ලැ.නො.	ලැ.නො.
වාණිජ කටයුතුවල නිරතවූ ව්‍යාපෘති (ඈ)	2,651	2,735	606,527	975,024	1,581,551	651,662	1,057,348	1,709,010	441,936	459,828
17 වන වගන්තිය යටතේ (ඇ)	2,116	2,216	580,734	966,286	1,547,021	626,170	1,046,161	1,672,331	413,280	431,550
16 වන වගන්තිය යටතේ	535	519	25,793	8,738	34,530	25,492	11,187	36,679	28,656	28,278
කර්මාන්ත අමාත්‍යාංශය ලියාපදිංචි වූ සමාගම් (ඈ)	3,020	3,259	-	-	208,934	-	-	209,366	ලැ.නො.	ලැ.නො.

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පුළුල් කළ ව්‍යාපෘති ද ඇතුළත්ව
(ඈ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය
(ඉ) සමුච්චිත සැබෑ ආයෝජන අගයන් දක්වා ඇත.

සටහන: ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කළ හා ගිවිසගත් ව්‍යාපෘති, ආයෝජන උපරිමයන් හෝ වෙනත් නම් කරන ලද විශේෂිත අවශ්‍යතාවන්ට යටත්ව තීරුබදු සහ විනිමය පාලන විධිවිධානවලින් නිදහස් වේ.

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත අමාත්‍යාංශය

2.13 රූප සටහන
ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායවල විදේශීය සෘජු ආයෝජන (අ)
(එ.ජ.ඩොලර් මිලියන)



(අ) ණය ද ඇතුළත්ව

මූලය: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

දේපළ සඳහා වූ ආයෝජන වියදම් ද පසුගිය වසරට සාපේක්ෂව වර්ධනය විය. එමෙන්ම, තොග/පරිලේඛන වෙනස් වීම් සහ වටිනා දේ අත්පත් කර ගැනීම් හා අතහැරීම් ද සැලකිය යුතු වර්ධනයක් 2021 වසරේ දී වාර්තා කරන ලදී.

2021 වසරේ දී ආයෝජන මණ්ඩලය යටතේ ඇති සමාගම් විසින් ලබා ගත් ණය ද ඇතුළුව විදේශ ආයෝජන ප්‍රමාණය, 2020 වසරේ දී වාර්තා වුණු එ.ජ. ඩොලර් මිලියන 687.0 හා සැසඳීමේදී, 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 780.2ක්[5] දක්වා සියයට 13.6කින් ඉහළ ගියේය. නිෂ්පාදන අංශය, සේවා අංශය සහ යටිතල පහසුකම් ව්‍යාපෘති ඇතුළු ප්‍රධාන අංශ වෙත විදේශ සෘජු ආයෝජන ගලා ඒමේ යථා තත්ත්වයට පත් වීමක් වාර්තා වූ අතර, කෘෂිකාර්මික අංශය වෙත ලැබෙන විදේශ සෘජු ආයෝජන ප්‍රමාණය, 2021 වසරේ දී පහළ මට්ටමක පැවතුණි. තවද, 1978 අංක 4 දරන ආයෝජන මණ්ඩල පනතේ 16 සහ 17 වන වගන්ති යටතේ ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම, 2020 වසරට සාපේක්ෂව සියයට 22.1ක වර්ධනයක් වාර්තා කරමින්, මෙම වසර තුළදී රුපියල් බිලියන 517.4ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ආයෝජන මණ්ඩල පනතේ 16 සහ 17 වන වගන්ති යටතේ වාණිජමය මෙහෙයුම් ආරම්භ කළ ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත ආයෝජන වටිනාකම, පෙර වසරට සාපේක්ෂව 2021 වසර තුළදී සියයට 8.1ක සමස්ත වර්ධනයක් වාර්තා කරමින්, පිළිවෙළින්, රුපියල් බිලියන 1,672.3ක් සහ රුපියල් බිලියන 36.7ක් විය.

5 මෙයට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි සමාගම් වෙත ලැබුණු ණය ද ඇතුළත් වූ, ලැබීම් අයත් වන අතර මෙම ඇස්තමේන්තු 5වන පරිච්ඡේදයේ දක්වා ඇති විදේශ සෘජු ආයෝජන ඇස්තමේන්තුවලට සමාන නොවේ. 5වන පරිච්ඡේදයේ සඳහන් පරිදි 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 784ක් වූ සමස්ත විදේශ සෘජු ආයෝජන ඇස්තමේන්තුවට ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවූ සමාගම්වලට ලැබුණු සෘජු ආයෝජන ද ඇතුළත් වීම මෙම වෙනසට හේතුවයි.

පවත්නා සම්පත් සහ උපයෝජනය

ආර්ථිකයේ පවතින සමස්ත සම්පත් ප්‍රමාණය පවත්නා මිල අනුව, 2020 වසරේ දී වාර්තා කළ සියයට 5.0ක පහත වැටීමට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 14.4කින් ඉහළ යන ලදී. මෙහිදී, දේශීය සම්පත් වන ද.දේ.නි. මෙන්ම විදේශීය සම්පත් වන ආනයන ද, 2021 වසරේ දී පවත්නා මිල අනුව මෙන්ම ස්ථාවර මිල අනුව ද වර්ධනය විය. මේ අතර, සම්පත් උපයෝජනය පිළිබඳව සැලකීමේ දී, සම්පත් වැඩි ප්‍රමාණයක් පරිභෝජනය සඳහා භාවිතා වී ඇත. ඒ අනුව, 2021 වසරේ දී සමස්ත සම්පත් උපයෝජනයෙන් සියයට 63.7ක් පරිභෝජන වියදම් වලින් සමන්විත විය. තවද, අපනයන මෙන්ම ආයෝජන කටයුතු වෙනුවෙන් උපයෝජනය කරන ලද සම්පත් ප්‍රමාණය ද 2021 වසරේ දී පවත්නා මිල අනුව ඉහළ ගොස් ඇත. මේ අතර, ස්ථාවර මිල අනුව සලකා බලන විට සමස්ත සම්පත් උපයෝජනයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ අපනයන සඳහා උපයෝජනය කර ඇති සම්පත් ප්‍රමාණය ඉහළ ගොස් ඇති අතර, ආයෝජන සඳහා යොදගත් සම්පත් ප්‍රමාණය පහළ ගොස් ඇත.

2.14 රූප සටහන
2021 වසරේ ආර්ථිකය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)



(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2

2.12 සංඛ්‍යා සටහන

සම්පත් සංයුතිය සහ උපයෝජනය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)(ආ)

අයිතමය	ප්‍රතිශතාත්මක දායකත්වය (%)		වර්ධනය (%)	
	2020 (ඇ)	2021	2020 (ඇ)	2021
1. සම්පත්				
දළ දේශීය නිෂ්පාදිතය	81.6	79.8	0.2	11.9
භාණ්ඩ සහ සේවා ආනයන	18.4	20.2	-22.9	25.7
එකතුව	**100.0**	**100.0**	**-5.0**	**14.4**
2. උපයෝජනය				
පරිභෝජනය	66.3	63.7	2.0	9.9
දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය	20.7	20.8	-6.0	14.5
තොග/පරිලේඛන වෙනස්වීම් සහ වටිනාදේ අත්පත් කර ගැනීම් සහ අතහැරීම	-0.2	1.4	67.9	874.2
භාණ්ඩ සහ සේවා අපනයන	13.1	14.2	-30.3	23.3
එකතුව	**100.0**	**100.0**	**-5.0**	**14.4**

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ඉතුරුම්

දේශීය මෙන්ම ජාතික ඉතුරුම් ද 2021 වසරේ දී පවත්නා මිල අනුව ඉහළ යන ලදී. ඒ අනුව මූලික වශයෙන් පුද්ගල ඉතුරුම් වර්ධනය වීම මත 2021 වසරේදී දේශීය ඉතුරුම් සියයට 20.3කින් වර්ධනය විය. මේ අතර, ප්‍රධාන වශයෙන් වසර තුළ දී රාජ්‍ය ආදායම පහත වැටීම හේතුවෙන් රජයේ නිර්-ඉතුරුම්හි ඉහළ යෑමක් දක්නට ලැබුණි. ඒ අනුව, ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස ගත් කළ, දේශීය ඉතුරුම් 2021 වසරේ දී සියයට 20.1ක් දක්වා වර්ධනය විය. මේ අතරතුර, රුපියල් වටිනාකම අනුව ශුද්ධ ප්‍රාථමික ආදායමෙහි සෘණ අගය අඩුවූ අතර ශුද්ධ විදේශීය ජංගම සංක්‍රාම පහළ යන ලදී. මෙම තත්ත්වයන්හි සමස්ත ප්‍රතිඵලයක් ලෙස ජාතික ඉතුරුම්, 2021 වසරේ දී සියයට 13.2කින් වර්ධනය වී ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස සියයට 23.8ක් බවට පත් විය. තවද, 2020 වසරේ දී ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස සියයට 1.6ක් වූ ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය, ආයෝජන වියදමේ සැලකිය යුතු ඉහළ යෑමත් සමඟ, 2021 වසර වන විට සියයට 3.9ක් දක්වා පුළුල් විය.

2.6. ආදායම

දළ මෙහෙයුම් අතිරික්තය 2021 වසරේ දී ද ප්‍රධාන ආදායම් සංරචකයව පැවති අතර, සේවක ආදායම් හා නිෂ්පාදනය මත වෙනත් බදු (සහනාධාර අඩු කළ පසු) පිළිවෙලින් දායක වූ අනෙකුත් සංරචක විය. ඒ අනුව, දළ මෙහෙයුම් අතිරික්තය 2021 වසරේ දී පවත්නා මිල අනුව සියයට 13.6කින් වර්ධනය වෙමින් ද.දේ.නි.යෙන් සියයට 64.4කට දායකත්වය දැක්විය. මෙම වර්ධනය සඳහා ශුද්ධ මෙහෙයුම් අතිරික්තය වසර තුළ දී සැලකිය යුතු ලෙස වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, අනෙකුත් ප්‍රධාන ආදායම් සංරචක සැලකූ විට, සේවක ආදායම් හා නිෂ්පාදනය මත වෙනත් බදු (සහනාධාර අඩු කළ පසු) ද වසර තුළ දී වර්ධනය විය. මේ අතරතුර, ආයතනික අංශ වර්ගීකරණයට අනුව ආදායම් ජනනය කිරීම සැලකීමේ දී, ගෘහ ඒකක සහ

2.13 සංඛ්‍යා සටහන

පරිභෝජනය, ආයෝජන සහ ඉතිරිකිරීම් (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)(ආ)

කාණ්ඩය	රුපියල් මිලියන		වර්ධනය (%)		ද.දේ.නි. ට දායකත්වය (%)	
	2020 (ඇ)	2021	2020 (ඇ)	2021	2020 (ඇ)	2021
1. වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.	15,027,374	16,809,309	0.2	11.9	100.0	100.0
2. පරිභෝජන වියදම	12,214,284	13,425,152	2.0	9.9	81.3	79.9
පෞද්ගලික	10,661,955	11,814,865	1.0	10.8	71.0	70.3
රජය	1,552,329	1,610,287	9.9	3.7	10.3	9.6
3. ආයෝජන	3,779,064	4,655,829	-4.2	23.2	25.1	27.7
4. දේශීය ඉතුරුම්	2,813,090	3,384,158	-7.0	20.3	18.7	20.1
පෞද්ගලික	3,993,489	4,674,599	12.2	17.1	26.6	27.8
රජය (ඈ)	-1,180,399	-1,290,441	-121.2	-9.3	-7.9	-7.7
5. දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය	-965,975	-1,271,672	-5.1	-31.6	-6.4	-7.6
6. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම	-423,063	-406,605	4.2	3.9	-2.8	-2.4
7. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම (ඈ)	1,150,789	1,030,321	11.7	-10.5	7.7	6.1
8. ජාතික ඉතුරුම්	3,540,816	4,007,874	-2.1	13.2	23.6	23.8

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
(ඈ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයවලින් වෙනස් වනුයේ ගණනය කිරීමේ දී ඇතිවන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල් අමාත්‍යාංශය

විශේෂ සටහන 4

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික උත්තේජකයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සහ අභියෝග

හැඳින්වීම

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලොව වටා බොහෝ රටවල නිමැවුමෙන් අති විශාල කොටසකට දායක වෙමින්, සුවිශේෂ රැකියා ප්‍රභවයක් සපයන අතර ව්‍යාපාර අංශයේ මූලය ලෙස පැවතෙමින් ව්‍යවසායයන්ගෙන් අති බහුතරය ලෙස රැඳී පවතියි. බොහෝ රටවල සේවා නියුක්තියෙන් තුනෙන් දෙකක් පමණ එම ව්‍යාපාරවලින් සැපයෙන අතර, ද.දේ.නි.යෙන් සියයට 50කට වැඩි ප්‍රමාණයකට දායකත්වය ලබා දෙයි.[1] විශේෂයෙන්ම, සංවර්ධනය වෙමින් පවතින රටවල වර්ධනයට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලබා දෙන දායකත්වයේ වැදගත්කම ඉස්මතු කරමින්, මැදි සහ අඩු ආදායම් රටවලට වඩා ඉහළ ආදායම් උපයන රටවල ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය විසින් ආර්ථික නිමැවුමට දක්වනු ලබන දායකත්වය සාමාන්‍යයෙන් වඩා ඉහළ අගයක් ගනී (Gonzales, Hommes and Laura, 2014).

සාමාන්‍යයෙන්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ග්‍රාමීය සහ අඩු ආදායම් ප්‍රදේශ ඇතුළුව, සියලු ස්වරූපයේ සමාජ සමූහයන් පුරා විහිදී පවතින අතර, එවැනි ව්‍යාපාරවල විශාල කොටසක් අවිධිමත් ආයතන වේ. නැගී එන ආර්ථිකයන් තුළ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මිලියන 365-445ත් අතර ප්‍රමාණයක් පවතින බවටත්, එවැනි ව්‍යාපාරවලින් හතරෙන් තුනකට අධික කොටසක් අවිධිමත් ව්‍යාපාර වන බවටත් වාර්තා වී තිබේ (International Labour Organization, 2016). ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් මට්ටම් ඉහළ නැංවීම සඳහා බෙහෙවින් දායකත්වය සපයනු ලබන බවට පෙනී යන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ආදායම් ව්‍යාප්තියෙහි අසමානතා අවම කිරීමට දායක වේ. තවද, ප්‍රමාණයෙන් කුඩා වීම සහ පාරිභෝගික කේන්ද්‍රීය ව්‍යාපාර ආකෘතිවල ප්‍රතිඵලයක් ලෙස, කුඩා ව්‍යාපාර වඩා නම්‍යශීලී වන අතර, වෙනස් වන පරිසරයට සහ තාක්ෂණයේ සිදු වන නව වැඩි දියුණු වීම් වලට අනුවර්තනය වීම මගින් ආර්ථික හැළහැප්පීම්වලට වඩා හොඳින් ඔරොත්තු දීමේ හැකියාවක් ද එම ව්‍යාපාර වලට ඇත. එබැවින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට යම් තාක් ප්‍රමාණයකට ආර්ථිකයක ඔරොත්තු දීමේ ශක්තිය වැඩි දියුණු කළ හැකි අතර, වර්ධනය සහ සංවර්ධනය සඳහා මඟ පාදයි.

රූප සටහන වි.ස. 4.1
ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ විශාල ව්‍යාපාරවල මධ්‍යස්ථ ප්‍රතිශත (සියයට)



මූලයඃ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මූල්‍ය සංසදයෙහි (https://www.smefinanceforum.org) 2019 ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික දර්ශක දත්ත ගබඩාවෙන් ලබා ගත් නව දත්ත සමඟ,[1] IFC (Gonzales, Hommes and Laura, 2014) හි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දේශ දර්ශකවලින් අනුගත කර ගන්නා ලදී.

1 රටවල් 176ක ලියාපදිංචි කරන ලද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ විශාල ව්‍යාපාරවල ද්විතියික දත්තවලින් සමන්විත වන, කුඩා හා මධ්‍ය පරිමාණ මූල්‍ය සංසදයෙන් (https://www.smefinanceforum.org) ලබා ගත හැකි 2019 ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික දර්ශක දත්ත ගබඩාවෙහි දත්ත මත පදනම්ව ඇත. පවතින නවතම වසර සඳහා තොරතුරු සලකා බලනු ලැබූ අතර, එය සියලු රටවල් සඳහා අවශ්‍යයෙන් සමාන නොවිය හැකිය. මූලාශ්‍ර ආයතන සහ කාල පරාසයන්හි පවතින වෙනස්කම් හේතුවෙන් දත්ත ප්‍රමිතිගත කර නොමැති බැවින්, රටවල් සංසන්දනය කිරීම යම් ප්‍රමාණයකට සීමා වේ. පවත්නා දත්ත මත පදනම්ව, මධ්‍යස්ථ අගයන් කරා එළඹීමට භාවිත කළ රටවල් ගණන සේවා නියුක්ති ප්‍රතිශතය සඳහා 80ක් වන අතර, එකතු කළ අගයේ ප්‍රතිශතය සඳහා 38ක් වේ.

වර්ධන උත්තේජනයක් ලෙස ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල පැවැත්ම සහ රටක සමස්ත ආර්ථික වර්ධනය අතර ධනාත්මක සබඳතාවක් ඇති බව සනාත කිරීමට ලේඛන සැලකිය යුතු ප්‍රමාණයක් සංඛ්‍යානමය සාක්ෂි සපයයි. සාමාන්‍යයෙන්, සාර්ථක ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විශාල ආයතන බවට ක්‍රමයෙන් විකාශය වන අතර, එවැනි ආයතන ආර්ථික වර්ධනයට අතිවිශාල දායකත්වයක් සපයනු ලැබේ. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සමාජයේ සෑම කොටසකටම ප්‍රතිලාභ ලැබෙන පරිදි වූ සහ තුලිත වර්ධනයකට මඟපාදමින්, විශාල ව්‍යාපාරවලට පදනම සපයන මාධ්‍යයක් ලෙස, රැකියා සපයන්නෙකු සහ නවෝත්පාදනයට පහසුකම් සලසන්නෙකු ලෙස ආර්ථිකයට වැදගත් දායකත්වයක් ලබා දෙයි.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විශාල ව්‍යාපාර සඳහා පදනම සපයන මාධ්‍යයකි: වඩාත් සාර්ථක ආර්ථිකයන් විශාල සහ කුඩා ව්‍යාපාර යන දෙවර්ගයෙහිම හිතකර සංයෝජනයකින් සමන්විතය. විශාල ව්‍යාපාර සාමාන්‍යයෙන් වඩා ඵලදායී වන අතර, ප්‍රාග්ධන මූලික ව්‍යාපෘති තුළ ආයෝජනය කිරීමට අවශ්‍ය ධාරිතාව ඒවා සතු වේ. තවද එවැනි ව්‍යාපාර විශාල පරිමාණයෙන් පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවලට පහසුකම් සලසන

අතර, වර්ධන පරිච්ඡේදයන්ට දායකත්වය ලබා දෙන නව දැනුම බිහි කිරීමට පෙරළා පහසුකම් සලසනු ලබයි. අනෙක් පසින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර එවැනි විශාල ආයතන සඳහා පදනම සපයන මාධ්‍යයක් ලෙස ක්‍රියා කිරීම මගින් වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර, එවැනි විශාල ආයතන හරහා පෙරළා සැපයුම් දාම ප්‍රසාරණය වීම ඔස්සේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය කෙරෙනු ඇත. සැම්සන්ග්, ඇපල්, මයික්‍රොසොෆ්ට්, ෆේස්බුක් වැනි නූතන ගෝලීය ව්‍යාපාරික දැවැන්තයන් බොහෝ දෙනෙකු කුඩා ව්‍යාපාර ලෙස ඔවුන්ගේ කටයුතු ආරම්භ කර ඇති අතර, එමගින් අවසානයේ දී අදාළ ජාතික සහ කලාපීය ආර්ථිකයන් මෙහෙයවීම දක්වා, ඕනෑම පරිමාණයකට විකාශය වීම සඳහා එවැනි කුඩා ව්‍යාපාර සතු හැකියාව ඉස්මතු කෙරෙයි. සත්‍ය වශයෙන් ම, සාර්ථක ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයකට, පෙරළා මානව ප්‍රාග්ධනය වර්ධනය කරමින්, රටක සාමාන්‍ය ජනතාව අතර ව්‍යවසායකත්ව නිපුණතා වැඩි දියුණු කිරීමට දායක විය හැකි අතර, එය තිරසාර වර්ධනයක් සඳහා පූර්ව අවශ්‍යතාවයක් වේ.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථිකයක සේවා නියුක්තිය සහ සමස්ත නිමැවුම ඉහළ නංවයි: සැලකිය යුතු ලෙස විශාල ව්‍යාපාර සංඛ්‍යාවකින් සමන්විත, විශාලතම අංශය වන, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ජනගහණයේ විශාල කොටසකට රැකියා අවස්ථා සපයයි. මහජනයාගේ ගෙවීමේ ශක්තිය වැඩි කිරීමට මින් පෙරළා සහාය හිමි වන අතර, එමගින් පරිභෝජනය ඉහළ නැංවීම සහ සමස්ත ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීම සිදු කෙරේ. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථිකයේ අංශ බහුතරයක් පුරා විහිදී යෑමත් සමඟ, ජීවනෝපාය ප්‍රකාරව පුද්ගලයන් විශාල ගණනක් සවිබල ගැන්වීම සහ අසමානතාවය අවම කිරීමට දායක වීම මගින්, තිරසාර සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමෙහිලා මෙම ආයතන විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර, එමගින් ස්ථාවර වර්ධන වේගයන් පවත්වා ගැනීම සඳහා අදාළ ආර්ථිකයන්ට සහාය ලබා දෙනු ලැබේ. තවද, තිරසාර සංවර්ධන ඉලක්ක අත්පත් කිරීම මගින් සාමාන්‍යයෙන් රටවල් මත ධනාත්මක ප්‍රතිරූපයක් ඇති වීම හේතුවෙන්, ආයෝජක විශ්වාසය වැඩි දියුණු කිරීම හරහා ආර්ථිකයන්ට සහාය ලබා දීම සඳහා සාර්ථක ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ අංශයකට චක්‍ර භූමිකාවක් ද ඉටු කළ හැකිය.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මගින් ව්‍යාපාර අතර තරඟකාරීත්වය ඉහළ නංවයි: සුවිශේෂී ව්‍යාපාර අවස්ථා හඳුනා ගැනීම මගින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ඒවායෙහි අදාළ ව්‍යාපාර පරිසරයන් තුළ තරඟකාරීත්වය ඉහළ නැංවිය හැකිය. හිතකර පරිසරයක් යටතේ, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් නිර්මාණය කරනු ලබන ඉහළ තරඟකාරී මට්ටම් මගින් තිරසාර වර්ධන මාර්ගවල අත්‍යවශ්‍ය අංගයක් වන නවෝත්පාදන අදහස් දිරිමත් කළ හැකිය. ගමන්වාර බෙදා ගැනීම සඳහා Uber සහ Lyft ද ගෘහස්ත නවාතැන් පහසුකම් සඳහා Airbnb ද වැනි නව්‍ය සාර්ථක අදහස් ඉදිරිපත් කොට මෑත කාලයේ දී සාර්ථකත්වයට පත් වූ ව්‍යාපාර සහ තවත් එවැනි අනුවර්තන සිදු කළ ව්‍යාපාර බොහොමයක්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නවෝත්පාදන ධාරිතාව මෙන්ම, සාමාන්‍යයෙන් සාම්ප්‍රදායික විශාල ආයතනවල කොටසක් නොවන පාර්ශ්වයන් ගණනාවකගේ ජීවිත එම ව්‍යාපාරවලට සමෘද්ධිමත් කළ හැකි වන්නේ කෙසේද යන්නටත් සාක්ෂි සපයයි.

සංවර්ධනය වෙමින් පවතින සහ නැගී එන ආර්ථිකයන් තුළ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල වැදගත්කම

තිරසාර සංවර්ධනය සහ නවෝත්පාදනය සඳහා පහසුකම් සැලසීම මගින් දරිද්‍රතාවය මැඩපැවැත්වීම මත සඵලදායී කාර්යභාරයක් සිදු කිරීම හේතුවෙන්, නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි සංවර්ධන ක්‍රියාවලියට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල දායකත්වය විශේෂයෙන් ම වැදගත් වේ. ජනගහන වර්ධනය හේතුවෙන්, 2030 වර්ෂය වන විට මිලියන 600ක පමණ රැකියා අවශ්‍ය වනු ඇතැයි ලෝක බැංකුව මගින් ඇස්තමේන්තු කර ඇත. සංවර්ධනය වෙමින් පවතින රටවල සාමාන්‍යයෙන් දක්නට ලැබෙන ඉහළ ජනගහන වර්ධනයන් සලකා බැලීමේ දී, රැකියා සපයන්නෙකු ලෙස ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල කාර්යභාරය අතිශය වැදගත් වේ. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සාමාන්‍යයෙන් වඩාත් ශ්‍රම මූලික ව්‍යාපාර වීම හරහා සංවර්ධනය වෙමින් පවතින සහ නැගී එන රටවල විශාල ශ්‍රම බලකායන් අවශෝෂණය කර ගැනීමේ හැකියාව එම ව්‍යාපාර සතු බැවින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර රැකියා සපයන්නෙකු ලෙස විශාල ව්‍යාපාරවලට වඩා වැදගත් වේ. තවද, සංවර්ධනය වෙමින් පවතින රටවලට කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය වැඩි දියුණු කිරීම, ඌණ භාවිත ස්වභාවික සම්පත් සඵලදායීව භාවිතා කිරීම සහ විවිධ අංශ හරහා ආර්ථික කටයුතු විවිධාංගීකරණය වැනි ගැටලු සඳහා පිළියම් යෙදීමට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර භාවිත කළ හැකිය. ඒ සමඟම, හිතකර තත්ත්වයන් යටතේ, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නවෝත්පාදන ධාරිතාව, සංවර්ධනය වෙමින් පවතින සහ නැගී එන ආර්ථිකයන්ට ඉහළ ආදායම් රටවල් දක්වා උසස් වීමේ හැකියාව ලබා දෙමින්, එම රටවලට ඉහළ වර්ධන මට්ටම් පවත්වා ගැනීම සඳහා සහාය විය හැකිය. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නවෝත්පාදන කටයුතු සඳහා පහසුකම් සැලසීමට ප්‍රතිපත්තිමය සහායයේ පවතින වැදගත්කම ඉස්මතු කරමින්, කොරියාව, මැලේසියාව, ඉන්දුනීසියාව, තායිලන්තය, ඉන්දියාව වැනි ආසියානු ආර්ථිකයන්හි වර්ධන අවකාශයන් නවෝත්පාදක කුඩා ව්‍යාපාර විසින් මෙහෙයවනු ලබන බව දක්නට ලැබේ (Asian Productivity Organization, 2015).

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන අභියෝග

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ඇතැම් ලක්ෂණ, නිදසුනක් ලෙස, ඒවායේ කුඩා ප්‍රමාණය, යම් අංශයන්හි දී ප්‍රතිලාභදායක විය හැකි වුවත්, පහත සාකච්ඡා වන ආකාරයේ සැලකිය යුතු අභියෝගවලට මඟපාදමින්, විශාල ව්‍යාපාර සමඟ සැසඳීමේ දී, අවසාන වශයෙන් අඩු ඵලදායීතාවක් සඳහා හේතු වෙමින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ස්වභාවය ඇතැම් විට ගැටලුවක් බවට පත් විය හැකිය.

සීමිත මූල්‍ය ප්‍රවේශය: මූල්‍ය පහසුකම් ලබා ගැනීමේදී ඇති දුෂ්කරතා බොහෝ රටවල ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන ප්‍රධාන බාධකවලින් එකක් වේ. අධ්‍යයන මගින් තහවුරු කර ඇති පරිදි, මූල්‍යනය වෙත ඇති එවැනි සීමිත ප්‍රවේශය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල වර්ධනයට ඇති ප්‍රධානම බාධාව ලෙස පවතියි. එහි ප්‍රතිඵලයක් ලෙස, මෙවැනි ව්‍යාපාර බොහොමයකට ප්‍රාග්ධන මූලික ව්‍යාපෘති සිදු කිරීම දුෂ්කර වේ. මින් පෙර සිදු කර ඇති අධ්‍යයන මගින් ඉස්මතු කර ඇති පරිදි, විධිමත් මූල්‍ය ආයතනවලින් සේවා ලබා ගැනීමේ දී ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මුහුණ දෙන දුෂ්කරතාවලට මුල් වන හේතු අතර, තොරතුරු අසමමිතිය, සීමිත ඇපකර ප්‍රමාණය සහ ඇපකරවල අඩු ගුණාත්මකභාවය, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අඩු මූල්‍ය සාක්ෂරතාව, ඉහළ ණය පැහැර හැරීම් ප්‍රතිශත සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඇගැයීමේ දී ණය දෙන්නන්ගේ ප්‍රවීණතාව සීමිත වීම ආදිය ඇතුළත් වේ. මෙම සීමාවන්හි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් ම ව්‍යාපෘති මූල්‍යනය සඳහා, බැංකු මගින් ඇපකරයක් රහිතව මූල්‍ය පහසුකම් ලබා ගැනීම අතිශයින්ම අසීරු කාර්යයක් වේ.

සීමිත ව්‍යාපාර කුසලතා සහ මානව සම්පත් රඳවා ගැනීමට නොහැකි වීම: ඕනෑම ව්‍යාපාරයක සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය අංග වන මූල්‍ය පාලනය, ගිණුම්කරණය, බදු කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය සහ අලෙවිකරණය වැනි ක්ෂේත්‍රවල ප්‍රවීණතාව අඩු වීම ද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ප්‍රධාන ගැටලුවක් ලෙස පවතියි. තවද, ස්වභාවයෙන්ම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට විශාල අලාභ දරා ගැනීමේ හැකියාව අඩු වන අතර, ඒ හේතුවෙන් ව්‍යාපාර චක්‍ර සහ දේශීය සහ ජාත්‍යන්තර පාර්ශ්ව වලින් හට ගන්නා කම්පන මගින් ඉහළ අවදානමට ලක් වීමේ හැකියාවක් මෙම ව්‍යාපාර වලට ඇත. ප්‍රධාන සේවකයන් රඳවා ගැනීමට නොහැකි වීම ද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ප්‍රගතියට බාධා ගෙන දෙන කාරණයක් ලෙස හඳුනාගෙන ඇත. බොහෝ අවස්ථාවල දී, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් සපයනු ලබන රැකියා අවස්ථා තාවකාලික රැකියා වීමේ ප්‍රවණතාවක් පවතින අතර, ඒ හේතුවෙන් සේවකයන්ට නිරන්තරයෙන් වෙනත් රැකියා අවස්ථා සොයා යෑමට සිදු වේ. එමෙන්ම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට, විශේෂයෙන්ම පුහුණු ශ්‍රමිකයන් සඳහා, විශාල ආයතන විසින් පිරිනමනු ලබන වැටුප් සහ ප්‍රතිලාභ සමඟ බොහෝ විට තරඟ වැදිය නොහැකි අතර, ඒ හේතුවෙන් සේවක හැර යාම් ඉහළ යාම සහ කුඩා ව්‍යාපාර දියුණු කිරීමේ හැකියාව ඇති එවැනි පුහුණු ශ්‍රමිකයන් රඳවා ගැනීමට නොහැකි වීමත් සිදු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, කුඩා ව්‍යාපාර බොහොමයක් ඒවායෙහි හිමිකරුවන් විසින් ම කළමනාකරණය සහ පවත්වාගෙන යනු ලැබීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන අතර, ඉන් පෙරළා සාර්ථක ව්‍යාපාරවලට පවා, කළමනාකරණය, පාලනය, මූල්‍ය සහ තිරසාර බව පිළිබඳ ගැටලු පැන නැගෙයි.

නියාමන බාධක සහ එකිනෙක නොගැළපෙන ප්‍රතිපත්ති: ව්‍යාපාර ලියාපදිංචිය, ගුණාත්මකභාවය සහ පාරිසරික ප්‍රමිති, වාර්තාකරණ අවශ්‍යතා, බදුකරණය වැනි විවිධ පැතිකඩ ඔස්සේ නොයෙක් රටවල තිබෙන නියාමන බාධා හේතුවෙන් ද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දුෂ්කරතාවලට මුහුණ දෙයි. කෙසේ වෙතත්, මෙම දුෂ්කරතා සහ ඒවායෙහි බලපෑම විවිධ රටවල් අතර සැලකිය යුතු ලෙස වෙනස් විය හැකිය. නිදසුනක් ලෙස, පසු ගිය දශක කිහිපය මුළුල්ලේ ආර්ථික සහයෝගීතාව සඳහා වන රටවල (OECD) නියාමන බාධකවල විශාල අඩු වීමක් දක්නට ලැබුණ ද, එවැනි බාධකවල සංකීර්ණත්වය රටකින් රටකට වෙනස් වේ (OECD, 2018). සාමාන්‍යයෙන්, කුඩා ව්‍යාපාරවලට නිපුණතා සහ අරමුදල් සපයා ගැනීමේ අපහසුතා හේතුවෙන් නියාමන සංකීර්ණතා සාර්ථකව අධ්‍යයනය කිරීමේ ධාරිතාවක් නොමැත. එහි ප්‍රතිඵලයක් ලෙස, ව්‍යාපාර පවත්වාගෙන යාමේ පරිසරයේ පවතින සමස්ත සීමා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ගැටලු රැසකට හේතු විය හැකි අතර, එය සාපේක්ෂව දුර්වල ආයතනික යටිතල පහසුකම් සමඟ ක්‍රියාත්මක වීම හේතුවෙන්, සංවර්ධනය වෙමින් පවතින රටවලට විශේෂයෙන් අදාළ විය හැකිය. තවද, ප්‍රතිපත්ති ගැළපීමේ අඩු බව සහ අඩු විනිවිදභාවය ද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන මෙම නියාමන බාධා තීව්‍ර කිරීමට හේතු වේ.

අඩු වෙළඳපොළ කොටස සහ වෙළඳපොළ වෙත පවතින සීමිත ප්‍රවේශය: ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආදායම් මට්ටම් පවත්වාගෙන යෑමේදී ද අභියෝගවලට මුහුණ දෙන අතර, අඩු වෙළඳපොළ කොටස සහ වෙළඳපොළ වෙත පවතින දුර්වල ප්‍රවේශය ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන, සාමාන්‍යයෙන් අඩු විකුණුම් ප්‍රමාණවලින් පීඩා විඳියි. විශාල ප්‍රචාරණ අයවැය දරා ගැනීමට නොහැකියාව, සීමිත ව්‍යාපාර සම්බන්ධතා, සීමිත සමාජ මාධ්‍ය භාවිතය සහ සීමිත මංගත සහභාගීත්වය මෙන්ම,

සංසන්දනාත්මකව අඩු වෙළඳපොළ ප්‍රවේශයක් කරා හේතු වන නව තාක්ෂණයට අනුගත වීමේ දුර්වලතා යනාදී විවිධ හේතූන් මේ සඳහා දායක විය හැකිය.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිළිබඳ තොරතුරු සහ දත්තවල හිඟය: විශේෂයෙන්ම, සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් ඇතුළුව, බොහෝ රටවල ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පිළිබඳ තොරතුරු ලබා ගැනීම සාමාන්‍යයෙන් අසීරු කාර්යයක් වේ. විශේෂයෙන්ම මූල්‍ය දත්තවලට අදාළව, තොරතුරු ප්‍රසිද්ධ කිරීමේ අවශ්‍යතා පවතින විශාල ආයතන මෙන්, සාමාන්‍යයෙන් එවැනි අවශ්‍යතා නොමැති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල තොරතුරු එම ව්‍යාපාරවල පෞද්ගලික සන්තකයේ තබා ගැනෙන අතර, විශ්වසනීය තොරතුරු ලබා ගැනීම සඳහා පිරිවැයක් දැරීමට ණය දෙන්නන් හට සිදු වීම හරහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ණය ලබා දීමට ණය දෙන්නන් අධෛර්යමත් වේ (Yoshino and Taghizadeh-Hesary, 2016). එමගින් මෙම ව්‍යාපාර සමීක්ෂණය කිරීම සඳහා මූල්‍ය ආයතන සතු හැකියාව වැළැක්වීම පමණක් නොව, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය පිළිබඳ පර්යේෂණ ප්‍රමාණය, ඒවායේ ගුණාත්මකභාවය සහ කාලීන බව ද සීමා කරන හෙයින්, මෙය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සංවර්ධනය සඳහා බාධාවකි.

වසංගතයේ සහ අනෙකුත් ප්‍රවණතාවන්හි බලපෑම: කොවිඩ්-19 වසංගතය තුළ දී ලොව පුරා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දුෂ්කරතා වලට මුහුණ පෑ අතර, එමගින් ආදායම් විශාල වශයෙන් අඩු වීමත් අවිනිශ්චිතතා ඉහළ යෑමත් සිදු විය. එම ව්‍යාපාරවලට මෙම අසීරු කාලයට මුහුණ දීම සඳහා රජය සහ අනෙකුත් බලධාරීන් විසින් පෙර නොවූ මට්ටමින් ලබා දුන් ප්‍රතිපත්තිමය සහාය උපකාරී වන්නට ඇති වුවත්, එම ව්‍යාපාර අතරින් බොහොමයක් සම්පූර්ණයෙන් ම යථා තත්ත්වයට පත් වී නොමැත. රුසියානු-යුක්රේන ගැටුම හේතුවෙන් ගෝලීය දේශපාලනික වාතාවරණය තුළ හට ගත් අවිනිශ්චිතතාව මගින් ද, විශේෂයෙන්ම, අගය දාම, අපනයන අංශ සහ සංචාරක ක්ෂේත්‍රය වැනි සේවා වෙළඳාම්වලට සම්බන්ධ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා දුෂ්කරතා එල්ල විය හැකිය.

ස්ත්‍රී-පුරුෂ භාවය අනුව පවතින අසමානතා: ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල කාන්තා ව්‍යවසායිකාවන්ගේ සහභාගීත්වය රටවල් අතර වෙනස් වන බවට වාර්තා වී ඇත. විධිමත් කුඩා ව්‍යාපාරවලින් තුනෙන් එකක් පමණ කාන්තාවන් විසින් හිමිකාරීත්වය දරනු ලබන ව්‍යාපාර වන බව අධ්‍යයන මගින් වාර්තා වුව ද, මෙම කොටස නැගෙනහිර ආසියාව සහ පැසිෆික් කලාපයේ සියයට 40කට අධික වැඩිම අගයක සිට දකුණු ආසියාවෙහි සියයට 10කට පහළ අඩුම අගයක් දක්වා පරාසයක පවතී. (IFC, 2014). කුඩා ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන පොදු අභියෝගවලට අමතරව, කාන්තාවන් හිමිකාරීත්වය දරන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංස්කෘතික නැඹුරුතා, ව්‍යාපාර විශාලත්වය සාපේක්ෂව අඩුවීම සහ ව්‍යාපාර සබඳතා අඩු බව මත පදනම්ව, අතිරේක බාධාවන්ට මුහුණ දෙයි. කාන්තාවන් හිමිකාරීත්වය දරන ව්‍යාපාර මත කොවිඩ්-19 වසංගතයේ බලපෑම ද අසමානුපාතික වන අතර, පිරිමි පුද්ගලයන් හිමිකාරීත්වය දරන ව්‍යාපාරවලට වඩා කාන්තාවන් හිමිකාරීත්වය දරන ව්‍යාපාරවලින් විශාල කොටසක් වසංගතයෙන් පීඩාවට පත් වූ අතර, වසා දැමීමේ තත්ත්වයට පත් වීමේ ඉඩකඩක් ඇති බව පෙනී යයි (United Nations, 2021). කෙසේ වෙතත්, බොහෝ විට මූල්‍ය ආයතන විසින් නිසි අවධානයක් යොමු නොකළ ද, කාන්තාවන් හිමිකාරීත්වය දරන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හොඳින් ක්‍රියාත්මක වන බවට සාක්ෂි ඇත (IFC, 2014). සමාජයේ සෑම කොටසකටම ප්‍රතිලාභ ලැබෙන පරිදි වූ වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා මෙම ස්ත්‍රී-පුරුෂ භාවය අනුව සිදු වන අසමානතාවලට පිළියම් යෙදීම සඳහා දිගින් දිගටම කැපවීමේ වැදගත්කම ඉස්මතු කරමින්, කාන්තාවන් විසින් වඩාත් පවුල් සහ ප්‍රජාවන්හි ප්‍රතිආයෝජන සිදු කරන හෙයින් (International Trade Centre, 2014), කාන්තා ව්‍යවසායිකාවන් සංවර්ධන ඉලක්ක අත්පත් කර ගැනීමෙහිලා වැඩි දායකත්වයක් දක්වයි.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා වන සාර්ථක ක්‍රමෝපායන්

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන සුලභ ගැටලු සඳහා පිළියම් යෙදීමට විවිධ රටවල් විසින් ක්‍රමෝපායන් ගණනාවක් භාවිත කර ඇත.

මූල්‍යන දුෂ්කරතා සඳහා පිළියම් යෙදීම: නොයෙක් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට විධිමත් අංශ වලින් මූල්‍ය පහසුකම් ලබා ගැනීම දුෂ්කර වන බැවින්, මෙම අවහිරතාව අවම කිරීම සඳහා වන ක්‍රමෝපායන් මගින් බොහෝ විට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල වර්ධනයට දායක විය හැකිය. තවද, බොහෝ විට, කුඩා ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන අනෙකුත් අභියෝග ද, මුදල් සපයා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් ඇතිවන අඩු ධාරිතාව සමඟ බැඳී ඇත. මේ හා සම්බන්ධව, විවිධ රටවල් විසින් ගන්නා ලද සාර්ථක ක්‍රමෝපායන්ට මූල්‍ය ආයතන විසින් ඇපකර මත පදනම්ව ලබා දෙන ණය පහසුකම් වල ඇති අඩුලුහුඬුකම් සඳහා පිළියම් යොදන ණය ඇප ආවරණ යෝජනා ක්‍රම හඳුන්වා දීම (උදාහරණ ලෙස, ජපානයේ පවත්වාගෙන යන විවිධ ණය ඇප ආවරණ සංස්ථා, කොරියාවේ Korea Credit Guarantee Fund සහ Korea Technology Finance Corporation, මැලේසියාවේ Credit Guarantee Corporation Malaysia Berhad යනාදිය), අඩු හෝ කිසිදු ලාභයක් ඉපයීමේ අරමුණකින් තොරව අධි අවදානම් ව්‍යාපෘති සඳහා ණය ලබා දීමෙහි විශේෂීකරණය වී සිටින සංවර්ධන බැංකු පිහිටුවීම (උදාහරණ ලෙස, චීනයේ China Development Bank, ජර්මනියේ Kreditanstalt für Wiederaufbau (KfW Bankengruppe), කොරියාවේ Korea Development Bank යනාදිය), විධිමත් මූල්‍ය ආයතන විසින් කුඩා ව්‍යාපාර

වෙත ණය ලබා දීම් මෙහෙය වීමට ණය ලබා දීමේ ඉලක්ක පැනවීම වැනි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, බහුජාතික නියෝජිත ආයතන ඔස්සේ දායක මූල්‍යනය, සමූහ අරමුදල්කරණය (crowdfunding) හා නව ව්‍යාපාර මත මුදලින් දායක වන ආයෝජකයන් (angel investors) වැනි විකල්ප මූල්‍යන මාර්ග වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම, සහ ණය දෙන්නන් හට අවශ්‍ය වන තොරතුරු සමඟ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දත්ත පද්ධති සංවර්ධනය කිරීම (උදාහරණයක් ලෙස, කුඩා ව්‍යාපාර විශාල ගණනක මූල්‍ය තොරතුරු සමඟ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ණය සැපයුමේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම ඉලක්කගත කර ඇති ජපානයේ Credit Risk Database) වැනි තොරතුරු අසමමිතිකතා අවම කර ගැනීම සඳහා වන ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

ජයග්‍රාහකයන්ට සහාය ලබා දීම: ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල මූල්‍ය දුෂ්කරතා සම්බන්ධ ගැටලුවලට පිළියම් යෙදීමට අමතරව, මෙම අංශයේ ව්‍යාපාර වෙත සමස්ත සහාය ලබා දීම සඳහා ලොව පුරා අනෙකුත් වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක වේ. නිදසුනක් ලෙස, කොරියාව වැනි ඇතැම් රටවල් ජාතික ප්‍රමුඛතාවලට අනුකූලව වර්ධන හැකියාවක් හා සංවිධානාත්මක ධාරිතාවක් සහිත කර්මාන්ත සහ ව්‍යාපාර වෙත සහාය ලබා දීම ඉලක්ක කෙරුණු, ජයග්‍රාහකයන් තෝරා ගැනීමේ ප්‍රවේශයක් භාවිත කර ඇත. කෙසේ වෙතත්, එවැනි ප්‍රතිපත්තියක් සම්පත් බෙදා හැරීමේ අඩුලුහුඬුකම් සඳහා තුඩු දිය හැකි බැවින්, එවැන්නකට එරෙහි විවේචන ද එල්ල වේ. කෙසේ වෙතත් එය, විශේෂයෙන්ම, වෙළඳපොළ මගින් මෙහෙයවෙන බෙදා හැරීම්වලින් වර්ධන හැකියා ඇති අංශ කරා සම්පත් ළඟා නොවන කාලයන්හි දී, අරමුණු කර ගත් අංශ කරා සම්පත් ගලා යැවීම සඳහා යොදා ගත හැකි ප්‍රතිපත්තියකි.

සමූහගත කිරීම සහ සම්බන්ධතා වැඩි දියුණු කිරීම: ගෝලීය වෙළඳපොළ ලිහිල්කරණය සහ ගෝලීයකරණය මගින් ජාත්‍යන්තර තරඟකරුවන්ට එරෙහිව හැකියාවන්හි නොගැළපීම් හේතුවෙන් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට අවාසිදායක තත්ත්වයක් ඇති විය හැකිය. මේ හා සම්බන්ධව, මැලේසියාවේ කාර්මික සම්බන්ධතා වැඩසටහන (Industrial Linkage Programme) වැනි ක්‍රියාමාර්ග හරහා ව්‍යාපාර සමූහ බිහි කිරීම හා විශාල සංවිධානවල අගය දාම සමඟ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සම්බන්ධ කිරීම මගින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තරඟ වැදීමට සහාය ලබා දිය හැකිය. තවද, නව තාක්ෂණය, කළමනාකරණ ක්‍රමවේද, වෙළඳපොළ සහ ආදාන අමුද්‍රව්‍ය, සහ නිෂ්පාදන ශිල්පක්‍රම පහසුවෙන් ග්‍රහණය කර ගැනීම හරහා ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ප්‍රතිලාභ සපයන අතරතුර, විශාල ව්‍යවසායන් සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අතර උප කොන්ත්‍රාත් සබඳතා ඇති කර ගැනීම මගින් කර්මාන්තයේ ඵලදායීතාව වැඩි දියුණු කළ හැකිය (Wijesinha, 2011).

ඉලක්කගත සහාය: ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ආර්ථික දායකත්වය ඉහළ නැංවීම අරමුණු කර ගත්, තායිලන්තයේ කුඩා හා මධ්‍ය පරිමාණ ප්‍රවර්ධන සැලැස්ම (SME Promotion Plan) වැනි ජාතික ප්‍රමුඛතාකරණ වැඩසටහන් (OECD/ERIA, 2018) මගින් ද රටක ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත සහාය ලබා දීමේ උත්සාහයන් විධිමත් කළ හැකිය. ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් තොරතුරු තාක්ෂණය අවම ලෙස භාවිත කිරීම වැඩි දියුණු කළ යුතු ප්‍රධාන අංශයක් ලෙස බොහෝ විට සඳහන් වේ. කොවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස, මංගත සහභාගීත්වයක් නොපැවති ව්‍යාපාර පවා ගනුදෙනුකරුවන් සහ සැපයුම්කරුවන් වෙත ළඟා වීම සඳහා මංගත උපකරණ භාවිත කිරීම ඇරඹීය. කෙසේ වෙතත්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් තොරතුරු තාක්ෂණ නිෂ්පාදන සහ සේවා තම ව්‍යාපාර කටයුතු සඳහා භාවිත කරනු ලැබීමෙන් බොහෝ ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාවක් ඇත. මෙම කරුණ සලකා බැලීමේ දී, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් තොරතුරු තාක්ෂණය යොදා ගැනීම වැඩි දියුණු කිරීම අරමුණු කර ගත්, ඉන්දියාවේ ඩිජිටල් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර යෝජනා ක්‍රමය (Digital MSME Scheme)[2] වැනි වැඩසටහන් මගින්, රාජ්‍ය සහ වෙනත් සහායක කණ්ඩායම්වලට තොරතුරු තාක්ෂණය භාවිත කිරීමේ ප්‍රතිලාභ පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම ඔස්සේ ප්‍රධාන කාර්යභාරයක් සිදු කළ හැකිය. මෙම ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර කුසලතා වැඩි දියුණු කිරීමට දායක වීම මගින්, බහුපාර්ශ්වික දායක නියෝජිත ආයතනයන් ද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ධාරිතා වර්ධනය සඳහා සහාය ලබා දෙයි. තවද, දේශගුණික විපර්යාස සඳහා පිළියම් යෙදීමට ලොව පුරා බොහෝ රටවල කැපවීම සහ ප්‍රජා උද්වේගය සලකා බැලීමේ දී, හරිත කටයුතු වල නිරත වී සිටින ව්‍යාපාර සහ තිරසාරාත්මක ව්‍යාපාර භාවිතයන් ප්‍රවර්ධනය කරන පාර්ශ්වයන්ට ද ඉහළ ගිය වෙළඳපොළ නියෝජනයක් භුක්ති විඳින අතරතුර, විවිධ රාජ්‍ය, පෞද්ගලික හා බහුජාතික නියෝජිත ආයතනවලින් මූල්‍ය සහාය ලබා ගත හැකිය.

සමස්තයක් ලෙස, මන්දගාමී වර්ධනය වැළැක්වීම සඳහා රටවලට ඉඩ ලබා දෙන, තිරසාර වර්ධනයට පහසුකම් සලසන ක්‍රියාමාර්ග මගින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ වර්ධනය සඳහා ද මඟ පෑදෙයි. උදාහරණයක් ලෙස, නව දැනුම වර්ධනය කිරීම මත අවධාරණය තැබූ දැනුම පදනම් කර ගත් ආර්ථිකයක් බිහි කිරීමට උත්සාහ ගැනීම කොරියානු ආර්ථිකයේ සහ එහි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ අංශයේ සාර්ථකත්වයේ ප්‍රධාන සාධකයක් බවට සැලකෙයි (Gregory et al., 2002). එමෙන්ම, ජර්මානු ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයේ ප්‍රධාන සංරචකයක් ලෙස වාර්තා වී ඇති (Herr and Nettekoven, 2018) වෘත්තීමය පුහුණුව ඔස්සේ ව්‍යාපාරවලට අදාළ කුසලතා වැඩි දියුණු

2 ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අමාත්‍යාංශය, ඉන්දීය රජය.

2

කිරීම මත ඉලක්ක තබමින් අධ්‍යාපන පද්ධතියට සිදු කරන වැඩි දියුණු කිරීම් මගින් නූතන ගෝලීය වෙළඳපොළ තුළ තරඟ කිරීමට අවශ්‍ය කුසලතාවලින් හෙබි කුඩා ව්‍යාපාර බිහි කිරීමට දායක විය හැකිය.

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර[3]

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ජනගහනයෙන් විශාල ප්‍රමාණයකට රැකියා ලබා දෙමින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියේ විශාල කාර්යභාරයක් ඉටු කරයි. එසේ වුව ද, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ද ඉහත සාකච්ඡා කළ ඔවුන්ගේ සංවර්ධනයට ඇති පොදු බාධාවන් බොහොමයකට මුහුණ දෙයි. රටේ නිෂ්පාදිතයෙන් සියයට 50ක් ඉක්ම වූ[4] දායකත්වයක් සහිතව ආර්ථික වැදගත්කමක් ලබා දුන්නද, හැකියාවන්හි සීමාසහිත බව (බෙහෝ විට මූල්‍ය සඳහා වන සීමිත ප්‍රවේශය සමඟ බැඳී ඇත), තාක්ෂණය භාවිතය අවම වීම සහ දේශීය සහ ගෝලීය දෙඅංශයේම අගය දාම සමඟ සීමිත සම්බන්ධතා හේතුවෙන් ශ්‍රී ලංකාවේ බොහෝ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඔවුන්ගේ සැබෑ ධාරිතාවය වෙත ළඟා වී නොතිබිය හැකිය. මූල්‍ය සාක්ෂරතාවය අවම වීම සහ විවිධ හේතු මත විධිමත් මූල්‍ය පද්ධතිය වෙත ප්‍රවේශ වීමේ දුෂ්කරතා හේතුවෙන් ශ්‍රී ලංකාවේ බොහොමයක් කුඩා ව්‍යාපාරවලට රට පුරා ව්‍යාප්ත වී ඇති ඉතා ඉහළ ණය පොලී අනුපාත යටතේ මූල්‍ය සේවා සපයන ලියාපදිංචි නොකළ ණය සැපයුම්කරුවන්ගේ සේවා භාවිත කිරීමට සිදු වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, එවැනි බොහෝ ව්‍යවසායකයන් ඉහළ පොලී පිරිවැය ගෙවීමේ දුෂ්කරතාවලට මුහුණ දෙන අතර, එමගින් ඔවුන්ගේ ව්‍යාපාරයන්හි පැවැත්ම තර්ජනයට ලක් වේ. එවැනි ණය ලබා දීමේ සේවාවන්හි අවිධිමත් ස්වභාවය හේතුවෙන් එවැනි කටයුතු නිරීක්ෂණය කිරීම අපහසු වන අතර, එමගින් ඵලදායී නියාමන ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව ද සීමා කරයි. මේ අතර, අනෙකුත් රටවල් මෙන් ශ්‍රී ලංකාවේ ද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සම්බන්ධයෙන් අර්ථවත් තක්සේරුවක් කිරීම සඳහා තොරතුරු නොමැතිකම දැඩි සීමාවක් වී ඇති අතර, අවිධිමත් වෙළඳපොළ ණය ගනුදෙනුකරුවන්ගේ බලපෑම සහ ඔවුන්ගේ භූමිකාව පහසුකම් සැපයීම හෝ සූරාකෑමක් ද යන වග තක්සේරු කිරීම ද දුෂ්කර කරයි. රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන දෙඅංශයම විසින් විවිධ කාල වකවානුවලදී මෙම ව්‍යාපාර සඳහා සහය දැක්වීමට ප්‍රයත්න දරා ඇත. නිදසුනක් ලෙස, කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශයේ (2016) ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයෙහි සංවර්ධනය උදෙසා සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලසුම් අන්තර්ගත කර තිබේ. කෙසේ වෙතත්, එවැනි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය දුර්වල තත්ත්වයේ පවතින අතර, ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය තවදුරටත් වැඩි දියුණු කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා මහ බැංකුව ද තම නියෝජිත කාර්යයක් වන ප්‍රාදේශීය සංවර්ධනය යටතේ කුඩා ව්‍යාපාර සඳහා සහය වීමේ දී වැදගත් පහසුකම් සැපයීමේ භූමිකාවක් ඉටු කරයි. ඒ අනුව, සහභාගීත්ව මූල්‍ය ආයතන සහ අනෙකුත් සේවා සපයන්නන් බොහොමයක් සමඟ මූල්‍ය සහ මූල්‍ය නොවන සේවා සපයනු ලබයි. මේ අතර, වසංගත කාල සීමාව තුළ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් විශාල ප්‍රතිපත්තිමය සහය තුළින් මෙම දුෂ්කර කාල සීමාව තුළ එම අංශයට අඛණ්ඩව ක්‍රියාත්මක වීමට උපකාරී විය. කෙසේ වෙතත්, පොදුවේ ගත් කල, ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කොවිඩ්-19 වසංගතය විසින් නිර්මාණය කරන ලද නව සාමාන්‍ය අවස්ථාවන් මෙතෙක් ප්‍රයෝජනයට ගෙන නොමැත. තවද, ගෝලීය සහ දේශීය ආර්ථික කටයුතුවල දැනට පවතින අවනිශ්චිතතාවය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා හානිකර විය හැකි අතර, ඒ සඳහා පිළියම් සහ වැළැක්වීමේ ප්‍රතිපත්ති අවශ්‍ය වේ. යෝජිත ණය ඇපකරණ ආයතනය කඩිනමින් ක්‍රියාත්මක කිරීම සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට අභියෝගාත්මක කාලයන් ජය ගනිමින් සමෘද්ධිමත් වීමට අවශ්‍ය තිරසාර සහාය ලබා දීම සඳහා කැපවූ සංවර්ධන බැංකුවක් පිහිටුවීම ඇතුළු 'සක්‍රීය කරන්නන්' ක්‍රියාවට නැංවීම සඳහා ඉදිරියේදී කාලෝචිත ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. සමස්තයක් වශයෙන්, බොහෝ අවස්ථාවන්හි නොසලකා හරින ලද ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රමුඛ පෙළ ව්‍යාපාරික පරිසරයට ගෙන ඒම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ජාතික ප්‍රමුඛතාවයක් සහිතව සම්බන්ධීකරණය කළ යුතුය.

3 ශ්‍රී ලාංකික ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විසින් මුහුණ දෙනු ලබන ගැටලු සහ අභියෝග පිළිබඳ සවිස්තරාත්මක සාකච්ඡාවක් මෙම වාර්තාවේ 1 වන පරිච්ඡේදයෙහි ගැටලු සහ ප්‍රතිපත්ති යන කොටසෙහි දැක්වේ.

4 කර්මාන්ත සහ වාණිජ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකාව.

මූලාශ්‍ර

1. Asian Productivity Organization (2015). Innovation and SME Financing in Selected Asian Economies.
2. Gonzales, E., Hommes, M. and Laura, M.M. (2014). MSME Country Indicators 2014: Analysis Note.
3. Gregory, G., Harvie, C., and Lee, H.H. (2002). 'Korean SMEs in the 21st Century: Strategies, Constraints, and Performance in a Global Economy', SMEs in a Global Economy Conference - Sustaining SME Innovation, Competitiveness and Development in the Global Economy, 272–290.
4. Herr, H. and Nettekoven, Z.M. (2018). The Role of Small and Medium-Sized Enterprises in Development: What Can be Learned from the German Experience?, Global Labour University Working Paper No. 53.
5. IFC (2014). Women-Owned SMEs: A Business Opportunity for Financial Institutions.
6. International Labour Organization (2016). Role of Finance in Driving Formalization of Informal Enterprises.
7. International Trade Centre (2014). SMEs Drive World Trade and Economic Growth.
8. Ministry of Industry and Commerce (2016). National Policy Framework for Small and Medium Enterprises (SMEs) Development: Action Plan.
9. OECD (2018). Improving the Business Environment for SMEs Through Effective Regulation, Policy Note, 2018 SME Ministerial Conference, OECD.
10. OECD/ERIA (2018). SME Policy Index: ASEAN 2018: Boosting Competitiveness and Inclusive Growth. SME Policy Index, OECD Publishing, Paris/ERIA, Jakarta.
11. United Nations (2021). Micro-, Small and Medium-Sized Enterprises Day, 27 June.
12. Wijesinha, A. (2011). SME Development Strategies for Sri Lanka: Learning Lessons from Neighbouring Countries, Talking Economics, Institute of Policy Studies of Sri Lanka.
13. Yoshino, N. and Taghizadeh-Hesary, F. (2016). Major Challenges Facing Small and Medium-Sized Enterprises in Asia and Solutions for Mitigating Them, ADBI Working Paper Series No. 564.

2.14 සංඛ්‍යා සටහන

පවත්නා වෙළඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව ආදායම් සංරචක (අ)(ආ)

අයිතමය	ප්‍රතිශතක දායකත්වය (%)									
	2020 (ඇ)					2021				
	මූල්‍ය නොවන අංශය	මූල්‍ය අංශය	රාජ්‍ය අංශය	ගෘහ ඒකක හා ලා.තො.ගෘ.සේ.ආ.* අංශය	සමස්ත ආර්ථිකය	මූල්‍ය නොවන අංශය	මූල්‍ය අංශය	රාජ්‍ය අංශය	ගෘහ ඒකක හා ලා.තො.ගෘ.සේ.ආ.* අංශය	සමස්ත ආර්ථිකය
සේවක ආදායම්	**33.1**	**7.5**	**30.3**	**29.1**	**100.0**	**34.4**	**7.5**	**28.6**	**29.4**	**100.0**
දළ මෙහෙයුම් අතිරික්තය	**34.3**	**5.8**	**1.5**	**58.4**	**100.0**	**35.1**	**6.4**	**1.8**	**56.7**	**100.0**
ශුද්ධ මෙහෙයුම් අතිරික්තය	36.8	6.5	0.7	56.0	100.0	38.0	7.3	0.6	54.1	100.0
මිශ්‍ර ආදායම	-	-	-	100.0	100.0	-	-	-	100.0	100.0
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය	45.9	6.0	8.2	40.0	100.0	44.7	5.7	10.8	38.9	100.0
නිෂ්පාදනය මත වෙනත් බදු (අඩු කළා එම සහනාධාර)	**85.5**	**14.2**	**-**	**0.3**	**100.0**	**84.7**	**15.1**	**-**	**0.2**	**100.0**
මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය	**34.0**	**6.4**	**10.9**	**48.7**	**100.0**	**35.0**	**6.8**	**10.2**	**48.0**	**100.0**

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
*ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය ප්‍රධානතම අංශය ලෙස තවදුරටත් පැවතුණ අතර, ඉන් අනතුරුව පිළිවෙලින් මූල්‍ය නොවන ආයතන අංශය, රාජ්‍ය අංශය සහ මූල්‍ය ආයතන අංශය වැඩිම දායකත්ව සපයන ලදී.

2.7. ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

ජනගහනය

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 22.156ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව, ජනගහන වර්ධන වේගය 2020 වසරේ වාර්තා වූ සියයට 0.5 සිට 2021 වසරේ දී සියයට 1.1ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ජනගහන වර්ධනයට වැඩිම දායකත්වයක් ලබා දෙන ලද්දේ බස්නාහිර පළාත විසින් වන අතර, දෙවන වැඩිම දායකත්වය නැගෙනහිර පළාතෙන් වාර්තා විය. මේ අතර, ජනගහන වර්ධනය සඳහා අඩුම දායකත්වය ලබා දෙන ලද්දේ ඌව සහ උතුරු පළාත් විසිනි. පෙර පැවති ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, 2021 වසරේ දී ද බස්නාහිර පළාත මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් ඉහළම කොටස වූ සියයට 28.1කට හිමිකම් කියන ලද අතර, පිළිවෙළින් මධ්‍යම සහ දකුණු පළාත් මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් සියයට 12.7කට සහ සියයට 12.2කට හිමිකම් කියන ලදී. මේ අතර, උතුරු පළාත 2021 වසරේ දී ද මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් අඩුම කොටස වූ සියයට 5.3කට හිමිකම් කියන ලදී. ජනගහන වර්ධනයට සමගාමීව, 2020 වසරේ වර්ග කිලෝමීටරයකට පුද්ගලයන් 350ක්ව පැවති ජන ඝනත්වය 2021 වසරේ දී වර්ග කිලෝමීටරයකට පුද්ගලයන් 353ක් දක්වා ඉහළ ගියේය. මෑත වසරවල පැවති ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, 2021 වසරේ දී ද කාන්තා ජනගහනය පිරිමි ජනගහනයට වඩා ඉහළ මට්ටමක පැවති අතර, වැඩිහිටි ජනගහනය පෙර පැවති සැලකිය යුතු ඉහළ මට්ටමේම පැවතුණි.

2.15 සංඛ්‍යා සටහන

පළාත් මට්ටමෙන් ජනගහනය සහ ජන ඝනත්වය (අ)(ආ)

පළාත	2020		2021	
	ජනගහනය පුද්ගලයන් '000	ජන ඝනත්වය	ජනගහනය පුද්ගලයන් '000	ජන ඝනත්වය
බස්නාහිර	6,165	1,716	6,219	1,731
මධ්‍යම	2,781	499	2,811	504
දකුණ	2,669	496	2,696	501
උතුර	1,152	139	1,165	141
නැගෙනහිර	1,746	187	1,783	190
වයඹ	2,563	341	2,592	345
උතුරු මැද	1,386	142	1,402	144
ඌව	1,387	166	1,400	168
සබරගමුව	2,070	421	2,088	424
මුළු එකතුව	**21,919**	**350**	**22,156**	**353**

(අ) තාවකාලික
(ආ) මධ්‍ය වාර්ෂික ජනගහන දත්ත 2012 ජන හා නිවාස සංගණනය මත පදනම් වේ.

මූලය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

2

ශ්‍රම බලකාය

ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය වන ශ්‍රම බලකාය,[6] 2020 වසරේ වාර්තා වූ මිලියන 8.467 සිට, සියයට 1.0ක වර්ධනයක් වාර්තා කරමින්, 2021 වසරේ දී මිලියන 8.553ක් දක්වා ඉහළ ගියේය. නාගරික, ග්‍රාමීය සහ වතු යන අංශ තුනෙහිම ශ්‍රම බලකාය ඉහළ යෑම මෙම වර්ධනයට හේතු විය. මේ අතර, නව රැකියා අවස්ථා සෙවීමට ඇති උනන්දුව අඩුවීම සහ කොවිඩ්-19 වසංගතය නිසා සාමාන්‍ය පරිදි ආර්ථික කටයුතු සිදු නොවීම හේතුවෙන් ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය ද 2020 වසරේ වාර්තා වූ මිලියන 8.273 සිට 2021 වසරේ දී මිලියන 8.581ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා ග්‍රාමීය අංශයේ, විශේෂයෙන්ම ග්‍රාමීය කාන්තාවන්, ආර්ථික කටයුතුවල යෙදීම අඩුවීම බොහෝ දුරට හේතු විය. ශ්‍රම බලකාය සහ ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය ඉහළ යෑම හේතුවෙන්, ශ්‍රම බලකාය සහ කුටුම්භ ජනගහනය අතර අනුපාතය වන ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය, 2020 වසරේ වාර්තා වූ සියයට 50.6 සිට 2021 වසරේ දී සියයට 49.9ක් දක්වා පහළ ගියේය. ඒ අනුව, 2020 වසරේ දී පිළිවෙලින් සියයට 71.9ක් සහ සියයට 32.0ක් ලෙස වාර්තා වූ පුරුෂ සහ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතික ද, 2021 වසරේ දී පිළිවෙලින් සියයට 71.0ක් සහ සියයට 31.8ක් දක්වා පහළ ගියේය. කෙසේ වුව ද, ස්ත්‍රී පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්ව පරතරය 2020 වසරේ වාර්තා වූ සියයට 39.8 සිට 2021 වසරේ දී සියයට 39.2ක් දක්වා පහළ යෑම යම් සාධනීය තත්ත්වයක් වුව ද, එය තවමත් කොවිඩ්-19 වසංගතයට පෙර පැවති මට්ටමට ළඟා වී නොමැත.

6 ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය, එනම් සලකා බලන සතියක කාලසීමාව තුළ වයස අවුරුදු 15 සහ ඊට වැඩි සේවා නියුක්ත සහ සේවා වියුක්ත ජනගහනය අයත් වේ.

2.16 සංඛ්‍යා සටහන

කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය (අ)

ශීර්ෂය	2020	2021 (ආ)				
		පළමු කාර්තුව	දෙවන කාර්තුව	තෙවන කාර්තුව	සිව්වන කාර්තුව	වාර්ෂික (ඇ)
කුටුම්බ ජනගහනය						
පුද්ගලයන් '000	**16,739**	**17,025**	**17,092**	**17,158**	**17,260**	**17,134**
ශ්‍රම බලකාය						
පුද්ගලයන් '000	**8,467**	**8,673**	**8,515**	**8,487**	**8,538**	**8,553**
සේවා නියුක්ත	7,999	8,181	8,082	8,044	8,146	8,114
සේවා වියුක්ත	468	492	432	444	392	440
ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඇ)	**50.6**	**50.9**	**49.8**	**49.5**	**49.5**	**49.9**
පුරුෂ	71.9	71.7	71.1	71.0	70.2	71.0
ස්ත්‍රී	32.0 (ඉ)	33.4	30.9	30.9	32.0	31.8

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය
(ආ) තාවකාලික
(ඇ) 2021 කාර්තු හතරෙහි සාමාන්‍යය
(ඈ) ශ්‍රම බලකාය, කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස
(ඉ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සේවා නියුක්තිය

සේවා නියුක්ත ජනගහනය[7] 2020 වසරේ වාර්තා වූ මිලියන 7.999 සිට 2021 වසරේ දී මිලියන 8.114ක් දක්වා ඉහළ ගිය ද, තවමත් කොවිඩ්-19 වසංගතයට පෙර පැවති සේවා නියුක්ති මට්ටමට ළඟා වී නොමැත. සේවා නියුක්තිය ඉහළ යෑමට කෘෂිකාර්මික හා සේවා කටයුතු වලට අදාළ රැකියා අවස්ථා ඉහළ යෑම හේතු විය. ඒ අනුව, කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය 2020 වසරේ වාර්තා වූ මිලියන 2.170 සිට 2021 වසරේ දී මිලියන 2.213ක් දක්වා ඉහළ ගිය අතර, සේවා අංශයේ සේවා නියුක්තිය 2020 වසරේ වාර්තා වූ මිලියන 3.677 සිට 2021 වසරේ දී මිලියන 3.791ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වුව ද, අඛණ්ඩව මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා මධ්‍යයේ, කර්මාන්ත අංශයේ සේවා නියුක්තිය 2020 වසරේ වාර්තා වූ මිලියන 2.153 සිට 2021 වසරේ දී මිලියන 2.109ක් දක්වා තවදුරටත් පහත වැටුණි. ඒ අනුව, කෘෂිකාර්මික හා සේවා අංශවලින් සමස්ත සේවා නියුක්තියට සපයන දායකත්වය 2020 වසරේ පිළිවෙලින් පැවති සියයට 27.1 සහ සියයට 46.0 සිට 2021 වසරේ දී පිළිවෙලින් සියයට 27.3ක් සහ සියයට 46.7ක් දක්වා ඉහළ ගිය අතර, කර්මාන්ත අංශයේ දායකත්වය 2020 වසරේ පැවති සියයට 26.9 සිට 2021 වසරේ දී සියයට 26.0ක් දක්වා පහත වැටුණි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණයට අනුව, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 2020 වසරේ වාර්තා වූ මිලියන 1.461ට සාපේක්ෂව 2021 වසරේ දී මිලියන 1.493ක් දක්වා ඉහළ ගියේය. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය

7 අදාළ යොමු කාලය තුළ සේවකයන්, සේවයයන් සහ තමාගේම වැඩ කටයුතු කරන්නන් හෝ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් ලෙස අවම පැයක්වත් ආර්ථික කටයුත්තක යෙදුන පුද්ගලයන් සේවා නියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි. මෙයට අදාළ යොමු කාලය තුළ ආර්ථික කටයුත්තක යෙදී නොසිටියත් එම ආර්ථික කටයුත්ත සමඟ විධිමත් බැඳීමක් ඇති පුද්ගලයන් ද අයත් වේ.

2.17 සංඛ්‍යා සටහන

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය

අංශය	2020 (අ)	2021 (ආ)	ප්‍රතිශත වෙනස 2021/2020 (ආ)
රාජ්‍ය (ඇ)	1,223,617	1,258,440	2.8
අර්ධ රාජ්‍ය (ඈ)	237,454	235,032	-1.0
සමස්ත රාජ්‍ය අංශය	**1,461,071**	**1,493,472**	**2.2**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මධ්‍යම රජය, පළාත් පාලන ආයතන සහ පළාත් සභා
(ඈ) රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය අධිකාරීන්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ලේකම් කාර්යාල, පළාත් සභා සහ අර්ධ රාජ්‍ය අයතනවල සේවා නියුක්තිකයන් මෙම සමීක්ෂණයට ඇතුළත් වේ. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය ඉහළ යෑම සඳහා රැකියා විරහිත උපාධිධාරීන් සහ බහුකාර්ය සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීම සහ සන්නද්ධ හා පොලිස් බලකා සහ සෞඛ්‍ය අංශවලට අදාළ බඳවා ගැනීම් හේතු විය. මේ අතර, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී රාජ්‍ය අංශයේ සේවකයන්, සේවායන් සහ තමාගේම වැඩ කටයුතු කරන්නන් කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති අතර, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පෞද්ගලික අංශයේ සමාගම්වලට මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා නිසා සේවකයන් සේවයෙන් ඉවත් කිරීම හේතු කොටගෙන පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය තවදුරටත් සුළු වශයෙන් පහත වැටුණි. එසේ වුව ද, සමස්ත සේවා නියුක්තියෙන් සියයට 42.0ක ඉහළම දායකත්වය දක්වමින් පෞද්ගලික අංශය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රැකියා උත්පාදන අංශය ලෙස අඛණ්ඩව 2021 වසරේ දී ද රැඳී සිටි අතර, තමාගේම වැඩ කටයුතු කරන්නන්ද සමස්ත සේවා නියුක්තියට සියයට 33.4ක දායකත්වයක් සපයන ලදී.

සේවා වියුක්තිය

නව රැකියා අවස්ථා උත්පාදනය වීම හේතුවෙන් සේවා වියුක්ති අනුපාතිකය 2020 වසරේ වාර්තා වූ සියයට 5.5 සිට 2021 වසරේ දී සියයට 5.1ක් දක්වා පහළ ගියේය. ඒ අනුව, සේවා වියුක්ත ජනගහනය[8] 2020 වසරේ වාර්තා වූ මිලියන 0.468 සිට 2021 වසරේ දී මිලියන 0.440ක් දක්වා පහළ ගියේය. පුරුෂ සහ ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතික ද 2020 වසරේ වාර්තා වූ පිළිවෙලින් සියයට 4.0 සහ සියයට 8.5 සිට 2021 වසරේ දී පිළිවෙලින් සියයට 3.7ක් සහ සියයට 7.9ක් දක්වා පහළ ගියේය. තවද, අ.පො.ස. උසස් පෙළ හා ඉන් ඉහළ කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය, 2020 වසරේ වාර්තා වූ සියයට 9.8 සිට 2021 වසරේ දී සියයට 9.1ක් දක්වා සැලකිය යුතු ලෙස පහළ ගියේය. කෙසේ වුව ද, ප්‍රවේශ මට්ටමේ රැකියා අවස්ථාවල තවදුරටත් ඇති හිඟකම පිළිඹිබු කරමින් තරුණ (අවුරුදු 15-24) සේවා වියුක්ති අනුපාතිකය 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 26.5හි නොවෙනස්ව පැවතුණි. තවද, 2021 වසරේ දී උත්පාදනය වූ නව රැකියා අවස්ථා සංඛ්‍යාව 2020 වසරේ සහ 2021 වසරේ සිදු කරන ලද සේවා අත්හිටුවීම් සංඛ්‍යාවට වඩා පහළ මට්ටමක පැවති බැවින් සමස්ත සේවා වියුක්ති අනුපාතිකය වසංගතයට පෙර පැවති මට්ටමට වඩා ඉහළ අගයක පැවතුණි.

විදේශ සේවා නියුක්තිය

2021 වසරේ අග භාගයේ දී සිදු වූ කැපී පෙනෙන වර්ධනය හේතුවෙන් විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් 2020 වසරේ වාර්තා වූ 53,711 සිට 2021 වසරේ දී 121,795ක් දක්වා සියයට 126.8ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, 2021 වසරේ අවසාන කාර්තුවේ 61,447ක් ලෙස වාර්තා වූ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සංඛ්‍යාව 2016 වසරේ තෙවන කාර්තුවෙන් පසු වාර්තා වූ ඉහළම අගයයි. විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්වල මෙම කැපී පෙනන ඉහළ යෑමට ශ්‍රමය ලබා ගන්නා රටවල සංචරණ සීමා ලිහිල් කිරීම හා රැකියා අවස්ථා ඉහළ යෑම, රැකියා සඳහා විදෙස්ගත වීමට අපේක්ෂිත පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් සිටීම සහ රැකියා සඳහා විදෙස්ගත වීමට බලාපොරොත්තුවෙන් සිටි පුද්ගලයන් කඩිනමින් එන්නත්කරණය කිරීම හේතු විය. ඒ අනුව, සමස්ත විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්

8 රැකියාවක් සොයන හා රැකියාවක් නොකළ සහ පසුගිය සති හතරක කාලය තුළ රැකියාවක් සෙවීමට යම් පියවරක් ගත් හා ඉදිරි සති දෙක තුළ රැකියාවක් ලැබුණහොත් භාරගැනීමට හැකියාවක් ඇති පුද්ගලයන් සේවා වියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි.

2.15 රූප සටහන
සේවා වියුක්ති අනුපාතිකය (%)



(අ) 2021 කාර්තු හතරෙහි සමාන්‍යය

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2.16 රූප සටහන
නිපුණතා කාණ්ඩ අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්



මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

2

2.17 රූප සටහන
ප්‍රධාන ගමනාන්ත අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්



මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

සඳහා පුරුෂ පිටත්ව යෑම් සියයට 66.2කින් ද කාන්තා පිටත්ව යෑම් 33.8කින් ද දායක විය. විදේශ රැකියා සඳහා සමස්ත පිටත්ව යෑම් සංඛ්‍යාව ඉහළ යෑමට සමගාමීව, වෘත්තීය, මධ්‍යම මට්ටම, ලිපිකරු හා ඒ ආශ්‍රිත, පුහුණු, අර්ධ පුහුණු, නුපුහුණු සහ ගෘහ සේවිකා යන සියලුම කාණ්ඩ යටතේ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් ඉහළ ගිය අතර, එහිදී පුහුණු, නුපුහුණු සහ ගෘහ සේවිකා යන කාණ්ඩවලින් ඉහළ දායකත්වයක් ලැබුණි. කටාර්, සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය සහ කුවේටය යන රටවලට සියයට 87.7ක් ඇතුළුව විදේශ රැකියා සඳහා සමස්ත පිටත්ව යෑම්වලින් සියයට 84.8කට දායක වෙමින් මැදපෙරදිග කලාපය 2021 වසරේ දී ද විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සම්බන්ධයෙන් පෙරමුණේ රැඳී සිටියේය. මේ අතර, 2022 වසරේ පළමු කාර්තුවේ දී තවදුරටත් දක්නට ලැබුණු වර්ධනයන් මධ්‍යයේ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්වල සැලකිය යුතු වර්ධනයක් 2022 වසරේ දී අපේක්ෂා කෙරේ.

ශ්‍රම ඵලදායිතාවය

වැඩ කරන ලද පැයකට එකතු කළ අගය (2010 මිල අනුව) වශයෙන් මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව, 2020 වසරේ[9] වාර්තා වූ රුපියල් 577.36 සිට 2021 වසරේ දී රුපියල් 562.15ක් දක්වා සියයට 2.6කින් පහළ ගියේය. කෘෂිකාර්මික, කර්මාන්ත සහ සේවා යන අංශ තුනෙහිම එකතු කළ අගයන් 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ඉහළ යෑමක් පෙන්නුම් කළ ද, 2021 වසරේ පැවති ලිහිල් සංචරණ සීමා හේතුවෙන් වැඩ කරන ලද පැය ගණන සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, මේ හේතුවෙන් සමස්ත ශ්‍රම ඵලදායිතාව සුළු වශයෙන් පහළ ගියේය. ඒ අනුව, කෘෂිකාර්මික, කර්මාන්ත සහ සේවා අංශවල ශ්‍රම ඵලදායිතාවන් පිළිවෙලින් 2020 වසරේ වාර්තා වූ වැඩ කරන ලද පැයකට පිළිවෙලින් රුපියල් 178.37, රුපියල් 611.90 සහ රුපියල් 764.25 සිට 2021 වසරේ දී පිළිවෙලින් රුපියල් 175.64, රුපියල් 598.78 සහ රුපියල් 734.94 දක්වා පහළ ගියේය. ශ්‍රම ඵලදායිතා මට්ටම් අනුව, සේවා අංශය, ශ්‍රම සම්පත් වඩාත් කාර්යක්ෂමව භාවිතා කර ඇති අංශය වශයෙන් වාර්තා වූ අතර, කර්මාන්ත අංශය දෙවන ඉහළම ශ්‍රම ඵලදායිතා මට්ටම වාර්තා කළ අංශය ලෙසත්, කෘෂිකාර්මික අංශය අවම ශ්‍රම ඵලදායිතා මට්ටම වාර්තා කළ අංශය ලෙසත් වාර්තා විය.

9 2020 වසරේ සිදු වූ ශ්‍රම ඵලදායිතාවයේ සැලකිය යුතු ඉහළ යෑමට හේතු වූයේ කොවිඩ්-19 වසංගතය පැතිරීම වැලැක්වීම සඳහා පනවන ලද සංචරණ සීමා හේතුවෙන් වැඩ කරන ලද පැය ගණනෙහි සිදු වූ සැලකිය යුතු අඩු වීම වේ.

2.18 සංඛ්‍යා සටහන
විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්

විදේශ සේවා නියුක්තිය	2019		2020 (අ)		2021 (ආ)	
	සංඛ්‍යාව	දායකත්වය %	සංඛ්‍යාව	දායකත්වය %	සංඛ්‍යාව	දායකත්වය %
මුළු විදේශ රැකියා සංඛ්‍යාව	**203,087**	**100.0**	**53,711**	**100.0**	**121,795**	**100.0**
මූලයන් අනුව						
ලියාපදිංචි නියෝජිතයන්	69,278	34.1	18,065	33.6	42,012	34.5
වෙනත්	133,809	65.9	35,646	66.4	79,783	65.5
ස්ත්‍රී/පුරුෂ අනුව						
පුරුෂ	122,257	60.2	32,500	60.5	80,670	66.2
ස්ත්‍රී	80,830	39.8	21,211	39.5	41,125	33.8
ශ්‍රම කාණ්ඩය අනුව						
වෘත්තීය	9,861	4.9	2,957	5.5	8,309	6.8
මධ්‍යම මට්ටම	5,725	2.8	1,496	2.8	4,216	3.5
ලිපිකරු හා ඒ ආශ්‍රිත	9,163	4.5	2,496	4.6	6,495	5.3
පුහුණු	62,711	30.9	16,664	31.0	39,971	32.8
අර්ධ පුහුණු	2,950	1.5	789	1.5	1,908	1.6
නුපුහුණු	51,188	25.2	13,987	26.0	31,497	25.9
ගෘහ සේවිකා	61,489	30.3	15,322	28.5	29,399	24.1

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

3

ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්

3.1 සමස්ත නිරීක්ෂණ

තව වෛරස ප්‍රභේද වර්ධනය වීමත් සමඟ කොවිඩ්-19 වසංගතය දිගු කාලයක් පුරා ව්‍යාප්ත වීම හමුවේ, ජනතාවගේ සමාජ ආර්ථික යහපැවැත්ම සහතික කරන අතර, ආර්ථික කටයුතු පවත්වා ගෙන යෑමට රටෙහි පවතින ආර්ථික හා සමාජ යටිතල පහසුකම් පද්ධතිය අඛණ්ඩව පහසුකම් සැපයුවේය. ගෝලීය ඉල්ලුම යථා තත්ත්වයට පත්වීම සහ සැපයුම ඉහළ යෑම සීමාවීම හේතුවෙන් ගෝලීය වෙළඳපොළ බලශක්ති මිල ගණන් ඉහළ යෑම 2021 වසර තුළ පැවති ප්‍රධානතම අභියෝගයක් වූ අතර, නැගෙනහිර යුරෝපා කලාපයේ පවතින භූ දේශපාලනික අර්බුදයත් සමඟ මෙම මිල ඉහළ යෑමේ ප්‍රවණතාව තවදුරටත් වඩාත් අයහපත් වෙමින් පවතී. ඒ අනුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.සං.) 2021 වසරේ දී දෙවතාවක් මිල සංශෝධන සිදු කළ ද, ගෝලීය මිල ගණන් තවදුරටත් ඉහළ යෑම මෙන්ම, ශ්‍රී ලංකා රුපියල 2022 වසරේ මුල් කාලයේ දී තියුණු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් මෙම මිල සංශෝධන ප්‍රමාණවත් නොවීය. ඒ හේතුවෙන් 2022 වසරේ මුල් කාලයේ දී තියුණු ලෙස මිල ගණන් ඉහළ නංවමින් නැවතත් මිල සංශෝධනයක් කිරීමට සිදු විය. පිරිවැය පිළිබිඹු වන පරිදි මිල ගණන් සහ ගාස්තු සඳහා ගැළපීම් නිසි කලට සිදු නොකිරීම හේතුවෙන් බලශක්ති ක්ෂේත්‍රයේ රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායයන්හි මූල්‍ය තත්ත්වය අඛණ්ඩව දුර්වල මට්ටමක පැවතිණි. රජය සතු මෙම වාණිජ ව්‍යවසායයන්වල දිගුකාලීනව පවතින මූල්‍ය ගැටලු සහ විදේශ විනිමය ගලා ඒම් දුර්වල වීම හේතුවෙන් එය රටේ බලශක්ති අර්බුදයක් දක්වා නිර්මාණය වී ඇති අතර, එමගින් පශ්චාත් කොවිඩ්-19 වසංගත අවධිය තුළ ආර්ථිකය යළි නැගී සිටීමට දරන ප්‍රයත්නයට සැලකිය යුතු අන්දමේ අහිතකර බලපෑමක් ඇති කරයි. රටේ සමාජ ආර්ථික යටිතල පහසුකම් පද්ධතිය සඳහා වූ ආයෝජනවල වැදගත්කම හඳුනාගනිමින්, රජය ග්‍රාමීය-නාගරික සබඳතා සහ වාසස්ථානවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම ඉලක්ක කරගත් ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාවට නැංවීය. කොළඹ වරාය නගර ව්‍යාපෘතියට සහ ඛනිජ තෙල් සම්පත් ගවේෂණයට අදාළ නීති බලාත්මක කිරීම, අපද්‍රව්‍ය බලශක්තියට හැරවීමේ පළමු ව්‍යාපෘතිය කෙරවලපිටියෙහි ආරම්භ කිරීම, සහ 2022 වසරේ ජනවාරි මාසයේදී මධ්‍යම අධිවේගී මාර්ගයේ තවත් කොටසක් විවෘත කිරීමෙන් අනතුරුව නව කැළණි පාලම විවෘත කිරීම ආදිය වසර තුළ දී සිදු කෙරුණු ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් විය. මෙම භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම් මධ්‍යයේ, සෞඛ්‍ය සහ අධ්‍යාපන සේවා සැපයීමට ද රජය අඛණ්ඩව කැපවූ අතර, කොවිඩ්-19 වසංගතය මගින් ජනතාවට ඇතිවූ කෙටි කාලීන සහ දිගු කාලීන බලපෑම් අවම කිරීමෙහිලා ඉන් විශාල කාර්යය භාරයක් ඉටු වී ඇතැයි අපේක්ෂා කෙරේ. බෝනොවන රෝග සහ ඩෙංගු වැනි වෙනත් බෝවන රෝග මගින් ඇති කළ අභියෝග මධ්‍යයේ, කොවිඩ්-19 වසංගතය ආරම්භයේ සිටම පරීක්ෂණ පහසුකම්, ප්‍රතිකාර සහ නිරෝධායන පහසුකම් සැපයීම පමණක් නොව විශේෂයෙන්ම, කොවිඩ්-19 එන්නත සහ වර්ධක මාත්‍රා ලබා දීමේ වැඩසටහන් නිසි කාලයේ දී ක්‍රියාත්මක කිරීම තුළින් කොවිඩ්-19 ව්‍යාප්තිය මැඩපැවැත්වීම සඳහා සෞඛ්‍ය අංශය මූලිකත්වය ගෙන කටයුතු කළේය. රටේ විදුලි සංදේශ අංශයෙන් ලද සහායත් සමඟ, අධ්‍යාපන ක්ෂේත්‍රය මංගත අධ්‍යාපන ක්‍රමය 'නව සාමාන්‍යකරණ' තත්ත්වයට අනුගත වී ඇති බව දක්නට ලැබෙන අතර, විශේෂයෙන්ම තාක්ෂණික උපාංග හිමිකාරීත්වය අඩු සහ ඒ ආශ්‍රිත සාක්ෂරතාව පහළ මට්ටමක පවතින ග්‍රාමීය සහ වතු අංශයේ පවුල්වල මෙන්ම, දුර්වල අන්තර්ජාල පහසුකම් සහිත දුෂ්කර ප්‍රදේශවල අධ්‍යාපනික ප්‍රතිඵලවල ගුණාත්මකභාවයට අදාළ ගැටලු තවදුරටත් අඛණ්ඩව පවතී. රාජ්‍ය මූල්‍ය

අවකාශය සීමා වීම මධ්‍යයේ, අඛණ්ඩව දෙවන වසර සඳහාත් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අවදානමට ලක්ව ඇති කුටුම්භ සහ පුද්ගලයින් සඳහා දීමනා ගෙවීමට සහ සහන ක්‍රියාමාර්ග සැලසීමට රජය පියවර ගත්තේය. දිගු කාලයක් මුළුල්ලේ පවතින වසංගතය සහ ඉන් ඇති කෙරෙන බලපෑම් හේතුවෙන් ජනගහනය තුළ දරිද්‍රතා මට්ටමට ආසන්නයේ සිටින සහ කොවිඩ්-19 හේතුවෙන් හෝ වෙනත් හේතුවකින් ආර්ථික ක්‍රියාකාරිත්වයට තවදුරටත් ඇතිවන ඕනෑම බාධාවක් මගින් අවදානමකට පත්වීමේ ඉහළ හැකියාවක් සහිත කණ්ඩායම් තුළින් 'නව දුගී' කාණ්ඩයක් නිර්මාණය වීමේ හැකියාවක් ඇති බව දරිද්‍රතාවට අදාළ දත්ත මගින් පිළිබිඹු කෙරේ. සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශයක් තුළ රටේ පවතින ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සඳහා වන ආයෝජන ඉතා අභියෝගාත්මක විය හැකි අතර, පසුගිය දශක කිහිපය තුළ පත් වූ රජයන් විසින් සිදුකළ යටිතල පහසුකම් ආයෝජන මගින් කොවිඩ්-19 වසංගතයෙහි දැඩි බලපෑම්වලින් ව්‍යාපාර, පවුල් සහ පුද්ගලයින් බොහෝ දුරට ආරක්ෂා කරගැනීමට ශ්‍රී ලංකාවට හැකි වී ඇති බව පිළිගත යුතුය. කෙසේ වෙතත්, එවැනි ආයෝජනවල කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා කෙටි කාලීන ගැටලු නිරාකරණය කිරීම පමණක් නොව, මැදි කාලීනව තිරසාර පදනමකින් යුතුව ආර්ථිකයේ ඵලදායී විභවතාව ගොඩනැංවීම අරමුණු කරගත් ඉදිරි දැක්මකින් යුතු හා සියලු පැතිකඩ ආවරණය කෙරෙන ප්‍රතිපත්ති සැකසීමට රාජ්‍ය සහ පෞද්ගලික අංශය ඇතුළු අංශ අතර බහු පාර්ශ්වීය සහයෝගය දිරිමත් කිරීම සඳහා රජය විසින් පියවර ගැනීම අවශ්‍ය වේ. මෙම ප්‍රතිපත්ති, කම්පන සහ විචලතාවන් සඳහා ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමෙහිලා අත්‍යවශ්‍ය වන අතර, එමගින් ආර්ථිකයේ තිරසාර ප්‍රගතිය, සැමට ප්‍රතිලාභ හිමිවන ඉහළ වර්ධන මාවතක් කරා යොමුවීම සහතික කෙරෙනු ඇත.

3

3.2 ආර්ථික යටිතල පහසුකම් ප්‍රතිපත්ති, ආයතනික රාමුව සහ ක්‍රියාකාරිත්වය

බනිජ තෙල්

කොවිඩ්-19 වසංගතය නැවත හිස එසවීමත් සමඟ බොරතෙල් මිල ගණන් ඉහළ යෑම කෙරෙහි ඇති වූ පීඩනය යම්කිසි දුරකට අඩු වුවද, ගෝලීය ආර්ථික වර්ධනය ස්ථාවරව යථා තත්ත්වයට පත් වීම මෙන්ම සැපයුම් තත්ත්වයන් සීමා වීම හේතුවෙන්, ගෝලීය බොරතෙල් මිල ගණන් 2021 වසරේ දී ශීඝ්‍රයෙන් ඉහළ ගියේය. කොවිඩ්-19 වසංගතයෙහි බලපෑමෙන් සිදු වූ ගෝලීය ඉල්ලුම පහළ යෑම හේතුවෙන්, බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය 2020 වසරේ දී එ.ජ. ඩොලර් 43.35ක් ලෙස පැවතියද, ගෝලීය ආර්ථිකය යළි යථා තත්ත්වයට පත්වීම ආරම්භ වීම මෙන්ම, වසංගතය ආශ්‍රිතව පැවති සංචරණ සීමා ලිහිල් කිරීමත් සමඟම ජාත්‍යන්තර වෙළඳපොළ බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය 2021 වසරේ දී එ.ජ. ඩොලර් 70.80ක් දක්වා සියයට 63.3කින් ඉහළ ගියේය. 2020 වසරේ මැද භාගයේ දී ආරම්භ වූ ගෝලීය බොරතෙල් මිල ගණන් යථා තත්ත්වයට පත් වීම ක්‍රමයෙන් වේගවත් වී, 2021 වසරේ මාර්තු මාසය වන විට වසංගතයට පෙර පැවති මට්ටම් කරා ළඟා වූ අතර, වසර හතක කාලය තුළ වාර්තා කළ ඉහළම මිල මට්ටමක් 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී වාර්තා කළේය. වෙස්ට් ටෙක්සාස් ඉන්ටර්මීඩියට් (ඩබ්.ටී.අයි) බොරතෙල් මිල ගණන් ද ඉහළ යන ප්‍රවණතාවක පැවති අතර, 2020 වසරේ දී එ.ජ. ඩොලර් 39.78ක් ලෙස පැවති බැරලයක මිලට සාපේක්ෂව 2021 වසරේ දී බැරලයක සාමාන්‍ය මිල එ.ජ. ඩොලර් 67.94ක් ලෙස වාර්තා විය. ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමේ ක්‍රියාවලිය සම්බන්ධව ඇති සුභවාදී අපේක්ෂා සහ බනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය (ඔපෙක්) හා එහි මිත්‍ර රටවල් විසින් පවත්වාගෙන යනු ලබන ගෝලීය තෙල් සැපයුම් කොන්දේසි දැඩි වීම මධ්‍යයේ ගෝලීය ඉල්ලුම ඉහළ යෑම, ගෝලීය බොරතෙල් මිල ඉහළ යෑමට මූලික වශයෙන් හේතු විය. කොවිඩ්-19 වසංගතයේ නැවත ව්‍යාප්තිය සමඟ පැන නැගුණු ඉල්ලුම් සම්බන්ධ අවිනිශ්චිතතාවන් සහ වෛරසයේ නව ප්‍රභේද හේතුවෙන් සිදුවන තාවකාලික අගුලු දැමීම් සහ සංචරණ සීමා ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් බොරතෙල් මිල ගණන් පහළ ගිය කෙටි කාල සීමාවන් දක්නට ලැබුණි. රුසියාව සහ යුක්‍රේනය අතර පවතින භූ දේශපාලනික ගැටුම් මධ්‍යයේ, සැපයුම තවදුරටත් සීමා විය හැකි වන බවට වූ අපේක්ෂාවන් හේතුවෙන් ගෝලීය බොරතෙල් මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, 2008 වසරේ ජූලි මාසයෙන් පසු ප්‍රථම වතාවට 2022 වසරේ මාර්තු මාසයේ දී බැරලයක මිල එ.ජ. ඩොලර් 140ක් දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. ගෝලීය බොරතෙල් මිල ගණන්වල ඉහළ යෑමේ ප්‍රවණතාවට අනුව, ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.බ.නී.සං.) විසින් ආනයනය කරන ලද බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය, 2020 වසර තුළ වාර්තා වූ එ.ජ. ඩොලර් 45.57ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් 68.86ක් දක්වා සියයට 51.1කින් ඉහළ ගියේය.

වසර එකහමාරකට වැඩි කාලයකට පසුව 2021 වසරේ දී රජය විසින් ප්‍රධාන බනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය සිල්ලර මිල ගණන් ඉහළ දැමීම සඳහා ගෝලීය

3.1 රූප සටහන

ආර්ථික හා සමාජ යටිතල පහසුකම්වල ක්‍රියාකාරිත්වය



3.2 රූප සටහන
ගෝලීය බොරතෙල් මිල ගණන්වල ප්‍රවණතා



මූලය: බ්ලූම්බර්ග් තොරතුරු සේවය

3

බොරතෙල් මිල ගණන් අඛණ්ඩව ඉහළ යෑම හේතු විය. ඒ අනුව, ලං.බ.නී.සං. 2021 වසරේ ජූනි සහ දෙසැම්බර් මාසවලදී දේශීය මිල ගණන් ඉහළ දමමින් මිල සංශෝධන කළ අතර, පසුව 2022 වසරේ මාර්තු මාසයේ දී සැලකිය යුතු ලෙස මිල ගණන් ඉහළ දැමීය. ලංකා අයිඕසී පොදු සීමිත සමාගම (LIOC) 2021 වසරේ දී ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය සිල්ලර මිල ගණන් අවස්ථා තුනකදී සංශෝධනය කළ අතර, පසුව 2022 වසරේ පෙබරවාරි මාසයේ දී අවස්ථා දෙකකදී ද, 2022 වසරේ මාර්තු මාසයේ දී තවත් අවස්ථා දෙකකදී සැලකිය යුතු ලෙස මිල සංශෝධන කළේය. මෙම ආයතන දෙක විසින්ම 2022 වසරේ මාර්තු මාසයේ දී සිදු කරන ලද මිල සංශෝධන ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම මිල සංශෝධනයන් වූ අතර, එම මිල සංශෝධන ගෝලීය බොරතෙල් මිලෙහි ශීඝ්‍ර ඉහළ යෑම සහ 2022 වසරේ මාර්තු මාසය ආරම්භයේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය කැපී පෙනෙන ලෙස අවප්‍රමාණය වීමේ බලපෑම ආවරණය වන ලෙස සිදු කර ඇත. සියලුම පාර්ශ්වකරුවන් අතර, විශේෂයෙන්ම පාරිභෝගිකයන් අතර මිල ගණන් සම්බන්ධයෙන් විනිවිදභාවය වර්ධනය කරන සහ එමගින් මිල ගණන් සංශෝධන පිළිබඳ පොදු ජනතාවගේ පිළිගැනීම ද ඇති කළ හැකි, පිරිවැය පිළිබිඹු කෙරෙන මිල යාන්ත්‍රණයක් කඩිනමින් ආයතනගත කිරීමේ අවශ්‍යතාව මෙමගින් නැවත අවධාරණය කරයි. එවැනි මිල සංශෝධන මගින් රටේ පොදු මිල මට්ටමට කෙටි කාලීන බලපෑමක් එල්ල විය හැකි වුවද, මැදි කාලීනව ලං.බ.නී.සං.හි මූල්‍ය ශක්‍යතාව සහතික කිරීමටත්, එමගින් සාර්ව ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කිරීමටත්, එවැනි මිල යාන්ත්‍රණයක් අත්‍යවශ්‍ය වේ. ගෝලීය සහ දේශීය වෙළඳපොළවල සිදුවන අඛණ්ඩ වර්ධනයන් පිළිබඳව නිසි සැලකිල්ල යොමු කරමින්, ඉදිරි දැක්මකින් යුතු සහ උපායමාර්ගික සැලසුම්කරණයක් නොමැතිවීම, දේශීය වෙළඳපොළට අඛණ්ඩ ඉන්ධන සැපයුමක් ලබාදීමට නොහැකිවීම සඳහා හේතු වී ඇති අතර, එය වර්තමානයේ හටගෙන ඇති අර්බුදය සඳහා කිසියම් දුරකට බලපා ඇති බව නැවත අවධාරණය කළ යුතු වේ. මිලකරණයට මෙන්ම ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාළව පාරදෘශ්‍යභාවයක් පැවතීම, ලං.බ.නී.සං.හි තිරසාර භාවයට සහ ශක්‍යතාවය සඳහා අත්‍යවශ්‍ය වේ.

වසර තුළ දී, විදුලිබල අංශය සඳහා වූ විකුණුම් පහළ යෑම හේතුවෙන්, දේශීය වෙළෙඳපොළ තුළ සමස්ත ඛනිජ තෙල් නිෂ්පාදිත අලෙවිය තවදුරටත් සියයට 7.7කින් පහත වැටුණි. කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වූ අප්‍රේල් සහ අගෝස්තු යන මාසවල දී ඇතැම් ආර්ථික කටයුතු කරගෙන යෑමට ඉඩ ලබා දීම හේතුවෙන්, 2021 වසර තුළ ආර්ථික ක්‍රියාකාරකම්වල පිබිදීමක් සිදු විය. ඒ අනුව, ලං.බ.නී.සං. මගින් ප්‍රවාහන, කාර්මික සහ ගුවන් සේවා යන අංශ වෙත අලෙවි කළ ඛනිජ තෙල් නිෂ්පාදිත ප්‍රමාණය, පිළිවෙළින්, සියයට 10.4කින්, සියයට 39.5කින් සහ සියයට 18.6කින් වර්ධනය විය. මේ අතර, ජලාශවල පැවති හිතකර ජල මට්ටම් සමඟ ජලවිදුලි උත්පාදනය කෙරෙහි වැඩි වශයෙන් යොමු වීම හේතුවෙන්, විදුලිබල උත්පාදනය සඳහා අවශ්‍ය ඩීසල් සහ දැවි තෙල් අලෙවිය, පිළිවෙළින්, සියයට 23.2කින් සහ සියයට 35.9කින් කැපී පෙනෙන ලෙස පහළ ගිය අතර, එමගින් ලං.බ.නී.සං.හි සමස්ත විකුණුම් කාර්ය සාධනය පහළ ගියේය.

2021 වසර තුළ දී සපුගස්කන්ද පිරිපහදුව විවිධ අවස්ථාවල දී වසා දැමීම හේතුවෙන් පිරිපහදු නිෂ්පාදනය සමස්තයක් වශයෙන් සියයට 24.7ක පහළ යෑමක් වාර්තා කළේය. 2021 වසරේ පෙබරවාරි මස මැද භාගයේ සිට මාස දෙකකට ආසන්න කාලයක් සාමාන්‍ය නඩත්තු කටයුතු සඳහා පිරිපහදුව වසා දැමීමෙන් අනතුරුව, පිරිපහදු කටයුතු සඳහා බොරතෙල් නොමැතිවීම හේතුවෙන් 2021 වසරේ නොවැම්බර් මාසයේ දී පිරිපහදුව සති තුනක කාලයක් සඳහා නැවත වසා දැමිණි. එමනිසා, සමස්ත බොරතෙල් යෙදවුම් ප්‍රමාණය සියයට 24.5කින් පහළ ගිය අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ ඩීසල්, පෙට්‍රල්, දැවි තෙල් සහ නැප්තා වැනි ප්‍රධාන නිෂ්පාදිතවල පිරිපහදු නිෂ්පාදනය, පිළිවෙළින්, සියයට 31.1කින්, සියයට 24.5කින්, සියයට 22.9කින් සහ සියයට 31.9කින් පහළ ගියේය. ලං.බ.නී.සං. විසින් පිරිපහදු කළ නිෂ්පාදිත ආනයනය කිරීම හරහා මෙම නිෂ්පාදන

හිඟයන් පූරණය කරන ලද අතර, එම ආනයන වසර තුළ දී සියයට 15.2කින් ඉහළ ගොස් ඇත.

දේශීය ඛනිජ තෙල් මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ නැංවුවද, ලං.ඛ.නී.සං.හි මූල්‍ය කාර්ය සාධනය 2021 වසරේ දී තවදුරටත් දුර්වල විය. ගෝලීය බොරතෙල් මිල ගණන්වල තියුණු ඉහළ යෑමට අනුකූලව මිල සංශෝධන ප්‍රමාද වීම හා ප්‍රමාණවත් නොවීම පිළිබිඹු කරමින්, විගණනය නොකළ තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ලං.ඛ.නී.සං. පෙර වසරේ වාර්තා කළ රුපියල් බිලියන 33.9ක මෙහෙයුම් ලාභයට සාපේක්ෂව, 2021 වසරේ දී රුපියල් බිලියන 41.7ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය. 2021 වසරේ දී ප්‍රවාහනය සහ විදුලිබල උත්පාදනය යන ප්‍රධාන අංශ වෙත අලෙවි කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදිතවලින් මෙහෙයුම් අලාභ සිදු වූ අතර, ගුවන් සේවා සහ කර්මාන්ත අංශවලට අලෙවි කරන ලද ඛනිජ තෙල් නිෂ්පාදිතවලින් මෙහෙයුම් ලාභ ඉපැයිණි. කෙසේ වෙතත්, 2021 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් ලං.ඛ.නී.සං.ට රුපියල් බිලියන 33.2ක සැලකිය යුතු විනිමය අනුපාත විචල්‍යතා අලාභයක් ඇති වූ අතර, එමගින් ලං.ඛ.නී.සං.හි සමස්ත ලාභයට (බදුවලට පෙර) සෘණාත්මක බලපෑමක් ඇති කරමින්, පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 2.4ක ලාභයට සාපේක්ෂව 2021 වසර තුළ දී රුපියල් බිලියන 82.2ක අලාභයක් වාර්තා විය. මේ අතර, ලං.ඛ.නී.සං. විසින් බැංකු අංශයෙන් ලබා ගත් ණය ප්‍රමාණය 2021 වසරේ දී රුපියල් බිලියන 505.3ක් දක්වා රුපියල් බිලියන 123.5කින් ඉහළ ගිය අතර, දේශීය බලපත්‍රලාභී වාණිජ බැංකුවල පැවති ලං.ඛ.නී.සං.ට අයත් තැන්පතු ප්‍රමාණය 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 140.1ක් දක්වා රුපියල් බිලියන 76.2කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) සහ ශ්‍රීලංකන් ගුවන් සේවයෙන් අයවිය යුතු ණය ඉහළ යෑම හේතුවෙන් රාජ්‍ය ආයතනවලින් ලං.ඛ.නී.සං.ට අයවිය යුතු සමස්ත හිඟ ණය මුදල, 2020 වසරේ පැවති රුපියල් බිලියන 142.7ක සිට 2021 වසර තුළ දී රුපියල් බිලියන 161.1ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, 2021 වසර අවසානයේ දී, ලං.වි.ම. හා ශ්‍රීලංකන් ගුවන් සේවය වෙතින් අය විය යුතු හිඟ මුදල, ලං.ඛ.නී.සං. වෙත අය විය යුතු සමස්ත හිඟ මුදලින් සියයට 90.1ක් පමණ විය. විදේශ විනිමය ගලා ඒම් හිඟවීමත් සමඟ ලං.ඛ.නී.සං.හි දුර්වල මූල්‍ය තත්ත්වයත් හේතුවෙන් නිසි කලට සහ පිරිවැය ඵලදායී ලෙස ඉන්ධන ප්‍රසම්පාදනය කර ගැනීම කෙරෙහි බාධා ඇති විය. නිසි කලට ඉන්ධන ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් සහ ලං.ඛ.නී.සං. ණය සඳහා රාජ්‍ය බැංකු ද්විත්වය මත පමණක් පදනම් වීම අවම කිරීමේ අරමුණින්, 2022 වසරේ ජනවාරි මාසයේ දී, ඉන්ධන මිලදී ගැනීමට අත්‍යවශ්‍ය ආනයන බිල්පත් සඳහා මූල්‍ය සම්පාදනය බලපත්‍රලාභී බැංකු අතර, ඔවුන්ගේ විදේශ විනිමය ප්‍රවාහයට සමානුපාතිකව බෙදා හැරීමට ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත් විය. 2022 වසරේ මුල් භාගයේ දී, විශේෂයෙන්ම, ඉන්දියාවෙන් පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත මිලදී ගැනීම සඳහා ඉන්දියානු අපනයන-ආනයන බැංකුව වෙතින් එ.ජ. ඩොලර් මිලියන 500ක කෙටි කාලීන ණයක් ලබා ගැනීමට රජය විසින් පියවර ගන්නා ලදී.

මූල්‍යමය වශයෙන් පිරිමැසුම්දායක ආකාරයෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා ලං.ඛ.නී.සං. විසින් ඒකාග්‍ර ප්‍රයත්නයක්

3.3 රූප සටහන
දේශීය ඛනිජ තෙල් මිල සංශෝධන
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව



මූලය: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

3.4 රූප සටහන
දේශීය ඛනිජ තෙල් මිල සංශෝධන
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම



මූලය: ලංකා අයිඕසී පොදු සීමිත සමාගම

3.5 රූප සටහන
ප්‍රවාහන අංශය සඳහා පෙට්‍රල් සහ ඩීසල් අලෙවිය



මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම

3.1 සංඛ්‍යා සටහන
ඛනිජ තෙල් අංශයේ ක්‍රියාකාරිත්වය

ශීර්ෂය		2020 (අ)	2021 (ආ)	වර්ධන අනුපාතය % 2020(අ)	2021(ආ)
ආනයනය කළ ප්‍රමාණය (මෙ.ටො. '000)					
බොරතෙල්		1,667	1,182	-9.5	-29.1
පිරිපහදු නිෂ්පාදිත		4,028	4,553	-15.0	13.0
ගල් අඟුරු		2,600	2,206	8.8	-15.1
එල්.පී. ගෑස්		437	422	1.7	-3.3
දේශීය එල්.පී. ගෑස් නිෂ්පාදනය (මෙ.ටො.'000)		25	17	-6.4	-34.1
ආනයන වටිනාකම (මි.ර.ගැ.)					
බොරතෙල්	(රු.මිලියන)	107,665	123,865	-38.0	15.0
	(එ.ජ.ඩො. මිලියන)	583	625	-39.9	7.2
පිරිපහදු නිෂ්පාදිත	(රු. මිලියන)	321,818	564,681	-33.4	75.5
	(එ.ජ.ඩො. මිලියන)	1,742	2,840	-35.6	63.0
ගල් අඟුරු	(රු.මිලියන)	40,194	55,118	3.8	37.1
	(එ.ජ.ඩො. මිලියන)	217	278	1.3	27.8
එල්. පී. ගෑස්	(රු.මිලියන)	43,812	64,436	1.5	47.1
	(එ.ජ.ඩො. මිලියන)	236	324	-2.2	37.2
බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල (මි.ර.ගැ.)					
	(රු./බැරල්)	8,415	13,645	-31.6	62.2
	(එ.ජ.ඩො./බැරල්)	45.57	68.86	-33.8	51.1
ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන ප්‍රමාණය	(මෙ.ටො. '000)	798	853	-18.9	7.0
ඛනිජ තෙල් ආශ්‍රිත අපනයන වටිනාකම	(රු.මිලියන)	68,849	100,975	-26.1	46.7
	(එ.ජ.ඩො. මිලියන)	374	506	-28.3	35.6
දේශීය අලෙවිය - පිරිපහදු නිෂ්පාදිත (මෙ.ටො. '000)		4,600	4,246	-16.8	-7.7
ඉන්, පෙට්‍රල් (ඔක්ටේන් 92) (අ)		1,139	1,238	-10.2	8.7
පෙට්‍රල් (ඔක්ටේන් 95)		120	116	-23.6	-3.5
සුදු ඩීසල් (ආ)		1,750	1,875	-18.2	7.1
සුපිරි ඩීසල්		69	75	-18.8	8.2
භූමිතෙල්		176	188	-14.8	7.2
දැව්තෙල්		971	513	-4.0	-47.2
ගුවන්යානා ඉන්ධන		189	224	-60.2	18.6
නැප්තා		165	11	1.7	-93.5
දේශීය අලෙවිය - එල්.පී. ගෑස් (මෙ.ටො. '000)		473	457	1.5	-3.3
දේශීය මිල (වසර අවසානයේ දී) (රු./ලීටර)					
පෙට්‍රල් (ඔක්ටේන් 92)		137.00	177.00	-	29.2
පෙට්‍රල් (ඔක්ටේන් 95)		161.00	207.00	-	28.6
සුදු ඩීසල්		104.00	121.00	-	16.3
සුපිරි ඩීසල්		132.00	159.00	-	20.5
භූමිතෙල්		70.00	87.00	-	24.3
දැව්තෙල්					
තත්පර 800		70.00	110.00	-27.1	57.14
තත්පර 1,500		70.00	110.00	-27.1	57.14
එල්.පී. ගෑස් (රු./කි.ග්‍රෑම්)					
ලිට්‍රෝ ගෑස්		119.44	214.00	-	79.2
ලාෆ්ස් ගෑස්		119.44	227.20	-	90.2
ජාත්‍යන්තර බොරතෙල් මිල ගණන් (එ.ජ.ඩො./බැරල්)					
බ්‍රෙන්ට්		43.35	70.80	-32.3	63.3
ඩබ්.ටී.අයි.		39.78	67.94	-30.2	70.8
ඛනිජ තෙල් සහ අනෙකුත් ද්‍රව ඉන්ධන					
ලෝක සැපයුම (දිනකට බැරල් මිලියන)		93.9	95.6	-6.4	1.8
ලෝක ඉල්ලුම (දිනකට බැරල් මිලියන)		92.0	97.5	-8.6	6.0

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(අ) XtraPremium Euro 3 ඇතුළත්ව
(ආ) XtraMile ඩීසල් ඇතුළත්ව

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයිඕසී පොදු සීමිත සමාගම
ලංකා මැරින් සර්විසස් සමාගම
ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම
ලාෆ්ස් ගෑස් සමාගම
ශ්‍රී ලංකා රේගුව
බ්ලූම්බර්ග් තොරතුරු සේවය
එ.ජ. බලශක්ති තොරතුරු පරිපාලනය

3

දැරීමේ කඩිනම් අවශ්‍යතාවක් පවතී. ශ්‍රී ලංකාව තුළ මිල සංශෝධනවලට සාපේක්ෂව, ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා ඉල්ලුම් නම්‍යතාව, විශේෂයෙන්ම, ප්‍රවාහන අංශය තුළ, සාපේක්ෂ වශයෙන් අඩුය. 2015 සිට 2019 දක්වා කාලය තුළ ලං.ඛ.නී.සං. මගින් ප්‍රවාහන අංශය වෙත අලෙවි කළ ඉන්ධන ප්‍රමාණයෙහි සාමාන්‍යය වූ ලීටර බිලියන 3.4ට සාපේක්ෂව 2021 වසරේ දී එම අගය ලීටර බිලියන 3.6ක් ලෙස වාර්තා වීම තුළින් මෙම තත්ත්වය මනාව පෙන්නුම් කෙරේ. 2022 වසරේ මුල් භාගයේ දී ඉතිහාසයේ මෙතෙක් වාර්තා කළ ඉහළම මිල සංශෝධන සිදු කිරීම් මධ්‍යයේ පවා ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා අඛණ්ඩව දැඩි ඉල්ලුමක් පැවතීම තුළින් මෙය තවදුරටත් සනාථ වේ. ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා වන ඉහළ යන ඉල්ලුම සැලකිල්ලට ගනිමින්, පුනර්ජනනීය විදුලි උත්පාදන ධාරිතාව පුළුල් කිරීම, පෞද්ගලික ප්‍රවාහනය භාවිතය අධෛර්යමත් කිරීම සඳහා ගාස්තු අය කිරීම හෝ රථවාහන තදබදය සඳහා ගාස්තු අය කිරීම වැනි ක්‍රියාමාර්ග සමඟ ඒකාබද්ධව පොදු ප්‍රවාහනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම වැනි ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා ඇති ඉල්ලුම සීමා කළ හැකි වෙනත් ක්‍රම හඳුනා ගැනීමට, බලශක්ති අමාත්‍යාංශය විසින් ලං.ඛ.නී.සං. සහ විදුලිබල හා ප්‍රවාහන ක්ෂේත්‍රයේ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් සමඟ සමීප සහයෝගීතාවයෙන් යුතුව විශේෂ පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ. දේශීය හා ගෝලීය වෙළඳපොළ ප්‍රවණතා පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින් ලං.ඛ.නී.සං. විසින් ඉදිරි දැක්මක් සහිතව තීරණ ගැනීමේ ක්‍රියාවලියක නිරත වීමේ දැඩි අවශ්‍යතාවක් ඇති බව දැනට පවතින බලශක්ති අර්බුදය මගින් නැවත වතාවක් අවධාරණය කරයි. මෑත මාසවල දී දක්නට ලද සැපයුම් අවහිරතා කිසියම් දුරකට විදේශ මුදල් ද්‍රවශීලතා ගැටලු

හේතුවෙන් ද පැන නැගුණ ද, ලං.වි.ම. සහ අනෙකුත් අදාළ රාජ්‍ය අංශයේ පාර්ශ්වකරුවන් සමඟ ඒකාග්‍රව, ලං.ඛ.නී.සං. විසින් කාලෝචිත සහ විචක්ෂණශීලී තීරණ ගැනීම හරහා ද මෙම සැපයුම් අවහිරතා බොහෝ දුරට අවම කර ගත හැකිව තිබුණි.

ඛනිජ තෙල් අංශයේ කාර්ය සාධනය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් වසර තුළ දී, මන්දගාමීව වුවද ක්‍රියාත්මක විය. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයක් ලෙස, *ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අයිතිය පැවරීම* (Built-Operate-Transfer) යන ආකෘතිය යටතේ, දිනකට බැරල් 100,000ක ධාරිතාවක් සපයන නව පිරිපහදුවක් සපුගස්කන්දෙහි පිහිටුවීම සඳහා වන සවිස්තරාත්මක ශක්‍යතා අධ්‍යයනය, ලං.ඛ.නී.සං. විසින් 2021 වසරේ දී අවසන් කරන ලදී. මේ අතර, ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා පවතින ගබඩා පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා කොළොන්නාව තෙල් ගබඩා පරිශ්‍රයේ මුළු ධාරිතාව ඝන මීටර් 93,000කින් යුතු ගබඩා ඉදිකිරීම් ව්‍යාපෘති දෙකක් ද වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ලං.ඛ.නී.සං. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතියේ කොටසක් ලෙස ගුවන් යානා ඉන්ධන නැවත පිරවීමේ පර්යන්තය සංවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම ද ආරම්භ කළේය. මීට අමතරව, ලං.ඛ.නී.සං. යෝජිත ද්‍රවීකෘත ස්වභාවික වායු (Liquefied Natural Gas) බලාගාර ව්‍යාපෘතිය යටතේ කැලණිතිස්ස බලාගාරයට ගෑස් සම්ප්‍රේෂණය කරන නල මාර්ගය ඉදිකිරීම සඳහා ලං.වි.ම. සමඟ අඛණ්ඩව සහයෝගයෙන් කටයුතු කළේය. ඒ අනුව, ඉඩම් අත්පත් කර ගැනීම සහ ව්‍යාපෘති යෝජනා ඇගයීම 2021 වසරේ දී ආරම්භ කළ අතර, ගෑස් නල මාර්ග ව්‍යාපෘතිය 2023 වසර වන විට අවසන් කිරීමට අපේක්ෂිතය. 2022 වසරේ මුල් භාගයේ දී ඉන්දියානු තෙල් සංස්ථාව (Indian Oil Corporation) සමඟ එක්ව දියත් කිරීමට නියමිත ත්‍රිකුණාමල තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගිවිසුමක් අත්සන් කරන ලදී. ඒ අනුව, ත්‍රිකුණාමලය තෙල් ගබඩා සංකීර්ණයේ ඇති තෙල් ටැංකි 99න් තෙල් ටැංකි 24ක් ලං.ඛ.නී.සං.ට ලබා දීමට සහ තවත් 61ක් ලං.ඛ.නී.සං. සහ අයි.ඕ.සී. සමාගමේ හවුල් ව්‍යාපාරයක් ලෙස ස්ථාපිත කිරීමට නියමිත අනුබද්ධිත ආයතනයක් මගින් වැඩිදියුණු කිරීමට නියමිත අතර, ඉතිරි ටැංකි 14 අයි.ඕ.සී. සමාගම විසින් සංවර්ධනය කිරීමට නියමිතය.

2021 වසර තුළ දී උද්ගාමී ඛනිජ තෙල් හා ගෑස් ගවේෂණය සඳහා ජාතික සැලැස්මක් සංවර්ධනය කිරීමේ කටයුත්තෙහි රජය අඛණ්ඩව නියැලී සිටියේය. ස්වාධීන, කාර්යක්ෂම සහ පාරදෘශ්‍යභාවයකින් යුතු උද්ගාමී තෙල් ගවේෂණයට අදාළ නෛතික රාමුවක් ස්ථාපිත කිරීමේ මූලික අරමුණ ඇතිව, 2021 අංක 21 දරන ඛනිජ තෙල් සම්පත් පනත 2021 ඔක්තෝබර් මාසයේ දී බලාත්මක කරනු ලැබූ අතර, එමගින් පැහැදිලි ජාතික උද්ගාමී ප්‍රතිපත්තියක් සහ ඛනිජ තෙල් සම්පත් හා ඒ ආශ්‍රිත මෙහෙයුම් කටයුතු අධීක්ෂණය මෙන්ම කළමනාකරණය කිරීම සඳහා නියාමන හා මෙහෙයුම් රාමුවක් නිර්මාණය කළේය. නව ඛනිජ තෙල් සම්පත් පනත බලාත්මක කිරීමෙන් පසුව, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන ලේකම් කාර්යාලය වෙනුවට ස්වාධීන නියාමකයෙකු ලෙස *ශ්‍රී ලංකා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අධිකාරිය* 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී ස්ථාපිත කරන ලදී. තවද, ජාත්‍යන්තර තෙල් නිධි සීමා නිර්ණය කිරීම් සහ වර්තමාන ප්‍රවණතාවලට අනුකූලව, කුඩා ගවේෂණ බිම් 871ක් සහ මන්නාරම, කාවේරි සහ ලංකා ද්‍රෝණිය ආවරණය වන පරිදි විශාල ගවේෂණ බිම් තුනකින් සමන්විත නව අක්වෙරළ හයිඩ්‍රොකාබන් ගවේෂණ බිම් සිතියමක් සකස් කර 2021 වසරේ ජූලි මාසයේ දී ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. තවද, 2020 වසරේ දී ගැසට් කරන ලද *ස්වභාවික වායු පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට* අනුකූලව, *වායු උපයෝගීකරණ ප්‍රධාන සැලැස්ම* කෙටුම්පත් කිරීමට අදාළ මූලික කටයුතු 2021 වසරේ දී සිදු වෙමින් පැවති අතර, එම සැලැස්ම ශ්‍රී ලංකා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අධිකාරිය විසින් 2022 මුල් භාගයේ දී දියත් කිරීමට අපේක්ෂා කෙරේ.

විදුලිබලය

2021 වසරේ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීමත් සමඟ විදුලිබලය සඳහා වූ ඉල්ලුම අඛණ්ඩව ඉහළ ගියේය. 2021 වසර තුළ දී, ජල විදුලිබල උත්පාදනයේ දායකත්වය ඉහළ යෑමත් සමඟ, පෙර වසරට සාපේක්ෂව විදුලිබල උත්පාදනය ගිගා වොට් පැය (ගි.වො.පැ.) 16,716ක් දක්වා සියයට 6.4කින් වර්ධනය විය. ජල පෝෂක ප්‍රදේශවලට ලැබුණු අධික වර්ෂාපතනය හේතුවෙන් වසර පුරා ජලාශවල ජල මට්ටම සියයට 60කට වඩා ඉහළ මට්ටමක පැවති අතර, එමගින් විදුලිබලය සඳහා වූ ඉල්ලුම සපුරාලීම සඳහා අඩු පිරිවැයක් සහිත ජලවිදුලිබල උත්පාදනය මත වැඩි වශයෙන් රඳා පැවතීමට හැකි විය. ඒ අනුව, ජලය උපයෝගී කරගත් සමස්ත විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 5,640ක් දක්වා සියයට 44.2කින් ඉහළ ගිය අතර, සමස්ත විදුලි උත්පාදනය සඳහා ජල විදුලිබල දායකත්වය, 2020 වසරේ දී වාර්තා වූ සියයට 25.0 සිට 2021 වසරේ දී සියයට 34.0ක් දක්වා ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ද්‍රව ඉන්ධන පදනම් කරගත් විදුලිබල

3

උත්පාදනය මත වන රැඳියාව අඩු කරමින් 2020 වසරට සාපේක්ෂව, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී, ද්‍රව ඉන්ධන භාවිතයෙන් සිදු කෙරෙන විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 2,634ක් දක්වා සියයට 37.0කින් පහළ ගිය අතර, ගල් අඟුරු භාවිතයෙන් කෙරෙන විදුලිබල උත්පාදනය ගි.වො.පැ. 5,519ක් දක්වා සියයට 4.1කින් පහළ ගියේය. මේ අතර, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව භාවිතයෙන් සිදු කෙරෙන විදුලිබල උත්පාදනය, පසුගිය වසරේ වාර්තා කළ ගි.වො.පැ. 2,922ට සාපේක්ෂව සියයට 56.6ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර, මේ සඳහා ජාතික විදුලිබල පද්ධතියට නව පුනර්ජනනීය බලශක්ති බලාගාර, විශේෂයෙන්ම මෙ.වො. 100ක ධාරිතාවයකින් යුතු මන්නාරම් සුළං විදුලි බලාගාරය එකතු කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, සමස්ත විදුලිබල උත්පාදන සංයුතිය සඳහා ද්‍රව ඉන්ධන, ගල් අඟුරු සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව භාවිතයෙන් සිදු කෙරෙන විදුලිබල උත්පාදන දායකත්වය, පිළිවෙළින්, සියයට 16ක්, සියයට 33ක් සහ සියයට 17ක් විය. තවද, 2021 වසරේ දී සමස්ත විදුලිබල උත්පාදනයට ලං.වි.ම.හි දායකත්වය සියයට 76.0ක් වූ අතර, ඉතිරිය ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගෙන් මිලදී ගන්නා ලදී. දුරස්ථ සහ ග්‍රාමීය ප්‍රදේශ වෙත විදුලිබල සැපයුම පුළුල් වුවද, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීමේ දී සිදු වන සමස්ත විදුලිබල හානිය 2021 වසරේ දී මුළු විදුලිබල උත්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 9.0ක් විය. වියළි කාලගුණ තත්ත්වය ආරම්භ වීම මධ්‍යයේ ජලාශවල ජල මට්ටම ශීඝ්‍රයෙන් අඩු වීම හේතුවෙන් 2022 වසරේ මුල් භාගයේ සිට ජල විදුලිබල උත්පාදනය ශීඝ්‍රයෙන් පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් ලෙස තාප විදුලිබල උත්පාදනය මත වැඩි වශයෙන්

3.6 රූප සටහන

විදුලිබල උත්පාදන සංයුතිය



3.2 සංඛ්‍යා සටහන

විදුලිබල අංශයේ ක්‍රියාකාරිත්වය

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)	වර්ධන අනුපාතය % 2020(අ)	2021(ආ)
ස්ථාපිත ධාරිතාව (මෙගාවොට්)	4,265	4,187	1.2	-1.8
ජල විදුලිබලය (ඇ)	1,383	1,383	-1.1	-
ද්‍රව ඉන්ධන (ඈ)	1,268	1,087	-1.1	-14.3
ගල් අඟුරු	900	900	-	-
සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (ඉ)	715	817	12.4	14.3
ජනනය කළ ඒකක (ගිගාවොට් පැය)	15,714	16,716	-1.3	6.4
ජල විදුලිබලය (ඇ)	3,911	5,640	3.4	44.2
ද්‍රව ඉන්ධන (ඈ)	4,182	2,634	-16.6	-37.0
ගල් අඟුරු	5,754	5,519	7.3	-4.1
සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය (ඉ)	1,866	2,922	5.9	56.6
මුළු අලෙවිය (ලං.වි.ම.) (ගිගාවොට් පැය)	14,286	15,214	-2.2	6.5
ගෘහස්ථ සහ ආගමික	5,172	5,320	6.3	2.9
කර්මාන්ත	4,164	4,822	-5.2	15.8
පොදු සේවා සහ හෝටල් (ඊ)	3,238	3,342	-9.1	3.2
වීදි ආලෝක කිරීම	108	97	-0.8	-9.8
ලං.වි. සමාගම (LECO)	1,605	1,633	-4.7	1.7
ලං.වි. සමාගමේ විදුලි අලෙවියේ සංයුතිය (ගිගාවොට් පැය)	1,624	1,603	-1.3	-1.3
ගෘහස්ථ සහ ආගමික	739	717	6.8	-3.0
කර්මාන්ත	279	306	-4.7	9.6
පොදු සේවා සහ හෝටල් (ඊ)	583	557	-8.9	-4.5
වීදි ආලෝක කිරීම	23	23	7.7	3.4
ලං.වි.ම. සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ සමස්ත හානිය (%)	9.1	9.0	10.3	-1.1
පාරිභෝගිකයන් සංඛ්‍යාව ('000) (උ)	7,213	7,401	2.0	2.6
ඉන්, ගෘහස්ථ සහ ආගමික	6,273	6,411	1.8	2.2
කාර්මික	70	73	3.8	4.2
පොදු සේවා හා හෝටල් (ඊ)	867	915	4.3	5.5

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සුළු පරිමාණ ජල විදුලි බලාගාර ඇතුළත් නොවේ
(ඈ) ස්වාධීන විදුලිබල නිෂ්පාදකයන්ගෙන් මිල දී ගත් විදුලිබලය ද ඇතුළත්ය
(ඉ) සුළු පරිමාණ ජල විදුලිබලය ඇතුළත්ව
(ඊ) රාජ්‍ය අංශය සඳහා සිදුකළ අලෙවිය ද ඇතුළත්ය
(උ) සී.ස. ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ පාරිභෝගිකයින් ද ඇතුළත්ව

මූලයන්: ලංකා විදුලිබල මණ්ඩලය
සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම

යැපීමට සිදුවීම හේතුවෙන්, 2022 වසරේ මුල් මාස තුළ දී ආර්ථිකයට අවශ්‍ය බලශක්ති ඉල්ලුම සපුරාලීමේ දුෂ්කරතාවලට ලං.වි.ම. මුහුණ දෙමින් සිටී. ගෝලීය බලශක්ති මිල ගණන් ඉහළ යෑම මධ්‍යයේ රට තුළ පවතින විදේශ විනිමය ගැටලු සමඟ ඉන්ධන මිලදී ගැනීමේ දී මතු වූ දුෂ්කරතා හේතුවෙන් 2022 වසරේ පෙබරවාරි මාසයේ සිට ක්‍රියාත්මකවන පරිදි විදුලිබල සැපයුම සීමා කිරීමට සිදු වී තිබේ.

ප්‍රධාන වශයෙන් 2020 වසරේ දී ඉල්ලුම පහළ යෑම නිසා ඇති වූ පදනම් බලපෑම හේතුවෙන් 2021 වසරේ දී විදුලිබල අලෙවිය ගි.වො.පැ. 15,214ක් දක්වා

සියයට 6.5කින් ඉහළ ගියේය. ආගමික ස්ථාන සහ වීදි ආලෝකකරණ හැර, අනෙකුත් සියලුම විදුලි පරිභෝජන කාණ්ඩවල ඉල්ලුම, සමස්ත විදුලි අලෙවියෙහි වර්ධනය ඒ සඳහා හේතු විය. වසර තුළ දී සංචාරක ක්ෂේත්‍රය යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, 2021 වසරේ දී සමස්ත විදුලිබල අලෙවියෙන් සියයට 1.4ක් වන හෝටල් අංශය වෙත සිදුකළ විදුලිබල අලෙවිය, 2020 වසරේ දක්නට ලැබුණු සියයට 29.2ක ශීඝ්‍ර පහළ යෑමට සාපේක්ෂව, සියයට 13.7කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, විදුලි බිල්පත් සැකසීම මනු කියවන්නන් හරහා සිදු කිරීමේ දී ගැටලුවලට මුහුණ දීමට ලං.වි.ම.ට සිදු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස විදුලිබල අලෙවිය සහ විදුලිබල උත්පාදනය පිළිබඳ දත්ත අතර සැලකිය යුතු නොගැළපීම් නිර්මාණය වී ඇත. ඒ අනුව, දුරස්ථ විසන්ධි කිරීම සහ ස්වයංක්‍රීයව යළි සබඳතාව ලබාදීමේ පහසුකම හරහා නිවැරදි සහ තත්කාලීනව බලශක්ති දත්ත රැස් කිරීමට ලං.වි.ම. පියවර ගෙන ඇත. දෙහිවල සහ කටුනායක ප්‍රදේශවල වාණිජ මට්ටමේ සුහුරු මනු කියවීමේ ව්‍යාපෘති දෙකක් ආරම්භ කර ඇත. මෙම සුහුරු මනු කියවීමේ තාක්ෂණය කඩිනමින් ක්‍රියාත්මක කිරීම මගින් බිල්පත් සැකසීමේ ක්‍රියාවලිය නිසියාකාරව සිදු කිරීමට සහ ඊට අදාළ ගාස්තු ඉක්මනින් හා කාර්යක්ෂමව අයකර ගැනීම සහතික කරනු ඇති අතර, එය ලං.වි.ම.යේ මූල්‍ය ප්‍රවාහ වර්ධනය කිරීමට හේතු විය හැකි බැවින්, එවැනි කාලානුරූපී පියවර ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම අත්‍යවශ්‍ය වේ.

2021 වසරේ දී ලං.වි.ම.යේ මූල්‍ය කාර්ය සාධනය වැඩිදියුණු වීම සඳහා ජල විදුලිබල උත්පාදනය මත වැඩි වශයෙන් පදනම් වීම මෙන්ම, අධික පිරිවැයක් සහිත ද්‍රව ඉන්ධන භාවිතා කෙරෙන විදුලිබල උත්පාදනය අඩු වීම ද උපකාරී විය. කෙසේ වෙතත්, මෙම වසර තුළ සිදු වූ අලාභ මෙන්ම, පසුගිය කාලය තුළ සිදු වූ අලාභ පියවා ගැනීම සඳහා මෙම මූල්‍ය ප්‍රගතිය ප්‍රමාණවත් නොවුණි. විගණනය නොකළ තාවකාලික මූල්‍ය දත්තවලට අනුව, ලං.වි.ම. 2020 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 69.2ක අලාභයට සාපේක්ෂව, 2021 වසරේ දී රුපියල් බිලියන 22.0ක අලාභයක් වාර්තා කළේය. ලං.වි.ම. විසින් බැංකු අංශයෙන් ලබාගත් කෙටිකාලීන ණය සහ ලං.බ.නී.සං. හා ස්වාධීන බලශක්ති නිෂ්පාදකයින් වෙත වූ නොපියවූ වගකීම් 2020 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 208.4ක සිට 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 237.8ක් දක්වා ඉහළ ගිය අතර, ලං.වි.ම.හි දිගුකාලීන නොපියවූ වගකීම්, 2020 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 483.8ක

3.7 රූප සටහන
විදුලි බලය : සාමාන්‍ය පිරිවැය හා සාමාන්‍ය ගාස්තුව



සිට 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 502.8ක් දක්වා ඉහළ ගියේය. විදුලි බිල්පත් පියවීම සඳහා සහන කාලයක් ලබා දීමට සහ බිල්පත් ගාස්තු නොගෙවූ පාරිභෝගිකයින්ගේ සේවා විසන්ධි කිරීම කල් දැමීමට රජය ගත් තීරණය, ලං.වි.ම.යේ මුදල් ප්‍රවාහය තවදුරටත් දුර්වල කළේය. මීට අමතරව, 2022 වසරේ මුල් භාගයේ දී දේශීය ඉන්ධන මිල ගණන් සඳහා සිදු කළ සංශෝධන මෙන්ම, 2022 වසරේ ඉතිරි කාලයේ දී ගෝලීය බලශක්ති මිල ගණන්වල සිදුවිය හැකි ඉහළ යෑම්, 2022 වසරේ දී ලං.වි.ම.යේ මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි තවදුරටත් අහිතකර බලපෑම් එල්ල කරනු ඇත. විදුලිය ගාස්තු සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිල යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට සහ විශේෂයෙන්ම 2014 වසරේ සිටම විදුලිය ගාස්තුවල සංශෝධනයක් සිදු නොවීම සැලකිල්ලට ගෙන විධිමත් කාල පරාසයක් තුළ ගාස්තු සංශෝධනය කිරීමේ ඇති අවශ්‍යතාව මෙම වර්ධනයන් තුළින් නැවත නැවතත් අවධාරණය කෙරේ. එමෙන්ම, පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිත කෙරෙන බලශක්ති උත්පාදන ධාරිතාව ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ග ගැනීම ද අවශ්‍ය වේ.

විදුලිබල අංශයේ නියාමන අධිකාරිය වන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අඛණ්ඩ විදුලිබල සැපයුමක් සහතික කිරීම සඳහා සිය අධීක්ෂණ සහ නියාමන ක්‍රියාකාරකම් නොකඩවා ශක්තිමත් කළේය. ලං.වි.ම. විසින් *2022-2041 සඳහා වන විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්ම* 2021 වසරේ ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. එම සැලැස්මට අනුව 2030 වසර වනවිට සමස්ත විදුලිබල උත්පාදනයෙන් සියයට

3

50ක් පමණ පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් සිදුවනු ඇත. කෙසේ වෙතත්, 2030 වසර වනවිට සමස්ත විදුලිබල උත්පාදනයෙන් සියයට 70ක් සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභව යොදා ගැනීම පිළිබඳ වූ රජයේ අරමුණට අනුකූලව විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්ම යළි සකස් කරන ලෙසට සහ සංශෝධිත විදුලිබල උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්ම 2022 වසරේ ජූනි මාසය වන විට ඉදිරිපත් කරන ලෙසට ද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් ලං.වි.ම.යෙන් ඉල්ලීම් කර ඇත. පරිසරයට අහිතකර හානි සිදු නොවන පිරිසිදු බලශක්තියක් සැපයීම සඳහා රජයේ කැපවීම නැවත අවධාරණය කිරීමට සහ තිරසාර බලශක්ති සංවර්ධනයක් සහතික කිරීම සඳහා නුදුරු අනාගතයේ දී නව ගල් අඟුරු බලාගාර ඉදි නොකිරීමට 2021 වසරේ ජූලි මාසයේ දී, කැබිනට් මණ්ඩලය විසින් තීරණය කළේය. 2050 වසර වන විට කාබන් විමෝචනය අඩු කිරීම සඳහා වන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා *එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ සම්මුතිය* යටතේ පවතින නිර්ණායකවලට අනුකූල වීම මෙහි අරමුණ වේ. මේ අතර, ජාතික විදුලි කාර්මික වෘත්තීය බලපත්‍ර ක්‍රමයක් සැකසීම, පුනර්ජනනීය බලශක්ති බලාගාර අධීක්ෂණය කිරීම සහ විදුලි කාර්මිකයන් සහ කාර්මික ශිල්පීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි විදුලිබල ක්ෂේත්‍රය සම්බන්ධ වෙනත් අධීක්ෂණ සහ නියාමන කටයුතු ද මෙම වසර තුළ දී ක්‍රියාත්මක විය.

විදුලිබල ඉල්ලුමෙහි අඛණ්ඩ වර්ධනයට සමගාමීව බලශක්ති උත්පාදනය පුළුල් කිරීමේ අරමුණින් විදුලි බලාගාර කිහිපයක සංවර්ධන කටයුතු ද වසර තුළ දී ක්‍රියාත්මක විය. විදුලිබලය උත්පාදනය කිරීමේ දිගු කාලීන සැලැස්මට අනුව, ද්‍රවීකෘත ස්වභාවික වායුව විදුලිබල උත්පාදනයේ ප්‍රධාන ප්‍රභවය බවට පත් කිරීමේ අපේක්ෂාව සලකා බලමින්, ශ්‍රී ලංකාවේ ප්‍රථම ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාරය කෙරවලපිටියේ ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දුන්නේය. ඒ අනුව, 2021 වසරේ මාර්තු මාසයේ දී ඉදිකිරීම් ආරම්භ වූ, මෙ.වො. 300ක විදුලි ජනන ධාරිතාවක් සහිත ප්‍රථම ද්‍රවීකෘත ස්වභාවික වායු පදනම් කරගත් විදුලි බලාගාරය 2024 වසරේ මුල් භාගය වන විට ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීමට අපේක්ෂිත අතර, දැනට ඉදිකිරීම් කටයුතු මූලික අදියරේ පවතින, මෙ.වො. 300ක විදුලි ජනන ධාරිතාවක් සහිත දෙවන විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු ද 2024 වසර අවසානයේ දී නිම කිරීමට අපේක්ෂා කෙරේ. *ඉදිකිරීම, හිමිකාරීත්වය සහ ක්‍රියාත්මක කිරීම* (Built-Own-Operate) යන පදනම මත, ද්‍රවීකෘත ස්වභාවික වායු පරිවර්තන පහසුකම් සහිතව දිය මත ඉදිවන ගබඩා සංකීර්ණයක් සහ *ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම සහ අයිතිය පැවරීම* (Built-Operate-transfer) යන පදනම යටතේ බෙදා හැරීමේ නල මාර්ගයකින් සමන්විත ද්‍රවීකෘත ස්වභාවික වායු පර්යන්තයක් ඉදිකිරීම සඳහා තරඟකාරී ලංසු කැඳවීම ද ලං.වි.ම. විසින් ආරම්භ කරන ලදී. ද්‍රවීකෘත ස්වභාවික වායු සැපයුමට යම් බාධා සිදුවිය හැකි අවස්ථාවක දී අඛණ්ඩ සැපයුමක් තහවුරු කිරීම සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාර තුළ ඉන්ධන සැපයුම් සහ ගබඩා පහසුකම් ඇතුළත් ද්විත්ව ඉන්ධන ශක්‍යතාවක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය. තවද, පද්ධතියෙහි විශ්වසනීයත්වය පවත්වා ගනු ලබන අතර, පුනර්ජනනීය බලශක්තිය වැඩි වශයෙන් එක් කිරීම සහ පද්ධතිය තුළ සිදුවන හානිය අඩු කිරීමේ අරමුණින්, විදුලිබල සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ පද්ධතිය පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදා හැරීමේ හානි අවම කිරීමේ ව්‍යාපෘතිය සහ විදුලිබල සැපයුම් පද්ධතිවල ස්ථාවරබව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය ඇතුළු සම්ප්‍රේෂණ සහ බෙදා හැරීමේ ව්‍යාපෘති කිහිපයක් ද වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

3.3 සංඛ්‍යා සටහන

සාමාන්‍ය විදුලිබල පිරිවැය සහ සාමාන්‍ය විදුලිබල ගාස්තු

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)	වර්ධන අනුපාතය (%)	
			2020(අ)	2021(ආ)
ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.)	10.35	8.78	-19.8	-15.2
ජල විදුලිය	2.33	1.67	-6.6	-28.3
ද්‍රව ඉන්ධන	29.01	32.03	-9.3	10.4
ගල් අඟුරු	10.87	10.68	-13.1	-1.7
පෞද්ගලික අංශයේ සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.)	22.94	16.94	-13.3	-26.2
ද්‍රව ඉන්ධන	27.55	30.35	-8.7	10.2
සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව (ඇ)	18.99	16.22	4.2	-14.6
සමස්ත සාමාන්‍ය පිරිවැය (රු./කි.වො.පැ.)				
උත්පාදන අවස්ථාවේ දී	13.99	11.74	-15.8	-16.1
විකුණුම් අවස්ථාවේ දී	21.67	18.63	-10.2	-14.0
සාමාන්‍ය ගාස්තුව (රු./කි.වො.පැ.)	16.72	16.37	0.5	-2.1
ගෘහස්ථ	14.87	14.91	5.2	0.3
පොදු සේවා	23.91	23.42	-0.1	-2.0
රාජ්‍ය අංශය	18.06	18.25	-0.7	1.1
කර්මාන්ත	14.84	14.70	0.8	-0.9
හෝටල්	18.13	17.79	2.4	-1.9

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය ප්‍රභව තුළ ජල විදුලිය සඳහා වූ සාමාන්‍ය පිරිවැය ඇතුළත් වේ.

මූලය: ලංකා විදුලිබල මණ්ඩලය

පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිත කෙරෙන විදුලිබල උත්පාදනයේ දායකත්වය ඉහළ නැංවීම හරහා බලශක්ති ක්ෂේත්‍රයේ තිරසාර බව සහතික කිරීම සඳහා රජය අඛණ්ඩව ප්‍රයත්න දැරුවේය. ඒ අනුව, 2021 වසර අවසානය වන විට ප්‍රධාන ජල විදුලිබල ව්‍යාපෘති වන උමා ඔය (මෙ.වො. 120) සහ බ්‍රෝඩ්ලන්ඩ්ස් (මෙ.වො. 35ක) ව්‍යාපෘති අවසන් වීමට ආසන්න අදියරේ පැවති අතර, 2022 වසර තුළ දී එම ව්‍යාපෘති ද්විත්වයෙහිම විදුලි උත්පාදන කටයුතු ආරම්භ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, මොරගොල්ල, ගිං ගඟ සහ තල්පිටිගල ජල විදුලිබල ව්‍යාපෘති ද වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවති අතර, මෙමගින් ජාතික විදුලිබල පද්ධතියට මෙ.වො. 65ක ධාරිතාවක් එක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 වසරේ මැද භාගයේ දී මෙ.වො. 100ක ධාරිතාවකින් යුතු මෙරට ප්‍රථම මහා පරිමාණ සුළං විදුලි බලාගාරය, මන්නාරම (අදියර I), එහි පූර්ණ ධාරිතාවයෙන් යුතුව සාර්ථක ලෙස ආරම්භ කෙරුණු අතර, මෙම බලාගාරය මගින් තවත් මෙ.වො. 50ක විදුලි බලයක් ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීමට සැලසුම් කර ඇත. මන්නාරම් ප්‍රදේශයේ මෙ.වො. 100ක විදුලි ජනන ධාරිතාවක් සහිත සුළං විදුලිබල උද්‍යාන දෙකක් අදියර දෙකක් යටතේ ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇති අතර, පුනරීන් පුනර්ජනනීය ද්වි ප්‍රභව බලශක්ති උද්‍යානයේ සහ ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ස්ථාපිත සුළං විදුලි බලාගාරවල සංවර්ධන කටයුතු ද සිදුවෙමින් පවතී. සූර්ය බලශක්තියට අදාළව, 2021 වසර අවසානයේ දී පාරිභෝගිකයින් 27,068ක් පමණ *සූර්ය බල සංග්‍රාමය* ව්‍යාපෘතියට සම්බන්ධ වී ඇති අතර, මෙම ව්‍යාපෘතිය යටතේ මෙ.වො. 416ක් ජාතික විදුලිබල පද්ධතියට එක් කර ඇත. මේ අතර, සියඹලාණ්ඩුව සූර්ය බල උද්‍යානයේ (මෙ.වො. 100ක) සහ පුනරීන් පුනර්ජනනීය ද්විප්‍රභව බලශක්ති උද්‍යානයේ (මෙ.වො. 150ක) මූලික කටයුතු මෙම වසර තුළ දී ක්‍රියාත්මක විය. රජයේ ගොඩනැගිලි සහ ආගමික ස්ථානවල වහල මත සූර්යබල පැනල ස්ථාපනය කිරීම මෙන්ම, ජලාශ මත පාවෙන සූර්යබල පැනල සවිකිරීමේ නියමු ව්‍යාපෘතිය සඳහා 2021 වසරේ ජුනි මාසයේ දී ඉන්දියාව සමඟ එ.ජ.ඩො. මිලියන 100ක ණය ගිවිසුමක් අත්සන් කළේය. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය මගින් මෙ.වො.120ක අතිරේක සූර්යබල උත්පාදන ධාරිතාවක් විදුලිබල පද්ධතියට එක් කිරීමට අපේක්ෂා කෙරේ. ත්‍රිකුණාමලය සාම්පූර් ප්‍රදේශයේ සූර්ය විදුලි බලාගාරයක් ස්ථාපිත කිරීම සඳහා 2022 වසරේ මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාව ඉන්දියාවේ ජාතික තාප බලාගාර සංස්ථාව සමඟ ගිවිසුමකට අත්සන් තැබිණි. බලශක්ති උත්පාදනයේ නව පියවරක් ලෙස, මෙ.වො.10ක ධාරිතාවයකින් යුත් කෙරවලපිටියේ ඉදි කළ ශ්‍රී ලංකාවේ පළමු ඝන අපද්‍රව්‍ය විදුලි බලාගාරයේ මෙහෙයුම් කටයුතු 2021 වසරේ පෙබරවාරි මාසයේ දී ආරම්භ විය. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වෙමින් පැවතිය ද, සමස්ත විදුලිබල උත්පාදන සංයුතියෙන් සියයට 70ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභව භාවිතයෙන් සපුරාලීමේ රජයේ ප්‍රතිපත්ති අරමුණ සාක්ෂාත් කරගැනීම සහතික කරමින්, විදුලිබල ඇණහිටීම් සහ අධික පිරිවැයක් සහිත විකල්ප විදුලිබල උත්පාදන ක්‍රම හරහා විදුලිබලය ජනනය කිරීම වළක්වාලීම සඳහා මෙම යෝජිත සහ සැලසුම් කර ඇති ව්‍යාපෘති නියමිත වේලාව කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය. තවද, දිගුකාලීන ආර්ථික පිරිවැය මෙන්ම, ඉහළ ප්‍රාග්ධන ආයෝජන අවශ්‍යතාව හා නඩත්තු පිරිවැය සහ බලශක්ති ප්‍රභව හේතුවෙන් පරිසරය හා සමාජය මත ඇතිවිය හැකි බාහිරතා සැලකිල්ලට ගනිමින් සුදුසු සහ තිරසාර බලශක්ති සංයුතියක් සැකසීම සඳහා ස්ථාවර ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා උපායමාර්ගික සැලසුම් සකස් කිරීම සහ යෝජිත පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සිදුවන ප්‍රමාදවීම් අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම සඳහා 2022 වසරේ පෙබරවාරි මාසයේ දී කැබිනට් අනුකමිටුවක් ද පත් කර ඇත.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මෙරට තිරසාර බලශක්ති සංවර්ධනය දිරිගැන්වීම සඳහා වන සිය ප්‍රයත්නයන් අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මෙරට බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා පහසුකම් සැලසීමට බලශක්ති කළමනාකරණ පද්ධතිය පිහිටුවීම සහ මිලදී ගන්නා උපකරණවල බලශක්ති පරිභෝජනය පිළිබඳ පාරිභෝගිකයා දැනුම්වත්කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැනි බලශක්ති සංරක්ෂණ කටයුතුවල නිරත විය. පුනර්ජනනීය බලශක්ති සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම, ව්‍යාපෘති සඳහා සුදුසු භූමි ප්‍රදේශ සහ සරිලන සම්ප්‍රේෂණ පද්ධති හඳුනා ගැනීම පිළිබඳ නිසි අවධානය යොමු කරමින්, *2021-2026 කාලපරිච්ඡේදය සඳහා වන පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම* ද සම්පාදනය කර ඇත. මීට අමතරව, දේශීය පුනර්ජනනීය ප්‍රභව වාණිජ මට්ටමේ ව්‍යාපෘති බවට සංවර්ධනය කිරීම කඩිනම් කිරීම සඳහා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වෙත බලශක්ති බලපත්‍ර සහ තාවකාලික අනුමැතිය ලබා දීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය කටයුතු කළේය.

3

මාර්ග සංවර්ධනය

ග්‍රාමීය-නාගරික සබඳතා වැඩිදියුණු කිරීම මූලික කොටගත් මාර්ග සංවර්ධන අධිකාරියෙහි ක්‍රියාමාර්ග, ගමනාගමන කාලය අඩු කිරීම සඳහා මහාමාර්ග ප්‍රවාහනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ පුද්ගල හා භාණ්ඩ යන දෙඅංශයෙහිම ප්‍රවාහන කටයුතුවල පහසුව වර්ධනය කිරීමේ අරමුණින් යුතුව අඛණ්ඩව ක්‍රියාත්මක විය. වසර තුළ දී, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් නඩත්තු කරන ලැබූ ජාතික මහාමාර්ගවල (A සහ B කාණ්ඩයේ මාර්ග) සමස්ත දිග කිලෝමීටර් 12,225ක් වූ අතර, අධිවේගී මාර්ගවල සමස්ත දිග කිලෝමීටර් 312.6ක් විය. වසර තුළ දී අධිවේගී හා මහා මාර්ග නඩත්තුව හා සංවර්ධනය, මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම, පාලම් හා ගුවන් පාලම් ඉදිකිරීම සහ ස්වභාවික ආපදාවලින් බලපෑමට ලක් වූ මාර්ග ප්‍රතිසංස්කරණය හරහා මහාමාර්ග ජාලය වැඩිදියුණු කිරීමට ගත් ක්‍රියාමාර්ග සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රුපියල් බිලියන 200.8ක පමණ වියදමක් දරා ඇත. 2021 වසර තුළ දී, අධිවේගී මාර්ග සහ මහාමාර්ග සංවර්ධනය සඳහා දරන ලද වියදම, පිළිවෙළින්, රුපියල් බිලියන 19.0ක් සහ රුපියල් බිලියන 155.9ක් වූ අතර, පාලම් සහ ගුවන් පාලම් ඉදිකිරීමට අදාළ වියදම රුපියල් බිලියන 14.7කි.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ශ්‍රම සම්පත් සැපයුම සහ ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනය සම්බන්ධයෙන් අභියෝග ඇති වුවද, නාගරික-ග්‍රාමීය සම්බන්ධතා වැඩිදියුණු කිරීම සහ එමගින් සැමට ප්‍රතිලාභ අත්වන වර්ධනයකට සහාය වීම සඳහා රටේ අධිවේගී මාර්ග ජාලය ශක්තිමත් කිරීමට රජය අඛණ්ඩව කටයුතු කළේය. ඒ අනුව, කඩවත සිට දඹුල්ල දක්වා විහිදෙන මධ්‍යම අධිවේගී මාර්ගයට අදාළ ඉදිකිරීම් කටයුතු සඳහා වසර තුළ දී ප්‍රමුඛතාව ලබා දුන් අතර, 2022 වසරේ ජනවාරි මැද භාගයේ දී එහි මීරිගම සිට කුරුණෑගල දක්වා මාර්ග කොටස මහජනතාව සඳහා විවෘත කරන ලදී. තවද, පොතුහැර සිට රඹුක්කන දක්වා අධිවේගී මාර්ගයේ පළමු කිලෝමීටර් 12ට අදාළ මූලික ඉදිකිරීම් කටයුතු ද වසර තුළ දී ආරම්භ විය. කඩවත සිට මීරිගම දක්වා කොටසේ ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පැවති අතර, එම ව්‍යාපෘතියේ IVවන කොටසට අදාළ කුරුණෑගල සිට දඹුල්ල දක්වා කොටසේ ඉඩම් අත්කර ගැනීම සහ නැවත පදිංචි කිරීමට අදාළව ප්‍රගතිය 2021 වසර අවසන් වන විට සියයට 70.7ක් විය. මේ අතර, කහතුඩුව සිට පැල්මඩුල්ල දක්වා වන කිලෝමීටර් 76ක් දිග රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ද වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ඒ අනුව, කහතුඩුව සිට ඉංගිරිය දක්වා දිවෙන අධිවේගී මාර්ගයේ I වන අදියරේ ඉදිකිරීම් කටයුතු 2021 වසරේ දී ආරම්භ විය. තවද, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අදාළ ශක්‍යතා අධ්‍යයනය නැවත ඇගයීම අවසන් කිරීමෙන් අනතුරුව ඉංගිරිය සිට පැල්මඩුල්ල දක්වා දිවෙන අදියර II සහ III ආරම්භ විය.

2021 වසරේ දී අධිවේගී මාර්ග තුළ ධාවනය කළ සමස්ත රථ වාහන සංඛ්‍යාව ඉහළ ගියේය. ඒ අනුව, 2021 වසර තුළ දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව සිට ගොඩගම දක්වා සහ පාලටුව සිට මත්තල දක්වා දෛනිකව ධාවනය කළ රථ වාහන සංඛ්‍යාව, පිළිවෙළින්, සියයට 2.7කින් සහ සියයට 30.4කින් ඉහළ ගියේය. මේ අතර, කොළඹ කටුනායක අධිවේගී මාර්ගයේ සහ පිටත වටරවුම් අධිවේගී මාර්ගයේ දෛනිකව ධාවනය වූ රථ වාහන සංඛ්‍යාව පෙර වසරට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 6.7ක සහ සියයට 38.8ක වර්ධනයක් වාර්තා කළේය. මෙවැනි ධනාත්මක ප්‍රවණතා හේතුවෙන්, 2021 වසරේ දී වාර්ෂික ආදායමෙහි සියයට 20.6ක වර්ධනයක් වාර්තා කරමින් අධිවේගී මාර්ගවලින් ලැබුණු ආදායම, දළ වශයෙන් රුපියල් බිලියන 8.8ක් දක්වා ඉහළ ගියේය. 2022 වසරේ ජනවාරි මාසය මැද භාගයේ දී මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම සිට කුරුණෑගල දක්වා දිවෙන කොටස විවෘත කිරීමෙන් අනතුරුව, 2022 වසරේ පෙබරවාරි මාසය අවසන් වන විට, මෙම කොටස සඳහා අදාළ ගාස්තු අයකිරීම්වල එකතුව රුපියල් මිලියන 134.4ක් විය.

දැනට පවතින මාර්ග පද්ධතිය සහ පාලම් සංවර්ධනය හා ප්‍රතිසංස්කරණය කිරීම්වලට අදාළ ක්‍රියාකාරකම් වසර තුළ දී අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2021 වසරේ නොවැම්බර් මාසය අග භාගයේ දී, පැලියගොඩ නව කැලණි පාලම විවෘත කිරීම, කොළඹ අගනගර ප්‍රදේශයේ මාර්ග තදබදය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගවලට අදාළ ප්‍රධාන පියවරක් වේ. මෙම ව්‍යාපෘතිය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සහ කොළඹ වරාය සම්බන්ධ කෙරෙන ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රස්ථානයක් මධ්‍යයේ පිහිටා ඇත. අලුතින් ඉදි කරන ලද මංතීරු හයකින් සමන්විත පාලම සහ එහි සිට නගරය කරා දිවෙන කුළුණු මත ඉදි වූ මාර්ගය හේතුවෙන් පසුගිය වසර කිහිපය තුළ කොළඹ ප්‍රදේශයේ දක්නට ලැබුණු වාහන තදබදයට විසඳුමක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. කොම්පඤ්ඤවීදිය හා ගැටඹේ හන්දිය සහ කොහුවල හන්දිය ආශ්‍රිත ගුවන් පාලම් ඉදිකිරීම වැනි තවත් මාර්ග සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් වසර තුළ දී ආරම්භ කරන ලදී. මීට අමතරව, කොච්චිකඩේ අතුරු මාර්ගය සහ අලව්ව

හා මුත්තෙට්ටුගල දුම්රිය හරස් මාර්ගවල ගුවන් පාලම් ඉදිකිරීම සඳහා අවශ්‍ය ශක්‍යතා අධ්‍යයන අවසන් කර ඇති අතර, සමුද්‍ර මාර්ගය දෙහිවල සිට පානදුර දක්වා දීර්ඝ කිරීමේ කටයුතු මෙම වසර තුළ දී ක්‍රියාත්මක විය. බදුල්ල-චෙන්කලඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට (A005) සමගාමීව, විශේෂයෙන්ම දක්ෂිණ අධිවේගී මාර්ගය ඇතුළු දක්ෂිණ මාර්ගවල සබඳතා සංවර්ධනය කෙරෙහි ඉලක්කගත කෙරුණු දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය ද ක්‍රියාත්මක විය. මේ අතර, වසර තුළ දී නව කැලණි පාලමේ සිට පිටත වටරවුම් අධිවේගී මාර්ගය දක්වා කුළුණු මතින් දිවෙන අධිවේගී මාර්ගය ඉදිකිරීමට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කරමින් පැවති අතර, නව කැලණි පාලමේ සිට රාජගිරිය දක්වා දිවෙන කොටසේ පාරිසරික බලපෑම් තක්සේරු කිරීම අවසන් විය.

මාර්ගස්ථ මගී ප්‍රවාහනය

කොවිඩ්-19 ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා වරින් වර සංචරණ සීමා පැනවීම සහ පෞද්ගලික ප්‍රවාහන සේවා සඳහා වන කැමැත්ත ඉහළ යෑම මධ්‍යයේ රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම සීමා වූ ප්‍රවාහන මෙහෙයුම් කටයුතු පෙන්නුම් කරමින්, මාර්ගස්ථ මගී ප්‍රවාහන කටයුතුවල සමස්ත කාර්ය සාධනය 2021 වසරේ දී අඛණ්ඩව පහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලං.ග.ම.) සහ පෞද්ගලික අංශයේ පොදු ප්‍රවාහන මෙහෙයුම් කටයුතු 2021 වසරේ දී කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා කළේය. ඒ අනුව, වසර තුළ දී ශ්‍රී ලං.ග.ම.යේ ධාවන කිලෝමීටර් ගණන සහ මගී කිලෝමීටර් ගණන, පිළිවෙළින්, සියයට 19.7කින් සහ සියයට 28.4කින් පහළ ගිය අතර, ධාවනය කළ සාමාන්‍ය බස් රථ සංඛ්‍යාව 2020 වසරේ දී වාර්තා වූ 4,045ට සාපේක්ෂව 2021 වසරේ දී 4,449ක් දක්වා ඉහළ ගියේය. එම බස් රථ සංඛ්‍යාව වසර තුළ දී ශ්‍රී ලං.ග.ම.යේ පොදු ප්‍රවාහන කටයුතු සඳහා ඵලදායි ලෙස යොදා ගත හැකි බස් රථ සංඛ්‍යාවෙන් සියයට 85.7ක් පමණ විය. මේ අතර, පෞද්ගලික අංශය මගින් ධාවනය කළ බස් රථ සංඛ්‍යාවෙහි සාමාන්‍යය පෙර වසරේ වාර්තා කළ බස් රථ 10,787ක සිට 2021 වසරේ දී බස් රථ 9,053ක් දක්වා සියයට 16.1කින් පහළ ගියේය. වසර තුළ දී, පෞද්ගලික අංශයේ බස් රථවල මගී කිලෝමීටර් ගණන සහ ධාවන කිලෝමීටර ගණන ද, පිළිවෙළින්, සියයට 12.2කින් සහ සියයට 4.4කින් පහළ ගියේය. 2021 වසර අවසානය වන විට, ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් පළාත් අතර බස් රථ ධාවනය සඳහා බලපත්‍ර 1,978ක් ද, පළාත තුළ බස් රථ ධාවනය සඳහා බලපත්‍ර 16,914ක් ද පෞද්ගලික අංශයට ලබා දී තිබුණි.

ජාතික ගමනාගමන කොමිෂන් සභාව කොවිඩ්-19 පැතිරීම වැළැක්වීම සඳහා නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශවලට විශේෂයෙන් ම, ආසන ධාරිතාව සීමා කිරීමට අදාළ මාර්ගෝපදේශවලට අනුගත වෙමින්, 2021 වසර තුළ දී ආරක්ෂිත පොදු ප්‍රවාහන පහසුකම් පුළුල් කිරීමට අඛණ්ඩව කටයුතු කළේය. ඒ අනුව, කොවිඩ්-19 ආශ්‍රිත සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව *සිසු සැරිය*, *ගැමි සැරිය* සහ *නිසි සැරිය* ඇතුළු විශේෂ බස් රථ සේවා කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. පාසල් ළමුන් ප්‍රවාහනය පහසු කිරීම සඳහා නව බස් රථ සේවා 97ක් පමණ *සිසු සැරිය* සේවාවට එකතු කරන ලදී. 2021 වසර අවසානය වන විට, *සිසු සැරිය* වැඩසටහන යටතේ බස් රථ සේවා 1,563ක් ද, *නිසි සැරිය* වැඩසටහන යටතේ බස් රථ සේවා 194ක් ද සහ *ගැමි සැරිය* ග්‍රාමීය බස් රථ සේවා වැඩසටහන යටතේ සේවා 14ක් ද ක්‍රියාත්මක විය. මෙම ව්‍යාපෘතිය තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින්, අලුතින් නිසි සැරිය සේවා 305ක් එක් කිරීම සඳහා වසර තුළ දී ජාතික ගමනාගමන කොමිෂන් සභාව ශ්‍රී ලං.ග.ම.ට අනුමැතිය ලබා දුන්නේය. ජාතික ගමනාගමන කොමිෂන් සභාව ද දකුණ, සබරගමුව, ඌව සහ උතුරු මැද යන පළාත් ආවරණය වන පරිදි නව බස් රථ සේවා 59ක් ද ආරම්භ කළේය.

2021 වසර තුළ දී අවස්ථා දෙකක දී දේශීය ඉන්ධන මිල ගණන් සංශෝධනය කිරීමත් සහ 2022 වසරේ මාර්තු මාසයේ දී නැවත සිදු වූ මිල සංශෝධනය කිරීමත් සමඟ ජාතික ගමනාගමන කොමිෂන් සභාවට බස් ගාස්තු ඉහළ දැමීම සඳහා කටයුතු සිදු කිරීමට සිදු විය. ඒ අනුව, 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී සාමාන්‍ය, සුඛෝපබෝගී සහ අර්ධ සුඛෝපබෝගී බස් ගාස්තු සාමාන්‍යයෙන් සියයට 17.4කින් ඉහළ නැංවූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අවම බස් ගාස්තුව රුපියල් 14.00ක සිට රුපියල් 17.00 ක් දක්වා ඉහළ ගියේය. සංශෝධිත බස් ගාස්තු 2022 වසරේ ජනවාරි 05 වන දින සිට ක්‍රියාත්මක විය. බස් ගාස්තුවල සාමාන්‍යය සියයට 15.0කින් ඉහළ නංවමින් 2022 වසරේ මාර්තු මාසයේ දී තවත් ගාස්තු සංශෝධනයක් සිදු වූ අතර, ඒ අනුව අවම බස් ගාස්තුව රුපියල් 20.00ක් දක්වා ඉහළ ගියේය.

සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලං.ග.ම.යේ මෙහෙයුම් අඩුවීමත් සමඟ 2021 වසරේ දී එහි මූල්‍ය කාර්ය සාධනය අඛණ්ඩව පසුබෑමට ලක් විය.

3.4 සංඛ්‍යා සටහන

රථවාහන නව ලියාපදිංචි කිරීම

ශීර්ෂය	2020	2021 (අ)	වර්ධන අනුපාතය %	
			2020	2021 (අ)
රථවාහන නව ලියාපදිංචි කිරීම (සංඛ්‍යාව)	**202,628**	**33,850**	**-44.8**	**-83.3**
බස් රථ	578	281	-64.2	-51.4
මෝටර් රථ	21,021	3,495	-45.0	-83.4
ත්‍රිරෝද රථ	7,150	2,093	-53.8	-70.7
ද්විත්ව කාර්ය වාහන	9,532	771	-29.2	-91.9
යතුරු පැදි	151,634	8,011	-46.7	-94.7
භාණ්ඩ ප්‍රවාහන වාහන	3,941	4,432	-24.5	12.5
ඉඩම් වාහන	8,302	14,764	8.3	77.8
කොඩ්‍රසයිකල් සහ මෝටර් නිවාස	470	3	-64.4	-99.4

(අ) තාවකාලික

මූලය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

3

විගණනය නොකළ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ශ්‍රී ලං.ග.ම.හි සමස්ත ආදායම 2021 වසරේ දී රුපියල් බිලියන 26.9ක් දක්වා සියයට 13.7කින් පහළ ගිය අතර, සමස්ත වියදම ද රුපියල් බිලියන 30.4ක් දක්වා සියයට 9.1කින් පමණ අඩු විය. ශ්‍රී ලං.ග.ම. පසුගිය වසරේ වාර්තා කළ රුපියල් බිලියන 2.2ක මෙහෙයුම් අලාභයට සාපේක්ෂව, 2021 වසරේ දී රුපියල් බිලියන 3.4ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය. වසර තුළ දී, ආර්ථික වශයෙන් ප්‍රතිලාභ නොලැබෙන මාර්ගවල ප්‍රවාහන සේවා යෙදවීමට සහ සහනාධාර වාර ප්‍රවේශපත්‍ර සඳහා පහසුකම් සැලසීමට රජය විසින් ලබාදුන් සහනාධාර මුදල රුපියල් බිලියන 12.2කි. මේ අතර, ශ්‍රී ලං.ග.ම. සිය බස් රථ සංඛ්‍යාව ඉහළ නැංවීමටත්, එමගින් මගීන්ට සපයන සේවා වැඩිදියුණු කිරීමටත් වැඩසටහන් කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය. ඒ අනුව, ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු බස් රථ 213ක් පමණ සමස්ත බස් රථ සංඛ්‍යාවට එක් කළ අතර, 2022 වසරේ මුල් භාගයේ දී ශ්‍රී ලං.ග.ම. සඳහා ඉන්දීය ණය පහසුකම යටතේ නව බස් රථ 500ක් මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත.

කොවිඩ්-19 වසංගතය ආරම්භයේ සිටම අත්‍යවශ්‍ය නොවන ආනයන මත පනවා ඇති සීමාවල බලපෑම පිළිබිඹු කරමින්, 2021 වසරේ දී නව මෝටර් රථ ලියාපදිංචිය අඛණ්ඩව පහළ ගියේය. 2020 වසර තුළ දී සිදු වූ සියයට 44.8ක පහළ යෑම හා සැසඳීමේ දී නව මෝටර් රථ ලියාපදිංචිය 2021 වසරේ දී සියයට 83.3කින් කැපී පෙනෙන ලෙස පහළ ගියේය. තනි කැබ් රථ, මෝටර් කාර් රථ, යතුරුපැදි සහ ද්විත්ව කාර්ය රථවල නව ලියාපදිංචිය සියයට 80කට වඩා පහළ යෑමක් වාර්තා කිරීමත් සමඟ සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී සියලුම ප්‍රධාන මෝටර් රථ කාණ්ඩවල අඩු වීමක් දක්නට ලැබුණි.

දුම්රිය ප්‍රවාහනය[1]

ශ්‍රී ලංකා දුම්රිය සේවය (ශ්‍රී ලං.දු.සේ.) 2021 වසරේ දී අඛණ්ඩව දුර්වල මූල්‍ය කාර්ය සාධනයක් වාර්තා කළේය. තාවකාලික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ශ්‍රී ලං.දු.සේ. 2020 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 10.1ක මෙහෙයුම් අලාභය හා සැසඳීමේ දී, මෙම වසර තුළ දී රුපියල් බිලියන 10.3ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය. මගී ප්‍රවාහනයෙන් ඉපැයූ ආදායම සියයට 53.0කින් පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන ශ්‍රී ලං.දු.සේ.හි සමස්ත ආදායම, පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 2.7ක් දක්වා සියයට 41.3කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. ආදායමෙහි මෙම පහළ යෑම සඳහා අප්‍රේල් සහ අගෝස්තු යන මාසවල දී කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ත වීම ප්‍රධාන වශයෙන් හේතු විය. වසර තුළ දී, පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්, පිළිවෙළින්, රුපියල් බිලියන 13.0ක් සහ රුපියල් බිලියන 27.4ක් දක්වා, පිළිවෙළින්, සියයට 11.2කින් සහ සියයට 19.6කින් පහළ යෑම හේතුවෙන්, ශ්‍රී ලං.දු.සේ.හි සමස්ත වියදම රුපියල් බිලියන 40.4ක් දක්වා සියයට 17.1කින් පහළ ගියේය. මෙහෙයුම් අඩු වීම හේතුවෙන් සේවක වැටුප් වියදම් මෙන්ම, ඉන්ධන වියදම් පහළ යෑම පුනරාවර්තන වියදමෙහි පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

මන්දගාමී වේගයකින් වුව ද, 2021 වසරේ දී ශ්‍රී ලං.දු.සේ. යටිතල පහසුකම් සංවර්ධන සහ සේවා වැඩිදියුණු කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කරගෙන ගියේය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ

1 මෙම වාර්තාව ප්‍රකාශයට පත් කරන විට, ශ්‍රී ලංකා දුම්රිය සංස්ථාවේ 2021 වසරේ මෙහෙයුම්වලට අදාළව දත්ත නිකුත් වී නොතිබිණි.

3.8 රූප සටහන

රථවාහන නව ලියාපදිංචිය



මූලය: මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව

3.5 සංඛ්‍යා සටහන

ගමනාගමන අංශයේ රජය සතු ව්‍යවසායවල මූලික ලක්ෂණ

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)	වර්ධන අනුපාතය % 2020 (අ)	2021 (ආ)
2. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය				
ධාවන කිලෝමීටර් (මිලියන)	309	248	-28.4	-19.7
මගී කිලෝමීටර් (මිලියන)	8,623	6,175	-39.9	-28.4
මුළු ආදායම (රු. මිලියන)	31,233	26,948	-28.2	-13.7
මෙහෙයුම් වියදම (රු. මිලියන)	33,437	30,386	-20.3	-9.1
මෙහෙයුම් ලාභය (+)/ අලාභය (-) (රු. මිලියන)	-2,204	-3,438	-241.6	56.0
3. ශ්‍රී ලංකා දුම්රිය සේවය				
ධාවන කිලෝමීටර් ('000)	7,990	ලැ.නො.	-28.9	-
මගී කිලෝමීටර් (මිලියන)	3,906	ලැ.නො.	-46.6	-
භාණ්ඩ ටොන් කිලෝමීටර් (මිලියන)	114	ලැ.නො.	-1.1	-
මුළු ආදායම (රු. මිලියන)	4,567	2,679	-42.2	-41.3
මෙහෙයුම් වියදම (රු. මිලියන)	14,618	12,979	-5.5	-11.2
මෙහෙයුම් ලාභය (+)/ අලාභය (-) (රු. මිලියන)	-10,051	-10,300	32.9	2.5
4. ශ්‍රීලංකන් ගුවන් සේවය				
පියාසර කරන ලද පැය ගණන	41,585	50,287	-61.1	20.9
මගී කිලෝමීටර් ප්‍රමාණය (මිලියන)	3,641	2,868	-76.5	-21.2
මගී ආසන පිරීමේ අනුපාතය (%)	56	36	-32.6	-36.0
බර පැටවීමේ අනුපාතය (%)	62	74	-16.8	19.6
භාණ්ඩ ප්‍රවාහනය (මෙ.ටො. '000)	56	93	-54.3	66.0
සේවා නියුක්තිය (සංඛ්‍යාව)	6,489	5,732	-3.3	-11.7

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා දුම්රිය සේවය
ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

අවහිරතා මධ්‍යයේ මධ්‍යස්ථ වේගයකින් වුව ද, දුම්රිය මාර්ග පද්ධති, දුම්රිය ඒකක සහ දුම්රිය සංඥා හා විදුලි සංදේශ සේවාවලට අදාළ සියලුම වැඩිදියුණු කිරීම් සහ නඩත්තු කටයුතු සිදු විය. වසර තුළ දී කුරුණ සිට මීගමුව දක්වා දිවෙන දුම්රිය මාර්ගය ද්විත්ව දුම්රිය මාර්ගයක් බවට පත් කිරීමේ ව්‍යාපෘතිය අවසන් කරන ලද අතර, මහනුවර සිට සරසවි උයන දක්වා කිලෝමීටර 5ක දිගකින් යුතු දුම්රිය මාර්ගය ද්විත්ව දුම්රිය මාර්ගයක් බවට පත් කිරීමේ කටයුතු ද ආරම්භ කරන ලදී. 2020 වසරේ දී ආරම්භ කරන ලද මගී දුම්රිය මැදිරි 200ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලද අතර, මෙම ව්‍යාපෘතියේ පුළුල් කිරීමක් ලෙස තවත් මගී දුම්රිය මැදිරි 100ක ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලදී. ඒ යටතේ 2021 වසරේ දී මගී දුම්රිය මැදිරි 30ක් නැවත ධාවනයට මුදා හැර ඇත. 2017 වසරේ දී ලබාගත් ඉන්දියානු ණය පහසුකම යටතේ වායුසමීකරණය කළ බලවේග කට්ටල දෙකක් මිලදීගෙන දුම්රිය පද්ධතියට එක් කරන ලද අතර, වසර තුළ දී මගී දුම්රිය මැදිරි 120ක් මිලදී ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පැවතුණි. ප්‍රධාන මාර්ගයේ, වෙරළබඩ මාර්ගයේ, පුත්තලම මාර්ගයේ, කැලණිවැලි මාර්ගයේ, මාතලේ මාර්ගයේ, උතුරු මාර්ගයේ සහ නැගෙනහිර මාර්ගයේ පිහිටා ඇති දුම්රිය පාලම්වල නඩත්තු කටයුතු වසර තුළ දී සිදුවෙමින් පැවතුණි. වසර තුළ දී සංඥා සහ විදුලි සංදේශ පද්ධති සැපයීමට අදාළ ව්‍යාපෘති කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී.

සිවිල් ගුවන් සේවය

කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ විදේශ ගමන් සඳහා වන රුචිය අඩු වීම හේතුවෙන් සිවිල් ගුවන් සේවා කර්මාන්තයේ ක්‍රියාකාරිත්වය අඛණ්ඩව මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. ඒ අනුව, 2020 වසරේ දී දක්නට ලැබුණු සියයට 76.0ක ශීඝ්‍ර පහත වැටීමෙන් අනතුරුව, 2021 වසරේ දී මගී පැමිණීම් සංඛ්‍යාව සියයට 36.8කින් අඛණ්ඩව පහළ ගියේය. පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී ගුවන් යානා හැසිරවීම් සංඛ්‍යාව සුළු පහළ යෑමක් පමණක් වාර්තා කළේය. මගීන්ගේ ගමනාගමනය පහසු කිරීම සහතික කරන අතරම, කොවිඩ්-19 ආශ්‍රිත මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම සඳහා වන රාජ්‍ය අංශයේ පාර්ශ්වකරුවන්ගේ කැපවීම මෙම අංශයේ ක්‍රියාකාරිත්වය ඉහළ නැංවීම සඳහා හේතු විය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට අමතරව, රත්මලාන ජාත්‍යන්තර ගුවන් තොටුපළ ද ජාත්‍යන්තර සෞඛ්‍ය සහ ආරක්ෂිත මාර්ගෝපදේශවලට අනුගත වීම වෙනුවෙන් ජාත්‍යන්තර ගුවන් තොටුපළ කවුන්සිලය (Airports Council International) වෙතින් ගුවන් තොටුපළ සෞඛ්‍ය ප්‍රතීතන සහතිකය ලබාගෙන ඇත. මේ අතර, මැදපෙරදිග ඇතැම් ගමනාන්ත වෙත ගමන් කරන මගීන්ගේ විශේෂ අවශ්‍යතා සපුරාලීමේ අරමුණින්, වේගවත් පී.සී.ආර්. පරීක්ෂණ සේවා පහසුකමක් ද

3.9 රූප සටහන

ගුවන් මගී හා ගුවන් භාණ්ඩ හැසිරවීම්



මූලය: ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ස්ථාපිත කර තිබුණි. 2022 වසරේ මාර්තු මාසයේ සිට, පූර්ණ එන්නත්කරණයට ලක් වූ සහ වයස අවුරුදු 12ට අඩු මගීන්ට තවදුරටත් පී.සී.ආර්. පරීක්ෂණ හෝ ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂණ අවශ්‍ය නොවිණි. වසංගතය ක්‍රමිකව පහව යෑමත් සමඟ විදේශ ගමන් සාමාන්‍යකරණය කිරීමට ගත් එවැනි ක්‍රියාමාර්ග හේතුවෙන් සිවිල් ගුවන් සේවා අංශය ස්ථාවර ලෙස යථා තත්ත්වයට පත් කිරීම සඳහා පහසුකම් සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ ඇතැම් බාධා මධ්‍යයේ වුවද, ගුවන් යානා සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් මන්දගාමීව ක්‍රියාත්මක විය. ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ තුළ දෙවන පර්යන්තය (A පැකේජය) ඉදිකිරීමෙහි කටයුතු අඛණ්ඩව කරගෙන ගියේය. 2021 වසරේ නොවැම්බර් මාසයේ දී, ගුවන් සමාගම්වල භාවිතය සඳහා ගුවන් යානා නවත්වන කොටස සහ ගුවන් යානා බැහැරුම් පථය (B පැකේජය) විවෘත කරන ලදී. තවද, 2021 වසර අවසානය වන විට, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ, රත්මලාන සංවර්ධන ප්‍රධාන සැලැස්ම - 2030 වසර උදෙසා වන දැක්ම යටතේ අතිරේක ගුවන් යානා නවත්වන කොටසක් සහිත නව ගුවන් යානා බැහැරුම් පථයක් ඉදිකිරීමට අදාළ කටයුතුවලින් සියයට 75ක් නිම කර ඇත.

2021 වසරේ මුල් භාගයේ දී ජාත්‍යන්තර ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකා දේශ සීමා නැවත විවෘත කිරීම සහ සමස්තයක් ලෙස ගෝලීය වශයෙන් සංචාරක කටයුතු සඳහා ඇති කැමැත්ත වර්ධනය වීම මධ්‍යයේ ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි දුර්වල මූල්‍ය කාර්ය සාධනයෙහි කිසියම් වැඩිදියුණු වීමක් වාර්තා විය. 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 49.3ක වර්ධනයක් වාර්තා කරමින්, 2021 වසරේ දෙසැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ දී ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි මෙහෙයුම් අලාභය රුපියල් බිලියන 14.3ක් දක්වා පහළ ගියේය. සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ ලැබූ මෙම වර්ධනය සඳහා, ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි මෙහෙයුම් වියදමෙහි වාර්තා වූ සියයට 54.9ක ඉහළ යෑම අභිබවමින් මෙහෙයුම් ආදායම සියයට 152.9කින් වැඩි වීම හේතු විය. ශ්‍රීලංකන් ගුවන් සේවයෙහි මෙහෙයුම් කටයුතුවල සැලකිය යුතු දියුණුවක් ඇති කිරීමට දායක වූ කැපී පෙනෙන පියවර අතර, භාණ්ඩ මෙහෙයුම් කටයුතු යටතේ අපනයන මෙහෙයුම් අඛණ්ඩව සිදු කරගෙන යෑම පමණක් නොව අත්‍යවශ්‍ය ඖෂධ සැපයුම් සහ

3.6 සංඛ්‍යා සටහන

ගුවන් සේවා අංශයේ ක්‍රියාකාරිත්වය

ශීර්ෂය	2020	2021 (අ)	වර්ධන අනුපාතය %	
			2020	2021(අ)
1. මගීන් (ගණන) (ආ)	**2,372,928**	**1,500,078**	**-76.0**	**-36.8**
ශ්‍රීලංකන් ගුවන් සේවය	1,237,931	857,158	-77.8	-30.8
විදේශ ගුවන් සේවා	1,134,997	642,920	-73.7	-43.4
2. භාණ්ඩ ප්‍රවාහනය (මෙ.ටො)	**136,093**	**184,139**	**-44.8**	**35.3**
ශ්‍රීලංකන් ගුවන් සේවය	56,151	93,195	-54.3	66.0
විදේශ ගුවන් සේවා	79,942	90,944	-35.3	13.8
3. ගුවන්යානා ගමනාගමනය (ගණන) (ඇ)	**25,576**	**25,090**	**-74.0**	**-1.9**
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළ	24,931	24,336	-74.3	-2.4
මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ	505	722	-60.9	43.0
යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපොළ	140	32	-31.4	-77.1

(අ) තාවකාලික
(ආ) සංක්‍රමණික මගීන් ඇතුළත් නොවේ
(ඇ) දේශීය ගුවන් ගමන් ඇතුළත් වේ

මූලය: ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

එන්නත් ප්‍රවාහනය කිරීම සඳහා ද ඉහළ අවධානයක් යොමු වීම ඇතුළත් විය. ශ්‍රීලංකන් ගුවන් සේවය සිය දේශසීමා හරහා සිදු කරන වාණිජ භාණ්ඩ මෙහෙයුම් ද වැඩි කර ඇත. ජාතික ගුවන් සේවය වසර තුළ දී නව ගමනාන්ත කිහිපයක් වෙත ගුවන් ගමන් වැඩි කර ඇති අතර, එමගින් එහි ගුවන් යානාවල මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යෑමට උපකාරී වී ඇත. 2022 වසරේ මාර්තු මාසයේ ශ්‍රී ලංකාවේ පැවති සුප්‍රසිද්ධ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා ඉසව්වක් සඳහා ශ්‍රීලංකන් ගුවන් සේවය නිල ගුවන් සේවා සහකරු වීම හරහා ශ්‍රීලංකන් ගුවන් සේවය ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රවර්ධන කටයුතුවල අඛණ්ඩව ක්‍රියාකාරීව නිරත විය.

වරාය සේවා

වසංගතයට පෙර පැවති මට්ටම් ඉක්මවා ගිය මෙහෙයුම් ක්‍රියාකාරකම් මට්ටම් වාර්තා කරමින් 2021 වසරේ දී වරාය කටයුතු ශීඝ්‍ර ලෙස යථා තත්ත්වයට පත් විය. වසර ආරම්භයේ දී පසුබෑමක් පෙන්නුම් කළ ද, කොවිඩ්-19 ඩෙල්ටා ප්‍රභේදයේ ශීඝ්‍ර ව්‍යාප්තිය හේතුවෙන් වරාය මෙහෙයුම් සඳහා යම් බාධා ඇති වූ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී හැර වසර පුරා වරාය ක්‍රියාකාරකම්වල ප්‍රගතියක් දක්නට ලැබුණි. ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ ඉහළම මට්ටම් ඉක්මවා යමින්, වසර තුළ දී අඩි විස්සේ බහලු ඒකක මිලියන 7.2කට සමාන බහලු ප්‍රමාණයක් සහ භාණ්ඩ මෙට්‍රික් ටොන් 109,369ක් මෙහෙයවනු ලැබීය. ඒ අනුව, කොළඹ වරායේ බහලු සහ භාණ්ඩ මෙහෙයුම්, පිළිවෙළින්, සියයට 5.8ක සහ සියයට 6.3ක වර්ධනයන් වාර්තා කළේය. තවද,

3.7 සංඛ්‍යා සටහන

වරාය සේවා ක්‍රියාකාරිත්වය

ශීර්ෂය	2020	2021 (අ)	වර්ධන අනුපාතය %	
			2020	2021(අ)
1. පැමිණි නැව් සංඛ්‍යාව	4,337	4,180	-7.7	-3.6
කොළඹ	3,806	3,675	-9.3	-3.4
ගාල්ල	22	14	-48.8	-36.4
ත්‍රිකුණාමලය	135	117	-4.9	-13.3
හම්බන්තොට	374	374	19.1	-
2. මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය (මෙ.ටො. '000)	102,908	109,369	-3.8	6.3
කොළඹ	97,681	103,824	-4.2	6.3
ද.ආ.පි.ප.	24,878	24,062	-6.2	-3.3
කො.ජා.බ.ප.	37,310	42,400	0.6	13.6
ශ්‍රී ලං.ව.අ.	35,493	37,362	-7.4	5.3
ගාල්ල	404	106	-20.8	-73.8
ත්‍රිකුණාමලය	3,072	3,190	-7.0	3.8
හම්බන්තොට	1,750	2,249	41.2	28.5
3. බහලු මෙහෙයුම් ප්‍රමාණය (TEUs '000) (ආ)	6,855	7,249	-5.2	5.8
ද.ආ.පි.ප.	1,872	1,839	-8.8	-1.8
කො.ජා.බ.ප.	2,885	3,212	-0.3	11.3
ශ්‍රී ලං.ව.අ.	2,098	2,198	-8.1	4.8
4. බහලු ප්‍රතිනැව්ගත කිරීම් (TEUs '000) (ආ) (ඇ)	5,765	6,050	-3.2	4.9
ද.ආ.පි.ප.	1,607	1,573	-2.7	-2.1
කො.ජා.බ.ප.	2,291	2,600	-0.2	13.4
ශ්‍රී ලං.ව.අ.	1,867	1,877	-7.0	0.6

(අ) තාවකාලික
(ආ) TEUs = අඩි විස්සට සමාන බහලු ඒකක
(ඇ) නැවත ගබඩා කිරීම් ද ඇතුළත් ව

මූලයඃ ශ්‍රී ලංකා වරාය අධිකාරිය

කොළඹ ජාත්‍යන්තර බහලු පර්යන්තය (කො.ජා.බ.ප.) සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය (ශ්‍රී ලං.ව.අ.) භාණ්ඩ මෙහෙයුම් සහ බහලු මෙහෙයුම් යන දෙඅංශයෙන්ම වර්ධනයන් වාර්තා කළ අතර, දකුණු ආසියානු පිවිසුම් පර්යන්තය (ද.ආ.පි.ප.) මෙහෙයුම්වල සුළු පහළ යෑමක් වාර්තා කළේය. විශේෂයෙන් ම, කො.ජා.බ.ප. මීට දශකයකට පමණ පෙර වූ එහි ආරම්භයේ සිට මේ දක්වා වූ කාලය තුළ ප්‍රථම වතාවට අඩි විස්සේ බහලු ඒකක මිලියන 3කට අධික ප්‍රමාණයක් මෙහෙයවීය. කො.ජා.බ.ප., ශ්‍රී ලං.ව.අ. සහ ද.ආ.පි.ප. මගින් කොළඹ වරායේ මෙහෙයවනු ලැබූ සමස්ත බහලු ධාරිතාවය සඳහා, පිළිවෙළින්, සියයට 44.3ක, සියයට 30.3ක, සියයට 25.4ක දායකත්වයක් සැපයීය. 2020 වසරේ ඔක්තෝබර් මාසයේ දී විවෘත කරන ලද නැගෙනහිර බහලු පර්යන්තය (නැ.බ.ප.) මගින් මෙම වසර තුළ දී අඩි විස්සේ බහලු ඒකක 390,069කට සමාන බහලු ප්‍රමාණයක් හසුරවන ලදී. වරාය මෙහෙයුම් ක්‍රියාකාරකම්වල වර්ධනයක් පැවතිය ද, විශාල නැව් වැඩි වශයෙන් පැමිණීම හේතුවෙන් සමස්ත නැව් පැමිණීම් සංඛ්‍යාව 2021 වසරේ දී පහළ යෑමක් වාර්තා කළේය. කලාපය තුළ ප්‍රධාන වරාය කේන්ද්‍රස්ථානයක් ලෙස නැගී සිටීම සඳහා කොළඹ වරායෙහි ඇති ඉහළ ශක්‍යතාව ඉස්මතු කරමින්, ලෝක බැංකුව සහ අයිඑච්එස් මාර්කිට් (IHS Markit) විසින් සම්පාදිත *බහාලුම් වරාය කාර්ය සාධන දර්ශකය* (Container Port Performance Index) (17 වන ස්ථානය) සහ වෙළඳ හා සංවර්ධන කටයුතු පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව (UNCTAD) විසින් සම්පාදිත *වරායයන් සඳහා වූ නිශ්චිත නාවික ගමනාගමන සම්බන්ධතා පිළිබඳ දර්ශකය* (Port Liner Shipping Connectivity Index) (17 වන ස්ථානය) වැනි ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් තුළ කොළඹ වරාය අඛණ්ඩව ඉහළ ස්ථානයන්හි ශ්‍රේණිගත විය.

කොවිඩ්-19 ආශ්‍රිත අවහිරතා මධ්‍යයේ වුව ද, වසර තුළ දී කොළඹ වරායේ ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන කටයුතු වඩාත් ස්ථාවර ලෙස අඛණ්ඩව සිදු විය. නැ.බ.ප.හි II අදියරේ ඉදිකිරීම් කටයුතු 2022 වසරේ ජනවාරි මාසයේ දී ආරම්භ වූ අතර, බටහිර බහලු පර්යන්තය (බ.බ.ප.) සඳහා විදේශීය ආයෝජකයෙකු, දේශීය ආයෝජකයෙකු සහ ශ්‍රී ලං.ව.අ. අතර *ඉදිකිරීම, ක්‍රියාත්මක කිරීම, අයිතිය පැවරීම පදනම් කර ගත් ගිවිසුමක්* (Built-Operate-Transfer agreement) වසර 35ක කාලයක් සඳහා අත්සන් කරන ලදී. නැ.බ.ප. සහ බ.බ.ප.යේ ඉදිකිරීම් කටයුතු, පිළිවෙළින්, 2025 සහ 2026 වන විට නිම කිරීම හරහා කොළඹ වරායේ ධාරිතාව අඩි විස්සේ බහලු ඒකක මිලියන 6කින් ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. තවද, *ජාතික වරාය ප්‍රධාන සැලැස්මට* අනුව, නව වරාය සන්නිවේදන පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ මූලික සැලසුම් සහ ශක්‍යතා අධ්‍යයනය 2021 වසරේ දී ආරම්භ විය. උතුරු කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීම සහ සංචාරක කර්මාන්තය සඳහා අංග සම්පූර්ණ

3.10 රූප සටහන

බහලු මෙහෙයුම්, ප්‍රතිනැව්ගත කිරීම් සහ නැව් පැමිණීම්



මූලයඃ ශ්‍රී ලංකා වරාය අධිකාරිය

3.11 රූප සටහන
වරාය ක්‍රියාකාරකම් වල ක්‍රියාකාරිත්වය



මූලය: ශ්‍රී ලංකා වරාය අධිකාරිය

3

වරායක් ලෙස ගාලු වරාය සංවර්ධනය කිරීම සඳහා අභිමතය විමසීමේ යෝජනා කැඳවීමට අදාළ කටයුතු ද වසර තුළ දී ක්‍රියාත්මක විය.

දේශීය රථ වාහන මෙහෙයුම්වල ඉතා පහළ මට්ටමේ ක්‍රිකාරීත්වයක් තිබියදීත්, මුළුමනින්ම රථ වාහන ප්‍රතිනැව්ගතකිරීම් හේතුකොටගෙන හම්බන්තොට වරායේ සමස්ත රථ වාහන මෙහෙයුම් ප්‍රමාණය එම වරායේ මෙහෙයුම් ආරම්භයේ සිට වාර්තා කළ ඉහළම වර්ධනය වාර්තා කරමින් 2021 වසරේ දී සියයට 40.4කින් ඉහළ ගියේය. ඒ අනුව, හම්බන්තොට වරාය තුළ හසුරවන ලද සමස්ත රථ වාහන සංඛ්‍යාව 493,400ක් වූ අතර, එයින් 489,942ක් රථ වාහන ප්‍රතිනැව්ගත කිරීම් විය. රථ වාහන ප්‍රතිනැව්ගත කිරීම් සියයට 46.3ක වර්ධනයක් වාර්තා කළ අතර, අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන මෝටර් රථ ආනයන මත පැනවූ සීමා හේතුවෙන් දේශීය රථ වාහන මෙහෙයුම් සියයට 76.9ක දැඩි පහළ යෑමක් වාර්තා කළේය.

2021 වසරේ වරාය කටයුතුවල ඉහළ යෑම හේතුවෙන් ශ්‍රී ලං.ව.අ. මූල්‍ය කාර්ය සාධනය වර්ධනය විය. ඒ අනුව, 2020 වසරේ දී බිලියන 20.3ක් වූ ශ්‍රී ලං.ව.අ.හි බදුවලට පෙර ලාභය 2021 දී රු. බිලියන 25.6ක් ලෙස වාර්තා විය. ශ්‍රී ලං.ව.අ.හි සමස්ත ආදායම රුපියල් බිලියන 45.5ක් දක්වා සියයට 16.8කින් ඉහළ ගිය අතර, මෙහෙයුම් වියදම ද රුපියල් බිලියන 32.9ක් දක්වා සියයට 10.7කින් ඉහළ ගියේය.

පණිවුඩ හුවමාරු සේවා

කොවිඩ්-19 වසංගතය අඛණ්ඩව ව්‍යාප්ත වීමේ අභියෝග තුළින් පැන නැඟුණු, ආර්ථිකයේ නූතන සන්නිවේදන අවශ්‍යතා සඳහා විශේෂයෙන්ම පහසුකම් සලසමින් විදුලි සංදේශ අංශය 2021 වසරේ දී අඛණ්ඩව පුළුල් විය. 2020 වසරේ දී දක්නට ලැබුණු පරිදි, 2021 වසර තුළ දී ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා විදුලි සංදේශ අංශය අඛණ්ඩව ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. ආර්ථික ක්‍රියාකාරකම් රාශියක් සඳහා මංගත ක්‍රමවේද භාවිත කිරීම ඉහළ යෑම මෙම අංශයේ හිතකර වර්ධනය සඳහා හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, දුරකථන සහ ජංගම දුරකථන ඝනත්වය වර්ධනය වීම හා සමගාමීව සමස්ත ජංගම දුරකථන සම්බන්ධතා, ස්ථාවර රැහැන් සහ රැහැන් රහිත දුරකථන සම්බන්ධතා සංඛ්‍යාව අඛණ්ඩව ඉහළ ගියේය.

නිවසේ සිට රැකියාවේ නිරත වීමේ ක්‍රමවේදය අනුගමනය කිරීම සහ අතථ්‍ය ඉගෙනුම් ක්‍රමවේද හරහා අධ්‍යාපන ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරගෙන යෑම හේතුවෙන් අන්තර්ජාල භාවිතයෙහි ද සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. ඒ අනුව, ජංගම සහ ස්ථාවර අන්තර්ජාල සම්බන්ධතා යන දෙඅංශයෙහිම ඉහළ යෑමත් සමඟ සමස්ත අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව සියයට 26.9කින් වර්ධනය විය. තවද, ආර්ථික ක්‍රියාකාරකම් විශේෂයෙන්ම සේවා අංශයට අදාළ ක්‍රියාකාරකම්වල සිදු වූ ශීඝ්‍ර වෙනස්වීම් පිළිබිඹු කරමින් පුද්ගලයන් 100කට අන්තර්ජාල ග්‍රාහක සංඛ්‍යාව මනිනු ලබන අන්තර්ජාල ඝනත්වය, 2020 වසරේ දී වාර්තා වූ සියයට 79.9ට සාපේක්ෂව 2021 වසරේ දී 100.4ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, කොවිඩ්-19 වසංගතයේ දෙවන රැල්ල ව්‍යාප්ත වීමත් සමඟ 2020 වසරේ ඔක්තෝබර් මාසයේ සිට ඉහළ ගිය සමස්ත දත්ත භාවිතය, 2021 වසරේ මුල් භාගයේ සිට සංචරණ සීමා ඉවත් කිරීමට සමගාමීව 2021 වසරේ පළමු කාර්තුවේ දී ක්‍රමයෙන් පහළ ගියේය. කෙසේ වෙතත්, 2021 වසරේ අප්‍රේල් මාසය අවසානයේ දී වසංගතයේ තුන්වන රැල්ලෙහි ආරම්භයත් සමඟ සංචරණ සීමා පැනවීම සහ රැකියා සහ අධ්‍යාපන කටයුතු මංගත ක්‍රමවේද වෙත යොමු වීමත් සමඟ අන්තර්ජාල දත්ත භාවිතයෙහි ශීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබුණි. සංචරණ සීමා ඉවත් කිරීම සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමත් සමඟ 2021 වසරේ ඔක්තෝබර් මාසයේ සිට අන්තර්ජාල දත්ත භාවිතයේ වර්ධන වේගය පහළ ගියේය.

කොවිඩ්-19 වසංගතයෙන් පසු යථා තත්ත්වයට පත් වීමේ ක්‍රියාවලිය හා සමගාමීව ඩිජිටල් පරිවර්තනයේ ඇති වැදගත්කම පිළිබඳ නිසි අවධානයක් යොමු කරමින්, *ජාතික ඩිජිටල් පරිවර්තන උපායමාර්ගය (2021-2024)* ක්‍රියාත්මක කිරීම මෙම වසර තුළ ආරම්භ විය. ඊට අදාළව, ඩිජිටල් රජය, ඩිජිටල් ආර්ථිකය සහ

3.8 සංඛ්‍යා සටහන

විදුලි සංදේශ අංශයේ ක්‍රියාකාරිත්වය

ශීර්ෂය	2020	2021(අ)	වර්ධන අනුපාතය %	
			2020	2021(අ)
ස්ථාවර දුරකථන සේවා ('000)	2,613	2,852	13.6	9.1
රැහැන් සහිත දුරකථන සංඛ්‍යාව	1,246	1,264	0.1	1.5
රැහැන් රහිත දුරකථන සංඛ්‍යාව	1,367	1,587	29.6	16.1
ජංගම දුරකථන සංඛ්‍යාව ('000)	28,739	29,959	-12.6	4.2
අන්තර්ජාල සම්බන්ධතා සංඛ්‍යාව (ආ)	17,524	22,236	30.7	26.9
පොදු දුරකථන කුටි සංඛ්‍යාව	461	ලැනො.	-3.2	-
ඝනත්වය (ඇ)				
ස්ථාවර දුරකථන	11.9	12.9	13.0	8.0
ජංගම දුරකථන	131.1	135.2	-13.1	3.1
අන්තර්ජාලය (ආ)	79.9	100.4	30.0	25.5

(අ) තාවකාලික
(ආ) ජංගම අන්තර්ජාල සම්බන්ධතා ඇතුළත්ව
(ඇ) පුද්ගලයින් 100 කට ඇති සම්බන්ධතා සංඛ්‍යාව ලෙස අර්ථ දක්වේ.

මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඩිජිටල් සේවා යන ප්‍රධාන අංශ තුනකින් සමන්විත මෙම උපායමාර්ගය ක්‍රියාත්මක කිරීමට මූලිකත්වය ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය වෙත සිය අනුමැතිය ලබා දෙන ලදී. ඩිජිටල් රජය සහ ඩිජිටල් සේවා යන අංශ මගින් රජයේ ආයතන අතර ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ඉලක්ක කරනු ඇති අතර, ඩිජිටල් ආර්ථිකය යන අංශයෙන්, ආර්ථිකයේ තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ කර්මාන්තයෙන් වාර්ෂිකව එ.ජ. ඩොලර් බිලියන 3ක අපනයන ආදායමක් උපයා ගැනීමට හැකි වන පරිදි දේශීය ධාරිතාව වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. තවද, *ජාතික ඩිජිටල් පරිවර්තන උපායමාර්ගය* ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිව, ස්වාධීන සහ අපක්ෂපාතී පාලනයක් සහතික කිරීම සඳහා සියලුම ව්‍යාපෘති සහ වැඩසටහන් ඇතුළත් ශක්තිමත් අධීක්ෂණ සහ ඇගයීම් පද්ධතියක් සංවර්ධනය කෙරෙමින් පවතී.

ජාතික ඩිජිටල් පරිවර්තන උපායමාර්ගයට අනුකූලව, රටෙහි පවතින ඩිජිටල් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම පිළිබඳව ඉලක්කගත වූ තවත් ක්‍රියාමාර්ග කිහිපයක් ද ප්‍රධාන පාර්ශ්ව ආයතනවල නායකත්වය යටතේ ක්‍රියාවට නංවන ලදී. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, සියලුම දිස්ත්‍රික්ක ආවරණය කරමින් ග්‍රාම නිලධාරී වසම් 14,000ක් තුළ සිව්වන පරම්පරාවේ (4G) සම්බන්ධතා ආවරණය වැඩි දියුණු කිරීම සඳහා *ගමට සන්නිවේදනය* නමැති ජාතික ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළේය. මෙම ව්‍යාපෘතිය මගින් 2024 වසර අවසන් වන විට මුළු දිවයිනම ආවරණය වන පරිදි 4G ආවරණය පුළුල් කර ගැනීමට ප්‍රයත්න දරන අතර, 2021 වසර අවසානයේ දී, දිස්ත්‍රික්ක දහයක ස්ථාන 251ක් තුළ මෙම ව්‍යාපෘතිය ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු වෙමින් පැවතිණි. වසංගතය අතරතුර දුරස්ථ ඉගෙනුම් සඳහා පහසුකම් සැලසීම සහ ඒ සඳහා පුළුල් ප්‍රවේශයක් සහතික කිරීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව *ඊ-තක්සලාව* සහ *LEARN* වැනි මංගත අධ්‍යාපනික ක්‍රමවේද සඳහා කිසිදු ගාස්තු අය කිරීමකින් තොරව ප්‍රවේශ අවස්ථාව සලසා දුන්නේය. ඉහළ යන පාරිභෝගික අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ගනු ලැබූ අනෙකුත් ප්‍රධාන පියවර අතර, *සීමා රහිත අන්තර්ජාල සැලසුම්* සඳහා අනුමැතිය ලබා දීම සහ ග්‍රාහකයින් සඳහා *විවිධ විදුලි සංදේශ ජාල අතර මාරු වුවත් ජංගම දුරකථන අංකය නොවෙනස්ව භාවිත කිරීමේ හැකියාව* වැනි සේවා ලබා ගැනීමට නෛතික අනුමැතිය ලබා දීම ද ඇතුළත් විය. ශ්‍රී ලංකා අනන්‍යසම ඩිජිටල් හැඳුනුම, ඉඩම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ඩිජිටල් කිරීම (eLand Registry), ඩිජිටල් සෞඛ්‍ය ව්‍යාපෘතිය, ඩිජිටල් පුස්තකාල ව්‍යාපෘතිය, ලංකා රාජ්‍ය ජාලය 2.0 සහ ලංකා රජයේ ක්ලවුඩ් 2.0 වැනි ආර්ථිකයේ ඩිජිටල් පරිවර්තනයට අදාළ පියවර ගැනීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය අඛණ්ඩව මූලිකත්වය ගෙන කටයුතු කළේය. මෙම ක්‍රියාමාර්ගවලට අමතරව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා විද්‍යුත් තැපෑල, වීඩියෝ සම්මන්ත්‍රණ සහ ඩිජිටල් ආකෘති පත්‍ර ඉදිරිපත් කිරීමේ පහසුකම් ද සංවර්ධනය කළේය.

3.12 රූප සටහන

දුරකථන ඝනත්වය



මූලයන්: ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

3.13 රූප සටහන
බ්‍රෝඩ්බෑන්ඩ් දත්ත භාවිතය



වසංගතය හේතුවෙන් ඇති වූ අවහිරතා මධ්‍යයේ තැපැල් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය අඛණ්ඩව මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. වසංගතයේ තුන්වන රැල්ල සහ ඒ ආශ්‍රිත කොවිඩ්-19 පාලනය කිරීමේ සීමා හේතුවෙන් තැපැල් සේවාවලට බාධා ඇති වුව ද, 2021 වසරේ ජූනි මාසයේ දී රජය විසින් තැපැල් සේවා *අත්‍යවශ්‍ය සේවාවක්* ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමඟ තැපැල් දෙපාර්තමේන්තුව නව ප්‍රවේශයන් අනුගමනය කරමින් සිය සේවා අඛණ්ඩව සිදු කිරීමට පියවර ගත්තේය. 2020 වසර අග භාගයේ දී නැවත දියත් කරන ලද *ඇණවුම් ලැබුණු පසු මුදල් ගෙවීමේ සේවාව*, 2021 වසර තුළ දී ද රුපියල් මිලියන 34.0ක ආදායමක් උත්පාදනය කරමින් සාර්ථකව ඉදිරියට ගෙන ගියේය. මේ අතර, 2021 වසර තුළ දී රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප් සහ ධීවර විශ්‍රාම වැටුප් මෙන්ම, වෙනත් සමාජ සේවා දීමනා ගෙවීමට ද තැපැල් දෙපාර්තමේන්තුව අඛණ්ඩව පහසුකම් සැලසූ අතර, ඖෂධ නොමිලේ බෙදා හැරීමට ද පහසුකම් සැලසීය. දිවයින පුරා තැපැල් බෙදාහැරීමේ ප්‍රදේශ 8,157ක් ආවරණය වන පරිදි, ප්‍රධාන තැපැල් කාර්යාල 654ක්, උප තැපැල් කාර්යාල 3,410ක් සහ පෞද්ගලික තැපැල් කාර්යාල 130කින් සමන්විත තැපැල් දෙපාර්තමේන්තුවේ ජාලය හරහා කිසිදු බාධාවකින් තොරව ප්‍රධාන තැපැල් සේවාවන් සපයන ලදී. කෙසේ වෙතත්, දැනට සිදු වෙමින් පවතින ඩිජිටල් පරිවර්තනය සහ පාරිභෝගිකයින්ගේ ඉහළ යන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි තැපැල් දෙපාර්තමේන්තුව විසින් නව්‍ය අගය එකතු කළ සේවා සැපයීමෙහි අවශ්‍යතාව පිළිබිඹු කරමින්, 2020 වසරේ රුපියල් බිලියන 7.7ක් වූ අලාභයට සාපේක්ෂව 2021 වසරේ දී තැපැල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් අලාභය රුපියල් බිලියන 7.2ක් වීම හේතුවෙන්, තැපැල් දෙපාර්තමේන්තුවෙහි මූල්‍ය තත්ත්වය අඛණ්ඩව දුර්වල විය.

ජල සම්පාදනය හා වාරිමාර්ග

2025 වසර වන විට සෑම නිවසකටම පිරිසිදු සහ ආරක්ෂිත පානීය ජලය සැපයීම ප්‍රධාන ඉලක්කයක් ලෙස දක්වන රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව 2021 වසර තුළ දී නව ජල සැපයුම් සම්බන්ධතා ලබාදීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් වසර තුළ දී නව ජල සැපයුම් සම්බන්ධතා 192,087ක් ලබා දී ඇති අතර, වසර අවසානය වන විට පැවති සමස්ත ජල සැපයුම් සම්බන්ධතා ප්‍රමාණය මිලියන 2.8කට ළඟා විය. මේ හේතුවෙන් 2020 වසර අවසානයේ සියයට 93.2ක්ව පැවති ගෘහ ඒකකවල ආරක්ෂිත පානීය ජලය සඳහා ප්‍රවේශය, 2021 වසර අවසානයේ දී සියයට 94.4ක් දක්වා වර්ධනය විය. කෙසේ වෙතත්, රට තුළ ආදායම් නූපදවන ජල පරිභෝජනය, 2020 වසරේ පැවති සියයට 24.6ට සාපේක්ෂව 2021 වසර තුළ දී සියයට 25.8ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. මේ අතර, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී මෙහෙයුම් සහ නඩත්තු වියදම් ඉහළ යෑම හේතුවෙන්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය පෙර වසරේ වාර්තා කළ රුපියල් මිලියන 370.5ක මෙහෙයුම් අලාභය හා සැසඳීමේ දී මෙම වසර තුළ රුපියල් බිලියන 3.1ක මෙහෙයුම් අලාභයක් වාර්තා කළේය.

ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව ජල සම්පාදන අමාත්‍යාංශයේ සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි අධීක්ෂණය යටතේ විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ ජනතාවට ලබා දුන් සැමට ජලය නම් ප්‍රමුඛ ප්‍රතිඥාව යටතේ ව්‍යාපෘති 118කට අදාළ භෞතික වැඩකටයුතු වසර තුළ දී ආරම්භ කරන ලදී. තවද, දිවයින පුරා ආරක්ෂිත පානීය ජල ධාරිතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් යුත් ප්‍රධාන ජල සම්පාදන යෝජනා ක්‍රම 33ක්, 2021 වසර තුළ දී ක්‍රියාත්මක විය. මේ අතර, මහව සහ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පදිංචි ප්‍රතිලාභීන් 97,700කට ආරක්ෂිත පානීය ජලය ලබා දෙමින් 2016 වසරේ ආරම්භ කරන ලද *දැදුරු ඔය ජල සම්පාදන ව්‍යාපෘතිය* වසර තුළ දී අවසන් කළ අතර, කිරම-කටුවන ජල සම්පාදන ව්‍යාපෘතිය හා කටාන ජල සම්පාදන ව්‍යාපෘතිය ඇතුළු තවත් ව්‍යාපෘති කිහිපයකම කටයුතු 2021 වසරේ දී නිම

3.14 රූප සටහන
ජල සැපයුම් තත්ත්වය



මූලය: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

කරන ලදී. 2021 වසර අවසානය වන විට යාපනය නගරය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කය තුළ ආරක්ෂිත පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම අරමුණු කරගත් යාපනය සහ කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය සියයට 61ක ප්‍රගතියක් අත්කර ගත්තේය. මෙම ව්‍යාපෘතිය යටතේ, වසර තුළ දී, තලෛයඩි මුහුදු ජල පවිත්‍රාගාරය, නයිනතිව් මුහුදු ජල පවිත්‍රාගාරය සහ යාපනය - කිලිනොච්චි නගරයේ ජල සැපයුම් ජාලය ආශ්‍රිත කටයුතු ආරම්භ කරන ලදී. තවද, 2021 වසර අවසන් වන විට, මාතලේ දිස්ත්‍රික්කයේ පිරිසිදු පානීය ජල ආවරණය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 94ක් විය.

කෘෂිකාර්මික අංශයේ ක්‍රියාකාරිත්වයට සහාය සැලසීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් දිවයින පුරා වාරිමාර්ග යෝජනා ක්‍රම සංවර්ධනය අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, කුඩාවිලච්චිය ජලාශය සහ දෙමටගල වැව ප්‍රතිසංස්කරණය කිරීම වැනි වෙනත් ව්‍යාපෘති කිහිපයක් සමඟ ඇල්ලේවැව ජලාශ ව්‍යාපෘතිය ද ආරම්භ කෙරිණි. තවද, ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ ගන්නා ලද ප්‍රධාන පියවරක් ලෙස කුඩා ජන කණ්ඩායම් සඳහා වාරි ජලය සැපයීම දිවයිනේ විවිධ ප්‍රදේශවල අඛණ්ඩව පුළුල් කෙරිණි. වසර තුළ දී, රුපියල් බිලියන 5.6ක පිරිවැයක් වැය කරමින් ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති 26ක් ක්‍රියාත්මක කළ අතර, ඉන් යාන්ඔය සහ දැදුරුඔය ජලාශ ව්‍යාපෘති සඳහා වැය කළ මුදල, පිළිවෙළින්, රුපියල් බිලියන 2.7ක් සහ රුපියල් මිලියන 556.1ක් විය. මේ අතර, සියලුම දිස්ත්‍රික්ක පුරා ග්‍රාමීය වැව් සහ අමුණු ප්‍රතිසංස්කරණය කිරීම ඉලක්ක කරගත් වාරි සෞභාග්‍ය ජාතික වැඩසටහන ද 2021 වසරේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ආරම්භ කරන ලදී. ග්‍රාමීය වැව් 2,500ක් වැඩිදියුණු කිරීම තුළින් පුරන් කුඹුරු අක්කර 50,000ක් අස්වැද්දීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. අයහපත් දේශගුණික විපර්යාසවලට එරෙහිව ජල සම්පත් යටිතල පහසුකම්වල ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීමේ අරමුණින් 2014 වසරේ දී ආරම්භ කරන ලද දේශගුණික බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය 2021 වසරේ දී නිම කරන ලදී. තවද, උමා ඔය පහළ ගංගාධාර ව්‍යාපෘතියේ මුළු පිරිවැය රුපියල් බිලියන 9.4 සිට රුපියල් බිලියන 17.9ක් දක්වා ඉහළ නැංවීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. 2021 වසර අවසන් වන විට මෙම ව්‍යාපෘතිය සියයට 65ක භෞතික ප්‍රගතියක් ලබා ඇත. තවද, ගොවි පවුල් 97,832කට ප්‍රතිලාභ සලසමින් වාරි ජලය අවශ්‍ය වන ඉඩම් හෙක්ටෙයාර් 72,882ක වාරිමාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ අරමුණින් 2017 වසරේ දී ආරම්භ කරන ලද ඵලදායීතාව නැංවීම සහ වාරිමාර්ග පද්ධතිවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය, වසංගතය මගින් ඇති වූ අවහිරතා හේතුවෙන් මන්දගාමී වේගයකින් වුව ද, අඛණ්ඩව ක්‍රියාවට නැංවිණි.

3.9 සංඛ්‍යා සටහන
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සපයනු ලබන ජලය

ශීර්ෂය	2020	2021(අ)	වර්ධන අනුපාතය % 2020	2021(අ)
මුළු ජල සම්පාදන යෝජනා ක්‍රම ගණන (ආ)	331	337	-4.9	1.8
වසර තුළ දී සපයන ලද නව ජල සම්බන්ධතා ගණන	122,733	192,087	12.8	56.5
සපයා ඇති මුළු ජල සම්බන්ධතා ගණන (ආ)	2,560,237	2,752,324	5.0	7.5
මුළු ජල නිෂ්පාදනය (ඝන මීටර් මිලියන)	782	815	4.8	4.2
ආදායම් නූපදවන ජලය (ප්‍රතිශතය)				
කොළඹ නගරය	39.2	34.8	-3.4	-11.4
සමස්ත දිවයින	24.6	25.8	-1.7	4.8
පිරිසිදු පානීය ජල පහසුකම් සඳහා ප්‍රවේශය (ප්‍රතිශතය) (ඇ)	93.2	94.4	1.4	1.3
නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය (ප්‍රතිශතය) (ඈ)	53.1	54.3	2.5	2.3

(අ) තාවකාලික
(ආ) වසර අවසානයේ දී
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තේ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණය - 2019 මත පදනම් වූ සංසන්දනාත්මක අගය සියයට 88.5 ක් වේ.
(ඈ) අනෙකුත් බලයලත් ආයතන මගින් කළමනාකරණය කරනු ලබන පද්ධති ද ඇතුළත්ව

මූලය: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

3

3.3 සමාජ යටිතල පහසුකම් පිළිබඳ ප්‍රතිපත්ති, ආයතනික රාමුව සහ ක්‍රියාකාරිත්වය

සෞඛ්‍ය

මූලික වශයෙන් ඩෙල්ටා ප්‍රභේදයේ ව්‍යාප්තිය සමඟ 2021 වසරේ දී කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වුව ද, ගෝලීය වශයෙන් පිළිගත් එන්නත්කරණ වැඩසටහන ක්‍රියාවට නැංවීමට සමගාමීව රජය විසින් සුදුසු පරිදි සහ නිසි කලට සංචරණ සීමා පැනවීම හේතුවෙන් 2022 වසරේ මුල් භාගයේ දී ඔමික්‍රෝන් ප්‍රභේදය වැළඳුණු පුද්ගල සංඛ්‍යාව අඩු කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකි විය. 2020 වසරේ මාර්තු සහ ඔක්තෝබර් යන මාසවල දී ඇති වූ කොවිඩ්-19 රැලි ද්විත්වයෙන් අනතුරුව, ශීඝ්‍රයෙන් බෝවන කොවිඩ්-19 ඩෙල්ටා ප්‍රභේදය හේතුවෙන් 2021 වසරේ අප්‍රේල් මාසයේ දී වසංගතයේ තුන්වන රැල්ල ඇති විය. 2021 වසරේ අප්‍රේල් මාසය මැද දක්වා කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ ජනගහනයෙන් මිලියනයකට 11ක් වූ රෝගීන් සංඛ්‍යාවට සාපේක්ෂව, වසංගතයේ තුන්වන රැල්ලේ උච්චතම අවස්ථාව වන 2021 වසරේ අගෝස්තු මාසයේ දී දෛනිකව තහවුරු කරන ලද නව කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව මිලියනයකට 276ක් දක්වා ඉහළ ගියේය. වේගයෙන් පැතිර යන කොවිඩ්-19 වෛරසයෙහි ඩෙල්ටා ප්‍රභේදය මේ සඳහා හේතු විය. කෙසේ වෙතත්, 2020 වසරේ මාර්තු සහ අප්‍රේල් මාසවලදී වසංගතයේ පළමු ව්‍යාප්තිය තුළ දී දීපව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලද ආර්ථික හා සමාජ කටයුතු සම්පූර්ණයෙන්ම සීමා කිරීමේ ක්‍රියාමාර්ගවලට වෙනස්ව යමින්, සමස්ත සමාජ ආර්ථික යහපැවැත්ම සහතික කිරීම සඳහා අවශ්‍ය ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩතාව පවත්වාගෙන යෑමට පහසුකම් සලසමින්, වසංගතයේ තුන්වන රැල්ල තුළ දී වෛරසය පැතිරීම පාලනය සඳහා රජය සුපරික්ෂාකාරිව සංචරණ සීමා කිරීම් අනුගමනය කළේය. තුන්වන රැල්ලේ ආරම්භක අවධියේ දී, හඳුනාගත් සියලුම කොවිඩ් ආසාදිතයින් රෝහල්ගත කිරීමට හෝ වෙන්කර ඇති මධ්‍යස්ථානවල නිරෝධායනය කිරීමට කටයුතු කළ අතර, කොවිඩ් ආසාදිතයින්ගේ පළමු පෙළ ආශ්‍රිතයින් නිරෝධායන මධ්‍යස්ථානවල දී හෝ ඔවුන්ගේ නිවෙස්වල දී නිරෝධායනය කිරීමට කටයුතු කරන ලදී. කෙසේ වෙතත්, රෝගීන් සංඛ්‍යාව ශීඝ්‍රයෙන් ඉහළ යෑම හේතුවෙන් රෝහල්වල ඇති වන අධික තදබදය වැළැක්වීමේ ප්‍රයත්නයක් ලෙස, රජය ප්‍රමුඛතා පදනමක් මත කොවිඩ්-19 රෝගීන් රෝහල්ගත කිරීමට තීරණය කළේය. 2021 වසරේ අගෝස්තු මාසයේ දී කොවිඩ් මරණ අනුපාතිකයේ කැපී පෙනෙන වැඩිවීමක් දක්නට ලැබීම හේතුවෙන් 2021 වසරේ අගෝස්තු මාසයේ සිට සැප්තැම්බර් මාසය අවසානය දක්වා රජය විසින් දිවයින පුරා ඇදිරි නීතිය පැනවූ අතර, එම කාල සීමාව තුළ අත්‍යවශ්‍ය ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරගෙන යෑමට අවසර ලබා දෙන ලදී. 2021 වසරේ ජූලි මාසය අග භාගයේ සිට වේගවත් වූ එන්නත්කරණ වැඩසටහනත් සමඟ, 2021 වසරේ සැප්තැම්බර් මාසය මැද භාගයේ සිට කොවිඩ්-19 මරණ සංඛ්‍යාවෙහි සැලකිය යුතු පහළ යෑමක් දක්නට ලැබීම හේතුවෙන් 2021 වසරේ ඔක්තෝබර් මාසයේ 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියලුම සංචරණ සීමා ඉවත් කිරීමට ඉඩ ප්‍රස්ථාව සැලසුණි. 2021 වසරේ දෙසැම්බර් මාසයේ මුල් භාගයේ දී ඔමික්‍රෝන් ප්‍රභේදය හඳුනා ගැනීමෙන් අනතුරුව, 2022 වසරේ පෙබරවාරි මාසයේ මැද භාගයේ දී රෝගීන් සංඛ්‍යාව ජනගහනයෙන් මිලියනයකට 66ක් දක්වා අඛණ්ඩව ඉහළ යෑමක් දක්නට ලැබුණි. රෝගීන් සංඛ්‍යාවේ මෙවැනි ඉහළ යෑමක් පැවතිය ද, ජනගහනයෙන් සියයට 65ක් එන්නත් මාත්‍රා දෙකක මූලික අවශ්‍යතාව සම්පූර්ණ කර තිබීම සහ ජනගහනයෙන් සියයට 28ක් වර්ධක මාත්‍රාව (booster dose) ලබාගෙන තිබීමත් හේතුවෙන් 2021 වසරේ අගෝස්තු මාසයේදී ජනගහනයෙන් මිලියනයකට මරණ 10ක් ලෙස වාර්තා වූ කොවිඩ් මරණ අනුපාතිකය හා සැසඳීමේ දී මෙම කාලපරිච්ඡේදය තුළ මරණ අනුපාතිකය ජනගහනයෙන් මිලියනයකට මරණ 2ක් දක්වා පහළ ගියේය. කොවිඩ් එන්නත්කරණ වැඩසටහනෙහි වේගවත් ප්‍රගතිය සැලකිල්ලට ගනිමින්, ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂණයෙන් හෝ පී.සී.ආර්. පරීක්ෂණයෙන් කොවිඩ්-19 වැළඳුණු බවට තහවුරු වූ දිනට හෝ රෝග ලක්ෂණ මතු වූ දිනයේ සිට දින 7කට පසුව කොවිඩ් රෝගීන් හුදකලා බවින් නිදහස් කිරීමට ඉඩ සලසමින් සෞඛ්‍ය අමාත්‍යාංශය 2022 වසරේ ජනවාරි මාසය අග භාගයේ දී චක්‍රලේඛයක් නිකුත් කළේය. ඒ අනුව, කොවිඩ්-19 රෝග ලක්ෂණවලින් තොර පූර්ණ එන්නත්කරණයට ලක්ව ඇති සමීප ආශ්‍රිතයින් නිරෝධායනය කිරීම අවශ්‍ය නොවූ අතර, අර්ධ වශයෙන් එන්නත් කරන ලද හෝ එන්නත් නොකළ පුද්ගලයන් දින 7ක නිරෝධායන කාල සීමාවක් සම්පූර්ණ කිරීමෙන් පසු නිරෝධායනයෙන් නිදහස් කිරීමට හැකි විය. 2022 වසරේ මුල් භාගයේ දී, වයස අවුරුදු 12 ට වැඩි ළමුන් ඇතුළත් වන පරිදි එන්නත්කරණ වැඩසටහන පුළුල් කරන ලද අතර, ඒ යටතේ වයස අවුරුදු 12 - 15 අතර වයස් කාණ්ඩවල පිරිස් සඳහා ෆයිසර් එන්නතේ එක් මාත්‍රාවක් ලබා දෙන ලදී. 2022 වසරේ අප්‍රේල් මාසයේ 30 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොවිඩ්-19 වෛරසයට එරෙහිව පූර්ණ වශයෙන් එන්නත් කර ඇති බවට සාක්ෂි

නොමැති පුද්ගලයින්ට පොදු ස්ථානවලට ඇතුළු වීම වළක්වාලමින් 2022 වසරේ ජනවාරි මාසය අග භාගයේ දී අතිවිශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. වසංගතය ආශ්‍රිත වියදම් සඳහා මුදල් කඩිනමින් වෙන් කිරීමට රජය අඛණ්ඩව කටයුතු කළේය. ඒ අනුව, 2021 වසර සඳහා වූ වසංගතය ආශ්‍රිත රජයේ සමස්ත වියදම රුපියල් බිලියන 165.6කි. මෙයින්, එන්නත්, නිරෝධායන පහසුකම්, සෞඛ්‍ය අංශයේ යටිතල පහසුකම් සහ වෛද්‍ය සැපයුම් වැනි සෞඛ්‍ය අංශයට අදාළ වියදම රුපියල් බිලියන 130.1කි.

වසංගතය ආශ්‍රිත අභියෝග මධ්‍යයේ, ශ්‍රී ලංකාව තවත් බෝවන රෝග පැතිරීම් පාලනය කිරීම සම්බන්ධයෙන් ද අඛණ්ඩව කටයුතු කළේය. 2021 වසරේ දී ඩෙංගු රෝගීන් 23,853ක් වාර්තා වූ අතර, ඉන් සැලකිය යුතු පිරිසක් දෙසැම්බර් මාසයේ මෝසම් වැසි ආරම්භයත් සමඟ වාර්තා විය. ආසන්න වශයෙන් රෝගීන්ගෙන් සියයට 70ක් පමණ කොළඹ, මඩකලපුව, ගම්පහ, කළුතර සහ කුරුණෑගල දිස්ත්‍රික්කවලින් වාර්තා විය. 2022 වසරේ ආරම්භක මාස තුන තුළ ඩෙංගු රෝගීන් 8,000කට අධික සංඛ්‍යාවක් හඳුනා ගැනීමත් සමඟ ඩෙංගු රෝගය ඉහළ යෑමේ ප්‍රවණතාවක් අඛණ්ඩව පැවති අතර, විශේෂයෙන් ම සාපේක්ෂව අඩු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වීමෙන් අනතුරුව, ඩෙංගු රෝගය යළි හිස එසවීම පිළිබඳ අවදානමක් මතු කර ඇත. ඩෙංගු රෝගීන් ඉහළ යෑමේ ප්‍රවණතාව අඩු වීම සඳහා කොවිඩ්-19 සංචරණ සීමා හේතුවෙන් ජනතාවට නිවාස තුළ රැඳී සිටීමට සිදු වීමත් සමඟ ඔවුන්ට අවට පරිසරය පිරිසිදුව පවත්වා ගැනීමට සහ තම නිවාස පරිශ්‍රය මදුරුවන් බෝවීමකින් තොරව තබා ගැනීමට හැකි වීම හේතු විය. පුද්ගල සනීපාරක්ෂාව පිළිබඳ පුද්ගලයන් අතර දැනුම්වත්භාවය ඉහළ යෑම, විශේෂයෙන්ම මුව

3.15 රූප සටහන
කොවිඩ් - 19 එන්නත්කරණයෙහි ප්‍රගතිය



ආවරණ භාවිතය වැඩි වීම හේතුවෙන් සුපුරුදු සෘතුමය ඉන්ෆ්ලුවෙන්සා වසංගත තත්ත්වය මෙම වසර තුළ දී දක්නට නොලැබිණි. 2021 වසරේ දී හඳුනාගත් මී උණ රෝගීන් සංඛ්‍යාව, 2020 වසරේ දී වාර්තා වූ රෝගීන් 8,579ට සාපේක්ෂව 6,855ක් විය.

සෞඛ්‍ය අංශයට කොවිඩ්-19 වසංගතය මගින් ඇති කරන ලද බලපෑම් මධ්‍යයේ වුව ද, බෝ නොවන රෝගවලින් පීඩා විඳින පුද්ගලයන්ට සහ ඉලක්කගත සෞඛ්‍ය රැකවරණයක් අවශ්‍ය ජන කොටස් සඳහා අඛණ්ඩව වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සහතික කිරීමට රජය කැපවී සිටියේය. ඒ අනුව, අඛණ්ඩව ඖෂධ සැපයීම සහතික කිරීම සහ රෝගීන් පසු විපරම් කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය, දිස්ත්‍රික් මට්ටමේ වෛද්‍ය නිලධාරීන් සමඟ සම්බන්ධීකරණ කටයුතු අඛණ්ඩව සිදු කළේය. 2020 වසරේ දී මෙන්ම, සෞඛ්‍ය අංශ කාර්ය මණ්ඩලය, සෞඛ්‍ය අංශයේ නොවන රාජ්‍ය නිලධාරීන් සහ තැපැල හරහා ඖෂධ බෙදා හැරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය කටයුතු කළේය. ඖෂධ මිලදී ගැනීම සහ නිවෙස් වෙත බෙදාහැරීම පහසු කිරීම සඳහා ඔසුසල් හිමියන්ගේ සංගමය සමඟ එක්ව වෙබ් පාදක යාන්ත්‍රණයක් ද ස්ථාපිත කරන ලදී. තවද, සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවකට අනුගත වීම, බෝ නොවන රෝග පාලනය කිරීම, පූර්ව අනතුරු ඇඟවීමේ සලකුණු හඳුනා ගැනීම සහ හදිසි අවස්ථාවක දී වෛද්‍ය සේවා ලබා ගැනීමේ ක්‍රම සහ විධි පිළිබඳව ජන මාධ්‍ය සහ සමාජ මාධ්‍ය හරහා දැනුම්වත් කිරීමේ කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය අඛණ්ඩව සිදු කළේය. විශේෂයෙන් ම, කොවිඩ්-19 වැළඳුණු ගර්භනී මව්වරුන් සහ දරුවන් සඳහා ප්‍රජනන, මාතෘ, අලුත උපන්, ළමා, නව යොවුන් සහ තරුණ සෞඛ්‍ය රැකවරණය ලබා දීම හරහා වසංගතය තුළ අවදානමට ලක්විය හැකි මාතෘ සහ ළමා කොටස්වල සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා පවුල් සෞඛ්‍ය කාර්යාංශය මූලිකත්වය ගෙන කටයුතු කළේය. කොවිඩ් රෝගයේ බලපෑම අවම කර ගැනීමේ ප්‍රයත්නයක් ලෙස ගර්භනී මව්වරුන් කොවිඩ්-19 වෛරසයට එරෙහිව එන්නත්කරණයට ලක් කළ දකුණු ආසියාවේ පළමු රට ශ්‍රී ලංකාව විය. ශ්‍රී ලංකාව මුහුණ දෙමින් සිටින පෝෂණ ඌණතාව, අධි බර හෝ ස්ථූලභාවය සහ ක්ෂුද්‍ර පෝෂක ඌණතාව යන මන්දපෝෂණයේ ත්‍රිත්ව බලපෑම සැලකිල්ලට ගනිමින්, දිස්ත්‍රික් මට්ටමින් විශේෂිත ඉලක්කගත මැදිහත්වීම් හරහා මෙම ගැටලු මඟහරවා ගැනීමට කටයුතු කරන ලදී.

වසර තුළ දී, රජයේ සෞඛ්‍ය සේවා පද්ධතියට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවිණි. ඒ අනුව, සෞඛ්‍ය සේවා ආයතන 9ක්

3

3.10 සංඛ්‍යා සටහන

සෞඛ්‍ය සේවයේ මූලික ලක්ෂණ

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)
1. රාජ්‍ය අංශය		
රෝහල් සංඛ්‍යාව (බටහිර වෛද්‍ය සේවය)	609	618
ඇඳන් සංඛ්‍යාව	77,121	78,228
ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක	514	542
වෛද්‍යවරුන් සංඛ්‍යාව	18,218	18,992
සහකාර වෛද්‍යවරුන් සංඛ්‍යාව	690	650
හෙද සේවක සංඛ්‍යාව	37,133	38,743
උපස්ථායක සංඛ්‍යාව	8,177	8,176
2. ආයුර්වේද		
රෝහල් සංඛ්‍යාව	118	118
ඇඳන් සංඛ්‍යාව	5,022	5,444
සුදුසුකම්ලත් ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව	1,749	1,806
ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව (ඇ)	26,061	26,183

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති ආයුර්වේද වෛද්‍යවරුන්

මූලයන්: සෞඛ්‍ය අමාත්‍යාංශය
ආයුර්වේද දෙපාර්තමේන්තුව

වැඩිදියුණු කර නැවත වර්ගීකරණය කරන ලද අතර, නව ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක 27ක් පිහිටුවීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලදී. 2021 වසර තුළ දී, මාතර නව දිස්ත්‍රික්ක මහ රෝහල සඳහා අතිරේක ගොඩනැගිලි ඉදිකිරීමට සහ ප්‍රතිසංස්කරණය කිරීමට අදාළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ අතර, එම ව්‍යාපෘතිය සියයට 90ක භෞතික ප්‍රගතියක් ද අත්කරගෙන ඇත. මීට අමතරව, කරාපිටිය ශික්ෂණ රෝහලේ පිළිකා ප්‍රතිකාර ඒකකයේ භෞතික යටිතල පහසුකම් පුළුල් කිරීම සහ සෞඛ්‍ය අමාත්‍යාංශට අයත් රෝහල් 28ක හදිසි අනතුරු හා හදිසි ප්‍රතිකාර වාට්ටුවල පහසුකම් වැඩි කිරීම ශක්තිමත් කිරීම සහ ක්‍රමවත් කිරීම ද වසර තුළ දී සිදු විය.

විශේෂයෙන් ම කොවිඩ්-19 වසංගතය මගින් රාජ්‍ය සෞඛ්‍ය සේවා අංශය වෙත එල්ල වූ පීඩනය සමනය කිරීමෙහිලා පෞද්ගලික අංශයේ සෞඛ්‍ය සේවාවන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. විශේෂයෙන් ම වසංගතය හේතුවෙන් ජනතාවගේ ඉහළ යන අවශ්‍යතා සපුරාලීම සඳහා නව්‍ය සේවා සැපයීමේ දී පෞද්ගලික රෝහල් මූලිකත්වය ගෙන තිබේ. පෞද්ගලික සෞඛ්‍ය සේවා සපයන්නන් හරහා දැරිය හැකි මිලකට දුරකථන මාර්ග හරහා වෛද්‍ය උපදෙස් සේවා ලබා ගැනීමට ඇති හැකියාව ඉහළ යෑම හේතුවෙන් විදුලි සංදේශ තාක්ෂණය භාවිතයෙන් වෛද්‍යවරුන්ගෙන් රෝග ඇගයීම්, රෝග විනිශ්චයන් සහ ප්‍රතිකාර ලබා ගැනීමට රෝගීන්හට අවකාශය ලැබිණි. කොවිඩ්-19 ආශ්‍රිත පරීක්ෂණ සේවා සහ ප්‍රතිකාරවලට අමතරව, අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථාන නිසිකලට සැපයීම හරහා කොවිඩ්-19 ව්‍යාප්තිය පාලනය සඳහා පුද්ගලික රෝහල් ද සුවිශාල කාර්යභාරයක් ඉටු කර ඇත. පෞද්ගලික සෞඛ්‍ය සේවා සපයන්නන් විසින් සිය සේවා සැපයීම ඉහළ නැංවීම හේතුවෙන්, පෞද්ගලික සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශයක් නොමැති පුද්ගලයන් සහ ජනගහනය තුළ සිටින පීඩිත ජන කොටස සඳහා රාජ්‍ය අංශයේ සෞඛ්‍ය සේවා ලබා ගැනීමට පවතින ඉඩ ප්‍රස්ථාව අහිමි වී යෑම වැළකිණි. 2021 වසර අවසානය වන විට, පෞද්ගලික සෞඛ්‍ය සේවා පද්ධතිය රෝහල් ඇඳන් 5,444ක ධාරිතාවයකින් යුතු රෝහල් 233කින් සමන්විත විය.

අධ්‍යාපනය

ඵලදායී පුරවැසියන් සහ ශක්තිමත් මානව සම්පත් පදනමක් නිර්මාණය කිරීම සඳහා වූ රජයේ දැක්මට අනුව යමින්, අධ්‍යාපන අමාත්‍යාංශය ආර්ථිකයේ මානව ප්‍රාග්ධන පදනමේ ඵලදායී විභවයන් නංවාලීමේ කාර්යයෙහි නිරත විය. ඒ අනුව, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන අවධීන්හි දී සැමට අධ්‍යාපනය යන මූලධර්මය අනුව පළාත් අධ්‍යාපන බලධාරීන් සහ ජාතික මට්ටමේ අධ්‍යාපන ආයතන සමඟ එක්ව අධ්‍යාපන අමාත්‍යාංශ්‍ය 2021-2025 කාල පරිච්ඡේදය සඳහා උපාය මාර්ගික සැලැස්මක් සංවර්ධනය කළේය. අධ්‍යාපනයේ සමානාත්මතාවය ශක්තිමත් කිරීම, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම, සාමාන්‍ය අධ්‍යාපනයේ කළමනාකාරීත්වය හා සේවා සැපයීම ශක්තිමත් කිරීම මෙන්ම, දත්ත සහ තොරතුරු පදනම් කරගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීම හා සැලසුම් කිරීම යන ප්‍රධාන ක්ෂේත්‍ර හතර යටතේ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා වන මැදි කාලීන සැලැස්ම සකස් කර ඇත. නව ජාතික පාසල් සංවර්ධන වැඩසටහන වැනි වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ද ක්‍රියාත්මක විය. දීපව්‍යාප්තව පිහිටි ජාතික පාසල් සංඛ්‍යාව 1,204ක් දක්වා ඉහළ නැංවීම සඳහා තෝරාගත් පාසල් 831ක් 'ජාතික පාසල්' කාණ්ඩයට වැඩිදියුණු කිරීම නව ජාතික පාසල් සංවර්ධන වැඩසටහන මගින් සිදු කෙරේ. වසර තුළ දී, මෙම වැඩසටහන සඳහා රුපියල් බිලියන 1.9ක් වෙන් කරන ලද අතර, තෝරාගත් සෑම පාසලකටම භෞතික හා ඉගෙනුම් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සහ සංවර්ධනය සඳහා රුපියල් මිලියන 2.0 බැගින් ලබා දීම සිදු විය. එහි පළමු පියවර ලෙස 2021 වසරේ මුල් කාලයේ දී පාසල් 09ක් ජාතික පාසල් ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. ඉගෙනුම් ප්‍රතිඵල සම්බන්ධයෙන් ගුණාත්මක වර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව, සක්‍රීය අධ්‍යාපනය පිළිබඳව ඉහළ අවධානයක්

යොමු කරමින්, ජාතික අධ්‍යාපන ආයතනය, *ගැටලු විශ්ලේෂණය මත පදනම් වූ ඉගෙනුම* යන තේමාව යටතේ සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සඳහා නව විෂය මාලාවක් සකස් කළ අතර, එම තේමාව යටතේ වන ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා පහසුකම් සැපයීමට ගුරු පුහුණු මොඩියුල සහ අත්පොත් ද නිසි ආකාරයට සකස් කළේය. උසස් පෙළ සඳහා පස්වන විෂය ධාරාව වශයෙන් *තාක්ෂණවේදය* විෂය ධාරාව හඳුන්වාදීමේ වැඩසටහන 2021 වසරේ දී අඛණ්ඩව ඉදිරියට ගෙන ගිය අතර, මෙම වැඩසටහන සඳහා අලුතින් පාසල් 09ක් එක් කිරීමෙහි ප්‍රතිඵලයක් ලෙස 2021 වසර අවසානයේ දී පාසල් 466ක තාක්ෂණ විෂය ධාරාව උගන්වනු ලැබීය. මේ අතර, දිවයින පුරා පාසල් 523ක උසස් පෙළ විෂයන් සඳහා වෘත්තීය විෂය ධාරාව ඇතුළත් කරමින් *වසර 13ක අනිවාර්ය අධ්‍යාපන ප්‍රතිපත්තිය* 2021 වසර තුළ දී තවදුරටත් වැඩිදියුණු කරන ලදී. විශේෂයෙන්ම, *වෘත්තීය* විෂය ධාරාව යටතේ ලියාපදිංචි වූ සිසුන් 9,603 අතරින් ආසන්න වශයෙන් සියයට 87ක පිරිසක් එවැනි විකල්ප අධ්‍යාපන අවස්ථාවක් නොමැති විට, අධ්‍යාපන පද්ධතියෙන් ඉවත්ව යෑමේ අවදානමට ලක්විය හැකි බවට හඳුනාගෙන ඇත. වසර තුළ දී, මෙම විෂය ධාරාව යටතේ අධ්‍යාපනය ලබමින් සිටි සිසුන් 11,000ක් පමණ ආයතනික පුහුණුව සඳහා යොමු කරන ලදී. තවද, පෙර වසරවලදී මෙම විෂය ධාරාව යටතේ ලියාපදිංචි වූ සිසුන් 6,390ක් ජාතික වෘත්තීය සුදුසුකම් (National Vocational Qualifications) 04 වන මට්ටම සම්පූර්ණ කර ඇති අතර, එම සිසුන් සංචාරක සහ ආගන්තුක සත්කාර, මෝටර් රථ/විදුලි කාර්මික සේවා, උපස්ථායක/ක්‍රීඩා, තොරතුරු තාක්ෂණ, ඉදිකිරීම් සහ කෘෂිකර්මාන්තය හා වැවිලි කර්මාන්තය වැනි කර්මාන්ත කිහිපයක රැකියා වෙත අන්තර්ග්‍රහණය කර ඇත. 2022 වසර තුළ දී මෙම වැඩසටහන තවත් පාසල් 78ක් දක්වා ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත.

වසර තුළ දී පාසල් වරින්වර වසා දැමීම හේතුවෙන් කොවිඩ්-19 වසංගතයේ අභියෝග ජය ගනිමින් සාමාන්‍ය අධ්‍යාපන කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යෑම සඳහා විවිධ නව ක්‍රමවේද අනුගමනය කිරීමට අවශ්‍ය විය. 2021 වසරේ මාර්තු මාසයේ සහ 2021 වසරේ අවසාන කාර්තුවේ දී ඉතා කෙටි කාලයක් සඳහා සුපුරුදු අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම හැරුණු විට, 2021 වසරේ වැඩි කාලයක් තුළ පාසල් අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් වසා දමා තිබුණි. පාසල් විවෘත කර තිබූ මෙම කෙටි කාලසීමා තුළ පාසල් පරිශ්‍රය තුළ සිටින ළමුන්, ගුරුවරුන් හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් කොවිඩ්-19 ආශ්‍රිත සෞඛ්‍ය මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපැදීම සහතික කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. පන්ති කාමර නිතිපතා විෂබීජහරණය කිරීම, දෑත් සේදීමේ පහසුකම් ලබා දීම, භෞතික වශයෙන් දුරස්ථ පන්ති කාමර සැකසීම සහ සිසුන් ආරක්ෂිත ලෙස ප්‍රවාහනය කිරීම සඳහා විධිවිධාන සම්බන්ධීකරණය කිරීම එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග අතර විය. වසර අවසාන භාගයේ දී, වයස අවුරුදු 16ට වැඩි සිසුන් ද ආවරණය වන පරිදි එන්නත්කරණ වැඩසටහන පුළුල් කරන අතර, ගුරුවරුන් එන්නත් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සෞඛ්‍ය අංශයේ පාර්ශ්වකරුවන් සමඟ සමීප සහයෝගයකින් යුතුව කටයුතු කළේය. පාසල් වසා දැමූ කාලපරිච්ඡේදය තුළ අඛණ්ඩව දෙවන වසර සඳහාත් ද්වි මුහුණුවරකින් යුතු යාන්ත්‍රණ හරහා අධ්‍යාපන ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරගෙන යෑම සහතික කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රයත්න දැරුවේය. 2020 වසර තුළ ක්‍රියාත්මක වූ මංගත වැඩසටහන් අඛණ්ඩව සිදු කිරීම සහ තවදුරටත් පුළුල් කිරීම මෙම යාන්ත්‍රණවල ප්‍රධාන අංගයක් විය. ඒ අනුව, *ගුරු ගෙදර* අධ්‍යාපනික වැඩසටහන යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිංහල සහ දෙමළ භාෂා ද්විත්වයෙන්ම අධ්‍යාපනික වැඩසටහන් විකාශනය කරන ලද අතර, පාසල්වල සියලුම ශ්‍රේණි සඳහා අතිරේක අධ්‍යාපනික කරුණු එක් කරමින් ජාතික විද්‍යුත් ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය වන *ඊ-තක්සලාව* පුළුල් කරන ලදී. මෙම අධ්‍යාපනික වැඩසටහන් සඳහා ප්‍රවේශය පුළුල් කරමින් එය ශ්‍රව්‍ය මාධ්‍යයෙන් ජාතික ගුවන්විදුලි නාලිකා හරහා ප්‍රචාරය කිරීමට ද වසර තුළදී කටයුතු කරන ලදී. 2021 වසර තුළ දී විශේෂයෙන්ම, ග්‍රාමීය සහ වතු ප්‍රදේශවල තාක්ෂණික සහ අන්තර්ජාල යටිතල පහසුකම් අවම වීම කෙරෙහි නිසි අවධානය යොමු කරමින්, *ගුරු ගෙදර* වැඩසටහන මගින් ශ්‍රව්‍ය මාධ්‍යයෙන් විකාශනය කෙරෙන අධ්‍යාපනික කරුණු සඳහා දවසේ ඕනෑම වේලාවක ප්‍රවේශ වීමට අවකාශය ලබා දෙමින් *රේඩියෝ ඊ-තක්සලාව* ජංගම යෙදුම සංවර්ධනය කරන ලදී. මේ අතර, දැනට පවතින මංගත ඉගෙනුම් පහසුකම් වෙත ප්‍රවේශ වීමේ දුෂ්කරතා ඇති සිසුන්හට පහසුකම් සැලසීම සඳහා දුර බැහැර ප්‍රදේශවල කලාපීය දුරස්ථ ඉගෙනුම් අධ්‍යාපන මධ්‍යස්ථාන 2,000කට අධික සංඛ්‍යාවක් ස්ථාපිත කරන ලදී. ඉගෙනුම් පරිසරයන් තුළ මුහුණට මුහුණලා සිදු කෙරෙන අන්තර්ක්‍රියා අවම වීම මධ්‍යයේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ ඉගෙනුම් ප්‍රතිඵල දුර්වල වීමේ අවදානමකට මුහුණ

3

දීමට පවතින වැඩි ඉඩ ප්‍රස්ථාව සැලකිල්ලට ගනිමින්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් ඇගයීම සඳහා නව අධ්‍යාපනික ඇගයීම් ක්‍රමයක් වසර තුළදී හඳුන්වා දුන් අතර, එමගින් එවැනි දරුවන් සඳහා තනි පුද්ගල අධ්‍යාපන සැලසුම් (Individual Education Plans) නිර්මාණය කිරීම සිදු විය. කොවිඩ්-19 වසංගතය මගින් ඇති වූ අනපේක්ෂිත තත්ත්වයන් හේතුවෙන් ජාතික මට්ටමේ විභාග කිහිපයක් ප්‍රමාද වුවද, එම විභාග 2022 වසරේ දී පැවැත්වීමට කඩිනමින් සැලසුම් සකස් කරන ලදී. ඒ අනුව, 2021 වසරේ අගෝස්තු මාසයේ පැවැත්වීමට නියමිතව තිබූ 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සහ උසස් පෙළ විභාගය කල් දැමීමෙන් අනතුරුව එම විභාග, පිළිවෙළින්, 2022 වසරේ ජනවාරි සහ පෙබරවාරි යන මාසවලදී පැවැත්වූ අතර, සාමාන්‍ය පෙළ විභාගය 2022 වසරේ මැයි මාසය දක්වා කල් තබන ලදී

සාමාන්‍ය අධ්‍යාපන ක්‍රියාකාරකම්වල අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා වන අදාළ සියලුම පාර්ශ්වකරුවන්ගේ කැපවීම, විශේෂයෙන්ම අධ්‍යාපනික ක්‍රියාකාරකම් මංගත ක්‍රමවේද වෙත ශීඝ්‍රයෙන් මාරු කිරීමට ගත් ක්‍රියාමාර්ග ඉතා ප්‍රශංසනීය වුවද, තාක්ෂණය ආශ්‍රිත යටිතල පහසුකම් වෙත ප්‍රවේශ වීමට ඇති දුෂ්කරතා සහ අදාළ සාක්ෂරතා මට්ටම්වල පවතින විෂමතා හේතුවෙන්, එවැනි ක්‍රියා මගින් අධ්‍යාපන ප්‍රතිඵලවල පවතින අසමානතා තවදුරටත් උග්‍ර කිරීමට වැඩි අවස්ථාවක් පවතින බව නිසි පරිදි හඳුනා ගැනීම වැදගත්ය. තවද, පන්ති කාමර සහ රසායනාගාර තුළ දී සහ විෂය බාහිර ක්‍රියාකාරකම්වල දී ගුරුවරුන් සහ සම වයසේ මිතුරන් සමඟ සම්බන්ධ වන විට දක්නට ලැබෙන එම ක්‍රියාකාරකම්වලටම අනන්‍ය වූ භෞතික අන්තර්ක්‍රියා නොමැතිවීම හේතුවෙන් ඇතිවන ගැටලු මගින් මංගත ඉගෙනුම් ප්‍රතිඵල දුර්වල කළ හැකි හෙයින් මංගත ඉගෙනුම් ප්‍රතිඵලවල ගුණාත්මකභාවය ඇගයීම කළ යුතු වේ. මෙවැනි ඉගෙනුම් පරතරයන් මගින් දරුවන්ගේ අධ්‍යාපන ප්‍රතිඵල කෙරෙහි දිගුකාලීන බලපෑම් ඇති කිරීමට ඉඩ ඇති අතර, එය දරුවන්ගේ කුසලතා, හැකියාවන් සහ දැනුම සම්බන්ධයෙන් සැලකිය යුතු අන්දමේ විෂමතා නිර්මාණය කිරීමේ හැකියාවක් පවතී. පසුගිය වසර දෙක තුළ දී සිසු දරුවන් ලබාගත් අධ්‍යාපනයේ ඉගෙනුම් ප්‍රතිඵලවල සිදුවිය හැකි දුර්වල වීම් පිළිබඳව අදාළ පාර්ශ්වකරුවන් විසින් පූර්වෝපායික ඇගයීම් සිදු කළ යුතු අතර, ළමයින් සාමාන්‍ය පරිදි පාසල් වෙත නැවත පැමිණීමත් සමඟ මෙම ඉගෙනුම් පරතරයන් පිරවීම සඳහා අවධානය යොමු වූ සහ ඉලක්කගත ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. එසේම, කොවිඩ්-19 වසංගතය මගින් නිර්මාණය කළ අවශ්‍යතා සපුරාලීම සඳහා සංවර්ධනය කර ඇති මංගත අධ්‍යාපන යටිතල පහසුකම් හරහා අත්‍යවශ්‍ය සම්පත් වෙත බාධාවකින් තොරව ප්‍රවේශ වීමට සහ නොමිලේ ලබා ගැනීමට පවතින ඉඩකඩ වර්ධනය වීම හේතුවෙන් රටේ අධ්‍යාපන යටිතල පහසුකම්වල දැනට පවතින විෂමතා අවම කිරීමට දායක විය හැකි බැවින් එවැනි යටිතල පහසුකම් අඛණ්ඩව පවත්වාගෙන යෑමට රජය විසින් පියවර ගැනීම ඉතා වැදගත් වේ.

3.11 සංඛ්‍යා සටහන

සාමාන්‍ය අධ්‍යාපනයේ මූලික ලක්ෂණ

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)
1. මුළු පාසල් සංඛ්‍යාව	11,091	11,095
රජයේ පාසල්	10,155	10,152
ප්‍රාථමික පාසල්	3,884	3,883
ද්විතීයික පාසල්	6,271	6,269
ඉන්, ජාතික පාසල්	373	383
වෙනත් පාසල්	936	943
පිරිවෙන්	816	819
පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ)	120	124
2. මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (ඈ)	4,272,289	4,238,760
රජයේ පාසල්	4,063,685	4,032,211
වෙනත් පාසල්	208,604	206,549
පිරිවෙන්	69,878	69,500
පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ)	138,726	137,049
ජාත්‍යන්තර පාසල්	ලැ.නො.	ලැ.නො.
3. මුළු ගුරුවරු සංඛ්‍යාව (ඈ)	265,394	264,215
රජයේ පාසල්	249,494	248,500
වෙනත් පාසල්	15,900	15,715
පිරිවෙන්	7,336	7,400
පෞද්ගලික හා විශේෂ පාසල් (ඇ)	8,564	8,315
ජාත්‍යන්තර පාසල්	ලැ.නො.	ලැ.නො.
4. නව ඇතුළත්කර ගැනීම් (ඉ)	319,405	307,415
5. ශිෂ්‍ය / ගුරු අනුපාතය		
රජයේ පාසල්	16	16
වෙනත් පාසල්	13	13
ජාත්‍යන්තර පාසල්	ලැ.නො.	ලැ.නො.
6. ප්‍රාථමික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (1-5 ශ්‍රේණි)	94.04	94.39
7. ද්විතීයික ශුද්ධ ඇතුළත්වීමේ අනුපාතය (6-11 ශ්‍රේණි)	91.68	91.46
8. වයස් විශේෂිත ඇතුළත්වීමේ අනුපාතය (1-9 ශ්‍රේණි)	ලැ.නො.	ලැ.නො.
9. ගුරු පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව	8	8
10. වසර තුළ දී පුහුණු කළ ගුරුවරු සංඛ්‍යාව	973	973
11. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සංඛ්‍යාව	19	19
පුහුණුව ලත් මුළු ගුරුවරු සංඛ්‍යාව	12,331	12,037
වසර තුළ දී පුහුණුව නිමකළ ගුරු සංඛ්‍යාව	3,864	4,447

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) රජය විසින් අනුමත පෞද්ගලික පාසල් සහ විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා වූ පාසල් (මෙයට සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ ජාත්‍යන්තර පාසල් අයත් නොවේ).
(ඈ) ජාත්‍යන්තර පාසල් වල දත්ත ඇතුළත් නොවේ.
(ඉ) රජයේ පාසල් සඳහා පමණි.

මූලය: අධ්‍යාපන අමාත්‍යාංශය

2021 වසර තුළ දී උසස් අධ්‍යාපන කටයුතු දුරස්ථ ඉගෙනුම් ක්‍රමවේද හරහා අඛණ්ඩව සිදු කරගෙන යෑමට රජය කටයුතු කළේය. වසර තුළ දී රාජ්‍ය විශ්වවිද්‍යාලවල උසස් අධ්‍යාපන කටයුතු 2020 වසරේ මාර්තු මාසයේ සිට ක්‍රියාත්මක වූ *ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය* (LEARN) නම් මංගත අධ්‍යාපන ක්‍රමය හරහා සිදු කරන ලදී. *ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාලය* මංගත අධ්‍යාපන ක්‍රමය යටතේ විශ්වවිද්‍යාල සිසුන්ට සහ කථිකාචාර්යවරුන්ට නොමිලේ දත්ත සඳහා ප්‍රවේශය ලබා දී ඇති අතර, මංගත මාර්ග ඔස්සේ දේශන පවත්වන ලදී. 2021 වසර තුළ, ඇතැම් අවස්ථාවල දී දිනකට සිසුන් 250,000ක් පමණ මෙම මංගත දේශන සඳහා සහභාගි වී ඇති අතර, ඉන් 100,000ක් මෙම මංගත අධ්‍යාපන ක්‍රමවේදය එකම අවස්ථාවකදී භාවිත කර ඇත. මේ අතර, මංගත අධ්‍යාපන සේවාවල ගුණාත්මකභාවය සහතික කිරීමේ අරමුණින්, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනෙකුත් විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් යුතුව *ලංකා අධ්‍යාපන හා පර්යේෂණ ජාල ඉගෙනුම් ක්‍රමවේදයෙහි* ප්‍රගතිය අඛණ්ඩව සමාලෝචනය කළේය.

3.12 සංඛ්‍යා සටහන

විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ මූලික ලක්ෂණ (අ)

ශීර්ෂය	2020 (ආ)	2021 (ඇ)
1. විශ්වවිද්‍යාල සංඛ්‍යාව	15	17
2. අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව	20	19
3. ශිෂ්‍ය සංඛ්‍යාව (උපාධි අපේක්ෂක) (ඈ)		
විශ්වවිද්‍යාල (ඉ)	106,641	118,711
ආයතන	3,844	3,610
විවෘත විශ්වවිද්‍යාලය	26,255	25,329
4. මුළු කාර්යමණ්ඩලය (සියලුම විශ්වවිද්‍යාලවල)		
අධ්‍යයන	6,525	6,742
අනධ්‍යයන	12,821	12,971
5. ශිෂ්‍ය / ගුරු අනුපාතය	18.8	19.7
6. වයස් විශේෂිත උපාධි අපේක්ෂක ඇතුළත් වීමේ අනුපාතය (අවුරුදු 19-23) (ඈ)	8.2	8.7
7. අ.පො.ස. උසස් පෙළ සිට විශ්වවිද්‍යාලයට ඇතුළත්වීම		
ඇතුළත්වීමට සුදුසුකම් ලැබූ ප්‍රමාණය (%)	62.42	62.44
සුදුසුකම් ලැබූවන්ගෙන් ඇතුළත් වූ ප්‍රමාණය (%)	22.98	22.49
8. උපාධිලත් සංඛ්‍යාව (ඊ)	32,066	ලැ.නො.
ප්‍රථම උපාධි	24,565	ලැ.නො.
පශ්චාත් උපාධි	7,501	ලැ.නො.
9. ප්‍රථම උපාධිය සඳහා නව ඇතුළත් වීම (උ)	41,669	ලැ.නො.
10. විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීම සඳහා සුදුසකම් ලැබූ සංඛ්‍යාව	181,206	194,297

මූලය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවතින විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) බාහිර උපාධි පාඨමාලා ඇතුළත් නොවේ.
(ඉ) විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් නොවේ.
(ඊ) බාහිර උපාධි හා විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් වේ.
(උ) බාහිර උපාධි හා විවෘත විශ්වවිද්‍යාලය ඇතුළත් නොවේ.

3.13 සංඛ්‍යා සටහන

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ මූලික ලක්ෂණ

ශීර්ෂය	2020	2021 (අ)
1. ලියාපදිංචි කළ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ආයතන සංඛ්‍යාව (ආ)	**1,239**	**1,071**
රාජ්‍ය	570	478
පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන	669	593
2. පිළිගත් පාඨමාලා සංඛ්‍යාව	**3,413**	**3,014**
රාජ්‍ය	2,900	2,387
පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන	513	627
3. ප්‍රදානය කළ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකපත් සංඛ්‍යාව	**47,621**	**45,033**
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව	8,670	4,633
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය	8,266	7,441
වෘත්තීය පුහුණු අධිකාරිය	15,608	17,253
ජාතික තරුණ සේවා සභාව	2,118	3,897
පෞද්ගලික ආයතන	12,959	11,809

(අ) තාවකාලික
(ආ) වසර අවසානයේ දී

මූලය: තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

රටේ තෘතීයික අධ්‍යාපන යටිතල පහසුකම් පුළුල් කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ඒ අනුව, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය සහ වවුනියාව විශ්වවිද්‍යාලය යනුවෙන් නව විශ්වවිද්‍යාල ද්විත්වයක් වසර තුළ දී ස්ථාපිත කරන ලදී. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය, උපාධි පාඨමාලා 08ක් සහ පශ්චාත් උපාධි පාඨමාලා 08ක් පිරිනැමීමේ පහසුකම් සහිත අධ්‍යයන අංශ 13කින් හා පීඨ 04කින් සමන්විත අංගසම්පූර්ණ විශ්වවිද්‍යාලයක් ලෙස 2021 වසරේ මාර්තු මාසයේ දී උසස් කරන ලදී. යාපනය විශ්වවිද්‍යාලයේ වවුනියා මණ්ඩපය 2021 වසරේ අගෝස්තු මාසයේදී වවුනියාව විශ්වවිද්‍යාලය ලෙසට උසස් කරන ලද අතර, ව්‍යාපාර අධ්‍යයනය, ව්‍යවහාරික විද්‍යා සහ තාක්ෂණ යන අධ්‍යයන ක්ෂේත්‍රවලට අදාළව උසස් මට්ටමේ තෘතීයික අධ්‍යාපනයක් ප්‍රවර්ධනය කිරීමට ඉන් අපේක්ෂා කෙරේ. මීට අමතරව, ජාතික හෙද විශ්වවිද්‍යාලයක් සහ ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ජාතික විශ්වවිද්‍යාලයක් පිහිටුවීමට යෝජනා කර ඇත. 2020/21 අධ්‍යයන වර්ෂය තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල කිහිපයක් සඳහා නව පාඨමාලා 16ක් හඳුන්වා දෙන ලදී.

3

පෞද්ගලික අංශය ද රටේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අවස්ථා පුළුල් කිරීම සඳහා පහසුකම් සැලසීය. ඒ අනුව, 2021 වසර අවසානය වන විට උපාධි පිරිනැමීමේ ආයතන ලෙස පිළිගත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සංඛ්‍යාව 21ක් විය. 2021 වසර තුළ දී රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් පිරිනමනු ලබන ප්‍රතීතනය ලත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව, 2020 වසරේ දී පැවති 167ක සිට 190ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, එමගින් සිසුන්ට පෞද්ගලික අංශය හරහා විවිධ අධ්‍යයන ධාරා යටතේ උසස් අධ්‍යාපනය හැදෑරීමට වැඩි අවස්ථා හිමි කර දී ඇත. මේ අතර, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ගුණාත්මක තත්ත්වය සහතික කිරීමේ අරමුණින් යුතුව, එම ආයතන නැවත ඇගයීම සඳහා පස් අවුරුදු මාර්ගෝපදේශයක් සැකසීමට අධ්‍යාපන අමාත්‍යාංශය අඛණ්ඩව කටයුතු කළ අතර, රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන සමාලෝචනය කිරීම සහ එම ආයතනවල වැඩසටහන් සමාලෝචනය කිරීම සඳහා වන අවම ප්‍රමිතීන් හඳුන්වාදීම සම්බන්ධ කටයුතු ද වසර තුළ දී සිදු වෙමින් පැවතුණි.

ආර්ථිකයේ ඉහළ යන අවශ්‍යතාවලට අනුකූලව ශ්‍රම බලකායේ නිපුණතා මට්ටම් ඉහළ නැංවීමේ අරමුණින් යුතුව කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රය 2021 වසර තුළ දී අධ්‍යාපන අවස්ථා ලබා දීමට අඛණ්ඩව කටයුතු කළේය. 2021 වසරේ දෙසැම්බර් අවසානය වන විට, රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන ආයතනවලින් සමන්විත, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු අධ්‍යාපනය ලබාදීමේ නිරත ලියාපදිංචි ආයතන සංඛ්‍යාව 1,071ක් විය. මෙම පුළුල් ආයතන ජාලය හරහා ප්‍රතීතනය කළ පාඨමාලා 3,000කට අධික සංඛ්‍යාවක් පවත්වා ඇති අතර, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ සුදුසුකම් ලැබූ සිසුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 45,033ක් නිකුත් කර ඇත. මේ අතර, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන් මංගත ක්‍රමවේද සහ රූපවාහිනී පාඩම් මාලා හරහා පැවැත්වීමට ක්‍රියාමාර්ග ගත් අතර, සිසුන්ගේ පුහුණු කාර්ය සාධනය පිළිබඳ දත්ත රැස් කිරීමට මෙන්ම වැඩසටහන් අයදුම්කරුවන් ඇගයීම සඳහා මංගත පද්ධතියක් ද නිර්මාණය කළේය. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් කිහිපයක් සඳහා නව ජාතික ප්‍රමිතීන් සකස් කළ අතර, ජාතික වෘත්තීය සුදුසුකම් වැඩසටහන්වල අදාළත්වය අඛණ්ඩව සහතික කිරීම සඳහා පවතින මාර්ගෝපදේශ සංශෝධනය කළේය. මේ අතර, කාර්මික අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව විසින් පුහුණු ශ්‍රමිකයන් සඳහා පවතින කාර්මික ඉල්ලුමට සරිලන පරිදි දිවයින පුරා වෘත්තීය පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීමට අඛණ්ඩව කටයුතු කරන ලදී. ඒ අනුව, තාක්ෂණ උදාන වැඩසටහන යටතේ වසර තුළ දී යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති කිහිපයක් සිදු කරන ලද අතර, පුත්තලම ප්‍රදේශයේ නව කාර්මික විද්‍යාලයක් ආරම්භ කරන ලදී.

නිවාස හා නාගරික සංවර්ධනය

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ අවහිරතා ගණනාවක් මධ්‍යයේ වුව ද, රට තුළ නිවාස පහසුකම් වැඩිදියුණු කිරීම ඉලක්ක කරගත් ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා රජය අඛණ්ඩව කටයුතු කළේය. ඒ අනුව, සියලුම ශ්‍රී ලාංකිකයන් සඳහා සුවපහසු සහ දැරිය හැකි මිල ගණන් සහිත නිවාස පහසුකම් සහතික කිරීමේ අරමුණ ඇතිව, සෞභාග්‍යයේ දැක්ම රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට සමගාමීව නිවාස ව්‍යාපෘති රැසක් ආරම්භ කරන ලදී. රජයේ දැක්මට අනුව, ඉඩමක් සතු වුවද, නිවාස ඉදිකර ගැනීමට නොහැකි අඩු ආදායම්ලාභී පවුල්වල නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් *ඔබට ගෙයක් - රටට හෙටක්* වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් සෑම ග්‍රාම නිලධාරී වසමකටම අවම වශයෙන් එක් නිවසක් ඉදිකර දීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2021 වසරේ දී නිවාස ඒකක 12,192ක් ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර, ඉන් නිවාස ඒකක 4,075ක ඉදිකිරීම් කටයුතු වසර තුළ දී නිම කරන ලදී. තවද, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී, පැවිදි භික්ෂූන් වහන්සේලාගේ අඩු ආදායම්ලාභී දෙමාපියන් සඳහා *මිහිඳු නිවහන* නිවාස වැඩසටහන සහ මැදි ආදායම් කාණ්ඩයේ පුද්ගලයන් සඳහා දැරිය හැකි මිලකට නිවාස ලබාදීම සඳහා *සියපත* සහ *සපිරි මහල්* නිවාස යන නිවාස වැඩසටහන් ද ක්‍රියාත්මක විය. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ද නාගරික ප්‍රදේශවල සහ එම ප්‍රදේශවලට ආසන්න ප්‍රදේශවල වර්ධනය වෙමින් පවතින නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා මැදි ආදායම් නිවාස ව්‍යාපෘතිය සහ දැරිය හැකි මිලකට නිවාස ලබා දීමේ ව්‍යාපෘතිය ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර, එමගින් රාජ්‍ය සේවකයන් ඇතුළු මැදි ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට සහාය විය.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් පුරවැසි කේන්ද්‍රීය නගර සංවර්ධනයක් සිදු කරන අතරම, නාගරික පරිසර තුළ ජීවත්වීමේ හැකියාව වැඩිදියුණු

කිරීම ඉලක්ක කරමින් මෙම වසර තුළ ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කළේය. නාගරික සංවර්ධන අධිකාරියෙහි නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ, බොරලැස්ගමුව බහුකාර්ය ගොඩනැගිල්ල, මිනුවන්ගොඩ පොළ, තත් කාලීනව ගංවතුර අවම කිරීමේ වැඩසටහන ඇතුළු ව්‍යාපෘති 57ක් පමණ වසර තුළ දී සිදු කරන ලදී. මෙම ව්‍යාපෘති යටතට රථගාල්, බස් නැවතුම්, පොදු වෙළෙඳපොළවල්, බහුකාර්ය ගොඩනැගිලි සහ නාගරික උද්‍යාන සංවර්ධනය ඇතුළත් වන අතර, නාගරික සංවර්ධනය සඳහා වන නගර සැලසුම්වලට අනුව සියලුම පළාත් ආවරණය වන පරිදි මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. ප්‍රාදේශීය නගර මධ්‍යස්ථාන වැඩි දියුණු කළ ජීවන පහසුකම් සහිත පුරවැසි කේන්ද්‍රීය නගර බවට ප්‍රතිසංවර්ධනය කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් *සියක් නගර (නගර සියයක්) අලංකරණ වැඩසටහන* දියත් කරන ලදී. නාගරික පරිසරයේ සෞන්දර්යත්වය සහ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීම ඉලක්ක කරමින් රාජ්‍ය ආයතන සංවර්ධන ව්‍යාපෘති, බේරේ වැව ප්‍රතිසංස්කරණය සහ ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය, යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම සහ සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය වැනි තවත් ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ද 2021 වසරේ දී ක්‍රියාත්මක විය. මීට අමතරව, බස්නාහිර කලාපීය ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ බස්නාහිර කලාපය තුළ සියලු පහසුකම්වලින් සමන්විත ප්‍රවාහන පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා නාගරික ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමට අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී. ඒ අනුව, කඩවත සහ කොළඹ-කොටුව ප්‍රවාහන කේන්ද්‍රස්ථානය වැනි බහු මාදිලි ප්‍රවාහන මධ්‍යස්ථාන සහ නගරාන්තර දුම්රිය ගමනාගමන පද්ධතියෙහි ඉදිකිරීම් කටයුතු 2021 වසර තුළ දී තවදුරටත් සිදු කෙරිණි. විදේශ ඍජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කරගත් ආයෝජන ව්‍යාපෘති වන ගාල්ල නගර මධ්‍යයේ සිදු වන ගාල්ල මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, ග්‍රෙගරි වැව ආශ්‍රිත තේමා උද්‍යාන ව්‍යාපෘතිය, හම්බන්තොට සේවා සැපයුම් මධ්‍යස්ථානය සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ බහු මහල් රථගාල ඇතුළු ව්‍යාපෘති කිහිපයක් දැනට ක්‍රියාත්මක කිරීමට නියමිත අතර, නාගරික සංවර්ධන අධිකාරියෙහි සංවර්ධන වැඩසටහන් යටතේ එම ව්‍යාපෘති ඉදිකිරීම කඩිනම්ව සිදු කෙරෙමින් පවතී.

ඒකාබද්ධ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළව ජාතික ධාරිතාව ගොඩනැංවීම සඳහා අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධතිවල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට රජය විසින් අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී. නාගරික ප්‍රදේශ සඳහා දිගු කාලීන තිරසාර ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් සැපයීම සඳහා කොළඹ අගනගරාශ්‍රිත කලාපයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. 2021 වසර අවසානය වන විට සියයට 87ක සමස්ත ප්‍රගතියක් අත්කර ගනිමින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ අතර, 2022 වසරේ මැද භාගය වන විට එය අවසන් කිරීමට අපේක්ෂිතය. ව්‍යාපෘතිය අවසන් වූ පසු දැනට පවතින දුම්රිය මාර්ග භාවිත කරමින් දිනකට අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 1,200ක් පමණ අරුවක්කාලු කසළ අංගනයට ප්‍රවාහනය කෙරෙනු ඇත. ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් පිළිබඳව ගැටලු පිළිබඳව විවිධ පාර්ශ්වකරුවන් විසින් අවධානයට ලක් කර ඇති අතර, නිවැරදි සැලසුමක් සහ නිසි කළමනාකරණයක් සහිතව ක්‍රියාවට නැංවීම තුළින් මෙම සනීපාරක්ෂක කසළ අංගනය මගින් දිනෙන් දින වර්ධනය වන රටේ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ගැටලුවට තිරසාර විසඳුමක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ඉදිරි වසර කිහිපය තුළ අපද්‍රව්‍ය කළමනාකරණ උද්‍යාන පිහිටුවීමට සහ කුඩා පරිමාණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන පිහිටුවීමට රජය මූලික පියවර ගෙන ඇති අතරම, හෝමාගම, බදුල්ල හා යාපනය යන ප්‍රදේශවල යාන්ත්‍රික කොම්පෝස්ට් කර්මාන්තශාලා සංවර්ධනය කිරීමට පියවර ද ගෙන ඇත.

දකුණු ආසියාවේ ප්‍රමුඛතම මූල්‍ය මධ්‍යස්ථානයක් සහ නවීනතම හා වඩාත් ආකර්ෂණීය නගරයක් ගොඩනැගීමේ අරමුණින් කොළඹ වරාය නගර ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු 2021 වසරේ දී අඛණ්ඩව කරගෙන යන ලදී. සියලුම ඉඩම් ගොඩකිරීම් කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව, 2021 වසරේ මැයි මාසයේ දී සම්මත කරන ලද 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත මගින්, ගොඩකරන ලද ප්‍රදේශය විශේෂ ආර්ථික කලාපයක් ලෙස නම් කරන ලදී. යටිතල පහසුකම් සංවර්ධනය මෙන්ම කාර්යාල සහ සිල්ලර වෙළඳසැල් හා නේවාසික ඒකක සංවර්ධනය කිරීම යන ක්‍රියාකාරකම්වලින් සමන්විත I වන අදියරෙහි යටිතල පහසුකම් සංවර්ධනය හා සම්බන්ධ කටයුතුවලින් සියයට 67ක සමුච්චිත ප්‍රගතියක් සහ භූමි අලංකරණ කටයුතුවලින් සියයට 52ක ප්‍රගතියක් අත් කර ගනිමින්, වරාය නගර අභ්‍යන්තර යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අදාළ ක්‍රියාකාරකම් 2021 වසරේ දී ක්‍රියාත්මක විය. තවද, 2021 වසර අවසානය වන විට කොළඹ අගනගරාශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට සමගාමීව, කොළඹ වරාය නගරයේ අපද්‍රව්‍ය හා අපජලය බැහැර කිරීමේ යටිතල පහසුකම්වලට අදාළ ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පැවතුණි. මාලිගාකන්ද ජල සම්පාදන නල මාර්ගය ඉදිකිරීම අවසන් කරන ලද අතර, එලී හවුස් ජල සම්පාදන නල මාර්ගය ඉදිකිරීම සම්බන්ධයෙන්

3

2021 වසර අවසානය වන විට ප්‍රගතිය සියයට 55ක් විය. ගොඩබිමේ සිට කොළඹ වරාය නගරය සම්බන්ධ කරන ප්‍රධාන ප්‍රවේශ මාර්ග ඉදිකිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. ප්‍රධාන ප්‍රවේශ යටිතල පහසුකම් අතරින්, අධිවේගී මාර්ග ජාලයෙන් වරාය නගරයට ප්‍රවේශ වීමට ඉඩ සලසන, කුලුනු මතින් දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය 2021 වසර අවසානය වන විට සියයට 35ක ප්‍රගතියක් ලබා ඇති අතර, දකුණු කොළඹ සිට වරාය නගරයට ප්‍රවේශ වීමට හැකි මුහුදුබඩ මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය එහි මූලික අදියරේ පවතී. සමුද්‍රීය යාත්‍රාංගණය, 2022 වසරේ ජනවාරි මාසයේදී, මහජනතාව සඳහා විවෘත කරන ලද අතර, යටිතල පහසුකම් සංවර්ධනය කඩිනම්ව නිම කිරීමත් සමඟ ව්‍යාපෘතියේ I වන අදියර 2023 වසරේ මුල් භාගය වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

3

සමාජ ආරක්ෂණ ජාල වැඩිපිළිවෙළ සහ දිළිඳුකම තුරන් කිරීම

දැනටමත් පවතින විෂමතා තවදුරටත් පුළුල් වීමත් සමඟ, දිළිඳුකම තුරන් කරලීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රශංසනීය ප්‍රගතිය කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක් වී ඇත. බලයට පත් රජයන් විසින් දිළිඳුකම තුරන් කිරීම සඳහා ගනු ලැබූ බහුවිධ ප්‍රයත්නයන් සහ එම රජයන් විසින් සැමට ප්‍රතිලාභ අත්වන වර්ධනයක් ඇති කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස පසුගිය දශක දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ දරිද්‍රතාවය අවම කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත්තේය. 2002 වසරේ *ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණය* මත පදනම්ව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සකසන ලද

3.16 රූප සටහන
දරිද්‍රතාවයෙහි ප්‍රවණතා



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

නිල දරිද්‍රතා රේඛාවට අනුව, ජනගහන දරිද්‍රතා දර්ශකය 1995/1996 වසරවල දී පැවති සියයට 28.8ක සිට 2019 වසරේ සමීක්ෂණයේ දී සියයට 3.2ක් දක්වා අඩු වී ඇත. 2012/13 වසරවල ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයේ දත්ත භාවිතයෙන් නිල දරිද්‍රතා රේඛාව මෑත කාලීනව යාවත්කාලීන කිරීමත් සමඟ, දරිද්‍රතාවය පහළ යෑම සම්බන්ධ ප්‍රවණතාව එකම ආකාරයක පෙන්නුම් කළද, 2019 වසරේ දී දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත්වන ජනගහනය සියයට 14.3ක් විය. ඒ අනුව, යාවත්කාලීන කරන ලද දරිද්‍රතා රේඛාවට අනුව, දරිද්‍රතා රේඛාවට පහළින් පුද්ගලයන් මිලියන 3.04ක් ජීවත් වන අතර, එය 2002 වසරේ දී දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන බවට පූර්ව ඇස්තමේන්තු කළ පුද්ගලයින් සංඛ්‍යාවට වඩා 4.4 ගුණයකින් වැඩිවීමකි. 2019 වසරේ ගෘහ ඒකක අදායම් හා වියදම් සමීක්ෂණය අනුව, දළ වශයෙන් ශ්‍රී ලාංකිකයන් හය දෙනෙකුගෙන් එක් අයෙකු දරිද්‍රතාවයට අදාළ බහුවිධ මානයන්ට අනුව දුප්පත් වන (Multidimensionally Poor) අතර, දරිද්‍රතාවයෙන් පෙළෙන ජන කොට්ඨාශය, බර තැබූ එම බහුමාන දර්ශකවලට අනුව සාමාන්‍යයෙන් සියයට 42ක් පමණ විහිනතාවයක් අත්දකින බව අනාවරණය වේ. ඒ අනුව, ජාතික බහුමාන ජනගහන දරිද්‍රතා දර්ශක සාපේක්ෂ වශයෙන් ග්‍රාමීය අංශයේ සියයට 16.6ක් ලෙස ද වතු අංශයේ සියයට 51.3ක් ලෙස ද ඉහළ මට්ටමක පැවතුණි. වතු අංශයේ ජනතාව ඉහළ මට්ටමේ විහිනතාවයකට මුහුණ දී ඇත. දිස්ත්‍රික්ක අතර, බහුමාන දරිද්‍රතාවයේ අඩුම මට්ටම් කොළඹ (සියයට 3.5) සහ ගම්පහ (සියයට 5.1) යන දිස්ත්‍රික්කවලින් වාර්තා වූ අතර, ඉහළම දරිද්‍රතා අනුපාතය නුවරඑළිය (සියයට 44.2) දිස්ත්‍රික්කයෙන් වාර්තා විය. දිස්ත්‍රික්ක අතර සැලකිය යුතු මට්ටමේ විෂමතාවක් පැවතිය ද, ජනගහනය අධික නාගරික ප්‍රදේශවල ජන ඝනත්වය ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් බහුමාන වශයෙන් දිළිඳු පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන්හි ඉහළ අගයක් ගත්තේය. කොවිඩ්-19 වසංගතයට පෙර සිටම ජනගහනයෙන් සැලකියයුතු කොටසක් දරිද්‍රතා අවදානමට මුහුණ දෙමින් සිටි බව මෙමගින් අවධාරණය කෙරේ. දිගු කාලයක් මුළුල්ලේ පවතින වසංගතය සහ ඉන් ඇති කෙරෙන බලපෑම් හේතුවෙන් ජනගහනය තුළ දරිද්‍රතා මට්ටමට ආසන්නයේ සිටින කණ්ඩායම් තුළින් නව දුගී කාණ්ඩයක් නිර්මාණය වීමේ හැකියාවක් පවතී. රාජ්‍ය මූල්‍ය අවකාශය සීමිත වීම මෙන්ම අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන් පැවතිය ද, දරිද්‍රතා මට්ටම් පැවතිය සහ විෂමතා අයහපත් අතට පත්වීමේ හැකියාව පිළිබඳව මනාව සැලකිල්ලට ගනිමින්, රජය සහ මහ බැංකුව විසින් පෙර නොවූ අන්දමේ රාජ්‍ය

මූල්‍ය සහ මුදල් උත්තේජක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හරහා ජනගහනයේ අවදානමට ලක්විය හැකි අංශ කෙරෙහි වසංගතය මගින් ඇති කෙරෙන අහිතකර බලපෑම් අවම කිරීමට අඛණ්ඩව ඉලක්ක කරන ලදී. මෙම පියවර මගින් ජනගහනයේ මූල්‍ය හා පෝෂණ තත්ත්වය මත වසංගතය මගින් ඇති කරන බලපෑම යම් තරමකට අවම කරනු ඇති නමුත්, සෞඛ්‍ය සහ අධ්‍යාපන යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය සහ ගෘහ ඒකකවල වත්කම් පදනම වැනි වසංගතයට පෙර සිට පැවති අනෙකුත් විෂමතා ගෘහ ඒකකවල වර්තමාන සහ අනාගත නිෂ්පාදන ධාරිතාවට බොහෝදුරට බාධා පමුණුවා ඇත. ඉදිරියේදී, කොවිඩ්-19 හෝ එවැනි අනපේක්ෂිත සිදුවීම් මගින් ඇති කෙරෙන දිගුකාලීන බලපෑම් හරහා ගෘහ ඒකකවලට ඇති විය හැකි අහිතකර බලපෑම් වළක්වා ගැනීමෙහිලා රජය විසින් කාර්යක්ෂම සහ ඉලක්කගත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී, දරිද්‍රතාව සම්බන්ධ විස්තරාත්මක සහ මෑත කාලීන දත්ත, අදාළ ආයතන විසින් නිසි කලට ලබා දීම ඉතා වැදගත් වේ.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ජීවනෝපායන් අහිමි වීම මගින් මූල්‍යමය වශයෙන් ඇති වූ දුෂ්කරතා අවම කිරීමේ අරමුණ ඇතිව, ජනගහනයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් සමාජ ආරක්ෂණ පියවර කිහිපයක් රජය ආරම්භ කළේය. කොවිඩ්-19 වසංගතය මගින් සමාජයේ අගහිඟකම් ඇති කණ්ඩායම්වලට ඇති කළ විෂමාකාර බලපෑම පිළිබඳව නිසි සැලකිල්ලක් යොමු කරමින්, රජය විසින් පවතින සමාජ සුබසාධන වැඩසටහන් අඛණ්ඩව දෙවන වසර සඳහාත් පුළුල් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව, වසංගතයේ තුන්වන රැල්ල ඇතුළත රජය විසින් 2021 වසරේ අප්‍රේල් සහ ජූනි යන මාසවල අවස්ථා දෙකක දී අවදානමට ලක්විය හැකි පවුල් සඳහා රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙන ලදී. එහිදී, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී සුදුසුකම් ලත් පවුල් මිලියන 2.8ක් අතර රුපියල් බිලියන 14.1ක් පමණ බෙදා දුන් අතර, 2021 වසරේ ජූනි මාසයේ දී දෙවන වටය ලෙස, පවුල් මිලියන 1.7ක් අතර රුපියල් බිලියන 8.2ක් බෙදා දුන්නේය. සමෘද්ධි ප්‍රතිලාභීන්, අඩු ආදායම්ලාභීන් හා අවදානමට ලක්විය හැකි පවුල්, වැඩිහිටි පිරිස් , ආබාධිත සහ වකුගඩු රෝගීන් ඇතුළු බොහෝ ගෘහ ඒකක මෙම වැඩසටහන තුළින් ප්‍රතිලාභ ලැබීය. මීට අමතරව, ජීවනෝපාය මාර්ග අහිමි වූ, එනමුත් රජයේ විසින් ලබාදෙන කිසිදු දීමනා වැඩසටහනකින් ආධාර නොලබන පවුල් ඉලක්ක කර ගනිමින් 2021 වසරේ අගෝස්තු මාසයේ දී එක් පවුලකට රුපියල් 2,000ක් බැගින් වූ දීමනාවක් ද ලබා දීමට රජය කටයුතු කළේය. ඒ අනුව, මෙම වැඩසටහන යටතේ රුපියල් බිලියන 11.8ක සමස්ත මුදල් ප්‍රමාණයක් බෙදා දී තිබුණි.

3.17 රූප සටහන
දිස්ත්‍රික් මට්ටමේ බහුමාන දරිද්‍රතා දර්ශකය - 2019



මූලයඃ ගෘහ ඒකක ආදායම් වියදම් සමීක්ෂණය - 2019
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පවතින සියලුම ආරක්ෂණ ජාල වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාමට සහ එමගින් ජනගහනයේ අවදානමට ලක්විය හැකි කොටස්වල ආර්ථික යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා වසර තුළ දී රජය කැපවී කටයුතු කළේය. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, දිගු කාලීන සමෘද්ධි සහන වැඩසටහන යටතේ රුපියල් බිලියන 51.6ක් ප්‍රතිලාභී පවුල් මිලියන 1.8ක් අතර වසර තුළ දී බෙදා දුන්නේය. ගෘහ ඒකකවලට ස්වෝත්සාහයෙන්ම දරිද්‍රතාවයෙන් මිදීමට හැකි වන පරිදි *ආරක්ෂිත වළල්ලක්* නිර්මාණය කිරීමේ අරමුණ ඇතිව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ජීවනෝපාය, සමාජීය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය ඉලක්ක කරගත් වැඩසටහන් රාශියක් ද ක්‍රියාත්මක කරන ලදී. පෙර පාසල් ළමුන් සඳහා උදෑසන ආහාර වේලක් ලබා දීමේ වැඩසටහන සහ ජාතික පාසල් ආහාර වැඩසටහන යටතේ පාසල තුළ ආහාර වේල ලබා දීම වෙනුවට *නිවසට රැගෙන යාම* සඳහා සලාක ලබාදීම අඛණ්ඩව සිදු කළ අතර, තරුණ මව්වරුන් සඳහා රුපියල් 20,000/=ක පෝෂණ

3

3.14 සංඛ්‍යා සටහන

ප්‍රධාන සුභසාධන වැඩසටහන් - ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව සහ ප්‍රදානයන්හි වටිනාකම

වර්ෂය	දිවිනැගුම / සමෘද්ධි සහනාධාර වැඩසටහන		පෝෂණ දීමනා වැඩසටහන (අ)		වියළි සලාක වැඩසටහන
	පවුල් සංඛ්‍යාව (ආ)	වටිනාකම (රු. මිලියන) (ඇ)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව (ආ)	වටිනාකම (රු. මිලියන)	වටිනාකම (රු. මිලියන)
2017	1,388,242	39,707	372,407	5,408	84
2018	1,384,021	39,239	329,047	5,490	58
2019	1,800,182	44,660	300,246	5,279	105
2020	1,770,086	52,434	238,034	4,761	ලැ.නො.
2021	1,760,485	55,400	250,848	5,248	ලැ.නො.

(අ) ගර්භණී සහ කිරිදෙන මව්වරුන් සඳහා
(ආ) වසර අවසානයේ දී
(ඇ) භූමිතෙල් සහනාධාරය ද ඇතුළත්ව

මූලයන්: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
මුදල් අමාත්‍යාංශය

3

දීමනාව ද රජය අඛණ්ඩව ලබා දුන්නේය. මෙම වැඩසටහන් කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලදී. අවශ්‍යතා සහිත පවුල් මුහුණ දෙන අභියෝග හමුවේ කුඩා දරුවන්ගේ සහ තරුණ මව්වරුන්ගේ පෝෂණ තත්ත්වය ආරක්ෂා කර ගැනීම සඳහා මෙම ක්‍රියාමාර්ග ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. කොවිඩ්-19 මගින් දිළිඳු පවුල් මත ඇති කෙරෙන විෂමාකාර සහ ක්ෂණික බලපෑම සැලකිල්ලට ගනිමින්, 2022 වසර සඳහා වන අයවැයෙන් යෝජිත පරිදි 2022 වසරේ පෙබරවාරි මාසයේ සිට ප්‍රතිලාභී පවුලකට ලබා දෙන සමෘද්ධි සහනාධාර මුදල සියයට 28කින් පමණ වැඩි කිරීමට ගත් තීරණය මගින් සමෘද්ධි වැඩසටහන තවදුරටත් පුළුල් කෙරිණි. ඒ අනුව, පවුලකට රුපියල් 3,500ක්, රුපියල් 2,500ක් සහ රුපියල් 1, 500ක් බැගින් වූ පවුල් ඒකක දීමනා, පිළිවෙළින්, එක් පවුලකට රුපියල් 4,500ක්, රුපියල් 3,200ක් සහ රුපියල් 1,900ක් දක්වා ඉහළ නංවන ලදී.

දරිද්‍රතාවය තුරන් කිරීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් ශ්‍රී ලංකාවට අත්කර ගැනීමට උපකාරී වී ඇති පවතින ආරක්ෂණ ජාල මගින්, කොවිඩ්-19 වසංගතය හරහා සමාජයේ අවදානමට ලක්විය හැකි කොටස් කෙරෙහි ඇති කෙරෙන බලපෑම අවම කර ගැනීමට ද උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, ඵලදායී හා තිරසාර ප්‍රතිඵල සහතික කිරීම සඳහා එවැනි ආරක්ෂණ ජාල කාර්යක්ෂම ලෙස ඉලක්කගත කිරීම සහ රජයේ අයවැය මත පදනම් නොවන නව ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම ද අත්‍යවශ්‍ය වේ. මෑත වසරවල දී, දුර්වල ඉලක්කකරණය හේතුවෙන් සමෘද්ධි වැනි සහනාධාර වැඩසටහන් දරිද්‍රතාවය පිටුදැකීමෙහිලා අඩු ඵලදායීතාවයක් පෙන්නුම් කිරීම පිළිබඳව දැඩි අවධානයක් යොමුව ඇත. සැබවින්ම අවදානමට ලක්විය හැකි පුද්ගලයින් හඳුනා ගැනීමට සහනාධාරලාභීන්ගේ ලැයිස්තුව නැවත සමාලෝචනය කිරීම, දුගී ජනතාව සඳහා ආර්ථික සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සාධාරණ කාල සීමාවක් තුළ සමාජ සුබසාධන වැඩසටහන්වලින් ඵලදායී ලෙස ප්‍රතිලාභීන් ඉවත් කිරීමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම යනාදිය මගින් මෙවැනි ආරක්ෂක වැඩසටහන් ආශ්‍රිතව රජයේ අයවැය මත වන පීඩනය අවම කෙරේ. මේ අතර, සමාජ ආරක්ෂක වැඩසටහන් ඉලක්කගත කිරීම වැඩිදියුණු කිරීම සඳහා කටයුතු කිරීම ඉතා වැදගත් වේ. මේ සම්බන්ධයෙන් ගත්කල, එවැනි මැදිහත්වීම්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නිරන්තරයෙන් යාවත්කාලීන කෙරෙන සහනාධාරලාභීන්ගේ නාම ලේඛනයක් ස්ථාපිත කිරීම කඩිනම් කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, ශ්‍රී ලංකාවේ ජනගහනය ශීඝ්‍රයෙන් වයස්ගත වීම මගින්, විශේෂයෙන්ම රජයේ විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක යෝජනා ක්‍රම වැනි පවතින සමාජ ආරක්ෂණ වැඩසටහන්වලින් ආවරණය නොවන අවිධිමත් අංශයේ සේවකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රම හඳුන්වාදීමේ වැදගත්කම අවධාරණය කරයි. වර්තමානයේ ජනගහනයෙන් සියයට 30ක් පමණක් විධිමත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් මගින් ආවරණය වන නමුත්, අඩු වෙමින් පවතින රාජ්‍ය මූල්‍ය අවකාශය මධ්‍යයේ රජයේ වත්මන් විශ්‍රාම වැටුප් රාමුව රජයේ අයවැය මත දිනෙන් දින වර්ධනය වන මූල්‍ය පීඩනයක් බවට පත්වෙමින් තිබේ. එමනිසා, විශේෂයෙන්ම ශ්‍රී ලාංකිකයන්ගේ ආයු අපේක්ෂාව ඉහළ යෑම සහ ඔවුන්ගේ වැඩිවන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින්, ඉදිරි දශක කිහිපය තුළ සැමට සුරක්ෂිත විශ්‍රාම ක්‍රමයක්

සහතික කිරීම සඳහා දීපව්‍යාප්ත දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම තුළින් රටේ සමාජ ආරක්ෂණ රාමුව පුළුල් කිරීම අත්‍යවශ්‍ය වේ.

පරිසරය

පරිසර අමාත්‍යාංශය රටේ ස්වභාවික සම්පත් සංරක්ෂණයට අදාළ නියාමන සහ ප්‍රතිපත්ති රාමුව ශක්තිමත් කිරීමට අදාළ මූලික පියවර කිහිපයක් ක්‍රියාත්මක කළේය. පාරිසරික ගැටලු අවම කිරීම සහ තිරසාර සංවර්ධනයට සහාය වීම සඳහා හිතකර ප්‍රතිපත්තිමය පරිසරයක් නිර්මාණය කිරීමේ ප්‍රධාන පියවර ලෙස *ජාතික පාරිසරික ප්‍රතිපත්තිය - 2022* සහ *ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම 2021 - 2030* සකස් කිරීම සිදුවිය. පාරිසරික සංවේදී ප්‍රදේශ වන ජෛව විවිධත්වයට අදාළ ප්‍රධාන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කිරීමේ අරමුණින් සකස් කළ, *ශ්‍රී ලංකාවේ පාරිසරික සංවේදී ප්‍රදේශ පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය*, 2021 වසරේ නොවැම්බර් මාසයේ දී අමාත්‍ය මණ්ඩලය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. 2012 වසරේ දී සකස් කරන ලද *ශ්‍රී ලංකාවේ ජාතික දේශගුණික විපර්යාස පිළිබඳ ප්‍රතිපත්තිය*, දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් මෑත කාලීන ප්‍රවණතා ද ඇතුළත් කරමින් වර්තමානයේ දී යාවත්කාලීන කෙරෙමින් පවතී. 2021 වසර තුළදී, විවිධ පාර්ශ්වකරුවන්ගේ සහය සහිතව ගංගා පද්ධතියේ දූෂණය අවම කිරීම ඉලක්ක කරගත් *සුරකිමු ගංගා* වැඩසටහන සහ *හුස්ම දෙන තුරු දීප ව්‍යාප්ත ජාතික රුක් රෝපණ වැඩසටහන* වැනි තවත් පාරිසරික වැඩසටහන් කිහිපයක් ද ක්‍රියාත්මක විය. 2021 වසරේ මාර්තු 31 වන දින සිට තනි භාවිත ප්ලාස්ටික් නිෂ්පාදන තහනම් කිරීමේ නීති ගැසට් කිරීම හා බලාත්මක කිරීම මෙන්ම ප්ලාස්ටික් කාණ්ඩ කේතකරණ පද්ධතියක් හඳුන්වාදීම වසර තුළ දී ගනු ලැබූ ප්‍රධානතම ප්‍රශංසනීය ක්‍රියාමාර්ග වේ. මෙ.වො. 10ක විදුලි බලයක් ජනනය කිරීමට අපේක්ෂිත ශ්‍රී ලංකාවේ පළමු අපද්‍රව්‍ය බලශක්ති බලාගාරය කෙරවලපිටියේ ඉදි කිරීම ද වසර තුළ දී තබන ලද ප්‍රධාන පියවරක් විය. දිරාපත් වන අපද්‍රව්‍ය යොදා ගනිමින් ජීව වායුව මගින් විදුලිය නිපදවීම සඳහා කොටවිල ප්‍රදේශයේ තවත් බලාගාරයක් ඉදිකිරීමේ කටයුතු ද මේ වනවිට ක්‍රියාත්මක වේ. මෙමගින් ජාතික විදුලිබල පද්ධතියට කි.වො. 400ක් එකතු කිරීමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකාව තුළ ඉහළ යන අපද්‍රව්‍ය කළමනාකරණ ගැටලු තිරසාර ලෙස විසඳීමට මෙවැනි ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය එක්ව පූර්ව අනතුරු ඇඟවීම් ලබා දීමට සහ රටේ ඇති වන ආපදා තත්ත්වයන් සඳහා පෙර සූදානම් කිරීම හා එම ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීම වැඩිදියුණු කිරීමට අදාළ පියවර ක්‍රියාත්මක කිරීමෙහි අඛණ්ඩව නිරත විය. වසර තුළ දී, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සාමාන්‍ය ජනතාවට, අදාළ ආපදා කළමනාකරණ බලධාරීන්ට සහ ධීවර ප්‍රජාවට ආපදා තත්ත්වයන් සඳහා පෙර සූදානම් වීමට පහසුකම් සැලසීමට සහ ස්වභාවික විපත්වලින් ඇතිවන අවදානම් අවම කර ගැනීමට විශේෂ කාලගුණ අනතුරු ඇඟවීම් 338ක් නිකුත් කර ඇත. එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ තෙල් කාන්දුව, නිරිතදිග මෝසම් ගංවතුර ආපදා සහ දෙවන අන්තර් මෝසම් කාලසීමාව අතරතුර ඇති වන ගංවතුර තත්ත්වයන් සම්බන්ධ ප්‍රතිපත්තිමය රාමුව ක්‍රියාත්මක කිරීමට අමතරව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ තෙල් කාන්දුව තක්සේරු කිරීම සඳහා කටයුතු කළේය. තෝරාගත් නගර සඳහා බහුවිධ ආපදා විශ්ලේෂණයක් සකස් කිරීම සහ දීප ව්‍යාප්තව පාසල් මුහුණ දෙන ආපදා අවදානම තක්සේරු කිරීමට අදාළ කටයුතු ද වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. 2021 වසරේ දී, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විශේෂයෙන් ම, රත්නපුර, කෑගල්ල, කළුතර, මහනුවර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි නාය යෑම් සහ බෑවුම් කඩා වැටීම්වලට අදාළව, අධීක්ෂණ කටයුතු, වාසස්ථානවලින් ඉවත් වීම සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සහ ආපදා සඳහා පිළියම් යෙදීමේ හා වළක්වා ගැනීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ කටයුතුවල සක්‍රීයව නිරත විය. වසර තුළ දී, අවශ්‍ය පරීක්ෂණ සහ විශ්ලේෂණ සිදු කිරීමෙන් පසු ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නාය යෑම් අවදානම් තක්සේරු වාර්තා 6,763ක් නිකුත් කරන ලදී. තවද, ස්ථායීකරණ ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් ස්ථාන 24ක නායයෑම් අවම කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර, තවත් ස්ථාන 32ක ප්‍රසම්පාදන කටයුතු සිදු වෙමින් පැවතුණි. නාය යෑම් අවදානමට ලක්විය හැකි ස්ථාන 147කට අදාළ සියලුම අවදානම් අවම කිරීමේ කටයුතු 2025 වසර වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

3

3

4

මිල සහ වැටුප්

4.1 සමස්ත නිරීක්ෂණ

නිල පාරිභෝගික මිල දර්ශක මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, 2021 වසර තුළ දී සමස්තයක් වශයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී කැපී පෙනෙන ඉහළ යෑමක් වාර්තා කළේය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි ආහාර සහ ආහාර නොවන කාණ්ඩවල අයිතමවල මිල ඉහළ යෑම්, භාණ්ඩ ප්‍රවාහන ගාස්තු වැඩිවීම්, අභ්‍යන්තර සැපයුම් ජාල තුළ ඇති වූ අවහිරතා, විවිධ මිල සංශෝධන හරහා ඇති වූ ඍජු සහ වක්‍ර බලපෑම් සහ කොවිඩ්-19 වසංගත තත්ත්වය සාර්ථකව පාලනය කිරීමත් සමඟ ඉල්ලුම ඉහළ යෑම දේශීය අයිතමවල මිල කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. 2021 වසරේ දී පොදු මිල මට්ටමේ ඉහළ යෑම සඳහා ආහාර කාණ්ඩය තුළ වන නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයට අයත් අයිතමවල මිල විචලනයන් වැඩිම දායකත්වය දක්වන ලදී. තවද, 2021 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ අයිතමවල මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ සඳහා කාබනික ගොවිතැන් ක්‍රම කෙරෙහි නැඹුරුවීමත් සමඟ අස්වැන්න අඩුවීම සහ වසංගත තත්ත්වය මැඩලීම හේතුවෙන් ආර්ථික කටයුතු සාමාන්‍යකරණය වීමත් සමඟ උත්සව සමයේ දී ඉල්ලුම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයේ අයිතමවල හැර අනෙකුත් ආහාර අයිතමවල මිල 2021 වසර තුළ දී අඛණ්ඩව ඉහළ ගියේය. ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2021 වසර තුළ දී අඛණ්ඩව ඉහළ ගිය අතර, 2021 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී එම ඉහළ යෑමේ වේගය තවදුරටත් ශීඝ්‍ර වූ නමුත් එමගින් පොදු මිල මට්ටම කෙරෙහි ඇති කරන ලද බලපෑම, ආහාර කාණ්ඩය මගින් ඇති කළ බලපෑමට වඩා අඩු මට්ටමක පැවතුණි. මෙම ප්‍රවණතා පිළිබිඹු කරමින්, 2021 ජනවාරි මාසයේ දර්ශකාංක 138.7ක් වාර්තා කළ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) 2021 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 154.7 දක්වා සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) 2021 ජනවාරි මාසයේ දී වාර්තා කළ දර්ශකාංක 142.1හි සිට 2021 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 161.0 දක්වා ඉහළ ගියේය. වැටුප් සම්බන්ධයෙන් ගත් කළ, විධිමත් සහ අවිධිමත් පෞද්ගලික අංශවල නාමික හා මූර්ත වැටුප්, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී. විධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ඉහළ යෑම සඳහා අවම වැටුප්වලට අදාළව සිදු කළ සංශෝධන හේතු වූ අතර, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ඉහළ යෑම සඳහා කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැනවූ සංචරණ සීමා ලිහිල් කිරීමත් සමඟ ආර්ථික කටයුතු සාමාන්‍ය තත්ත්වයට පත්වී ශ්‍රම ඉල්ලුම ඉහළ යෑම සහ ජීවන වියදම ඉහළ යෑම හේතු විය. රාජ්‍ය අංශය සම්බන්ධයෙන් සැලකූ විට නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය 2020 සහ 2021 වසර දෙක තුළ දී නොවෙනස්ව පැවති අතර, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකයේ අඩු වීමක් දක්නට ලැබුණි.

4.2 මිල

පොදු මිල මට්ටමේ විචලන

නිල පාරිභෝගික මිල දර්ශක වන කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද.[1] මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, වැඩි වශයෙන් ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් හා අනුරූපව විචලනය වෙමින්, 2021 වසර පුරා සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් වසර තුළ සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ද මෙම වසරේ දී සමස්ත වශයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ නමුත්, එම කාණ්ඩය මගින් පොදු මිල මට්ටමට ඇති කළ බලපෑම ආහාර කාණ්ඩයට සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි. 2021 වසරේ මහ කන්නයේ ලැබුණු යහපත් අස්වැන්න නිසා ආහාර කාණ්ඩයේ මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2021 වසරේ මාර්තු මාසයේ දී පොදු මිල මට්ටමේ අඩුවීමක් දක්නට ලැබුණු අතර, අනෙකුත් සියලුම මාසවල දී පොදු මිල මට්ටම අඛණ්ඩ ඉහළ යෑමක් පෙන්නුම් කළේය. තවද, ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩවල මිල වැඩිවීම්, භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම්, නිෂ්පාදන හිඟතාවයන් සහ සැපයුම් ජාලවල පැවති අවහිරතා පොදු මිල මට්ටම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. මීට අමතරව ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම විවිධ අයිතමවල සිදු වූ මිල වැඩිවීම් හේතුවෙන් ඇති වූ වක්‍ර බලපෑම් ද පොදු මිල මට්ටම මත සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලද අතර, මේ හේතූන් නිසා, 2021 වසරේ අවසාන කාලයේ දී පොදු මිල මට්ටම සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගියේය. සීමිත සැපයුමක් පැවති භාණ්ඩ හා සේවාවන්හි මිල ඉහළ යෑම කෙරෙහි බැංකු පද්ධතිය මගින් ලබා දුන් ණය හේතු කොටගෙන ජනතාවගේ මුදල් ආදායම් ඉහළ යෑමද හේතු විය. තවද, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් අඩු වී තිබූ පාරිභෝගික ඉල්ලුම 2021 වසර අවසානය වන විට යථා තත්ත්වයට පත්වීම ද මිල මට්ටම කෙරෙහි බලපෑමක් ඇති කළේය.

2021 වසර පුරා ඉහළ ගිය නිතර මිල උච්චාවචන[2] සහිත ආහාර කාණ්ඩයේ මිල ගණන් වසරේ අවසාන මාස දෙක තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ යෑම් පෙන්නුම් කරන ලදී. තවද, පූර්ණ වශයෙන් කාබනික ගොවිතැන වෙත නැඹුරු වීමට දැරූ උත්සාහයන් සමඟ පැන නැගුණු ගැටලු, එනම්, ප්‍රමාණවත් කාබනික පොහොර නොමැති වීම, කාබනික ගොවිතැන සඳහා නිසි මඟපෙන්වීම් සහ උපදෙස් නොලැබීම, රට තුළ ඉතිරිව පැවති රසායනික පොහොරවල මිල අධික ලෙස ඉහළ යෑම, වගා හානි වැඩිවීම සහ අස්වැන්න අඩුවීම, නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිල ගණන් ඉහළ යෑම කෙරෙහි සැලකිය යුතු පීඩනයක් ඇති කරන ලදී. ප්‍රධාන වශයෙන් සහල්, පොල්, අමු මිරිස් සහ එළවළු මිල ඉහළ යෑම හේතුවෙන් නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ මිල ගණන් 2021 ජනවාරි සහ 2021 පෙබරවාරි මාසවල දී ඉහළ ගියේය. එසේ වුවද, පොල්, එළවළු, ළූණු, අමු මිරිස් සහ අර්තාපල් මිල අඩුවීම හේතුවෙන් නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2021 මාර්තු සහ අප්‍රේල් මාසවල දී පහළ ගියේය. ඉන් අනතුරුව, මෙම පහළ යෑමේ ප්‍රවණතාව වෙනස් වී, 2021 ජූනි මාසයේ දී එම කාණ්ඩයේ මිල ගණන් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, ඒ සඳහා සහල්, එළවළු සහ නැවුම් මත්ස්‍ය මිල ගණන් ඉහළ යෑම හේතු විය. මෙම ඉහළ යෑමේ ප්‍රවණතාව 2021 ජූලි මාසයේ දී ද දක්නට ලැබුණි. සහල්, පොල් සහ ළූණු මිල පහළ යෑම හේතුවෙන් 2021 අගෝස්තු මාසයේ දී නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ මිල ප්‍රවණතාව වෙනස් වූ අතර, සහල් සහ එළවළු මිල පහළ යෑම 2021 සැප්තැම්බර් මාසයේ දී එම කාණ්ඩයේ මිල ගණන් පහළ යෑමට මූලික විය.

4.1 සංඛ්‍යා සටහන
තෝරාගත් ආහාර අයිතම මත පනවන ලද උපරිම සිල්ලර මිල - 2021

අයිතමය	උපරිම සිල්ලර මිල (කිලෝග්‍රෑමයට රු.)	උපරිම සිල්ලර මිල බලපැවැත් වූ දිනය
සහල්		2021.09.02 (අ)
සම්බා	103.00	
නාඩු	98.00	
සුදු කැකුළු	95.00	
රතු කැකුළු	95.00	
සුදු සීනි		2021.09.02 (ආ)
පැකට් නොකළ	122.00	
පැකට් කළ	125.00	

(අ) 2021 සැප්තැම්බර් 29 වන දින සිට බලපැවැත්වෙන පරිදි උපරිම සිල්ලර මිල ඉවත් කෙරිණි.
(ආ) 2021 නොවැම්බර් 03 වන දින සිට බලපැවැත්වෙන පරිදි උපරිම සිල්ලර මිල ඉවත් කෙරිණි.

මූලය: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

1 ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිල පාරිභෝගික මිල දර්ශක වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) මාසිකව සම්පාදනය කරනු ලබයි. ජා.පා.මි.ද. මගින් ජාතික මට්ටම නියෝජනය වන ලෙස තෝරාගත් පාරිභෝගික අයිතමවල මිල වෙනස් වීම් පෙන්නුම් කරනු ලබන අතර කො.පා.මි.ද. මගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ජනතාව නියෝජනය වන ලෙස තෝරාගත් පාරිභෝගික අයිතමවල මිල වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

2 සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයට ඇතුළත් වේ.

4.1 රූප සටහන

මිල සහ වැටුප් විචලන - 2021

(අ) නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩයට සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග ඇතුළත් වේ.

(ආ) අනෙකුත් ආහාර කාණ්ඩයට නිතර මිල උච්චාවචනය වන ආහාර අයිතම හැර අනෙකුත් ආහාර ඇතුළත් වේ.

(ඇ) නාමික සහ මූර්ත වැටුප් වෙනස ලෙස 2021 සහ 2020 වසරවල සාමාන්‍ය අතර ප්‍රතිශතමය වෙනස දක්වා ඇත.

(ඈ) පධිපාලක සහා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වේ.

ඉන් අනතුරුව, 2021 ඔක්තෝබර් මාසයේ දී මෙම කාණ්ඩයේ මිල ගණන් ඉහළ ගිය අතර ඒ සඳහා, සහල්, පලතුරු, ලොකු ළූණු සහ කුකුළු මස් මිල ඉහළ යෑම හේතු විය. තවද, 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ මිල ගණන් කැපී පෙනෙන වැඩිවීමක් පෙන්නුම් කළ අතර, මේ සඳහා සහල්, එළවළු, අමු මිරිස්, කුකුළු මස්, නැවුම් මත්ස්‍ය, පොල්, අර්තාපල් සහ ළූණු මිල ගණන් ඉහළ යෑම සහ උත්සව සමයේ ඇති වූ ඉහළ පාරිභෝගික ඉල්ලුම හේතු විය. 2020/2021 මහ කන්නයේ අස්වැන්න වෙළඳපොළට ලැබෙන මාස ද ඇතුලුව, 2021 ජූලි මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ දී සහල් මිල අඛණ්ඩව ඉහළ ගියේය. කෙසේ වුවද, රජය මගින් ගනු ලැබූ පියවර කිහිපයක් හේතුවෙන් 2021 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී සහල් මිල පහළ ගියේය. තවද, වසරකට වැඩි කාලයක්

4.2 රූප සටහන
සතිපතා සිල්ලර මිල - සහල්



4.3 රූප සටහන
සතිපතා සිල්ලර මිල - එළවළු



4.4 රූප සටහන
සතිපතා සිල්ලර මිල - පොල් (මධ්‍යම)



4.5 රූප සටහන
සතිපතා සිල්ලර මිල - මාළු (අ)



පුරා නොවෙනස්ව පැවති සම්බා, නාඩු, සුදු කැකුළු සහ රතු කැකුළු සහල් මිල මත පනවා තිබූ උපරිම සිල්ලර මිල ගණන් 2021 සැප්තැම්බර් මාසයේ දී ඉහළ නැංවුවද, වෙළඳපොළෙහි සහල් හිඟයක් ඇතිවීම වැළැක්වීමේ අරමුණින් එම මාසයේදීම උපරිම සිල්ලර මිල ගණන් පනවමින් නිකුත් කළ ගැසට් නිවේදනය අවලංගු කරන ලදී. මේ අතර, සහල් සැපයුමේ ඇති වූ ගැටලුකාරී තත්ත්වයන් මඟහැරවීම සඳහා ආනයනික සහල් මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2021 නොවැම්බර් මාසය ආරම්භයේ දී පහළ දමන ලදී. තවද, 2021 සැප්තැම්බර් මාසයේ දී උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කිරීමත් සමඟ සියලුම දේශීය සහල් වර්ගවල මිල ගණන් ඉතා වේගයෙන් ඉහළ යනු දක්නට ලැබුණි. මේ සඳහා, විශේෂයෙන්ම කොවිඩ්-19 ව්‍යාප්තිය සාර්ථකව පාලනය කිරීමත් සමඟ 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දී ආර්ථික කටයුතු සාමාන්‍යකරණය වී උත්සව සමයේ දී ඉහළ ඉල්ලුමක් ඇතිවීම හේතු විය.

කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තියත් සමඟ පනවන ලද සංචරණ සීමා, ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානවල වෙළඳාම් කටයුතු සීමාසහිත වීම සහ අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් එළවළු සැපයුමට ඇති වූ බාධා මූලික කොටගෙන, 2021 වසර තුළ දී එළවළු මිල ගණන් මිශ්‍ර විචලන පෙන්නුම් කළේය. මේ අතර, වසරේ අවසන් මාස දෙක තුළ දී එළවළු මිල ගණන් ඉහළ යෑමට පොහොර සහ කෘමිනාශක හිඟය නිසා නිෂ්පාදනය අවම වීම සහ උත්සව සමයේ ඇති වූ ඉහළ ඉල්ලුම ප්‍රධාන වශයෙන් හේතු විය. පොල් මිල ගණන් සමස්තයක් ලෙස 2021 වසර තුළ දී පහළ ගිය අතර, මේ හේතුවෙන් පොල් සඳහා උපරිම සිල්ලර මිල ගණන් පනවමින් නිකුත් කළ ගැසට් නිවේදනය 2021 ජූනි 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලදී. කෙසේ වුවද, සෘතුමය සාධක, උත්සව කාලය තුළ ඇති වූ ඉහළ පරිභෝජනය සහ ජාත්‍යන්තර වෙළඳපොළෙහි දිසිඳි පොල් (desiccated coconut) සඳහා ඉල්ලුම ඉහළ

4.6 රූප සටහන
සතිපතා සිල්ලර මිල - අර්තාපල්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

4.7 රූප සටහන
සතිපතා සිල්ලර මිල - ආනයනික ලොකු ඊෑණු



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

යෑමෙන් දේශීය පරිභෝජනයට අවශ්‍ය පොල් හිඟ වීම හේතුවෙන් 2021 ඔක්තෝබර් සහ දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයේ දී පොල් මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කුකුළු ආහාර සඳහා යොදාගනු ලබන බඩ ඉරිඟු සහ ප්‍රතිජීවක ඖෂධ ආදියෙහි මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් කුකුළු මස් නිෂ්පාදන පිරිවැය ඉහළ ගිය අතර, මේ හේතුවෙන් 2021 වසර තුළ දී කුකුළු මස් මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, ලොකු සහ කුඩා මාළු වර්ග දෙකෙහිම මිල ගණන් 2021 වසර තුළ දී ඉහළ ගියේය. තවද, විශේෂ වෙළඳ භාණ්ඩ බදු සංශෝධන කිහිපයකට ලක් වූ අර්තාපල් මිල, 2021 වසරේ මුල් මාස නවය තුළ දී බොහෝ දුරට ස්ථාවර මට්ටමක පැවතුණද, ඉන් අනතුරුව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2021 වසර තුළ දී රතු ඊෑණු මිල සමස්තයක් ලෙස පහළ ගිය අතර, රජය මගින් සිදු කළ කාලෝචිත මැදිහත්වීම් හේතුවෙන් වසර තුළ බොහෝදුරට ස්ථාවරව පැවති ලොකු ඊෑණු මිල, වසර අග භාගයේ දී අඛණ්ඩ ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. මේ අතර, වෙළඳපොළ තුළ අත්‍යවශ්‍ය ආහාර හිඟයක් ඇති වීම වැළැක්වීමේ අරමුණින්, නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩය තුළ ඇති ආනයනික අර්තාපල් සහ ලොකු ඊෑණු මත පාලන මිල පනවමින් නිකුත් කර තිබූ ගැසට් නිවේදන 2021 නොවැම්බර් 03 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලදී.

2021 වසර තුළ නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතම හැර අනෙකුත් ආහාර අයිතමවල මිල ගණන් අඛණ්ඩව ඉහළ ගියේය. ඒ අනුව, 2021 වසර තුළ නොකඩවා ඉහළ ගිය පරිප්පු මිල, 2020 වසරේ දී නිරීක්ෂණය වූ මිල මට්ටම්වලට වඩා ඉහළ අගයක පැවති අතර, මේ සඳහා ජාත්‍යන්තර වෙළඳපොළ මිල ගණන් සහ භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම් හේතු විය. උත්සව සමය තුළ වැඩි වූ ඉල්ලුම හේතුවෙන් 2021 අප්‍රේල් මාසය තුළ දී ඉහළ ගිය සීනි මිල, 2021 අගෝස්තු මාසයේ දී ඉහළම සීනි මිල වාර්තා කළ අතර, සීනි ආනයනය සඳහා ආනයනික බලපත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය කිරීමේ තීරණය ඊට හේතු විය.

4.8 රූප සටහන
සතිපතා සිල්ලර මිල - සීනි



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

4.9 රූප සටහන
ජාත්‍යන්තර වෙළඳපොළ මිල - සීනි



මූලය: ලෝක බැංකුව

4.10 රූප සටහන
සතිපතා සිල්ලර මිල - පරිප්පු



4.11 රූප සටහන
සතිපතා සිල්ලර මිල - තිරිඟු පිටි



රජය මගින් රට තුළ ප්‍රමාණවත් සීනි තොග පවතින බවට දැනුම්වත් වී මෙම තීරණය ගනු ලැබුව ද, පෞද්ගලික වෙළඳුන් විසින් දේශීය වෙළඳපොළට සීනි තොග සැපයීම සීමා කිරීම හේතුවෙන් සීනි මිල මත ඉහළ පීඩනයක් ඇති විය. තවද, ජාත්‍යන්තර වෙළඳපොළේ සීනි නිෂ්පාදනය පහත වැටීම සහ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් ජාත්‍යන්තර වෙළඳපොළේ සීනි මිල 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ඉහළ මට්ටම්හි පැවතුණි. මේ හේතුවෙන්, ඉහළ ගිය සීනි මිල පහළ දැමීම සඳහා, 2021 සැප්තැම්බර් 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි සුදු සීනි මත උපරිම සිල්ලර මිල ගණන් පනවන ලදී. කෙසේ වුවද, 2021 සැප්තැම්බර් මාසයේ මැද සිට සීනි මිල ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කිරීම හේතුවෙන් සීනි මත පනවා තිබූ උපරිම සිල්ලර මිල ගණන් 2021 නොවැම්බර් 03 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරන ලදී. ඕස්ට්‍රේලියාවේ සහ නවසීලන්තයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් නිෂ්පාදනය සීමිත වීම, කොවිඩ්-19 ආශ්‍රිත සීමාවන් ක්‍රමයෙන් ලිහිල් කිරීමත් සමඟ ආර්ථික කටයුතු සාමාන්‍යකරණය වීම තුළ ගෝලීය ඉල්ලුම ඉහළ යෑම වැනි හේතු නිසා ජාත්‍යන්තර වෙළඳපොළේ කිරිපිටි මිල ඉහළ ගියේය. ඒ අනුව, 2020 වසර පුරා නොවෙනස්ව පැවති ආනයනික කිරිපිටි මිල, ජාත්‍යන්තර වෙළඳපොළේ මිල ඉහළ යෑම, භාණ්ඩ ප්‍රවාහන ගාස්තු ඉහළ යෑම සහ පාලන මිල ඉවත් කිරීම යන හේතු නිසා 2021 ඔක්තෝබර් මාසයේ දී ඉහළ සංශෝධනයකට ලක් වූයේය. ඉන් අනතුරුව 2021 ඔක්තෝබර් 15 වන දින සිට දේශීය කිරිපිටි මිල ඉහළ දමන ලදී. ඉන් පසුව, 2021 අවසානය වන විට ආනයනික කිරිපිටි මිල නැවතත් ඉහළ ගියේය. මේ අතර, දේශීය කරවල නිෂ්පාදකයන් දිරිමත් කිරීමේ අරමුණින්, 2021 අගෝස්තු 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි කරවල කිලෝග්‍රෑමයක් මත වූ රුපියල් 100ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද එලෙසම පවත්වාගෙන යායුතු බවට ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. තවද, 2021 ඔක්තෝබර් 10 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තිරිඟු පිටි කිලෝග්‍රෑමයක මිල රුපියල් 10කින් ඉහළ දැමීම හේතුවෙන්, 2021 ඔක්තෝබර් 11 වන දින සිට ග්‍රෑම් 450ක් බරැති පාන් ගෙඩියක මිල රුපියල් 5කින් ඉහළ දැමූ අතර, ඊට සමගාමීව බනිස් සහ කේක් වැනි අනෙකුත් බේකරි නිෂ්පාදනවල මිල ගණන් ද ඉහළ දමන ලදී. ඉන් අනතුරුව, තිරිඟු පිටි මිල නැවතත් ඉහළ දැමූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2021 නොවැම්බර් 29

4.2 සංඛ්‍යා සටහන
තෝරාගත් ආහාර අයිතම මත පනවන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බදු - 2021

අයිතමය	විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (කිලෝග්‍රෑමයට රු.)	විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද බලපැවැත් වූ දිනය
ආනයනික සහල්		
සම්බා	65.00	2021.10.11
	0.25	2021.11.02
නාඩු	65.00	2021.10.11
	0.25	2021.11.02
සුදු කැකුළු	65.00	2021.10.11
	0.25	2021.11.02
රතු කැකුළු	65.00	2021.10.11
	0.25	2021.11.02
ආනයනික අර්තාපල්	15.00	2021.02.12
	50.00	2021.04.27
	20.00	2022.01.01
ආනයනික ලොකු ළූණු	0.25	2021.01.14
	40.00	2021.09.08
	10.00	2022.01.01
පරිප්පු		
පියලි නොකළ	0.25	2021.01.14
පියලි කළ	0.25	2021.01.14
රතු ළූණු	50.00	2021.05.18
හාල්මැස්සන්	100.00	2021.02.12
කරවල	100.00	2021.02.12

මූලය: මුදල් අමාත්‍යාංශය

4.12 රූප සටහන
ජාත්‍යන්තර වෙළඳපොළ මිල - බොරතෙල්



මූලයන්: ලං.බ.නී.ස සහ අනෙකුත් අපනයන ආයතන
ලංකා අයි.ඕ.සී.

4.13 රූප සටහන
ජාත්‍යන්තර වෙළඳපොළ මිල - එල්.පී. ගෑස්



මූලය: සෞදි ඇරම්කෝ එල්.පී. ගෑස් මිල

වන දින සිට ග්‍රෑම් 450ක් බරැති පාන් ගෙඩියක මිල රුපියල් 10කින් ඉහළ ගියේය. ඉන් අනතුරුව, පාන් ඇතුළු සියලුම බේකරි නිෂ්පාදනවල යෙදවුම් පිරිවැය සහ අනෙකුත් වෙළඳපොළ තත්ත්වයන් අනුව ඒවායේ මිල තීරණය කිරීමට ඉඩ සැලසීමේ අරමුණින් 2021 දෙසැම්බර් 21 වන දින සිට එම අයිතමයන් මත පනවා තිබූ මිල පාලනයන් ඉවත් කළ බව නිවේදනය කරන ලදී. විශේෂයෙන්ම 2021 නොවැම්බර් 03 වන දින සිට සුදු සීනි, පරිප්පු, කුකුළු මස්, ටින් මාළු, තිරිඟු පිටි, මුං ඇට, කඩල, කරවල, බඩ ඉරිඟු සහ ආනයනික කිරිපිටි යන අත්‍යවශ්‍ය භාණ්ඩ කිහිපයක මිල පාලනය සඳහා පනවා තිබූ ගැසට් නිවේදන අවලංගු කරන ලදී.

4.3 සංඛ්‍යා සටහන
තෝරාගත් වෙළඳ භාණ්ඩ සඳහා සිදු කළ පරිපාලිත මිල සංශෝධන - 2021

අයිතමය	ඒකකය	සංශෝධිත මිල (රු.)	බලපැවැත් වූ දිනය
කිරි පිටි			
ආනයනික	ග්‍රෑම් 400	480.00	2021.10.09
	ග්‍රෑම් 400	540.00	2021.12.31
දේශීය	ග්‍රෑම් 400	470.00	2021.10.15
තිරිඟු පිටි			
ප්‍රීමා සමාගම	කි.ග්‍රෑ. 1	97.00	2021.10.10
	කි.ග්‍රෑ. 1	114.50	2021.11.27
සෙරන්ඩිබ් සමාගම	කි.ග්‍රෑ. 1	97.00	2021.10.10
	කි.ග්‍රෑ. 1	114.50	2021.11.29
එල්.පී. ගෑස්			
ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම	කි.ග්‍රෑ. 9.6	1,150.00	2021.07.25
	කි.ග්‍රෑ. 12.5	2,675.00	2021.10.10
ලාෆ්ස් ගෑස් සමාගම	කි.ග්‍රෑ. 12.5	1,856.00	2021.08.12
	කි.ග්‍රෑ. 12.5	2,840.00	2021.10.10
ඉන්ධන			
පෙට්‍රල් (92 ඔක්ටේන්)			
ලං.බ.නී.ස. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	157.00	2021.06.12
ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	162.00	2021.10.22
ලං.බ.නී.ස. සහ ලංකා අයි.ඕ.සී	ලීටර් 1	177.00	2021.12.21
සුදු ඩීසල්			
ලං.බ.නී.ස. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	111.00	2021.06.12
ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	116.00	2021.10.22
ලං.බ.නී.ස. සහ ලංකා අයි.ඕ.සී.	ලීටර් 1	121.00	2021.12.21
භූමිතෙල්			
ලං.බ.නී.ස.	ලීටර් 1	77.00	2021.06.12
ලං.බ.නී.ස.	ලීටර් 1	87.00	2021.12.21

මූලයන්: පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් මගින් පොදු මිල මට්ටම මත ඇති කරන ලද බලපෑම ආහාර කාණ්ඩයට සාපේක්ෂව අවම වුවද, 2021 වසර පුරා අඛණ්ඩව ඉහළ යමින් වසර අවසානයේ වැඩි වේගයකින් ඉහළ ගියේය. 2021 වසරේ දී ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් මිල ඉහළ ගිය අතර, මේ සඳහා කොවිඩ්-19 එන්නත්කරණයේ සැලකිය යුතු ප්‍රගතිය, වසංගත ආශ්‍රිත සීමාවන් ලිහිල් කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීම හේතුවෙන් බොරතෙල් සැපයුමට වඩා ඉල්ලුමේ ඉහළ යෑම හේතු විය. මෙම ජාත්‍යන්තර වෙළඳපොළේ බොරතෙල් මිල ඉහළ යෑම ආනයනික බොරතෙල්[3] මිල ගණන්හි පෙන්නුම් කළ අතර, ඒ අනුව 2020 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2021 දෙසැම්බර් මාසයේ දී ආනයනික බොරතෙල් මිල[3] සියයට 64.6කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2021 වසරේ දී පෙට්‍රල් (ඔක්ටේන් 92), සුදු ඩීසල් සහ භූමිතෙල්වල දේශීය මිල ගණන් දෙවරක් වැඩි කරන ලද අතර එය පොදු මිල මට්ටම මත අමතර වක්‍ර පීඩනයක් ඇති කරන ලදී. මීට අමතරව, වාහන අමතර කොටස් මිල, වාහන සේවා පිරිවැය සහ කුලී රථ ගාස්තු වසර තුළ ඉහළ ගියේය. තවද, 2021 වසරේ අවස්ථා කිහිපයක දී ආපනශාලා සහ හෝටල් උප කාණ්ඩයට අයත් පිළියෙළ කරන ලද ආහාර අයිතම කිහිපයක මිල ගණන්වල ඉහළ යෑම් වාර්තා වූ

3 ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.බ.නී.ස.) සහ අනෙකුත් අපනයන ආයතන, ලංකා අයි.ඕ.සී. පොදු සීමිත සමාගම

4

අතර, ඒ සඳහා අර්ධ වශයෙන් හේතු වූයේ ජාත්‍යන්තර වෙළඳපොළේ එල්.පී. ගෑස් මිල ඉහළ යෑමත් සමඟ 2021 ඔක්තෝබර් 10 වන දින සිට ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සහ ලාෆ්ස් ගෑස් සමාගම විසින් කිලෝග්‍රෑම් 12.5ක් බරැති එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල සැලකිය යුතු ලෙස ඉහළ දැමීමයි. එමෙන්ම, 2020 දෙසැම්බර් මාසයට අනුරූපව 2021 දෙසැම්බර් මාසයේ දී ගෝලීය එල්.පී. ගෑස්[4] වෙළඳපොළ තුළ ප්‍රොපේන් සහ බියුටේන් මිල පිළිවෙළින් සියයට 76.6 සහ සියයට 63.0කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. දේශීය වෙළඳපොළේ එල්.පී. ගෑස් මිල සංශෝධනවලට අමතරව, ආහාර මිල ගණන් ඉහළ යෑමද පිළියෙල කරන ලද ආහාර මිල ගණන් ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. ජාත්‍යන්තර පාසල් ගාස්තු සහ ද්විතීයික අධ්‍යාපනය සඳහා වන උපකාරක පන්ති ගාස්තු ඉහළ යෑම හේතුවෙන් වසරේ වැඩි කාලයක් තුළ ස්ථාවර මට්ටම්වල පැවති අධ්‍යාපන උප කාණ්ඩයට අයත් අයිතමවල මිල ගණන් 2021 සැප්තැම්බර් මාසයේ සිට ඉහළ ගියේය. පුද්ගලික වෛද්‍ය සේවා ගාස්තු, පුද්ගලික රෝහල්/වෛද්‍ය රසායනාගාර සඳහා ගෙවීම් සහ වෛද්‍ය/ඖෂධ නිෂ්පාදනවල ගාස්තු මිල ගණන් වරින්වර සංශෝධනය වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2021 අප්‍රේල් මාසයේ සිට සෞඛ්‍ය උප කාණ්ඩයේ අයිතමවල මිල ගණන් අඛණ්ඩව වැඩි විය. මේ අතර, නිවාස කුලී 2021 ඔක්තෝබර් මාසයේ වැඩි වූ නමුත් එම වැඩිවීම කොවිඩ්-19 වසංගත තත්ත්වයට පෙර සිදු වූ නිවාස කුලී වැඩිවීමට සාපේක්ෂව අඩු මට්ටමක පැවති අතර, 2021 සැප්තැම්බර් මාසයේ සිට ගෘහ නඩත්තු සහ උපකරණවල පිරිවැයෙහි කැපී පෙනෙන ඉහළ යෑමක් දක්නට ලැබුණි. මේ අතර, 2020 වසර තුළ බොහෝ දුරට ස්ථාවර මට්ටම්වල පැවති ඇඳුම් සහ පාවහන් මිල ගණන් 2021 ඔක්තෝබර් මාසයේ සිට අඛණ්ඩව ඉහළ වැඩිවීමක් පෙන්නුම් කළේය.

පාරිභෝගික මිල දර්ශක

කොළඹ පාරිභෝගික මිල දර්ශකය

කො.පා.මි.ද. 2021 ජනවාරි මාසයේ පැවති දර්ශකාංක 138.7හි සිට 2021 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 154.7 දක්වා වේගයෙන් ඉහළ ගියේය. 2021 ජනවාරි සහ පෙබරවාරි මාසවල දී දක්නට ලැබුණු මාසික ඉහළ යෑම් සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම මිල ගණන්හි සිදු වූ විචලන හේතු විය. එසේ වුවද, 2021 මාර්තු සහ අප්‍රේල් මාස දෙක තුළ දී

4 සෞදි ඇරැම්කෝ (Saudi Aramco) එල්.පී. ගෑස් මිල

4.14 රූප සටහන
කො.පා.මි. දර්ශකයෙහි මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය - 2021



(අ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම ලෙස විදුලිය, එල්.පී. ගෑස්, ඉන්ධන, බස් ගාස්තු සහ දුම්රිය ගාස්තු සැලකේ.
(ආ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම හැර ඉතිරි අයිතම

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

කො.පා.මි.ද. පහළ ගිය අතර, එයට මුළුමනින්ම දායක වූයේ ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි සිදු වූ විචලනයන්ය. ඉන් පසුව, 2021 මැයි සහ ජූනි මාසවල දී කො.පා.මි.ද. ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් ඉහළ යෑම දායක වූ අතර, ආහාර කාණ්ඩය සාපේක්ෂ වශයෙන් වැඩි දායකත්වයක් දක්වන ලදී. 2021 ජූලි මාසයේ දී කො.පා.මි.ද. ඉහළ යෑමට මුළුමනින්ම දායක වූයේ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි සිදු වූ විචලන වුවද, 2021 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී කො.පා.මි.ද. ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ඉහළ යෑම් දායක විය. එමෙන්ම, 2021 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ නිරීක්ෂණය කළ කැපී පෙනෙන මාසික වැඩිවීම් සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් දායක වූ අතර, වැඩි දායකත්වය දැක්වූයේ ආහාර කාණ්ඩයයි.

ජාතික පාරිභෝගික මිල දර්ශකය

2021 මාර්තු මාසයේ වාර්තා වූ මාසික පහළ යෑම හැරුණු විට, ජා.පා.මි.ද. 2021 ජනවාරි මාසයේ දී දර්ශකාංක 142.1හි සිට 2021 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 161.0 දක්වා අඛණ්ඩව ඉහළ ගියේය. 2021 ජනවාරි සහ පෙබරවාරි මාසවල ජා.පා.මි. දර්ශකයෙහි දක්නට ලැබුණු මාසික ඉහළ යෑම් සඳහා ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි ඉහළ යෑම් ප්‍රධාන

4.15 රූප සටහන
ජා.පා.මි. දර්ශකයෙහි මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය - 2021



(අ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම ලෙස විදුලිය, එල්.පී. ගෑස් ඉන්ධන, බස් ගාස්තු සහ දුම්රිය ගාස්තු සැලකේ.
(ආ) ආහාර නොවන කාණ්ඩයේ පරිපාලිත අයිතම හැර ඉතිරි අයිතම

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වශයෙන් දායක විය. 2021 මාර්තු මාසයේ දී වාර්තා වූ මාසික පහළ යෑමට මුළුමනින්ම හේතු වූයේ ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් පහළ යෑමයි. කෙසේ වුවද, ඉන් අනතුරුව 2021 අප්‍රේල් මාසයේ දී කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ල ආරම්භ වීමත් සමඟ ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, 2021 දෙසැම්බර් මාසය දක්වා ජා.පා.මි.ද. ඉහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය තුළ 2021 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවල ජා.පා.මි.ද. ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් ආහාර නොවන කාණ්ඩය දායක වූ අතර ඉතිරි මාස සඳහා ආහාර කාණ්ඩය විසින් සැලකිය යුතු දායකත්වයක් සපයන ලදී. ආහාර අයිතමවල සැපයුමෙහි ඇති වූ හිඟය හේතුවෙන් එම අයිතමවල මිල ඉහළ ගිය අතර, ජනගහනයේ ඇතැම් කොටස්වල මුදල් ආදායම් තත්ත්වය ඉහළ යෑමද ආහාර අයිතමවල මිල තවදුරටත් ඉහළ යෑමට බලපෑමක් ඇති කළේය.

නිෂ්පාදකයාගේ මිල දර්ශකය (නි.මි.ද.)

ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කෘෂිකර්මාන්ත, නිෂ්පාදන සහ උපයෝගිතා අංශවල දේශීය භාණ්ඩ සහ සේවා නිෂ්පාදකයන්ට ලැබෙන සාමාන්‍ය මිල ගණන් මත පදනම්ව සම්පාදනය කරනු ලබන නි.මි. දර්ශකයෙහි පදනම් කාලපරිච්ඡේදය වූ 2013 සිව්වන කාර්තුව, 2018 සිව්වන කාර්තුව වශයෙන් 2021 නොවැම්බර් මාසයේ දී යාවත්කාලීන කරන ලදී. ඒ අනුව, වත්මන් ආර්ථික ප්‍රවණතා පිළිබිඹු වන අයුරින් නි.මි. දර්ශකයෙහි බර තැබීම් සහ මිල ගණන් යාවත්කාලීන කරන ලදී. තවද, නි.මි. දර්ශකය සඳහා නව අයිතම කිහිපයක් එකතු කිරීමත්, නිෂ්පාදන උප අංශයේ භූගෝලීය ආවරණය පුළුල් කිරීමට අමතරව, කෘෂිකර්ම සහ නිෂ්පාදන උප අංශ දෙකෙහි පැවති අයිතම කිහිපයක් ඉවත් කිරීමත් සිදු කරන ලදී. නි.මි.ද. (2018 සිව්වන කාර්තුව=100) 2021 ජනවාරි මාසයේ දී දර්ශකාංක 116.0ක් වාර්තා කළ අතර එතැන් සිට 2021 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 133.7 දක්වා සමස්තයක් ලෙස ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කෘෂිකාර්මික උප අංශයේ නි.මි.ද. 2021 ජනවාරි මාසයේ දර්ශකාංක 134.0ක් වාර්තා කළ අතර, ඉන් අනතුරුව එය සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතෙමින් වසරේ අවසන් මාස පහ තුළ අඛණ්ඩව ඉහළ ගොස් දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 161.7 දක්වා ළඟා විය. මේ අතර, නිෂ්පාදන උප අංශයේ නි.මි.ද. 2021 ජනවාරි සහ දෙසැම්බර් මාසවල දී පිළිවෙළින් දර්ශකාංක 113.9ක් සහ දර්ශකාංක 131.4ක් වාර්තා කළ අතර මෙම වසර තුළ වැඩි වශයෙන් මාසික ඉහළ යෑම් මෙම උප අංශයෙන් වාර්තා විය. 2021 ජනවාරි මාසයේ දී දර්ශකාංක 100.1ක් වාර්තා කළ උපයෝගිතා (විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සැකසුම් සැපයුම සහ ජලය එක්රැස් කිරීම, ප්‍රතිකාරක යෙදීම හා සැපයීම) උප අංශයේ නි.මි.ද. පළමු මාස හතර තුළ කැපී පෙනෙන උච්චාවචනයන් පෙන්නුම් කළ අතර පසුව වසර පුරා ස්ථාවර වෙමින් 2021 දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 102.5ක් වාර්තා කළේය.

4.3 වැටුප්

2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී විධිමත් හා අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් පහළ යෑමක් පෙන්නුම් කරන ලදී. 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් ද ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් නොවෙනස්ව පැවතිණි. සංචරණ සීමා සහ ආර්ථික ක්‍රියාකාරකම්වල පසුබෑම වැනි කොවිඩ්-19 වසංගතය නිසා ඇති වූ අහිතකර බලපෑම්, 2021 වසරේ වැටුප් වර්ධනයන් කෙරෙහි සෘණාත්මක බලපෑම් ඇති කළේය. ඒ අතර, කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක වීමත් සමඟ ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීම සහ විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් වැඩි කිරීමට ගත් තීරණය, විශේෂයෙන්ම විධිමත් හා අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළේය.

4

පෞද්ගලික අංශයේ වැටුප්

අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2012=100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2021 වසර තුළ සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. 2021 අප්‍රේල් මාසයේ වාර්තා වූ සුළු පහළ යෑම සහ 2021 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාස දෙකෙහි වාර්තා වූ තියුණු ඉහළ යෑම් හැර වසරේ ඉතිරි මාසවල දී නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය සාමාන්‍ය වැඩිවීම් වාර්තා කළේය. 2021 අප්‍රේල් මාසයේ නිරීක්ෂණය වූ පහළ යෑමට කුඩා කර්මාන්ත ක්‍රියාකාරකම්වල වැටුප් පහත වැටීම හේතු වූ අතර, 2021 සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවල නිරීක්ෂණය වූ තියුණු වැටුප් ඉහළ යෑම සඳහා කෘෂිකර්ම, කර්මාන්ත සහ සේවා යන සියලුම උප ක්‍රියාකාරකම් හේතු විය. මෙම වර්ධනයන් සමඟ, අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 9.2කින් ඉහළ ගියේය. මේ අතර, කෘෂිකර්ම අංශයේ නාමික වැටුප් සියයට 6.4කින් ද, කර්මාන්ත අංශයේ නාමික වැටුප් සියයට 9.7කින් ද, සේවා අංශයේ නාමික වැටුප් සියයට 10.0කින් ද 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ඉහළ ගියේය. කොවිඩ්-19 ආශ්‍රිත සංචරණ සීමා ලිහිල් කිරීම සහ රට පුරා එන්නත්කරණ වැඩසටහන ක්‍රියාත්මක වීම සමඟ ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීම, අවිධිමත් අංශයේ වැටුප් ඉහළ යෑමට මූලික විය. තවද, සේවා නියුක්ත ජනගහනයෙන් පිළිබිඹු වන පරිදි කර්මාන්ත අතර සිදුව ඇති ශ්‍රම විතැන් වීම් හේතුවෙන් ඇති වූ ශ්‍රම ඉල්ලුම වැඩිවීම ද අදාළ වැටුප්වල ඉහළ යෑම්වලට හේතු විය. තවද, විශේෂයෙන්ම 2021 වසරේ අවසාන භාගයේ දී අවිධිමත් අංශයේ වැටුප් වැඩිවීමට ජීවන වියදම ඉහළ යෑම ද දායක විය. මේ අතර, අවිධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 2.0කින් ඉහළ ගියේය.

පඩි පාලක සභා මගින් පාලනය වන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ[5] සේවකයන්ගේ නාමික වැටුප් 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 74.4කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම ඉහළ යෑමට, 2021 මාර්තු 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි තේ සහ රබර් වගා කිරීමේ සහ නිෂ්පාදනය කිරීමේ ක්ෂේත්‍රයට අදාළ පඩි පාලක සභාව මගින් තේ සහ රබර් වතු කම්කරුවන්ගේ

4.16 රූප සටහන
2021 වසරේ අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලනය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දෛනික වැටුප රුපියල් 1,000 දක්වා වැඩි කිරීම හේතු විය. තවද, 2016 අංක 03 දරන ජාතික අවම සේවක වැටුප් පනතට ගෙන එන ලද සංශෝධනය අනුව 2021 අගෝස්තු 16 දින සිට පෞද්ගලික අංශයේ අවම මාසික වැටුප රුපියල් 10,000 සිට රුපියල් 12,500ක් දක්වා සහ අවම දෛනික වැටුප රුපියල් 400 සිට රුපියල් 500ක් දක්වා වැඩි කිරීම ද මෙම නාමික වැටුප් වැඩිවීමට දායක විය. ඒ අනුව, විධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය ද පසුගිය වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 64.3කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් නිවසේ රැඳී සිටීමට සිදු වූ සේවකයන්ට අවසන්වරට ගෙවන ලද මූලික වැටුපෙන් සියයට 50ක් හෝ මසකට රුපියල් 14,500ක් යන විකල්ප අතරින් සේවකයාට වඩාත් වාසිදායක වන පරිදි වැටුප් ගෙවීමේ එකඟතාවක් සහිත වූ ත්‍රෛපාර්ශ්වීය ගිවිසුම, සංචාරක අංශ සඳහා 2021 දෙසැම්බර් දක්වා දීර්ඝ කරන ලදී.

රාජ්‍ය අංශයේ වැටුප්

රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, පසුගිය වසරට සාපේක්ෂව 2021 වසරේ දී නොවෙනස්ව පැවතුණි. කෙසේ වෙතත්, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් සියයට 6.4කින් පහළ ගියේය. 2022 ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි මුදල් අමාත්‍යංශය විසින් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ, ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයේ සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ පැවති වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා සිදු කළ වැටුප් වැඩිවීම් සහ රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා ලබා දුන් රුපියල් 5,000ක විශේෂ දීමනාව, රාජ්‍ය අංශයේ වැටුප් කෙරෙහි 2022 වසරේ දී ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇත.

5 පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් ගණනය කරනු ලබයි.

5

විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

5.1 සමස්ත නිරීක්ෂණ

ව්‍යවහාර මුදලේ බාහිර අගය මත වන අඛණ්ඩ පීඩනය සමඟ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි මන්දගාමී ක්‍රියාකාරීත්වය හා සමගාමීව අඛණ්ඩව ඉහළ මට්ටමක පැවති ණය සේවාකරණ වගකීම් සහ දුර්වල ගෙවුම් තුලනයක් පවතින තත්ත්වය මධ්‍යයේ 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය ඉහළ අවදානම් තත්ත්වයන් සඳහා මුහුණ දුන්නේය. අපනයන යථා තත්ත්වයට පත් වීම සහ ස්ථාවර වර්ධනයක් පිළිබිඹු කළ ද, ආනයන වියදම සාපේක්ෂව ඉහළ යෑම හේතුවෙන් වෙළඳ හිඟය කැපී පෙනෙන ලෙස පුළුල් වූ අතර, එය විදේශීය ජංගම ගිණුම මත සෘණාත්මක බලපෑමක් ඇති කළේය. තෝරාගත් භාණ්ඩ සඳහා ආනයන සීමා පවතින අතරතුර වුව ද, අපනයන වර්ධනය ඉක්මවා යමින් ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යෑම වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්වීම සමඟ ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ බලශක්ති මිල ඉහළ යෑමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී සහ 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී වෙළඳ හිඟය කැපී පෙනෙන ලෙස පුළුල් විය. පරිගණක සේවා උප අංශය හිතකර වර්ධනයක් පෙන්නුම් කළ ද, සේවා අංශයේ ක්‍රියාකාරීත්වය 2020 සහ 2021 යන වසර ද්විත්වයේ ම මන්දගාමී වූ අතර, 2021 වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී පමණක් සංචාරක අංශයේ පිබිදීමක් දක්නට ලැබුණි. 2021 වසරේ දී පොලී සහ ලාභාංශ ගෙවීම් අඩු වීම හේතුවෙන් පසුගිය වසරට සාපේක්ෂව ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සුළු වශයෙන් අඩු විය. වසරේ දෙවන භාගයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීමේ මන්දගාමීත්වයක් නිරීක්ෂණය කළ අතර, ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය සැලකිය යුතු ලෙස පහළ යෑමට එය හේතු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ජංගම ගිණුමේ හිඟය 2020 වසරේ දී වූ දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි.) ප්‍රතිශතයක් ලෙස සියයට 1.5ට සාපේක්ෂව 2021 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.0ක් දක්වා සැලකිය යුතු ලෙස පුළුල් විය. කොටස් වෙළඳපොළෙහි සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විවිධ ආයෝජන අඛණ්ඩව ශුද්ධ ගෙවීම් වාර්තා කළ අතර, විදේශීය ඍජු ආයෝජන ආකාරයෙන් වන විදේශීය ආයෝජන තවදුරටත් මන්දගාමී තත්ත්වයක පැවතුණ හෙයින් මූල්‍ය ගිණුම ද මන්දගාමී ක්‍රියාකාරීත්වයක් වාර්තා කළේය. විදේශීය ගිණුම් මත පීඩනය තීව්‍ර කරමින් රජය වෙත වූ විදේශීය ලැබීම්, විදේශ ව්‍යාපෘති ණය සහ ප්‍රදාන මෙන්ම විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් දෙකකට සීමා විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) නව විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) වෙන් කිරීම සහ බංගලාදේශ බැංකුව, චීන මහජන බැංකුව සමඟ 2021 වසරේ දී සහ ඉන්දියානු සංචිත බැංකුව සමඟ 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී සිදු කළ විදේශ විනිමය හුවමාරු

පහසුකම් තුළින් මහ බැංකුව වෙත විදේශ විනිමය ලැබීම් වාර්තා විය. විදේශ විනිමය ලැබීම් අවම වීම හේතුවෙන් විදේශීය අංශයේ ඉහළ යන අසමතුලිතතා හමුවේ, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතාවය වර්ධනය කිරීම සහ විදේශ සංචිත නැවත ගොඩ නැංවීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. මහ බැංකුව විසින් අපනයන ඉපැයීම් ශ්‍රී ලංකා රුපියල්වලට හුවමාරු කිරීමේ අවශ්‍යතා දැක්වූ අතර, ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කළ අපනයන ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් කොටසක් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණීම සඳහා බැංකු වෙත නියෝග දෙන ලදී. වසර තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ නැංවීම සඳහා ද මහ බැංකුව සහ රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය. මේ අතර, වෙළඳපොළ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය සැලකිල්ලට ගනිමින්, 2021 සහ 2022 වසර තුළ දී ජාතික ප්‍රමුඛතාවයක් ලෙස සලකා ප්‍රධාන වශයෙන් ම ඉන්ධන, එල් පී ගෑස් සහ ගල් අඟුරු ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා මහ බැංකුව විසින් මූල්‍ය සහය ලබා දෙන ලදී. ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ක්‍රියාවලියට සහයෝගය දැක්වීම සඳහා 2021 වසරේ දී සහ 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී විනිමය අනුපාතිකය බොහෝ දුරට ස්ථායී මට්ටමක පවත්වා ගත්ත ද, විදේශීය අංශයේ මතුවන ගැටලු සලකා බලමින් මහ බැංකුව විසින් 2022 වසරේ මාර්තු මස මුල සිට විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැලපීමක් සඳහා ඉඩ හරින ලදී. කෙසේ වෙතත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ දක්නට ලැබුණු ඉහළ පීඩනය හේතුවෙන්, විනිමය අනුපාතිකය සැලකිය යුතු ඉහළ ප්‍රමාණයකින් අවප්‍රමාණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වසරේ දී සියයට 7.0කින් අවප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, 2022 වසරේ මාර්තු මස අවසානය වන විට සියයට 33.0කින් සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. විදේශීය අංශයේ පවතින අර්බුදයට පිළියමක් ලෙස කඩිනම් පියවර ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව හඳුනා ගැනීම තුළින් සහ ආර්ථිකයේ අඛණ්ඩව පැවත එන දිගු කාලීන ගැටලු විසඳීම ඉලක්ක කරගත් පුළුල් ආර්ථික ප්‍රතිසංස්කරණ තුළින් ඒවාට දායකවීම සඳහා ජා.මූ. අරමුදල සමඟ සබඳතා ආරම්භ කිරීම සහ මෙරට විදේශීය ණය තිරසාර ලෙස කළමනාකරණය කර ගැනීම ඇතුළුව රජය සහ මහ බැංකුව විසින් 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කරන ලදී.

5.1 සංඛ්‍යා සටහන

ගෙවුම් තුලනයෙහි විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම

ශීර්ෂය	එ.ජ. ඩොලර් මිලියන		රුපියල් මිලියන	
	2020 (අ)	2021 (ආ)	2020 (අ)	2021 (ආ)
ජංගම ගිණුම (ශුද්ධ)	**-1,187**	**-3,343**	**-238,248**	**-672,960**
වෙළඳ ගිණුම	**-6,008**	**-8,139**	**-1,115,988**	**-1,617,274**
අපනයන	10,047	12,499	1,858,927	2,486,943
ආනයන	16,055	20,637	2,974,915	4,104,218
සේවා (ශුද්ධ)	**819**	**1,586**	**150,014**	**316,225**
ලැබීම්	3,035	2,475	559,615	493,320
ගෙවීම්	2,216	889	409,601	177,095
ප්‍රාථමික ආදායම් (ශුද්ධ)	**-2,205**	**-2,018**	**-423,063**	**-406,605**
ලැබීම්	198	116	36,766	22,769
ගෙවීම්	2,404	2,134	459,829	429,374
ද්විතීයික ආදායම් (ශුද්ධ)	**6,207**	**5,228**	**1,150,789**	**1,034,694**
ද්විතීයික ආදායම්: ලැබීම්	7,117	5,498	1,319,377	1,088,388
සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ	7,104	5,491	1,317,007	1,087,188
රජයේ සංක්‍රාම	13	6	2,371	1,200
ද්විතීයික ආදායම්: ගෙවීම්	910	270	168,589	53,694
ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)	**28**	**25**	**5,193**	**5,009**
ප්‍රාග්ධන ගිණුම: ලැබීම්	51	50	9,472	9,850
ප්‍රාග්ධන ගිණුම: ගෙවීම්	23	24	4,279	4,841
ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)	**-1,159**	**-3,318**	**-233,056**	**-667,951**
මූල්‍ය ගිණුම (ශුද්ධ)	**-394**	**-4,029**	**-77,578**	**-962,044**
සෘජු ආයෝජන: වත්කම්	**15**	**17**	**2,699**	**3,468**
සෘජු ආයෝජන: වගකීම්	**434**	**598**	**80,592**	**118,973**
විවිධ ආයෝජන: වත්කම්	-	-	-	-
විවිධ ආයෝජන: වගකීම්	**-2,383**	**-906**	**-441,922**	**-181,568**
හිමිකම්	-217	-236	-40,223	-46,914
ණය සුරැකුම්පත්	-2,166	-670	-401,700	-134,654
මූල්‍ය ව්‍යුත්පන්න	-	-	-	-
අනෙකුත් ආයෝජන: වත්කම්	**-136**	**387**	**-27,446**	**77,454**
මුදල් සහ තැන්පතු	64	306	11,666	62,761
වෙළඳ ණය සහ අත්තිකාරම්	-224	257	-41,647	51,199
අනෙකුත් ලැබිය යුතු ගිණුම්	24	-176	2,535	-36,506
අනෙකුත් ආයෝජන: වගකීම්	**231**	**2,216**	**38,567**	**605,734**
මුදල් සහ තැන්පතු	-15	4,016	-3,519	810,195
ණය	174	-1,552	29,568	-309,188
මහ බැංකුව	-14	-57	-2,689	-11,377
තැන්පතු භාරගන්නා ආයතන	75	-2,152	10,390	-429,506
රජය	169	664	31,961	132,662
අනෙකුත් අංශ	-56	-7	-10,093	-968
වෙළඳ ණය සහ අත්තිකාරම්	185	-428	32,565	-87,756
අනෙකුත් ගෙවිය යුතු ගිණුම්	-114	180	-20,046	34,713
විශේෂ ගැනුම් හිමිකම්	-	787	-	157,771
සංචිත වත්කම්	**-1,992**	**-2,526**	**-375,594**	**-499,826**
මූල්‍ය රත්‍රන්	-667	-212	-123,485	-42,734
විශේෂ ගැනුම් හිමිකම්	-5	123	-825	24,635
ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම	-	-	-	-
අනෙකුත් සංචිත වත්කම්	-1,319	-2,437	-251,284	-481,726
මුදල් සහ තැන්පතු	-177	1,536	-37,326	300,122
සුරැකුම්පත්	-1,143	-3,976	-214,172	-782,339
ශුද්ධ වැරදීම් හා අත්හැරීම්	**765**	**-711**	**155,478**	**-294,093**
සමස්ත ශේෂය (ඇ)	**-2,328**	**-3,967**	**-405,854**	**-745,312**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස				
වෙළඳ ගිණුම	-7.4	-9.6		
භාණ්ඩ හා සේවා	-6.4	-7.8		
ජංගම ගිණුම	-1.5	-4.0		
ජංගම හා ප්‍රාග්ධන ගිණුම	-1.4	-3.9		

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) සමස්ත ශේෂය ගණනය කිරීම සඳහා 5.12 සංඛ්‍යා සටහන පරිශීලනය කරන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5.1 රූප සටහන

විදේශීය අංශයේ ක්‍රියාකාරීත්වය









5.2 රූප සටහන
ගෙවුම් තුලනය



5.2 ජංගම ගිණුමේ ශේෂය

සේවා ගිණුම් ශේෂයේ වැඩිවීම සහ ප්‍රාථමික ආදායම් ගිණුම් හිඟය අඩුවීම හමුවේ වුව ද, වෙළඳ හිඟය පුළුල් වීම සහ ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ දී විදේශීය ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස පුළුල් විය. අපනයන ආදායමට සාපේක්ෂව ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන් 2020 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 6.0ක සාපේක්ෂ අඩු වෙළඳ හිඟය සමඟ සැසඳීමේ දී 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 8.1ක පමණ පුළුල් වෙළඳ හිඟයක් වාර්තා විය. තොරතුරු තාක්ෂණය මත පදනම් වූ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සම්බන්ධ සේවා සහ ප්‍රවාහන අංශය වර්ධනය වීම් හේතුවෙන් ඇති වූ ඉහළ ලැබීම්වල ප්‍රතිඵලයක් ලෙස සේවා ගිණුමේ අතිරික්තය වැඩි විය. වසරේ අවසාන කාලපරිච්ඡේදයේ දී සංචාරක අංශය ද යථා තත්ත්වයට පත්වීමේ ලකුණු පෙන්නුම් කරන ලදී. සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ප්‍රතිආයෝජිත ඉපැයීම්වල වැඩිවීමක් තිබියදීත්, විදේශීය ආයෝජකයන් සතු රාජ්‍ය සුරැකුම්පත් සඳහා වන කුපන ගෙවීම් සහ විදේශීය සෘජු ආයෝජන සමාගම්හි ලාභාංශ ගෙවීම් අඩුවීමත් සමඟ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය අඩු විය. 2020 වසර සමඟ සැසඳීමේ දී විශේෂයෙන් ම 2021 වසරේ අවසාන භාගයේ දී, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස අඩු වීමට එවකට පැවති නිල විනිමය අනුපාතිකයට සාපේක්ෂව අවිධිමත් වෙළඳපොළෙහි විනිමය අනුපාතිකයෙහි කැපී පෙනෙන වෙනසක් පැවතීම හේතු වූවා විය හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස, ජංගම ගිණුමේ හිඟය 2020 වසරේ දී වාර්තා වූ

5.2 සංඛ්‍යා සටහන
ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

ශීර්ෂය	2020 (අ)			2021 (ආ)		
	බැර	හර	ශුද්ධ	බැර	හර	ශුද්ධ
භාණ්ඩ හා සේවා	**13,083**	**18,271**	**-5,189**	**14,974**	**21,526**	**-6,552**
භාණ්ඩ	**10,047**	**16,055**	**-6,008**	**12,499**	**20,637**	**-8,139**
වෙළඳ භාණ්ඩ	10,047	16,047	-5,999	12,499	20,636	-8,138
මූල්‍ය නොවන රත්‍රන්	-	9	-9	-	1	-1
සේවා	**3,035**	**2,216**	**819**	**2,475**	**889**	**1,586**
ප්‍රවාහන	1,174	1,059	114	608	256	352
මුහුදු ප්‍රවාහන	702	635	67	450	150	300
නැව් කුලී	702	635	67	450	150	300
ගුවන් ප්‍රවාහන	472	424	48	158	106	52
මගී ගාස්තු	394	354	40	108	89	19
ගුවන් කුලී	78	71	7	50	17	33
සංචාරක (ඇ)	682	449	234	507	239	268
ඉදිකිරීම්	7	10	-3	10	11	-1
රක්ෂණ සහ විශ්‍රාම වැටුප්	39	82	-42	20	37	-17
මූල්‍ය සේවා	96	220	-125	95	102	-7
විදුලි සන්දේශ සහ පරිගණක සේවා	995	288	706	1,201	171	1,030
විදුලි සන්දේශ	24	32	-8	32	31	2
පරිගණක සේවා	971	257	714	1,168	140	1,028
වෙනත් ව්‍යාපාරික සේවා	16	37	-21	16	17	-1
රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන)	26	70	-44	19	57	-38
ප්‍රාථමික ආදායම්	**198**	**2,404**	**-2,205**	**116**	**2,134**	**-2,018**
සේවක වැටුප්	36	132	-96	30	74	-43
ආයෝජන ආදායම්	162	2,271	-2,110	86	2,060	-1,975
සෘජු ආයෝජන	17	636	-619	16	647	-631
ලාභාංශ	14	445	-431	12	357	-345
ප්‍රති ආයෝජිත ඉපැයුම්	3	191	-188	4	290	-286
විවිධ ආයෝජන	-	943	-943	-	818	-818
හිමිකම්	-	35	-35	-	26	-26
පොලී ආදායම්	-	908	-908	-	793	-793
කෙටි කාලීන	-	2	-2	-	...	...
දිගු කාලීන	-	905	-905	-	793	-793
අනෙකුත් ආයෝජන	56	693	-637	43	595	-552
සංචිත වත්කම්	89	-	89	27	-	27
ද්විතීයික ආදායම්	**7,117**	**910**	**6,207**	**5,498**	**270**	**5,228**
රජය	13	-	13	6	-	6
සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ	7,104	910	6,194	5,491	270	5,221
ජංගම ගිණුම	**20,398**	**21,585**	**-1,187**	**20,587**	**23,930**	**-3,343**
ප්‍රාග්ධන ගිණුම	**51**	**23**	**28**	**50**	**24**	**25**
ප්‍රාග්ධන සංක්‍රාම	51	23	28	50	24	25
රජය	24	-	24	11	-	11
සංස්ථා සහ කුටුම්බ	27	23	4	38	24	14
ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම	**20,449**	**21,608**	**-1,159**	**20,637**	**23,955**	**-3,318**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අනේවාසිකයන්ට සැපයූ මගී සේවාවන්, ප්‍රවාහන සේවාවන්හි ඇතුළත්ය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

එ.ජ. ඩොලර් බිලියන 1.2ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 3.3ක් දක්වා පුළුල් විය. ජංගම ගිණුමේ හිඟය පුළුල් වීම සහ සමස්ත නිමැවුමේ සිදු වූ සුළු වර්ධනය පිළිබිඹු කරමින්, ජංගම ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2020 වසරේ දී වාර්තා වූ සියයට 1.5 සමඟ සැසඳීමේ දී 2021 වසරේ දී සියයට 4.0ක් විය.

5.2.1 වෙළඳ ගිණුම

වෙළඳ ශේෂය

පසුගිය වසර දෙක තුළ පහළ ගිය වෙළඳ ගිණුමේ හිඟය 2021 වසරේ දී කැපී පෙනෙන ලෙස පුළුල් වූ අතර ස්ථාවර අපනයන වර්ධනය ඉක්මවා ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යෑම එයට හේතු විය. 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 6,008ක් වූ වෙළඳ ගිණුමේ හිඟය 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 8,139ක් දක්වා පුළුල් විය. වෙළඳ හිඟයෙහි ප්‍රසාරණයට ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතු වූ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් ඉන්ධන මිල ඇතුළුව භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම, ආර්ථික කටයුතු සාමාන්‍ය තත්ත්වයට පත් වීම හේතුවෙන් ආනයනික අයිතම සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම, එන්නත් වැනි බෙහෙත් සහ ඖෂධීය අයිතම සඳහා වූ ආනයන වියදම ඉහළ යෑම සහ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය මත පනවා තිබූ ඇතැම් සීමා ලිහිල් කිරීම යනාදිය දායක විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වෙළඳ හිඟය 2020 වසරේ වාර්තා වූ සියයට 7.4ට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 9.6ක් දක්වා පුළුල් විය.

අපනයන හා ආනයන ක්‍රියාකාරිත්වය, වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දිශාව

අපනයන ක්‍රියාකාරිත්වය

වසරක් සඳහා වූ ඉහළම අපනයන ආදායම් මට්ටම වාර්තා කරමින් වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 12,499ක් දක්වා ළඟා වූ අතර, එය 2019 වසරේ වාර්තා කරන ලද මෙයට පෙර ඉහළම අපනයන ආදායම වන එ.ජ. ඩොලර් මිලියන 11,940 ඉක්මවා ගියේය. ඒ අනුව, අපනයන ආදායම 2020 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 10,047ට සාපේක්ෂව සියයට 24.4කින් වර්ධනය විය. ශක්තිමත් අපනයන ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින්, 2021 වසරේ ජූනි මාසයේ සිට අඛණ්ඩව සෑම මසක ම අපනයන ආදායම එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවා ගියේය. තවද, 2021 නොවැම්බර් මාසයේ දී, මෙතෙක් වාර්තා කරන ලද ඉහළම මාසික අපනයන ආදායම වන එ.ජ. ඩොලර් මිලියන 1,211ක අගය වාර්තා කරන ලදී. 2021 වසරේ දී අපනයන ආදායම ඉහළ යෑම බොහෝ අපනයන කාණ්ඩයන්හි ආදායම් පුළුල් පදනමකින් ඉහළ යෑම හේතුවෙන් සිදු විය. ඉහළ අපනයන ආදායම් සඳහා, විශේෂයෙන් ම අපනයනාභිමුඛ කර්මාන්ත සහ වසංගතයේ බලපෑමට ලක් වූ කර්මාන්ත වෙත නව පසුවිපරම් ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම සහ දිරිගැන්වීම් ලබා දීම හරහා, රජය, මහ බැංකුව සහ අනෙකුත් අදාළ බළධාරීන්ගේ විශේෂ ප්‍රතිපත්තිමය අවධානය හිමිවීම, කඩිනම් එන්නත්කරණ වැඩසටහන හේතුවෙන් දේශීය නිෂ්පාදනය යථා තත්ත්වයට පත් වීම සහ ගෝලීය වෙළඳපොළ සාමාන්‍ය තත්ත්වයට පත් වීම සමඟ

5

5.3 රූප සටහන
අපනයන, ආනයන සහ වෙළඳ හිඟය
(එ.ජ. ඩොලර් බිලියන)



5.4 රූප සටහන
අපනයන සංයුතිය - 2021



5.3 සංඛ්‍යා සටහන

අපනයන සංයුතිය

කාණ්ඩය	2020		2021 (අ)		වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන	වාර්ෂික වෙනස්වීම %	වෙනස් වීමට වූ දායකත්වය %
	වටිනාකම එ.ජ. ඩොලර් මිලියන	දායකත්වය %	වටිනාකම එ.ජ. ඩොලර් මිලියන	දායකත්වය %			
කෘෂිකාර්මික අපනයන	**2,336.2**	**23.3**	**2,729.5**	**21.8**	**393.3**	**16.8**	**16.0**
තේ	1,240.9	12.4	1,324.4	10.6	83.4	6.7	3.4
කුළුබඩු	333.5	3.3	454.8	3.6	121.3	36.4	4.9
පොල්	345.2	3.4	425.2	3.4	80.1	23.2	3.3
මුහුදු ආහාර	189.8	1.9	274.1	2.2	84.3	44.4	3.4
සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත	134.7	1.3	148.8	1.2	14.1	10.5	0.6
රබර්	30.1	0.3	42.2	0.3	12.1	40.1	0.5
සකස් නොකළ දුම්කොළ	25.5	0.3	31.6	0.3	6.1	23.9	0.2
එළවළු	36.6	0.4	28.5	0.2	-8.0	-22.0	-0.3
කාර්මික අපනයන	**7,672.0**	**76.4**	**9,702.0**	**77.6**	**2,030.0**	**26.5**	**82.8**
රෙදිපිළි හා ඇඟලුම්	4,423.1	44.0	5,435.1	43.5	1,012.1	22.9	41.3
රබර් නිෂ්පාදිත	786.1	7.8	1,050.4	8.4	264.4	33.6	10.8
ආහාර, පාන වර්ග හා දුම්කොළ	464.0	4.6	586.9	4.7	122.8	26.5	5.0
ඛනිජතෙල් නිෂ්පාදිත	373.6	3.7	506.4	4.1	132.8	35.6	5.4
යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ	337.5	3.4	500.9	4.0	163.4	48.4	6.7
මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ	181.5	1.8	276.7	2.2	95.2	52.5	3.9
රසායනික නිෂ්පාදිත	172.7	1.7	223.2	1.8	50.5	29.2	2.1
මූල ලෝහ හා උපාංග	110.9	1.1	156.4	1.3	45.5	41.1	1.9
සත්ත්ව ආහාර	102.9	1.0	149.4	1.2	46.5	45.2	1.9
ප්‍රවාහන උපකරණ	71.4	0.7	148.2	1.2	76.8	107.5	3.1
අනෙකුත් කාර්මික අපනයන	648.4	6.5	668.5	5.3	20.1	3.1	0.8
ඛනිජ අපනයන	**25.1**	**0.2**	**44.5**	**0.4**	**19.4**	**77.3**	**0.8**
වර්ග නොකළ අපනයන	**14.1**	**0.1**	**22.6**	**0.2**	**8.5**	**60.1**	**0.3**
මුළු අපනයන (ආ) (ඇ)	**10,047.4**	**100.0**	**12,498.6**	**100.0**	**2,451.2**	**24.4**	**100.0**
වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය (ඇ)	**185.52**		**198.88**				

(අ) තාවකාලික
(ආ) ප්‍රතිඅපනයන ඇතුළත් නොවේ.
(ඇ) දත්ත වාර්තා කිරීමේදී සිදුවන කාල පමාවන් සහ වෙනත් සාධක සඳහා ගැළපීම් කර ඇත.
(ඇ) විනිමය අනුපාතිකයඃ එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්ඃ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5

ඉල්ලුම් සහ සැපයුම් වෙළඳපොළ දාමයන් ද්විත්වයම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම ප්‍රධාන වශයෙන් හේතු විය. අපනයන පරිමා සහ ඒකක මිල දර්ශකයන්හි වෙනස්වීම් මගින් පැහැදිලි වන පරිදි, අපනයන ආදායම ඉහළ යෑමට අපනයන පරිමාව වැඩි වීම සැලකිය යුතු ලෙස දායක විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අපනයන ආදායම 2020 වසරේ වාර්තා වූ සියයට 12.4ක සිට 2021 වසරේ දී සියයට 14.8ක් දක්වා ඉහළ ගියේය.

කාර්මික භාණ්ඩ අපනයන ආදායම සමස්ත අපනයනයන්ගෙන් සියයට 78කට පමණ දායක වෙමින් 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 9,702ක් දක්වා සියයට 26.5කින් ඉහළ ගියේය. කාර්මික අපනයන කාණ්ඩය පුළුල් පදනමකින් වර්ධනය වූ අතර, රෙදිපිළි සහ ඇඟලුම් අපනයන ආදායම 2021 වසරේ දී සියයට 22.9ක වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 5,435ක් දක්වා ළඟා වූ අතර, එය සමස්ත අපනයන ආදායම ඉහළ යෑමට සියයට 40 කට වඩා වැඩි දායකත්වයක් දැක්වීය. සියලුම ප්‍රධාන ඇඟලුම් අපනයන ගමනාන්තයන්ගෙන් ලැබූ ආදායම ඉහළ යෑම මෙම වැඩි වීමට හේතු විය. රබර් නිෂ්පාදිත අංශයට ඉහළ ක්‍රියාකාරිත්වයක් වාර්තා කිරීමට ප්‍රධාන වශයෙන් ඝන ටයර් සහ ගෘහාශ්‍රිත රබර් අත්වැසුම් ඇතුළු රබර් නිෂ්පාදිත අපනයන සහාය වූ අතර, රබර් නිෂ්පාදිත අපනයන, ඇඟලුම් සහ තේ අපනයනයෙන් පසු එ.ජ. ඩොලර් බිලියනය සීමාව ඉක්මවූ ශ්‍රී ලංකාවේ තුන්වැනි ප්‍රධානතම අපනයන අංශය බවට පත් විය. ප්‍රධාන වශයෙන් නැව් සහ ගුවන්යානා ඉන්ධන අපනයන හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගිය අතර සපයන ලද පරිමාව අඩු වුවද, නැව් සහ ගුවන් යානා ඉන්ධන අපනයන මිලෙහි සාමාන්‍යය ඉහළ යෑම එයට හේතු විය. ආහාර, පාන වර්ග සහ දුම්කොළ කාණ්ඩයේ ඉහළ යෑමට අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදිත, සත්ත්ව හෝ එළවළු මේද

සහ තෙල්, සහ මෘද්වංගී (ප්‍රධාන වශයෙන්, කකුළුවන් වැනි) සකස් කිරීම් ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලැබූ පුද්ගලික සනීපාරක්ෂක උපකරණ සඳහා වන ඉල්ලුම අඩු වීම පෙන්නුම් කරමින්, 2021 වසර තුළ දී රෙදිපිළි උපාංග (ප්‍රධාන වශයෙන්, මුහුණු ආවරණ) සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත යටතේ වර්ග කරන ලද ප්ලාස්ටික් ඇඳුම් උපාංග අපනයන ආදායම සැලකිය යුතු ලෙස පහළ ගියේය.

බොහෝ උප කාණ්ඩයන්හී කාර්යසාධනය ඉහළ යෑමත් සමඟ 2020 වසරට සාපේක්ෂව කෘෂිකාර්මික අපනයන 2021 වසරේ දී සියයට 16.8ක වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම ඉහළ යෑම සඳහා කුළුබඩු, තේ, මුහුදු ආහාර සහ පොල් නිෂ්පාදිත ආදායම ඉහළ යෑම මූලිකව දායක වූ අතර, එළවළු අපනයන ආදායම පහළ ගියේය. අපනයන මිලෙහි සාමාන්‍යය පහළ යෑම අභිබවා අපනයන පරිමාව සියයට 7.7කින් ඉහළ යෑම 2021 වසරේ දී තේ අපනයන ආදායම ඉහළ යෑම සඳහා හේතු විය. ස්වාභාවික රබර්, කුළුබඩු (ප්‍රධාන වශයෙන් කුරුඳු සහ සාදික්කා) සහ සකස් නොකළ දුම්කොළ අපනයන ඉහළ යෑම සඳහා අපනයන මිල ගණන් ඉහළ යෑම හේතු වූ අතර, මුහුදු ආහාර, ගම්මිරිස් සහ පොල් (පොල් මද ආශ්‍රිත/ ආශ්‍රිත නොවන නිෂ්පාදිත දෙවර්ගයම) ඉහළ ආදායම් වාර්තා කරනු ලැබූයේ අපනයන මිල සහ පරිමාවන් යන දෙඅංශයම ඉහළ යෑම හේතුවෙනි. සුළු කෘෂිකාර්මික නිෂ්පාදිතයන්ගේ ආදායම ඉහළ යෑමට පලතුරු, ධාන්‍ය වර්ග සහ වාෂ්පශීලී තෙල් වර්ග අපනයන පරිමාවන් ඉහළ යෑම හේතු විය. කෙසේ වුවද, මිල ඉහළ මට්ටමක පැවතියද, එළවළු අපනයන ක්‍රියාකාරිත්වය දුර්වල වීමට අඩු අපනයන පරිමාවන් හේතු විය.

සමස්ත අපනයනයෙන් සියයට 1කට වඩා අඩු දායකත්වයක් දැක්වූ ඛනිජ අපනයන ආදායම 2021 වසරේ දී පසුගිය වසරට සාපේක්ෂව සියයට 77.3කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා ලෝපස්, ලෝබොර සහ අළු උප කාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇති ටයිටේනියම් ලෝපස් මූලික වශයෙන් දායක වූ අතර, පස් හා පාෂාණ සහ අගනා ලෝහ අපනයන ආදායම වැඩි වීම සඳහා ස්වාභාවික මිනිරන් සහ ක්වාට්ස් ඉහළ යෑම හේතු විය.

ආනයන ක්‍රියාකාරිත්වය

ප්‍රධාන වශයෙන් පුද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයන ඇතුළුව ඇතැම් ආනයන මත සීමා පැනවීම් අඛණ්ඩව ක්‍රියාත්මක වීම මධ්‍යයේ වුවද,

5.5 රූප සටහන
ආනයන සංයුතිය - 2021



මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2020 වසරට සාපේක්ෂව 2021 වසරේ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 20,637ක් දක්වා සියයට 28.5කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. පුද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයන ඉතා පහළ මට්ටමක පැවතුණ ද, දේශීය ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීමත් සමඟ යෙදවුම් සඳහා ඇති ඉල්ලුම ඉහළ යෑම, ඉන්ධන මිල ඇතුළුව ගෝලීය භාණ්ඩ වෙළඳපොළ මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම, ඛනිජ තෙල් පිරිපහදුව වරින් වර වසා දැමීම හේතුවෙන් පිරිපහදු කළ ඛනිජ තෙල් මත යැපීම ඉහළ යෑම, එන්නත් වැනි බෙහෙත් සහ ඖෂධීය අයිතම මත ආනයන වියදම ඉහළ යෑම සහ ඇතැම් ආනයන සීමා ලිහිල් කිරීම ආනයන ඉහළ යෑම සඳහා මූලිකව හේතු විය. ප්‍රධාන ආනයන කාණ්ඩයන් සියල්ලම පාහේ ඉහළ යෑම මගින් නිරූපණය කරන පරිදි ආනයන ඉහළ යෑම පුළුල් පදනමක් ගන්නා ලදී. ආනයන පරිමා සහ ඒකක මිල දර්ශකයන්හී වෙනස්කම් හරහා නිරීක්ෂණය කළ අයුරින්, පරිමාවන් සහ මිල වෙනස්වීම්හී බලපෑම ප්‍රධාන ආනයන කාණ්ඩ මත විවිධාකාර වූ නමුත් සාමාන්‍යයෙන් ආනයන වියදම පරිමා සහ මිල දෙඅංශයේම ඉහළ යෑමේ බලපෑමට ලක් විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආනයන වියදම 2020 වසරේ වාර්තා වූ සියයට 19.8 හා සැසඳීමේ දී 2021 වසරේ සියයට 24.4ක් දක්වා ඉහළ ගියේය.

සමස්ත ආනයන වියදමින් අඩකට වඩා දායක වන අන්තර් භාණ්ඩ ආනයන වියදම 2021 වසරේ ආනයන ඉහළ යෑමට විශාල වශයෙන් හේතු විය. වසර තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 12,309ක් දක්වා සියයට 35.6කින් ඉහළ ගියේය. රටේ

ආනයන ලැයිස්තුවෙහි විශාලතම වියදම් අයිතමය ලෙස බොර තෙල්, පිරිපහදු කළ ඛනිජ තෙල් (එල්. පී. ගෑස් ඇතුළුව) සහ ගල් අඟුරු සඳහා වූ ඉන්ධන ආනයන වියදම 2020 වසරේ පැවති එ.ජ. ඩොලර් මිලියන 2,543 හා සැසඳීමේදී 2021 වසර තුළදී, එ.ජ. ඩොලර් මිලියන 3,743ක් දක්වා ඉහළ ගියේය. බොර තෙල් සහ ගල් අඟුරු ආනයන පරිමාවන් පහළ යෑමේ බලපෑම ඉක්මවා යමින් මෙම සියලුම උප කාණ්ඩයන්හි මිල ගණන්හි සාමාන්‍යය සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන පරිමාව ඉහළ යෑම ඉන්ධන ආනයන වියදම ඉහළ යෑම සඳහා හේතු විය. දෙවන විශාලතම ආනයන අයිතමය වන රෙදිපිළි සහ රෙදිපිළි උපාංග ආනයන වියදම පළමු වරට එ.ජ. ඩොලර් බිලියන 3 සීමාව පසු කර ගියේය. යුරෝපා සංගමයේ රටවල්, එක්සත් රාජධානිය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වැනි ප්‍රධාන අපනයන ගමනාන්තයන්ගෙන් ශ්‍රී ලංකාවේ ඇඟලුම් සඳහා වන ඉහළ ඉල්ලුම සපුරාලීම සඳහා භාවිත කරනු ලබන රෙදි සහ කෙඳි වර්ග සඳහා වන ආනයන වියදම ඉහළ යෑම මෙයට මූලිකව හේතු විය. රසායනික නිෂ්පාදිත ආනයන (ප්‍රධාන වශයෙන්, කාබන්) පළමුවරට එ.ජ. ඩොලර් බිලියනයේ සීමාව පසු කර ගිය අතර, මූල ලෝහ (ප්‍රධාන වශයෙන්, යකඩ සහ වානේ), ප්‍රාථමික ආකාරයේ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, සහ ස්වාභාවික හා කෘත්‍රිම රබර් ඇතුළු අනෙකුත් ආනයන කාණ්ඩ වසර තුළ ඉහළ වර්ධන අනුපාත වාර්තා කළේය. කෙසේ වුවද, 2021 වසරේ බොහෝ කාලයක් පුරාවට පැවති රසායනික පොහොර ආනයන තහනම හේතුවෙන් පොහොර (ප්‍රධාන වශයෙන්, යූරියා) සඳහා වන වියදම පහළ ගිය අතර, සකස් නොකළ දුම්කොළ සහ සිමෙන්ති ක්ලින්කර් ආදී වූ ඛනිජ නිෂ්පාදිත වියදම් 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී පහළ ගියේය.

5.4 සංඛ්‍යා සටහන

ආනයන සංයුතිය

කාණ්ඩය	2020		2021 (අ)		වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන	වාර්ෂික වෙනස්වීම %	වෙනස්වීමට වූ දායකත්වය %
	වටිනාකම එ.ජ. ඩොලර් මිලියන	දායකත්වය %	වටිනාකම එ.ජ. ඩොලර් මිලියන	දායකත්වය %			
පාරිභෝගික භාණ්ඩ	**3,401.7**	**21.2**	**3,848.7**	**18.6**	**447.0**	**13.1**	**9.8**
ආහාර හා පාන වර්ග	1,554.4	9.7	1,666.5	8.1	112.1	7.2	2.4
සහල්	10.5	0.1	73.0	0.4	62.5	595.3	1.4
සීනි හා රසකැවිලි	277.1	1.7	288.8	1.4	11.7	4.2	0.3
කිරි නිෂ්පාදිත	333.8	2.1	317.7	1.5	-16.1	-4.8	-0.4
පරිප්පු	96.9	0.6	143.0	0.7	46.1	47.5	1.0
වෙනත්	836.0	5.2	843.9	4.1	7.9	0.9	0.2
ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ	1,847.3	11.5	2,182.2	10.6	334.9	18.1	7.3
බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත	595.5	3.7	882.5	4.3	287.0	48.2	6.3
විදුලි සංදේශ මෙවලම්	268.4	1.7	382.9	1.9	114.5	42.6	2.5
ගෘහ උපකරණ	174.2	1.1	257.1	1.2	82.9	47.6	1.8
රෙදිපිළි හා උපාංග	200.7	1.2	221.3	1.1	20.7	10.3	0.5
වෙනත්	608.5	3.8	438.4	2.1	-170.0	-27.9	-3.7
අන්තර් භාණ්ඩ	**9,076.5**	**56.5**	**12,308.9**	**59.6**	**3,232.4**	**35.6**	**70.5**
ඉන්ධන	2,542.6	15.8	3,742.9	18.1	1,200.3	47.2	26.2
රෙදිපිළි හා රෙදිපිළි උපාංග	2,335.1	14.5	3,066.9	14.9	731.9	31.3	16.0
රසායනික නිෂ්පාදිත	831.5	5.2	1,074.4	5.2	242.9	29.2	5.3
මූල ලෝහ	460.3	2.9	866.4	4.2	406.1	88.2	8.9
ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	540.2	3.4	765.7	3.7	225.6	41.8	4.9
කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	383.1	2.4	468.9	2.3	85.8	22.4	1.9
තිරිඟු හා ඉරිඟු	384.4	2.4	418.3	2.0	33.8	8.8	0.7
අනෙකුත් අන්තර් භාණ්ඩ	1,599.4	10.0	1,905.4	9.2	306.0	19.1	6.7
ආයෝජන භාණ්ඩ	**3,563.2**	**22.2**	**4,462.7**	**21.6**	**899.5**	**25.2**	**19.6**
යන්ත්‍රසූත්‍ර හා උපකරණ	2,176.1	13.6	2,809.5	13.6	633.4	29.1	13.8
ගොඩනැගිලි ද්‍රව්‍ය	1,035.6	6.5	1,248.9	6.1	213.2	20.6	4.7
ප්‍රවාහන උපකරණ	348.3	2.2	398.5	1.9	50.2	14.4	1.1
අනෙකුත් ආයෝජන භාණ්ඩ	3.2	0.02	5.8	0.03	2.6	81.4	0.1
වර්ග නොකළ ආනයන	**14.0**	**0.1**	**17.1**	**0.1**	**3.1**	**22.2**	**0.1**
මුළු ආනයන (ආ) (ඇ)	**16,055.4**	**100.0**	**20,637.4**	**100.0**	**4,582.0**	**28.5**	**100.0**
වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය (ඈ)	**185.52**		**198.88**				

(අ) තාවකාලික
(ආ) ප්‍රතිආනයන ඇතුළත් නොවේ.
(ඇ) දත්ත වාර්තා කිරීමේදී සිදුවන කාල පමාවන් සහ වෙනත් සාධක සඳහා ගැළපීම් කර ඇත.
(ඈ) විනිමය අනුපාතිකය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5.5 සංඛ්‍යා සටහන

ප්‍රධාන ආනයනවල පරිමාවන්

මෙට්‍රික් ටොන් දහස්

ශීර්ෂය	2017	2018	2019	2020	2021 (අ)
පිරිපහදු කළ ඛනිජ තෙල් (ආ)	**4,895**	**4,959**	**4,740**	**4,028**	**4,553**
පළමු කාර්තුව	1,275	1,382	1,199	1,249	1,378
දෙවන කාර්තුව	1,123	1,207	1,206	678	1,008
තෙවන කාර්තුව	1,336	1,317	1,211	1,123	865
සිව්වන කාර්තුව	1,161	1,054	1,124	978	1,302
තිරිඟු	**1,250**	**1,297**	**1,159**	**1,404**	**1,307**
පළමු කාර්තුව	291	412	164	272	323
දෙවන කාර්තුව	334	329	318	285	288
තෙවන කාර්තුව	359	285	292	498	335
සිව්වන කාර්තුව	265	271	385	348	360
බොරතෙල් (ආ)	**1,591**	**1,674**	**1,842**	**1,667**	**1,182**
පළමු කාර්තුව	282	283	461	464	274
දෙවන කාර්තුව	376	459	460	265	368
තෙවන කාර්තුව	464	461	461	568	362
සිව්වන කාර්තුව	469	471	460	370	178
සීනි	**498**	**645**	**556**	**683**	**582**
පළමු කාර්තුව	108	205	140	193	293
දෙවන කාර්තුව	158	166	153	108	140
තෙවන කාර්තුව	101	119	100	209	14
සිව්වන කාර්තුව	132	154	164	172	136
පොහොර	**399**	**861**	**707**	**952**	**412**
පළමු කාර්තුව	78	256	148	88	114
දෙවන කාර්තුව	73	154	142	294	182
තෙවන කාර්තුව	129	225	238	126	17
සිව්වන කාර්තුව	119	226	179	444	98
සහල්	**748**	**249**	**24**	**16**	**147**
පළමු කාර්තුව	259	203	8	8	3
දෙවන කාර්තුව	79	37	3	2	4
තෙවන කාර්තුව	160	2	5	2	3
සිව්වන කාර්තුව	250	7	8	4	137

(අ) තාවකාලික
(ආ) ගළපන ලද

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සමස්ත ආනයන වියදමෙන් සියයට 22ක් පමණ වන ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 4,463ක් දක්වා සියයට 25.2කින් ඉහළ ගියේය. යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කොටස් හැර, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ යටතේ වර්ග කර ඇති සියලුම ආනයන අයිතම සඳහා වූ වියදම 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ඉහළ ගිය අතර, මෙම ඉහළ යෑම සඳහා කාර්යාල යන්ත්‍රසූත්‍ර (ප්‍රධාන වශයෙන්, පරිගණක), සන්නිවේදන උපාංග (ප්‍රධාන වශයෙන්, සම්ප්‍රේෂණ උපකරණ) සහ වෛද්‍ය සහ රසායනාගාර උපකරණ ප්‍රධාන වශයෙන් දායක විය. ඇතැම් ආනයන සීමා 2021 වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වුවද, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ (වාණිජ කටයුතු සඳහා භාවිතයට ගැනෙන රථවාහන ඇතුළුව) ආනයන ද ඉහළ ගියේය. සිමෙන්ති ආනයන වියදම අවම වීම මධ්‍යයේ වුවද, ගොඩනැගිලි ද්‍රව්‍ය කාණ්ඩයේ ඉහළ යෑම සඳහා යකඩ සහ වානේ ආනයන හේතු වූ අතර, ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඉහළ යෑම සඳහා කෘෂිකාර්මික ට්‍රැක්ටර්, ලොරි රථ සහ දුම්රිය උපකරණ ප්‍රධාන වශයෙන් හේතු විය.

ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2020 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,847ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 2,182ක් දක්වා සියයට 18.1කින් ඉහළ ගියේය. මෙම ඉහළ යෑම සඳහා විශාලතම දායකත්වය බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත දැක්වූ අතර, විශේෂයෙන් ම කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහන යටතේ ආනයනය කරන ලද එන්නත් මෙයට මූලික විය. ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනයේ කැපී පෙනෙන ඉහළ යෑම සඳහා දායක වූ අනිකුත් කාණ්ඩ අතර ජංගම දුරකථන, රබර් ටයර් සහ රූපවාහිනී යන්ත්‍ර විය. කෙසේ වුවද, 2020 වසරේ මාර්තු මාසයේ සිට රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද සීමා පැනවීම් අඛණ්ඩව ක්‍රියාත්මක වීම සමඟ, 2019 සහ 2020 වසරවලට සාපේක්ෂව 2021 වසරේ දී පුද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයනය කිරීම ඉතා පහළ මට්ටමක පැවතුණි.

ආහාර සහ පාන වර්ග ආනයන වියදම 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 7.2කින් ඉහළ ගියේය. ආහාර සහ පාන වර්ග කාණ්ඩය යටතේ ආනයන වියදමෙහි විශාලතම ඉහළ යෑම සඳහා තෙල් සහ මේද වර්ග කාණ්ඩය යටතේ වර්ග කර ඇති පොල්තෙල් ආනයනය හේතු වූ අතර, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ධාන්‍ය සහ ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත කාණ්ඩයේ, විශේෂයෙන් වසර අවසානය වන විට, සැලකිය යුතු වැඩි වීමක් (2021 වසරේ අවසාන මාස දෙක තුළ එ.ජ. ඩොලර් මිලියන 63ක් පමණ) වාර්තා කිරීම සඳහා සහල් ආනයන හේතු විය. 2021 වසරේ ඉහළ ආනයන වියදම් වාර්තා කළ අනිකුත් ප්‍රධාන ආහාර ද්‍රව්‍ය වූයේ පරිප්පු, සීනි සහ නැවුම් පලතුරුය. කෙසේ වුවද, 2021 වසර තුළ දී, මුහුදු ආහාර, පාන වර්ග සහ කිරි ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම පහළ ගිය අතර පිළිවෙළින්, ටින්කළ මාලු හා හාල්මැස්සන්, මධ්‍යසාර පාන වර්ග සහ කිරිපිටි ආනයන වියදම් අඩු වීම එයට හේතු විය. ආහාර සහ පාන වර්ග ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ යෑම සඳහා මිල ගණන් ඉහළ යෑම විශාල වශයෙන් දායක විය.

5

5.6 සංඛ්‍යා සටහන

වෙළඳ දර්ශක (අ)

2010 = 100

කාණ්ඩය	වටිනාකම් දර්ශකය			පරිමා දර්ශකය			ඒකක වටිනාකම් දර්ශකය		
	2020	2021 (ආ)	වාර්ෂික වෙනස්වීම%	2020	2021 (ආ)	වාර්ෂික වෙනස්වීම%	2020	2021 (ආ)	වාර්ෂික වෙනස්වීම%
අපනයන									
කෘෂිකාර්මික අපනයන	**101.3**	**118.4**	**16.8**	**90.5**	**101.1**	**11.7**	**112.0**	**117.1**	**4.6**
තේ	86.2	92.0	6.7	80.7	87.2	8.0	106.8	105.5	-1.2
රබර්	17.4	24.3	40.1	29.4	29.3	-0.5	59.1	83.2	40.8
පොල්	208.4	256.7	23.2	168.0	188.1	11.9	124.0	136.5	10.1
කුළුබඩු	161.0	219.5	36.4	114.5	146.9	28.3	140.6	149.4	6.3
සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත	188.6	208.3	10.5	173.1	188.4	8.8	108.9	110.6	1.5
කාර්මික අපනයන	**125.9**	**159.3**	**26.5**	**153.5**	**183.2**	**19.3**	**82.1**	**86.9**	**6.0**
රෙදිපිළි හා ඇඟලුම්	131.9	162.1	22.9	111.5	140.6	26.1	118.3	115.3	-2.5
ඛනිජ තෙල් නිෂ්පාදිත	141.9	192.4	35.6	238.5	282.8	18.6	59.5	68.0	14.3
රබර් නිෂ්පාදිත	141.2	188.7	33.6	100.0	112.6	12.7	141.3	167.6	18.6
ඛනිජ අපනයන	**103.6**	**183.7**	**77.3**	**68.6**	**111.4**	**62.6**	**151.2**	**164.8**	**9.1**
මුළු අපනයන	**116.5**	**145.0**	**24.4**	**132.9**	**156.9**	**18.0**	**87.7**	**92.4**	**5.4**
ආනයන									
පාරිභෝගික භාණ්ඩ	**137.5**	**155.5**	**13.1**	**128.0**	**127.8**	**-0.2**	**107.4**	**121.7**	**13.3**
ආහාර හා පාන වර්ග	117.5	126.0	7.2	127.4	125.5	-1.5	92.2	100.4	8.8
ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ	160.4	189.5	18.1	128.7	130.4	1.3	124.7	145.3	16.6
අන්තර් භාණ්ඩ	**112.8**	**152.9**	**35.6**	**140.2**	**152.0**	**8.5**	**80.5**	**100.6**	**25.0**
ඉන්ධන	83.6	123.1	47.2	133.1	134.2	0.8	62.8	91.7	46.1
පොහොර	107.8	65.9	-38.9	160.2	74.5	-53.5	67.3	88.4	31.4
රසායනික නිෂ්පාදිත	159.9	206.6	29.2	157.9	177.3	12.2	101.3	116.6	15.1
තිරිඟු සහ ඉරිඟු	144.8	157.6	8.8	138.9	134.2	-3.3	104.3	117.4	12.6
රෙදිපිළි හා රෙදිපිළි උපාංග	129.1	169.5	31.3	126.8	153.9	21.4	101.8	110.2	8.2
ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත	127.7	181.0	41.8	148.9	169.5	13.8	85.8	106.8	24.6
දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග	31.0	38.0	22.5	36.5	41.9	14.7	85.1	90.9	6.8
ආයෝජන භාණ්ඩ	**129.3**	**162.0**	**25.2**	**183.4**	**230.6**	**25.7**	**70.5**	**70.3**	**-0.4**
ගොඩනැගිලි ද්‍රව්‍ය	126.0	152.0	20.6	147.7	154.5	4.7	85.4	98.3	15.2
ප්‍රවාහන උපකරණ	58.8	67.3	14.4	50.4	46.7	-7.5	116.6	144.1	23.6
යන්ත්‍රසූත්‍ර හා උපකරණ	162.7	210.1	29.1	264.5	359.0	35.7	61.5	58.5	-4.9
වෙනත් ආයෝජන උපකරණ	96.2	174.5	81.4	112.9	142.6	26.4	85.2	122.3	43.5
මුළු ආනයන	**119.7**	**153.9**	**28.5**	**145.5**	**162.2**	**11.5**	**82.3**	**94.9**	**15.2**
වෙළඳ මිල අනුපාතය							**106.5**	**97.4**	**-8.6**

(අ) එ.ජ. ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලික

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

වෙළඳ මිල අනුපාතය

අපනයන භාණ්ඩවල මිල ගණන් සහ ආනයන භාණ්ඩවල මිල ගණන් අතර අනුපාතය නිරූපණය කරනු ලබන වෙළඳ මිල අනුපාතය ශ්‍රී ලංකාව සඳහා 2021 වසරේ දී පහළ ගියේය. අපනයන මිල දර්ශකය දර්ශකාංක 92.4ක් දක්වා සියයට 5.4කින් ඉහළ ගිය අතර, ආනයන මිල දර්ශකය දර්ශකාංක 94.9ක් දක්වා සියයට 15.2ක ඉහළ අනුපාතයකින් ඉහළ ගියේය. අපනයන මිල ඉහළ යෑම සඳහා සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩයන්හී මිල දර්ශක ඉහළ යෑම දායක වූ අතර, අන්තර් භාණ්ඩ සහ පාරිභෝගික භාණ්ඩ ආනයනයේදී වූ ඉහළ මිල ගණන් සමස්ත ආනයන මිල දර්ශකය ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2021 වසරේ දී, වෙළඳ මිල අනුපාතය දර්ශකාංක 97.4ක් දක්වා සියයට 8.6කින් පහළ ගිය අතර, ආනයන මිල දර්ශකය අපනයන මිල දර්ශකයට වඩා වැඩි වේගයකින් ඉහළ යාමෙන් අපනයන ඒකකයකින් මිලදී ගත හැකි ආනයන ප්‍රමාණය අඩු වූ බව නිරූපණය විය.

2021 වසර තුළ දී අපනයන ආදායම සහ ආනයන වියදම යන දෙඅංශයෙහිම ඉහළ යෑම සඳහා වෙළඳ පරිමාවන් පුළුල් වීම සැලකිය යුතු ලෙස දායක විය. ප්‍රධාන අපනයන කාණ්ඩ ත්‍රිත්වය සඳහා වන අපනයන පරිමා දර්ශක වර්ධනය වූ අතර, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ සඳහා වූ ආනයන පරිමා දර්ශක

5.6 රූප සටහන
වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

වසර තුළ ඉහළ ගියේය. කෙසේ වුවද, පාරිභෝගික භාණ්ඩ සඳහා ආනයන පරිමා දර්ශක 2021 වසරේ සුළු වශයෙන් පහළ ගියේය.

වෙළඳ දිශාව

පසුගිය වසරට සාපේක්ෂව 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් නොවෙනස්ව පැවතුණි. වටිනාකම අනුව සැලකූ විට, 2021 වසරේ ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වෙළඳ හවුල්කරුවා ලෙස ඉන්දියාව තම ස්ථානය නැවත වරක් අත් කරගත් අතර, ඉන් අනතුරුව චීනය සහ ඇමෙරිකා එක්සත් ජනපදය පිළිවෙළින් ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් විය. එම රටවල් තුන සාමූහිකව ශ්‍රී ලංකාවේ සමස්ත වෙළඳාමෙන් (අපනයන සහ ආනයන ද්විත්වය ම) සියයට 42කට පමණ දායක විය. ඉන්දියාව සහ චීනය සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එක් එක් රට සඳහා එ.ජ. ඩොලර් බිලියන 5 ඉක්මවා ගිය අතර, ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 3.5 ඉක්මවා ගියේය. එක්සත් අරාබි එමීර් රාජ්‍යය, එක්සත් රාජධානිය සහ ජර්මනිය අනිකුත් ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් වූ අතර, එක් එක් රට සඳහා 2021 වසරේ වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවීය. 2021 වසරේ රටවල් අනුව වෙළඳ ශේෂ සලකා බැලීමේ දී, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජර්මනිය, නෙදර්ලන්තය, ඉතාලිය සහ බෙල්ජියම වැනි බටහිර රටවල් සමඟ සැලකිය යුතු වෙළඳ අතිරික්තයන් වාර්තා වූ අතර, චීනය, ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, මැලේසියාව සහ සිංගප්පූරුව ආදී වූ ආසියාතික රටවල් සමඟ සැලකිය යුතු වෙළඳ හිඟයයන් වාර්තා විය.

2021 වසරේ දී ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා රටවල් තවදුරටත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්ත විය. ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ අපනයන සඳහා තවදුරටත් තනි විශාලතම ගැනුම්කරුවා වූයේ සමස්ත අපනයන අතරින් සියයට 24.9ක්, එනම් එ.ජ. ඩොලර් බිලියන 3ක් ඉක්ම වූ අපනයන මිලදී ගනිමින් වන අතර, ඉන් පසුව, එක්සත් රාජධානිය (සියයට 7.5ක්), ඉන්දියාව (සියයට 6.6ක්), ජර්මනිය (සියයට 6.1ක්) සහ ඉතාලිය (සියයට 4.6ක්) ප්‍රධාන අපනයන ගමනාන්ත විය. 2021 වසරේ දී සමස්ත අපනයන ඉහළ යෑමට සමගාමීව බොහෝ අපනයන ගමනාන්තයන්හි ආදායම, ප්‍රධාන අපනයන ගමනාන්ත දහය ද ඇතුළුව, ඉහළ ගියේය. ඇඟලුම්, රබර් නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ, සහ ආහාර, පාන වර්ග සහ දුම්කොළ ඇමෙරිකා එක්සත් ජනපදය වෙත අපනයන කරන ලද ප්‍රධාන භාණ්ඩ අතර විය. ඇමෙරිකා එක්සත් ජනපදය තවදුරටත් ශ්‍රී ලංකාවේ විශාලතම තනි ඇඟලුම් අපනයන ගමනාන්තය ලෙස 2021 වසරේ සමස්ත ඇඟලුම් අපනයන වටිනාකමෙන් සියයට 42කට දායක විය. එක්සත් රාජධානිය වෙත සිදු කළ අපනයන අතර ඇඟලුම්, රබර් නිෂ්පාදිත, රෙදිපිළි උපාංග, ආහාර, පාන වර්ග සහ දුම්කොළ, යන්ත්‍රසූත්‍ර සහ යන්ත්‍රික උපකරණ සහ මුහුදු ආහාර ප්‍රධාන විය. කුළුබඩු, සත්ත්ව ආහාර, රෙදිපිළි, ආහාර, පාන වර්ග සහ දුම්කොළ, දැව සහ කඩදාසි නිෂ්පාදිත සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත ඉන්දියාව වෙත සිදු කළ අපනයන අතරට ඇතුළත් විය. කලාපයක් ලෙස යුරෝපා සංගමයට අයත් රටවල් වෙත 2021 වසරේ සිදු කළ අපනයන සමස්ත අපනයනවලින් සියයට

5.7 රූප සටහන
රටවල් අනුව වෙළඳ ශේෂයන් (එ.ජ. ඩොලර් මිලියන)



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

5

5.8 රූප සටහන
අපනයන වෙළඳ දිශාව



මූලය: ශ්‍රී ලංකා රේගුව

5.9 රූප සටහන
ආනයන වෙළඳ දිශාව



*එක්සත් රාජධානිය අයත් නොවේ

මූලය: ශ්‍රී ලංකා රේගුව

5

24ක් පමණ වූ අතර සමස්ත ඇඟලුම් අපනයනයෙන් සියයට 30ක් පමණ ඊට ඇතුළත් විය. රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග සහ දුම්කොළ, තේ, මුහුදු ආහාර, යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ සහ පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත යුරෝපා සංගමයේ රටවල් වෙත සිදු කළ අනෙකුත් ප්‍රධාන අපනයන අතර වේ. 2021 වසරේ මැද පෙරදිග රටවල් සහ රුසියාව ඇතුළුව ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් ශ්‍රී ලංකාවේ තේ සඳහා ප්‍රධාන ගමනාන්ත වූ අතර, සමස්ත තේ අපනයනයෙන් සියයට 58කට පමණ සාමූහිකව දායක විය.

ආසියානු කලාපයේ රටවල් 2021 වසරේ ශ්‍රී ලංකාව විසින් තවදුරටත් භාණ්ඩ ආනයනය කරන ලද ප්‍රධාන රටවල් විය. 2021 වසරේ එ.ජ. ඩොලර් බිලියන 4.7කට වඩා වැඩි ආනයන ප්‍රමාණයකට හා සමස්ත ආනයන අතුරින් සියයට 23කට පමණ දායක වෙමින් චීනය අඛණ්ඩව තෙවැනි වතාවටත් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභවය විය. චීනයෙන් සිදු කළ ආනයන සඳහා වූ වියදම සියයට 33කින් ඉහළ යනු ලැබුයේ ප්‍රධාන වශයෙන් යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත ආනයන ඉහළ යෑම හේතුවෙනි. ඉන් අනතුරුව, ඉන්දියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය 2021 වසර සඳහා දෙවන සහ තෙවන ආනයන ප්‍රභව වූයේ, පිළිවෙළින්, සියයට 22.4ක සහ සියයට 6.8ක ප්‍රතිශතයක් සඳහා දායක වෙමිනි. ඛනිජ තෙල් නිෂ්පාදිත, රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, මූල ලෝහ සහ තිරිඟු හේතුවෙන් ඉන්දියාවෙන් සිදුකළ ආනයන සඳහා වූ වියදම සියයට 50කින් ඉහළ ගියේය. ඛනිජ තෙල් නිෂ්පාදිත, මූල ලෝහ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් සිදු කළ ප්‍රධාන ආනයන වූ අතර, එය එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙන් සිදු කළ මුළු ආනයන අතරින් සියයට 86ක් පමණ සඳහා දායක විය. ආනයන ප්‍රභවයක් ලෙස 2021 වසරේ දී මැලේසියාව සඳහා සිව්වන ස්ථානය හිමිවූයේ ඛනිජ තෙල් නිෂ්පාදිත, ආහාර සැකසුම්, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ, රසායනික නිෂ්පාදිත සහ තෙල් සහ මේද වර්ග ආදී වූ ප්‍රධාන ආනයන අයිතම ඉහළ යෑම හේතුවෙනි. ඛනිජ තෙල් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත සහ යන්ත්‍රසූත්‍ර සහ උපකරණ 2021 වසරේ සිංගප්පූරුවෙන් ආනයනය කළ ප්‍රධාන භාණ්ඩ වේ. ආනයන ප්‍රභවයක් ලෙස 2020 වසරේ දී හයවන ස්ථානයේ වූ ජපානය එයට සාපේක්ෂව

2021 වසරේ දී දසවන ස්ථානය කරා පහත වැටුණේ ප්‍රධාන වශයෙන්ම වසර තුළ රථවාහන ආනයනය මත පනවා තිබුණු සීමා හේතුවෙනි.

විදේශ වෙළඳ ප්‍රතිපත්ති, ප්‍රවණතා සහ ආයතනික සහාය

වසංගතයේ විනාශකාරී බලපෑම් මධ්‍යයේ 2021 වසරේ වෙළඳ අංශය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ප්‍රතිපත්තිමය සහාය සහ අංශයේ සියලුම කොටස්කරුවන්ගේ ප්‍රයත්නයන් ඉවහල් විය. අපනයන අංශය පූර්ව වසංගත මට්ටම් අභිබවා යමින් යථා තත්ත්වයට පත්වීම සඳහා රජය සහ මහ බැංකුව විසින් ලබා දුන් ප්‍රතිපත්ති උත්තේජන සහ ප්‍රකෘතිමත් වෙමින් පවතින ගෝලීය ආර්ථික තත්ත්වයන් ඒකාබද්ධව සහාය විය. වේගවත් අපනයන ප්‍රවර්ධනයක් ක්‍රියාත්මක කරමින් සහ අවම බදු අනුපාත පවත්වා ගනිමින් ඇතැම් කෘෂිකාර්මික සහ කාර්මික නිෂ්පාදන සඳහා ආනයන ආදේශක දියුණු කිරීම තුළින් දේශීය නිෂ්පාදකයාට සහාය දැක්වීම සඳහා වූ රජයේ උත්සාහයන් වසර පුරා

5.7 සංඛ්‍යා සටහන

ශ්‍රී ලංකාව වරණීය වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන

වරණීය වෙළඳ ගිවිසුම	2020 වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන)	2021 (අ) වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන)	2021 (අ) වර්ධනය (%)	2021 (අ) දායකත්වය (%)	ප්‍රධාන අපනයන නිෂ්පාදන (අපනයන ප්‍රමාණ අනුව අනුපිළිවෙලින්)
වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී.)	3,671.8	4,312.7	17.5	80.8	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, තේ, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ
එයින් යුරෝපා සංගමය (ජී.එස්.පී. ප්ලස් සහිතව) (ආ)	1,907.0	2,402.1	26.0	45.0	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, තේ, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ
එක්සත් රාජධානිය	690.9	680.7	-1.5	12.8	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර, ප්‍රවාහන උපකරණ
ඇමෙරිකා එක්සත් ජනපදය (ඇ)	585.7	677.8	15.7	12.7	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, රසායනික නිෂ්පාදිත, කුළුබඩු
රුසියානු සමූහාණ්ඩුව (ඈ)	142.2	132.9	-6.5	2.5	තේ, රබර් නිෂ්පාදිත, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, ඇඟලුම්, රසායනික නිෂ්පාදිත
ඕස්ට්‍රේලියාව	79.2	103.5	30.7	1.9	ඇඟලුම්, රබර් නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, තේ, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත
කැනඩාව	61.0	87.9	44.0	1.6	රබර් නිෂ්පාදිත, ඇඟලුම්, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර
ජපානය	71.0	87.6	23.4	1.6	තේ, රසායනික නිෂ්පාදිත, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, ආහාර, පාන වර්ග හා දුම්කොළ, මුහුදු ආහාර
තුර්කිය	80.3	74.1	-7.7	1.4	තේ, රබර් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, ඇඟලුම්, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත
වෙනත් ජී.එස්.පී. ක්‍රම	54.6	66.1	21.1	1.2	
ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) 2000 වසරේ සිට ක්‍රියාත්මකයි	358.4	525.8	46.7	9.9	සත්ත්ව ආහාර, ආහාර, පාන වර්ග හා දුම්කොළ, කුළුබඩු, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, දැව හා කඩදාසි නිෂ්පාදිත
ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) (ඉ) 1975 වසරේ සිට ක්‍රියාත්මකයි	204.7	238.6	16.6	4.5	ඇඟලුම්, තේ, පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත
ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) 1989 වසරේ සිට ක්‍රියාත්මකයි	89.5	91.8	2.5	1.7	කුළුබඩු, මූල ලෝහ හා උපාංග, පොල් මද ආශ්‍රිත / මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, සත්ත්ව ආහාර, රබර් නිෂ්පාදිත
පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) 2005 වසරේ සිට ක්‍රියාත්මකයි	53.0	62.3	17.6	1.2	සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, පොල් මද ආශ්‍රිත / මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, ස්වාභාවික රබර්, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ
දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) 2006 වසරේ සිට ක්‍රියාත්මකයි	42.2	101.6	140.6	1.9	කුළුබඩු, පොල් මද ආශ්‍රිත / මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත, මූල ලෝහ හා උපාංග, රෙදිපිළි, තේ
සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) 1995 වසරේ සිට ක්‍රියාත්මකයි	0.8	1.4	83.6	0.03	රබර් නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත, තේ, ආහාර, පාන වර්ග හා දුම්කොළ, රෙදිපිළි
වරණීය වෙළඳ ගිවිසුම් යටතේ මුළු අපනයන	**4,420.4**	**5,334.3**	**20.7**	**100.0**	
ශ්‍රී ලංකාවේ මුළු වෙළඳ භාණ්ඩ අපනයනවලින් ප්‍රතිශතයක් ලෙස	**44.0**	**42.7**			

(අ) තාවකාලික
(ආ) යුරෝපා සංගමය මගින් ලබාදෙන ජී.එස්.පී. සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන භාණ්ඩවලින් තීරු බදු අයිතම සියයට 66 කට වරණීය ප්‍රවේශය ලබා දෙන අතර යුරෝපා සංගමය මගින් ලබා දෙන ජී.එස්.පී. ප්ලස් සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන එම තීරු බදු අයිතම සඳහාම තීරු බදු රහිත ප්‍රවේශයක් ලබා දේ. එක්සත් රාජධානිය ඇතුළත් නොවේ.
(ඇ) එක්සත් ජනපදය මගින් ලබා දුන් ජී.එස්.පී. සහනය 2020 වසරේ දෙසැම්බර් 31 වන දින අවසන් වූ බැවින් ජී.එස්.පී. සහනය ලැබීමට සුදුසු අපනයන පෙන්නුම් කරන අතර එය 2021 වසර සඳහාද බලාපැවැත්වෙන පරිදි නැවත බලාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.
(ඈ) රුසියාව, බෙලාරුස් හා කසකස්ථානය ඇතුළත් වේ.
(ඉ) පෙරදී මෙය බැංකොක් ගිවිසුම (1975) ලෙස හඳුන්වන ලදී.

මූලයන්: වාණිජ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව

අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2021 වසර ආරම්භයේ දී, ආර්ථික පුනර්ජීවනය සහ දිළිඳුකම පිටුදැකීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් අදාළ පාර්ශ්වකරුවන් සමඟ ඒකාබද්ධ ප්‍රයත්නයක් තුළින් ඔවුන්ගේ කටයුතු විධිමත් සහ ඉලක්කගත ආකාරයකින් පෙළ ගැස්වීම හරහා අපනයන ආදායම සහ අනෙකුත් ණය නොවන විදේශ විනිමය ගලා ඒම් දිරිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. ඒ අනුව, භාණ්ඩ වෙළඳාම (රෙදිපිළි සහ ඇඟලුම්, මැණික් සහ ස්වර්ණාභරණ, රබර් නිෂ්පාදිත, තේ, පොල් නිෂ්පාදිත, ධීවර, කුළුබඩු සහ සුළු කෘෂිකාර්මික අපනයන බෝග), සංචාරක ඉපැයීම්, සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ විදේශ ආයෝජන යනාදී සෑම ප්‍රධාන අංශයක් සඳහා ම මහ බැංකුව විසින් සම්බන්ධීකරණය කරනු ලබන අනු කමිටු කිහිපයක් ආරම්භ කරන ලදී. මෙම අනු කමිටු විසින් එක් එක් අංශවල ප්‍රගතියට බාධා කරනු ලබන ක්ෂණික ගැටලු සහ බාධක මඟහරවා ගැනීම සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වෙමින්, ලබා දෙන ලද ඉලක්ක සපුරාලීම සඳහා ප්‍රයත්න දරන ලදී. එමෙන්ම, වෙළඳාම පිළිබඳ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ශක්තිමත් කිරීම සඳහා වෙළඳ අමාත්‍යාංශය ජාතික වෙළඳ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළේය. මේ අතර, ලෝක වෙළඳ සංවිධානය ලෝක භාණ්ඩ වෙළඳාම් පරිමාව 2021 වසරේ දී සියයට 9.8කින් (2020 වසරේ සියයට 5.0ක පහළ යෑමක සිට) සහ 2022 වසරේ දී සියයට 3.0ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කරමින් යථා තත්ත්වයට පත් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, යෝග්‍ය ප්‍රතිපත්ති සහ සහාය තුළින් අන්තර්ජාතික වෙළඳපොළෙහි ශ්‍රී ලංකාවේ අපනයන කොටස ආරක්ෂා කිරීම සඳහා බලධාරීන් අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

2021 වසරේ දී ආනයන සීමා කිරීම් කිහිපයක් ලිහිල් කරන ලදී. විදේශීය අංශය මත ඇති වූ පීඩනය හේතුවෙන් 2020 වසරේ මුල් භාගයේ දී රජය විසින් ක්‍රියාත්මක කරන ලද ආනයන සීමා කිරීම් 2021 වසරේ දී ක්‍රමයෙන් ඉවත් කරන ලදී. මේ සම්බන්ධයෙන් 2020 සහ 2021 වසර තුළ දී ආනයන පාලනය පිළිබඳ විධාන ඇතුළත් අතිවිශේෂ ගැසට්පත්‍ර මාලාවක් අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද තිරුබදු නිර්ණය කිරීමේ කමිටුවේ මගපෙන්වීම යටතේ ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේතුව විසින් නිකුත් කරන ලදී. දේශීය කර්මාන්තවලට සහ පාරිභෝගිකයන්ට අවම බලපෑමක් ඇති වන පරිදි විදේශ විනිමය ආරක්ෂා කර ගැනීම සඳහා මූලික වශයෙන් තෝරාගත් අත්‍යවශ්‍ය නොවන සහ හදිසි නොවන ආනයනික භාණ්ඩ සඳහා තාවකාලික පදනමක් මත මෙම සීමාවන් පනවා තිබුණි. කෙසේ වෙතත්, 2021 ජූනි මාසයේ සිට මෙම ආනයන සීමා කිරීම් සැලකිය යුතු ලෙස අඩු කරන ලද නමුත්, 2021 වසරේ සැප්තැම්බර් මාසයේ කෙටි කාලයක් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ණයවර ලිපි හා ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබාදීමේ කොන්දේසි යටතේ, සිදු කළ තෝරාගත් අත්‍යවශ්‍ය නොවන සහ හදිසි නොවන භාණ්ඩ ආනයනය කිරීම් සඳහා සියයට සියයක ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාවක් මහ බැංකුව විසින් පනවන ලදී. මීට අමතරව, කාබනික කෘෂිකර්මාන්තය වෙත මාරු වීම සඳහා වූ රජයේ ප්‍රතිපත්තිය හා සමගාමීව 2021 වසරේ මැයි මාසයේ කාබනික නොවන පොහොර ආනයනය සීමා කරන ලදී. කෙසේ වුවද, 2021 වසරේ නොවැම්බර් මාසය වන විට මෙම ක්‍රියාමාර්ග ද ලිහිල් කරන ලදී. විදේශීය අංශය මත වූ අඛණ්ඩ පීඩනය සැලකිල්ලට ගනිමින්, රජය විසින් 2022 වසරේ මාර්තු මාසයේ දී තෝරාගත් හදිසි නොවන සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා ආනයන බදු වැඩි කරනු ලැබූ අතර, ආනයන බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාව වැනි සීමා කිහිපයක් පනවන ලදී.

වසංගතයේ බලපෑමට ලක් වූ විදේශීය අංශය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහාය වීමේ අරමුණින්, 2021 වසරේ දී විදේශීය අංශයට සපයන ලද ආයතනික සහාය වැඩිදියුණු කිරීම සඳහා විවිධ පියවර ගනු ලැබීය. අපනයන සංවර්ධන මණ්ඩලය 2018-2022 ජාතික අපනයන ක්‍රමෝපාය අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතරතුර, ප්‍රවර්ධන වැඩසටහන් නැවත ආරම්භ කළේය. ජාතික අපනයන ක්‍රමෝපායේ කාර්ය සැලැස්ම, වෙළඳපොළ සංවර්ධනය, නිෂ්පාදන සහ සැපයුම් දාම සංවර්ධනය සහ ධාරිතා ගොඩනැගීම යන ක්ෂේත්‍රවල අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. අපනයන සංවර්ධන මණ්ඩලය අන්තර්ජාලය පදනම් කරගත් ප්‍රවර්ධන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර, වෙළඳ ප්‍රදර්ශන, ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට වන ප්‍රවර්ධන වැඩසටහන්, සන්නාම ප්‍රවර්ධන වැඩසටහන් ආදී වූ 2020 වසර තුළ දී බොහෝවිට මංගත මාර්ග හරහා සිදු කරන ලද වැඩසටහන් සඳහා භෞතිකව සහභාගී වීම ද නැවත ආරම්භ කළේය. ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ගැටලු නිරාකරණයේ දී රාජ්‍ය සහ පෞද්ගලික අංශවල පාර්ශ්වකරුවන් අතර සම්බන්ධතා ගොඩනගමින් වාණිජ මණ්ඩල ද අපනයන ප්‍රවර්ධනය සඳහා දායක විය. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ජාතික ප්‍රමිතීන් සම්පාදනය සහ යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් ක්‍රියාත්මක කළ අතර, එය දේශීය නිෂ්පාදකයන්ට විදේශීය නිෂ්පාදන හා තරග වැදීමට

5

සහාය විය. ඒ අනුව, ජාත්‍යන්තර ප්‍රමිතීන් හා අනුකූල විය හැකි පරිදි ජාතික ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම උදෙසා, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් ප්‍රකාශ කර ඇති ප්‍රමිතීන් 327 අතුරින් 128ක් 2021 වසර අවසාන වන විට සංශෝධනය කරන ලදී. අභියෝගකාරී වෙළඳපොළ වාතාවරණය මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව විසින් රුපියල් බිලියන 48.7ක් වටිනා ව්‍යාපාර රක්ෂණය කිරීම් වාර්තා කරන ලද අතර, එය පසුගිය වසරට වඩා රුපියල් බිලියන 11.6ක ඉහළ යෑමකි. මෙහෙයුම් සහ කළමනාකරණ ක්‍රියාවලීන් විශ්ලේෂණය කරනු ලබන සහ අවශ්‍ය ප්‍රතිසංස්කරණ පිළිබඳ නිර්දේශ සපයන අනු කමිටු දහයක් යටතේ ශ්‍රී ලංකා රේගුව නවීකරණය කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක විය. මේ අතර, ශ්‍රී ලංකා රේගුව සහ ඒ ආශ්‍රිත කටයුතු විශ්ලේෂණයට සහ අදාළ කටයුතු වාර්තා කිරීමට 2021 පෙබරවාරි මාසයේ දී ජනාධිපති විමර්ශන කොමිසමක් පත් කරන ලද අතර, රේගුවේ කාර්යයන් වැඩි දියුණු කිරීම සහ ආදායම් කාන්දු වීම වැළැක්වීම මෙහි අරමුණ වේ. ලෝක වෙළඳ සංවිධානයෙහි වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුම ක්‍රියාත්මක කිරීමට අදාළව ශ්‍රී ලංකා රේගුව සිය ක්‍රියාකාරකම් තවදුරටත් විධිමත් කළේය.

සමස්ත අපනයන ආදායම ඉහළ යෑම හා සමගාමීව 2021 වසරේ වෙළඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනය විය. සමාලෝචනයට ලක්වන කාලය තුළ, වරණීය වෙළඳාම් පිළිබඳ පොදු ක්‍රම (ජී.එස්.පී.) යටතේ වෙළඳාම් සිදු කළ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් වන යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ සිදු කළ වෙළඳාම් තුළින් වෙළඳපොළ පිවිසුම් අවස්ථා පුළුල් විය. 2020 වසරේ ජූලි මාසයේ දී පහළ මැදි ආදායම් ලබන රටක් ලෙස නැවත වර්ගීකරණය වීමත් සමඟ යුරෝපා සංගමයේ වත්මන් විශේෂ ප්‍රතිලාභයන් සහිත වරණීය වෙළඳාම් පිළිබඳ පොදු ක්‍රමයේ (ජී.එස්.පී. ප්ලස්) වලංගු කාලසීමාව වන 2023 වසර ඉක්මවන තෙක් ශ්‍රී ලංකාව එහි ප්‍රතිලාභ අත්විඳිනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඇමෙරිකා එක්සත් ජනපදය වෙතින් ලබා දුන් ජී.එස්.පී. යෝජනා ක්‍රමය 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වුවද, ඇමෙරිකා එක්සත් ජනපද රජයේ සාමාන්‍ය පිළිවෙත අනුව, නැවත වරක් එම පහසුකම් අතීතයට බලපාන පරිදි ප්‍රතිස්ථාපනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 ජනවාරි මස 01 වන දින සිට යුරෝපා සංගමයේ තීරු බදු ක්‍රමයෙන් පරිබාහිරව එක්සත් රාජධානියේ නව ගෝලීය තීරු බදු යෝජනා ක්‍රමයක් බලාත්මක වූ අතර, යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් ප්‍රතිලාභියෙකු ලෙස ශ්‍රී ලංකාව විසින් පෙර සේම එක්සත් රාජධානිය වෙත තීරු බදු රහිත ප්‍රවේශය තවදුරටත් අත්විඳින ලදී. කෙසේ වුවද, 2022 වසරේ සිට එක්සත් රාජධානිය නව ජී.එස්.පී. යෝජනා ක්‍රමයක් ස්ථාපනය කිරීමට අපේක්ෂා කරන අතර, ශ්‍රී ලංකාවේ වාණිජ දෙපාර්තමේන්තුව විසින් එක්සත් රාජධානියේ අදාළ බළධාරීන්ට අවශ්‍ය යෙදවුම් ලබා දී ඇත. 2021 වසරේ මාර්තු මස 31 වන දිනෙන් වලංගු කාල සීමාව අවසන් වූ ජපානය විසින් ලබා දෙන ලද ජී.එස්.පී. යෝජනා ක්‍රමය 2031 වසර දක්වා නැවත වසර දහයක කාල සීමාවක් සඳහා දීර්ඝ කරන ලදී. මීට අමතරව, අපනයන සඳහා දායකත්වය සාපේක්ෂව අඩු මට්ටමක පැවැතිය ද, රුසියානු සමූහාණ්ඩුව, තුර්කිය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, ස්විට්සර්ලන්තය, නෝර්වේ සහ නවසීලන්තය ආදී වූ වෙනත් රටවල් ලබා දුන් ජී.එස්.පී. යෝජනා ක්‍රම මගින් ද ශ්‍රී ලංකාවට අඛණ්ඩව ප්‍රතිලාභ හිමි විය. ද්වීපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලැබූ අතර, 2021 වසරේ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අපනයන ඉහළ යෑමට දායක විය. ඉන්දියාව සහ පාකිස්ථානය සමඟ ඒ ඒ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන, 2021 වසරේ දී මෙම රටවල් වෙත සිදු කරන ලද සමස්ත අපනයනයෙන් සියයට 65ක් පමණ ඉහළ අගයක පැවතිණි. මේ අතර, ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සහ පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සිදු කළ ආනයන ඉන්දියාවෙන් සහ පාකිස්ථානයෙන් සිදු කළ මුළු ආනයනවල ප්‍රතිශතයක් ලෙස, පිළිවෙළින්, සියයට 5කට (එ.ජ. ඩොලර් මිලියන 209ක්) සහ සියයට 3කට (එ.ජ. ඩොලර් මිලියන 12ක්) අඩුවෙන් වාර්තා විය. කලාපීය වෙළඳ ගිවිසුම් යටතේ, ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) (චීනය, දකුණු කොරියාව සහ බංගලාදේශයට සිදු කළ අපනයන ඉහළ යෑම හේතුවෙන්) සහ ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) (මෙක්සිකෝවට කුරුඳු අපනයන ඉහළ යෑම හේතුවෙන්) යටතේ 2021 වසරේ සිදු කරන ලද අපනයන ඉහළ ගියේය. මොංගෝලියාව ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමෙහි හත්වන සාමාජිකයා ලෙස 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී එක් වූ අතර, ශ්‍රී ලංකාව ඇතුළු අනිකුත් සහභාගීත්ව රාජ්‍යයන් විසින් 2021 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි මොංගෝලියාව සමඟ අන්‍යෝන්‍ය වශයෙන් තීරු බදු සහන ලැයිස්තු හුවමාරු කර ගන්නා ලදී. 2021 වසරේ දී සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) යටතේ සිදු කළ අපනයන තවදුරටත් පහළ මට්ටමක පැවතුණ අතර. දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) යටතේ සිදු කළ අපනයන ඉහළ ගියේය. ලෝක වෙළඳ සංවිධානය සමඟ ශ්‍රී ලංකාවේ බහු පාර්ශ්වීය සම්බන්ධතා 2021

5

වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. චීනය, ජපානය, ඉන්දුනීසියාව සහ බංගලාදේශය වැනි අනාගත විභවයන් සහිත වෙළඳ හවුල්කරුවන් සමඟ සාකච්ඡා කිරීමට සහ වරණීය වෙළඳ ගිවිසුම් සඳහා එළඹීමට කටයුතු සිදු කරනු ලබන අතර, සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි සමාලෝචන ක්‍රියාවලිය 2021 වසරේ අඛණ්ඩව ක්‍රියාත්මක විණි. මේ අතර, අපනයන වෙළඳපොළ පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරීම සඳහා කලාපීය විස්තීරණ ආර්ථික හවුල්කාරිත්වය (RCEP) වැනි අනෙකුත් කලාපීය වෙළඳ ගිවිසුම් සඳහා සම්බන්ධ වීමේ හැකියාව ද ශ්‍රී ලංකාවට සොයා බැලිය හැක.

5.2.2 සේවා ගිණුම

සේවා ගිණුමේ අතිරික්තය පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ නමුත්, වසංගතයට පෙර සහ පාස්කු ඉරු දින ප්‍රහාරයන්ට පෙර පැවැති මට්ටම්වලට වඩා අඩු මට්ටමක පැවතුණි. පරිගණක සේවා ඉපැයීම්වල යහපත් වර්ධනය, සංචාරක ඉපැයීම්වල ක්‍රමානුකූල වර්ධනය සහ මුහුදු හා ගුවන් භාණ්ඩ ප්‍රවාහන සේවාවල වර්ධනයන් මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, සේවා ගිණුමේ අතිරික්තය 2020 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 0.8ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 1.6ක් විය.

විදේශ ගමන් සහ සංචාරක සේවා

කොවිඩ්-19 වසංගතයෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ සංචාරක කර්මාන්තය 2021 වසර අග භාගයේ දී ස්ථාවර ප්‍රගතියක් අත්පත් කර ගත් අතර, අදාළ බළධාරීන් ගනු ලැබූ ඵලදායී ක්‍රියාමාර්ග සහ ශ්‍රී ලංකාව ආරක්ෂිත සංචාරක ගමනාන්තයක් ලෙස ගෝලීය ප්‍රජාව අතර ප්‍රචලිත වීම මෙයට ඉවහල් විය. 2021 ජනවාරි මාසයේ දී විදේශ සංචාරකයින් සඳහා රට නැවත විවෘත කිරීමෙන් පසුව, කලින් කලට පනවන ලද සමාජ සහ ආර්ථික කටයුතු සීමා කිරීම් නොතකා සංචාරකයින්ගේ ස්ථාවර වැඩිවීමක් දක්නට ලැබිණි. මේ හේතුවෙන් සංචාරක ක්ෂේත්‍රයට ඵලදායී බව තහවුරු වූ සෞඛ්‍ය ආරක්ෂණ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමට සහ වැඩි දියුණු කිරීමට හැකි විය. වසංගතයේ තුන්වන රැල්ල හිස එසවීම හේතුවෙන්, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී පැනවූ තාවකාලික සීමා කිරීම්වලින් පසුව 2021 වසරේ ජූනි මාසයේ දී නැවත රට විවෘත කරන ලද අතර, පූර්ණ එන්නත්කරණයට ලක්වූ සංචාරකයින් සඳහා නිරෝධායනයෙන් තොරව රටට ඇතුළු වීම සඳහා අවස්ථාව ලබා දුනි. මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස සහ සාර්ථක දේශීය එන්නත්කරණ වැඩපිළිවෙළ හා සමගාමීව, 2021 සැප්තැම්බර් මස සිට විදේශීය සංචාරකයන්ගේ පැමිණීම ක්‍රමානුකූලව ඉහළ යෑම ආරම්භ වූ අතර, 2021 දෙසැම්බර් මස 89,506ක් වූ 2021 වසර සඳහා එක් මසක් තුළ ඉහළම සංචාරක පැමිණීම වාර්තා විය. සංචාරක ක්ෂේත්‍රයේ යථා තත්ත්වයට ළඟා වීම සඳහා සහයවීමක් ලෙස සියලුම සංචාරක ව්‍යාපාර සහ සංචාරක සේවා සපයන්නන් වෙත සෞඛ්‍ය ආරක්ෂණ රෙගුලාසි නිශ්චිතව දක්වා ඇති ආචාර ධර්ම පද්ධතිය සංශෝධනය කිරීම, සහ සෞඛ්‍ය ආරක්ෂණ මාර්ගෝපදේශ යාවත්කාලීන කිරීම ආදී වූ ක්‍රියාමාර්ග කිහිපයක් බලධාරීන් විසින් ක්‍රියාවට නංවන ලදී. සංචාරක ක්ෂේත්‍රය 2019 වසරේ සිට මුහුණ දෙන ලද පසුබෑම යථා තත්ත්වයට පත් වන තුරු මූල්‍ය අංශය වෙත පියවීමට ඇති ණය සඳහා ලබා දුන්

5.8 සංඛ්‍යා සටහන

සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය

ශීර්ෂය	2017	2018	2019	2020	2021 (අ)	වාර්ෂික වෙනස්වීම (%) 2021
සංචාරක පැමිණීම් (සංඛ්‍යාව)	2,116,407	2,333,796	1,913,702	507,704	194,495	-61.7
පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින් ගණන						
විනෝදාස්වාදය	1,744,149	1,979,819	1,592,212	444,328	157,766	-64.5
ව්‍යාපාර	70,683	71,255	70,068	13,946	3,956	-71.6
වෙනත්	301,575	282,722	251,422	49,430	32,773	-33.7
සංචාරකයින් ගත කළ රාත්‍රී ගණන (දහස්)	23,068	25,205	19,902	4,315	2,937	-31.9
කාමර උපයෝජන අනුපාතය (%)	73.3	72.8	57.1	15.0	18.6	24.3
දළ සංචාරක ලැබීම් (රු.මිලියන)	598,143	711,961	646,362	124,189	101,903	-17.9
ඒක පුද්ගල සංචාරක ලැබීම් (රු.)	282,622	305,066	337,755	244,609	523,936	114.2
මුළු සේවා නියුක්තිය (සංඛ්‍යාව) (ආ)	359,215	388,487	402,607	347,751	357,927	2.9
ඍජු සේවා නියුක්තිය	156,369	169,003	173,592	175,990	177,476	0.8
වක්‍ර සේවා නියුක්තිය	202,846	219,484	229,015	171,761	180,451	5.1

(අ) තාවකාලික
(ආ) ඇස්තමේන්තු

මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

විශේෂ සටහන 5

ශ්‍රී ලංකාව පශ්චාත් වසංගත යථා තත්ත්වයට පත්වීමේ කාල සීමාව තුළ සංචාරක කර්මාන්තයේ භූමිකාව

හැඳින්වීම

එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය (UNWTO) විසින් සංචාරක කර්මාන්තය "පෞද්ගලික හෝ ව්‍යාපාරික /වෘත්තීමය අරමුණු සඳහා මිනිසුන් තම සුපුරුදු වටපිටාවෙන් පිටත රටවල් හෝ ස්ථානවලට සංක්‍රමණය වන සමාජ, සංස්කෘතික සහ ආර්ථික සංසිද්ධියක්" ලෙස නිර්වචනය කර ඇත. ජාත්‍යන්තර සංචාරක කර්මාන්තය (මින් ඉදිරියට "සංචාරක කර්මාන්තය" ලෙස හැඳින්වේ) යනු ප්‍රධාන වශයෙන්, සේවා අපනයනය කිරීමක් වේ. සංචාරක ඉපැයීම් සහ වියදම්, ගෙවුම් තුලනයෙහි භාණ්ඩ සහ සේවා ගිණුමෙහි "සේවා" යටතේ "සංචාර" ලෙස වාර්තා කරනු ලැබේ (ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගෙවුම් තුලනය සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්ව කාර්ය සංග්‍රහය බීපීඑම් 6). යෙදවුම් සඳහා විදේශ විනිමය පිටතට ගලා යෑම ඉතා අවම වන නිසා සංචාරක කර්මාන්තය රටක ශුද්ධ විදේශ විනිමය ඉපැයීමේ ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස පවතී. විදේශ විනිමය ඉපැයීමට අමතරව, සංචාරක කර්මාන්තය ආර්ථික වර්ධනයට, සේවා නියුක්තියට සහ කලාපීය ආදායම් විෂමතා අවම කිරීමට ද දායක වේ. ශ්‍රී ලංකාවේ පවතින සාමකාමී, සුපිරිසිදු, ආරක්ෂිත සහ විදේශිකයන්ට හිතකර පරිසරය සමඟින් රටේ උපායමාර්ගික පිහිටීම, ආකර්ෂණීය ස්වභාවික දායාදයන්, සංස්කෘතික විවිධත්වය, සහ දියුණු ඉතිහාසය මෙම කර්මාන්තයේ උන්නතිය සඳහා පදනම සපයයි. එබැවින්, විශේෂයෙන් ම, වසංගතයෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ කාලපරිච්ඡේදය තුළ මෙරට විදේශීය අංශයේ අසමතුලිතතා මඟහරවා ගැනීම සඳහා සංචාරක කර්මාන්තයේ සංවර්ධනය මූලික ආර්ථික ප්‍රමුඛතාවක් වනු ඇත.

වර්තමානයේ ආර්ථිකය සඳහා සංචාරක ඉපැයීම්වල වැදගත්කම

සංචාරක කර්මාන්තය, 2014 සහ 2019 වසර අතර විදේශ විනිමය ඉපැයීම්වලින් තෙවන විශාලතම මූලාශ්‍රය වූ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ මුළු විදේශ විනිමය ඉපැයීම්වලින් සියයට 14කට පමණ දායක විය. විදේශ මුදල් ඉපැයීමේ විශාලතම මූලාශ්‍රය වන භාණ්ඩ අපනයන ඉපැයීම් 2010 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 8,626ක සිට 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 12,499ක් දක්වා වර්ධනය වුව ද, එවැනි අපනයන නිෂ්පාදනය කිරීම සඳහා යෙදවුම් ආනයනය කිරීමට සැලකිය යුතු ආනයන වියදමක් වැය වී ඇත. කෙසේ වෙතත්, සංචාරක කර්මාන්තය, තනි කර්මාන්තයක් වශයෙන් යෙදවුම් ආනයනය මත සාපේක්ෂව අඩු රඳා පැවතීමක් සමඟ සැලකිය යුතු විදේශ විනිමය ඉපැයීමක් උත්පාදනය කිරීමට සමත් වී ඇත. උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ උච්චතම වසර වන 2018 වසරේ දී, සංචාරක ඉපැයීම්, එ.ජ. ඩොලර් මිලියන 4,381ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය ඇඟලුම් අපනයන ඉපැයීම්වලින් රෙදිපිළි ආනයන වියදම් අඩු කළ විට ලැබෙන ශුද්ධ ඇඟලුම් අපනයන ඉපැයීම් (එ.ජ. ඩොලර් මිලියන 2,459ක්) සහ තේ (එ.ජ. ඩොලර් මිලියන 1,428ක්) හා රබර් නිෂ්පාදිත (එ.ජ. ඩොලර් මිලියන 875ක්) වැනි අනෙකුත් ප්‍රධාන කර්මාන්තවල අපනයන ඉපැයීම් අභිබවා ගොස් ඇත. මේ අතර, විදේශ විනිමය ඉපැයීම්වලින් දෙවන විශාලතම මූලාශ්‍රය වන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2014 වසර සහ 2019 වසර අතර එ.ජ. ඩොලර් මිලියන 7,023ක වාර්ෂික සාමාන්‍යයක් උත්පාදනය කළත්, 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,491ක් දක්වා පහළ ගොස් ඇත. එබැවින්, සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකාවට විදේශ විනිමය ඉපැයීමේ වැදගත් මූලාශ්‍රයක් වන අතර, විදේශීය අංශයේ පීඩනයන්ට ඔරොත්තු දීමේ හැකියාව පවත්වා ගැනීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

සංචාරක කර්මාන්තයේ විභවතාව

ගෝලීය සංචාරක කර්මාන්තය මෑත දශක කිහිපය තුළ කාලානුරූපීව ගෝලීය මූල්‍ය අර්බුදය සහ වසංගත රෝග පැතිරීම වැනි බලපෑම් වලට ලක්වුවත්, ස්ථාවර වර්ධනයක් වාර්තා කළේය. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයට අනුව, 2019 වසර වන විට සංචාරක පැමිණීම් මිලියන 1,468ක් දක්වා ළඟා විය. ශ්‍රී ලංකාව ද සිවිල් යුද්ධය අවසන් වූ 2010 වසරේ සිට වඩා සැලකිය යුතු වැඩි වීමක් සමඟ 2018 වසර දක්වා සංචාරක පැමිණීම්වල අඛණ්ඩ වර්ධනයක් වාර්තා කරන ලදී. තවද, 2018 වසරේ දී, කීර්තිමත් සංචාරක තොරතුරු මූලාශ්‍රයක් වන "ලෝන්ලි ප්ලැනට් (Lonely Planet)" විසින් 2019 වසර සඳහා හොඳම ගමනාන්තය ලෙස ශ්‍රී ලංකාව නම් කරන ලදී. කෙසේ වෙතත්, 2019 වසරේ දී ගෝලීය සංචාරක පැමිණීම් වාර්තාගත ඉහළම අගයට ළඟා වුවත්, අවාසනාවන්ත ලෙස, 2019 වසරේ අප්‍රේල් මාසයේ පාස්කු ඉරු දින සිදු වූ ත්‍රස්ත ප්‍රහාරය හේතුවෙන් සංචාරක පැමිණීම් පසුබෑමකට ලක් විය. මෙම බලපෑම සිදු වුව ද, 2019 වසර අවසානය සහ 2020 වසර මුල් කාලපරිච්ඡේදය වන විට සංචාරක පැමිණීම් යථා තත්ත්වයට පත් විය. එනමුත්, සංචාරක පැමිණීම් සහ ඉපැයීම් කොවිඩ්-19 වසංගතය හේතුවෙන් නැවත පහළ යන ලදී. මේ අතර, ඉදිරි වසරවල දී, ගෝලීය සංචාරක කර්මාන්තයේ යථා තත්ත්වයට පත් වීම මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2022 වසරේ ජනවාරි මාසයේ දී, එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය විසින් කරන ලද සමීක්ෂණයකට අනුව, එහි සංචාරක විශේෂඥ මණ්ඩලය අතරින් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සියයට 63ක්ම 2024 වසර වන තෙක් තම රටවල ජාත්‍යන්තර සංචාරක පැමිණීම් 2019 වසරේ පැවති මට්ටමට යළි පත් නොවනු ඇතැයි අපේක්ෂා කළ අතර, ප්‍රතිචාර දැක්වූවන්ගෙන් සියයට 79ක් ආසියා පැසිෆික් කලාපවල සංචාරක පැමිණීම් 2024 වසර වන තෙක් 2019

5

වසරේ පැවති මට්ටමට යථා තත්ත්වයට පත් නොවනු ඇති බව විශ්වාස කර ඇත. කෙසේ වෙතත්, එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය, ලෝක ගමනාගමන සහ සංචාරක කවුන්සිලය (WTTC) සහ වෙළඳපොළ විශ්ලේෂකයින් පෙන්වා දී ඇත්තේ වසංගතය හේතුවෙන් සංචාරක ලක්ෂණ මූලික වශයෙන් වෙනස් වී ඇති බවත්, පුද්ගල ඉතිරිකිරීම් සැලකිය යුතු ප්‍රමාණයක් වියදම් කිරීමට සූදානම් කර ඇති බව සහ සංචාරය කිරීමට දැඩි කුතුහලයකින් විශාල පිරිසක් සිටින බවයි. එබැවින්, සුදුසු උපාය මාර්ග කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන්නේ නම්, 2022 සහ 2023 වසරවල දී පවා සැලකිය යුතු සංචාරකයින් සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට සහ/හෝ සංචාරක කර්මාන්තයෙන් සැලකිය යුතු විදේශ විනිමය ඉපැයීම් උපයා ගැනීමට ශ්‍රී ලංකාවට හැකියාවක් පවතී.

"නව සාමාන්‍ය" යුගයේ දී වසංගත තත්ත්වයේ සහ සංචාරක කර්මාන්තයේ ප්‍රතිචාරය

සංචාරක කර්මාන්තයට සහයෝගය දැක්වීමේ වැදගත්කම හඳුනා ගනිමින් රජය සහ මහ බැංකුව විසින් කොවිඩ්-19 වසංගත තත්ත්වය තුළ ණය සහන දීමනා, සහනදායී ණය යෝජනා ක්‍රම, ගාස්තු නිදහස් කිරීම්, විදුලි බිල්පත් සහන, ප්‍රදාන සහ බදු සහන පියවර වැනි සහන ක්‍රියාමාර්ග රාශියක් ලබා දෙන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සංචාරක කර්මාන්තය හරහා මෙරටට විදේශ ව්‍යවහාර මුදල් ලැබීම් තහවුරු කිරීම සඳහා මඟ පාදමින්, 2022 වසරේ ජනවාරි මස අනේවාසිකයන්ගෙන් විදේශ ව්‍යවහාර මුදලින් පමණක් ගෙවීම් ලබා ගත යුතු බව හෝටල් සේවා සපයන්නන්හට දැනුම් දෙමින් විධාන නිකුත් කරන ලදී. දේශීය සහ විදේශීය ව්‍යවහාර මුදලින් සංචාරක කර්මාන්තය විශාල ආයෝජන කර ඇති බැවින්, ප්‍රධාන ප්‍රාග්ධන ආයෝජනවලින් තොරව විදේශ ව්‍යවහාර මුදලින් සිය ඉපැයීම් ශක්තිමත් කර ගැනීමට මෙමඟින් අවස්ථාව සැලසේ. මේ අතර, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් සමස්තයක් ලෙස සංචාරක කර්මාන්තය සැලකිය යුතු පසුබෑමකට ලක් වූ විට, නිරෝධායන මධ්‍යස්ථාන ලෙස හෝටල් කුලියට දීමෙන් ඇතැම් කුඩා පරිමාණයේ හෝටල් තම ව්‍යාපාර පවත්වාගෙන ගියහ.

ලෝක ගමනාගමන සහ සංචාරක කවුන්සිලය විසින් "නව සාමාන්‍ය" හෝ ගෝලීය සංචාරක කර්මාන්තයේ වත්මන් ප්‍රවණතාවයන්හී අනුගත විය යුතු නව ලක්ෂණ කිහිපයක් ඉස්මතු කර ඇත (සංචාරක ප්‍රවණතා 2021 සහ ඉන් ඉදිරියේ දී සංචාරක සහ සංචාරක කර්මාන්තයේ නැගී එන පාරිභෝගිකයන්ගේ ප්‍රවණතා, නොවැම්බර් 2021). උදාහරණයක් ලෙස, රටවල් විසින් පනවන ලද සීමාවන්හී හදිසි වෙනස්වීම් සහ කොවිඩ්-19 වැළඳීමේ අවදානම හේතුවෙන් සංචාරකයන් නවාතැන් සහ ප්‍රවාහන පහසුකම් කල්තියා වෙන්කරවා ගැනීමට පසුබට වෙයි. තවද, අමතර මුදලක් ගෙවීමකින් තොරව හදිසි අවලංගු කිරීම් වලට ඉඩ ප්‍රස්ථා සලසන විකල්ප සඳහා සංචාරකයන් කැමැත්තක් දක්වයි. දෙවනුව, වසංගත තත්ත්වය හේතුවෙන් දුරස්ථ ස්ථානයක සිට රාජකාරී කිරීම සාමාන්‍යකරණය වීම හේතුවෙන්, "ඩිජිටල් නොමැඩ්වරු" (තැනින් තැනට යමින් ඩිජිටල් තාක්ෂණය හරහා වැඩ කිරීම) සහ සංචාරක ස්ථානවල දිගුකල් ගත කිරීම ("staycation") වැනි සංකල්ප ජනප්‍රිය වී ඇති අතර, සංචාරකයන් දිගු කාලීන වීසා, නවාතැන් ගන්නා ස්ථානයන්හී දිගු කාලයක් රැඳී සිටින විට ලබා දෙන වට්ටම්, වේගවත් අන්තර්ජාල පහසුකම් සහ අනෙකුත් රාජකාරී කටයුතු හා සම්බන්ධ පහසුකම් අපේක්ෂා කරයි. 2021 වසර තුළ දී සංචාරකයන් රැඳී සිටීමේ කාලය සහ සංචාරයක දී සිදු කරන වියදම් ඉහළ ගොස් ඇති වග ජාත්‍යන්තර සංචාරක සංවිධාන තවදුරටත් නිරීක්ෂණය කරයි. තෙවනුව, සෞඛ්‍ය ගැටලු හේතුවෙන් වැඩිහිටි පුද්ගලයන් හෝ කුඩා දරුවන් සිටින පවුල්වලට සාපේක්ෂව තරුණ සංචාරකයන් (වයස අවුරුදු 20 සිට 40 දක්වා වන්නන්) සංචාරය කිරීම සඳහා වැඩි වශයෙන් යොමු වීමත් සමඟ සංචාරකයන්ගේ ආකෘතිය වෙනස් වී ඇත. එබැවින්, එවැනි සංචාරකයන්ගේ අවශ්‍යතා සහ මනාප සපුරාලීම සඳහා සංචාරක කර්මාන්තයට සහ සමස්තයක් වශයෙන් රටට හැකි විය යුතු වේ. මෙම වයස් කාණ්ඩය ත්‍රාසජනක ක්‍රියා සඳහා කැමැත්තක් දක්වන අතර, පුද්ගලවාදය අගය කරයි. ඔවුන් තම සංචාර සැලසුම් කිරීම සහ වෙන්කරවා ගැනීම් සඳහා ජංගම දුරකථන සහ ඩිජිටල් සේවා භාවිත කරන අතර, සමාජ මාධ්‍ය, බ්ලොග් සහ අනෙකුත් සංචාරකයන් අන්තර්ජාලයේ පළ කරන ලද සමාලෝචන මත තම තීරණ පදනම් කරගනී. සිව්වනුව, මානසික සෞඛ්‍යය සහ පුද්ගලික සුවතාවයේ අගය මෑත කාලීනව කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති අතර, සංචාරය කිරීම තුළින් මෙම අවශ්‍යතා සපුරාලීම සඳහා ඇති පාරිභෝගික උනන්දුව ද ඉහළ ගොස් ඇත. පරාර්ථකාමී කටයුතු හා සම්බන්ධ වීමට සංචාරකයන්ට අවස්ථාව හිමිවන පරාර්ථකාමී කටයුතු උදෙසා සංචාරය කිරීම ("philantourism") පිළිබඳව ද උනන්දු වන අතර, ලොව පුරා ඇති පාරිසරික මධ්‍යස්ථාන පිළිබඳව දැනුම ලබා ගත හැකි පාරිසරික සංචාරයන් ("ecotourism") සඳහා ද උනන්දුව වැඩි වී ඇත. පස්වනුව, ප්‍රධාන සංචාරක ස්ථාන සහ ග්‍රාමීය සංචාරක ස්ථාන අසළ පිහිටා ඇති එතරම් ප්‍රසිද්ධියක් නොඋසුලන ස්ථාන ගවේෂණය කරමින් ද්විතීයික සංචාරවල ("secondary destination") යෙදීමේ ප්‍රවණතාවය ද ඉහළ ගොස් ඇත.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය: ඉදිරි දැක්ම

සංචාරක අමාත්‍යාංශය සහ එහි විෂය පථය යටතේ ඇති ආයතන පෞද්ගලික අංශය සමඟ එක්ව රට තුළ සංචාරක යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට සහ ඉලක්කගත වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා උපායමාර්ග සහ ක්‍රියාමාර්ග රාශියක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද 2022-2025 සංචාරක උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම මගින් ක්ෂේත්‍රය නංවාලීමට සහ ගැටලු

5

නිරාකරණය කිරීම සඳහා ඵලදායී මාර්ගෝපදේශ සැපයීය. සංචාරක කර්මාන්තය විසින් පුළුල් සංචාරක ප්‍රතිපත්තියක් ද කෙටුම්පත් කර ඇති අතර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් සිටියි. කෙසේ වෙතත්, ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ දී අවධාරණය කළ යුතු ඇතැම් අංග තිබේ.

(i). සංචාරක කර්මාන්තයේ නව අවස්ථා

පුද්ගල සුවතාවය හා සබැඳුණු සංචාරක කර්මාන්තය (wellness tourism), අධ්‍යාපනය හා සබැඳුණු සංචාරක කර්මාන්තය (education tourism) සහ පරාර්ථකාමී කටයුතු හා සබැඳුණු සංචාරක කර්මාන්තය ("philantourism") වැනි සංචාරක ක්ෂේත්‍රයේ නව වපසරියන්හි සේවාවන් පුළුල් කිරීම සහ වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකාවට හැකියාව ඇත. පුද්ගල සුවතාවය හා සබැඳුණු සංචාරක කර්මාන්තය තුළ සාමකාමී සහ විවේකී නවාතැන් ස්ථාන, හුදෙකලා ස්ථාන (retreat), භාවනා, යෝග සහ ආයුර්වේද ප්‍රතිකාර වැනි කායික සහ මානසික යහපැවැත්ව වැඩි දියුණු කිරීමේ පහසුකම් ආදිය සැපයීමේ අවස්ථා පුළුල් කළ හැක. අධ්‍යාපනය හා සබැඳුණු සංචාරක කර්මාන්තය යටතේ ඉංග්‍රීසි සහ දකුණු ආසියානු සංස්කෘතිය සහ ශිෂ්ටාචාරය වැනි ක්ෂේත්‍රවල කෙටි කාලීන හෝ දිගුකාලීන වැඩසටහන් දැනට පවතින හෝ නව අධ්‍යාපන ආයතනවල ඉදිරිපත් කළ හැක. නැගෙනහිර ආසියාතිකයින් පාසල් අධ්‍යාපනයෙන් පසු විදේශයන්හී දී ඉංග්‍රීසි භාෂා වැඩසටහන් හැදෑරීම සාමාන්‍ය දෙයක් වන අතර, එවැනි වැඩසටහන් ශ්‍රී ලංකාව තුළ හැදෑරීමට අවස්ථාව සැලසිය හැක. විදේශ සිසුන් සඳහා හුවමාරු වැඩසටහන් සහ නිවෙස් තුළ ආගන්තුක වැඩසටහන් (home-stay) ද දිරිමත් කළ හැක. පරාර්ථකාමී කටයුතු හා සබැඳුණු සංචාරක කර්මාන්තය මගින් විදේශිකයන්ට රට තුළ පුණ්‍ය කටයුතු සහ කෘෂිකාර්මික කටයුතු වැනි පරාර්ථකාමී කටයුතුවල නියැලීමට අවස්ථාව ලබා දිය හැක.

(ii). ස්වාභාවික පරිසරය සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීම, සහ පරිසර දූෂණය අවම කිරීමේ වැදගත්කම

එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය සහ ලෝක ගමනාගමන හා සංචාරක කවුන්සිලයේ ප්‍රකාශනවල මෙන්ම ශ්‍රී ලාංකීය හෝටල් අංශයෙන් ලැබෙන සන්නිවේදනයන්හි දක්වා ඇති පරිදි ලෝක සංචාරකයන් අතර ස්වභාවධර්මය සංරක්ෂණය කිරීම සහ පරිසර හිතකාමීත්වය පිළිබඳ උනන්දුව ඉහළ යමින් පවතී. සංචාරක නවාතැන්පොළවල් ඉදිකිරීමේ දී අන් අය සඳහා ස්වභාවධර්මය හෝ දර්ශනීය දෘෂ්ටිපථයන් (වෙරළ ආසන්නයේ ඇති හෝටල් ආදිය) විනාශ නොකිරීමටත්, වනාන්තර සහ පුද්ගල ඇසින් සැඟවී ඇති අනෙකුත් ආරක්ෂිත ස්ථාන අනවසරයෙන් අත්පත් කර ගැනීම වැළැක්වීමටත් ශ්‍රී ලංකාවේ බලධාරීන්ට විශාල කාර්යභාරයක් ඇත. තවද, ආකර්ෂණීය ස්ථාන සහ නවාතැන් පොළවල් ආසන්නයේ ශබ්ද දූෂණය කළමනාකරණය කළ යුතු වේ. සංචාරක සේවා සැපයීමේ නියැලී සිටින්නන්ගේ කාර්යයන් පරිසර හිතකාමී ද යන්න අධීක්ෂණය කිරීම (උදාහරණයක් ලෙස තල්මසුන්ට බාධා කරන තල්මසුන් නැරඹීමේ චාරිකා) වැදගත් වේ. එමෙන්ම අලි ඇතුන් සහ වන සතුන්ට, විශේෂයෙන් ම දිවියන්ට, හිංසා කිරීම හේතුවෙන් ඇති වූ අහිතකර ප්‍රචාරණය අවම කිරීම සඳහා මෑතක දී සම්මත කරන ලද සත්ත්ව ආරක්ෂණ පනත භාවිතයට ගත යුතු වේ.

(iii). සංචාරකයන්ගේ ගමන් මග කෙරෙහි අවධානය යොමු කිරීම

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සාමාන්‍යයෙන් වාර්ෂික පදනමක් මත රටෙන් පිටව යන අවස්ථාවේ දී සංචාරකයන් අතර සමීක්ෂණයක් සිදු කරනු ලබයි. 2018-2019 සමීක්ෂණ වාර්තාවේ සඳහන් වන පරිදි සංචාරකයන්ගෙන් සියයට 17ක් පමණක් සංචාරක පැකේජ භාවිත කළ බව අනාවරණය වූ බැවින් සංචාරකයන් බොහෝ දුරට තමන් විසින්ම සංචාර සැලසුම් කරන බව පෙනී යයි. තවද, සමීක්ෂණයට ලක් කරන ලද සංචාරකයන්ගෙන් සියයට 60ක් තම මිතුරන් සහ ඥාතීන්ගෙන් සහ සියයට 30ක් මංගත (online) මූලාශ්‍රයන්ගෙන් ගමන් තොරතුරු ලබා ගෙන ඇති අතර, මෙයින් පුද්ගල නිර්දේශ සහ මංගත ක්‍රමයන්ගේ පළ කර ඇති සමාලෝචනයන්ගේ වැදගත්කම පිළිබිඹු කරයි. මෙම සොයාගැනීම් මගින් එක් එක් සංචාරකයා තෘප්තිමත් කිරීමේ වැදගත්කම සහ ප්‍රචාරණයේ දී තනි පුද්ගලයෙකුට කළ හැකි බලපෑම පෙන්වා දෙයි. තවද, සියයට 60ක් පමණක් ඔවුන්ගේ සංචාරය විශිෂ්ට බවත්, සියයට 36ක් පමණක් තමන්ට නැවත ශ්‍රී ලංකාවට පැමිණීමට අවශ්‍ය බවත් ප්‍රකාශ කරන ලද බැවින් සංචාරකයන්ගේ තෘප්තිය මධ්‍යස්ථ මට්ටමක වූ බව පෙනී යයි. සංචාරකයන්ට වන සුළු අපහසුතාවයකින් පවා ඔවුන්ගේ සමස්ත අත්දැකීම විනාශ වී තනි පුද්ගලයෙකු විසින් සමස්ත සංචාරක කර්මාන්තයටම බලපාන සෘණාත්මක ප්‍රචාරණයක් ඇති කළ හැක.

(iv). ඩිජිටල් තාක්ෂණය වැඩි වශයෙන් භාවිත කිරීම

සංචාරක අත්දැකීම් වැඩිදියුණු කිරීම සහ ඉහළ ඝනත්වයේ (high-density tourism) සිට සමාජීය වශයෙන් දුරස්ථභාවය සහිත (socially-distanced tourism) සංචාරක කර්මාන්තයකට පරිවර්තනය කිරීම සඳහා ඩිජිටල් තාක්ෂණ භාවිතය වැඩි දියුණු කිරීමට ඉඩකඩ පවතී. මේ සඳහා, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය, සංචාරක ජංගම යෙදුම (සංවර්ධනය කරමින් පවතී) වැනි පියවර කිහිපයක් ගෙන ඇතත්, ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීම සඳහා වඩාත් බලවත් ක්‍රියාමාර්ග කඩිනමින් අවශ්‍ය වේ. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය සහ ආසියානු සංවර්ධන බැංකුවේ (ADB), "කොවිඩ්-19 සහ ආසියා සහ පැසිෆික් කලාපයේ අනාගත සංචාරක කර්මාන්තය" (2022 වසරේ මාර්තු මස) වාර්තාව

5

විසින් ද සංචාරක කර්මාන්තයේ ඩිජිටල් තාක්ෂණයේ පුළුල් වන භූමිකාව පෙන්වා දෙනු ලබයි.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය, බස්නාහිර, දකුණු සහ මධ්‍යම පළාත්වල සහ සීගිරිය ආශ්‍රිත ප්‍රදේශවලට සංකේන්ද්‍රණය වී ඇත. ජාතික වනෝද්‍යානවල ගැවසෙන නරඹන්නන් අධික වීම මෑතක සිට සැලකිය යුතු සෘණාත්මක ප්‍රචාරයක් ලබා ගෙන ඇත. එනමුත්, අනුරාධපුරය සහ පොළොන්නරුව වැනි ඓතිහාසික ස්ථානත් සැලකිය යුතු සංචාරකයින් පිරිසක් ආකර්ෂණය කර නොගනී (සංඛ්‍යා ලේඛන පරිශිෂ්ටයේ 86 වගුව). එනමුත්, පුද්ගල සුවතාවය (wellness), ග්‍රාමීය (rural), පරාර්ථකාමී (philanthropical), ත්‍රාසජනක (adventure) සංචාරක කර්මාන්ත ඇතිකිරීමට රටේ අනෙකුත් ප්‍රදේශවල සුදුසු ස්ථාන පවතින අතර, සංචාරකයින් මෙම ප්‍රදේශවලට ආකර්ෂණය කර ගත යුතුය. මේ අතර, සංචාරකයින්ට, සංචාරක ස්ථාන සඳහා ප්‍රවේශපත්‍ර මිලදී ගැනීමේ දී එක් එක් ස්ථානවල දී මිලදී ගැනීමට සිදු වන අතර පෙරහැර සහ උත්සව (කුඩා පරිමාණ උත්සව වුවත්), පොදු ප්‍රවාහන සේවාවන්, ආරක්ෂක සේවාවන්, ආගමික ස්ථානවලට සුදුසු ඇඳුම්, ජාතික වනෝද්‍යානවලට නොගෙනා යුතු යැයි තහනම් කළ දේවල් ආදිය පිළිබඳව යාවත්කාලීන තොරතුරු මංගතව නොමැති වීම වැනි අපහසුතාවන්ට මුහුණ දීමට සිදුවෙයි. එබැවින්, එවැනි තොරතුරු මෙන්ම පුද්ගල අභිමතය පරිදි තෝරාගත් ප්‍රවේශපත්‍ර කළඹක් වශයෙන් (ticket-bundle) මිලදී ගැනීමේ පහසුකම, සංවර්ධනය කරමින් පවතින ජංගම යෙදුමට (mobile application) හෝ සංචාරකයින් සඳහා වෙන් වූ අන්තර්ජාල වෙබ් අඩවියකට ඇතුළත් කිරීම ඉතා ප්‍රයෝජනවත් වනු ඇත. ඩිජිටල් තාක්ෂණය, ස්පර්ශ රහිත සේවා බෙදා හැරීමේ ක්‍රම (touchless service provision), ක්ෂණික ප්‍රතිචාර (QR) කේත ආශ්‍රිත සම්බන්ධතා රහිත ගෙවීම් ක්‍රමවේද සහ සෞඛ්‍ය සහ ආරක්ෂණ තොරතුරු රැස් කිරීමට සහ බෙදා ගැනීමටද භාවිත කළ හැක.

(v). වඩා හොඳ ප්‍රතිපත්ති සම්පාදනය කර සංචාරක ව්‍යාපාරයේ විභවය ප්‍රයෝජනයට ගැනීම සඳහා තොරතුරු වැඩිදියුණු කිරීම

සුදුසු ප්‍රතිපත්ති තීරණ ගැනීම හොඳ තොරතුරු ජාලයක් මත රඳා පවතී. සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා රටවල් අතර පවතින දැඩි තරඟකාරිත්වය සහ සංචාරක ලක්ෂණ නිතර විකාශනය වීම නිසා, ප්‍රතිපත්ති තීරණ සඳහා ශක්තිමත් තොරතුරු ජාලයක් භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානයෙහි සහාය ඇතිව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ස්ථාපනය කරමින් පවතින "සංචාරක සැටලයිට් ගිණුම්කරණය" (Tourism Satellite Accounting) වැඩසටහන තුළින් ජාතික ගිණුම් සඳහා සංචාරක ව්‍යාපාරයේ ආර්ථික දායකත්වය වඩා හොඳින් තක්සේරු කිරීමට හැකි වනු ඇත. එබැවින් එය ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම අවශ්‍ය වේ.

මීට අමතරව, සංචාරක වීසා යටතේ පැමිණෙන පුද්ගලයින්ගේ ලක්ෂණ, ඔවුන් කුමන ස්ථානයේ දී, කුමක් සඳහා කොපමණ මුදලක් වියදම් කරන්නේ ද යන්න, තෘප්තිමත් මට්ටම, සංචාරක ව්‍යාපාරයේ සේවා නියුක්තිය, සෘජු හා වක්‍ර සංචාරක සේවා සපයන්නන්ගේ සංඛ්‍යාව හා වර්ග සහ භූගෝලීය ප්‍රදේශ පිළිබඳ විවිධ තොරතුරු වැනි අනෙකුත් සාධක සමූහයක් පිළිබඳව නිතර වැඩි වාර ගණනකින් ප්‍රකාශයට පත් කෙරෙන දත්ත අවශ්‍ය වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) මගින් පවා වසංගත කාලපරිච්ඡේදය තුළ රටවල් කිහිපයක පවත්වන ලද අධ්‍යයනයන් තුළින්, ජාතික සංචාරක ආයතනයන්ට, සංචාර වැඩිදියුණු කිරීම, නවෝත්පාදන ඇතිකිරීම සහ පෞද්ගලික අංශයට පෙර දැක්මක් ලබා ගැනීම සඳහා තම වෙළඳපොළ පර්යේෂණ හැකියාවන් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත (පශ්චාත් වසංගත ලෝකයේ සංචාරක ව්‍යාපාරය: ආසියා පැසිෆික් කලාපයේ සහ බටහිර අර්ධගෝලය සඳහා ආර්ථික අභියෝග සහ අවස්ථා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2021).

(vi). සංචාරක අංශයේ අවදානම් කළමනාකරණ හැකියාවන් වැඩිදියුණු කිරීම

සංචාරක කර්මාන්තය ස්වභාවිකවම භූ දේශපාලනික සිදුවීම්වලට බෙහෙවින් ගොදුරු විය හැකි, සෘතුමය බලපෑමට ලක්වන කර්මාන්තයක් වන බැවින්, මෙම කර්මාන්තය ණය සහන සහ රාජ්‍ය මූල්‍ය දීමනා වැනි සහන මත පමණක් රඳා නොසිට සිය අවදානම් කළමනාකරණ හැකියාවන් වැඩිදියුණු කළ යුතුය. ණය සහන බැංකුවල ආදායම් අඩු කරන අතර, බැංකුවල ද්‍රවශීලතාවයටද බලපෑම් කර අවදානම් වැඩි කරයි. බැංකු අංශයට ඇතිවන අයහපත් බලපෑම් මුළු ආර්ථිකයටම පැතිරිය හැකිය.

(vii). සංචාරක අංශය තුළ අවිධිමත් උප අංශය අඩු කිරීම

ශ්‍රී ලංකාවේ සංචාරක අංශය, සිය ව්‍යාපාර අවිධිමත් ලෙස කරගෙන යන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් විශාල සංඛ්‍යාවකින් සමන්විත වේ. කෙසේ වෙතත්, එවැනි ව්‍යවසායන් සංචාරක ආයතන සමඟ ලියාපදිංචි වීමට දිරිමත් කිරීම තුළින් රජය ක්‍රියාත්මක කරන උපාය මාර්ගවල විධිමත් බව සහතික කිරීමට සහ සහනදායී ක්‍රියාමාර්ග අවශ්‍ය වූ විට සෑම සහභාගිවන්නෙකුටම සාධාරණ ලෙස ලබා දීමට උපකාරී වේ. එසේම, කර්මාන්තයක ඉහළ අවිධිමත්භාවය, ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා තොරතුරු රැස් කිරීම, රාජ්‍ය සේවා සැපයීම සහ තත්ත්ව ප්‍රමිතීන් සඳහා නියාමනය කිරීම සීමා කරයි. තවද, ව්‍යාපාර ලියාපදිංචි කිරීම තුළින් ණය ලබා ගැනීම ඇතුළු මූල්‍ය පිවිසුම් අවස්ථා වැඩිදියුණු කිරීම මෙන්ම බදු එකතු කිරීම ද ඉහළ නංවනු ඇත.

5

(viii). සංචාරකයින් අතර විවිධත්වය දිරිමත් කිරීම

ඉහළ ශුද්ධ වටිනාකමක් ඇති පුද්ගලයින් (high net worth individuals) පමණක් ඉලක්ක නොකර, පුද්ගල අභිරුචිය, රට, සහ වියදම් කිරීමේ හැකියාව අනුව විවිධ වර්ගයේ සංචාරකයින් තෘප්තිමත් කිරීමට පහසුකම් සැලසිය යුතුය. මෙය විශේෂිත ලක්ෂණ සහිත හෝ තනි රටක/කලාපයක සංචාරකයින් මත මුළු කර්මාන්තයම රඳා පැවතීම අඩු කිරීමට උපකාරී වනු ඇත. ඇත්ත වශයෙන්ම, සියලුම වර්ගයේ සංචාරකයින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා දායක වේ. විවිධ වියදම් හැකියාවකින් යුත් සංචාරකයින් රටට ආකර්ෂණය කර ගැනීම තුළින් විවිධ ආයෝජන හැකියාවන් ඇති දේශීය ආයතනවලට සංචාරක කර්මාන්තය තුළ ක්‍රියාත්මක වීමට අවස්ථාව සලසා දෙනු ඇත.

(ix). සංචාරක ව්‍යාපාරය මත දැඩි ලෙස රඳා පැවතීම අඩු කිරීම

සංචාරක කර්මාන්තය මත යැපෙන රටවල් ප්‍රායෝගික ප්‍රමාණයෙන් කුඩා රටවල් වන අතර, එම රටවල විදේශ විනිමය ආදායම හා ස්වාරක්ෂකයන් ප්‍රමාණවත් නොවන බවත්, එම රටවල රාජ්‍ය මූල්‍ය අවකාශය සීමිත වන අතරම, අනෙකුත් සාර්ව ආර්ථික අභියෝගවලටද මුහුණ දෙන බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2021 වසරේ නිකුත් කර ඇති "පශ්චාත් වසංගත ලෝකයේ සංචාරක ව්‍යාපාරය: ආසියා පැසිෆික් කලාපයේ සහ බටහිර අර්ධගෝලයේ ආර්ථික අභියෝග සහ අවස්ථා" යන පර්යේෂණ වාර්තාව මගින් පෙන්වා දී ඇත. ඒ තුළින් සංචාරක ව්‍යාපාරය මත අධික ලෙස රඳා පැවතීම වෙනත් අපනයනවලින් අඩු සාර්ථකත්වයක් අත්කරගත් ඉහත කී ලක්ෂණවලින් පීඩා විඳින රටවල ලක්ෂණයක් බව පෙනී යයි. සංචාරක කර්මාන්තය මත යැපෙන එවැනි රටවල අපනයන සංකීර්ණතාවය අවම වන අතර, එය ඔවුන්ගේ නව නිෂ්පාදන කිරීමේ හැකියාවට බලපායි. නව නිෂ්පාදන සංවර්ධනය කිරීම සඳහා නිෂ්පාදන දැනුම හා හැකියාවන් පුළුල් කිරීම අවශ්‍ය වේ. සංචාරක කර්මාන්තය යනු රටක තාක්ෂණික ධාරිතාව වැඩි කරන කර්මාන්තයක් නොවන අතර, බාහිර කම්පනවලට බෙහෙවින් ගොදුරු වන කර්මාන්තයකි. ඉහත සඳහන් කළ පර්යේෂණ වාර්තාව මගින්, නව ඩිජිටල් ආර්ථික මෙවලම් භාවිතයෙන් හෝ සමස්ත අපනයන සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම තුළින් අනෙකුත් භාණ්ඩ හා සේවා අපනයන අංශ දියුණු කිරීමට සංචාරක කර්මාන්තය මත යැපෙන රටවල් (ශ්‍රී ලංකාව ඇතුළුව) විචක්ෂණශීලී විය යුතු බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පෙන්වා දී ඇත. මෙම වාර්තාව මගින් යෝජනා කර ඇති පරිදි ශ්‍රී ලංකාව මැදිකාලයේ දී, සිය සංචාරක ආකෘතිය ගැන නැවත සලකා බලා අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කළ යුතුය.

නිගමනය

භූ දේශපාලනික අර්බුදයන්ගේ සහ අභියෝගාත්මක දේශීය සමාජ දේශපාලනික පරිසරයේ බලපෑම් මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා ආර්ථිකයේ පශ්චාත් වසංගතයෙන් පසු යථා තත්ත්වයට පත් වීම සඳහා සංචාරක අංශය උත්තේජනයක් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංචාරක කර්මාන්තයේ නව සාමාන්‍යයකට (new-normal) අනුවර්තනය වීමට පමණක් නොව, නව සාමාන්‍යයක් නිර්මාණය කිරීමට රජය සහ පෞද්ගලික අංශයේ සාමූහික ප්‍රයත්නයන් අවශ්‍ය වේ. මෙම ප්‍රයත්නයේ දී, ශ්‍රී ලංකාවේ බලධාරීන් විසින් මෙරට මෑත කාලීන ආර්ථික තත්ත්වය මත පදනම්ව ඇතැම් විදේශ රජයන් විසින් නිකුත් කළ අනතුරු හැඟවීම් යහපත් සහසම්බන්ධතාවයක් තුළින් ඉවත්කළ යුතුය. සංචාරක කර්මාන්තයේ යථා තත්ත්වයට පත් වීම රඳා පවතින්නේ, නූතන සංචාරකයාගේ අවශ්‍යතා සපුරාලිය හැකි වීම, විය හැකි සැපයුම් සහ බලශක්ති හිඟයන් සඳහා පෙර සූදානම් වීම සහ ණය හා පොලී ගෙවීම් සඳහා දී ඇති සහන කාලයට පසු මනා මූල්‍ය කළමනාකරණයකින් යුතුව කටයුතු කිරීම යනාදිය මතය. සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමේ විභවතාවයක්, භාවනා සහ වෛද්‍ය හා ඓතිහාසික පර්යේෂණ සඳහා තරුණ කණ්ඩායම් ආකර්ෂණය කර ගැනීම වැනි විවිධාංගීකරණය වූ සංචාරක උවමනා සඳහා පවතින බව වාණිජමය දෘෂ්ටිකෝණයකින් පෙනී යයි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ පෞද්ගලික සංචාර සංවිධානය කරන්නන් විසින් කලාපයේ අනෙකුත් රටවල්වලට සාපේක්ෂව ආකර්ෂණීය පැකේජ ලබා දෙමින් මෙම විශේෂිත සංචාරක කණ්ඩායම් ශ්‍රී ලංකාවට පැමිණීමට දිරිමත් කළ යුතුය. වසංගතය අඩුවීමත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකයේ පුනර්ජීවනය පිණිස සංචාරක අංශයට සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කළ හැකි බව අපේක්ෂිතය.

මූලාශ්‍ර

1. Asian Development Bank and United Nations World Tourism Organisation. (2022). COVID-19 and the future of tourism in the Asia and Pacific. Manila, Philippines and Madrid, Spain: Author.
2. Goretti, M. M., Leigh, M. L. Y., Babii, A., Cevik, M. S., Kaendera, S., Muir, M. D. V., ... & Salinas, M. G. (2021). Tourism in the post-pandemic world: economic challenges and opportunities for Asia-pacific and the western hemisphere. International Monetary Fund.
3. International Monetary Fund. (2009). Balance of Payments and International Investment Position Manual - BPM 6 (6th Edition). Washington D. C., USA: International Monetary Fund.
4. Sri Lanka Tourism Development Authority. (.....). Survey of Departing Tourists from Sri Lanka 2018-2019. Colombo, Sri Lanka: Sri Lanka Tourism Development Authority.
5. United Nations World Tourism Organisation. (2022). World Tourism Barometer January 2022. Madrid, Spain: United Nations World Tourism Organisation.
6. World Travel and Tourism Organisation. (2021). Trending in Travel – Emerging Consumer Trends in Travel & Tourism in 2021 and Beyond. London, United Kingdom: World Travel and Tourism Organisation.

5.10 රූප සටහන
සංචාරක පැමිණීම් සහ ඉපැයීම්



මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

සහන ද දීර්ඝ කරන ලදී. සංචාරකයන්ගේ පැමිණීම්, 2020 වසරේ පළමු මාස තුන තුළ වාර්තා වූ පැමිණීම් 507,311ත් ඇතුළුව 2020 වසරේ වාර්තා වූ මුළු සංචාරක පැමිණීම් 507,704ට සාපේක්ෂව, 2021 වසරේ දී 194,495ක් දක්වා සියයට 61.7කින් පහළ ගියේය. 2022 වසරේ මුල් භාගයේ දී සිදු වූ සංචාරකයන්ගේ පැමිණීමේ ක්‍රමානුකූල වැඩි වීම භූ දේශපාලනික පීඩන හේතුවෙන් ගෝලීය සංචාරක කර්මාන්තයට වූ බාධක නොතකා අඛණ්ඩව සිදු විය.

යුරෝපය සංචාරක පැමිණීම් සඳහා ප්‍රමුඛ කලාපය වූ අතර, ඉන්දියාව තවදුරටත් සංචාරක පැමිණීම් සඳහා තනි රටක් ලෙස මුල් තැන ගන්නා ලදී. යුරෝපය මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 48කට දායක වෙමින් සංචාරක පැමිණීම් 93,496ක් වාර්තා කළේය. චීනයෙන් වූ සංචාරක පැමිණීම් ඉතා අඩු වුවද, ආසියා පැසිෆික් කලාපය මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 43.2 කට දායක වෙමින් සංචාරක පැමිණීම් 83,926ක් වාර්තා කළ අතර, එය දෙවන විශාලතම සංචාරක පැමිණීම වේ. රටවල් අනුව සංචාරක පැමිණීම ගත් කළ, 2021 වසරේ දී ඉන්දියාව සංචාරක පැමිණීම් 56,268ක් සමඟින් පෙරමුණ ගත් අතර, රුසියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, සහ පාකිස්ථානය ඉන් පසුව ඉහළම සංචාරකයන් සංඛ්‍යාවක් වාර්තා කළේය. 2021 අගෝස්තු මස අවසානයේ දී, ශ්‍රී ලංකාව ඉන්දියාවේ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන නැවත ආරම්භ කරනු ලැබුවේ පූර්ණ එන්නත්කරණයට ලක්වූ සංචාරකයන් සඳහා සිය දේශ සීමා විවෘත කරමිනි. රුසියාව 2021 වසරේ දී දෙවන විශාලතම සංචාරක ප්‍රභවය ලෙස එක්සත් රාජධානිය පසු කළ අතර, ඒ සඳහා රුසියාවෙන් කුලී පදනම මත ලබාගත් ගුවන් යානා ගමන්වාර ඉලක්ක කර ගනිමින් සිදු කළ සංචාරක ප්‍රවර්ධන වැඩසටහන් හේතු විය. සම්ප්‍රදායික සහ සම්ප්‍රදායික නොවන වෙළඳපොළ සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා මාධ්‍යයක් ලෙස නිත්‍ය ගමන් මාර්ග සහ කලින් කලට කුලී පදනම මත ලබාගත් ගුවන් ගමන් මෙහෙයුම් හරහා වැඩි දියුණු කරන ලද සම්බන්ධතා ප්‍රවර්ධනය කළ හැකි බව එමගින් පැහැදිලි වේ. 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ ඉහළම සංචාරක ප්‍රභව පහ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 56.4ක් සඳහා දායක වී ඇත.

සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදම සහ රැඳී සිටින කාලය යන ද්විත්වයෙහි ම ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, සංචාරකයන් පැමිණීම අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී සංචාරක ඉපැයීම් සුළු වශයෙන් පහළ ගියේය. සංචාරකයින්ගේ වියදම් සහ මෙරට ගත කරන කාලය පිළිබඳ 2021 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද සංශෝධිත තක්සේරුව අනුව, සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම 2020 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් 158.1 සිට 2021 වසරේ දී එ.ජ. ඩොලර් 172.6ක් දක්වා ඉහළ ගියේය. තවද, සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය 2020 වසර සඳහා ඇස්තමේන්තු කළ දින 8.5 සමඟ සැසඳීමේ දී කොවිඩ්-19 හේතුවෙන් වන නිරෝධායනයේ බලපෑම නිරූපණය කරමින් 2021 වසරේ දී දින 15.1ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. සංචාරක ඉපැයීම් 2020 වසරේ පැවති එ.ජ. ඩොලර් මිලියන 682ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 507ක් දක්වා සියයට 25.7කින් පහළ ගියේය. මේ අතර, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී විදේශ ගමන් සම්බන්ධයෙන් රටින් පිටවීම්වල ද පහළ යෑමක් වාර්තා විණි.

2021 වසරේ දී සංචාරක අංශය සඳහා වූ ආයෝජන තවදුරටත් පුළුල් වූ අතර, ශ්‍රී ලංකාවේ සංචාරක අංශයේ විභවය පිළිබඳ ආයෝජකයන් සතු අඛණ්ඩ විශ්වාසය මෙයින් නිරූපණය වේ. 2021 වසරේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ආයෝජන සබඳතා ඒකකය වෙත එ.ජ. ඩොලර් මිලියන 134ක වටිනාකමකින් සහ කාමර 1,328ක සමස්ත ධාරිතාවයකින් යුතු යුතු සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ නව ආයෝජන ව්‍යාපෘති 45ක් ලැබී තිබුණි. මේ අතර, එ.ජ.ඩොලර් මිලියන 104ක වටිනාකමකින් සහ කාමර 922ක සමස්ත ධාරිතාවයකින් යුතු සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධ නව ආයෝජන ව්‍යාපෘති 30ක් සඳහා ආයෝජන සබඳතා ඒකකය 2021 වසරේ දී අවසර ලබා දුන්නේය. තවද, කාමර 6,265ක් සහිත හෝටල් ව්‍යාපෘති 87ක් මේ වන විට විවිධ අදියරයන්හී ඉදිකරමින් පවතී. ඒ අනුව, කාමර 25,958ක සමස්ත

ධාරිතාවයකින් යුතු ශ්‍රේණිගත ආයතන 480ක් සහ අති සුඛෝපභෝගී කුඩා හෝටල්, බංගලා, නිවාඩු නිකේතන, පෞරාණික බංගලා, පෞරාණික නිවාස, සංචාරක සත්කාර නිවාස ඒකක, කුලියට ගත් තට්ටු නිවාස සහ කුලියට ගත් නිවාස ඇතුළුව, කාමර 21,379ක සමස්ත ධාරිතාවයකින් යුතු අතිරේක ආයතන 3,177 ක් 2021 වසරේ දී ක්‍රියාත්මක වුණි.

සංචාරකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා රජය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධව 2021 වසරේ ප්‍රතිපත්තිමය මුලපිරීම් කිහිපයක් සහ විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළේය. කොවිඩ්-19 වසංගතයට මුහුණදීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉල්ලීම පරිදි බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් සංචාරක ක්ෂේත්‍රයට අදාළව 2021 මාර්තු මස 31 වන දින දක්වා ලබා දී තිබූ ණය සහන කාලය 2021 ඔක්තෝම්බර් මස 01 වන දින දක්වා දීර්ඝ කරන ලදී. කෙසේ වුවද, මෙම කර්මාන්තය මත වසංගතය හේතුවෙන් ඇති වූ දිගු කාලීන අහිතකර බලපෑම් සලකා බැලීමෙන් පසු, 2022 ජූලි මාසයෙන් අවසන් වන අයුරින් සහන කාලය තවත් මාස නවයකින් නැවත වරක් දීර්ඝ කිරීමට මහ බැංකුව විසින් කටයුතු කරන ලදී. මෙම දීර්ඝ කිරීම හා සමගාමීව, සංචාරක අංශය සඳහා මගී ප්‍රවාහන සේවා සපයන ව්‍යාපාරික සහ පෞද්ගලික අංශයේ වාහන සඳහා කල්බදු වාරික ගෙවීමට ලබා දුන් සහන කාලය ද දීර්ඝ කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සංචාරක අංශයේ නියුතු පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා සහනදායී පොලී අනුපාතයක් යටතේ ණය ලබා දීම සඳහා ක්‍රියාත්මක කරන ලද සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ණය පහසුකම, එක් එක් ණය සඳහා වෙන් වෙන් ව සලකා බලන පදනමෙන්, කිහිප වතාවක් 2022 ජූනි මස 30 වන දින දක්වා දීර්ඝ කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි සියලුම සංචාරක ආයතනයන්හි බලපත්‍ර වලංගු කාලය සහ සංචාරක මගපෙන්වන්නන්ගේ බලපත්‍ර වලංගු කාලය 2021 දෙසැම්බර් මස 31 වන දින දක්වා දීර්ඝ කිරීම ආදී වූ සංචාරක කර්මාන්තයේ පාර්ශ්වකරුවන් මුහුණ දෙන ගැටලු අඩු කිරීම සඳහා සංචාරක ක්ෂේත්‍රයේ බලධාරීන් විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ සහාය ඇතිව ලියාපදිංචි සියලු සංචාරක මගපෙන්වන්නන් සඳහා ඔවුන්ගේ දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය අඛණ්ඩ වෘත්තිමය සංවර්ධනය සඳහා මාර්ගගත ඉගෙනුම් ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. තවද, අවිධිමත් අංශයේ සංචාරක ක්‍රියාකරුවන් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි ලියාපදිංචි වීම දිරිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත් කරන ලදී. සංචාරක හෝටල්, නිවාඩු නිකේතන, සංචාරක සත්කාර නිවාස, බංගලා, සංචාරක නියෝජිතායතන, සංචාරක හිතකාමී භෝජනාගාර, ආපනශාලා සහ ස්පා සහ සුවතා මධ්‍යස්ථාන ඇතුළු සියලුම අවිධිමත් සංචාරක ව්‍යාපාර සඳහා තාවකාලික ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියක් හරහා ලියාපදිංචි කිරීමට අවසර ලබා දී ඇත. මේ අතර, නව ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් පුළුල් ගෝලීය ප්‍රේක්ෂක ආකර්ෂණයක් ඇති කර ගැනීම සඳහා මෙරට ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින් උපායමාර්ගික ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබීය. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 2021 වසරේ මාර්තු මාසයේ දී පස් අවුරුදු ගෝලීය සන්නිවේදන වැඩසටහනක් දියත් කරන ලද අතර, 2021 ඔක්තෝබර් මස ඉන්දියානු සිනමාව ඉලක්ක කර ගනිමින් චිත්‍රපට ආශ්‍රිත සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය ආරම්භ කළේය. තවද, 2021 ඔක්තෝබර් මස 1 වන දින සිට 2022 මාර්තු මස 31 දක්වා ඩුබායි හී පැවති වර්ල්ඩ් එක්ස්පෝ 2020 (World Expo 2020) ප්‍රදර්ශනය, වෙළඳාම, ආයෝජන සහ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවට අවස්ථාවක් සලසා දෙන ලදී. ශ්‍රී ලංකා සංචාරක ක්ෂේත්‍රයට නව තේමා කිහිපයක් 2021 වසරේ දී ප්‍රථම වරට හඳුන්වා දුන් අතර, ඩිජිටල් නොමැඩ්වරුන් (දුර ස්ථානවල සිට තාක්ෂණය හරහා වැඩ කරන පිරිස්) සඳහා මුලපිරීමක් සහ මංගත ක්‍රම හරහා සම්බන්ධතා වැඩි දියුණු කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ වනජීවී සම්පත සජීවීව විකාශනය කරවූ ලබන 'go on a couch safari' ඩිජිටල් වැඩසටහන මේ අතර වේ. ක්‍රියාකාරී ලෙස සංචාරක ප්‍රවර්ධනය කිරීම හේතුවෙන් 2021 වසරේ සංචාරය කිරීමට වඩාත් යෝග්‍ය ගමනාන්තයන් අතුරින් එකක් ලෙස කොන්ඩේ නාස්ට් (Condé Nast), ට්‍රැවල් ඇන්ඩ් ලෙෂර් සඟරාව (Travel and Leisure magazine), සීඑන්එන් ට්‍රැවල් (CNN travel) ආදී වූ ලෝක ප්‍රචලිත සංචාරක සංවිධානයන්ගෙන් ඇගයීම් කිහිපයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාව සමත් වූ අතර, ශාරීරික සුවතා සම්බන්ධ සංචාරක ව්‍යාපාරයේ ගමනාන්ත අතුරින් ඉහළම ස්ථානයක ශ්‍රේණිගත කිරීම සහ කාන්තා ඒකළ සංචාරක දර්ශකයේ දෙවන ස්ථානයට පත් වීමට හැකිවිය.

ප්‍රවාහන, විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා සහ අනෙකුත් සේවා

තොරතුරු තාක්ෂණය මත පදනම් වූ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සම්බන්ධ අංශයෙහි ක්‍රියාකාරිත්වය 2021 වසර තුළ දී යහපත් මට්ටමක පැවතුණු අතර, එය එ.ජ. ඩොලර් බිලියන 1ක සීමාව ඉක්ම විය. වසංගතය හේතුවෙන් 2020 වසරේ දී මුහුදු ප්‍රවාහන සේවා වෙත ඇති වූ සැලකිය යුතු බාධාවලින් පසුව 2021 වසරේ දී භාණ්ඩ ප්‍රවාහන සේවාවල ධනාත්මක වර්ධනයක් වාර්තා විය. 2021 වසරේ දී මෙරට වරායන් වෙත නැව් ගමනාගමනය සුළු වශයෙන් අඩු වුව ද, දේශීය බහාලුම් හැසිරවීම, ප්‍රතිනැව්ගත කිරීම් සහ තැන්මාරු මෙහෙයුම් ඇතුළුව සමස්ත බහාලුම් හැසිරවීමේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි. පටවන ලද සහ මුදා හරින ලද භාණ්ඩ අනුව හසුරුවන ලද මුළු භාණ්ඩ ප්‍රමාණය ද වර්ෂය තුළ වැඩි විය. මෙය සහ ගෝලීය වශයෙන් භාණ්ඩ හැසිරවීම් ගාස්තු ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස රටේ ආනයන සහ අපනයන යන දෙඅංශයේම භාණ්ඩ ප්‍රවාහනය හා සම්බන්ධ ගාස්තු වැඩි වීමට හේතු විය. මේ අතර, වසංගතය සමඟ සංචාරක පැමිණීම් අඩුවීම හේතුවෙන් ගුවන් මගී සේවාවන්හි ඉපැයීම්වල කැපී පෙනෙන අඩුවීමක් දක්නට ලැබුණි. වසංගතය හේතුවෙන් ශ්‍රී ලාංකිකයින්ට අනේවාසික ගුවන් සමාගම්වල ගමන් කිරීමට ඇති අවස්ථා සීමා වීමේ ප්‍රතිඵලයක් ලෙස, මගී ප්‍රවාහන සේවා ගෙවීම් ද අඩු විය. මූල්‍ය සේවා, ඉදිකිරීම් සේවා, රාජ්‍ය සේවා සහ අනෙකුත් ව්‍යාපාරික සේවා ඇතුළු අනෙකුත් සේවා උප අංශ වෙතින් 2021 වසරේ දී සුළු ශුද්ධ ගෙවීම් ප්‍රමාණයක් වාර්තා විය. ඒ අනුව, සේවා ගිණුමේ අතිරික්තය 2020 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 0.8ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 1.6ක් දක්වා වැඩි විය. කෙසේ වුව ද, ප්‍රධාන වශයෙන් ම සංචාරක කර්මාන්තයේ ඉපැයීම් අඩු වීම හේතුවෙන් සේවා ගිණුමේ අතිරික්තය පාස්කු ඉරුදින ප්‍රහාරයන්ට පෙර පැවති මට්ටමට සාපේක්ෂව 2020 සහ 2021 වසරවල සැලකිය යුතු ලෙස පහළ මට්ටමක පැවතුණි.

5.2.3 ප්‍රාථමික ආදායම

සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ප්‍රතිආයෝජිත ඉපැයීම්වල ඉහළ යෑමක් හමුවේ වුව ද, විදේශීය ණය සඳහා වන පොලී ගෙවීම්, රාජ්‍ය සුරැකුම්පත්හි ආයෝජන සඳහා වන කුපන ගෙවීම් සහ සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ලාභාංශ ගෙවීම් අඩු වීම හේතුවෙන්, 2021 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟයෙහි අඩු වීමක් වාර්තා විය. වසර තුළ දී, රජයේ, පෞද්ගලික අංශයේ සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් අඩු වූ අතර, තැන්පතු භාර ගන්නා ආයතන විසින් වසර තුළ දී, අනේවාසිකයන් වෙත සිදුකළ පොලී ගෙවීම් සුළු වර්ධනයක් වාර්තා කළේය. ඇතැම් කෙටි කාලීන වාණිජ ණය ක්‍රමානුකූලව ගෙවන අතරම, රජය ක්‍රමයෙන් අඩු පිරිවැය සහිත සහනදායී අරමුදල් වෙත යොමු වීමත් සමඟ රජයේ විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම්වල අඩුවීමක් නිරීක්ෂණය විය. තවද, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල කොටසක හිමිකාරීත්වය අනේවාසිකයන් සිට නේවාසිකයන් වෙත වෙනස් වීම මෙන්ම, 2020 සහ 2021 වසරවල දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල් පිරීම සහ නව නිකුතුන් නොමැති වීම හේතුවෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල අනේවාසිකයන් වෙත සිදු කළ කුපන ගෙවීම්හි සැලකිය යුතු අඩු වීමක් වාර්තා විය. කෙසේ වුවත්, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී ප්‍රතිආයෝජිත ඉපැයීම්වල වැඩි වීමක් දක්නට ලැබුණි. මේ අතර, 2021 වසරේ දී ජාත්‍යන්තර සංචිත මත වන ආයෝජන ආදායම් අඩු වීම මූලිකවම හේතු කොට ගෙන ප්‍රාථමික ආදායම් ගිණුම වෙත වූ ලැබීම් පහත වැටුණි. මෙම ප්‍රවණතා හමුවේ, 2021 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය, 2020 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 2.2ට සාපේක්ෂව, එ.ජ. ඩොලර් බිලියන 2.0ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

5.2.4 ද්විතීයික ආදායම

2021 වසරේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස ද්විතීයික ආදායම් ගිණුම දුර්වල විය. 2021 වසරේ පළමු මාස පහ තුළ හිතකර වර්ධනයක් වාර්තා කළ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ 2021 වසරේ ජූනි මාසයේ සිට ක්‍රමානුකූල අඩුවීමක් වාර්තා කළේය. මෙය 2021 වසරේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2020 වසරේ දී වාර්තා වූ සියයට 5.8ක වර්ධනයට සාපේක්ෂව සියයට 22.7කින් අඩු වීම සඳහා හේතු විය. මෙම පහත වැටීම සඳහා, නිල විනිමය අනුපාතිකයට සාපේක්ෂව අවිධිමත් වෙළඳපොළේ විනිමය අනුපාතිකයෙහි කැපී පෙනෙන වෙනසක් පැවතීම හේතුවෙන් විධිමත් මාර්ග හරහා ලැබෙන ප්‍රේෂණ අඩු වීම මූලික වශයෙන් හේතු විය. මෙම ප්‍රවණතා සමඟ, 2021 වසරේ දී ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම්, 2020 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 6.2ට සාපේක්ෂව එ.ජ. ඩොලර් බිලියන 5.2ක් දක්වා අඩු විය. 2022 වසරේ මාර්තු මස සිට විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සහ විදේශ රැකියා සඳහා

5

විශේෂ සටහන 6

අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම මගින් රටක මූල්‍ය වෙළඳපොලට සහ ආර්ථිකයට ඇති කරන බලපෑම

හැඳින්වීම

යම් රටක් තුළ මෙන්ම එම රටින් පිටත දේශසීමා අතර සිදුකෙරෙන ගනුදෙනු වලදී එම ගනුදෙනු වලට අදාළ මුදල් කාර්යක්ෂමව සහ ආරක්ෂාකාරී අයුරින් සංචලනය කළ හැකි ක්‍රමවේදයක් පැවතීම රටක මූල්‍ය පද්ධතියෙහි දැකිය හැකි වැදගත් ලක්ෂණයකි. විශේෂයෙන්ම, විදේශ විනිමය යොදා ගනිමින් දේශසීමා අතර සිදුවන මුදල් මාරු කිරීම් වලදී මෙම කරුණ වඩාත් වැදගත් වේ. සාමාන්‍යයෙන්, රටක මෙලෙස දේශ සීමා අතර සිදුවන මුදල් ගනුදෙනුවලින් බහුතරයක් විධිමත් මුදල් හුවමාරු ක්‍රම හරහා සිදු වේ. ඒ කෙසේ වුවත්, ඕනෑම රටක, විශේෂයෙන්ම, දේශසීමා අතර සිදුකෙරෙන ගනුදෙනු සඳහා විවිධාකාරයේ අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම භාවිතා කරනු ලබයි. රටක පුරවැසියන් ගනුදෙනු සඳහා විධිමත් මුදල් හුවමාරු ක්‍රම තොරාගන්නවාද නැතහොත් අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම තෝරාගන්නවාද යන්න එම රටෙහි ආර්ථිකයෙහි සහ මූල්‍ය වෙළඳපොලේ පවතින විවිධ ලක්ෂණ සහ එවැනි ගනුදෙනුවල නීත්‍යානුකූලභාවය මත රඳා පවතී. බලපත්‍රලාභී සහ නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන විසින් ජනතාවට සපයනු ලබන මුදල් හුවමාරුකිරීමේ සේවාවන් විධිමත් මුදල් හුවමාරු මාධ්‍යන් ලෙස හඳුනා ගැනේ. එලෙස මුදල් හුවමාරු කිරීමේ සේවාවන් සැපයීම සඳහා නියාමනයකට ලක්නොකෙරෙන හවාලා, හුන්ඩි හෝ උන්ඩියල් (දකුණු ආසියාවේ), ෆෙයි කියන් හෝ චිට් (අග්නිදිග ආසියාවේ) සහ බ්ලැක් මාර්කට් පෙසෝ (යුරෝපීය රටවල) වැනි මුදල් හුවමාරු සේවා සපයන්නන්ගේ ජාල අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම ලෙස හඳුනා ගැනේ. කෙසේ වෙතත්, වර්තමානයේ, ජර්මනිය, එක්සත් රාජධානිය සහ ඇමරිකා එක්සත් ජනපදය වැනි ඇතැම් රටවල් එකී රටවල ක්‍රියාත්මක වන මුදල් විශුද්ධිකරණයට එරෙහි නීතිමය අවශ්‍යතා මත පදනම්ව එම රටවල අවිධිමත් මුදල් හුවමාරු සේවා සපයන්නන් සඳහාද ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර ලබා දීම වැනි නියාමන ප්‍රවේශයන් අනුගමනය කරයි. විධිමත් බැංකු ක්‍රමයන් භාවිතා නොවූ අතීතයේ සිටම මුදල් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට භෞතික සංචලනයකින් තොරව එම මුදල් වල වටිනාකම පමණක් හුවමාරු කර යැවීම සඳහා හවාලා ක්‍රමය අඛණ්ඩව භාවිතා කර ඇත. කෙසේ වෙතත්, ජංගම දුරකතනයක යෙදුමක් භාවිතා කිරීමෙන් පවා බැංකු ගනුදෙනු ඉතා පහසුවෙන් ඉටුකර ගැනීමේ හැකියාවක් පවතින නූතනයේදීත් එවැනි අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම භාවිතයේ පවතී. විවිධ පුද්ගලයන්, කණ්ඩායම් මෙන්ම ආයතන විසින් නීත්‍යානුකූල මෙන්ම නීත්‍යානුකූල නොවන ගනුදෙනු සඳහා ද ගෙවීම් මාධ්‍යක් ලෙස මෙම අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම භාවිතා කරනු ලැබේ. විශේෂයෙන් එවැනි සේවාවන් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම ඇතුළු සාපරාධී ක්‍රියාකාරකම් සඳහා දැඩි ලෙස උපයෝගී කර ගනී. නිදසුනක් වශයෙන්, 2001 වසරේදී එක්සත් ජනපද ලෝක වෙළඳ මධ්‍යස්ථානයට එල්ල වූ මාරාන්තික ත්‍රස්තවාදී ප්‍රහාරයට තුඩු දුන් ක්‍රියාකාරකම් සඳහා මුදල් සැපයීමේදී හවාලා මුදල් හුවමාරු ක්‍රමය භාවිතා කර ඇති බව තහවුරු වී ඇත. මෙම ක්‍රම වල ඇති ඇතැම් වාසිදායක ලක්ෂණයන් වන අඩු ගනුදෙනු පිරිවැය, පහසු ප්‍රවේශය, අවම ලේඛන කටයුතු සහ ඉක්මනින් මුදල් මාරු කර ගැනීමේ හැකියාව යනාදිය මෙම අවිධිමත් ප්‍රේෂණ මාධ්‍යන් සමාජය තුළ ජනප්‍රිය වීමට හේතු සාධක වී ඇත. කෙසේ වෙතත්, සාපරාධී ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවිධිමත් මාධ්‍යක් වීම හේතුකොටගෙන ගණුදෙනු කරනු ලබන මුදල් අහිමි වීමේ හැකියාවක් පවතින බැවින් මේවා වඩාත් අවදානම් සහගත මුදල් හුවමාරු ක්‍රම ලෙසට හඳුනා ගැනේ. විශේෂයෙන්ම, මෙම ක්‍රම මුදල් විශුද්ධිකරණහි නියැළෙන්නන් සහ ත්‍රස්තවාදයට මුදල් සපයන්නන් විසින් අනිසි ලෙස භාවිතා කිරීමට බෙහෙවින් ඉඩකඩ පවතී. මෙවන් අවිධිමත් සහ නීත්‍යානුකූල නොවන ගෙවීම් ක්‍රම මගින් ආර්ථිකයක විධිමත් අංශයේ සිට අවිධිමත් අංශය කරා ආර්ථික සම්පත් ගලා යාමට සලස්වන බැවින්, රටක මූල්‍ය පද්ධතියෙහි සහ ආර්ථික ක්‍රියාකාරකම්වල සුමට ක්‍රියාකාරිත්වයට ද මෙම ක්‍රම අහිතකර ලෙස බලපෑ හැකිය. එබැවින් අවිධිමත් මුදල් ප්‍රේෂණ ක්‍රම රටක මූල්‍ය පද්ධතිය සහ ආර්ථිකය කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම් පිළිබඳව මෙම සටහන මගින් අවධාරණය කෙරේ. තවද, මෙම අවිධිමත් ප්‍රේෂණ ක්‍රම සියල්ලටම අඩු වැඩි වශයෙන් එකම ලක්ෂණ පවතින බැවින්, මේ සටහන මගින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් භාවිතා වන හවාලා මුදල් ප්‍රේෂණ ක්‍රමය කෙරෙහි අවධානය යොමු කරනු ඇති අතර, එය හවාලා මුදල් හුවමාරු/ප්‍රේෂණ ක්‍රමය හෝ අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම ලෙස මෙම සටහන තුල විටින් විට භාවිතා කරනු ලබයි.

හවාලා ගනුදෙනු පිළිබඳ හැඳින්වීමක්

ලොව පුරා විසිරි සිටින නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ජාලයන් ලෙස ක්‍රියාත්මක වන මෙම මුදල් ප්‍රේෂණ ක්‍රමයන් ඇතැම් විට සමාජයෙහි යම් නිශ්චිත ප්‍රජාවක් තුල මුදල් හුවමාරු කර ගැනීම සඳහා ක්‍රියාත්මක වනු දැක ගත හැකිය. ලොවපුරා විසිර පවතින මෙම ජාලයන්හි නියෝජිතයන් ගනුදෙනු වලට අදාළ මුදල් වටිනාකම් එකිනෙකා අතර හුවමාරු කර ගැනීමේ නියැලී සිටියි. හවාලා ක්‍රමය තුළ, හවාලා නියෝජිතයන් හෝ අලෙවිකරුවන් (Hawala Dars) විවිධ රටවල ජීවත් වන අතර ගනුදෙනු පියවීම් සම්පූර්ණයෙන්ම ඔවුනොවුන් අතර විශ්වාසය මත සිදු වේ. එක් රටක නියෝජිතයෙකු වෙනත් රටකට මුදල් යැවීමට අවශ්‍ය පුද්ගලයින්ගෙන් එම රටෙහිදී මුදල් එකතු කරන අතර මුදල් ලැබිය යුතු රටෙහි නියෝජිතයා එම මුදල්

5

අපේක්ෂිත ලබන්නන්ට ඔවුන් කැමති මුදල් වර්ගයකින් පියවනු ලබයි. මෙලෙස සිදුවන මුදල් ප්‍රේෂණයන්හි දී, දේශසීමා හරහා භෞතික මුදල් සංචලනයක් සිදු නොවේ, කිසිදු මූල්‍ය ආයතනයක් දේශසීමා ගනුදෙනුවලට සම්බන්ධ ද නොවේ. එමෙන්ම, මෙම ක්‍රමය යටතේ සිදුවන කිසිදු ගනුදෙනුවක් සඳහා නිසි ලෙස සටහන් තැබීමක් ද සිදු නොවේ. කෙසේ වෙතත්, ගනුදෙනුකරුවෙකුට එම මුදල් ගිණුමකට බැර කිරීමේ කිරීමේ අවශ්‍යතාවයක් පවතින අවස්ථාවක, අවශ්‍යනම් මූල්‍ය ආයතන හරහා එය සිදු කළ හැකිය.

හවාලා ක්‍රම භාවිතා කරන්නන්

ආර්ථිකයක සිටින විවිධ තරාතිරමේ පුද්ගලයන් සිය නීත්‍යානුකූල මෙන්ම නීත්‍යානුකූල නොවන අරමුණු සඳහා ද මෙම හවාලා ක්‍රම භාවිතා කරනු ලැබේ. නිදසුන් ලෙස අ) විදේශීය ශ්‍රමිකයන් තම මව් රටවල සිටින ඥාතීන් වෙත මුදල් යැවීම සඳහා, ආ) ආනයනය/අපනයන කරන ලද භාණ්ඩ සඳහා මුදල් ගෙවීම් සහ මුදල් ලබා ගැනීම් සඳහා, ඇ) දෙමාපියන් තම දරුවන්ගේ විදේශ අධ්‍යාපනය වෙනුවෙන් මුදල් යැවීම සඳහා, ඈ) අඩු සංවර්ධිත බැංකු ප්‍රවේශයන් පවතින ප්‍රදේශ වල ජීවත් වන පුද්ගලයින්ගේ මුදල් හුවමාරුව සඳහා, ඉ) නිසි වීසා ප්‍රේෂණ නොමැතිව විදේශගතවී සිටින සංක්‍රමණිකයන් සහ, ඊ) මුදල් විශුද්ධිකරණය කරන්නන් සහ ත්‍රස්තවාදයට මුදල් සපයන්නන් වැනි නීත්‍යානුකූල නොවන අයවලුන් සිය ගෙවීම් අවශ්‍යතා සඳහා.

හවාලා මුදල් ප්‍රේෂණ ක්‍රම වල ප්‍රධාන ලක්ෂණ

හවාලා ඇතුළු අවිධිමත් ප්‍රේෂණ ක්‍රමයන්හි පවතින ඒවාට අවේනික විශේෂිත ලක්ෂණ නිසා, මෙම ප්‍රේෂණ ක්‍රමයන් භාවිතා කරන්නන් සඳහා ආකර්ෂණීය වේ. එම විශේෂ ලක්ෂණ අතර පහසු ප්‍රවේශ්‍යතාව වැදගත් තැනක් ගනී. අවිධිමත් ප්‍රේෂණ ජාලයන්හි නියෝජිතයන් ලොව පුරා සෑම ප්‍රදේශයකම විසිරී පැතිරී සිටින බැවින් විධිමත් බැංකු පහසුකම් සීමිත හෝ නොමැති දුරස්ථ ප්‍රදේශ වල පවා ඕනෑම ආර්ථික ක්‍රියාකාරකමක් සඳහා මුදල් ප්‍රේෂණය කිරීම පිණිස ඔවුන්ගේ සේවාවන් ලබා ගත හැකිය. භාවිතා කරන්නන් සඳහා දැරිය හැකි මට්ටමේ සේවා ගාස්තු ද මේවායෙහි පවතින තවත් විශේෂ ලක්ෂණයකි. විධිමත් බැංකු මාර්ග හරහා අරමුදල් ප්‍රේෂණය කිරීමේදී අදාළ වන ගාස්තු සමඟ සසඳන විට හවාලා ගනුදෙනු හා සම්බන්ධ කොමිස් මුදල් වඩා ලාභදායි වේ. එසේම, ඇතැම් අවස්ථා වල, හවාලා නියෝජිතයින් විසින් පිරිනමනු ලබන විනිමය අනුපාතිකය විදේශ විනිමය සඳහා බලයලත් නියෝජිතයින් විසින් සිය ගනුදෙනුකරුවන්ට ලබා දෙන විනිමය අනුපතිකයන්ට වඩා ආකර්ශනීය වේ. ගනුදෙනුවල වේගවත් භාවයද මෙහිදී සැලකිය යුතු කරුණකි. මෙම අවිධිමත් මුදල් ප්‍රේෂණ ක්‍රම තුළ ව්‍යවහාර මුදල් සංචලනයක් සිදු නොවන අතර විදේශ මුදල් වටිනාකමට සමාන මුදලක් ලබන්නාගේ ගිණුමකට අරමුදල් තැන්පත් කිරීමක් ලෙස හෝ ලබන්නා වෙත ව්‍යවහාර මුදලින් කරනු ලබන ගෙවීමක් ලෙස මෙම ගනුදෙනු පියවනු ලැබේ. ඇතැම් අවස්ථාවලදී, පැය කිහිපයක් ඇතුළත ලබන්නා හට මුදල් සපයා දීමේ හැකියාවක් මෙම ක්‍රමය තුල පවතින අතර ඇතැම් විට අදාළ හවාලා නියෝජිතයාට ගනුදෙනුවෙහි මුරපදය හෙළි කිරීමෙන් පසු ඔවුන්ගේ නිවසටම මුදල් ලබා දීමක් සිදු වේ. ගනුදෙනු සිදු කිරීමේ ඇති පහසුවද මෙහි දැකිය හැකි තවත් ලක්ෂණයකි. කුවේට්, දකුණු කොරියාව සහ මාලදිවයින වැනි බොහෝ විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සිටින රටවල මෙම අවිධිමත් මුදල් හුවමාරු ක්‍රමයන්හි නියෝජිතයන් ඔවුන්ගේ වැඩබිම් වලදීම ප්‍රේෂණ මුදල් එකතු කර ගැනීමට ක්‍රියාත්මක වන බැවින් ප්‍රේෂණකරුට එය ඉතා පහසු වේ. මෙම නියෝජිතයින්ට සේවා පරිශ්‍රයන් තුලදීම සේවකයින්ගෙන් වැටුප් එකතු කිරීමේ යාන්ත්‍රණයන් ඇත. අවසානයේ මෙම මුදල් ඔවුන්ගේ පවුල් වෙත යැවීම මෙහි අරමුණයි. නිර්ණාමිකව ගනුදෙනු කිරීමේ ඇති හැකියාවද මෙම ක්‍රමවල දැකිය හැකි ලක්ෂණයකි. මෙය හවාලා හි වඩාත්ම ආකර්ෂණීය ලක්ෂණයයි. මෙලෙස ගනුදෙනු කිරීමේදී කඩදාසි හෝ ලේඛනගත සාක්ෂි අවශ්‍ය නොවේ. එබැවින් තම ගනුදෙනුවලදී රහස්‍ය භාවය රැකිය යුතු පුද්ගලයන්ට එය වක්‍ර ආරාධනාවකි. තවද, මෙම නියෝජිතයන් කිසිදු නියාමන අධීක්ෂණයකට යටත් නොවන බැවින් අරමුදල් මූලාශ්‍රයේ නීත්‍යානුකූලභාවය සේවා සපයන්නන් විසින් ප්‍රශ්න නොකෙරේ. සාමාන්‍යයෙන්, රටක විනිමය පාලන සහ මුදල් හුවමාරු සීමා කිරීම් සහ පාලනයන් වැඩි වන තරමට, විධිමත් අංශයේ ගනුදෙනුකරුවන් ද මෙම අවිධිමත් සේවාවන් ලබා ගැනීමට නැඹුරු වන බැවින් හවාලා සහ උන්ඩියල් වැනි ක්‍රියාකාරකම් ද එමගින් ඉහළ යනු ඇත.

හවාලා ක්‍රම හරහා සිදුකරන මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මගින් උපයන ලද නීති විරෝධී ඉපයීම් එක රටක සිට තවත් රටකට හුවමාරු කිරීම සඳහා මෙම අවිධිමත් මුදල් ප්‍රේෂණ ක්‍රම පහසු වේදිකාවක් සපයයි. මුදල් විශුද්ධිකරණය යනු සාපරාධී ක්‍රියාවලින් උපයගන්නා ලද නෛතික නොවන මුදල් නීත්‍යානුකූලව පිළිගත් මුදල් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියයි. මුදල් විශුද්ධිකරණය කිරීමේ ක්‍රියාවලිය මූලික වශයෙන් පියවර තුනකින් සමන්විත වේ. පළමු පියවර ලෙස නීති විරෝධී ක්‍රියාවලින් උපයන ලද මුදල් මූල්‍ය පද්ධතියේ එනම් බැංකු ගිණුම්වල තැන්පත් කිරීම හඳුනා ගත හැකිය. දෙවන පියවරේදී එලෙස තැන්පත් කරන ලද මුදල් තවදුරටත් කොටස් ලෙස වෙන්

5

කිරීම සිදු කරනු ලබයි. මෙය නීතිවිරෝධී ලෙස උපයනු ලැබූ අදයම්වල මූලාශ්‍රය වසන් කිරීම සඳහා කරනු ලබන ගනුදෙනු මාලාවකි. අවසාන පියවර වන්නේ නීතිවිරෝධී ක්‍රියාවලින් උපයන ලද ආදායම විධිමත් ආර්ථික පද්ධතියට අවශෝෂණය කර ගැනීමයි. ත්‍රස්තවාදයට මුදල් සැපයීම යනු ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සහ/හෝ සංවිධානවලට මුදල් සැපයීමේ වේ. ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ මූලාශ්‍රය නීත්‍යානුකූල හෝ නීති විරෝධී විය හැකිය. ත්‍රස්තවාදී කණ්ඩායම්වල න්‍යාය පත්‍ර ඉදිරියට ගෙන යාමට ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා අඛණ්ඩව මුදල් ගලා ඒම අත්‍යවශ්‍ය වේ. එබැවින් ත්‍රස්තවාදීන් විසින් ඔවුන්ගේ අරමුදල් අවශ්‍යතා සඳහා මෙවැනි ක්‍රම අවභාවිතා කරයි.

හවාලා ගනුදෙනු මුවාවෙන් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම කරනු ලබන ක්‍රම කිහිපයක් පවතී. මේවායෙහි පවතින අඩුපාඩු සහ ඍණාත්මක ප්‍රතිවිපාක හඳුනා ගැනීම සහ පාලනය කිරීම සඳහා නියමිත නියාමන රාමුවක් නොමැති වීම හේතුවෙන් මුදල් විශුද්ධිකරණයට සහ ත්‍රස්තවාදී කටයුතුවලට මුදල් සැපයීම වැනි අවදානම් කටයුතු සඳහා මෙම ක්‍රම අවභාවිත වේ. මෙම නියෝජිතයින් විසින් ගනුදෙනු පිළිබඳ වාර්තා නිසි ලෙස තබා ගැනීමේ ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකිරීම මෙමගින් මුදල් විශුද්ධීකරණයට සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට උදව් වන තවත් සාධකයක් වේ. බැංකු ක්ෂේත්‍රය හා සසඳන විට, මෙම ගනුදෙනු වල දී අරමුදල් මූලාශ්‍රය සහ භාවිතය පිළිබඳව අවධානය යොමු නොවීම ද මුදල් විශුද්ධිකරණය කරන්නන් සහ ත්‍රස්තවාදයට මුදල් සපයන්නන් දිරිමත් කිරීමට හේතු වේ. තවද නීතිමය කටයුතු ආරම්භ කිරීමට ඇති අපහසුව මෙහි තවත් කැපී පෙනෙන ලක්ෂණයක් වේ.

අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම භාවිතා කිරීමේ අවදානම

මුදල් හුවමාරු කිරීම සඳහා විධිමත් ක්‍රම වෙනුවට හවාලා වැනි අවිධිමත් ක්‍රම යොදාගැනීමේ ප්‍රතිඵලයක් ලෙස බොහොමයක් අවිහිංසක පුද්ගලයන් නීති බලාත්මක කරනු ලබන ආයතනවල විමර්ශනයන්ට අනවශ්‍ය පරිදි ලක් වීමේ අවධානමක් දැක ගත හැකිය. හවාලා මඟින් සිදුකරන ගනුදෙනු වලදී විධිමත් ගනුදෙනු වලදී භාවිතා කරන ගනුදෙනු උපකරණ (negotiable instruments) හෝ ප්‍රේෂණ මාධ්‍යයන් (wire transfers) කිසිවක් භාවිතා කිරීම කිසිඳු ආකාරයකින් සිදු නොවේ. ඒ වෙනුවට, හවාලා වෙළෙන්දන්/තැරැව්කරුවන් අතර සිදුවන සන්නිවේදනය මත පමණක් පදනම්ව මුදල් මාරු කිරීම් සිදු වේ. එබැවින්, ගනුදෙනුව සිදුකළ බවට ඔප්පු කිරීමට හැකියාවක් නොලැබෙන අතර, දුක් මහන්සියෙන් උපයාගත් මුදල් මෙම ක්‍රම හරහා වෙනත් රටකට යැවීමට කටයුතු කිරීමෙන් එම මුදල් අහිමි වීමට වුවද වැඩි ඉඩක් ඇත. ඇතැම් විට, ගනුදෙනු තුලනය කිරීමේ අරමුණින් හවාලා තැරැව්කරුවන් වංචා, මත්ද්‍රව්‍ය ජාවාරම් වැනි අපරාධමය ක්‍රියා සමග ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වී සිටී. එබැවින්, නීති බලාත්මක කරන ආයතන විසින් හවාලා තැරැව්කරුවන් විමර්ශනයට ලක් කිරීමේ වැඩි ඉඩකඩක් පවතී. එවන් අවස්ථාවකදී, අවිහිංසකව හෝ නොදන්නාකමින් හවාලා ක්‍රම භාවිතා කරනු ලබන පුද්ගලයින්ද නීති ක්‍රියාත්මක කරනු ලබන ආයතනවල නිලධාරීන්ගේ ප්‍රශ්නකිරීම්වලට ලක් වනු ඇත.

හවාලා ගනුදෙනු ක්‍රම මඟින් රටකට, මූල්‍ය වෙළඳපොලට සහ ආර්ථිකයට ඇති කරන බලපෑම

දේශසීමා අතර ක්‍රියාත්මක වන අවිධිමත් ගනුදෙනු හුවමාරු ක්‍රමහේතුවෙන් රටක මූල්‍ය වෙළඳපොළ, ආර්ථිකය සහ ජාතික ආරක්ෂාව මත අහිතකර බලපෑම් ඇති විය හැකිය. සැලකිය යුතු තරමේ අවිධිමත් මුදල් හුවමාරු ක්‍රමයන් පැවතීම හේතුවෙන් රටක අහිතකර බලපෑම් ඇති විය හැකි ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් පහත දැක්වේ.

බදු ආදායම අඩු වීම

අවිධිමත් ක්‍රම හරහා මුදල් ප්‍රේෂණය කිරීමට හවාලා මාධ්‍යන් තුළින් පුද්ගලයන් හා ආයතනවලට ඉඩකඩ ලබාදීම හේතුවෙන් බදු පැහැර හැරීමට මං සළසනු ලබයි. එවන් ගනුදෙනු හේතුවෙන් රජයට ආදායම් බදු හරහා ලැබෙන ඍජු බදු ආදායම් මෙන්ම වක්‍ර බදු ආදායම් ද අහිමි වේ. හවාලා ක්‍රම හරහා සිදුකරන ගනුදෙනු ලේඛනගත නොවීම නිසාත්, එම තොරතුරු දේශීය බදු අධිකාරීන්ට නොලැබීම නිසාත්, හවාලා ගනුදෙනු සිදු කරනු ලබන පුද්ගලයන්ගේ අදායම මෙන්ම හවාලා තැරැව්කරුවන්ගේ ආදායමද රටක බදු ආදායම යටතට නොගැනේ. තවද, ලියාපදිංචි ගාස්තු සහ අනෙකුත් සේවා බදු වැනි, විධිමත් මාධ්‍යන් හරහා සිදු කරනු ලබන ගනුදෙනුවලට අදාළ වක්‍ර බදු අහිමි වීම තුළින් රාජ්‍ය ආදායම කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇති කරනු ලබයි. තවද, රටක ආනයනකරුවන් සහ අපනයනකරුවන් විසින් භාණ්ඩ මත වන බදු පැහැර හැරීමේ අරමුණින් ද හවාලා ගනුදෙනු යොදාගනු ලබයි. නිදසුනක් වශයෙන්, ගණුදෙනු ලේඛනවල මිල ගණන් අඩුවෙන් සඳහන් කරන ලෙස ආනයනකරුවෙකු විසින් විදේශ අපනයනකරුවෙකුගෙන් ඉල්ලා සිටීම මගින් ආනයනකරු විසින් රජයට ගෙවිය යුතු බදු මුදල අඩුකරගත හැක. එවිට සැබෑ පිරිවැය සහ ලේඛන වල සටහන් කළ පිරිවැය අතර වෙනස හවාලා මාධ්‍යන් හරහා පියවා ගත හැකි අතර, එය බදු බලධාරීන්ගේ අවධානයට ලක් නොවනු ඇත.

රටක ගෙවුම් ශේෂය හා විදේශ සංචිත කෙරෙහි ඇති කරන බලපෑම

ශ්‍රී ලංකාව වැනි නැගී එන ආර්ථිකයන්හි ගෙවුම් තුලන (BOP) සහ විදේශ සංචිතවල ඉතා වැදගත් අංගයක් ලෙස ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ හඳුනා ගත හැකිය. ශ්‍රමිකයින් විසින් හවාලා වැනි අවිධිමත් ක්‍රම හරහා සිය ඉපයීම් ප්‍රේෂණය

5

කරන විට, ගෙවුම් තුලනය ගණනය කිරීමේදී එම ඉපැයීම් සැලකිල්ලට නොගැනේ. ගෙවුම් තුලනය වාර්තා කරනු ලබන තවත් සංරචක කිහිපයකටම (උදා: භාණ්ඩ වෙළෙඳාම) මෙය අදාළ වේ. ඒ අනුව, රටක විදේශ අංශයේ සැබෑ තත්ත්වය ගෙවුම් තුලන දත්ත තුළින් නිරූපණය නොවනු ඇත.

තවද, රටක විදේශ සංචිත ගොඩනැගෙනුයේ විධිමත් මාර්ග හරහා එවනු ලබන ප්‍රේෂණයන් හරහා බැවින් රටක විදේශ සංචිත ඉහළ නැංවීමෙහි ලා හවාලා හරහා කරනු ලබන ප්‍රේෂණයන් උපකාරී නොවනු ඇත. ඇත්ත වශයෙන්ම, විධිමත් හා අවිධිමත් මාධ්‍ය අතර මාරු වීම හේතුවෙන් එම සංචිත පහත යා හැකිය.

මුදල් සැපයුම මත ඇති කරන බලපෑම

භෞතික මුදල් සංචලනයක් සිදු නොවන බැවින් හවාලා ගනුදෙනු හේතුවෙන් ආර්ථිකයක පුළුල් මුදල් සැපයුම මත ඇතිකරන සෘජු බලපෑම ශුන්‍ය වේ. කෙසේ වෙතත්, මුදල් ලැබෙන රටේ පුළුල් මුදල් සැපයුමේ සංයුතිය හවාලා ගනුදෙනු හේතුවෙන් බලපෑමට ලක් විය හැකිය. ඊට හේතු වන්නේ හවාලා ගනුදෙනු භෞතික මුදල් භාවිතය කෙරෙහි නැඹුරු වීම නිසා බැංකු තැන්පතුවල (ඉතුරුම් හා කාලීන) අඩු වීමක් සිදු වන බැවිනි. හවාලා මාධ්‍යන් විසින් බැංකු ක්ෂේත්‍රය කෙරෙහි ඇති කරන සෘණාත්මක බලපෑම සහ මුදලට ඇති ඉල්ලුමේ අස්ථාවරත්වයක් ඇති කිරීමට සමත් වන ආකාරයේ මුදල් ආර්ථිකයක් නිර්මාණය වීම හරහා මූල්‍ය අතරමැදිකරණය සීමා විය හැකි අතර මුදල් ප්‍රතිපත්තියේ අකාර්යක්ෂමතාවයන් ඇති කරනු ඇති බව විද්වත් මතයයි.

මූල්‍ය අතරමැදිකරණය මත ඇති කරන බලපෑම

බැංකු පද්ධතියෙන් මුදල් කාන්දු වීම හේතුවෙන් බැංකු පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව සීමා විය හැකිය. එසේම, බැංකු විසින් ඉහළ පොලී අනුපාතයක් ප්‍රදානය කිරීම හරහා තැන්පතු ආකර්ෂණය කරගැනීමට උත්සාහ කරනවිට වෙළඳපොළ පොලී අනුපාත ඉහළ යාමේ හැකියාවක්ද ඇතිවිය හැකි බව මේ පිළිබඳව සිදු කර ඇති අධ්‍යනයන්හි සඳහන් කර ඇත. තවද, විකල්ප හා අවිධිමත් මුදල් ප්‍රේෂණ ක්‍රම හේතුවෙන් මූල්‍ය අතරමැදිකරණයේ සුවිශේෂී කාර්යන් ද තර්ජනයට ලක් විය හැකිය. හවාලා ජාලයන්හි වැඩිවීම හේතුවෙන් බැංකුවලට හිමි ඔවුන්ගේ වෙළඳපොළ කොටස අහිමි වීමේ හැකියාවක්ද පවතී.

ජාතික ආරක්ෂාව මත ඇති කරන බලපෑම

ලෝකයේ සිදුව ඇති මහා පරිමාණ ත්‍රස්තවාදී ප්‍රහාර කිහිපයක්ම අර්ධ වශයෙන් මූල්‍යනය වී ඇත්තේ හවාලා වැනි ක්‍රම හරහා බැවින් එවැනි අවිධිමත් ක්‍රම පැවතීම ජාතික ආරක්ෂාව සම්බන්ධ ආයතනවලට අභියෝගයක් වේ.

හවාලා යනු නීතිවිරෝධී කටයුතු සඳහා ඇති වෙළෙඳපොළවල් වල මුදල් ගනුදෙනු සිදුවන ක්‍රමයක් ලෙස හඳුනා ගත හැකි අතර, ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ යම් යම් මූලාශ්‍රයන් සඳහා අවිධිමත් මාධ්‍යන් යොදා ගන්නා බැවින් එය ත්‍රස්තවාදී මූල්‍යනයට එරෙහි සටනේ ඵලදායිත්වයටද තර්ජනයක් ලෙස සැළකේ. ඒ අනුව මෙවන් ක්‍රම ව්‍යාප්ත වීම නැවැත්වීමටත් ත්‍රස්තවාදීන් විසින් හවාලා මාධ්‍යන් යොදා ගැනීම නැවැත්වීමටත් සෑම උත්සාහයක්ම ගත යුතුව ඇත.

ශ්‍රී ලංකාව සහ හවාලා අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම වල වර්ධනය

වසංගතය අතරතුර ශ්‍රමකියින් විදේශ රටවලට පිටත්වීම අඩුවීමත් ශ්‍රී ලංකාවේ විධිමත් වෙළෙඳපොළ හා අවිධිමත් වෙළෙඳපොළ අතර විශාල විනිමය අනුපාත වෙනස්කම් පැවතීම හේතුවෙන් මුදල් ප්‍රේෂණය සඳහා හවාලා ක්‍රම බහුලවම යොදා ගැනීම නිසාත් වසර 2021 දී විගාමික ශ්‍රමිකයන් විසින් ශ්‍රී ලංකාව වෙත කරනු ලබන ප්‍රේෂණහි කැපී පෙනෙන අඩු වීමක් නිරීක්ෂණය වී ඇත.

හවාලා නියෝජිතයින් විසින් ප්‍රදානය කරනු ලැබූ ආකර්ෂණිය ඉහල විදේශ විනිමය විනිමය අනුපාතික හේතුවෙන් විගාමික සේවකයින් මුදල් එවීම සඳහා විධිමත් බැංකු පද්ධතියෙන් දුරස් වී හවාලා ක්‍රම වෙත නැඹුරුතාවයක් දැකගත හැකිවිය. 2021 දී සේවක ප්‍රේෂණවල දැඩි පහත වැටීම ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන තත්ත්වයට අහිතකර ලෙස බලපෑම් ඇති කරන ලදී. එසේම, බැංකු පද්ධතිය තුළ පැවති විදේශ මුදල් සැපයුමේ හිඟය හේතුවෙන්, ශ්‍රී ලංකාවේ ආනයනකරුවන්ද තම ආනයන බිල්පත් ගෙවීමට හවාලා ක්‍රම භාවිතා කරන ලද බව වාර්තා වේ.

සමස්තයක් වශයෙන් ගත් කළ, මෑත කාලයේ හවාලා ක්‍රමවල ජනප්‍රියතාවය නිසා, විධිමත් මාර්ග හරහා රටට තීරණාත්මක විදේශ මුදල් ප්‍රවාහයන් ලැබීම අහිමි වී ඇති අතර, ඒ හරහා විදේශ විනිමය සැපයුම අඩාල වීම සහ විදේශ මුදල් සංචිත අඩු වීම ආදිය හේතුවෙන් ගෙවුම් තුලනය සඳහා ද බලපෑම් ඇති වී ඇත. මේ අනුව හවාලා ක්‍රම ව්‍යාප්ත වීම ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලන තත්ත්වයට සැලකිය යුතු තර්ජනයක් එල්ල කරයි. කෙසේ වෙතත්, වෙළෙඳපොළ ඉල්ලුම හා සැපයුම මත පදනම්ව තරගකාරී විනිමය අනුපාතයක් ලබා දීමට විධිමත් මුදල් හුවමාරු ක්‍රමවලට හැකියාව පවතින්නේනම්, විනිමය අනුපාත අතර වෙනස්කම් බොහෝ දුරට අවම කරගත හැකි බැවින් ඒ හරහා අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම සඳහා ඇතිවන ඉල්ලුම අවම කිරීමට හැකියාව ලැබෙනු ඇත.

හවාලා ක්‍රම වලට එරෙහිව ගත් මෑතකාලීන ක්‍රියාමාර්ග

පෙර සඳහන් කළ පරිදි, ආර්ථිකයට එල්ල වූ දැඩි තර්ජනයන් හේතුවෙන් රට තුළ හවාලා ක්‍රම ව්‍යාප්ත වීම පාලනය කිරීමේ ප්‍රයත්නයන් 2021 වසර

5

තුළදී ක්‍රියාත්මක කරන ලදී. හවාලා ගණුදෙනුවල ඇති අවදානම පිළිබඳව මහජනතාවගේ දැනුම්වත්භාවය වැඩි කිරීම සඳහා පුවත්පත්වල ලිපි හා දැන්වීම් පළ කිරීම ද ඇතුළුව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. තවද, නීතිරෝධී කටයුතුවලට සම්බන්ධ අරමුදල් මෙම ගිණුම් හරහා ගනුදෙනු වී ඇත්ද යන වග විමර්ශන මගින් තහවුරු වන තුරු එවැනි ගණුදෙනු වල යෙදුනු ගිණුම්වල මුදල් ගණුදෙනු සඳහා යොදා ගැනීමේ හැකියාව අත්හිටුවන ලදී. තවද, බැංකු හා අනෙකුත් මූල්‍යායතන වැනි විධිමත් මාර්ග හරහා විදේශ ශ්‍රමිකයන් තම ඉපයීම් ප්‍රේෂණය කිරීමට දිරි ගැන්වීම සඳහා අමතර මුදලක් පිරිනැමීම වැනි මූල්‍ය දිරිගැන්වීම් ද හඳුන්වාදෙන ලදී. තවද, විධිමත් ප්‍රේෂණ ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ අවිධිමත් ක්‍රම භාවිතය අධෛර්යමත් කිරීමේ අරමුණින් විදෙස්ගත ශ්‍රමිකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ සහ විදේශ ප්‍රේෂණ සඳහා ණය පහසුකම් වැනි වෙනත් දිරි ගැන්වීම් යෝජනා කරන ලදී.

ඉදිරි දැක්ම

හවාලා ක්‍රම පැවතීම ගෝලීය ආර්ථිකයට විශාල අවදානමක් ඇති කරන අතර මෙම ක්‍රම විශාල වශයෙන් ව්‍යාප්ත වීමේ තර්ජනය හේතුවෙන් විවිධ රටවල් විසින් විවිධ උපක්‍රම භාවිතා කරමින් මෙවැනි ක්‍රම මගින් ඇති විය හැකි අහිතකර බලපෑම් අවම කිරීමට කටයුතු කර ඇත. ඉන්දියානු සංචිත බැංකුවේ කොන්දේසි සහිත අනුමැතියකින් තොරව ඉන්දියාවෙන් පිටත ඕනෑම පුද්ගලයෙකුට ගෙවීමක් කිරීම තහනම් කිරීම මගින් ඉන්දියාව තුළ හවාලා ගණුදෙනු සඳහා සීමා පනවා ඇත. මීට අමතරව, විධිමත් මූල්‍ය අංශයට ප්‍රවේශ වීම සඳහා ග්‍රාමීය ප්‍රදේශවල වාණිජ බැංකු ශාඛා පිහිටුවීම වැනි ක්‍රියා මාර්ග ද විධිමත් මූල්‍ය සේවාවන් හි ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා ඉන්දීය සංචිත බැංකුව විසින් ක්‍රියා මාර්ග ද ගෙන ඇති අතර හවාලා ක්‍රමවල බලපෑම පාලනයට මුදල් හුවමාරු සේවා ක්‍රම වෙත ප්‍රවේශ වීමට බැංකු නොවන මූල්‍ය අංශයට අවසර ලබා දී ඇත. ඉන් අනතුරුව ඉන්දීය රජය විසින් 1970 දශකයේදී මූල්‍ය විනිමය කළමණාකරන පනත (Financial Exchange Management Act) බලාත්මක කරන ලදී. එසේම, මුදල් හුවමාරු කරන ආයතන විදේශීය විනිමය හුවමාරු සමාගම් බවට පරිවර්තනය කිරීම සඳහා පකිස්තානය ද පියවර ගෙන ඇති අතර එහිදී ඔවුන්ට ලියාපදිංචි වීමට සහ අදාළ නියාමනයන්ට අනුකූල වීමට වසර දෙකක කාලයක් ලබා දෙන ලදී. මූල්‍ය කාර්ය සාධක බලකාය 2013 වසරේදී මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීමෙහි හවාලා සහ අනෙකුත් සමාන සේවා සපයන්නන්ගේ භූමිකාව යන මැයෙන් කරන ලද ප්‍රකාශනය මගින්, නියාමනය නොකළ හවාලා සහ අනෙකුත් සමාන සේවා සපයන්නන් හඳුනා ගැනීමේ උපායමාර්ග සහ ඔවුන්ගේ ව්‍යාපාර විධිමත් කිරීමට දිරි ගැන්වීම් ඇති කළ හැකි මාර්ග පැහැදිලිව විස්තර කර ඇත. මේ වන විට ශ්‍රී ලංකාවේ හවාලා ක්‍රම නිරීක්ෂණය කිරීම සහ නීත්‍යානුකූල රාමුවකට ගෙන ඒම සඳහා සුදුසු නීතිමය අවශ්‍යතා ඇති කොට ක්‍රියාත්මක කිරීමට පියවර ගැනීමට බලධාරීන් සැලසුම් කර ඇත.

මූලාශ්‍ර

1. Chene, M., 2008. Hawala Remittance System and Money Laundering, U4 Help Desk, Transparency International. [online] U4.no. Available at: <https://www.u4.no/ publications/hawala-remittance-system-and-money-laundering.pdf> [Accessed 18 March 2022].
2. Qorchi, M., Maimbo, S. and Wilson, J., 2003. Informal Funds Transfer Systems An Analysis of the Informal Hawala System. [online] Available at: <https://www.imf.org/external/pubs/nft/op/222/index.htm> [Accessed 18 March 2022].
3. Mumin, D., 2014. The Implications of Hawala Remittance System to The Somali Businesses: A Case Study of Eastleigh, Nairobi. [online] Erepo.usiu.ac.ke. Available at: <http://erepo.usiu.ac.ke/bitstream/handle/11732/48/Deeqo.pdf?isAllowed=y&sequence=1> [Accessed 18 March 2022].
4. Passas, N., 2003. Informal Value Transfer Systems, Terrorism and Money Laundering A Report To The National Institute Of Justice. [online] Ojp.gov. Available at: <https://www.ojp.gov/pdffiles1/nij/grants/208301.pdf> [Accessed 18 March 2022].
5. El Qorchi, M., Maimbo, S. and Wilson, J., 2003. Informal Funds Transfer Systems: An Analysis of the Informal Hawala System. Occasional Papers, [online] Available at: <https://doi.org/10.5089/9781589062269.084> [Accessed 7 April 2022].

5

පිටත්ව යන සංක්‍රමණික ශ්‍රමිකයින් සංඛ්‍යාව වැඩි වීමත් සමඟ, 2022 වසරේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස නැවත යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ. බැංකු අංශය හරහා ලැබෙන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා පහසුකම් සැලසීමට මහ බැංකුව විසින් 'විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසු කිරීමේ දෙපාර්තමේන්තුව' නමින් නව දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කරන ලද අතර, බැංකු අංශය හරහා මුදල් ප්‍රේෂණ කරනු ලබන ශ්‍රමිකයන් සඳහා දිරිගැන්වීමේ යෝජනා ක්‍රම රැසක් ද හඳුන්වා දෙන ලදී. තවද, බොහෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහභාගීත්වයෙන් ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම විසින්, පහසුවෙන් ප්‍රේෂණ මාරු කිරීමට පහසුකම් සැලසීම සඳහා "ලංකා රෙමිට්" නමින් ජංගම යෙදුමක් දියත් කරන ලදී. රුපියල්වලට පරිවර්තනය කරන ලද ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ සඳහා නිල විනිමය අනුපාතිකයට වඩා වැඩි තාවකාලික මූල්‍ය දිරිගැන්වීමක් ලබා දුන් අතර, සංක්‍රමණික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සුභසාධනය වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා තවත් දිරිගැන්වීම් යෝජනා ක්‍රම කිහිපයක් ඉදිරියේ දී හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ.

5.3 ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

2021 වසරේ දී ප්‍රාග්ධන ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම් සමස්තයක් ලෙස නොවෙනස්ව පැවතුණි. පෙර වසර සමඟ සැසඳීමේ දී, 2021 වසරේ දී රජය වෙත වූ ප්‍රාග්ධන සංක්‍රාම පහළ ගිය අතර, පෞද්ගලික අංශය වෙත වූ ප්‍රාග්ධන සංක්‍රාම වැඩි වීමක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රාග්ධන ගිණුමෙහි 2020 වසරේ වූ එ.ජ. ඩොලර් මිලියන 28ක අතිරික්තය සමඟ සැසඳීමේ දී 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 25ක අතිරික්තයක් වාර්තා කළේය.

5.4 මූල්‍ය ගිණුම

ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුමෙහි, 2021 වසරේ දී වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළ අතර, වගකීම්වල ශුද්ධ වෙනස්වීම් ඉහළ ගියේය. වගකීම්වල ශුද්ධ වෙනස්වීම්, 2020 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 1.7ක අඩුවීමට සාපේක්ෂව, 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 1.9ක වැඩිවීමක් වාර්තා කළේය. කොවිඩ්-19 වසංගතය සහ දේශීය තත්ත්වයන් හමුවේ පවතින අඛණ්ඩ අවිනිශ්චිතතාවය පිළිබිඹු කරමින්, සෘජු ආයෝජන ව්‍යාපාර ලබාගත් විදේශීය ණය ද ඇතුළු විදේශීය සෘජු ආයෝජන, පෙර වසරේ දී මෙන්ම 2021 වසරේ දී ද මධ්‍යස්ථව පැවතුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සෘජු ආයෝජන ව්‍යාපාර ලබාගත් විදේශීය ණය ද ඇතුළු විදේශීය සෘජු ආයෝජන, 2020 වසරේ දී ලද එ.ජ. ඩොලර් මිලියන 670ට සාපේක්ෂව, 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 784ක් ලෙස වාර්තා විය. තවද, සෘජු ආයෝජන ව්‍යාපාර ලබාගත් විදේශීය ණය ඇතුළත් නොවූ විදේශීය සෘජු ආයෝජන, 2020 වසරේ දී වාර්තා කරන ලද එ.ජ. ඩොලර් මිලියන 434ට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 598ක් විය. අංශ අනුව සැලකීමේ දී, විදේශීය සෘජු ආයෝජන ප්‍රධාන වශයෙන් ලැබී ඇත්තේ විදුලි සන්දේශ, දේපළ සංවර්ධනය, ඇඟලුම් සහ හෝටල් යන අංශවලට අදාළ ව්‍යාපෘතිවලට වන අතර, එම විදේශීය සෘජු ආයෝජන මූලික වශයෙන් ලැබී ඇත්තේ දැනටමත් ස්ථාපිත සෘජු ආයෝජන ව්‍යාපාර සඳහාය. 2021 වසරේ දී විදේශීය සෘජු ආයෝජන මධ්‍යස්ථ වුව ද, ඉදිරි අනාගතයේ දී, විශේෂයෙන්ම කොළඹ වරාය නගරයට සහ හම්බන්තොට වරාය ව්‍යාපෘතියට විදේශීය සෘජු ආයෝජන ලැබීම් වාර්තා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, නාගරික සංවර්ධන අධිකාරිය යටතේ පවතින ඌන උපයෝජිත වත්කම්වලින් මුදල් ඉපැයීමට ද ප්‍රයත්න ක්‍රියාත්මක වන අතර, රටෙහි විදේශීය සෘජු ආයෝජන වෙනුවෙන් එම ලැබීම් ද දායක වනු ඇත.

2021 වසරේ දී රජයට ලැබුණු ප්‍රධාන මූල්‍ය ලැබීම් අතරට 2021 වසරේ අප්‍රේල් සහ සැප්තැම්බර් මාසවල දී චීන සංවර්ධන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 810ක පමණ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් දෙකක් ඇතුළත් විය. මීට අමතරව, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල සහ රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙත වූ විදේශීය ආයෝජන වලින් සමන්විත ණය සුරැකුම්පත් ආකාරයෙන් වූ ආයෝජන, 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 670ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. අනේවාසිකයන්ට ගෙවීමට තිබූ එ.ජ.ඩොලර් මිලියන 700ද ඇතුළත් එ.ජ. ඩොලර් බිලියන 1.0ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය 2021 වසරේ ජූලි මාසයේ දී කල් පිරීම, රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජනවල ශුද්ධ ගෙවීම් සහ වසර තුළ දී ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආශ්‍රිතව අනේවාසිකයන් විසින් ද්විතීයික වෙළෙඳපොළ වෙතින් සිදුකළ ශුද්ධ මිලදී ගැනීම්වල ශුද්ධ බලපෑම මේ සඳහා හේතුවිය. 2021 වසරේ අගෝස්තු මාසයේ දී ජා.මූ. අරමුදල වෙතින් වි.ගැ.හි. වෙන් කිරීමෙන් වූ ලැබීම (එ.ජ. ඩොලර් මිලියන 787ක් පමණ) සහ 2021 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී බංගලාදේශ බැංකුව සමඟ සිදුකළ ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකමෙහි ලැබීම් (එ.ජ. ඩොලර් මිලියන 200) ඇතුළුව, මහ බැංකුවට ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය. තවද, මහ බැංකුව විසින් 2021 වසරේ මාර්තු මාසයේ දී චීන මහජන බැංකුව සමඟ ඇතිකර ගත් එ.ජ. ඩොලර් බිලියන 1.5කට පමණ සමාන වූ ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම 2021 වසරේ දෙසැම්බර් මාසයේ දී සක්‍රීය කරන ලදී. තවද, 2020 වසරේ දී ඉන්දියානු සංචිත බැංකුවෙන් ලබාගත් එ.ජ. ඩොලර් මිලියන 400ක විදේශ විනිමය හුවමාරු පහසුකම වසර තුළ දී මහ බැංකුව විසින් පියවන ලදී. මේ අතර, පෞද්ගලික අංශය වෙත වූ මූල්‍ය ලැබීම් 2021 වසරේ දී මධ්‍යස්ථ විය. ඒ අනුව, කොළඹ කොටස් වෙළඳපොළෙහි සෘජු ආයෝජන ගනුදෙනු නොවන විදේශීය ආයෝජනවලින් සමන්විත හිමිකම් ආකාරයෙන් වූ විවිධ ආයෝජන, 2020 වසරේ දී වූ එ.ජ. ඩොලර් මිලියන 217ක ශුද්ධ ගෙවීමට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 236ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. තවද, පෞද්ගලික අංශයට සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත වූ විදේශීය ණය ලැබීම් ද 2021 වසරේ දී

5

5.11 රූප සටහන
මූල්‍ය ගිණුම



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

5.9.අ. සංඛ්‍යා සටහන
මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

ශීර්ෂය	2020 (අ)		2021 (ආ)	
	මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්	වගකීම්හි ශුද්ධ වෙනස්වීම්	මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්	වගකීම්හි ශුද්ධ වෙනස්වීම්
මූල්‍ය ගිණුම	**-2,113**	**-1,718**	**-2,122**	**1,907**
සෘජු ආයෝජන	**15**	**434**	**17**	**598**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්	10	211	13	317
ප්‍රති ආයෝජිත ඉපැයුම් නොවන හිමිකම්	7	20	9	27
සෘජු ආයෝජකයින් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි	7	20	9	27
ප්‍රති ආයෝජිත ඉපැයුම්	3	191	4	290
ණය උපකරණ	4	223	5	281
සෘජු ආයෝජකයින් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි	4	223	5	281
විවිධ ආයෝජන	**-**	**-2,383**	**-**	**-906**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්	-	-217	-	-236
ණය සුරැකුම්පත්	-	-2,166	-	-670
රජය	-	-2,166	-	-670
කෙටි කාලීන (භාණ්ඩාගාර බිල්පත්)	-	-122	-	-2
දිගු කාලීන	-	-2,044	-	-668
භාණ්ඩාගාර බැඳුම්කර	-	-431	-	-25
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	-	22	-	-2
ස්වෛරීත්ව බැඳුම්කර	-	-1,635	-	-640
නිකුතු	-	-	-	-
කල්පිරීම්	-	-859	-	-700
ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු	-	-776	-	60
මූල්‍ය ව්‍යුත්පන්න	-	-	-	-
අනෙකුත් ආයෝජන	**-136**	**231**	**387**	**2,216**
මුදල් සහ තැන්පතු	64	-15	306	4,016
මහ බැංකුව	-	400	-	1,375
කෙටි කාලීන	-	...	-	1
දිගු කාලීන	-	400	-	1,374
තැන්පතු භාරගන්නා ආයතන	64	-415	306	2,641
කෙටි කාලීන	259	-415	256	2,641
දිගු කාලීන	-194	-	50	-
පිටු අංක 176 හා සම්බන්ධයි				
විශේෂිත අයිතමයන්				
විදේශීය සෘජු ආයෝජන				
හිමිකම්		20		27
ප්‍රති ආයෝජිත ඉපැයුම්		191		290
අන්තර් සමාගම් ණය		223		281
මුළු විදේශීය සෘජු ආයෝජන (1)		**434**		**598**
ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට ලබා දුන් ණය (2)		236		187
ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට ලබා දුන් ණයද ඇතුළුව මුළු විදේශීය සෘජු ආයෝජන (1+2) (ඇ)		**670**		**784**
කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ මුළු ශුද්ධ ලැබීම්		**-225**		**-238**
සෘජු ආයෝජන		-8		-2
විවිධ ආයෝජන		-217		-236
රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත්හි ශුද්ධ විදේශීය ආයෝජන (භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර)		**-553**		**-27**
විදේශීය මිල දී ගැනීම්		120		17
විදේශීය විකුණුම්		673		44

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ ඇස්තමේන්තු සමඟ සසඳන විට යම් වෙනසක් වේ නම් එසේ වනුයේ ආවරණ සහ ගණනය කිරීමේ ක්‍රමවේදයන්හි වෙනස්කම් හේතුවෙනි.

මධ්‍යස්ථ ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. මේ අතර, බැංකු අංශය වෙත වූ විදේශීය ලැබීම් සැලකීමේ දී, මුදල් හා තැන්පතු සැලකිය යුතු ශුද්ධ වැඩිවීමක් වාර්තා කර ඇති අතර, බැංකු අංශයේ කෙටි කාලීන විදේශීය ණය වගකීම්වල සැලකිය යුතු ශුද්ධ පියවීම් ප්‍රමාණයක් වාර්තා විය. ප්‍රධාන වශයෙන් වසංගත කාලපරිච්ඡේදවල දී ඉන්ධන සඳහා ඉල්ලුම අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඛනිජ තෙල් බිල්පත් සඳහා සිදුකළ ශුද්ධ පියවීම් හමුවේ වෙළඳ ණය සහ අත්තිකාරම් වගකීම්වල ශුද්ධ වෙනස් වීම් අඩු විය. තවද, මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිශ්කාෂණ සංගමයට අදාළ වගකීම්වලින් ප්‍රධාන වශයෙන් සමන්විත ගෙවිය යුතු අනෙකුත් ගිණුම්, 2021 වසරේ දී ශුද්ධ වැඩිවීමක් වාර්තා කළේය.

2021 වසරේ දී දළ නිල සංචිත පහත වැටීම පිළිබිඹු කරමින් මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ විදේශීය වත්කම් අඩුවීම හේතුවෙන්, මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 2.1කින් අඩු විය. රජයේ සැලකිය යුතු විදේශීය ණය සේවාකරණ ගෙවීම්, මහ බැංකුවේ කල් පිරෙන වගකීම් පියවීම මෙන්ම විශේෂයෙන් 2021 වසරේ අවසාන කාලපරිච්ඡේදය තුළ දී ඉන්ධන, එල් පී ගෑස්, ගල් අඟුරු, ඖෂධ සහ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීමට පහසුකම් සැලසීම සඳහා මහ බැංකුව විසින් විදේශ විනිමය සැලකිය යුතු ලෙස සැපයීම හේතුවෙන් 2021 වසර තුළ දී දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 2.5කින් අඩු විය. කෙසේ වෙතත්, තැන්පතු භාරගන්නා ආයතනවල මුදල් හා තැන්පතු ආකාරයෙන් වූ වත්කම්හි ශුද්ධ

5

5.9.ආ සංඛ්‍යා සටහන
මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

ශීර්ෂය	2020 (අ)		2021 (ආ)	
	මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්	වගකීම්හි ශුද්ධ වෙනස්වීම්	මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්	වගකීම්හි ශුද්ධ වෙනස්වීම්
අනෙකුත් ආයෝජන (පිටු අංක 175 හා සම්බන්ධයි)				
ණය	-	174	-	-1,552
මහ බැංකුව	-	-14	-	-57
ජා.මූ. අරමුදලෙන් ලද ණය	-	-14	-	-57
විස්තීර්ණ ණය පහසුකම	-	-14	-	-57
තැන්පතු භාරගන්නා ආයතන	-	75	-	-2,152
කෙටි කාලීන	-	403	-	-2,169
දිගු කාලීන	-	-328	-	17
රජය	-	169	-	664
දිගු කාලීන	-	169	-	664
අනෙකුත් අංශ (ඇ)	-	-56	-	-7
දිගු කාලීන	-	-56	-	-7
වෙළඳ ණය සහ අත්තිකාරම්	-224	185	257	-428
තැන්පතු භාරගන්නා ආයතන	9	-	-3	-
කෙටි කාලීන	9	-	-3	-
අනෙකුත් අංශ (ඇ)	-233	185	260	-428
කෙටි කාලීන	-233	185	260	-428
අනෙකුත් ලැබිය යුතු / ගෙවිය යුතු ගිණුම්	24	-114	-176	180
මහ බැංකුව	-	-114	-	180
කෙටි කාලීන (ඉ)	-	-114	-	180
තැන්පතු භාරගන්නා ආයතන	24	-	-176	-
කෙටි කාලීන	24	-	-176	-
විශේෂ ගැනුම් හිමිකම්	-	-	-	787
සංචිත වත්කම්	**-1,992**		**-2,526**	
මූල්‍ය රත්‍රන්	-667		-212	
විශේෂ ගැනුම් හිමිකම්	-5		123	
ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම	-		-	
අනෙකුත් සංචිත වත්කම්	-1,319		-2,437	
මුදල් සහ තැන්පතු	-177		1,536	
මූල්‍ය අධිකාරියේ හිමිකම්	-1,092		1,055	
අනෙකුත් ආයතනයන්හි හිමිකම්	914		481	
සුරැකුම්පත්	-1,143		-3,976	
ණය සුරැකුම්පත්	-1,143		-3,976	
දිගු කාලීන	-1,143		-3,976	
අනෙකුත් හිමිකම්	1		3	
මූල්‍ය ගිණුම (ශුද්ධ)	**-394**		**-4,029**	
විශේෂිත අයිතමයන්				
රජයේ දිගු කාලීන ණය (ශුද්ධ)		**169**		**664**
ලැබීම් (ණය මුදා හැරීම්)		1,882		2,418
ව්‍යාපෘති ණය		1,382		1,608
විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම්		500		810
ගෙවීම්		1,713		1,754

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික අංශයේ සමාගම් ඇතුළත් වේ.
(ඇ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්වල වෙළඳ ණය ඇතුළත් වේ.
(ඉ) ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම්වල ශුද්ධ ගනුදෙනු ඇතුළත් වේ.

5.10 සංඛ්‍යා සටහන
2021 වසර තුළ විදේශ ණය මගින් මූල්‍යනය කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන්

දායකයා සහ ව්‍යාපෘතිය	ලැබුණු ණය මුදල එ.ජ. ඩොලර් මිලියන
රජයේ ව්‍යාපෘතීන් මුළු එකතුව	**1,608**
එයින්;	
ආසියානු සංවර්ධන බැංකුව	**613**
එයින්;	
ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන	221
ද්විතීයික අධ්‍යාපන අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන	52
මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන	42
ජාත්‍යන්තර සංවර්ධන සංගමය	**294**
එයින්;	
දේශගුණික බලපෑම් අවම කරවීම් කළමනාකරණය	36
උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය	28
ජපානය	**135**
එයින්;	
කැළණි ගඟ හරහා නව පාලමක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය	51
ජාතික සම්ප්‍රේෂණ සහ බෙදාහැරීමේ ජාල සංවර්ධනය සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	34
ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව	**131**
එයින්;	
කොවිඩ්-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය	54
ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය	42
චීන අපනයන - ආනයන බැංකුව	**126**
එයින්;	
මහනුවර උතුරු පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	54
දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය	36
මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සහ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම	34
ඉන්දියානු අපනයන - ආනයන බැංකුව	**81**
එයින්;	
දුම්රිය අංශය සංවර්ධනය සඳහා වූ ඩොලර් ණය	80
ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය	**27**
එයින්;	
අඹතලේ ජල සම්පාදන පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය	10
ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව	**22**
එයින්;	
කොළඹ නාගරික පුනර්ජනන ව්‍යාපෘති සඳහා සහාය වීම	19
නෙදර්ලන්ත රබෝ බැංකුව (Robo Bank)	**22**
එයින්;	
කළුතර මහ රෝහල සංවර්ධනය	13

මූලය: මුදල් අමාත්‍යාංශය

අත්කර ගැනීම් සහ ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් විසින් ඔවුන්ගේ විදේශීය වෙළඳ හවුල්කරුවන් වෙත ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම් නිරූපණය කරන වෙළඳ ණය සහ අත්තිකාරම් මත වන වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් වසර තුළ දී ඉහළ ගිය අතර, බලපත්‍රලාභී වාණිජ බැංකුවල අනෙකුත් ලැබිය යුතු ගිණුම් වසර තුළ දී ශුද්ධ අඩුවීමක් වාර්තා කළේය.

5.5 සමස්ත ශේෂය

ශුද්ධ ජාත්‍යන්තර සංචිතවල වෙනස නිරූපණය කරන ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂය 2021 වසරේ දී අඛණ්ඩව සැලකිය යුතු හිඟයක් වාර්තා කළේය. වසර තුළ දී මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඛණ්ඩව මධ්‍යස්ථ වීම, සිදුකළ සැලකිය යුතු මට්ටමේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සිදු කළ ශුද්ධ විකුණුම් හේතුවෙන් දළ නිල සංචිත, 2021 වසර තුළ දී සැලකිය යුතු ලෙස පහත වැටුණි. ඒ අනුව, ශුද්ධ ජාත්‍යන්තර සංචිත 2021 වසර අවසානයේ දී හිඟයක් වාර්තා කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේ දී සමස්ත ශේෂයෙහි වූ එ.ජ. ඩොලර් බිලියන 2.3ක හිඟයකට සාපේක්ෂව 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 4.0ක පමණ හිඟයක් වාර්තා කළේය.

5.6 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

අන්තර්ජාතික ආයෝජන තත්ත්වය අනුව 2020 වසර අවසානයේ සිට 2021 වසර අවසන් වන විට ශ්‍රී ලංකාවේ විදේශීය වගකීම් තත්ත්වය ඉහළ ගිය අතර, විදේශීය වත්කම් තත්ත්වය පහළ ගියේය. ඒ අනුව, රටෙහි විදේශීය වගකීම් තත්ත්වය 2020 වසර අවසාන වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 58.6ක සිට 2021 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 64.5ක් දක්වා වැඩි වූ අතර, රටෙහි විදේශීය වත්කම් තත්ත්වය 2020 වසර අවසාන වන විට වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 10.9ක සිට 2021 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 8.8ක් දක්වා අඩු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි ශුද්ධ වගකීම් තත්ත්වය 2020 වසර අවසාන වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 47.7ක සිට 2021 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 55.7ක් දක්වා වැඩි විය.

අනේවාසිකයන් සතුව ඇති ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම් තත්ත්වය 2021 වසර තුළ සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන්, 2020 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 5.7ක් වූ දළ නිල සංචිත 2021 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් බිලියන 3.1ක් දක්වා අඩු වීම හේතුවෙන් විදේශීය වත්කම් තත්ත්වය අඩු විය.[1] මේ අතර, නේවාසික ශ්‍රී ලාංකිකයන් විදේශයන්හි සිදු කරන ඍජු ආයෝජන නිරූපණය කරන ඍජු ආයෝජන වත්කම් තත්ත්වය වසර තුළ දී සුළු වශයෙන් වැඩි විය. තැන්පතු භාරගන්නා ආයතනවල මුදල් හා තැන්පතු ආකාරයෙන්

1 විදේශ සංචිත තත්ත්වයෙහි සවිස්තරාත්මක විශ්ලේෂණයක් 5.6.1 කොටසෙහි අන්තර්ගත වේ.

5.11 සංඛ්‍යා සටහන

අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

ශීර්ෂය	2020 (අ)		2021 (ආ)	
	වත්කම්	වගකීම්	වත්කම්	වගකීම්
ඍජු ආයෝජන (ඇ)	**1,509**	**13,655**	**1,522**	**17,891**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්	1,473	8,665	1,482	12,626
ණය උපකරණ	36	4,990	40	5,264
විවිධ ආයෝජන	**...**	**8,579**	**...**	**7,508**
හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්		867		1,148
අනෙකුත් අංශ		867		1,148
ණය සුරැකුම්පත් (ඈ)	...	7,712	...	6,360
තැන්පතු භාරගන්නා ආයතන	...		...	
කෙටි කාලීන	...		...	
රජය		7,616		6,266
කෙටි කාලීන		4		1
දිගු කාලීන		7,613		6,265
අනෙකුත් අංශ		96		94
දිගු කාලීන		96		94
මූල්‍ය ව්‍යුත්පන්න	**-**	**-**	**-**	**-**
අනෙකුත් ආයෝජන	**3,710**	**36,340**	**4,096**	**39,100**
මුදල් සහ තැන්පතු	**835**	**1,734**	**1,142**	**5,749**
මහ බැංකුව		400		1,775
කෙටි කාලීන		...		1
දිගු කාලීන		400		1,774
තැන්පතු භාරගන්නා ආයතන	835	1,333	1,142	3,974
කෙටි කාලීන	622	1,333	878	3,974
දිගු කාලීන	214		264	
ණය		**31,353**		**29,585**
මහ බැංකුව		1,378		1,265
ජා.මූ. අරමුදලෙන් ලද ණය		1,378		1,265
තැන්පතු භාරගන්නා ආයතන		5,324		3,172
කෙටි කාලීන		4,174		2,005
දිගු කාලීන		1,150		1,167
රජය		20,570		21,077
දිගු කාලීන		20,570		21,077
අනෙකුත් අංශ (ඉ)		4,081		4,071
දිගු කාලීන		4,081		4,071
වෙළඳ ණය සහ අත්තිකාරම්	**954**	**2,341**	**1,211**	**1,913**
තැන්පතු භාරගන්නා ආයතන	101		98	
කෙටි කාලීන	101		98	
අනෙකුත් අංශ (ඊ)	853	2,341	1,113	1,913
කෙටි කාලීන	853	2,341	1,113	1,913
අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම්	**1,920**	**343**	**1,744**	**523**
මහ බැංකුව (උ)		343		523
කෙටි කාලීන		343		523
තැන්පතු භාරගන්නා ආයතන	1,920		1,744	
කෙටි කාලීන	1,920		1,744	
විශේෂ ගැනුම් හිමිකම්		**570**		**1,330**
සංචිත වත්කම්	**5,664**		**3,139**	
මූල්‍ය රත්‍රන්	409		175	
විශේෂ ගැනුම් හිමිකම්	3		124	
ජා.මූ. අරමුදලේ සංචිත මට්ටම	69		67	
අනෙකුත් සංචිත වත්කම්	5,184		2,773	
මුදල් සහ තැන්පතු	2,210		2,729	
මූල්‍ය අධිකාරියේ හිමිකම්	861		899	
අනෙකුත් ආයතනයන්හි හිමිකම්	1,350		1,830	
සුරැකුම්පත්	2,974		44	
ණය සුරැකුම්පත්	2,974		44	
මුළු වත්කම්/වගකීම්	**10,883**	**58,574**	**8,758**	**64,498**
ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය		**-47,691**		**-55,740**
විශේෂිත අයිතමයන්				
පරිණත කාලය අනුව අන්තර්ජාතික ආයෝජන තත්ත්වය	10,883	58,574	8,758	64,498
කෙටි කාලීන	6,184	9,062	6,804	9,564
දිගු කාලීන	4,699	49,512	1,954	54,934

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ, කොළඹ කොටස් හුවමාරුවේ සහ අනෙකුත් පෞද්ගලික සමාගම්වල පැවති ඍජු ආයෝජන තත්ත්වය ද ඇතුළත් වේ.
(ඈ) විදේශ විනිමය ණය නිකුතුව වෙළඳපොළ වටිනාකම මත පදනම් වන අතර දේශීය විනිමය ණය නිකුතුව පොත් අගය මත පදනම් වේ.
(ඉ) රජය සතු වාණිජ ව්‍යවසායයන් ලබාගත් ව්‍යාපෘති ණය සම්බන්ධයෙන් වූ නොපියවා ඉතිරිව ඇති ණය ඇතුළත් වේ.
(ඊ) ලංකා බහිල තෙල් නිතිගත සංස්ථාවේ සහ පෞද්ගලික සමාගම්වල නොපියවූ වෙළඳ ණය ඇතුළත් වේ.
(උ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම්වල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5

පවතින වත්කම් තත්ත්වය ඉහළ ගිය අතර, අනෙකුත් ලැබිය යුතු ගිණුම්වල අඩුවීමක් වාර්තා විය. මේ අතර, පෞද්ගලික අංශය මගින් අනේවාසිකයන්ට ලබා දී ඇති වෙළඳ ණය සහ අත්තිකාරම්වල නොපියවා ඉතිරිව ඇති වත්කම් තත්ත්වය, 2020 වසර අවසානයේ දී නිරීක්ෂණය කරන ලද තත්ත්වයට වඩා 2021 වසර අවසන් වන විට වැඩි විය.

අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි පිළිබිඹු වන අනේවාසිකයන් වෙත වූ ශ්‍රී ලංකාවේ සමස්ත වගකීම් තත්ත්වය ද 2021 වසර අවසානය වන විට සැලකිය යුතු ලෙස වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ සෘජු ආයෝජන වගකීම්, මහ බැංකුවේ සහ තැන්පතු භාරගන්නා ආයතනවල මුදල් හා තැන්පතු වගකීම් මෙන්ම වි.ගැ.හි. වෙන් කිරීමට අදාළ වගකීම් වැඩි වීමයි. කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත කර ඇති අනේවාසික සමාගම්වල ප්‍රධාන හිමිකම් තත්ත්වයන් කිහිපයක සැලකිය යුතු තක්සේරු ලාභ වාර්තා වීම හේතුවෙන්, හිමිකම් ස්වරූපයෙන් පවතින නොපියවා ඉතිරිව ඇති සෘජු ආයෝජනවල වගකීම් තත්ත්වය එ.ජ. ඩොලර් බිලියන 4.0කින් පමණ වැඩි විය. 2021 වසර අවසානය වන විට මෙම අනේවාසික ආයෝජකයන් සඳහා සැලකිය යුතු තක්සේරු ලාභයක් ලබා දෙමින්, වසර ආරම්භයේ සිට හිමිකම් තත්ත්වය සැලකිය යුතු ලෙස ඉහළ ගිය බැවින්, විශේෂයෙන් සමහර සමාගම්වල මෙම හිමිකම් වෙනුවෙන් වූ ලාභ ඉහළ යෑම් කැපී පෙනුණි. තවද, වසර තුළ දී චීන මහජන බැංකුව සමඟ චීන යුවාන් බිලියන 10ක (එ.ජ. ඩොලර් බිලියන 1.5කට පමණ සමාන) සහ බංගලාදේශ බැංකුව (එ.ජ. ඩොලර් මිලියන 200ක්) සමඟ නව ද්වීපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම්වලට එළඹීමෙහි සහ දකුණු ආසියානු කලාපීය සහයෝගීතා මූල්‍ය සංවිධානය යටතේ ඉන්දියානු සංචිත බැංකුවෙන් ලැබුණු විදේශ විනිමය හුවමාරු පහසුකම (එ.ජ. ඩොලර් මිලියන 400ක) පියවීමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස මහ බැංකුවේ මුදල් හා තැන්පතු වගකීම් තත්ත්වය 2021 වසර අවසානය වන විට වැඩි විය. මේ අතර, තැන්පතු භාරගන්නා ආයතනවල මුදල් සහ තැන්පතු වගකීම් තත්ත්වය ද 2021 වසර අවසානය වන විට ඉහළ ගියේය. තවද, වසර තුළ දී ජා.මූ. අරමුදල විසින් සිදු කරන ලද එ.ජ. ඩොලර් මිලියන 787ක් පමණ වූ නව වි.ගැ.හි. වෙන්කිරීම සමඟ වි.ගැ.හි වගකීම් තත්ත්වය ද 2021 වසර අවසානයේ දී වැඩි විය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් වසර තුළ කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් ආපසු ගෙවීම සහ නොපියවා ඉතිරිව ඇති රජයේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ මිල කැපී පෙනෙන ලෙස පහත වැටීම සමඟ 2020 වසර අවසානයට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට විවිධ ආයෝජන වගකීම් තත්ත්වය පහත වැටුණි. ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ සහ තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය ණය වගකීම් පහළ යෑම හේතුවෙන් අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි විදේශීය ණය වගකීම් තත්ත්වය ද 2021 වසර අවසානයේ දී පහත වැටුණි. එසේ වුව ද, ප්‍රධාන වශයෙන් වසර තුළ දී ලබාගත් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් දෙකක් හේතුවෙන් රජයේ විදේශීය ණය වගකීම් තත්ත්වයෙහි ඉහළ යෑමක් වාර්තා කළේය. තවද, 2021 වසර තුළ දී මහ බැංකුවෙහි ආසියානු නිශ්කාෂණ සංගමයට අදාළ වගකීම් වැඩිවීමත් සමඟ නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ගෙවිය යුතු ගිණුම් තත්ත්වය වැඩි වූ අතර, ශ්‍රී ලංකාවේ ආනයනකරුවන් වෙත ලැබුණු වෙළඳ ණයවල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය අඩු විය.

5.6.1 සංචිත වත්කම් තත්ත්වය

2020 වසර අවසානය වන විට වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 5.7ට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 3.1ක් දක්වා අඩු විය. සැලකිය යුතු විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම්වල සහ වසර තුළ දී වූ මධ්‍යස්ථ විදේශ විනිමය ලැබීම් හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මහ බැංකුවේ මැදිහත්වීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස දළ නිල සංචිත පහත වැටුණි. වසර තුළ දී දළ නිල සංචිත නැවත ගොඩ නැංවීමට උපකාරී වූ ප්‍රධාන ලැබීම් වලට චීන සංවර්ධන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 810ක පමණ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් දෙකක්, ජා.මූ. අරමුදල මගින් ලද එ.ජ. ඩොලර් මිලියන 787ක පමණ වි.ගැ.හි. වෙන් කිරීම සහ චීන මහජන බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් බිලියන 1.5ක පමණ (චීන යුවාන් බිලියන 10) ලද සහ බංගලාදේශ බැංකුවෙන් ලද එ.ජ. ඩොලර් මිලියන 200ක ද්වීපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම්වලට අදාළ ලැබීම් ඇතුළත් වේ. කෙසේ වෙතත්, කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආපසු ගෙවීම (එ.ජ. ඩොලර් බිලියන 1.0), විදේශීය ව්‍යාපෘති ණය සහ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් වලට අදාළ ණය වාරික ගෙවීම් සහ පොලී ගෙවීම් (එ.ජ. ඩොලර් බිලියන 2.2), ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ අක්වෙරළ බැංකු ඒකක වෙතින් ලබා ගත් ණය සඳහා වූ ණය වාරික ගෙවීම් සහ පොලී ගෙවීම් (එ.ජ. ඩොලර් බිලියන 2.3) ඇතුළත්ව විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම් සහ අත්‍යවශ්‍ය ආනයන බිල්පත් මූල්‍යයනය කිරීමට මහ බැංකුව විදේශ විනිමය

5.12 රූප සටහන
කාර්තුමය දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

සැපයීම මගින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීම, වසර තුළ දී දළ නිල සංචිත මට්ටම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු විය. වසර අවසානයේ පැවති දළ නිල සංචිත මට්ටම ආනයනික මාස 1.8කට (2020 වසරේ දී ආනයනික මාස 4.2කට) සමාන වූ අතර, ඉදිරි වසර තුළ කල් පිරීමට නියමිත කෙටිකාලීන ණය සහ වගකීම්වලින් සියයට 23කට (2020 දී සියයට 43කට) සමාන විය. මේ අතර, තැන්පතු භාරගන්නා ආයතන සතු විදේශීය වත්කම් ප්‍රමාණයෙහි මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ ද, ප්‍රධාන වශයෙන් නිල සංචිතවල පහළ යෑම හේතුවෙන්, දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත මුළු ජාත්‍යන්තර සංචිත ද 2021 වසර අවසානය වන විට පහළ ගියේය. 2020 වසරේ දී වූ ආනයනික මාස 6.4ට සාපේක්ෂව, 2021 වසර අවසානය වන විට රටෙහි මුළු විදේශීය වත්කම් තත්ත්වය ආනයනික මාස 3.6කට සමාන විය.

5.12 සංඛ්‍යා සටහන
දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

ශීර්ෂය	2017	2018	2019	2020	2021 (අ)
1. රජයේ විදේශීය වත්කම්	488	817	386	155	177
2. මහ බැංකුවේ විදේශීය වත්කම්	7,470	6,102	7,256	5,510	2,962
3. **දළ නිල සංචිත වත්කම් (1+2)**	**7,959**	**6,919**	**7,642**	**5,664**	**3,139**
4. තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය වත්කම්	2,478	2,664	2,760	2,856	2,983
5. **මුළු විදේශීය වත්කම් (3+4) (ආ)**	**10,436**	**9,583**	**10,402**	**8,521**	**6,122**
6. සංචිතවලට අදාළ වගකීම් (ඇ)	1,361	1,425	1,771	2,121	3,562
7. **ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6)**	**6,597**	**5,495**	**5,871**	**3,543**	**-423**
8. **සමස්ත ශේෂය (ඈ)**	**2,068**	**-1,103**	**377**	**-2,328**	**-3,967**
9. දළ නිල සංචිත මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන					
9.1 වෙළඳ භාණ්ඩ	4.6	3.7	4.6	4.2	1.8
9.2 වෙළඳ භාණ්ඩ හා සේවා	3.8	3.1	3.7	3.7	1.8
10. මුළු විදේශීය වත්කම් මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන					
10.1 වෙළඳ භාණ්ඩ	6.0	5.2	6.3	6.4	3.6
10.2 වෙළඳ භාණ්ඩ හා සේවා	4.9	4.3	5.1	5.6	3.4

(අ) තාවකාලික
(ආ) 'විදේශයන්හි සිදුකරන ලද සෘජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.
(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (විශේෂ ගැනුම් හිමිකම් හැර)
(ඈ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස් වීම

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

5.7 විදේශීය ණය සහ ණය සේවාකරණය

5.7.1 විදේශීය ණය

ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ සහ තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය ණය වැඩිවීමත් සමඟ 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ මුළු විදේශීය ණය තත්ත්වය ඉහළ ගියේය. 2020 වසර අවසන් වන විට පැවති රටේ මුළු විදේශීය ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 49.0ක සිට 2021 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 50.7ක් දක්වා වැඩි විය. ප්‍රධාන වශයෙන් චීන සංවර්ධන බැංකුවෙන් ලබාගත් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් දෙක ලැබීමත් සමඟ නොපියවා ඉතිරිව ඇති රජයේ මුළු විදේශීය ණය වසර තුළ ඉහළ යාමක් වාර්තා කළ ද, වෙළඳපොළ මිලට අනුව රජයේ විදේශීය ණය 2020 වසර අවසන් වන විට පැවති එ.ජ. ඩොලර් බිලියන 28.2ක සිට 2021 වසර අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 27.3ක් දක්වා අඩු විය. මෙය, ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ මිල පහත වැටීම සහ 2021 වසරේ ජූලි මාසයේ කල් පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය ආපසු ගෙවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. 2021 වසරේ රජයේ විදේශීය ණය අඩු වීමට ප්‍රධාන හේතුවක් වූයේ ජාත්‍යන්තර වෙළඳපොළවල් වෙතින් නව ණය ගැනීම අඩු වීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත උපයෝගී කර ගනිමින් රජය සතු විදේශීය ණය වගකීම් ආපසු ගෙවීමට සිදු වීමයි. මේ අතර, ඉන්දියානු සංචිත බැංකුවෙන් ලැබුණු විදේශ විනිමය හුවමාරු පහසුකම ආපසු ගෙවුව ද, චීන මහජන බැංකුව සහ බංගලාදේශ බැංකුව සමඟ නව ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම්වලට එළඹීම හේතුවෙන් 2020 වසර අවසානයට සාපේක්ෂව 2021 වසර අවසන් වන විට මහ බැංකුවේ නොපියවා

5

5.13 සංඛ්‍යා සටහන
නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)
රජය	**28,187**	**27,344**
කෙටි කාලීන	**4**	**1**
ණය සුරැකුම්පත්	4	1
භාණ්ඩාගාර බිල්පත් (ඇ)	4	1
දිගු කාලීන	**28,183**	**27,343**
ණය සුරැකුම්පත්	7,613	6,265
භාණ්ඩාගාර බැඳුම්කර (ඇ)	31	8
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ඈ)	27	24
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ඉ)	7,555	6,233
ණය	20,570	21,077
මහ බැංකුව	**2,690**	**4,892**
කෙටි කාලීන	**343**	**524**
මුදල් සහ තැන්පතු	...	1
අනෙකුත් ගෙවිය යුතු ගිණුම්	343	523
ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්	343	523
දිගු කාලීන	**2,348**	**4,368**
විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම්	570	1,330
මුදල් සහ තැන්පතු	400	1,774
ණය	1,378	1,265
ජා.මූ. අරමුදලේ ණය	1,378	1,265
විස්තීර්ණ ණය පහසුකම	1,378	1,265
තැන්පතු භාරගන්නා ආයතන	**6,657**	**7,146**
කෙටි කාලීන	**5,507**	**5,979**
මුදල් සහ තැන්පතු (ඊ)	1,333	3,974
වාණිජ බැංකු	1,333	3,974
ණය	4,174	2,005
වාණිජ බැංකු	4,174	2,005
දිගු කාලීන	**1,150**	**1,167**
ණය	1,150	1,167
වාණිජ බැංකු	1,109	1,084
තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන	41	83
අනෙකුත් අංශ (උ)	**6,517**	**6,078**
කෙටි කාලීන	**2,341**	**1,913**
වෙළඳ ණය සහ අත්තිකාරම් (ඌ)	2,341	1,913
දිගු කාලීන	**4,176**	**4,165**
ණය සුරැකුම්පත් (ඉ)	96	94
ණය	4,081	4,071
පෞද්ගලික අංශය	2,315	2,425
රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය සංස්ථා	1,766	1,646
සෘජු ආයෝජන: අන්තර් සමාගම් ණය (එ)	**4,990**	**5,264**
දළ විදේශීය ණය තත්ත්වය	**49,041**	**50,724**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන්		
දළ විදේශීය ණය	60.5	60.0
කෙටි කාලීන ණය	10.1	10.0
දිගු කාලීන ණය	50.4	50.0
දළ විදේශීය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන්		
කෙටි කාලීන ණය	16.7	16.6
දිගු කාලීන ණය	83.3	83.4
විශේෂිත අයිතමයන්		
අනේවාසිකයින් සතු ණය සුරැකුම්පත්හි මුහුණත වටිනාකම-ආංශික වර්ගීකරණය	**12,058**	**11,400**
රජය	11,883	11,225
භාණ්ඩාගාර බිල්පත්	4	1
භාණ්ඩාගාර බැඳුම්කර	33	9
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	27	24
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර	11,820	11,191
අනෙකුත් අංශ	175	175
නොපියවා ඉතිරිව ඇති මුළු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල මුහුණත වටිනාකම	**14,050**	**13,050**
අනේවාසිකයින් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය	11,820	11,191
නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය (2019 වසරේ දෙසැම්බර් සිට විදේශීය ණය සංඛ්‍යානවල අන්තර්ගත නොවේ)	2,230	1,859

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පොත් අගය මත පදනම්ව
(ඈ) මුහුණත වටිනාකම මත පදනම්ව
(ඉ) වෙළඳපොළ මිල මත පදනම්ව
(ඊ) අනේවාසික විදේශ මුදල් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(උ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(ඌ) ලංකා බනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(එ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉතිරිව ඇති විදේශීය ණය සැලකිය යුතු ලෙස වැඩි විය. කෙටිකාලීන ණය තත්ත්වය කැපී පෙනෙන ලෙස පහළ ගියද, මුදල් හා තැන්පතුවල සැලකිය යුතු ඉහළ යෑම හේතුවෙන් තැන්පතු භාරගන්නා ආයතනවල නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය ද සැලකිය යුතු ලෙස වැඩි විය. මේ අතර, පෞද්ගලික අංශයේ සමාගම් විසින් ලබා ගත් විදේශීය ණය ප්‍රමාණය වැඩි වුව ද, පෞද්ගලික අංශය වෙත ලැබුණු වෙළෙඳ ණයෙහි නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය අඩුවීම සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ විදේශීය ණය ආපසු ගෙවීම සමඟ 2021 වසරේ දී පෞද්ගලික අංශයේ සමාගම් සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය පහළ ගියේය. තව ද, වසර තුළ දී සෘජු ආයෝජන ව්‍යාපාර කිහිපයක් වෙත අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ලැබුණු බැවින්, සෘජු ආයෝජන ව්‍යාපාරවල අන්තර් සමාගම් ණය 2021 වසරේ දී ඉහළ ගියේය.

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රටෙහි නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය වසර තුළ දී සුළු වශයෙන් පහළ යෑමක් වාර්තා කරන ලදී. 2020 වසරට සාපේක්ෂව 2021 වසර තුළ දී නාමික ද.දේ.නි.යෙහි වැඩිවීම පිළිබිඹු කරමින්, 2021 වසර අවසානයේ දී නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2020 වසර අවසානයෙහි පැවති සියයට 60.5ට සාපේක්ෂව සියයට 60.0ක් විය. සමස්ත විදේශීය ණය තත්ත්වයෙන් රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය 2020 වසර අවසානයේ දී පැවති සියයට 57.5 සිට 2021 වසර අවසානයේ දී සියයට 53.9ක් දක්වා පහළ

5.13 රූප සටහන
විදේශීය ණය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ගියේය. ණය කල්පිරීමේ කාලය අනුව, දිගුකාලීන කල් පිරීම් සහිත ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2020 වසර අවසානයේ දී පැවති සියයට 50.4ට සාපේක්ෂව 2021 වසර අවසානයේ දී සියයට 50.0ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය.

5.7.2 විදේශීය ණය සේවාකරණ ගෙවීම්

ණය වාරික ගෙවීම්වල සුළු ඉහළ යෑමක් තිබුණ ද, පොලී ගෙවීම් අඩුවීම හේතුවෙන් 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් පෙර වසරට සාපේක්ෂව පහළ ගියේය. විදේශීය ණය වාරික ගෙවීම් 2020 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 3.0ට සාපේක්ෂව, 2021 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 3.1ක් දක්වා වැඩි විය. ඉන්දියානු සංචිත බැංකුවෙන් ලබාගත් ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු පහසුකම පියවීම 2021 වසරේ ණය වාරික ගෙවීම්වල ඇතුළත් වේ. තවද, 2021 වසරේ පියවන ලද එ.ජ. ඩොලර් බිලියන 1ක වටිනාකමකින් යුත් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය කල් පිරීමේ දී, එ.ජ. ඩොලර් මිලියන 700ක් අනේවාසිකයන්ට ගෙවන ලද අතර, ඉතිරිය නේවාසිකයන්ට ගෙවන ලදී. වසර තුළ දී රජයේ විදේශීය ණය වාරික ගෙවීම් සුළු වශයෙන් ඉහළ ගියේය. මේ අතර, වසර තුළ දී පෞද්ගලික අංශය, රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය ණය වාරික ගෙවීම් පෙර වසරට සාපේක්ෂව, සැලකිය යුතු ලෙස අඩු විය. මහ බැංකුව විසින් ජා.මූ. අරමුදල වෙතින් 2016 වසරේ දී ගෙවුම් තුලනයට සහය වීම සඳහා ලබාගත් විස්තීර්ණ ණය පහසුකමට අදාළ ණය වාරික ගෙවීම් වසර තුළ දී අඛණ්ඩව සිදු කළේය. 2020 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 1.6ට සාපේක්ෂව, විදේශීය ණය මත වූ පොලී ගෙවීම් වසර තුළ දී එ.ජ. ඩොලර් බිලියන 1.4ක් දක්වා අඩු විය. වසර තුළ දී, අනේවාසිකයන්ට නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා කුපන ගෙවීම්, රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන සඳහා පොලී ගෙවීම් සහ රජයේ විදේශීය ණය සඳහා පොලී ගෙවීම් අඩු වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. පසුගිය වසරට සාපේක්ෂව, 2021 වසරේ දී වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ආදායම ඉහළ යෑමේ සහ විදේශීය ණය සේවාකරණ ගෙවීම් පහළ යෑමේ ඒකාබද්ධ බලපෑම හේතුවෙන්, වෙළඳ භාණ්ඩ හා සේවා අපනයනයෙහි ප්‍රතිශතයක් ලෙස මුළු විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2020 වසරේ වාර්තා වූ සියයට 35.2ක සිට 2021 වසරේ දී සියයට 30.0ක් දක්වා පහළ ගියේය. මුළු විදේශීය ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණයෙන් රජයේ විදේශීය ණය සේවාකරණ ගෙවීම්, 2020 වසරේ වාර්තා වූ සියයට 86.5ක සිට 2021 වසරේ දී සියයට 81.1ක් දක්වා පහළ ගියේය.

5.14 සංඛ්‍යා සටහන

විදේශීය ණය සේවාකරණ ගෙවීම්

එ.ජ. ඩොලර් මිලියන

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)
1. ණය සේවාකරණ ගෙවීම්	**4,604**	**4,498**
1.1 ණය ආපසු ගෙවීම්	**3,004**	**3,111**
රජය	2,577	2,460
ව්‍යාපෘති ණය	1,713	1,754
ණය සුරැකුම්පත්	864	706
මහ බැංකුව	14	457
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	14	57
ජාත්‍යන්තර විනිමය හුවමාරු ගිවිසුම්	-	400
පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන	412	193
විදේශීය ණය	412	193
1.2 පොලී ගෙවීම්	**1,601**	**1,388**
රජය	1,405	1,187
ව්‍යාපෘති ණය	497	394
ණය සුරැකුම්පත්	908	793
මහ බැංකුව	19	15
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල	18	15
ජාත්‍යන්තර විනිමය හුවමාරු ගිවිසුම්	2	1
පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන	167	175
විදේශීය ණය	167	175
සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය	10	11
2. වෙළඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්	**13,083**	**14,974**
3. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා ජංගම සංක්‍රාම	**20,398**	**20,587**
4. ණය සේවාකරණ අනුපාතිකය		
4.1 ඉහත 2හි ප්‍රතිශතයක් වශයෙන්		
සමස්ත අනුපාතිකය	35.2	30.0
ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර	35.0	29.6
4.2 ඉහත 3හි ප්‍රතිශතයක් වශයෙන්		
සමස්ත අනුපාතිකය	22.6	21.8
ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර	22.4	21.5
5. රජයේ ණය සේවාකරණ ගෙවීම්		
5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (ඇ)	3,982	3,648
5.2 ඉහත 1 හි ප්‍රතිශතයක් වශයෙන්	86.5	81.1

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගනුදෙනු හැර

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5.8 විනිමය අනුපාතිකයේ හැසිරීම

2022 වසරේ මාර්තු මස මුල දී විනිමය අනුපාතිකය වෙනස් වීමට ඉඩ හැරීමට පෙර ශ්‍රී ලංකා රුපියල 2021 වසරේ දී සහ 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී පුළුල් ලෙස ස්ථාවර මට්ටම්වල පවත්වා ගෙන යන ලදී. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි සීමිත විදේශ ව්‍යවහාර මුදල් ද්‍රවශීලතාවක් පැවතීම හේතුවෙන්, විශේෂයෙන්ම 2021 වසරේ පළමු මාස හතර තුළ දී, ශ්‍රී ලංකා රුපියල යම්

5

උච්චාවචනයක් සමඟින් අවප්‍රමාණය වීමේ පීඩනයක් පෙන්නුම් කළේය. ආනයන බිල්පත් සහ රජයේ ණය සේවාකරණ අවශ්‍යතා සපුරාලීම සඳහා අඛණ්ඩ ගෙවීම් මධ්‍යයේ, ණය සහ ණය නොවන ප්‍රවාහ වශයෙන් විදේශ විනිමය ලැබීම් බොහෝ දුරට පහළ යෑම මේ සඳහා හේතු විය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීම සිදු කළ සහ අඛණ්ඩ ශිෂ්ට ප්‍රයෝග භාවිතය වසරේ ඉතිරි කාලපරිච්ඡේදය තුළ දී සහ 2022 වසරේ පළමු මාස කිහිපය තුළ දී ශ්‍රී ලංකා රුපියල ස්ථාවර වීමට ආධාර විය. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහාය ඇතිව මහ බැංකුවේ මැදිහත්වීමත් සමඟ අන්තර් බැංකු වෙළඳපොළෙහි බරිත සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය 2021 වසර අවසාන කාලපරිච්ඡේදයේ දී එ.ජ. ඩොලරයකට රුපියල් 200 - 203ක මට්ටමේ පුළුල් ලෙස ස්ථාවරව පැවතුණි. ඒ අනුව, 2021 වසර අවසානයේ දී රඑ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලේ වාර්ෂික අවප්‍රමාණය සියයට 7.0කට සීමා වූ අතර, මෙය වසංගතයේ කම්පනය හේතුවෙන් ආර්ථිකය අර්බුදකාරී තත්ත්වයෙන් නැවත යථා තත්ත්වයට පත්වීමට ආසන්නයේ සිටි අවස්ථාවේ දී මුදල් ඒකකය අධික ලෙස අවප්‍රමාණය වීමේ අහිතකර ප්‍රතිවිපාක අවම කර ගැනීමට උපකාරී විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ නිරීක්ෂණය වූ පීඩනය සඳහා විදේශ විනිමය උපයන්නන් විසින් විදේශ විනිමය ඉපැයීම් ප්‍රමාණවත් ලෙස රුපියල්වලට පරිවර්තනය නොකිරීම ද යම් දුරකට හේතු විය. අපනයන ආදායම රුපියල්වලට පරිවර්තනය කිරීමේ අනිවාර්ය අවශ්‍යතා පිළිබඳ රෙගුලාසි පැනවීමත් සමඟ දේශීය වෙළඳපොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතා තත්ත්වය යම් ප්‍රමාණයකට වැඩිදියුණු විය. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම් පිළිබිඹු කරමින්, 2021 වසරේ දී ශ්‍රී ලංකා රුපියල ජපන් යෙන් (සියයට 3.8කින්) සහ යූරෝ වලට (සියයට 1.1කින්) සාපේක්ෂව අතිප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුම (සියයට 6.0කින්) සහ ඉන්දියානු රුපියලට (සියයට 5.5කින්) සාපේක්ෂව අවප්‍රමාණය විය. තවද, 2022 වසරේ මුල් මාස දෙක තුළ, අඛණ්ඩ ශිෂ්ට ප්‍රයෝග හේතුවෙන් ශ්‍රී ලංකා රුපියල පුළුල්ව ස්ථාවරව පැවතුණි. කෙසේ වෙතත්, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාව පහළ යෑමෙන් විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩනයන් 2021 වසරේ දී සහ 2022 වසරේ මුල් කාලපරිච්ඡේදයේ දී තීව්‍ර වීම හමුවේ, 2022 වසරේ මාර්තු මස මුල දී අවශ්‍ය වූයේ විනිමය අනුපාතිකයෙහි ක්‍රමානුකූල ගැලපීමකි. කෙසේ වෙතත්, ඉන් පසුව 2022 වසරේ මාර්තු මස මුල දී විනිමය අනුපාතිකයෙහි නම්‍යශීලීභාවය සැලසීමෙන් පසුව ඇති වූ බලපෑමෙන්, වෙළඳපොළ බලවේග හමුවේ සැලකිය යුතු ඉහල ප්‍රමාණයකින් විනිමය අනුපාතිකය

5

5.15 සංඛ්‍යා සටහන

විනිමය අනුපාතික වෙනස්වීම්

මුදල් වර්ගය	විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය						පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ)			
	වර්ෂය අග අනුපාතිකය			වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය			වර්ෂය අග		වාර්ෂික සාමාන්‍යය	
	2019	2020	2021	2019	2020	2021	2020	2021	2020	2021
යූරෝ	203.67	229.42	226.86	200.14	212.07	235.10	-11.23	1.13	-5.62	-9.80
ඉන්දියානු රුපියල්	2.55	2.55	2.69	2.54	2.50	2.69	0.00	-5.45	1.46	-6.95
ජපන් යෙන්	1.67	1.81	1.74	1.64	1.74	1.81	-7.54	3.82	-5.65	-3.96
බ්‍රිතාන්‍ය පවුම්	238.46	254.35	270.60	228.20	238.22	273.51	-6.25	-6.00	-4.21	-12.90
එක්සත් ජනපද ඩොලර්	181.63	186.41	200.43	178.78	185.52	198.88	-2.56	-7.00	-3.64	-6.72
විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.)	251.17	268.48	280.53	246.97	258.61	283.18	-6.45	-4.29	-4.50	-8.68
සඵල විනිමය අනුපාතික දර්ශක (ආ) (ඇ) (2017 = 100)	**වර්ෂය අග දර්ශකය**			**වාර්ෂික සාමාන්‍ය දර්ශකය**			**පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම්**			
							වර්ෂය අග දර්ශකය		**වාර්ෂික සාමාන්‍ය දර්ශකය**	
	2019	2020	2021	2019	2020	2021	2020	2021	2020	2021
නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව	86.74	83.12	79.65	88.17	85.93	78.64	-4.17	-4.18	-2.54	-8.48
මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව	90.74	88.37	86.06	90.42	91.52	86.13	-2.61	-2.61	1.22	-5.90

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට සාපේක්ෂව අවප්‍රමාණය වීමක් පෙන්නුම් කරයි.

(ආ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළඳ හවුල්කරුවන් සහ තරඟකාරී රටවල් 24ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමඟ සිදු කරන වෙළඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි. සෘණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ඇ) විනිමය අනුපාතික දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය අතිප්‍රමාණය වීම/අවප්‍රමාණය වීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළයාම/පහළයාම මගින් පිළිබිඹු කෙරෙයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

5.14 රූප සටහන
විනිමය අනුපාතිකයේ වෙනස්වීම්



අවප්‍රමාණය වීම හේතුවෙන් එම අපේක්ෂාව මුදුන්පත් කර ගැනීමට නොහැකි විය. ඒ අනුව, 2022 වසරේ මාර්තු මස අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 33.0කින් අවප්‍රමාණය විය. එම තීරණය මෙන්ම අනෙකුත් අදාළ නියාමන සීමා ඉවත් කිරීම සහ අලුතින් පනවන ලද ආනයන සීමා කිරීම් මගින් විශේෂයෙන්ම, අපනයනකරුවන්ට සහ ප්‍රේෂණ සිදු කරන්නන්ට ඇති ශුද්ධ ලාභය ඉහළ යෑම හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් ලැබීම දිරිමත් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, හදිසි නොවන ආනයන සහ අනෙකුත් ගෙවීම් අධෛර්යමත් කරමින් පවතී. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම් පිළිබිඹු කරමින්, 2022 වසරේ මාර්තු මස අවසානය වන විට ශ්‍රී ලංකා රුපියල යූරෝ වලට (සියයට 32.1කින්), ඉන්දියානු රුපියලට (සියයට 31.7කින්), ස්ටර්ලින් පවුමට (සියයට 31.1කින්), සහ ජපන් යෙන්වලට (සියයට 28.9කින්) සාපේක්ෂව අවප්‍රමාණය විය.

බලශක්ති මිල ගණන්හි ඉහළ යන උච්චාවචන, හිමිකම් කොටස්වල අඩු කාර්යසාධනය, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සහ ද්‍රවශීලතා ගැටළු හේතුවෙන් ආයෝජකයන් ආරක්ෂිත මුදල් ඒකකයක් ලෙස එ.ජ. ඩොලර් කරා නැඹුරු වීම ඇතුළු විවිධ සාධක හේතුවෙන් එ.ජ. ඩොලරය ශක්තිමත් වීම සමඟ 2021 වසරේ දී අනෙකුත් ප්‍රධාන මුදල් ඒකක එ.ජ. ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය විය. ඒ අනුව, 2021 වසර අවසාන වන විට එ.ජ. ඩොලරයට සාපේක්ෂව ජපන් යෙන් (සියයට 10.4කින්), යූරෝ (සියයට 8.0කින්), ඉන්දියානු රුපියල (සියයට 1.6කින්) සහ ස්ටර්ලින් පවුම (සියයට 1.1කින්) අවප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් රැසකට සාපේක්ෂව අවප්‍රමාණය වීමේ සමස්ත ප්‍රතිඵලයක් ලෙස 2021 වසර තුළ දී සහ 2022 වසරේ මාර්තු අවසානයේ දී ශ්‍රී ලංකා රුපියල වි.ගැ. හි. සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 4.3කින් සහ සියයට 32.1කින් අවප්‍රමාණය විය.

5.3.1 නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය

ව්‍යවහාර මුදල් වර්ග කිහිපයකින් සැදුම්ලත් පැසකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි හැසිරීම මනිනු ලබන, මුදල් වර්ග 5කින් සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික දර්ශක වසර තුළ දී පහළ ගියේය. විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම් සමඟින් අනෙකුත් තෝරාගත් ප්‍රධාන මුදල් ඒකක වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි සිදු වූ නාමික අවප්‍රමාණය වීම පිළිබිඹු කරමින්, නා.ස.වි.අ. දර්ශක පහළ ගියේය. ඒ අනුව, 2021 වසර තුළ දී, මුදල් වර්ග 5කින් සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නා.ස.වි.අ. දර්ශක, පිළිවෙළින්, සියයට 3.6කින් සහ සියයට 4.2කින් පහළ ගියේය. මුදල් පැසෙහි ඇතුළත් නාමික විනිමය අනුපාතිකවල වෙනස්වීම මෙන්ම රටවල උද්ධමන වෙනස ද සැලකිල්ලට ගෙන ගණනය කෙරෙන, මූර්ත සඵල විනිමය අනුපාතික (මූ.ස.වි.අ.) දර්ශක මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2021 වසරේ දී මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූ.ස.වි.අ. දර්ශකය සියයට 6.9කින් ඉහළ ගිය අතර, මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූ. ස. වි. අ. දර්ශකය සියයට 2.6කින් පහළ ගියේය. කෙසේ වුවත්, ශ්‍රී ලංකා රුපියලෙහි අඛණ්ඩ විදේශීය තරඟකාරිත්වය පිළිබිඹු කරමින්, මූ.ස.වි.අ. දර්ශක, 2021

5

වසරේ දී පදනම් වර්ෂයේ සීමාවට (2017=100) පහළින් පැවතුණි. 2022 වසරේ මාර්තු මස විනිමය අනුපාතිකය තියුණු ලෙස අවප්‍රමාණය වීමත් සමඟ පැසෙහි ඇතුළත් එ.ජ. ඩොලරයට සහ අනෙකුත් ප්‍රධාන මුදල් ඒකක වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වූ නාමික අවප්‍රමාණය වීම, නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක සැලකිය යුතු ලෙස පහළ ගියේය. ඒ අනුව, 2022 වසරේ මාර්තු අවසානයේ දී මුදල් වර්ග 5කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන් පිළිවෙළින්, සියයට 31.9කින් අඩු වූ අතර, සියයට 31.1කින් සහ මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක, පිළිවෙළින්, සියයට 32.0කින් සහ සියයට 35.1කින් පහළ ගියේය.

5.3.2 දේශීය විදේශ විනිමය වෙළඳපොළ වර්ධනයන්

2021 වසරේ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ සිදු වූ ගනුදෙනු පරිමාවන් තවදුරටත් පහළ ගියේය. ඒ අනුව, 2020 වසරේ එ.ජ. ඩොලර් මිලියන 18,408ක් ලෙස වාර්තා වූ අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු පරිමාව, 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 12,160ක් දක්වා අඩු විය. 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 10,445ක් වූ මුළු එතැන් විනිමය පරිමාව 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,852ක් (මුළු ගනුදෙනු ප්‍රමාණයෙන් සියයට 48.1ක්) දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. 2020 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 7,964ක් වූ ඉදිරි විනිමය පරිමාව ද 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන

5.15 රූප සටහන
කාර්තුමය අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු පරිමාවන්



වෙළඳපොළ කටයුතු සඳහා අඛණ්ඩව මැදිහත් විය. මහ බැංකුවේ මැදිහත්වීම තුළින් විනිමය අනුපාතිකයෙහි ඉහළ උච්චාවචනය වීම් වළක්වා ගැනීමට උපකාරී වූ අතර, එය ආර්ථිකයට සහ ජනතාවට සිදුවන බාධා වළක්වා ගැනීම සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය ආනයන මූල්‍යනය කිරීමේ අවශ්‍යතාවන්ට සහාය විය. කෙසේ වෙතත්, 2021 වසරේ අග දී පැවති ස්ථාවර විනිමය අනුපාතිකය යටතේ ආනයනකරුවන්ට අඩු පිරිවැයක් යටතේ වැඩි ප්‍රමාණයක් ආනයනය කිරීමට හැකි වූ අතර, අපනයනකරුවන් තම අපනයන ආදායම පරිවර්තනය කිරීමට මැලි වීම හේතුවෙන් එය දේශීය විදේශ විනිමය වෙළඳපොළට අහිතකර බලපෑමක් ඇති කළේය.

6

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා රාජ්‍ය මූල්‍ය කටයුතු

6.1 සමස්ත නිරීක්ෂණ

කොවිඩ්-19 වසංගතයට සහ විදේශීය අංශයේ බහුවිධ අභියෝගවලට එරෙහිව ආර්ථිකය ක්‍රියා කරන විට, දිගු කාලීනව පැවත එන රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා සහ ඇතැම් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල අනපේක්ෂිත ප්‍රතිවිපාක පිළිබිඹු කරමින්, 2021 වසරේ දී මධ්‍යම රජයේ අයවැය මෙහෙයුම් කටයුතු දුර්වල විය. 2020 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ආදායම් තියුණු ලෙස පහත වැටුණු අතර, 2021 වසරේ දී එය ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ අවම මට්ටම දක්වා පහත වැටෙමින් තවදුරටත් දුර්වල වූයේ, වසංගතය මගින් ඇති කරන ලද පසුගාමී ආර්ථික ක්‍රියාකාරිත්වය සහ 2019 වසර අවසානයේ සිට හඳුන්වා දුන් ලිහිල් බදු ක්‍රමය පවත්වාගෙන යෑම සඳහා කැප වී සිටීම යනාදී හේතු නිසාය. මේ අතර, වසංගතය ආශ්‍රිත වියදම් සමඟ වැටුප් හා වේතන සහ පොලී ගෙවීම් සඳහා වූ ඉහළ වියදම් හේතුවෙන්, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී රජයේ වියදම් අඩු වීමකින් තොරව ඉහළ මට්ටමක පැවතුණි. ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ ද, 2021 වසරේ දී රාජ්‍ය ආයෝජන සුළු වශයෙන් පහළ ගියේය. 1988 වසරේ සිට වාර්තා වූ ඉහළම අගය වෙත ළඟා වෙමින්, සමස්ත අයවැය හිඟය අපේක්ෂිත මට්ටමෙන් සැලකිය යුතු ලෙස අපගමනය වෙමින්, 2021 වසරේ දී පෙර වසරටත් වඩා පුළුල් විය. අහිතකර ගෝලීය වෙළඳපොළ ප්‍රවණතා මෙන්ම ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීමත් සමඟ විදේශීය මූල්‍යන මාර්ග සීමා වී තිබීම හේතුවෙන් අයවැය හිඟය පියවා ගැනීම සඳහා වැඩි වශයෙන් දේශීය බැංකු අංශය, විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව, මත රඳා පැවතීමට රජයට සිදු විය. වසංගතය හේතුවෙන් ඇති වූ සමාජ ආර්ථික අර්බුද හමුවේ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම්වල ක්‍රියාකාරිත්වය සුමට කිරීමට අවශ්‍ය විශාල අරමුදල් ප්‍රමාණයක් මහ බැංකුව රජය වෙත ලබා දුන් අතර, ණය ගැනීමේ පිරිවැය අඩු මට්ටමක පවත්වා ගැනීම සඳහා 2021 වසරේ අගෝස්තු මාසය දක්වා ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගෙන ගියේය. කෙසේ වෙතත්, බැංකු අංශය හරහා අයවැය හිඟය මූල්‍යනය අධික ලෙස සිදු කිරීම උද්ධමනකාරී වන බැවින්, මහ බැංකුව හරහා මූල්‍යනය ක්‍රමානුකූලව අඩු කිරීම සහ දිගුකාලීන විදේශ මූල්‍යන විකල්ප වෙත යොමුවීම සඳහා සක්‍රීය ලෙස කටයුතු කිරීම මූල්‍ය ස්ථායීතාවය රැක ගැනීම සඳහා අනුගමනය කළ යුතු පියවර වේ. මේ අතර, 2021 වසර අවසන් වන විට මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය නාමික වශයෙන් සහ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ඉතා ඉහළ මට්ටමකට වර්ධනය වූ අතර, මෙය අයවැය හිඟය පුළුල් වීම, වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ යෑම මෙන්ම, විනිමය අනුපාතිකය අවප්‍රමාණ වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ විනිමය අනුපාතික විචලනයේ බලපෑම ආදී හේතුන්වල ඒකාබද්ධ ප්‍රතිඵලයකි. ඉදිරියේ දී ආපසු ගෙවීමට ඇති විශාල ණය වාරික සහ ප්‍රමාණවත් නොවන මූල්‍ය ගලා ඒම් මධ්‍යයේ විදේශ විනිමය සංචිතවල අඩු වීම මගින් විදේශ අංශයේ ද්‍රවශීලතා තත්ත්වය තවදුරටත් පිරිහීම යන කරුණු මත ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහළ හෙළීම් මාලාවක් 2021 වසරේ දී සිදු කරන ලදී. ප්‍රමාණවත් තරමේ ආදායමක් නොලැබීම, රාජ්‍ය ණය තිරසාරභාවය පිළිබඳ ගැටලුකාරී බව, රාජ්‍ය ණය වර්ධනය වීම මධ්‍යයේ දේශීය බැංකු මූලාශ්‍ර හරහා අයවැය හිඟය මූල්‍යනය කිරීම, උද්ධමනය වේගයෙන් ඉහළ යෑම, දේශීය මූල්‍ය පද්ධති ස්ථායීතාවය සහ විදේශීය අංශය සම්බන්ධයෙන් මතුවන

අවදානම් තත්ත්ව හේතුවෙන් රාජ්‍ය මූල්‍ය අංශයේ ඉදිරි දැක්ම දුර්වල වී ඇත. මෙම පසුබිම යටතේ, රජයේ මූල්‍යන අවශ්‍යතා අවම කරමින් රජයේ ආදායම් රැස් කිරීමේ ඉතා දුර්වල ගමන්මග තිරසාර ලෙස වෙනස් කිරීම සඳහා සුදුසු බදු වර්ග හඳුන්වා දීම සහ බදු පදනම පුළුල් කිරීම මෙන්ම බදු පරිපාලනය ශක්තිමත් කිරීම හරහා ආදායම් වැඩි කිරීම මූලිකව අරමුණු කරගත් දැඩි රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවක් ඇති කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම කාලීන අවශ්‍යතාවය බවට පත්ව ඇත. මේ අතර, ඉදිරි කාලයේ දී රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇති කිරීමේ ගමන්මගින් පරිබාහිර නොවීම තහවුරු කිරීම සඳහා රජය විසින් ක්ෂණිකව ක්‍රියාත්මක කරන වරින්වර සිදු කරන වියදම් ප්‍රතිපත්තිවලින් වැළකී සිටිමින් රජයේ වියදම් දැඩි ලෙස පාලනය කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, ආදායම් රැස් කිරීම ශක්තිමත් කරන අතර පුනරාවර්තන වියදම් පාලනය කිරීම මගින් ජංගම ගිණුමේ හිඟය අඩු කිරීම සහ එමගින් මැදි කාලීනව ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් වාර්තා කිරීමට විශ්වසනීය සැලැස්මක් ඇතිව ඒකාබද්ධ ප්‍රයත්නයක් ගැනීම, රජයේ ණය තිරසාර බව සහතික කිරීම සඳහා මෙම අවස්ථාවේ දී ඉතා වැදගත් වේ. සුදුසු සංශෝධන හරහා මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගයට (MTDS) අනුකූලව ණය කළමනාකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක කරන ප්‍රයත්නයන්, ණය ආපසු ගෙවීමේ දුෂ්කරතා අවම කිරීමට මෙන්ම රාජ්‍ය මූල්‍ය අංශයේ නුදුරු කාලීන අවදානම් අඩු කිරීමට අත්‍යවශ්‍ය වේ.

6.2 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග[1]

2021 වසරේ අයවැය මගින් යෝජිත රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය, රටේ ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සඳහා පූර්ව අවශ්‍යතාවක් වන සාර්ව ආර්ථික ස්ථායීතාව තහවුරු කිරීම අරමුණු කරගත්ත ද, අභියෝගාත්මක සාර්ව ආර්ථික තත්ත්වයන් සහ ප්‍රමාණවත් හා අරමුණට ගැලපෙන ප්‍රතිපත්ති මගින් සහායක් නොලද, පමණට වඩා ශුභවාදී රාජ්‍ය මූල්‍ය ඉලක්ක හේතුවෙන් 2021 වසරේ දී අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ප්‍රතිඵල අත්පත් කර ගැනීමට නොහැකි විය. රජයේ මූල්‍ය උපාය මාර්ගයට අනුකූලව, 2021 වසරේ දී ආදායම් ලැබීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 10.7ක් දක්වා ඉහළ යනු ඇතැයි ද, එමගින් අයවැය හිඟය සහ මධ්‍යම රජයේ ණය, පිළිවෙළින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 8.8ක් සහ සියයට 96.3ක් වනු ඇතැයි ද අපේක්ෂා කෙරුණි. *රට හදන සෞභාග්‍යයේ දැක්ම* යන ජාතික ප්‍රතිපත්ති රාමුව මගින් අපේක්ෂිත පරිදි, රජයේ මැදි කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය වැඩසටහන මගින් දිළිඳුබව තුරන් කිරීම සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවධානය යොමු විය. රජය විසින් ආර්ථික සහ සමාජීය යටිතල පහසුකම් සඳහා සිදු කරනු ලබන ඉහළ ආයෝජන සමඟ, කොවිඩ්-19 වසංගතය වැනි අනපේක්ෂිත ව්‍යසනයන්ගෙන් ජනතාව ආරක්ෂා කර ගන්නා අතරතුර, ප්‍රාදේශීය මට්ටමේ විෂමතා අවම කිරීමට අපේක්ෂිතය. ඒ අනුව, ඉහළ සහ තිරසාර ආර්ථික වර්ධනයකට සහාය සලසමින්, 2021 - 2025 සඳහා වන මැදි කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව මගින් 2021 වසරේ දී රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.4ක් දක්වා ඉහළ නැංවීමට සහ මැදි කාලීනව, සාමාන්‍යයක් ලෙස ගත් කල, රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5 - 6ක අගයකට වඩා පවත්වා ගෙන යෑම ඉලක්ක කෙරුණි. වියදම් තාර්කීකරණ ක්‍රියාමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම තුළින්, පුනරාවර්තන වියදම් 2021 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 14.2ක අගයක පවත්වා ගෙන යෑමටත්, එය 2025 වසර වන විට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12.3ක් දක්වා තවදුරටත් අඩු කර ගැනීමටත් අපේක්ෂා කරන ලදී. මෙම අපේක්ෂිත ප්‍රවණතා ද සමඟ, රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 14.2ක් දක්වා ඉහළ යමින් 2025 වසර සඳහා වන අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4.0ක් දක්වා පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කෙරුණි. මේ අතර, නොපියවූ ණය ප්‍රමාණය, 2021 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 96.3ක් දක්වා අඩු කර ගැනීමටත්, එය මැදි කාලීනව ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 75.5ක් දක්වා තවදුරටත් අඩු කර ගැනීමටත් බලාපොරොත්තු විය. රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය ද රාජ්‍ය මූල්‍ය කටයුතු මත ඇති කරන පීඩනය අවම කිරීම සඳහා අත්‍යවශ්‍ය අංගයක් ලෙස හඳුනා ගන්නා ලදී. කෙසේ වෙතත්, 2021 වසර සඳහා ප්‍රකාශයට පත් කෙරුණු ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ඉලක්ක සපුරා ගැනීමට අපොහොසත් වූයේ ආදායම් ලැබීම් පහත වැටීමට සහ රාජ්‍ය වියදම් අඩු කිරීමට නොහැකි වීමට හේතු වන අභියෝගාත්මක ආර්ථික පරිසරය සහ නොගැලපෙන ප්‍රතිපත්ති හමුවේ වඩා ශුභවාදී වූ උපකල්පන මත මෙම ඉලක්ක පදනම් වීම හේතුවෙනි.

1 මෙම කොටසේ සාකච්ඡා කර ඇති ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, 2021 ජනවාරි 01 සිට 2022 මාර්තු 15 දක්වා ක්‍රියාත්මක වූ ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ඇතුළත් 'ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග' යන 12 වන විශේෂ සටහනේ වැඩිදුරටත් පැහැදිලි කර ඇත.

6.1 රූප සටහන
රාජ්‍ය මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය







6.2 රූප සටහන
ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශක
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2019 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛන සංශෝධන කර ඇත.

මූලයඃ මුදල් අමාත්‍යාංශය

ආර්ථිකය කඩිනමින් යථා තත්ත්වයට පත් වීම සහ ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා ලිහිල් බදු ක්‍රමයක් රජය විසින් පවත්වා ගෙන යෑම, 2021 වසර තුළ දී රජයේ ආදායම් ලැබීම් දුර්වල වීමට හේතු විය. සංස්ථාපිත ආදායම් බදු, පුද්ගල ආදායම් බදු සහ එකතු කළ අගය මත බදුවලට අදාළව 2019 වසර අවසානයේ දී සිදු කරන ලද සංශෝධන 2021 වසරේ දී එලෙසම පවත්වා ගෙන යන ලදී. ඒ අනුව, 2019 වසරේ නොවැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කළ බදු සංශෝධන සහ 2020 වසරේ ජනවාරි සහ 2021 වසරේ අප්‍රේල් මාසවල දී ප්‍රකාශයට පත් කළ අනෙකුත් සංශෝධන ඇතුළත් කරමින් 2017 අංක 24 දරන ආදායම් බදු පනත 2021 වසරේ මැයි මාසයේ දී සංශෝධනය කෙරුණි. මීට අමතරව, හඳුනාගන්නා ලද අලුතින් ආරම්භ කෙරුණු ව්‍යාපාරවලට, ඒවා ක්‍රියාත්මක කළ දිනයේ සිට වසර දෙකක කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව එම ව්‍යාපාර විසින් ලබන ලාභ සහ ප්‍රතිලාභ මත බදු විරාම කිහිපයක් ප්‍රදානය කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රතිචක්‍රීයකරණය කළ ඉදිකිරීම් ද්‍රව්‍ය විකුණනු ලබන ඕනෑම ව්‍යාපාරයක්, වෘත්තීය අධ්‍යාපනය සඳහා ප්‍රමිතිගත සහ පිළිගත් ආයතනයකින් වෘත්තීය අධ්‍යාපනය සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසු පුද්ගලයෙකු විසින් ආරම්භ කරනු ලබන ඕනෑම ව්‍යාපාරයක්, නේවාසික පුද්ගලයෙකු විසින් ශ්‍රී ලංකාවෙහි බෝට්ටු සහ නෞකා නිෂ්පාදනය සඳහා පවත්වාගෙන යනු ලබන ඕනෑම ව්‍යාපාරයක්, සූර්ය හෝ විදුලි බලය මෙගා වොට් සියයකට නොඅඩු අගයක් නිපදවීමේ ධාරිතාව සහිතව පිහිටුවන ලද සහ එවැනි බලශක්තියක් ජාතික සැපයුමට සපයන ඕනෑම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් සහ ශ්‍රී ලංකාවේ දේශීය ශ්‍රමය සහ දේශීය අමුද්‍රව්‍ය භාවිත කරමින් සන්නිවේදන කුළුණු සහ අදාළ උපාංග ඉදි කරන සහ ස්ථාපනය කරන හෝ එවැනි ඉදිකිරීමක් හෝ ස්ථාපනය කිරීමක් සඳහා අවශ්‍ය තාක්ෂණික සේවාවන් සපයන නේවාසික පුද්ගලයෙකු විසින් ආරම්භ කරනු ලබන ඕනෑම ව්‍යාපාරයක් මෙම බදු විරාම භුක්ති විඳීමට සුදුසුකම් ලබයි. තවද, රන්, මැණික් හෝ ස්වර්ණාභරණ අපනයනය කිරීමෙහි නියැලී සිටින ව්‍යාපාරවල විදේශ ව්‍යවහාර මුදල් ඉපැයුම්, බහු ජාතික සමාගම් විසින් ඕනෑම දේශීය බැංකුවක විදේශ ව්‍යවහාර මුදලින් තැන්පත් කරන පොලී ආදායම, ශ්‍රී ලංකා දේපල වෙළඳාම් ආයෝජන භාර වෙත විකුණන ලද, හුවමාරු කරන ලද හෝ පවරන ලද ඉඩම් සහ ගොඩනැගිලි මගින් පුද්ගලයෙකු විසින් ලබන උපලබ්ධි ලාභ, 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතෙහි විධිවිධානවලට යටත්ව, 2021 වසරේ අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආදායම් බදුවලින් නිදහස් කරන ලදී. තවද, 2022 වසරේ මාර්තු මාසයේ දී, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවල සංකීර්ණභාවය ඉවත් කිරීමට සහ ආර්ථිකයේ නැඟී එන අංශ සඳහා සහන සලසන අතරතුර, බදු අනුකූලතාව ඉහළ නැංවීමට විවිධ පාර්ශ්වයන්ගේ ඉල්ලීම්වලට ඉඩ සලසමින් එම පනතේ විධිවිධාන කිහිපයක් සංශෝධනය කිරීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය. මේ අතර, 2019 වසර අග භාගයේ දී ක්‍රියාත්මක කරන ලද බදු සංශෝධන ඇතුළත් කරමින් 2021 වසරේ දී 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කරන ලදී. වසර තුළ දී, රට තුළ අපනයන සහ විදේශීය සෘජු ආයෝජන දිරිමත් කිරීම සඳහා නිශ්චිත ව්‍යාපාර/ ව්‍යාපෘති කිහිපයක් සඳහා සෙස් බද්දෙන් සහ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කෙරුණි. ඒ අනුව, අපනයන භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය හරහා ලැබෙන සුන්බුන්/ අපද්‍රව්‍ය අපනයන කිරීමෙහි නිරත වී සිටින ඕනෑම ව්‍යාපාරයක්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හෝ ඉදිකිරීමේ කාලය තුළ එක් එක් අදියරක දී එ.ජ. ඩොලර් මිලියන 50ක් හෝ ඊට වැඩි අගයක් ආයෝජනය කරන ඕනෑම ව්‍යාපාරයක් හෝ උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘතියක් විසින් සිදු කරන භාණ්ඩ ආනයනය කිරීම්, සෙස් බදු සහ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදුවලින් නිදහස් කරන ලදී. තවද, කොවිඩ්-19 වැළැක්වීමේ වැඩසටහනට සහාය ලබා දීම සඳහා වෛද්‍ය උපකරණ ආනයනය කිරීම ද වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කෙරුණි. මේ අතර, ගොවීන් සඳහා අවශ්‍ය ආරක්ෂාව සැලසීමට සහ දේශීය වෙළඳපොළ තුළ මිල ඉහළ යෑම් අඩු කිරීමට

6

ගත් සැපයුම් පාර්ශ්වීය කළමනාකරණ ක්‍රියාමාර්ග ලෙස සහල්, අර්තාපල්, බඩ ඉරිඟු, කරවල, කිරි නිෂ්පාදිත, ලොකු ඊෑණු සහ හාල්මැස්සන් වැනි ආහාර අයිතම කිහිපයක ආනයන මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සංශෝධනය කෙරුණි. ආර්ථික කටයුතු වේගවත්ව යථා තත්ත්වයට පත් කිරීම සහ ඒ හරහා ආදායම් ප්‍රවාහ වර්ධනය කිරීම ඉහත සඳහන් කළ ප්‍රතිපත්තිවල අරමුණ වුවත්, ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීම මන්දගාමී වීම හේතුවෙන් 2021 වසර තුළ දී ඉහළ රාජ්‍ය ආදායමක් ලැබීමට බාධා ඇති විය.

2021 වසර තුළ දී සහ 2022 වසර මුල් භාගයේ දී, බදු පැහැර හැරීම අවම කිරීමේ සහ බදු පරිපාලනයේ පවතින සංකීර්ණතා අවම කිරීමේ අරමුණ ඇතිව ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දීමට රජය උත්සාහ කළේය. ඒ අනුව, අනෙකුත් කරුණුවලට ඉඩ සලසන අතරම, 2020 වසරේ මාර්තු 31 වන දිනට හෝ ඊට පෙර අවසන් වන ඕනෑම තක්සේරු වර්ෂයක් සඳහා අයබදු ප්‍රකාශයක් තුළ හෝ 2020 මාර්තු 31 වන දිනට හෝ ඊට පෙර අවසන් වන ඕනෑම බදු කාල සීමාවක් සඳහා මෙතෙක් හෙළි නොකෙරුණු, නමුත් බදු අය විය යුතු, සිය සැපයුම්, ආදායම් සහ වත්කම් ස්වේච්ඡාවෙන් වාර්තා කිරීම සඳහා පුද්ගලයන්ට 2021 අංක 18 දරන මුදල් පනතේ විධිවිධාන යටතේ බදු සමාව සඳහා නීති සම්පාදන ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලදී. කෙසේ වෙතත්, බදු බලාත්මක කිරීම සඳහා ශක්තිමත් ක්‍රියාමාර්ග නොපැවතීම හේතුවෙන්, 2021 වසරේ දී බදු සමාවෙන් උත්පාදනය වූ ආදායම රුපියල් මිලියන 174.6කට සීමා විය. කෙටි කාලීන ආදායම් හිඟයන් සපුරා ගැනීම සඳහා බදු සමාවන් ක්‍රියාත්මක කරනු ලැබුවත්, අත්දකින ලද දත්ත මගින් පෙන්නුම් කෙරෙන ආකාරයට සාමාන්‍යයෙන් මෙම ප්‍රතිපත්ති මගින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබෙන අතර, මෙවැනි ප්‍රතිපත්ති මගින් නීතියට අනුකූලව බදු ගෙවන්නන් අධෛර්යමත් කරමින්, දූෂණය සහ මුදල් විශුද්ධිකරණය පවා දිරිමත් කරනු ලැබේ. මේ අතර, මත්පැන්, දුම්වැටි, වාහන (වාහන එකලස් කිරීමේ කොටස් ඇතුළුව), විදුලි සංදේශ, ඔට්ටු ඇල්ලීම හා සූදුව සඳහා පවතින බදු වෙනුවට සංයුක්ත බද්දක් ලෙස විශේෂ භාණ්ඩ හා සේවා බද්දක් (SGST) පැනවීමේ පනත් කෙටුම්පතක් 2022 වසරේ ජනවාරි මාසයේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. විශේෂ භාණ්ඩ හා සේවා බද්ද පැනවීමේ අරමුණ වූයේ ඉහත සඳහන් කරන ලද භාණ්ඩ හා සේවා මත බදු වර්ග රැසක් පැනවීමේ දී සහ පරිපාලනය කිරීමේ දී පැන නගින සංකීර්ණතා මඟහරවා ගනිමින් බදු පරිපාලනයේ කාර්යක්ෂමතාව තහවුරු කිරීම ය. කෙසේ වෙතත්, විශේෂ භාණ්ඩ හා සේවා බදු පනත් කෙටුම්පතට එරෙහිව ඉදිරිපත් කෙරුණු අභියාචනා සලකා බලමින්, එහි වගන්ති කිහිපයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සමඟ නොගැළපීම හේතුවෙන් එම විශේෂ භාණ්ඩ හා සේවා බදු පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතරයකින් සහ ජනමත විචාරණයකින් සම්මත කළ යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලදී. මීට අමතරව, බදු ආශ්‍රිත සියලුම මූලාශ්‍ර ලේඛනවල බදු ගෙවුම්කරු හඳුනා ගැනීමේ අංකය (TIN) භාවිත කිරීම අනිවාර්ය කිරීම සහ සියලුම සීමිත වගකීම් සහිත සමාගම් සඳහා විද්‍යුත් අයබදු ගොනු කිරීම අනිවාර්ය කිරීම වැනි බදු පරිපාලනය වැඩි දියුණු කිරීමේ පියවර කිහිපයක් ගන්නා ලදී. රාජ්‍ය ආදායමේ කැපී පෙනෙන පහළ වැටීමට පිළියම් යෙදීම සහ දිගු කාලීන පදනමක් මත රජයේ මූල්‍යන වැඩිදියුණු කිරීම සඳහා බදු ව්‍යුහය පිළිබඳ නැවත සලකා බලා එය වඩාත් සරල කිරීම මෙන්ම බදු පරිපාලනය ශක්තිමත් කිරීම වර්තමානයේ දී අත්‍යවශ්‍ය කාර්ය වේ.

ආර්ථිකමය වශයෙන් අවදානමට ලක් විය හැකි කණ්ඩායම්වලට සහාය වන අතරතුර, වසංගතයේ බලපෑම් අවම කිරීම සඳහා රජය විසින් අඛණ්ඩව සම්පත් යොදවන ලදී. ඒ අනුව, රජය විසින් පවතින සමාජ ආරක්ෂණ ජාල හරහා ජීවනෝපායන් සඳහා සහාය වෙමින් දීප ව්‍යාප්ත ප්‍රතිශක්තීකරණ වැඩසටහන වේගවත් ලෙස ක්‍රියාත්මක කරන අතරම, වසංගතය පැතිරීම පාලනය කිරීමට සහ පුරවැසියන්ගේ ආරක්ෂාව සහතික කිරීමට තීරණාත්මක පියවර ගන්නා ලදී. රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කෙරෙහි වසංගතයෙන් එල්ල වූ ඉහළ පීඩනය හඳුනා ගනිමින්, 2021 වසර සඳහා අනුමත වී තිබූ රුපියල් බිලියන 2,997ක ණය ගැනීමේ සීමාව තුළ සිටිමින් කොවිඩ්-19 වසංගතය හා සම්බන්ධව මතුවන අවිනිශ්චිත වියදම් සපුරා ගැනීම සඳහා පාර්ලිමේන්තුව විසින් 2021 වසරේ ජූනි මාසයේ දී රුපියල් බිලියන 200ක පරිපූරක අයවැයක් අනුමත කරන ලදී. මේ අතර, 2022 වසරේ ජනවාරි මාසයේ දී, භාණ්ඩ සහ සේවාවල මිල ඉහළ යෑම හේතුවෙන් පුද්ගලයින් විසින් මුහුණ දුන් ආර්ථික දුෂ්කරතා අවම කිරීමේ අරමුණ ඇතිව, රජය විසින් රුපියල් බිලියන 229ක සහන පැකේජයක් හඳුන්වා දෙන ලදී. මෙම සහන පැකේජය යටතේ, සමෘද්ධි ප්‍රතිලාභීන් හට මසකට රුපියල් 1,000ක උපරිම සීමාවකට යටත්ව අනුපාත පදනම මත මාසික දීමනාවක් ප්‍රදානය කරන අතරතුර, 2022 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි, විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා ඇතුළත් නොවන රුපියල් 5,000ක මාසික දීමනාවක් රාජ්‍ය නිලධාරීන්ට සහ විශ්‍රාමිකයන්ට ලබා දුන්නේය. මීට අමතරව, මහ කන්නයේ අපේක්ෂිත නිෂ්පාදන හානි හේතුවෙන්

6

ඇතිවන ඉපැයීම් අලාභවලට හානිපූරණය කිරීම සඳහා ගොවියාගේ ආදායම වී කිලෝවකට රුපියල් 75ක් දක්වා ඉහළ නැංවීමේ අරමුණ ඇතිව, ගොවීන්හට වී කිලෝවකට රුපියල් 25ක් අතිරේකව ගෙවීම, වතුකරයේ සෑම පවුලකටම කිලෝවකට රුපියල් 80ක සහනාධාර මිලකට පිටි කිලෝ 15ක් සැපයීම, පර්චස් 20ට අඩු ගෙවතු වගා කරන අයට රුපියල් 5,000ක් සහ පර්චස් 20ට වැඩි ගෙවතු වගා කරන අයට රුපියල් 10,000ක් ගෙවීම සහ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය හා ඖෂධ නිෂ්පාදිත සඳහා අය කරන බදු ඉවත් කිරීම ඇතුළුව සහන ක්‍රියාමාර්ග කිහිපයක් ම ක්‍රියාත්මක කිරීමට තවමත් ඉතිරිව ඇත. අයවැයෙන් අනුමත ප්‍රතිපාදන අභිබවා ලබා දුන් සහන මගින් මහජනතාවට සහායක් සැලසීමට අදහස් කරන නමුත්, විශේෂයෙන්ම අඩු රාජ්‍ය ආදායමක් පවතින අවස්ථාවක දී, ණය නොවන මූල්‍යකරණ විකල්ප හෝ අනෙකුත් වියදම්වල සැලකිය යුතු කපා හැරීමක් නොමැතිව සහන ලබා දීම හේතුවෙන් ණය තිරසාරභාවය පිළිබඳ ගැටලු උග්‍රකරන අතරම, උද්ධමන සහ විදේශීය අංශ මත පීඩන ඇතිකරමින්, අවසානයේ දී මහජනතාව මත පැටවෙන බර සැහැල්ලු කිරීම වෙනුවට, එය තවදුරටත් ඉහළ නැංවෙනු ඇත. එබැවින්, එවැනි සහන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුත්තේ එම ප්‍රතිපත්ති මගින් රාජ්‍ය මූල්‍ය අංශයට වන බලපෑම පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමිනි.

රජයේ වියදම් අඛණ්ඩව ඉහළ යාම, ආදායම් රැස් කිරීම දුර්වල වීම සහ දේශීය මූල්‍යන අවශ්‍යතා ඉහළ යෑම යන කරුණු සලකා බැලීමේ දී, ණය ගැනීමේ සීමා මෙන්ම රාජ්‍ය මූල්‍ය නීතිවලට අදාළ ඉලක්ක සැපිරිය යුතු කාල සීමා සහ ප්‍රමාණාත්මක සීමා 2021 වසරේ දී සංශෝධනය කරන ලදී. ඒ අනුව, රුපියල් බිලියන 2,000ක් වූ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමේ සීමාව රුපියල් බිලියන 3,000ක් දක්වා ඉහළ නැංවීමේ යෝජනාව පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. මීට අමතරව, 2021 වසරේ නොවැම්බර් මාසයේ දී දළ ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 3,397ක් දක්වා රුපියල් බිලියන 400කින් ඉහළ දැමීම සඳහා 2020 අංක 7 දරන විසර්ජන පනත සංශෝධනය කරන ලදී. මේ අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය ප්‍රමාණය සියයට 60ක් දක්වා අඩු කිරීමේ ණය ඉලක්කය සපුරාලිය යුතු කාල සීමාව 2020 සිට 2030 දක්වා දීර්ඝ කළ අතර, රජය විසින් නිකුත් කරනු ලබන ඇපකරවල සීමාව ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 10 සිට සියයට 15ක් දක්වා වැඩි කිරීමට 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ද සංශෝධනය කරන ලදී.

මධ්‍යම රජයේ අයවැය මත සැලකිය යුතු ණය බරක් ඇති කරමින් බොහෝ අවස්ථාවල රාජ්‍ය ව්‍යවසායයන් සිය මූල්‍ය බර රජය සතු බැංකු වෙත පැවරුවද, රජය විසින් දිගින් දිගටම රාජ්‍ය ව්‍යවසායයන් සඳහා පහසුකම් සලසන ලදී. ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුකූලව විනිවිදභාවය, සාධාරණත්වය, වගවීම සහ වගකීම සහතික කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන් සඳහා උපාය මාර්ගික රාමුවක් ස්ථාපනය කිරීමේ අරමුණින්, ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. රාජ්‍ය ව්‍යවසායයන්හි සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ රාජකාරිවලට අදාළ විධිවිධාන මෙන්ම මහජන යහපත සුරක්ෂිත කිරීම සඳහා එම ආයතනවල පාර්ශ්වකරුවන් සමඟ සබඳතා ගොඩනැඟීම මෙම මාර්ගෝපදේශවලට ඇතුළත් වේ. තවද, රාජ්‍ය ව්‍යවසායයන්වලට අදාළ අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා ඒවායෙහි ව්‍යාපාරික හැසිරීම සම්බන්ධයෙන් උපදෙස් සපයමින් රාජ්‍ය ව්‍යවසායයන් වෙත මෙහෙයුම් අත්පොතක් නිකුත් කරන ලදී. මේ අතර, රාජ්‍ය ව්‍යවසායයන්ගේ ආයෝජනවලට පහසුකම් සැලසීම සඳහා ආයෝජනය පිළිබඳ කළමනාකරණ කමිටුවක් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලදී. වසංගතය හමුවේ ශ්‍රීලංකන් ගුවන් සේවයේ පිරිහුණු මූල්‍ය කාර්ය සාධනය සැලකිල්ලට ගනිමින්, එහි මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රීලංකන් ගුවන් සේවය වෙත ඇපකර සහ සහන සලසන ලිපි (Letter of Comfort) නිකුත් කරන ලද අතර, එම ආයතනය වෙත ප්‍රාග්ධනය යෙදවීමට රජය තීරණය කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2020 වසරේ නොවැම්බර් මාසයේ දී මුළු මුදල රුපියල් බිලියන 27.7ක් වන වාරික දෙකක් සහ 2021 වසරේ අප්‍රේල් මාසයේ දී අතිරේක රුපියල් බිලියන 18.0ක මුදලක් ශ්‍රීලංකන් ගුවන් සේවයට නිකුත් කරන ලදී. මෙම මුදල 2020 වසරේ ඔක්තෝබර් මාසයේ 26 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද එ.ජ. ඩොලර් මිලියන 500ක ප්‍රාග්ධනීකරණ වැඩසටහනේ කොටසක් විය. තවද, කෙටි කාලීන ණය පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කිරීම සඳහා රජය විසින් මහා භාණ්ඩාගාරය ඔස්සේ එ.ජ. ඩොලර් මිලියන 205.4ක් සහ රුපියල් බිලියන 27.6කට සමාන කල් ඉකුත් වූ සියලු සහන සලසන ලිපි රජයේ බැංකු දෙක වෙත යළි නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. මීට අමතරව, රාජ්‍ය බැංකු දෙක විසින් භාණ්ඩාගාර ඇපකර ලබා දීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත පදනම්ව, 2021 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 75ක නව කාරක ප්‍රාග්ධන පහසුකම් ශ්‍රීලංකන් ගුවන් සේවය වෙත ලබා දෙන ලදී. ලංකා ඛනිජ තෙල්

6

නීතිගත සංස්ථාවේ දිනෙන් දින ඉහළ යන මූල්‍ය අලාභ සහ එහි ප්‍රතිඵලයක් ලෙස බැංකු ක්ෂේත්‍රයට එල්ල වන පීඩනය සැලකිල්ලට ගනිමින්, 2021 වසරේ සහ 2022 වසරේ මුල් භාගයේ දී ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ දේශීය ඛනිජ තෙල් මිල ගණන් ඉහළ නංවමින් සංශෝධනය කිරීමට රජය විසින් අවසර ලබා දෙන ලදී. කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යවසායයන් මගින් රාජ්‍ය මූල්‍ය වෙත ඇති කෙරෙන බර අවම කිරීම පිණිස ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් සඳහා පිරිවැය පිළිබිඹු කරන මිලකරණ යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය ව්‍යවසායයන්ගේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඒවා විනිවිදභාවයකින් යුතුව ප්‍රතිව්‍යුහගත කිරීම රජයේ ප්‍රමුඛතාවයක් විය යුතුය.

දුර්වල ආදායම් ඉපැයීමක් පැවතීම හඳුනා ගනිමින්, 2022 වසර සඳහා වන අයවැය මගින් කෙටි කාලීනව ආදායම් වර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග රජය විසින් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, 2022 අයවැයට අනුකූලව, 2022 වසරේ ජනවාරි 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මූල්‍ය ආයතනවල මූල්‍ය සේවා සැපයීම මත පනවා ඇති එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15ක සිට සියයට 18ක් දක්වා වැඩි කිරීම සඳහා 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පතක් 2022 වසරේ මාර්තු මාසයේ දී පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. මේ අතර, 2022 වසර සඳහා වන අයවැයෙන් යෝජනා කළ පරිදි, 2021 වසරේ නොවැම්බර් මාසයේ දී මත්පැන් සහ සිගරට් මත පනවා ඇති නිෂ්පාදන බද්ද ඉහළ නංවමින් සංශෝධනය කරන ලදී. 2017 අංක 24 දරන ආදායම් බදු පනතේ විධිවිධානවලට අනුකූලව බදු අය විය යුතු ආදායම ගණනය කරනු ලබන පුද්ගලයන්, හවුල් ව්‍යාපාර සහ සමාගම් අතරින් 2020 වසරේ අප්‍රේල් 01 වන දිනෙන් ඇරඹෙන බදු තක්සේරු වර්ෂය සඳහා බදු අය විය යුතු ආදායම රුපියල් බිලියන 2ක් ඉක්මවා යන්නන් මත සියයට 25ක අතීතය මත බලපැවැත්වෙන අධිභාර බද්දක් පැනවීමේ අරමුණින් 2022 අංක 14 දරන අධිභාර බද්ද පනත බලාත්මක කරන ලදී. අතීතය මත බලපැවැත්වෙන මෙවැනි බදුවලින් වර්ෂයක් තුළ රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට අපේක්ෂා කළ ද, මෙම තාවකාලික බදු ප්‍රතිපත්ති මගින් තිරසාර පදනමක් මත රාජ්‍ය ආදායම උත්පාදනය කළ නොහැකිය. මීට අමතරව, එවැනි අතීතය මත බලපැවැත්වෙන පරිදි පනවනු ලබන බදු මගින් ඇති කෙරෙන අවිනිශ්චිතතා හේතුවෙන් ආයෝජකයන්ගේ විශ්වාසයට සහ බදු ගෙවීම සඳහා ඇති කැමැත්තට බාධා සිදු වනු ඇත.

2022 වසරේ දී, සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය සහ රටේ පවතින විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ රාජ්‍ය වියදම සාර්ථකව කළමනාකරණය කිරීමේ අරමුණ ඇතිව, රජය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වා දෙන ලදී. වසර තුළ දී, ආර්ථික ප්‍රතිලාභ සලකා බලා ප්‍රමුඛතා පදනම මත රාජ්‍ය ආයෝජන සිදු කරන අතර ම, වාහන, ගොඩනැගිලි සහ වෙනත් වත්කම් මිල දී ගැනීමේ වියදම් සීමා කිරීම, රාජ්‍ය ආයතන සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම අත්හිටුවීම හරහා වියදම් තාර්කිකරණය කිරීමට රජය කැපවිය. 2022 වසර සඳහා වන අයවැයට අනුකූලව, රජයේ ආයතනවල විදුලිය සඳහා වන ප්‍රතිපාදන සියයට 10කින් අඩු කිරීම, රාජ්‍ය ආයතනවල දුරකථන වියදම් සියයට 25කින් අඩු කිරීම, අමාත්‍යවරුන් සහ රාජ්‍ය නිලධාරීන්හට ලබා දෙන ඉන්ධන දීමනාව මසකට ලීටර් 5 බැගින් අඩු කිරීම සහ නව කාර්යාල පරිශ්‍රයන් ගොඩනැගීම වසර දෙකකට අත්හිටුවීම හරහා විවිධ වියදම් කපා හැරීමේ ක්‍රියාමාර්ග රජය විසින් 2021 වසරේ නොවැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. කෙසේ වෙතත්, ඉහළ යන රජයේ වියදම් සැලකිය යුතු ලෙස අඩු කිරීමට සහ එමගින් රජයේ මූල්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීමට මෙවැනි පියවර ප්‍රමාණවත් නොවිය හැකිය. රටේ පවතින විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය හමුවේ, 2022 වසරේ මාර්තු මාසයේ දී, වාහන, විදුලි සෝපාන, වායු සමීකරණ සහ අනෙකුත් විදුලි උපකරණ භාවිතය අවම කිරීම ඔස්සේ රාජ්‍ය අංශයේ විදුලිය සහ ඉන්ධන පරිභෝජනය සීමා කිරීමට රජය විසින් මාර්ගෝපදේශ කිහිපයක් නිකුත් කරන ලදී. තවද, ආයු අපේක්ෂාව ඉහළ යෑම සහ එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය සේවයේ ක්‍රියාකාරීව සිටීමට ඇති හැකියාව සැලකිල්ලට ගනිමින්, රටේ ශ්‍රම බලකාය ශක්තිමත් කිරීම සහ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ සඳහා දරන්නට වන වියදම අඩු කිරීම සඳහා 2022 වසරේ ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය නිලධාරීන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 65ක් දක්වා දීර්ඝ කරන ලදී. මේ අතර, 2022 වසරේ ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයින්ගේ අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු 62ක් දක්වා දීර්ඝ කෙරුණි.

ආපසු ගෙවිය යුතු විදේශ ණය ප්‍රමාණය විශාල වීම සහ ප්‍රමාණවත් නොවන මූල්‍ය ගලා ඒම් මධ්‍යයේ, රටේ විදේශ විනිමය සංචිත අඩු වීම සලකා බලමින්, ප්‍රධාන ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ ආයතන තුන විසින් 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහත හෙළන ලදී. එස් ඇන්ඩ් පී ගෝලීය ණය ශ්‍රේණිගත කිරීමේ

6

6.1 සංඛ්‍යා සටහන

රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)
රුපියල් මිලියන		
මුළු ආදායම සහ ප්‍රදාන	**1,373,308**	**1,463,810**
මුළු ආදායම	1,367,960	1,457,071
බදු ආදායම	1,216,542	1,298,019
බදු නොවන ආදායම	151,417	159,052
ප්‍රදාන	5,348	6,740
වියදම් සහ ශුද්ධ ණය දීම්	**3,040,996**	**3,521,735**
පුනරාවර්තන	2,548,359	2,747,512
මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම	-123,428	-
ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම්	492,638	774,223
එයින් රාජ්‍ය ආයෝජන	811,773	789,636
මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම	-299,178	-
වර්තන ගිණුමේ ශේෂය	**-1,180,399**	**-1,290,441**
ප්‍රාථමික ශේෂය	**-687,386**	**-1,009,542**
සමස්ත අයවැය ශේෂය	**-1,667,688**	**-2,057,925**
මූල්‍යනය	**1,667,688**	**2,057,925**
විදේශීය මූල්‍යනය	-83,199	-13,901
දේශීය මූල්‍යනය	1,750,887	2,071,826
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ඇ)		
මුළු ආදායම සහ ප්‍රදාන	**9.1**	**8.7**
මුළු ආදායම	9.1	8.7
බදු ආදායම	8.1	7.7
බදු නොවන ආදායම	1.0	0.9
ප්‍රදාන	0.04	0.04
වියදම් සහ ශුද්ධ ණය දීම්	**20.2**	**21.0**
පුනරාවර්තන	17.0	16.3
මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම	-0.8	-
ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම්	3.3	4.6
එයින් රාජ්‍ය ආයෝජන	5.4	4.7
මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම	-2.0	-
වර්තන ගිණුමේ ශේෂය	**-7.9**	**-7.7**
ප්‍රාථමික ශේෂය	**-4.6**	**-6.0**
සමස්ත අයවැය ශේෂය	**-11.1**	**-12.2**
මූල්‍යනය	**11.1**	**12.2**
විදේශීය මූල්‍යනය	-0.6	-0.1
දේශීය මූල්‍යනය	11.7	12.3

මූලය: මුදල් අමාත්‍යාංශය

(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2020 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛනවලට ගැළපුම් සිදු කර ඇත.

(ආ) තාවකාලික

(ඇ) 2020 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 මාර්තු 29 දින නිකුත් කරන ලද සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත.

ආයතනය (S&P Global Ratings) මගින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම 2021 වසරේ අගෝස්තු 27 වන දින 'CCC+ (ස්ථාවර)' සිට 'CCC+ (සෘණ)' දක්වා පහත හෙළන ලද අතර, 2022 වසරේ ජනවාරි 12 වන දින 'CCC (සෘණ)' දක්වා තවදුරටත් පහත හෙළන ලදී. ෆිච් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය (Fitch Ratings) විසින් 2020 වසරේ නොවැම්බර් 27 වන දින සිට වසරකට වැඩි කාලයක් 'CCC' වශයෙන් ශ්‍රේණිගත කිරීම පවත්වා ගෙන ගිය ද, එම ආයතනය විසිනුත් 2021 වසරේ දෙසැම්බර් 17 වන දින ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම 'CCC' දක්වා පහත හෙළා ඇත. එසේම, මූඩීස් ආයෝජක සේවය (Moody's Investors Service) විසින් ද 2021 වසරේ ඔක්තෝබර් 28 වන දින ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම 'Caa1 (ස්ථාවර)' සිට 'Caa2 (ස්ථාවර)' දක්වා පහත හෙළන ලදී. රාජ්‍ය මූල්‍ය අසමතුලිතතා, විදේශ මූල්‍යන අවශ්‍යතා සපුරාලීමේ දී රටට මුහුණ දීමට සිදු වී ඇති විදේශීය අංශයේ අභියෝග, ප්‍රතිපත්තිමය ඉදිරි දැක්ම අවිනිශ්චිත වීම සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය මන්දගාමී වීමේ අවදානම මෙම ශ්‍රේණිගත කිරීමේ තීරණවලට මූලික වශයෙන් බලපා ඇත. කෙසේ වෙතත්, 2021 වසරේ ජූලි මාසයේ 27 වන දින කල් පිරුණු එ.ජ. ඩොලර් මිලියන 1,000ක සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ඇතුළුව, සිය සියලු ණය සේවාකරණ වගකීම් රජය විසින් 2021 වසරේ දී පියවූ අතර, 2022 වසරේ ජනවාරි මාසයේ 18 වන දින කල් පිරුණු එ.ජ. ඩොලර් මිලියන 500ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ද පියවා ඇත.

6.3 රජයේ අයවැය කටයුතු

ආදායම සහ ප්‍රදාන

ආදායම

2019 වසරේ අග භාගයේ සිට ලිහිල් බදු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමත් සමඟ, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම ඉතිහාසයේ වාර්තා වූ අඩුම අගය දක්වා පහත වැටෙමින්, 2021 වසරේ දී රජයේ ආදායම මන්දගාමී වර්ධනයක් වාර්තා කළේය. 2021 වසරේ දී, නාමික වශයෙන්, රජයේ ආදායම රුපියල් බිලියන 1,457.1ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.5කින් ඉහළ ගිය අතර, එකතු කළ අගය මත බද්ද, ආදායම් බදු, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සහ සෙස් බද්ද වැනි බදුවලින් ලද ආදායම ඉහළ යෑම මේ සඳහා හේතු විය. පෙර වසරේ පැවති රුපියල් බිලියන 1,216.5ක් වූ බදු ආදායම 2021 වසරේ දී රුපියල් බිලියන 1,298.0ක් දක්වා සියයට 6.7කින් ඉහළ ගියේය. මේ අතර, ගාස්තු සහ අය කිරීම්, බදු කුලී ආදායම, පොලී ආදායම සහ මහ බැංකුවෙන් ලැබෙන ලාභ පැවරුම් අඩු වුවද, රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් ලද ලාභ හා ලාභාංශ සහ සමාජ ආරක්ෂණ දායක මුදල්වලින් ලද ආදායම් ඉහළ යෑම හේතුවෙන්, 2020 වසරේ දී රුපියල් බිලියන 151.4ක් වූ බදු නොවන ආදායම, 2021 වසරේ දී රුපියල් බිලියන 159.1ක් දක්වා ඉහළ

6

6.3 රූප සටහන
රාජ්‍ය ආදායමේ සංයුතිය - 2021



මූලය: මුදල් අමාත්‍යාංශය

ගියේය. කෙසේ වෙතත්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රජයේ ආදායම පෙර වසරේ පැවති සියයට 9.1 සිට 2021 වසරේ දී සියයට 8.7ක් දක්වා පහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම 2020 වසරේ දී සියයට 8.1ක් වැනි පහළ මට්ටමක පැවති අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සියයට 7.7ක් දක්වා තවදුරටත් පහළ ගියේය. 2021 වසර තුළ දී, ලිහිල් බදු ක්‍රමය අඛණ්ඩව පැවතීම, විදේශීය අංශයේ පීඩනය සමනය කිරීම සඳහා ආනයන සීමා පැනවීම සහ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීම මන්දගාමී වීම හේතුවෙන්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රජයේ ආදායම සහ බදු ආදායම යන ද්විත්වයම, නිදහසින් පසු වාර්තා වූ අවම අගයයන් දක්වා පහළ ගියේය. මේ අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස බදු නොවන ආදායම, 2020 වසරේ දී වාර්තා වූ සියයට 1.0ට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 0.9ක් දක්වා අඩු වූ අතර, 2020 වසරේ දී රුපියල් බිලියන 5.3ක් වූ රජය වෙත ලැබුණු ප්‍රදාන, 2021 වසරේ දී රුපියල් බිලියන 6.7ක් දක්වා සුළු වශයෙන් ඉහළ යෑමක් වර්තා කළේය.

නාමික වශයෙන්, 2020 වසරේ දී රුපියල් බිලියන 268.2ක් වූ ආදායම් බදු මගින් ලද ආදායම, 2021 වසරේ දී රුපියල් බිලියන 302.1ක් දක්වා සියයට 12.6කින් ඉහළ ගියේය. 2020 වසර ආරම්භයේ දී අහෝසි කරන ලද ආර්ථික සේවා ගාස්තුව හැර අනෙකුත් සියලුම ආදායම් බදු වර්ගවලින් ඉහළ ගිය ආදායම් ලැබීම් මෙමගින් පිළිබිඹු වේ. ආදායම් බදුවලින් ලද ආදායම ඉහළ යෑමත් සමඟ, 2020 වසරේ දී මුළු බදු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 22.1ක්ව පැවති සෘජු බදු ආදායම 2021 වසරේ දී 23.3ක් දක්වා ඉහළ ගියේය. පසුගිය වසරට සාපේක්ෂව 2021 වසරේ දී ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම සහ ආයතනවල කාර්ය සාධනයෙහි සිදු වූ වර්ධනය පිළිබිඹු කරමින්, සංස්ථාපිත හා සංස්ථාපිත නොවන බදු මගින් ලැබෙන ආදායම, පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 228.3 සිට 2021 වසරේ දී රුපියල් බිලියන 273.6ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද සහ රඳවා ගැනීමේ බද්ද මගින් ලද ආදායම්, 2020 වසරේ දී, පිළිවෙළින්, රුපියල් බිලියන 15.0 සහ 10.0 සිට සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ දී, රුපියල් බිලියන 15.4ක් සහ 12.4ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. මේ අතර, 2020 වසරේ ජනවාරි මාසයේ දී ආර්ථික සේවා ගාස්තුව ඉවත් කිරීමෙන් පසුව, 2021 වසර තුළ දී ආර්ථික සේවා ගාස්තුව ලෙස එකතු වූ හිඟ මුදල්, රුපියල් බිලියන 0.7ක් විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ආදායම් බදුවලින් ලැබෙන ආදායම, 2020 වසරේ සිට බොහෝ දුරට නොවෙනස්ව පැවතෙමින්, 2021 වසරේ දී සියයට 1.8ක් ලෙස වාර්තා විය.

ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් එකතු කළ අගය මත බද්ද මගින් ලැබෙන ආදායම ඉහළ ගියේය. ඒ අනුව, එකතු කළ අගය මත බදු ආදායම, 2020 වසරේ දී පැවති රුපියල් බිලියන 233.8ට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 308.2ක් දක්වා ඉහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස එකතු කළ අගය මත බදුවලින් ලැබෙන ආදායම 2020 වසරේ දී සියයට 1.6ක් වූ අතර, එය 2021 වසරේ දී සියයට 1.8ක් දක්වා ඉහළ ගියේය. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ආශ්‍රිත එකතු කළ අගය මත බදු ආදායම, 2020 වසරේ දී පැවති රුපියල් බිලියන 148.1 සිට 2021 වසරේ දී රුපියල් බිලියන 185.5ක් දක්වා ඉහළ ගිය අතර, ආනයන ආශ්‍රිත එකතු කළ අගය මත බදු ආදායම, 2020 වසරේ දී පැවති රුපියල් බිලියන 85.7 සිට 2021 වසරේ දී රුපියල් බිලියන 122.8ක් දක්වා වර්ධනය විය. එකතු කළ අගය මත බද්ද මුළු ආදායමේ සහ මුළු බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස, 2020 වසර තුළ දී, පිළිවෙළින්, සියයට 17.1ක් සහ 19.2ක් වූ අතර, 2021 වසරේ දී, මෙම බදු ප්‍රතිශත පිළිවෙළින්, සියයට 21.2ක් සහ 23.7ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2019 වසරේ දෙසැම්බර් මාසයේ දී ජාතිය ගොඩනැගීමේ බද්ද අහෝසි කිරීමෙන් අනතුරුව, 2021 වසරේ දී එම බද්දට අදාළ හිඟ මුදල් ලැබීම රුපියල් බිලියන 0.4ක් ලෙස වාර්තා විය.

රට තුළ පවතින විදේශ විනිමය ද්‍රවශීලතා ගැටලු සැලකිල්ලට ගනිමින් මෝටර් රථ ආනයනය සඳහා පනවා ඇති සීමා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හේතුවෙන් නිෂ්පාදන බදු ආදායම ලැබෙන ප්‍රභව දුර්වල වීම නිසා නිෂ්පාදන / සුරා බදු ආදායම 2021 වසරේ දී අඩු විය. ඒ අනුව, නාමික වශයෙන්,

6

6.2 සංඛ්‍යා සටහන

රාජ්‍ය ආදායම පිළිබඳ සම්පිණ්ඩනය

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)
රුපියල් මිලියන		
බදු ආදායම	**1,216,542**	**1,298,019**
ආදායම් බදු	268,249	302,115
එකතු කළ අගය මත බදු	233,786	308,213
නිෂ්පාදන/සුරා බදු	321,932	306,861
ආනයන මත බදු	114,183	64,339
අනෙකුත් බදු	278,392	316,490
බදු නොවන ආදායම	**151,417**	**159,052**
මුළු ආදායම	**1,367,960**	**1,457,071**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ඇ)		
බදු ආදායම	**8.1**	**7.7**
ආදායම් බදු	1.8	1.8
එකතු කළ අගය මත බදු	1.6	1.8
නිෂ්පාදන/සුරා බදු	2.1	1.8
ආනයන මත බදු	0.8	0.4
අනෙකුත් බදු	1.9	1.9
බදු නොවන ආදායම	1.0	0.9
මුළු ආදායම	**9.1**	**8.7**

මූලය: මුදල් අමාත්‍යාංශය

(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2020 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛනවලට ගැලපුම් සිදු කර ඇත.

(ආ) තාවකාලික

(ඇ) 2020 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 මාර්තු 29 දින නිකුත් කරන ලද සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත.

නිෂ්පාදන / සුරා බදු ආදායම, 2020 වසරේ දී රුපියල් බිලියන 322.0ක් වූ අතර, 2021 වසරේ දී එය රුපියල් බිලියන 306.9ක් දක්වා පහළ ගිය අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස නිෂ්පාදන / සුරා බදු එක්රැස් කිරීම, පෙර වසරේ පැවති සියයට 2.1ක සිට 2021 වසරේ දී සියයට 1.8ක් දක්වා අඩු විය. මෝටර් රථ සම්බන්ධයෙන් වන නිෂ්පාදන බදු ආදායම ලැබීම්, 2020 වසරේ දී රුපියල් බිලියන 48.8ක් සහ 2019 වසරේ දී රුපියල් බිලියන 130.4ක් වූ අතර, 2021 වසරේ දී එම ලැබීම් රුපියල් බිලියන 18.1ක් දක්වා පහළ ගියේය. මේ අතර, 2020 වසරේ දී රුපියල් බිලියන 94.3ක් වූ දුම්වැටි සහ දුම්කොළ මත වන නිෂ්පාදන බදු ආදායම, 2021 වසරේ දී රුපියල් බිලියන 88.5ක් දක්වා පහළ ගියේය. සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ දී පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයනය වැඩි වීම හේතුවෙන්, ඛනිජ තෙල් නිෂ්පාදන මත වන නිෂ්පාදන බදු ආදායම 2020 වසරේ දී පැවති රුපියල් බිලියන 53.1 සිට 2021 වසරේ දී රුපියල් බිලියන 55.3ක් දක්වා ඉහළ ගියේය. මීට අමතරව, වසංගතය හේතුවෙන් ඇති වූ අවහිරතා මධ්‍යයේ වුව ද හෝටල් / ආපනශාලා / සංචාරක කර්මාන්තය ආශ්‍රිත සේවා යථා තත්ත්වයට පත් වීම පිළිබිඹු කරමින්, මත්පැන් නිෂ්පාදනය වැඩි වීම හේතුවෙන්, 2021 වසරේ දී මත්පැන් හරහා උපයාගත් සුරා බදු ආදායම රුපියල් බිලියන 138.6ක් දක්වා සියයට 14.6කින් ඉහළ ගියේය.

අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ කිහිපයක ආනයනය මත සීමා පැනවූවද, 2021 වසරේ දී ජාත්‍යන්තර වෙළෙඳාම සම්බන්ධ බදු ආදායම මිශ්‍ර කාර්ය සාධනයක් පෙන්නුම් කළේය. ආනයන තීරු බදුවලින් ලද ආදායම, 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 114.2 සිට 2021 වසරේ දී රුපියල් බිලියන 64.3ක් දක්වා පහළ ගියේය. ආනයන සීමා කිරීම්වලට අමතරව, ආනයන තීරු බදු ව්‍යුහය සරල කිරීමට අනුකූලව 2020 වසරේ නොවැම්බර් මාසයේ දී තෝරාගත් භාණ්ඩ සඳහා ආනයන තීරු බදු අනුපාතය සියයට 30 සිට සියයට 15 දක්වා අඩු කිරීම ද ජාත්‍යන්තර වෙළඳ කටයුතුවලින් ලැබෙන ආදායම පහත වැටීමට හේතු විය. මේ අතර, විශේෂ වෙළඳ භාණ්ඩ බදු ආදායම, 2020 වසරේ දී පැවති රුපියල් බිලියන 82.7ට සාපේක්ෂව, 2021 වසරේ දී රුපියල් බිලියන 55.8ක් දක්වා සියයට 32.5කින් පහළ ගියේය. අත්‍යවශ්‍ය නොවන ද්‍රව්‍ය කිහිපයක් මත ආනයන සීමා පැනවීම, කරවල, ලොකු ළූණු සහ අර්තාපල් සඳහා බදු අනුපාත අඩු කිරීම සහ ලුණු, සහල්, දිසිඳි පොල් සහ බඩ ඉරිඟු සඳහා බදු සහන පැනවීම, විශේෂ වෙළඳ භාණ්ඩ බදු මගින් ලද ආදායම අඩු වීමට හේතු විය. අනෙක් අතට, අත්‍යවශ්‍ය නොවන විවිධ ද්‍රව්‍ය සඳහා ආනයන සීමා කිරීම් සහ වෛද්‍ය උපකරණ, ව්‍යාපෘති ආශ්‍රිත භාණ්ඩ සහ තෝරාගත් භාණ්ඩ සඳහා ලබා දී ඇති බදු නිදහස් කිරීම් මධ්‍යයේ වුව ද, වසර තුළ දී වරාය සහ ගුවන් තොටුපළ බදු සහ සෙස් බද්දෙන් ලැබෙන ආදායම ඉහළ ගියේය. ඒ අනුව, 2020 වසරේ දී රුපියල් බිලියන 115.4ක් වූ වරාය සහ ගුවන් තොටුපළ බද්දෙන් ලද ආදායම, 2021 වසරේ දී රුපියල් බිලියන 154.1ක් දක්වා ඉහළ ගිය අතර සෙස් බද්දෙන් ලැබෙන ආදායම, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 75.5ක් දක්වා සියයට 53.2කින් ඉහළ ගියේය. ආනයන තීරු බදු ව්‍යුහය සරල කිරීමට අනුකූලව, සෙස් බද්දෙන් එකතු වන ආදායම් ඉහළ යෑම සඳහා තෝරා ගත් භාණ්ඩ සඳහා 2020 වසරේ නොවැම්බර් මාසයේ දී සෙස් බදු අනුපාතය ඉහළ නැංවීම හේතු විය.

වාණිජ ව්‍යවසායයන්වලින් ලාභ සහ ලාභාංශ ලැබීම් සහ සමාජ ආරක්ෂණ දායක මුදල්වලින් ලද ආදායම් ඉහළ යෑම හේතුවෙන් වසර තුළ දී, නාමික වශයෙන්, බදු නොවන ආදායම ඉහළ ගියේය. ඒ අනුව, 2020 වසරේ දී රුපියල් බිලියන 151.4ක් වූ බදු නොවන

ආදායම, 2021 වසරේ දී රුපියල් බිලියන 159.1ක් දක්වා ඉහළ ගියේය. ආර්ථික ක්‍රියාකාරකම් නැවත යථා තත්ත්වයට පත් වීම පිළිබිඹු කරමින් වාණිජ ව්‍යවසායයන්ගෙන් ලැබෙන ලාභ සහ ලාභාංශ, 2020 වසරට සාපේක්ෂව 2021 වසර තුළ දී රුපියල් බිලියන 30.6ක් දක්වා සියයට 73.6කින් ඉහළ ගියේය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී, සමාජ ආරක්ෂණ දායක මුදල්වලින් ලද ආදායම රුපියල් බිලියන 34.6ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.8කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, පොලී සහ බදු කුලී ආදායම, 2020 වසරේ දී ලද රුපියල් බිලියන 19.4ට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 11.6ක් දක්වා අඩු වූ අතර, 2021 වසරේ දී ගාස්තු සහ අය කිරීම්වලින් ලැබෙන ආදායම රුපියල් බිලියන 42.6ක් දක්වා සියයට 10.0කින් පහළ ගියේය. මහ බැංකුව විසින් රජය වෙත සිදු කරන ලද ලාභ පැවරුම් ප්‍රමාණය, 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 24.0ට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 15.0ක් විය.

ප්‍රදාන

ද්විපාර්ශ්වීය සහ බහුපාර්ශ්වීය මූලාශ්‍රවලින් ලද මුළු විදේශ ප්‍රදාන, 2020 වසරේ දී ලද රුපියල් බිලියන 5.3ට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 6.7ක් දක්වා ඉහළ ගියේය. 2020 වසරේ දී රුපියල් බිලියන 2.8ක් වූ ද්විපාර්ශ්වීය මූලාශ්‍රවලින් ලද විදේශීය ප්‍රදාන, 2021 වසරේ දී රුපියල් බිලියන 3.2ක් දක්වා ඉහළ ගිය අතර, 2020 වසරේ දී රුපියල් බිලියන 2.5ක් වූ බහුපාර්ශ්වීය මූලාශ්‍රවලින් ලද විදේශීය ප්‍රදාන, 2021 වසරේ දී රුපියල් බිලියන 3.5ක් දක්වා වර්ධනය විය. ජපන් රජය, ආසියානු සංවර්ධන බැංකුව සහ එක්සත් ජනපදයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2021 වසර තුළ දී ප්‍රදානයන් ලබා දුන් ප්‍රධාන සංවර්ධන හවුල්කරුවන් විය.

වියදම් සහ ශුද්ධ ණය දීම්

පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් යන දෙඅංශයෙහිම ඉහළ යෑම හේතුවෙන් වසර තුළ දී මුළු වියදම හා ශුද්ධ ණය දීම් ඉහළ ගියේය. ඒ අනුව, මුළු වියදම සහ ශුද්ධ ණය දීම් 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 3,041.0ට (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 20.2) සාපේක්ෂව, 2021 වසරේ දී රුපියල් බිලියන 480.7කින් ඉහළ යමින් රුපියල් බිලියන 3,521.7ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 21.0ක්) දක්වා වර්ධනය විය. 2021 වසරේ දී, මුළු වියදම සහ ශුද්ධ ණය දීම් 2021 වසර සඳහා

6.4 රූප සටහන
රාජ්‍ය පුනරාවර්තන වියදමේ සංයුතිය - 2021



මූලය: මුදල් අමාත්‍යාංශය

වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 99.9ක් සහ 2021 වසර සඳහා සංශෝධිත වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 105.9ක් විය. වැටුප් හා වේතන සහ පොලී ගෙවීම් සඳහා වන වියදම් ඉහළ යෑම පිළිබිඹු කරමින්, පුනරාවර්තන වියදම් 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 2,548.4ට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 2,747.5ක් දක්වා ඉහළ ගියේය. 2020 වසරේ දී රුපියල් බිලියන 492.6ක් වූ ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලයන 774.2ක් දක්වා ඉහළ ගියේය.

2021 වසරේ දී, වැටුප් හා වේතන සහ පොලී ගෙවීම් සඳහා වන වියදම් ඉහළ යෑම, පුනරාවර්තන වියදම් ඉහළ යෑමට දායකත්වයක් ලබා දුණි. වාර්ෂික වැටුප් වර්ධකවල බලපෑමට අමතරව, 2020 වසරේ සැප්තැම්බර් මාසයේ දී අඩු ආදායම්ලාභී පවුල්වල නුපුහුණු පුද්ගලයන් සහ රැකියා විරහිත උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් රජයේ සේවයට බඳවා ගැනීම හේතුවෙන්, 2020 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 794.2ක් වූ වැටුප් හා වේතන වියදම්වලට සාපේක්ෂව, 2021 වසරේ දී එම වියදම රුපියල් බිලියන 845.7ක් දක්වා රුපියල් බිලියන 51.5කින් ඉහළ ගියේය. 2021 වසර තුළ දී වැටුප් හා වේතන වියදම් රජයේ ආදායමෙන් සියයට 58.0කට සහ 2021 වසරේ සමස්ත පුනරාවර්තන වියදමෙන් සියයට 30.8කට දායක විය. භාණ්ඩාගාර බැඳුම්කර සඳහා පොලී ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් දේශීය පොලී ගෙවීම් වර්ධනය වීම පිළිබිඹු කරමින්, 2020 වසරේ දී රුපියල් බිලියන 980.3ක් වූ පොලී ගෙවීම්, 2021 වසරේ දී රුපියල් බිලියන 1,048.4ක් දක්වා සියයට 6.9කින් වැඩි විය. ඒ අනුව, 2021 වසරේ දී භාණ්ඩාගාර බැඳුම්කර ඔස්සේ

6

6.3 සංඛ්‍යා සටහන

ආර්ථික වර්ගීකරණයට අනුව වියදම් සහ ශුද්ධ ණය දීම්

ශීර්ෂය	2020 (අ)	2021 (ආ)
රුපියල් මිලියන		
පුනරාවර්තන වියදම්	**2,548,359**	**2,747,512**
භාණ්ඩ හා සේවා වියදම	974,351	1,014,612
එයින් වැටුප් හා වේතන	794,158	845,680
පොලී ගෙවීම්	980,302	1,048,382
විදේශීය	266,679	253,750
දේශීය	713,623	794,633
වර්තන පැවරුම් හා සහනාධාර	717,133	684,518
එයින් කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට	610,486	595,696
සමෘද්ධි	52,434	55,400
විශ්‍රාම වැටුප්	257,833	269,827
පොහොර සහනාධාර	36,687	21,235
අනෙකුත්	263,532	249,233
මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම	-123,428	-
ප්‍රාග්ධන වියදම්	**795,368**	**767,606**
මූර්ත වත්කම් අත්පත් කර ගැනීම්	483,543	438,753
ප්‍රාග්ධන පැවරුම්	307,917	326,578
අනෙකුත්	3,907	2,275
ශුද්ධ ණය දීම්	**-3,552**	**6,617**
මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම	-299,178	-
ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්	**492,638**	**774,223**
මුළු වියදම සහ ශුද්ධ ණය දීම්	**3,040,996**	**3,521,735**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ඇ)		
පුනරාවර්තන වියදම්	**17.0**	**16.3**
භාණ්ඩ හා සේවා වියදම	6.5	6.0
එයින් වැටුප් හා වේතන	5.3	5.0
පොලී ගෙවීම්	6.5	6.2
විදේශීය	1.8	1.5
දේශීය	4.7	4.7
වර්තන පැවරුම් හා සහනාධාර	4.8	4.1
එයින් කුටුම්භ සහ අනෙකුත් අංශයන්ට	4.1	3.5
සමෘද්ධි	0.3	0.3
විශ්‍රාම වැටුප්	1.7	1.6
පොහොර සහනාධාර	0.2	0.1
අනෙකුත්	1.8	1.5
මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම	-0.8	-
ප්‍රාග්ධන වියදම්	**5.3**	**4.6**
මූර්ත වත්කම් අත්පත් කර ගැනීම්	3.2	2.6
ප්‍රාග්ධන පැවරුම්	2.0	1.9
අනෙකුත්	0.03	0.01
ශුද්ධ ණය දීම්	**-0.02**	**0.04**
මුදල් අමාත්‍යාංශයට අනුව නොපියවූ ගෙවීම් සඳහා වන ගැළපීම	-2.0	-
ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්	**3.3**	**4.6**
මුළු වියදම සහ ශුද්ධ ණය දීම්	**20.2**	**21.0**

මූලය: මුදල් අමාත්‍යාංශය

(අ) මුදල් අමාත්‍යාංශයට අනුව, 2020 අයවැයෙහි ප්‍රකාශයට පත් කළ පරිදි, 2020 වසරට අදාළ රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාලේඛනවලට ගැළපුම් සිදු කර ඇත.

(ආ) තාවකාලික

(ඇ) 2020 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 මාර්තු 29 දින නිකුත් කරන ලද සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත.

ණය ගැනීම් රුපියල් බිලියන 6,968.0ක් දක්වා රුපියල් බිලියන 1,248.4කින් ඉහළ යෑම නිසා, භාණ්ඩාගාර බැඳුම්කර මත ගෙවූ පොලිය 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 550.5ට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 593.4ක් දක්වා ඉහළ ගියේය. අවම වශයෙන්, අඩු කිරීමට අපහසු රජයේ පුනරාවර්තන වියදම් සපුරා ගැනීම සඳහා හෝ ප්‍රමාණවත් ආදායමක් නොපැවතීම යන උග්‍ර ගැටලුව පැහැදිලිව නිරූපණය කරමින්, රාජ්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස පොලී ගෙවීම් සඳහා වන වියදම, 2020 වසරේ දී පැවති සියයට 71.7ට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 72.0ක් විය. මේ අතර, 2021 වසරේ යල කන්නයේ සිට රසායනික පොහොර සඳහා ලබා දුන් පොහොර සහනාධාරය ඉවත් කිරීම සහ පාසල් හා උසස් අධ්‍යාපන සිසුන් සඳහා වාර ප්‍රවේශ පත්‍ර ලබා දීම, වයස අවුරුදු 70ට වැඩි වැඩිහිටියන් සඳහා මූල්‍ය සහාය ලබා දීම වැනි සහනාධාර වැඩසටහන් මත සිදු කළ වියදම අඩු වීමේ ප්‍රතිඵලයක් ලෙස කුටුම්භ අංශය වෙත ලබා දුන් සහනාධාර පහළ යෑම වැනි හේතු නිසා, 2020 වසරේ දී රුපියල් බිලියන 717.1ක් වූ සහනාධාර සහ පැවරුම් සඳහා වියදම, 2021 වසරේ දී රුපියල් බිලියන 684.5ක් දක්වා පහත වැටුණි. කෙසේ වෙතත්, 2021 වසරේ දී විශ්‍රාම වැටුප් සඳහා වියදම රුපියල් බිලියන 269.8ක් දක්වා සියයට 4.7කින් ඉහළ ගිය අතර, සමෘද්ධි ගෙවීම් සඳහා වියදම, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 55.4ක් දක්වා සියයට 5.7කින් ඉහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පුනරාවර්තන වියදම්, 2020 වසරේ දී වාර්තා වූ සියයට 17.0ට සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 16.3ක් දක්වා පහත වැටුණි.

2021 වසරේ දී ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්, නාමික වශයෙන් සහ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස යන දෙආකාරයෙන්ම ඉහළ ගියේය. ඒ අනුව,

6.5 රූප සටහන

කාර්යයන් අනුව මුළු වියදම හා ණය දීම් - 2021



මූලය: මුදල් අමාත්‍යාංශය

6.4 සංඛ්‍යා සටහන

කාර්යයන් අනුව වියදම් වර්ගීකරණය

ශීර්ෂය	2021 (අ)
රුපියල් මිලියන	
පුනරාවර්තන වියදම්	**2,747,512**
සාමාන්‍ය පොදු සේවා	499,629
සිවිල් පරිපාලනය	134,930
ආරක්ෂක කටයුතු	257,918
පොදු නීතිය හා ආරක්ෂාව	106,782
සමාජ සේවා	974,821
අධ්‍යාපනය	261,716
සෞඛ්‍යය	275,165
සුබසාධන	397,343
ප්‍රජා සේවා	40,597
ආර්ථික සේවා	164,590
කෘෂිකර්මය සහ වාරිමාර්ග	68,206
බලශක්ති සහ ජල සම්පාදන	1,385
ප්‍රවාහන සහ සන්නිවේදනය	47,255
වෙනත්	47,744
අනෙකුත්	1,108,472
එයින් පොලී ගෙවීම්	1,048,382
ප්‍රාග්ධන වියදම සහ ණය දීම්	**789,636**
සාමාන්‍ය පොදු සේවා	61,675
සිවිල් පරිපාලනය	54,624
පොදු නීතිය හා ආරක්ෂාව	7,051
සමාජ සේවා	189,733
අධ්‍යාපනය	48,897
සෞඛ්‍යය	111,956
නිවාස	18,333
ප්‍රජා සේවා	10,547
ආර්ථික සේවා	537,370
කෘෂිකර්මය සහ වාරිමාර්ග	79,463
බලශක්ති සහ ජල සම්පාදන	96,520
ප්‍රවාහන සහ සන්නිවේදනය	263,042
වෙනත්	98,346
අනෙකුත්	858
මුළු වියදම සහ ණය දීම්	**3,537,148**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස	
සාමාන්‍ය පොදු සේවා	3.3
සමාජ සේවා	6.9
ආර්ථික සේවා	4.2
අනෙකුත්	6.6
එයින් පොලී ගෙවීම්	6.2
මුළු වියදම හා ණය දීම්	**21.0**

(අ) තාවකාලික — මූලය: මුදල් අමාත්‍යාංශය

ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම්, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 774.2ක් දක්වා සියයට 57.2කින් ඉහළ ගිය අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම් 2020 වසරේ දී වාර්තා වූ සියයට 3.3 හා සසඳන විට 2021 වසරේ දී සියයට 4.6ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2020 වසරේ ප්‍රාග්ධන වියදම්වලට හිඟ ගෙවීම් සඳහා ගැළපීමක් සිදු නොකළ දත්ත සැලකූ විට, 2020 වසරේ දී රුපියල් බිලියන 795.4ක් වූ ප්‍රාග්ධන වියදම්, 2021 වසරේ දී රුපියල් බිලියන 767.6ක් දක්වා පහත වැටුණි.

ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් සහ අයවැය හිඟය මූල්‍යනය

රජයේ ආදායම් ලැබීම් අඩු වීමේ සහ පුනරාවර්තන වියදම් අඩු නොවී පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් 2021 වසර තුළ දී දුර්වලව පැවතුණි. මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛනවලට අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත අයවැය හිඟය, 2020 වසරේ දී වාර්තා වූ සියයට 11.1 (රුපියල් බිලියන 1,667.7) සිට 2021 වසරේ දී සියයට 12.2ක් (රුපියල් බිලියන 2,057.9ක්) දක්වා තවදුරටත් පසුබෑමට ලක් විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙමින් වර්තන ගිණුමේ හිඟය, 2020 වසරේ දී වාර්තා වූ සියයට 7.9ට (රුපියල් බිලියන 1,180.4ට) සාපේක්ෂව සැලකිය යුතු වෙනසක් නිරූපණය නොකරමින්, 2021 වසරේ දී සියයට 7.7ක් (රුපියල් බිලියන 1,290.4ක්) වශයෙන් වාර්තා විය. මේ අතර, සමස්ත අයවැය හිඟයෙන් පොලී ගෙවීම ඉවත් කිරීම මගින් ගණනය කෙරෙන, එම වසරට අදාළ රජයේ අභිමත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල බලපෑම පිළිබිඹු කරන ප්‍රාථමික ශේෂයේ හිඟය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2020 වසරේ දී වාර්තා වූ සියයට 4.6ට (රුපියල් බිලියන 687.4ට) සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 6.0ක් (රුපියල් බිලියන 1,009.5ක්) දක්වා දුර්වල විය.

විදේශ මූල්‍යන ප්‍රවේශයන් සීමා වීම හමුවේ, විදේශ මූල්‍යන විකල්පයන් මත යැපීම අඩු කර ගැනීමට රජයෙහි පැවති අභිමතය පෙන්නුම් කරමින්, 2021 වසරේ දී අයවැය හිඟය මූල්‍යනය කිරීමේ දී රජය වැඩි වශයෙන් දේශීය මූලාශ්‍ර මත රඳා පැවතියේය. මුදල් අමාත්‍යාංශයට අනුව, 2021 වසරේ දී භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, අක්වෙරළ බැංකු ඒකක සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් ලබා ගත් සම්පූර්ණ ශුද්ධ ණය ගැනීම් ඇතුළත් වන, දේශීය මූලාශ්‍ර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය රුපියල් බිලියන 2,071.8ක් වූ අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය මූලාශ්‍ර මගින් මූල්‍යනය, 2020 වසරේ දී වාර්තා වූ සියයට 11.7ට සාපෙක්ෂව, 2021 වසරේ දී සියයට 12.3ක අගයක පැවතුණි. මේ අතර, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා සිදු කළ ශුද්ධ ණය ආපසු ගෙවීම ද ඇතුළත්ව, ශුද්ධ විදේශීය ණය ආපසු ගෙවීම් රුපියල් බිලියන 13.9ක් ලෙස වාර්තා විය.

2021 වසර තුළ දී, විශේෂයෙන් ම බැංකු අංශය මගින් ණය ලබා ගැනීම හරහා දේශීය මූලාශ්‍ර මගින් අයවැය හිඟය මූල්‍යනය කිරීම හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සහ කෙටි කාලීන මුදල් වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ යෑමේ පීඩනයක් ඇති විය. රජය විසින් බැංකු අංශයෙන් ලබා ගත් ණය, ශුද්ධ දේශීය මූල්‍යනයෙන් සියයට 63.0කට (රුපියල් බිලියන 1,304.3කට) දායකත්වය දැක්වීය. එයින් රුපියල් බිලියන 1,225.2ක් මහ බැංකුව මගින් සිදු කළ මූල්‍යනයන් විය. වාණිජ බැංකු මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය 2021 වසර තුළ දී රුපියල් බිලියන 79.1ක් විය. මේ අතර, උද්ධමනකාරී නොවන මූලාශ්‍ර ලෙස සැලකෙන බැංකු නොවන මූලාශ්‍ර මගින් සිදු කළ මූල්‍යනය රුපියල් බිලියන 767.5ක් වූ අතර, එය 2021 වසර තුළ දී ලබා ගත් සමස්ත ශුද්ධ දේශීය මූල්‍යනයන්ගෙන් සියයට 37.0ක් විය. ණය උපකරණ අනුව සලකා බැලීමේ දී, දේශීය මූල්‍යනයෙන් සියයට 62.8ක් (රුපියල් බිලියන 1,301.5) භාණ්ඩාගාර බැඳුම්කර මගින් ද, සියයට 30.7ක් (රුපියල් බිලියන 635.1) භාණ්ඩාගාර බිල්පත් මගින් ද සියයට 16.6ක් (රුපියල් බිලියන 343.0) අයිරා පහසුකම් මගින් ලබා ගෙන ඇත. කෙසේ වෙතත්, 2021 වසර තුළ දී අක්වෙරළ බැංකු ඒකක සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් ලබා ගත් ණය, ශුද්ධ ආපසු ගෙවීම් ලෙස වාර්තා විය.

2021 වසර තුළ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා රුපියල් බිලියන 199.9ක (එ.ජ. ඩොලර් බිලියන 1ක) ශුද්ධ ණය ගෙවීමත් සමඟ, සමස්ත විදේශීය මූල්‍යනය රුපියල් බිලියන 13.9ක ශුද්ධ ගෙවීමක් ලෙස වාර්තා විය. රුපියල් බිලියන 164.9ක (එ.ජ. ඩොලර් බිලියන 0.8ක) නව ණය ගැනීම් සහ රුපියල් බිලියන 18.2ක (එ.ජ. ඩොලර් බිලියන 0.1ක) ණය ආපසු ගෙවීම්වල ප්‍රතිඵලයක් ලෙස, 2021 වසර තුළ දී විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම මගින් ලබා ගත් ශුද්ධ ණය රුපියල් බිලියන 146.7ක් (එ.ජ. ඩොලර් බිලියන 0.7ක්) ලෙස වාර්තා විය.

6.4 රාජ්‍ය ණය සහ ණය සේවාකරණ ගෙවීම්

මධ්‍යම රජයේ ණය

අඛණ්ඩව දුර්වල මට්ටමක පැවති රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්ය සාධනය හේතුවෙන් හටගෙන දිගින් දිගටම පැවතුණ ඉහළ අයවැය හිඟය, කොවිඩ් වසංගතය හමුවේ තවදුරටත් උග්‍ර වූ අතර, 2021 වසර අවසන් වන විට මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස වර්ධනය වීමට එය මූලික වශයෙන් හේතු විය. නාමික වශයෙන්, මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය, 2020 වසර අවසානයට වාර්තා වූ රුපියල් බිලියන 15,117.2ට සාපේක්ෂව, 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 17,589.4ක් දක්වා වැඩි විය. ජාත්‍යන්තර වෙළඳපොළේ මතු වූ අහිතකර ප්‍රවණතා හේතුවෙන් ගෝලීය වෙළඳපොළ ප්‍රවේශය සීමා වීම මධ්‍යයේ මූල්‍ය අවශ්‍යතා වැඩිවීම ගෝලීය වශයෙන් සුරක්ෂිත වත්කම් සඳහා ආයෝජකයන්ගේ රුචිය වැඩි වීම සහ ආකර්ෂණීය නොවන ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් යනාදිය හේතුවෙන් අයවැය හිඟය මූල්‍යනය සඳහා දේශීය මූලාශ්‍ර මත රඳා පැවතීම මගින් මධ්‍යම රජයේ නොපියවූ ණය සංයුතියේ කැපී පෙනෙන වෙනසක් ඇති විය. එහි ප්‍රතිඵලයක් ලෙස, මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස දේශීය ණය ප්‍රමාණය, පෙර වසර අවසානයේ වාර්තා වූ සියයට 60.0 සිට 2021 වසර අවසානයේ දී සියයට 63.1ක් දක්වා වැඩි විය. මේ අතර, මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස විදේශ ණය මට්ටම 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 40.0ට සාපේක්ෂව 2021 වසර අවසන් වන විට සියයට 36.9ක් දක්වා පහළ ගියේය. ප්‍රධාන රාජ්‍ය මූල්‍ය විචල්‍යවල දුර්වල කාර්යසාධනය හේතුවෙන් මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2020 වසර අවසානයට පැවති සියයට 100.6ට සාපේක්ෂව 2021 වසර අවසන් වන විට සියයට 104.6ක් දක්වා ඉහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, මධ්‍යම රජයේ දේශීය ණය ප්‍රමාණය, 2020 වසර අවසන් වන විට පැවති සියයට 60.3 සිට 2021 වසර අවසන් වන විට සියයට 66.0ක් දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ විදේශීය ණය ප්‍රමාණය, 2020 වසර අවසන් වන විට පැවති සියයට 40.3 සිට 2021 වසර අවසන්

6.6 රූප සටහන
මධ්‍යම රජයේ නොපිය වූ ණය



මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

වන විට සියයට 38.6ක් දක්වා අඩු විය. තවද, ප්‍රධාන වශයෙන් දේශීය මූලාශ්‍ර හරහා අයවැය හිඟය මූල්‍යනය කිරීම මෙන්ම, 2021 වසරේ කල්පිරුණු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය ඇතුළු විදේශ ණය පියවීම්වල බලපෑම පිළිබිඹු කරමින්, මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස විදේශීය මුදලින් නාමනය කළ ණය ප්‍රමාණය, 2020 වසර අවසානයේ පැවති සියයට 47.5 සිට 2021 වසර අවසානයේ දී සියයට 42.4ක් දක්වා අඩු විය. කෙසේ වෙතත්, කෙටි කාලීන ණය උපකරණ හරහා ණය ගැනීම ඉහළ යෑම හේතුවෙන් නොපියවූ මුළු ණය ප්‍රමාණයේ කල්පිරීමේ සාමාන්‍ය කාලය 2020 වසර අවසානයේ පැවැති වසර 5.7ට සාපේක්ෂව 2021 වසරේ දී වසර 5.2ක් දක්වා අඩු වී ඇත.

මධ්‍යම රජයේ නොපියවූ දේශීය ණය ප්‍රමාණය, 2020 වසර අවසානයේ සිට රුපියල් බිලියන 2,032.2ක ඉහළ යෑමක් පිළිබිඹු කරමින් 2021 වසර අවසන් වන විට රුපියල් බිලියන 11,097.2ක් දක්වා වර්ධනය වී ඇත.[2] විශේෂයෙන්ම, පූර්ව ප්‍රකාශිත උපරිම ඵලදා අනුපාතික පවත්වා ගැනීම මෙන්ම, දේශීය පොලී අනුපාතික ඉහළ නංවනු ඇතැයි වෙළඳපොළ තුළ පැවති අපේක්ෂා හේතුවෙන් දිගුකාලීන රජයේ සුරැකුම්පත් සඳහා ඇති අඩු වෙළඳපොළ රුචිය හමුවේ රජය විසින් කෙටි කාලීන මූල්‍යනය කෙරෙහි වැඩි විශ්වාසයක් තැබීමත් සමඟ, කෙටිකාලීන දේශීය රාජ්‍ය ණය ප්‍රමාණය, 2020 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 2,197.6 සිට 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 3,139.8ක් දක්වා සියයට 42.9කින් වැඩි වී ඇත. ඒ අනුව, 2020 වසර අවසානයේ සමස්ත දේශීය ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස සියයට 24.2ක් වූ කෙටිකාලීන ණය ප්‍රමාණය, 2021 වසර අවසානය වන විට සියයට 28.3ක් දක්වා වැඩි විය. නාමික වශයෙන් ගත් කල, කෙටි කාලීන ණය ප්‍රමාණයේ වැඩිවීමට බොහෝ දුරට හේතු වූයේ, භාණ්ඩාගාර බිල්පත් හරහා ලබා ගත් ණය, 2020 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 1,620.7 සිට 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 2,270.5ක් දක්වා සියයට 40.1කින් වර්ධනය වීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 වසර අවසානයේ පැවති මුළු දේශීය ණය ප්‍රමාණයෙන් සියයට 17.9ක් වූ භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රතිශතය, 2021 වසර අවසානය වන විට සියයට 20.5ක් දක්වා වැඩි වී ඇත. කෙසේ වෙතත්, තාවකාලික අත්තිකාරම් හරහා මහ බැංකුව විසින් රජයට ලබා දෙන නොපියවූ ණය ප්‍රමාණය, 2020 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 153.1 සිට 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 150.1ක් දක්වා සුළු වශයෙන් අඩු වී ඇත. 2021 වසර තුළ දී අයවැය හිඟය මූල්‍යනය සඳහා කෙටි කාලීන මූල්‍ය උපකරණ මත වැඩිපුර රඳා පැවතීමට රජයට සිදු වූ බැවින්, සමස්ත දේශීය ණය ප්‍රමාණයෙන් මධ්‍යම හා දිගුකාලීන ණය ප්‍රතිශතය, 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 75.8 සිට 2021 වසර අවසානය වන විට සියයට 71.7ක් දක්වා අඩු විය. කෙසේ වෙතත්, නාමික වශයෙන්, මධ්‍යම සහ දිගුකාලීන දේශීය ණය ප්‍රමාණය ද 2020 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 6,867.5 සිට 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 7,957.4ක් දක්වා සියයට 15.9කින් වැඩි වී ඇත. දේශීය ණය කළඹෙහි ප්‍රධාන ණය මූලාශ්‍රය ලෙස අඛණ්ඩව පවතින භාණ්ඩාගාර බැඳුම්කර මාර්ගයෙන් ලබා ගත්, පියවීමට ඇති ශේෂය, 2020 වසර අග භාගයේ දී සමස්ත දේශීය ණයවල ප්‍රතිශතයක් ලෙස සියයට 63.0ක් වූ අතර, එයට සාපේක්ෂව 2021 වසර අග දී එම අගය සියයට 62.8ක් විය. නාමික වශයෙන්, 2020 වසර අවසානයේ දී රුපියල් බිලියන 5,713.3ක් වූ සමස්ත දේශීය ණයෙහි භාණ්ඩාගාර බැඳුම්කරවල අගය, 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 6,966.2ක් දක්වා සියයට 21.9කින් වැඩි වී ඇත. මේ අතර, නේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන, 2020 වසර අවසානයේ දී වාර්තා වූ රුපියල් බිලියන 486.9 (එ.ජ. ඩොලර් මිලියන 2,611.9)

6.7 රූප සටහන
මධ්‍යම රජයේ නොපිය වූ දේශීය ණය සංයුතිය - 2021 වසර අවසානයට



මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

2 2014 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, නේවාසිකයන් සතු මධ්‍යම රජයේ ණය, දේශීය ණය වශයෙන් වර්ගීකරණය කර ඇත.

සිට 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 455.2ක් (එ.ජ. ඩොලර් මිලියන 2,271.1ක්) දක්වා අඩු වී ඇත. මීට අමතරව, නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජන ද 2020 වසර අවසානයේ දී වාර්තා වූ රුපියල් බිලියන 415.8 (එ.ජ. ඩොලර් මිලියන 2,230.4) සිට 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 372.6ක් (එ.ජ. ඩොලර් මිලියන 1,859.0ක්) දක්වා අඩු වී ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ එ.ජ. ඩොලර් බිලියන 1ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය කල්පිරීම සමඟ, එ.ජ. ඩොලර් මිලියන 371.3ක් දේශීය බැඳුම්කර හිමියන්ට ආපසු ගෙවීමය. තවද, අක්වෙරළ බැංකු ඒකකවලින් ලබා ගත් නොපියවූ ණය ප්‍රමාණය, 2020 වසර අවසානයේ සිට 2021 වසර අවසන් වන විට රුපියල් බිලියන 139.3ක්

6.5 සංඛ්‍යා සටහන

මධ්‍යම රජයේ නොපියවූ ණය (වසර අවසානයේ දී)

රුපියල් මිලියන

ශීර්ෂය	2018	2019 (අ)(ආ)	2020 (අ)(ආ)	2021 (අ)(ඇ)
මුළු රාජ්‍ය ණය	**12,030,548**	**13,031,543**	**15,117,247**	**17,589,373**
දේශීය ණය (ඈ)	**6,071,001**	**6,830,260**	**9,065,068**	**11,097,223**
කල්පිරීමේ කාලය අනුව				
කෙටිකාලීන	1,134,553	1,270,374	2,197,594	3,139,794
මැදි හා දිගුකාලීන	4,936,447	5,559,887	6,867,473	7,957,430
ආයතන අනුව (ඉ)				
බැංකු	2,321,802	2,887,739	4,731,652	5,467,126
බැංකු නොවන	3,749,199	3,942,521	4,333,416	5,630,097
විදේශීය ණය	**5,959,547**	**6,201,283**	**6,052,179**	**6,492,150**
ණය වර්ගය අනුව				
සහනදායී ණය	2,705,836	2,767,459	2,988,113	3,097,585
සහනදායී නොවන ණය	3,253,711	3,433,824	3,064,066	3,394,565
බහු පාර්ශ්වීය	58,586	112,943	156,252	324,112
ද්වි පාර්ශ්වීය	209,970	198,733	184,051	171,327
වාණිජ ණය	2,985,156	3,122,148	2,723,763	2,899,126
ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර	2,220,411	2,531,493	2,203,279	2,243,049
විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම්	330,174	242,191	279,612	445,521
භාණ්ඩාගාර බිල්පත්වල අනේවාසිකයන්ගේ ආයෝජන	11,909	23,727	670	204
භාණ්ඩගාර බැඳුම්කරවල අනේවාසිකයන්ගේ ආයෝජන	146,914	80,294	6,204	1,710
වෙනත්	275,747	244,444	233,997	208,643
ව්‍යවහාර මුදල් අනුව				
වි.ගැ.හි.	954,761	927,372	970,714	986,072
එ.ජ. ඩොලර්	3,781,626	4,076,588	3,875,950	4,275,471
ජපාන යෙන්	622,852	624,956	664,291	623,206
යූරෝ	225,831	228,713	251,406	240,521
වෙනත්	374,477	343,653	289,818	366,880
මධ්‍යම රජයේ ණය / ද.දේ.නි. (ඊ)	**84.2**	**86.9**	**100.6**	**104.6**
විශේෂිත අයිතමයන්				
විනිමය අනුපාතයේ මුළු විචලනය	1,063,218	12,401	355,663	500,206
විදේශීය ණය මත	963,181	16,857	329,895	474,322
විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කළ දේශීය ණය මත	100,037	-4,456	25,767	25,884

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2014 වසරේ දී ජා.මූ.අ. විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, අනේවාසිකයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන විදේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇති අතර, නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

(ඈ) 2012 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාවට නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 56,662කි.) ඇතුළත් වේ.

(ඉ) ව්‍යාපාර සහ පුද්ගලයින් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන සඳහා වන ගැළපීම් හේතුවෙන් බැංකු සහ බැංකු නොවන අංශ යටතේ පැවති දේශීය ණයවල සංයුතිය 2017 වසරේ සිට සංශෝධනය කරන ලදී.

(ඊ) 2019 සහ 2020 වර්ෂ සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 මාර්තු 29 දින නිකුත් කරන ලද සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත.

(එ.ජ. ඩොලර් මිලියන 695.0ක්) දක්වා රුපියල් බිලියන 88.1කින් අඩුවිය. විදේශ මුදල් ඒකක මගින් නාමනය කරන ලද නොපියවූ දේශීය ණය ප්‍රමාණය, 2020 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 1,130.0ක (එ.ජ. ඩොලර් මිලියන 6,062.2ක) සිට 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 967.1ක් (එ.ජ. ඩොලර් මිලියන 4,825.1ක්) දක්වා රුපියල් බිලියන 162.9කින් අඩු වී ඇත.[3] මේ අතර, වාණිජ බැංකු සහ මහ බැංකුව සතු රජයේ නොපියවූ ණය ප්‍රමාණය, 2021 වසර අවසානයේ දී, පිළිවෙළින්, රුපියල් බිලියන 3,901.6ක් සහ රුපියල් බිලියන 1,565.5ක් දක්වා වර්ධනය වෙමින්, දේශීය බැංකු අංශය වෙත මධ්‍යම රජයේ ඇති ණය වගකීම් රුපියල් බිලියන 5,467.1ක් දක්වා කැපී පෙනෙන ලෙස වැඩි විය. මහ බැංකුව සතුව පැවති මධ්‍යම රජයේ ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ යෑමට හේතු වී ඇත්තේ, 2020 වසර අවසානයේ වූ රුපියල් බිලියන 654.6ක් වූ භාණ්ඩාගාර බිල්පත්වල අයෝජනය, 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 1,391.3ක් දක්වා වැඩි වීමය. මෙය, අඩු වූ වෙළඳපොළ සහභාගීත්වය සහ පරිපාලනමය වශයෙන් භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකුවට සෘජු දායකත්වයක් විශේෂයෙන් ලබා දීම මධ්‍යයේ, රාජ්‍ය සුරැකුම්පත් වෙන්දේසිවල දී භාණ්ඩාගාර බිල්පත් සඳහා වන මහ බැංකුවේ දායකත්වය වැඩිවීමේ ප්‍රතිඵලයකි. මේ අතර, වාණිජ බැංකු සතු රජයේ නොපියවූ ණය ප්‍රමාණය, 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 3,901.6ක් දක්වා වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ, 2021 වසරේ දී වාණිජ බැංකු විසින් භාණ්ඩාගාර බැඳුම්කරවල සිදු කරන ලද ඉහළ ආයෝජනයන්ය. වාණිජ බැංකු සතු භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය, 2020 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 1,513.3ක අගයේ සිට 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,646.8ක් දක්වා වැඩි වී ඇත. කෙසේ වෙතත්, සමස්ත දේශීය ණය ප්‍රමාණයෙන් බැංකු අංශය විසින් දරන ලද ණය ප්‍රතිශතය, 2020 වසර අවසානයේ පැවති සියයට 52.2ක සිට 2021 වසර අවසානය වන විට සියයට 49.3ක් දක්වා අඩු විය. මේ අතර, බැංකු නොවන අංශය සතු නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය, 2020 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 4,333.4ට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 5,630.1ක් දක්වා වැඩි වී ඇත.

3 නේවාසික පුද්ගලයන් සතු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ අක්වෙරළ බැංකු ඒකකවලින් ලබා ගත් ණය, විදේශ මුදල් ඒකක මගින් නාමනය කරන ලද දේශීය ණය යටතට අයත් වේ.

6.8 රූප සටහන
මධ්‍යම රජයේ නොපියවූ විදේශීය ණය සංයුතිය - 2021 වසර අවසානයට



6.9 රූප සටහන
ව්‍යවහාර මුදල් වර්ගය අනුව මධ්‍යම රජයේ සමස්ත නොපිය වූ ණය සංයුතිය - 2021 වසර අවසානයට



මධ්‍යම රජයේ විදේශ ණය වගකීම, නාමික වශයෙන්, 2020 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 6,052.2ක අගයේ සිට 2021 වසර අවසන් වන විට බිලියන 6,492.2ක් දක්වා වැඩි වී ඇත.[4] කෙසේ වෙතත්, විදේශ මූලාශ්‍ර සඳහා ඇති සීමිත ප්‍රවේශය, මූල්‍යනය සඳහා දේශීය මූලාශ්‍ර මත රඳා පැවතීමට රජය විසින් ප්‍රකාශිත මූල්‍යන උපාය මාර්ගය සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ශුද්ධ ආපසු ගෙවීම් හේතුවෙන්, විදේශ ණය, සමස්ත නොපියවූ ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස 2020 වසර අවසානයේ වූ සියයට 40.0 සිට 2021 වසර අවසානය වන විට සියයට 36.9ක් දක්වා අඩු විය. බහුපාර්ශ්වික ණය ලබා ගැනීම් සහ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් මගින් ලබාගත් ණය වැඩි වීම මෙන්ම, රුපියල අවප්‍රමාණය වීමේ බලපෑම ද හේතුවෙන් සමස්ත විදේශ ණය කළඹ තුළ සහනදායී නොවන ණය ප්‍රමාණයේ ප්‍රතිශතය, 2020 වසර අවසානයේ වූ සියයට 50.6 සිට 2021 වසර අවසන් වන විට සියයට 52.3ක් දක්වා වැඩි විය.

4 2014 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, අනේවාසිකයන් සතු මධ්‍යම රජයේ ණය, විදේශ ණය ලෙස වර්ගීකරණය කර ඇත.

නාමික වශයෙන්, සහනදායී නොවන නොපියවූ ණය ප්‍රමාණය, 2020 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 3,064.1 සිට 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 3,394.6ක් දක්වා සියයට 10.8කින් වැඩිවී ඇත. නේවාසික (එ.ජ. ඩොලර් මිලියන 371.3) සහ අනේවාසික (එ.ජ. ඩොලර් මිලියන 628.7) ආයෝජකයන් සතු එ.ජ. ඩොලර් බිලියන 1ක් වටිනා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආපසු ගෙවනු ලැබූව ද, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් අනේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනයන්හි අගය රුපියල් බිලියන 39.8කින් වැඩි වී ඇත. මේ අතර, 2020 වසර අවසන් වන විට, මුළු විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 49.4ක් වූ සහනදායී ණය ප්‍රතිශතය 2021 වසර අවසන් වන විට සියයට 47.7ක් දක්වා සුළු වශයෙන් අඩු වී ඇතත්, නොපියවූ සහනදායී ණය 2021 වසර අවසානය වනවිට රුපියල් බිලියන 3,097.6ක් දක්වා රුපියල් බිලියන 109.5කින් වැඩි විය.

2020 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් මිලියන 38,492.7ක් වූ විදේශ මුදල් ඒකක මගින් නාමනය කළ නොපියවූ ණය, 2021 වසර අවසන් වන විට එ.ජ ඩොලර් මිලියන 37,206.1ක් දක්වා අඩු විය. විදේශ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් ඇති වූ විචලන මගින් විදේශ මුදල ඒකක මගින් නාමනය කළ නොපියවූ ණය, 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 500.2කින් පමණ ඉහළ ගියේය. විදේශ ව්‍යාපෘති ණය, විදේශ විනිමය මූල්‍ය පහසුකම මගින් ලබා ගත් ණය සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මගින් ලබා ගත් නොපියවූ ණය මත විනිමය අනුපාතික විචලන බලපෑම රුපියල් බිලියන 474.3ක් වූ අතර, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සහ අක්වෙරළ බැංකු ඒකක මගින් ලබා ගත් ණය මත ඇති වූ බලපෑම රුපියල් බිලියන 25.9ක් විය. විදේශ මුදල් ඒකක මගින් නාමනය කර ඇති ණය, රජයට ලැබෙන විදේශ මුදල් උපයෝගී කරගෙන ණය සේවාකරණය කරන්නේ නම්, විනිමය අනුපාතිකවල විචලනය හේතුවෙන් නොපියවූ ණය ප්‍රමාණයේ රුපියල්වලින් නාමික අගය වැඩිවීමේ බලපෑම එතරම් ගැටලුවක් නොවනු ඇත. කෙසේ වෙතත්, රජය වෙත ලැබෙන විදේශ විනිමය ගලා ඒම් පහත වැටීම මධ්‍යයේ, රජය විසින් විදේශීය ව්‍යවහාර මුදලින් වන ණය සේවාකරණය සඳහා රුපියල්වලින් සැලකිය යුතු ප්‍රමාණයක අරමුදල් යොදා ගැනීමත්, එහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ යන රජයේ ණය ලබා ගැනීමේ අවශ්‍යතා විශාල වශයෙන් බැංකු ක්ෂේත්‍රය හරහා සපුරා ගැනීමත් ගැටලුකාරී තත්ත්වයක් ලෙස පවතී.

නිත්‍ය ආදායම් ප්‍රවාහ පහත වැටීම, අඛණ්ඩව පවතින රාජ්‍ය මූල්‍ය හිඟයන්, සහනදායී මූල්‍යන ප්‍රභව වෙත පවතින ප්‍රවේශය සීමිත වීම සහ පොලී අනුපාතික හා විනිමය අනුපාතික හැසිරීම් මගින් ඇතිවන අහිතකර ප්‍රතිඵල පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකාවේ මධ්‍යම රජයේ ණය පසු ගිය දෙවසර තුළ දී ඉතා ඉහළ මට්ටමක් දක්වා වැඩි වී ඇත. 2020 වසර තුළ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 40.3ක් වූ විදේශීය ණය, 2021 වසරේ දී සියයට 38.6ක් දක්වා සුළු වශයෙන් පහත වැටුණ ද, අභියෝගාත්මක දේශීය සාර්ව ආර්ථික ප්‍රවණතා, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළ තුළ හට ගත් අවිනිශ්චිතතා මෙන්ම, අහිතකර ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් පහළ දැමීම් හමුවේ දළ නිල සංචිත ඉතා බරපතල ලෙස අවම මට්ටමක් දක්වා පහත වැටීම නිසා නුදුරු කාලයේ දී විදේශීය ණය සේවාකරණය ආශ්‍රිතව පවතින අවදානම් වර්ධනය වී ඇත. විශ්වසනීය ආයතනයක සහයෝගය සහිතව විදේශ ව්‍යවහාර මුදල් ප්‍රවාහ ඉහළ නංවා නොගන්නේ නම්, 2022 වසරේ සිට වාර්ෂිකව පියවීමට සිදු වන එ.ජ. ඩොලර් බිලියන 5කට අධික වන විදේශ ණය සේවාකරණ පියවීම්හි සාමාන්‍යය ශ්‍රී ලංකාවට අතිශය අභියෝගාත්මක කර්තව්‍යයක් වනු ඇත. ණය කළඹ ප්‍රතිව්‍යුහගත කිරීම සමඟ, විචක්ෂණශීලී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහ සම්පත් වර්ධනය කර ගැනීම වහාම සිදු කළ යුතුව ඇත. මේ අතර, තවදුරටත් ණය එක් රැස් වීම වැළැක්වීම සඳහා පොලී ගෙවීම් ප්‍රාග්ධනීකරණයෙන් තොරව, දේශීය සහ විදේශීය ව්‍යවහාර මුදල් ණය ආපසු ගෙවීම සඳහා පමණක් ණය මූල්‍යනය භාවිත කිරීම රජයේ මැදි කාලීන ප්‍රතිපත්තිමය ප්‍රමුඛතාව විය යුතුය. නුදුරු කාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය සේවාකරණ වගකීම් සපුරා ගැනීමට විදේශ මුදල් ඒකක මගින් නාමනය වූ

6.6 සංඛ්‍යා සටහන

මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම්

රුපියල් මිලියන

ශීර්ෂය	2018	2019	2020	2021 (අ)
ණය සේවාකරණ ගෙවීම්	**2,088,551**	**2,022,507**	**1,941,373**	**2,375,599**
දේශීය	1,561,363	1,213,698	1,169,522	1,590,131
විදේශීය	527,188	808,809	771,851	785,468
ණය ආපසු ගෙවීම්	**1,236,361**	**1,121,155**	**961,071**	**1,327,216**
දේශීය	921,881	546,315	455,899	795,498
විදේශීය	314,480	574,839	505,172	531,718
පොලී ගෙවීම්	**852,190**	**901,353**	**980,302**	**1,048,383**
දේශීය	639,482	667,383	713,623	794,633
කෙටිකාලීන	74,525	81,029	77,965	98,694
මැදි හා දිගුකාලීන	564,957	586,354	635,658	695,939
විදේශීය	212,708	233,970	266,679	253,750

(අ) තාවකාලික

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

6.10 රූප සටහන
මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම්
(ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස)



6.7 සංඛ්‍යා සටහන
මධ්‍යම රජයේ ණය දර්ශක

ප්‍රතිශත

දර්ශකය	2018	2019 (අ)	2020 (අ)	2021 (ආ)
මධ්‍යම රජයේ ණය/ද.දේ.නි.	84.2	86.9	100.6	104.6
දේශීය ණය/ද.දේ.නි. (ඇ)	42.5	45.5	60.3	66.0
විදේශීය ණය/ද.දේ.නි.	41.7	41.3	40.3	38.6
දේශීය ණය/මධ්‍යම රජයේ ණය	50.5	52.4	60.0	63.1
විදේශීය ණය/මධ්‍යම රජයේ ණය	49.5	47.6	40.0	36.9
විදේශීය ණය/අපනයන (ඈ)	181.0	178.6	250.2	217.8
ණය සේවාකරණ/ද.දේ.නි.	14.6	13.5	12.9	14.1
ණය සේවාකරණ/රජයේ ආදායම	108.8	107.0	141.9	163.0
එයින් දේශීය ණය සේවාකරණ/රජයේ ආදායම	81.3	64.2	85.5	109.1
ණය සේවාකරණ ගෙවීම්/රජයේ වියදම (ඉ)	53.1	45.4	48.5	49.0
එයින් දේශීය ණය සේවාකරණ/රජයේ වියදම (ඉ)	39.7	27.2	29.2	32.8
විදේශීය ණය සේවාකරණ/අපනයන (ඈ)	16.0	23.3	31.9	26.4
ණය පොලී ගෙවීම්/ද.දේ.නි.	6.0	6.0	6.5	6.2
ණය පොලී ගෙවීම්/රජයේ වියදම (ඉ)	21.7	20.2	24.5	21.6
දේශීය ණය පොලී ගෙවීම්/ද.දේ.නි.	4.5	4.5	4.7	4.7
විදේශීය ණය පොලී ගෙවීම්/ද.දේ.නි.	1.5	1.6	1.8	1.5
ණය පොලී ගෙවීම්/ රජයේ පුනරාවර්තන වියදම්	40.8	37.2	38.5	38.2
විදේශීය ණය පොලී ගෙවීම්/අපනයන (ඈ)	6.5	6.7	11.0	8.5

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2019 සහ 2020 වර්ෂ සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 මාර්තු 29 දින නිකුත් කරන ලද සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත.
(ආ) තාවකාලික
(ඇ) 2012 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 56,662කි.) ඇතුළත් වේ.
(ඈ) භාණ්ඩ හා සේවා අපනයන
(ඉ) ණය ආපසු ගෙවීම් ඇතුළත්ව රජයේ වියදම

ණය ඉදිරියටත් ලබා ගත්ත ද, සමස්ත රාජ්‍ය මූල්‍ය හිඟය නිසා හට ගන්නා නව මූල්‍යන අවශ්‍යතා පවතින සම්පත්වලට අනුකූලව ගළපමින්, මැදි කාලීනව ණය නොවන විදේශ විනිමය ප්‍රවාහ නැවත යථා තත්ත්වයට පත් වන විට තවදුරටත් විදේශ ණය ලබා ගැනීම ක්‍රමයෙන් අඩු කළ යුතුය. ණය ආශ්‍රිතව ඉහළ ගොස් ඇති අවදානම් සහගත තත්ත්වයන් පිළිබඳව සලකා බැලීමේ දී, සුදුසු සංශෝධන ද සහිතව, මැදි කාලීන ණය කළමනාකරණ ක්‍රමෝපායට අනුකූලව සාර්ථක වගකීම් කළමනාකරණ ක්‍රියාවලියක් මෙරටට අවශ්‍ය වන්නේ ඵලදායී ණය කළමනාකරණ ක්‍රියාවලියක් හරහා ණය ස්ථායී බවක් ඇති කිරීමට ය. දිගු කාලීනව ණය සේවා ගෙවීම් සුමට කිරීම මගින් නුදුරු කාලීන ණය බර අඩු කර ගැනීම සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරීමට යොදන වත්මන් ප්‍රයත්න ඉතා වැදගත් වේ. මේ අතර, රාජ්‍ය ණය තිරසාරභාවය තහවුරු කරමින් මැදි කාලීනව ප්‍රාථමික ශේෂයෙහි අතිරික්තයක් වාර්තා කිරීම පිණිස, පුනරාවර්තන වියදම් අවම කිරීම සහ විශ්වසනීය හා ස්ථිර කැපවීමකින් ආදායම් ඉපැයීම ශක්තිමත් කිරීම හරහා වර්තන ගිණුම තුළ හිඟය අවම කිරීම අතිශය වැදගත් වේ.

මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීම්

2021 වසරේ දී ණය ආපසු ගෙවීම් මෙන්ම පොලී ගෙවීම්වල ඉහළ යෑම හේතුවෙන් නාමික වශයෙන් සමස්ත ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 2,375.6ක් දක්වා සියයට 22.4කින් ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින් ලබා ගත් ණය කල්පිරීම හේතුවෙන් 2021 වසරේ දී දේශීය ණය ආපසු ගෙවීම් රුපියල් බිලියන 795.5ක් දක්වා සියයට 74.5කින් ඉහළ ගියේය. 2021 වසරේ ජූලි මාසයේ දී රුපියල් බිලියන 199.9ක (එ.ජ. ඩොලර් බිලියන 1 ක) ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල්පිරීම සහ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම සඳහා වූ රුපියල් බිලියන 330.6ක ආපසු ගෙවීම් මූලිකව පිළිබිඹු කරමින්, 2021 වසරේ දී විදේශ ණය ආපසු ගෙවීම් රුපියල් බිලියන 531.7ක් දක්වා සියයට 5.3කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පසුගිය වසරේ රුපියල් බිලියන 961.1ක් ලෙස වාර්තා වූ සමස්ත ණය ආපසු ගෙවීම් 2021 වසරේ දී රුපියල් බිලියන 1,327.2ක් දක්වා සියයට 38.1කින් ඉහළ ගිය අතර, එය මුළු ණය සේවාකරණ ගෙවීම්වලින් සියයට 55.9කට දායකත්වය දැක්වීය. මේ අතර, 2021 වසරේ දී දේශීය ණය සඳහා පොලී ගෙවීම් ඉහළ යෑම හේතු කොටගෙන, මධ්‍යම රජයේ ණය සඳහා පොලී ගෙවීම් රුපියල් බිලියන 1,048.4ක් දක්වා සියයට 6.9කින් ඉහළ ගියේය.

විදේශීය මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශයන් සීමාසහිත වීම සහ 2021 වසර අවසාන භාගය තුළ දේශීය පොලී අනුපාත ඉහළ යෑම මධ්‍යයේ පෙර වසරට වඩා 2021 වසරේ දී දේශීය ණය ගැනීම් සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන් මධ්‍යම රජයේ දේශීය ණය සඳහා පොලී ගෙවීම් රුපියල් බිලියන 794.6ක් දක්වා සියයට 11.4කින් වැඩි විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම සහ ව්‍යාපෘති ණය සඳහා වූ පොලී ගෙවීම් අඩු වීම හේතුවෙන්, විදේශ ණය සඳහා වූ පොලී ගෙවීම්, 2020 වසරේ වාර්තා වූ බිලියන 266.7ට සාපේක්ෂව, 2021 වසරේ දී රුපියල් බිලියන 253.8ක් දක්වා පහළ ගියේය. සමස්තයක් ලෙස ගත් කල, 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී දේශීය ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 1,590.1ක් දක්වා සියයට 36.0කින් ඉහළ ගිය අතර, විදේශ ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 785.5ක් දක්වා සියයට 1.8කින් සුළු වශයෙන් ඉහළ ගියේය.

වැඩි වෙන මධ්‍යම රජයේ ණය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ණය පොලී ගෙවීම් ඉහළ යෑම හේතුවෙන්, ණය සේවාකරණ ගෙවීම් පිළිබඳ ප්‍රධාන දර්ශක 2021 වසරේ දී අහිතකර වර්ධනයක් පෙන්නුම් කළේය. සමස්ත ණය සේවාකරණ ගෙවීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ පැවති සියයට 12.9 සිට 2021 වසරේ දී සියයට 14.1ක් දක්වා ඉහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2020 වසරේ සියයට 3.0ක් වූ දේශීය ණය ආපසු ගෙවීම්, 2021 වසරේ දී සියයට 4.7ක් දක්වා වැඩි වූ අතර, 2020 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.4ක් වූ විදේශ ණය ආපසු ගෙවීම් 2021 වසරේ දී සියයට 3.2ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය. කෙසේ වෙතත්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත ණය පොලී ගෙවීම් 2020 වසරේ වාර්තා වූ සියයට 6.5 සිට 2021 වසරේ දී සියයට 6.2ක් දක්වා අඩු විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස දේශීය ණය සඳහා වූ පොලී ගෙවීම්, 2021 වසරේ දී සියයට 4.7ක් ලෙස බොහෝ දුරට නොවෙනස්ව පැවති අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස විදේශ ණය සඳහා පොලී ගෙවීම්, පෙර වසරේ පැවති සියයට 1.8 සිට 2021 වසරේ දී සියයට 1.5ක් දක්වා අඩු විය. මේ අතර, රජයේ සමස්ත ණය සේවාකරණ ගෙවීම් රජයේ ආදායම ඉක්මවා යෑම හේතුවෙන් රාජ්‍ය ණය බරෙහි බරපතලකම අවධාරණය කරමින්, 2020 වසරේ සියයට 141.9ක්ව පැවති මධ්‍යම රජයේ ණය සේවාකරණ ගෙවීමත් රජයේ ආදායමත් අතර අනුපාතය, 2021 වසරේ දී සියයට 163.0ක් දක්වා පිරිහීමට ලක් විය. තවද, 2021 වසරේ දී ණය සේවාකරණ ගෙවීම්වල වර්ධනයට සාපේක්ෂව භාණ්ඩ හා සේවා අපනයනවල වර්ධනය ඉහළ යෑම හේතුවෙන් භාණ්ඩ හා සේවා අපනයනවල ප්‍රතිශතයක් ලෙස විදේශ ණය සේවාකරණ ගෙවීම් 2020 වසරේ දී වාර්තා වූ සියයට 31.9 සිට සියයට 26.4ක් දක්වා පහළ ගියේය.

නොපියවූ රාජ්‍ය ණය

නොපියවූ මධ්‍යම රජයේ සමස්ත ණය, රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් ලබා ගත් විදේශ ව්‍යාපෘති ණය, සහ රාජ්‍ය ඇපකර ණය යනාදියෙන් සමන්විත නොපියවූ රාජ්‍ය ණය, මධ්‍යම රජයේ ණය ඉහළ යෑම හේතුවෙන් 2021 වසර තුළ දී කැපී පෙනෙන ලෙස වර්ධනය විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, සමස්ත නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය, 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 109.4ක අගයේ සිට 2021 වසර අවසානය වන විට සියයට 115.5ක් දක්වා ඉහළ ගියේය. නාමික වශයෙන්, 2020 වසර අවසානයේ රුපියල් බිලියන 16,427.1ක් වූ සමස්ත නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය, 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 19,407.3ක් දක්වා සියයට 18.1ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය ප්‍රමාණය, සමස්ත නොපියවූ රාජ්‍ය ණයවලින් සියයට 90.6ක දායකත්වයක් දැක්වීය. මේ අතර, නාමික වශයෙන්, 2020 වසර අවසානයේ රුපියල් බිලියන 986.4ක් වූ මහජන ඇපකර ණය, 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,506.7ක් දක්වා සියයට 52.8කින් වැඩි වූ අතර, එය සමස්ත නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණයෙන් සියයට 7.8ක් විය. සමස්ත නොපියවූ රාජ්‍ය ඇපකර ණයවලින් සියයට 62.1ක් විදේශ මුදල් ඒකක මගින් නාමනය කර ඇත. තවද, 2021 වසර තුළ දී ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ණය ආපසු ගෙවීම හේතුවෙන් එම ආයතනවල විදේශ ව්‍යාපෘති ණය, පිළිවෙළින්, සියයට 2.0කින් සහ සියයට 6.4කින් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහත වැටීමක් වාර්තා කිරීම නිසා රජය සතු වාණිජ ව්‍යවසායයන් වෙත ලැබී ඇති විදේශ ව්‍යාපෘති ණය සම්බන්ධ නොපියවූ ණය, 2020 වසර අවසානයේ දී වාර්තා වූ රුපියල් බිලියන 323.5ක සිට 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 311.2ක් දක්වා අඩුවිය. 2021 වසර අවසානයේ දී, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නොපියවූ මහජන ඇපකර ණය ප්‍රමාණය 2020 වසරට සාපේක්ෂව, පිළිවෙළින්, රුපියල් බිලියන 561.3ක් සහ රුපියල් බිලියන 200.9ක් දක්වා, පිළිවෙළින්, සියයට 62.5කින් සහ සියයට 45.4කින් සැලකිය යුතු වැඩි වීමක් වාර්තා කර ඇත. මේ අතර, 2021 වසර අවසානයේ දී,

6

6.8 සංඛ්‍යා සටහන
නොපියවූ රාජ්‍ය ණය (වසර අවසානයේ දී)

	2018	2019	2020	2021 (අ)
රුපියල් මිලියන				
මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය (ආ)	**12,030,548**	**13,031,543**	**15,117,247**	**17,589,373**
රජයේ ඇපකර රහිතව රාජ්‍ය ව්‍යවසායයන් ලද විදේශ ව්‍යාපෘති ණය	**366,130**	**345,453**	**323,510**	**311,191**
සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම	24,964	22,317	22,189	21,833
ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය	168,649	150,418	136,720	128,026
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	172,517	172,717	164,602	161,332
රජයේ ඇපකර මත ලබාගෙන ඇති ණය (ඇ) (ඈ)	**781,741**	**778,305**	**986,391**	**1,506,743**
සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම	10,829	16,532	34,801	115,332
ලංකා බැංකුව සහ මහජන බැංකුව	ලැ.නො.	ලැ.නො.	ලැ.නො.	36,540
ලංකා විදුලි බල මණ්ඩලය	21,376	25,212	70,559	89,311
ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාව	333,869	297,220	345,500	561,267
සීමාසහිත ලංකා නැව් සංස්ථාව	13,098	12,613	12,505	12,263
ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය	36,843	35,311	35,562	35,738
සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම	11,000	5,398	9,692	13,899
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය	85,541	102,339	138,180	200,851
වී අලෙවි මණ්ඩලය	11,436	11,420	2,023	1,313
මාර්ග සංවර්ධන අධිකාරිය	189,022	206,563	262,015	349,895
ශ්‍රීලන්කන් ගුවන් සමාගම	31,981	32,083	43,530	60,336
අනෙකුත් සංස්ථා	36,746	33,615	32,023	29,998
රාජ්‍ය ණය	**13,178,418**	**14,155,301**	**16,427,148**	**19,407,307**
ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (ඉ)				
මධ්‍යම රජයේ සමස්ත නොපියවූ ණය (ආ)	84.2	86.9	100.6	104.6
රජයේ ඇපකර රහිතව රාජ්‍ය ව්‍යවසායයන් ලද විදේශ ව්‍යාපෘති ණය	2.6	2.3	2.2	1.9
රජයේ ඇපකර මත ලබාගෙන ඇති ණය (ඇ) (ඈ)	5.5	5.2	6.6	9.0
රාජ්‍ය ණය	**92.2**	**94.4**	**109.4**	**115.5**

මූලයන්: මුදල් අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) 2012 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාවට නිකුත් කරන ලද රුපියල් මිලියන 78,441ක් වටිනා භාණ්ඩාගාර බැඳුම්කර (එයින් 2017 ජනවාරි 01 දින රුපියල් මිලියන 21,778ක් වටිනා බැඳුම්කර කල්පිරීම නිසා දැනට නොපියවූ ප්‍රමාණය රුපියල් මිලියන 56,662කි.) ඇතුළත් වේ.
(ඇ) මූල්‍ය නොවන රාජ්‍ය ආයතන පමණක් ඇතුළත් වේ.
(ඈ) 2014 ජූනි මාසයේ දී ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙත නිකුත් කරන ලද එ.ජ. ඩොලර් මිලියන 175ක ජාත්‍යන්තර බැඳුම්කර ඇතුළත් වේ. එ.ජ. ඩොලර් මිලියන 175ක් වූ මෙම ජාත්‍යන්තර බැඳුම්කරය 2019 ජූනි මාසයේ දී කල්පිරුණු අතර, වසර 05ක කාලයක් සඳහා යළි නිකුත් කරන ලදී.
(ඉ) 2019 සහ 2020 වර්ෂ සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2022 මාර්තු 29 දින නිකුත් කරන ලද සංශෝධිත ද.දේ.නි. ඇස්තමේන්තු භාවිතා කර ඇත.

ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්හි රාජ්‍ය ඇපකර ණය ප්‍රමාණයට ප්‍රධාන දායකත්වයක් දක්වන ලද අතර, මුළු ණය ප්‍රමාණයෙන්, පිළිවෙළින්, සියයට 37.3ක් සහ සියයට 23.2ක් සඳහා හිමිකම් කියන ලදී.

6.5 උප රාජ්‍ය ආයතනවල අයවැය කටයුතු

උප රාජ්‍ය ආයතනවල ප්‍රතිපත්ති දිශාව හා ක්‍රියාමාර්ග

2021 වසරේ දී, කලාපීය යටිතල පහසුකම් සංවර්ධනය සහ රාජ්‍ය අංශයේ සේවා සැපයීම වැඩිදියුණු කිරීම සහ එමගින් ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ අරමුණ ඇතිව උප රාජ්‍ය ආයතන මට්ටමින් ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.[5] ඒ අනුව, පළාත් පාලන වැඩිදියුණු කිරීමේ අංශ ව්‍යාපෘතිය, ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය, පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය, මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සහ ප්‍රාදේශීය සංවර්ධන ආධාර ව්‍යාපෘතිය ඇතුළුව යටිතල පහසුකම් ආශ්‍රිත ව්‍යාපෘති කිහිපයක් වසර තුළ දී ක්‍රියාත්මක විය. මේ අතර, උප රාජ්‍ය මට්ටමින් සෞඛ්‍ය හා අධ්‍යාපන සේවා සැපයීමේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණ ඇතිව, ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය සහ සාමාන්‍ය අධ්‍යාපනය නවීකරණ වැඩසටහන ද 2021 වසරේ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සහ රට තුළ සැමට සමෘද්ධිය ඇති කර ගැනීමේ අරමුණින්, තුලිත ප්‍රාදේශීය සංවර්ධනය, අන්තර් ආයතනික සම්බන්ධීකරණය, ආදායම් උත්පාදන වගකීම උප රාජ්‍ය ආයතනවලට

5 උප රාජ්‍ය ආයතන පද්ධතිය පළාත් සභා 9කින් සහ මහ නගර සභා 24ක්, නගර සභා 41ක් සහ ප්‍රාදේශීය සභා 276ක් ඇතුළු පළාත් පාලන ආයතන 341කින් සමන්විත වේ.

6

විශේෂ සටහන 7

ආර්ථික වර්ධනයට සහය සපයන්නන් ලෙස රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම

හැඳින්වීම

රාජ්‍ය ව්‍යවසායයන්[1] දීර්ඝ කාලයක් පුරාවට රටවල්වල සමාජ ආර්ථික සංවර්ධනයට අදාළව ප්‍රධාන භූමිකාවක් ඉටු කර ඇත. සිංගප්පූරුව, ජපානය, චීනය සහ කොරියාව වැනි ආසියානු කලාපයේ අනෙකුත් රටවල් කිහිපයක දක්නට ලැබෙන පරිදි, කාර්යක්ෂම රාජ්‍ය ව්‍යවසායයන් මගින් රැකියා උත්පාදනය, දරිද්‍රතාවය තුරන් කිරීම, රාජ්‍ය මූල්‍ය ස්ථායීතාව, ක්ෂේත්‍රයක හෝ භූගෝලීය ප්‍රදේශයක සංවර්ධනය, පාරිසරික ආරක්ෂාව මෙන්ම ක්ෂේත්‍ර නියාමනය සඳහා ද සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

මෑත දශක කිහිපය තුළ රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකරණය කිරීම සහ ඒවායේ නියාමනයන් ඉවත් කිරීමට අදාළව එකඟතාවයෙහි වැඩි නැඹුරුවක් පැවතිය ද, විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යභාරය අවප්‍රමාණය වී නොමැත. මේ සඳහා මූලික වශයෙන් හේතු වී ඇත්තේ ආර්ථික වර්ධනය, සංවර්ධනය සහ සමස්තයක් ලෙස ජනගහනයේ යහපැවැත්ම කෙරෙහි ඉහළම බලපෑමක් ඇති කෙරෙන අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සහ පොදු සේවා සපයන්නන් ලෙස රාජ්‍ය ව්‍යවසායයන් පුළුල් දායකත්වයක් දැක්වීමයි. කෙසේ වෙතත්, සංවර්ධනය වෙමින් පවතින රටවල රාජ්‍ය ව්‍යවසායයන් අඩු ඵලදායීතාවක් පෙන්නුම් කිරීමේ ප්‍රවණතාවක් පවතින අතර, දූෂණ අක්‍රමිකතා පැවතීම හේතුවෙන් එම ව්‍යවසායයන්වල තරගකාරිත්වයට බාධා එල්ල වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, රාජ්‍ය ව්‍යවසායයන්, රාජ්‍ය අයවැය සහ රජය වෙත සැලකිය යුතු පීඩනයක් ඇති කිරීමට හේතු වී ඇති අතර, ඇතැම් අවස්ථාවලදී එය රාජ්‍ය මූල්‍ය හා ආර්ථික අර්බුදවලට මඟ පාදා ඇත. මෙවැනි පසුබිමක් තුළ ශ්‍රී ලංකාව සිය රාජ්‍ය ව්‍යවසායයන්ගේ ක්‍රියාකාරිත්වය පිළිබඳව අවධානයෙන් සිටීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය ව්‍යවසායයන් විකසනය වීම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසාය අංශයේ ආරම්භය, 1939 - 1945 අතර කාලය තුළ පැවති දෙවන ලෝක යුද සමයේ දී, සැපයීම සීමා වූ අත්‍යවශ්‍ය භාණ්ඩ ලබාදීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන් කිහිපයක් පිහිටුවීම සිදුවූ කාලය දක්වා අතීතයට දිවයයි. 1950 දශකයේ මැද භාගයේ දී, සෝවියට් සංගමය ලැබූ සාර්ථකත්වය සහ එම කාලපරිච්ඡේදයේ දී ඉන්දියාව තුළ සමාජවාදී සංවර්ධන මතවාදයක් අනුගමනය කිරීමත් සමඟ සමාජවාදය කෙරෙහි ඇති උනන්දුව ඉහළ ගියේය. ඒ අනුව, එවකට පැවති රජය රටේ සංවර්ධනය සඳහා රජය මූලික කරගත් මධ්‍යම ආර්ථික සැලසුම්කරණය අත්‍යවශ්‍ය අංගයක් ලෙස සැලකීය.

මෙම කාල පරිච්ඡේදය තුළ දී, පිළිවෙළින්, 1955 අංක 19 දරන රාජ්‍ය අනුග්‍රහය ලත් සංස්ථා පනත සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යන ප්‍රධාන පනත් ද්විත්වය බලගැන්වීම මගින් රාජ්‍ය ව්‍යවසායයන්හි සංවර්ධන ක්‍රියාවලිය වේගවත් විය. පළමු පනත මගින් දැනට පවතින කර්මාන්ත නීතිගත කිරීමට ප්‍රයත්න දැරූ අතර, දෙවැන්න මගින් ඕනෑම කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකමක් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා රජයට බලතල ලබා දෙන ලදී. 1957 වසර වන විට, සිමෙන්ති, කඩදාසි, පිඟන් භාණ්ඩ, සම් සහ පාවහන් ආශ්‍රිත ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් කිහිපයක මෙහෙයුම් කටයුතු ආරම්භ විය. 1958 වසරේ දී ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටුවීමට තුඩු දුන් බස් සමාගම් ජනසතු කිරීම මෙම කාලපරිච්ඡේදය තුළ සිදු වූ තවත් වැදගත් සංවර්ධන කාර්යයකි.

1959 වසරේ දී, ආනයන ආදේශක මත පදනම් වූ කාර්මීකරණය පිළිබඳ අවධාරණය කෙරෙන දස අවුරුදු සැලැස්මක් හඳුන්වා දෙන ලද අතර, එම සැලැස්ම පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොවූව ද, පසු කාලයේ දී මෙම සැලැස්ම ආර්ථික ප්‍රතිපත්ති සඳහා සමීපස්ථ මඟ පෙන්වීමක් ලබා දුණි. ඒ අනුව, සිමෙන්ති, වානේ, කඩදාසි, ටයර්, ඛනිජ වැලි, ලුණු, පිටි ඇඹරීම, තුනී ලෑලි (ප්ලයිවුඩ්), ඛනිජ තෙල් පිරිපහදු කිරීම සහ පොහොර වැනි 'මූලික කර්මාන්ත' රජය විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත විය. කෙසේ වෙතත්, රජය විසින් ක්‍රියාත්මක කිරීමට උනන්දුවක් දක්වන ලද පාවහන්, පිඟන් භාණ්ඩ, රෙදිපිළි සහ සම් භාණ්ඩ නිෂ්පාදන වැනි ඇතැම් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පෞද්ගලික ව්‍යවසායයන්ගේ සහභාගීත්වය සඳහා ද අවසර හිමි විය. දිගු කාලයක් පුරා පැවති ගෙවුම් ශේෂ හිඟය සහ එහි ප්‍රතිඵලයක් ලෙස 1960 වසරේ සිට දැඩි ආනයන පාලන මාලාවක් හඳුන්වා දීම, මෙම දේශීය ව්‍යවසායයන් අභිමුඛ කරගත් සංවර්ධන උපායමාර්ගය ඇති කිරීම සඳහා හේතු විය.

1970 දශකයේ දී, නව ව්‍යවසායයන් ස්ථාපිත කිරීම සහ පුද්ගලික ව්‍යාපාර ජනසතු කිරීම හා පවරා ගැනීම් යන ක්‍රම ද්විත්වය හරහා රාජ්‍ය අංශයේ ඒකාධිකාරයන් කිහිපයක් පිහිටුවීම ඇතුළු ආර්ථික වශයෙන් සමෘද්ධිමත් වීම සඳහා ගත් නව්‍ය ක්‍රියාමාර්ග රාශියක් දක්නට ලැබුණි.

1 රාජ්‍ය ව්‍යවසායයන් සම්බන්ධයෙන් පොදුවේ පිළිගත් නිර්වචනයක් නොමැත (යුරෝපා කොමිසම, 2013; ජා.මූ.අ., 2014; ආර්ථික සහයෝගීතාව සහ සංවර්ධනය සඳහා වූ සංවිධානය, 2015). කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යවසායයන්ගේ ඇතැම් ලක්ෂණ නම්: (1) ආයතනය සතුව තමන්ටම අනන්‍ය වූ නීති රාමුවක් තිබීම; (2) ආයතනය අඩුම තරමින් අර්ධ වශයෙන් හෝ රාජ්‍ය ආයතනයක් විසින් පාලනය කරනු ලැබීම; සහ (3) ආයතනය ප්‍රධාන වශයෙන් වාණිජමය හෝ ආර්ථික ක්‍රියාකාරකම්වල නිරත වීම (ජා.මූ.අ., 2020) යනාදියයි. *රජයේ මූල්‍ය සංඛ්‍යාලේඛන මාර්ගෝපදේශ 2014* (ජා.මූ.අ., 2014) අනුව ඕනෑම ආයතනයක රජය සතුව පවතින පාලනය ඇගයීමේදී විවිධ විනිශ්චයන් මත පදනම් වන බව සඳහන් වේ. ඒ අනුව, රජයකට කුඩා කොටස් ප්‍රමාණයක අයිතියක් හිමි අවස්ථාවක දී වුව ද ආයතනික තීරණ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කළ හැකිය.

ස්වභාවික ඒකාධිකාරයන් ලෙස රාජ්‍ය ව්‍යවසායයන් විසින් පෞද්ගලික අංශයේ ව්‍යවසායකයින් ලබා දෙන මිලට සාපේක්ෂව අඩු මිලකට සේවා හෝ නිෂ්පාදන සපයනු ඇති බවත්, ඇතැම්විට අපනයන හැකියාවත් ඇතුළත්ව සමස්ත වෙළඳපොළ ඉල්ලුම සපුරාලනු ඇති බවත් යන සාධක යටතේ රාජ්‍ය ව්‍යවසායයන් නිර්මාණය කිරීම ප්‍රයෝජනවත් වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. ඒ අනුව, මීළඟ වසර කිහිපය තුළ දී, අනෙකුත් කර්මාන්ත අතරින්, වරාය සේවා, මගී ප්‍රවාහනය සහ වැවිලි කර්මාන්තය වැනි අංශවල ක්‍රියාත්මක වූ පෞද්ගලික ව්‍යාපාර ජනසතු කිරීම සිදු විය. 1970 දශකයේ මැද භාගය වන විට, බැංකු, වැවිලි, මහා පරිමාණ කර්මාන්ත, ප්‍රවාහන, රක්ෂණ, විදුලි සංදේශ, තැපැල් සේවා, වරාය, විදුලිබලය, ඛනිජ තෙල් ආනයනය හා බෙදා හැරීම, මහාමාර්ග, සෞඛ්‍ය සහ අධ්‍යාපනය වැනි ප්‍රධාන ආර්ථික හා සමාජ ක්‍රියාකාරකම් රාජ්‍ය අංශයේ ඒකාධිකාරයන් ලෙස හෝ බොහෝ දුරට රාජ්‍ය ව්‍යවසායයන් විසින් ක්‍රියාත්මක කරන ලදී. 1962 වසරේ දී 14ක්ව පැවති රාජ්‍ය ව්‍යවසායයන් සංඛ්‍යාව, 1980 දශකය මැද භාගය වන විට 280 ඉක්මවා යමින් ඉතා ශීඝ්‍රයෙන් ඉහළ ගියේය.

1980 දශකයේ මැද භාගය වන විට, රාජ්‍ය ව්‍යවසායයන් විවිධ ගැටලු රාශියකට මුහුණ දෙන බව හඳුනා ගන්නා ලදී. මෙම ගැටලු අතරට, දුර්වල මූල්‍ය ක්‍රියාකාරිත්වයක් බවට පරිවර්තනය වන මෙහෙයුම් අකාර්යක්ෂමතා, නිෂ්පාදන හා සේවාවල ගුණාත්මකභාවය අඩු වීම හා සැපයුම් හිඟය, රාජ්‍ය ව්‍යවසායයන්හි අවශ්‍යතාවලට වඩා දේශපාලන කරුණු මත පදනම්ව සිදු කෙරෙන බඳවා ගැනීම්, විශාල ආයෝජන අවශ්‍යතා සපුරාලීම සඳහා සම්පත් යෙදවීමට නොහැකිවීම සහ රාජ්‍ය අයවැය මත අධික ලෙස යැපීම යනාදිය ඇතුළත් විය. රාජ්‍ය ව්‍යවසායයන් මගින් රාජ්‍ය අයවැය මත ඇති කරන පීඩනය ඉහළ යෑම සහ බහුපාර්ශ්වික දායක නියෝජිතායතන විසින් සාර්ව ආර්ථික ස්ථායීතාවයේ කඩිනම් අවශ්‍යතාව අවධාරණය කිරීමත් සමඟ 1988 වසරේ දී පුද්ගලීකරණය රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට රජයට සිදු විය. පෞද්ගලික අංශය වෙත රාජ්‍ය ව්‍යවසායයන් පවරා දීමේ මෙම වැඩසටහන 1989 වසරේ දී ආරම්භ වූ අතර, එතැන් සිට 1993 වසර දක්වා කාලපරිච්ඡේදය තුළ, වාණිජ ව්‍යවසායයන් 43ක් පමණ අර්ධ වශයෙන් හෝ පූර්ණ වශයෙන් පුද්ගලීකරණය කරන ලදී. කෙසේ වෙතත්, මෙම පුද්ගලීකරණ ක්‍රියාවලිය පසු කාලීනව දැඩි විවේචනයට ලක් විය. ආර්ථිකය සහ නියාමන ආයතන දුර්වල වන විට පෞද්ගලීකරණයේ ප්‍රතිලාභ නෙළා ගැනීමට වඩාත් අපහසු වන බව පුද්ගලීකරණය පිළිබඳ ශ්‍රී ලංකාවේ බොහෝ අත්දැකීම් තුළින් අවධාරණය වේ.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායයන්හි වර්තමාන තත්ත්වය

පසුගිය දශක තුන පුරාවට, බලයට පත් වූ රජයන් පුද්ගලීකරණය කිරීම සහ ජනසතු කිරීම යන ප්‍රතිපත්ති අතර දෝලනය විය. වර්තමානයේ දී, විදුලිබල, බලශක්ති, මූල්‍ය හා රක්ෂණ, ජලය, ගුවන් සේවා, සෞඛ්‍ය සහ අධ්‍යාපනය ඇතුළු ප්‍රධාන අංශ කිහිපයක රාජ්‍ය ව්‍යවසායයන් හාරසියයකට වැඩි සංඛ්‍යාවක් ක්‍රියාත්මක වේ. 1971 අංක 38 දරන මුදල් පනතේ 'පරිපාලන II කොටස' මගින් රාජ්‍ය ව්‍යවසායයන් බොහෝ සංඛ්‍යාවක් නියාමනය කරනු ලබන අතර, මෑත කාලයේ දී, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ රාජ්‍ය ව්‍යවසායයන් කිහිපයක් ද ස්ථාපිත කර ඇත. මේ අතුරින්, රාජ්‍ය ව්‍යවසායයන් 52ක් ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය සහ විකාසය සඳහා උපායමාර්ගිකව වැදගත් වන බැවින්, ඒවා රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් ලෙස හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් අතරට, ලංකා බැංකුව, මහජන බැංකුව, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ශ්‍රීලංකන් ගුවන් සේවය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ඇතුළත් වේ.

උපායමාර්ගික අංශ හරහා ආර්ථිකය තුළ වැදගත් භූමිකාවක් රාජ්‍ය ව්‍යවසායයන් මගින් ඉටු කළ ද, රාජ්‍ය ව්‍යවසායයන්හි දුර්වල මූල්‍ය කාර්ය සාධනය, සැලකිය යුතු සාර්ව ආර්ථික බලපෑම් සමඟ රාජ්‍ය මූල්‍ය මත අධික පීඩනයක් එල්ල කර ඇත. රාජ්‍ය ව්‍යවසායයන්හි අලාභ මූල්‍යයනය සඳහා බැංකු පද්ධතිය මත අධික ලෙස යැපීම මගින් ඵලදායී ආයෝජන වළක්වාලීම පමණක් නොව, මූල්‍ය පද්ධතිය අවදානමට පත් කිරීමට ද රාජ්‍ය ව්‍යවසායයන්වල දුර්වල මූල්‍ය කාර්ය සාධනය හේතු වී ඇත. රාජ්‍ය ව්‍යවසායයවල ඉහළ යන මූල්‍ය අලාභ මගින් අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සඳහා වන දේශීය ඉල්ලුම මනා ලෙස සපුරාලීම සම්බන්ධයෙන් එම ව්‍යවසායයන්වල පවතින හැකියාව කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම් තුළින් සාර්ව ආර්ථික ස්ථායීතාව ද තර්ජනයට ලක්වී ඇත. මෙම ගැටලුව හඳුනා ගනිමින්, මෑත වසර වලදී, රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රජය පියවර කිහිපයක් ගෙන ඇත. අදාළ ව්‍යවසායයන්, රේඛීය අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය විසින් අත්සන් කරන ලද ත්‍රෛපාර්ශ්වික අවබෝධතා ගිවිසුමක් ලෙස ආයතනික අභිප්‍රාය ප්‍රකාශයක් (Statement of Corporate Intent) හඳුන්වාදීම සහ රාජ්‍ය ව්‍යවසායයන්හි වගවීමේ මට්ටම ඉහළ නංවමින්, වාණිජමය වශයෙන් නිදහස ලබා දෙන නියාමන රාමුවක් හඳුන්වාදීම, ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ ප්‍රධාන ප්‍රතිසංස්කරණ වේ. සමාන අරමුණු සහිත රාජ්‍ය ව්‍යවසායයන් සහ අගය දාමය තුළ සමාන තත්ත්වයක සිටින රාජ්‍ය ව්‍යවසායයන් අත්පත් කර ගැනීම සහ ඒකාබද්ධ කිරීම සඳහා ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ හඳුනාගෙන ඇති අතර, එමගින් මෙම ව්‍යවසායයන් සඳහා 'පරිමාණානුකූල ඵල' නිර්මාණය කෙරෙනු ඇත. තවද, සිංගප්පූරුවේ සහ මැලේසියාවේ දක්නට ලැබෙන පරිදි, අනෙකුත් සමාගම්වල කොටස් පවත්වා ගනිමින් 'පරිපාලන සමාගම්' ලෙස ක්‍රියාත්මක වන සමාගම් ලබන ආකාරයේ සාර්ථකත්වයක් අත්පත්කර ගැනීම සඳහා ඉහළ වටිනාකම් සහිත දේපළ වෙළඳාම්

6

වත්කම් කිහිපයක් කළමනාකරණය කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා රජයට පූර්ණ හිමිකාරිත්වයක් හිමි සමාගමක් වන සීමාසහිත සෙලෙන්දිවා ආයෝජන සමාගම රජය විසින් මෑත කාලීනව පිහිටුවන ලදී.

ආර්ථික ගමන් මග කඩිනමින් නිවැරදි කිරීමේ අවශ්‍යතාවක් පවතින කාල වකවානුවක, පශ්චාත් කොවිඩ්-19 වසංගත කාලපරිච්ඡේදය තුළ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලිය තුළ, අවශ්‍ය ප්‍රතිසංස්කරණ කඩිනම් කිරීමේ මෙන්ම රටේ සංවර්ධනය සඳහා සහය සපයන්නන් ලෙස රාජ්‍ය ව්‍යවසායයන් දැඩි හා වේගවත් පරිවර්තනයකට ලක් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතී. රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්යක්ෂමතාව, ඵලදායිතාව සහ ලාභදායිත්වය වැඩිදියුණු කිරීම සඳහා මෙම ප්‍රතිසංස්කරණ කටයුතු අත්‍යවශ්‍ය වන අතර, තවදුරටත් කල්පවතින ආර්ථික ගැටලුවක් බවට පත් නොවී, ඵලදායී හා තිරසාර ලෙස ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීමේ ක්‍රියාවලියට රාජ්‍ය ව්‍යවසායයන් දායක වීමට එම ආයතන සවිබල ගැන්වීම සිදු වේ. එලෙස රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිසංස්කරණය කිරීමේ දී සලකා බැලිය හැකි ප්‍රධාන ප්‍රතිසංස්කරණ කිහිපයක් පහත දක්වා ඇත.

යෝජිත ප්‍රධාන රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ

අ. පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම

රාජ්‍ය ව්‍යවසායයන්ට බොහෝ අවස්ථාවලදී ඒවායෙහි මූල්‍ය ශක්‍යතාව සහතික කිරීම සහ රජයට අවශ්‍ය සමාජ ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය සැලසීම අතර මනා තුලනයක් පවත්වා ගැනීම සඳහා ප්‍රයත්න දැරීමට සිදු වේ. නිදසුනක් ලෙස ග්‍රාමීය ප්‍රජාව සඳහා පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම හෝ කඳුකර ප්‍රදේශ ආදී භූගෝලීය වශයෙන් අභියෝගාත්මක ප්‍රදේශ සඳහා විදුලිය සැපයීම වැනි ඇතැම් අවස්ථාවලදී වාණිජමය වශයෙන් ඵලදායි නොවන නමුත්, අත්‍යවශ්‍ය නිෂ්පාදන සහ සේවා සැපයීමෙහි රාජ්‍ය ව්‍යවසායයන් නියැළීමේදී මෙම අභියෝගය පැන නගියි. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසායයන් විසින් සපයනු ලබන භාණ්ඩ හා සේවා අත්‍යවශ්‍ය භාණ්ඩ ලෙස සලකනු ලැබුව ද, මෙම භාණ්ඩ හා සේවා තිරසාර පදනමකින් හා අඛණ්ඩව සැපයීම සහතික කිරීමෙහිලා පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම ප්‍රමුඛතම කාර්යයක්ව පවතී.

මෑත කාලීනව, විශේෂයෙන්ම ඉන්ධන නිෂ්පාදිත සහ ජලය හා විදුලිය වැනි උපයෝගීතා සේවා සම්බන්ධව පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව දැඩි ප්‍රයත්නයක් දරා ඇත. ගෝලීය ප්‍රවණතාවලට සමගාමීව ඉන්ධන නිෂ්පාදිතවල මිල ගණන් නිතිපතා වෙනස් කිරීම සිදු වුණු කෙටි කාල වකවානු පැවතිය ද, 2019 වසරේ සැප්තැම්බර් මාසය සහ 2021 වසරේ ජූනි යන මාසය අතර කාලය තුළ මිල සංශෝධන කිසිවක් සිදු නොකළ අතර, පසුකාලීනව ගෝලීය බොරතෙල් මිල ගණන් ඉහළ යෑමෙහි බලපෑම සහ වසර කිහිපයක් පුරා ලං.බ.නී.සං. විසින් දරන ලද මූල්‍ය අලාභ පූරණය කර ගැනීමට අවස්ථා තුනකදී මිල ඉහළ නැංවීමක් සිදු කෙරිණි. ජලය සහ විදුලිය ගාස්තු, පිළිවෙළින්, 2012 වසරේ සිට සහ 2014 වසරේ සිට අඛණ්ඩව සංශෝධනය කිරීමකින් තොරව පැවතුණි. ආනයනික අතරමැදි භාණ්ඩ මත යැපෙන ලං.බ.නී.සං. සහ ලං.වි.ම. වැනි රාජ්‍ය ව්‍යවසායයන් සම්බන්ධයෙන් ගත් කල, ගෝලීය භාණ්ඩ මිල ගණන් වෙනස්වීම් සහ විනිමය අනුපාතික උච්චාවචන මගින් වන බලපෑම්වලට එම ව්‍යවසායයන් නිරාවරණය වීම හේතුවෙන්, මෙම ආයතන සඳහා නිරන්තර මිල සංශෝධන කිරීම් අවශ්‍ය වන බව නැවත අවධාරණය කළ යුතුය. එබැවින්, මෙවැනි බාහිර කම්පන හේතුවෙන් සිදුවන අලාභ අදාළ ව්‍යවසායයන්ට දරාගත නොහැකි බැවින්, දීර්ඝ කාලයක් පුරා මිල ගණන් හෝ ගාස්තු සංශෝධනවලින් තොරව පවත්වා ගැනීම අනුමත කළ නොහැකිය.

ඒ අනුව, විනිවිදභාවයකින් යුතු සහ දේශපාලනීකරණයෙන් තොර මිල නියමයන් ක්‍රියාත්මක කිරීම කඩිනම් අවශ්‍යතාවක්ව පවතී. සහනාධාර මිල ගණන් මගින් පාරිභෝගිකයින්ට කෙටි කාලීනව ඇතැම් මූල්‍ය ප්‍රතිලාභ සහ සහන ලබා දිය හැකි වුව ද, පිරිවැයට අඩු මිලක් යටතේ සපයන මෙවැනි සහන සඳහා අදාළ වියදම් බර රජය විසින් දරනු ලබන බව අවධානයට ගත යුතුය. 2022 වසරේ මුල් අවධියේ දී මතු වූ විදුලිබල සහ බලශක්ති අර්බුදයෙන් පෙනී ගිය පරිදි, ආර්ථිකය තුළ වළක්වාලිය නොහැකි අවහිරතා සඳහා මඟ පාදන, සැලකිය යුතු මට්ටමේ සාර්ව ආර්ථික පිරිවැයක් ඇති කිරීමට, සහනාධාර මිල මගින් ඇති කරන මිල විකෘතිතා සහ සම්පත් අකාර්යක්ෂම ලෙස බෙදා හැරීම් හේතු වේ. පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම මගින් රාජ්‍ය ව්‍යවසායයන්වල ශුද්ධ ලාභය වෙත සෘණාත්මක බලපෑමක් ඇති නොවන පරිදි, පිරිවැය පහළ යෑමෙහි ප්‍රතිලාභ විනිවිදභාවයකින් යුතුව සහ නිසිකලට රාජ්‍ය ව්‍යවසායයන් හරහා පාරිභෝගිකයින් වෙත ලැබීම සහතික කෙරෙනු ඇත. ආර්ථිකයේ අනෙකුත් අංශවලට ඇති කෙරෙන ධනාත්මක බලපෑම් ද ඇතුළුව එවැනි මිලකරණ යාන්ත්‍රණයක් මගින් රාජ්‍ය ව්‍යවසායයන්හි විනිවිදභාවය සහ වගවීම විශාල වශයෙන් ඉහළ නැංවිය හැක.

ආ. උපායමාර්ගික දිශානතිය වැඩිදියුණු කිරීම

රජයට අවශ්‍ය මූල්‍ය ප්‍රතිලාභ කෙටි කාලීනව උත්පාදනය කිරීම පමණක් නොව, ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන් වෙත ඔවුන්ගේ ඵලදායී විභවතාව සහ සමස්ත යහපැවැත්ම උදෙසා පහසුකම් සැපයීම මගින් උපාය මාර්ගික වටිනාකමක් ලබා දීම රාජ්‍ය ව්‍යවසායයන්හි මූලික කාර්යභාරය වේ. ඒ අනුව, රජයේ සමස්ත දැක්ම සමඟ මනා ලෙස සම්බන්ධ වුණු, විනිවිදභාවයකින් යුතු සහ පැහැදිලි උපාය මාර්ගයක් මෙම ආයතන සතුව තිබීම අත්‍යවශ්‍ය වේ. මෙමගින්,

6

රූප සටහන වි.ස 7.1
තෝරාගත් රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් බැංකු අංශයෙන් ලබාගත් ණය සංසන්දනය



(අ) ශ්‍රී ලංකන් ගුවන් සේවයේ මූල්‍ය ක්‍රියාකාරීත්වය මාර්තු 31 දිනයෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා අදාල වේ. 2021 වසර සඳහා වන දත්ත 2022 වසරේ මාර්තු 31 දිනයෙන් අවසන් වන මාස නවයක කාලසීමාවට අදළ වේ.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරන ලද මුදල් සංඛ්‍යාන අනුව

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා විදුලිබල මණ්ඩලය
ශ්‍රීලංකන් ගුවන් සේවය
ශ්‍රී ලංකා මහ බැංකුව

රාජ්‍ය ව්‍යවසායයන් සඳහා පැහැදිලි අරමුණක් සහ ඉලක්කයක් සහතික කෙරෙනු ඇත.

මෑතකදී දක්නට ලැබුණු පරිදි, ආර්ථිකයේ පාර්ශ්වකරුවන් සඳහා වටිනාකමක් නිර්මාණය කර දීමට සහ ආර්ථික වර්ධනය ඉහළ නැංවීමෙහිලා රාජ්‍ය ව්‍යවසායයන් සතු සම්පත්වලින් ප්‍රතිලාභ අත්කර ගැනීමට එම ව්‍යවසායයන් අපොහොසත් වී ඇත. දේශීය ප්‍රවණතා තුළින් පමණක් නොව, ගෝලීය ප්‍රවණතා තුළින් ද පැන නගින ඉඩ ප්‍රස්ථාවන් සහ අභියෝග පූර්වෝපායික වශයෙන් හඳුනාගෙන එම අභියෝගවලට විසඳුම් සෙවීමට රාජ්‍ය ව්‍යවසායයන් නිරන්තරයෙන්ම අසමත් වීම, එම ව්‍යවසායයන් සතුව උපායමාර්ගික සැලසුම් නොමැති වීම හේතුවෙන් ආර්ථිකයට ඇති කෙරෙන අවහිරතා මගින් පිළිබිඹු කෙරේ. ගෝලීය බලශක්ති සහ ආහාර මිල ගණන් අහිතකර ලෙස ඉහළ යෑම හමුවේ එවැනි උච්චාවචනයන්ට මුහුණ දීම සඳහා කිසිදු ශක්තිමත් ස්වාරක්ෂක ක්‍රමවේදයක් නොමැති තත්ත්වයක් තුළ, ආර්ථිකය මුහුණ දෙමින් සිටින සැපයුම් පාර්ශ්වීය කම්පන මගින් රාජ්‍ය ව්‍යවසායයන්හි පවතින දුර්වල උපායමාර්ගික සැලසුම්කරණය මැනවින් ගම්‍ය වේ.

එමනිසා, උපායමාර්ගික දිශානතිය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන් සිය මෙහෙයුම් සූක්ෂමව ඇගයීම වැදගත් වේ. නිෂ්පාදිතයක හෝ සේවාවක අගය දාමයන්හි කොටස් වෙන් වෙන්ව ක්‍රියාත්මක කිරීම මගින් රාජ්‍ය ව්‍යවසායයන්ට නිතැනින්ම ප්‍රතිලාභ හිමිවන අංශ පිළිබඳ ඇගයීමට හැකියාවක් ලැබේ. එලෙස අගය දාමයෙහි ක්‍රියාකාරකම් විභේදනය හරහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය සඳහා පහසුකම් සැලසිය හැකිය. ඒ අනුව, මෙහෙයුම් අකාර්යක්ෂමතාව මගින් ඇති වන බලපෑම රජය හෝ පාරිභෝගිකයන් හෝ වෙනත් අදාළ පාර්ශ්වකරුවන් විසින් දැරියයුතු නොවේ.

ඇ. මූල්‍ය විනිවිදභාවය සහ වගවීම වැඩි දියුණු කිරීම

වාණිජමය නොවන අරමුණු ඉටු කිරීමට ප්‍රයත්න දරන අතරතුර, තරගකාරී සහ වාණිජමය වශයෙන් පිරිමැසුම්දායක වීම සඳහා රාජ්‍ය ව්‍යවසායයන් විසින් දැඩි ප්‍රයත්නයක් දරන අතර, එබඳු වාණිජමය නොවන අරමුණු ඉටුකර ගැනීමට යාමේදී මූල්‍ය කාර්ය සාධනය දුර්වල විය හැකිය. රාජ්‍ය ව්‍යවසායයන් විසින් ඔවුන්ගේ වාණිජ වගකීම් සමඟ සමාජ වගකීම් කාර්යක්ෂමව තුලනය කරගන්නේ ද යන්න පිළිබඳව සොයා බැලීමට වගවීම, විනිවිදභාවය සහ පාලනය යන මූලධර්ම ඇතුළත් මනා කාර්ය සාධන අධීක්ෂණ රාමුවක් රාජ්‍ය ව්‍යවසායයන් තුළ ස්ථාපිත කිරීම වැදගත් වේ.

ඊට අදාළව, රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්ය සාධනය නියාමනය සහ ඇගයීම සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශක (Key Performing Indicators) හඳුනා ගැනීම සහ සැකසීම කඩිනමින් අවශ්‍ය වන එක් ප්‍රධාන පියවරකි. එවැනි ප්‍රධාන කාර්ය සාධන දර්ශක මගින් මූල්‍යමය ප්‍රතිලාභ ඇගයීමට ලක් කළ යුතු අතර, හුදෙක් රජය සඳහා ලාභ උපයන්නන් වීම පමණක් නොව, රාජ්‍ය ව්‍යවසායයන් සතුව පුළුල් අරමුණක් ඇති බැවින් සමාජීය, මානව සහ පාරිසරික ප්‍රාග්ධන සඳහා වන බලපෑම සලකා බැලීම ද මෙහිදී වැදගත් වේ.

රාජ්‍ය ව්‍යවසායයන් සම්බන්ධයෙන් සාංගමික අනාවරණය සහ ඒවායෙහි විනිවිදභාවය ඉහළ නැංවීම වෙත අවධානය යොමු කළ යුතු තවත් එක් අංගයකි. ඒ අනුව, රාජ්‍ය ව්‍යවසායයන් විසින් උසස් ප්‍රමිතීන් අනුගමනය කළ යුතු අතර, ලැයිස්තුගත සමාගම්වල තත්ත්වයෙන් යුතු උසස් ගිණුම්කරණ කටයුතු, සාංගමික අනාවරණ,

6

අනුකූලතා කටයුතු සහ විගණන ප්‍රමිතීන් යනාදියට අනුගත විය යුතුය. බොහෝ රාජ්‍ය ව්‍යවසායයන් වසර අවසාන මූල්‍ය ප්‍රකාශන හෝ වාර්ෂික ප්‍රගති සමාලෝචන නියමිත වේලාවට සකස් නොකිරීම හේතුවෙන් කලින් කලට ගැටලු උද්ගතව ඇති අතර, ඇතැම් ව්‍යවසායයන්වල මූල්‍ය ප්‍රකාශන පළ කිරීම වසර ගණනාවකින් ප්‍රමාද වී ඇත. රාජ්‍ය ව්‍යවසායයන්හි තත්ත්වය සහ ඒවා මූල්‍යමය වශයෙන් පිරිමැසුම්දායක සහ ආර්ථික වශයෙන් තිරසාර අන්දමින් ක්‍රියා කරන්නේ ද යන්න ඇගයීම සඳහා මූල්‍යමය හා මූල්‍යමය නොවන තොරතුරු පිළිබඳ අනාවරණ ඇතුළු සියළු තොරතුරු නිසි කලට අඛණ්ඩව වාර්තා කිරීම සහතික කිරීම සඳහා දැඩි යාන්ත්‍රණයක් අත්‍යවශ්‍ය වේ.

ඈ. සාංගමික පාලනය ශක්තිමත් කිරීම

දක්ෂ විධායක මණ්ඩලයක කාර්යක්ෂම සහ වෘත්තීය කළමනාකරණය මත රාජ්‍ය ව්‍යවසායයන්හි සාර්ථකත්වය රඳා පවතියි. රාජ්‍ය ව්‍යවසායයන්හි භාරකාරත්වය සහ කාර්ය සාධනය පිළිබඳ සම්පූර්ණ වගකීම විධායක මණ්ඩලය විසින් භාර ගැනීම අවශ්‍ය වන අතර, රජයේ දැක්මට අනුකූලව උපායමාර්ගික ක්‍රමවේදයකින් අදාළ රාජ්‍ය ව්‍යවසාය මෙහෙයවීම හරහා ආර්ථිකයේ ප්‍රගතියට දායක වීමට තරම් දක්ෂ විය යුතුය. ශ්‍රී ලංකාවේ ඇතැම් රාජ්‍ය ව්‍යවසායයන් සම්බන්ධයෙන් දක්නට ලැබෙන පරිදි, විධායක මණ්ඩලයේ අකාර්යක්ෂමතාවල ප්‍රතිඵලයක් ලෙස උපායමාර්ගික දිශානතියෙහි දුර්වල වීමක් සිදුවිය හැකි අතර, එමගින් රාජ්‍ය සම්පත් විශාල ලෙස අවභාවිතයට ලක් විය හැක.

සාංගමික පාලනයේ ගුණාත්මකභාවය සම්බන්ධයෙන් විධායක මණ්ඩලවල සංයුතිය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශක්තිමත් වගවීමක් සහතික කිරීම සඳහා රජය විසින් දක්ෂ, පළපුරුදු සහ වෘත්තිමය පුද්ගලයන් විධායක මණ්ඩල සඳහා පත් කිරීම ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. එම පත්වීම් මැතිවරණ ක්‍රියාවලියෙන් ස්වාධීන සහ ස්ථාවර කාලයක් සහිත ගිවිසුම් මත පදනම් විය යුතුය. තාවකාලික පිළියම් යෙදීම් වෙනුවට, මැදි කාලීනව පරිවර්තනයක් සඳහා ගැළපෙන කාර්යක්ෂම උපායමාර්ගික සැලසුමක් මේ තුළින් සහතික කළ හැක.

තමන්ට පැවරී ඇති සම්පත් පොදු මහජනතාව සතු සම්පත් බව සලකමින්, රාජ්‍ය ව්‍යවසායයන්ගේ විධායක මණ්ඩල සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය ඉතා උනන්දුවෙන් සහ දැඩි සැලකිල්ලෙන් ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වේ. මුදල් අමාත්‍යාංශය 2021 වසරේ අග භාගයේ දී සාංගමික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සහ රාජ්‍ය ව්‍යවසායයන් සඳහා මෙහෙයුම් අත්පොතක් නිකුත් කිරීම, මේ සම්බන්ධයෙන් ගත් කාලෝචිත ක්‍රියාමාර්ගයකි. සියලුම රාජ්‍ය ව්‍යවසායයන් මෙම මාර්ගෝපදේශයන්ට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා වන මුදල් අමාත්‍යාංශයේ දැඩි අධීක්ෂණය තුළින් මෙම ආයතනවල පරිවර්තන ක්‍රියාවලිය වැඩිදියුණු කළ හැකිය. ප්‍රශස්ත ජාත්‍යන්තර පරිචයන්ට අනුකූලව, රාජ්‍ය ව්‍යවසායයන්හි සාංගමික පාලන ප්‍රමිතීන් අඛණ්ඩව පෙළගැස්වීම සඳහා මාර්ගෝපදේශ නිතිපතා සමාලෝචනය කිරීම ද අත්‍යවශ්‍ය වේ.

ප්‍රශස්ත සාංගමික පාලනය මගින් රාජ්‍ය ව්‍යවසායයන් වඩා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමට, ප්‍රාග්ධනය සඳහා වන ප්‍රවේශය වැඩි දියුණු කිරීමට මෙන්ම සම්පත් අවභාවිතයෙන් ආරක්ෂා කරන අතර, අවදානම අවම කිරීමට උපකාරී වේ. සාංගමික පාලනයට අදාළව ප්‍රතිසංස්කරණවලට භාජනය වී ඇති රාජ්‍ය ව්‍යවසායයන්ට ඉන් ලැබී ඇති සෘජු ප්‍රතිලාභ ගණනාවක් පිළිබඳව පර්යේෂණ සොයා ගැනීම් මගින් අනාවරණය කර ඇත. එවැනි ප්‍රතිලාභ අතරට, මෙහෙයුම් කාර්ය සාධනය වැඩිදියුණු වීම, දේශීය හා ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළ හරහා විකල්ප මූල්‍ය ප්‍රභව වෙත ප්‍රවේශ වීමේ හැකියාව ඉහළ යෑම, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍යන පහසුකම් ලබා දීම, රාජ්‍ය ව්‍යවසායයන් මගින් රාජ්‍ය මූල්‍ය වෙත වන පීඩනය අවම වීම මෙන්ම ලාභාංශ ගෙවීම් ඉහළ යෑම, සහ දූෂණය හා නාස්තිය අඩු වීම හා විනිවිදභාවය වැඩිදියුණු වීම හරහා අයවැය සඳහා වන ශුද්ධ දායකත්වය ඉහළ යෑම යනාදිය ඇතුළත් වේ.

රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ: ජාත්‍යන්තර අත්දැකීම්

දශක ගණනාවක සිට ලොව පුරා රටවල් සිය රාජ්‍ය ව්‍යවසායයන්හි කාර්ය සාධනය වඩාත් යහපත් අතට පරිවර්තනය කිරීම සඳහා උත්සාහ දරා ඇත. ඒ අතරින් ශ්‍රී ලංකාව සඳහා වඩාත් සුදුසු රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ අත්දැකීම් පහතින් විස්තර කෙරේ.

සිංගප්පූරුව

සිංගප්පූරුව සම්බන්ධයෙන් ගත් කල, ආයෝජන සමාගමක් වන ටෙමාසෙක් *(Temasek)* විශාල සාර්ථකත්වයක් අත්කරගත් සමාගමකි. පෙරදී සිංගප්පූරු රජයේ අයිතිය යටතේ පැවති ආයෝජනවල සහ වත්කම්වල හිමිකාරීත්වය දැරීමට මෙන්ම, වාණිජමය වශයෙන් කළමනාකරණය කිරීම සඳහා 1974 වසරේ දී මෙම සමාගම පිහිටුවන ලදී. 1965 වසරේ දී නිදහස ලැබීමෙන් පසුව අමුද්‍රව්‍ය ලෙස යොදාගත හැකි ස්වභාවික සම්පත් ප්‍රමාණවත් නොවීම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන සිංගප්පූරුව විසින් වේගවත් කාර්මීකරණ සහ ආර්ථික සංවර්ධන වැඩසටහනක් ආරම්භ කරන ලදී. රජය විසින් උපායමාර්ගික අංශ කිහිපයකම ආරම්භක ව්‍යාපාර ස්ථාපිත කළ බැවින්, පාලන අයිතිය රජය සතු වූ මෙම ව්‍යවසායයන්හි වාණිජ කළමනාකරණ වගකීමෙන් ඊට අදාළ අමාත්‍යාංශ නිදහස් කිරීම සඳහා ටෙමාසෙක් පිහිටුවන ලදී. කාලයත් සමඟ එම අරමුදල මගින් කළඹ ආයෝජන සමාගම් අනෙකුත්

6

වෙළඳපොළවල් කරා පුළුල් කිරීමට මෙන්ම, ජාත්‍යන්තර වශයෙන් වඩාත් තරගකාරී වීම සඳහා ව්‍යාපාර ඒකාබද්ධ කිරීම් සහ අත්පත් කර ගැනීම් සඳහා යොමුවීම දිරිමත් කෙරිණි. සමාගම් ප්‍රඥප්තිය කිහිප වතාවක් සංශෝධන කිරීම හරහා ටෙමාසෙක් සමාගම වර්තමාන පරම්පරාවෙන් ඔබ්බට තිරසාර ප්‍රතිලාභ උත්පාදනය කිරීමේ මෙහෙයුම් අරමුණ ඇති ගෝලීය ආයෝජන සමාගමක් බවට පරිවර්තනය විය. ටෙමාසෙක්හි ආයෝජන කළඹෙහි වටිනාකම 2021 වසරේ මාර්තු මාසය අවසන් වන විට එ.ජ. ඩොලර් බිලියන 283ක් වූ අතර, ටෙමාසෙක් සමූහය එම වසර තුළ එ.ජ. ඩොලර් බිලියන 42ක ශුද්ධ ලාභයක් උපයා තිබිණි. විශේෂයෙන්ම, ටෙමාසෙක් යටතේ ඇති කළඹ සමාගම් තුළ අධ්‍යක්ෂක මණ්ඩලවල රජයේ නියෝජිතයන් නොමැති වීම සැලකිය යුතු කරුණකි. තවද, ටෙමාසෙක් හෝ වෙනත් රජය සතු ව්‍යවසයයන්හි ඉහළ තනතුරු දරන පුද්ගලයින් පත් කිරීම සහ ඒවායේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සිංගප්පූරු රජය මගින් කිසිදු බලපෑමක් සිදු නොකරයි.

චීනය

විදේශ වෙළඳාම සඳහා ආර්ථිකය විවෘත කිරීම අරමුණු කරගත් වෙළඳපොළ අභිමුඛ ආර්ථික ප්‍රතිසංස්කරණ මත පදනම් වූ ප්‍රතිසංස්කරණ මාලාවක් 1970 වසරේ සිට චීනයේ රාජ්‍ය ව්‍යවසායයන් සඳහා සිදු කර ඇත. 2003 වසරේ දී රාජ්‍ය ව්‍යවසායයන් සඳහා අරමුදල් සැපයීමට සහ නියාමනය කිරීම සඳහා රජය සතු වත්කම් අධීක්ෂණ සහ පරිපාලන කොමිෂන් සභාව *(State-owned Assets Supervision and Administration Commission)* ස්ථාපිත කරන ලදී. 2013 වසරේ සිට චීනය විශාල රාජ්‍ය ව්‍යවසායයන් ඒකාබද්ධ කිරීම සහ මිශ්‍ර හිමිකාරිත්ව වැඩසටහන් පුළුල් කිරීම පිළිබඳව අවධානය යොමු කර ඇත. වර්තමානයේ දී, චීනයේ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය මගින් රාජ්‍ය ව්‍යවසායයන් ශක්තිමත් කිරීම, වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ අනුව, රජය සතු වත්කම් අධීක්ෂණ සහ පරිපාලන කොමිෂන් සභාවෙහි ප්‍රධාන ප්‍රවේශයක් වන උපායමාර්ගික වශයෙන් වැදගත්වන ව්‍යවසායයන් රජය සතුව පවත්වාගන්න අතර සෙසු *උපායමාර්ගික වශයෙන් වැදගත්ව නොවන ව්‍යවසායයන් රාජ්‍ය අයිතියෙන් බැහැර කිරීමේ සංකල්පය (zhuada fagxiao)* යටතේ රාජ්‍ය ආර්ථිකය කෙරෙහි උපායමාර්ගිකව වැදගත් යැයි සැලකෙන රාජ්‍ය ව්‍යවසායයන් ශක්තිමත් කරන අතරම, පෞද්ගලීකරණය සහ වත්කම් අලෙවි කිරීම හරහා කුඩා පරිමාණයේ රාජ්‍ය ව්‍යවසායයන් සංඛ්‍යාව අඩු කිරීමට උත්සාහ දරයි. එමෙන්ම, මෙම කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන සමාගම් ඒවායේ පෞද්ගලික අංශයේ තරගකාරී සමාගම් හා සැසඳීමේදී පවා ඉතා ඉහළ මට්ටමේ පාලනයක් සහිත සමාගම් බවට විශ්වාසයක් පවතී. සවිස්තරාත්මක ලාභාංශ ඉලක්ක සහිත කාර්ය සාධනය පදනම් කරගත් ගිවිසුම් යටතේ මෙම සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් සහ අධ්‍යක්ෂවරුන් පත් කිරීම සිදුවේ. එමෙන්ම, ස්වාධීන වෘත්තීයමය අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය හරහා මෙම ආයතනවල වගවීම ඉහළ නංවා ඇත.

බ්‍රසීලය

දුර්වල ක්‍රියාකාරිත්වයක් සහිත රාජ්‍ය ව්‍යවසායයන්වල ගැටලුකාරී තත්වයන් පැවතිය ද, *පෙට්‍රොබ්‍රාස් (Petrobras)* වැනි *ෆෝචූන් ග්ලෝබල් 500 ලැයිස්තුවේ (Fortune Global 500 list)* පවා ඇතුළත් වූ අතිශය සාර්ථක රාජ්‍ය ව්‍යවසායයන් බ්‍රසීලය විසින් නිර්මාණය කර ඇත. 2010 වසරේ දී පෙට්‍රොබ්‍රාස් සමාගම සම්පූර්ණයෙන්ම රාජ්‍ය හිමිකාරීත්වයක් සහිත සමාගමක් වුවත්, පසුව මිශ්‍ර හිමිකාරීත්වයක් සහිත සමාගමක් බවට පරිවර්තනය විය. මෙම පරිවර්තනය සහතික කළ කොටස් නිකුතුව, මේ දක්වා ප්‍රාග්ධන වෙළඳපොළ ඉතිහාසයේ විශාලතම ප්‍රාග්ධන වර්ධනයක් ඇති කළ ගනුදෙනුවකි. මෙමගින් එම සමාගමට ස්වකීය වර්ධනයට සහාය වීම සඳහා ආයෝජන ලබා ගැනීමට අවස්ථා නිර්මාණය වූ අතර, සමාගමේ වෙළඳපොළ වටිනාකමෙහි ඉහළ යෑමක් ද සිදු විය. සමාගම කොටස් හුවමාරුව තුළ ලැයිස්තුගත කිරීම මගින් තනි හිමිකරුවකු ලෙස පැවති රාජ්‍ය සහභාගීත්වය සැලකිය යුතු ලෙස සීමා වීමත් සමඟ වඩාත් උසස් ආයතනික පාලනයක් සඳහා මෙම සිදුවීම මග පෑදූ අතර, එමගින් දේශපාලනික බලපෑම්වල අවදානම සහ අධ්‍යක්ෂක මණ්ඩලයේ හා කළමනාකාරිත්වයේ කැපවීම අඩුවීමේ අවදානම වැළැක්විණි.

ඉන්දියාව

රාජ්‍ය ව්‍යවසායයන්හි අකාර්යක්ෂමතාව පිළිබඳ ගැටලුව විසඳීම සඳහා මෑත වසර තුළදී ඉන්දියාව විසින් රාජ්‍ය ආයෝජන ඉවත් කිරීමේ උපාය මාර්ගයක අනුගමනය කරන ලදී. එම ව්‍යවසායයන්හි කළමනාකාරිත්වයෙහි පාලනය පැවරීම ඇතුළුව, රජය සතු කොටස්වල සැලකිය යුතු ප්‍රමාණයක් විකිණීම ද මේ සඳහා ඇතුළත් විය. වර්තමානයේ දී, *ෆෝචූන් ග්ලෝබල් 500 ලැයිස්තුව* තුළ, චීනයට පසු දෙවන විශාලතම රාජ්‍ය අංශය සතු ව්‍යවසායයන් සංඛ්‍යාවක් හිමි රට ලෙස ඉන්දියාව සැලකේ. ඉන්දියානු රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රයේ මෑත කාලීන ක්‍රියාමාර්ගයක් වූයේ *එයාර් ඉන්දියා* සමාගම පෞද්ගලීකරණය කිරීමයි. මේ යටතේ ඉන්දියානු රජයට එ.ජ. ඩොලර් මිලියන 360ක පමණ කොටස් හිමි වූ අතර, පුද්ගලික සමූහ ව්‍යාපාරයට එ.ජ. ඩොලර් බිලියන 2ක් වූ *එයාර් ඉන්දියා* සමාගමේ ණය වගකීම ලබා ගැනීම සිදු විය. ඉන්දියාව, රාජ්‍ය ආයතනවල සහ රාජ්‍ය අංශයේ ව්‍යාපාරවල අතිරික්ත ඉඩම් සහ ගොඩනැගිලි රඳවා තබා ගැනීම, කළමනාකරණය කිරීම සහ එමගින් මුදල් ඉපැයීම ඉලක්ක කරගත් ජාතික ඉඩම් මුදල්කරණ සංස්ථාව

6

(National Land Monetisation Corporation) නමින් සමාගමක් පිහිටුවීමට ද නියමිතය. මෙය සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් ලෙස මුදල් අමාත්‍යාංශය යටතේ පිහිටුවීමට නියමිතය.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යවසාය සාර්ථක ලෙස ප්‍රතිසංස්කරණය කිරීම: ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සීමිත සමාගම

සේවාවල ගුණාත්මකභාවය, විශ්වසනීයත්වය සහ මිලකරණය සම්බන්ධයෙන් විදුලි සංදේශ අංශය ශ්‍රී ලංකාවේ ඇති වඩාත්ම සාර්ථක සේවා අංශවලින් එක අංශයකි. වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ සියයට 135කට වඩා වැඩි ජංගම දුරකථන ඝනත්වයක් පවතින අතර, කලාපය තුළ අඩුම ජංගම දුරකථන ගාස්තු සහ අන්තර්ජාල ගාස්තු සහිත රටවල් අතර ද ශ්‍රී ලංකාව සිටී. පසුගිය දශක දෙක තුළ සාර්ථක රාජ්‍ය ව්‍යවසායයක් ලෙස ඉදිරියට පැමිණි ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සීමිත සමාගම, විදුලි සංදේශ අංශයෙහි ප්‍රධාන පෙර ගමන්කරු වේ.

නිදහස් ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, 1980 දශකයේ මුල් භාගයේදී විදුලි සංදේශ දෙපාර්තමේන්තුව පිහිටුවීම හරහා විදුලි සංදේශ ක්ෂේත්‍රය ප්‍රතිව්‍යුහගත කිරීමෙහිලා ශ්‍රී ලංකාව විසින් සැලකිය යුතු පියවරක් ගත් අතර, පසුව එහි මෙහෙයුම් කටයුතු *ශ්‍රී ලංකා ටෙලිකොම්* නම් රාජ්‍ය සංස්ථාව වෙත පැවරිය. 1996 වසරේ දී *ශ්‍රී ලංකා ටෙලිකොම්* ආයතනය රජය සතු සීමිත සමාගමක් ලෙස ප්‍රතිස්ථාපනය කරන ලදී. රජයට අයත් මෙම ව්‍යවසායෙහි හැරවුම් ලක්ෂ්‍යයක් වූයේ ඊළඟ වසරේ දී කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 25ක් *නිපොන් ටෙලිග්‍රාෆ් සහ දුරකථන සංස්ථාව (Nippon Telegraph & Telephone Corporation)* වෙත එ.ජ. ඩොලර් මිලියන 225කට විකිණීමයි. ඉන් අනතුරුව, *ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සීමිත සමාගම* 2003 වසරේ දී කොළඹ කොටස් වෙළෙඳපොළේ සාර්ථක ලෙස ලැයිස්තුගත කිරීම සිදු විය. භාණ්ඩාගාර ලේකම් හරහා සියයට 49.50ක කොටස් හිමිකාරීත්වයක් දරන රජය සහ සියයට 44.98ක හිමිකාරීත්වයක් දරන *ග්ලෝබල් ටෙලිකොමියුනිකේෂන්ස් හෝල්ඩින්ග්ස් (Global Telecommunications Holdings N.V.)* 2020 වසර අවසන් වන විට, *ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සීමිත සමාගමෙහි* ප්‍රධාන කොටස් හිමිකරුවන් දෙදෙනා විය. සෙසු කොටස් ප්‍රතිශතය වෙනත් කොටස් හිමියන් සතු වන අතර, ඒවා කොළඹ කොටස් හුවමාරුව තුළ ප්‍රසිද්ධියේ ගනුදෙනු කෙරේ. ඒ අනුව, 2020 වසරේ දී ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමෙහි ලාභාංශ දළ වශයෙන් රුපියල් මිලියන 947ක් වූ අතර, 2022 වසරේ දී සමාගමේ ලාභාංශය රුපියල් බිලියන 1.4ක අගයක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා ටෙලිකොම් උදාහරණය මගින් රාජ්‍ය ව්‍යවසායයන් සතුව පවතින සුවිශේෂ විභවතාවන් මෙන්ම, ආයෝජන ආපසු පැවරීම වැනි කාලෝචිත ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම හරහා ආර්ථිකයට මෙම විභවතාවෙන් ඵල ප්‍රයෝජන අත්කරගත හැක්කේ කෙසේදැයි යන්න අවධාරණය කරයි. මෙහිදී, තරගකාරීත්වය සහ තරගකාරී වෙළඳපොළක් සහතික කිරීම සඳහා කැප වූ නියාමන පරිසරයක් නිර්මාණය කිරීම හරහා ක්ෂේත්‍රයේ සමස්ත ගතික සංවර්ධනය සහතික කිරීමට ඉවහල් වූ *ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන්* සභාව ස්වාධීන නියාමන ආයතනයක් ලෙස පිහිටුවීම, ශ්‍රී ලංකා ටෙලිකොම්හි ප්‍රගතියට දායක වූ බව සඳහන් කිරීම ද වැදගත්ය.

ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම අත්කරගත් සාර්ථකත්වය සැලකිල්ලට ගනිමින්, ඉදිරියේදී රාජ්‍ය ව්‍යවසායයන් විකිණීම සහ/හෝ පවරා දීම පිළිබඳ රජයට සලකා බැලිය හැක. ඒ අනුව, රජයේ වත්කම් විකිණීම සම්බන්ධයෙන්, අනුප්‍රාප්තික රජයන් ස්ථාවර ප්‍රතිපත්තියක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වන අතර, එම ක්‍රියාවලිය අතරතුර කාලෝචිත හා ක්‍රියාශීලී අයුරින් පාර්ශවකරුවන්ගේ ගැටලු පිළිබඳව ද අවධානය යොමු කළ යුතුය.

ඉදිරි දැක්ම

ඉදිරියේ දී, ශ්‍රී ලංකා ආර්ථිකය පශ්චාත් කොවිඩ්-19 අවධිය තුළ යථා තත්ත්වයට පත් වීමේදී සහ ඉහළ මැදි ආදායම් තත්ත්වයට ළඟා වීමේදී, විශේෂයෙන් ඒකාබද්ධ කිරීම් සහ ඉහත යෝජිත සමාගම් පාලනය ශක්තිමත් කිරීම යනාදියට අදාළව දැනට ක්‍රියාත්මක කෙරෙමින් පවතින ප්‍රතිසංස්කරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා රජය විසින් පියවර ගැනීම ඉතා වැදගත් වේ. විනිවිදභාවයෙන් යුතු මිලකරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම, උපාය මාර්ගික දිශානතිය වැඩිදියුණු කිරීම සහ මූල්‍ය වගවීම වැඩිදියුණු කිරීමට අදාළ ප්‍රතිසංස්කරණ ද, රාජ්‍ය ව්‍යවසායයන්වල කාර්ය සාධනය කෙටිකාලීනව වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙමගින් රාජ්‍ය ආදායම වැඩිදියුණු වීම සහතික කිරීම පමණක් නොව, රාජ්‍ය අයවැය මගින් වන සංක්‍රාම හරහා හෝ බැංකු පද්ධතියෙන් ණය ගැනීම් හරහා අලාභ මූල්‍යයනය කිරීමේ අවශ්‍යතාවය ද අඩු කරයි. ගෘහස්ත ඒකක සහ ව්‍යවසායයන් විසින් කෙරෙන වඩාත් ඵලදායී ආදායම් උත්පාදනය හෝ වත්කම් නිර්මාණය සඳහා සැලකිය යුතු සම්පත් ප්‍රමාණයක් යොමු කරවීමට මෙමගින් හැකියාව ලැබේ. ඒ අනුව, කෙටි කාලීනව රාජ්‍ය ආදායම මත සහ මැදි හා දිගු කාලීනව ආර්ථික වර්ධනය කෙරෙහි ගුණාකාර බලපෑමක් ඇති කෙරෙනු ඇත.

විශේෂයෙන්ම, උපායමාර්ගික ක්ෂේත්‍රවල රාජ්‍ය ව්‍යවසායයන් පුළුල්ව ව්‍යාප්ත වී තිබීමත් සමඟ, එම ව්‍යවසායයන් විසින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී ඉටු කරන ප්‍රධාන කාර්යභාරය පිළිබඳව නිසි සැලකිල්ලක්

6

යොමු කරමින්, මෙම ව්‍යවසායයන් රජයට මූල්‍යමය වශයෙන් බරක් නොවී ඵලදායී ලෙස ක්‍රියා කිරීම සහ හිතකර සමාජ ආර්ථික ප්‍රතිඵල ලබා දීම ඉතා වැදගත් වේ. ඊට අදාළව, රජය විසින් රාජ්‍ය ව්‍යවසායවල වෙන් වශයෙන් ශක්‍යතා අධ්‍යයන සිදුකිරීම සහ දේශීය හෝ විදේශීය ආයතන වෙත ඔවුන්ගේ ඇතැම් වත්කම් විකිණීම සම්බන්ධයෙන් කාලෝචිත පියවර ගත යුතුය. ඉන් අනතුරුව, මෙම රාජ්‍ය ව්‍යවසායයන් දේශපාලනීකරණය කිරීමකින් තොරව, තිරසාර සහ ශක්‍ය මෙහෙයුම් සහතික කිරීම පිණිස ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව ද රජයට සලකා බැලිය හැක. එවැනි ප්‍රතිසංස්කරණ සඳහා ආරම්භයේ දී ඇතැම් ජනප්‍රිය නොවන ප්‍රතිපත්ති මුලපිරීම් අවශ්‍ය විය හැකි නමුත්, ඉන් මැදි කාලීනව සහ දිගු කාලීනව මූල්‍යමය ශක්‍යතා ඇති සහ ආර්ථිකමය වශයෙන් ප්‍රයෝජනවත් වන රාජ්‍ය ව්‍යවසායයන් නිර්මාණය කිරීමට මග පෑදිය හැකි බව ද රජය විසින් හඳුනාගත යුතුය. එවැනි ප්‍රතිසංස්කරණ තුළින්, පවතින රාජ්‍ය ව්‍යවසායයන් රාජ්‍ය මූල්‍යයට පීඩනයක් ඇති කරන තත්ත්වයේ සිට වටිනාකම් නිර්මාණය කෙරෙන ව්‍යවසායයන් බවට පරිවර්තනය කිරීම හරහා එම ව්‍යවසායයන් ශ්‍රී ලංකාවේ ප්‍රගතිය ඉහළ වර්ධන මාවතක් කරා ගෙන යන මාවතේ අවහිරයක් වනවා වෙනුවට සහය සපයන්නන් ලෙස දායක වීම අත්‍යවශ්‍ය වේ.

මූලාශ්‍ර

1. Central Bank of Sri Lanka. A Review of the Economy of Sri Lanka, 1950 - 1975
2. Central Bank of Sri Lanka. 1998. Economic Progress of Independent Sri Lanka.
3. Central Bank of Sri Lanka. Annual Reports, Various Issues.
4. European Commission. 2013. European System of Accounts 2010 (ESA10), Section 2.51, Luxembourg.
5. IMF. 2014. Government Finance Statistics Manual 2014. Washington, DC: International Monetary Fund.
6. IMF. 2020. 'State-Owned Enterprises: The Other Government.' IMF Fiscal Monitor, April 2020.
7. Guluzade, A., 2020, May. How reform has made China's state-owned enterprises stronger. In World Economic Forum. May (Vol. 21).
8. Kim, K. and Panchanatham, N., 2021. Reform and privatization of state-owned enterprises in India. In Reforming State-Owned Enterprises in Asia (pp. 157-168). Springer, Singapore.
9, Knight.M., Guruge, A. and Cham, M.R., 2017. State-owned enterprise reforms in Sri Lanka: the way forward. Manila : Asian Development Bank Institute.
10. Lakshman.W.D. ed., 1997. Dilemmas of development: fifty years of economic change in Sri Lanka. Sri Lanka Association of Economists.
11. Ministry of Finance. Annual Report, Various Issues.
12. Mukherjee. A., Sarma, A.P., Barah, A. and Mohan, A., 2020. Public Sector Enterprises in India : Enhancing Geo-Strategic Reach and Exports.
13. OECD. 2015. OECD Guidelines on Corporate Governance of State-Owned Enterprises, 2015 Edition. Paris: OECD Publishing.
14. PwC. State-Owned Enterprises: Catalysts for public value creation?
15. World Bank Group. 2014. Corporate Governance of State-Owned Enterprises: A tool kit.

පැවරීම, සහ පෞද්ගලික අංශයේ සහභාගීත්වය යන අංශයන් තුළ ජාතික අයවැයෙන් වෙන් කළ මුදල් යොදා ගනිමින් මුදල් කොමිෂන් සභාව විසින් 2021 වසරේ දී පියවර කිහිපයක් ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරන ලදී. උප රාජ්‍ය මට්ටමින් අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවා ලබා දීම ඇතුළුව ඔවුන්ගේ වියදම් අවශ්‍යතා ඉටු කර ගැනීමට පළාත් සභාවලට ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීමට මුදල් කොමිෂන් සභාව නිර්දේශ කළේය. තවද, සම්පත් සඵලදායීව භාවිත කිරීම සහ පළාත් සභාවලට ඍජුවම අරමුදල් සැපයීම මගින් ප්‍රාදේශීය විෂමතා අවම කිරීම, සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ වාර්ෂික සැලසුමක් සකස් කිරීම සහ පළාත් සභා අතර තුලිත සම්පත් බෙදා හැරීමක් පවත්වා ගෙන යෑම සහතික කිරීම සඳහා නිර්දේශ සිදු කෙරිණි. ආපදා ප්‍රතිචාර හා ආපදා අවම කිරීමේ කටයුතු සහ ප්‍රජා මූලික මැදිහත්වීම් බොහොමයක් පළාත් සභා සහ පළාත් පාලන ආයතන හරහා සිදු කෙරෙන බැවින්, පළාත් පාලන ආයතනවලට සේවා සැපයීම සහ පරිසර ආරක්ෂණ කටයුතු සඳහා ජාතික අයවැය යටතේ විශේෂ ප්‍රදානයක් වෙන් කිරීමට කොමිෂන් සභාව නිර්දේශ කර ඇත. මෙම නිර්දේශයට අනුකූලව, මුදල් කොමිෂන් සභාව විසින් එවැනි කටයුතු සඳහා අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සඳහා සිදු කරන අරමුදල් වෙන් කිරීම් නවතා දැමීමේ අවශ්‍යතාව ඉස්මතු කරන ලදී. තවද, මධ්‍යම රජයේ අයවැය මත පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල යැපීම අවම කිරීම සඳහා ආදායම් උත්පාදනය ඉහළ නැංවීමට පළාත් සභා සහ පළාත් පාලන ආයතන සවිබල ගැන්වීම කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදී. අන්තර් උප රාජ්‍ය මූල්‍ය සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම සඳහා ජාතික සහ උප රාජ්‍ය ආයතනවල සැලසුම්කරණය, අයවැය සැකසීම සහ රාජ්‍ය ආයෝජන වාර්තා කිරීම සඳහා පොදු රාමුවක් සකස් කිරීමට මුදල් කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදී. රජයේ අයවැය මත රඳා පැවතීම අඩු කරමින්, රට තුළ තුලිත සංවර්ධනයක් පවත්වා ගෙන යන අතරතුර, සේවාවල

6

ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අදාළ අංශවල සහ ප්‍රදේශවල පෞද්ගලික ආයෝජන දිරිමත් කිරීම සඳහා ද නිර්දේශ සිදු කෙරිණි.

පළාත් සභාවල අයවැය කටයුතු

2020 වසරට සාපේක්ෂව ඉහළ ගිය ආර්ථික කටයුතු පිළිබිඹු කරමින් පළාත් සභාවල ආදායම් රැස් කිරීම 2021 වසරේ දී වර්ධනය විය. බදු ආදායම් රැස් කිරීම ඉහළ යෑම හේතුවෙන් 2020 වසරේ රුපියල් බිලියන 52.2ක් වූ පළාත් සභාවල සමස්ත ආදායම 2021 වසරේ දී රුපියල් බිලියන 58.1ක් දක්වා ඉහළ ගියේය. පළාත් සභාවල ප්‍රධාන ආදායම් මූලාශ්‍රය ලෙස අඛණ්ඩව පවතින මුද්දර ගාස්තුවලින් රැස් කළ ආදායම, 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 27.4 සිට 2021 වසරේ දී රුපියල් බිලියන 38.8ක් දක්වා ඉහළ යෑම නිසා ආදායමෙහි සිදු වූ වැඩි වීම හේතුවෙන් 2020 වසරේ දී රුපියල් බිලියන 43.1ක් වූ බදු ආදායම, 2021 වසරේ දී රුපියල් බිලියන 51.1ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, දැනට පවතින ආනයන සීමා මධ්‍යයේ මෝටර් රථ ලියාපදිංචි කිරීම් අඩු වීම මූලික වශයෙන් හේතු කරගෙන, බලපත්‍ර ගාස්තුවලින් උපයනු ලබන ආදායම, 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 11.2ට සාපේක්ෂව, 2021 වසරේ දී රුපියල් බිලියන 10.8ක් දක්වා පහත වැටුණි. 2019 දෙසැම්බර් මාසයේ දී ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කිරීමත් සමඟ 2020 වසරේ රුපියල් බිලියන 2.7ක් වූ මධ්‍යම රජය විසින් පවරන ලද ජාතිය ගොඩනැගීමේ බද්දෙන් ඉපැයූ ආදායම, 2021 වසරේ දී රුපියල් බිලියන 0.3ක් දක්වා සැලකිය යුතු ලෙස පහත වැටුණි. ඒ අනුව, පළාත් සභාවල සමස්ත බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස 2020 වසරේ දී සියයට 63.5ක් වූ මුද්දර ගාස්තුවලින් ලත් ආදායම 2021 වසරේ දී සමස්ත බදු ආදායමෙන් සියයට 76.0ක් දක්වා ඉහළ ගිය අතර, ජාතිය ගොඩනැගීමේ බද්දෙන් ලත් ආදායම් ප්‍රතිශතය, 2020 වසරේ පැවති සියයට 6.3ක අගයේ සිට 2021 වසරේ දී සියයට 0.5ක් දක්වා පහත වැටුණි. මේ අතර, 2020 වසරේ රුපියල් බිලියන 9.1ක් වූ බදු නොවන ආදායම, 2021 වසරේ දී රුපියල් බිලියන 7.1ක් දක්වා පහත වැටුණි. බස්නාහිර පළාතේ හැරුණු කොට අනෙකුත් සියලු පළාත්වල ආදායම පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී පහත වැටුණි. ඒ අනුව, මුද්දර ගාස්තු සහ පොලී ආදායමෙන් ලද ඉහළ ආදායම හේතුවෙන්, සියලු පළාත් සභා විසින් රැස් කරනු ලබන සමස්ත ආදායමේ ප්‍රතිශතයක් ලෙස බස්නාහිර පළාත් සභාවේ ආදායම, 2020 වසරේ වාර්තා වූ සියයට 46.8 සිට 2021 වසරේ දී සියයට 53.6ක් දක්වා ඉහළ ගියේය. අනෙකුත් පළාත් සභා අතරින් වයඹ සහ දකුණු පළාත් සභා සමස්ත ආදායමෙන්, පිළිවෙළින්, සියයට 10.3කට සහ සියයට 10.0කට දායකත්වය දැක්වීය.

පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී මූලික වශයෙන් පුනරාවර්තන වියදම් ඉහළ යෑම හේතුවෙන් පළාත් සභාවල සමස්ත වියදම ඉහළ ගියේය. නාමික වශයෙන්, 2020 වසරේ දී රුපියල් බිලියන 337.0ක් වූ සමස්ත වියදම, 2021 වසරේ දී රුපියල් බිලියන 376.4ක් දක්වා ඉහළ ගිය අතර, 2020 වසරේ මෙන් 2021 වසරේ දී, එය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, සියයට 2.2ක් ලෙස නොවෙනස්ව පැවතිණි. ප්‍රධාන වශයෙන්, පුද්ගලික වැටුප් හා වේතන ගෙවීම සඳහා වන වියදම, 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 228.6ක සිට 2021 වසරේ දී රුපියල් බිලියන 251.5ක් දක්වා ඉහළ යෑම හේතුවෙන්, 2020 වසරේ රුපියල් බිලියන 289.7ක් වූ පුනරාවර්තන වියදම්, 2021 වසරේ දී රුපියල් බිලියන 317.0ක් දක්වා ඉහළ ගියේය. පළාත් සභාවල සමස්ත පුනරාවර්තන වියදමෙන් සියයට 79.4ක ප්‍රතිශතයකට දායක වෙමින් පුද්ගල වැටුප් හා වේතන පුනරාවර්තන වියදම්වල විශාලතම සංරචකය ලෙස පැවතිණි. මේ අතර, පළාත් සභාවල වැටුප් හා වේතනවලින් සියයට 90ක් පමණ අධ්‍යාපන සහ සෞඛ්‍ය අංශ වෙනුවෙන් වැය කෙරිණි. බස්නාහිර, මධ්‍යම සහ දකුණු පළාත් සභා වැඩිම වියදම් දරන පළාත් පාලන ආයතන ලෙස වාර්තා වූ අතර, පළාත් සභාවල සමස්ත පුනරාවර්තන වියදමෙන් මෙම පළාත් සභා ත්‍රිත්වය, පිළිවෙළින්, සියයට 20.6කට, සියයට 12.8කට සහ සියයට 12.5කට දායකත්වය දැක්වීය.

6.9 සංඛ්‍යා සටහන

පළාත් සභාවල අයවැය තත්ත්වය

රුපියල් මිලියන

ශීර්ෂය	2018	2019	2020 (අ)	2021 (ආ)
මුළු ආදායම	**88,689**	**91,344**	**52,245**	**58,141**
බදු ආදායම	82,228	81,499	43,096	51,067
බදු නොවන ආදායම	6,461	9,845	9,149	7,075
මුළු වියදම	**292,265**	**310,124**	**337,006**	**376,447**
පුනරාවර්තන වියදම්	251,552	286,884	289,667	316,969
එයින් වැටුප් හා වේතන	198,129	219,698	228,561	251,525
ප්‍රාග්ධන වියදම්	40,713	23,240	47,339	59,478
මධ්‍යම රජයේ පැවැරුම්	**203,576**	**218,780**	**284,761**	**318,306**
සාමූහික ප්‍රදාන	180,095	199,968	265,593	284,602
උපමාන පාදක ප්‍රදාන	2,462	2,205	1,752	2,559
පළාත් විශේෂිත සංවර්ධන ප්‍රදාන	13,536	11,376	11,004	12,632
විශේෂ යෝජනා ක්‍රම සඳහා විදේශීය ප්‍රදාන	7,483	5,230	6,412	18,513

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: මුදල් අමාත්‍යාංශය
පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

මේ අතර, ප්‍රධාන වශයෙන් ම විශේෂ ව්‍යාපෘති සඳහා සිදු කළ වියදම ඉහළ යෑම හේතුවෙන්, පළාත් සභාවල ප්‍රාග්ධන වියදම, 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 47.3 සිට 2021 වසරේ දී රුපියල් බිලියන 59.5ක් දක්වා ඉහළ ගියේය.

පළාත් සභාවල ආදායම් ලැබීම් ඉහළ ගිය ද, පළාත් සභාවලින් වසර තුළ දී දරන ලද ඉහළ වියදම සපුරා ගැනීම සඳහා මධ්‍යම රජය විසින් පළාත් සභා වෙත ලබා දුන් පැවරුම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, ප්‍රධාන වශයෙන් ම සාමූහික ප්‍රදාන සහ විශේෂ ව්‍යාපෘති සඳහා ලබා දෙන ප්‍රදාන ඉහළ යෑම හේතුවෙන්, පළාත් සභා වෙත මධ්‍යම රජය විසින් ලබා දුන් පැවැරුම්, 2021 වසරේ දී රුපියල් බිලියන 318.3ක් දක්වා සියයට 11.8කින් ඉහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයෙන් සිදු කළ පැවැරුම්, 2020 වසරේ සිට නොවෙනස්ව පවතිමින් 2021 වසරේ දී සියයට 1.9ක් ලෙස පැවතිණි. සමස්ත පැවරුම්වලින් සියයට 89.4ක් නියෝජනය කරමින්, 2021 වසර තුළ දී පළාත් සභා වෙත ලබා දුන් සමූහ ප්‍රදාන රුපියල් බිලියන 284.6ක් ලෙස වාර්තා විය. මීට අමතරව, 2020 වසරේ දී රුපියල් බිලියන 6.4ක් ලෙස වාර්තා වූ විශේෂ ව්‍යාපෘති සඳහා ලබා දුන් ප්‍රදාන, 2021 වසරේ දී රුපියල් බිලියන 18.5ක් දක්වා ඉහළ ගියේය. 2021 වසර තුළ දී, අදාළ පළාත් සඳහා විශේෂිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන, පිළිවෙළින්, රුපියල් බිලියන 12.6ක් සහ රුපියල් බිලියන 2.6ක් විය. ඒ අතර, සමාලෝචනය කෙරෙන කාලපරිච්ඡේදය තුළ දී, පළාත් සභාවල වියදමෙන් සියයට 84.6ක් මධ්‍යම රජයේ පැවරුම් ඔස්සේ මූල්‍යනය කිරීමෙන් පෙනී යන්නේ මධ්‍යම රජයේ අයවැය මත එල්ල වන පීඩනය අවම කිරීම සඳහා පළාත් සභා තුළ ආදායම් ජනනය කිරීම දිරිමත් කරවන කලාපීය මට්ටමේ ක්‍රමෝපායන්හි දැඩි අවශ්‍යතාවයයි. අනවශ්‍ය ලෙස විශාල පළාත් පාලන සහ ප්‍රාදේශීය සභා ක්‍රමයක් පවත්වාගෙන යාම මධ්‍යම රජයේ අයවැයට සැලකිය යුතු මූල්‍ය බරක් වී ඇති බව ද සඳහන් කළ හැකිය. එම ආයතනවල මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් මහජන නිරීක්ෂණ සහ වගවීම් සහතික කරමින්, පළාත් පාලන සහ ප්‍රාදේශීය සභා ක්‍රමය තුළ දැඩි යහපාලන නීති සංග්‍රහයක් ක්‍රියාත්මක කළ යුතු බවට යෝජනා කෙරේ.

6

6

7

මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය

7.1 සමස්ත නිරීක්ෂණ

උද්ධමන පීඩන ඇති වීම මැඩපැවැත්වීමේ සහ විදේශීය අංශයේ අසමතුලිතතා සඳහා පිළියම් යෙදීමේ අරමුණ සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව 2021 වසරේදී ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙන් බැහැර විය. කොවිඩ්-19 වසංගත කාලය තුළ මහ බැංකුව විසින් ලබා දෙන ලද මුදල් ප්‍රතිපත්ති සහාය 2021 වසරේ වැඩි කාලයක් පුරා අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, එමගින් වෙළඳපොළ පොලී අනුපාතික ඉතිහාසයේ මෙතෙක් පැවති අවම මට්ටම් දක්වා අඩු විය. එමෙන්ම, රජයේ සහ පෞද්ගලික අංශයේ අරමුදල් අවශ්‍යතා සඳහා ද මහ බැංකුව පහසුකම් සලසමින් ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහාය විය. ඒ අනුව, අරමුදල් පිරිවැය අඩු වීම හේතුවෙන් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශය සඳහා ලබා දුන් ණය සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, එය පුළුල් මුදල් සැපයුමේ ප්‍රසාරණයට හේතු විය. මැදි කාලීනව ඇති විය හැකි අධික උද්ධමන පීඩන වැළැක්වීමට සහ විදේශීය අංශයේ හා දේශීය මූල්‍ය වෙළඳපොළ අසමතුලිතතා සඳහා පිළියම් යෙදීමේ අරමුණින් 2021 අගෝස්තු මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ නැංවීමට මහ බැංකුව තීරණය කළේය. මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම මෙන්ම, දළ නිල සංචිත භාවිතා කරමින් රජයේ විදේශීය ණය ආපසු ගෙවීම් සිදු කිරීම සහ සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාව අඩු විය. එවැනි දැඩි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික මෙන්ම, අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතික ද ක්‍රමයෙන් ඉහළ ගිය අතර, ප්‍රාථමික වෙළඳපොළ රජයේ සුරැකුම්පත් වෙන්දේසියෙහි ලංසු පිළිගැනීම සඳහා පනවා තිබූ උපරිම ඵලදා අනුපාතික ඉවත් කිරීම මගින් රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික ද ඉහළ යෑමට ඉඩ සලසන ලදී. විදේශීය අංශයෙහි අභියෝග සහ උද්ධමන ප්‍රවණතා හේතුවෙන් ඇති වූ අභියෝග හමුවේ, විශේෂයෙන්ම අඛණ්ඩව වසර දොළහක් පුරා තනි අගයක මට්ටමේ පැවති උද්ධමනය ඉහළ යෑම සලකා බලමින්, ආර්ථිකයේ යටිදැරි ඉල්ලුම් පීඩන ඇති වීම වැළැක්වීමට සහ උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සඳහා 2022 පළමු කාර්තුව තුළදී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් දැඩි කිරීමට පියවර ගනු ලැබිණ. ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම, දේශීය ණය පොලී අනුපාතික මත පනවා තිබූ උපරිම සීමා ලිහිල් කිරීම, විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු අනුපාතික මත පනවා තිබූ උපරිම සීමා ඉවත් කිරීම සහ දේපළ ඇපකර සහිත නිවාස ණය සඳහා ලබා දුන් සහනදායී පොලී අනුපාතික ඉහළ නැංවීම මෙම දැඩි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ඇතුළත් විය. විනිමය අනුපාතිකය විශාල වශයෙන් අවප්‍රමාණය වීම සහ ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් අඛණ්ඩව ඉහළ යෑමත් සමග උද්ධමනය ඉහළ යෑම සඳහා සැලකිය යුතු අවදානම් ඇති කරමින් දේශීය මිල ගණන්වල ශීඝ්‍ර ඉහළ යෑමක් දක්නට ලැබුණි. ඊට ප්‍රතිචාර වශයෙන්, 2022 අප්‍රේල් මාසයේදී මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සැලකිය යුතු ලෙස දැඩි කරමින් සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 700කින් ඉහළ නැංවීමෙන් මෑත ඉතිහාසයේ එක් වරකදී සිදු කළ වැඩිම ඉහළ නැංවීම සිදු කළ අතර, ණය උපකරණ සඳහා පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා සියල්ලම පාහේ ඉවත් කරන ලදී. එවැනි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙන්ම, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම සහ ගෝලීය වශයෙන් ප්‍රධාන වෙළඳ භාණ්ඩවල සැපයුම් තත්ත්වයන්හි අපේක්ෂිත වැඩි දියුණු වීම සමග ආනයන ඉල්ලුමෙහි අපේක්ෂිත අඩු වීම හේතුවෙන් ආර්ථිකයේ යටිදැරි ඉල්ලුම් පීඩන ඇති වීම පාලනය වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එමගින් මැදි කාලීනව මිල සහ ආර්ථික ස්ථායීතාව නැවත ළඟාකර ගැනීමට අපේක්ෂා කෙරේ.

7.2 මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය

කොවිඩ්-19 වසංගතය ආරම්භයේ සිටම ආර්ථික කටයුතු සහ රජයේ මුදල් ප්‍රවාහ සඳහා සහාය වීමට පෙර නොවූ ආකාරයේ මුදල් උත්තේජක අඛණ්ඩව ලබා දුන් මහ බැංකුව, ආර්ථිකයේ අපේක්ෂිත මට්ටම්වලට වඩා අධික උද්ධමන පීඩන ඇති වීම වැළැක්වීමට සහ විදේශීය අංශයෙහි හා දේශීය මූල්‍ය වෙළඳපොළ අසමතුලිතතා සඳහා පිළියම් යෙදීමේ අරමුණින් 2021 අගෝස්තු මාසයේ සිට සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීම ආරම්භ කළේය. 2020 වසරේ මුල් කාලයේ සිට ආර්ථික කටයුතු සඳහා දැඩි ලෙස බාධා ඇති කළ කොවිඩ්-19 වසංගතයේ රැළි ගණනාවක බලපෑම අවම කිරීම සඳහා සුවිශේෂී මුදල් ප්‍රතිපත්ති ලිහිල්කරණය 2021 වසරේ පළමු භාගය තුළදී ද අඛණ්ඩව පවත්වාගෙන යෑම අවශ්‍ය විය. මහ බැංකුවේ අතිශය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ දේශීය මුදල් වෙළඳපොළ වෙත විශාල වශයෙන් ද්‍රවශීලතාව ලබා දීම මගින් බොහෝ වෙළඳපොළ පොලී අනුපාතික 2021 වසර තුළදී ඉතිහාසයේ මෙතෙක් පැවති අවම මට්ටම් දක්වා අඩු වූ අතර, එමගින් පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයේම අරමුදල් පිරිවැය අඩු විය. ඒ අනුව, පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා සහාය වෙමින් ඉහළ මට්ටමක පැවතිණි. රාජ්‍ය අංශයට ලබා දුන් ණය, විශේෂයෙන්ම මහ බැංකුවෙන් ලබා දෙන මූල්‍යනය ඇතුළුව බැංකු පද්ධතියෙන් රජයට ලබා දෙන ශුද්ධ ණය 2021 වසර තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. රජයේ අදායම අපේක්ෂිත මට්ටමට වඩා අඩු වීම මෙන්ම රජයේ වියදම ඉහළ යෑම හේතුවෙන් රජයේ මුදල් ප්‍රවාහවලට සිදු වූ බාධා හමුවේ රජයේ හදිසි මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළෙන් සැලකිය යුතු ප්‍රමාණයක භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම හරහා මෙන්ම මහ බැංකුව වෙත භාණ්ඩාගාර බිල්පත් සෘජු පැවරුම් මගින් රජය වෙත මූල්‍යමය සහාය ලබා දෙන ලදී. 2021 වසර තුළදී දේශීය ණය ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස පුළුල් මුදල් සමස්ත ඉහළ මට්ටමක පැවතිය ද බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් පුළුල් මුදල් වර්ධනය අඩු විය. ආර්ථිකයේ දක්නට ලැබුනු ඇතැම් අසමතුලිතතා, විශේෂයෙන් ඉල්ලුම් පීඩන ඇති වීම සහ විදේශීය අංශයෙහි හා දේශීය මූල්‍ය වෙළඳපොළ තුළ ඇති වූ පීඩන දක්නට ලැබීම හේතුවෙන්, සමස්ත සාර්ව ආර්ථික ස්ථායීතාව ඇති කිරීමේ අරමුණින් 2021 වසරේ දෙවන භාගය තුළදී මුදල් සහ ද්‍රවශීලතා තත්ත්ව දැඩි කිරීම ආරම්භ කිරීමට මහ බැංකුවට සිදු විය.

7.1 සංඛ්‍යා සටහන

මෑත කාලීන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

දිනය	ක්‍රියාමාර්ගය
2019 පෙබරවාරි 22	2019 මාර්තු මස 01 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 1.00කින් 5.00% දක්වා අඩු කරන ලදී.
2019 මැයි 31	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 7.50% සහ 8.50% දක්වා අඩු කරන ලදී.
2019 අගෝස්තු 23	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 7.00% සහ 8.00% දක්වා අඩු කරන ලදී.
2020 ජනවාරි 30	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 6.50% සහ 7.50% දක්වා අඩු කරන ලදී.
2020 මාර්තු 17	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 6.25% සහ 7.25% දක්වා අඩු කරන ලදී.
2020 මාර්තු 17	2020 මාර්තු මස 16 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 1.00කින් 4.00% දක්වා අඩු කරන ලදී.
2020 මාර්තු 27	4.00% පොලී අනුපාතිකයක් යටතේ රුපියල් බිලියන 50ක් දක්වා වූ සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම (ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය - පළමු අදියර) හඳුන්වාදෙන ලදී.
2020 අප්‍රේල් 03	2020 අප්‍රේල් මස 03 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25කින්, පිළිවෙළින්, 6.00% සහ 7.00% දක්වා අඩු කරන ලදී.
2020 අප්‍රේල් 16	බැංකු අනුපාතිකය පදනම් අංක 500කින් 10.00% දක්වා අඩු කරනු ලැබූ අතර, පදනම් අංක +300 ආන්තිකයක් සහිතව නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය හා අනුකූලව ස්වයංක්‍රීයව ගැළපීම සඳහා ඉඩ හරින ලදී.
2020 මැයි 06	2020 මැයි මස 06 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 5.50% සහ 6.50% දක්වා අඩු කරන ලදී. බැංකු අනුපාතිකය ස්වයංක්‍රීයව 9.50% දක්වා අඩු විය.
2020 ජූනි 16	2020 ජූනි මස 16 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2.00කින් 2.00% දක්වා අඩු කරන ලදී.
2020 ජූනි 16	4.00% පොලී අනුපාතිකයක් යටතේ ලබා දුන් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම (දෙවන අදියර) රුපියල් බිලියන 150ක් දක්වා ඉහළ නංවන ලදී.
2020 ජූලි 09	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, 4.50% සහ 5.50% දක්වා අඩු කරන ලදී. බැංකු අනුපාතිකය ස්වයංක්‍රීයව 8.50% දක්වා අඩු විය.
2021 අගෝස්තු 19	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 5.00% සහ 6.00% දක්වා වැඩි කරන ලදී. බැංකු අනුපාතිකය ස්වයංක්‍රීයව 9.00% දක්වා වැඩි විය.
2021 අගෝස්තු 19	2021 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ඇරඹෙන සංචිත කාලපරිච්ඡේදයේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2.00කින් 4.00% දක්වා වැඩි කරන ලදී.
2022 ජනවාරි 20	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින්, පිළිවෙළින්, 5.50% සහ 6.50% දක්වා වැඩි කරන ලදී. බැංකු අනුපාතිකය ස්වයංක්‍රීයව 9.50% දක්වා වැඩි විය.
2022 මාර්තු 04	නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින්, පිළිවෙළින්, 6.50% සහ 7.50% දක්වා වැඩි කරන ලදී. බැංකු අනුපාතිකය ස්වයංක්‍රීයව 10.50% දක්වා වැඩි විය.
2022 මාර්තු 07	විනිමය අනුපාතිකය වෙනස් වීමකට ඉඩ සලසන ලදී.
2022 අප්‍රේල් 08	2022 අප්‍රේල් මස 08 වැනි දින ව්‍යාපාර කටයුතු අවසාන වන අවස්ථාවේ සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 700කින්, පිළිවෙළින්, 13.50% සහ 14.50% දක්වා වැඩි කරන ලදී. බැංකු අනුපාතිකය ස්වයංක්‍රීයව 17.50% දක්වා වැඩි විය.

සටහන: මහ බැංකුව විසින් පහත පරිදි පොලී අනුපාතික මත උපරිම සීමා පනවන ලදී/ සංශෝධනය කරන ලදී.

- 2019.04.26: බලපත්‍රලාභී බැංකුවල හා බැංකු නොවන මූල්‍ය ආයතනවල තැන්පතු උපකරණ මත උපරිම පොලී අනුපාතික සීමා පනවන ලදී.
- 2019.09.24: බලපත්‍රලාභී බැංකුවල ණය පොලී අනුපාතික මත උපරිම සීමා පැනවූ අතර, තැන්පතු පොලී අනුපාතික මත පනවා තිබූ උපරිම සීමා ඉවත් කරන ලදී.
- 2020.04.27: බලපත්‍රලාභී බැංකුවල උකස් පහසුකම් මත උපරිම පොලී අනුපාතික සීමා පනවන ලදී.
- 2020.08.24: බලපත්‍රලාභී බැංකුවල තෝරා ගත් ණය උපකරණ මත පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා තවදුරටත් අඩු කරන ලදී.
- 2020.11.26: බලපත්‍රලාභී බැංකුවල දේපළ ඇපකර සහිත නිවාස ණය සඳහා උපරිම පොලී අනුපාතික සීමා පනවන ලදී.
- 2021.08.24: බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික මත උපරිම සීමා පනවන ලදී.
- 2021.12.30: බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික මත පැනවූ උපරිම සීමා සංශෝධනය කරන ලදී (දින 364 භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික හා සම්බන්ධ කරන ලදී).
- 2021.12.31: බලපත්‍රලාභී බැංකුවල දේපළ ඇපකර සහිත නිවාස ණය මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා සංශෝධනය කරන ලදී (ඛරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය හා සම්බන්ධ කරන ලදී).
- 2022.03.04: බලපත්‍රලාභී බැංකුවල තෝරාගත් ණය උපකරණ මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා වැඩි කරන ලදී.
- 2022.03.11: බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ විනිමය තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කරන ලදී.
- 2022.04.08: බලපත්‍රලාභී බැංකුවල තෝරාගත් ණය උපකරණ මත පැනවූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කිරීමට තීරණය කරන ලදී.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

7

මුදල් අංශයේ ප්‍රවණතා



7.2 රූප සටහන
ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණවල සහ මෙහෙයුම් ඉලක්කයේ හැසිරීම



ඒ අනුව, මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික, එනම් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය 2021 අගෝස්තු මස මැද දී පදනම් අංක 50 බැගින්, පිළිවෙළින්, සියයට 5.00ක් සහ සියයට 6.00ක් දක්වා ඉහළ නංවන ලදී. තවත් ක්‍රියාමාර්ග කිහිපයක් ද සමග ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ද 2021 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රතිශතාංක 2කින් සියයට 4.0ක් දක්වා ඉහළ නංවන ලද අතර එමගින් බැංකු පද්ධතිය තුළින් රුපියල් බිලියන 170ක ද්‍රවශීලතාව අවශෝෂණය කළේය. මීට අමතරව, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ පවතින දැඩි ද්‍රවශීලතා හිඟය හේතුවෙන් ඇතැම් බැංකු මගින් විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සඳහා ලබා දෙන පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, රුපියල් තැන්පතු සහ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සඳහා ලබා දෙන පොලී අනුපාතික අතර පවතින විෂමතා සඳහා පිළියම් යෙදීමට 2021 අගෝස්තු මාසයේදී බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සඳහා ලබා දෙන පොලී අනුපාතික මත උපරිම සීමාවක් පැනවීමට මහ බැංකුවට සිදු විය. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීමෙන් අනතුරුව, දේශීය මුදල් වෙළඳපොළෙහි සමස්ත ද්‍රවශීලතාව විශාල හිඟ මට්ටම් දක්වා අඩු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහයෙහි ක්‍රමානුකූල ඉහළ යෑමක් සිදු විය.

කෙසේ වෙතත්, විදේශීය අංශයේ අඛණ්ඩව පැවති පීඩන මෙන්ම ලිහිල් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය මධ්‍යයේ උද්ධමනය අපේක්ෂිත මට්ටම්වලට වඩා ඉහළ යෑමත් සමග 2021 අගෝස්තු මාසයේ සිට අනුගමනය කළ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග 2022 වසරේදී වඩාත් දැඩි විය. ඒ අනුව, 2022 ජනවාරි සිට මාර්තු දක්වා කාලය තුළදී ප්‍රතිපත්ති පොලී අනුපාතික සමස්තයක් ලෙස පදනම් අංක 150කින් ඉහළ නැංවූ අතර එමගින් ආනයන සඳහා ඇති ඉල්ලුම ද ඉහළ දැමීමට බලපෑම් ඇති කළ මුදල් සහ ණය ප්‍රසාරණය අඩු කිරීමට අපේක්ෂිත අතර, සැපයුම් අංශයේ බාධා හේතුවෙන් මිල ගණන් අඛණ්ඩව ඉහළ යෑම මධ්‍යයේ අහිතකර උද්ධමන අපේක්ෂා ඇති වීම ද අවම කෙරෙනු ඇතැයි අපේක්ෂිතය. දැඩි මුදල් ප්‍රතිපත්තියෙහි බලපෑම සහ අනෙකුත් නියාමන ක්‍රියාමාර්ගවල සිදු කළ සංශෝධන පිළිබිඹු කරමින් වෙළඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් ඉහළ ගියේය. බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු මත පනවන ලද උපරිම පොලී අනුපාතිකය පවතින වෙළඳපොළ තත්ත්වයන් පිළිබිඹු කිරීමට ඉඩ ලබා දෙමින් 2021 දෙසැම්බර් මාසයේදී ලිහිල් කෙරුණු අතර, ඉන් පසුව 2022 මාර්තු මාසයේදී එය ඉවත් කෙරිණි. තවද, 2020 දෙසැම්බර් මාසයේදී වැටුප්ලාභී සේවකයන් සඳහා හඳුන්වා දෙනු ලැබූ විශේෂ දේපළ ඇපකර සහිත නිවාස ණය සඳහා ලබා දුන් පොලී අනුපාතිකය ද සංශෝධනය කෙරිණි. මීට අමතරව, 2020 අගෝස්තු මාසයේදී දේශීය ණය උපකරණ පොලී අනුපාතික මත පැනවූ උපරිම සීමා 2022 මාර්තු මාසයේදී ඉහළ නංවන ලදී. ආර්ථිකයේ උද්ධමන පීඩන පාලනය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රමානුකූලව දැඩි කළ ද, විනිමය අනුපාතිකය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම සහ ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන්, විශේෂයෙන්ම ජාත්‍යන්තර බොරතෙල් මිල ගණන් අඛණ්ඩව ඉහල යෑම හේතුවෙන් දේශීය මිල ගණන් ක්ෂණිකව සහ ශීඝ්‍ර ලෙස ඉහළ ගිය අතර එමගින් උද්ධමනය ඉහළ යෑමට සැලකිය යුතු බලපෑම් ඇති විය. එවැනි උද්ධමන පීඩනවල බලපෑම්වලට මුහුණ දීමේ අවශ්‍යතාවය හඳුනාගෙන සහ අහිතකර උද්ධමන අපේක්ෂා වර්ධනය වීම වැළැක්වීම ද ඇතුළු අනෙකුත් සාධක හේතුවෙන් 2022 අප්‍රේල් මාසයේදී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 700කින් ඉහළ නංවා මෑත ඉතිහාසයේ එක් වරකදී සිදු කළ වැඩිම ඉහළ නැංවීම සිදු කරමින් සහ ණය උපකරණ සඳහා පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා සියල්ලම පාහේ ඉවත් කරමින් මහ බැංකුව මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් දැඩි කිරීමට තීරණය කළේය. මෙම ක්‍රියාමාර්ග හේතුවෙන්, අධික පරිභෝජනය අධෛර්යවත් කරමින් සහ ඉතුරුම් ධෛර්යවත් කරමින්, වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

7

මෙමගින් ආර්ථිකයේ යටිදැරි ඉල්ලුම් පීඩන මෙන්ම අපේක්ෂා ලිහිල් කිරීමට හැකි වනු ඇති අතර එමගින් සමස්ත සාර්ව ආර්ථික ස්ථායීතාවය සහතික කරමින් උද්ධමනය මැදි කාලීනව අපේක්ෂිත තනි අගයක් කරා නැවත ළඟාකර ගැනීමට උපකාරී වනු ඇත.

ආර්ථිකයට එල්ල වූ විවිධ බාහිර අභියෝග මධ්‍යයේ නුදුරු කාලීනව ආර්ථික ස්ථායීතාවයට සහාය වීමේ අරමුණින් ආර්ථික නියෝජිතයින්ගේ අපේක්ෂා සහ හැසිරීම් පාලනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් මහ බැංකුව ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ නිවැරදි තොරතුරු මහජනතාව වෙත ලබා දීමට 2021 වසරේදී මහ බැංකුවේ සන්නිවේදන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළේය. මේ සම්බන්ධයෙන් මහ බැංකුව සාම්ප්‍රදායික සන්නිවේදන ක්‍රියාමාර්ග මෙන්ම සමාජ මාධ්‍ය සහ ඩිජිටල් වේදිකාද අවස්ථානුකූලව තොරතුරු බෙදා හැරීම සඳහා භාවිතා කළේය. මැදි කාලීනව මුදල් ප්‍රතිපත්ති සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති දක්වමින් *'2021 පෙර දැක්ම: 2021 සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශ ප්‍රතිපත්ති'* ප්‍රකාශය ඉදිරිපත් කිරීම 2021 වසර ආරම්භයේදී සිදු කෙරිණි. අභියෝග සහ අවිනිශ්චිතතා වැඩි වීමත් සමග, තෙවැදෑරුම් රාමුවක් මත පදනම්ව ආර්ථිකය ශක්තිමත් කිරීම සහ සාර්ව ආර්ථික ස්ථායීතාව පිළිබඳ සහතිකයක් වෙළඳපොළ වෙත ලබා දීම අරමුණු කොටගෙන, මහ බැංකුව 2021 ඔක්තෝබර් මාසයේදී *'සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා වන සය මාසික පෙර දැක්ම'* ඉදිරිපත් කරන ලදී. සුදුසු මැදි කාලීන පුරෝකථන සමග පාර්ශ්වකරුවන්ගේ අපේක්ෂා පාලනය කිරීම සඳහා වෙළඳපොළ මෙහෙයවීම කෙරෙහි අවධානය යොමු කරමින් මහ බැංකුව වසර තුළදී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව සන්නිවේදනය කළේය. සමාජ දුරස්ථභාවය සම්බන්ධව වරින් වර පැනවූ සීමා කිරීම් හමුවේ, මුදල් ප්‍රතිපත්ති මාධ්‍ය සාකච්ඡා මාර්ගගත සැසි ලෙස අඛණ්ඩව පැවැත්වූ අතර හැකි සෑම විටම සාමාන්‍ය පරිදි මුදල් ප්‍රතිපත්ති මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම ද සිදු කළේය. එවැනි අවස්ථාවන් සමාජ මාධ්‍ය හරහා සජීවීව විකාශය කිරීමට අමතරව, ස්ථායීභාවය සහ පාර්ශ්වකරුවන්ගේ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම සඳහා මහ බැංකුවේ ප්‍රතිපත්ති අවධාරණය කරමින් මාධ්‍ය නිවේදන නිකුත් කිරීම, මංගත සම්මන්ත්‍රණ, සම්මුඛ සාකච්ඡා සහ සම්මන්ත්‍රණ භාෂා ත්‍රිත්වයෙන්ම නිතර පැවැත්වීමට මහ බැංකුව අවශ්‍ය පියවර ගනු ලැබීය. තවද, වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ අභියෝග මධ්‍යයේ වුවත්, ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව සහ මෑත කාලීන ආර්ථික ප්‍රවණතා ඇතුළු මහ බැංකුවේ ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන්ම නිකුත් කරන ලදී. දෛනික, සතිපතා, මාසික සහ කාර්තුමය වශයෙන් වන ප්‍රධාන සාර්ව ආර්ථික සංඛ්‍යාලේඛන මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කිරීම ද සිදු කළේය.

7.3 උද්ධමනයේ ප්‍රවණතා

ගෝලීය සහ දේශීය වශයෙන් වූ සැපයුම් අංශයේ බාධා, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම, පරිපාලිත මිල ගණන් ඉහළ දැමීම මෙන්ම වැය කළ හැකි ආදායම වැඩි වීම මධ්‍යයේ ක්‍රමයෙන් ඉහළ ගිය ඉල්ලුම් පීඩන පිළිබිඹු කරමින් 2021 වසරේදී මතුපිට උද්ධමනය ඉහළ ගියේය. කොළඹ පරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද., 2013=100) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (ජා.පා.මි.ද., 2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2021 වසර ආරම්භයේදී සාපේක්ෂව අඩු මට්ටම්වල පැවති අතර ඉන් පසුව ආහාර උද්ධමනය මෙන්ම ආහාර නොවන කාණ්ඩයේ උද්ධමනය ඉහළ යෑම හේතුවෙන් ඉහළ ගියේය. වසංගතය ආශ්‍රිතව පනවන ලද සීමා සහ ඇතැම් ආහාර ද්‍රව්‍ය (සහල්, එළවළු ආදිය) නිෂ්පාදනය පහත වැටීමෙන් වූ සැපයුම් අංශයේ බාධා හේතුවෙන් ආහාර උද්ධමනය ඉහළ අගයක පැවතුණි. තවද, තෙල්, ගෑස් සහ ඇතැම් වෙළඳ භාණ්ඩවල ගෝලීය මිල ගණන් අධික ලෙස ඉහළ යෑම හේතුවෙන් දේශීය භාණ්ඩ සහ සේවාවල මිල ගණන් කිහිප වරක් ඉහළ දමනු ලැබීය. එවැනි මිල වෙනස් කිරීම් මගින් අනෙකුත් අංශවලට ඇති වූ බලපෑම මෙන්ම, බාහිර මිල වෙනස් වීම් අවශෝෂණය කිරීමේ ක්‍රමවේදයක් ලෙස උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කිරීම හේතුවෙන් 2021 වසරේ අවසාන කාලයේදී ආහාර උද්ධමනය සහ ආහාර නොවන කාණ්ඩයේ උද්ධමනය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එමෙන්ම, වසංගතය ආශ්‍රිතව පැවති අධික වියදම් හේතුවෙන් සෞඛ්‍යය වැනි කාණ්ඩවල වියදම් ඉහළ යෑම ද ආහාර නොවන කාණ්ඩයේ උද්ධමනය ඉහළ යෑමට හේතු විය. ඒ අනුව, අඛණ්ඩව වසර දොළහක් පුරා තනි අගයක මට්ටමේ උද්ධමනයක් පැවති කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2020 වසර අවසානයේදී වාර්තා වූ සියයට 4.2 සිට 2021 වසර අවසානය වනවිට සියයට 12.1ක් දක්වා ඉහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය උද්ධමනය ද 2020 වසරේදී වාර්තා වූ සියයට 4.6 සිට 2021 වසරේදී සියයට 6.0ක් දක්වා ඉහළ ගියේය. ඒ හා සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය ද 2020 වසර අවසානයේදී වාර්තා වූ සියයට 4.6 සිට 2021

7.3 රූප සටහන
වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කොළඹ පාරිභෝගික මිල දර්ශකය)



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

7.4 රූප සටහන
වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (ජාතික පාරිභෝගික මිල දර්ශකය)



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

වසර අවසානය වන විට සියයට 14.0ක් දක්වා ඉහළ ගියේය. ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය පෙර වසරේ වාර්තා වූ සියයට 6.2 හා සාපේක්ෂව 2021 වසරේදී සියයට 7.0ක් ලෙස වාර්තා විය. උද්ධමනයේ ඉහළ යෑම 2022 වසරේ මුල් කාලයේදී ද පැවති අතර කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2022 මාර්තු මාසයේදී සියයට 18.7ක් ලෙස වාර්තා වූ අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2022 පෙබරවාරි මාසයේදී සියයට 17.5ක් දක්වා ඉහළ ගියේය.

සැලකිය යුතු මුදල් ලිහිල්කරණයේ පසු කාලීන බලපෑම පිළිබිඹු කරමින් උද්ධමනයේ යටිදැරි ඉල්ලුම මනිනු ලබන උද්ධමනයේ සංරචකය වන මූලික උද්ධමනය ද, 2021 වසරේ දෙවන භාගයේදී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. 2021 වසර ආරම්භයේදී අඩු මට්ටමක පැවති වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය ඉන් පසුව ඉහළ ගියේය. නිතර මිල උච්චාවචන සහිත ආහාර, බලශක්ති සහ ප්‍රවාහන ආදී අයිතමයන් මූලික උද්ධමනය ගණනය කිරීමේදී ඉවත් කරනු ලැබූව ද කිරිපිටි, පාන් සහ බේකරි නිෂ්පාදිත වැනි ඇතැම් ආහාර අයිතමයන්ගේ මිල ගණන් කිහිප වරක් ඉහළ යෑම මෙන්ම සෞඛ්‍ය, ආපනශාලා සහ හෝටල් වැනි ආහාර නොවන කාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම, 2021 වසරේ අග භාගයේදී මූලික උද්ධමනය ඉහළ යෑම සඳහා දායක විය. වසංගත කාලය තුළදී සපයන ලද සැලකිය යුතු රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති උත්තේජක හේතුවෙන් ක්‍රමයෙන් ගොඩනැගුණු ඉල්ලුම් පීඩනවල බලපෑම මූලික උද්ධමනයේ ප්‍රවණතා මගින් පිළිබිඹු විය. කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය

7.2 සංඛ්‍යා සටහන
වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනයේ හැසිරීම

සියයට

		දෙසැ.-16	දෙසැ.-17	දෙසැ.-18	දෙසැ.-19	දෙසැ.-20	දෙසැ.-21	මාර්තු-22
මතුපිට උද්ධමනය	කො.පා.මි.ද. (2013=100)	**4.5**	**7.1**	**2.8**	**4.8**	**4.2**	**12.1**	**18.7**
	ආහාර උද්ධමනය	4.1	14.4	-1.5	6.3	9.2	22.1	30.2
	ආහාර නොවන උද්ධමනය	4.5	4.2	4.8	4.3	2.0	7.5	13.4
	ජා.පා.මි.ද. (2013=100)	**4.2**	**7.3**	**0.4**	**6.2**	**4.6**	**14.0**	**17.5** (අ)
	ආහාර උද්ධමනය	2.3	12.8	-4.5	8.6	7.5	21.5	24.7 (අ)
	ආහාර නොවන උද්ධමනය	5.8	2.9	4.7	4.2	2.2	7.6	11.0 (අ)
මූලික උද්ධමනය	කො.පා.මි.ද. (2013=100)	**5.8**	**4.3**	**3.1**	**4.8**	**3.5**	**8.3**	**13.0**
	ජා.පා.මි.ද. (2013=100)	**6.7**	**2.7**	**3.1**	**5.2**	**4.7**	**10.8**	**14.1** (අ)

(අ) 2022 පෙබරවාරි අවසානයට

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

විශේෂ සටහන 8

මෑත කාලීන ගෝලීය උද්ධමන තත්ත්ව පිළිබඳ සමාලෝචනය

හැඳින්වීම

මහ බැංකු විසින් සිය ප්‍රධාන අරමුණ වන මිල ස්ථායීතාවය එනම්, උද්ධමනය අඩු සහ ස්ථාවර මට්ටමේ පවත්වා ගැනීම පිළිබඳ සැලකිලිමත් වේ. උද්ධමනය අඩු ආදායම්ලාභීන්හට හා ස්ථාවර ආදායම්ලාභීන්හට විෂමාකාර අන්දමින් බලපෑම් කරන හෙයින්, මුදල් ප්‍රතිපත්තිය සැකසී ඇත්තේ උද්ධමනය අධික ලෙස ඉහළ යෑම වළක්වා ගනිමින් මහජනතාවගේ, විශේෂයෙන්ම දුගී ජනතාවගේ ක්‍රය ශක්තිය ආරක්ෂා කිරීමටයි. උද්ධමන ඉලක්කකරණ රාමුවක් ක්‍රියාවට නැංවීම ඇතුළු ඒකාබද්ධ ප්‍රතිපත්තිමය ප්‍රයත්න සහ මුදල් ප්‍රතිපත්ති සම්පාදනය අඛණ්ඩව වැඩිදියුණු කිරීමත් සමඟ, පසුගිය දශක කිහිපය තුළ ගෝලීය උද්ධමනයෙහි පහළ යෑමේ ප්‍රවණතාවක් පැහැදිලිව දක්නට ලැබුණි. කෙසේ වෙතත්, සාධක කිහිපයක් හේතු කොටගෙන ගෝලීය වශයෙන් මෙන්ම දේශීය වශයෙන්ද උද්ධමනය ඉහළ යෑමේ තත්ත්වයන් නිරන්තරයෙන් දක්නට ලැබුණි. සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීමෙහිලා එවැනි මෑත කාලීන සිදුවීම් පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් අත්‍යවශ්‍ය වන අතර, එය අනාගතයේදී උද්ධමනය ඉහළ යෑමේ තත්ත්වයන්ට මුහුණ දීමට සහ ඇතිවන අහිතකර බලපෑම් අවම කිරීමට උපකාරී වනු ඇත.

ඉතිහාසය තුළ උද්ධමනය ඉහළ ගිය අවස්ථා

දෙවන ලෝක සංග්‍රාමයෙන් අනතුරුව, ගෝලීය උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාවයක් පැවතියද, මිල පාලන ඉවත් කිරීම්, සැපයුම් හිඟතාවන්, ඉල්ලුම ඉහළ යෑම මෙන්ම, ඇතැම් අවස්ථාවලදී වැරදි ප්‍රතිපත්තිමය තීරණ හේතුවෙන් ඇතැම් රටවල උද්ධමනය වරින්වර ඉහළ ගිය අවස්ථා පැවතුණි. මින් පෙර සිදු කර ඇති අධ්‍යනයන් මගින් විවිධ මට්ටමේ ආර්ථිකයන් මත පදනම්ව, කාලයත් සමඟ ගෝලීය උද්ධමනය වෙනස්වීමට අදාළ විවිධ ප්‍රවණතා සහ ලක්ෂණ පෙන්වා දී ඇත (රූප සටහන වි.ස. 8.1).

රූප සටහන වි. ස. 8.1
ගෝලීය උද්ධමන (1970-2020)



මූලය: Ha, J. M. et al. (2021)

සටහන: මෙහි ගෝලීය උද්ධමනය යනු රටවල් 193ක මධ්‍යස්ථ මතුපිට පාරිභෝගික උද්ධමනය වන අතර, රටවල් 36ක උද්ධමනය මගින් දියුණු ආර්ථිකයන්, රටවල් 157ක උද්ධමනය මගින් නැගී එන වෙළඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ද ආවරණය කරන අතර, එයින් රටවල් 27ක් අඩු ආදායම් ලබන රටවල් ලෙස වර්ගීකරණය කර ඇත.

එ.ජ. ඩොලරය මත පීඩනයක් ඇති කරමින්, 1960 දශකය අග භාගයේදී රත්‍රන් එ.ජ. ඩොලර් බවට පරිවර්තනය කිරීම හේතු කොටගෙන සිදු වූ මුදල් ප්‍රසාරණය උද්ධමන පීඩන ඇති වීම සඳහා හේතු වූ අතර, මෙම උද්ධමන පීඩනය රටේ ගෙවුම් ශේෂ හිඟය හරහා ලොව අනෙකුත් රටවල් කරා ව්‍යාප්ත විය. මෙය "මහා උද්ධමනය (The Great Inflation)" නමැති යුගයේ ආරම්භය ලෙස හඳුන්වනු ලබන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජනපදයේ අධිකාරීන් විසින් රත්‍රන් ඩොලර් බවට පරිවර්තනය කිරීම අත්හිටුවීමත් සමඟ 1970 දශකය මුල් කාලය වන විට බ්‍රෙටන් වුඩ්ස් ගිවිසුම (Bretten Woods Agreement)[1] බිඳ වැටුණි. කෙසේ වෙතත්, අරාබි ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය (OAPEC) විසින් සම්බාධක පැනවීමත් සමඟ, 1973 වසරේදී තෙල් මිල ගණන් ඉහළ යෑම සිදු වූ අතර, 1974 වසර වන විට ගෝලීය මධ්‍යස්ථ පාරිභෝගික මිල උද්ධමනය උපරිම අගයට පත් විය. දියුණු ආර්ථික විසින් මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම මගින් මිල ඉහළ යෑමේ කම්පනයට ප්‍රතිචාර දැක්වූ නමුත්, ඉරාන විප්ලවය සහ ඉන් පසුව ඇති වූ ඉරාන-ඉරාක යුද්ධය හේතුවෙන් 1980 දශකයේ මුල් කාලයේදී තෙල් මිල ගණන් නැවතත් ඉහළ යෑම මගින් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය සඳහා බාධා සිදු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, උද්ධමනය පහළ යෑම 1980 දශකයේ මැද කාලයේදී පමණක් සිදු විය. ඒ අනුව, 1974 වසරේදී ඉලක්කම් දෙකක මට්ටම්වල පැවති දියුණු ආර්ථිකයන්හි මධ්‍යස්ථ පාරිභෝගික මිල උද්ධමනය, 1986 වසර වන විට අඩු තනි අගයක් දක්වා පහත වැටුණු අතර, එමගින් දරුණු ආර්ථික අවපාත මගින් ඇති කළ අවදානම් මධ්‍යයේ වුවද එම රටවල මහ බැංකුවල විශ්වසනීයත්වය සහතික විය. මෙය 1976 වසරේ සිට 1981 වසර දක්වා වසර පහක කාල සීමාව තුළ එක්සත් ජනපද පොලී අනුපාතික සිව් ගුණයකින් වැඩි වීම තුළින් පිළිබිඹු වූ අතර, ප්‍රතිඵලයක් ලෙස 1981 මුල් කාලය සහ 1982 වසර අතර කාලපරිච්ඡේදය තුළ නිෂ්පාදනය තියුණු ලෙස පහත

1 1944 වසරේ ජූලි මාසයේදී, බ්‍රෙටන් වුඩ්ස් ක්‍රමයට (Bretten Woods System) එකඟ වීම සඳහා රටවල් 44ක නියෝජිතයින් එක්සත් ජනපදයේ නිව් හැම්ප්ෂයේහි බ්‍රෙටන් වුඩ්ස්හිදී රැස්වූ අතර, එහිදී එක්සත් ජනපද ඩොලරයේ පදනම රත්‍රන් බවට තීරණය කරන ලද අතර අනෙකුත් මුදල් ඒකක එක්සත් ජනපද ඩොලරයේ අගයට සම්බන්ධ කරන ලදී.

7

වැටුණි. යුරෝපයේ ඇතැම් දියුණු ආර්ථිකද උද්ධමනය උපරිම මට්ටමක පැවති මෙම අවස්ථාවේදී වඩාත් දැඩි ලෙස ප්‍රතිචාර දැක්වීය. "මහා අවධමනය (The Great Moderation)" ලෙස හඳුන්වන කාලපරිච්ඡේදය තුළ උද්ධමනය පාලනය කිරීමේ සාර්ථකත්වය සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග නිසා ඇති වූ සාර්ව ආර්ථිකය ස්ථායී වීම ප්‍රධාන වශයෙන් හේතු විය. උද්ධමනය ඉහළ යෑම් පැවති බොහෝ රටවල් සිය මුදල් ප්‍රතිපත්ති රාමුව ලෙස උද්ධමන ඉලක්කරණය ක්‍රියාවට නැංවීම සුවිශේෂී ලක්ෂණයක් වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අඩු උච්චාවචන සහිත ගෝලීය උද්ධමනය පහළ යෑමේ තත්ත්වයක් ඇති විය. කෙසේ වෙතත්, 1990 දශකයේ මැද කාලයේදී පමණ ආරම්භ වූ ඉහළ උද්ධමන අනුපාතික යථා තත්ත්වයට පත්වීමේ ප්‍රමාදයක් නැගීඑන වෙළෙඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථික හා අඩු ආදායම් ලබන රටවල්වල දක්නට ලැබුණි. මේ සඳහා බොහෝ දුරට එම රටවල ආර්ථිකයන්හි පවතින ව්‍යුහාත්මක ගැටලු වන ජනතාවාදී දේශපාලන සංස්කෘතීන්, ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමවලට සමගාමීව ඇතැම් විට පැවති දිගු කාලීන සහ සැලකිය යුතු රාජ්‍ය මූල්‍ය හා ජංගම ගිණුම් හිඟයන්, භාණ්ඩ අපනයනකරුවන් සඳහා වන වෙළඳ මිල අනුපාතය පිරිහීමට ලක්වීම සහ කාර්මික ආර්ථිකයන්ට සාපේක්ෂව පැවති සැපයුම් අංශයේ ගැටලු හේතු විය. 1989 වසරේ සිට 1994 වසර දක්වා කාලපරිච්ඡේදය තුළ ඇතැම් අවස්ථාවල සිවිල් යුද්ධය මධ්‍යයේ මෙම ආර්ථිකයන්හි උද්ධමනය පාලනය කිරීමට දැරූ ප්‍රයත්න, අති විශාල ආර්ථික නිෂ්පාදන අලාභවලට හේතු විය.

කාලපරිච්ඡේදය	ඉහළ උද්ධමනය සඳහා හේතු
1973-1982	තෙල් මිල අවස්ථා දෙකකදී ඉහළ යෑම; පළමු අවස්ථාවේදී අරාබි ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය (OAPEC) විසින් පැනවූ සම්බාධක හේතුවෙනි. දෙවන අවස්ථාවේදී ඉරාන විප්ලවය සහ ඉරාන-ඉරාක යුද්ධය නිසා සිදු වූ තෙල් නිෂ්පාදනය පහත වැටීම හේතුවෙනි.
2008	2004 සිට 2008 දක්වා කාලපරිච්ඡේදය තුළ ආහාර මිල ඉහළ යෑම සහ තෙල් මිල තුන් ගුණයකින් වැඩි වීම ඇතුළු ගෝලීය ඉල්ලුම මත පදනම් වූ සාධක මෙන්ම, එක්සත් ජනපදයේ ඉතා ලිහිල් මුදල් ප්‍රතිපත්ති තත්ත්වයන් මගින් අනෙකුත් අංශවලට ඇති කරන ලද බලපෑම් ද හේතු විය.
වර්තමාන තත්ත්වය (2021 වසරේ සිට)	කොවිඩ්-19 වසංගතය ආශ්‍රිතව සැපයුම් දාමවල අවහිරතා ඇති වීම, බලශක්ති සහ භාණ්ඩ මිල ඉහළ යෑම, පොහොර මිල ඉහළ යෑම, භූ දේශපාලනික අර්බුද හේතුවෙන් ඇති වූ බාධා සහ ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍යකරණය වීම හේතුවෙන් ඉල්ලුම් තත්ත්වයන් යථා තත්ත්වයට පත් වීම.

ගෝලීය බලශක්ති සහ ආහාර මිල ගණන් ඉහළ යෑමත් සමඟ, ආර්ථිකයන් ගෝලීය මූල්‍ය අර්බුදය වෙත ගමන් කළ 2000 දශකයේ මුල් කාලයේදී ගෝලීය උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාවය කෙටි කාලයකට නතර විය. මේ සඳහා විශේෂයෙන්ම, වෙළඳ භාණ්ඩ මූලික කරගත් ආර්ථික වර්ධනය මත විශාල වශයෙන් රඳා පවතින නැගී එන හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි ශීඝ්‍ර වර්ධනය හේතු විය. මූල්‍ය අර්බුදය හේතුවෙන් වෙළඳපොළ බිඳ වැටෙන තෙක්ම, දැඩි ඉල්ලුම හේතුවෙන් බලශක්ති හා ආහාර මිල ගණන් අඛණ්ඩව ඉහළ ගියේය. ශීඝ්‍රයෙන් ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා නිෂ්පාදන හා බෙදාහැරීමේ ධාරිතාව ප්‍රමාණවත් නොවීම හමුවේ සැපයුම් කාර්යසාධනය මන්දගාමීවීම බලශක්ති මිල ගණන් ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. නැගී එන හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් ගෙන් වූ ඉල්ලුම මෙන්ම අහිතකර කාලගුණික තත්ත්වය සහ චීනය, යුක්රේනය සහ ආර්ජන්ටිනාව ඇතුළු ප්‍රධාන ධාන්‍ය අපනයනය කරන රටවල් විසින් අපනයන සීමා කිරීම වැනි ආහාර අපනයනකරුවන් විසින් අනුගමනය කරන ලද අපනයන සීමා ඇතුළු වෙනත් සාධක ගණනාවක් හේතුවෙන් ආහාර මිල ගණන් ද පවත්නා ඉහළ උද්ධමනයට දායක වී ඇත.

කෙසේ වෙතත්, ගෝලීය මූල්‍ය අර්බුදයෙන් අනතුරුව, උද්ධමනය අවම මට්ටම් කරා ළඟා වූ අතර, 2017 වසර වන විට ගෝලීය වාර්ෂික සාමාන්‍ය උද්ධමනයෙහි මධ්‍යස්ථය සියයට 2.6ක් විය. විශේෂයෙන්ම, සංවර්ධිත ආර්ථිකයන්ගෙන් අඩක් පමණ 2015 වසරේදී සෘණ උද්ධමන අනුපාතික වාර්තා කළ අතර, සෑම සංවර්ධිත ආර්ථිකයන් හතරකින් තුනක්ම අඩු තනි අගයක මට්ටමේ උද්ධමනයක් වාර්තා කළේය (Jongrim Ha et al, 2019). උද්ධමන ඉලක්කකරණය ක්‍රියාත්මක කරනු ලබන ආර්ථික ඇතුළු

රූප සටහන වි. ස. 8.2
2000 වසරේ සිට ගෝලීය උද්ධමන ප්‍රවණතා (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත කාර්තුමය පාරිභෝගික මිල උද්ධමනය)



මූලයන්: Global Projection Model Network
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

7

නැගී එන වෙළඳපොළ හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් සැලකීමේදී අඩුවන උද්ධමනය ප්‍රමුඛ ලක්ෂණයක් වූ අතර සෑම රටවල් පහකින් තුනකම උද්ධමනය ඉලක්කගත මට්ටමට වඩා අඩු අගයක් වාර්තා කර ඇත.

2021 වසරේ සිට ඉහළ උද්ධමන පැවති කාල සීමා

පිරිවැය හා ඉල්ලුම මත පදනම් වූ සාධක කිහිපයක ඒකාබද්ධ බලපෑම හේතුවෙන් වර්තමානයෙහි පවතින ඉහළ උද්ධමනය පෙර අවස්ථාවලට සාපේක්ෂව ඉතා පුළුල් සහ දීර්ඝ කාලීන වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බලශක්ති ආශ්‍රිත හා කෘෂිකාර්මික වෙළඳ භාණ්ඩ ඇතුළු ප්‍රධාන වෙළඳ භාණ්ඩ සඳහා වන සැපයුම් අවහිරතා, සැපයුම් දාම ගැටලු, ශ්‍රම හිඟය සහ වසංගතයෙන් පසු දෛනික කටයුතු සාමාන්‍යකරණය වීමත් සමඟ භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් වන ඉල්ලුම ඉහළ යෑම මෙම කාල සීමාවේදී උද්ධමනය ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක වී ඇත. 2022 පෙබරවාරි මාසය අවසානයේ රුසියානු-යුක්රේන යුද්ධය මූලික කර ගනිමින් ඇති වූ භූ දේශපාලනික අර්බුදය හේතුවෙන් හටගත් අවිනිශ්චිතතා විවිධ පැතිකඩ ඔස්සේ උද්ධමනය තවදුරටත් ඉහළ නැංවූ අතර, වෙළෙඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම ද උද්ධමනය කෙරෙහි දායක විය.

උද්ධමනයේ සැපයුම් ආශ්‍රිතව ඇති වූ මෙම අවහිරතා සමඟ, වසංගත තත්ත්වය අතරතුර ආර්ථිකයන්ට සහාය වීම සඳහා ලොව පුරා සිටින මුදල් හා රාජ්‍ය මූල්‍ය අධිකාරීන් විසින් සපයන ලද විශාල ප්‍රතිපත්තිමය උත්තේජන මෙන්ම, බහුපාර්ශ්වික සංවිධානවලින් ලැබුණු අතිරේක ප්‍රතිපත්තිමය සහාය ද සැපයුම් සාධක හේතුවෙන් ඇති වූ උද්ධමනය තවදුරටත් ඉහළ නංවාලීමට සහ අපේක්ෂා කළ කාලයට වඩා දිගු කාලයක් පැවතීමට හේතුවනු ඇත. ආර්ථික තත්ත්වය කුමක් වුවත්, මෙම සාධකවල ඒකාබද්ධ බලපෑම් බොහෝ ආර්ථිකයන්හි උද්ධමනය එහි ඉලක්කගත අගයට වඩා සහ ඉතිහාසයේ මෙතෙක් වාර්තා වූ සාමාන්‍ය උද්ධමන අගයන්වලට වඩා කිහිප ගුණයකින් වැඩි උද්ධමන අගයක් වාර්තා කිරීමට හේතු වී ඇත. ඒ අනුව, 2021 වසරේදී ගෝලීය උද්ධමනය වසර 14කට ආසන්න කාලයකදී වාර්තා වූ ඉහළම අගයට ළඟා විය. 2022 පෙබරවාරි මාසයේදී පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය ඉහළ යෑම සියයට 7.9ක් ලෙස වාර්තා වීමත් සමඟ ඇමරිකා එක්සත් ජනපදය වසර 40ක් තුළ වාර්තා වූ ඉහළම උද්ධමනය අත්විඳිනු ලැබිණි. 2022 වසරේ පෙබරවාරි මාසය වන විට, පසුගිය මාස 12 තුළදී පිළිවෙළින්, සියයට 6.2ක සහ සියයට 5.9ක උද්ධමනයක් වාර්තා කරමින්, එක්සත් රාජධානිය සහ නවසීලන්ත ආර්ථිකයන් ද පසුගිය දශක තුන තුළ වාර්තා වූ ඉහළම උද්ධමනය සඳහා මුහුණ දුන්නේය. මෙම උද්ධමනය ඉහළ යෑමේ ප්‍රවණතාව අනුව යමින්, ප්‍රමුඛ ආර්ථිකයන්ට මෙන්ම, නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්ට 2022 වසරේදී ද උද්ධමන පීඩනයන් සඳහා මුහුණ දීමට සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2021 වසරේදී යූරෝ කලාපයේ උද්ධමනය ද සියයට 5.0ක පමණ වාර්තාගත ඉහළ අගයක් විය.

වර්තමාන උද්ධමනය ඉහළ යෑමේ තත්ත්වය ආරම්භ වන විට, මෙම උද්ධමන පීඩන තාවකාලික බව බොහෝ දෙනා විශ්වාස කළ අතර, පශ්චාත් වසංගත කාලසීමාව තුළදී ආර්ථික වර්ධනය යථා තත්ත්වයට පත් කිරීමට බාධාවක් විය හැකි බැවින් මුදල් ප්‍රතිපත්ති හරහා ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාවක් පැන නොනගින ලදී. කෙසේ වෙතත්, පවතින සැපයුම් දාම අවහිරතා සහ බලශක්ති මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, ගෝලීය පර්යේෂණ කණ්ඩායම විසින් මීට පෙර අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉහළ අගයකින් වැඩි කාලයක් උද්ධමනය ලොව පුරා පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම කාරණය, ප්‍රතිපත්ති සම්පාදකයන්හට ආර්ථික වර්ධනයට වඩා ස්ථායීතාවට ප්‍රමුඛතාව ලබා දීම පිළිබඳව අවධානය යොමු කිරීමට හේතු වූ අතර, සංවර්ධිත, නැගී එන හා සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි මහ බැංකු බොහොමයක් ප්‍රතිපත්තිමය උත්තේජන ආපසු හැරවීම ආරම්භ කළහ. උද්ධමනයට එරෙහිව සටන් කිරීම සඳහා වන ඉදිරි මාර්ගෝපදේශ හරහා සැලකිය යුතු ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සහ තවදුරත් ප්‍රතිපත්ති දැඩි කිරීමේ අවශ්‍යතාව සන්නිවේදනය කිරීම තුළින් දැඩි ප්‍රතිපත්ති ස්ථාවරයක් ක්‍රියාත්මක කිරීම බොහෝ රටවල මහ බැංකු විසින් ආරම්භ කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ගෝලීය මූල්‍ය තත්ත්වය දැඩි වීමත් සමග යම් කාල පරාසයකින් අනතුරුව ගෝලීය උද්ධමනය නැවත අපේක්ෂිත මට්ටම දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉල්ලුම් අංශයේ ක්‍රියාමාර්ගවලට අමතරව, යෝග්‍ය ආහාර තොග ගබඩා කර තබා ගැනීම සඳහා සාම්ප්‍රදායික කෘෂිකාර්මික පිළිවෙත් වෙනස් කිරීම සහ අත්‍යවශ්‍ය වෙළඳ භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම වැළැක්වීම සඳහා ආනයන ප්‍රතිපත්ති සංශෝධනය කිරීම වැනි ඇතැම් සැපයුම් අංශයේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳ ඇතැම් රටවල් විසින් සොයා බලනු ලබයි.

පොදුවේ සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් දැක්වූ ප්‍රතිපත්තිමය ප්‍රතිචාර

පොදුවේ ගත් කළ, රජයන් විසින් ගනු ලැබූ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන්ගේ සහාය ද ඇතිව උද්ධමනය ඉහළ යන අවස්ථා පාලනය කිරීම සඳහා මහ බැංකු විසින් යෝග්‍ය මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවා ඇත. ණය ලබා ගැනීමේ පිරිවැය වැඩි කිරීමට සහ එමගින් සමස්ත පාරිභෝගික වියදම් අධෛර්යමත් කිරීම සඳහා මහ බැංකු

7

විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නංවනු ලබයි. රාජ්‍ය මූල්‍ය අංශය සැලකූ විට, බදු වැඩි කිරීම සහ රජයේ වියදම් අඩු කිරීම මගින් ඉල්ලුම මගින් මෙහෙයවන උද්ධමනය පාලනය කිරීම හරහා උද්ධමන පීඩන අඩු කිරීමට රජයන් විසින් ක්‍රියා කරනු ලබයි. එමෙන්ම, පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය පාලනය කිරීමේදී, නිෂ්පාදන පිරිවැය අවම කිරීම සඳහා මිල පාලනය කිරීම් සහ සහනාධාර ලබාදීම ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

විශේෂයෙන්ම, විනිවිදභාවයෙන් යුතු ස්වාධීන මහ බැංකුවලට ආර්ථික පාර්ශවකරුවන් අතර විශ්වාසනීයත්වය ස්ථාපිත කිරීම තුළින් උද්ධමන අපේක්ෂා පාලනය කිරීම හරහා උද්ධමනය වේගවත් ලෙස අඩු කිරීමට හැකි වී ඇත. සාර්ව ආර්ථික ස්ථායීතාවය මත මහ බැංකුවේ ස්වාධීනත්වයේ බලපෑම පිළිබඳ සිදු කරන ලද අධ්‍යනයන් ද මහ බැංකුවේ ස්වාධීනත්වය සහ උද්ධමනය අතර සෘණාත්මක සම්බන්ධතාවය තහවුරු කිරීමට සහාය වේ (Brumm 2002, 2011; Garriga and Rodriquez 2020; Berger, de Haan, and Eijffinger 2001). පර්යේෂණාත්මකව, සංවර්ධිත ආර්ථිකයන්හි උද්ධමන අපේක්ෂා පාලනය කිරීමට මහ බැංකුවේ විනිවිදභාවය උපකාරී වන බව තහවුරු වී ඇති අතර, එමගින් උද්ධමනය ස්ථාවර වී එහි අවිනිශ්චිතතාවය අඩු කරනු ලැබේ (Weber, 2016). සමස්තයක් ලෙස, මූල්‍ය ආයතන ශක්තිමත් කිරීම, මහ බැංකුකරණයේ ස්වාධීනත්වය ඉහළ නැංවීම සහ යෝග්‍ය රාජ්‍ය මූල්‍ය වාතාවරණයක් ස්ථාපිත කිරීම වැනි සුදුසු ස්ථායීකරණ ප්‍රතිපත්ති දිගු කාලීනව පවතින ව්‍යුහාත්මක උද්ධමනය අඩු කිරීමට උපකාරී වේ. තවද, ආර්ථික පාර්ශ්වකරුවන්ගේ මනාව පාලනය වූ උද්ධමන අපේක්ෂා සමඟ මෙම උද්ධමන පීඩන තාවකාලික ලෙස සලකන බැවින් එවැනි ප්‍රතිපත්තිමය අවශ්‍යතා වරින් වර ඇති වන සැපයුම මත පදනම් වූ උද්ධමන පීඩන සාර්ථකව හැසිරවීමට උපකාරී වේ.

රූප සටහන වි.ස. 8.3
රටට ආවේණික ලක්ෂණ අනුව උද්ධමනය



මූලය: Ha, J.M. et al. (2019)

රූප සටහන වි. ස. 8.4
කො.පා.මි.ද. මත පදනම් වූ උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වෙනස්වීම)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තා

උද්ධමන ප්‍රවණතාවන්ගේ ඉතිහාසය විමර්ශනය කිරීමේදී, සංවර්ධිත සහ නැගී එන ආර්ථිකයන් හා සසඳන විට, සංවර්ධනය වෙමින් පවතින හෝ අඩු ආදායම් ලබන රටවල් බොහොමයක් තුළ කාලයක් පුරා නොවෙනස් ඉහළ උද්ධමන වාතාවරණයක් පැවතී ඇත. එබැවින්, මෙම රටවල මහ බැංකුවලට අඩු සහ ස්ථායී උද්ධමන වාතාවරණයක් ළඟා කර ගැනීම සහ උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සැලකිය යුතු අභියෝගයකි. සංවර්ධනය වෙමින් පවතින රටවල උද්ධමනය බලශක්ති මිල ගණන් සහ ආහාර මිල ගණන් වැනි බාහිර කම්පන වලට ලක් විය හැකි වුවද, ඉහළ අයවැය හිඟය සහ මහ බැංකුව විසින් එවැනි හිඟයන් මූල්‍යනය කිරීම, රාජ්‍ය වියදම් ඉහළ යෑම, යුද වියදම් වැඩි වීම, ඵලදායීතාව අඩු වීම, කාලගුණික ආශ්‍රිත බාධාවන්ට නිරන්තරයෙන් ලක් වීම, ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ගේ ඉහළ උද්ධමන අපේක්ෂා අඛණ්ඩව පැවතීම, අතිරික්ත මුදල් සැපයුම සහ අස්ථාවර විනිමය අනුපාතික ඇතුළු ව්‍යුහාත්මක වෙනස්කම් බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල ඉහළ අඛණ්ඩ උද්ධමන අනුපාතික සඳහා හේතු වී ඇත.

උද්ධමනයේ යටිදැරි ඉල්ලුම මත පදනම් වූ සංචරකය වන මූලික උද්ධමනය ඉහළ යෑම සඳහා දායක වන ගෝලීය සාධකවල බලපෑම රූප සටහන වි.ස. 8.3 මගින් පෙන්නුම් කෙරේ.

දැඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ මිල පාලනය කිරීම් උද්ධමනය පාලනය කිරීමට උපකාරී වී ඇති අතර, ඇතැම් අවස්ථා වලදී මුදල් පැවරුම් සහ ආහාර සහනදායී මිල ගණන්වලට ලබා දීම වැනි ආරක්ෂණ ජාල මැදිහත්වීම් හරහා උද්ධමන පීඩනවල බලපෑම යම් ප්‍රමාණයකට අඩු විය. බොහෝ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් තුළ, රාජ්‍ය මූල්‍ය නීති ඇතුළු වෙනත් ප්‍රතිපත්ති ක්‍රියාකාරීව භාවිතා කිරීම ගෝලීය කම්පනවලින් ආර්ථිකයන් ආරක්ෂා කිරීමට උපකාරී වී ඇත.

ශ්‍රී ලංකාව තුළ උද්ධමනය ඉහළ ගිය අවස්ථා

ශ්‍රී ලංකා ආර්ථිකයට ද ගෝලීය උද්ධමනයේ වෙනස්වීම්, පිරිවැය මත පදනම් වූ උද්ධමන සාධක සහ ඉල්ලුම් කළමනාකරණයේ ව්‍යුහාත්මක සීමාවලින් අත්මිදීමට නොහැකි විය. අයවැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා මුදල් ප්‍රසාරණය වැඩි කිරීමේ පසු බලපෑම සහ සැපයුම් අංශයේ, විශේෂයෙන්ම කාලගුණය හා සම්බන්ධ තාවකාලික අවහිරතා හා ජාත්‍යන්තර වෙළඳ භාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ශ්‍රී ලංකාවට ද අවස්ථා කිහිපයකදී උද්ධමනය ඉහළ යෑමේ තත්ත්වයන් අත්විඳීමට සිදු විය. කෙසේ වෙතත්, ප්‍රතිපත්ති සම්පාදනයේ සහ ප්‍රතිපත්ති සන්නිවේදනයේ අඛණ්ඩ වැඩිදියුණු කිරීම් හමුවේ ශ්‍රී ලංකාව දශකයකට වැඩි කාලයක් පුරා උද්ධමනය අඩු සහ ස්ථාවර මට්ටමක පවත්වා ගෙන ඇති අතර සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශයක් තුළදී පවා රජයේ මැදිහත්වීම හරහා අත්‍යවශ්‍ය භාණ්ඩ මත, ඇතැම් භාණ්ඩ ආනයනය කිරීම මත වූ ඇතැම් බදු අඩු කිරීමෙන්, ඇතැම් භාණ්ඩ

7

සඳහා උපරිම සිල්ලර මිල ගණන් නියම කිරීමෙන් සැපයුම් ගැටලු තාවකාලිකව විසඳා ඇත. ඉල්ලුම මත පදනම් වූ උද්ධමන පීඩන පාලනය කිරීම සඳහා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගෙන ඇත. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ මුදල් ප්‍රතිපත්ති රාමුවක් අනුගමනය කිරීම, මැදි කාලීනව උද්ධමනය පහළ සහ ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමේ අරමුණින් මුදල් ප්‍රතිපත්තිය මනා ඉදිරි දැක්මක් සහිතව පවත්වාගෙන යෑමට මහ බැංකුවට උපකාර වන අතර, එමගින් මහ බැංකුවේ විනිවිදභාවය සහ වගවීම සහතික කරමින් තිරසාර ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමට සහාය වේ. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව, උද්ධමන පුරෝකථන හරහා සමීපව නිරීක්ෂණය කළ හැකි අපේක්ෂිත උද්ධමන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ අරමුණ හා සම්බන්ධ බැවින්, අපේක්ෂිත ඉලක්කවල සිට උද්ධමන පුරෝකථනවල අපගමනයන් පිළිබඳ ආකෘති පදනම් කරගත් ඉදිරි දැක්මකින් යුතු සවිස්තරාත්මක විශ්ලේෂණයක් මගින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කරනු ලැබේ. එබැවින්, උද්ධමන අපේක්ෂා නිසි ලෙස පාලනය කරමින් උද්ධමනය අපේක්ෂිත ඉලක්කගත මට්ටම් වෙත නැවත රැගෙන ඒම සඳහා නිසිකලට පූර්වෝපායික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම තුළින් එවැනි අපගමනයන් සඳහා බලපාන සාධක පාලනය කළ හැකිය.

ලොව පුරා බොහෝ රටවල් මෙන්ම, ශ්‍රී ලංකාව ද මේ වන විට ඉහළ උද්ධමනකාරී තත්ත්වයකට මුහුණ දෙමින් සිටී. කොවිඩ්-19 වසංගතය මගින් ඇති කරන ලද තත්ත්වයන්ට අමතරව, මෑත කාලීනව උද්ධමනය ඉහළ යෑම සඳහා හේතු වූයේ ඉන්ධන සහ ඇතැම් අත්‍යවශ්‍ය ආනයනික භාණ්ඩ ඇතුළුව ජාත්‍යන්තර වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ඇති වන සැපයුම් අංශයේ සාධක වේ. තවද, මේ සඳහා මිල පාලනය කිරීම් ඉවත් කිරීම හා එමගින් අනෙකුත් අංශවලට ඇති කෙරෙන බලපෑම් මෙන්ම වසංගතය හේතුවෙන් ගත් ආර්ථික උත්තේජන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතුවෙන් ඇති වූ ඉල්ලුම මත පදනම් වූ උද්ධමන පීඩන ද දායක විය. යටිදැරි ඉල්ලුම් තත්ත්වයන් මගින් වර්ධනය කෙරෙන පීඩන තත්ත්වයන් පිළිබිඹු කරමින්, නිතර මිල උච්චාවචනය වන ආහාර මිල ගණන්, බලශක්ති සහ ප්‍රවාහන වියදම් ඇතුලත් නොවන මූලික උද්ධමනය, අනෙකුත් රටවල් හා සමානවම ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. මහ බැංකුව මගින් ගනු ලබන පූර්වෝපායික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ උද්ධමනය ඉලක්කගත පරාසය වෙත කඩිනමින් යොමු කිරීමට ඇති කැපවීම ප්‍රතිපත්ති සන්නිවේදනය ඔස්සේ යළි අවධාරණය කිරීම තුළින් එවැනි ඉල්ලුම මත පදනම් වූ පීඩන පාලනය කරයි. ඒ අනුව, ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම සඳහා වන අවහිරතා අවම වන පරිදි උද්ධමනය හැකි ඉක්මනින් ඉලක්කගත මට්ටම වෙත නැවත ගෙන ඒම සහතික කිරීම සඳහා පූර්ව ප්‍රතිපත්ති සම්පාදනය කරන අතරම, මහ බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ නංවන ලදී. කෙසේ වෙතත්, ආර්ථිකය තුළ පවතින අධික උද්ධමන පීඩනය වැළැක්වීමට මුදල් ප්‍රතිපත්තිය මත පදනම් වූ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට ඉඩ සලසමින් සැපයුම් අංශයේ ගැටලු මග හරවා ගැනීමට සහ ඒ අනුව ශක්තිමත් ප්‍රතිපත්ති නියමිත වේලාවට අනුගමනය කිරීම ඉතා වැදගත් වේ. ආර්ථික ක්‍රියාවලියෙහි නියැලෙන්නන්ගේ සමපේක්ෂණ තුළින් ගොඩනැගෙන උද්ධමන පීඩන සහ ඒ අනුව ඇති වන උද්ධමන අපේක්ෂා පාලනය කිරීම සඳහා මහ බැංකුවේ මැදිහත්වීම ඉතා වැදගත් වේ. සැපයුම් අංශයේ අවහිරතා හේතුවෙන් ඇති වන අහිතකර උද්ධමන ප්‍රවණතා මුලින් හඳුනාගෙන එම උද්ධමන ප්‍රවණතා පාලනය කිරීම සඳහා පූර්වෝපායික ප්‍රතිපත්ති තීරණ ගැනීමට රජය විසින් යාන්ත්‍රණයක් ස්ථාපිත කර තිබීම වැදගත් වේ. ස්ථායී සහ හිතකර උද්ධමන මට්ටම්වල පහසුව භුක්ති විඳීම සඳහා සිය ඉලක්ක කරා ඉක්මනින් ගමන් කිරීමට අවශ්‍ය ඕනෑම රටකට එවැනි ප්‍රතිපත්ති මාලාවක් ඉතා වැදගත් වන අතර, එමගින් මහජනතාවගේ ඉහළ ජීවන තත්ත්වයන් තහවුරු කරන තිරසාර ආර්ථික වර්ධනයක් සහතික කෙරේ.

මූලාශ්‍ර

1. Berger, H., Haan, J. De and Eijffinger, S. C. W. (2001) 'Central bank independence: an update of theory and evidence', *Journal of Economic Surveys*, 3-40.

2. Brumm, H. J. (2011) 'Inflation and central bank independence: Two-way causality?', *Economics Letters*, 220-222.

3. Garriga, A. and Rodriguez, C. (2020) 'More effective than we thought: Central bank independence and inflation in developing countries', *Economic Modelling*, 87-105.

4. Ha, J. M., Kose, A. and Ohnsorge, F. (2019) Inflation in Emerging and Developing Economies and Developing Economies. World Bank Group.

5. Ha, J. M., Kose, A. and Ohnsorge, F. (2021) 'One-Stop Source, A Global Database of Inflation', *Policy Research Working Paper*, (9737). World Bank Group.

6. Kwon, G., L. McFarlane, and W. Robinson, (2009) 'Public Debt, Money Supply, and Inflation: A Cross-Country Study', *IMF Staff Papers*, (56(3)), 476-515.

7. Rouse, C. C., Zhang J., and Tedeschi, E. (2021) 'Historical Parallel's to Today's Inflationary Episode'.

8. Weber, C. S. (2016) 'Central Bank Transparency and Inflation (Volatility)—New Evidence', *International Economics and Economic Policy*, (15), 21-67.

7.5 රූප සටහන
වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනයේ හැසිරීම



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2020 වසර අවසානයේදී පැවති සියයට 3.5 සිට 2021 වසර අවසානය වන විට සියයට 8.3ක් දක්වා ඉහළ ගිය අතර, 2022 මාර්තු මාසය වන විට තවදුරටත් සියයට 13.0ක් දක්වා ඉහළ ගියේය. වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2020 වසරේදී වාර්තා වූ සියයට 3.1 හා සාපේක්ෂව 2021 වසරේදී සියයට 4.4ක් විය. ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය ද 2020 වසර අවසානයේ පැවති සියයට 4.7 සිට 2021 වසර අවසානය වන විට සියයට 10.8ක් දක්වාද, 2022 පෙබරවාරි මාසය වන විට තවදුරටත් සියයට 14.1ක් දක්වා ද ඉහළ ගියේය. ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2020 වසරේදී වාර්තා වූ සියයට 4.1 හා සාපේක්ෂව 2021 වසරේදී සියයට 5.5ක් ලෙස වාර්තා විය. මූලික උද්ධමනයේ පවතින සහ අපේක්ෂිත ප්‍රවණතා සැලකිල්ලට ගෙන ඉල්ලුමෙන් ජනිතවන උද්ධමනකාරී පීඩන අවම කිරීමට සහ උද්ධමන අපේක්ෂා පාලනය කිරීමේ අරමුණින් මුදල් තත්ත්ව දැඩි කිරීම සඳහා පූර්වෝපායික මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය මගින් මනිනු ලබන ආයතනික සහ කුටුම්භ යන දෙඅංශයේම උද්ධමන අපේක්ෂා, පවතින උද්ධමන ප්‍රවණතාවල බලපෑම පිළිබිඹු කරමින් 2021 වසරේදී ඉහළ මට්ටමක පැවතුණි. උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයට අනුව, සැපයුම් අංශයේ බාධා හේතුවෙන් ආයතනික සහ කුටුම්භ යන දෙඅංශයම නුදුරු කාලීනව උද්ධමනය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය සහ දේශීය වශයෙන් ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් වෙනස් වීම සහ වසංගතය ආශ්‍රිතව පනවන ලද සංචරණ සීමා, මුදල් සැපයුම ඉහළ යෑම, රුපියලෙහි ඇති විය හැකි අවප්‍රමාණය වීම, ආනයන මත පනවනු ලබන සීමා, උත්සව කාලවලදී පවත්නා ඉහළ ඉල්ලුම, ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරය, ඉන්ධන සහ ගෑස් මිල ඉහළ යෑමට පවතින හැකියාව, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල සහ ආනයන අයිතමවල මිල ගණන් ඉහළ යෑම, විශේෂයෙන්ම පොහොර හිඟය හේතුවෙන් දේශීය සැපයුම පහළ යෑම සහ දේශීය ආර්ථිකයෙහි අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම යනාදිය සමීක්ෂණට ප්‍රතිචාර දැක්වූවන් විසින් උද්ධමන අපේක්ෂා ඉහළ යෑම සඳහා දක්වන ලද ප්‍රධාන හේතු විය. උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණට ප්‍රතිචාර දැක්වූවන්ට අනුව, 2021 වසර අග භාගයේදී මහ බැංකුව විසින් ගන්නා ලද මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ එහි ප්‍රතිඵලයක් ලෙස පොලී අනුපාතික ඉහළ යෑම මෙන්ම සැපයුම් තත්ත්ව වැඩි දියුණු වීම් සහ ආනයන සීමා ලිහිල් කිරීම් පිළිබිඹු කරමින්, ඉදිරි කාලය සඳහා ආයතනික අංශයේ උද්ධමන අපේක්ෂා අඩු වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කෙරේ.

7.4 පොලී අනුපාතිකවල හැසිරීම

වෙළඳපොළ ද්‍රවශීලතාව සහ කෙටි කාලීන පොලී අනුපාතික

2021 වසර මැද වන තෙක් දේශීය මුදල් වෙළඳපොළ තුළ විශාල අතිරික්තයක් ලෙස පැවති රුපියල් ද්‍රවශීලතාව, 2021 වසර අවසානය වන විට විශාල හිඟ ද්‍රවශීලතා මට්ටමක් දක්වා අඩු විය. ප්‍රාථමික වෙළඳපොළ වෙන්දේසිවලදී මහ බැංකුව විසින් රජයේ සුරැකුම්පත් මිලදී ගැනීම සහ මහ බැංකුවට භාණ්ඩාගාර බිල්පත් සෘජු ලෙස පැවරීම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළට සැලකිය යුතු රුපියල් ද්‍රවශීලතාවක් සැපයූවද, අනෙකුත් සාධක කිහිපයක් හේතුවෙන් 2021 වසර තුළදී ද්‍රවශීලතාව අඩු විය. දළ නිල සංචිත භාවිත කිරීමෙන් රජයේ විදේශ ණය ආපසු ගෙවීම, මහජනතාව බැංකු පද්ධතියෙන් ව්‍යවහාර මුදල් ආපසු ගැනීම සහ දේශීය බැංකු සමග පැවති විදේශ විනිමය මිලදී ගැනීම් විකිණීම් හුවමාරු ගිවිසුම් කල්පිරීම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව අඛණ්ඩව අඩු වූ අතර 2021 අගෝස්තු මස මැද වන විට සුළු හිඟයක මට්ටමක් දක්වා අඩු විය. 2021 සැප්තැම්බර් මාසයේදී බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 4.0ක් දක්වා ප්‍රතිශතාංක 2කින් ඉහළ නැංවීම හරහා ද්‍රවශීලතාව ස්ථාවර පදනමින් අවශෝෂණය කර ගැනීම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාව

7

7.6 රූප සටහන
දේශීය මුදල් වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාව සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

තවදුරටත් අඩු විය. ඒ අතරම, 2021 අගෝස්තු මස මැද වන විට මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීමෙන් අනතුරුව, කෙටිකාලීන වෙළඳපොළ පොලී අනුපාතික නිසි පරිදි මෙහෙයවීමේ අරමුණින් මහ බැංකුව දේශීය මුදල් වෙළඳපොළෙන් අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා විවට වෙළඳපොළ කටයුතු ආරම්භ කළේය. මේ අතර, මහ බැංකුව විසින් ඇතැම් බැංකුවල ද්‍රවශීලතා හිඟය අවම කිරීම සඳහා දිගු කාලීන පදනම මත ද්‍රවශීලතාව සැපයීමට දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි අවශ්‍ය පරිදි පවත්වන ලදී. අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය බාධාවකින් තොරව සිදු කිරීමට පහසුකම් සැලසීම සඳහා විදේශ විනිමය සැපයීමට මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ සිදු කළ මැදිහත් වීම් හේතුවෙන් ද වෙළඳපොළ ද්‍රවශීලතාව අඩු විය. මෙම ප්‍රවණතා හේතුවෙන්, 2021 වසරේ මුල් භාගයේදී රුපියල් බිලියන 137ක පමණ අතිරික්තයක් වාර්තා කළ දේශීය මුදල් වෙළඳපොළ දෛනික සාමාන්‍ය ද්‍රවශීලතාව, 2021 වසරේ සිව්වන කාර්තුවේදී රුපියල් බිලියන 205ක හිඟයක් දක්වා අඩු විය. 2022 මාර්තු මස අවසානය වන විට දේශීය මුදල් වෙළඳපොළෙහි පැවති එක් දින ද්‍රවශීලතාවෙහි හිඟය තවදුරටත් ඉහළ ගොස් රුපියල් බිලියන 600ක අගය ඉක්මවමින් ඉහළ මට්ටම් කරා ළඟා විය.

2021 අගෝස්තු මස මැද දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙනස්වීමෙන් වූ බලපෑම සහ විශාල හිඟ ද්‍රවශීලතා මට්ටම පිළිබිඹු කරමින්, මුදල් ප්‍රතිපත්ති රාමුවේ මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව කරා ළඟා විය. 2021 වසර ආරම්භයේදී නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි පහළ සීමාවට ආසන්නයෙන් පැවති බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, 2021 වසරේ දෙවන කාර්තුවේ සිට දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ක්‍රමයෙන් අඩුවීමත් සමග නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි මැද දක්වා ක්‍රමයෙන් ඉහළ ගියේය. තවද, 2021 අගෝස්තු මාසයේ සිට මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීමත් සමග බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව දක්වා ඉහළ යෑමට ඉඩ හරින ලදී. ඒ අනුව, 2021 අගෝස්තු මාසයේ සිට සමස්ත ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 200කින් ඉහළ නැංවීම හා සැසඳීමේදී, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, 2021 අගෝස්තු මාසයේ සිට පදනම් අංක 240කින් පමණ ඉහළ ගොස් ඇති අතර, 2022 මාර්තු මස අවසානය වන විට සියයට 7.49ක් විය. මේ අතර, ප්‍රතිමිලදී ගැනීමේ වෙළඳපොළ ගනුදෙනුවල බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික ද බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි හැසිරීම් හා සමාන හැසිරීමක් අනුගමනය කළ අතර, 2022 මාර්තු මස අවසානය වන විට සියයට 7.50ක් විය.

රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික

2020 වසර තුළදී සැලකිය යුතු ලෙස අඩු වූ රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික, රජයේ ණය ගැනීමේ අවශ්‍යතාවය ඉහළ යෑම, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙනස් වීම සහ ප්‍රාථමික වෙන්දේසිවලදී රජයේ සුරැකුම්පත් වෙන්දේසියෙහි ලංසු පිළිගැනීම සඳහා වූ උපරිම ඵලදා අනුපාතික ඉවත් කිරීම හේතුවෙන් 2021 වසරේදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මූල්‍යන අවශ්‍යතා සපුරාලීම සඳහා විදේශ විනිමය රජය වෙත ගලා ඒම සීමිත වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය මූලාශ්‍රවලින් ණය ගැනීම සඳහා රජය වැඩි වශයෙන් යොමු වීම හේතුවෙන් 2021 වසර මුළුල්ලේ රජයේ සුරැකුම්පත් ඵලදා අනුපාතික මත ඉහළ පීඩනයක් ඇති විය. කෙසේ වෙතත්, ප්‍රාථමික වෙන්දේසිවලදී රජයේ සුරැකුම්පත් වෙන්දේසියෙහි ලංසු පිළිගැනීම සඳහා උපරිම ඵලදා අනුපාතික පැවතීම මගින් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඉහළ යෑම සීමා කිරීමට උපකාරී විය. එහෙත්, 2021 අගෝස්තු මස මැද දී ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සහ 2021 සැප්තැම්බර් මස මැද දී ප්‍රාථමික වෙන්දේසිවලදී රජයේ සුරැකුම්පත් වෙන්දේසියෙහි ලංසු පිළිගැනීම සඳහා වූ උපරිම ඵලදා අනුපාතික ඉවත් කිරීමෙන් පසුව, රජයේ සුරැකුම්පත්

7.7 රූප සටහන
භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රාථමික වෙළඳපොළ එලදා අනුපාතික (අ)



(අ) ලංසු පිළිගත නොහැකි වීම හෝ අදාළ පරිණත කාලය සඳහා සුරැකුම්පත් නිකුතු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඇතැම් සති සඳහා එලදා අනුපාතික වාර්තා නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මත එලදා අනුපාතිකවල සැලකිය යුතු ඉහළ යෑමක් දක්නට ලැබුණි. රජයේ ඉහළ ණය ගැනීමේ අවශ්‍යතාව සහ එමගින් සමස්ත ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි වන බලපෑම මධ්‍යයේ රාජ්‍ය මූල්‍ය අංශයේ දුර්වලතා හේතුවෙන් පිරිහෙන ආයෝජක කැමැත්ත මෙන්ම 2022 වසරේ පළමු කාර්තුව තුළදී ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම් පිළිබිඹු කරමින් 2022 වසරේ මුල් කාලයේදී ද එලදා අනුපාතික සැලකිය යුතු ලෙස තවදුරත් ඉහළ යෑමක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2020 වසර අවසානයේ සිට 2022 මාර්තු මස අවසානය දක්වා කාලය තුළ සියලු කල්පිරීම්වල ප්‍රාථමික වෙළඳපොළ භාණ්ඩාගාරික බිල්පත් මත එලදා අනුපාතික පදනම් අංක 723-823ක පරාසයකින් ඉහළ ගියේය. ප්‍රාථමික වෙන්දේසිවලදී රජයේ සුරැකුම්පත් වෙන්දේසියෙහි ලංසු පිළිගැනීම සඳහා වූ උපරිම එලදා අනුපාතික ඉවත් කිරීමත් සමග රජයේ

7.8 රූප සටහන
රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ එලදා වක්‍රය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සුරැකුම්පත් සඳහා වන වෙළඳපොළ රුචිකත්වය ඉහළ ගිය අතර, භාණ්ඩාගාර බිල්පත් නිකුතුවල වැඩි කොටසක් වෙළඳපොළ සහභාගීවන්නන් විසින් මිලදී ගනු ලැබීය. කෙසේ වෙතත්, 2021 වසර තුළ, විශේෂයෙන්ම වසරේ අවසාන කාලය තුළදී, අවිනිශ්චිතතාව හමුවේ කෙටි කාලීන ආයෝජන කරා ආයෝජකයන්ගේ කැමැත්ත පෙන්නුම් කරමින් වෙළඳපොළ සහභාගීවන්නන් විසින් මිලදී ගත් භාණ්ඩාගාර බිල්පත්වලින් වැඩි ප්‍රමාණයක් දින 91ක කල් පිරීම්වලින් සමන්විත විය. 2021 වසර ආරම්භයේ සිට 2022 මාර්තු මස අවසානය දක්වා කාලය තුළ නිකුත් කරන ලද සියලු කල්පිරීම්වල ප්‍රාථමික වෙළඳපොළ භාණ්ඩාගාර බැඳුම්කර මත එලදා අනුපාතික ද පදනම් අංක 223-876ක් අතර පරාසයකින් ඉහළ ගියේය. එම කාලය තුළදී ද්විතීයික වෙළඳපොළ තුළ සියලු කල්පිරීම්වල රජයේ සුරැකුම්පත් මත එලදා අනුපාතික ද සැලකිය යුතු ඉහළ යෑම් වාර්තා කළේය. ඒ අනුව, 2020 වසර අවසානයේ සිට 2022 මාර්තු මස අවසානය දක්වා කාලය තුළ සියලු කල්පිරීම්වල ද්විතීයික වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් මත එලදා අනුපාතික පදනම් අංක 740-746ක පරාසයකින් ඉහළ ගිය අතර, ද්විතීයික වෙළඳපොළ භාණ්ඩාගාර බැඳුම්කර මත එලදා අනුපාතිකවල ඉහළ යෑම පදනම් අංක 758-855ත් අතර පරාසයක පැවතිණි. මේ අතර, රජය විසින් 2021 වසරේදී සහ 2022 මාර්තු මස අවසානය දක්වා කාලය තුළ සියයට 5.00-10.00 අතර පරාසයේ විවිධ ස්ථාවර අනුපාතික යටතේ එක්සත් ජනපද ඩොලර් වලින් නාමනය කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් අරමුදල් රැස් කර ගන්නා ලදී.

තැන්පතු සහ ණය පොලී අනුපාතික

මුදල් තත්ත්වයන් ලිහිල් කිරීම සඳහා මහ බැංකුව විසින් ගනු ලැබූ ප්‍රතිපත්ති සහ නියාමන ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර දක්වමින් 2021 අගෝස්තු මාසය වන තෙක් සැලකිය යුතු ලෙස අඩු වූ බලපතුලාභී වාණිජ බැංකුවල තැන්පතු පොලී අනුපාතික, 2021 අගෝස්තු මාසයේදී මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමත් සමග සාපේක්ෂව අඩු ප්‍රමාණයකින් ඉහළ ගියේය. බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR)[1] සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR)[2] 2021 අගෝස්තු මස අවසානය වන විට ඉතිහාසයේ මෙතෙක් පැවති අවම මට්ටම් වන, පිළිවෙළින්, සියයට 4.75ක් සහ සියයට 5.62ක් ලෙස වාර්තා විය. තවද, බරිත සාමාන්‍ය

1 බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR), බලපතුලාභී වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

2 බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR), බලපතුලාභී වාණිජ බැංකු වෙතැති සියලුම පොලී උපයන කාලීන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

7.9 රූප සටහන
තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම



නව තැන්පතු අනුපාතිකය (AWNDR)[3] සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය ද (AWNFDR)[4] ඒවායෙහි අවම මට්ටම් වන, පිළිවෙළින්, සියයට 4.77ක් 2021 අප්‍රේල් මාසයේදී සහ සියයට 4.90ක් 2021 මැයි මාසයේදී වාර්තා කළේය. ඒ අනුව, සාමාන්‍ය තැන්පතු පොලී අනුපාතික ඒවායේ අවම මට්ටම් කරා ළඟා වීම සඳහා 2019 වසරේ සිට පදනම් අංක 345-443ක ප්‍රමාණයකින් පමණ අඩු වී ඇත. කෙසේ වෙතත්, මුදල් තත්ත්වය දැඩි කිරීමත් සමග සියලුම තැන්පතු අනුපාතික වැඩි වීම ආරම්භ වූ අතර, 2021 අගෝස්තු මස සිට 2022 පෙබරවාරි මස අවසානය දක්වා කාලය තුල බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය පදනම් අංක 32කින් සහ බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය පදනම් අංක 131කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, වෙළඳපොළ ණය පොලී අනුපාතිකවල ඉහළ යෑමට සාපේක්ෂව තැන්පතු පොලී අනුපාතිකවල ඉහළ යෑමේ අඩු බවක් නිරීක්ෂණය විය. තවද, වෙළඳපොළ තැන්පතු පොලී අනුපාතික වැඩි වීමට වඩා උද්ධමන අනුපාතිකය ඉහළ යෑම හේතුවෙන් බැංකු අංශයේ ඇතැම් තැන්පතු උපකරණ 2021 වසර අවසාන කාලයේදී සෘණ මූර්ත පොලී අනුපාතික වාර්තා කළේය.

ආර්ථිකයේ පැවති ලිහිල් මුදල් තත්ත්ව හේතුවෙන් පහළ යන ලද වෙළඳපොළ ණය පොලී අනුපාතික, මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමත් සමග 2021 වසර අවසානය වන විට ශීඝ්‍රයෙන් ඉහළ ගියේය. බොහෝ වෙළඳපොළ ණය පොලී අනුපාතික 2021 වසරේදී ඉතිහාසයේ මෙතෙක් පැවති අවම අගයන් කරා අඩු විය. මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR),[5] බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR)[6] සහ බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR),[7] 2019 වසර අවසානයේ සිට පදනම් අංක 422-533ත් අතර පරාසයකින් අඩු වෙමින්, ඒවායෙහි මෙතෙක් පැවති අවම අගයන් වූ, පිළිවෙළින්, සියයට 5.65ක් 2021 අප්‍රේල් මාසයේදී, සියයට 9.37ක් 2021 සැප්තැම්බර් මාසයේදී සහ සියයට 7.47ක් 2021 ජූනි මාසයේදී වාර්තා කළේය. ඉන් අනතුරුව, 2021 අගෝස්තු මාසයේදී මුදල් තත්ත්වයන් දැඩි කිරීමත් සමග, බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය, බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය, 2021 අගෝස්තු මාසයේ සිට 2022 පෙබරවාරි මස අවසානය වන විට, පිළිවෙළින්, පදනම් අංක 310කින්, 75කින් සහ 203කින් ඉහළ ගියේය. 2022 පෙබරවාරි මස අවසානය වන විට බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකයෙහි වාර්තා කර ඇති පරිදි, සුරැකුම්පත් වර්ගයට අනුව, ආනයන සහ අපනයන හා සම්බන්ධ බිල්පත්වලට (මිලදී ගත් අපනයන බිල්පත් හැර) අදාළ ණය පොලී අනුපාතික අනෙකුත්

7.10 රූප සටහන
සුරැකුම් වර්ගය අනුව බරිත සාමාන්‍ය ණය අනුපාතික (සියයට)



3 බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR), මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පත් කර ඇති සියලුම පොලී උපයන නව රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

4 බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR), මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පත් කර ඇති සියලුම පොලී උපයන නව කාලීන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

5 බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (AWPR), සතියක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය ප්‍රධාන ගනුදෙනුකරුවන්ට ලබා දුන් කෙටි කාලීන රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා වන පොලී අනුපාතික මත පදනම් වේ.

6 බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR), බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද සියලුම රුපියල් ණය සහ අත්තිකාරම්වලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

7 බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය (AWNLR), මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද නව රුපියල් ණය සහ අත්තිකාරම්වලට අදාළ පොලී අනුපාතික මත පදනම් වේ.

7.3 සංඛ්‍යා සටහන

පොලී අනුපාතිකවල හැසිරීම

වාර්ෂික පොලී අනුපාතිකය සියයට

පොලී අනුපාතිකය	2020 අවසානයට	2021 අවසානයට	පදනම් අංකවල වෙනස
ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික			
නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය	4.50	5.00	50
නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය	5.50	6.00	50
බරිත සාමාන්‍ය ඉක්ම්ණ මුදල් අනුපාතිකය	4.55	5.95	140
රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික			
ප්‍රාථමික වෙළඳපොළ (අ)			
භාණ්ඩාගාර බිල්පත්			
දින 91	4.69	8.16	347
දින 182	4.80	8.33	353
දින 364	5.05	8.24	319
භාණ්ඩාගාර බැඳුම්කර			
වසර 2	5.65(ආ)	9.16(ඇ)	351
වසර 3	5.99(ආ)	9.70(ඇ)	371
වසර 4	6.32(ආ)	8.55(ඇ)	223
වසර 5	6.79(ආ)	11.14(ඇ)	435
වසර 10	9.99(ආ)	8.86(ඇ)	-113
ද්විතීයික වෙළඳපොළ			
භාණ්ඩාගාර බිල්පත්			
දින 91	4.63	7.77	314
දින 182	4.73	8.07	334
දින 364	4.98	8.22	324
භාණ්ඩාගාර බැඳුම්කර			
වසර 2	5.56	8.58	302
වසර 3	5.96	9.55	359
වසර 4	6.40	10.38	398
වසර 5	6.65	10.66	401
වසර 10	7.55	11.71	416
බලපත්‍රලාභී වාණිජ බැංකු (ඇ)			
තැන්පතු පොලී අනුපාතික			
ඉතිරිකිරීමේ තැන්පතු	0.10-7.00	0.05-6.35	-
එක් අවුරුදු ස්ථාවර තැන්පතු (ඉ)	0.25-15.00	0.15-15.00	-
බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (ඊ)	5.80	4.94	-86
බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඊ)	7.14	5.94	-120
බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (ඊ)	4.93	6.45	152
බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (ඊ)	5.08	6.67	159
ණය පොලී අනුපාතික			
බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (මාසික)	5.74	8.33	259
බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය	10.29	9.87	-42
බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය	8.38	9.48	110
අනෙකුත් මූල්‍ය ආයතන (උ)			
තැන්පතු පොලී අනුපාතික			
ජාතික ඉතිරිකිරීමේ බැංකුව			
ඉතිරිකිරීමේ තැන්පතු	3.50	3.50	0
එක් අවුරුදු ස්ථාවර තැන්පතු	5.25	5.50	25
බලපත්‍රලාභී මුදල් සමාගම් (ඌ)			
ඉතිරිකිරීමේ තැන්පතු	3.40-4.74	3.46-4.75	-
එක් අවුරුදු ස්ථාවර තැන්පතු	6.56-7.21	9.02-10.13	-
ණය පොලී අනුපාතික			
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	7.00-10.00	7.50-11.50	-
රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (එ)	8.73-12.50	7.50-12.50	-
බලපත්‍රලාභී මුදල් සමාගම් (ඌ)			
මූල්‍ය කල්බදු	14.31-28.97	12.77-28.33	-
කුලීපිට ගැනුම්	13.71-20.05	11.08-27.00	-
ඉඩම් සහ දේපළ මත ලබා දුන් ණය (ඒ)	19.95-22.30	-	-
නිශ්චල දේපළ මත ලබා දුන් ණය (ඒ)	-	15.77-16.77	-
සාංගමික ණය වෙළඳපොළ			
ණයකර	9.00-13.25	8.00-12.00	-
වාණිජ පත්‍රිකා	6.50-15.50	6.00-12.00	-

මූලයන්: අදාළ මූල්‍ය ආයතන
කොළඹ කොටස් හුවමාරුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ආයතනගත වෙන්දේසියේදී නිකුත් කළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික

(ආ) 2020 වසරේදී අවසාන ප්‍රාථමික වෙන්දේසිය
වසර 2 - සැප්. 28; වසර 3 - දෙසැ. 11; වසර 4 - නොවැ. 12;
වසර 5 - දෙසැ.11; වසර 10 - ජන. 13

(ඇ) 2021 වසරේදී අවසාන ප්‍රාථමික වෙන්දේසිය
වසර 2 - නොවැ. 11; වසර 3 - දෙසැ. 13; වසර 4 - අගෝ. 30;
වසර 5 - ඔක්. 12; වසර 10 - ජූලි 29

(ඉ) වාණිජ බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.

(ඉ) ඇතැම් වාණිජ බැංකු විසින් සැපයූ විශේෂ පොලී අනුපාතික මෙහි උපරිම පොලී අනුපාතිකය වේ.

(ඊ) රජයේ අනුමැතිය මත ලබා දෙන සියයට 15ක් වූ ජෙට්ස් පුරවැසි විශේෂ ස්ථාවර තැන්පතු අනුපාතිකයෙහි බලපෑම ඉවත් කිරීම සඳහා 2018 වසරේ ජූලි මස සිට බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කරනු ලබන්නේ අදාළ වෙළඳපොළ පොලී අනුපාතික මගිනි. 2018 ජූනි මස සිට බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය ගණනය කිරීම සඳහා මෙම ක්‍රමය භාවිතා වේ.

(උ) තෝරාගත් අනෙකුත් මූල්‍ය ආයතන විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.

(ඌ) පොලී අනුපාතික පරාසයන් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අදාළ මාසයේදී තැන්පතු නැවත ලබා ගැනීම සහ ණය ලබා දීම සඳහා ඉදිරිපත් කරනු ලබන උපරිම සහ අවම සාමාන්‍ය පොලී අනුපාතික මත පදනම් වේ. 2021 වසර සඳහා දත්ත තාවකාලික වේ.

(එ) නිවාස කටයුතු සඳහා දෙන ලද ණය පමණි.

(ඒ) 2021 ජූලි මස සිට "ඉඩම් සහ දේපළ මත ලබා දුන් ණය" දර්ශකය "නිශ්චල දේපළ මත ලබා දුන් ණය" ලෙස වෙනස් කර ඇත.

සුරැකුම්පත්වල පොලී අනුපාතිකවලට සාපේක්ෂව ඉහළ අගයක් පෙන්නුම් කළ අතර, ස්ථාවර, ඉතිරිකිරීමේ සහ අනෙකුත් තැන්පතු හා තැන්පතු සහතිකවලට අදාළ ණය පොලී අනුපාතික අවම අගයක් වාර්තා කළේය. 2021 අගෝස්තු මාසයේ සිට මුදල් ප්‍රතිපත්තිය දැඩි කළ ද, නොපිය වූ ණය තොගයෙහි බලපෑම සහ වෙළඳපොළ ණය පොලී අනුපාතික තවදුරටත් ඉහළ දැමීම සඳහා පවතින හැකියාව පෙන්නුම් කරමින්, 2022 පෙබරවාරි අවසානය වන විට සුරැකුම්පත් වර්ග ගණනාවකට අදාළ බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතික 2020 වසර අවසානයේදී දක්නට ලද අනුපාතිකවලට වඩා අඩු මට්ටමක පැවතුණි. මාසික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණය[8] මගින් මනිනු ලබන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙත ලබා දුන් ණය සැලකූ විට, බලපත්‍රලාභී බැංකු විසින් එම ව්‍යාපාර අංශය වෙත ලබා දුන් ණය සඳහා වූ සාමාන්‍ය පොලී අනුපාතික බලපත්‍රලාභී වාණිජ බැංකුවල සමස්ත සාමාන්‍ය ණය පොලී අනුපාතිකවල ප්‍රවණතාව පෙන්නුම් කළ ද, එම අනුපාතිකවලට වඩා ඉහළ මට්ටමක පැවතුණි. ඒ අනුව, 2021 වසර අවසානය වන විට බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය (AWSR)[9] සහ බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය (AWNSR),[10] පිළිවෙළින්, සියයට 10.49ක් සහ සියයට 10.04ක් විය. දැඩි මුදල් තත්ත්වයන් හමුවේ, ණය උපකරණ සඳහා අදාළ වූ උපරිම පොලී අනුපාතික කිහිපයක් ද ඉහළ නංවන ලදී. ඒ අනුව, 2020 දෙසැම්බර් මාසයේදී වැටුප්ලාභී සේවා නියුක්තිකයන්හට හඳුන්වා දුන් දේපළ ඇපකර සහිත නිවාස ණයෙහි පළමු වසර පහ සඳහා අදාළ වසරකට සියයට 7ක් වූ ස්ථාවර පොලී අනුපාතිකය මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකයට සම්බන්ධ කර විචල්‍ය අනුපාතිකයකට වෙනස් කෙරිණි. තවද, 2020 අගෝස්තු මාසයේදී දේශීය ණය උපකරණ පොලී අනුපාතික මත පනවන ලද උපරිම පොලී අනුපාතික සීමා දැඩි මුදල් තත්ත්ව සලකා බලා 2022 මාර්තු මාසයේදී ඉහළ නැංවූ අතර, එහිදී ණය කාඩ්පත් සඳහා අදාළ වන උපරිම පොලී අනුපාතිකය වසරකට සියයට

8 වාර්ෂික පිරිවැටුප රුපියල් බිලියන 1කට නොවැඩි සහ සේවකයන් 300කට අඩු සංඛ්‍යාවක් සහිත සේවා නියුක්ත ව්‍යාපාර, මාසික කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය සමීක්ෂණය උදෙසා සලකා බලන ලෙස බැංකුවලින් ඉල්ලා සිටින ලදී.

9 බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය (AWSR) ගණනය කිරීමේදී, රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම ඇතුළත් නොවන අතර, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් සියලුම රුපියල් ණය සහ අත්තිකාරම්වල පොලී අනුපාතික මත පදනම් වේ.

10 බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය (AWNSR) ගණනය කිරීමේදී, රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම ඇතුළත් නොවන අතර, මාසයක් තුළ බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබා දුන් සියලුම නව රුපියල් ණය සහ අත්තිකාරම්වල පොලී අනුපාතික මත පදනම් වේ.

20 දක්වා ද, පෙර ගිවිසගෙන ඇති තාවකාලික බැංකු අයිරා සඳහා අදාළ වන උපරිම පොලී අනුපාතිකය වසරකට සියයට 18ක් දක්වා ද උකස් අත්තිකාරම් සඳහා අදාළ වන උපරිම පොලී අනුපාතිකය වසරකට සියයට 12ක් දක්වා ද ඉහළ නැංවීය. ඉන් පසුව 2022 අප්‍රේල් මාසයේදී මෙම උපරිම පොලී අනුපාතික සීමා සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලදී.

සෑම වසරක් අවසානයේදීම මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබ රජයේ ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරනු ලබන නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය,[11] 2021 වසර සඳහා වූ සියයට 10.12 හා සැසඳීමේදී 2022 වසර සඳහා සියයට 7.48ක් විය. 2022 වසර සඳහා නෛතික පොලී අනුපාතිකය සහ වෙළඳපොළ පොලී අනුපාතිකය, 2021 ඔක්තෝබර් මාසය ද ඇතුළුව, ඉන් පෙර මාස 12ක් සඳහා එනම් 2020 නොවැම්බර් මාසයේ සිට 2021 ඔක්තෝබර් මාසය දක්වා බලපත්‍රලාභී වාණිජ බැංකුවල මාසික බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතික සහ බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකවල සරල සාමාන්‍යය මත පදනම්ව ගණනය කර ඇත.

විදේශ විනිමය තැන්පතු මත වන පොලී අනුපාතික

දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ වූ හිඟ ද්‍රවශීලතාව හමුවේ විදේශ විනිමය තැන්පතු රැස් කිරීමට බැංකු අතර පැවති තරඟකාරීත්වය පිළිබිඹු කරමින්, විදේශ විනිමය තැන්පතු මත පොලී අනුපාතික ශීඝ්‍රයෙන් ඉහළ ගිය අතර, ඒ හේතුවෙන් විදේශ විනිමය තැන්පතු පොලී අනුපාතික සහ රුපියල් තැන්පතු පොලී අනුපාතික අතර පැවති විෂමතාවන් නිවැරදි කිරීම සඳහා ඇතැම් නියාමන ක්‍රියාමාර්ග ගැනීමට ද අවශ්‍ය විය. කොවිඩ්-19 එන්නත්කරණ වැඩසටහන්වල සහාය සමග ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම හමුවේ, ප්‍රධාන වශයෙන් උද්ධමන පීඩන ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, බොහෝ රටවල මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම ආරම්භ කෙරිණි. ගෝලීය පොලී අනුපාතික ඉහළ යෑම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පවතින ද්‍රවශීලතා තත්ත්ව සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකු විසින් පිරිනමනු ලබන දේශීය විදේශ විනිමය තැන්පතු මත වූ ඇතැම් පොලී අනුපාතික සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රුපියල් තැන්පතු සහ විදේශ විනිමය තැන්පතු උපකරණ සඳහා වූ පොලී අනුපාතික අතර විෂමතා ඇති විය. එබැවින්, මහ බැංකුව විසින් එවැනි පොලී අනුපාතික විෂමතා අවම කිරීම සඳහා 2021 අගෝස්තු මස අවසාන කාලයේදී බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විදේශ විනිමය තැන්පතු පොලී අනුපාතික මත උපරිම පොලී අනුපාතිකයක් පනවන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස, විදේශ විනිමය තැන්පතු පොලී අනුපාතික යම් ප්‍රමාණයකට අඩු විය. කෙසේ වෙතත්, 2021 අගෝස්තු මාසයේදී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැඩි කිරීම හේතුවෙන් රුපියල් තැන්පතු උපකරණ මත වූ පොලී අනුපාතික ක්‍රමයෙන් වැඩි වීමත් සමඟ, වෙළඳපොළ තත්ත්වයන් වඩාත් හොඳින් පිළිබිඹු වීම සඳහා විදේශ විනිමය තැන්පතු පොලී අනුපාතික සඳහා වන උපරිම සීමාව ද සංශෝධනය කළ අතර, 2022 මාර්තු මාසයේදී එම උපරිම සීමාව ඉවත් කෙරිණි. ඒ අනුව, එ.ජ. ඩොලර්වලින් පවත්වා ගෙන යනු ලබන ඉතුරුම් තැන්පතු මත පොලී අනුපාතික 2020 වසර අවසානයේදී පැවති සියයට 0.03-4.00ත් අතර පරාසයට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 0.03-4.60ත් අතර පරාසයක පැවතුණි. ස්ටර්ලින් පවුම්වලින් පවත්වා ගෙන යනු ලබන ඉතුරුම් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික 2020 වසර අවසානයට සාපේක්ෂව 2021 වසර අවසානයේදී සියයට 0.03-3.00ත් අතර පරාසයක නොවෙනස්ව පැවතුණි. මේ අතර, එ.ජ. ඩොලර්වලින් පවත්වා ගෙන යනු ලබන කාලීන තැන්පතු සඳහා අදාළ පොලී අනුපාතික 2020 වසර අවසානයේදී වාර්තා වූ 0.10-6.00ත් අතර පරාසයට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 0.02-7.00ත් අතර පරාසයක පැවතුණි. තවද, ස්ටර්ලින් පවුම්වලින් පවත්වා ගෙන යනු ලබන කාලීන තැන්පතු සඳහා අදාළ වන පොලී අනුපාතික 2020 වසර අවසානයේදී පැවති සියයට 0.05-4.25ත් අතර පරාසයට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 0.02-5.75ත් අතර පරාසයක පැවතුණි.

7.5 මුදල් සහ ණය සමස්තවල ප්‍රවණතා

සංචිත මුදල්

ආර්ථිකයේ මුදල් පදනම පිළිබිඹු කරනු ලබන සංචිත මුදල්, සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල්වල ඉහළ යෑම සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ඉහළ නැංවීමේ බලපෑම පිළිබිඹු කරමින්, 2021 වසර තුළදී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2020 වසර අවසානයේදී වාර්තා කළ සියයට 3.4ක වර්ධනයට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 35.4කින් සංචිත මුදල්

11 නෛතික පොලී අනුපාතිකය 1990 අංක 06 දරන සිවිල් විධාන සංග්‍රහය (සංශෝධන) පනතේ නිර්වචනය කර ඇති අතර, එය මුදලක් අයකර ගැනීම සම්බන්ධයෙන් වූ ඕනෑම නීතිමය ක්‍රියාමාර්ගයකදී අදාළ වේ. වෙළඳපොළ පොලී අනුපාතිකය, 1990 අංක 2 දරන ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ නිර්වචනය කර ඇති අතර, ණය දෙන ආයතන විසින් වාණිජමය ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ නීතිමය ක්‍රියාමාර්ගයකදී රුපියල් 150,000 කට වඩා වැඩි ණය මුදලක් අය කරගැනීමේදී, ඒ සඳහා එකඟ වූ පොලී අනුපාතිකයක් නොමැති විටෙක අදාළ වේ.

වර්ධනය විය. 2020 වසරේදී වැඩි වූ රුපියල් බිලියන 31.8ට සාපේක්ෂව 2021 වසර තුළදී රුපියල් බිලියන 1,305.8 දක්වා රුපියල් බිලියන 341.4කින් සංචිත මුදල් ඉහළ ගියේය. වසංගතය සහ ඒ ආශ්‍රිතව පැනවූ සංචරණ සීමාවන් මධ්‍යයේ මහජනතාව විසින් ආරක්ෂණ චේතනාවෙන් මුදල් සඳහා කළ ඉල්ලුම ඉහළ යෑම මෙන්ම තැන්පතු සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික සාපේක්ෂව අඩු වීම සහ ආර්ථික ක්‍රියාකාරකම් සාමාන්‍ය තත්ත්වයට පත් වීමේ යම් බලපෑමක් පිළිබිඹු කරමින් සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල් වසර තුළදී ඉහළ මට්ටමක පැවතුණි. ඒ අනුව, සංසරණයෙහි පවතින ව්‍යවහාර මුදල්, 2020 වසරේදී ඉහළ ගිය රුපියල් බිලියන 156.8ක ප්‍රමාණය ද අභිබවමින්, 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 1,005.1 දක්වා රුපියල් බිලියන 170.3කින් ඉහළ ගියේය. ආර්ථිකයට මුදා හරින ලද මුදල් විශාල වශයෙන් වැඩි වීම මගින් 2021 අගෝස්තු මාසයෙන් අවසන් වන මාස අට තුළදී පවත්වා ගෙන යනු ලැබූ ඉතා ලිහිල් මුදල් ප්‍රතිපත්තිය පෙන්නුම් කෙරේ. මේ අතර, 2021 සැප්තැම්බර් මාසයේදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය ප්‍රතිශතාංක 2කින් ඉහළ නැංවීමත් සමග බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන තැන්පතු ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

7.11 රූප සටහන
මහ බැංකු ශේෂ පත්‍රයේ සංයුතිය



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

ඒ අනුව, 2021 වසර අවසානය වන විට බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන තැන්පතු ප්‍රමාණය රුපියල් බිලියන 300.7 දක්වා රුපියල් බිලියන 171.1කින් සැලකිය යුතු වැඩි වීමක් වාර්තා කළේය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ශේෂ පත්‍රයේ වත්කම් අනුව සලකා බැලීමේදී 2021 වසර තුළදී සංචිත මුදල් ප්‍රසාරණය සඳහා මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම්

7.4 සංඛ්‍යා සටහන
මුදල් සමස්තවල ප්‍රවණතා

රුපියල් බිලියන

අයිතමය	2020 අවසානයට	2021 අවසානයට (අ)	වෙනස 2020 ප්‍රමාණය	වෙනස 2020 %	වෙනස 2021 ප්‍රමාණය	වෙනස 2021 %
1. සමස්ත ව්‍යවහාර මුදල් එකතුව	834.8	1,005.1	156.8	23.1	170.3	20.4
1.1 මහජනයා වෙතැති ව්‍යවහාර මුදල්	641.0	784.4	146.8	29.7	143.4	22.4
1.2 වාණිජ බැංකු වෙතැති ව්‍යවහාර මුදල්	193.8	220.6	10.0	5.5	26.9	13.9
2. මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු (ආ)	129.6	300.7	-125.0	-49.1	171.1	132.0
3. මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු (ඇ)	0.03	0.01				
4. සංචිත මුදල් (1 + 2 + 3)	**964.4**	**1,305.8**	**31.8**	**3.4**	**341.4**	**35.4**
5. වාණිජ බැංකු වෙතැති මහජනයා සතු ඉල්ලුම් තැන්පතු	536.1	675.4	164.9	44.4	139.3	26.0
6. පටු මුදල් සැපයුම, M_1 (1.1 + 5)	**1,177.2**	**1,459.9**	**311.7**	**36.0**	**282.7**	**24.0**
7. මහජනයා සතු වාණිජ බැංකු වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු	7,318.6	8,179.0	1,271.4	21.0	860.4	11.8
8. පුළුල් මුදල් සැපයුම, M_2 (6 + 7)	**8,495.8**	**9,638.9**	**1,583.1**	**22.9**	**1,143.1**	**13.5**
9. ගැළපුම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු (ඈ)	909.9	1,008.4	198.5	27.9	98.5	10.8
10. ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම, M_{2b} (8 + 9)	**9,405.7**	**10,647.3**	**1,781.6**	**23.4**	**1,241.6**	**13.2**
මුදල් ගුණකය, M_{2b}	**9.75**	**8.15**				
සංසරණ ප්‍රවේගය, M_{2b} (ඉ)	**1.77 (ඊ)**	**1.65**				

(අ) තාවකාලික
(ආ) මහ බැංකුව වෙතැති වාණිජ බැංකු තැන්පතු සහ මහ බැංකුව වෙතැති ප්‍රාථමික වෙළඳුන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(ඇ) මහ බැංකුව වෙතැති රාජ්‍ය නියෝජිත ආයතනවල තැන්පතු 2020 වසර අවසානයේදී රුපියල් මිලියන 30.4 ක් ලෙස ද, 2021 අවසානයේදී රුපියල් මිලියන 5.5ක් ලෙස ද පැවතුණි.
(ඈ) අක්වෙරළ බැංකු ඒකකවල නේවාසික තැන්පතු සහ දේශීය බැංකු ඒකකවල විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවලින් දේශීය වගකීම් ලෙස හඳුනාගත් කොටසක් ඇතුළත් වේ.
(ඉ) වසර සඳහා සාමාන්‍යය.
(ඊ) සංශෝධිත

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

7

වැඩි වීම මුළුමනින්ම දායක වී ඇති අතර මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස අඩු වී ඇත. රජය වෙත සපයන ලද ශුද්ධ ණය 2020 වසරේදී රුපියල් බිලියන 505.9කින් ඉහළ යෑම හා සැසඳීමේදී 2021 වසර තුළදී රුපියල් බිලියන 1,225.2කින් ඉහළ යෑම මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් වැඩි වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ප්‍රාථමික වෙන්දේසිවලදී භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සහ සෘජු ලෙස මහ බැංකුව වෙත භාණ්ඩාගාර බිල්පත් පැවරීම හේතුවෙන් මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය (ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම්හි ශුද්ධ අගය ගැළපීමෙන් පසු) සැලකිය යුතු ලෙස ඉහළ යෑම රජය වෙත සපයන ලද ශුද්ධ ණය ඉහළ යෑම මගින් පිළිඹිබු වේ. ඒ අනුව, 2021 වසර තුළදී මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත් තොගය රුපියල් බිලියන 1,945.4ක් දක්වා රුපියල් බිලියන 1,228.1කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, ආර්ථික කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීම හමුවේ, වසංගතයෙන් පීඩාවට පත් ව්‍යාපාර සහ පුද්ගලයන් වෙත සහාය ලබා දීම සඳහා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා ලබා දුන් සහන ණය නැවත පියවීමත් සමග මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත සපයන ලද ණය අඩු විය. මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් 2020 වසරේ වාර්තා වූ රුපියල් බිලියක 401.1ක ඉහළ යෑම හා සැසඳීමේදී 2021 වසර තුළදී රුපියල් බිලියන 1,254.4කින් ඉහළ ගියේය. මේ අතර, 2021 වසර තුළදී මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ඍණ මට්ටම දක්වා රුපියල් බිලියන 914.0කින් සැලකිය යුතු ලෙස අඩු විය. කල්පිරෙන ලද නිව්යෝර්ක්හි ෆෙඩරල් සංචිත බැංකුව සමග එළඹුණු එ.ජ. ඩොලර් බිලියන 1.0ක ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම 2021 පෙබරවාරි සහ මාර්තු මාස වලදී අදියර දෙකකින් නැවත පියවීම සහ 2021 ජූලි මාසයේදී කල්පිරුණු එ.ජ. ඩොලර් බිලියන 1.0ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය පියවීම ඇතුළු රජය වෙනුවෙන් මහ බැංකුව විසින් සිදු කරන ලද විදේශ ණය සේවාකරණ ගෙවීම් ප්‍රධාන වශයෙන් හේතුවෙමින් 2021 වසර තුළදී මහ බැංකුවේ විදේශීය වත්කම් අඩු වූ අතර, මහ බැංකුවේ විදේශීය වගකීම් මෙම කාලසීමාව තුළදී ඉහළ ගියේය. මීට අමතරව, අත්‍යවශ්‍ය ආනයන සිදු කිරීම සඳහා පහසුකම් සැලසීමට මහ බැංකුව සිය ජාත්‍යන්තර සංචිත කළඹෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත විදේශ විනිමය සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී.

පුළුල් මුදල් සැපයුම (M_{2b}) ප්‍රසාරණය වීමේ බලපෑම ඉක්මවා යමින් සංචිත මුදල් සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීමේ ප්‍රතිඵලයක් ලෙස සංචිත මුදල් සහ පුළුල් මුදල් සැපයුම අතර සම්බන්ධය පෙන්නුම් කරනු ලබන මුදල් ගුණකය 2021 වසර තුළදී අඩු විය. ඒ අනුව, පුළුල් මුදල් සැපයුම (M_{2b}) මත පදනම් වන මුදල් ගුණකය 2020 වසර අවසානයේදී වාර්තා කළ 9.75 සිට 2021 වසර අවසානය වන විට 8.15 දක්වා අඩු විය. මේ අතර, ව්‍යවහාර මුදල් හා තැන්පතු අතර අනුපාතය 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 7.3 සිට 2021 වසර අවසානය වන විට සියයට 8.0 දක්වා වැඩි වූ අතර, මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු පෙර වසරට සාපේක්ෂව අඩු වේගයකින් ඉහළ ගියේය.

පුළුල් මුදල් (M_{2b}) සැපයුම සහ දේශීය ණය

දේශීය ණය අඛණ්ඩව ප්‍රසාරණය වුවද බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පහළ යෑම හේතුවෙන් 2021 වසර අවසානය වන විට පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය මන්දගාමී විය. ඒ අනුව, පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2020 වසර අවසානයේදී වාර්තා වූ සියයට 23.4 හා සැසඳීමේදී, 2021 වසර අවසානය වන විට සියයට 13.2ක් දක්වා මන්දගාමී විය. සමස්ත පුළුල් මුදල් සැපයුම 2020 වසර අවසානයේදී පැවති රුපියල් බිලියන 9,405.7 සිට 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 10,647.3ක් දක්වා රුපියල් බිලියන 1,241.6කින් ඉහළ ගියේය. පුළුල් මුදල් සැපයුමෙහි ප්‍රසාරණයට දායක වෙමින්, ප්‍රධාන වශයෙන් දේශීය ණය ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස 2021 වසර තුළදී බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් රුපියල් බිලියන 2,014.1කින් වැඩි වූ අතර, බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් වසර තුළදී රුපියල් බිලියන 772.5කින් අඩු විය.

පුළුල් මුදල් සැපයුමෙහි වගකීම් අංශයට අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවත්වාගෙන යනු ලබන මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු ඉහළ යෑම 2021 වසරේදී පුළුල් මුදල් සැපයුම ප්‍රසාරණය වීමට වැඩි වශයෙන් දායක වුවද, පෙර වසරට සාපේක්ෂව මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු ඉහළ යෑමෙහි අඩු වීමක් නිරීක්ෂණය විය. පුළුල් මුදල් සැපයුමෙහි ප්‍රසාරණයට සියයට 77ක පමණ දායකත්වයක් ලබා දෙමින්, බලපත්‍රලාභී වාණිජ බැංකුවල පවත්වා ගෙන යනු ලබන මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතුවල 2020 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 1,469.9ක සැලකිය යුතු ඉහළ යෑමට සාපේක්ෂව, 2021 වසර තුළදී රුපියල් බිලියන 958.8කින් ඉහළ ගියේය. වෙළඳපොළ තැන්පතු පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වීම 2021

7

7.5 සංඛ්‍යා සටහන

සංචිත මුදල් සහ පුළුල් මුදල් (M_{2b}) සැපයුමෙහි වත්කම් අංශය

රුපියල් බිලියන

අයිතමය	2020 අවසානයට	2021 අවසානයට (අ)	වෙනස			
			2020		2021	
			ප්‍රමාණය	%	ප්‍රමාණය	%
සංචිත මුදල්	**964.4**	**1,305.8**	**31.8**	**3.4**	**341.4**	**35.4**
මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්	526.8	-387.3	-369.2	-41.2	-914.0	-173.5
මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම්	437.7	1,693.1	401.1	1,095.6	1,255.4	286.8
රජයට ලබා දුන් ශුද්ධ ණය	868.9	2,094.1	505.9	139.3	1,225.2	141.0
වාණිජ බැංකුවලට ලබා දුන් ණය	114.5	143.2	112.7	6,181.0	28.7	25.1
අනෙකුත් අයිතම (ශුද්ධ) (ආ)	-545.7	-544.2	-217.5	-66.2	1.5	0.3
පුළුල් මුදල් (M_{2b})	**9,405.7**	**10,647.3**	**1,781.6**	**23.4**	**1,241.6**	**13.2**
ශුද්ධ විදේශීය වත්කම්	-209.5	-982.0	-310.2	-308.0	-772.5	-368.8
මුදල් අධිකාරීන් (ඇ)	526.8	-387.3	-369.2	-41.2	-914.0	-173.5
වාණිජ බැංකු	-736.2	-594.7	59.0	7.4	141.5	19.2
ශුද්ධ දේශීය වත්කම්	9,615.2	11,629.3	2,091.8	27.8	2,014.1	20.9
දේශීය ණය	11,721.2	14,002.0	2,310.4	24.6	2,280.8	19.5
රජයට ලබා දුන් ශුද්ධ ණය	4,548.1	5,832.4	1,752.1	62.7	1,284.4	28.2
මහ බැංකුව	868.9	2,094.1	505.9	139.3	1,225.2	141.0
වාණිජ බැංකු	3,679.2	3,738.3	1,246.3	51.2	59.2	1.6
රාජ්‍ය සංස්ථාවලට/රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය	1,002.2	1,188.1	184.2	22.5	185.9	18.6
පෞද්ගලික අංශයට ලබා දුන් ණය	6,170.9	6,981.4	374.1	6.5	810.5	13.1
අනෙකුත් අයිතම (ශුද්ධ) (ආ)	-2,106.0	-2,372.7	-218.7	-11.6	-266.7	-12.7

(අ) තාවකාලික
(ආ) අනෙකුත් අයිතම වත්කම් සහ අනෙකුත් අයිතම වගකීම් අතර වෙනස මගින් ගණනය කරනු ලැබේ.
(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් මෙන්ම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලබන රජයේ රන් පවුම් ශේෂය ද මෙහි අන්තර්ගත වේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

වසර තුළදී කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු සඳහා අරමුදල් යෙදවීම අඩු මට්ටමක පැවතීමට හේතු වූ අතර, එමගින් බලපත්‍රලාභී වාණිජ බැංකු සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතුවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2020 වසර අවසානයේදී පැවති සියයට 21.7ට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 11.7ක් දක්වා මන්දගාමී විය. මේ අතර, 2021 වසර තුළදී වසංගතය ආශ්‍රිතව අවිනිශ්චිතතා යළි ඇති වීමත් සමග, ඉල්ලුම් තැන්පතු සහ මහජනයා සතු ව්‍යවහාර මුදල් (M_1, පටු මුදල් සැපයුම පිළිබිඹු කරන), 2020 වසරේදී වූ රුපියල් බිලියන 311.7ක ඉහළ යෑමට සාපේක්ෂව 2021 වසර තුළදී රුපියල් බිලියන 282.7කින් ඉහළ ගියේය. ඒ අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත M_1 පටු මුදල් සැපයුමෙහි වර්ධනය 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 36.0ක සැලකිය යුතු වර්ධනයට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 24.0 දක්වා මන්දගාමී විය.

7.12 රූප සටහන

පුළුල් මුදල්වල (M_{2b}) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස සඳහා තුඩු දුන් සාධක (වත්කම් අනුව)



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

පුළුල් මුදල් සැපයුමෙහි වත්කම් අංශය සලකා බැලීමේදී, 2020 වසර තුළදී පෙන්නුම් කළ ප්‍රවණතාව අඛණ්ඩව පිළිබිඹු කරමින්, බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම්වල ඉහළ යෑමක් නිරීක්ෂණය වුවද, මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් 2021 වසර තුළදී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් අඩු විය. දේශීය බැංකු ඒකක සහ අක්වෙරළ බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑමත් සමග බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් 2020 වසරේදී වාර්තා වූ රුපියල් බිලියන 59.0ක ඉහළ යෑම අභිබවා

7

යමින්, 2021 වසර තුළදී රුපියල් බිලියන 141.5කින් ඉහළ ගියේය. අනේවාසිකයන් සතු තැන්පතු වගකීම් ලෙස විදේශ ව්‍යවහාර මුදල් වගකීම් ඉහළ ගියද, ප්‍රධාන වශයෙන් විදේශ බැංකු සමග විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන්, දේශීය බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 45.6කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ආකාරයෙන් ලද අරමුදල් බැංකු පද්ධතියට පරිවර්තනය කිරීම අවම වීම මගින් 2021 වසර තුළදී දේශීය බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑමට පැවති හැකියාව සීමා විය. මේ අතර, විදේශීය ණය ගැනීම්වල සැලකිය යුතු පහත වැටීම මෙන්ම අනේවාසිකයන් වෙත ණය දීම ඉහළ යෑම හේතුවෙන් අක්වෙරළ බැංකු ඒකකවල ශුද්ධ විදේශීය වත්කම් ද 2021 වසර තුළදී රුපියල් බිලියන 95.9කින් ඉහළ ගියේය.

බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම්, රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයම වෙත ලබා දුන් ණය ඉහළ යෑම හේතුවෙන්, 2021 වසර තුළ දී සැලකිය යුතු ලෙස අඛණ්ඩව ඉහළ ගියේය. විදේශ මූල්‍යනය සඳහා ප්‍රවේශය සීමා වීම සහ රජයේ ආදායම පහත වැටීම මධ්‍යයේ, රජයේ ඉහළ ගිය අරමුදල් අවශ්‍යතාව දේශීය බැංකු පද්ධතියෙන්, විශේෂයෙන්ම මහ බැංකුවෙන්, විශාල වශයෙන් සපුරා ගන්නා ලදී. 2020 වසරේදී දක්නට ලැබුණු ප්‍රවණතාව අඛණ්ඩව පෙන්නුම් කරමින්, බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය 2021 වසර තුළදී රුපියල් බිලියන 1,284.4කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ඉන් සියයට 95ක පමණ දායකත්වයක් මහ බැංකුව විසින් සපයන ලදී. ඒ අනුව, 2021 වසර තුළදී මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 1,225.2කින් ඉහළ ගියේය. මේ අතර, 2021 වසර සඳහා සංශෝධිත අයවැය ඇස්තමේන්තු අනුව රජය විසින් අත්තිකාරම් ආපසු ගෙවීමත් සමග, මහ බැංකුව විසින් රජයට ලබා දුන් තාවකාලික අත්තිකාරම් 2021 වසරේ මුල් කාලයේදී වාර්තා වූ රුපියල් බිලියන 198.2 සිට 2021 දෙසැම්බර් මාසයේදී රුපියල් බිලියන 150.1ක් දක්වා පහළ ගියේය. මේ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය 2020 වසරේ රුපියල් බිලියන 1,246.3ක සැලකිය යුතු ඉහළ යෑමට සාපේක්ෂව 2021 වසරේදී රුපියල් බිලියන 59.2කින් ඉහළ ගියේය. මේ සඳහා වසර තුළදී දේශීය බැංකු ඒකක විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ඉහළ යෑම මුළුමනින්ම හේතු වූ අතර, අක්වෙරළ බැංකු ඒකක විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රමාණය සංකෝචනය විය. ඒ අනුව, දේශීය බැංකු ඒකක විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය ප්‍රධාන වශයෙන් දිගු කාලීන රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම මෙන්ම රාජ්‍ය බැංකුවල රජයේ අයිරා ශේෂයන් ඉහළ යෑම හේතුවෙන් රුපියල් බිලියන 157.6කින් ඉහළ ගියේය. රජය වෙත ලබා දුන් සෘජු විදේශ විනිමය ණය අඩු වීම, බලපත්‍රලාභී වාණිජ බැංකු සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල් පිරීම් සහ බැංකු පද්ධතිය තුළ සීමිත විදේශ විනිමය පැවතීම මධ්‍යයේ කල් පිරීමෙන් පසු ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර තුළ නැවත ආයෝජනය කිරීමට ඇති කැමැත්ත අඩු වීම හේතුවෙන් අක්වෙරළ බැංකු ඒකක විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 22.3ක ඉහළ යෑමට සාපේක්ෂව 2021 වසරේදී රුපියල් බිලියන 98.5කින් පහළ ගියේය.

7.13 රූප සටහන
දේශීය ණයෙහි වාර්ෂික ඉහළ යෑම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දුර්වල මූල්‍ය තත්ත්වය සහ දිගු කාලීනව පවතින ගැටලු පිළිබිඹු කරමින්, රජය සතු වාණිජ ව්‍යාපාර, බැංකු පද්ධතිය වෙතින් ලබා ගත් ණය 2021 වසර තුළදී අඛණ්ඩව ඉහළ ගියේය. ඒ අනුව, බැංකු පද්ධතිය වෙතින් රජය සතු වාණිජ ව්‍යාපාර ලබා ගත් ණය 2020 වසරේදී වූ රුපියල් බිලියන 184.2ක ඉහළ යෑමෙන් අනතුරුව 2021 වසරේදී රුපියල් බිලියන 185.9කින් ඉහළ ගියේය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් සිදු කළ බැංකු ණය ගැනීම් රුපියල් බිලියන 123.5කින් ඉහළ යෑම 2021 වසරේදී රජය සතු වාණිජ ව්‍යාපාර විසින් ලබා ගත් ණය ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් 2021 වසර තුළදී සිදු කළ බැංකු ණය ගැනීම් රුපියල් බිලියන 24.5කින් ඉහළ ගිය අතර වසංගතය හා සම්බන්ධ සෞඛ්‍ය වියදම් සඳහා පහසුකම් සැලසීම හේතුවෙන් ඉහළ ගිය මූල්‍යන අවශ්‍යතා පිළිබිඹු කරමින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ලබා ගත් ණය රුපියල් බිලියන 14.6කින් ඉහළ ගියේය. මීට අමතරව,

2021 වසර තුළදී ලංකා පොහොර සංස්ථාව, සමූපකාර තොග වෙළඳ සංස්ථාව, ශ්‍රීලන්කන් ගුවන් සේවය, ජාතික ජලසම්පාදන සහ ජලාපවහන මණ්ඩලය සහ ලංකා විදුලිබල මණ්ඩලය විසින් ලබා ගත් ණය ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, වී අලෙවි මණ්ඩලය සහ නාගරික සංවර්ධනය අධිකාරිය විසින් වසර තුළදී ඒවායේ ණය වගකීම් ශුද්ධ පදනම මත බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නැවත පියවා ඇත.

අඩු පොලී අනුපාතික පැවති වාතාවරණයක සහායයෙන් සහ ආර්ථික ක්‍රියාකාරකම් වැඩි දියුණු වීම පිළිබිඹු කරමින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය 2021 වසර තුළදී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය 2020 වසරේදී වූ රුපියල් බිලියන 374.1ක ඉහළ යෑමට සාපේක්ෂව 2021 වසරේදී රුපියල් බිලියන 810.5කින් ඉහළ ගියේය. ලිහිල් මුදල් තත්ත්වයේ සහායයෙන්, 2021 අගෝස්තු මාසය තෙක් ක්‍රමානුකූලව වර්ධනය වූ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය එම කාලය තුළදී රුපියල් බිලියන 624.6කින් ඉහළ ගියේය. 2021 වසර අවසානයේදී වෙළඳපොළ තුළ පැවති දැඩි මුදල් සහ ද්‍රවශීල තත්ත්වයෙහි බලපෑම පිළිබිඹු කරමින්, පෞද්ගලික අංශයට සපයන ලද ණය වර්ධනයෙහි යම් මන්දගාමී වීමක් පසුව දක්නට ලැබුණි. කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ලබා දුන් ණය සහන දීර්ඝ කිරීම සමග සිදු වන ණය ප්‍රාග්ධනීකරණය මෙන්ම, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශ වෙත ණය ප්‍රවාහ වර්ධනය කිරීම සඳහා 2021 අප්‍රේල් මාසයේදී බලපත්‍රලාභී බැංකු සඳහා පනවන ලද ප්‍රමුඛ අංශ සඳහා ණය ලබාදීමේ ඉලක්ක ද වසර තුළදී ණය වර්ධනය සඳහා දායක වී ඇත. 2020 වසර අවසානය වන විට සියයට 6.5ක පැවති පෞද්ගලික අංශයට සපයන ලද ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2021 අගෝස්තු මාසය වන විට සියයට 15.1ක් දක්වා වැඩි වූ අතර 2021 වසර අවසානය වනවිට සියයට 13.1ක් දක්වා මන්දගාමී විය.

7.14 රූප සටහන
වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණයට අනුව, 2021 වසර අවසානය වන විට පෞද්ගලික ණය සහ අත්තිකාරම් වර්ධනයේ යම් මන්දගාමී වීමක් දක්නට ලැබුන ද, ආර්ථික කටයුතු වැඩි දියුණු වීම පිළිබිඹු කරමින් ප්‍රධාන ආර්ථික අංශ වෙත සපයන ලද ණය වර්ධනය 2021 වසර තුළදී ක්‍රමයෙන් ඉහළ ගියේය. සමස්තයක් ලෙස, 2021 වසර තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය ප්‍රසාරණය කෙරෙහි කර්මාන්ත (රුපියල් බිලියන 340.4කින්) සහ සේවා (රුපියල් බිලියන 259.3කින්) අංශ වෙත සපයන ලද ණයෙහි ඉහළ යෑම, පිළිවෙළින්, සියයට 43කින් සහ සියයට 33කින් පමණ දායක වී ඇති අතර, කෘෂිකාර්මික සහ ධීවර (රුපියල් බිලියන 53.9කින්) අංශ වෙත සපයන ලද ණය මෙන්ම පෞද්ගලික ණය සහ අත්තිකාරම් (රුපියල් බිලියන 130.1කින්) ලෙස ලබා දුන් ණය ඉහළ යෑම, පිළිවෙළින්, සියයට 7කින් සහ සියයට 17කින් පමණ දායක වී ඇත. එක් එක් අංශයේ කාර්යසාධනය සැලකීමේදී, කෘෂිකාර්මික සහ ධීවර අංශය වෙත සපයන ලද ණය 2020 වසර අවසානය වන විට වාර්තා කරන ලද සියයට 3.9ක අඩු වර්ධනය හා සැසඳීමේදී 2021 වසර අවසානය වන විට සියයට 11.0ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. මෙම අංශය තුළ, වී, රබර්, පොල්, එළවළු, පලතුරු සහ සුළු ආහාර භෝග, සහ ධීවර යන උප අංශ වෙත ණය ගලා යෑම 2021 වසර තුළදී ඉහළ ගොස් ඇති අතර, වසර තුළදී තේ උප අංශයට සපයන ලද ණය සුළු වශයෙන් පහළ ගොස් ඇත. මේ අතර, බොහෝ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් වීම පිළිඹිබු කරමින්, බොහෝ උප අංශ වෙත ණය ගලායෑම වේගවත් වීම හේතුවෙන් 2021 වසර තුළදී කර්මාන්ත සහ සේවා අංශ කටයුතු වර්ධනය වී ඇත. ඒ අනුව, කර්මාන්ත අංශය වෙත සපයන ලද වාර්ෂික ලක්ෂ්‍යමය ණය වර්ධනය 2020 වසර අවසානයේදී පැවති සියයට 4.7 සිට 2021 වසර අවසානය වන විට සියයට 13.4ක් දක්වා ඉහළ ගියේය. කර්මාන්ත අංශය වෙත වූ සමස්ත ණය ගලයෑමෙන් සියයට 54ක් පමණ වන ඉදිකිරීම් අංශය වෙත සපයන ලද ණය, වාර්ෂික

7

ලක්ෂ්‍යමය පදනම මත, 2021 වසර අවසානය වන විට සියයට 14.5ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. රෙදිපිළි හා ඇඟලුම් මෙන්ම ආහාර සහ පාන වර්ග යන අනෙකුත් උප අංශ සඳහා සපයන ලද ණය ද 2021 වසර අවසානය වන විට සැලකිය යුතු ලෙස වර්ධනය විය. සේවා අංශය වෙත සපයන ලද වාර්ෂික ලක්ෂ්‍යමය ණය වර්ධනය 2020 වසර අවසානයේදී වාර්තා වූ සියයට 1.4 හා සැසඳීමේදී 2021 වසර අවසානය වන විට සියයට 15.1ක් දක්වා ඉහළ ගියේය. සේවා අංශය තුළ, වෙළෙඳාම් ආශ්‍රිත කටයුතුවල වැඩි දියුණු වීම පිළිබිඹු කරමින්, තොග සහ සිල්ලර යන උප අංශය වෙත සපයන ලද වාර්ෂික ලක්ෂ්‍යමය ණය වර්ධනය 2020 වසර අවසානයේදී වාර්තා වූ සුළු පහළ යෑම හා සැසඳීමේදී 2021 වසර අවසානය වන විට සියයට 9.6කින් වර්ධනය විය. වසංගතය හමුවේ සංචාරක කර්මාන්තය ඉහළ නැංවීම සඳහා දීර්ඝ කරන ලද ණය සහන පහසුකම් සැලසීම සහ ක්‍රියාත්මක කරනු ලැබූ අනෙකුත් ක්‍රියාමාර්ග මෙන්ම එම කර්මාන්තය යථා තත්ත්වයට පත්වීම මධ්‍යයේ එම අංශය වෙත ලබා දුන් ණය ඉහළ යෑම පිළිබිඹු කරමින් සංචාරක උප අංශය

7.15 රූප සටහන

ප්‍රධාන අංශවලට ලබා දුන් පෞද්ගලික අංශයේ ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය (සියයට)



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

වෙත සපයන ලද ණය සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වූ අතර 2021 වසර අවසානය වන විට සියයට 10.1ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. තවද, සේවා අංශයේ ණය ඉහළ යෑමට මූල්‍ය සහ ව්‍යාපාරික සේවා සහ ප්‍රවාහන උප අංශ වෙත ණය ලබා දීම ද

7.6 සංඛ්‍යා සටහන

වාණිජ බැංකු විසින් ලබා දුන් ණය සහ අත්තිකාරම්හි ආංශික වර්ගීකරණය (අ) (ආ)

රුපියල් බිලියන

අංශය	2020 අවසානයට	2021 අවසානයට (ඇ)	2021 දායකත්වය (%)	2021 ප්‍රතිශතක වෙනස
කෘෂිකාර්මික සහ ධීවර	**489.7**	**543.6**	**7.6**	**11.0**
එයින්, තේ	102.0	101.2	1.4	-0.8
රබර්	30.8	41.4	0.6	34.4
පොල්	27.8	33.7	0.5	21.2
වී	38.6	44.4	0.6	15.3
එළවළු, පලතුරු සහ සුළු ආහාර භෝග	29.2	30.9	0.4	5.8
ධීවර	20.5	24.0	0.3	17.0
කර්මාන්ත	**2,540.1**	**2,880.5**	**40.2**	**13.4**
එයින්, ඉදිකිරීම්	1,348.6	1,544.7	21.6	14.5
ආහාර සහ පාන වර්ග	148.3	174.7	2.4	17.8
රෙදිපිළි සහ ඇඟලුම්	235.1	273.1	3.8	16.1
සකස්කළ ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර-සූත්‍ර සහ ප්‍රවාහන උපකරණ	132.9	152.8	2.1	14.9
සේවා	**1,716.7**	**1,976.0**	**27.6**	**15.1**
එයින්, තොග සහ සිල්ලර වෙළෙඳාම	501.8	549.8	7.7	9.6
සංචාරක ව්‍යාපාරය	261.7	288.2	4.0	10.1
මූල්‍ය සහ ව්‍යාපාරික සේවා	350.1	437.2	6.1	24.9
නාවික, ගුවන් සහ භාණ්ඩ නිෂ්කාශනය	21.6	30.3	0.4	40.1
පෞද්ගලික ණය සහ අත්තිකාරම් (ඈ)	**1,632.1**	**1,762.2**	**24.6**	**8.0**
එයින්, කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ	330.8	375.0	5.2	13.3
උකස් ණය	248.7	294.9	4.1	18.6
ණය කාඩ්පත්	127.8	143.1	2.0	12.0
එකතුව (ඉ)	**6,378.6**	**7,162.3**	**100.0**	**12.3**

(අ) වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම් වේ.
(ආ) ණය සහ අත්තිකාරම්වලට අයිරා සහ වට්ටම් කළ බිල්පත් ඇතුළත් වන අතර එකතු වෙමින් පවත්නා මුදල් ශීර්ෂ ඇතුළත් නොවේ.
(ඇ) තාවකාලික
(ඈ) 'කර්මාන්ත' යටතේ වර්ගීකරණය කර ඇති 'ඉදිකිරීම්' කාණ්ඩයට අයත්වන පෞද්ගලික නිවාස ණය ඉවත්කර ඇති අතර ආරක්ෂණ ජාල ආශ්‍රිත ණය ක්‍රම මඟින් ලබාදෙන ණය ඇතුළත් වේ.
(ඉ) ගණනය කිරීමේ ක්‍රමවේදයන්හි වෙනස්කම් හේතුවෙන්, කාර්තුමය සමීක්ෂණයට අනුව පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය, මුදල් සමීක්ෂණයේ ඇති එම අගයට වඩා වෙනස් වේ.

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

7.7 සංඛ්‍යා සටහන

වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් සමස්ත ණය ශේෂයේ පරිණත කාල පිළිබඳ විශ්ලේෂණය (අ) (ආ)

අංශය	පරිණත කාලය	දෙසැම්බර් 2020		දෙසැම්බර් 2021 (ඇ)	
		දායකත්වය (%)	වර්ධනය (%)	දායකත්වය (%)	වර්ධනය (%)
කෘෂිකාර්මික සහ ධීවර	කෙටි කාලීන	4.5	-1.7	4.6	14.6
	මැදි කාලීන	1.7	-5.3	1.6	9.2
	දිගු කාලීන	1.5	44.0	1.4	2.4
කර්මාන්ත	කෙටි කාලීන	11.5	-9.2	12.3	19.7
	මැදි කාලීන	8.5	0.1	8.4	10.8
	දිගු කාලීන	19.8	17.4	19.5	10.8
සේවා	කෙටි කාලීන	8.6	-12.6	9.2	19.9
	මැදි කාලීන	9.1	4.3	8.7	8.1
	දිගු කාලීන	9.2	15.6	9.6	17.5
පෞද්ගලික ණය සහ අත්තිකාරම්	කෙටි කාලීන	9.2	-3.6	9.7	17.3
	මැදි කාලීන	5.5	10.4	5.0	1.6
	දිගු කාලීන	10.8	41.5	10.0	3.2
එකතුව	කෙටි කාලීන	33.9	-7.7	35.7	18.4
	මැදි කාලීන	24.8	3.4 (ඈ)	23.8	6.0
	දිගු කාලීන	41.3	23.3	40.5	10.0

(අ) වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත පදනම් වේ.
(ආ) මූලික කල්පිරීම පදනම් කරගනිමින් ණය වර්ගීකරණය සිදුකර ඇති අතර එය වසරකට වඩා අඩු - කෙටි කාලීන, වසර 1-5 අතර - මැදි කාලීන හා වසර පහකට වඩා වැඩි - දිගු කාලීන වශයෙන් දක්වා ඇත.
(ඇ) තාවකාලික
(ඈ) සංශෝධිත

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සහාය වී ඇත. පෞද්ගලික ණය සහ අත්තිකාරම් ලෙස ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2020 වසර අවසානයේදී පැවති සියයට 15.1 හා සැසඳීමේදී 2021 වසර අවසානය වන විට සියයට 8.0කින් මන්දගාමී ලෙස වර්ධනය විය. එම මන්දගාමී ණය ප්‍රසාරණයට දායක වෙමින්, කල්පවත්නා පාරිභෝගික භාණ්ඩ යටතේ ලබා දුන් ණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2020 වසර අවසානයේ පැවති සියයට 38.4ක සැලකිය යුතු වර්ධනය හා සැසඳීමේදී 2021 වසර අවසානය වන විට සියයට 13.3ක් දක්වා මන්දගාමී විය. ඉහළ යන ලද රන් මිල මෙන්ම මූල්‍යනයේ ඇති වූ බාධා හමුවේ උකස් ආශ්‍රිත අත්තිකාරම් වෙත වූ ඉහළ ඉල්ලුම පිළිබිඹු කරමින් උකස් ආශ්‍රිත අත්තිකාරම් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2021 වසර අවසානය වන විට සියයට 18.6ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ණය කාඩ්පත් අත්තිකාරම් ද 2020 වසර අවසානයේදී වූ සියයට 2.5ක පහළ යෑම හා සැසඳීමේදී 2021 වසර අවසානය වන විට වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 12.0කින් ඉහළ ගියේය. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද සමස්ත ණය ශේෂයේ පරිණත කාලය පිළිබඳව සැලකීමේදී කෙටි හා මැදි කාලීන ණයෙහි ඉහළ යෑමක් දක්නට ලැබූ අතර වසර අවසානයේ පැවති දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබිඹු කරමින් දිගු කාලීන ණය පහසුකම්වල මන්දගාමී වීමක් දක්නට ලැබුණි.

පුළුල් මුදල් සැපයුම (M_4)

M_{2b} පුළුල් මුදල් සැපයුමෙහි ප්‍රවණතාව අනුගමනය කරමින්, මූල්‍ය සමීක්ෂණය[12] මගින් මනිනු ලබන පුළුල් මුදල් සැපයුමේ (M_4) වර්ධනය 2021 වසර අවසානය වන විට අඩු විය. M_4 පුළුල් මුදල් සැපයුමෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2020 වසර අවසානයේදී වාර්තා වූ සියයට 21.4 සිට 2021 වසර අවසානය වන විට සියයට 13.3ක් දක්වා ක්‍රමයෙන් පහළ ගියේය. වත්කම් අංශය අනුව සලකා බැලීමේදී, 2021 වසර තුළදී M_4 පුළුල් මුදල් සැපයුමේ ප්‍රසාරණය සඳහා ශුද්ධ දේශීය වත්කම් ඉහළ යෑම මුළුමනින්ම දායක වී ඇති අතර එහි බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් සපයන ලද දේශීය ණය රුපියල් බිලියන 259.6කින් සහ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් සපයන ලද දේශීය ණය රුපියල් බිලියන 103.6කින් ඉහළ ගියේය. M_4 පුළුල් මුදල් සැපයුමට අනුව 2021 වසර තුළදී රජයට ලබා දුන් සමස්ත ශුද්ධ ණයෙහි වැඩි වීම රුපියල් බිලියන 1,403.6ක් වූ අතර ඉන් රුපියල් බිලියන 102.3ක් බලපත්‍රලාභී විශේෂිත බැංකුවලින් ද, රුපියල් බිලියන 16.9ක් බලපත්‍රලාභී මුදල් සමාගම් මගින් ද ලබා දෙන ලදී. තවද, අඩු පොලී අනුපාතික වාතාවරණයක් පැවතීම හේතුවෙන් බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්

12 මූල්‍ය සමීක්ෂණය ද්‍රවශීලතාව පිළිබඳ වඩාත් පුළුල් මිනුමක් වන අතර එයට ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු මෙන්ම බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් ද ඇතුළුව සියලුම තැන්පතු බාරගන්නා ආයතන ආවරණය කරනු ලබයි.

විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2020 වසරේදී වාර්තා වූ සියයට 6.3ක වර්ධනයට සාපේක්ෂව, 2021 වසර තුළදී සියයට 12.7කින් වර්ධනය විය. බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2021 වසරේදී රුපියල් බිලියන 157.3කින් ඉහළ ගිය අතර වසර අවසානයේදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 16.8ක වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2021 වසරේදී රුපියල් බිලියන 86.7කින් ඉහළ ගිය අතර වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 7.4ක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, M_4 පුළුල් මුදල් සැපයුමෙහි සමස්ත ශුද්ධ විදේශීය වත්කම් 2021 වසර තුළදී රුපියල් බිලියන 781.5කින් අඩු වූ අතර විදේශීය වගකීම් ඉහළ යෑම හේතුවෙන් බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 9.0කින් අඩු විය.

M_4 පුළුල් මුදල් සැපයුමෙහි වගකීම් අංශය අනුව, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් වෙතැති මහජනයා සතු කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතුවල වර්ධනය 2021 වසර අවසානය වන විට

7.16 රූප සටහන

මුදල් සමස්තවල වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අඩු විය. ඒ අනුව, M_4 පුළුල් මුදල් සැපයුමට අනුව, කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතුවල වර්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2020 වසර අවසානයේදී වාර්තා වූ සියයට 20.0ට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 11.6ක් දක්වා මන්දගාමී විය. බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු, වාර්ෂික

7.8 සංඛ්‍යා සටහන

පුළුල් මුදල් (M_4) සැපයුමෙහි වත්කම් අංශය
(මූල්‍ය සමීක්ෂණය අනුව ගණනය කරන ලදී)

රුපියල් බිලියන

අයිතමය	2020 අවසානයට	2021 අවසානයට (අ)	වෙනස 2020 ප්‍රමාණය	2020 %	2021 ප්‍රමාණය	2021 %
පුළුල් මුදල් (M_4)	**11,461.9**	**12,985.4**	**2,017.4**	**21.4**	**1,523.5**	**13.3**
තුඩුදුන් සාධක						
ශුද්ධ විදේශීය වත්කම්	**-217.1**	**-998.6**	**-305.9**	**-344.6**	**-781.5**	**-360.0**
මුදල් අධිකාරීන් (ආ)	526.8	-387.3	-369.2	-41.2	-914.0	-173.5
බලපත්‍රලාභී වාණිජ බැංකු	-736.2	-594.7	59.0	7.4	141.5	19.2
බලපත්‍රලාභී විශේෂිත බැංකු	-7.6	-16.6	4.3	36.0	-9.0	-117.9
ශුද්ධ දේශීය වත්කම්	**11,679.0**	**13,984.0**	**2,323.2**	**24.8**	**2,305.0**	**19.7**
දේශීය ණය	**14,652.4**	**17,296.4**	**2,558.3**	**21.2**	**2643.9**	**18.0**
රජයට ලබා දුන් ශුද්ධ ණය	**5,365.7**	**6,769.3**	**1,882.8**	**54.1**	**1,403.6**	**26.2**
මහ බැංකුව	868.9	2,094.1	505.9	139.3	1,225.2	141.0
බලපත්‍රලාභී වාණිජ බැංකු	3,679.2	3,738.3	1,246.3	51.2	59.2	1.6
බලපත්‍රලාභී විශේෂිත බැංකු	742.2	844.5	128.4	20.9	102.3	13.8
බලපත්‍රලාභී මුදල් සමාගම්	75.5	92.4	2.3	3.1	16.9	22.4
රාජ්‍ය සංස්ථාවලට/රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය (බලපත්‍රලාභී වාණිජ බැංකු)	**1,002.2**	**1,188.1**	**184.2**	**22.5**	**185.9**	**18.6**
පෞද්ගලික අංශයට ලබා දුන් ණය	**8,284.5**	**9,338.9**	**491.3**	**6.3**	**1,054.4**	**12.7**
බලපත්‍රලාභී වාණිජ බැංකු	6,170.9	6,981.4	374.1	6.5	810.5	13.1
බලපත්‍රලාභී විශේෂිත බැංකු	936.5	1,093.7	122.3	15.0	157.3	16.8
බලපත්‍රලාභී මුදල් සමාගම්	1,177.1	1263.8	-5.1	-0.4	86.7	7.4
අනෙකුත් අයිතම (ශුද්ධ) (ඇ)	**-2,973.4**	**-3,312.4**	**-235.1**	**-8.6**	**-339.0**	**-11.4**

(අ) තාවකාලික
(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් මෙන්ම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලබන රජයේ රන් පවුම් ශේෂය ද මෙහි අන්තර්ගත වේ.
(ඇ) අනෙකුත් වත්කම් සහ අනෙකුත් වගකීම් අතර වෙනස මගින් ගණනය කරනු ලැබේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ලක්ෂ්‍යමය පදනම මත, 2020 වසරේදී වාර්තා වූ සියයට 21.6ක වර්ධනයට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 13.5කින් වර්ධනය විය. කෙසේ වෙතත්, බලපත්‍රලාභී මුදල් සමාගම් වෙතැති කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතු, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 2020 වසරේදී වාර්තා වූ සියයට 0.7ක සුළු වශයෙන් සංකෝචනය වීමට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 5.5කින් පමණක් වර්ධනය විය. 2021 වසර තුළදී බැංකු අංශය විසින් පොලී සහිත තැන්පතු රැස් කිරීම මන්දගාමී වීම හේතුවෙන් M_4 පුළුල් මුදල් සැපයුමට අනුව කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතුවල සමස්ත වර්ධනය පහළ ගිය ද බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් රැස් කළ කාලීන සහ ඉතිරිකිරීමේ තැන්පතුවල යම් වර්ධනයක් නිරීක්ෂණය විය.

7

8

මූල්‍ය අංශයේ ක්‍රියාකාරීත්වය සහ පද්ධති ස්ථායීතාව

8.1 සමස්ත නිරීක්ෂණ

පුබල සාර්ව ආර්ථික අභියෝගතා මධ්‍යයේ වුව ද, 2021 වසර තුළ දී මූල්‍ය පද්ධතිය ස්ථාවරව පැවතුණි. ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂක පවත්වා ගෙන ගිය අතර බැංකු අංශයේ මූල්‍ය අතරමැදිකරණය සතුටුදායක තත්ත්වයක පැවතුණි. මීට අමතරව, 2021 වසර තුළ දී ශුද්ධ පොලී ආදායමෙහි සහ පොලී නොවන ආදායමෙහි සිදු වූ කැපී පෙනෙන වර්ධනයන් හේතුවෙන් මෙම අංශයේ ලාභදායීත්වය පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වුවද, රටේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ සිදු වූ පහත වැටීම් සහ රට තුළට විදේශ විනිමය ගලා ඒම් අඩුවීම හේතුවෙන් බැංකුවලට විදේශ මුදල් ද්‍රවශීලතා හිඟයකට මුහුණ දීමට සිදු විය. සමස්තයක් ලෙස, ණය වර්ධනය සහ ලාභදායීත්වය අනුව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්යසාධනය සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. මධ්‍ය කාලීනව, ශක්තිමත් සහ ස්ථාවර බලපත්‍රලාභී මුදල් සමාගම් ගොඩනැගීම සහ මෙම අංශයේ තැන්පත්කරුවන් ආරක්ෂා කිරීම සඳහා මූල්‍ය අංශය ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන සැලැස්ම ක්‍රියාවට නැංවීම 2021 වසර තුළ දී ක්‍රියාත්මක විය. තවද, නව සාමාන්‍යකරණයට අනුගත වීම සහතික කිරීමට සහ කොවිඩ්-19 වසංගත තත්ත්වයේ බලපෑමට ලක් වූ ආර්ථිකයට අඛණ්ඩව සහාය ලබා දීම සඳහා සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී මහ බැංකුව සිය විෂය පථය යටතේ පවතින මූල්‍ය ආයතනවලට අදාළ රෙගුලාසි කිහිපයක් ලිහිල් කළේය. රක්ෂණ අංශය ද වත්කම් සහ දළ ලියාහළ වාරිකය අනුව ප්‍රසාරණයක් වාර්තා කළ අතර ලාභදායීත්වයේ සුළු සෘණාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. මේ අතර, 2021 වසර තුළ දී මූල්‍ය වෙළඳපොළ මිශ්‍ර කර්යසාධනයක් වාර්තා කරන ලදී. විදේශ ණය ආපසු ගෙවීමේ සහ මහ බැංකුවේ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙනස් වීමේ ප්‍රතිඵලයක් ලෙස 2021 වසරේ පළමු මාස හත තුළ දී අතිරික්ත මට්ටමක පැවති මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවය හිඟයක් බවට පත්විය. සංචාරක ව්‍යාපාරය යථා තත්ත්වයට පත්වීම මන්දගාමී වීම, ප්‍රේෂණ ඉපැයීම්වල අඩු වීම, අපනයන ආදායම්වල පරිවර්තනය මන්දගාමී වීම, ආනයන වියදම් වැඩි වීම සහ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම පහත වැටීම හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ ද්‍රවශීලතාවය දැඩි බලපෑමකට ලක්විය. 2021 වසරේ අවසාන භාගයේ රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි ප්‍රාථමික වෙන්දේසිවල දී ආයෝජකයින් කෙටි කාලීන භාණ්ඩාගාර බිල්පත් වෙත යොමු වීම දක්නට ලැබුණු අතර උපරිම ඵලදා අනුපාතික සීමා ඉවත් කිරීම සහ මහ බැංකුවේ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙනස් වීමත් සමඟ 2021 වසරේ දෙවන භාගයේ දී ද්විතීයික වෙළඳපොළ ඵලදා අනුපාතික වක්‍රය ඉහළට විතැන් විය. අඩු පොලී අනුපාත පරිසරයක් තුළ දේශීය ආයෝජකයන් කොටස් වෙළඳපොළ වෙත යොමු වීමත් සමඟ 2021 වසර තුළ දී කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව සීඝ්‍ර වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, රටේ පද්ධතිමය වශයෙන් වැදගත් වන ගෙවීම් සහ පියවීම් පද්ධතිය මහ බැංකුව විසින් සමීප නියාමනය සහ අධීක්ෂණය මගින් ඉහළ ඔරොත්තු දීමේ හැකියාවකින් යුතුව සුමටව ක්‍රියාත්මක කරන ලදී. තවද, නියාමන සහ අධීක්ෂණ රාමුව සඳහා ශක්තිමත් නෛතික පදනමක් ලබා දීමේ අරමුණ ඇතිව මහ බැංකුව ප්‍රධාන ව්‍යවස්ථාවන්ට නීති ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම අඛණ්ඩව සිදු කරන ලදී. මහ බැංකුවේ නියාමන හා අධීක්ෂණ බලතල වැඩි දියුණු කිරීම සඳහා 2021 වසරේ දී නව බැංකු පනත පිළබඳ දෙවන වටයේ සාකච්ඡා අවසන් කළ අතර 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතට සංශෝධන සකස් කරන ලදී.

8.1 සංඛ්‍යා සටහන

මූල්‍ය අංශයේ සමස්ත වත්කම්

ආයතනය	2020 (අ)		2021 (ආ)	
	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)
බැංකු අංශය	**17,087.9**	**72.9**	**19,969.9**	**74.7**
මහ බැංකුව	2,421.6	10.3	3,046.3	11.4
බලපත්‍රලාභී වාණිජ බැංකු	12,828.8	54.7	14,820.5	55.4
බලපත්‍රලාභී විශේෂිත බැංකු	1,837.5	7.8	2,103.0	7.9
තැන්පතු බාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන	**1,536.5**	**6.6**	**1,636.7**	**6.1**
බලපත්‍රලාභී මුදල් සමාගම්	1,367.9	5.8	1,452.0	5.4
සමූපකාර ග්‍රාමීය බැංකු (ඇ)	167.8	0.7	183.9	0.7
සඤසුරුවම් හා ණය ගනුදෙනු සමූපකාර සමිති	0.8	0.0	0.8	0.0
විශේෂිත මූල්‍ය ආයතන	**386.5**	**1.6**	**387.7**	**1.4**
විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්	33.7	0.1	35.7	0.1
බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්	6.6	0.0	8.4	0.0
ප්‍රාථමික අලෙවිකරුවන්	87.2	0.4	78.7	0.3
කොටස් තැරැව්කරුවන්	19.9	0.1	36.5	0.1
ඒකක භාර / ඒකක භාර කළමනාකරණ සමාගම්	204.0	0.9	198.5	0.7
වෙළඳපොළ අතරමැදියන් (ඈ)	18.0	0.1	11.8	0.0
ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම්	17.1	0.1	18.2	0.1
ගිවිසුම්ගත ඉතිරිකිරීම් ආයතන	**4,425.6**	**18.9**	**4,756.1**	**17.8**
රක්ෂණ සමාගම්	789.7	3.4	879.8	3.3
සේවක අර්ථසාධක අරමුදල	2,824.3	12.1	3,166.1	11.8
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල	376.6	1.6	419.1	1.6
අනුමත විශ්‍රාම සහ අර්ථසාධක අරමුදල්	364.9	1.6	207.6	0.8
රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල	70.1	0.3	83.5	0.3
එකතුව	**23,436.5**	**100.0**	**26,750.4**	**100.0**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) දත්ත නොමැතිකම හේතුවෙන්, 2021 අවසානයේ සමූපකාර ග්‍රාමීය බැංකුවල වත්කම් පදනම ලෙස එම වසරේ දෙවන කාර්තුවේ දත්ත යොදා ගෙන ඇත.
(ඈ) වෙළඳපොළ අතරමැදියන් ලෙස ලියාපදිංචි වී ඇති බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් හැර.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කම්කරු දෙපාර්තමේන්තුව
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය
සණස මහා සංගමය
ශ්‍රී ලංකා ඒකක භාර සංගමය
ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම්
සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

8.2 බැංකු අංශයේ කාර්යසාධනය

කොවිඩ්-19 වසංගතයෙන් සහ අනෙකුත් සාර්ව ආර්ථිකය සම්බන්ධ ගැටලු හේතුවෙන් පැන නැගුනු දැඩි අභියෝග මධ්‍යයේ වුව ද බැංකු අංශය, පෙර වසරට සාපේක්ෂව 2021 වසරේ දී ප්‍රමාණවත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ස්වාරක්ෂකයන් සමඟ මධ්‍යස්ථ වේගයකින් ප්‍රසාරණය වූ අතර ශක්තිමත්ව පැවතුණි. මහ බැංකුව විසින් ඇතැම් අංශ සඳහා හඳුන්වා දුන් අඛණ්ඩව ක්‍රියාත්මක වන ණය සහන සැලසීම සහ ක්‍රමිකව අහෝසි වන සහන මධ්‍යයේ වුව ද ප්‍රාග්ධනයට සහ ද්‍රවශීලතාවයට අදාළ අවම විචක්ෂණ අවශ්‍යතා සපුරාලීමට බැංකු අංශයට හැකි විය.

බැංකු අංශය, මූල්‍ය අංශයේ මූලිකත්වය දැරූ අතර 2021 වසර අවසන් වන විට මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් සියයට 63.3ක් බැංකු අංශය සතුවිය. පවතින වසංගත තත්ත්වය සහ සාර්ව ආර්ථිකය සම්බන්ධ ගැටලු හේතුවෙන් ඇති වූ අභියෝගාත්මක ආර්ථික වාතාවරණයක් මධ්‍යයේ වුව ද, 2021 වසර තුළ බැංකු අංශය විසින් පිළිගත හැකි ණය වර්ධනයක් පවත්වා ගෙන ගියේ ය. බැංකු අංශයට අරමුදල් සැපයීමේ ප්‍රධාන ප්‍රභවය වූයේ තැන්පතු වන අතර 2021 වසර තුළ රුපියල් ණය ගැනීම්වල කැපී පෙනෙන වැඩිවීමක් දක්නට ලැබුණි. කෙසේ වුව ද, විදේශ මූලාශ්‍රවලින් විදේශ ණය ලබා ගැනීම සඳහා ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහත වැටීම බලපාන ලදී. ශුද්ධ පොලී ආදායමේ සහ පොලී නොවන ආදායමේ ඇති වූ කැපී පෙනෙන වැඩිවීම හේතුවෙන් 2021 වසර තුළ බැංකු අංශයේ ලාභදායීත්වය පසුගිය වසරට සාපේක්ෂව සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය.

ව්‍යාපාර පුළුල් කිරීම: බැංකු අංශය 2021 වසර අවසන් වන විට බැංකු 30කින්, එනම් විදේශීය බැංකු ශාඛා 11 ද ඇතුළත්ව බලපත්‍රලාභී වාණිජ බැංකු 24කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6කින්, සමන්විත විය. බැංකු අංශය, එහි අතරමැදිකරණ භූමිකාව අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් මූල්‍ය අන්තර්ගතභාවය පහසු කිරීම සඳහා බැංකු ජාලය පුළුල් කරන ලදී. 2021 වසරේ දී වසංගතය හේතුවෙන් බැංකුවලට භෞතිකව ප්‍රවේශ වීම සීමා වීමත් සමඟ, බොහෝ බැංකු විසින් පාරිභෝගිකයින්ට ඔවුන්ගේ බැංකු අවශ්‍යතා සපුරා ගැනීම සඳහා තාක්ෂණය මත පදනම් වූ මංගත නිෂ්පාදන/සේවාවන් හඳුන්වා දෙන ලදී.

වත්කම්: බැංකු අංශයේ වත්කම් පදනම 2021 වසර තුළ රුපියල් ට්‍රිලියන 2.3කින් ඉහළ ගොස්, 2021 වසර අවසානය වන විට රුපියල් ට්‍රිලියන 16.9 ඉක්ම වූ අතර, එය 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 17.1ක වාර්ෂික වර්ධනයට සාපේක්ෂව සියයට 15.4ක වර්ධනයකි. එම වත්කම් වර්ධනය ප්‍රධාන වශයෙන් ණය හා අත්තිකාරම් සහ ආයෝජන මගින් මෙහෙයවනු ලැබීය. ණය හා අත්තිකාරම්වල වර්ධනය 2020 වසරේ දී සියයට 11.9ක සිට 2021 වසරේ දී සියයට 15.3ක් දක්වා ඉහළ යන ලදී. 2021 වසර තුළ සිදු වූ ණය කළඹෙහි වර්ධනයෙන් දළ වශයෙන් සියයට 92.2කට හේතු වී ඇත්තේ රුපියල් ණය ඉහළ යාමයි. ණය ගලා යෑම ආර්ථිකයේ ප්‍රධාන අංශ හරහා විවිධාංගීකරණය විය. ණය වර්ග වශයෙන් ගත් කළ බැංකු අයිරා (සියයට 40.7), උකස් අත්තිකාරම් (සියයට 21.5) සහ ණය කාඩ්පත් (සියයට 12.6) 2021 වසරේ දී ඉහළ වර්ධන වේගයක් වාර්තා කරන ලදී. මේ අතර,

8

8.1 රූප සටහන

මූල්‍ය අංශයේ කාර්යසාධනය



8.2 සංඛ්‍යා සටහන

බැංකු, බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක ව්‍යාප්තිය

වර්ගීකරණය	2020 අවසානයට (අ)	2021 අවසානයට (ආ)
බලපත්‍රලාභී වාණිජ බැංකු		
i. **මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු සංඛ්‍යාව**	**24**	**24**
දේශීය බැංකු	13	13
විදේශීය බැංකු	11	11
ii. **මුළු බලපත්‍රලාභී වාණිජ බැංකු ඒකක සංඛ්‍යාව**	**6,702**	**6,614**
ශාඛා (ඇ)	2,915	2,919
දේශීය බැංකු	2,869	2,874
විදේශීය බැංකු	46	45
ශිෂ්‍ය ඉතුරුම් ඒකක	3,787	3,695
iii. **ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර**	**5,744**	**5,891**
බලපත්‍රලාභී විශේෂිත බැංකු		
i. **මුළු බලපත්‍රලාභී විශේෂිත බැංකු සංඛ්‍යාව**	**6**	**6**
ජාතික මට්ටමේ ඉතිරි කිරීමේ බැංකු	1	1
නිවාස ණය ආයතන	2	2
අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු	3	3
ii. **මුළු බලපත්‍රලාභී විශේෂිත බැංකු ඒකක සංඛ්‍යාව**	**704**	**705**
ශාඛා (ඇ)	**704**	**705**
ජාතික මට්ටමේ ඉතිරි කිරීමේ බැංකු	266	263
නිවාස ණය ආයතන	64	64
අනෙකුත් බලපත්‍රලාභී විශේෂිත බැංකු	374	378
iii. **ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර**	**432**	**451**
මුළු බැංකු ශාඛා සහ අනෙකුත් බැංකු ඒකක සංඛ්‍යාව	**7,406**	**7,319**
මුළු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව	**6,176**	**6,342**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ශිෂ්‍ය ඉතුරුම් ඒකක හැර සියලුම බැංකු ඒකක

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ආයෝජනවල වාර්ෂික වර්ධනය 2020 වසර අවසානයේ සියයට 40 සිට 2021 වසර අවසන් වන විට සියයට 16.4ක් දක්වා අඩු විය. භාණ්ඩාගාර බැඳුම්කර ආයෝජන රුපියල් බිලියන 903.7කින් වැඩි වීම සහ භාණ්ඩාගාර බිල්පත් සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන පිළිවෙලින් රුපියල් බිලියන 99.8කින් සහ රුපියල් බිලියන 55කින් අඩුවීම හේතුවෙන් කල්පිරීම තෙක් රඳවා ගන්නා ආයෝජන කළඹ 2021 වසරේ දී සියයට 24.8කින් වර්ධනය විය. භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල සිදු කළ ආයෝජන පිළිවෙලින් රුපියල් බිලියන 50කින්, රුපියල් බිලියන 47.6කින් සහ රුපියල් බිලියන 63.8කින් නාමිකව අඩුවීමත් සමඟ වෙළඳ කළඹ සියයට 21.2කින් සංකෝචනය විය.

වගකීම්: අරමුදල් සැපයීමේ ප්‍රධාන ප්‍රභවය ලෙස තැන්පතු අඛණ්ඩව පැවතුණු අතර, ණය ගැනීම් දෙවන විශාලතම ප්‍රභවය විය. සමස්ත තැන්පතුවලට කාලීන තැන්පතු දැක්වූ දායකත්වය 2020 වසරේ සියයට 63 සිට 2021 වසර අවසන් වන විට සියයට 60.6ක් දක්වා අඩුවීමක් වාර්තා කළ ද, 2021 වසර තුළ දී සිදු වූ

8.3 සංඛ්‍යා සටහන

බැංකු අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය

අයිතමය	2020 (අ)		2021 (ආ)		වෙනස (%)	
	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	2020 (අ)	2021 (ආ)
වත්කම්						
ණය සහ අත්තිකාරම්	9,091.7	62.0	10,479.7	61.9	11.9	15.3
ආයෝජන	4,195.8	28.6	4,885.6	28.9	40.0	16.4
වෙනත් (ඇ)	1,378.8	9.4	1,558.3	9.2	-1.8	13.0
වගකීම්						
තැන්පතු	11,140.9	76.0	12,671.3	74.9	21.6	13.7
ණය ගැනුම්	1,692.2	11.5	2,181.2	12.9	0.8	28.9
ප්‍රාග්ධන අරමුදල්	1,254.2	8.6	1,464.4	8.7	11.0	16.8
වෙනත්	578.9	3.9	606.6	3.6	5.0	4.8
මුළු වත්කම්/වගකීම්	**14,666.3**	**100.0**	**16,923.6**	**100.0**	**17.1**	**15.4**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුදල් හා බැංකු ශේෂයන්, ස්ථාපනයන්, ප්‍රති විකුණුම් ගිවිසුම් සහ ස්ථාවර වත්කම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

තැන්පතු වැඩිවීමෙන් සියයට 42.7කට කාලීන තැන්පතු දායක විය. මේ අතර, 2021 වසර අවසන් වන විට සමස්ත තැන්පතුවලින් ඉතුරුම් තැන්පතු සහ ජංගම තැන්පතු, පිළිවෙලින්, සියයට 29.5ක් සහ සියයට 7ක් විය. ඒ අනුව, ජංගම හා ඉතුරුම් ගිණුම් අනුපාතය 2020 වසරේ පැවති සියයට 34.5 සිට 2021 වසරේ දී සියයට 36.6ක් දක්වා ඉහළ ගියේය. 2021 වසර තුළ දී සමස්ත තැන්පතුවල වර්ධන වේගය අඩු වීම බැංකුවලට ඔවුන්ගේ ණය ගැනීම් වැඩි කිරීම සඳහා පෙළඹවීය. බැංකු අංශයේ සමස්ත ණය ගැනීම් 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 12.8ක (එනම් සියයට 0.8) ඉහළ යාමට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 489ක (එනම් සියයට 28.9) වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ 2021 වසරේ දී සියයට 86.6ක (රුපියල් බිලියන 688) වර්ධනයක් වාර්තා වූ රුපියල් ණය ගැනීම් වන අතර, 2021 වසරේ දී ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම් පහත වැටීම්වල සෘණාත්මක බලපෑම පිළිබිඹු කරමින් විදේශ විනිමය ණය ගැනීම් සියයට 27.6කින් (එ.ජ. ඩොලර් බිලියන 1.3) අඩු විය.

8.4 සංඛ්‍යා සටහන

බැංකු අංශයේ තැන්පතු සංයුතිය

අයිතමය	2020 (අ)		2021 (ආ)		වෙනස (%)	
	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	රුපියල් බිලියන	ප්‍රතිශතය (%)	2020 (අ)	2021 (ආ)
ඉල්ලුම් තැන්පතු	696.9	6.3	889.2	7.0	31.8	27.6
ඉතුරුම් තැන්පතු	3,149.9	28.3	3,742.7	29.5	34.4	18.8
ස්ථාවර තැන්පතු	7,022.3	63.0	7,676.3	60.6	15.3	9.3
වෙනත් තැන්පතු	271.9	2.4	363.1	2.9	38.1	33.6
මුළු තැන්පතු	**11,140.9**	**100.0**	**12,671.3**	**100.0**	**21.6**	**13.7**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8.5 සංඛ්‍යා සටහන
බැංකු අංශයේ ණය සහ අත්තිකාරම් සංයුතිය
(2021 අවසානයට)

අංශය	වටිනාකම රුපියල් බිලියන (අ)	මුළු ණයෙන් ප්‍රතිශතයක් ලෙස %	අක්‍රීය ණය අනුපාතිකය %
පරිභෝජන	1,785.1	17.0	3.1
ඉදිකිරීම්	1,608.4	15.3	6.2
තොග හා සිල්ලර වෙළඳාම	1,373.2	13.1	6.5
නිෂ්පාදන	992.9	9.5	8.1
යටිතල පහසුකම් සංවර්ධනය	930.7	8.9	1.8
මුදල් අමාත්‍යාංශයට ණය දීම්	857.5	8.2	-
කෘෂිකර්ම, වන සම්පත් හා ධීවර	813.5	7.8	6.3
මූල්‍ය සේවාවන්	460.7	4.4	1.6
විදේශ අංශය සඳහා ණය දීම්	419.2	4.0	3.2
සෞඛ්‍ය, සමාජ සේවා හා සහාය සේවාවන්	391.9	3.7	2.7
සංචාරක	358.2	3.4	5.6
ප්‍රවාහනය හා ගබඩා කිරීම	206.0	2.0	6.1
වෘත්තීය, විද්‍යාත්මක සහ කාර්මික කටයුතු	142.9	1.4	3.0
තොරතුරු තාක්ෂණ සහ සන්නිවේදන සේවාවන්	73.2	0.7	5.9
අධ්‍යාපන	54.6	0.5	2.9
කලා, විනෝදය සහ විනෝදාත්මක	11.8	0.1	4.5
මුළු ණය	**10,479.7**	**100.0**	**4.5**

(අ) තාවකාලික

මූලයः ශ්‍රී ලංකා මහ බැංකුව

ශේෂපත්‍රයෙන් බාහිර නිරාවරණः අභියෝගාත්මක ව්‍යාපාරික වාතාවරණය හමුවේ ශේෂපත්‍රයෙන් බාහිර නිරාවරණ, 2020 වසරේ පැවති සියයට 16.1ක වර්ධනයට (රුපියල් බිලියන 675.2) සාපේක්ෂව, 2021 වසරේ දී සියයට 3.2ක සෘණාත්මක වර්ධනයක් (රුපියල් බිලියන 160.6) පෙන්නුම් කළේය. 2021 වසර තුළ දී විදේශ විනිමය නිරාවරණ (රුපියල් බිලියන 410.9) සහ භාවිත නොකළ ණය සීමාවල (රුපියල් බිලියන 81.5) සැලකිය යුතු පහළ යාමක් නිරීක්ෂණය වන අතර, ඇපකර සහ බැඳුම්කර (රුපියල් බිලියන 139) සහ වෙළඳාම සම්බන්ධ නිරාවරණවල (ලේඛිත ණය (රුපියල් බිලියන 138.9) සහ ප්‍රතිග්‍රහණ (රුපියල් බිලියන 92) වර්ධනයක් වාර්තා කළේය.

බැංකු අංශයේ අවදානම්

ණය අවදානම

වසංගත තත්ත්වය 2021 වසර තුළ විවිධ පරිමාණයන්ගෙන් පැවතීම නිසා, එමගින් පීඩාවට පත් වූ පුද්ගලයන් සහ ඇතැම් අංශවල ව්‍යාපාර වෙනුවෙන් ලබා දෙන ණය සහන සඳහා අවස්ථා කිහිපයක දී 2022 වසර දක්වා දීර්ඝ කිරීම් ලබා දෙන ලදී. ණය සහන කාලසීමාව තුළ දී අක්‍රීය කාණ්ඩ සඳහා ණය හා අත්තිකාරම් වර්ගීකරණය අත්හිටුවා ඇති අතර, ණය සහන අත්හිටුවීමෙන් පසු සාමාන්‍ය වර්ගීකරණ නීති ක්‍රියාත්මක වනු ඇත. කෙසේ වෙතත්, අපේක්ෂිත ණය හානි (expected credit losses) ඇස්තමේන්තු කිරීම සඳහා කොවිඩ්-19 හේතුවෙන් ඉහළ අවදානමක් සහිත අංශ හඳුනාගැනීම බැංකු විසින් ආරම්භ කර ඇත. ණය සහන කාලය තුළ දී ණය පහසුකම් වර්ගීකරණය අත්හිටුවා තිබුන ද, රුපියල් බිලියන 66.4ක් වූ 2020 වසරේ අක්‍රීය ණය වැඩිවීමට සාපේක්ෂව 2021 වසරේ දී එය රුපියල් බිලියන 20.1කින් ඉහළ යන ලදී. එසේ වුවද, 2021 වසර තුළ සාපේක්ෂ වශයෙන් ණය සහ අත්තිකාරම් ඉහළ වර්ධනයක් පෙන්වීම හේතුවෙන්, දළ අක්‍රීය ණය අනුපාතය 2020 වසර අවසානයේ පැවති සියයට 4.9ක සිට 2021 වසර අවසානයේ දී සියයට 4.5ක් දක්වා අඩු විය. ඉහළ වෙන් කිරීම් අවශ්‍ය වන කාණ්ඩවලට අක්‍රීය ණය සංක්‍රමණය වීමත් සමඟ ශුද්ධ අක්‍රීය ණය අනුපාතය ද 2021 වසර තුළ අඩු වී ඇත. මුළු අක්‍රීය ණය සඳහා වෙන් කිරීම් රුපියල් බිලියන 80.2කින් වැඩි වූ අතර, එයින් නිශ්චිත වෙන් කිරීම් සියයට 84.7ක් විය. අක්‍රීය ණය වර්ධනය වුව ද, වෙන් කිරීම් ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස නිශ්චිත හා සමස්ත වෙන් කිරීම් ආවරණ අනුපාත 2021 වසර තුළ පිළිවෙලින් සියයට 64ක් සහ සියයට 75.8ක් දක්වා ඉහළ යන ලදී. ඒ අනුව, අහිතකර බලපෑම් අවශෝෂණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් වෙන් කිරීම් හා ප්‍රාග්ධන ස්වාරක්ෂකයන් සහිතව බැංකු අංශය ක්‍රියාත්මක වූ බැවින් ණය අවදානම කළමනාකරණය කළ හැකි මට්ටමක පවතී.

සමස්ත ණය කළඹෙන් සියයට 63.8ක් පරිභෝජන, ඉදිකිරීම් හා යටිතල පහසුකම්, වෙළඳාම්, නිෂ්පාදන සහ කෘෂිකර්මාන්තය යන ආර්ථික අංශ 5 වෙත ප්‍රධාන වශයෙන් කේන්ද්‍රනය වී තිබුණි.

8.2 රූප සටහන
බැංකු අංශයේ ශේෂ පත්‍ර නොවන අයිතම
(2021 අවසානයට)



මූලයः ශ්‍රී ලංකා මහ බැංකුව

8

8.3 රූප සටහන
බැංකු අංශයේ අක්‍රීය ණය



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

8.4 රූප සටහන
බැංකු අංශයේ අක්‍රීය ණය සඳහා වෙන් කිරීම්



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

නිෂ්පාදන, තොග හා සිල්ලර වෙළඳාම, කෘෂිකර්මාන්තය, ඉදිකිරීම්, වන වගාව හා ධීවර සහ සංචාරක යන අංශයන්හි අක්‍රීය ණය අනුපාතය, 2021 වසර අවසන් වන විට පැවති සමස්ත බැංකු අංශයේ අක්‍රිය ණය අනුපාතය වන සියයට 4.5ට වඩා ඉහළ අගයක් වාර්තා කරන ලදී.

තවද, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) ට අනුව අපේක්ෂිත අලාභ ආකෘතිය ක්‍රියාත්මක කිරීමෙන් පසු, 2021 වසර අවසානයේ දී බැංකු අංශයේ මුළු ණයවලින් සියයට 7.64ක් 3 වන කාණ්ඩයේ ණය ලෙස පෙන්නුම් කළ අතර මුළු ණය (3 වන කාණ්ඩයේ ණය හානිකරණය ගලපන ලද) වලින් සියයට 4.26ක් 3 වන කාණ්ඩයේ (3 වන කාණ්ඩයේ ණය හානිකරණය ගලපන ලද) ණය ලෙස පෙන්නුම් කළේය.

වෙළඳපොළ අවදානම

පොලී අනුපාතයඃ පොලී අනුපාතය පිළිබඳ සංවේදිතා අනුපාතය (මාස 12ට අඩු කල් පිරීම් සහිත, පොලී දරන වත්කම්, පොලී දරන වගකීම්වල අනුපාතයක් ලෙස) 2020 වසර අවසන් වන විට පැවති සියයට 74.9ක අගයේ සිට 2021 වසර අවසන් වන විට සියයට 79.6ක් දක්වා වැඩිවීම මගින් 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී පොලී අනුපාත අවදානමට නිරාවරණය පහළ ගියේය. 2021 වසරේ භාණ්ඩාගාර බැඳුම්කරවලට අදාළ ප්‍රාග්ධන ලාභය රුපියල් බිලියන 4.1ක් වූ අතර, එය 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 12.2ට සාපේක්ෂව පහළ අගයකි. 2020 වසරේ දී ඉහළ ලාභ ලැබීමට හේතු වූ අවම පොලී අනුපාත සහ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමත් සමඟ 2021 වසර දෙවන භාගයේ දී නිරීක්ෂණය වූ පොලී අනුපාතවල ඉහළ ගැලපීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

කොටස් මිලඃ 2021 වසර තුළ දී කොටස් මිල විචලනය වීම මගින් බැංකු අංශය වෙත වන අවදානම අවම මට්ටමක පැවතුනි. 2021 වසර අවසන් වන විට වෙළඳාම් කිරීමේ අරමුණින් පවත්වාගන්නා ආයෝජන කළඹේ කොටස් වෙළඳපොළ ආයෝජනවල වටිනාකම රුපියල් බිලියන 12.5ක් වූ අතර, එය වෙළඳාම් කිරීමේ අරමුණින් පවත්වාගන්නා ලද ආයෝජනවලින් සියයට 2.1ක් ද, මුළු වත්කම්වලින් සියයට 0.1ක් ද නියෝජනය කරන ලදී.

විනිමය අනුපාතයඃ විදේශ මුදලින් රැස් කරන ලද වත්කම්වල අඩුවීමට සාපේක්ෂව විදේශ මුදලින් නිදහස් කළ යුතු වගකීම් ඉහළ අගයකින් අඩු වීම නිසා, ශුද්ධ විදේශ විනිමය නිරාවරණය 2020 වසරේ පැවති එ.ජ. ඩොලර් මිලියන 30ක හිඟ විදේශ විනිමය නිරාවරණයට සාපේක්ෂව 2021 වසර අවසානයේ එ.ජ. ඩොලර් මිලියන 133.2ක අතිරික්ත විදේශ විනිමය නිරාවරණයක් වාර්තා කළේය. ශුද්ධ විදේශ විනිමය නිරාවරණ, ශේෂ පත්‍රයේ වූ මුළු විදේශ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 0.3ට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 1.3ක් දක්වා ඉහළ ගියේය. 2021 වසරේ දී විදේශ මුදලින් රැස් කරන ලද ශේෂ පත්‍ර වත්කම් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වුයේ විදේශ විනිමය ණය ඉහළ යාම සහ අනෙක් බැංකුවල තැන්පත් කිරීම් හා ආයෝජනවල සිදු වූ වැඩිවීම වූ අතර එම වර්ධනය ඉදිරි මිලදී ගැනීම් හා අනෙකුත් ව්‍යුත්පන්න උපකරණ අඩුවීම නිසා සිදු වූ ශේෂපත්‍රයෙන් බාහිර

8

8.5 රූප සටහන
බැංකු අංශයේ ද්‍රවශීලතා අනුපාත



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නිරාවරණ අඩු වීමට සාපේක්ෂව පහළ අගයක් වාර්තා කළේය. මේ අතර විදේශ මුදලින් රැස් කරන ලද ශේෂ පත්‍ර වගකීම්වල වූ වර්ධනය සඳහා ගනුදෙනුකරුවන්ගේ විදේශ විනිමය තැන්පතු වැඩිවීම හේතු වූ අතර විදේශ මුදලින් රැස් කරන ලද ශේෂ පත්‍රයෙන් බාහිර වගකීම්වල අඩුවීම සිදු වූයේ ඉදිරි විකුණුම්වල වූ අඩුවීම තුළිනි. බැංකු අංශය 2021 වසර තුළ දී රුපියල් බිලියන 28.7ක ශුද්ධ විදේශ මුදල් ප්‍රත්‍යාගණන ලාභයක් වාර්තා කළ අතර 2020 වසරට අදාළ ප්‍රත්‍යාගණන ලාභය වූයේ රුපියල් බිලියන 16.5කි.

ද්‍රවශීලතා අවදානම: **බැංකු අංශය සමස්තයක් වශයෙන් අවම ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය වන සියයට 20ක අනුපාතය පවත්වා ගත්තේය.** බලපත්‍රලාභී වාණිජ බැංකුවල දේශීය මෙහෙයුම් අංශය සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු, ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය සියයට 20 කට ඉහළින් පවත්වා ගත යුතු වේ. බැංකු අංශයේ

8.6 රූප සටහන
සමුච්චිත පරිණත කාලය බැංකු අංශයේ සමුච්චිත වගකීම්වල ප්‍රතිශතයක් ලෙස



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය මෙහෙයුම් අංශවල සමස්ත ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය 2020 වසර අවසානයේ දී සියයට 37.8 සිට 2021 වසර අවසානයේ දී සියයට 33.8ක් දක්වා අඩු වූ අතර බලපත්‍රලාභී වාණිජ බැංකුවල අක්වෙරළ බැංකු අංශවල මෙම අනුපාතය එම කාලය තුළ දී සියයට 43.2 සිට සියයට 34ක් දක්වා අඩු විය. 2021 වසරේ දී ණයවල ඉහළ වර්ධනයක් සිදුවුව ද, තැන්පතු හා ණය ගැනීම්වලට ණය ලබා දීම් අනුපාතය සුළු වශයෙන් අඩු විය. එමෙන්ම, මුළු වත්කම්වලට ද්‍රවශීලතා වත්කම් අනුපාතය සහ තැන්පතුවලට ද්‍රවශීලතා වත්කම් අනුපාතය ද අඩු විය.

බැංකු අංශයේ ද්‍රවශීලතා ආතති තත්ත්වයක් යටතේ දී දින 30ක කාලයක් සඳහා ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ද්විතීයික වෙළඳපොළෙහි පහසුවෙන් සහ ක්ෂණිකව මුදල් බවට පරිවර්තනය කළ හැකි ඉහළ ගුණාත්මක භාවයෙන් යුතු වත්කම් සමූහය වන රුපියල් සහ සියලු මුදල් ඒකක සඳහා අදාළ ද්‍රවශීල ආවරණ අනුපාතය 2021 වසර අවසානය වන විට පිළිවෙලින් සියයට 217.8ක සහ සියයට 171.8ක පැවතුණ අතර එය අවම අවශ්‍යතාවය වන සියයට 100ට වඩා ඉහළ අගයක පැවතුණි. මීට අමතරව, අවශ්‍ය ස්ථාවර අරමුදල්වලට සාපේක්ෂව පවත්නා ස්ථාවර අරමුදල් ප්‍රමාණය වනෘ ශුද්ධ ස්ථාවර අරමුදල් අනුපාතය 2021 වසර අවසානයේ දී සියයට 135.1ක්ව පැවතුනු අතර එය අවම නියාමන අවශ්‍යතාවය වන සියයට 100ට වඩා ඉහළ අගයක පැවතුණි. 2021 වසර අවසානය වන විට මුළු ද්‍රවශීල වත්කම් රුපියල් ට්‍රිලියන 5ක් වූ අතර එයින් සියයට 75.2ක් ම රාජ්‍ය සුරැකුම්පත්වල කර තිබූ ආයෝජනයන්ය. පොලී අනුපාත පහළ යෑමේ නැඹුරුවක් දක්වන අවස්ථාවක වත්කම්වලට සාපේක්ෂව වගකීම් අඩු පොලී අනුපාතයකට අලුත් වීම සැලකිල්ලට ගෙන කෙටි කාලීනව වත්කම් හා වගකීම් වඩා යහපත් ලෙස කළමනාකරණය කළ බැවින් බැංකු අංශයේ ''දින 30ට අඩු" සහ ''මාස 12ට වැඩි" යන පරිණත කාලයන්ට අදාළ සමුච්චිත පරිණත පරතරයන්, සමුච්චිත වගකීම්වල ප්‍රතිශතයක් ලෙස ගත් විට 2020 වසරට සාපේක්ෂව 2021 වසර අවසානයේ දී පුළුල් වී ඇත. අවම ද්‍රවශීලතා අවශ්‍යතාවයන් සපුරාලීමට බැංකු සමත් වී ඇති නමුත්, පරිණත පරතරය අනවශ්‍ය ලෙස පුළුල් වීම ද්‍රවශීලතා අවදානමකට හේතු විය හැකිය.

බැංකු අංශයේ කාර්යසාධනය

ලාභදායීත්වය: **2021 වසර තුළ වාර්තා වූ පොලී වියදම සියයට 11.5කින් අඩුවීමට සාපේක්ෂව සහ පොලී ආදායම සියයට 3.2කින් වැඩිවීම හේතුවෙන් බැංකු අංශයේ ශුද්ධ පොලී ආදායම සියයට 28.5කින් වර්ධනය වී ඇත.** ඒ අනුව, 2020 වසර අවසානයේ සියයට

8

8.6 සංඛ්‍යා සටහන

බැංකු අංශයේ ද්‍රවශීල වත්කම්වල සංයුතිය

අයිතමය	2020 (අ)		2021 (ආ)		වෙනස (රු. බිලියන)	
	රු. බිලියන	ප්‍රතිශතය (%)	රු. බිලියන	ප්‍රතිශතය (%)	2020 (අ)	2021 (ආ)
භාණ්ඩාගාර බිල්පත්	1,149.9	23.0	1,040.6	20.8	278.7	-109.3
භාණ්ඩාගාර බැඳුම්කර	1,685.3	33.7	2,142.3	42.9	481.8	457.1
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර	655.8	13.1	577.0	11.5	86.1	-78.8
මුදල්	203.1	4.1	231.8	4.6	6.2	28.7
ඒක්ෂණ මුදල්	337.7	6.8	177.2	3.5	168.9	-160.5
විදේශ බැංකු ගිණුම්වල ශේෂයන්	469.9	9.4	538.9	10.8	42.4	69.0
වෙනත්	493.6	9.9	290.3	5.8	309.8	-203.3
ද්‍රවශීල වත්කම්වල එකතුව	**4,995.1**	**100.0**	**4,998.0**	**100.0**	**1,373.9**	**2.9**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

3.1ක්ව පැවති ශුද්ධ පොලී ආන්තිකය, 2021 වසරේ දී සියයට 3.4ක් දක්වා වර්ධනය විය. පසුගිය වසරට සාපේක්ෂව ශුද්ධ පොලී ආදායම රුපියල් බිලියන 121.8කින් වර්ධනය වූ අතර, 2021 වසරේ ඉහළ විදේශ මුදල් ප්‍රත්‍යාගණන ලාභ හේතුවෙන් පොලී නොවන ආදායම රුපියල් බිලියන 24.6කින් ඉහළ ගොස් ඇත. රුපියල් බිලියන 20.5ක් වූ සේවක පිරිවැය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොට ගෙන පොලී නොවන වියදම රුපියල් බිලියන 47.4කින් ඉහළ ගිය අතර, ණය අලාභ වෙන් කිරීම් 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 7.7කින් ඉහළ ගොස් ඇත. ඒ අනුව, 2021 වසර සඳහා වන බදු පෙර ලාභය රුපියල් බිලියන 258.7ක් වූ අතර නියාමන වාර්තාකරණයට අනුව එය පෙර වසරට සාපේක්ෂව රුපියල් බිලියන 69ක වැඩි වීමකි.

8.7 සංඛ්‍යා සටහන

බැංකු අංශයේ ලාභදායීත්වය

අයිතමය	2020 (අ)		2021 (ආ)	
	වටිනාකම (රු. බිලියන)	සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස	වටිනාකම (රු. බිලියන)	සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස
ශුද්ධ පොලී ආදායම	**427.1**	**3.1**	**548.9**	**3.4**
පොලී ආදායම	1,161.1	8.5	1,198.3	7.5
පොලී වියදම	734.0	5.4	649.3	4.1
පොලී නොවන ආදායම	**141.9**	**1.0**	**166.6**	**1.0**
විදේශීය හුවමාරු ආදායම	31.5	0.2	46.4	0.3
පොලී නොවන වියදම	**252.4**	**1.9**	**299.8**	**1.9**
සේවක පිරිවැය	128.0	0.9	148.4	0.9
අක්‍රීය ණය මත වෙන් කිරීම්	**83.5**	**0.6**	**91.3**	**0.6**
බදු පෙර ලාභය (එකතු කළඅගය මත බදු අඩු කළ පසු)	**189.7**	**1.4**	**258.7**	**1.6**
බදු පසු ලාභය	**135.8**	**1.0**	**198.4**	**1.2**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2021 වසර අවසානයේ දී බැංකු අංශයෙහි බදු පසු ලාභය රුපියල් බිලියන 198.4ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව සියයට 46ක වැඩි වීමකි. මෙම ලාභයෙහි වැඩිවීම, වත්කම් මත ප්‍රතිලාභ (බදු පෙර) අනුපාතය 2020 වසරේ දී තිබූ සියයට 1.4 අගය ඉක්මවා 2021 අවසානය වන විට සියයට 1.6ක් දක්වා ඉහළ යාමට හේතු වූ අතර එම කාලසීමාව තුළ හිමිකම් මත ප්‍රතිලාභ (බදු පසු) අනුපාතය 2020 වසරේ දී සියයට 11.4 සිට 2021 වසරේ දී සියයට 14.5ක් දක්වා වර්ධනය වීමට හේතු විය. තවද, 2020 වසරේ දී සියයට 51.8ක් වූ කාර්යක්ෂමතා අනුපාතය මෙහෙයුම් පිරිවැය අඩුවීම හේතුවෙන් 2021 වසර වනවිට සියයට 48.1ක් දක්වා සාධනීය වෙනසක් වාර්තා කළේය.

ප්‍රාග්ධනය: 2021 වසර තුළ ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට අනුකූල වීමට බැංකු අංශය සමත් විය. කිසිදු බැංකුවක් විසින් සලකා බලනු ලබන කාල සීමාව තුළ ප්‍රාග්ධන සංරක්ෂණ ස්වාරක්ෂක පහත හෙළීමක් සිදු කර නොමැත.

8.7 රූප සටහන

බැංකු අංශයේ ලාභදායීත්ව දර්ශක



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8.8 රූප සටහන
බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ප්‍රාග්ධනය උත්පාදනය කරගැනීමට වර්තමානයේ පවතින අභියෝග සැලකිල්ලට ගනිමින්, දැනට ප්‍රාග්ධන ඌණතාවයන් ඇති බැංකු සඳහා ඉහළ දමන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීමට ලබා දී තිබූ දින නියමයන් 2022 දෙසැම්බර් මාසය දක්වා දීර්ඝ කරන ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 9 (SLFRS 9) ක්‍රියාත්මක කිරීමේ පළමු දින බලපෑම හඳුනාගැනීමෙන් පසුව උසස් තත්ත්වයේ ප්‍රාග්ධනය එක් රැස් කිරීම සඳහා බැංකු දිරිමත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වසර තුළ දී බැංකු විසින් ලාභ රඳවා ගැනීම් හරහා පළමු ස්ථර ප්‍රාග්ධනය ලෙස රුපියල් බිලියන 70ක් සහ නව කොටස් නිකුත් කිරීම් හරහා රුපියල් බිලියන 16.8ක් උපයාගෙන ඇත. වසර තුළ දී බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධනය සියයට 4.3කින් වර්ධනය වූ අතර, ඉන් සියයට 75.7ක් සඳහා පළමු ස්ථර ප්‍රාග්ධනය දායක විය.

8.8 සංඛ්‍යා සටහන
බැංකු අංශයේ නියාමන ප්‍රාග්ධන සංයුතිය

අයිතමය	වටිනාකම (රු. බිලියන)		සංයුතිය (%)	
	2020 (අ)	2021 (ආ)	2020 (අ)	2021 (ආ)
ප්‍රථම ස්ථරය : ප්‍රාග්ධන	**1,041.4**	**1,083.8**	**100.0**	**100.0**
කොටස් ප්‍රාග්ධනය	335.3	352.1	32.2	32.5
ව්‍යවස්ථාපිත සංචිත අරමුදල්	65.9	66.7	6.3	6.2
නොබෙදූ ලාභ	410.6	480.5	39.4	44.3
පොදු හා අනෙකුත් සංචිත	257.9	250.5	24.8	23.1
වෙනත්	32.9	21.6	3.2	2.0
නියාමක ගැලපීම්	-61.1	-87.5	-5.9	-8.0
දෙවන ස්ථරය : ප්‍රාග්ධන	**266.2**	**279.8**	**100.0**	**100.0**
ප්‍රත්‍යාගණන සංචිත	27.2	35.3	10.2	12.6
උපකාරක ණය	166.5	160.2	62.6	57.2
පොදු වෙන්කිරීම් සහ වෙනත්	73.7	84.7	27.7	30.3
නියාමක ගැලපීම්	-1.3	-0.4	-0.5	-0.1
සමස්ත නියාමන ප්‍රාග්ධන පදනම	**1,307.6**	**1,363.6**		

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2021 වසර තුළ අධීක්ෂණ සහ නියාමන ප්‍රවණතා

2021 වසර තුළ දී මහ බැංකුව, බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාව සහ ශක්තිමත් බව තහවුරු කිරීමට බලපත්‍රලාභී බැංකුවල මූල්‍ය සහ මෙහෙයුම් ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා විචක්ෂණශීලී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ නියාමනයන් අඛණ්ඩව හඳුන්වා දීමට කටයුතු කළේය. එමෙන්ම, කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය නිසා පීඩාවට පත් වූ ආර්ථික අංශ සඳහා සහන සැපයීම අඛණ්ඩව පවත්වාගැනීම සඳහා සහ බැංකු ක්ෂේත්‍රය නව සාමාන්‍ය තත්ත්වයට හැඩගැසීමට පහසු කිරීම සඳහා ඇතැම් නියාමනයන් සුපරීක්ෂාකාරීව ලිහිල් කිරීමට ද මහ බැංකුව කටයුතු කරන ලදී.

බලපත්‍රලාභී බැංකු විසින් පුළුල් පදනමකින් ආර්ථිකය යළි නගා සිටුවීම සඳහා මග පාදන, දේශීය ආර්ථික වර්ධනය සහ අපනයන ආදායම අනුව ගත් කළ ඉහළ වර්ධන ප්‍රභවයක් සහිත ආර්ථික අංශ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ පුද්ගලයන් සහ ව්‍යාපාරයන්ට ලබා දෙන ණය සඳහා ප්‍රමුඛතා පදනමින් ණය දීමේ ඉලක්ක හඳුන්වා දීමට මහ බැංකුව කටයුතු කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ පුද්ගලයන් සහ ව්‍යාපාරයන්ට ලබා දෙන ණය, අදාළ බැංකුවේ ඊට පෙර වසරේ අවසානය වන විට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ පුද්ගලයන් සහ ව්‍යාපාරයන්ට ලබා දී තිබූ ණය ප්‍රමාණයෙන් වාර්ෂිකව සියයට 20කට නොඅඩු ප්‍රමාණයකින් වර්ධනය කරන ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී. තවද, එළඹෙන අස්වනු නෙලීමේ සමය සැලකිල්ලට ගනිමින්, කොවිඩ්-19 වසංගත තත්ත්වය නිසා පීඩාවට පත්, කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට සහය දැක්වීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග සලකා බලමින්, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට එරෙහිව ගනු ලබන ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග 2021 වසරේ ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාස හයක කාලයක් සඳහා අත්හිටුවන ලෙසට ද බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී.

දිගු කාලයක් සඳහා ණය සහන කාලසීමා පවත්වාගෙන යාම නිසා ඇතිවන බලපෑම් මධ්‍යයේ වුවද, මූල්‍ය ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාව සහ ස්ථායීතාවය

8

8.9 සංඛ්‍යා සටහන

කොවිඩ්-19 වසංගතයෙන් බලපෑමට ලක්වූ සක්‍රීය ණයගැතියන් සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ලබාදුන් ණය සහනවල තත්වය (2020 මාර්තු සිට 2021 දෙසැම්බර් 31 දක්වා)

ණය සහන අදියර	බලපත්‍රලාභී බැංකු	
	අනුමත කරන ලද ඉල්ලීම්	හිඟ ශේෂය (රු. බිලියන)
අදියර 1	1,266,620	2,185.0
අදියර 2	127,289	939.0
අදියර 3	176,188	917.0
අදියර 4	145,687	642.4
මුළු එකතුව	**1,715,784**	*ලැ.නො.

ලැ.නො. - ලැබී නොමැත.
*එකම ණයගැතියන් යෝජනා ක්‍රම කිහිපයක් යටතේ සහන ලබාගෙන තිබිය හැක.

මූලයන්: බලපත්‍රලාභී බැංකු
ශ්‍රී ලංකා මහ බැංකුව

තහවුරු කරමින්, කොවිඩ්-19 නිසා බලපෑමට පත් ව්‍යාපාර සහ පුද්ගලයන් හට සහය දැක්වීමේ ප්‍රයත්නයන් මහ බැංකුව විසින් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අතරට, මගී ප්‍රවාහන ක්ෂේත්‍රයේ නියුතු පීඩාවට පත් ව්‍යාපාර හා පුද්ගලයින් විසින් ලබා ගන්නා ලද කල්බදු පහසුකම් සඳහා 2021 වසරේ අප්‍රේල් මස සිට මාස හයක කාලයක් සඳහා සහන කාලයක් ලබා දීම, කොවිඩ්-19 නිසා බලපෑමට පත් සංචාරක ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයින් වෙත ලබා දී තිබූ ණය සහන කාල සීමාව 2021 වසරේ අප්‍රේල් මස සිට තවත් මාස හයක කාලයක් සඳහා දීර්ඝ කිරීම සහ කොවිඩ්-19 තෙවන රැල්ල නිසා බලපෑමට පත් ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා සහන ක්‍රියාමාර්ග දීර්ඝ කිරීම ඇතුළත් වේ. වසංගත තත්ත්වය තවදුරටත් උත්සන්න වීම සැලකිල්ලට ගනිමින් මෙකී සහන ක්‍රියාමාර්ගයන් 2021 වසරේ දෙසැම්බර් මස දක්වා සහ සංචාරක ක්ෂේත්‍රය සඳහා 2022 ජූනි මස අවසානය දක්වා දීර්ඝ කිරීමට 2021 වසරේ සැප්තැම්බර් මස දී කටයුතු කරන ලදී. 2021 වසර අවසාන වන විට ණය සහන කාලය යටතේ ඇති ණය ප්‍රමාණය බැංකු අංශයේ සමස්ත ණය ප්‍රමාණයෙන් දළ වශයෙන් සියයට 6ක් පමණ විය. කෙසේ වෙතත්, මෙම ණය මගින් ඇති විය හැකි බලපෑම අදාළ සුරැකුම්වල වටිනාකමෙහි සහ එම ණය මත දැනටමත් සිදු කරන ලද හානිකරණයෙහි ශුද්ධ අගය වේ.

තවද, විකල්පයක් ලෙස, ණය ගනුදෙනුකරුවන්ගේ අනාගත මුදල් ප්‍රවාහයන් සැලකිල්ලට ගනිමින් සහ ඔවුන්ගේ ව්‍යාපාර නගාසිටුවීම සඳහා පිළිගත හැකි සැලැස්මක් ඉදිරිපත් කිරීමට යටත්ව, ඔවුන්ගේ පවතින ණය පහසුකම් වෙළඳපොළෙහි පවතින අඩු පොලී අනුපාත යටතේ දිගු කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමට සලකා බලන ලෙස බලපත්‍රලාභී බැංකු වෙතින් ඉල්ලා සිටින ලදී. එමෙන්ම, බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන්ට එරෙහිව "පරාටේ" නීතිය ක්‍රියාත්මක කරවීම සහ කල්බදු වත්කම් බලෙන් යලි අත්පත්කර ගැනීම් ආදී සියලුම ආකාරයේ ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග 2022 වසරේ මාර්තු අවසානය දක්වා අත්හිටුවීම සහ සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධයෙන් එය 2022 වසරේ ජූනි අවසානය දක්වා ද දීර්ඝ කිරීම සිදු කරන ලදී.

බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් සඳහා පනවා තිබූ සීමා 2021 ජනවාරි මාසයේ දී තාවකාලිකව ලිහිල් කර 2021 වසරේ ජූලි මාසයේ දී නැවත පනවන ලදී. ඒ අනුව, 2020 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන විගණනය අවසන් කිරීමෙන් අනතුරුව මුදල් ලාභාංශ ගෙවීමට සහ ලාභ රටින් බැහැර කරවීම සඳහා බලපත්‍රලාභී බැංකුවලට අවසර දුන් අතර, 2021 වසරේ ජූනි අවසානය දක්වා තම කොටස් ආපසු මිලදී ගැනීම් සහ අත්‍යවශ්‍ය නොවන වියදම් වැඩි කිරීමෙන් වැළකී සිටින ලෙස සහ ප්‍රාග්ධන වියදම් දැරීමේ දී නිසි සැලකිල්ලකින් සහ විචක්ෂණශීලීව කටයුතු කරන ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී. පසුකාලීනව කොවිඩ්-19 වසංගත තත්ත්වය යලි ඉහළ යාම නිසා බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීලතාව සහ අනෙකුත් ප්‍රධාන කාර්යසාධක දර්ශක කෙරෙහි ඇතිවිය හැකි අහිතකර බලපෑම සැලකිල්ලට ගනිමින් 2021 වසරේ ජූලි මාසයේ දී, මෙම සීමා පැනවීම් සමාලෝචනය කර යලි පැනවීමට කටයුතු කරන ලදී.

2021 වසර තුළ දී, බලපත්‍රලාභී බැංකු මගින් විදේශ විනිමය පිටතට ගලා යාම සහ ඒ සඳහා ඇති හැකියාව සීමා කරමින් විදේශ විනිමය වෙළඳපොළේ උච්ඡාවචනයන් වළක්වා ගැනීමට, විනිමය අනුපාතිකයේ පීඩනය ලිහිල් කිරීමට සහ බැංකුවල අවදානම් කළමනාකරණයට ඇති බලපෑම අවම කිරීම සඳහා මහ බැංකුව විසින් පූර්වෝපායික නියාමන ක්‍රියාමාර්ග ගැනීමට අඛණ්ඩව කටයුතු කර ඇත. මෙම ක්‍රියාමාර්ග අතරට බලපත්‍රලාභී බැංකු විසින් විදේශ විනිමය ඉදිරි ගිවිසුම් වෙත එළඹීම තාවකාලිකව නැවැත්වීම, ආනයන සඳහා ආන්තික අවශ්‍යතා හඳුන්වා දීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගැනීම තාවකාලිකව අත්හිටුවීම ඇතුළත් වේ. තවද, මූර්ත ආර්ථිකයේ ප්‍රාග්ධන ගොඩනැගීම උත්තේජනය කිරීම සහ රටේ විදේශ මුදල් අවශ්‍යතා සඳහා සහය වීමේ අරමුණින්, බලපත්‍රලාභී බැංකු විසින් විදේශ මුදල් ණය ගැනීම් පිළිබඳ බැංකු පනත් විධාන සංශෝධන ඉදිරිපත් කිරීමට ද මහ බැංකුව විසින් කටයුතු කරන ලදී.

බැංකු ක්ෂේත්‍රයේ ඒකාකාරී සහ විචක්ෂණ පරිචයන් ස්ථාපනය කිරීමේ අරමුණින්, බලපත්‍රලාභී බැංකුවල ණය අවදානම් කළමණාකරණය සහ යහපාලන

8

විශේෂ සටහන 9

කොවිඩ්-19 සහන සහ ණය පමා කාලයන්: අභියෝගයන් සහ ඉදිරි දැක්ම

පසුගිය සියවසේ මානව වර්ගයා මුහුණ දුන් විශාලතම ආර්ථික අභියෝගය

කොවිඩ්19 යනු මෙම සියවසේ මානව වර්ගයා මුහුණ දුන් විශාලතම සෞඛ්‍ය හා ආර්ථික අභියෝගයයි. ලොව පුරා රටවල්වලින් සියයට 90කට වැඩි ප්‍රමාණයක් 2020 වසරේ දී ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරකම්වල සංකෝචනයන් වාර්තාකර ඇත. ගෝලීය ආර්ථිකයේ අන්තර්සබඳතා සහ එකිනෙකා මත රඳා පැවතීම හේතුවෙන්, මෙම ව්‍යසනය ලෝක ආර්ථිකයට පෙර නොවූ ලෙස බලපෑ අතර, මෙහි බලපෑම පළමු හා දෙවන ලෝක යුද්ධ, මහා ආර්ථික අවපාතය සහ ගෝලීය මූල්‍ය අර්බුදය යන ව්‍යසනයන් ද ඉක්මවිය (ලෝක බැංකුව, 2022).

කොවිඩ්-19 සම්බන්ධයෙන් මහ බැංකු ප්‍රතිචාර දැක්වූයේ කෙසේද?

වසංගතයේ බහුවිධ අභියෝගවලට මුහුණ දීම සඳහා ලොව පුරා මහ බැංකු සහ මූල්‍ය අධිකාරීන් විසින් සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන ප්‍රතිපත්ති ප්‍රතිචාරයන් හඳුන්වා දෙන ලදී. මෙම පියවරයන්ට මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම, වත්කම් ප්‍රතිමිලදී ගැනීම/ප්‍රමාණාත්මක ලිහිල් කිරීම් වැඩසටහන්, සහ නියාමන ලිහිල් කිරීම් මෙන්ම රජයන් විසින් සපයනු ලබන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග යන් වන බදු අඩු කිරීම/කල් දැමීම, සෘජු මුදල් ගෙවීම්, ව්‍යාපාර නුබුන්වත්ව පවත්වා ගෙනයාම සඳහා පහසුකම් සැපයීම (insolvency support) සහ ගෙවීම් තාවකාලිකව අත්හිටුවීම/කල් දැමීම වැනි දෑ ඇතුලත් විය (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2022).

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොවිඩ්19 වසංගතයේ ආරම්භයත් සමඟ ආර්ථිකයට ද්‍රවශීලතාව සැපයීම සඳහා සුවිශේෂී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මාලාවක් හඳුන්වා දුන් අතර, බලපත්‍රලාභී බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන (මෙතැන් සිට මූල්‍ය ආයතන, ලෙස හැඳින්වෙන) විසින් සිය ගනුදෙනුකරුවන්ට සහාය වීම සඳහා අවශ්‍ය මෙහෙයුම් නම්‍යශීලීත්වය සැලසීම සඳහා නියාමන ලිහිල්කිරීම් ද හඳුන්වා දෙන ලදී.

ඒ අනුව, වසංගතයෙන් පීඩාවට පත් ණය ගනුදෙනුකරුවන් විසින් ලබා ගන්නා ලද ණය සහ පොලී ගෙවීම සඳහා මාස හයක සහන කාලයක් ලබා දෙන ලෙසත්, එවැනි ණය සඳහා එකතු කර ඇති සහ නොගෙවූ දඩ පොලී කපා හරින ලෙසත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ආයතන වෙත දන්වන ලදී. පසුකාලීනව විවිධ අවස්ථාවන්හි දී කොවිඩ්19 වසංගත තත්ත්වයේ ඇතිවූ වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, දැඩි ලෙස පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන් සඳහා මෙම ණය සහන කාල සීමාව ඒ ඒ අවස්ථාවන් හිදී මාස 18කට අධික කාලයක් සඳහා දීර්ඝ කිරීමට ද කටයුතු කරන ලදී.

මෙයට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක පාරිභෝගිකයන් සඳහා අඩු පොලී පිරිවැය අරමුදල් සැපයීම සඳහා රුපියල් බිලියන 50 ක ප්‍රතිමූල්‍යකරණ සහ ණය සුරැකුම් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම, හඳුනාගත් ණය පහසුකම් සඳහා පොලී අනුපාතික අඩු කිරීම, ඉදිකිරීම් අංශයට සහ රජයේ සැපයුම්කරුවන්ට ද්‍රවශීලතා පහසුකම් සැපයීම, අක්‍රීය ණය ගනුදෙනුකරුවන්ට එරෙහිව ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග අත්හිටුවීම, සුළු පරිමාණ ගනුදෙනුකරුවන්ට සහන සැලසීම සඳහා බැංකු සේවා කිහිපයක ගාස්තු සහ අය කිරීම් අඩු කිරීම වැනි ක්‍රියාමාර්ග රැසක් ගෙන ඇත.

කොවිඩ්-19 වසංගතය විසින් නිර්මාණය කරන ලද නව අභියෝග සහ අවස්ථා

කොවිඩ්19 නිසා ව්‍යාපාරයන්ට ඇති වූ බලපෑම ඒකාකාරී නොවන බව නොරහසකි. වසංගත තත්ත්වය මධ්‍යයේ සමහර ව්‍යාපාර සහ ආර්ථික අංශ මුළුමනින්ම ඇණහිටි අතර, ඇතැම් ව්‍යාපාර සිය ව්‍යාපාර වර්ධනය කරගැනීම සඳහා නව අවස්ථා සහ මංපෙත් සොයාගන්නා ලදී.

වසංගතයේ තත්ත්වයේ වැඩි වීමත් සමඟ ලොව පුරා ව්‍යාපාර රැසක් නිවසේ සිට රාජකාරී කිරීම සහ නම්‍යශීලී රාජකාරී ක්‍රම වෙත යොමු වූ අතර, එම ක්‍රමයන්ගේ ඇති බහුවිධ වාසි සහ අඩු පිරිවැය හේතුවෙන් එය දැන් ස්ථිර වශයෙන් භාවිතයට යොමුවී ඇත. මෙලෙසම, බොහෝ ව්‍යාපාර විසින් ඔවුන්ගේ පිරිවැය අධික ව්‍යාපාරික ගමන් සහ සම්මුඛ රැස්වීම් වෙනුවට මංගත ක්‍රම ඔස්සේ පවත්වන සම්මන්ත්‍රණ සහ අතථ්‍ය රැස්වීම් වෙත යොමු වී ඇත. මෙවැනි අභිරුචිතාවයන් ගේ සිදුවූ වෙනස්වීම් නිසා ව්‍යාපාර විසින් තම යටිතල පහසුකම් භෞතික සහ අත්ථ්‍ය යන දෙවර්ගයේම සංකලනයක් ලෙස පවත්වා ගැනීමට ප්‍රමුඛතාවය ලබා දී ඇත (Sadun, Simcoe, සහ Conti, 202; Nugent, 2021) තවද, ඩිජිටල් සේවා සහ අන්තර්ජාල ගනුදෙනු සඳහා පාරිභෝගික නැඹුරුව වැඩිවීම නිසා සුපිරි වෙළඳසැල්, සිල්ලර වෙළඳාම්, විලාසිතා සහ විනෝදාශ්වාද වැනි සේවා අංශයේ ව්‍යාපාර රැසක් තම ව්‍යාපාර කටයුතු ප්‍රධාන වශයෙන් මංගත සහ ස්මාට් ජංගම දුරකථන යෙදවුම් ඔස්සේ සිදු කිරීමට යොමු වන ලදී. දේශීය වශයෙන් ද, අන්තර්ජාල ඔස්සේ සිදු කෙරෙන සිල්ලර වෙළඳාම් ඉහළ යාම, වීඩියෝ චැනලින් සේවා ඔස්සේ වෛද්‍යවරුන් හමුවීම, මාර්ගගත ඉගෙනුම් සහ උපකාරක පන්ති සේවා සපයන්නන් සඳහා ඇති ඉල්ලුම ඉහළ යාම සහ සිනමා ශාලා, මංගල උත්සව, ප්‍රිය සම්භාෂණ, ප්‍රසංග, සංදර්ශන සහ සැනකෙළි ආදී

8

විශාල වශයෙන් ජනයා රැස්වෙන ක්‍රියාකාරකම් සඳහා අඩු නැඹුරුවක් දැක්වීම යනාදිය මගින් මෙම සන්දර්භය මැනවින් ප්‍රකට කරන ලදී. මෙවැනි වෙනස්කම් ඇතැම් ව්‍යාපාර සහ ඒ ආශ්‍රිත සැපයුම් දාම කෙරෙහි අයහපත් ලෙස බලපෑ අතර, ඇතැම් ව්‍යාපාර විසින් සිය ව්‍යාපාර නව්‍යකරණය සඳහා මෙම වෙනස්කම් නව අවස්ථාවන් බවට පරිවර්තනය කරගැනීමට කටයුතු කර ඇත.

මෙලෙසම, මූල්‍ය ආයතන සහ මූල්‍ය අංශය ද මෙම වසංගත තත්ත්වය හමුවේ බොහෝ අභියෝග සහ අවස්ථාවන්ට මුහුණ දෙන ලදී. වසංගත කාලය තුළ ලොව පුරා මූල්‍ය ආයතන මුහුණ දුන් වඩාත්ම තීරණාත්මක අභියෝගයන් ලෙස ද්‍රවශීලතා සහ ණය අවදානම් හැඳින්විය හැකි අතර, ඒනිසා හටගත් ආර්ථික කටයුතු අඩපණ වීම් හේතුවෙන් ව්‍යාපාර වසා දැමීම, රැකියා සහ ආදායම අහිමි වීම නිසා ණය ගැනුම්කරුවන්ට ඔවුන්ගේ ණය නිසි කලට ආපසු ගෙවීම වඩාත් දුෂ්කර විය. ගෝලීය ආර්ථිකයේ වැඩිවන අවිනිශ්චිතතාවය හේතුවෙන්, ක්‍රමිකව ණය ආපසු ගෙවූ ගනුදෙනුකරුවන්ගේ පවා පසුකාලීනව ණය පැහැර හැරීමේ සම්භාවිතාව සැලකිය යුතු ලෙස වැඩි විය. මෙමගින් මූල්‍ය ආයතනයන්හි වත්කම්වල ගුණාත්මකභාවයට සැලකිය යුතු බලපෑමක් එල්ල විය. ණය ගැතියන් විසින් ණය ආපසු ගෙවීම ප්‍රමාද කිරීම සහ තැන්පත්කරුවන් විසින් සිය තැන්පතු නිතර ආපසු ගැනීම නිසා මූල්‍ය ආයතනයන්හි ද්‍රවශීලතා තත්ත්වයන් ද බලපෑමට ලක් විය. මෙමගින් මූල්‍ය ආයතන හි ණය දීමට ඇති හැකියාව සීමා වූ අතර, එමගින් ආර්ථික ක්‍රියාකාරකම් නැවත යථා තත්ත්වයට පත්කිරීම සඳහා අවශ්‍ය ණය ප්‍රවාහ ද සීමා විය.

වැඩිවන අවිනිශ්චිතතාවය හේතුවෙන් මූල්‍ය ආයතන හි ණය දෙන්නන්, තැන්පත්කරුවන් සහ ආයෝජකයින් විසින් මූල්‍ය ආයතන වෙත වැඩියෙන් අරමුදල් යෙදවීමට මැලි කමක් දැක්වූ බැවින් නව අරමුදල් රැස්කිරීම සහ පවතින අරමුදල් මාර්ග ඉදිරි කාලය සඳහා දීර්ඝ කර ගැනීම මූල්‍ය ආයතන විසින් මුහුණ දුන් තවත් අභියෝගයක් විය. මේ නිසා මූල්‍ය ආයතන හි අරමුදල්වල පිරිවැය ඉහළ ගිය අතර ප්‍රතිමූල්‍යකරණ අවදානම ද වැඩි විය.

වසංගත තත්ත්වය විසින් මූල්‍ය ආයතනයන් හි මෙහෙයුම් අවදානම, සෞඛ්‍ය සහ ආරක්ෂණ අවදානම සහ ව්‍යාපාර අඛණ්ඩතා අවදානම වැනි අනෙකුත් අවදානම් ද වැඩි කළේය. සේවා සැපයීම් ඩිජිටල් ක්‍රම මත වැඩි වශයෙන් රඳා පැවතීම නිසා සයිබර් ආරක්ෂණ අවදානම සහ තාක්ෂණ අවදානම ඉහළ ගිය අතර, මෙවැනි නැගී එන අවදානම් තත්ත්වයන් අවම කිරීම සඳහා මූල්‍ය ආයතන හට වැඩි පිරිවැයක් දැරීමට ද සිදු විය. අවසානයේ දී, ඉහත සඳහන් සියළුම දෑ මූල්‍ය ආයතනයන් හි උපායමාර්ගික අවදානම ඉහළ දැමීමට හේතු විය. "නව සාමාන්‍යය" තුල මූල්‍ය ආයතන විසින් වසංගතයට පෙර සැලසුම් කළ උපායමාර්ග තවදුරටත් වලංගු නොවූ අතර, මූල්‍ය ආයතන හට ඔවුන්ගේ අවදානම් යලි තක්සේරු කිරීමට, ඔවුන්ගේ ප්‍රමුඛතා යලි පෙළගැස්වීමට සහ ඔවුන්ගේ ව්‍යාපාරික දිශානතීන් ගැන යලි විමසා බැලීමට සිදු විය.

කෙසේ වෙතත්, මංගත බැංකුකරණය, මුදල්රහිත ගෙවීම් සහ ඩිජිටල් පසුම්බි වැනි ඇතැම් ව්‍යාපාරික අංශයන් වසංගත කාලය තුළ ශීඝ්‍ර වර්ධනයක් අත්කර ගන්නා ලදී. පොදුවේ ගත් කල, ගෝලීය සහ දේශීය වශයෙන් අඩු වූ පොලී අනුපාතවලින් සහ විදේශ විනිමය අනුපාතිකයන්ගේ උච්ඡාවචනයන් හේතුවෙන් විදේශ මුදල් වත්කම්, වෙළඳපොළ අගයට ගැලපීමේ දී (mark-to-market) ඇති වන ලාභයන් නිසා මූල්‍ය ආයතන ලාභ උපයන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම ප්‍රවනතාවයන් සමීපව නිරීක්ෂණය කළ අතර, මූල්‍ය අංශයේ වැඩිවන අවදානම් විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවන් වලදී කාලීන නියාමන ක්‍රියාමාර්ග හඳුන්වා දීමට කටයුතු කරන ලදී.

සහනාධාර සහ ස්ථායීතාවය සමබර කරගන්නේ කෙසේ ද?

ශ්‍රී ලංකා මහ බැංකුව, මෙරට ප්‍රමුඛතම මූල්‍ය අධිකාරිය ලෙස, සිය මූලික අරමුණු වන ආර්ථික සහ මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව පවත්වා ගැනීමට අහිතකරව බලපෑ හැකි අනවශ්‍ය අවදානම් ගොඩ නැගීම වළක්වා ගනිමින්, බලපෑමට ලක් වූ ආර්ථික අංශ යලි යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය සහන සැපයීමට කාලෝචිත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වසංගත තත්ත්වය හමුවේ මුදල් ප්‍රවාහ කළමණාකරනය කරගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණ දුන් ණය ගනුදෙනුකරුවන් හට, ඔවුන්ගේ ණය නිසි පරිදි නොගෙවීම හේතුවෙන් ඒවා අක්‍රීය ගණයට වැටීම සහ එමගින් මුහුණපෑමට සිදුවන දුෂ්කරතා මගහරවා ගැනිම සඳහා කෙටිකාලීන පිළියමක් ලෙස, ණය සහන කාලයක් හඳුන්වා දෙන ලදී. කෙසේ වෙතත්, මෙම සහන ලබා දෙන කාලය සහ ඒ යටතට ගැනෙන ණය වල වටිනාකම වැඩි වන විට, ණය සහන කාලය තුල මූල්‍ය ආයතන හට තම තැන්පත්කරුවන් හට ගෙවීම් සිදුකිරීමට සහ අනෙකුත් මෙහෙයුම් වියදම් පියවා ගැනීම සඳහා විකල්ප අරමුදල් සපයා ගැනීමට සිදු විය. ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, මූල්‍ය ආයතනයන් හි අරමුදල්වල පිරිවැය පියවා ගැනීමට ප්‍රමාණවත්, නාමික පොලියක් සහන කාලය සඳහා අය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අවසර ලබා දෙන ලදී. කෙසේ වෙතත්, ඉන් අනතුරුව, මෙම අමතර පොලිය හේතුවෙන් ණය ගනුදෙනුකරුවන් මුහුණ දෙන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය ගනුදෙනුකරුවන් සහ මූල්‍ය ආයතන යන දෙපාර්ශවයටම පිරිවැය අවම වන යාන්ත්‍රණයක් සහිත උපායමාර්ගයක් හඳුන්වා දීම සඳහා මේ වන විටත් මූලික කටයුතු සිදු කරමින් පවතී.

මෙම අමතර පොලිය සම්බන්ධයෙන් සමාජයේ විවිධ කතිකාවන් ඇති වුවද, එමගින් තැන්පත්කරුවන්ගේ

8

මුදල් මත අනවශ්‍ය ආතතියක් ඇති නොකරමින් සහ මූල්‍ය ආයතන සහ සමස්ථ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය පවත්වාගනිමින් මාස 18කට වැඩි කාලයක් පුරාවට ණය ගනුදෙනුකරුවන් හට සිය ණය ආපසු ගෙවීම කල් දැමීමට අවස්ථාව ලබා දීම සඳහා මූල්‍ය ආයතන වෙත ඉඩ සැලසෙන ලදී.

ණය සහන ඉවත් කිරීම: නිසි කල්හි වැදගත්කම

ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වෙමින් සහ වෙළඳාම් සඳහා රටවල් තම දේශසීමා යළි විවෘත කරමින් පවතින පසුබිමක, ලොව පුරා මහ බැංකු විසින් කොවිඩ්19 ට ප්‍රතිචාර වශයෙන් ගෙන තිබූ සුවිශේෂී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රමයෙන් ඉවත් කරන ලදී. කෙසේ වෙතත්, ආර්ථිකයේ ද්‍රවශීලතාවය සහ නුබුන්වත්භාවය පවත්වා ගෙන යෑමට හේතුවූ ආධාරක ක්‍රියාමාර්ග නිසි කලට පෙර ඉවත් කිරීමෙන් ආර්ථිකය පුරා පැතිරුණු ණය හිඟයන්, දේපල සින්න වීම්, බුන්වත් වීම් සහ විරැකියාව ඉහළ යෑම ආදී ප්‍රතිවිපාකයන්ට හේතු විය හැකි බවට විශේෂඥයින් අනතුරු අඟවයි. මෙය පශ්චාත්වසංගත ආර්ථික පුනර්ජීවනයට අහිතකර ලෙස බල පෑ හැකි අතර, මේවායේ ස්වයං හටගැනීමේ (self-reinforcing) ස්වභාවය සහ ප්‍රතිපෝෂණ බලපෑම (feedback effect) නිසා ආර්ථිකයට කෙටිකාලීන සහ දිගු කාලීන බලපෑම් ඇති කල හැක (Financial Stability Board, 2021).

එලෙසම, ආධාරක ක්‍රියාමාර්ග දීර්ඝ කාලයක් පවත්වාගෙන යාමෙන් රටෙහි ණය බර වැඩිවීම, සමාගම් සහ කුටුම්භ විසින් අධික ලෙස අවදානම් ගැනීම, ණය අවදානම වැඩි කිරීම සහ සදාචාරාත්මක අවදානම් (moral hazard) ඇති කිරීමට හේතු විය හැක. එමෙන්ම, දැඩි රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් (tight fiscal positions) පවතින රටවලට මෙම සහන දිගු කාලයක් පවත්වාගෙන යාමේ අධික පිරිවැය දැරීමට අපහසු විය හැක. තවද, මෙමගින් ආර්ථික සම්පත් වඩාත් කාර්යක්ෂම අංශ වෙත ගලා යාම සඳහා දුර්වල/ශක්‍යතාවයෙන් තොර ව්‍යාපාර/ව්‍යාපාර ක්‍රම ආර්ථිකයෙන් ඉවත් වීම සහ තාක්ෂණික වෙනස්වීම් වැනි අත්‍යාවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණයන් මන්දගාමී කිරීමට හේතු විය හැක. (Financial Stability Board, 2021).

ණය සහනයෙන් ඔබ්බට ඇත්තේ කුමක්ද?

ණය සහන කාලය සහ අනෙකුත් සහනසාධක ක්‍රියාමාර්ග ඉවත් කිරීම ණය ගැණුම්කරුවන්ට සහ මූල්‍ය ආයතන යන දෙපාර්ශවයන්ටම අභියෝගකාරී වනු ඇත. මෙයට ඉහතින් දක්වා ඇති පරිදි, කොවිඩ්19 වසංගත තත්ත්වය විසින් ව්‍යාපාර ක්ෂේත්‍රයන් ගණනාවකට කර ඇති වෙනස්කම් ස්ථිර ස්වභාවයක් ගන්නා අතර, ඇතැම් ව්‍යාපාරික ආකෘතීන් තවදුරටත් පෙර පරිදිම ලාභදායී නොවිය හැක (Jacobides සහ Reeves, 2020; Morgan, 2020).

ව්‍යාපාර වල අඛණ්ඩතාවය ගැන සලකා බැලීමේදී, මෙම වසංගතය, නිසි ප්‍රාග්ධනයක් නොමැති, හදිසි තත්ත්වයන්ට මුහුණදීම සඳහා සැලසුම් සහ කඩිනම් තීරණ ගැනීමේ හැකියාව නොමැති සමාගම් සඳහා වූ පරීක්ෂාවක් විය. එවැනි ඇතැම් සමාගම් සඳහා, කොවිඩ් වසංගත කාලය තුළ ව්‍යාපාර අඛණ්ඩව පවත්වා ගෙනයාමට හැකිවූ ප්‍රධාන සාධකය ලෙස මෙම සහන ක්‍රියාමාර්ගයන් දැක්විය හැක. එබැවින්, මූල්‍ය ආයතන විසින් ව්‍යාපාර යලි යථා තත්ත්වයට පත්කිරීමට කිරීමට ගන්නා ප්‍රයත්නයන් හිදී ප්‍රමුඛතාවය/අවධානය යොමුකළ යුත්තේ මූල්‍යමය වශයෙන් ශක්‍යතාවයක් ඇති, එහෙත්, ඍජුවම වසංගතය හේතුවෙන් ඇතිවූ ද්‍රවශීලතා සහ බුන්වත් ගැටළු වලින් පීඩා විඳින ව්‍යාපාරයන් වෙතය. එසේම, එවැනි මැදිහත්වීම් නිසි පාරදෘෂ්‍යතාවයකින් සිදු කළයුතු අතර, වෙළඳපොළ තරඟකාරීත්වයට බාධාවක් නොවිය යුතුය (OECD, 2021).

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, ශක්‍යතාවය සහිත ව්‍යාපාර යලි නගාසිටුවීම සඳහා බලපත්‍රලාභී බැංකු තුළ පශ්චාත් වසංගත ආර්ථික පුනර්ජීවන ඒකක පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත මාර්ගෝපදේශ නිකුත් කළේය.

ඒ අනුව, ණය සහන කාලසීමාව අවසන් කිරීම සඳහා ද්‍රවශීලතා සහාය අවශ්‍ය අය ඇතුළුව, ව්‍යාපාර යලි නගාසිටුවීමට සහාය අවශ්‍ය, ශක්‍යතාවය ඇති ව්‍යාපාර සහිත අක්‍රීය සහ ණය ආපසුගෙවීම් දුර්වල ණය ගනු දෙනු කරුවන් හඳුනාගෙන, ඔවුන් යලි නගාසිටුවීමට අදාළ සැලසුම් සකස්කිරීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කරනු ඇත.

එවැනි ණය ගැණුම්කරුවන්ට ඔවුන්ගේ පවතින ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීමට/ප්‍රතිලේඛණගත කිරීමට මූල්‍ය සහ මූල්‍ය නොවන පහසුකම් වල සම්මිශ්‍රණයක් ලබා ගත හැකි අතර ඔවුන්ගේ ව්‍යාපාර යලි නගාසිටුවීම සඳහා අවශ්‍යතාව මත පදනම්ව අමතර ණය පහසුකම් සහ/හෝ වෙනත් සුදුසු ආධාරක ක්‍රියාමාර්ග ද ලබා ගත හැකිවනු ඇත.

කෙසේ වෙතත්, හිතාමතා පැහැර හරින ලද ණය ගැතියන් ලෙස හඳුනාගෙන ඇති ගනුදෙනුකරුවන්, ණයට ගත් මුදල් වෙනත් අරමුණු සඳහා යොදාගෙන ඇති ණය පැහැරහරින්නන් සහ ශක්‍යතාවයකින් තොර ව්‍යාපාර හෝ ව්‍යාපෘති සඳහා ණය යොදවා ඇති සහ ව්‍යාපාරයේ වැරදි කළමනාකරණය සහ/හෝ වංචා හේතුවෙන් ණය පැහැර හැර ඇති ගනුදෙනුකරුවන් හට මෙම අවස්ථා හිමි නොවනු ඇත.

ඉදිරි දැක්ම: තිරසාර, සැමට ප්‍රතිලාභ සැලසෙන ආර්ථික පුනුරුදයක්

ඉහත සියළු මැදිහත්වීම්වල අවසාන ඉලක්කය වනුයේ ආර්ථිකයට සිදුවන බාධා අවම කර ජනතාවගේ ජීවනෝපායන් යලි යථා තත්ත්වයට පත් කිරීමයි. මේ සඳහා ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන් විසින් වසංගතයෙන් උගත් පාඩම් ගැන සාමූහිකව සිතා බැලිය යුතු අතර, තිරසාර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන පශ්චාත් වසංගත ආර්ථික පුනරුදයක් සුරක්ෂිත කිරීමට සවිඥානික උත්සාහයක් දැරිය යුතුය.

8

ඉදිරි කාලය සැලකීමේදී, මූල්‍ය ආයතන සහ ව්‍යාපාර යන දෙඅංශයම ඔවුන්ගේ ව්‍යාපාර ආකෘතීන් ගැන නැවතත් සිතා බැලිය යුතු අතර, කොවිඩ්19 වසංගතය විසින් නිර්මාණය කරන ලද නව ව්‍යාපාරික අවස්ථා ගවේෂණය කරමින්, ඔවුන්ගේ කාර්යක්ෂමතාව සහ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යාපාර ක්‍රියාපටිපාටි සැලසුම් ප්‍රතිනිර්මාණය කළ යුතුය. වැඩිවන අවදානම් තත්ත්වයන් දූරදර්ශීව කළමණාකරණය කරන අතරම, තාක්ෂණික ක්‍රමවේද සඳහා ආයෝජනය කිරීම, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, ඉදිරිකාලයේ දී ප්‍රමුඛතාවය හිමි වන තවත් අංශයකි. මෙහිදී මූල්‍ය ආයතන සහ ව්‍යාපාර ඔවුන්ගේ ණය බර ගැන සැලකිලිමත් වීම වැදගත් අතර, ඔවුන්ගේ නව මුදල් ප්‍රවාහ සහ ආපසු ගෙවීමේ හැකියාවට සරිලන පරිදි සිය ණය පහසුකම් ඒකාබද්ධ කිරීමට, ප්‍රතිව්‍යුහගත කිරීමට හෝ ප්‍රතිලේඛනගත කිරීමට හෝ නුබුන්වත්භාවය පවත්වා ගැනීම සහ එවැනි වර්ධනයක් පවත්වාගෙන යෑම සඳහා අඩු වියදම් අරමුදල් සඳහා විකල්ප මාර්ග සෙවීමට හෝ අභ්‍යන්තරව ප්‍රාග්ධනය ගොඩනැගීම සඳහා යොමු විය යුතු වනු ඇත.

මෙම ක්‍රියාමාර්ගයන්ට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ආයතන හි අභ්‍යන්තර ප්‍රාග්ධන ගොඩනැගීම, ප්‍රතිසාධන සැලසුම් සකස් කිරීම, තාක්ෂණික අවදානම් කළමනාකරණය, දිගුකාලීන අඩු වියදම් අරමුදල් සම්පාදනය සහ මූල්‍ය ආයතනයන් හි අක්‍රීය වත්කම් ක්‍රමානුකූලව බැහැර කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ රැසක් ක්‍රියාත්මක කර ඇත.

මූලාශ්‍ර

- Financial Stability Board. (2021). COVID-19 support measures, Extending, amending and ending. Basel: Financial Stability Board.
- International Monetary Fund. (2022, February 26). Policy Responses to COVID-19. Retrieved from International Monetary Fund: https://www.imf.org/en/Topics/imf-and-covid19/Policy-Responses-to-COVID-19
- Jacobides, M. G., & Reeves, M. (2020, October 30). Adapt Your Business to the New Reality. Retrieved from Havard Business Review: https://hbr.org/2020/09/adapt-your-business-to-the-new-reality
- Morgan, B. (2020, May 01). 10 Examples of How COVID-19 Forced Business Transformation. Retrieved from Forbes: https://www.forbes.com/sites/blakemorgan/2020/05/01/10-examples-of-how-covid-19-forced-business-transformation/?sh=29ac793a1be3
- Nugent, T. (2021, October 14). 5 Ways COVID Has Changed Global Business. Retrieved from Business Because: https://www.businessbecause.com/news/insights/7763/how-covid-has-changed-global-business?sponsored
- OECD. (2021). COVID-19 emergency government support and ensuring a level playing field on the road to recovery. Paris: Organisation for Economic Co-operation and Development.
- Sadun, R., Simcoe, T., & Conti, A. (2021, September 30). Has COVID-19 Permanently Changed Business Strategy? What Experts Say. Retrieved from MIT Sloan Management Review: https://sloanreview.mit.edu/strategy-forum/has-covid-19-permanently-changed-business-strategy-what-experts-say
- The World Bank. (2022). Finance for an Equitable Recovery. Washington, DC: International Bank for Reconstruction and Development / The World Bank.

රාමුව ශක්තිමත් කරන ලද අතරම ණය පහසුකම් සහ අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනාගැනීම සහ මිනුම්කිරීම සම්බන්ධව මූල්‍ය උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 9 සමඟ අනුයාත කිරීම ද සිදුකරන ලදී. මෙම නව විධානයන් ක්‍රියාත්මක කිරීම මගින් බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් සහ අනෙකුත් මූල්‍ය වත්කම්වල දැනට පවතින අවදානම් මෙන්ම අනාගතයේ ඇති විය හැකි අවදානම් පිළිබඳව වඩාත් නිවැරදිව තක්සේරු කිරීමට පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ.

බලපත්‍රලාභී බැංකුවල මෙහෙයුම්වල ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම 2021 වසරේ දී මහ බැංකුව ප්‍රධාන අවධානය යොමු කළ අංශයන්ගෙන් එකකි. ඒ අනුව, ආයතනයට විශේෂ වූ හෝ සමස්ත වෙළඳපොළටම බලපාන ආතතීන් හෝ එම දෙකෙහිම සංකලනයකින් ප්‍රාග්ධනය, ද්‍රවශීලතාවය සහ අනෙකුත් සියලු අංශයන් වෙත ඇතිවන කම්පනයන්ට මුහුණ දීම සඳහා ප්‍රතිසාධන සැලසුම් පවත්වාගෙන යන ලෙස 2021 වසරේ ජූනි මාසයේ දී බලපත්‍රලාභී බැංකු වෙත උපදෙස් ලබා දෙන ලදී.

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ යහභාවිතයන්ට අනුකූලව බලපත්‍රලාභී බැංකුවල තොරතුරු තාක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීමට සහ ශක්තිමත් කිරීම දිරිගැන්වීම සඳහා බලපත්‍රලාභී බැංකුවල තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා නියාමන රාමුවක් හඳුන්වා දෙන ලදී. මෙම නියාමන රාමුව මගින් බලපත්‍රලාභී බැංකු සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ පොදුවේ මෙන්ම, දත්තවල සංවේදීතාව, තොරතුරු පද්ධතිවල අත්‍යවශ්‍ය බව සහ භාවිතා කරන තොරතුරු පද්ධතීන්හි යටිතල ව්‍යුහය වැනි සාධක මත පදනම්ව අවම නියාමන අවශ්‍යතා නිර්ණය කෙරේ. එමෙන්ම, තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය සඳහා වන යහපාලන රාමුව වැඩිදියුණු කිරීමට ද මෙමගින් අපේක්ෂා කෙරේ.

විදේශ මුදල් තැන්පතු සඳහා දැනට පවතින පොලී අනුපාත සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් විදේශ මුදල් තැන්පතු සඳහා පිරිනැමිය හැකි උපරිම පොලී අනුපාත නියම කරන ලද අතර, දැනට පවතින

8

හා අපේක්ෂිත සාර්ව ආර්ථික වර්ධනයන් සැලකිල්ලට ගනිමින්, උකස්කර මත ලබා දෙන නිවාස ණය සඳහා අය කළ හැකි උපරිම පොලී අනුපාත ද නියම කරන ලදී.

2021 වසරේ දී නියාමන අවශ්‍යතා අනුව තවත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක් ද හඳුන්වා දෙන ලදී. ඊට, බලපත්‍රලාභී බැංකු සඳහා බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ විධාන යටතේ මධ්‍යම රජයේ විදේශ හිමිකම් සඳහා අදාළ වන අවදානම් මත බර තැබීම් සංශෝධනය කිරීම, නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් විශේෂයක් ලෙස තායි බාත් තීරණය කිරීම, පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිතායතනයක් ලෙස ලංකා රේටිං ඒජන්සි ලිමිටඩ් ආයතනය නම් කිරීම, පැවති නිරෝධායන ඇඳිරි නීති කාලසීමාව තුළ බැංකු සේවා සැපයීම, 2022 වසර සඳහා බලපත්‍රලාභී බැංකුවල වාර්ෂික බලපත්‍ර ගාස්තු සඳහා නව වාර්ෂික බලපත්‍ර ගාස්තු ව්‍යුහයක් හඳුන්වා දීම යනාදිය ඇතුළත් වේ. 2021 වසර තුළ හඳුන්වා දුන් සියලුම ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති වෙනස්කම්වල ලැයිස්තුව මෙම වාර්තාවේ ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග 2021 වසරේ කොටසේ දක්වා ඇත.

මහ බැංකුව විසින් සිදුකරන ව්‍යවස්ථාපිත පරීක්ෂණයන්, අවදානම් මත පදනම් වූ පරීක්ෂණ ක්‍රමවේදයක් සහ අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආකෘතියක් වන බැංකු තිරසාරත්ව ශ්‍රේණිගත කිරීම (Bank Sustainability Rating Indicator - BSRI) මත පදනම් වූ වඩාත් ශක්තිමත් අධීක්ෂණ මාර්ගෝපදේශ රාමුවක් සමඟින් වැඩි දියුණු කරන ලදී. මේ අනුව, බලපත්‍රලාභී බැංකු 30ටම අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීම් සිදු කරන ලද අතර, සියලු බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ බැංකු තිරසාරත්ව ශ්‍රේණිගත කිරීමේ දර්ශක රාමුවට අනුකූලව සිදු කිරීම සහ අවදානම් මත පදනම් වූ පරීක්ෂණ සඳහා පහසුකම් සැලසීමට බැංකු තිරසාරත්ව ශ්‍රේණිගත කිරීමේ දර්ශකය ද වැඩිදියුණු කරන ලදී. තවද, අධි අවදානම් සහිත ක්ෂේත්‍ර සහ දුර්වල/ අකාර්යක්ෂම බැංකු මෙහෙයුම් පරීක්ෂාව සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් සපයා දෙමින් අනාගත ව්‍යවස්ථාපිත පරීක්ෂාවන්වල දී බැංකුවල අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීම් ඉහළ දැමීමේ ක්‍රම සහ විධි පිළිබඳ අවධානය යොමු කරනු ලබයි. මහ බැංකුවේ ව්‍යවස්ථාපිත පරීක්ෂණයන් හි විෂය පථය බැංකු සමූහයන්ගේ අනිකුත් ආයතනයන් නිසා පැන නගින අවදානම් දක්වා පුළුල් කරමින් තෝරාගත් බැංකු සමූහ සඳහා අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ අධීක්ෂණ පවත්වන ලදී.

8.3 බැංකු නොවන මූල්‍ය ආයතනවල කාර්යසාධනය

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය

විශේෂයෙන්ම ණය වර්ධනය සහ ලාභදායීත්වය හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්යසාධනය 2021 වසර තුළ සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2021 වසර අවසානය වන විට මෙම අංශයේ මුළු වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 1,487.7ක් වූ අතර එය ශ්‍රී ලංකාවේ සමස්ත මූල්‍ය පද්ධතියේ වත්කම්වලින් සියයට 5.6ක් නියෝජනය කරන ලදී. ඇතැම් මුදල් සමාගම් ආයතනික වශයෙන් නියාමන අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වුව ද, මෙම අංශය අවම නියාමන අවශ්‍යතාවලට වඩා හිතකර ප්‍රාග්ධන හා ද්‍රවශීලතාවයක් පවත්වා ගනිමින් ස්ථාවරව පැවතිණි. දුර්වල මූල්‍ය තත්ත්වයන් සහිත බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් නැවත නගා සිටුවීම පිළිබඳ සලකා බලමින් මහ බැංකුව විසින් ප්‍රධාන විචක්ෂණ දර්ශක අධීක්ෂණය අඛණ්ඩව සිදු කරන ලදී. බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ තැන්පත්කරුවන් ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව ශක්තිමත් සහ ස්ථාවර බලපත්‍රලාභී මුදල් සමාගම් මධ්‍ය කාලීනව ගොඩ නැංවීම සඳහා, මූල්‍ය අංශය සඳහා වූ ඒකාබද්ධ කිරීමේ වැඩපිළිවෙල (ඒකාබද්ධකරණ වැඩපිළිවෙල) ක්‍රියාත්මක කරමින් පවතී. එමෙන්ම, කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය හේතුවෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සහ පුද්ගලයන්ට සහාය වීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලට අවශ්‍ය නම්‍යශීලීත්වය ලබා දෙමින් නියාමන පියවර ගණනාවක් හඳුන්වා දෙන ලදී.

8.10 සංඛ්‍යා සටහන

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ශාඛා ව්‍යාප්තිය - පළාත් අනුව

පළාත	2020 අවසානයට (අ)	2021 අවසානයට (ආ)	වසර තුළ වෙනස
මධ්‍යම	166	184	18
නැගෙනහිර	119	142	23
උතුරු මැද	107	111	4
වයඹ	165	180	15
උතුර	96	119	23
සබරගමුව	116	122	6
දකුණ	162	178	16
ඌව	70	82	12
බස්නාහිර	516	589	73
එකතුව	**1,517**	**1,707**	**190**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

8.9 රූප සටහන

2020 සහ 2021 වසර සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ සේවාවන් අනුව සපයන ලද සමස්ත ණය සහ අත්තිකාරම් (දළ)



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ව්‍යාපාර වර්ධනය

ව්‍යාප්තිය : 2021 වසර අවසානයේ දී මෙම අංශය බලපත්‍රලාභී මුදල් සමාගම් 39[1]කින් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 3කින් සමන්විත විය. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ශාඛා 1,707 සහ වෙනත් සේවා සපයන ස්ථාන 309ක් පැවති අතර ඉන් ශාඛා සහ වෙනත් සේවා සපයන ස්ථාන 1,359ක් (සියයට 67.4) බස්නාහිර පළාතෙන් පිටත පිහිටා තිබිණි.

වත්කම් : 2020 වසරේ දී නිරීක්ෂණය කළ සියයට 2.2ක ඍණ වර්ධනයට සාපේක්ෂව මෙම අංශයේ වත්කම් පදනම 2021 වසරේ දී සියයට 6.1කින් (රුපියල් බිලියන 86) රුපියල් බිලියන 1,487.7ක් දක්වා වර්ධනය විය. ණය සහ අත්තිකාරම් කළඹේ වර්ධනය මෙම අංශයේ ප්‍රසාරණයට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම අංශයේ ණය සහ අත්තිකාරම්, සමස්ත වත්කම්වලින් සියයට 76.8ක් විය. මෙම අංශයේ ණය සහ අත්තිකාරම් කළඹේ වැඩි නියෝජනය මූල්‍ය කල්බදු මගින් සිදු කර ඇති අතර එය 2021 වසර අවසානය වන විට සමස්ත ණය සහ අත්තිකාරම්වලින් සියයට 48.3ක් විය. විදේශ විනිමය පිටතට ගලායාම සීමා කිරීමේ පියවරක් ලෙස මෝටර් රථ ආනයනය සඳහා රජය විසින් පනවා ඇති සීමා කිරීම් හේතුවෙන් මූල්‍ය කල්බදු කළඹේ වර්ධනය ප්‍රධාන වශයෙන් පහත වැටිණි. කෙසේ වෙතත්, වෙනත් සුරැකුම් ණය හා අත්තිකාරම් සහ උකස් අත්තිකාරම් ඉහළ යාම හේතුවෙන්, මෙම අංශයේ ණය සහ අත්තිකාරම් කළඹ වසර තුළ වර්ධනයක් වාර්තා කරන ලදී. ඒ අනුව, 2020 වසර තුළ පැවති 5.7ක ඍණ වර්ධනයට සාපේක්ෂව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය විසින් පිරිනමන ලද ණය සහ අත්තිකාරම් සියයට 9.9කින් (රුපියල් බිලියන 102.7) රුපියල් බිලියන 1,142.5 දක්වා 2021 වසරේ දී ඉහළ යන ලදී.

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ආයෝජන කළඹ කොටස්, ආයතනික ණය උපකරණ, රජයේ සුරැකුම්පත් සහ දේපළවල ආයෝජනවලින් සමන්විත විය. 2020 වසරේ දී ආයෝජන කළඹ වාර්තා කළ සියයට 20.2ක සැලකිය යුතු වර්ධනයට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 5.4ක සුළු වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 167.4ක් දක්වා ළඟා විය. මාස 12ට අඩු කාලයකින් කල් පිරෙන රජයේ සුරැකුම්පත්වල ආයෝජනය ඉහළ යාම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

1 මුදල් මණ්ඩලය විසින් 2020 වසරේ ජූලි මස 13 වන දින ව්‍යාපාර කටයුතු අත්හිටු වූ සමාගම් ද්විත්වය ද ඇතුළත් වේ.

8.11 සංඛ්‍යා සටහන

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ වත්කම් සහ වගකීම් සංයුතිය

අයිතමය	2020 (අ)		2021 (ආ)		වෙනස (%)	
	රුපියල් බිලියන	ප්‍රතිශතයක් ලෙස	රුපියල් බිලියන	ප්‍රතිශතයක් ලෙස	2020 (අ)	2021 (ආ)
වත්කම්						
ණය සහ අත්තිකාරම් (ශුද්ධ)	1,039.8	74.2	1,142.5	76.8	-5.7	9.9
ආයෝජන	158.9	11.3	167.4	11.3	20.2	5.4
වෙනත්	203.0	14.5	177.9	12.0	2.6	-12.4
වගකීම්						
සමස්ත තැන්පතු	748.6	53.4	783.3	52.7	-1.1	4.6
සමස්ත ණය ගැනීම්	328.0	23.4	325.9	21.9	-19.1	-0.6
ප්‍රාග්ධන මූලිකාංග	248.1	17.7	304.0	20.4	22.1	22.6
වෙනත්	77.0	5.5	74.5	5.0	14.6	-3.3
සමස්ත වත්කම්/වගකීම්	**1,401.7**	**100.0**	**1,487.7**	**100.0**	**-2.2**	**6.1**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

8.12 සංඛ්‍යා සටහන

බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ තැන්පතුවල සංයුතිය

අයිතමය	වටිනාකම (රු. බිලියන)		සංයුතිය %	
	2020 (අ)	2021 (ආ)	2020 (අ)	2021 (ආ)
ස්ථාවර තැන්පතු	710.5	744.3	94.9	95.0
ඉතුරුම් තැන්පතු	37.3	38.4	5.0	4.9
තැන්පතු සහතිකපත්	0.8	0.6	0.1	0.1
මුළු තැන්පතු	**748.6**	**783.3**	**100.0**	**100.0**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රධාන වශයෙන් මුදල්, බැංකු හා මූල්‍ය ආයතනවල පවත්වාගෙන යනු ලබන ශේෂයන් යනාදියෙන් සමන්විත වූ වෙනත් වත්කම් 2021 වසර තුළ දී සියයට 12.4කින් පහත වැටිණි.

වගකීම් : මෙම අංශයේ වගකීම්වලින් ප්‍රධාන කොටස තවදුරටත් ගනුදෙනුකරුවන්ගේ තැන්පතු මගින් නියෝජනය කරන අතර එය සමස්ත වගකීම්වලින් සියයට 52.7ක් විය. මෙම වසර තුළ දී තැන්පතු සියයට 4.6කින් (රුපියල් බිලියන 34.7) රුපියල් බිලියන 783.3ක් දක්වා වර්ධනය වූ අතර, ණය ගැනීම් රුපියල් බිලියන 325.9ක් දක්වා සියයට 0.6කින් (රුපියල් බිලියන 2.1) පහත වැටිණි.

ලාභදායීත්වය : මෙම අංශයේ ශුද්ධ පොලී ආදායම 2021 වසරේ දී සැලකිය යුතු ලෙස සියයට 18.2කින් (රුපියල් බිලියන 20.2) වර්ධනය වෙමින් රුපියල් බිලියන 131.4ක් දක්වා ළඟා විය. පොලී ආදායම සියයට 5කින් (රුපියල් බිලියන 11.5) අඩු වුව ද පොලී වියදම් සියයට 27.1කින් (රුපියල් බිලියන 31.8) සැලකිය යුතු ලෙස අඩු වීම මෙම වර්ධනයට හේතු විය. දළ සාමාන්‍ය වත්කම්වල ආන්තික වැඩි

8.10 රූප සටහන

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ලාභදායීත්ව දර්ශක



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

8.13 සංඛ්‍යා සටහන

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ආදායම් සහ වියදම් සංයුතිය

අයිතමය	2020 (අ)		2021 (ආ)	
	වටිනාකම (රු. බිලියන)	සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස	වටිනාකම (රු. බිලියන)	සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස
පොලී ආදායම	228.5	15.0	217.0	14.2
පොලී වියදම	117.4	7.7	85.6	5.6
ශුද්ධ පොලී ආදායම	**111.2**	**7.3**	**131.4**	**8.6**
පොලී නොවන ආදායම	32.0	2.1	49.5	3.2
පොලී නොවන වියදම	78.4	5.2	87.1	5.7
අක්‍රීය ණය සඳහා වෙන් කිරීම් (ශුද්ධ)	38.2	2.5	11.1	0.7
බදු පෙර ලාභය	**26.6**	**1.7**	**82.7**	**5.4**
බදු පසු ලාභය	**13.7**	**0.9**	**55.6**	**3.6**

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

වීමට සාපේක්ෂව ශුද්ධ පොලී ආදායමේ ඉහළ වැඩි වීම හේතුවෙන් මෙම අංශයේ ශුද්ධ පොලී ආන්තිකය (සාමාන්‍ය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ශුද්ධ පොලී ආදායම) 2020 වසරේ වාර්තා වූ සියයට 7.3 සිට 2021 වසරේ දී සියයට 8.6ක් දක්වා ඉහළ යන ලදී.

2021 වසරේ දී පොලී නොවන ආදායම සියයට 54.5කින් (රුපියල් බිලියන 17.5) සහ පොලී නොවන වියදම් සියයට 11.1කින් (රුපියල් බිලියන 8.7) ඉහළ ගිය අතර එය මෙම අංශයේ ලාභදායීත්වයට සැලකිය යුතු දායකත්වයක් දැක්වීය. වැටුප්, වේතන සහ වෙනත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ (රුපියල් බිලියන 4.7), පරිපාලන වියදම් (රුපියල් බිලියන 2.8) සහ වෙනත් වියදම් (රුපියල් බිලියන 3) ඉහළ යාම හේතුවෙන් පොලී නොවන වියදම් ප්‍රධාන වශයෙන් ඉහළ යන ලදී. මෙම කාල සීමාව තුළ ණය වාරික එකතු කිරීම විශාල වශයෙන් ඉහළ යාම හේතුවෙන් අක්‍රීය ණයවලට එරෙහිව සිදු කරන ලද ණය අලාභ වෙන්කිරීම් රුපියල් බිලියන 27.1කින් පහළ යන ලදී. ප්‍රධාන වශයෙන් මෙම කාල පරිච්ඡේදය තුළ සුරැකුම්පත් විකිණීම හෝ ආයෝජනය මගින් ලැබූ ආදායම් රුපියල් බිලියන 1.2කින්, සේවා ගාස්තු රුපියල් බිලියන 1.8කින් සහ පැහැර හැරීමේ ගාස්තු රුපියල් බිලියන 6.8කින් වර්ධනය වීම ද ඇතුළත්ව පොලී නොවන ආදායම රුපියල් බිලියන 17.5කින් සැලකිය යුතු ලෙස වර්ධනය වීම හේතුවෙන් මෙම අංශයේ බදු පසු ලාභය, 2020 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 13.7 සිට 2021 වසරේ දී රුපියල් බිලියන 55.6ක් දක්වා සියයට 307.1කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.

8.11 රූප සටහන
බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ අවදානම මත බර තැබූ වත්කම් සහ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2020 වසරේ දී හිමිකම් මත ප්‍රතිලාභ සහ වත්කම් මත ප්‍රතිලාභ පිළිවෙලින් සියයට 6.1ක් සහ සියයට 1.7ක් ලෙස වාර්තා කළ අතර එම වසරට සාපේක්ෂව 2021 වසරේ දී හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය සියයට 20.2ක් දක්වා තියුණු ඉහළ යාමක් වාර්තා කිරීමෙන් සහ බදු පෙර වත්කම් මත ප්‍රතිලාභ සියයට 5.4ක් දක්වා ඉහළ යාමෙන් ලාභදායීත්වයේ ඉහළ යාම පිළිබිඹු වේ. වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ ඉහළ අගයක පැවතීම මෙම අංශයේ ප්‍රාග්ධන උත්පාදනය සඳහා නව ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට ප්‍රයෝජනවත් වනු ඇත. මෙම කාල සීමාව තුළ විශාල ලෙස සමස්ත වියදම අඩුවීම සහ ආදායම ඉහළ යාම හේතුවෙන්, 2020 වසරේ දී වාර්තා වූ ආදායම් මත පිරිවැය අනුපාතය සියයට 89.7 සිට 2021 වසර දී සියයට 69ක් දක්වා වර්ධනය වූ අතර, 2021 වසර තුළ කාර්යක්ෂමතා අනුපාතය සියයට 51.3ක් දක්වා වර්ධනය විය.

ප්‍රාග්ධනය : මෙම වසර තුළ අවම නියාමන අවශ්‍යතාවය අභිබවා ප්‍රාග්ධනය පවත්වා ගෙන යාම හේතුවෙන් මෙම අංශයේ ඔරොත්තු දීමේ හැකියාව අඛණ්ඩව පවත්වා ගැනීමට හැකිවිය. 2021 වසරේ ජනවාරි මස 01 දිනට රුපියල් බිලියන 2ක සහ 2022 වසරේ ජනවාරි මස 01 දිනට රුපියල් බිලියන 2.5ක නියාමන අවශ්‍යතා සපුරාලීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් කිහිපයක් විසින් නව ප්‍රාග්ධනය යෙදවීමත් සමඟ මෙම අංශයේ ප්‍රාග්ධන පදනම 2020 වසර අවසානය වන විට පැවති රුපියල් බිලියන 218.9 ට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 251.6 දක්වා වර්ධනය විය. 2020 වසර අවසානයේ දී පිළිවෙලින් සියයට 14.5 සහ 15.7 යන අගයන්හි පැවති මෙම අංශයේ මූලික ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය සහ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය, 2021 වසර අවසානයේ දී පිළිවෙලින් සියයට 15.5ක් සහ 17ක් දක්වා වර්ධනය විය.

විචක්ෂණ අවශ්‍යතාවලට අනුකූල වන, විවිධාංගීකරණය වූ ව්‍යාපාරික ආකෘතීන් සහිත ශක්තිමත් සහ ස්ථාවර බැංකු නොවන මූල්‍ය ආයතන 25ක් ගොඩනැගීම සඳහා 2021 වසරේ දී ඒකාබද්ධකරණ වැඩපිළිවෙල හඳුන්වා දෙන ලදී. මෙම වැඩපිළිවෙල යටතේ බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 12ක් සඳහා අත්පත් කර ගැනීම් සහ ඒකාබද්ධ කිරීම් සඳහා මූලික අනුමැතීන් 6ක් දැනටමත් ලබා දී ඇත. ඒකාබද්ධකරණ වැඩපිළිවෙල හඳුන්වා දීමට අමතරව, මූල්‍ය තත්ත්වයන් තවදුරටත් පිරිහීම වැළැක්වීම, එවැනි ආයතනවල ස්ථායීතාවය පවත්වා ගැනීම සහ තැන්පත්කරුවන්ගේ ලැදියාවන් සුරක්ෂිත කිරීම සඳහා මහ බැංකුව විසින් නියාමන ක්‍රියාමාර්ග කිහිපයක් දියත් කරන ලදී.

බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ අවදානම්

ණය අවදානම : 2020 වසර අවසානයේ සමස්ත දළ අක්‍රීය ණය සහ අත්තිකාරම් වාර්ෂික පදනම මත වාර්තා වූ සියයට 26.2ක (රුපියල් බිලියන 33.4) වර්ධනයට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 13.9කින් (රුපියල් බිලියන 22) අඩු වී ඇත. දළ අක්‍රීය ණය අනුපාතය, 2020 වසර අවසානය වන විට වාර්තා වූ සියයට 13.9ට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 11ක් දක්වා පහත ගොස් තිබුණ ද, ශුද්ධ අක්‍රීය ණය අනුපාතය තවදුරටත් ඉහළ මට්ටමක පවතී. අක්‍රීය ණය සඳහා ඉහළ වෙන්කිරීම් ආවරණය හේතුවෙන් ශුද්ධ අක්‍රීය ණය අනුපාතය, 2020 වසර අවසානයේ දී වාර්තා කළ සියයට 4.2ට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 2.7ක් දක්වා පහත වැටිණි. 2020 වසරේ දෙසැම්බර් මාසයේ වාර්තා වූ සියයට 58.9ට සාපේක්ෂව 2021 වසරේ දෙසැම්බර් මාසයේ සියයට 66.8ක් දක්වා වෙන්කිරීම් ආවරණ අනුපාතය වැඩි විය. මෙම අංශයේ පවතින ණය අවදානම තවමත් කළමනාකරණය කළ හැකි වුව ද, ණය අවදානම තක්සේරු කිරීමේ දී සහන යෝජනා ක්‍රම යටතේ ණය වර්ගීකරණය අත්හිටුවීමේ බලපෑම සලකා බැලිය යුතු වේ. එමෙන්ම, කොවිඩ්-19 වසංගතයෙන් පසුව 2021 වසරේ දී උකස් අත්තිකාරම් සහ රන් ණය (රුපියල් බිලියන 58) වර්ධනය වීමේ

8

8.12 රූප සටහන
බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ අක්‍රීය ණය පහසුකම් සහ වෙන්කිරීම් ආවරණයන්



ප්‍රවණතාවක් පැවතිණි. එබැවින්, රන් වෙළඳපොළෙහි ඇති විය හැකි ඕනෑම මිල පහත වැටීමක් මෙම අංශයේ කාර්යසාධනයට සහ එහි අක්‍රීය ණයවලට අහිතකර ලෙස බලපානු ඇත.

වෙළඳපොළ අවදානම : මෙම අංශයේ වෙළඳපොළ අවදානම අවම මට්ටමක පැවතුණු අතර එය පොලී අනුපාත අවදානමෙන් හා කොටස් අවදානමෙන් සමන්විත විය.

පොලී අනුපාත අවදානම : භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාත අඛණ්ඩව ඉහළ යාම සමඟ, තැන්පතු සඳහා නිර්දේශිත අනුපාත 2021 වසරේ නොවැම්බර් මස 01 සිට ඉහළ නංවන ලදී. ඒ අනුව, පොලී සහිත වත්කම් හා වගකීම්වල කල්පිරීමේ ඍණ පරතරය හේතුවෙන් පොලී අනුපාත අවදානම ඉහළ යා හැකිය.

8.13 රූප සටහන
බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම්



කොටස් අවදානම : 2020 වසරේ දී සියයට 1ක්ව පැවති සමස්ත වත්කම්වලින් ලැයිස්තුගත කොටස්වල ආයෝජනය 2021 වසරේ දී සියයට 0.8ක් දක්වා පහළ යාම හේතුවෙන් කොටස් වෙළඳපොළ වෙත නිරාවරණය වීම ඉතා පහළ මට්ටමක පැවති බැවින් වසර තුළ කොටස් වෙළඳපොළ හා සම්බන්ධ අවදානම අවම මට්ටමක පැවතිණි.

ද්‍රවශීලතා අවදානම : 2021 වසර තුළ දී මෙම අංශයේ ද්‍රවශීල වත්කම් ප්‍රමාණය අවම නියාමන මට්ටමට වඩා ඉහළ අගයක පවත්වා ගැනීමට හැකි විය. මෙම අංශයේ අවම ද්‍රවශීලතා වත්කම් අවශ්‍යතාවය රුපියල් බිලියන 89.9ක් වන අතර, සමස්ත නියාමන ද්‍රවශීල වත්කම් 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 155.9ක් ලෙස පැවතිණි. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් කොවිඩ්-19 වසංගතයට ප්‍රතිචාර ලෙස ද්‍රවශීල වත්කම් අවශ්‍යතා සඳහා නියාමන ලිහිල් කිරීම අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස අවම ද්‍රවශීලතා අවශ්‍යතාව ඉහළ යාම හේතුවෙන් 2020 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 89ක ද්‍රවශීලතා අතිරික්තයට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට ද්‍රවශීලතා අතිරික්තය සියයට 25.9කින් (රුපියල් බිලියන 23) පහළ යන ලදී. ද්‍රවශීලතා අනුපාතය (තැන්පතු හා ණය ගැනීම්වලට ද්‍රවශීලතා වත්කම් දක්වන අනුපාතය) 2020 වසර අවසානයේ දී වාර්තා කළ සියයට 13කට සාපේක්ෂව 2021 වසර අවසානයේ දී සියයට 14.1ක් දක්වා වර්ධනය විය.

රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික අලෙවිකාර සමාගම්

2021 වසර අවසානය වන විට බලපත්‍රලාභී වාණිජ බැංකු 6ක් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් 7ක් ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි ලියාපදිංචි වී ඇත. එම අලෙවිකරුවන්

8

අතරින් පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පී.එල්.සී. සහ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම යන ආයතනවල ප්‍රාථමික අලෙවිකාර ව්‍යාපාර සහ ක්‍රියාකාරම්හි නියැලීම පිළිවෙලින් 2017 වසරේ අගෝස්තු මස 15 දින සිට සහ 2017 වසරේ ජූලි මස 06 දින සිට තාවකාලිකව අත්හිටුවා ඇත. 2017 වසරේ ජූලි මස 24 දින සිට එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී ආයතනය ප්‍රාථමික වෙන්දේසි සඳහා සහභාගී වීම අත්හිටුවන ලදී. එබැවින් බලපත්‍රලාභී වාණිජ බැංකු 5ක් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් 5ක් පමණක් දැනට රජයේ සුරැකුම්පත් වෙළඳපොළ සඳහා වන ප්‍රාථමික අලෙවිකරුවන් වශයෙන් ක්‍රියාකාරීව සහභාගී වේ.

වත්කම් සහ වගකීම් : ප්‍රාථමික අලෙවිකාර සමාගම්හි සමස්ත වත්කම් ප්‍රමාණය 2021 වසර අවසානය වන විට සියයට 9.8ක පසුබෑමක් පෙන්නුම් කරමින් රුපියල් බිලියන 78.7ක් දක්වා අඩු විය. වෙළඳ කළඹ, අලෙවිය සඳහා පවතින කළඹ සහ කල්පිරීම තෙක් රඳවාගන්නා කළඹ යනාදියෙන් සමන්විත රජයේ සුරැකුම්පත්හි සමස්ත ආයෝජන කළඹ 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 70.5ක් දක්වා සියයට 12කින් අඩු විය. 2020 වසර අවසානයේ දී රුපියල් බිලියන 62.6ක්ව පැවති වෙළඳ කළඹ 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 54.9ක් දක්වා ද 2020 වසර අවසානයේ රුපියල් බිලියන 14.7ක්ව පැවති කල්පිරීම තෙක් රඳවාගන්නා කළඹ 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 12ක් දක්වා ද අඩු විය. 2020 වසර අවසානයේ දී රුපියල් බිලියන 2.8ක් වූ අලෙවිය සඳහා පැවති කළඹ 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 3.6ක් දක්වා වැඩි විය.

ලාභදායීත්වය : ප්‍රතිලාභ අනුපාතයන්හි වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස ලාභදායීත්වයේ සිදු වූ සැලකිය යුතු පසුබෑම පිළිබිඹු කරමින් 2020 වසරේ වාර්තා වූ රුපියල් බිලියන 4.9ක බදු පසු ලාභයට සාපේක්ෂව 2021 වසරේ දී ප්‍රාථමික අලෙවිකාර සමාගම් රුපියල් බිලියන 0.4ක බදු පසු අලාභයක් වාර්තා කර ඇත. ප්‍රාග්ධන ලාභය සැලකිය යුතු ලෙස පහළ යාමත් සමඟ 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ ප්‍රාථමික අලෙවිකාර සමාගම් වාර්තා කළ විශාල ප්‍රත්‍යාගණන අලාභය, 2021 වසරේ බදු පසු අලාභයට ඉහළ දායකත්වයක් සපයා ඇත. තවද ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල වත්කම් මත ප්‍රතිලාභ අනුපාතිකය සහ හිමිකම් මත ප්‍රතිලාභ පිළිවෙලින් 2020 වසර අවසානය වන විට පැවති සියයට 7.6ක සහ සියයට 30.5ක සිට 2021 වසර අවසාන වන විට සියයට සෘණ 0.7ක් සහ සියයට සෘණ 3.2ක් දක්වා පහළ ගියේය.

ප්‍රාග්ධනය : වසර තුළ වාර්තා වූ අලාභ හේතුවෙන් ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල කොටස් හිමිකම සියයට 6.7කින් සැලකිය යුතු ලෙස පහළ යන ලදී. ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල අවදානම් මත බර තබන ලද ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාතිකය 2020 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 27ක සිට 2021 වසර තුළ දී සියයට 42.8ක් දක්වා ඉහළ යාමක් පෙන්නුම් කළ අතර, ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල එම අනුපාතිකය එහි අවම අවශ්‍යතාවය වන සියයට 10ට වඩා වැඩි අගයක පැවතිණි.

ප්‍රාථමික අලෙවිකාර අංශයේ අවදානම්

වෙළඳපොළ අවදානම : මෙම අංශයේ සාපේක්ෂ වෙළඳපොළ අවදානම අඩුවීම පිළිබිඹු කරමින් ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල වෙළඳපොළ අවදානම සුළු වශයෙන් පහළ ගිය අතර වෙළඳ කළඹ, සමස්ත ආයෝජන කළඹෙහි අනුපාතිකයක් ලෙස 2020 වසර අවසානයේ පැවති සියයට 78.2ක සිට 2021 වසර අවසානය වන විට සියයට 77.9ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය.

ද්‍රවශීලතා අවදානම : 2021 වසර අවසානය වන විට, දිනක් ඇතුළත කල්පිරෙන වත්කම් සහ වගකීම්වල සෘණ නොගැලපීම වැඩිවීම, ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල සමස්ත ද්‍රවශීලතා අවදානම සඳහා නිරාවරණය වීම වැඩිවීමට හේතු විය. 2020 වසර අවසානය වන විට රුපියල් බිලියන 13 (සියයට 79.5ක්) ලෙස පැවති දිනක් ඇතුළත කල්පිරෙන වත්කම් හා වගකීම්වල සෘණ නොගැලපීම 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 20.3ක් දක්වා වැඩි විය. මෙය එක් දිනක් සඳහා වන වගකීම් 2021 වසර අවසානය වන විට සියයට 82.8කින් ඉහළ යාමකි. ප්‍රාථමික අලෙවිකරුවන් විසින් අවදානම් රහිත රාජ්‍ය සුරැකුම්පත් විශාල ප්‍රමාණයක් පවත්වාගෙන යෑම සහ එවැනි රාජ්‍ය සුරැකුම්පත් අනපේක්ෂිත ද්‍රවශීලතා පරතරයන් පියවා ගැනීම සඳහා අරමුදල් සපයා ගැනීමේ සුරැකුමක් ලෙස යොදා ගැනීමට ඇති හැකියාව හේතුවෙන්, ද්‍රවශීලතා ගැටලුවලට මුහුණදුන් එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී. හැර අනෙකුත් ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ද්‍රවශීලතා අවදානම පහළ මට්ටමක පැවතුණි. ද්‍රවශීලතා පරතරය පියවා ගැනීම සඳහා පෙර සූදානම් කරගත් හදිසි අරමුදල් සපයා ගැනීමේ සැලසුම් ප්‍රාථමික අලෙවිකරුවන් බොහෝමයක් සතුව පැවතිණි.

වෙළඳපොළ සහභාගීත්වය

ප්‍රාථමික වෙළඳපොළ ක්‍රියාකාරකම්: භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන ප්‍රාථමික වෙළඳපොළ වෙන්දේසි සඳහා ප්‍රාථමික

8

අලෙවිකරුවන්ගේ සහභාගීත්වය 2021 වසර තුළ දී මිශ්‍ර කාර්යසාධනයක් පිළිබිඹු කරන ලදී. 2021 වසරේ දී පවත්වන ලද සමස්ත භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි 52 මගින් පිළිගන්නා ලද සමස්ත ලංසු ප්‍රමාණයන් සඳහා ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස වරලත් බලපත්‍රලාභී බැංකු, ප්‍රාථමික අලෙවිකාර සමාගම් සහ සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය පිළිවෙලින් සියයට 43.1ක්, සියයට 56.3ක් සහ සියයට 0.6ක් විය. 2021 වසරේ දී පැවැත්වූ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි 22ක් තුළ ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස වරලත් බලපත්‍රලාභී බැංකු, ප්‍රාථමික අලෙවිකාර සමාගම් සහ සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය පිළිවෙලින් සියයට 36ක්, සියයට 27.5ක් සහ සියයට 36.5ක් විය.

ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ද්විතීයික වෙළඳපොළ ක්‍රියාකාරකම්: 2021 වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත් හා සම්බන්ධ ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු (වටිනාකම අනුව) රුපියල් බිලියන 5,068.3ක් දක්වා සියයට 33.1කින් අඩුවීමක් දක්නට ලැබුණු අතර එයින් සියයට 63.5ක් ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු විය. 2020 වසර සමඟ සැසඳීමේදී 2021 වසර තුළ දී ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල එකවර මිලදී ගැනුම් සියයට 56කින් අඩු වූ අතර එකවර විකුණුම් සියයට 11.4කින් වැඩිවිය.

බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්

සමාගම් 4කින් සමන්විත වන බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් අංශය සියයට 27.2ක වර්ධනයක් සමඟින් 2021 වසර අවසානයේ දී වාර්තා කළ මුළු වත්කම් පදනම රුපියල් බිලියන 8.4ක් විය. සමස්ත වත්කම් ප්‍රමාණයෙන් සියයට 74.6ක් වූ ක්ෂුද්‍රමූල්‍ය ණය හා අත්තිකාරම් එහි විශාලතම කොටස විය. 2020 වසර අවසානයේ දී රුපියල් බිලියන 5.3ක් ලෙස වාර්තා වූ ක්ෂුද්‍රමූල්‍ය ණය හා අත්තිකාරම් සියයට 14.8ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 6.3ක් ලෙස සටහන් විය. 2021 වසර අවසානය වන විට ක්ෂුද්‍රමූල්‍ය සමාගම් අංශයෙහි අක්‍රීය ණය අනුපාතය සියයට 16.8ක් විය. මෙම අංශයේ සමස්ත තැන්පතු පදනම 2020 වසරේ පැවති රුපියල් මිලියන 488 සිට 2021 වසරේ දී රුපියල් මිලියන 544ක් දක්වා සියයට 11කින් වර්ධනය විය. 2020 වසරේ පැවති රුපියල් බිලියන 4.4 සිට 2021 වසරේ දී රුපියල් බිලියන 5.5ක් දක්වා සියයට 29කින් මෙම අංශයේ සමස්ත වගකීම් වර්ධනය වී තිබියදීත්, 2020 වසරේ පැවති හිමිකම් සියයට 1.9 සිට වර්ධනය වීමත් සමඟ හිමිකම්වලට ණය අනුපාතය සියයට 2ක් දක්වා වැඩි විය. කොවිඩ්-19 වසංගතය හමුවේ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වලට පවත්නා ද්‍රවශීල වත්කම් භාවිතයෙන් අවශ්‍ය පරිදි අදාළ මෙහෙයුම් වියදම් පියවා ගැනීමට ඉඩ ප්‍රස්තාව ලබාදීම සඳහා මුදල් මණ්ඩලය විසින් ද්‍රවශීල වත්කම් පවත්වාගෙන යාමේ අවම මට්ටම නියම කෙරෙන 2016 අංක 06 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ විධානයන් අහෝසි කිරීමේ තීරණය, තව දුරටත් ක්‍රියාත්මක කෙරිණි. බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්වල සමස්ත මූලික ප්‍රාග්ධනය රුපියල් බිලියන 2.7ක් ලෙස සටහන් වූ අතර සියලුම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් මූලික ප්‍රාග්ධනය සඳහා වන අවම විචක්ෂණශීලී රෙගුලාසිවලට අනුගතව ක්‍රියාත්මක විය.

ඒකක භාර අංශය

ඒකක භාර සංඛ්‍යාව 2020 වසර අවසානයට සාපේක්ෂව 2021 වසර අවසානයේ 75ක් ලෙස නොවෙනස්ව පැවති අතර, ඒකක භාර කළමනාකරණ සමාගම් සංඛ්‍යාව 2020 වසර අවසානයේ වාර්තා වූ 18ක සිට 16ක් දක්වා 2021 වසර අවසාන වන විට පහත වැටුණි. ඒකක භාර අරමුදල ප්‍රධාන වශයෙන් මුදල් වෙළඳපොළ අරමුදල් සහ ආදායම් අරමුදල්වලින් සමන්විත වන අතර එය පිළිවෙළින් ඒකක භාර අංශයේ සියයට 23ක් සහ සියයට 21ක් නියෝජනය කරයි. මීට අමතරව, ගිල්ට් එඩ්ජ් අරමුදල්, වර්ධන අරමුදල් සහ සමතුලිත අරමුදල් ඒකක භාර අංශයේ පිළිවෙලින් සියයට 15ක්, සියයට 13ක් සහ සියයට 12ක් සඳහා දායක විය.

ව්‍යාපාර වර්ධනය: 2021 වසර තුළ දී ඒකක භාර අංශයේ මුළු වත්කම් පදනමෙහි සෘණාත්මක වර්ධනයක් දක්නට ලැබුණි. 2021 වසර අවසානයේ දී මෙම අංශයේ සමස්ත වත්කම් රුපියල් බිලියන 195ක් දක්වා සියයට 3කින් පහත වැටුණි. නිකුත් කරන ලද ඒකක සංඛ්‍යාව 2020 වසර අවසානයේ දී වාර්තා වූ මිලියන 8,014 සිට 2021 වසර අවසානයේ දී මිලියන 7,835 දක්වා අඩු වී ඇති බව දක්නට ලැබුණි. කෙසේවුවද, සමස්ත ඒකක

8.14 සංඛ්‍යා සටහන

ඒකක භාර අංශයේ ක්‍රියාකාරීත්වය

අයිතමය	2020 (අ)	2021 (ආ)
ඒකක භාර සංඛ්‍යාව	75	75
සමස්ත ඒකක හිමියන්ගේ සංඛ්‍යාව	52,402	59,426
නිකුත් කළ ඒකක ගණන (මිලියන)	8,014	7,835
සමස්ත වත්කම් (රු. බිලියන)	201.0	195.0
ශුද්ධ වත්කම් අගය (රු. බිලියන)	201.5	191.3
කොටස්වල ආයෝජන (රු. බිලියන)	14.1	17.6
සමස්ත ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස (%)	7.0	9.1
රජයේ සුරැකුම්පත්වල ආයෝජනය (රු. බිලියන)	25.3	23.4
සමස්ත වත්කම්වල ප්‍රතිශතයක් ලෙස (%)	12.6	12.1

(අ) සංශෝධිත
(ආ)තාවකාලික

මූලයන්: ශ්‍රී ලංකා ඒකක භාර සංගමය
ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

8

8.14 රූප සටහන
අරමුදල් සංඛ්‍යාව අනුව ඒකක භාර අංශයේ වර්ගීකරණය



* වෙනත්: ෂාරියා අරමුදල් 4ක්, මූලික හිමිකම් නිකුතු අරමුදලක් සහ ඩොලර් අරමුදලක්

මූලය: ශ්‍රී ලංකා ඒකක භාර සංගමය

හිමියන් සංඛ්‍යාව 2020 වසර අවසානයේ වාර්තා වූ 52,402ක සිට 2021 වසර අවසානයේ දී 59,426ක් දක්වා ඉහළ ගියේය.

ආයෝජන: ඒකක භාර විසින් රජයේ සුරැකුම්පත්වල කරන ලද ආයෝජන මෙම අංශයේ ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 12.6ක සිට 2021 වසර අවසානයේ දී සියයට 12.1ක් දක්වා පහත වැටුණි. කෙසේවුවද, මෙම අංශයේ කොටස්වල ආයෝජනය ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස 2020 වසර අවසානයේ දී පැවති සියයට 7ට සාපේක්ෂව 2021 වසර අවසානයේ දී සියයට 9.1ක් දක්වා ඉහළ ගොස් ඇත.

රක්ෂණ අංශය

2021 වසර අවසන් වන විට රට තුළ රක්ෂණ සමාගම් 27ක් මෙහෙයුම් කටයුතුවල නිරත වූ අතර, ඉන් 13ක් දිගුකාලීන රක්ෂණ සමාගම් ලෙසත්, 12ක් සාමාන්‍ය රක්ෂණ සමාගම් ලෙසත්, සමාගම් 2ක් දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ යන ව්‍යාපාර දෙකෙහිමත් නිරත වූහ.

2021 වසර තුළ රක්ෂණ අංශයේ වත්කම් පදනමේ සුළු වර්ධනයක් වාර්තා විය. 2021 වසර අවසානය වන විට රක්ෂණ අංශයේ මුළු වත්කම් ප්‍රමාණය වාර්ෂික පදනම මත සියයට 11.4කින් වර්ධනය වී තිබුණු අතර එය රුපියල් බිලියන 879.8ක් දක්වා වැඩි වී තිබුණි. දිගුකාලීන රක්ෂණ උප අංශයේ වත්කම් පදනම 2020 වසර අවසානය වන විට වාර්තා වූ සියයට 16.1ක වර්ධනයට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 633ක් දක්වා සියයට 12.3කින් වර්ධනය වූ අතර, සාමාන්‍ය රක්ෂණ උප අංශයේ වත්කම් පදනම 2021 වසර අවසානය වන විට රුපියල්

8.15 සංඛ්‍යා සටහන
රක්ෂණ අංශයේ ක්‍රියාකාරිත්වය*

රු. බිලියන

අයිතමය	2020 (අ)	2021 (ආ)
සමස්ත වත්කම්	789.7	879.8
රජයේ සුරැකුම්පත්	309.3	337.1
හිමිකම් කොටස්	44.8	53.8
අතැති මුදල් හා තැන්පතු	117.3	132.5
දළ වාරිකය	208.2	233.8
සමස්ත ආදායම	264.3	298.6
වාරික ආදායම	208.2	233.8
අයෝජන ආදායම	56.1	64.9
බදු පෙර ලාභය	40.4	38.4
ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතය (%)		
- දිගු කාලීන රක්ෂණය	352.0	384.0
- සාමාන්‍ය රක්ෂණය	272.0	224.0
රඳවා ගැනීම් අනුපාතය (%)		
- දිගු කාලීන රක්ෂණය	95.4	96.0
- සාමාන්‍ය රක්ෂණය	82.4	76.2
හිමිකම් අනුපාතය (%)		
- දිගු කාලීන රක්ෂණය	38.6	38.7
- සාමාන්‍ය රක්ෂණය	49.2	55.8
ඒකාබද්ධ මෙහෙයුම් අනුපාතය (%)		
- දිගු කාලීන රක්ෂණය	82.7	81.2
- සාමාන්‍ය රක්ෂණය	88.6	94.9
වත්කම් මත ප්‍රතිලාභය (%)		
- දිගු කාලීන රක්ෂණය	3.3	3.4
- සාමාන්‍ය රක්ෂණය	10.7	7.8
හිමිකම් මත ප්‍රතිලාභය (%)		
- දිගු කාලීන රක්ෂණය	14.5	15.7
- සාමාන්‍ය රක්ෂණය	22.7	15.5
ප්‍රාරක්ෂණ අනුපාතය (%)		
- සාමාන්‍ය රක්ෂණය	32.6	25.3

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
*ජාතික රක්ෂණ භාර අරමුදලේ තොරතුර හැර

මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

බිලියන 246.8ක් දක්වා සියයට 9.2කින් ඉහළ යන ලදී. 2021 වසර අවසානය වන විට රක්ෂණ අංශයේ සමස්ත වත්කම්වල ප්‍රතිශතයක් ලෙස දිගුකාලීන රක්ෂණ උප අංශයේ වත්කම් තවදුරටත් ඉහළ අගයක් දරමින් සියයට 71.9ක පැවති අතර, එය 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 71.4ක සිට සුළු වර්ධනයකි. මෙම වර්ධනයට සමගාමීව, රක්ෂණ අංශයේ සමස්ත වත්කම්වල ප්‍රතිශතයක් ලෙස සාමාන්‍ය රක්ෂණ උප අංශයේ සමස්ත වත්කම් 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 28.6ක සිට 2021 වසර අවසානය වන විට සියයට 28.1ක් දක්වා පහත වැටුණි.

රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරිකය 2020 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 208.2 සිට 2021 වසර අවසානය වන විට රුපියල් බිලියන 233.8ක් දක්වා සියයට 12.2කින් වර්ධනය විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී දිගුකාලීන රක්ෂණ උප අංශයේ සහ සාමාන්‍ය රක්ෂණ උප අංශයේ දළ ලියාහළ වාරික

8

8.15 රූප සටහන
රක්ෂණ අංශයේ දළ ලියා හළ වාරික ආදායම



මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

පිළිවෙළින්, සියයට 21.1කින් සහ සියයට 3.6කින් ඉහළ ගියේය. ඒ අනුව, 2021 වසර අවසානය වන විට දිගුකාලීන රක්ෂණ උප අංශය මුළු දළ ලියාහළ වාරිකයට ප්‍රධාන දායකත්වය දක්වමින් සියයට 53.3ක දායකත්වයක් වාර්තා කළේය. මෝටර් රථ රක්ෂණ කාණ්ඩය සාමාන්‍ය රක්ෂණ උප අංශයෙහි ප්‍රධාන කාණ්ඩය වූ අතර එය 2021 වසර අවසානය වන විට සාමාන්‍ය රක්ෂණයට සියයට 55.9ක දායකත්වයක් දක්වා ඇත. මෝටර් රථ රක්ෂණ කාණ්ඩයේ දළ ලියාහළ වාරිකය 2021 වසර අවසානය වන විට සියයට 0.3කින් සුළු වශයෙන් පහත වැටුණි.

2021 වසර තුළ දී රක්ෂණ අංශයෙහි ලාභදායීත්වය පහත වැටුණු අතර බදුපෙර ලාභයෙහි සියයට 4.9ක අඩුවීමක් වාර්තා විය. 2021 වසර තුළ දී දිගුකාලීන රක්ෂණ උප අංශයේ බදුපෙර ලාභය සියයට 16.1ක වර්ධනයක් වාර්තා කළ අතර 2021 වසරේ දී වැඩි වූ හිමිකම් පෑම් හේතුවෙන් සාමාන්‍ය රක්ෂණ උප අංශයේ බදුපෙර ලාභය සියයට 20.7ක අඩුවීමක් වාර්තා කරන ලදී. මේ අතර, මෙම අංශයේ ප්‍රාරක්ෂණ ලාභය 2021 වසර අවසානය වන විට සියයට 22.1කින් පහත වැටුණි.

2021 වසර අවසානය වන විට රක්ෂණ අංශයෙහි හිමිකම් පෑම් රුපියල් බිලියන 94.7ක් වූ අතර එය සියයට 17.8ක වර්ධනයකි. 2021 වසර අවසානය වන විට දිගුකාලීන රක්ෂණ උප අංශයේ සහ සාමාන්‍ය රක්ෂණ උප අංශයේ හිමිකම් පෑම් පිළිවෙළින්, සියයට 22.3කින් සහ සියයට 13.8කින් වර්ධනය විය.

2020 වසරට සාපේක්ෂව සලකා බලනු ලබන වසර තුළ දී දිගුකාලීන රක්ෂණ උප අංශයේ වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය ඉහළ ගිය අතර සාමාන්‍ය රක්ෂණ උප අංශයේ වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය පහත වැටුණි. 2021 වසර අවසානය වන විට දිගුකාලීන රක්ෂණ උප අංශයේ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සියයට 3.4ක් දක්වා වර්ධනය වූ අතර සාමාන්‍ය රක්ෂණ උප අංශයේ වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සියයට 7.8ක් දක්වා පහත වැටුණි. දිගුකාලීන රක්ෂණ උප අංශයේ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 2020 වසර අවසානයේ පැවති සියයට 14.5 සිට 2021 වසර අවසානය වන විට සියයට 15.7ක් දක්වා වර්ධනය වූ අතර සාමාන්‍ය රක්ෂණ උප අංශයේ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය 2020 වසර අවසානයේ පැවති සියයට 22.7 සිට 2021 වසර අවසානය වන විට සියයට 15.5ක් දක්වා පහත වැටුණි.

දිගුකාලීන රක්ෂණ උප අංශයේ සමස්ත වත්කම් මත ප්‍රාග්ධනය 2020 වසර අවසානය වන විට පැවති සියයට 22.1ක සිට 2021 වසර අවසානය වන විට සියයට 20.9ක් දක්වා පහත වැටුණු අතර සාමාන්‍ය රක්ෂණ උප අංශයේ සමස්ත වත්කම් මත ප්‍රාග්ධනය 2020 වසර අවසානය වන විට පැවති සියයට 48.3ක සිට 2021 වසර අවසානය වන විට සියයට 50.4ක් දක්වා වර්ධනය විය.

රක්ෂණ අංශයෙහි ආයෝජන තවදුරටත් වැඩි වශයෙන් රජයේ සුරැකුම්පත් මත කේන්ද්‍රගත වී ඇත. දිගුකාලීන රක්ෂණ උප අංශය රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති වත්කම් කොටස 2020 වසර අවසානයේ පැවති සියයට 46.8ට සාපේක්ෂව 2021 වසර අවසානයේ සියයට 46.1ක් දක්වා පහත වැටුණු අතර, සාමාන්‍ය රක්ෂණ උප අංශය රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති වත්කම් කොටස 2020 වසර අවසානයේ පැවති සියයට 40.7ට සාපේක්ෂව 2021 වසර අවසානයේ සියයට 45.7ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වුවද, දිගුකාලීන රක්ෂණ උප අංශයේ සහ සාමාන්‍ය රක්ෂණ උප අංශයේ සමස්ත ආයෝජනවලින් කොටස්වල ආයෝජන 2020 වසර අවසානයේ පැවති සියයට 6.3 සහ සියයට 7.6 සිට 2021 වසර අවසානය වන විට පිළිවෙළින්, සියයට 7.2ක් සහ සියයට 8ක් දක්වා ඉහළ ගියේය.

විශ්‍රාම අරමුදල්

2021 වසර අවසානයේ දී විශ්‍රාම අරමුදල්වල වත්කම් මූල්‍ය අංශයේ මුළු වත්කම්වලින් සියයට 14.5ක් වූ අතර එය රුපියල් බිලියන 3,876.3ක් ලෙස වාර්තා විය. විශ්‍රාම අරමුදල් අංශයේ ප්‍රමුඛත්වය දරන සේවක අර්ථසාධක අරමුදල එම අංශයේ මුළු වත්කම්වලින් සියයට 81.7ක් නියෝජනය කරයි. මීට අමතරව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සහ රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල නම් වූ රාජ්‍ය ආයතන විසින් කළමනාකරණය කරන අරමුදල් දෙකක් ද වේ.

8

සේවක අර්ථසාධක අරමුදල

1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත (සේ.අ.අ පනත) ප්‍රකාරව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ./අරමුදල) භාරකාරීත්වය මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පවරා ඇති අතර, එහි පරිපාලනය කම්කරු කොමසාරිස් වෙත පවරා ඇත. සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධානවලට අනුව මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම් හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

අරමුදලෙහි මුළු වටිනාකම 2020 වසර අවසානයේ වාර්තා වූ රුපියල් බිලියන 2,824.3ට සාපේක්ෂව 2021 වසර අවසානය වන විට සියයට 12.1ක වර්ධනයක් පෙන්නුම් කරමින්, අරමුදලේ සමස්ත වටිනාකම රුපියල් බිලියන 3,166.1ක් දක්වා රුපියල් බිලියන 341.8කින් වැඩිවිය. සාමාජිකයන්ගේ ශුද්ධ දායක මුදල් ලැබීම් (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) මෙන්ම අරමුදල් ආයෝජනය තුළින් උපයාගත් ආදායම් යන ඒවායෙහි සමස්ත ප්‍රතිඵලය මෙම වර්ධනයට හේතු විය. අරමුදල සාමාජිකයන් වෙත වූ මුළු වගකීම (සාමාජික ශේෂ) 2021 වසර අග වනවිට රුපියල් බිලියන 3,066.9ක් වූ අතර, එය 2020 වසර අග පැවති රුපියල් බිලියන 2,767.8ට සාපේක්ෂව සියයට 10.8ක වර්ධනයකි. 2021 වසර සඳහා මුළු දායක මුදල් ලැබීම් සියයට 9.9කින් රුපියල් බිලියන 165.7ක් දක්වා වර්ධනය වූ අතර, සාමාජිකයන් හා ඔවුන්ගේ නෛතික උරුමක්කරුවන් හට සිදු කළ සමස්ත ප්‍රතිලාභ ගෙවීම් රුපියල් බිලියන 118.2ක් වූ අතර, එය 2020 ට සාපේක්ෂව සියයට 7.7ක වර්ධනයකි. ඒ අනුව, 2021 වසරට අදාළ ශුද්ධ දායක මුදල් ලැබීම් පෙර වසරේ පැවති රුපියල් බිලියන 41.0ක් හා සසඳන කළ රුපියල් බිලියන 47.5ක් විය. 2021 වසරේ අරමුදලෙහි ශුද්ධ ආදායම රුපියල් බිලියන 299.1ක් වූ අතර, එය පෙර වසරේ ශුද්ධ ආදායම වූ රුපියල් බිලියන 244.9 හා සසඳන විට සියයට 22.1ක වර්ධනයකි. මෙයට ප්‍රධානතම හේතුව වූයේ ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් (ලැයිස්තුගත කොටස්) මත ශුද්ධ ලාභය රුපියල් බිලියන 36.8කින් ඉහළ යාමයි.

8.16 සංඛ්‍යා සටහන

සේවක අර්ථසාධක අරමුදලේ කාර්යසාධනය පිළිබඳ වසර පහක සාරාංශය

අයිතමය	2017	2018	2019	2020(අ)	2021(ආ)
අරමුදලේ සමස්ත වටිනාකම (රු. බිලියන)	2,066.3	2,289.4	2,540.4	2,824.3	3,166.1
සාමාජිකයන් සඳහා වූ මුළු වගකීම (රු. බිලියන)	2,020.8	2,254.2	2,497.6	2,767.8	3,066.9
මුළු දයක මුදල් ලැබීම් (රු. බිලියන)	133.3	145.0	157.2	150.7	165.7
මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු. බිලියන)	117.5	108.0	126.3	109.7	118.2
ශුද්ධ දායක මුදල් ලැබීම් (රු. බිලියන)	15.8	37.0	30.9	41.0	47.5
පොළි අනුපාතය (%)	10.50	9.50	9.25	9.00	9.00
මුළු සාමාජික ගිණුම් (මිලියන)	18.1	18.7	19.4	19.8	19.8
සක්‍රීය සාමාජික ගිණුම් (මිලියන)	2.8	2.9	2.9	2.6	2.3

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

අරමුදලෙහි සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම (පොත් අගය) 2020 වසරේ පැවති රුපියල් බිලියන 2,829.5ට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 3,173.3ක් දක්වා සියයට 12.2කින් වර්ධනය විය. අරමුදලෙහි ආයෝජන ප්‍රතිපත්තිය, අරමුදලෙහි සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගනිමින්, සාමාජිකයින්ට දිගුකාලීන ධන මූර්ත ප්‍රතිලාභයක් ලබා දීමේ අරමුණ පෙරදැරිව ක්‍රියාත්මක කෙරුණු අතර එහි දී සාමාජිකයන්ට ප්‍රතිලාභ ගෙවීම් සහ අනෙකුත් මෙහෙයුම් වියදම් සපුරාගැනීම සඳහා අවශ්‍ය ද්‍රවශීලතාව පවත්වා ගැනීම ද සලකා බලනු ලැබීය. ඒ අනුව, 2021 වසර අවසානය වන විට අරමුදලෙහි සමස්ත ආයෝජන කළඹෙන් සියයට 93.2ක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර තිබූ අතර, සමාගම් කොටස්වල සියයට 3.8ක් ද සාංගමික ණයකරවල සියයට 0.8ක් ද ස්ථාවර තැන්පතුවල සියයට 1.8ක් ද ඉතිරි සියයට 0.4 ප්‍රතිවිකුණුම් ගිවිසුම්වල ද ආයෝජනය කර තිබුණි.

ආයෝජන ආදායම : අරමුදලෙහි සමස්ත ආයෝජන ආදායම 2021 වසරේ දී රුපියල් බිලියන 342.2ක් ලෙස වාර්තා වූ අතර, එය පෙර වසර හා සැසඳීමේ දී සියයට 19.9ක වර්ධනයකි. පොලී ආදායම, අඛණ්ඩව අරමුදලෙහි ප්‍රධාන ආදායම් ප්‍රභවය ලෙස පැවති අතර එය 2020 වසරේ උපයන ලද රුපියල් බිලියන 277.4ට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් බිලියන 293.7ක් දක්වා සියයට 5.9කින් වර්ධනය විය. 2021 වසරේ ලාභාංශ ආදායම රුපියල් බිලියන 6.7ක් දක්වා වැඩි වූ අතර, එය 2020 වසරේ දී පැවති රුපියල් බිලියන 3.0ට සාපේක්ෂව සියයට 124.0ක වැඩි වීමකි. ලාභය හෝ අලාභය තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් මත ශුද්ධ ලාභය/අලාභය 2020 වසරේ දී රුපියල් බිලියන 5.0ක ශුද්ධ ලාභයක් ලෙස වාර්තා වූ අතර 2021 වසරේ දී එය රුපියල් බිලියන 41.8ක ශුද්ධ ලාභයක් ලෙස දැක්විණ.

අරමුදලෙහි සමස්ත ප්‍රතිලාභය : 2021 වසරේ දී අරමුදලේ සමස්ත දළ ආදායම රුපියල් බිලියන 342.4ක් ලෙස සටහන් වූ අතර, එය පෙර වසර හා සැසඳීමේ දී සියයට 19.9ක වර්ධනයකි. මෙහෙයුම් වියදම් සහ බදු වියදම් සඳහා වෙන් කිරීම් කළ පසු 2021 වසර සඳහා ශුද්ධ ලාභය රුපියල් බිලියන 299.1ක් වන අතර එය 2020 ට සාපේක්ෂව සියයට 22.1ක වැඩිවීමකි. ඒ අනුව, 2021 වසරේ සේවක අර්ථසාධක අරමුදලේ සාමාන්‍ය ආයෝජනය මත ප්‍රතිලාභය සියයට 11.40ක් විය. තවද 2021 වසරේ දී අරමුදලේ දළ ආදායමට සාපේක්ෂව මෙහෙයුම් වියදම් අනුපාතය සියයට 0.48ක් ලෙස පවත්වා ගෙන යාමට හැකිවිය. කෙසේ වෙතත්, 2021 වසරේ වැඩි වූ ලාභය සමඟ අරමුදලේ ආදායම් බදු වියදම 2020 වසර හා සැසඳීමේදී රුපියල් බිලියන 2.6කින් වැඩි විය. තවද, මූල්‍ය උපකරණ වර්ගීකරණය හා මිනුම්කරණය සඳහා අදාළ වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 09ට අනුව ලැයිස්තුගත ව්‍යාපාර කොටස්, සාධාරණ වෙළඳපොළ වටිනාකමට ගණනය කරන ලද අතර දක්නට ලැබුණු හිතකර ලැයිස්තුගත කොටස් වෙළඳපොළ තත්වය හේතුවෙන් රුපියල් බිලියන 41.8ක ශුද්ධ ලාභයක් 2021 වසරේ දී වාර්තා විය. ඒ අනුව, 2021 වසරේ දී සාමාජික ශේෂයන් මත සියයට 9.00ක පමණ පොළී අනුපාතයක් ප්‍රකාශයට පත්කිරීමට සේවක අර්ථසාධක අරමුදලට හැකි විය.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් වසර තුළ සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාන්‍ය ක්‍රියාකාරී යාන්ත්‍රණයන්ට යම් බාධා වීම් පැවතිය ද අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන අවශ්‍යතාවලට අනුකූල වෙමින් සේවක අර්ථසාධක අරමුදලේ කාර්යයන් සිදු කරන ලදී. ඒ අනුව, ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය, උපාය මාර්ගික වත්කම් විභජනයන් සහ මුදල් මණ්ඩලය මගින් අනුමත කරන ලද ආයෝජන මාර්ගෝපදේශයන්හි දක්වා ඇති පරාමිතීන්ට අනුකූලව අරමුදලෙහි සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගනිමින්, ප්‍රශස්ත ප්‍රතිලාභයක් අරමුදලට ලබා දීමේ අරමුණින් සියලුම ආයෝජන ක්‍රියාකාරකම් සිදු කරන ලදී. වෙළඳපොළ පොලී අනුපාතවල පැවති සැලකිය යුතු වෙනස් වීම්, කොටස් වෙළඳපොළේ උච්චාවචනයන් සහ අනෙකුත් ආර්ථික තත්ත්වයන් හේතුවෙන් වසර තුළ රටෙහි පැවති ආයෝජන වාතාවරණය තරමක් අභියෝගාත්මක විය. ඒ අනුව, වෙනස් වන ආර්ථික තත්ත්වයන් හමුවේ ඕනෑම අවදානමක් සඳහා මුහුණ දෙමින් සුපරික්ෂාකාරී ආයෝජන තීරණ ගන්නා ලදී. තවද, මහ බැංකුවේ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ද ඇතිව වෙළඳපොළ තත්ත්වයන්, ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ යහ භාවිතයන් සැලකිල්ලට ගනිමින් ආයෝජන තීරණ ගැනීම පහසු කිරීම සඳහා පවතින ආයෝජන මාර්ගෝපදේශ ප්‍රතිශෝධනය සහ සංශෝධනය කිරීමට කටයුතු කරන ලදී.

සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

විශ්‍රාම අරමුදල් අංශයේ වත්කම් පදනමෙන් සියයට 10.8කට දායක වූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, එහි වත්කම් පදනමේ, මුළු දායකත්වයේ සහ ආයෝජනවල වර්ධනයක් වාර්තා කළ අතර සාමාජික ගිණුම් සංඛ්‍යාවේ අඩුවීමක් වාර්තා කළේය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි සාමාජික ගිණුම් මිලියන 14.7න් 2021 වසර අවසන් වන විට පැවති සක්‍රීය ගිණුම් ප්‍රමාණය මිලියන 2.1ක් පමණි. අරමුදලට දායක වන සේවා යෝජකයින් සංඛ්‍යාව 2020 වසර අවසානයේ 75,756 සිට 2021 වසර අවසන් වන විට 44,501ක් දක්වා අඩු විය. සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි මුළු සාමාජික ශේෂය 2021 අවසානය වන විට රුපියල් බිලියන 406.3ක් දක්වා සියයට 8.3ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් පෙන්නුම් කළේය. අරමුදල වෙත ලැබුණු මුළු දායකත්වය සහ සාමාජිකයින්ට ගෙවන ලද මුළු ප්‍රතිලාභ පිළිවෙලින් සියයට 11කින් සහ සියයට 6.6කින් වර්ධනය වී 2021 වසර අවසානයේ පිළිවෙලින් රුපියල් බිලියන 29.7ක් සහ රුපියල් බිලියන 20.2ක් ලෙස වාර්තා විය.

මේ අතර, 2021 වසර අවසානයේ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි සමස්ත වත්කම් රුපියල් බිලියන 419.1ක් දක්වා සියයට 11.3කින් ඉහළ යන ලදී.

8.17 සංඛ්‍යා සටහන
සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ ක්‍රියාකාරීත්වය

අයිතමය	2020 (අ)	2021 (ආ)
සමස්ත වත්කම් (රු. බිලියන)	376.6	419.1
සමස්ත නොපියවූ සාමාජික ගිණුම් ශේෂය (රු. බිලියන)	375.2	406.3
සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන)	15.9	14.7
ක්‍රියාකාරී සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන)	2.5	2.1
දායකවන්නා වූ සේවා යෝජකයන් සංඛ්‍යාව	75,756	44,501
සමස්ත දායකත්වය (රු. බිලියන)	26.8	29.7
සමස්ත ප්‍රතිගෙවුම් (රු. බිලියන)	18.6	19.8
සමස්ත ආයෝජන කළඹ (රු. බිලියන)	371.3	410.1
එයින් රජයේ සුරැකුම්පත් (%)	80.0	86.0
දළ ආදායම (රු. බිලියන)	34.7	35.5
බෙදාහැරීම සඳහා පවත්නා ලාභය (රු. බිලියන)	31.5	32.7
ආයෝජනය මත ප්‍රතිලාභය (%)	9.1	8.6
සාමාජික ගිණුම් සඳහා ගෙවූ පොලී අනුපාතිකය (%)	8.0	7.3

(අ) සංශෝධිත
(ආ)තාවකාලික

මූලය: සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

8

අරමුදල මගින් කරන ලද ආයෝජන 2021 අවසානයේ රුපියල් බිලියන 410.1ක් වූ අතර එය 2020 අවසානයට සාපේක්ෂව සියයට 10.5ක වැඩිවීමකි. 2021 අවසානයේ දී මෙම ආයෝජනවලින් සියයට 86ක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ අතර 2020 අවසානයේ දී එම අගය දැක්වූයේ සියයට 80ක් ලෙසයි. අරමුදල විසින් 2021 වසර අවසන් වන විට ස්ථාවර තැන්පතුවල ආයෝජන ප්‍රමාණය මුළු ආයෝජනයන්ගෙන් සියයට 6.9ක් වූ අතර එය 2020 වසර අවසන් වන විට වාර්තා වූ සියයට 14.3ට සාපේක්ෂව සැලකිය යුතු අඩු වීමකි. 2021 වසර සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල එහි සාමාජික ශේෂයන් මත සියයට 7.3ක ප්‍රතිලාභයක් ගෙවීමට සමත් වූ අතර එය පෙර වසර තුළ ගෙවූ ප්‍රතිලාභය වන සියයට 8ට සාපේක්ෂව අඩුවීමක් වාර්තා කරයි.

අනෙකුත් විශ්‍රාම අරමුදල්

රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල, විශ්‍රාම අරමුදල් අංශයෙන් සියයට 2.2ක් නියෝජනය කරමින් 2021 වසර තුළ දී තම වත්කම්, ආයෝජන, සහ ශුද්ධ දායකත්වයෙහි වර්ධනයක් පෙන්නුම් කළේය. 2021 වසර අවසානයේ අරමුදල රුපියල් බිලියන 83.5ක් දක්වා සියයට 19.1කින් වර්ධනය විය. අරමුදලේ සක්‍රීය සාමාජිකයින් සංඛ්‍යාව 2020 වසර අවසානයේ පැවති 235,884 හා සසඳන විට 2021 වසර අවසානයේ දී 241,384 ක් දක්වා වර්ධනය විය. මේ අතර, 2021 වසර අවසානයේ අරමුදලේ ආයෝජන ද සියයට 16.4කින් වර්ධනය වී රුපියල් බිලියන 81ක් කරා ළඟා විය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල 2021 වසර අවසන් වන විට එහි මුළු ආයෝජනවලින් සියයට 57.4ක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති අතර අනෙකුත් ආයෝජන මුළු ආයෝජනවලින් සියයට 42.6ක් විය. අරමුදල විසින් පසුගිය වසරේ වාර්තා කළ රුපියල් මිලියන 507ක ශුද්ධ දායකත්වයට සාපේක්ෂව 2021 වසරේ දී රුපියල් මිලියන 835ක ශුද්ධ දායකත්වයක් වාර්තා කරන ලදී. සාමාජික ශේෂයන් මත ප්‍රතිලාභය 2020 වසරේ වාර්තා වූ සියයට 9.75ට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 8ක් විය.

අනුමත විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් 2021 වසර අවසානය වන විට විශ්‍රාම අරමුදල් අංශයේ වත්කම්වලින් සියයට 5.4කට හිමිකම් කියන ලදී. මෙම අරමුදල් මගින් ආවරණය වන ඇස්තමේන්තුගත සාමාජිකයින් සංඛ්‍යාව 76,692ක් වූ අතර අරමුදල්වල මුළු වත්කම් 2021 අවසානයේ රුපියල් බිලියන 207.6ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

8.4 මූල්‍ය වෙළඳපොළ කාර්යසාධනය

දේශීය මුදල් වෙළඳපොළ

වෙළඳපොළ ද්‍රවශීලතාව

2020 වසර තුළ දී මෙන්ම 2021 වසරේ පළමු භාගය තුළ දී ද අඛණ්ඩව අතිරික්ත මට්ටමක පැවති දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව, 2021 වසරේ ජූලි මස මැද භාගයේ සිට සැලකියයුතු ලෙස අඩුවූ අතර 2021 අගෝස්තු අග භාගය වන විට හිඟ ද්‍රවශීලතාවක් බවට පත් විය. මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම සහ මහ බැංකුව විසින් විදේශ විනිමය ආශ්‍රිත ගනුදෙනු සිදු කිරීම 2021 වසරේ පළමු භාගය තුළ පැවති සැලකියයුතු මට්ටමක අතිරික්ත ද්‍රවශීලතාව සඳහා බලපෑ ප්‍රධාන සාධක විය. කෙසේ වෙතත්, ඉන්පසුව දේශීය මුදල් වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව පහළ ගිය අතර, ඊට බලපෑ ප්‍රධාන සාධක වූයේ රජයේ විදේශ ණය ගෙවීම්, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මුදල් ආපසු ගැනීම, මහ බැංකුව සතුව පැවති භාණ්ඩාගාර බිල්පත් පරිණත වීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ මහ බැංකුව අතර වූ විදේශ විනිමය හුවමාරු ගිවිසුම් (මිලදී ගැනුම් විකුණුම්) පරිණත වීමයි. 2021 වසරේ අගෝස්තු මස මැද භාගයේ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීමත් සමඟ 2021 වසරේ සැප්තැම්බර් 01 දිනෙන් ආරම්භ වූ සංචිත පවත්වාගෙන යෑමේ කාලසීමාවේ සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 2.00 සිට

8.16 රූප සටහන
මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවයේ දෛනික වෙනස්කම් සඳහා බලපාන සාධක



සියයට 4.00 දක්වා ඉහළ නැංවීමත් සමඟ දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සැලකිය යුතු ලෙස අඩු විය. ඒ අනුව, 2020 වසරේ අග පැවති රුපියල් බිලියන 206.8ක් වූ වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව 2021 වසරේ සැප්තැම්බර් මස අග වන විට රුපියල් බිලියන 119.6ක හිඟ ද්‍රවශීලතාවක් බවට පත් විය. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අනුව, 2021 වසරේ අගෝස්තු මස අග භාගයේ සිට විවට වෙළඳපොළ කටයුතු හරහා ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි පවත්වමින් මුදල් වෙළඳපොළ තුළ එක්දින පදනමින් හිඟ ද්‍රවශීලතාවක් පවත්වා ගන්නා ලදී. තවද, මහ බැංකුව ප්‍රාථමික වෙළඳපොළෙන් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමෙන් හා මහ බැංකුවට විශේෂ නිකුත් කිරීම් යටතේ ලබා දෙන ලද භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමෙන් ඇති වූ අතිරික්ත ද්‍රවශීලතාවයේ බලපෑමෙන්, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් වෙළඳපොළ අනුපාතිකය පහළ යෑම වළක්වාලීමේ අරමුණින් එම අතිරික්ත ද්‍රවශීලතාව ස්ථිර පදනම මත අවශෝෂණය කිරීම සඳහා 2021 වසරේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස තුළ දී භාණ්ඩාගාර බිල්පත් ස්ථිර පදනමින් විකිණීම සිදු කරන ලදී. මේ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු කිහිපයක පැවැති ද්‍රවශීලතා පීඩනයන් අවම කිරීම සඳහා 2021 වසරේ දෙවන භාගය තුළ දී මහ බැංකුව විසින් අවස්ථා දෙකක දී දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදී. කෙසේ වෙතත්,

8.17 රූප සටහන

විවට වෙළඳපොළ වෙන්දේසි, නිත්‍ය පහසුකම, නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය



මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

8.18 සංඛ්‍යා සටහන

මුදල් වෙළඳපොළ ගනුදෙනු සහ විවට වෙළඳපොළ කටයුතුවල සමස්ත සාරාංශය

ගනුදෙනු	පරිමාව (රුපියල් බිලියන)		බරිත සාමාන්‍ය පොලී අනුපාතිකය වසර අග (අවම-උපරිම) - %	
	2020	2021	2020	2021
වෙළඳපොළ				
ඒක්ෂණ මුදල් (එක්දින)	3,234	7,935	4.52 - 7.50	4.53-5.97
ප්‍රතිමිලදීගැනුම් (එක්දින)	3,151	3,533	4.53 - 7.53	4.55-6.00
විවට වෙළඳපොළ කටයුතු				
එක්දින පදනමින්				
ප්‍රතිමිලදීගැනුම්	320	1,183	6.73 - 7.51	5.71-5.99
ප්‍රතිවිකුණුම්	175	-	5.88 - 7.54	-
ද්‍රවශීලතා ආධාරක පහසුකම	18	-	6.23 - 7.12	-
කෙටිකාලීන පදනමින්				
ප්‍රතිමිලදීගැනුම්	31	423	7.01 - 7.16	5.96-5.99
ප්‍රතිවිකුණුම්	66	-	4.53 - 6.85	-
ද්‍රවශීලතා ආධාරක පහසුකම	48	-	6.30 - 6.93	-
දිගුකාලීන පදනමින්				
ප්‍රතිමිලදීගැනුම්	3	60	7.10 - 7.15	6.04-6.05
ප්‍රතිවිකුණුම්	299	204	4.53 - 7.53	6.13-7.20
ද්‍රවශීලතා ආධාරක පහසුකම	86	-	4.88 - 7.16	-
ස්ථිර පදනමින්				
භාණ්ඩාගාර බිල්පත් මිලදීගැනීම්	-	-	-	-
භාණ්ඩාගාර බැඳුම්කර මිලදීගැනීම්	22	-	8.42 - 9.68	-
භාණ්ඩාගාර බිල්පත් විකුණුම්	-	14	-	7.00-7.23
භාණ්ඩාගාර බැඳුම්කර විකුණුම්	-	-	-	-
නිත්‍ය පහසුකම (ප්‍රතිපත්ති පොලී අනුපාතික යටතේ)				
නිත්‍ය තැන්පතු පහසුකම	32,809	29,450	4.50	5.00
නිත්‍ය ණය පහසුකම	715	30,095	5.50	6.00

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

2021 වසර අවසානය වනවිට දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව රුපියල් බිලියන 366.2ක හිඟයක් වාර්තා විය.

මුදල් වෙළඳපොළ පොලී අනුපාතික

2021 වසරේ අගෝස්තු මස සිට මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වයේ ඇති වූ දැඩි වීම සහ 2021 වසරේ සිදු වූ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීමත් සමඟ පවත්නා මුදල් ප්‍රතිපත්ති රාමුවෙහි මෙහෙයුම් ඉලක්කය ලෙස සැලකෙන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව දක්වා ගමන් කළේය. 2021 වසරේ ජූලි මැද භාගයේ සිට මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව පහළ යෑමත් සමඟම බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රතිපත්ති පොලී අනුපාතික

8

කොරිඩෝවෙහි මධ්‍ය සීමාවට ඉහළින් පැවතුණි. ඒ අනුව, 2021 වසරේ ජූලි සිට ඉදිරියට අනෙකුත් කෙටිකාලීන වෙළඳපොළ පොලී අනුපාතික ද ඉහළට ගමන් කළේය. ඇතැම් බැංකු විසින් අන්තර් බැංකු වෙළඳපොළෙන් සැලකිය යුතු ලෙස ණය ගැනීම, අතිරික්ත ද්‍රවශීලතාව විදේශීය බැංකු කිහිපයකට පමණක් සීමා වී පැවතීම, වෙළඳපොළ සහභාගිවන්නන් අතර මුදල් වෙළඳපොළ ගනුදෙනු සඳහා අදාළ වන සීමාවන් පැවතීම හේතුකොටගෙන දේශීය මුදල් වෙළඳපොළ තුළ පොලී අනුපාතික ඉහළ යෑමේ ප්‍රවණතාවක් දක්නට ලැබුණි. තවද, 2021 වසරේ අගෝස්තු මස 19 දින ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50කින් ඉහළ නැංවීමත් සමඟ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය තවදුරටත් ඉහළ ගිය අතර 2021 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට සියයට 5.94ක් ලෙස පැවතුණි. කෙසේ වෙතත්, 2021 වසර අවසානය වන විට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, බොහෝ දුරට ස්ථායීව නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාවෙහි පැවතුණි. මෙම කාලසීමාව තුළ දී, බරිත සාමාන්‍ය වෙළඳපොළ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකයද, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි හැසිරීමට අනුව පැවතුණි. 2021 වසර අවසානය වන විට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ බරිත සාමාන්‍ය වෙළඳපොළ ප්‍රතිමිලදීගැනුම් අනුපාතික, පිළිවෙළින්, සියයට 5.95 සහ සියයට 5.98ක් ලෙස පැවතුණි.

දේශීය විදේශ විනිමය වෙළඳපොළ

2021 වසර තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අගය, 2020 වසර අවසානය වන විට වාර්තා වූ රුපියල් 186.41 සිට 2021 වසර අවසානය වන විට රුපියල් 200.43ක් දක්වා සියයට 7කින් අවප්‍රමාණය විය. සංචාරක කර්මාන්තය යථා තත්ත්වයට පත්වීම ප්‍රමාද වීම, සාපේක්ෂව අඩු විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් අඛණ්ඩව පහත වැටීම මධ්‍යයේ ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමට තිබූ අවකාශය සීමා වීම වැනි කොවිඩ්-19 වසංගතයේ බලපෑම් හේතුවෙන් විදේශ විනිමය වෙළඳපොළේ සැපයුම සීමා වී ඇති විට දී ප්‍රධාන වශයෙන් ඉහළ ආනයන පරිමා සහ අඛණ්ඩ විදේශ ණය සේවාකරණ අවශ්‍යතා හේතුවෙන් විදේශ විනිමය වෙළඳපොළේ ඉල්ලුම ඉහළ යෑමත් සමඟ වසර ආරම්භයේ දී රුපියල් 186ක මට්ටමේ පැවති විනිමය අනුපාතිකය වසරේ පළමු කාර්තුව තුළ දී පීඩනයට ලක් විය. අපනයනකරුවන් සිය ආදායම රුපියල් බවට පරිවර්තනය කිරීම පහත වැටීම සහ අවිධිමත් විදේශ විනිමය වෙළඳපොළ කටයුතු සක්‍රීය වීමත් සමඟ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අවිධිමත් ක්‍රම ඔස්සේ ප්‍රේෂණය කිරීම හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ අඛණ්ඩව පැවති ද්‍රවශීලතා හිඟය තවදුරටත් උග්‍ර විය. විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමේ පීඩනය සහ වෙළඳපොළ සමපේක්ෂණය යම්තාක් දුරකට මැඩපැවැත්වීම සඳහා තම විදේශ විනිමය ගනුදෙනු එ.ජ. ඩොලරයක් සඳහා රුපියල් 200ත් රුපියල් 203ත් අතර පරාසයක් තුළ ක්‍රියාත්මක කිරීමට 2021 වසරේ අප්‍රේල් මස අග සිට බැංකු අතර අන්‍යෝන්‍ය එකඟතාවයක් ඇති විය. අත්‍යවශ්‍ය ආනයන බිල්පත් පියවීමට පහසුකම් සැලසීමේ අරමුණින් ද්විපාර්ශ්වික විකුණුම්-ගැනුම් විදේශ විනිමය හුවමාරු ගනුදෙනු මාලාවක් සමඟ සැලකිය යුතු ප්‍රමාණයක විදේශ විනිමය වෙළඳපොළ වෙත විකිණීම තුළින් මහ බැංකුව වෙළඳපොළ වෙත සැලකිය යුතු ලෙස විදේශ විනිමය ද්‍රවශීලතාව සැපයීම ඔස්සේ විනිමය අනුපාතිකය විශාල ලෙස අවප්‍රමාණය වීම බොහෝ දුරට වළකා ගැනුණි. 2021 වසරේ සැප්තැම්බර් මස ආරම්භයේ සිට, මහ බැංකුව විසින් බැංකුවලට තම විදේශ විනිමය ගනුදෙනු සඳහා එ.ජ. ඩොලරයක අගය රුපියල් 200ත් රුපියල් 203ත් අතර පරාසයක් තුළ පවත්වා ගැනීමට ලබාදුන් උපදෙස්වලට අනුකූලව, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ එ.ජ. ඩොලර් / ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතිකයේ එතැන් සාමාන්‍ය අගය එකී නියමිත පරාසය තුළ පැවතුණි. මේ අතර, රටට වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීම දිරිමත් කරන අතරම විදේශ විනිමය රුපියල්වලට පරිවර්තනය කිරීම වැඩි කිරීමේ අරමුණින් රජය සහ මහ බැංකුව විසින් ගෙන ඇති ප්‍රතිපත්තිමය උපදෙස්වලට අනුකූලව දිරිගැන්වීමේ යෝජනා ක්‍රම ගණනාවක් හඳුන්වා දෙනු ලැබීය. එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි සමස්ත අවප්‍රමාණයට අනුගාමීව, 2021 වසර අවසානය වන විට වාණිජ බැංකුවල විදුලි පැවරුම් ගනුදෙනු සඳහා වූ එ.ජ. ඩොලරයක මිලදී ගැනීමේ සහ විකිණීමේ සාමාන්‍ය විනිමය අනුපාතික පිළිවෙළින් රුපියල් 198.50ක් සහ රුපියල් 203.00ක් වශයෙන් පැවති අතර, 2020 වසර අවසානයේ දී එම අගයයන් පිළිවෙළින් රුපියල් 184.12ක් සහ රුපියල් 189.18ක් විය. මේ අතර, 2021 වසර තුළ ස්ටර්ලින් පවුමට, ඉන්දියානු රුපියලට සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට සාපේක්ෂව ද ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය.

2021 වසර තුළ " මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ශුද්ධ විකුණුම්කරුවෙකු විය. දළ නිල සංචිත ප්‍රමාණය ඉහළ නැංවීමේ අරමණින්, ප්‍රධාන

8

වශයෙන්, රුපියල් බවට පරිවර්තනය කෙරෙන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සහ අනිවාර්යය පදනම මත රුපියල් බවට පරිවර්තනය කරන ලද අපනයන ආදායමෙන් යම් නිශ්චිත ප්‍රතිශතයක් මහ බැංකුවට විකිණීමේ අවශ්‍යතාවය යටතේ බැංකුවලින් යම් විදේශ විනිමය ප්‍රමාණයක් මිල දී ගැනීම හැරුණු විට, අත්‍යවශ්‍ය ආනයන සඳහා පහසුකම් සැලසීමට මහ බැංකුව විසින් සැලකිය යුතු ලෙස විදේශ විනිමය ප්‍රමාණයක් වෙළඳපොළට සපයන ලදී. මහ බැංකුවේ මෙම විදේශ විනිමය සැපයුම, දේශීය විදේශ විනිමය වෙළඳපොළේ විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය සීමිත ප්‍රමාණයකට පියවා ගැනීමට උපකාරී විය. ඒ අනුව, 2021 වසරේ දී මහ බැංකුව එ.ජ. ඩොලර් මිලියන 506ක් වෙළඳපොළෙන් අවශෝෂණය කරමින් එ.ජ. ඩොලර් මිලියන 1,253ක් වෙළඳපොළ වෙත සපයා ඇති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 747ක ශුද්ධ විකිණුම් ප්‍රමාණයක් වාර්තා විය.

එසේම, රට තුළට වැඩි වශයෙන් විදේශ විනිමය ප්‍රවාහ ආකර්ෂණය කර ගැනීමේ සහ එමගින් දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතාවය වැඩි දියුණු කිරීමේ අරමුණු ඇතිව, රජය විසින් මහ බැංකුව සමඟ එක්ව, විධිමත් බැංකු අංශ හරහා රට වෙත ලැබෙන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරිගැන්වීම් කිහිපයක් ලබා දෙන ලදී. විදේශ මුදල් නෝට්ටු ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමේ දී එ.ජ. ඩොලරයකට අමතර රුපියල් 10ක් ලබා දීම වැනි තාවකාලික ක්‍රියාමාර්ග ගණනාවක් තුළින් මහජනතාව ද දිරිමත් කරන ලදී.

2021 වසර තුළ දී, අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනුවල මුළු පරිමාව එ.ජ. ඩොලර් බිලියන 12.2ක් වූ අතර, එය 2020 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 18.4ක් විය. ඒ අනුව, දේශීය විදේශ විනිමය අන්තර් බැංකු වෙළඳපොළේ වෙළඳ පරිමාව 2020 වසරට සාපේක්ෂව සියයට 33.9කින් පහළ ගොස් ඇත. මෙයට සමගාමීව, අන්තර් බැංකු විදේශ විනිමය වෙළඳපොළෙහි ගනුදෙනුවල දෛනික සාමාන්‍ය පරිමාව 2020 දී එ.ජ. ඩොලර් මිලියන 77 සිට 2021 දී එ.ජ. ඩොලර් මිලියන 50ක් දක්වා අඩු විය.

රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ

රාජ්‍ය සුරැකුම්පත් ඵලදා වක්‍රය, 2021 වසර තුළ දී ඉහළට විතැන් වූ අතර, එම වසරේ අවසාන භාගය වන විට ඉහළ මට්ටම්වල ස්ථාවර විය. 2021 වසරේ අගෝස්තු මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50කින් සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පදනම් අංක 200කින් ඉහළ නැංවීම

8.19 සංඛ්‍යා සටහන

රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික

වාර්ෂික ප්‍රතිශතය

අයිතමය	ප්‍රාථමික වෙළඳපොළ		ද්විතීයික වෙළඳපොළ	
	2020	2021	2020	2021
භාණ්ඩාගාර බිල්පත්				
දින 91	4.51 - 7.55	4.69 - 8.43	4.50 - 7.54	4.63 - 8.00
දින 182	3.87 - 8.15	4.75- 8.33	4.61 - 8.12	4.71 - 8.07
දින 364	4.13 - 8.61	4.98 - 8.26	4.80 - 8.57	4.94 - 8.33
භාණ්ඩාගාර බැඳුම්කර				
වසර 2	5.47 - 5.86	6.19 - 9.36	5.16 - 8.94	5.25 - 8.96
වසර 3	5.72 - 9.33	6.25 - 9.94	5.59 - 9.38	5.68 - 9.81
වසර 4	6.32 - 9.39	6.34 - 8.55	6.02 - 9.59	6.21 - 10.40
වසර 5	6.50 - 9.81	6.72 - 11.14	6.30 - 9.81	6.43 - 11.03
වසර 6	6.57 - 8.59	7.44 - 10.90	6.37 - 9.89	6.61 - 11.26
වසර 8	6.97 - 9.99	7.16 - 11.63	6.63 - 9.99	6.98 - 11.55
වසර 10	9.99	8.86 - 11.91	6.84 - 10.05	7.44 - 11.80
වසර 15	7.84	8.44 - 12.06	7.13 - 10.18	7.76 - 11.85
වසර 20	-	-	7.15 - 10.25	7.89 - 11.83
වසර 30	-	-	7.61 - 10.52	8.04 - 11.81

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

යන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර දක්වමින්, රාජ්‍ය සුරැකුම්පත්වල ඵලදා අනුපාතික ඉහළ ගියේය. 2021 සැප්තැම්බර් මාසයේ දී භාණ්ඩාගාර බිල්පත් මත පනවා තිබූ උපරිම පිළිගැනීම් ඵලදා අනුපාතිකය ඉවත් කිරීමට අදාළ නොවූ භාණ්ඩාගාර බිල්පත් මහ බැංකුව මගින් මූල්‍යනය කිරීම මධ්‍යයේ රජයේ ණය ගැනීම් වැඩි වීම හා සෘණාත්මක ණය ශ්‍රේණිගත කිරීම් යන හේතු නිසා පොලී අනුපාතික නැවත වරක් ඉහළ ගියේය.

විශේෂයෙන් වසරේ අග භාගයේ පැවති ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවල දී, පරිණත කාලය

8.18 රූප සටහන

ප්‍රාථමික වෙළඳපොළ තුළ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර මත බර තැබූ සාමාන්‍ය ඵලද අනුපාතික (වාර්ෂික ප්‍රතිශතය)



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

8.20 සංඛ්‍යා සටහන

භාණ්ඩාගාර බිල්පත්හි ප්‍රාථමික වෙළඳපොළ හරිත සාමාන්‍ය එලදා අනුපාතික

වාර්ෂික ප්‍රතිශතය

වසර	පරිණත කාලය			සමස්ත සාමාන්‍යය
	දින 91	දින 182	දින 364	
2017	9.01	9.80	10.07	9.77
2018	8.40	8.58	9.68	9.36
2019	8.15	8.44	9.40	9.06
2020	5.93	5.72	6.37	6.09
2021	6.35	6.13	5.33	6.24

සටහන: රජයේ සුරැකුම්පත් පොලිය මත වූ 10% රැඳවුම් බද්ධ 2018 අප්‍රේල් 01 දින සිට ඉවත් කරන ලදී.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8.19 රූප සටහන

මිල දර්ශකවල විචලනයන් සහ වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය



මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

දින 91ක් වූ භාණ්ඩාගාර බිල්පත් සඳහා වෙළඳපොළ කැමැත්ත වැඩි වශයෙන් යොමු වී තිබුණි. එහෙත්, ප්‍රාථමික භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසිවල දී දිගුකාලීන කල්පිරීම් සහිත බැඳුම්කර සඳහා සාමාන්‍යයෙන් ආයෝජකයන්ගේ වැඩි කැමැත්තක් දක්නට ලැබුණි. කෙටි කාලීන දින 91 භාණ්ඩාගාර බිල්පත්වල එලදා අනුපාතිකය 2021 වසර අවසානය වන විට සියයට 8.16ක මට්ටමක බොහෝ දුරට ස්ථාවරව පැවති අතර, දින 182 සහ දින 364 පරිණත කාල සඳහා පිළිවෙළින් සියයට 8.33ක සහ සියයට 8.24ක යන අගයන් ගන්නා ලදී. කෙසේ වුවද, 2020 මිකර ප්‍රමාණයට වඩා සුළු වශයෙන් අඩුවීමකි.

මෙම වසරේදී භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වල විදේශ ආයෝජනයන්හි මුළු ශුද්ධ ගලායෑම එ.ජ. ඩොලර් මිලියන 27.3ක් වූ අතර, එයට සාපේක්ෂව 2020 දී එම අගය එ.ජ. ඩොලර් මිලියන 552.7ක් ලෙස සටහන් විය. රුපියල් වශයෙන් ගත් විට රාජ්‍ය සුරැකුම්පත්හි විදේශ ආයෝජන 2020 වසර අවසන් වන විට පැවති රුපියල් බිලියන 6.7ට සාපේක්ෂව 2021 වසර අවසානයේ දී රුපියල් බිලියන 1.8ක් ලෙස වාර්තා වූ අතර, එමගින් නව ආයෝජන සඳහා සැලකිය යුතු ඉඩක් විවෘත විය.

කොටස් වෙළඳපොළ

2021 වසරේ දී දේශීය ආයෝජකයින් විසින් මෙහෙයවන ලද කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව සීඝ්‍ර වර්ධනයක් වාර්තා කළේය. 2021 වසරේ දී සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) සහ ස්ටැන්ඩර්ඩ් සහ පුවර්ස් ශ්‍රී ලංකා 20 (S&P SL 20) දර්ශකය පිළිවෙළින් සියයට 80.5ක සහ සියයට 60.5ක වර්ධනයක් වාර්තා කළේය. 2021 වසර අවසන් වන විට, වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය රුපියල් බිලියන 5,489.2ක පැවතුණු අතර එය සියයට 85.4ක වර්ධනයක් වාර්තා කළේය. තවද, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය 2020 වසර අවසානයේ පැවති සියයට 19.7ට සාපේක්ෂව 2021 වසර අවසානයේ සියයට 36.7ක් දක්වා ළඟා වූ අතර එය වසර 10ක් තුළ වාර්තා වූ වැඩිම අගය විය.

2021 වසරේ පැවති අඩු පොලී අනුපාත ක්‍රමය හේතුවෙන් දේශීය ආයෝජකයන්ගේ සහභාගීත්වය කොටස් ආයෝජන වෙත යොමු වීමත් සමඟ කොටස් වෙළඳපොළ තුළ ඔවුන්ගේ සහභාගීත්වය කැපී පෙනුණි. දේශීය තනි ආයෝජකයින් සතු සුරැකුම්පත් ප්‍රමාණය සියයට 53.3ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් 2021 වසර අවසානයේ රුපියල් බිලියන 30.5ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, දේශීය ආයතනික ආයෝජකයින් සතු සුරැකුම්පත් ප්‍රමාණය සියයට 17.8ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, විදේශීය තනි සහ ආයතනික ආයෝජකයින් සතු සුරැකුම්පත්

8.20 රූප සටහන

කොටස් වෙළඳපොළෙහි විදේශ සහභාගිත්වය



මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

ප්‍රමාණය පිළිවෙළින් සියයට 0.3ක සහ සියයට 2.6ක සුළු වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය.

දේශීය ආයෝජකයින්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය සමඟ කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව යන දෙඅංශයෙන්ම සිදුකරන ලද ඩිජිටල්කරණය වැනි කාලෝචිත මුලපිරීම් හේතුවෙන්, දෛනික පිරිවැටුම සහ ප්‍රාග්ධන රැස්කිරීම් 2021 වසර තුළ දී වැඩිදියුණු විය. 2021 වසර තුළ දී, නව කොටස් මූලික මහජන නිකුතු (Initial Public Offering) 13ක් සිදු කළ අතර එහි වටිනාකම රුපියල් බිලියන 12.7කි. මිල ඉපැයීම් අනුපාතය සහ මිල පොත් අගය, 2020 වසර අවසානයේ පැවති 11.2 හා 1.1ට සාපේක්ෂව 2021 වසර අවසානයේ දී 13.6ක් සහ 1.7ක් ලෙස පැවතුණි. 2020 වසර තුළ වාර්තා වූ රුපියල් මිලියන 1,899ට සාපේක්ෂව 2021 වසර තුළ දී ද්විතීයික වෙළඳපොළේ සාමාන්‍ය දෛනික පිරිවැටුම අසාමාන්‍ය අගයක් වාර්තා කළ අතර එය රුපියල් මිලියන 4,888.2ක් විය.

වෙළඳපොළේ විදේශීය සහභාගීත්වය සලකා බලනු ලබන කාල පරිච්ඡේදය තුළ දී අවම මට්ටමක පැවතුණි. 2020 වසරේ දී වාර්තා වූ සියයට 13.4ක දායකත්වයට සාපේක්ෂව 2021 වසරේ දී මුළු පිරිවැටුමෙන් සියයට 2.9ක් පමණක් විදේශීය මිලදී ගැනීම් හරහා ලැබුණු අතර වෙළඳපොළෙන් විදේශීය ගලා යාම් අඛණ්ඩව පැවතුණි. පසුගිය වසර තුළ දී වාර්තා වූ රුපියල් බිලියන 51.1ට සාපේක්ෂව 2021 වසර තුළ දී විදේශ ආයෝජන පිටතට ගලායාම් රුපියල් බිලියන 52.6ක් විය. ඒ අනුව, කොටස්වල මුළු වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස විදේශීය හිමිකම් 2020 වසර අවසානයේ වාර්තා වූ සියයට 25.4 හා සසඳන විට, 2021 වසර අවසානයේ සියයට 24.6ක් දක්වා අඩු විය.

සාංගමික ණය සුරැකුම්පත් වෙළඳපොළ

වාණිජ පත්‍ර (Commercial Papers) වෙළඳපොළ 2020 වසර හා සසඳන කල 2021 වසරේ දී සාපේක්ෂව වැඩි ක්‍රියාකාරීත්වයක් පෙන්වීය. 2021 වසරේ දී බලපත්‍රලාභී බැංකුවල සහය ඇතිව නිකුත් කරන ලද වාණිජ පත්‍රවල වටිනාකම රුපියල් බිලියන 5.8ක් වූ අතර 2020 වසරේ දී එම අගය රුපියල් බිලියන 4.5ක් විය. පසුගිය වසරේ වාර්තා වූ සියයට 6.50 සිට 15.50ක් දක්වා පරාසයට සාපේක්ෂව වාණිජ පත්‍රවල පොලී අනුපාත 2021 වසර තුළ සියයට 6.00 සිට 12.00ක් දක්වා පරාසයක විචලනය විය.

සාංගමික ණයකර වෙළඳපොළෙහි ක්‍රියාකාරකම් මට්ටම 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. 2020 වසරේ දී රැස් කරන ලද රුපියල් බිලියන 21.9ට සාපේක්ෂව 2021 වසර තුළ දී කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ සමාගම් 14ක් විසින් නිකුත් කරන ලද සාංගමික ණයකරවල මූලික නිකුතු 27ක් මගින් රුපියල් බිලියන 84.4ක් රැස් කරන ලදී. ස්ථාවර සහ පාවෙන පොලී අනුපාත සහිත ණයකර 2021 වසරේ දී නිකුත් කරන ලද අතර ස්ථාවර පොලී අනුපාත පසුගිය වසරේ පැවති සියයට 9.00 සිට 13.25ක් දක්වා පරාසයට සාපේක්ෂව සියයට 8.00 සිට 12.00ක් දක්වා පරාසයක පැවතුණි.

8.5 සංවර්ධන මූල්‍ය සහ මූල්‍ය ප්‍රවේශය

ස්වයං රැකියාවල නිරත වූ පුද්ගලයන් ඇතුළුව සියලුම ආර්ථික අංශවලට අයත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් කොවිඩ්-19 වසංගත සමය තුළ මුහුණ දෙනු ලැබූ අභියෝග ජයගැනීම සඳහා මහ බැංකුව විසින් විවිධ ණය යෝජනා ක්‍රම හරහා දායකත්වය ලබාදෙන ලදී. 2021 වසර තුළ, ණය පරිපූරක සේවා රාශියක් සපයමින්, මහ බැංකුව තවදුරටත් විවිධ ප්‍රතිමූල්‍ය, පොලී සහනාධාර සහ ණය ඇපආවරණ යෝජනා ක්‍රම සම්බන්ධීකරණය, පහසුකම් සැලසීම හා ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී. ප්‍රතිමූල්‍යකරණ යෝජනා ක්‍රම 14ක්, පොලී සහනාධාර යෝජනා ක්‍රම සහ ණය ඇපආවරණ යෝජනා ක්‍රම 6ක් යටතේ ගිණුම්ගත කරන ලද මුළු ණය ප්‍රමාණයෙන් පිළිවෙළින් සියයට 58ක් හා සියයට 42ක දායකත්වයක් ලබාදෙමින් ක්‍රියාත්මක වූ අතර මෙම ණය යෝජනා ක්‍රම තුළින් සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා ප්‍රතිලාභීන් 80,899 පමණ ආවරණය වන පරිදි 2021 වසර තුළ මුදාහරින ලද සමස්ත ණය ප්‍රමාණය රුපියල් මිලියන 27,268කි.

කොවිඩ්-19 වසංගතයට මුහුණ දීම සඳහා මහ බැංකුව විසින් සුවිශේෂී පියවර රාශියක් ගන්නා ලදී. වසංගතයෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාර හා පුද්ගලයන්ට සහන ලබාදෙමින් මහ බැංකුව සුවිශේෂී ප්‍රතිපත්තිමය පියවර රාශියක් වසර පුරාම ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ සහනදායී ණය යෝජනා ක්‍රම සඳහා, මාස 24 සිට මාස 36 දක්වා ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කරමින් සහ ණය සහන කාලය පළමුව 2021 වසරේ සැප්තැම්බර් මස 30 වන දින තෙක් ද පසුව 2021 වසරේ දෙසැම්බර් මස 31 වන දින දක්වා ද දීර්ඝ කරමින් ණය සහන ලබා දෙන ලදී. තවද, සහන කාලය 2022 වසරේ ජූනි මස 30 වන දින දක්වා දීර්ඝ කිරීම මගින් සංචාරක අංශය සඳහා පහසුකම් සැලසීමට සුවිශේෂී පියවර ගන්නා ලදී. මහ බැංකුව විසින් ණය සහන පමා කාලයන් සපයමින් සහ විවිධ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරමින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත තවදුරටත් සහය දක්වන ලදී. වෙළඳපොළ මත පදනම්

විශේෂ සටහන 10

ශ්‍රී ලංකාව සඳහා වූ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය: උසස් ජීවන තත්ත්වයක් උදෙසා උසස් ගුණාත්මකභාවයෙන් යුතු මූල්‍ය අන්තර්ගතභාවයක් ඇති කිරීම

හැඳින්වීම

පුද්ගලයින්ට සහ ව්‍යාපාර වලට ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි ප්‍රයෝජනවත් සහ දැරිය හැකි මූල්‍ය නිෂ්පාදන සහ සේවාවන් එනම් ගනුදෙනු, ගෙවීම්, ඉතුරුම්, ණය සහ රක්ෂණය සඳහා ඇති ප්‍රවේශය වගකීමෙන් සහ තිරසාර අයුරින් ලබාදීම මූල්‍ය අන්තර්ගතභාවය ලෙස පුළුල්ව අර්ථ දැක්විය හැක.[1] පුද්ගලයින්ට සහ ව්‍යාපාර වලට විධිමත් මූල්‍ය අංශයේ නියැලීමට ඇති බාධා ඉවත් කිරීමටත්, ඔවුන්ගේ ආදායම් මාර්ග සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීමටත් මූල්‍ය අන්තර්ගතභාවය තුළින් අවස්ථාව සැලසෙන බැවින් එය සර්ව සහභාගීත්ව මූල්‍ය අන්තර්ගතභාවය ලෙසද අර්ථකථනය කළ හැකිය.

2000 වසර මුල් භාගයේ සිටම මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංකල්පය ගෝලීය ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයෙහි කේන්ද්‍රීය අංශයක් බවට පත් වී ඇත. බොහෝ රටවල් දරිද්‍රතාවයෙන් මිදීමට සහ තිරසාර ආර්ථික වර්ධනය සඳහා දායක වීමට පුද්ගලයන් සහ ආයතන විසින් දරන ප්‍රයත්න ප්‍රවර්ධනය කිරීමේ උත්සාහයක් ලෙස මූල්‍ය අන්තර්ගතභාවය යොදා ගනු ලබයි. මූල්‍ය අංශයෙන් බැහැරව සිටින ජන කොටස් සඳහා මූල්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය ඉහළ නැංවීම තුළින් වඩා හොඳ ජීවන තත්ත්වයක් සඳහා අවස්ථාවන් විවර වන අතරම ඔවුන්ට ඉදිරි දැක්මකින් යුතුව මූල්‍ය කටයුතු කළමනාකරණය කිරීමේ හැකියාවද ලැබෙනු ඇත. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට මූල්‍ය සේවා සඳහා ඇති ප්‍රවේශය ඉහළ නැංවීම තුළින් නව සහ වඩා ඵලදායි ව්‍යාපාරික කටයුතු සඳහා ආයෝජනය කිරීමට ඔවුන් දිරිමත් වීම තුළ, ආර්ථික වර්ධනයට දායක වෙමින් නව රැකියා අවස්ථා උත්පාදනට හැකි වේ. මූල්‍ය අන්තර්ගතභාවය තුළින් පමණක් මිනිසුන් දරිද්‍රතාවයෙන් මුදවා ගැනීමට නොහැකි වුවද, වඩා හොඳ ජීවන තත්ත්වයක් ගොඩනංවා ගැනීමට එය උපකාරී වනු ඇත. තවද රටක මූල්‍ය ස්ථායිතාවය සඳහා ශක්තිමත් පදනමක් ගොඩනැගීමේදී මූල්‍ය අන්තර්ගතභාවයේ ඇති වැදගත්කම පුළුල් ලෙස හඳුනාගෙන ඇති අතර, එමගින් සාර්ව සහභාගීත්වයක් සහිත ආර්ථික වර්ධනයකට මඟ පෑදෙනු ඇත. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංකල්ප සහ ප්‍රයත්නයන් ප්‍රතිපත්ති මෙවලමක් ලෙස වැඩි දියුණු කිරීමේදී, මූල්‍ය අන්තර්ගතභාවයෙහි මට්ටම තක්සේරු කිරීම, ගණනය කිරීම සහ ආර්ථික හා සමාජීය වශයෙන් සැබෑ අවශ්‍යතා නිසි ලෙස හඳුනා ගැනීම අවශ්‍ය වේ.

මෙම පසුබිම තුළ, ජාතික මට්ටමින් ඉලක්ක හඳුනාගැනීමට සහ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ මූලපිරීම් වල ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් මූල්‍ය අන්තර්ගතභාවයෙහි මට්ටම පොදු මානයක් 3ක් යටතේ තක්සේරු කර ඇත.

'ප්‍රවේශය' පිළිබඳ මානය මගින් මූල්‍ය සේවාවන් ව්‍යාප්තියෙහි පවතින තීව්‍රභාවය පෙන්නුම් කරයි. එනම්, බැංකු ශාඛා, ස්වයංක්‍රීය ට්‍රේලර් යන්ත්‍ර (ATM), POS උපාංග වල ව්‍යාප්තිය හෝ තොරතුරු පිරිවැය වැනි මූල්‍ය ආයතන වෙත ප්‍රවේශ වීමේදී පාරිභෝගිකයන් මුහුණ දෙනු ලබන ඉල්ලුම් අංශයේ බාධා පිළිබඳව විස්තර කරනු ලබයි. "භාවිතය" පිළිබඳ මානය මගින් පාරිභෝගිකයන් මූල්‍ය සේවා භාවිතා කරන ආකාරය, කාලය සහ වාර ගණන පිළිඹිබු කරයි. 'මූල්‍ය නිෂ්පාදන සහ සේවා සැපයීම් වල ගුණාත්මකභාවය' යනුවෙන් හැඳින්වෙන්නේ පාරිභෝගිකයාගේ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සේවා තෝරා ගැනීමේ හැකියාව මෙන්ම පාරිභෝගික ආරක්ෂාව පිළිබඳ අංගයන් සහ මූල්‍ය නිෂ්පාදන සහ සේවා පිළිබඳ ඇති දැනුම්වත්භාවය සහ අවබෝධයයි.[2]

ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවයෙහි වර්තමාන තත්ත්වය

මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාව විසින් දරන ලද දිගු කාලීන ප්‍රයත්න විසිවන සියවසේ මුල් භාගය දක්වා දිව යයි. මෙම ප්‍රයත්නවල ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය සැලකිය යුතු මට්ටමකින් ඉහළ නංවා ගැනීමට හැකියාව ලැබී ඇත. ලෝක බැංකු සමූහයේ සාමාජිකයෙකු වන ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතාවේ සහාය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2018 වසරේදී පවත්වන ලද මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික සමීක්ෂණයට අනුව, ශ්‍රී ලංකාවේ ගිණුම් හිමිකාරීත්වය සියයට 88ක් පමණ වූ අතර, එය දකුණු ආසියානු කලාපීය සාමාන්‍යය වූ සියයට 70ට වඩා ඉහළ අගයක් ගන්නා ලදී.[3] ගිණුම් හිමිකාරීත්වයේ ස්ත්‍රී පුරුෂ විෂමතාවයක් හෝ ග්‍රාමීය සහ අඩු ආදායම්ලාභී ජනකොටස් අතර සැලකිය යුතු විෂමතාවයක් වාර්තා වී නොමැත. 2021 දෙසැම්බර් මස වන විට වැඩිහිටියන් 100,000කට ශාඛා 16.4ක බැංකු ශාඛා

1 ලෝක බැංකු

2 ලෝක බැංකුව, 2015

3 Global Findex, 2017: 73.65 per cent of adults in Sri Lanka have accounts at a financial institution and the regional average in South Asia is 70 per cent (36 per cent excluding India)

8

ඝනත්වයක් පැවතීම[4] මගින් ශ්‍රී ලංකාව තුළ ඉහළ මට්ටමේ බැංකු ශාඛා ව්‍යාප්තියක් පෙන්නුම් කරනු ලබයි. කෙසේ වෙතත්, ශ්‍රී ලාංකිකයන් අතර ඉහළ සාක්ෂරතා මට්ටමක් (92.9%[5]) පැවතුණද මූල්‍ය සාක්ෂරතා මට්ටම (35%[6]) අඩු මට්ටමක පැවතීම අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීමට බාධාවක් ලෙස හඳුනාගෙන ඇත.

වඩාත් පුළුල්ව ගත් කළ, ඉහළ මට්ටමේ ප්‍රවේශ පැවතියද, ගිණුම් භාවිතය, ජංගම මුදල්, රක්ෂණ, විශ්‍රාම යෝජනා ක්‍රම, බැඳුම්කර සහ කොටස් වෙළඳපොළ උපකරණ වැනි අනෙකුත් මූල්‍ය නිෂ්පාදන සහ සේවා භාවිතය මධ්‍යස්ථ මට්ටමක පවතී. වඩාත් වැදගත් කරුණ නම්, පුද්ගලයන්ට සහ ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට විධිමත් මූල්‍ය සැපයුම්කරුවන්ගෙන් සුදුසු ණය සේවාවන් සඳහා ඇති සීමිත ප්‍රවේශය සැලකිය යුතු බාධකයක් ලෙස පැවතීමයි.[7]

නාගරික සහ කර්මාන්ත ක්ෂේත්‍රයේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට විධිමත් මූල්‍ය මූලාශ්‍ර සඳහා හොඳ ප්‍රවේශයන් පැවතිය ද, ගම් මට්ටමේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා වන මූල්‍ය පහසුකම් ප්‍රවේශය සැලකිය යුතු අඩු මට්ටමක පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස දැඩි අවදානමට ලක්වූ පිරිස් අවිධිමත් මූල්‍ය අංශය වෙත යොමු වී ඇති අතර එමගින් දැඩි ලෙස අවදානම් වලට නිරාවරණය වීමත් මූල්‍ය අනුක්‍රමිකතා හේතුවෙන් ඇතිවන දුෂ්කරතාවන්ට සහ දරිද්‍රතාවයට ගොදුරු වීමේ අවදානමක් පවතී.

2018 වර්ෂයේ පැවැත්වූ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික සමීක්ෂණය මගින් ඩිජිටල් ගෙවීම් සහ අනෙකුත් ඩිජිටල් මූල්‍ය සේවා භාවිත තවදුරටත් වර්ධනය කිරීම සඳහා සැලකිය යුතු අවස්ථාවන් ඇති බව පෙන්වා දී ඇත.

කෙසේ වෙතත්, පවතින මූල්‍ය නිෂ්පාදන හා සේවා භාවිත කිරීමට අවශ්‍ය මූල්‍ය දැනුම, කුසලතා හා හැකියාව නොමැතිකම හේතුවෙන් තිරසාර මට්ටම කරා ළඟා වී උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාව ශ්‍රී ලංකාවට අහිමි වී ඇත. අවිධිමත් මූල්‍ය ආයතන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ ඵලදායි නියාමන අධිකාරියක් නොමැති කම සහ බලපෑමට ලක්වූ කණ්ඩායම් සඳහා නිසි නීතිමය රැකවරණයක් නොමැති වීම, ඔවුන් විධිමත් මූල්‍ය අංශයෙන් බැහැරවීම සඳහා බලපානු ලබන ප්‍රධාන සාධක ලෙස නිරීක්ෂණය වී ඇත.

මෙවැනි, පසුබිමක් තුළ, ශ්‍රී ලංකාව සඳහා වූ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය හඳුන්වාදීම කාලීන අවශ්‍යතාවයක් ලෙස හඳුන්වා දිය හැකිය.

4 CBSL
5 Economics and Social Statistics Report, 2021, CBSL
6 The Standard and Poor's Global Financial Literacy Survey, 2014-2015
7 ශ්‍රී ලංකාව සඳහා වූ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපාය මාර්ගය

ශ්‍රී ලංකාව තුළ මූල්‍ය අන්තර්ගතභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා සියලුම පාර්ශවකරුවන්ට දිගු කාලීන, විස්තීරණ සහ මනා සම්බන්ධීකරණයකින් යුතු වූ ප්‍රවේශයක් ලබාදීම සඳහා ගන්නා ලද පළමු ජාතික මට්ටමේ ප්‍රයත්නය ලෙසද මෙය හඳුනාගත හැක. ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයවීමෙන් හා රාජ්‍ය ආයතන, විධිමත් මූල්‍ය සේවා සපයන්නන් සහ අනෙකුත් අදාළ වෘත්තීය ආයතන ඇතුළුව විවිධ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය වැඩි දියුණු කර ඇත. 2020 මාර්තු මාසයේදී මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර 2021 මාර්තු මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දියත් කරන ලද අතර මේ වන විට සාමාජික ආයතන 20කට අධික සංඛ්‍යාවක් සමඟ සහයෝගයෙන් යුතුව ක්‍රියාවට නංවනු ලබයි.

ශ්‍රී ලංකාව සඳහා වූ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි ප්‍රතිපත්ති රාමුව සහ ක්‍රියාකාරීත්වය

ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය වැඩි දියුණු කිරීම සඳහා දිගු කාලීන, විස්තීරණ, ප්‍රමිතිගත මනා සම්බන්ධීකරණයකින් යුතු ප්‍රවේශයක් සැපයීම, මූල්‍ය අන්තර්ගතභාව පිළිබඳ උපාය මාර්ගයෙහි අරමුණ වේ.

ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි දැක්ම මගින් උපාය මාර්ගයේ පාර්ශවකරුවන් සහයෝගීව සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරනු ලබන අභිලාෂකාමී දිගු කාලීන අරමුණු නිරූපණය කරන අතර උපාය මාර්ගයෙහි ප්‍රමුඛතා සඳහා මඟපෙන්වීම සපයනු ලබයි.

'උසස් ජීවන තත්ත්වයක් සඳහා ගුණාත්මක අන්තර්ගතභාවයක්'

ශ්‍රී ලංකාවේ සියලු පුද්ගලයින් සහ ව්‍යවසායයන්ට තම ජීවන මට්ටම ඉහළ නංවා ගනිමින්, ආර්ථික වර්ධනය සඳහා දායක විය හැකි ඉහළ ගුණාත්මකභාවයකින් යුතු, වඩාත් සුදුසු, ආරක්ෂිත සහ දැරිය හැකි මූල්‍ය නිෂ්පාදන හා සේවා වෙත දැනුම්වත්, සාධාරණ සහ සමානාත්මතායෙන් යුතු ප්‍රවේශයක් ඇති කර දීම.

මූල්‍ය සේවා සඳහා සරල ප්‍රවේශයකින් ඔබ්බට ගිය වැදගත් සංකල්පයන් මෙම දැක්ම තුළ අන්තර්ගත වී ඇත. එහිදී හොඳින් දැනුම්වත් වූ පාරිභෝගිකයන්ට මූල්‍ය නිෂ්පාදන හා සේවා නිසිලෙස තෝරාගැනීමට සහ භාවිත කිරීමට හැකි හිතකර පරිසරයක් පැවතීම අවධාරණය කරනු ලබයි. ඉහළ ගුණාත්මකභාවයකින් යුතු වඩාත් සුදුසු ආරක්ෂිත සහ දැරිය හැකි, විධිමත් මූල්‍ය නිෂ්පාදන හා සේවා සඳහා ඇති පුළුල් ප්‍රවේශය සහතික කිරීම කෙරෙහි මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය තුළින් අවධානය යොමු කර ඇත.

මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වූ ශ්‍රීලාංකීය නිර්වචනය

8

එහි දැක්ම හා සමගාමී වන අතර මූල්‍ය අන්තර්ගතභාවය හුදකලා ඉලක්කයක් නොවන බවත්, එය සමාජයට ධනාත්මක ආර්ථික හා සමාජීය බලපෑමක් ඇති කරන බවත් අවධාරනය කරයි.

ශ්‍රී ලංකාවේ සියලුම පුද්ගලයන්ට හා ව්‍යවසායකයින්ගේ අවශ්‍යතා සහ දැනුම්වත් තේරීම් මත පදනම්ව උසස් තත්ත්වයේ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය දැක්වීමට සහ ඔවුන්ගේ ජීවන තත්ත්වයන්හි ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සුදුසු ආරක්ෂිත හා දැරිය හැකි මූල්‍ය සේවා වෙත ප්‍රවේශ වීමටත් ඔවුන්ගේ එම මූල්‍ය සේවාවන් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීම තුළින් ඔවුන්ගේ ආර්ථික කටයුතු සඳහා දායක වීමටත්, ජීවන තත්ත්වය ඉහළ නංවා ගැනීමටත් හැකි පරිසරයක් නිර්මාණය කිරීම මූල්‍ය අන්තර්ගතභාවය ලෙස අර්ථ දැක්විය හැක.



ශ්‍රී ලංකාව සඳහා වූ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය තුළින් ප්‍රධාන ක්ෂේත්‍ර 4ක් වටා කේන්ද්‍රගත වූ නිශ්චිත ප්‍රතිපත්ති අරමුණු සමූහයක් පැහැදිලි ලෙස අර්ථ දක්වනු ලබයි.

1. ඩිජිටල් මූල්‍ය සහ ගෙවීම්
2. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මූල්‍ය
3. පාරිභෝගික ආරක්ෂණය සහ
4. මූල්‍ය සාක්ෂරතාවය සහ ධාරිතා සංවර්ධනය

මෙම ක්ෂේත්‍රයන් හි ප්‍රගතිය ළඟාකර ගැනීම සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමේදී සංවර්ධනය කළ යුතු සක්‍රියක අංශයන් ලෙස දත්ත, යටිතල පහසුකම් සහ ප්‍රතිපත්ති මෙවලම් සහ නියාමන පරිසරය සක්‍රීය කිරීම හඳුනාගෙන ඇත.



ශ්‍රී ලංකාව සඳහා වූ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගික රාමුව.

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ වර්තමාන තත්ත්වය ඇගයීම තුළින් සහ එක් එක් ක්ෂේත්‍ර තුළ පවත්නා දුබලතා හා අවස්ථාවන් සැලකිල්ලට ගනිමින් අවශ්‍ය ප්‍රතිපත්ති මූලපිරීම් ඇතුලත් කරමින් ඉහළ මට්ටමේ මූල්‍ය අන්තර්ගතභාවයක් ළඟා කර ගැනීම සඳහා ජාතික උපාය මාර්ගයෙහි ක්‍රියාකාරී සැලැස්ම සකස්කර ඇත. මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම, අනුක්‍රමික සහ කාලානුරූපි ක්‍රියාකාරකම් සමූහයකින් සමන්විතව ඇති අතර ආයතනික මට්ටමේ වගකීම් පැහැදිලි ලෙස නිරූපණය කර ඇත.

ශ්‍රී ලංකාව තුළ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය ක්‍රියාවට නැංවීම උදෙසා අදියර 4කින් සමන්විත වූ පාලන ව්‍යුහයක් ස්ථාපනය කර ඇත. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය සඳහා සමස්ත ප්‍රතිපත්තිමය මඟ පෙන්වීම ඉහළින්ම වූ ජාතික කවුන්සිලය මගින් ලබාදෙන අතර උපාය මාර්ගයෙහි අඛණ්ඩ ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම සහ එහි ප්‍රගතිය පිළිබඳ ජාතික කවුන්සිලය යාවත්කාලීන කිරීම කළමනාකරණ කමිටුව වෙත පැවරී ඇත. එමෙන්ම, අපේක්ෂිත කාල රාමුව තුළදී උපාය මාර්ගික ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම සඳහා අදාළ සියලු ආයතන හරහා සම්බන්ධීකරණය සහ අධීක්ෂණය සහතික කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි පිහිටුවා ඇති ලේකම් කාර්යාලය කටයුතු කරනු ලබන අතර එක් එක් ප්‍රතිපත්ති ක්ෂේත්‍ර යටතේ පිහිටුවා ඇති ක්‍රියාකාරී කමිටු උපදේශන සංසදයන් ලෙස කටයුතු කරනු ලබයි.



ශ්‍රී ලංකාව සඳහා වූ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි පාලන ව්‍යුහය.

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි අධීක්ෂණ සහ ඇගයීම් රාමුව යටතේ ස්ථාපිත කරන ලද ප්‍රතිඵල රාමුව මගින් අපේක්ෂිත මූලික අරමුණු පැහැදිලි ලෙස ප්‍රකාශ වන අතර මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ මූලික අරමුණු සමස්ත ක්‍රියාවලිය පුරාම මැනිය හැකි දර්ශක බවට පරිවර්තනය කර පෙන්වනු ලබයි.

සියලුම ප්‍රතිපත්ති ක්ෂේත්‍ර ආවරණය කරමින්, සමස්ථ ක්‍රියාවලියේ ප්‍රමුඛතා ක්‍රියාවක් ලෙස මූල්‍ය අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු කර ඇත. මූල්‍ය සාක්ෂරතාවය සහ ධාරිතා සංවර්ධනය යටතේ හඳුන්වා දී ඇති ක්‍රියාමාර්ගයන්ට ප්‍රමුඛත්වය දෙමින්, අදාළ පාර්ශවකරුවන් උපාය මාර්ගික සැලැස්ම ක්‍රියාවට නැංවීමේදී ඉතා සක්‍රීය ලෙස සහයෝගයෙන් කටයුතු කරනු ලබයි. එමෙන්ම අනාගත පරපුර තුළ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සංකල්පය ස්ථාපිත කිරීම සඳහා කාලෝචිත හා ඵලදායී ප්‍රතිපත්ති මෙවලමක් ලෙස, අධ්‍යාපන අමාත්‍යාංශය

8

විසින් 611 ශ්‍රේණි දක්වා පාසල් විෂය මාලාවට මූල්‍ය අධ්‍යාපනය අනිවාර්‍යය අංගයක් ලෙස ඇතුළත් කිරීම සඳහා අදාල පාර්ශවකරුවන් සමඟ එක්ව කටයුතු කරනු ලබයි.

වැඩිහිටියන් සඳහා වූ මූල්‍ය අධ්‍යාපන වැඩසටහන් ප්‍රමිතිගත කිරීම සඳහා, මූල්‍ය සාක්ෂරතාවය සහ ඩිජිටල් සාක්ෂරතාවය ආවරණය කරමින් අධ්‍යාපන මොඩියුල සකස් කරන ලද අතර, පුහුණුකරුවන්ගේ පුහුණු වැඩසටහන්ද ක්‍රියාත්මක වෙමින් පවතී. තවද, රටේ මූල්‍ය සාක්ෂරතා මට්ටම තක්සේරු කිරීම සඳහා දීප ව්‍යාප්තව මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ සමීක්ෂණයක් 2021 වසරේදී පවත්වන ලදී. මෙමඟින් රැස් කරන ලද දත්ත, ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය සාක්ෂරතා මට්ටම ඇගයීම සඳහා යොදාගනු ලැබේ. මූල්‍ය දැනුම, මූල්‍ය හැසිරීම සහ මූල්‍ය ආකල්ප යන ප්‍රධාන අංග 3 යටතේ ජාත්‍යන්තරව පිළිගත් හා සම්මත මූල්‍ය සාක්ෂරතා ලකුණු ක්‍රමයට අනුව මූල්‍ය සාක්ෂරතා මට්ටම තක්සේරු කිරීමට සැලසුම් කර ඇත.

මූල්‍ය සාක්ෂරතා සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට සහාය වීමේ වැඩසටහන් එකම දිශානතියක් කරා ගමන් කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් එවැනි වැඩසටහන් පවත්වනු ලබන සියලුම පාර්ශවකාර ආයතනයන්හි සහයෝගීතාව වැඩි දියුණු කිරීම සඳහා සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ගොඩනඟා ගනිමින් පවතී. එහි ඉදිරි පියවරක් වශයෙන්, යෝජිත මූල්‍ය සාක්ෂරතාවය සහ ධාරිතා සංවර්ධනයේ පෙර දැක්ම මගින් මූල්‍ය අධ්‍යාපනය සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට සහායවීමේ වැඩසටහන් සංවර්ධනයට සහ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූලධර්ම සහ උපාය මාර්ගික දිශානතිය සැපයෙනු ඇත.

ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ඉලක්ක සපුරා ගැනීම සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය දායක වන්නේ කෙසේද?

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය මගින් රටේ සමස්ත මූල්‍ය අන්තර්ගතභාවයෙහි මට්ටම ඉහළ නැංවීම පමණක්ම අපේක්ෂා නොකරන අතර ආදායම, භූගෝලීය පිහිටීම, වයස, ස්ත්‍රී පුරුෂ භාවය වැනි සමාජීය ජන විකාශන ගුණාංග හා සම්බන්ධ වූ මූල්‍ය අන්තර්ගත මට්ටම්වල විෂමතා ද අවම කිරීමට අරමුණු කර ඇත.

මෙම උපාය මාර්ගය මගින් මූල්‍ය සේවා නොලබන සහ අඩු මූල්‍ය සේවා ලබන ජන කොටස් වලට ඔවුන්ගේ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමට උපකාර වන පරිදි මූල්‍ය නිෂ්පාදන හා සේවා සඳහා ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීමට අපේක්ෂා කෙරේ. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ඉහළ ආදායම් උත්පාදනයට සහ විධිමත් රැකියා අවස්ථා උදා කිරීමට පුළුල් මූල්‍ය ප්‍රවේශය තුළින් අවස්ථාව සැලසෙනු ඇත.

ඒ හා සමගාමීව, මනාව සැලසුම් කොට සම්බන්ධීකරණය කරන ලද විස්තීරණ මූල්‍ය සාක්ෂරතා මූලපිරීම් මගින් මූල්‍ය පාරිභෝගිකයන්ගේ නිවැරදි මූල්‍ය දැනුම, කුසලතා හා හැසිරීම වැඩි දියුණු කෙරෙන අතර ඒ තුළින් අනාගත ශ්‍රී ලාංකිකයන්ගේ මූලික මූල්‍ය අවශ්‍යතා සපුරාලීමට ඇති හැකියාව සහතික කෙරේ. වඩාත් මූල්‍යමය හැකියාවෙන් යුතු සහ සවිබල ගැන්වූ පාරිභෝගිකයන් විසින් අවසානයේ යහපත් වෙළඳපොළ හැසිරීම් ප්‍රවර්ධනය කිරීම සහ මූල්‍ය සේවා වැඩිදියුණු කිරීම සිදු කරනු ලබන අතර එමගින් යහපත් මූල්‍ය චක්‍රයක් ඇතිවනු ඇත.

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය තුළින් සියලුම මූල්‍ය සේවා සපයන්නන්ට ක්‍රියාත්මක වීම සඳහා සුදුසු නියාමන පරිසරයක් ඇති කරනු ලබන අතර එමගින් පාරිභෝගික ආරක්ෂාවද ශක්තිමත් කරනු ඇත. මූල්‍ය පද්ධති ස්ථායිතාවය පවත්වා ගැනීමේ පුළුල් අරමුණින් පරිභෝගිකයින්ගේ විශ්වාසය වැඩි දියුණු කළ යුතු අතරම ගනුදෙනුකරුවන්ගේ යහපත උදෙසා හොඳම භාවිතයන් ස්ථාපිත කළ යුතුය.

වෙළඳපොළ ක්‍රියාකරුවන්ට වඩාත් නව්‍ය මූල්‍ය සේවාකරණයකට ඉඩ සලසමින් වඩාත් හිතකර නියාමන පරිසරයකින් සහ අවශ්‍ය ඩිජිටල් යටිතල පහසුකම්වලින් සමන්විතව, අඩු ආදායම්ලාභී පුද්ගලයින්ට සහ සමාජයේ කුඩා ව්‍යවසායයන්ට සැලකිය යුතු පිරිවැය කාර්යක්ෂමතාවකින් හා සක්‍යතාවයෙන් යුතු සේවා සැපයීම් සැලසෙන බැවින් ඩිජිටල් මූල්‍ය පරිසර පද්ධතියේ සැලකිය යුතු වැඩි දියුණු කිරීම් මූල්‍ය අන්තර්ගතභාවය සඳහා ආශීර්වාදයක් වනු ඇත.

මූලාශ්‍ර

1. World Bank, Financial Inclusion, Overview: https://www.worldbank.org/en/topic/
2. How to Measure Financial Inclusion, World Bank (2015): https://www.worldbank.org/en/topic/financialinclusion/brief/how-to-measure-financialinclusion
3. The Global Findex Database, World Bank Group (2017): https://openknowledge.worldbank.org/handle/10986/29510
4. Central Bank of Sri Lanka (2021)
5. Economics and Statistics Report, Central Bank of Sri Lanka (2021): https://www.cbsl.gov.lk/en/publications/other-publications/statistical-publications/economicand-social-statistics-of-sri-lanka/ess-2021
6. The Standard and Poor's Global Financial Inclusion Survey (2014 – 2015): https://gflec.org/wp-content/uploads/2016/02/Gallup-country-list-with-score.pdf
7. National Financial Inclusion Strategy for Sri Lanka (2021-2024): https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/NFIS%20Summary %2 English_2.pdf

වූ අගයදාම මූල්‍යකරණය රට තුළ ස්ථාපිත කිරීමේ අරමුණින්, ශ්‍රී ලංකාව තුළ කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා පුළුල් අගයදාම වැඩසටහනක් සංවර්ධනය කිරීමට ඇති හිඩැස් සහ අවස්ථා හඳුනා ගැනීම පිණිස මහ බැංකුව, ගෘහස්ථ කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන ලදී. තවදුරටත්, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සහල් මෝල් හිමියන් හා ශ්‍රී ලංකාව තුළ තීව්‍රකරණය වූ ඉස්සන් ගොවිපලවල් සඳහා ණය ඇප ආවරණ හා පොලී සහනාධාර යෝජනා ක්‍රම හඳුන්වා දීමටත් එම යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීමටත් කටයුතු කරන ලදී. කිරි ගොවීන් හා දියුණු වෙමින් පවතින ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වැඩි දියුණු කිරීම සඳහා ණය ඇපආවරණ හා පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමයක්, 2021 වසරේ දී ආරම්භ කරන ලදී.

තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා රටේ ප්‍රධාන අවධානය යොමු කරන ක්ෂේත්‍රයක් ලෙස ශ්‍රී ලංකාව සඳහා වන මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයක් වැඩි දියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පසුගිය කාලය තුළ හඳුනාගෙන තිබුණි. මහ බැංකුව 2021 වසරේ මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය සාර්ථකව දියත් කරන ලද අතර රටපුරා මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනයට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනා ගනිමින් මෙහෙයුම් කටයුතු සිදු කිරීම ආරම්භ කරන ලදී. මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි සියලුම ප්‍රතිපත්ති ආධාරක හරහා හඳුනාගත් ප්‍රධාන අංශයක් ලෙස මූල්‍ය අධ්‍යාපනය වැඩි දියුණු කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් 2021 වසරේ දී දීප ව්‍යාප්ත මූල්‍ය සාක්ෂරතා සමීක්ෂණයක් සාර්ථකව නිම කරන ලද අතර මහ බැංකුව සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන්ගේ ද සහයෝගීතාවයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පාසල් විෂය මාලාවට මූල්‍ය අධ්‍යාපනය අනිවාර්ය විෂයක් ලෙස ඇතුලත් කිරීමට මොඩියුල හා අධ්‍යාපනික උපකාරක මෙවලම් සංවර්ධනය කරමින් පවතී.

මූල්‍ය සාක්ෂරතාවය, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය යටතේ හඳුනාගෙන ඇති ප්‍රධාන උපකාරකවලින් එකක් වන අතර රටේ ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම සඳහා ප්‍රධාන කාර්යභාරයක් මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ඉටුකළ යුතුව ඇත. රටපුරා මූල්‍ය සාක්ෂරතාවය ඉහළ නැංවීමේ අරමුණින් මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල 6 හි සහයෝගය ඇතිව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වසර පුරා වැඩසටහන් කිහිපයක් ආරම්භ කරන ලදී. ඒ අනුව, 2021 වසරේ දී පුහුණුකරුවන් පුහුණු කරවීමේ වැඩසටහන් 8ක්, ගුවන් විදුලි සහ රූපවාහිනී වැඩසටහන් 17ක්, දැනුම හුවමාරු කරගැනීමේ වැඩසටහන් 7ක් සහ මූල්‍ය සාක්ෂරතාව, ව්‍යවසායකත්ව සහ කුසලතා සංවර්ධන වැඩසටහන් 330කට වැඩි ප්‍රමාණයක් පවත්වන ලදී. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පැවති අවිනිශ්චිතතාවයන් හා බාධක මධ්‍යයේ අළුතින් වැඩි දියුණු කරන ලද මාර්ගගත පුහුණු හා දැනුම්වත් කිරීමේ මෙවලම් උපයෝගි කරගනිමින් මාර්ගගත වැඩසටහන් මාලාවක් ද ක්‍රියාත්මක කරන ලදී.

8.6 මූල්‍ය යටිතල පහසුකම්

ගෙවීම් සහ පියවීම් පද්ධති

2021 වසර තුළ කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, මහ බැංකුව විසින් රට තුළ අඛණ්ඩව ගෙවීම් සහ පියවීම් සේවා සහතික කරමින් ආර්ථික කටයුතු සඳහා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. මහ බැංකුව විසින් කාර්යක්ෂම සහ ආරක්ෂිත ජාතික ගෙවීම් යටිතල පහසුකම් සැලසීම සඳහා රට තුළ පවතින ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

සලකා බලනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, තත්කාලීන දළ පියවීම් පද්ධතිය (Real Time Gross Settlement System - RTGS) සහ ලංකාසෙක්‍යු (LankaSecure) යන පද්ධතියෙන් සමන්විත ලංකාසෙට්ල් පද්ධතිය (LankaSettle System), වැඩි වූ ගනුදෙනු සඳහා අනුගත වෙමින් සුමටව ක්‍රියාත්මක විය. තත්කාලීන දළ පියවීම් පද්ධති ගනුදෙනුවල වටිනාකම 2021 වසර තුළ දී සියයට 96.3ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කෙරිණි. වටිනාකම අනුව බලන විට, සලකා බලනු ලබන කාල සීමාව තුළ දී තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා සිදු කළ ගනුදෙනුවල මුළු වටිනාකම මුදල් භාවිතයෙන් තොරව සිදු කළ මුළු ගනුදෙනුවල වටිනාකමින් සියයට 94ක් විය. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතනයන්හි ද්‍රවශීලතා ගැටලු හේතුවෙන් ඇතිවිය හැකි බාධාවන් මඟහරවා ගැනීම සඳහා රජයේ සුරැකුම්පත් ඇපයට තබාගෙන ලබා දෙන පොලී රහිත එක්දින ද්‍රවශීලතා පහසුකම, මහ බැංකුව විසින් අඛණ්ඩව සපයන ලදී. 2021 වසර තුළ දී, මහ බැංකුව විසින් එක්දින ද්‍රවශීලතා පහසුකම ඉල්ලා සිටි තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතන වෙත නිකුත් කරන ලද එක්දින ද්‍රවශීලතා පහසුකමෙහි සාමාන්‍ය වටිනාකම ව්‍යාපාරික දිනයකට රුපියල් බිලියන 208.5ක් විය.

2021 වසර අවසානයේ දී, ලංකාසෙක්‍යු සතු මුළු නිර්ලේඛිත සුරැකුම්පත් ප්‍රමාණය රුපියල් බිලියන (මුහුණත අගය) 9,238.6ක් වූ අතර එය භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 2,270.7ක් හා භාණ්ඩාගාර බැඳුම්කර රුපියල් බිලියන 6,967.9කින් සමන්විත විය. ලංකාසෙක්‍යු මගින් 2021 වසර තුළ දී ගණුදෙනු[2] රුපියල් ට්‍රිලියන 262.8ක් සඳහා පහසුකම් සලසා ඇත.

2021 වසර තුළ දී, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් මෙහෙයවනු ලබන චෙක්පත් නිෂ්කාශන පද්ධතිය හරහා නිෂ්කාශනය කළ මුළු චෙක්පත් ප්‍රමාණය මිලියන 33ක් වන අතර එහි වටිනාකම රුපියල් බිලියන 8,311.5කි. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නිෂ්කාශනය කළ මුළු චෙක්පත් ප්‍රමාණය පෙර වසරට සාපේක්ෂව සියයට 1.8ක සුළු අඩුවීමක් පෙන්නුම් කළද, චෙක්පත්වල වටිනාකම සියයට 11ක වර්ධනයක් වාර්තා කරන ලදී.

2021 වසර තුළ දී, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් මෙහෙයවනු ලබන සුළු පරිමාණ සමූහ ගෙවීම් සඳහා ප්‍රධාන වශයෙන් පහසුකම් සලසන ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියේ (Sri Lanka Interbank Payment System–SLIPS) ගනුදෙනු ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙලින් සියයට 13.7කින් සහ සියයට 26.8කින් මිලියන 41.9 දක්වා සහ රුපියල් බිලියන 2,862.2 දක්වාත් වර්ධනය විය.

ගෙවීම් කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි (Common Card and Payment Switch - CCAPS) පළමු අදියර වන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common ATM Switch-CAS) මගින් එම යාන්ත්‍රණයට සම්බන්ධ ඕනෑම ටෙලර් යන්ත්‍රයකින් මුදල් ආපසු ගැනීමේ සහ ශේෂය පරීක්ෂා කිරීමේ හැකියාව ලබාදේ. සලකා බලන කාල පරිච්ඡේදය තුළ දී, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා සිදු කළ ගනුදෙනු ප්‍රමාණය මිලියන 58.2 දක්වා සියයට 18.8කින් වැඩි වී ඇති අතර, එහි වටිනාකම රුපියල් බිලියන 671ක් දක්වා සියයට 32.4කින් ද වර්ධනය වී ඇත. 2021 වසර අවසානය වන විට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය හා සම්බන්ධ වී තිබුණු මූල්‍ය ආයතන සංඛ්‍යාව 29ක් විය. තමන්ටම අයත් ස්වයංක්‍රීය ගෙවීම් කාඩ්පත් කළමනාකරණ පද්ධති මෙහෙයවීමේ හැකියාවක් නොමැති මූල්‍ය ආයතනවලට සේවා සැපයීම සඳහා 2015 වසර තුළ දී හඳුන්වා දුන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ හවුල් යාන්ත්‍රණයේ සාමාජිකයින් දෙදෙනෙකු සිටි අතර, සලකා බලනු ලබන කාලසීමාව තුළ දී එහි මෙහෙයුම් කටයුතු සුමටව සිදු කරන ලදී.

2015 දී දියත් කරන ලද විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common Electronic Fund Transfer Switch - CEFTS), සාමාජික ආයතන අතර සුළු පරිමාණ අරමුදල් තත්කාලීනව හුවමාරු කිරීමේ පහසුකම ලබා දෙන ලදී. 2021 වසර තුළ දී, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් සිදු කළ ගනුදෙනු ප්‍රමාණය මිලියන 27.6 සිට මිලියන 54.7 දක්වා සියයට 97.8කින් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, එම ගනුදෙනුවල මුළු වටිනාකම රුපියල් බිලියන 2,415.3 සිට රුපියල් බිලියන 4,926.6 දක්වා සියයට 104කින් ද වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ඩිජිටල් ගෙවීම් ක්‍රම ප්‍රවර්ධනය කිරීම සඳහා මහ බැංකුව සහ මූල්‍ය ආයතන විසින් අඛණ්ඩව සිදු කරන ලද ප්‍රවර්ධන කටයුතු සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් රජය විසින් නැවත සංචාරක සීමා පැනවීමත් සමඟ පාරිභෝගිකයින් ඩිජිටල් ගෙවීම් ක්‍රම වෙත යොමු වීමයි.

සේවක අර්ථසාධක අරමුදල, ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ද

2 ප්‍රාථමික නිකුතු, ද්විතීය වෙළඳපොළ කටයුතු (එකවර මිලදී ගැනීම්, ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු, ඇප ගනුදෙනු), විවිධ වෙළඳපොළ කටයුතු සහ එක්දින ද්‍රවශීලතා පහසුකම ද ඇතුළත්ව රජයේ සුරැකුම්පත් සම්බන්ධ සියලුම ගනුදෙනු ලංකාසෙක්‍යු පද්ධතිය මගින් පියවීම් සිදු කරනු ලබයි.

8.21 සංඛ්‍යා සටහන

ගෙවීම් පද්ධති මගින් සිදුවූ ගනුදෙනු

ගෙවීම් පද්ධති	2020 (අ)		2021 (ආ)	
	ප්‍රමාණය ('000)	වටිනාකම (රු. බිලියන)	ප්‍රමාණය ('000)	වටිනාකම (රු. බිලියන)
විශාල පරිමාණයේ ගෙවීම් පද්ධති				
තත්කාලීන දළ පියවීම් පද්ධතිය	397	150,051	450	294,602
සුළු පරිමාණයේ ගෙවීම් පද්ධතිය				
ප්‍රධාන චෙක්පත් නිෂ්කාශන පද්ධතිය	33,631	7,491	33,021	8,311
ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS)	36,830	2,257	41,868	2,862
ණය කාඩ්පත්	44,692	222	50,689	283
හර කාඩ්පත්	75,094	210	108,040	316
අන්තර්ජාල බැංකු කටයුතු	57,861	4,442	135,387	6,470
දුරකථන බැංකු කටයුතු	26,701	485	27,897	538
තැපැල් උපකරණ	646	5	596	5
එකතුව	**275,852**	**165,163**	**397,948**	**313,387**
එ.ජ.ඩොලර් චෙක්පත් නිෂ්කාශන පද්ධතිය	32	48	28	51

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

විශේෂ සටහන II

මූල්‍ය තාක්ෂණයේ (FinTech) ආක්‍රමණය : බැංකු අධීක්ෂකවරුන් සඳහා ඉදිරි මග

1. හැඳින්වීම

බැංකුකරණය, පරිගණකගත බැංකු පද්ධති සිට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සහ අන්තර්ජාල බැංකු පද්ධති දක්වා දශක ගණනාවක් තිස්සේ තාක්ෂණය සමඟ ඉතා සමීප සබඳතාවක් පවත්වා ඇත. තාක්ෂණය සමඟ අනුගත වීම තුළින් බැංකුවලට අඛණ්ඩව සිය කාර්යක්ෂමතාව වැඩි කිරීමට, අතරමැදි පිරිවැය අඩු කිරීමට හා ලාභදායිතාව වැඩි කිරීමට හැකියාව ලැබී ඇත. ලාභදායිත්වය ඉහළ නැංවීම සඳහා බැංකු විසින් තාක්ෂණය අධිකව භාවිතා කිරීම තාක්ෂණ ආයෝජකයින්ගේ අවධානයට ලක්ව ඇති අතර ඒ තුළින් නව ව්‍යාපාරික අවස්ථාවන් නිර්මාණය වෙමින් නවීන මූල්‍ය තාක්ෂණ අංශයේ නැගී සිටීමක් ඇතිකර ඇත.

මූල්‍ය තාක්ෂණය (FinTech) පසුගිය දශකය තුළ ශීඝ්‍රයෙන් වර්ධනය වී ඇති අතර, එය වර්තමානයේ සාම්ප්‍රදායික බැංකු ව්‍යාපාර ආකෘතීන්ට මෙන්ම සම්ප්‍රදායික බැංකු අධීක්ෂණ ක්‍රමවේද යන දෙකටම අභියෝග එල්ල කරමින් පවතින බව පැහැදිළි ය.

වැඩි කාර්යක්ෂමතාවයකට අමතරව, මූල්‍ය තාක්ෂණය විසින් අලුතින් හඳුන්වාදෙනු ලබන පහසුකම් හා සේවාවන්, බැංකු පහසුකම් නොමැති සහ බැංකු ශාඛාවන් වෙත සීමිත හෝ කිසිදු ප්‍රවේශයක් නොමැති අඩු බැංකුකරණයට ලක් වූ ජනතාව වෙනුවෙන්, සම්ප්‍රදායික නොවන ක්‍රම හරහා, සම්ප්‍රදායික බැංකු හා වෙනත් මූල්‍ය සේවා ලබා ගැනීම සඳහා අවස්ථා සලසා දෙනු ලබයි. මේ සඳහා ප්‍රධාන හේතුව ලෙස මූල්‍ය තාක්ෂණය පදනම් කරගත් බැංකු සේවා සැපයීම සඳහා ප්‍රාථමික මාධ්‍යක් ලෙස ස්මාර්ට් ජංගම දුරකථන භාවිත කිරීම සහ අඩු වරප්‍රසාදලත් සමාජ ස්ථර අතර පවා සාපේක්ෂව ඉහළ ජංගම දුරකථන භාවිතාවක් පැවතීම සැලකිය හැකිය. ඒ අනුව, මූල්‍ය තාක්ෂණය විසින් බැංකු ක්ෂේත්‍රයේ ඉහළ තරඟකාරීත්වය, ඉහළ කාර්යක්ෂමතාවය සහ අඩු වූ අතරමැදි පිරිවැය සඳහා අවස්ථාව සලසා ඇත. කෙසේ වෙතත්, නැගී එන මූල්‍ය තාක්ෂණ ආයතන මගින් ලබා දෙන පහසුකම් හා සේවාවන් වල පවතින කාර්යක්ෂමතාවය හා ඒවා පිළිබඳව ගනුදෙනුකරුවන් තුළ පවතින තෘප්තිමත් භාවය හේතුවෙන් වෙනස් නොවන සාම්ප්‍රදායික බැංකුවල ව්‍යාපාර කටයුතු වේගයෙන් අහිමි වී යෑමේ අවධානමකට ලක් විය හැක.

මූල්‍ය තාක්ෂණයෙහි ශීඝ්‍ර ව්‍යාප්තිය, තාක්ෂණය, දත්ත පාලනය සහ වෙළෙඳපොළ හැසිරීම සම්බන්ධ නව අවදානම් ඇති කිරීමට හේතු වී ඇත. මෙමගින් බැංකු ක්ෂේත්‍රය විසින් මූල්‍ය තාක්ෂණය භාවිතය සඳහා සහය වන අධීක්ෂණ ප්‍රවේශයක අවශ්‍යතාවය මතු කරනු ලබයි. එවැනි ප්‍රවේශයන් තුළින් මෙම ක්ෂේත්‍රය තුළ නවෝත්පාදන ක්‍රියාවලිය සහ තරඟකාරීත්වය වැඩි දියුණු කරන අතරතුර පාරිභෝගිකයින් ආරක්ෂා කිරීම සඳහා අදාළ අවදානම් කළමණාකරණය කිරීම පිළිබඳව කටයුතු කිරීම අවශ්‍ය වේ.

2. සාම්ප්‍රදායික බැංකුකරණයට බලපාන මූල්‍ය තාක්ෂණ නවෝත්පාදනයන් (Fintech innovations)

බොහෝ මූල්‍ය තාක්ෂණික නවෝත්පාදනයන් පවතින නමුත් එයින් ඇතැම් නවෝත්පාදනයන් සාම්ප්‍රදායික බැංකු ක්ෂේත්‍රය සඳහා සැලකිය යුතු ලෙස බලපෑමක් ඇති කල හැක. අතථ්‍ය බැංකුකරණය (Virtual Banking), විවෘත බැංකුකරණය (Open Banking), සමීසුරුවන්ගෙන් සමීසුරුවන් වෙත ණය දෙනු ලබන වේදිකාවන් (Peer-to-peer lending platforms) සහ ඩිජිටල් මුදල් (Digital Currencies) යනු සාම්ප්‍රදායික බැංකුකරණ ක්‍රියාවලිය සැලකිය යුතු මට්ටමකින් වෙනස් කිරීමට හැකියාව ඇති මූල්‍ය තාක්ෂණික නවෝත්පාදන සතරක් ලෙස නම් කිරීමට හැකි අතර, ඒවා පහතින් විස්තරාත්මකව දක්වා ඇත.

2.1 අතථ්‍ය බැංකුකරණය (Virtual Banking)

සිය ගනුදෙනුකරුවන් සමඟ භෞතික හමුවීමක් අවශ්‍ය නොවන අයුරින් සම්පූර්ණයෙන්ම විද්‍යුත් මාධ්‍යයන් ඔස්සේ සිය සේවාවන් සපයන බැංකුවක් අතථ්‍ය බැංකුවක් ලෙස සැලකේ. මෙමගින් භෞතික ස්ථානයන් සහ කාර්ය මණ්ඩලයන්හි අවශ්‍යතාවය අවම වීම හේතුවෙන් පිරිවැය සැලකිය යුතු මට්ටමින් අඩුකර ගත හැක. මෙහි ඇති ආකර්ශනීය අඩු පිරිවැය හේතුවෙන් වර්තමානයේ පවතින සහ අලුතින් එක්වන බැංකු යන දෙවර්ගය ම අතථ්‍ය බැංකුකරණ සංකල්පය කෙරෙහි අවධානය යොමුකරමින් පවතී. අතථ්‍ය බැංකුවක ගනුදෙනුකරුවන්ට ගිණුම් විවෘත කිරීම, මුදල් තැන්පතු කිරීමේ සිට ණය ලබා ගැනීම දක්වා සියලු ම බැංකු කටයුතු බැංකු ශාඛාවකට පැමිණීමකින් තොරව තම ජංගම දුරකථන යෙදවුම් හරහා හෝ අන්තර්ජාල බැංකුකරණ ක්‍රම හරහා සිදු කිරීමට හැකියාව පවතී. අතථ්‍ය බැංකුකරණය සහ සාම්ප්‍රදායි බැංකුකරණය හරහා පිරිනමනු ලබන බැංකු පහසුකම් හා සේවාවන් සඳහා තීරණ ගැනීමේ සහ හැසිරවීමේ කාර්යයන් බොහෝ සෙයින් සමාන වීම නිසා අතථ්‍ය බැංකුකරණය සාම්ප්‍රදායික බැංකු හට නැගීඑන මූල්‍ය තාක්ෂණය මගින් මෙහෙය වන බැංකු හා වෙනත් මූල්‍ය තාක්ෂණ ව්‍යාපාර විසින් සප යනු ලබන සේවාවන් මගින් එල්ල වන අභියෝගයන්ට සාර්ථකව මුහුනදීම සඳහා වඩාත් පහසු ක්‍රමයක් වනු ඇත.

8

2.2 විවෘත බැංකුකරණය (Open Banking)

විවෘත බැංකුකරණය යෙදුම් ක්‍රමලේඛන අතුරුමුහුණත් (Application Programming Interfaces - API) භාවිතය මඟින් බැංකුවක පාරිභෝගික දත්ත වෙත කිසියම් අනුමත තෙවන පාර්ශවයන්ට ප්‍රවේශ වීමට ඉඩ සලසනු ලබයි. මෙමඟින් විවිධ මූල්‍ය ආයතනවල බැංකු දත්ත වෙත ප්‍රවේශ වීමට හැකියාව, බැංකු කිහි පයක් සමඟ ඉතා පහසුවෙන් ගනුදෙණු කිරීම වැනි පහසුකම් ජංගම යෙදුම් හරහා සිය පාරිභෝගිකයින්හට විවිධාකාරයෙන් ලබා දීමට තෙවන පාර්ශවීය මූල්‍ය තාක්ෂණ ආයතනයන් වෙත හැකියාව ලැබී ඇත. විවෘත බැංකුකරණ පහසුකම් ක්‍රියාත්මක කර ඇති බැංකුවක් සාම්ප්‍රදායික මූල්‍ය ආයතනයකට වඩා සැලකිය යුතු ලෙස වෙනස් වනු ඇත. විවෘත බැංකුකරණය තුළින් පාරිභෝගිකයින් හට ඔවුන්ගේ දත්ත පාලනය කිරීමට ඉඩ සලසා දෙනු ලබන අතර, එමඟින් පාරිභෝගිකයින්ට ඔවුන්ගේ මුල් බැංකුවට කලින් ලබා දිය නොහැකි වූ තමන් වෙනුවෙන් නිර්මාණය කළ සහ නිමවූ මූල්‍ය සේවාවන් ලබා ගැනීමට අවස්ථාව සැලසේ. ඒ අනුව විවෘත බැංකුකරණය මඟින් එක් එක් ගනුදෙනුකරුවන්ට සහ ව්‍යාපාරවලට තම මූල්‍ය කටයුතු වඩාත් කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. තවදුරටත් වඩා වැදගත් දෙය නම්, නව තාක්ෂණයන් බිහිවීමට සහ බැංකු විසින් මූල්‍ය සේවා සපයන ආකාරය ප්‍රතිව්‍යුහගත කිරීමට ඉඩ සලසා දීම මඟින් විවෘත බැංකුකරණය මූල්‍ය තාක්ෂණ කර්මාන්තයේ නවෝත්පාදනයට පහසුකම් සපයා දෙනු ලැබීමයි.

2.3 සමිසුරුවන්ගෙන් සමිසුරුවන් වෙත ණය දෙනු ලබන වේදිකාවන් (Peer-to-peer lending platforms)

නැඟී එන මූල්‍ය තාක්ෂණ ව්‍යාපාර විසින් සාම්ප්‍රදායික බැංකුකරණයට වඩාත් ම සෘජු බලපෑමක් ඇති කරන මාධ්‍යක් ලෙස මෙම ක්‍රමය හැඳින්විය හැකි ය. මෙම ක්‍රමය මඟින් ණය දෙන්නන් සහ ණය ලබා ගන්නන් සෘජුවම සම්බන්ධ කිරීම අපේක්ෂා කරනු ලබන අතර එමඟින් මූල්‍ය අතරමැදිකරණයේ පිරිවැය සැලකිය හැකි ලෙස අඩු කරනු ලබයි. සමිසුරුවන්ගෙන් සමිසුරුවන් වෙත ණය ලබාදීමේ ක්‍රමවේදය මුලින්ම ආරම්භ වූයේ බැංකු ණය ලබා ගැනීමට නොහැකි බැංකු සේවා නොලබන සහ සීමිත බැංකු සේවාවන් ලබන ගනුදෙනුකරුවන් සඳහා වන විකල්ප අරමුදල් ප්‍රභවයක් ලෙසය. කෙසේ වෙතත්, එහි පිරිවැය කාර්යක්ෂමතාව හේතුවෙන් සමිසුරු වන්ගෙන් සමිසුරුවන් වෙත ණය දෙනු ලබන ක්‍රමවේදය වර්තමානයේ සාම්ප්‍රදායික බැංකුවල සාමාන්‍ය ගනුදෙනුක රුවන් ද ක්‍රමානුකූලව ආකර්ෂණය කරගනිමින් පවතී. ප්‍රාග්ධන ප්‍රමාණවත්මකභාවය (Capital Adequacy), ද්‍රවශීලතා අවශ්‍යතා (Liquidity Requirements) මෙන් ම තැන්පතු රක්ෂණ (Deposit Insurance) වැනි ආරක්ෂිත ක්‍රමවේද හෝ විචක්ෂණ ක්‍රියාමාර්ග නොමැති වීම හේතුවෙන් සමිසුරුවන්ගෙන් සමිසුරුවන් වෙත ණය ලබා දෙන ආයතන වලට සාම්ප්‍රදායික බැංකු ගණුදෙණුකරුවන්ගේ මධ්‍ය පරිමාණ සංක්‍රමණය වීමක් වුවද මූල්‍ය පද්ධති ස්ථායිතාවය සඳහා බලපෑමක් ඇති කරන තත්වයක් බවට පත්විය හැක.

2.4 ඩිජිටල් මුදල් (Digital currencies)

මූල්‍ය තාක්ෂණ ව්‍යාපාර විසින් ඩිජිටල් මුදල් හඳුන්වාදීම, මෑතකාලීනව සාම්ප්‍රදායික මුදල් හා බැංකු පද්ධති විසින් මුහුණ දෙන විශාලතම අභියෝගය ලෙස දැක්විය හැකිය. සාමාන්‍ය ජනතාව විසින් සිදු කරනු ලබන බැංකු සහ වෙනත් මූල්‍ය ගනුදෙනු ඩිජිටල්කරණයට ලක්වීම වැඩි වීමත් සමඟ ක්‍රිප්ටෝ මුදල් (Cryptocurrencies) සහ මහ බැංකු ඩිජිටල් මුදල් (Central Bank Digital Currencies - CB-DCs) වඩාත් ප්‍රචලිතවිය හැකි ඩිජිටල් මුදල් වර්ග දෙකක් ලෙස හඳුන්වාදිය හැක. ක්‍රිප්ටෝ මුදල් යනු බ්ලොක්චේන් තාක්ෂණය (Blockchain Technology) භාවිතයෙන් ක්‍රියා කරන විශාල විමධ්‍යගත පරිගණක ජාලයක් භාවිත කර බෙදා හරින ලද ලෙජරයක් සහ ආරක්ෂිත සන්නිවේදනය සඳහා වූ ශිල්පීය ක්‍රම භාවිතය මඟින් සුරක්ෂිත කරන ලද ඩිජිටල් වත්කමකි. ක්‍රිප්ටෝ මුදල් මහ බැංකුවක් වැනි මධ්‍යගත අධිකාරියක් මඟින් නිකුත් නොකෙරේ. ඒ අනුව ක්‍රිප්ටෝ මුදල් රාජ්‍ය මැදිහත්වීම්වල ඉතා අවම බලපෑමකට යටත්වන අතර එමඟින් මහ බැංකු මුදල් ප්‍රතිපත්ති කාර්යක්ෂමතාව කෙරෙහි බලපෑම් ඇති කිරීමේ හැකියාවක්ද වේ. තවද, රටක මුදල් අධිකාරිය විසින් නිකුත් කරනු ලබන මහ බැංකු ඩිජිටල් මුදල් රටේ නිල මුදල් ඒකකයේ ඩිජිටල් ටෝකනයක් ලෙස ක්‍රියා කරයි. මහ බැංකු ඩිජිටල් මුදල් අදාල රටෙහි මුදල් අධිකාරිය විසින් නිකුත් කරන බැවින් බැවින් ඒවා නිකුත් කරන රජය විසින් ඒ සඳහා පූර්ණ වගවීමක් සිදු කරනු ලබන අතරම එම නිකුත් කරන මුදල් අධිකාරියේ පූර්ණ ප්‍රතිපත්ති පාලනයකට යටත්ව පවතිනු ඇත.

3. මූල්‍ය තාක්ෂණය සඳහා නියාමන සහ අධීක්ෂණ ප්‍රවේශය කුමක් විය යුතු ද?

3.1 බැංකු විසින් මූල්‍ය තාක්ෂණය භාවිතයට අනුගත වීමේදී විවෘත එහෙත් ප්‍රවේශමී සහගත නියාමන ප්‍රවේශයක් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය.

මූල්‍ය තාක්ෂණයෙහි ඉක්මන් ව්‍යාප්තිය හමුවේ බැංකු අධීක්ෂකවරුන්හට නව අවධානම් ඇතුළත් කිරීමට සිය අධීක්ෂණ සීමාවන් පුළුල් කිරීම, නව ආකාරයේ ඩිජිටල් මූල්‍ය සේවා සඳහා පවතින රෙගුලාසිවල ප්‍රමාණවත්භාවය හඳුනා ගැනීම, සහ මූල්‍ය තාක්ෂණ නවෝත්පාදනයන් සහ මූල්‍ය තාක්ෂණ ව්‍යාපාරවලට නිරාවරණය වීම හේතුවෙන් බැංකු මුහුණ දෙන අවධානම් හඳුනා ගැනීම, අධීක්ෂණය කිරීම, සහ අවම කිරීම වැනි අවශ්‍යතා සම්බන්ධයෙන් ගැටළුකාරී තත්වයක් මතුව ඇත.

8

තව ද, මූල්‍ය තාක්ෂණය මත පදනම් වූ සේවාවන්, අන්තර්ජාලයට සම්බන්ධ තොරතුරු පද්ධති හා දත්ත රාශියක් මත රඳා පවතී. එබැවින්, මූල්‍ය තාක්ෂණය හා බැඳුණු තාක්ෂණය, සයිබර් ආරක්ෂාව සහ දත්ත ආරක්ෂාව සම්බන්ධ අවදානම් හොඳින් අවබෝධ කර ගැනීම සහ විචක්ෂණශීලී ව කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය වේ.

කෙසේ වෙතත්, අධික නියාමනය සහ අධීක්ෂණය නව්‍යකරණයට බාධාවක් විය හැකි අතර එමගින් බැංකුවලට අවාසි තත්වයක් ඇති කරමින් ගනුදෙනුකරුවන් ද අධෛර්යමත්භාවයට පත් කරනු ඇත. එබැවින්, බැංකු අධීක්ෂකවරුන් මූල්‍ය තාක්ෂණ සේවාවන් හා සම්බන්ධ අවදානම් සහ ප්‍රතිලාභ හොඳින් තක්සේරු කළ යුතු අතර අවශ්‍ය නවෝත්පාදනයන්ට එල්ල වන බාධා අවම කිරීමට පියවර ගත යුතුය.

මූල්‍ය තාක්ෂණ සේවාවන් අධීක්ෂණය සම්බන්ධයෙන් බැංකු අධීක්ෂකවරුන් විසින් ගත හැකි අධීක්ෂණ ප්‍රවේශයන් තුළ අන්ත දෙකක් දක්නට ලැබේ. පළමුවැන්න නම් නිර්බාධ (Laissez Faire) ප්‍රවේශය වන අතර එහිදී බැංකු පද්ධතියට බරපතල අවදානම් මතුවන අවස්ථාව දක්වා අධීක්ෂකවරුන්ගේ මැදිහත්වීමකින් තොරව නවෝත්පාදනයට අවසර ලබා දෙනු ඇත. අනෙක් ප්‍රවේශය වන්නේ නවෝත්පාදනය සීමා කරන රෙගුලාසි බලාත්මක කිරීම තුළින් අධීක්ෂකවරුන් විසින් අපේක්ෂා කරන සේවාවන් සඳහා පමණක් නවෝත්පාදනයන් සීමා කිරීමයි.

3.2 අධීක්ෂකවරුන් අධීක්ෂණ තාක්ෂණය (SupTech) සමඟ ඉදිරියට යාමට ඇති අවශ්‍යතාවය

මූල්‍ය තාක්ෂණයෙහි ප්‍රතිලාභ පාරිභෝගිකයින් සහ බැංකු යන දෙ අංශයේ ම අභිවෘද්ධිය සඳහා යොදා ගන්නා අතරතුර බැංකු පද්ධතිය ස්ථාවරව තබා ගැනීම බැංකු අධීක්ෂකවරුන් වෙත පැවරී ඇති වගකීමයි. සාම්ප්‍රදායික බැංකුකරණ ක්‍රම මඟින් මතුවන අවදානම් කළමණාකරණය කිරීම සඳහා නිර්මාණය වී ඇති වර්තමානයේ භාවිත කරනු ලබන අධීක්ෂණ ප්‍රතිපත්ති, ශිල්පීය ක්‍රම, සහ සම්පත් මූල්‍ය තාක්ෂණය විසින් අලුතින් නිර්මාණය කරනු ලබන අවදානම් කළමණාකරණය කිරීම සඳහා ප්‍රමාණවත් නොවනු ඇත. තව ද, බැංකු අධීක්ෂකවරුන් සතුව පවතින සම්පත් ප්‍රමාණයද සීමා සහිත වේ. එබැවින්, පවතින සීමිත සම්පත් භාවිත කරමින් සහ මූල්‍ය ආයතනවල අවදානම මෙන්ම ස්ථායීතාවය ඉලක්ක කර ගනිමින් ඵලදායී අධීක්ෂණ ක්‍රමවේදයක් සලසන අධීක්ෂණ පරිචයක් සඳහා අනුගත වීම අත්‍යවශ්‍ය වී ඇත.

මෙම සාධක හේතුවෙන් බැංකු අධීක්ෂකවරුන් විසින් නව තාක්ෂණය පදනම් කරගත් අධීක්ෂණ ප්‍රවේශයන් ගොඩනැඟීම සහ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වන අතර මෙය අධීක්ෂණ තාක්ෂණය (SupTech) ලෙස හැඳින්වේ. මෙලෙස බැංකු අධීක්ෂකවරුන් විසින් අධීක්ෂණ තාක්ෂණයට අනුගත වීම බැංකු අධීක්ෂණය කරන ක්‍රමවේදය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරනු ඇත.

4. බැංකු අධීක්ෂකවරුන් සඳහා අත්‍යවශ්‍ය වන අධීක්ෂණ තාක්ෂණ හැකියාවන්

සංකීර්ණ අධීක්ෂණ තොරතුරු පද්ධති (Supervisory Information Systems), උසස් දත්ත විශ්ලේෂණ හැකියාවන් සහ අදාළ ව්‍යුහගත නොවන දත්ත මූලාශ්‍රවලින් දැනුම උකහා ගැනීම සඳහා කෘත්‍රිම බුද්ධිය (Artificial Intelligence) භාවිත කිරීම ආදිය ඕනෑම නූතන බැංකු අධීක්ෂකවරයෙකුට අවශ්‍ය ප්‍රධාන අධීක්ෂණ තාක්ෂණ හැකියාවන් ය. මේවා සම්බන්ධව සවිස්තරාත්මකව පහතින් දක්වා ඇත.

4.1 අධීක්ෂණ තොරතුරු පද්ධති

අධීක්ෂණ තොරතුරු පද්ධතියක් යනු බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන විසින් වාර්තා කරන ලද තොරතුරු රැස් කිරීම, පරීක්ෂාකර බැලීම සහ විශ්ලේෂණය කිරීම සඳහා පහසුකම් සපයන තොරතුරු පද්ධතියකි. බැංකුවලට දත්ත ඉදිරිපත් කිරීමට හෝ නියාමන කටයුතු සඳහා බැංකු අධීක්ෂකවරුන්ට දත්ත ලබා ගැනීමට හැකිවීම, ලේඛන සහ දත්ත ගබඩා කිරීම, කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සහිත දත්ත ගබඩාවන් පැවතීම (Data Warehouse), බැංකු අධීක්ෂණ කණ්ඩායම් විසින් දත්ත විමසීම සහ විශ්ලේෂණය කිරීම සඳහා කුඩා දත්ත සමුදායන් (Databases) හෝ දත්ත සටහන් (Data-marts) පැවතීම, සහ අධීක්ෂණය පිළිබඳ තීක්ෂණ දැක්මක් ලබාදිය හැකි වන දත්ත විශ්ලේෂණ සහ ව්‍යාපාරික බුද්ධි මෙවලම් (Business Intelligence Tools) පැවතීම යන විශේෂාංග අධීක්ෂණ තොරතුරු පද්ධතියක් සතු ලක්ෂණ වේ.

4.2 උසස් දත්ත විශ්ලේෂණ හැකියාවන් මඟින් නිවැරදි සහ කාලෝචිත පූර්ව අනතුරු ඇඟවීමේ දර්ශක (Early Warning Signals) ජනනය කිරීම.

අධීක්ෂණ තොරතුරු පද්ධතියක් සමඟින් උසස් දත්ත විශ්ලේෂණ හැකියාවන් ක්‍රියාවට නැංවීමෙන් බැංකු අධීක්ෂකවරුන්ට ඉමහත් ප්‍රතිලාභ ලැබෙනු ඇත. දත්ත විමසීම, විශ්ලේෂණය සහ දෘශ්‍යකරණය (Visualization) සඳහා වූ හැකියාවන් මෙයට ඇතුළත් වනු ඇත. විශ්ලේෂණාත්මක වේදිකාවක් (Analytics Platform) මඟින් බැංකු අධීක්ෂකවරුන් හට ප්‍රමිතිගත (Standardized)

8

සහ වරින්වර අවශ්‍යය වන (Ad hoc) දත්ත පූර්ණ ගණනය හා විශ්ලේෂණය සඳහා පහසුකම් සලසයි.

පුළුල් දත්ත විශ්ලේෂණ වේදිකාවක් මඟින් බැංකු විසින් ඉදිරිපත් කරන ලද ව්‍යුහගත දත්ත, ණය කාර්යාංශයේ සහ වෙනත් බාහිර මූලාශ්‍ර මගින් ලැබෙන දත්ත සහ සාර්ව ආර්ථික පුරෝකථන භාවිතා කරමින් විශ්ලේෂණ ආකෘති හරහා විවිධ අවදානම් බාණ්ඩ, බැංකු, සහ බැංකු බාණ්ඩ සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීමට හැකියාව පවතී. එවැනි වේදිකාවක් තුළින් සාර්ව ආර්ථික පුරෝකථන සහ ආයතනික ප්‍රවණතා මත පදනම්ව ඉදිරි කාලානුරූපී ආතති පරීක්ෂණ (stress tests) පැවැත්වීමට බැංකු අධීක්ෂකවරුන්ට හැකියාව ලැබෙනු ඇත.

4.3 කෘතිම බුද්ධිය (Artificial Intelligence -AI) භාවිතා කර පොදු සහ අනෙකුත් ව්‍යුහගත නොවන දත්ත තුළින් අධීක්ෂණය පිළිබඳ තීක්ෂණ දැකීම් ජනනය කිරීම.

පූර්ණ සංවර්ධිත දත්ත විශ්ලේෂණ හැකියාවන් මඟින් බැංකු අධීක්ෂකවරුන් හට සාම්ප්‍රදායික සංඛ්‍යාන මෙවලම් මෙන්ම කෘත්‍රිම බුද්ධිය මත පදනම් වූ නැඟී එන තාක්ෂණය න් භාවිත කරමින් ව්‍යුහගත සහ ව්‍යුහගත නොවන දත්ත විශ්ලේෂණය සහ අර්ථ නිරූපණය කිරීමට පහසුකම් සලසා දිය යුතුය. ඒ අනුව, පොදු දත්ත සහ වෙනත් ව්‍යුහගත නොවන දත්ත වලින් අධීක්ෂණය පිළිබඳ තීක්ෂණ දැකීම් ජනනය කිරීම සඳහා බැංකු අධීක්ෂකවරුන් විසින් කෘත්‍රිම බුද්ධිය පදනම් කරගත් තාක්ෂණයන් භාවිත කිරීම සහ විවිධ විශ්ලේෂණ වේදිකාවන් ඔස්සේ බැංකු ශ්‍රේණිගත කිරීම් සහ පූර්ව අනතුරු ඇඟවීමේ නිරීක්ෂණය කිරීම් ඇතුළු ව්‍යුහගත දත්ත පදනම් කරගත් විශ්ලේෂණ මත දැනටමත් සිදු කර ඇති නියාමන හැකියාවන් තවදුරටත් පුළුල් කිරීම සඳහා විවිධ ව්‍යුහගත නොවන (ලිඛිතමය) දත්ත මූලාශ්‍රවලින් දැනුම උකහා ගැනීම ඉලක්ක කරගනු ඇත.

5. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනටමත් ගෙන ඇති පියවරයන්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය තාක්ෂණය සඳහා පහසුකම් සැලසීමට මෙන් ම ප්‍රධාන අවදානම්වලට විසඳුම් සෙවීමට විවිධ පියවර රැසක් ගෙන ඇත. මෙම පියවර අතරින් කිහිපයක් පහතින් විස්තරාත්මකව දක්වා ඇත.

5.1 තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව (Regulatory framework on technology risk management and resilience)

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 වසරේදී බලපත්‍රලාභී බැංකු සඳහා අවම නියාමන අවශ්‍යතා මාලාවක් ලෙස තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව හඳුන්වා දෙන ලදී. මෙම නියාමන රාමුවේ ප්‍රධාන ලක්ෂණ වනුයේ, ඉහළ තොරතුරු ආරක්ෂාවක් හඳුන්වාදීම, පද්ධති උපයෝජ්‍යතාව (System Availability) සහ අත්‍යවශ්‍ය සහ තීරණාත්මක තොරතුරු පද්ධති (Critical Information Systems) බිඳ නොවැටී පවත්වා ගැනීම, සංවේදී දත්ත සඳහා ඉහළ තොරතුරු ආරක්ෂණ අවශ්‍යතා හඳුන්වාදීම සහ පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු සඳහා ඉහළ අවදානම් කළමනාකරණ පියවරයන් හඳුන්වාදීමයි.

ඉහත නියාමන රාමුවේ ප්‍රධාන සංරචක ලෙස තාක්ෂණික අවදානම් කළමනාකරණ පාලන රාමුව, තොරතුරු වල ආරක්ෂාව, තොරතුරු පද්ධති උපයෝජ්‍යතාව සහ විපත් ප්‍රතිසාධනය (Disaster Recovery), කාර්ය මණ්ඩල නිපුණතා, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සහ වලාකුළු පරිගණකකරණය (Cloud Computing) ඇතුළු තෙවන පාර්ශවීය යටිතල පහසුකම් (Third-Party Infrastructure) භාවිතය අදිය සඳහා වන අවශ්‍යතා ඇතුළත් වේ.

5.2 ගනුදෙනුකරු හඳුනා ගැනීමේ (Know-Your-Customer - KYC) දත්ත හුවමාරුව පිළිබඳ සංකල්පය සනාථ කිරීම (Proof-of-Concept - POC).

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021 වසරේදී බ්ලොක්චේන් තාක්ෂණය (Blockchain Technology) පදනම් කරගත් ගනුදෙනුකරු හඳුනා ගැනීම සඳහා සංකල්පය සනාථ කිරීමේ ක්‍රියාවලියක් ගොඩනැඟීම සහ පරීක්ෂා කිරීම සම්පූර්ණ කරන ලදී. මෙලෙස බැංකු ක්ෂේත්‍රයම ආවරණය වන ගනුදෙනුකරු හඳුනා ගැනීමේ දත්ත හුවමාරුව පිළිබඳව බ්ලොක්චේන් තාක්ෂණය පදනම් වූ සංකල්පය සනාථ කිරීමේ ක්‍රමවේදය සංවර්ධනය කිරීමේ අරමුණු වූයේ, පාරිභෝගික අත්දැකීම් වැඩි දියුණු කිරීමට, මෙහෙයුම් වියදම් අඩු කිරීමට සහ බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල මෙහෙයුම් අවදානම අවම කිරීමට මෙමඟින් ඇති හැකියාවන් තක්සේරු කිරීමයි. පරිශීලක හිතකාමී සහ ආරක්ෂිත සැලසුම් සහිතව ගනුදෙනුකරු හඳුනා ගැනීමේ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම තුළින් ඩිජිටල් මූල්‍ය සේවා භාවිත කිරීමට පාරිභෝගිකයන් දිරිමත් කරන අතර මූල්‍ය සේවා සඳහා ඔවුන්ගේ ප්‍රවේශය ද වැඩි කරනු ඇතැයි තවදුරටත් අපේක්ෂා කෙරේ.

මෙහිදී බැංකු අතර පාරිභෝගිකයන්ගේ තොරතුරු සුරක්ෂිතව සහ කාර්යක්ෂමව හුවමාරු කර ගැනීමට අනුබල දෙන බ්ලොක්චේන් තාක්ෂණයේ සාධනීය ලක්ෂණ කිහිපයක් හඳුනා ගැනීමට හැකි විය. මෙය බ්ලොක්චේන් තාක්ෂණය තුළින් මූල්‍ය සේවාවන්හි නවෝත්පාදනයන් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ බැංකු සහ තොරතුරු තාක්ෂණ

යන ක්ෂේත්‍රවල ස්වේච්ඡා සහභාගීත්වය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද සුවිශේෂී ජාතික ව්‍යාපෘතියක් ලෙස හැඳින්විය හැකිය.

5.3 නියාමන පරීක්ෂණ අවකාශ රාමුව (Regulatory sandbox)

වැඩි කාර්යක්ෂමතාවයක් සහිත හා මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය වැඩි කරන නවෝත්පාදනයන් සඳහා මුල පිරීම් දිරිමත් කිරීම සහ සක්‍රීය කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 වසරේදී මූල්‍ය තාක්ෂණ නියාමන පරීක්ෂණ අවකාශ රාමුව යන සංකල්පය ආරම්භ කරන ලදී. නියාමන අවශ්‍යතා උල්ලංඝනය කිරීමේ අවදානමකින් තොරව තෝරාගත් නවෝත්පාදකයින්ට ඔවුන්ගේ මූල්‍ය තාක්ෂණ පහසුකම් සහ සේවා පරීක්ෂා කිරීමට ආරක්ෂිත ඉඩක් ලබා දීම මෙම ක්‍රමයෙන් අපේක්ෂා කෙරේ.

6. ඉදිරි දැක්ම

මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය කෙරෙහි කිසිඳු අහිතකර බලපෑමක් ඇතිනොවන අයුරින් මූල්‍ය තාක්ෂණය වෙතින් උපරිම ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා, මූල්‍ය අංශයේ නියාමකයින්ට ද්විත්ව ප්‍රවේශයක් සඳහා අනුගත වීමට සිදුවේ. මූල්‍ය තාක්ෂණ නවෝත්පාදනයන් මඟින් ඇති වන අවදානම් ප්‍රමාණවත් ලෙස අවම කර ගනිමින්, එවැනි නවෝත්පාදනයන් සඳහා පහසුකම් සලසන නියාමන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා මූල්‍ය නියාමකයින් විසින් තම නියාමන රාමුව සඳහා අවශ්‍ය වෙනස්කම් සිදු කළ යුතුය. තවද, එම නියාමන රාමුව ශීඝ්‍රයෙන් දියුණු වන මූල්‍ය තාක්ෂණ කර්මාන්තය විසින් හඳුන්වා දෙනු ලබන වෙනස්කම් සඳහා ප්‍රතිචාර දක්වනු ලබන මෙන්ම අඛණ්ඩව විකාශනය වන නියාමන රාමුවක් වීම අවශ්‍ය වේ. අනෙක් අතට, අධි තාක්ෂණය මත පදනම් වූ ස්වයංක්‍රීය අධීක්ෂණ ක්‍රමවේද වෙත ප්‍රවේශ වීම හරහා බැංකු අධීක්ෂකවරුන්ගේ අධීක්ෂණ ධාරිතාවන් සැලකිය යුතු ලෙස වැඩි දියුණු කිරීමද සිදුකළ යුතුය. නවීන අධීක්ෂණ තොරතුරු පද්ධති ක්‍රියාත්මක කිරීම, උසස් දත්ත විශ්ලේෂණ හැකියාවන් වර්ධනය කිරීම සහ කෘත්‍රිම බුද්ධිය සහය කරගත් අධීක්ෂණ තාක්ෂණ (SupTech) මෙවලම් හඳුන්වාදීම මේ සඳහා ඇතුළත් වේ. එවැනි අධීක්ෂණ පරිසරයක් මූල්‍ය තාක්ෂණය මඟින් මෙහෙයවන ලබන යුගයක ඵලදායී ලෙස බැංකු පද්ධතිය අධීක්ෂණය කිරීමට බැංකු අධික්ෂකවරුන්ට අවස්ථාව සලසනු ලබයි.

මූලාශ්‍ර

1. The Next Wave of Suptech Innovation - Suptech Solutions for Market Conduct Supervision" World Bank Group" March 2021
2. FinTech" RegTech and SupTech(What They Mean for Financial Supervision" Toronto Centre" August 2017
3. Supervisory Implications of FinTech in SEACEN Jurisdictions" Herbert Poenisch & Michael Zamorski" SEACEN Financial Stability Journal - Volume 7$2016
4. CBSL Successfully Completes the Process of Developing and Testing a Blockchain Technology based Shared Know-Your-Customer ^KYC& Proof-of-Concept ^POC&" Central Bank of Sri Lanka" Press Release - October 2021

විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා රජයේ ආයතන සඳහා මංගත ගෙවීම් (Online Payments) **පහසුකම් ලබා දීම පිණිස දියත් කරන ලද ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව** (LankaPay Online Payment Platform - LPOPP) **සමඟ මෙම කාල සීමාව තුළ දී සම්බන්ධ විය.** සලකා බලනු ලබන කාල සීමාව තුළ දී, ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව හරහා සිදු වූ ගනුදෙනු ප්‍රමාණය 96,258 සිට 513,961 දක්වා සියයට 433.9කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති අතර එහි වටිනාකම රුපියල් බිලියන 75.3 සිට රුපියල් බිලියන 198.2 දක්වා සියයට 163.1කින් වර්ධනය වී ඇත. සලකා බලනු ලබන කාල සීමාව තුළ දී, ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව හරහා සිදු වූ ගනුදෙනු ප්‍රමාණය සහ ඒවායේ වටිනාකම වර්ධනය වීම සඳහා ශ්‍රී ලංකා රේගුවට අදාළ ගනුදෙනු වැඩිවීම සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මේ සමඟ සම්බන්ධ වීම ප්‍රධාන වශයෙන් හේතු විය.

2021 වසර තුළ දී, 126,670ක් නව LANKAQR **වෙළඳුන් ලෙස සම්බන්ධ වීමත් සමඟ** LANKAQR **පාදක වූ ගනුදෙනු ප්‍රමාණය හා වටිනාකම පිළිවෙලින් සියයට 625.4කින් 1,154,984ක් දක්වා සහ සියයට 361.3කින් රුපියල් මිලියන 2,487ක් දක්වා සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි.** LANKAQR ගෙවීම්, සුළු හා මධ්‍ය පරිමාණ වෙළඳුන් අතර මෙන්ම පාරිභෝගිකයන් අතර ද ප්‍රචලිත කිරීමේ අරමුණින්, ''LANKAQR ක්‍රමවේදය ජනගතකරණ වැඩසටහන'', 2021 ඔක්තෝම්බර් මාසයේ දී දියත් කරන ලදී. තවද, LANKAQR ගෙවීම් ක්‍රමයක් ලෙස පිළිගැනීමට වෙළඳුන් දිරිමත් කිරීම සඳහා LANKAQR මූලික කර ගෙන කරන ලද ගනුදෙනු සඳහා සියයට 0.5ක උපරිම වෙළඳ වට්ටම් අනුපාතය නැවත දැනුම් දෙන තුරු දීර්ඝ කරන ලදී.

2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝගයෙහි විධිවිධාන යටතේ ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් පද්ධතිවල කටයුතු නියාමනය හා අධීක්ෂණය, මහ බැංකුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, ඉහත නියෝගයට අනුකූලව, හර කාඩ්පත් නිකුත් කරන්නන් ලෙස කටයුතු කිරීමට මූල්‍ය ආයතන දෙකකට බලපත්‍ර ලබා දෙන ලදී. කොවිඩ්-19 වසංගතය යළි හිස එසවීම සහ රජය විසින්

8

සංචාරක සීමා පැනවීම හේතුවෙන් ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධතියක ක්‍රියාකරුවෙක් සම්බන්ධයෙන් අතථ්‍ය ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන ලද අතර, ගෙවීම් කාඩ්පත් සහ ජංගම ගෙවීම් පද්ධති සේවා සපයන්නන්ට පවරන ලද රෙගුලාසිවලට අනුකූල වීම අඛණ්ඩව අධීක්ෂණය කිරීම සඳහා දුරස්ථ ආවේක්ෂණ කටයුතු ශක්තිමත් කිරීමෙන් බලපත්‍රලාභී සේවා සපයන්නන්ගේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කරන ලදී.

බ්ලොක්චේන් තාක්ෂණය (Blockchain Technology) පදනම් කරගත් ගනුදෙනුකරුවන් හඳුනා ගැනීමේ හවුල් යාන්ත්‍රණය (Shared KYC) සඳහා සංකල්ප සාධනය (Proof of Concept) යෙදවීම සහ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය මහ බැංකුව විසින් සාර්ථකව නිම කරන ලදී. ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ නවෝත්පාදනයන් බලාත්මක කිරීම සඳහා බ්ලොක්චේන් තාක්ෂණයේ ඇති විභවය මෙමගින් පෙන්නුම් කරන ලදී.

ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ උපදේශනාත්මක සහ අධීක්ෂණ කමිටුව වන ජාතික ගෙවීම් කවුන්සිලය මගින් 2020-2022 සඳහා වූ ගෙවීම් පද්ධති ඉදිරි දැක්ම අධීක්ෂණය කිරීම සහ 2022-2024 සඳහා වූ ගෙවීම් පද්ධති ඉදිරි දැක්ම සාකච්ඡා කිරීම තුළින් රටේ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ඵලදායී ලෙස පහසුකම් සැලසීම පිණිස අවදානම් නිරීක්ෂණය කරමින් මූල්‍ය අංශයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට තවදුරටත් ක්‍රියා කරන ලදී. ශ්‍රී ලංකාව සඳහා නව ප්‍රේෂණ මාර්ග අධ්‍යයනය කිරීමට සහ යෝජනා කිරීමට ජාතික ගෙවීම් කවුන්සිලය පත් කළ ක්‍රියාකාරී කමිටුවේ වාර්තාව 2021 වසර තුළ දී ජාතික ගෙවීම් කවුන්සිලය වෙත ඉදිරිපත් කරන ලදී. විවෘත බැංකුකරණය (Open Banking), අතථ්‍ය මුදල් (Virtual Currencies), මහ බැංකු ඩිජිටල් මුදල් වර්ග (Central Bank Digital Currency) සහ කෘතිම බුද්ධිය (Artificial Intelligence) වැනි නව්‍ය ගෙවීම් නිෂ්පාදන/වේදිකා පිළිබඳ කමිටු කිහිපයක වාර්තා සලකා බලනු ලබන කාලසීමාවේදී ජාතික ගෙවීම් කවුන්සිලයට ඉදිරිපත් කරන ලදී.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රමුඛතම කාර්යය වන මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම සම්බන්ධ හෝ අනෙකුත් නීති විරෝධී කටයුතු සම්බන්ධව වාර්තා වන සැක කටයුතු ගනුදෙනු විශ්ලේෂණය කිරීම හා අදාළ ආයතන වෙත යොමු කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. 2021 වසර තුළ දී වාර්තාකරණ ආයතන, නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන්, නියාමන අධිකාරීන් සහ මහජනතාව විසින් සැක කටයුතු ගනුදෙනු වාර්තා සහ තොරතුරු විමසීම් 4,696ක් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී. සලකා බලනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, ක්‍රියාකාරී සහ උපායමාර්ගික විශ්ලේෂණයන්ගෙන් පසුව වැඩිදුර විමර්ශන සහ නියාමන ක්‍රියාමාර්ග සඳහා ඉන් 1,830ක් අදාළ නීතිය බලාත්මක කිරීමේ අධිකාරීන් සහ නියාමන අධිකාරීන් වෙත යොමු කරන ලදී. සැක කටයුතු ගනුදෙනු වාර්තා 2,220ක් අඛණ්ඩ ආවේක්ෂණ ක්‍රියාවලිය යටතේ තබා ඇති අතර, 641ක් මූලික විශ්ලේෂණය සහ වැඩිදුර අධ්‍යයනය සඳහා තබා ඇත. ඉතිරි සැක කටයුතු ගනුදෙනු වාර්තා වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවන කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලදී. එසේම, 2021 වසර තුළ දී, 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි 6 වන වගන්තිය අනුව, වාර්තාකරණ ආයතන විසින් දේශීය හා විදේශීය වශයෙන් රුපියල් මිලියන 1 සහ ඊට වැඩි හෝ විදේශ මුදල්වලින් එයට සමාන වන මුදල් ගනුදෙනු වාර්තා මිලියන 5.7ක් (තාවකාලික) සහ විද්‍යුත් අරමුදල් හුවමාරු වාර්තා මිලියන 9.2ක් (තාවකාලික) මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී.

රට තුළ මුදල් විශුද්ධිකරණය වැළක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළක්වීමේ නීතිමය රාමුව සමඟ වන ආයතනික අනුකූලතාවය සහතික කිරීම සඳහා අවදානම මත පදනම් වූ අධීක්ෂණ ක්‍රියාවලිය මූල්‍ය බුද්ධි ඒකකය විසින් අඛණ්ඩව සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන මෙන්ම නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් සඳහා ද මූල්‍ය බුද්ධි ඒකකය විසින් අවදානම මත පදනම් වූ පරීක්ෂණ සිදු කරන ලදී. ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කරන ලද එතැන් පරීක්ෂණ පැවැත්වීමට පැවති බාධාවන් මධ්‍යයේ වුව ද, මූල්‍ය බුද්ධි ඒකකය විසින් අවදානම මත පදනම් වූ ස්ථානීය පරීක්ෂණ 2ක් ද, අවදානම මත පදනම් වූ ඒකාබද්ධ ස්ථානීය පරීක්ෂණ 7ක් ද සහ එතැන් පරීක්ෂණ 7ක් ද සාර්ථකව සිදු කරන ලදී. තවද, මූල්‍ය ආයතනවල මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සමඟ අනුකූල වීම ඇගයීම සඳහා පසු විපරම් විතැන් පරීක්ෂණ 4ක් ද පවත්වන ලදී. තවදුරටත්, මූල්‍ය අංශයේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම කෙරෙහි අනුකූලතාවය ඇගයීම පිණිස මූල්‍ය ආයතන සඳහා තේමාත්මක සමාලෝචන (Thematic Reviews) 5ක් සිදුකරන ලද අතර එවැනිම වූ තේමාත්මක සමාලෝචන 2ක් නම් කරන ලද මූල්‍ය

8

නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සඳහා ද සිදු කරන ලදී. 2021 වසර තුළ සිදු කරන ලද පරීක්ෂණ මත පදනම්ව, එක්සත් ජාතීන්ගේ සම්බාධක සම්බන්ධව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග, ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති, ගනුදෙනුකරු හඳුනාගැනීම සහ තහවුරු කරගැනීම සහ සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීම, නිසි අවදානම් පාලන සහ අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම යනාදී කරුණු උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු 4ක් සඳහා සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 5ක් සඳහා රුපියල් මිලියන 10.5ක පරිපාලනමය දණ්ඩන පනවන ලදී. ඊට අමතරව, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ විධිවිධාන හා එම ප්‍රකාරව නිකුත් කරන ලද නියෝග හා මාර්ගෝපදේශ සහ ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ රීති ප්‍රකාරව වාර්තා වූ අනුකූල නොවීම් හේතු කරගනිමින් මූල්‍ය ආයතන සඳහා වසර තුළ දී හේතු පැහැදිලි කිරීමේ ලිපි 9ක් සහ අනතුරු ඇඟවීමේ ලිපි 5ක් නිකුත් කරන ලදී. තවද, මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ අධීක්ෂණ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම කෙරෙහි අනුකූලතාවය දක්වන නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර හා වෘත්තීන් සංඛ්‍යාව වැඩිදියුණු කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය විසින් කටයුතු කරන ලදී.

2021 වසර තුළ දී රට තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ පාලන තන්ත්‍රයේ සඵලදායීතාව වැඩිදියුණු කිරීමේ අරමුණු ඇතුව මූල්‍ය බුද්ධි ඒකකය විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නීතිමය රාමුව සඳහා නීතිමය සංශෝධන හඳුන්වා දීමට ක්‍රියාමාර්ග රැසක් ගන්නා ලදී. තවද, මූල්‍ය කාර්යසාධන බලකායෙහි නිර්දේශයන්හි නිර්දේශ අංක 01 සමඟ අනුකූලතාවය දැක්වීම පිණිස ලෝක බැංකුවේ සහාය ඇතිව ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ජාතික අවදානම් තක්සේරුව යාවත්කාලීන කිරීම ආරම්භ කරන ලදී. මෙහි ක්‍රියාකාරී කණ්ඩායම්, රාජ්‍ය හා පුද්ගලික නියෝජිතයන් 66කින් සහ 123 කට වැඩි නිලධාරීන්ගෙන් සමන්විත වේ.

සියලුම පාර්ශවකරුවන්ගේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ අධීක්ෂණ ක්‍රියාවලිය හා ආයතනික අනුකූලතාවය තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස වසර තුළ දී මූල්‍ය බුද්ධි ඒකකය විසින් මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ කිහිපයක් නිකුත් කරන ලද අතර, දැනුවත් කිරීම්/පුහුණු වැඩසටහන් 50ක් සඳහා සම්පත් දායකත්වය සපයන ලදී.

මූල්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ නීති ප්‍රතිසංස්කරණ

මහ බැංකුවේ නියාමන සහ අධීක්ෂණ රාමුව සඳහා වඩාත් ශක්තිමත් නෛතික පදනමක් සැපයීමේ අරමුණින් මහ බැංකුව එමගින් පාලනය වන ව්‍යවස්ථාවන්ට නව ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව මහ බැංකුව විසින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වෙමින් යෝජිත බැංකු පනතේ ප්‍රතිපාදන තවදුරටත් ශක්තිමත් කිරීම සහ විධිමත් කිරීම සඳහා නව බැංකු පනත සම්බන්ධයෙන් සිදු කළ දෙවන සාකච්ඡා වටය 2021 වසරේ දී අවසන් කරන ලදී. මීට අමතරව, මහ බැංකුවේ නිරාකරණ කිරීමේ බලාධිකාරය ද ඇතුලත්ව බැංකු නොවන මූල්‍ය ආයතන සම්බන්ධයෙන් මහ බැංකුව සතු නියාමන සහ අධීක්ෂණ බලතල වැඩි දියුණු කිරීම සඳහා මහ බැංකුව විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත සඳහා අවශ්‍ය සංශෝධන සකස් කරන ලදී.

වෙළඳ, නිෂ්කාශනය සහ පියවීම් පිළිබඳ පනත, මූල්‍ය වත්කම් කළමනාකරණ නියෝජිතායතන පනත සහ ක්ෂුද්‍රමූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත යන නව නීති සම්පාදනය කිරීමට ද මහ බැංකුව සිය දායකත්වය සපයන ලදී. රජයේ සුරැකුම්පත් සහ විදේශ විනිමය ගනුදෙනු හා සම්බන්ධ වෙළඳාම, නිෂ්කාශන, පියවීම් සහ භාරකාරීත්වයට අදාළ රෙගුලාසි වැඩි දියුණු කිරීම ශ්‍රී ලංකාව සඳහා නව වෙළඳ, නිෂ්කාශන සහ පියවීම් පිළිබඳ පනතක් හඳුන්වා දීමෙහි අරමුණ වේ. රජයේ සුරැකුම්පත් සහ විදේශ විනිමය වෙළඳපොළ සඳහා නවීන පශ්චාත් වෙළඳ නිෂ්කාශනය, මධ්‍යම ප්‍රතිපාර්ශ්ව පද්ධති, බහු ව්‍යවහාර මුදල් තත්කාලීන දළ පියවීම් පද්ධතිය ආදිය මගින් සහය දක්වන ආරක්ෂිත, නවීන, තරඟකාරී සහ සාධාරණ වෙළඳපොළවල් බවට පරිවර්තනය කිරීම සඳහා ඇවැසි පුළුල් නෛතික හා තාක්ෂණික යටිතල පහසුකම් හඳුන්වාදීම කෙරෙහි මෙම පනත තුළින් මූලික අවධානය යොමු කරනු ලබයි. ඌණ ක්‍රියාකාරී වත්කම් හේතුවෙන් නියාමනය කරන ලද මූල්‍ය ආයතනවල ශේෂ පත්‍රයන් හි පවතින වගකීම්භාරය ලිහිල් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාව තුළ මූල්‍ය වත්කම් කළමනාකරණ සමාගම් පිහිටුවීම සඳහා සංකල්ප මත පදනම් වූ නීතිමය රාමුවක් හඳුන්වාදීම මූල්‍ය වත්කම් කළමනාකරණ නියෝජිතායතන පනතේ අරමුණ විය. මුදල් ණයට දීමේ ව්‍යාපාරය සහ ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාරය නියාමනය සහ අධීක්ෂණය සඳහා වෙන්වූ නියාමන අධිකාරියක් පිහිටුවීම සහ

8

පාරිභෝගිකයාගේ ආරක්ෂාව සහතික කිරීම යන කාරණා මූලික කොට ගෙන නව ක්ෂුද්‍රමූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත කෙටුම්පත් කරන ලදී.

ඊට අමතරව, භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම ශක්තිමත් කිරීමට මෙන්ම ශ්‍රී ලංකාවේ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ පිළිබඳ ආයෝජකයින්ගේ විශ්වාසය යළි ස්ථාපිත කිරීමට ද මහ බැංකුව මගින් 1937 අංක 7 දරන ලියාපදිංචි කොටස් හා සුරැකුම්පත් ආඥාපනතට යෝජිත සංශෝධන ඉදිරිපත් කළ අතරම ඒ යටතේ නිකුත් කර තිබූ අනුනීති ද නිකුත් කරන ලදී. තවද, විදේශ විනිමය වෙළඳපොළෙහි සුමට ක්‍රියාකාරීත්වයට පහසුකම් සැලසීමේ සහ නියාමන බලතල ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව 2017 අංක 12 දරන විදේශ විනිමය පනත සඳහා ද සංශෝධන යෝජනා කරන ලදී.

මහ බැංකුව විසින් වෙනත් පාර්ශ්වකරුවන් විසින් කෙටුම්පත් කරන ලද එහෙත් මහ බැංකුවට සහ මූල්‍ය අංශයට අදාළ ව්‍යවස්ථාවන් කිහිපයක් එනම්, කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත් කෙටුම්පත, කොරෝනා වෛරස් රෝගය 2019 (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත, මුදල් පනත් කෙටුම්පත, දත්ත සුරැකීමේ පනත් කෙටුම්පත මෙන්ම ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සහ ලංකා බැංකු ආඥාපනත ආදිය සඳහා යෝජිත සංශෝධනයන් සමාලෝචනය කිරීම සඳහා දායකත්වය ලබා දෙන ලදී. එහි දී එම ව්‍යවස්ථා හඳුන්වා දීමෙහි ලා බැඳුණු ජාතික වැදගත්කම මෙන්ම මහ බැංකුවේ පවත්නා නියාමන සහ අධීක්ෂණ රාමුවට එවැනි පනත්/සංශෝධනවල ඇති බලපෑම ද මහ බැංකුව විසින් සළකා බලන ලදී. මූල්‍ය පද්ධතිය කෙරෙහි බිඳහෙලිය නොහැකි මහජන විශ්වාසයක් පවත්වාගෙන යාම සඳහා මහ බැංකුව විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ සහ 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ නීතිපති දෙපාර්තමේනතුවේ සහ අනෙකුත් නීති බලාත්මක කිරීමේ ආයතනවල සහාය ඇතිව අනවසර මුදල් සමාගම්, තහනම් යෝජනා ක්‍රම සහ මූල්‍ය ක්ෂේත්‍රයේ අනෙකුත් ගැටලු සම්බන්ධව නඩු පැවරීම් අඛණ්ඩව සිදු කරන ලදී.

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය

මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවෙහි අරමුණු වන්නේ මූල්‍ය පාරිභෝගිකයාගේ අයිතීන් සුරැකීම සහ මූල්‍ය පාරිභෝගිකයින් සඳහා මූල්‍ය නිෂ්පාදන සහ සේවාවල සාධාරණත්වය හා විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීමය. පැමිණිලි හා ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා නව නීති සම්පාදනය කිරීම හෝ පවතින නීති පද්ධතියට සංශෝධන සිදු කිරීම මගින් සුදුසු නීතිමය ප්‍රතිපාදන හඳුන්වා දීම සහ විශේෂිත පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ/විමර්ශන කටයුතු සිදු කිරීම වැනි ක්‍රියාමාර්ග ද ඇතුළුව නව ක්‍රියාමාර්ග මහ බැංකුව විසින් ගෙන ඇත. මෙම ක්‍රියාමාර්ග මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව සම්බන්ධ ගැටලු පිළිබඳව ඉක්මන් පියවර ගැනීමට බලධාරීන්ට බලය ලබා දෙනු ඇත. මසකට පැමිණිලි 500 ක පමණ සාමාන්‍යයක් සහිතව පැමිණිලි සහ ඉල්ලීම් 6,186ක් 2021 වසර තුළ මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවට ලැබී ඇත. ඒ අතරින් මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවට මැදිහත් විය හැකි ක්‍රියාත්මකවිය යුතු පැමිණිලි හා ඉල්ලීම්වලින් සියයට 91කට අධික ප්‍රමාණයක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත් අතර සමස්ත පැමිණිලි ප්‍රමාණයෙන් දළ වශයෙන් සියයට 45.7ක් සාර්ථකව සමතයකට පත් කරන ලදී. මෙම පැමිණිලි අතුරින් බොහොමයක් කොවිඩ්-19 වසංගතය නිසා බලපෑමට ලක්වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා වන ණය සහන, ණය ප්‍රතිලේඛන ගත කිරීම, ඉහළ පොලී අනුපාතික, පිළිගත නොහැකි/සදාචාරාත්මක නොවන ක්‍රියාවන් සහ ණය පහසුකම් කලින් පියවීම සම්බන්ධයෙනි. මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව 2021 වසරේ දී පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා සරල ආකෘති පත්‍රයක් හඳුන්වා දුන් අතර මෙමගින් පැමිණිලි කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කරනු ඇත.

දුර්වල මූල්‍ය සමාගම් සඳහා වන නිරාකරණ සහ බලගැන්වීම් කටයුතු

මහ බැංකුව විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය කළමණාකරණය අඛණ්ඩව සිදුකරන ලදී. රුපියල් 600,000 සිට රුපියල් 1,100,000 දක්වා දක්වා උපරිම තැන්පතු රක්ෂණාවරණය ඉහළ නැංවීම සඳහා රෙගුලාසි නිකුත් කිරීමට අමතරව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමණාකරන කටයුතු දියුණු කිරීම උදෙසා ජාත්‍යන්තර මනා පරිචයන්ට අනුකූල වෙමින් එතෙක් බලාත්මකව පැවති රෙගුලාසි අවලංගු කර 2021 අංක 2 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය පිළිබඳ නව රෙගුලාසිය ප්‍රතිස්ථාපනය කරන ලදී. කොවිඩ්-19 වසංගතය මගින් ඇති කළ අවහිරතා මධ්‍යයේ වුවද, මහ බැංකුව විසින් අදාළ කාල පරිච්ඡේදය තුළ දී සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් සහ ෆිනෑන්ස් පී.එල්.සී., ද ස්ටැන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්, ටී. කේ. එස්.

8

ෆිනෑන්ස් ලිමිටඩ්, ද ෆිනෑන්ස් කම්පැණි පී.එල්.සී., ඊ.ටී.අයි. ෆිනෑන්ස් ලිමිටඩ් සහ ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පී.එල්.සී යන බලපත්‍ර අවලංගු කරන ලද/අත්හිටුවන ලද මුදල් සමාගම්හි තැන්පතුකරුවන්ට වන්දි මුදල් ගෙවීමේ කටයුතු බාධාවකින් තොරව ක්‍රියාත්මක කරන ලදී. මහ බැංකුව විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මගින් ඉහත සඳහන් මුදල් සමාගම් හයේ (06) තැන්පතුකරුවන් 70,832 දෙනෙකු සඳහා රුපියල් මිලියන 29,251.46ක මුදලක්, රක්ෂණ වන්දි වශයෙන් 2021 වසරේ දෙසැම්බර් 31 දින වන විට අභ්‍යන්තර ගෙවීම් පටිපාටියට යටත්ව ඍජුවම හා කොන්දේසි සහිත ගිවිසුමකට යටත්ව මහජන බැංකුව හරහා සිදු කරන ලදී. එක් සාමාජික ආයතනයකට, ද්‍රවශීලතා ආධාරක වශයෙන් ලබාදුන් ණයවල ශේෂය (මුල් ණය මුදලින්) 2021 වසරේ දෙසැම්බර් මස 31 දිනට රුපියල් බිලියන 1.4ක් විය.

මහ බැංකුව විසින් 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධානවලට අනුව තහනම් යෝජනා ක්‍රම පිළිබඳව ලද මහජන පැමිණිලි කිහිපයකට අදාළව පරීක්ෂණ පවත්වන ලදී. තවදුරටත්, තහනම් යෝජනා ක්‍රම හා සම්බන්ධ වීමේ අනිසි ප්‍රතිවිපාක සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම හා විවිධ මහජන කාණ්ඩවල මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීමේ අරමුණින් දිවයින පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. මහ බැංකුව දැනට පවතින නියාමන රාමුව තුළ බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා නිරාකරණ රාමුවක් සැකසීමේ ක්‍රියාවලියෙහි නිරතව සිටී.

විදේශ විනිමය නියාමනය සහ අධීක්ෂණය

කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් මුහුණ දුන් අභියෝග මධ්‍යයේ වුවද, මහ බැංකුව විසින් මෙම වසර තුළ දී විදේශ විනිමය ගනුදෙනු නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ විදේශ සංචිත සංරක්ෂණය කිරීම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ප්‍රතිපත්තිමය පියවර කිහිපයක් හඳුන්වාදෙන ලදී.

දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමේ අරමුණ පෙරදැරිව, බලයලත් වෙළෙඳුන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ප්‍රායෝගික ගැටලු විසඳීම සඳහා විදේශ විනිමය පනත යටතේ පෙර නිකුත් කරන ලද රෙගුලාසි, නියෝග සහ විධිවිධාන වෙනුවට සංශෝධිත රෙගුලාසි, නියෝග සහ විධිවිධාන මාලාවක් 2021 වසරේ මාර්තු 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිකුත් කරන ලදී. තවද දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා ගැටලු සැලකිල්ලට ගනිමින්, විදේශ විනිමය පනතෙහි 22 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද නියෝගයක් මගින් ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධ ඇතැම් බාහිර ප්‍රේෂණ සීමා කරන ලදී. වැඩි දියුණු වූ ආමුබ ප්‍රේෂණ මගින් රටට ඇති කරන ලද ධනාත්මක බලපෑම සලකා බලමින්, 2020 වසරේ දී හඳුන්වා දුන් විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම 2021 වසරේ අප්‍රේල් 08 දින සිට තවත් වසරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. එපමණක් නොව, නේවාසික සමාගම් කොටස්වල ආයෝජන සඳහා අනේවාසික ආයෝජකයන්ගෙන් ලැබෙන මුදල් විදේශ මුදලින් ලබා ගැනීමට සහ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය නොකර ජංගම ගනුදෙනු සඳහා යෙදවීමට පහසුකම් සලසමින් විධිවිධාන නිකුත් කරන ලදී. තවද, ආමුබ ප්‍රේෂණ ආකර්ෂණය කරගැනීම සඳහා, ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගම්වලට බාහිරව ණයට ගත් අරමුදල්වලින් ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ද්විතීයික වෙළඳපොළෙන් මිලදී ගැනීමට අවසර දෙන ලදී.

ශ්‍රී ලංකාවේ නේවාසිකයින් අත ඇති විදේශ මුදල් විධිමත් මාර්ගයක් හරහා ආකර්ෂණය කර ගැනීමේ ප්‍රයත්නයක් ලෙස, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන

8.22 සංඛ්‍යා සටහන

විදේශ ව්‍යාවහාර මුදල් ගිණුම්හි ගනුදෙනුවල සාරාංශය

එ.ජ. ඩොලර් මිලියන

ගිණුම් වර්ගය	ආමුබ ප්‍රේෂණ		ප්‍රතිමුබ ප්‍රේෂණ		දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය	
	2020	2021	2020	2021	2020	2021
පුද්ගලික විදේශ ව්‍යාවහාර මුදල් ගිණුම්	766.7	663.2	205.6	234.1	2,666.2	2,715.4
ව්‍යාපාරික විදේශ ව්‍යාවහාර මුදල් ගිණුම්	6,796.7	7,647.9	2,805.7	3,756.9	1,951.0	3,071.7
ආමුබ ආයෝජන ගිණුම්	1,382.9	854.7	1,901.1	1,221.9	1,861.1	1,969.2
විශේෂ තැන්පතු ගිණුම්	214.9[1]	207.1[1]	3.2[2]	83.0	290.0	585.2[3]
ප්‍රතිමුබ ආයෝජන ගිණුම්	138.2	11.2	8.4	6.9	ලැ.නො.	ලැ.නො.

ලැ.නො. - ලැබී නොමැත

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

[1] ආමුබ ආයෝජන ගිණුම්, අක්වෙරළ බැංකු ඒකකයේ ගිණුම් සහ විදේශ ව්‍යාවහාර මුදල් තැන්පතුවලින් මාරු කරන ලද අරමුදල් හැර

[2] විශේෂ තැන්පතු ගිණුම් යටතේ තැන්පතු කල් පිරීමෙන් පසු 2020.10.07 දින සිට බාහිර ප්‍රේෂණ සිදු කරන ලදී.

[3] ආමුබ ආයෝජන ගිණුම්, අක්වෙරළ බැංකු ඒකකයේ ගිණුම් සහ විදේශ ව්‍යාවහාර මුදල් තැන්පතුවලින් මාරු කරන ලද අරමුදල් ඇතුළත්ව.

8.23 සංඛ්‍යා සටහන

අපනයන ආදායම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම

එ.ජ. ඩොලර් මිලියන

	1 වන කාර්තුව*	2 වන කාර්තුව	3 වන කාර්තුව	4 වන කාර්තුව	එකතුව
2021 වසර තුළ ගෙන්වා ගත් මුළු අපනයන ආදායම්	477.32	1,072.04	1,458.12	3,169.36	6,176.84
2021 වසර තුළ රුපියල්වලට පරිවර්තනය කරන ලද මුළු අපනයන ආදායම්	111.08	215.02	367.49	878.19	1,571.78

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

*2021.02.28 දින සිට බලපැවැත්වෙන පරිදි මුදල් නීති පනත යටතේ නීති නිකුත් කරන ලද අතර ඒ අනුව 2021 මාර්තු සිට දත්ත පවතියි.

අධිකාරියේ ලියාපදිංචි හෝටල්වලට නේවාසිකයින්ගෙන් ඔවුන් සන්තකයේ ඇති විදේශ මුදල් ලබා ගැනීමට අවසර දෙමින් මුදල් අමාත්‍යවරයා විසින් විදේශ විනිමය පනතේ 4 වැනි වගන්තිය යටතේ නියෝග යක් නිකුත් කරන ලදී. මීට අමතරව, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාවය වැඩි දියුණු කිරීම සඳහා, අපනයනකරුවන් වෙත අපනයන ඉපැයීම් දින 180ක් ඇතුළත මෙරටට ගෙන ඒමට සහ එම ඉපැයීම් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමට නියම කරමින් 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ රීති නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමට අවශ්‍ය අපනයන ආදායම් ප්‍රතිශතය වෙනස් කරමින් මෙම රීති වරින් වර අවශ්‍ය පරිදි සංශෝධනය කරන ලදී. ඒ අනුව, මෙම නියෝගය මඟින් රුපියල්වලට පරිවර්තනය කළ යුතු වූ, අපනයනකරුවන් විසින් ශ්‍රී ලංකාව තුළට රැගෙන එන අපනයන ඉපයීම් දේශීය විදේශ විනිමය වෙළඳපොළට තරමක් දුරට සහය ලබා දෙමින් වසර පුරා ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

8.24 සංඛ්‍යා සටහන

2020 වසරේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හරහා සිදු කළ ප්‍රේෂණයන් (CTRAs) සහ ශ්‍රී ලංකා රුපියල්වලට විදේශ විනිමය විකුණුම් සහ ශ්‍රී ලංකා රුපියල් මගින් සිදු කළ විදේශ විනිමය මිලට ගැණුම්

	2020	2021
සංක්‍රමණික මාරු කිරීම්		
සංක්‍රමණික දීමනාව ප්‍රේෂණය කිරීම සඳහා මහ බැංකුවේ ලියාපදිංචි කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් ගණන	742	787
ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හරහා කරන ලද ප්‍රතිමුඛ ප්‍රේෂණ (එ.ජ. ඩොලර් මිලියන)	12.7	4.5
විදේශ විනිමය විකුණුම් සහ මිලට ගැණුම් (එ.ජ. ඩොලර් මිලියන)		
විදේශ විනිමය විකුණුම් (ආකෘතිය 1)	11,484.3	12,019.6[1]
විදේශ විනිමය මිලට ගැණුම් (ආකෘතිය 2)	20,246.3	12,153.5[1]

[1] තාවකාලික

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

8.25 සංඛ්‍යා සටහන

පරිසීමිත වෙළඳුන්ගේ කාර්යසාධනය

	2020	2021	වෙනස %
බැංකු පද්ධතිය තුළට කරන ලද තැන්පත් කිරීම් (එ.ජ. ඩොලර් මිලියන)	132.71	22.78	-82.8
ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් හට කරන ලද විකිණීමේ ප්‍රමාණය (එ.ජ. ඩොලර් මිලියන)	3.64	3.72	2.2

මූලයඃ ශ්‍රී ලංකා මහ බැංකුව

රීතීන් හා රෙගුලාසි සමඟ අනුකූලතාව සහතික කිරීමේ අරමුණින් මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරවල නිරත වීම සඳහා අවසරලත් පරිසීමිත වෙළෙඳුන්ගේ ක්‍රියාකාරකම් අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. ගෝලීය වසංගත තත්ත්වය හමුවේ ආර්ථික කටයුතු අඩපණවීම මත පසුගිය වසර තුළ පරිසීමිත වෙළෙඳුන්ගේ සමස්ත කාර්යසාධනය පසුබෑමට ලක් විය. මෙයට අමතරව, මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද රීතීන් සමඟ අපනයනකරුවන්ගේ හා බලයලත් වෙළෙඳුන්ගේ අනුකූලතාවය සහතික කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් මගින් මාසික පදනම මත රැස් කරගන්නා ලද අපනයන ඉපයීම් පිළිබඳ දත්ත අඛණ්ඩව අධීක්ෂණයට ලක් කරන ලදී. තවද, විදේශ විනිමය මෙහෙයුම් පිළිබඳ සාර්ව ආර්ථික තීරණ ගැනීම සඳහා සහය වන අතරම, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ගලා ඒම්/ගලා යාම් ඇතුලුව, විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි සහ උපදෙස් අනුව බලයලත් වෙළෙඳුන් මගින් පුළුල් ලෙස දත්ත රැස් කිරීම සඳහා දේශ සීමා අතර සිදුවන විදේශ මුදල් ගනුදෙනු අධීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට 2021 වසර තුළ ක්‍රියා කරන ලදී.

ණය තොරතුරු

කොවිඩ්-19 වසංගතය මගින් ඇති කරන ලද අභියෝගාත්මක පරිසරය මධ්‍යයේ වුවද, ණය තොරතුරු කාර්යාංශය ණය දෙන සාමාජික ආයතන වෙත 2021 වසරේ දී මිලියන 8.37ක ණය වාර්තා ලබා දීමෙන් සිය කාර්යභාරය පවත්වාගෙන යන ලදී. කෙසේ වෙතත්, නිකුත් කරන ලද වාර්තා පෙර වසරට සාපේක්ෂව සියයට 3.2කින් සුළු වශයෙන් පහත වැටුණි. පෞද්ගලික ණය වාර්තා (iReport) සඳහා ඇති ඉල්ලුම 2020 වසරට සාපේක්ෂව 2021 වසරේ දී සියයට 0.6ක අඩුවීමක් වාර්තා කරන ලදී. 2021 වසර තුළ පාරිභෝගිකයින් 8,114ක් ඔවුන්ගේ පෞද්ගලික ණය වාර්තා ලබා ගැනීම සඳහා කාර්යාංශයට පැමිණ ඇති අතර ගනුදෙනුකරුවන් 1,438ක් බැංකු හරහා ඔවුන්ගේ පෞද්ගලික ණය වාර්තා අයදුම් කර ඇත. ණය තොරතුරු කාර්යාංශය

8

විසින් 2021 වසරේ දී පෞද්ගලික ණය වාර්තා 2,988ක් මාර්ගගතව නිකුත් කරන ලදී. එසේම, 2021 වසරේ ණය තොරතුරු කාර්යාංශ ලකුණු (ණය ලකුණු) වාර්තා සඳහා ඉල්ලුම සියයට 183කින් ඉහළ ගොස් ඇත.

ණය සහන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය ආයතනවලට සහාය වීමට ණය තොරතුරු කාර්යාංශය ද දායක විය. ණය සහන කාලය තුළ දී ණය සහන ලබා ගත් ණය ගැතියන්ගේ ණය දත්ත, ඔවුන්ගේ ණය වාර්තා සහ ණය ලකුණු කෙරෙහි අහිතකර බලපෑමක් ඇති නොවන අයුරින් වාර්තා කර ඇති බවට සහතික වීම සඳහා ණය තොරතුරු කාර්යාංශය විසින් මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් නිකුත් කරන ලද නියෝගයන්ට අනුකූල වෙමින් ණය හිමියන් වෙත වාර්තාකරණ මාර්ගෝපදේශ නිකුත් කරන ලදී.

මීට අමතරව, ණය තොරතුරු කාර්යාංශය නව සාමාන්‍ය තත්ත්වය තුළ වඩාත් කාර්යක්ෂමව ක්‍රියා කිරීම සඳහා එහි පද්ධතිය සහ ක්‍රියාවලීන් සන්නද්ධ කිරීම සඳහා සිය ඩිජිටල් වර්ධන සැලසුම් වේගවත් කරන ලදී. ඒ අනුව, ණය තොරතුරු කාර්යාංශය එහි සේවා ප්‍රමිතීන් සහ හැරවුම් කාලයන් වැඩි දියුණු කරන අතරම ණය තොරතුරු කාර්යාංශයෙහි පරිශීලකයින්ගේ සහ පාර්ශ්වකරුවන්ගේ විකාශනය වන අවශ්‍යතා සපුරාලීම සඳහා එහි වත්මන් පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමට පියවර ගන්නා ලදී. ධාරකයේ සිට ධාරකයට යෙදුම් ක්‍රමලේඛන අතුරුමුහුණත (Host to Host Application Programming Interface), පෞද්ගලික ණය වාර්තා නිකුත් කිරීම ස්වයංක්‍රීයකරණය සහ එය සාමාජික ආයතනවල ජංගම බැංකු යෙදුම් සමඟ ඒකාබද්ධ කිරීම, ණය තොරතුරු කාර්යාංශ පරිශීලකයින්ට වේගය සහ ප්‍රවේශ වීමේ පහසුව ලබා දීම සඳහා ක්‍රියාත්මක වූ වැදගත් අංගයන් විය.

ශ්‍රී ලංකාව සඳහා තිරසාර මූල්‍ය පෙර දැක්ම දියත් කිරීම

ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය පරිචයන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් මහ බැංකුව 2016 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවට (IFC) අනුබද්ධිත තිරසාර බැංකුකරණ ජාලය (SBN) හා සම්බන්ධ විය. ඉන් අනතුරුව, ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවෙහි තාක්ෂණික සහාය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) මූල්‍ය ආධාර ඇතිව, මහ බැංකුව විසින් 2019 වසරේ අප්‍රේල් මාසයේ දී 'ශ්‍රී ලංකාව සඳහා තිරසාර මූල්‍ය පෙර දැක්ම' (Roadmap for Sustainable Finance in Sri Lanka) දියත් කරන ලදී. මෙම පෙර දැක්ම මගින් මූල්‍ය නියාමකයින්ට, මූල්‍ය ආයතනවලට සහ වෙළඳපොළවලට ඔවුන් මූල්‍ය දායකත්වය සපයන ව්‍යාපෘති හා සම්බන්ධ පාරිසරික, සමාජීය සහ යහපාලන අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සහ හරිත, දේශගුණ හිතකාමී සහ සමාජීයව යහපත් ව්‍යාපාර සඳහා සහාය ප්‍රවර්ධනය කිරීමට පුළුල් මග පෙන්වීමක් සපයයි.

මෙම පෙරදැක්මෙහි ඇතුළත් ඉලක්ක ක්‍රියාත්මක කිරීම උදෙසා, මහ බැංකුව විසින් 2021 වසරේ දී හරිත මූල්‍ය කටයුතු වර්ගීකරණයක් සැකසීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර එය තිරසාර මූල්‍ය කටයුතු සඳහා මූල්‍ය අංශයට පහසුකම් සැලසීමේ දී සපුරාලිය යුතු ප්‍රධාන අවශ්‍යතාවයකි. එකී වර්ගීකරණය තුළින් හරිත ක්‍රියාකාරකම් කාණ්ඩ කිරීම සහ ඒ සඳහා වන මිනුම් පද්ධතියක් ස්ථාපිත කිරීම සිදු කරන අතර යම් ව්‍යාපෘතියක් හරිත/තිරසාර දැයි තීරණය කිරීම සඳහා මූල්‍ය ආයතනවලට පොදු එකඟතාවයක් ලබා දෙනු ඇත. මහ බැංකුව හරිත මූල්‍යන වර්ගීකරණය සංවර්ධනය කිරීමේ දී ඊට තාක්ෂණික සහ මූල්‍ය ආධාර සපයන ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව සමඟ සමීපව කටයුතු කරන අතර 2022 වසරේ මුල් භාගයේ දී එය දියත් කිරීමට අපේක්ෂා කරයි.

8

විශේෂ සටහන 12
ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග[1]

මුදල් ප්‍රතිපත්තිය[2]

2021 අගෝස්තු 19 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 5.00 සහ සියයට 6.00 දක්වා පදනම් අංක 50කින් ඉහළ නංවන ලදී. බැංකු අනුපාතිකය සියයට 8.50 සිට සියයට 9.00 දක්වා ස්වංයක්‍රීයව වැඩි විය.

- 2021 සැප්තැම්බර් 01 දිනෙන් ආරම්භ වන සංචිත පවත්වා ගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට ක්‍රියාත්මක වන පරිදි, සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් පවත්වාගෙන යනු ලබන මුළු තැන්පතු වගකීම්වලින් සියයට හතරක ප්‍රමාණයක් සංචිතයක් ලෙස පවත්වාගෙන යා යුතු බවට මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2022 ජනවාරි 20 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50කින් පිළිවෙලින් සියයට 5.50ක් සහ සියයට 6.50ක් දක්වා ඉහළ නංවන ලදී. බැංකු අනුපාතිකය සියයට 9.00 සිට සියයට 9.50 දක්වා ස්වයංක්‍රීයව ඉහළ ගියේය.

2022 මාර්තු 04 - නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 100කින් පිළිවෙලින් සියයට 6.50කින් සහ සියයට 7.50කින් ඉහළ නැංවිණි. බැංකු අනුපාතිකය සියයට 9.50 සිට සියයට 10.50 දක්වා ස්වයංක්‍රීයව ඉහළ ගියේය.

2022 මාර්තු 07 - විනිමය අනුපාතිකය වෙනස් වීමකට ඉඩ සලසන ලදී.

විශේෂ ණය යෝජනා ක්‍රම

2021 මාර්තු 24 - ණය සහන කාලය 2021 සැප්තැම්බර් මස 30 දක්වා දීර්ඝ කිරීමේ සහ සංචාරක කර්මාන්තයේ නියැලි ව්‍යාපාරිකයින්ට ලබා දෙන ලද ණය සඳහා ණය ආපසු ගෙවීමේ කාලය මාස 36ක් දක්වා දීර්ඝ කිරීමේ අරමුණින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකමෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී.

2021 අප්‍රේල් 05 - නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා එම ණය යෝජනා ක්‍රමයට අදාළ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කර නැවත නිකුත් කරන ලදී.

2021 අප්‍රේල් 20 - සුදුසුකම්ලත් භෝගයක් ලෙස කහ භෝගය ඇතුළත් කිරීම සඳහා නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයට අදාළ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී.

2021 මැයි 04 - කෘෂිකාර්මික වටිනාකම් අගයදාමයන් ඇති කරලීම තුළින් කුඩා වතු හිමියන්ගේ ආධිපත්‍ය දරන ගෘහස්ථ කෘෂිකර්මාන්තයට උපකාර කිරීමේ අරමුණ ඇතිව නව ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමයක් ලෙස දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතියට අදාළව (DAD-PP) සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2021 ජූනි 09 - සියලු අංශ වෙත ලබා දුන් කාරක ප්‍රාග්ධන ණය සඳහා වන ණය සහන කාලය 2021 සැප්තැම්බර් මස 30 දක්වා දීර්ඝ කිරීමට සහ ණය ආපසු ගෙවීමේ කාලය මාස 36ක් දක්වා සංශෝධනය කිරීම සඳහා සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකමට අදාළ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී.

2021 සැප්තැම්බර් 01 - ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන්ට සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ලබා දෙනු ලබන ණය සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2021 සැප්තැම්බර් 10 - සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමයේ අදියර I, II සහ III හි ණය සහන කාලය 2021 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කරන ලදී.

- සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ 2021 සැප්තැම්බර් 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා ණය සහන කාලයක් ලබා දීම.

2021 සැප්තැම්බර් 21 - කුඩා තේ වතු සහ රබර් වතු හිමියන්ගේ පුනර්ජීවන ව්‍යාපෘතිය (STaRR) සහ කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) යටතේ ණය ගැනුම්කරුවන් සඳහා 2021 සැප්තැම්බර් 01 දින සිට 2021 දෙසැම්බර් 31 දක්වා ණය සහන කාලයක් ලබා දීම.

1 2021 ජනවාරි 01 දින සිට 2022 මාර්තු 15 දින දක්වා ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

2 2022 අප්‍රේල් 08 දින මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් දැඩි කළ අතර, මේ පිළිබඳ විස්තර මෙම වාර්තාවේ 7 වන පරිච්ඡේදයෙහි අඩංගු වේ.

2021 සැප්තැම්බර් 23	-	සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමයේ අදියර I, II, III සහ සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ සංචාරක ක්ෂේත්‍රය සඳහා ලබා දුන් ණය සඳහා 2022 ජූනි 30 දක්වා ණය සහන කාලයක් ලබා දීම.
2021 සැප්තැම්බර් 27	-	සැපයුම්දාමය නැවත පණ ගැන්වීම සඳහා වන ණය යෝජනා ක්‍රමය යටතේ 2021 සැප්තැම්බර් 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා ණය සහන කාලයක් ලබා දීම.
2021 ඔක්තෝබර් 26	-	රජය සතු ව්‍යවසායයන් නැවත බලගැන්වීම සඳහා කාරක ප්‍රාග්ධන ණය පහසුකම් ලබා දීමට සහනදායී කොන්දේසි යටතේ ප්‍රතිමූල්‍යකරණ යෝජනා ක්‍රමයක් ලෙස සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම - අදියර IV හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.
2021 ඔක්තෝබර් 29	-	'ස්වශක්ති - රැකියා දස ලක්ෂයක් කරා' ණය යෝජනා ක්‍රමය යටතේ 2021 සැපැතැම්බර් 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා ණය සහන කාලයක් ලබා දීම.
2021 නොවැම්බර් 02	-	සැපයුම්දාම නැවත පණ ගැන්වීම සඳහා වන ණය යෝජනා ක්‍රමය, කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන, කුඩා තේ වතු සහ රබර් වතු හිමියන්ගේ පුනර්ජීවන ව්‍යාපෘතිය, සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය හා සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමය I, II, III යටතේ වන ණය සහන සඳහා ඉල්ලීම් භාර ගැනීමේ කාලය 2021 නොවැම්බර් 15 දක්වා දීර්ඝ කරන ලදී.
2021 දෙසැම්බර් 21	-	ශ්‍රී ලංකාවේ ඉස්සන් ගොවිපළවල් වැඩිදියුණු කිරීම සඳහා සහනදායී කොන්දේසි යටතේ පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී.

මූල්‍ය අංශය

බලපත්‍රලාභී බැංකු

2021 ජනවාරි 13	-	වසංගත තත්ත්වය හමුවේ, කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට සහන සැලසීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගවලට සමගාමීව, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට එරෙහිව ගනු ලබන ණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ග මාස හයක කාලයකට අත්හිටුවන ලෙස දැනුම් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
2021 ජනවාරි 19	-	බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම්වලට පනවා තිබූ සීමා කිරීම් ලිහිල් කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. ඒ අනුව, 2020 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල විගණන කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව, මුදල් ලාභාංශ ගෙවීම සහ ලාභ මෙරටින් බැහැර කිරීම සඳහා අවසර ලබා දෙන ලදී. තව ද, 2021 වසරේ ජූනි 30 දක්වා සිය කොටස් ආපසු මිලට ගැනීමෙන් සහ අත්‍යවශ්‍ය නොවන වියදම් ඉහළ දැමීමෙන් වැළකී සිටින ලෙස බලපත්‍රලාභී බැංකුවලට දැනුම් දුන් අතර, ප්‍රාග්ධන වියදම් සිදු කිරීමේ දී ඉතා විචක්ෂණශීලීව සහ නිසි සැලකිල්ලෙන් යුතුව කටයුතු කරන ලෙසට දැනුම් දෙන ලදී.
2021 ජනවාරි 25	-	බලපත්‍රලාභී බැංකු විසින් 2021 වසර සඳහා අපේක්ෂිත අලාභ ගණනය කිරීමේ දී, රජය විසින් නිකුත් කරන ලද, විදේශ මුදලින් නාමනය කරන ලද මූල්‍ය උපකරණ සඳහා ඇති නිරාවරණයන්ගේ ණය පැහැර හැරීමක දී විය හැකි ඇස්තමේන්තුගත අලාභ සියයට 10ක් දක්වා පහත දමමින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 9: මූල්‍ය උපකරණ යොදා ගන්නා ආකාරය සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංශෝධනය කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
	-	2021 වසර සඳහා රජය වෙතින් අය වීමට ඇති, විදේශීය මුදලින් ගෙවීම් සඳහා වන බර තැබීම් සියයට 20 සිට සියයට 10 දක්වා සහ උකස්කර මත ලබා දී ඇති නිවාස ණය සඳහා අදාළ බර තැබීම සියයට 50 සිට සියයට 35 දක්වා අඩු කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.
	-	විදේශ විනිමය වෙළඳපොළ තුළ පවතින අධි විචලතාව සහ එමගින් බලපත්‍රලාභී බැංකුවල අවදානම් කළමනාකරණය මත ඇති විය හැකි බලපෑම සැලකිල්ලට ගනිමින්, වහාම ක්‍රියාත්මක වන පරිදි මාස තුනක කාලයක් සඳහා විදේශ මුදල් ඉදිරි ගිවිසුම් සඳහා එළඹීමෙන් වළකින ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.
2021 මාර්තු 10	-	කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ, මගී ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යාපාර සහ පුද්ගලයන් විසින් ලබා ගත් කල්බදු (ලීසිං) පහසුකම් සඳහා 2021 වසරේ අප්‍රේල් 01 දින සිට මාස හයක ණය සහන කාලයක් ලබා දෙන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
2021 මාර්තු 18	-	බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය විශාල වශයෙන් පිටතට ගලා යාමට ඇති හැකියාව සහ එමගින් බලපත්‍රලාභී බැංකුවල අවදානම් කළමනාකරණය මත ඇති විය හැකි බලපෑම සහ විනිමය අනුපාත මත ඇති විය හැකි පීඩනය පිළිබඳව සැලකිල්ලට ගෙන, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සිදු කරන ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගැනීම 2021 වසරේ මාර්තු 23 දින සිට 2021 වසරේ අප්‍රේල් 09 දක්වා අත්හිටුවමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

2021 මාර්තු 19	- කොවිඩ්-19 නිසා බලපෑමට පත් සංචාරක ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් වෙත පිරිනමන ලද ණය සහන කාල සීමාව, 2021 වසරේ අප්‍රේල් 01 දින සිට තවත් මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
2021 අප්‍රේල් 01	- 2021 වසරේ අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ ගෙවනු ලබන උපරිම වන්දි මුදල රුපියල් 600,000 සිට රුපියල් 1,100,000 දක්වා ඉහළ නැංවීම සඳහා 2021 අංක 01 දරන රෙගුලාසිය නිකුත් කරන ලදී. 2021 වසරේ අප්‍රේල් 01 දිනට පෙර බලපත්‍ර අවලංගු/අත්හිටු වූ මුදල් සමාගම් සඳහා මෙම ඉහළ නැංවීම ක්‍රියාත්මක කරන ලදී.
2021 අප්‍රේල් 09	- බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය ප්‍රවාහ පිටතට ගලා යාමට ඇති හැකියාව, එමගින් බලපත්‍රලාභී බැංකුවල අවදානම් කළමනාකරණය මත ඇති විය හැකි බලපෑම සහ විනිමය අනුපාතික මත ඇති විය හැකි පීඩනය අවම කිරීමේ අරමුණින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගැනීම 2021 වසරේ අප්‍රේල් 23 දින දක්වා අත්හිටුවමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.
2021 අප්‍රේල් 21	- ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් ලෙස සලකමින්, එම ක්ෂේත්‍රයන්හි නියුතු පුද්ගලයන් හා ව්‍යාපාර වෙත බලපත්‍රලාභී බැංකු විසින් ලබා දෙන ණය සහ අත්තිකාරම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමේ ඉලක්ක හඳුන්වා දෙමින් මූල්‍ය නීති පනත් නියෝග නිකුත් කරන ලදී. මේ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් ඔවුන්ගේ පසුගිය වසර අවසානය වන විට පැවති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට ලබා දී තිබූ මුළු ණය ප්‍රමාණයට සාපේක්ෂව ලක්ෂ්‍යමය පදනම මත වාර්ෂිකව සියයට 20ක ප්‍රතිශතයකට නොඅඩු ප්‍රමාණයකින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට ලබා දෙන ණය පහසුකම් ඉහළ දැමීමට කටයුතු කළ යුතුය.
2021 අප්‍රේල් 23	- බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය පිටතට ගලා යාමට ඇති හැකියාව, එමගින් බලපත්‍රලාභී බැංකුවල අවදානම් කළමණාකරණය මත ඇති විය හැකි බලපෑම සහ විනිමය අනුපාතික මත ඇති විය හැකි පීඩනය අවම කිරීමේ අරමුණින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගැනීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.
2021 අප්‍රේල් 25	- විදේශ විනිමය වෙළඳපොළ තුළ පවතින අධි විචලතාව සහ එමගින් බලපත්‍රලාභී බැංකුවල අවදානම් කළමනාකරණය මත ඇති විය හැකි බලපෑම සැලකිල්ලට ගනිමින්, කොන්දේසිවලට යටත්ව, නැවත දැනුම් දෙන තුරු ස්ථානීය දිනයෙන් ඔබ්බට වලංගු දින සහිත විදේශ මුදල් ඉදිරි ගිවිසුම් සඳහා එළඹීමෙන් වළකින ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත දැනුම් දෙමින් බැංකු පනත් විධානයක් නිකුත් කරන ලදී.
2021 මැයි 25	- මූර්ත ආර්ථිකය තුළ ප්‍රාග්ධනය ගොඩනැගීම සහ රටේ විදේශ මුදල් අවශ්‍යතා සපුරාලීම උත්තේජනය කිරීම සඳහා, මුළු විදේශ මුදල් ණය සීමාව සියයට 10 දක්වා පවත්වා ගෙන යාමේ කොන්දේසියට යටත්ව, බලපත්‍රලාභී බැංකු මගින් කෙටි කාලීන ණය ගැනීමේ සීමා වසරක කාලයක් සඳහා අහෝසි කරමින් බලපත්‍රලාභී බැංකුවල විදේශ මුදල් ණය සීමා පිළිබඳ බැංකු පනත් විධාන සංශෝධනය කරන ලදී.
	- කොවිඩ්-19 වසංගතයේ තෙවන රැල්ල නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ලබා දිය යුතු ණය සහන හා පවත්නා සහන දීර්ඝ කිරීම් දැනුම් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. කොවිඩ්-19 ව්‍යසනය නිසා බලපෑමට පත් ණය ගනුදෙනුකරුවන් මත ඇති පීඩනය අවම කරමින් මෙම යෝජනා ක්‍රමය සියලු බලපත්‍රලාභී බැංකු ඔස්සේ ඒකාකාරීව ක්‍රියාත්මක කරවීම මෙම චක්‍රලේඛයේ අරමුණයි.
2021 ජූනි 07	- කොවිඩ්-19 ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා පනවා ඇති සංචරණ සීමා මධ්‍යයේ අත්‍යවශ්‍ය බැංකු සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමේ දී, අදාළ සෞඛ්‍යාරක්ෂක ක්‍රියාමාර්ග සහ මාර්ගෝපදේශ දැඩි ලෙස අනුගමනය කරමින් බැංකු සේවා පවත්වාගෙන යන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කෙරිණ.
2021 ජූනි 16	- ආයතනික විශේෂිත ආතතීන්, වෙළඳපොළ පදනම් ආතතීන් හෝ ඒ දෙකේම සංකලනයක් හේතුවෙන් බැංකුවල ප්‍රාග්ධනයට, ද්‍රවශීලතාවයට සහ අනෙකුත් සියලුම අංශ මත ඇති විය හැකි කම්පනවලට සාර්ථකව මුහුණ දීම සඳහා ප්‍රතිසාධන සැලැසුම් (Recovery Plans) සකස් කර පවත්වා ගෙන යන ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙමින් බැංකු පනත් විධානයක් නිකුත් කෙරිණි.
	- විදේශයන්ගෙන් ලබා ගත් නව විදේශ විනිමය ණය ගැනීම් භාවිතා කරමින්, ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින්, එක් එක් වර්ගය සඳහා සියයට 50 බැගින් වූ සමාන අනුපාතයන්ගෙන් ආයෝජනය කිරීමේ කොන්දේසියට යටත්ව, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවට ද්විතීයික වෙළෙඳපොළ තුළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීමට අවසර ලබා දෙමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

2021 ජූනි 18	- බැංකු (අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු පටිපාටිය) නියෝග යටතේ නම් කරන ලද විදේශ මුදල් විශේෂයන් අතරට තායි බාත් මුදල් වර්ගය ඇතුළත් කිරීම දැනුම් දෙමින් බැංකු පනත් නියෝගයක් නිකුත් කරන ලදී. මෙමගින් 2011 අංක 01 දරන බැංකු (අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු පටිපාටිය) නියෝගයේ උපලේඛනය යාවත්කාලීන විය.
2021 ජූලි 13	- බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම සීමා කරමින් බැංකු පනත් නියෝග නිකුත් කෙරිණි. ඒ අනුව, 2021 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන/අතුරු මූල්‍ය ප්‍රකාශන විගණනය කර අවසන් වන තුරු මුදල් ලාභාංශ ගෙවීම සහ ලාභ මෙරටින් බැහැරට යැවීමෙන් වැළකී සිටින ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී. තවද, 2021 දෙසැම්බර් 31 දක්වා තම කොටස් ආපසු මිලට ගැනීමෙන් සහ අත්‍යවශ්‍ය නොවන වියදම් ඉහළ දැමීමෙන් වැළකී සිටින ලෙස සහ ප්‍රාග්ධන වියදම් සිදු කිරීමේ දී ඉතා විචක්ෂණශීලීව සහ නිසි සැලකිල්ලෙන් යුතුව කටයුතු කරන ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී.
2021 අගෝස්තු 06	- ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ නිකුත් කර ඇති 2010 අංක 01 දරන රෙගුලාසිය අවලංගු කර 2021 අංක 02 දරන නව රෙගුලාසිය නිකුත් කරන ලදී.
2021 අගෝස්තු 21	- නිරෝධායන ඇඳිරි නීතිය යටතේ 2021 වසරේ අගෝස්තු 20 සිට 2021 වසරේ අගෝස්තු 30 දක්වා බලපැවැත්වෙන පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද නිවේදනය අනුව නිකුත් කර ඇති සියලුම ආරක්ෂක පියවර හා මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපදිමින් අත්‍යවශ්‍ය බැංකු සේවා අඛණ්ඩව සිදු කරන ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
2021 අගෝස්තු 24	- බලපත්‍රලාභී බැංකු විසින් රුපියල් සහ විදේශ මුදල් තැන්පතු සඳහා පිරිනැමෙන සහ ගෙවන පොලී අනුපාතවල ඇති විෂමතා සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සියලුම විදේශ මුදල් තැන්පතු සඳහා ගෙවනු ලබන උපරිම වාර්ෂික සඵල පොලී අනුපාතය සියයට 5ට සීමා කරමින් මුදල් නීති පනත් නියෝගයක් නිකුත් කරන ලදී. විදේශ මුදල් විශේෂ තැන්පතු ගිණුම් සඳහා පිරිනැමිය හැකි හෝ ගෙවිය හැකි අතිරේක පොලී අනුපාතය, ඉහත දක්වා ඇති පොලී අනුපාතයට වඩා ඉහළ පොලී අනුපාතයක් විය යුතුය.
2021 සැප්තැම්බර් 01	- කොවිඩ්-19 වසංගත තත්ත්වය යළි ඉහළ යාම සහ එමගින් ව්‍යාපාර හා පුද්ගලයින්ට ඇති වන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, පීඩාවට පත් ණය ගනුදෙනුකරුවන් සඳහා (2021 වසරේ අගෝස්තු 31 දක්වා) මීට පෙර දී තිබූ සහන 2021 වසරේ දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. මෙමගින් සක්‍රීය සහ අක්‍රීය යන කාණ්ඩ දෙකෙහිම සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ට ඒ ඒ අවස්ථානුකූලව ණය සහන ලබා ගත හැකිය.
2021 සැප්තැම්බර් 08	- විනිමය අනුපාතිකයේ ස්ථායීතාව සහ දේශීය විදේශ මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය පවත්වා ගැනීම සඳහා දැනට පනවා ඇති ක්‍රියාමාර්ගවලට සහය දැක්වීමක් ලෙස, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව හරහා ණයවර ලිපි යටතේ සහ ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබා දීමේ කොන්දේසි යටතේ, තෝරාගත් හදිසි නොවන ස්වභාවයේ, භාණ්ඩ ආනයනය කිරීමේ දී, වහාම ක්‍රියාත්මක වන පරිදි සියයට 100ක මුදල් ආන්තික තැන්පතු අවශ්‍යතාවක් පනවන ලදී. - බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් හදිසි නොවන භාණ්ඩ ආනයනය සඳහා වන ණයවර ලිපි මත සියයට 100ක පොලී හිමිකම් රහිත මුදල් ආන්තික තැන්පතු පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාව පිළිබඳ නියෝගය නිකුත් කරන ලදී. - බලපත්‍රලාභී බැංකුවල බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතාවන් සඳහා වන 2016 අංක 01 දරන බැංකු පනත් විධානයේ අවශ්‍යතාවයන් සඳහා සහ බලපත්‍රලාභී බැංකු සඳහා වන අනෙකුත් අදාළ නියාමනයන්ගේ අවශ්‍යතා සඳහා පිළිගත හැකි බාහිර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස "ලංකා රේටින් ඒජන්සි ලිමිටඩ්" නම් කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
2021 සැප්තැම්බර් 13	- කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ සංචාරක ක්ෂේත්‍රයේ පුද්ගලයින් වෙත ලබා දී ඇති ණය සහන කාලය 2021 වසරේ ඔක්තෝබර් 01 දින සිට ඉදිරියට මාස 9ක් දක්වා දීර්ඝ කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
2021 සැප්තැම්බර් 14	- බැංකු ක්ෂේත්‍රය තුළ ඒකාකාරී හා විචක්ෂණශීලී පරිචයන් ස්ථාපිත කිරීම උදෙසා හා බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් සහ ණය හැර අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනා ගැනීම හා මැනීම සඳහා පවත්නා නියාමන ආකෘතිය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 9: මූල්‍ය උපකරණ සමඟ අනුයාත කිරීමේ අරමුණින් බලපත්‍රලාභී බැංකු වෙත බැංකු පනත් විධාන දෙකක් නිකුත් කරන ලදී.
2021 සැප්තැම්බර් 30	- බැංකු ක්ෂේත්‍රය තුළ ඒකාකාරී හා විචක්ෂණශීලී පරිචයන් ස්ථාපිත කිරීම උදෙසා බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් සහ ණය පහසුකම් හැර අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනා ගැනීම සහ මැනීම පිළිබඳ 2021 අංක 13 සහ 2021 අංක 14 දරන බැංකු පනත් විධානවලට පරිපූරක චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2021 ඔක්තෝබර් 01	- බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් හදිසි නොවන ස්වභාවයේ භාණ්ඩ ආනයනයේ දී ණයවර ලිපි මත සියයට 100ක පොලී හිමිකම රහිත මුදල් ආන්තික තැන්පතු පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාව පිළිබඳ නියෝගය අහෝසි කරන ලදී.
	- ආනයන සඳහා ඇති ආන්තික තැන්පතු අවශ්‍යතා සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2021 අංක 12 දරන බැංකු පනත් විධාන අවලංගු කරමින් බැංකු පනත් විධානයක් නිකුත් කරන ලදී.
2021 ඔක්තෝබර් 05	- සංචාරක ක්ෂේත්‍රය ද ඇතුළත්ව මගී ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යාපාර සහ පුද්ගලයන් විසින් ලබා ගත් කල්බදු පහසුකම් සඳහා ලබා දී තිබූ ණය සහන දීර්ඝ කරමින්, කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ පෞද්ගලික සහ පොදු මගී ප්‍රවාහන සේවා සපයන ව්‍යාපාර හා පුද්ගලයන් විසින් ලබා ගත් කල්බදු (ලීසිං) පහසුකම්වලට අදාළව ලැබෙන ඉල්ලීම් 2021 අංක 08 චක්‍රලේඛය යටතේ හා සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවාහන සේවා සපයන්නන්ගෙන් ලැබෙන ඉල්ලීම් 2021 අංක 10 දරන චක්‍රලේඛය යටතේ සලකා බලන ලෙස දන්වමින් බලපත්‍රලාභි බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
2021 දෙසැම්බර් 09	- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ යහභාවිතයන්ට අනුකූලව බලපත්‍රලාභී බැංකුවල තොරතුරු තාක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම කඩිනම් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා වන නියාමන රාමුව මැයෙන් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.
2021 දෙසැම්බර් 22	- කොවිඩ්-19 හේතුවෙන් ව්‍යාපාර සහ පුද්ගලයන් මුහුණ දී ඇති අභියෝග සැලකිල්ලට ගනිමින් "පරාටේ" නීතිය ක්‍රියාත්මක කිරීම සහ කල්බදු වත්කම් බලෙන් නැවත පවරා ගැනීම ඇතුළු සියලු ආකාරයේ ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග 2022 මාර්තු 31 දක්වා අත්හිටුවන ලෙස ඉල්ලා සිටිමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ සංචාරක ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාර සහ පුද්ගලයින් සම්බන්ධයෙන් සියලු ආකාරයේ දේපළ අත්පත් කරගැනීමේ ක්‍රියාමාර්ග අත්හිටුවීම 2022 ජූනි 30 දක්වා නොවෙනස්ව ක්‍රියාත්මක වේ.
2021 දෙසැම්බර් 27	- රුපියල් ට්‍රිලියන 2ට වැඩි වත්කම් සහිත බලපත්‍රලාභී බැංකු සඳහා නව බලපත්‍ර ගාස්තු කාණ්ඩයක් හඳුන්වා දෙමින්, 2022 වසර සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ගෙවිය යුතු වාර්ෂික බලපත්‍ර ගාස්තු පිළිබඳ බැංකු පනත් නිර්ණයක් නිකුත් කරන ලදී.
2021 දෙසැම්බර් 30	- සාර්ව ආර්ථිකයේ දැනට පවතින හා අපේක්ෂිත වර්ධනයන් සහ බලපත්‍රලාභී බැංකු විසින් විදේශ මුදල් තැන්පතු සඳහා දැනට ලබා දෙන පොලී අනුපාත සැලකිල්ලට ගනිමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් විදේශ මුදල් තැන්පතු සඳහා පිරිනැමිය හැකි උපරිම පොලී අනුපාත දැනුම් දෙමින් මුදල් නීති පනත් නියෝගයක් නිකුත් කරන ලදී.
2021 දෙසැම්බර් 31	- සාර්ව ආර්ථිකයේ දැනට පවතින හා අපේක්ෂිත වර්ධනයන් සහ රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා මේ වන විට පවත්නා වෙළඳපොළ පොලී අනුපාතයන් සැලකිල්ලට ගනිමින් උකස්කර මත ලබාදෙන නිවාස ණය සඳහා අදාළ නව පොලී අනුපාත දැනුම් දෙමින් 2020 අංක 03 දරන මුදල් නීති පනත් නියෝගයට සංශෝධනයක් නිකුත් කරන ලදී.
2022 මාර්තු 11	- මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කිරීම සඳහා මෑතක දී ගත් ක්‍රියාමාර්ග, සාර්ව ආර්ථිකයේ අපේක්ෂිත වර්ධනයන් සහ රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා මේ වන විට පවත්නා වෙළඳපොළ පොලී අනුපාතයන් සැලකිල්ලට ගනිමින්, ණය කාඩ්පත්, පෙර ගිවිසගත් තාවකාලික අයිරා සහ උකස් අත්තිකාරම් සඳහා අය කළ හැකි නව උපරිම පොලී අනුපාතයන් දැනුම් දෙමින් 2021 අංක 02 දරන මුදල් නීති පනත් නියෝගය සංශෝධනය කරන ලදී.
	- මූල්‍ය ප්‍රතිපත්තිය දැඩි කිරීම සඳහා මෑතක දී ගත් ක්‍රියාමාර්ග, සාර්ව ආර්ථිකයේ අපේක්ෂිත වර්ධනයන් සහ බලපත්‍රලාභී බැංකු විසින් විදේශ මුදල් තැන්පතු සඳහා දැනට ලබා දෙන පොලී අනුපාත සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් විදේශ මුදල් තැන්පතු සඳහා පිරිනැමිය හැකි උපරිම පොලී අනුපාත සීමා ඉවත් කරමින් 2021 අංක 03 දරන මුදල් නීති පනත් නියෝගය සංශෝධනය කරන ලදී.
බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්	
2021 ජනවාරි 01	- තක්සේරුකරුවන් සඳහා වන සුදුසුකම් නිර්ණායක සංශෝධනය කරමින්, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිශ්චල දේපළ තක්සේරු කිරීමේ විධානයට සංශෝධනයක් නිකුත් කරන ලදී.
2021 පෙබරවාරි 17	- පළමු ලියාපදිංචියෙන් පසුව වසරකට වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කර ඇති, ලියාපදිංචි මෝටර් රථ සඳහා ණය පහසුකම් ලබා ගැනීමේ දී අදාළ වන වටිනාකම් මත ණය අනුපාතය සියයට 80ක් ලෙස සංශෝධනය කරමින්, වටිනාකම් මත ණය අනුපාත විධානය සඳහා සංශෝධන බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී.

2021 මාර්තු 12	- කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ, මගී ප්‍රවාහන සේවයේ නියුතු පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා 2021 වසරේ අප්‍රේල් 01 වන දින සිට මාස හයක කාලයක් සඳහා ණය සහන ලබා දෙන ලෙස දන්වා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
2021 මාර්තු 19	- 2020 වසරේ සැප්තැම්බර් 30 දින නිකුත් කරන ලද 2020 අංක 09 දරන චක්‍රලේඛය යටතේ සංචාරක අංශයට ලබා දී ඇති ණය සහනය 2021 වසරේ අප්‍රේල් 01 දින සිට තවත් මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලෙස දන්වා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
2021 මාර්තු 31	- 2020 අංක 01 දරන ණය පහසුකම් වර්ගීකරණය හා මිනුම්කරණයට අදාළ විධානය ක්‍රියාත්මක කිරීම මාස තුනකින් කල් දැමීම පිළිබඳව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත දැනුම් දෙන ලදී. - කොවිඩ්-19 වසංගතයේ දිගුකාලීන බලපෑම හේතුවෙන් නිර්මාණය වූ අභියෝගාත්මක වාතාවරණය තුළ ද්‍රවශීලතා මට්ටම් සඳහා ඇති විය හැකි පීඩනය මඟහරවා ගැනීම සඳහා පහසුකම් සැලසීමට 2020 වසරේ සැප්තැම්බර් 30 දින නිකුත් කරන ලද ද්‍රවශීල වත්කම් පිළිබඳ විධානයේ සංශෝධනය, 2021 වසරේ ජූනි 30 දක්වා මාස තුනක කාලයක් සඳහා දීර්ඝ කරමින් විධානයක් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී.
2021 අප්‍රේල් 01	- 2021 වසරේ අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ ගෙවනු ලබන උපරිම වන්දි මුදල රුපියල් 600,000 සිට රුපියල් 1,100,000 දක්වා ඉහළ නැංවීම සඳහා 2021 අංක 01 දරන රෙගුලාසිය නිකුත් කරන ලදී. 2021 වසරේ අප්‍රේල් 01 දිනට පෙර බලපත්‍ර අවලංගු/අත්හිටු වූ මුදල් සමාගම් සඳහා මෙම ඉහළ නැංවීම ක්‍රියාත්මක කරන ලදී.
2021 අප්‍රේල් 09	- බලපත්‍රලාභී මුදල් සමාගම් විදේශ අරමුදල් සඳහා නිරාවරණය වීම තුළින් ඇති වන මූල්‍ය විචලනයන් ස්ථාවර කිරීම, විදේශ මුදල් ණයට ගැනීමේ දී ඇති වන අවදානම් කළමනාරණය කිරීම සහ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් සිදු කරන විදේශ මුදල් ණය ගැනීම් සඳහා නියාමන රාමුවක් ස්ථාපිත කිරීම යනාදිය අරමුණු කර ගනිමින් විදේශ මුදල් ණය ගැනීම්වලට අදාළව නව විධානයක් නිකුත් කරන ලදී.
2021 ජූනි 04	- බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් සිදු කරන විදේශ මුදල් ණය ගැනීම් පිළිබඳව මෙයට පෙර නිකුත් කරන ලද විධානවලට අමතරව, මූල්‍ය හා මූල්‍ය නොවන ආයතන විසින් සිදු කරන විදේශ මුදල් ණය ගැනීම්වලට වසරක කාලයක් සඳහා පහසුකම් සලසන බව බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත දැනුම් දෙන ලදී.
2021 ජූනි 09	- කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා වන සහන පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. ඒ අනුව, කොවිඩ්-19 තෙවන ව්‍යාප්තියෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා තවදුරටත් සහන ලබා දෙන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලින් ඉල්ලීමක් කරන ලදී.
2021 ජූලි 05	- කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, ණය පහසුකම් මත ලබා ගෙන ඇති වාහන අත්පත් කර ගැනීම සහ නැවත ලබා ගැනීම අවම වශයෙන් ඉදිරි මාස තුන දක්වා (2021 වසරේ සැප්තැම්බර් 30 දක්වා) අත්හිටුවන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙතින් ඉල්ලා සිටින ලදී.
2021 ජූලි 07	- 2020 අංක 01 දරන ණය පහසුකම් වර්ගීකරණය සහ මිනුම්කරණ විධානය බලාත්මක වන දිනය කල් දමන ලදී. - ඒ අනුව, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් මාසිකව හෝ ඊට වැඩි පදනමින් වාරික වශයෙන් ආපසු ගෙවිය යුතු ණය පහසුකම් සඳහා "විශේෂයෙන් සඳහන් කරන ලද" කාණ්ඩය සහ අදියර 3 වර්ගීකරණය පිළිවෙළින් 2022 වසරේ අප්‍රේල් 01 දින සිට කල් ඉකුත් වූ දිනය ලෙස දින 120 සහ 2023 වසරේ අප්‍රේල් 01 දින සිට කල් ඉකුත් වූ දිනය ලෙස දින 90 උපයෝගී කර ගත යුතු බව දන්වන ලදී.
2021 ජූලි 09	- සෑම ප්‍රාථමික අලෙවිකාර සමාගමක් විසින්ම නියමිත අවම ප්‍රාග්ධන මට්ටම, 2021 වසරේ දෙසැම්බර් 31 දක්වා රුපියල් බිලියන 1.0ට නොඅඩු මට්ටමක පවත්වා ගත යුතු අතර ඉන්පසුව 2022 වසරේ ජනවාරි 01 සහ 2023 වසරේ ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පිළිවෙළින්, රුපියල් බිලියන 2.0 සහ රුපියල් බිලියන 2.5ක් දක්වා ඉහළ නංවා ගත යුතු බව දන්වමින් ප්‍රාථමික අලෙවිකාර සමාගම් වෙත අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය පිළිබඳව විධානයක් නිකුත් කරන ලදී. - විශේෂ අවදානම් සංචිතයක් පවත්වා ගැනීම සහ ප්‍රාග්ධන තක්සේරු කිරීමේ හා සැලසුම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව ද මෙම විධානය මගින් විස්තර කරනු ලැබේ.

2021 අගෝස්තු 06	- ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ නිකුත් කර ඇති 2010 අංක 01 දරන රෙගුලාසිය අවලංගු කර 2021 අංක 02 දරන නව රෙගුලාසිය නිකුත් කරන ලදී.
2021 සැප්තැම්බර් 10	- 2021 වසරේ ජූනි 09 දින නිකුත් කරන ලද චක්‍රලේඛයට සංශෝධනයක් නිකුත් කරමින්, කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ලබා දී ඇති ණය සහන තවදුරටත් 2021 වසරේ සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කරන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙතින් ඉල්ලා සිටින ලදී.
2021 සැප්තැම්බර් 24	- නිශ්චිත අරමුණු සඳහා පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස "ලංකා රේටින් ඒජන්සි ලිමිටඩ් ආයතනය" ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගෙන ඇති බව දන්වමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
2021 ඔක්තෝබර් 06	- රජයේ ආයතන සහ අදාළ පාර්ශ්වයන් කරන ලද ඉල්ලීම් කිහිපයක් සැලකිල්ලට ගනිමින්, කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා 2022 වසරේ මාර්තු 31 දක්වා ණය සහන ලබා දෙන ලෙස සහ නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග අත්හිටුවන ලෙස දන්වමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
2021 ඔක්තෝබර් 18	- රට තුළට විධිමත් අරමුදල් හුවමාරු කිරීමේ ක්‍රමවේදයන් හරහා වැඩි සේවක ප්‍රේෂණ පැමිණීම දිරිමත් කිරීමේ අරමුණින් සේවක ප්‍රේෂණ සඳහා අමතර දිරි දීමනා ගෙවන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් වෙතින් ඉල්ලා සිටින ලදී.
2021 නොවැම්බර් 01	- භාණ්ඩාගාර බිල්පත් අනුපාතවල ඉහළ යෑමට අනුකූලව වසර 2, 3 සහ 5 යන කාලීන තැන්පතුවල පවතින පොලී ආන්තිකය සංශෝධනය කරන ලදී.
2021 දෙසැම්බර් 24	- 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 74 වගන්තිය යටතේ රජයේ සුරැකුම්පත් හි ප්‍රතිවිකුණුම් මත ආයෝජනය බලපත්‍රලාභී මුදල් සමාගම් හි ද්‍රවශීල වත්කම්වලට ඇතුළත් කරන ලදී.
2021 දෙසැම්බර් 31	- බලපත්‍රලාභී මුදල් සමාගමේ ආරක්ෂාව සහ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගමෙහි ප්‍රධාන වගකිවයුතු පුද්ගලයන්ට ඔවුන්ගේ වගකීම් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමට හැකි බව සහතික කිරීමේ අරමුණින් ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම පිළිබඳ විධානයක් නිකුත් කරන ලදී. - බලපත්‍රලාභී මුදල් සමාගම් හි ව්‍යාපාර පවත්වාගෙන යාම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ආරක්ෂා කිරීම පිළිබඳ යහපාලන භාවිතයන් ප්‍රවර්ධනය කිරීමේ අදහසින් ආයතනික යහපාලනය පිළිබඳ විධානයක් නිකුත් කරන ලදී. - ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ආයෝජන මත වැඩි ප්‍රතිලාභ ලබා දීමේ අරමුණින් වසර 5ක කාලීන තැන්පතු සහ වසර 5ක ණය උපකරණවල පොලී ආන්තිකය සංශෝධනය කරන ලදී.
2022 ජනවාරි 31	- බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා තාක්ෂණ අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ අවම නියාමන අවශ්‍යතා පිහිටුවීමේ අරමුණ ඇතිව තාක්ෂණ අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව සම්බන්ධයෙන් විධානයක් නිකුත් කරන ලදී.
2022 පෙබරවාරි 08	- ශ්‍රමිකයන්ගේ ආමුඛ ප්‍රේෂණ හේතුවෙන් අය කරනු ලබන ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කිරීම මගින් විදේශයේ සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා දිරිදීමනාවක් ලබා දීමට බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත දැනුම් දෙන ලදී.
රක්ෂණය	
2021 මාර්තු 10	- 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 96 වගන්තිය ප්‍රකාරව රක්ෂණ සමාගම් වෙත ලාභාංශ බෙදා හැරීම සහ ප්‍රකාශය සම්බන්ධයෙන් 2021 අංක 01 දරන නියෝගය නිකුත් කළ අතර රක්ෂණකරුවන් විසින් එම නියෝගයේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසිවලට අනුකූල වීමට යටත්ව මෙම නියෝගය නිකුත් කරන ලදී.
2021 මාර්තු 23	- රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අදහස අනුව නිෂ්පාදන සාධාරණ සහ අපක්ෂපාතී බව කොමිෂන් සභාව විසින් තහවුරු කිරීමෙන් පසුව පමණක් නිෂ්පාදන/රක්ෂණ ඔප්පු ආකෘති දියත් කළ හැකි බව රක්ෂණ සමාගම් වෙත දැනුම් දෙමින් 2021 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. - සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් යෝජිත දියත් කිරීමේ දිනට අවම වශයෙන් දින 30කට පෙර ඔප්පු ලේඛන ඉදිරිපත් කළ යුතු අතර දිගුකාලීන රක්ෂණ සමාගම් විසින් යෝජිත දියත් කිරීමේ දිනට දින 45කට පෙර ඔප්පු ලේඛන ඉදිරිපත් කළ යුතුය.
2021 මාර්තු 24	- කේත ලබා දීම සඳහා වන සීමාවන් සහ කේත වෙනස් කිරීම සඳහා වන සීමාවන් සම්බන්ධයෙන් රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරව්කාර සමාගම් සඳහා රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 96A වගන්තියට අනුව 2021 අංක 02 දරන නියෝගය නිකුත් කරන ලදී.
2021 අප්‍රේල් 08	- තෙවන පාර්ශවීය මෝටර් රථ රක්ෂණ ප්‍රවර්ධනය/දැන්වීම තහනම් කිරීම පිළිබඳ 2021 අංක 02 දරන චක්‍රලේඛය සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී.

2021 ජූලි 29	- රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 96A වගන්තියට අනුව 2021 අංක 03 දරන නියෝගය මගින් සියලුම රක්ෂණකරුවන්ට, තැරැව්කරුවන්ට සහ අලාභ ගැලපුම් සේවා සපයන්නන්ට මූල්‍ය අවභාවිතය හෝ වංචාව යන හේතු මත සේවාවන් අත්හිටුවා ඇති පුද්ගලයන් සේවයට බඳවා නොගන්නා ලෙසට නියෝග කරන ලදී. කෙසේ වෙතත්, රක්ෂණකරුවෙකු, තැරැව්කරුවෙකු, අලාභ ගැලපුම්කරුවෙකු හෝ ආයතනික රක්ෂණ නියෝජිතයෙකු විසින් පුද්ගලයෙකුගේ සේවය අත්හිටුවීම සිදු කරනු ලබන අවස්ථාවක, එවැනි නෛතික පුද්ගලයින් නිසි ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු අතර විශේෂයෙන් එවැනි අත්හිටුවීමකට පෙර ස්වභාවික යුක්තියේ මූලධර්ම (Natural Justice) අනුගමනය කළ යුතුය.
2021 අගෝස්තු 30	- 2021 අංක 01 දරන නියෝගය රක්ෂකයන් හට හදිසි වගකීම් සහ ලාභාංශ ප්‍රකාශයේදී සහ බෙදා හැරීමේදී අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම ආවරණය කිරීම සඳහා සංශෝධනය කරන ලදී.
2021 සැප්තැම්බර් 06	- විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන්ගේ සේවා ජාල (ජංගම රක්ෂණය) භාවිතය අවසන් කිරීම සහ එයට සම්බන්ධ කරුණු පිළිබඳව රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 96A වගන්තියට අනුව 2021 අංක 04 දරන නියෝගය නිකුත් කරන ලදී.
2021 දෙසැම්බර් 06	- රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 88 වැනි වගන්තිය යටතේ දැනට පවතින දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා ගෙවිය යුතු උපරිම කොමිස් මුදල පිළිබඳ නව අංක 10 නිර්ණය මගින් පැවති අංක 10 නිර්ණය ප්‍රතිස්ථාපනය කරන ලද අතර එය රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කරුවන් වෙත නිකුත් කරන ලදී.
2021 දෙසැම්බර් 16	- රක්ෂණ සමාගම්වල සහ රක්ෂණ තැරව්කාර ආයතනවල ප්‍රධාන නිලධාරීන් පිළිබඳ 2021 අංක 05 නියෝගය මගින් 2016 මැයි 13 වන දින නිකුත් කරන ලද දැනට පවතින අංක 09 නියෝගය ප්‍රතිස්ථාපනය කරන ලද අතර එය රක්ෂණ සමාගම්වලට සහ රක්ෂණ තැරැව්කරුවන් වෙත නිකුත් කරන ලදී.
ප්‍රාග්ධන වෙළඳපොළ	
2021 ජනවාරි	- කොළඹ කොටස් වෙළඳපොළ සමඟ සාකච්ඡා කර කොටස් තැරැව්කාර සමාගම් සඳහා පුළුල් මාර්ගෝපදේශ මාලාවක් සකස් කරන ලදී.
2021 මාර්තු	- කොටස් වෙළඳපොළෙහි ආයෝජකයින්ගේ පදනම පුළුල් කිරීමට ඩිජිටල් වේදිකාවන් සඳහා පහසුකම් සලසන ලදී.
	- කොළඹ කොටස් වෙළෙඳපොළෙහි අත්පිට වෙළෙඳපොළ (Over the Counter - OTC) වේදිකාව හරහා පත්‍ර රත්‍රන් (Paper Gold) හඳුන්වා දීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී.
2021 අප්‍රේල්	- විශේෂ අරමුණු සහිත අත්පත් කර ගැනීමේ සමාගම් (Special Purpose Acquisition Companies) ලැයිස්තුගත කිරීම පහසු කිරීමේ යෝජනාවට ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී.
2021 ජූනි	- කොළඹ කොටස් වෙළෙඳපොළෙහි අත්පිට වෙළෙඳපොළ වේදිකාව තුළ සාංගමික ණය සුරැකුම්පත් වල ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් (REPO) ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට මධ්‍යම තැන්පතු පද්ධති (CDS) නීති සංශෝධනය කරන ලදී.
	- කොළඹ කොටස් වෙළෙඳපොළෙහි වැඩි දියුණු කළ ආන්තික පද්ධතිය සහ ගෙවීම් හා කොටස් හුවමාරු වීමේ සමගාමී ක්‍රියාවලි (Delivery vs Payment) යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට නීති රීති නිකුත් කිරීම සහ ආන්තික ආකෘතිය සංශෝධනය කිරීම තුළින් පහසුකම් සලසන ලදී.
	- ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළෙඳපොළ නිෂ්පාදන හඳුන්වා දීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී.
	- ව්‍යුහාත්මක වරෙන්තු (Structured Warrants) හඳුන්වා දීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී.
	- හරිත බැඳුම්කර හඳුන්වා දීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී.
	- සමූහ අරමුදල් (crowdfunding) වැනි මාර්ගගත වේදිකා හරහා අරමුදල් රැස් කිරීමට පහසුකම් සැලසීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී.
	- සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නව පනත් කෙටුම්පත බලාත්මක කිරීමේ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කෙරිණි.
2021 ජූලි	- කොටස් වෙළඳපොළ මෙහෙයුම් ඩිජිටල්කරණයේ දෙවන අදියර ආරම්භ කරන ලදී.
	- සුරැකුම්පත් ණයට ගැනීම හා ණයට දීම තුළින් නියාමනය කරන ලද කෙටි විකිණීම් (covered short selling) හඳුන්වා දීමට ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී.
2021 නොවැම්බර්	- දේශීය සමාගම් මගින් නිකුත් කරන ලද විදේශ මුදල් වලින් නාමනය කරන ලද කොටස් කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත කිරීම සඳහා පහසුකම් සැලසීමට අනුමැතිය ලබා ගැනිණ.

ගෙවීම් සහ පියවීම්

2021 ජූනි 09 - LANKAQR ක්‍රමවේදය සමඟ වෙළඳුන් වැඩිවශයෙන් සම්බන්ධ වීම දිරිමත් කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, LANKAQR ගනුදෙනු සඳහා උපරිම වෙළඳ වට්ටම් අනුපාතය (MDR) සියයට 0.5ක් ලෙස පවත්වා ගැනීමේ කාලය 2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන පරිදි මාස හයක කාලයක් දක්වා දීර්ඝ කරන ලදී.

2021 දෙසැම්බර් 27 - LANKAQR ගනුදෙනු සඳහා උපරිම වෙළඳ වට්ටම් අනුපාතය සියයට 0.5ක අගයක පවත්වා ගෙන යෑමේ කාලය නැවත දැනුම් දෙන තෙක් දීර්ඝ කෙරිණි.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

2021 අප්‍රේල් 27 - මාර්ගගත ගෙවීම් ක්‍රමවේද හා සම්බන්ධ පාර්ශ්වයන් සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳ 2021 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2021 අප්‍රේල් 28 - ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා විදේශයන්හි දී සිදු කරන මුදල් ආපසු ගැනීම තුළින් විදේශ මුදල් පිටතට ගලා යාම හා සම්බන්ධ සැක කටයුතු ගනුදෙනු ඉහළ යෑමේ ප්‍රවණතාව සැලකිල්ලට ගනිමින්, 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති ප්‍රකාරව ගනුදෙනුකරුවන් සමඟ ව්‍යාපාරික සම්බන්ධතාවලට එළඹීමේ දී සහ ගනුදෙනු සිදු කිරීමේ දී නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ යුතු බවට උපදෙස් දෙමින් 2021 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2021 මැයි 04 - කොවිඩ්-19 වසංගතයේ තෙවන රැල්ල පැවති කාලපරිච්ඡේදය තුළ ඇති වූ මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා සම්බන්ධ අවදානම් අවම කිරීම සඳහා අතිරේක ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ 2021 අංක 03 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.

2021 ජූලි 20 - මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාර්යයන් සඳහා සීසීටීවී (CCTV) මෙහෙයුම් පිළිබඳ 2021 අංක 2 දරන මාර්ගෝපදේශය මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී.

2021 ඔක්තෝබර් 04 - 2021 අංක 18 දරන මුදල් පනත යටතේ සිදු කරනු ලබන තැන්පතු පිළිබඳ 2021 අංක 04 දරන චක්‍රලේඛය බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී.

2022 ජනවාරි 10 - මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාර්යයන් සඳහා සීසීටීවී (CCTV) මෙහෙයුම් පිළිබඳ 2021 අංක 02 දරන චක්‍රලේඛය සංශෝධනය කිරීම සඳහා 2022 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී.

විදේශ විනිමය කළමනාකරණය සහ ජාත්‍යන්තර කටයුතු

2021 ජනවාරි 01 - බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලද "අභ්‍යන්තර සේවක ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" පිළිබඳ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ පදිංචි, විදේශ ව්‍යවහාර මුදලින් ආදායම් උපයන සේවාවක නියුතු ශ්‍රී ලාංකිකයෙකු විසින් විදේශ ව්‍යවහාර මුදලින් උපයන ආදායම් සහ විදේශ රටක දී සේවා සැපයීම තුළින් උපයන විදේශ මුදල් ආදායම් මෙම යෝජනා ක්‍රමය යටතට ඇතුළත් වන පරිදි විෂය පථය පුළුල් කරන ලෙසට සහ 2020 දෙසැම්බර් 28 වන දින හෝ ඊට පසුව සිදු කරන ලද විදේශ මුදල් ආදායම් පරිවර්තන සඳහා මෙම යෝජනා ක්‍රමය බලාත්මක කිරීමට බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් ලබා දෙන ලදී.

2021 ජනවාරි 15 - කොන්දේසිවලට යටත්ව විදේශීය ණය නැවත ගෙවීමේ දී බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා අදාළ වන විදේශ විනිමය අවදානම සමනය කරවීමට තාවකාලික විශේෂ විදේශ විනිමය ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට අවසර ලබා දෙමින් බලයලත් වෙළඳුන් වෙත 2021 විධාන අංක 01 නිකුත් කරන ලදී.

2021 ජනවාරි 27 - විදේශීය සංචිත ගොඩනැංවීම සඳහා බලපත්‍රලාභී බැංකුවල පරිවර්තනය කරන ලද සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් 10ක් අනිවාර්ය පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීම සඳහා වන යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට අදාළව මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2021 පෙබරවාරි 03 - දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා බලයලත් වෙළෙඳුන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ප්‍රායෝගික ගැටලු විසඳීම සඳහා පැවති නියෝග හා නියමයන් අවලංගු කරමින් 2021 මාර්තු 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් නියෝග හා නියමයන් නිකුත් කරන ලදී.

- ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 01 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/34 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.

- ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 02 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/35 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම සඳහා අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 03 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/36 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- විවිධ ප්‍රාග්ධන ගනුදෙනු සඳහා අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 04 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/37 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- විදේශ විනිමය ගනුදෙනුවල නිරතවීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 05 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/38 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තෙකු විසින් විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල්, අපනයනය කිරීම හෝ ආනයනය කිරීම මත 2020 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 8 වන වගන්තිය යටතේ වූ නියමය (අංක 2213/39 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් නිශ්චය කිරීම සඳහා විදේශ විනිමය පනතෙහි 31 වන වගන්තිය යටතේ වූ නියමය (අංක 2213/40 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.

2021 පෙබරවාරි 18

- නැව්ගත කරන ලද දින සිට දින 180ක් ඇතුළත අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීමට සහ අපනයනයට අදාළ මුදල් ලැබුණු වහාම බලපත්‍රලාභී බැංකුවක් මගින් එකී අපනයනය මගින් ලද මුලු මුදලින් සියයට විසි පහක ප්‍රතිශතයක් (25%) ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමට අදාළව මුදල් නීති පනත යටතේ 2021 අංක 1 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති වශයෙන් අති විශෙෂ ගැසට් නිවේදන අංක 2215/39 නිකුත් කරන ලදී.
- 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ, 2021 පෙබරවාරි 18 දින නිකුත් කළ ගැසට් නිවේදනය සහ රීති යටතේ, විදේශ සංචිත ගොඩනැංවීමේ අරමුණින් අපනයන ආදායම් ලැබීම්වලින් සියයට 25ක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්ය කළ අතර එයින් සියයට 50ක් බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණිය යුතු බව දක්වමින් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සඳහා මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2021 මාර්තු 09

- පරිවර්තනය සඳහා අදාළ වන කාල සීමාව දින 14ක් දක්වා දීර්ඝ කිරීම සඳහා මුදල් නීති පනත යටතේ 2021 අංක 2 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති වශයෙන් අංක 2218/38 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

2021 මාර්තු 17

- පැවති වෙළඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගෙන, පරිවර්තනය කරන ලද සේවක ප්‍රේෂණවලින් සියයට 10ක් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීමේ අවශ්‍යතාවය තාවකාලිකව අත්හිටුවීම සඳහා "අභ්‍යන්තර සේවක ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" යටතේ බලපත්‍රලාභී බැංකුවලට සංශෝධිත මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.
- පැවති වෙළඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගෙන, අනිවාර්යයෙන් පරිවර්තනය කළ යුතු අපනයන ආදායමෙන් සියයට 25න් සියයට 50ක් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීමේ අවශ්‍යතාවය තාවකාලිකව අත්හිටුවීම සඳහා "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" යටතේ බලපත්‍රලාභී බැංකුවලට සංශෝධිත මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2021 මාර්තු 18

- 2021 පෙබරවාරි 03 දින නිකුත් කරන ලද නියෝගවලට හා නියමයන්ට සමගාමීව බලයලත් වෙළඳුන් වෙත පහත සඳහන් විධාන (2021 වසරේ මාර්තු 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි) නිකුත් කරන ලදී.
  - ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් වෙනුවෙන් බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරන ජංගම ගනුදෙනු සඳහා විදේශ විනිමය පනතේ 6 වන වගන්තිය යටතේ 2021 අංක 2 දරන විධාන නිකුත් කරන ලදී.
  - ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන්ට සිදු කරනු ලබන විදේශ විනිමය ගෙවීම් සඳහා විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් භාවිත කිරීම සම්බන්ධයෙන් 2021 අංක 3 දරන විධාන නිකුත් කරන ලදී.
  - ශ්‍රී ලංකාවේ සුදුසුකම් ලත් නේවාසික/අනේවාසික පුද්ගලයන් විසින් විදේශ ව්‍යවහාර මුදලින් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට අදාළව 2021 අංක 4 දරන විධාන නිකුත් කරන ලදී.

- ශ්‍රී ලංකාව තුළ නේවාසික විදේශ විනිමය උපයන්නන් විසින් සිදු කරන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට අදාළව 2021 අංක 5 දරන විධාන නිකුත් කරන ලදී.
- රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල/පුද්ගලයන් විසින් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලට අදාළව 2021 අංක 6 දරන විධාන නිකුත් කරන ලදී.
- "ශ්‍රී ලංකාව - මගේ සිහින නිවහන වැඩසටහන" යටතේ නේවාසික වීසා බලපත්‍ර මත දීර්ඝ කාලයක් ශ්‍රී ලංකාවේ වාසය කිරීමට කැමති සහ වයස අවුරුදු 55ට වැඩි ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන් විසින් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන්ගේ විශේෂ ගිණුම්වලට අදාළව 2021 අංක 7 දරන විධාන නිකුත් කරන ලදී.
- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද "නේවාසික ආගන්තුක යෝජනා ක්‍රමය" යටතේ ශ්‍රී ලංකාවට පැමිණෙන ආයෝජකයන් හා වෘත්තිකයන් විසින් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් නේවාසික ආගන්තුකයින් සඳහා වන යෝජනා ක්‍රමයේ විශේෂ ගිණුම්වලට අදාළව 2021 අංක 08 දරන විධාන නිකුත් කරන ලදී.
- බලයලත් වෙළෙඳුන් විසින් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමි විදේශ විනිමය උපයන්නන් හට ණය පහසුකම් ලබා දීම සඳහා ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ට සපයන ණය පහසුකම් සම්බන්ධයෙන් වන 2021 අංක 09 දරන විධාන නිකුත් කරන ලදී.
- බලයලත් වෙළෙඳුන් විසින් විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකික පුරවැසියන් හට විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය හා අත්තිකාරම් ප්‍රදානය කිරීම සඳහා විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් (විගාමිකයන් හැර) හට ප්‍රදානය කරන ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් වන 2021 අංක 10 දරන විධාන නිකුත් කරන ලදී.
- බලයලත් වෙළෙඳුන් විසින් ස්ථිර නේවාසිකයන්ට සහ ද්විත්ව පුරවැසියන් සඳහා විදේශ ව්‍යවහාර මුදලින් හා ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම සඳහා ස්ථිර නේවාසික වීසා බලපත්‍රය මත ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් හෝ ද්විත්ව පුරවැසිභාවය සහිත ශ්‍රී ලාංකිකයන් හට ප්‍රදානය කරන ණය සම්බන්ධයෙන් 2021 අංක 11 දරන විධාන නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීම සහ අලෙවිය සඳහා අනුමත නියෝජිතයන් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අධිකාරී විසින් පත් කරන ලද බලයලත් වෙළෙඳුන් හා ප්‍රාථමික වෙළෙඳුන් හට අවසර දීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සම්බන්ධයෙන් වන 2021 අංක 12 දරන විධාන නිකුත් කරන ලදී.
- ආකෘති පත්‍ර 1 සහ 2 හි ගනුදෙනු බලයලත් වෙළෙඳුන් විසින් වාර්තා කිරීමේ අවශ්‍යතාවය දක්වමින් විදේශ විනිමය විකිණීම (ආකෘති පත්‍රය 1) සහ විදේශ විනිමය මිලදී ගැනීම (ආකෘති පත්‍රය 2) සම්බන්ධයෙන් වන 2021 අංක 13 දරන විධාන නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ප්‍රේෂණ සිදු කිරීමට ශ්‍රී ලංකාවේ නේවාසිකයන් විසින් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 14 දරන විධාන නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාව තුළ සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනුවලට සම්බන්ධ ආමුඛ ප්‍රේෂණ සිදු කිරීමට අනේවාසික අයෝජකයන් විසින් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සඳහා ආමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 15 දරන විධාන නිකුත් කරන ලදී.
- සංක්‍රමණික දීමනාව ලබා ගැනීම සඳහා විගාමිකයන් විසින් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 16 දරන විධාන නිකුත් කරන ලදී.
- නියාමන අවශ්‍යතාවයන්ට යටත්ව ශ්‍රී ලංකාවෙන් උපයාගත් ජංගම ආදායම් ලබා ගැනීම සඳහා විගාමිකයන් විසින් ගිණුම විවෘත කිරීම හා පවත්වාගෙන යාම සඳහා විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම සම්බන්ධයෙන් වන 2021 අංක 17 දරන විධාන නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ නේවාසික හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වාසික විගාමිකයන් සහ ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත ආයතන/සමාගම් විසින් ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විවෘත කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා අනේවාසික රුපියල් ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 18 දරන විධාන නිකුත් කරන ලදී.

	• විදේශීය ණය දෙන්නන්ගෙන් ලබා ගත් ණය මුදල් බැර කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සංස්ථාගත සමාගම් විසින් ගිණුම් විවෘත කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා විදේශ වාණිජ ණය ගැනීමේ ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 19 දරන විධාන නිකුත් කරන ලදී. • ජංගම හා ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන් ඇපකර නිකුත් කිරීම සහ අලුත් කිරීම සඳහා අදාළ වන විධාන දක්වමින් 2021 අංක 20 දරන විධාන නිකුත් කරන ලදී.
2021 මාර්තු 26	- ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්ගේ අතැති විදේශ මුදල් විධිමත්ව ආකර්ශණය කර ගැනීමේ පියවරක් ලෙස දේශීය හෝටල් ගාස්තු විදේශ මුදලින් ගෙවීමට අවස්ථාව සලසා දෙමින්, විදේශ මුදල් තමා සන්තකයේ ඇති ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්ගෙන් එම විදේශ මුදල් පිළිගැනීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල්වලට අවසරය ලබා දීම සඳහා පනතේ 4 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග ප්‍රකාරව අංක 2260/69 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.
2021 මාර්තු 29	- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන එ.ජ. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් ගැණුම්-විකුණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම් වෙන්දේසි ක්‍රමයට සහභාගී වීමේ දී, සුදුසුකම, අදාළ අනුපාතික, කාල සීමාව සහ යාන්ත්‍රණය ඇතුළුව, අවශ්‍යතා මාලාවක් අනුගමනය කරන මෙන් සියලු බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙමින්, "ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලබන එ.ජ. ඩොලර්/ ශ්‍රී ලංකා රුපියල් ගැණුම්-විකුණුම් විදේශ විනිමය හුවමාරු ගිවිසුම් වෙන්දේසිවලට සහභාගී වීම" සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.
2021 අප්‍රේල් 07	- 2020 අප්‍රේල් 08 වන දා සිට මාස 24ක කාල සීමාවක් ඇතුළත සුදුසුකම්ලත් පුද්ගලයන් විසින් විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමට අවසර ලබා දීම සඳහා අංක 2222/37 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී. - විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමේ සහ පවත්වාගෙන යාමේ නිර්ණායක, අවසරලත් හර කිරීම් සහ බැර කිරීම් සහ වෙනත් අවශ්‍යතා දක්වමින් බලයලත් වෙළෙඳුන්ට 2021 අංක 21 දරන විධානය නිකුත් කරන ලදී.
2021 අප්‍රේල් 09	- මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද අපනයනය මඟින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති තවදුරටත් සංශෝධනය කරමින්, පරිවර්තනය සඳහා අදාළ වන කාල සීමාව දින 30ක් දක්වා දීර්ඝ කිරීමට සහ පරිවර්තන අවශ්‍යතාවය සියයට 10ක් දක්වා අඩු කිරීමට අදාළව 2021 අංක 3 දරන අපනයනය මඟින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති වශයෙන් අංක 2222/60 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.
2021 මැයි 04	- සපයන ලද සේවාවක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකුගෙන් විදේශ මුදල් පිළිගැනීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් වෙත අවසරය ලබා දෙමින් 2021 අංක 22 දරන විධාන නිකුත් කරන ලදී.
2021 මැයි 25	- 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගම් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ පූර්ණ අවසරය සහිතව, විදේශ විනිමය ඉපැයීම් සහිත තම සමාගමේ පාලිත සමාගම්වලට විදේශ මුදලින් ණය ලබා දීම සඳහා අදාළ වන අවසරය ලබා දෙමින් පනතේ 4 වැනි වගන්ති ප්‍රකාරව අංක 2229/5 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.
2021 මැයි 28	- මුදල් මණ්ඩලය විසින් සිය අභිමතය පරිදි සියයට 10කට නොඅඩු ප්‍රතිශතයක් දක්වා යම් තරමක නිදහස් කිරීම් ලබා දීමට අදාළ ප්‍රතිපාදන සමඟ පරිවර්තන අවශ්‍යතාවය සියයට 25ක් දක්වා ඉහළ නැංවීමට අදාළව 2021 අංක 4 දරන අපනයනය මඟින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති වශයෙන් අංක 2229/9 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී. - 2021 වසරේ ජනවාරි 27 වන දින බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලද "අභ්‍යන්තර සේවක ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" පිළිබඳ මෙහෙයුම් උපදෙස් නැවත ස්ථාපිත කරන ලදී. - 2021 වසරේ පෙබරවාරි 18 වන දින බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලද "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම" පිළිබඳ මෙහෙයුම් උපදෙස් නැවත ස්ථාපිත කරන ලදී.
2021 ජූනි 11	- ගිණුම්හිමියාගේ දේශීය වියදම් සඳහා විදේශ මුදලින් ආපසු ගැනීම අවසරලත් හර කිරීමක් වශයෙන් ඇතුළත් කරමින් රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් සහ රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට අදාළව 2021 අංක 23 දරන විධාන නිකුත් කරන ලදී.
2021 ජූනි 17	- 2021 අංක 5 දරන විධානයන්හි ඇමුණුම I සංශෝධනය කරමින් ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම්වලට අදාළව 2021 අංක 24 දරන විධාන නිකුත් කරන ලදී.
2021 ජූනි 30	- සමුච්චිත කාල සීමාව, තැන්පතුව ආරම්භ කළ මුල් දිනයේ සිට මාස 24ක් නොඉක්මවන පරිදි මාස 6 සහ මාස 12 යන කාල සීමා සඳහා දැනටමත් ආරම්භ කර ඇති විශේෂ තැන්පතු ගිණුම්වල යළි ආයෝජනය කිරීමට අදාළ රෙගුලාසි වශයෙන් අංක 2234/19 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

- පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයෙකුගෙන් විදේශ මුදලින් ණය ලබා ගත් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද සමාගම්වලට, නියමයන් සහ කොන්දේසිවලට යටත්ව එකී ණය මුදලෙන් සියයට 50ක් භාවිතා කරමින්, ද්විතීයික වෙළෙඳපොළෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගැනීමට අවසර ලබා දෙන රෙගුලාසි වශයෙන් අංක 2234/20 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

2021 ජූලි 02

- මාස හයක කාලසීමාවක් සඳහා ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීමේදී අනුගමනය කළ යුතු පහත ක්‍රියාමාර්ග දක්වමින් පනතේ 22 වන වගන්තිය යටතේ නියෝග ලෙස අංක 2234/49 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.
  - විගාමිකයාගේ සමීපතම පවුලේ සාමාජිකයෙකුගෙන් (විගාමිකයාගේ දෙමාපියන්, ආච්චි, සීයා, සහෝදර සහෝදරියන් සහ කලත්‍රයා) මුදල් ත්‍යාග ලෙස ලද අරමුදල්වලින් සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් ආපසු සිය රටට යැවීම අත්හිටුවීම.
  - පොදු අවසරය යටතේ සංක්‍රමණික දීමනාවට හිමිකම්පාන ලද විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හරහා තම සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් ආපසු සිය රටට යැවීම, එ.ජ. ඩොලර් 10,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.
  - සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව, එ.ජ. ඩොලර් 30,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.
  - ඕනෑම වර්තන ආදායමක් හෝ සමුච්චිත ආදායමක් (සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල, පාරිතෝෂිකය සහ විශ්‍රාම වැටුප් හෝ වෙනත් ඕනෑම විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළුව) විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් හරහා ආපසු සිය රටට යැවීම, එ.ජ. ඩොලර් 30,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.
  - ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික වෙනත් රටක තාවකාලික නේවාසික වීසා ලබාගෙන ඇති ඕනෑම ශ්‍රී ලාංකික පුද්ගලයෙකු වෙනුවෙන් කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ හෝ විදේශ විනිමය නිකුත් කිරීම, එක් පුද්ගලයෙකු සඳහා එ.ජ. ඩොලර් 20,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.
  - වෙනත් රටක තාවකාලික නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාව හැර යාමට අදහස් කරන ශ්‍රී ලංකාව තුළ නේවාසික ඕනෑම පුද්ගලයෙකු වෙනුවෙන් විදේශ විනිමය නිකුත් කිරීම එක් පුද්ගලයෙකු සඳහා එ.ජ. ඩොලර් 10,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.
  - පහත දක්වා ඇති අවස්ථාවල දී හැර ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජන සිදු කිරීමට පොදු අවසරය යටතේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටුවනු ලැබේ.
    - පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුගෙන් ලබා ගන්නා විදේශ ව්‍යවහාර ණය මුදලක් මඟින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන, හෝ
    - පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා සිදු කරන අමතර ආයෝජනයක්, හෝ
    - ආයෝජිතයාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එ.ජ. ඩොලර් 15,000ක උපරිමයක් දක්වා, පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට යටත්ව දැනටමත් විදේශයක සංස්ථාපිත/පිහිටුවා ඇති පාලිත සමාගම්වල හෝ ශාඛා කාර්යාවල සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින් සිදු කිරීමට නියමිත අමතර ආයෝජනයක්/අරමුදල් යෙදවීමක් (අදාළ පරිදි), හෝ
    - සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින්, පනතෙහි හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතෙහි විධිවිධානවලට යටත්ව විදේශයක දැනටමත් පිහිටුවා ඇති සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ වෙනත් ඕනෑම සමාන කාර්යාලය නඩත්තු කිරීමේ අරමුණ සඳහා, එ.ජ. ඩොලර් 30,000ක උපරිමයක් දක්වා සිදු කරන ප්‍රේෂණ.

- ශ්‍රී ලංකාව තුළ නේවාසික පුද්ගලයෙකුගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ/සහ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුබ ප්‍රේෂණ, එ.ජ. ඩොලර් 20,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.
- පොදු අවසරයෙහි දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා, පහත අවස්ථාවලදී එක් එක් ආයෝජනය මත පදනම්ව, පනතෙහි 7(10) වගන්ති ප්‍රකාරව අවසර ලබා දීම සඳහා මුදල් මණ්ඩලයට බලය පවරනු ලැබිණි.
  - පනතෙහි විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුගෙන් ලබා ගන්නා විදේශ ව්‍යවහාර ණය මුදලක් මඟින් යෝජිත ආයෝජනය මූල්‍යනය කිරීම හෝ
  - පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට යටත්ව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයොජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවයක් සඳහා යෝජිත ආයෝජනය සිදු කිරීම.

2021 ජූලි 06 - විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළදී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) 2021 අංක 2 දරන රෙගුලාසි (අංක 2213/35 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) සංශෝධනය කරමින් කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත, ශ්‍රී ලංකා රුපියල්වලින් සහ ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් වන ණය සුරැකුම්පත්වල ආයෝජනය සම්බන්ධ විධිවිධාන ඇතුළත් කරමින් පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග ප්‍රකාරව අංක 2235/22 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

2021 ජූලි 08 - 2021 අංක 21 දරන විධාන අහෝසි කරමින් විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාමේ නිර්ණායක, අවසරලත් හර කිරීම් සහ බැර කිරීම් සහ වෙනත් අවශ්‍යතා දක්වමින් බලයලත් වෙළෙඳුන්ට 2021 අංක 25 දරන විධානය නිකුත් කරන ලදී.

2021 ජූලි 30 - කොළඹ කොටස් හුවමාරුව තුළ විදේශ විනිමය ආයෝජන සඳහා අවශ්‍ය පහසුකම් සලසමින් හඳුන්වා දුන් විශේෂ විදේශ මුදල් ගිණුම් විවෘත කිරීමේ සහ පවත්වාගෙන යාමේ නිර්ණායක, අවසරලත් හර කිරීම් සහ බැර කිරීම් සහ වෙනත් අවශ්‍යතා දක්වමින් බලයලත් වෙළෙඳුන්ට 2021 අංක 26 දරන විධානයන් නිකුත් කරන ලදී.

- කොළඹ කොටස් හුවමාරුවේ ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් ලැයිස්තුගත කොටස් හෝ ණය සුරැකුම්පත්වල සිදු කරන ලද ආයෝජනයකින් පැන නඟින ඕනෑම ආදායමක් හෝ කල් පිරීමේ ප්‍රතිලාභයක් වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම සඳහා ගිණුම්හිමියා විසින් 2021 අංක 26 දරන විධාන යටතේ විවෘත කර පවත්වාගෙන යන විශේෂ විදේශ මුදල් ගිණුම්වලට තම විදේශ විනිමය ඉපැයීම් මාරු කිරීම, 2021 වසරේ මාර්තු 18 දිනැති 2021 අංක 5 දරන ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම් සඳහා වන විධානයන්හි දක්වා ඇති අවසරලත් හර කිරීම් වලට අමතරව අවසරලත් හර කිරීමක් වශයෙන් ඇතුළත් කරමින් 2021 අංක 27 දරන විධාන නිකුත් කරන ලදී.

2021 අගෝස්තු 06 - "අපනයන මගින් ලද ආදායම් අපනයනකරුවන්ගේ අදාළ විදේශ ව්‍යවහාර ගිණුම් වෙත බැර කිරීම" සම්බන්ධව බලපත්‍රලාභී බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කෙරිණි. ඒ අනුව, ලේඛනගත කිරීම සම්පූර්ණ වන තෙක්, මුදල් ආපසු ගැනීම සහ/හෝ පරිවර්තනය කිරීම පිළිබඳව කොන්දේසිවලට යටත්ව, අපනයන ආදායම් බැංකුවල පවත්වා ගෙන යන අදාළ අපනයනකරුවන්ගේ විදේශ ව්‍යවහාර ගිණුම/ගිණුම් වෙත වහාම බැර කරන මෙන් සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත උපදෙස් දෙන ලදී.

2021 ඔක්තෝබර් 28 - ශ්‍රී ලංකාවට ලැබෙන අපනයන ඉපැයීම්වලින් අවසරලත් ගෙවීම් සිදු කිරීමෙන් පසු ශේෂය එළඹෙන මාසයේ හත්වන දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්ය කරමින්, 2021 අංක 5 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති ලෙස මුදල් නීති පනත යටතේ අති විශෙෂ ගැසට් නිවේදන අංක 2251/42 නිකුත් කරන ලදී.

2021 නොවැම්බර් 01 - "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" පිළිබඳ 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද 2021 ඔක්තෝබර් 28 දින සංශෝධනය කරන ලද ගැසට් පත්‍රය සහ රීතිවලට අනුකූලව, රුපියල් බවට පරිවර්තනය කරන ලද අපනයන ආදායම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණීමේ පදනම වෙනස් කරමින්, බලපත්‍රලාභී බැංකු වෙත "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" සම්බන්ධ මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා රුපියල් බවට අනිවාර්යයෙන් පරිවර්තනය කළ යුතු අවසර ලත් අඩු කිරීම්වලින් පසු ඉතිරි වන අපනයන ආදායමෙන් සියයට 10ක් ශ්‍රී ලංකා මහ බැංකුවට විකුණන ලෙස සියලුම බලපත්‍රලාභී බැංකුවලින් ඉල්ලා සිටින ලදී.

2021 දෙසැම්බර් 01	- 2021 දෙසැම්බර් මාසය තුළ දී, විදේශ මුදල් ආදායම් උපයන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට එ.ජ. ඩොලරයකට රුපියල් 8ක අතිරේක දිරි දීමනාවක් ලබා දීම සඳහා "විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සඳහා ලබා දෙන අතිරේක දිරි දීමනා යෝජනා ක්‍රමය" යටතේ මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.
2021 දෙසැම්බර් 13	- මහජනතාව අතැති විදේශ මුදල් විධිමත් බැංකු අංශය හරහා යොමු කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා "අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" සඳහා බලපත්‍රලාභී බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. ඒ අනුව, මහජනතාවට දිරි දීමනා රැසක් පිරිනමන ලද අතර, 2021 දෙසැම්බර් මාසය තුළ දී ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන ලද එවැනි විදේශ මුදල්වලින් සියයට 20ක් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීමට බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් නිකුත් කෙරිණි.
2021 දෙසැම්බර් 15	- 2021 දෙසැම්බර් 13 දිනැති බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද "අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරි දිරිගැන්වීම" සම්බන්ධ මෙහෙයුම් උපදිස්, මහජනතාව අතැති විදේශ මුදල් සම්බන්ධයෙන් ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම ඔස්සේ සිදු කල හැකි බව ඇතුළත් වන පරිදි සංශෝධනය කරන ලදී. - 2021 ජූලි 02 දිනැති අති විශෙෂ ගැසට් නිවේදන අංක 2234/49 මගින් ප්‍රසිද්ධියට පත් කරන ලද පනතෙහි 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගවල වලංගු කාලය, 2022 ජනවාරි 02 දින සිට ඉදිරි මාස 06ක් දක්වා දීර්ඝ කරමින් අති විශෙෂ ගැසට් නිවේදන අංක 2258/23 නිකුත් කරන ලදී.
2021 දෙසැම්බර් 27	- ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකු සමාගමක කොටස් ප්‍රාග්ධනයෙහි ආයෝජනය කිරීම වෙනුවෙන් ලද මුදලින් ආයෝජිතයාගේ ජංගම ගනුදෙනු සිදු කිරීම සඳහා විශේෂ විදේශ මුදල් ගිණුම් (විශේෂ විදේශ මුදල් ගිණුම් ආයෝජිතයා) විවෘත කිරීමේ සහ පවත්වා ගෙන යාමේ නිර්ණායක දක්වමින් 2021 අංක 28 දරන විධානයන් නිකුත් කරන ලදී. - 2021 අංක 28 දරන විධානයන් ප්‍රකාරව කොටස් ප්‍රාග්ධනය වෙනුවෙන් ලද මුදලින් මෙම විධානයන් යටතේ ලබා දී ඇති ප්‍රතිලාභ නැවත අය කර ගැනීමට අවසරය ලබා දෙමින්, 2021 මාර්තු 18 දිනැති අංක 09 දරන ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම් හිමියන් සඳහා වන ප්‍රතිලාභ සඳහා වන විධානයන් සංශෝධනය කරමින් 2021 අංක 29 දරන විධානයන් නිකුත් කරන ලදී. - 2021 මැයි 28, 2021 නොවැම්බර් 01 සහ 2021 දෙසැම්බර් 13 දිනැතිව බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය", "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" සහ "අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" සඳහා වන මෙහෙයුම් උපදිස්, බලපත්‍රලාභී බැංකු විසින් රුපියල් බවට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සියයට 25ක් (නැවත දැනුම් දෙන තුරු), අවසර ලත් අඩු කිරීම්වලින් පසු ඉතිරි අපනයන ආදායමෙන් සියයට 25ක් (නැවත දැනුම් දෙන තුරු) සහ රුපියල් බවට පරිවර්තනය කළ අතැති විදේශ මුදල්වලින් සියයට 25ක් (2021 දෙසැම්බර් මාසය තුළ) ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීමට අවශ්‍ය වන පරිදි සංශෝධනය කරන ලදී. - 2021 දෙසැම්බර් 13 දිනැති සහ 2021 දෙසැම්බර් 15 දිනැති සංශෝධිත "අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" සඳහා නිකුත් කළ මෙහෙයුම් උපදිස් යටතේ ලබා දෙන දිරි දීමනා, 2022 ජනවාරි 31 දින දක්වා දීර්ඝ කරන ලදී.
2022 ජනවාරි 21	- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය සහිත බලපත්‍රලාභී හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන්ට සපයන සේවාවන්ට අදාළ ගෙවීම් විදේශ විනිමයෙන් පමණක්ම භාර ගැනීම අනිවාර්යය කරමින්, 2022 අංක 1 දරන හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය භාර ගැනීමේ රීති ලෙස මුදල් නීති පනත යටතේ අති විශෙෂ ගැසට් නිවේදන අංක 2263/41 නිකුත් කරන ලදී.
2022 ජනවාරි 31	- 2021 දෙසැම්බර් 01 සහ 2021 දෙසැම්බර් 27 දිනැතිව බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා ලබා දෙන අතිරේක දිරිදීමනා යෝජනා ක්‍රමය" සහ "අතැති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා මහජනතාව දිරිගැන්වීම" සඳහා වන මෙහෙයුම් උපදිස් යටතේ පිරිනමනු ලබන දිරිගැන්වීම්වල වලංගු කාල සීමාව සහ රුපියල් බවට පරිවර්තනය කළ අතැති විදේශ මුදල්වලින් සියයට 25ක් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීමේ අවශ්‍යතාවය, නැවත දැනුම් දෙනු තුරු වලංගු වන පරිදි සංශෝධනය කරන ලදී.
2022 පෙබරවාරි 24	- 2021 මාර්තු 18 දිනැති 2021 අංක 4 දරන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳ වන විධානයන්ට සංශෝධනයක් වශයෙන්, විදේශයන්හි රැකියාවේ නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ (විගාමිකයන් හැර) අධ්‍යාපනික ආයතනවල සිසුන් වශයෙන් ලියාපදිංචි වී ඇති ආසන්නතම පවුලේ සාමාජිකයින්ගේ පාඨමාලා හා උපකාරක සේවා ගාස්තු, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් අදාළ අධ්‍යාපනික ආයතනයේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට බැර කිරීමේ අවසරය ලබා දෙමින් 2022 අංක 1 දරන විධානයන් නිකුත් කරන ලදී.

	- 2021 මාර්තු 18 දිනැති 2021 අංක 5 දරන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳ වන විධානයන්ට සංශෝධනයක් වශයෙන්, විදේශයන්හි රැකියාවේ නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ (විගාමිකයන් හැර) අධ්‍යාපනික ආයතනවල සිසුන් වශයෙන් ලියාපදිංචි වී ඇති ආසන්නතම පවුලේ සාමාජිකයන්ගේ පාඨමාලා හා උපකාරක සේවා ගාස්තුවලට අදාළව පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් කරන මාරු කිරීම් අදාළ අධ්‍යාපනික ආයතනවල ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට ලබා ගැනීමේ අවසරය ලබා දෙමින් 2022 අංක 2 දරන විධානයන් නිකුත් කරන ලදී.
2022 මාර්තු 11	- 2021 අංක 5 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති ලෙස මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද අති විශෙෂ ගැසට් නිවේදන අංක 2251/42 අහෝසි කරමින්, ශ්‍රී ලංකාවට ලැබෙන අපනයන ඉපැයීම්වලින් දී ඇති අවසරලත් ගෙවීම් සිදු කිරීමෙන් අනතුරුව, ශේෂය එළැඹෙන මාසයේ හත්වන දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාවය තවදුරටත් සංශෝධන සිදු කරමින් 2022 අංක 1 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ රීති ලෙස මුදල් නීති පනත යටතේ අති විශෙෂ ගැසට් නිවේදන අංක 2270/66 නිකුත් කරන ලදී. - පනත යටතේ නිකුත් කරන ලද නියෝග සහ විධානයන්වල කාර්යයන් සඳහා, "තායි බාත්" නම් කරන ලද විදේශ මුදලක් ලෙස ඇතුළත් කරමින් 2022 අංක 3 දරන විධානයන් නිකුත් කරන ලදී.
ආනයන සහ අපනයන පාලන රෙගුලාසි	
2021 ජනවාරි 05	- 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින ටයර් ආනයනවලට සම්බන්ධ භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2209/18 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.
2021 පෙබරවාරි 11	- 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින පිඟන් මැටි නිෂ්පාදන සහ සාරි ආශ්‍රිත භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2214/56 දරන ,අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.
2021 අප්‍රේල් 06	- 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින පාම් තෙල් ආශ්‍රිත ආනයන භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2222/31 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.
2021 අප්‍රේල් 23	- 2020 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින ජංගම වැඩපළ ආශ්‍රිත ආනයන භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2224/43 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී. - 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින ජංගම වැඩපළ ආශ්‍රිත ආනයන භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2224/44 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.
2021 මැයි 06	- ඛනිජමය හෝ රසායනික පොහොර ඇතැම් ආනයන තහනම් කරමින් සහ අවශේෂ ඛනිජමය හෝ රසායනික පොහොර ආනයන මත ආනයන සීමා බලපත්‍ර පනවමින්, 2021 අංක 07 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2226/48 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.
2021 ජූනි 11	- රත්‍රන් සහ මුහුණු ආවරණ ආනයන කිරීම් මත ආනයන සීමා බලපත්‍ර පනවමින්, 2021 අංක 08 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2231/16 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී. - ඔක්සිජන් සහ ශ්වසන උපකරණ අපනයන කිරීම් මත සීමා පනවමින්, 2021 අංක 09 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2231/17 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී. - 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින ආනයන භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 10 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2231/18 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2021 ජූලි 31 - බනිජමය හෝ රසායනික පොහොර ආනයනය කිරීම් "ආනයන සීමා බලපත්‍ර" කාණ්ඩය යටතේ සිට "තහනම්" කාණ්ඩය යටතට ගෙන යමින්, 2021 අංක 11 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2238/45 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2021 සැප්තැම්බර් 30 - සුදු ස්ඵටිකකෘත සීනි ආනයනය මත පනවා තිබූ ආනයන සීමා බලපත්‍ර ඉවත් කරමින්, 2021 අංක 12 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2247/12 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2021 නොවැම්බර් 03 - සහල් ආනයනය මත පනවා තිබූ තාවකාලික අත්හිටුවීම ඉවත් කරමින්, 2021 අංක 14 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2252/30 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2021 නොවැම්බර් 30 - 2021 අංක 15 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2256/23 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරමින්,

- රසායනික පොහොර, පළිබෝධනාශක සහ වල්නාශක ආනයනය මත පනවා තිබූ ආනයන සීමා ඉවත් කරන ලදී.
- ගුවන් විදුලි මග පෙන්වීමේ ආධාරක උපකරණ මත ආනයන සීමා බලපත්‍ර පනවන ලදී.
- ග්ලයිෆොසේට් ආනයනය තහනම් කරන ලදී.

2022 ජනවාරි 12 - 2022 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2262/18 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරමින්,

- බාස්මතී සහල් ආනයන මත පනවා තිබූ තාවකාලික අත්හිටුවීම ඉවත් කරන ලදී.
- කටු ගැලවූ මසුන් ආනයන මත පනවා තිබූ ආනයන සීමා නව සංයෝජිත වර්ගීකරණ (HS) කේතවලට අනුව අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

2022 මාර්තු 09 - ආනයන සීමා බලපත්‍රයක් මත ආනයනය කළ යුතු භාණ්ඩ ලැයිස්තුවක් දක්වමින්, 2022 අංක 05 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (අංක 2270/18 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

මිල සංශෝධන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අයිතම කිහිපයක් සඳහා පනවන ලද උපරිම සිල්ලර මිල ගණන් පහත පරිදි සංශෝධනය කරන ලදී.

දිනය	අයිතමය	සංශෝධනය
2021.02.08	සුදු සීනි, වියළි මිරිස් (කුඩු නොකළ හෝ නොඇඹරූ), අර්තාපල් (ආනයනික), කීරි සම්බා	උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කරන ලදී.
2021.06.18	පොල් (වට ප්‍රමාණය අඟල් 13ට වැඩි, වට ප්‍රමාණය අඟල් 12-13 අතර, වට ප්‍රමාණය අඟල් 12ට අඩු)	උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කරන ලදී.
2021.07.25	ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව අඩංගු ලීටර් 18 (කිලෝ ග්‍රෑම් 9.6) ගෑස් සිලින්ඩර	දිස්ත්‍රික්ක මත පදනම්ව උපරිම සිල්ලර මිල ගණන් පනවන ලදී.
2021.08.12	පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව (PCR)	එක් පරීක්ෂණයක් හා වාර්තාවක් සඳහා රුපියල් 6,500ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී.
	ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂණය (RAT)	එක් පරීක්ෂණයක් හා වාර්තාවක් සඳහා රුපියල් 2,000ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී.
2021.08.19	තෝරා ගත් ඖෂධ සහ වෛද්‍ය උපාංග	උපරිම සිල්ලර මිල ගණන් ඉහළ නංවන ලදී.
2021.09.02	සුදු සීනි	ආනයනකරු විසින් විකිණිය යුතු උපරිම තොග මිල කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 116කි.
	සුදු සීනි (ඇසුරුම් නොකළ)	කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 122ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී.
	සුදු සීනි (ඇසුරුම් කළ)	කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 125ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී.
	දුඹුරු හෝ රතු සීනි (ඇසුරුම් නොකළ)	කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 125ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී.

දිනය	අයිතමය	සංශෝධනය
2021.09.02	දුඹුරු හෝ රතු සීනි (ඇසුරුම් කළ)	කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 128ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී.
	කීරි සම්බා	කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 120ක සිට රුපියල් 125ක් දක්වා ඉහළ නංවන ලදී.
	සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (සූදුරු සම්බා හැර)	කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 98ක සිට රුපියල් 103ක් දක්වා ඉහළ නංවන ලදී.
	සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (මොට්ටෙයිකරුපන් සහ අට්ටික්කාරි හැර)	කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 96ක සිට රුපියල් 98ක් දක්වා ඉහළ නංවන ලදී.
	සුදු/රතු කැකුළු සහල්	කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 93ක සිට රුපියල් 95ක් දක්වා ඉහළ නංවන ලදී.
2021.09.04	ෆින්ගර් ටිප් පල්ස් ඔක්සිමීටරය	ඒකකයකට රුපියල් 3,000ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී.
2021.09.29	කීරි සම්බා, සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (සූදුරු සම්බා හැර), සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (මොට්ටෙයිකරුපන් හා අට්ටික්කාරි හැර), සුදු/රතු කැකුළු සහල් සහ සුදු/රතු කැකුළු සම්බා	උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කරන ලදී.
2021.10.08	කිරි පිටි (සම්පූර්ණ යොදය සහිත කිරි පිටි, යොදය රහිත කිරි පිටි සහ ළදරු කිරි පිටි), සිමෙන්ති, ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව සහ තිරිඟු පිටි	උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කරන ලදී.
2021.11.03	මයිසූර් පරිප්පු, වියළි හාල්මැස්සන් (තායිලන්තයෙන් සහ ඩුබායි යන රටවලින් ආනයනය කරන ලද), කඩල, මුං ඇට, ටින් කළ මාළු (ආනයනික), සුදු සීනි, තිරිඟු පිටි, සම්පූර්ණ යොදය සහිත කිරිපිටි (ආනයනික සහ දේශීය - ග්‍රෑම් 400 සහ කිලෝග්‍රෑම් 1), අධි ශීත කළ හෝ ශීත කළ බ්‍රොයිලර් කුකුළු මස් (සම්පූර්ණ කුකුළා - සම සහිත හෝ සම රහිත), අර්තාපල් (ආනයනික), බොම්බයි ළූණු (ආනයනික), වියළි මිරිස් (කුඩු නොකළ හෝ නොඇඹරූ), කරවල (කට්ටා සහ සාලයා), සස්ටජන් (ග්‍රෑම් 400), උම්බලකඩ, පොල්, බ්‍රොයිලර් කුකුළු මස් (සම්පූර්ණ කුකුළා - සම සහිත හෝ රහිත), බඩ ඉරිඟු (ඕනෑම කාර්යයක් සඳහා භාවිත කරන), ටින් කළ මාළු, දුඹුරු සීනි හෝ රතු සීනි	උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කරන ලදී.
2022.01.28	දේශීයව ඇසුරුම් කළ/බෝතල් කළ පානීය ජලය	උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කරන ලදී.
2022.02.28	පැරසිටමෝල් පෙති/කරල් (මි.ග්‍රෑ. 500)	පෙත්තක්/ කරලක් සඳහා වන උපරිම සිල්ලර මිල රුපියල් 1.71ක සිට රුපියල් 2.30ක් දක්වා ඉහළ නංවන ලදී.
2022.03.15	පැරසිටමෝල් පෙති/කරල් (මි.ග්‍රෑ. 500) ඇතුළුව තෝරා ගත් ඖෂධ	උපරිම සිල්ලර මිල ගණන් ඉහළ නංවන ලදී.

බදු සංශෝධන

ආදායම් බදු

2021 මැයි 13 - ප්‍රධාන වශයෙන් ම, 2020 වසරේ නොවැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කළ අයවැය යෝජනා සහ 2020 වසරේ ජනවාරි මාසයේ දී සහ 2021 වසරේ අප්‍රේල් මාසයේ දී සිදු කළ අනෙකුත් නිවේදන නීතිගත කිරීම සඳහා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත, 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලදී.

2021 ජූනි 29 - 2020 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යටතේ ආදායම් බදුවලින් නිදහස් වන තොරතුරු තාක්ෂණ සහ සක්‍රීය සේවා නියම කිරීමට අංක 2234/6 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

බදු විරාම

2021 අප්‍රේල් 01 - පහත සඳහන් නව ව්‍යාපාරවලින් උපයා ගන්නා ලද හෝ උපචිත වන ලැබීම් හා ලාභ (ප්‍රාග්ධන ලාභ හැර) සඳහා වසර දෙකක ක්‍රියාත්මක කිරීමේ කාලයට යටත්ව බදු විරාම ලබා දෙන ලදී.

- ඉදිකිරීම් කර්මාන්තයේ දී භාවිතා කරන ලද ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ස්ථාපිත වෙනම තෝරාගත් වැඩබිමක ප්‍රතිචක්‍රීකරණය කරන ලද ඉදිකිරීම් ද්‍රව්‍ය විකුණනු ලබන ව්‍යාපාරයක් වසර දහයකට බදුවලින් නිදහස් කිරීම.
- තාක්ෂණික සහ වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව (TVET) සංකල්පය යටතේ ප්‍රමිතිගත කර ඇති සහ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියාමනය කරන ඕනෑම ආයතනයක් මගින් වෘත්තීය අධ්‍යාපනය සාර්ථකව නිම කළ පුද්ගලයකු විසින්, 2021 අප්‍රේල් 01 දින හෝ එදිනෙන් පසුව ආරම්භ කරන ලද ඕනෑම ව්‍යාපාරයක් පස් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා බදුවලින් නිදහස් කිරීම.
- නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද බෝට්ටු හෝ නැව් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයකින්, බෝට්ටු හෝ නැව් සැපයීම මගින් ලැබූ හෝ උපයන ලද ඕනෑම ලැබීම් හෝ ලාභ, සත් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා බදුවලින් නිදහස් කිරීම.
- මෙගා වොට් සියයකට නොඅඩු ධාරිතාවයකින් බලශක්තිය නිපදවීමට හැකි ඕනෑම පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතියක් මගින් ජාතික විදුලිබල පද්ධතියට බලශක්තිය සපයනු ලබන්නේ නම්, එවැනි ව්‍යාපෘති සත් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා බදුවලින් නිදහස් කිරීම.
- 2021 ජනවාරි 01 දින හෝ ඉන්පසුව ඕනෑම හෝ වාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවේ දේශීය ශ්‍රමිකයන් සහ අමුද්‍රව්‍ය භාවිතා කරමින් සන්නිවේදන කුළුණු සහ ඒ හා සම්බන්ධ උපකරණ ඉදිකිරීම සහ සවිකිරීම හෝ එවැනි ඉදිකිරීම් හා සවිකිරීම් සඳහා අවැසි තාක්ෂණ සේවා සපයන ඕනෑම ව්‍යාපාරයක්, පස් අවුරුදු කාලපරිච්ඡේදයක් සඳහා බදුවලින් නිදහස් කිරීම.

ආදායම් බදු නිදහස් කිරීම්

2021 අප්‍රේල් 01 - 2021 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් දෑ සඳහා ආදායම් බදු නිදහස් කිරීම් ලබා දී ඇත.

- කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මගින් බලපත්‍ර ලබා දී ඇති ශ්‍රී ලංකා දේපළ වෙළඳාම් ආයෝජන භාරයකට, යම් තැනැත්තෙකු ඉඩම් හෝ ගොඩනැගිලි විකිණීම, හුවමාරු කිරීම හෝ පැවරීම මගින් උපයන ලාභ.
- කොටස්කරුවෙකු විසින් ඕනෑම ශ්‍රී ලංකා දේපළ වෙළඳාම් ආයෝජන භාරයක සිදු කරන ආයෝජනයකින් හෝ ව්‍යාපාරයක ප්‍රාග්ධන වත්කම් මගින් උපයන ලාභාංශ සහ ලැබීම්.
- ඕනෑම සුභසාධක සංගමයක් (සාමාජිකයන්ගේ ඉතුරුම් ප්‍රවර්ධනය කරනු ලබන යහසාධක අරමුදල් ඇතුළුව) මගින් උපයන ලද පොලිය.
- කිසියම් තක්සේරු වර්ෂයක ආනයන වියදම ආවරණය කර ගැනීම සඳහා ඕනෑම දේශීය බැංකුවක විදේශ මුදලින් විවෘත කළ සහ පවත්වා ගෙන යන තැන්පතු මගින් බහුජාතික සමාගමක් විසින් උපයන ලද පොලිය.
- සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපනය කර ඇති ඕනෑම සමෘද්ධි ප්‍රජාපාදක බැංකුවක් විසින් රජයේ සුරැකුම්පත් මගින් උපයනු ලබන පොලිය හෝ වට්ටම.

- 2021 අප්‍රේල් 01 දින හෝ ඉන්පසුව ශ්‍රී ලංකා රජය විසින් හෝ රජය වෙනුවෙන් නිකුත් කළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල එ.ජ. ඩොලර් මිලියන 100කට නොඅඩු සමුච්චිත ආයෝජනයක් සිදු කළ වාණිජ බැංකුවක් හෝ බලයලත් ගනුදෙනුකරුවෙකු එමගින් උපයන ලැබීම්.
- රත්‍රන්, මැණික් හෝ ස්වර්ණාභරණ අපනයනය කරන ඕනෑම ව්‍යාපාරයක් හෝ ශ්‍රී ලංකාවට මැණික් ගෙන්වා කපා ඔප මට්ටම් කිරීමෙන් පසු, එසේ කපා ඔප මට්ටම් කළ මැණික් අපනයනය කිරීමේ ව්‍යාපාර, විදේශ මුදලින් උපයන ලාභ සහ එම ලාභ ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා ප්‍රේෂණය වන්නේ නම්, එමගින් උපයන ලාභ.
- TVET සංකල්පය යටතේ ප්‍රමිතිගත සහ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියාමනය කරනු ලබන ඕනෑම වෘත්තීය අධ්‍යාපන ආයතනයක් විසින් කිසියම් තක්සේරු වර්ෂයකදී පෙර වර්ෂයට සාපේක්ෂව සිසුන් බඳවා ගැනීම දෙගුණයක් කර ඇත්නම්, එකී ආයතනය විසින් උපයන ලද හෝ ඉපැයූ ලැබීම් සහ ලාභ. මෙම නිදහස් කිරීම අවුරුදු පහක කාලපරිච්ඡේදයක් සඳහා අදාළ වේ.
- ස්ථිරව ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ආයතනයක් හරහා ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු සිදුකරන අනේවාසික සමාගමක් විසින් තම ව්‍යාපාරය පුළුල් කිරීමට හෝ කොළඹ කොටස් වෙළඳපොළෙන් කොටස් හෝ සුරැකුම්පත් අත්කර ගැනීමට හෝ භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර හෝ ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර අත්කර ගැනීමට, එලෙස උපයා ගත් ලාභ අවම වශයෙන් වසර තුනක කාලපරිච්ඡේදයක් සඳහා ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සිදු කළ නිර්වාසික සමාගමක් විසින් ප්‍රේෂණ බදුවලින් (ප්‍රේෂණ ලාභ මත සියයට 14ක අනුපාතයෙන්) නිදහස් කෙරේ. මෙම බදු නිදහස් කිරීම වසර තුනක කාලපරිච්ඡේදයක් සඳහා අදාළ වේ.

එකතු කළ අගය මත බදු

2021 පෙබරවාරි 01 - 2021 වසරේ ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත අපනයනය පදනම් කර ගත් සමාගම් විසින් ඇතැම් ඇගලුම් (සංයෝජිත වර්ගීකරණ (HS) කේත අංක අඩංගු පරිච්ඡේද අංක 61, 62 සහ 63 යටතේ වර්ගීකරණය කරන ලද) දේශීයව විකිණීමේ දී, ඒකක මත පදනම් කර ගත් එකතු කළ අගය මත බදු අනුපාතිකය රුපියල් 100 සිට රුපියල් 25ක් දක්වා අඩු කරන ලදී (දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මහජන දැන්වීම - PN/VAT/2021-01).

2021 මැයි 13 - ප්‍රධාන වශයෙන් ම, 2019 වසරේ දෙසැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතිකය අඩු කිරීම සහ 2020 වසරේ ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව ඉහළ නැංවීම යනාදිය නීතිගත කිරීම සඳහා, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත, 2021 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලදී.

2021 ජූනි 29 - 2021 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, 2021 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යටතේ, එකතු කළ අගය මත බදුවලින් නිදහස් වන තොරතුරු තාක්ෂණ සහ සක්‍රීය සේවා නියම කිරීමට, අංක 2234/7 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

2022 මාර්තු 31 - 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි, මූල්‍ය ආයතන විසින් සපයන මූල්‍ය සේවාවන් මත වන එකතු කළ අගය මත බදු අනුපාතිකය සියයට 15 සිට සියයට 18ක් දක්වා ඉහළ නැංවීම සඳහා සහ ඇතැම් භාණ්ඩ හා සේවා එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීමට 2022 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කරන ලදී.

නිෂ්පාදන/සුරා බදු

2021 ජනවාරි 01 - සංචාරක මණ්ඩලය අනුමත කරනු ලැබූ සහ සංචාරක මණ්ඩල අනුමැතිය රහිත කාමර 5 හෝ ඊට වැඩි හෝටල් බලපත්‍රය (ර.බී.7), හෝටල් පීඨිකා බලපත්‍රය (ර.බී.8), භෝජනාගාර බලපත්‍රය (සංචාරක මණ්ඩලයේ අනුමැතිය සහිත/අනුමැතිය රහිත - ර.බී.11), තානායම් බලපත්‍රය (ර.බී.12) සහ ස්ථානීය පරිභෝජනය (ර.බී.22බී) (සංචාරක මණ්ඩලය විසින් අනුමැතිය සහිත/අනුමැතිය රහිත) සඳහා වාර්ෂික මද්‍යසාර බලපත්‍ර ගාස්තු ඉවත් කරන ලදී (අංක 2208/35 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 ජනවාරි 07 - ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ, ඉන් නිකුත් කරනු ලබන්නා වූ බෝතල් කරන ලද රා ලීටරයක් සඳහා වන සුරා බද්ද රුපියල් 50 සිට රුපියල් 25 දක්වා අඩු කරන ලදී (අංක 2209/42 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 ජනවාරි 11 - තරු 3 සහ තරු 4 හෝටල්, තරු 5 සහ ඊට ඉහළ ගණයේ තරු හෝටල්/බුටික් හෝටල් වැනි හෝටල්, 2021 වසර සඳහා මද්‍යසාර භාවිතයට අය කරනු ලබන ගාස්තුවෙන් නිදහස් කරන ලදී (අංක 2210/2 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 නොවැම්බර් 12 - දේශීය ව නිෂ්පාදනය කරනු ලබන මද්‍යසාර මත අය කරනු ලබන සුරා බදු පහත පරිදි ඉහළ නංවන ලදී (අංක 2253/41 දරන අති විශෙෂ ගැසට් නිවේදනය):

වර්ගය	පෙර පැවති බද්ද 2019.12.03 දින සිට බලපැවැත්වෙන පරිදි (මද්‍යසාර ලීටරයකට රුපියල්)	බදු සංශෝධනය 2021.11.13 සිට බලපැවැත්වෙන පරිදි (මද්‍යසාර ලීටරයකට රුපියල්)
විශේෂ අරක්කු	3,800	4,180
උක්පැණි/ තල්/ පොල් අරක්කු	4,050	4,460
දේශීයව නිපද වූ විදේශීය මද්‍යසාර	4,150	4,570
බියර් (මද්‍යසාර ප්‍රතිශතය සියයට 5ට අඩු)	3,200	3,300
බියර් (මද්‍යසාර ප්‍රතිශතය සියයට 5ට සමාන හෝ ඊට වැඩි)	3,200	3,450
වයින්	3,200	3,300

2022 ජනවාරි 01 - තරු 3 සහ තරු 4 හෝටල්; තරු 5 සහ ඊට ඉහළ ගණයේ තරු හෝටල්/බුටික් හෝටල් වැනි හෝටල්, 2022 මාර්තු 31 වන දින දක්වා මද්‍යසාර භාවිත කිරීම සඳහා අදාළ වන ගාස්තුවෙන් නිදහස් කරන ලදී (අංක 2260/78 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

- සංචාරක මණ්ඩලය අනුමත කරනු ලැබූ සහ සංචාරක මණ්ඩල අනුමැතිය රහිත කාමර 5 හෝ ඊට වැඩි හෝටල් බලපත්‍රය (ර.බී.7), හෝටල් පීඨිකා බලපත්‍රය (ර.බී.8), භෝජනාගාර බලපත්‍රය (සංචාරක මණ්ඩලයේ අනුමැතිය සහිත/අනුමැතිය රහිත - ර.බී.11), තානායම් බලපත්‍රය (ර.බී.12) සහ ස්ථානීය පරිභෝජනය (ර.බී.22බී) (සංචාරක මණ්ඩලය විසින් අනුමැතිය සහිත/අනුමැතිය රහිත), 2022 මාර්තු 31 වන දින දක්වා වාර්ෂික මද්‍යසාර බලපත්‍ර ගාස්තුවලින් නිදහස් කරන ලදී (අංක 2260/79 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන)

2021 අප්‍රේල් 05 - ශ්‍රී ලංකා පොලීසිය අයත් වන රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත, භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව, ශ්‍රී ලංකා පොලීසියට ත්‍රී රෝද රථ 2,000ක් මිල දී ගැනීම, නිෂ්පාදන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2222/2 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

- වාහන නිෂ්පාදනය කිරීමේ/එකලස් කිරීමේ කර්මාන්තය සහ වාහන උපාංග නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටිය ක්‍රියාත්මක කිරීමට සමගාමීව දේශීයව එකලස් කරන ලද/නිෂ්පාදනය කරන ලද මෝටර් රථ හා යතුරු පැදි සඳහා නව බදු ව්‍යුහයක් හඳුන්වා දෙන ලදී (අංක 2222/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 අප්‍රේල් 22 - ජංගම වැඩපළ මෝටර් රථ සඳහා වන නිෂ්පාදන බදු අනුපාතික සංශෝධනය කරන ලදී (අංක 2224/24 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 අගෝස්තු 03 - ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත, භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව, අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය වතුර බවුසර් 52ක් සහ ඩබල් කැබ් රථ 62ක් ආනයනය කිරීම, නිෂ්පාදන බද්දෙන් නිදහස් කරන ලදී. (අංක 2239/16 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 නොවැම්බර් 12 - දුම්වැටි මත පනවා ඇති නිෂ්පාදන බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී (අංක 2253/42 දරන අති විශේෂ ගැසට් නිවේදනය):

වර්ගය	පෙර පැවති බද්ද 2019.12.01 සිට බලපැවැත්වෙන පරිදි (දුම්වැටි 1,000ට රුපියල්)	බදු සංශෝධනය 2021.11.13 සිට බලපැවැත්වෙන පරිදි (දුම්වැටි 1,000ට රුපියල්)
< මි.මී. 60	13,360	6,750
මි.මී. 60 - මි.මී. 67	22,300	28,850
මි.මී. 67 - මි.මී. 72	37,650	41,100
මි.මී. 72 - මි.මී. 84	43,100	46,600
> මි.මී. 84	48,350	51,800

ආනයන තීරු බදු

පෙට්‍රල් හා ඩීසල් ආනයනය සඳහා වන ආනයන තීරු බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

අයිතමය	දිනය	ආනයන තීරු බද්ද (ලීටරයට රුපියල්)	ආනයන තීරු බදු සහනය (ලීටරයට රුපියල්)	අදාළ තීරු බද්ද (ලීටරයට රුපියල්)
පෙට්‍රල් (92 ඔක්ටේන්)	2020.12.31	50.00	18.00	32.00
	2021.02.02	50.00	29.00	21.00
	2021.03.25	50.00	45.00	5.00
පෙට්‍රල් (95 ඔක්ටේන්)	2020.12.31	50.00	16.00	34.00
	2021.02.02	50.00	8.00	42.00
	2021.03.25	50.00	24.00	26.00
සුදු ඩීසල්	2020.12.31	25.00	20.00	5.00
	2021.02.02	25.00	14.00	11.00
	2021.03.25	25.00	25.00	0.00
සුපිරි ඩීසල්	2020.12.31	25.00	15.00	10.00
	2021.02.02	25.00	-	25.00
	2021.03.25	25.00	10.00	15.00

සටහන: 2020 වසරේ නොවැම්බර් 24 වන දින සිට මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි පනවන ලද අධිභාරය 2021 වසරේ පෙබරවාරි 02 වන දින ඉවත් කරන ලදී.

2021 අගෝස්තු 11 - කිරිපිටි ආනයනය කිරීම මත පනවන ලද ආනයන තීරු බදු සහනය කිලෝග්‍රෑමයට රුපියල් 210 සිට රුපියල් 15 දක්වා අඩු කරන ලදී (ශ්‍රී ලංකා රේගු වෙබ් අඩවියේ රේගු තීරු බදු සහ බදු සංශෝධන - TIP/TP/01/47 (2 වන වෙළුම)).

සෙස් බද්ද

2021 ජනවාරි 12 - ආනයනික අමුද්‍රව්‍ය යොදා ගනිමින් අපනයනය සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරන, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත සහ රේගු බන්ධිත ගුදම් තුළ වන නිෂ්පාදන වැඩපිළිවෙළ (Customs Manufacture-in-Bond Scheme) හෝ අපනයන සඳහා තාවකාලික අපනයන වැඩපිළිවෙළ (Temporary Importation for Export Processing (TIEP) Scheme) යටතේ ලියාපදිංචි වී ඇති ව්‍යවසායයන් විසින් එම අපනයන භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියෙන් සහ අලුත්වැඩියා/නඩත්තු ක්‍රියාවලිය තුළින් ජනිත වන සුන්බුන්/ඉවතලන දෑ අපනයනය කිරීම, සෙස් බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2210/09 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 මාර්තු 15	- පිඟන් ගඩොල් සහ සනීපාරක්ෂක භාණ්ඩ ආනයනය මත වන සෙස් බද්ද සංශෝධනය කරන ලදී (අංක 2219/15 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021 මාර්තු 17	- 2019 වසරේ මාර්තු 06 දින හෝ එදිනට පසුව සෑම අදියරකදීම එ.ජ. ඩොලර් මිලියන 50ක් හෝ ඊට වැඩි මුදලක් ව්‍යාපෘතියක් මත ආයෝජන කරන, ඕනෑම ව්‍යවසායයක් සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් මගින් එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාල සීමාව හෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අතරතුර නමුත් වාණිජ කටයුතු ආරම්භ කිරීමට පෙර, ආනයනය කරනු ලබන ඕනෑම භාණ්ඩයක් සෙස් බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2219/36 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2022 ජනවාරි 11	- සහල්, ධීවර නිෂ්පාදන සහ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව හා ආශ්‍රිත උපාංගවලට අදාළ නව සංයෝජිත වර්ගීකරණ කේත හා අනුරූපීව, පවතින සෙස් බද්ද දීර්ඝ කරන ලදී (අංක 2262/20 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද

ආනයනික භාණ්ඩ කිහිපයක් සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

දිනය	අදාළ අයිතමය	සංශෝධනය
2021.01.13	බොම්බයි ළූණු, රතු සහ කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ) සහ සීනි	මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2210/16 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.01.18	පෙරහන් ගාන ලද හෝ පිටි කරන ලද කේපු, කොත්තමල්ලි බීජ, කහ (කුඩු නොකළ හෝ නොඇඹරූ සහ අනෙකුත්) සහ උඳු පිටි	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2211/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.02.11	හාල්මැස්සන්	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියලේ සිට කිලෝග්‍රෑමයට රුපියල් 100ක් දක්වා ඉහළ නංවන ලදී (අංක 2214/58 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
	කරවල සහ අර්තාපල්	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඩු කරන ලදී (අංක 2214/58 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.03.03	මැකරල්, ජැක් හෝ හෝස් මැකරල් මාළු, උඳු, කව්පි, මෙනේරි සහ කුරක්කන්	වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2217/23 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.04.13	බොම්බයි ළූණු, රතු සහ කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ) සහ සීනි	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2223/2 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.04.26	මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත), උම්බලකඩ, මුං ඇට (මුං), මැංගුස්ටීන් (අලුත් සහ වියළි) සහ කිවි ෆෘට්	වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2225/1 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.04.27	දිසිඳි පොල්	මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 300ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී (අංක 2225/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
		කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත, මසකට මෙට්‍රික් ටොන් 13,000ක උපරිමයකට යටත්ව, රජයට අයත් බී.සී.සී. ලංකා ලිමිටඩ් ආයතනය විසින් දිසිඳි පොල් ආනයනය කිරීමේදී, ඒ සඳහා අදාළ වන කිලෝග්‍රෑමයට රුපියල් 300ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයට රුපියල් 1ක් අය කරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි මාස තුනක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2225/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
	අර්තාපල්	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 50 දක්වා ඉහළ නංවන ලදී (අංක 2225/13 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

දිනය	අදාළ අයිතමය	සංශෝධනය
2021.05.17	යෝගට්, රතු ළූණු, සුදු ළූණු, කොණ්ඩ කඩල (සම්පූර්ණ සහ පියලි කළ), කඩල (සම්පූර්ණ සහ පියලි කළ), රට ඉඳි (අලුත් සහ වියළි), දොඩම් (අලුත් සහ වියළි), ලෙමන් (අලුත් සහ වියළි), මිදි (අලුත් සහ වියළි), ඇපල්, ක්වීන්සස්, මිරිස් (වියළි, කුඩු නොකළ), මිරිස් (කුඩු කළ හෝ ඇඹරූ), සූදුරු බීජ, මහදුරු බීජ, බඩ ඉරිඟු, රට කජු (පොතු හරින ලද), මාජරින්, ටින් මාළු සහ මුහුණු ආවරණ	වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2228/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.06.14	ක්ලෙමන්ටයින් (අලුත් සහ වියළි), මහසිදරන්, පොමෙලොස් ඇතුළුව (අලුත් සහ වියළි), පෙයාර්ස්, ඇප්‍රිකොට්, ඇඹුල් චෙරීස් (ප්‍රරූනුස් සෙරාසස්), චෙරීස් (අනෙකුත්), පීචස් (නෙක්ටාරීන් ඇතුළුව), ප්ලම්ස් සහ ස්ලෝස්, එළවළු තෙල් හා පොල්තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් සහ මාජරින් (අනෙකුත්)	වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2232/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.07.18	පෙරහන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු, කොත්තමල්ලි, කහ (කුඩු නොකළ හෝ නොඇඹරූ හා අනෙකුත්) සහ උඳු පිටි	වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2236/66 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.08.11	හාල්මැස්සන්, කරවල, වෙඩරු, කිරිවලින් නිපද වූ තැවරුම්, උළුහාල්, කුරක්කන් පිටි, අබ ඇට සහ ලුණු	වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2240/20 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
	ලුණු	ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව, ජාතික ඖෂධ නියාමන අධිකාරිය යටතේ ලියාපදිංචි, වාණිජ පරමාර්ථයෙන් තොරව ඖෂධ නිෂ්පාදනය කරන ඕනෑම ඖෂධ නිෂ්පාදන ආයතනයක් විසින් ලුණු ආනයනය කිරීමේ දී, ලුණු ආනයනය සඳහා අදාළ වන කිලෝග්‍රෑමයට රුපියල් 40ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන්, කිලෝග්‍රෑමයට රුපියල් 10ක් අය කරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි වසරක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2240/20 දරන අති විශේෂ ගැසට් නිවේදනය).
2021.09.07	බොම්බයි ළූණු	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට ශත 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා ඉහළ නංවන ලදී (අංක 2244/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.10.11	සහල්	මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 65ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී (අංක 2249/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
		වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව, සී/ස රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් සහල් ආනයනය කිරීමේ දී, සහල් ආනයනය සඳහා අදාළ වන රුපියල් 65ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයට ශත 25ක් අය කරගෙන, ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි මාස හතරක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2249/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

දිනය	අදාළ අයිතමය	සංශෝධනය
2021.10.13	අර්තාපල්, රතු සහ කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ) සහ සීනි	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2249/16 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.11.02	සහල්	සහල් සඳහා අදාළ වන කිලෝග්‍රෑමයට රුපියල් 65ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයට ශත 25ක් අය කරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි මාස හයක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2252/25 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
	බඩඉරිඟු	මෙට්‍රික් ටොන් 2,000ක උපරිමයකට යටත්ව, රජයට අයත් ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය විසින් ත්‍රිපෝෂ නිෂ්පාදනය සඳහා බඩඉරිඟු ආනයනය කිරීමේදී, ඒ සඳහා අදාළ වන කිලෝග්‍රෑමයට රුපියල් 25ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයට රුපියල් 1ක් අය කරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි මාසයක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2252/9 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.11.23	දිසිඳි පොල්	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2255/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
		කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව, රජයට අයත් බී.සී.සී. ලංකා ලිමිටඩ් ආයතනය විසින් දිසිඳි පොල් ආනයනය කිරීමේ දී, ඒ සඳහා අදාළ වන කිලෝග්‍රෑමයට රුපියල් 300ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයට රුපියල් 1ක් අය කරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි මාස හයක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2255/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.12.21	බඩඉරිඟු	සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අනුමැතිය/නිර්දේශ ලබා ගෙන ඇති සත්ත්ව ආහාර නිෂ්පාදකයින් සඳහා "සත්ත්ව ආහාර" නිෂ්පාදනයට අවශ්‍ය කරන බඩ ඉරිඟු උපරිම වශයෙන් මෙට්‍රික් ටොන් 40,000ක ප්‍රමාණයක් ආනයනය කිරීමේ දී, ඒ සඳහා අදාළ වන කිලෝග්‍රෑමයට රුපියල් 25ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයට රුපියල් 10ක් අය කරගෙන ඉතිරි වටිනාකම අත් හැරීමට හැකි වන පරිදි මාස හයක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2259/9 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021.12.31	අර්තාපල් සහ බොම්බයි ළූණු	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි අර්තාපල් ආනයනය මත වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 50 සිට කිලෝග්‍රෑමයට රුපියල් 20 දක්වා අඩු කරන ලද අතර, බොම්බායි ළූණු ආනයනය සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 40 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10 දක්වා අඩු කරන ලදී (අංක 2260/72 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2022.01.11	සහල් සහ සීනි	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2262/15 දරන අති විශේෂ ගැසට් නිවේදනය).

දිනය	අදාළ අයිතමය	සංශෝධනය
2022.03.03	බඩඉරිඟු	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 10ක් දක්වා අඩු කරන ලදී (අංක 2269/48 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
		"ත්‍රිපෝෂ" නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකා ත්‍රිපෝෂ ලිමිටඩ් ආයතනය විසින් බඩඉරිඟු ආනයනය කිරීමේදී, ඒ සඳහා අදාළ වන කිලෝග්‍රෑමයට රුපියල් 10ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයට රුපියලක් අය කරගෙන, ඉතිරි වටිනාකම, අත් හැරීමට හැකි වන පරිදි මාස හයක කාලයක් සඳහා බදු සහනයක් ලබා දෙන ලදී (අංක 2269/48 දරන අති විශේෂ ගැසට් නිවේදනය).
	ඉදල් ඉරිඟු (අනෙකුත්)	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි රුපියල් 10ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී (අංක 2269/48 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
	මැකරල්, උළු, කව්පි සහ කුරක්කන්	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2269/56 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2022.03.09	යෝගට්, බටර්, කිරිවලින් නිපදවූ තැවරුම්, පෙරහන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු, රට ඉඳි (අලුත් සහ වියළි), දොඩම් (අලුත්), මිදි (අලුත් සහ වියළි) සහ ඇපල්	මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ නංවන ලදී (අංක 2270/19 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද

2021 පෙබරවාරි 22 - සීනි හෝ වෙනත් රසකාරක එක් කරන ලද හෝ සාන්ද්‍ර කරන ලද කිරි සහ යොදය (සංයෝජිත වර්ගීකරණ (HS) කේත අංක 0402.10.00, 0402.21.00, 0402.29.00 යටතේ එන නිෂ්පාදන) මත පැන වූ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 10 සිට සියයට 2.5ක් දක්වා අඩු කරන ලදී (අංක 2216/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 මාර්තු 09 - 2008 අංක 14 දරන ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනත සහ වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග යටතේ අනුමත වූ ඕනෑම ව්‍යාපෘතියක් හැරුණු කොට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ ඇති, සෑම අදියරදීකම එ.ජ. ඩොලර් මිලියන 50කට නොඅඩු ප්‍රාග්ධන ආයෝජනයක් සිදු කරන ව්‍යාපාර විසින් ඕනෑම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන අතර හෝ වාණිජ කටයුතු ආරම්භ කිරීමට පෙර, එම ව්‍යාපෘතීන්ට අදාළව ආනයනය කරනු ලබන ප්‍රාග්ධන භාණ්ඩ, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2218/51 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 මාර්තු 19 - රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව, ඛනිජ තෙල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත, විශේෂයෙන් තාර නිෂ්පාදනය සඳහා ලංකා ඛනිජ තෙල් සංස්ථාව විසින් ආනයනය කරන ලද උඳුන් තෙල්, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2219/68 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 අප්‍රේල් 19 - ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු මෙට්‍රික් ටොන් එකක මිල එ.ජ. ඩොලර් 325ට ළඟා වන තෙක්, ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු සඳහා වන සියයට 7.5ක වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද, සියයට 7.5ක් හෝ මෙට්‍රික් ටොන් එකකට රුපියල් 2,000 යන දෙකෙන් වඩා අඩු අගය ලෙස, සංශෝධනය කරන ලදී (අංක 2224/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 ජූනි 11 - අමු හෝ බදින ලද, සම්පූර්ණයෙන් හෝ කැබලි කළ කොකෝවා ඇට සඳහා වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 10 සිට සියයට 5 දක්වා අඩු කරන ලදී (අංක 2231/19 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 අගෝස්තු 11 - සීනි හෝ වෙනත් රසකාරක එක් කරන ලද හෝ සාන්ද්‍ර කරන ලද කිරි සහ යොදය (සංයෝජිත වර්ගීකරණ (HS) කේත අංක 0402.10.00, 0402.21.00 සහ 0402.29.00 යටතේ එන නිෂ්පාදන) වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2240/21 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2022 ජනවාරි 06 - සෞඛ්‍ය විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිර්දේශ කර, මුදල් විෂය පවරා ඇති අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද පරිදි, යම් වසංගත තත්ත්වයක් හෝ මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් වන හදිසි තත්ත්වයක් හමුවේ කටයුතු කිරීමට සෞඛ්‍ය සේවා සැපයීම සඳහා අවශ්‍ය වන්නා වූ ද, යම් රජයේ රෝහලකට හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයට ප්‍රදාන කරන ලද්දා වූ ද, වෛද්‍ය උපකරණ, යන්ත්‍ර සූත්‍ර, තාක්ෂණික උපකරණ, උපාංග සහ ඒවායේ කොටස්, රෝහල් ගෘහ භාණ්ඩ, ඖෂධ සහ රසායනික ද්‍රව්‍ය වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2261/58 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2022 ජනවාරි 11 - නව සංයෝජිත වර්ගීකරණ (HS) අනු අංශ යටතේ අයිතම කිහිපයක් සඳහා නිදහස් කිරීම් සහ සහනදායී අනුපාතික ලබා දෙන ලදී (අංක 2262/19 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

අනෙකුත් බදු සහ අයබදු[3]

2021 ජනවාරි 05 - පාර්ලිමේන්තු කටයුතු විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ 8 වන පාර්ලිමේන්තුවේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් ආනයනය කරන ලද මෝටර් රථයක් සුඛෝපභෝගී බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2209/23 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 පෙබරවාරි 09 - විදේශීය ටෙලි නාට්‍ය සහ චිත්‍රපට විකාශය මත ටෙලි නාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද නැවතත් පනවන ලදී (අංක 2214/25 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 මැයි 10 - මාසයක කාලයක් සඳහා විදේශීය වාණිජ වැඩසටහන් විකාශනය වෙනුවෙන් නිෂ්කාශන සහතිකයක් ලබා ගැනීම සඳහා විධිවිධානයක් හඳුන්වා දෙන ලදී (අංක 2227/2 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

කාලය	පැවති බද්ද 2017.11.08 වන දින සිට බලපැවැත්වෙන පරිදි (රුපියල්)	සංශෝධිත බද්ද 2021.05.11 වන දින සිට බලපැවැත්වෙන පරිදි (රුපියල්)
යම් බලපත්‍රලාභී ආයතනයක් විසින් යම් වාර ගණනක් විකාශය කිරීම සඳහා,		
• නිෂ්කාශන සහතිකයේ සඳහන් දින සිට දින 30ක කාලපරිච්ඡේදයක් සඳහා	-	100,000
• නිෂ්කාශන සහතිකයේ සඳහන් දින සිට දින 183ක කාලපරිච්ඡේදයක් සඳහා	500,000	500,000
• නිෂ්කාශන සහතිකයේ සඳහන් දින සිට දින 365ක කාලපරිච්ඡේදයක් සඳහා	1,000,000	1,000,000

2021 සැප්තැම්බර් 15 - ඇතැම් නීති යටතේ හෙළිදරව් කිරීමට නියම කරන ලද, හෙළිදරව් නොකළ, බදු අය කළ හැකි සැපයුම්, ආදායම් සහ වත්කම් පිළිබඳව ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීමට පුද්ගලයන්ට ඉඩ ලබා දීම සඳහාත්, එලෙස ස්වේච්ඡාවෙන් හෙළිදරව් කළ සැපයුම්, ආදායම් සහ වත්කම් මත බද්දක් පැනවීම සඳහාත්, 2021 අංක 18 දරන මුදල් පනත බලාත්මක කරන ලදී.

2022 ජනවාරි 20 - මද්‍යසාර, දුම්වැටි, මෝටර් වාහන (වාහන එකලස් කිරීම සඳහා අමතර කොටස් ඇතුළුව), විදුලි සංදේශ, ඔට්ටු හා සූදු මත පවතින බදු (බදු, තීරු බදු, අය බදු, සෙස් බද්ද හෝ අය කරන ලද වෙනත් ඕනෑම ගාස්තුවක්) වෙනුවට සංයුක්ත බද්දක් ලෙස විශේෂ භාණ්ඩ සහ සේවා බද්දක් පැනවීම සඳහා පාර්ලිමේන්තුව වෙත පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන ලදී.

2022 අප්‍රේල් 08 - 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලබන, 2020 අප්‍රේල් මස 01 දිනෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, බදු අය කළ හැකි ආදායම රුපියල් බිලියන 2ක් ඉක්මවනු ලබන යම් පුද්ගලයෙකුගේ, හවුල් ව්‍යාපාරයක හෝ සමාගමක, බදු අය කළ හැකි ආදායම මත අතීතයට බලපාන, එක් වරක් පමණක් අය කරන සියයට 25ක අධිභාර බද්දක් පැනවීම සඳහා 2022 අංක 14 දරන අධිභාර බද්ද පනත බලාත්මක කරන ලදී.

අනෙකුත්

2021 ජනවාරි 05 - හම්බන්තොට ආරබොක්ක ප්‍රදේශයේ ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහාම වෙන් කළ කලාපයක් පිහිටුවීම (අංක 2209/22 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 මාර්තු 04 - "උසස් ජීවන තත්ත්වයක් උදෙසා ගුණාත්මක අන්තර්ගතභාවයක්" යන දැක්මෙන් යුතුව ශ්‍රී ලංකාව සඳහා වන මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ප්‍රථම ජාතික උපායමාර්ගය එළිදක්වන ලදී.

3 2021 ජනවාරි 01 දින සිට 2022 අප්‍රේල් 08 දක්වා ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇතුළත් වේ

2021 මාර්තු 05	- 'සිලෝන් ටයර් මැනුෆැක්චරින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්' පිහිටුවීමට අදාළ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම (අංක 2217/40 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021 මාර්තු 23	- කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය (CIFC) මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියට අදාළ තොරතුරු ප්‍රකාශයට පත් කරන ලදී (අංක 2220/30 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021 අප්‍රේල් 19	- ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහාම වෙන් කළ විශේෂිත කලාපය තුළ ඇති එක් එක් ආයතන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ ප්‍රදානය කරනු ලබන දිරිදීමනා නියම කරන ලදී (අංක 2224/2 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021 අප්‍රේල් 20	- රෙදිපිළි නිෂ්පාදනය කිරීම සඳහාම වෙන් කළ විශේෂිත කලාපය තුළ ඇති එක් එක් ආයතන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ ප්‍රදානය කරනු ලබන දිරිදීමනා නියම කරන ලදී (අංක 2224/9 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021 මැයි 21	- විවට වෙළඳපොළ කටයුතු හා නිත්‍ය පහසුකම් සම්බන්ධයෙන් වන 2021 අංක 01 දරන වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස් පිළිබඳ චක්‍රලේඛය සහභාගිත්ව ආයතන වෙත නිකුත් කරන ලදී.
2021 මැයි 24	- 'වෙල්කම් හොටෙල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්' යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දී ඇති කාල සීමාව 2022 වසරේ ජනවාරි මස 01 දින සිට තවදුරටත් මාස 18කින් දීර්ඝ කරන ලදී (අංක 2229/2 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). - 'ඇවික් ඉන්ටර්නැෂනල් හොටෙල්ස් ලංකා ලිමිටඩ්' ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දී ඇති කාල සීමාව 2020 වසරේ මාර්තු මස 25 වන දින සිට තවදුරටත් මාස 19කින් දීර්ඝ කරන ලදී (අංක 2229/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2021 මැයි 27	- කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය සහ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පිහිටු වීම සඳහා 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.
2021 ජූලි 30	- ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘතියක් වශයෙන් කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය යටතේ වූ බටහිර බහාලුම් පර්යන්තය-1 (WCT-1) සංවර්ධනය කිරීමේ සහ මෙහෙයවීමේ ව්‍යාපෘතියට අදාළ නිදහස් කිරීම් සහ කොන්දේසි ඇතුළුව ව්‍යාපෘති තොරතුරු පළ කරන ලදී (අංක 2238/39 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). - රෙදි පිළි නිෂ්පාදනය සඳහාම වෙන් කළ කලාපය තුළ ඇති එක් එක් ව්‍යවසායයන් සඳහා ලබා දුන් බදු නිදහස් කිරීම්/සහන ප්‍රකාශයට පත් කරන ලදී (අංක 2238/40 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).
2022 පෙබරවාරි 01	- ලංකාසෙට්ල් පද්ධතිය මත නිර්ලේඛිත රාජ්‍ය සුරැකුම්පත්වලට එරෙහිව දිනය තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සැපයීම පිළිබඳව සියලුම සෘජු අලෙවි සහභාගීකරුවන් සඳහා 2022 අංක 01 දරන මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.
රාජ්‍ය වියදම	
2021 ජූනි 23	- රුපියල් බිලියන 200ක පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී (අංක 80 දරන පාර්ලිමේන්තු න්‍යාය පත්‍රය).
2021 අගෝස්තු 05	- රුපියල් බිලියන 11.8ක පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී (අංක 89 දරන පාර්ලිමේන්තු න්‍යාය පත්‍රය).
2021 අගෝස්තු 13	- මුදල් අමාත්‍යතුමා විසින් රුපියල් බිලියන 19ක විශේෂ නීති සේවා බලපත්‍රයක් අනුමත කරන ලදී.
2021 අගෝස්තු 16	- ඕනෑම කර්මාන්තයක හෝ සේවාවක නියුතු සේවකයන් සඳහා වන ජාතික අවම මාසික වේතනය රුපියල් 10,000 සිට රුපියල් 12,500ක් දක්වා ඉහළ නැංවීමට සහ ජාතික අවම දෛනික වේතනය රුපියල් 400 සිට රුපියල් 500ක් දක්වා ඉහළ නැංවීම සඳහා 2021 අංක 16 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත මගින් 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය කරන ලදී.
2021 නොවැම්බර් 12	- ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 2,997 සිට රුපියල් බිලියන 3,397 දක්වා රුපියල් බිලියන 400කින් ඉහළ නැංවීම සඳහා 2021 අංක 26 දරන විසර්ජන (සංශෝධන) පනත මගින් 2020 අංක 07 දරන විසර්ජන පනත සංශෝධනය කරන ලදී.
2021 දෙසැම්බර් 10	- 2021 අංක 30 දරන විසර්ජන පනත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.
2022 ජනවාරි 06	- රාජ්‍ය සේවකයන්ගේ අනිවාර්ය විශ්‍රාම ගැනීමේ වයස් සීමාව අවුරුදු 65ක් දක්වා දීර්ඝ කරන ලදී (අංක 02/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය).

2022 ජනවාරි 13	-	2022 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, රාජ්‍ය සේවකයන් සහ විශ්‍රාමික තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ දී සැලකිල්ලට ගනු නොලබන, රුපියල් 5,000ක මාසික දීමනාවක් ලබා දෙන ලදී (අංක 03/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය).
2022 මාර්තු 08	-	විදුලිය සහ ඉන්ධන පරිහරණය අවම කිරීම සඳහා රාජ්‍ය අංශය වෙත මාර්ගෝපදේශ නිකුත් කරන ලදී (අංක 04/2022 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය).

රාජ්‍ය ණය කළමනාකරණය

2021 ජනවාරි 26	-	වෙළඳපොළ යථා තත්ත්වයට පත් ව ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළෙහි අරමුදල් රැස්කිරීම රජයට හිතකර වන තෙක් භාණ්ඩාගාරයට අවශ්‍ය විදේශ අරමුදල් සම්පාදනය කිරීම පහසු කිරීම සඳහා ඇපකර අරමුදල් සම්පාදනය සහ / හෝ විදේශ මුදල් මූලාශ්‍ර තත්ත්වයන් මත ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඍජු නිකුතු ක්‍රමය යටතේ බැංකු සඳහා නිකුත් කිරීමට කටයුතු කරන ලදී.
2021 පෙබරවාරි 03	-	භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි සඳහා පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතිකය දින 364 පරිණත කාලයට පමණක් අදාළ වන පරිදි ප්‍රකාශයට පත් කිරීමට හා දින 91 සහ දින 182 පරිණත කාලයන් සඳහා වන ඵලදා අනුපාතික දින 364 සඳහා තීරණය වන ඵලදා අනුපාතිකයට අනුකූල වන පරිදි තීරණය කරන ලද අතර සියලුම භාණ්ඩාගාර බැඳුම්කර පරිණත කාලයන් සඳහා වෙන්දේසියේ දී පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතික ප්‍රකාශයට පත් කිරීම තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී.
2021 මාර්තු 26	-	ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු පිළිබඳ ක්‍රියාපිළිවෙත් වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම, ගනුදෙනුවල විශ්වසනීයත්වය ඉහළ නැංවීම සහ ආයෝජකයන්ගේ ආරක්ෂාව සහ විශ්වාසය වැඩි කිරීම යන අරමුණු සහිතව ද්විතීයික වෙළඳපොළෙහි සිදුවන සියලුම රජයේ සුරැකුම්පත් ගනුදෙනු, එම ගනුදෙනු සිදු කරන දිනයේම වාර්තා කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව, ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිකරුවන් විසින් සිදු කරන සියලුම ගනුදෙනු, ශ්‍රී ලංකා මහ බැංකුවට වාර්තා කිරීම, 2021 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක විය.
2021 ජූනි 07	-	අක්වෙරළ ණයගැනීම් තුළින් ඇතිවන විදේශ විනිමය අවදානම අඩු කර ගැනීමට, අක්වෙරළ අරමුදල් එහි ශක්‍යතාවයන් මත රැස් කිරීම වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වැනි අරමුදල් සඳහා පහසුකම් සැලසීමේ මාර්ග ඇති කිරීම මගින් පෞද්ගලික අංශය දිරිමත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.
2021 ජූනි 09	-	විදේශයන්ගෙන් ලැබෙන අරමුදල් එ.ජ.ඩොලරයෙන් නාමනය කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර තුළ සමානව බෙදී යන සේ ආයෝජනය කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සඳහා පහසුකම් සැපයීමට කටයුතු කිරීම තුළින් තවදුරටත් විදේශ අරමුදල් රට තුළට ගලා ඒමට අවස්ථාව සැලසීමට කටයුතු කරන ලදී.
2021 ජූනි 14	-	සහතික කළ ණයෙහි උපරිම මට්ටම, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 10 සිට සියයට 15 දක්වා ඉහළ නැංවීමට සහ රජයේ සම්පූර්ණ ණය වගකීම් (පවත්නා විනිමය අනුපාතයට අනුව බාහිර ණය ඇතුළුව) දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 60ට අඩුවෙන් පවත්වාගෙන යාමේ ඉලක්කගත කාලසීමාව 2020 අවසානයේ සිට 2030 අවසානය දක්වා මාරු කිරීමට 2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත, 2021 අංක 12 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලදී.
2021 ජූනි 23	-	භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් පවතින මූල්‍ය සීමාව, රුපියල් බිලියන 2,000 සිට රුපියල් බිලියන 3,000 දක්වා ඉහළ නංවන ලදී (පාර්ලිමේන්තු අංක 80 න්‍යාය පත්‍රය).
2021 ජූලි 08	-	විදේශයක සිටින පුද්ගලයෙකුගෙන් ලබා ගන්නා ලද විදේශ විනිමය ණයවලින් සියයට 50ක් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර තුළ හා ඉතිරි සියයට 50 ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර තුළ ආයෝජනය කිරීමට ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද සමාගම් සඳහා අවසර ලබා දීමට කටයුතු කරන ලදී.
2021 ජූලි 20	-	පහත ලක්ෂණ සහිතව ඍජු නිකුතු කවුළුවක් හඳුන්වා දෙමින් භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික නිකුතු ක්‍රමවේදය තවදුරටත් පුළුල් කරන ලදී. • ප්‍රාථමික වෙන්දේසියක පළමු අදියරේ දී සම්පූර්ණයෙන් පිළිගන්නා ලද සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකයන් සඳහා වෙන්දේසියේ දී තීරණය කරන ලද බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික යටතේ, අදාළ සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකවලින් වෙන්දේසියට ඉදිරිපත් කරන ලද ප්‍රමාණයෙන් සියයට 20ක උපරිමයකට යටත්ව ඍජු නිකුතු කවුළුව වෙන්දේසිය පියවන දිනයට පෙර දිනය දක්වා විවෘත වනු ඇත. • නිකුතු කවුළුව තුළින් ඉදිරිපත් කළ ප්‍රමාණය අභිබවා ලංසු ලැබුණහොත් වෙන්දේසියේ පළමු අදියර තුළ දී එක් එක් සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංක සඳහා වෙන්දේසියේ දී ලද සාර්ථකත්වයට සමානුපාතිකව සහභාගිවූවන් අතර වෙන් කිරීම් සිදු කරනු ඇත.

2021 සැප්තැම්බර් 22	-	2021 සැප්තැම්බර් මස 22 දින සිට බලපැවැත්වෙන පරිදි, පරිණත කාලය දින 364 සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා උපරිම ඵලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී.
2021 සැප්තැම්බර් 23	-	මාර්ගගත භාණ්ඩාගාර බැඳුම්කර පද්ධතියේ තෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා වන අවම පිළිගැනීමේ අවශ්‍යතාවය එක් එක් සුරැකුම්පත් හඳුනාගැනීමේ ජාත්‍යන්තර අංකය යටතේ පළමු අදියරෙහි පිළිගත යුතු අවම ලංසු ප්‍රමාණය වෙන්දේසිය සඳහා ඉදිරිපත් කළ වටිනාකමෙන් සියයට 80 දක්වා ඉහළ නංවන ලදී. තවද, භාණ්ඩාගාර බැඳුම්කර නිකුතු ක්‍රියාවලියෙහි තෙවන අදියර ක්‍රියාත්මක කිරීම පරිණත කාලය වසර 5 හෝ ඊට අඩු පරිණතයන් සඳහා පමණක් සීමා කරන ලදී.
2021 දෙසැම්බර් 24	-	අංක 2251/42 දරන 2021 ඔක්තෝබර් 28 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයට අනුව, භාණ්ඩ හා සේවා අපනයන ආදායම් උපයන්නන් සහ විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන්ද ඇතුළුව අනෙකුත් සියලුම විදේශ ව්‍යවහාර මුදල් හිමියන් සඳහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනයට අවස්ථාවක් සලසා දීම පිණිස ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා ඍජු නිකුතු කවුළුවක් හඳුන්වා දෙන ලදී.
2022 පෙබරවාරි 01	-	ඍජු නිකුතු කවුළුව හරහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන රැගෙන එනු ලබන ආයෝජන සැකසුම්කරුවන් ද ඇතුළු පත් කළ නියෝජිතයන් සඳහා දිරිදීමනාවක් ලබා දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, එ.ජ.ඩොලර් රැගෙන ආ ආයෝජන මුදල, පදනම් අංක 50කින් (සියයට 0.5) ගුණ කර එම අගය, පියවීමේ දිනයෙහි පවතින එ.ජ.ඩොලර් විදේශ විනිමය අනුපාතිකය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට හැරවීමෙන් පසු ලැබෙන මුදල, දිරිදීමනාවක් වශයෙන් ගෙවනු ලබයි. එම දිරිදීමනාව, පත් කළ නියෝජිතයන් මාර්ගයෙන්, අදාළ ශ්‍රී ලංකා රුපියල්වලින් නාමනය කරන ලද බැංකු ගිණුම්වලට මුදා හරිනු ලබයි.

සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය

		සංඛ්‍යා සටහන් අංක
1.	ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය	1 - 42
2.	ආර්ථික සහ සමාජ යටිතල පහසුකම්	43 - 48
3.	මිල සහ වැටුප්	49 - 61
4.	විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති	62 - 96
5.	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය කටයුතු	97 - 115
6.	මුදල් ප්‍රතිපත්තිය, පොලී අනුපාතික, මුදල් සහ ණය	116 - 127
7.	මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ පද්ධති ස්ථායීතාව	128 - 147

බර සහ මිණුම්

පරිවර්තන සාධක

බ්‍රිතාන්‍ය ඒකක සඳහා මෙට්‍රික් ඒකක

අක්කර 1	=	හෙක්ටයාර (හෙ.) 0.405
රාත්තල් 1	=	කිලෝග්‍රෑම් (කි.ග්‍රෑ.) 0.454
දිගු ටොන් 1 (රා. 2,240)	=	මෙට්‍රික් ටොන් (මෙ.ටො.) 1.016
හොණ්ඩර 1	=	කිලෝග්‍රෑම් 50.802
සැතපුම් 1	=	කිලෝමීටර් (කි.මී.) 1.609
දිගු ටොන් සැතපුම් 1	=	මෙට්‍රික් ටොන් කිලෝමීටර් 1.635
අක්කරයකට රාත්තල් 1	=	හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 1.121
අක්කරයකට හොණ්ඩර 1	=	හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 125.535
එ.රා. පයින්ට් 1	=	ලීටර් 0.568
එ.රා. ගැලුම් 1	=	ලීටර් 4.55

මෙට්‍රික් ඒකක සඳහා බ්‍රිතාන්‍ය ඒකක

හෙක්ටයාර 1	=	අක්කර 2.471
කිලෝග්‍රෑම් 1	=	රාත්තල් 2.205
මෙට්‍රික් ටොන් 1 (කිලෝග්‍රෑම් 1,000)	=	දිගු ටොන් 0.984
මීටර් 1	=	අඩි 3.281
කිලෝමීටර් 1	=	සැතපුම් 0.621
මෙට්‍රික් ටොන් කිලෝමීටර් 1	=	දිගු ටොන් සැතපුම් 0.612
ලීටර් 1	=	එ.රා. පයින්ට් 1.76 = එ.රා.ගැ. 0.220
හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 1	=	අක්කරයට රාත්තල් 0.892

වී/සහල් පරිවර්තන

වී බුසල් 1 (රාත්තල් 46)	=	කිලෝග්‍රෑම් 20.87
වී මෙට්‍රික් ටොන් 1	=	වී බුසල් 47.92
	=	සහල් මෙට්‍රික් ටොන් 0.7
සහල් මෙට්‍රික් ටොන් 1	=	වී බුසල් 68.46
	=	වී මෙට්‍රික් ටොන් 1.43
අක්කරයකට වී බුසල් 1	=	හෙක්ටයාරයට වී කිලෝග්‍රෑම් 51.55

පොල්/පොල් නිෂ්පාදන පරිවර්තන

කපාපු පොල් (දිසිඳි පොල්) මෙට්‍රික් ටොන් 1	=	පොල් ගෙඩි 8,960
පොල් තෙල් මෙට්‍රික් ටොන් 1	=	පොල් ගෙඩි 9,250
කොප්පරා මෙට්‍රික් ටොන් 1	=	පොල් ගෙඩි 5,500
උකු කළ පොල් කිරි මෙට්‍රික් ටොන් 1	=	පොල් ගෙඩි 4,000

කර්මාන්ත මූලය අනුව දළ ජාතික ආදායම (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)

රුපියල් මිලියන

ආර්ථික කටයුතු	2017	2018	2019(ආ)	2020 (ආ)(ඇ)	2021 (ඇ)
කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය	**1,043,994**	**1,146,672**	**1,136,615**	**1,290,885**	**1,514,559**
1. ධාන්‍ය වගාව (වී හැර)	18,242	19,551	19,620	39,240	55,694
2. වී වගාව	88,565	140,057	136,071	186,852	235,063
3. එළවළු වගාව	100,037	103,590	102,278	134,731	157,654
4. උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග	3,519	3,378	3,473	4,501	4,265
5. පළතුරු වගාව	84,328	98,811	109,541	116,135	109,972
6. තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් ෆාම්)	103,773	110,736	81,481	123,650	167,037
7. තේ වගාව	116,548	109,175	99,341	108,333	113,427
8. වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී)	2,044	3,285	2,121	3,864	4,542
9. කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව	87,678	87,443	84,718	94,892	127,435
10. රබර් වගාව	18,962	23,134	15,500	19,013	37,857
11. වෙනත් බහුවාර්ෂික භෝග වගාව	24,165	24,323	27,556	32,556	32,079
12. කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන්	103,728	123,174	134,295	142,433	175,173
13. පැල බෝකිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන්	14,066	13,963	13,356	12,814	14,273
14. වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන	100,597	106,736	110,276	105,760	105,502
15. කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව	159,141	152,549	169,976	135,409	142,629
16. මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව	18,603	26,766	27,013	30,702	31,957
කර්මාන්ත	**3,568,560**	**3,752,368**	**4,084,836**	**3,935,697**	**4,680,060**
17. පතල් හා කැණීම් කර්මාන්තය	351,428	350,649	374,931	329,334	371,018
18. ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය	842,027	898,826	863,114	945,670	1,091,461
19. රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය	603,272	656,612	740,954	686,366	942,731
20. ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	23,743	28,381	27,754	25,794	26,280
21. කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය	50,404	53,117	61,197	58,876	65,715
22. අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන	30,496	45,277	83,917	63,060	70,022
23. රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	80,885	74,163	114,068	114,430	147,521
24. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන	86,306	91,498	105,034	95,989	133,031
25. ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන	120,605	128,271	149,858	155,581	197,766
26. ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන	47,452	58,770	67,293	66,775	89,483
27. යන්ත්‍රෝපකරණ නිෂ්පාදන	57,387	61,387	78,012	78,934	99,499
28. ගෘහභාණ්ඩ නිෂ්පාදනය	54,751	52,007	70,576	64,850	70,381
29. වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවිකිරීම	51,372	56,969	67,486	70,080	89,309
30. විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම	90,954	106,774	116,962	123,666	100,083
31. ජලය එකරැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම	17,383	19,078	19,675	19,288	19,034
32. මලාපවහන කටයුතු, කසළ කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය	19,114	20,163	22,346	21,219	19,240
33. ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන්	1,040,978	1,050,428	1,121,659	1,015,786	1,147,487
සේවාවන්	**7,477,148**	**8,191,090**	**8,732,156**	**8,943,498**	**9,668,927**
34. තොග හා සිල්ලර වෙළඳාම	1,404,772	1,533,760	1,647,971	1,747,678	1,888,012
35. මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම	1,516,369	1,632,761	1,715,466	1,626,659	1,675,683
36. තැපැල් සහ කුරියර් සේවාවන්	5,036	5,162	5,589	5,761	6,229
37. නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන්	207,055	228,259	227,231	143,839	155,325
38. ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු	3,948	4,062	4,099	4,036	4,274
39. විදුලි සංදේශ සේවාවන්	67,357	76,271	89,158	98,885	115,202
40. පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවාවන්	19,180	22,216	26,215	30,147	38,890
41. මූල්‍ය හා මූල්‍ය අතරමැදි සේවාවන් සහ ඒ ආශ්‍රිත වෙනත් සේවාවන්	531,241	575,756	622,398	721,998	876,948
42. රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණය	146,575	141,637	175,233	206,058	227,063
43. නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම	770,252	834,398	891,455	920,883	1,006,056
44. වෘත්තීයමය සේවාවන්	224,431	244,015	260,735	265,223	285,140
45. රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව සහ සමාජ ආරක්ෂණය	746,439	920,922	897,143	945,576	1,004,373
46. අධ්‍යාපනය	266,324	281,628	336,126	371,356	373,941
47. සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන්	276,142	306,853	358,947	413,482	466,974
48. වෙනත් පුද්ගලික සේවාවන්	1,292,025	1,383,391	1,474,390	1,441,918	1,544,818
මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය	**12,089,702**	**13,090,131**	**13,953,606**	**14,170,080**	**15,863,546**
භාණ්ඩ හා සේවා මත අයකෙරෙන බදු . සහනාධාර	1,238,401	1,200,776	1,043,551	857,294	945,764
වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)	**13,328,103**	**14,290,907**	**14,997,157**	**15,027,374**	**16,809,309**
විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම	-352,856	-389,601	-441,394	-423,063	-406,605
වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම	**12,975,247**	**13,901,306**	**14,555,763**	**14,604,311**	**16,402,705**

(අ) 2010 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

(ආ) සංශෝධිත

(ඇ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය

කර්මාන්ත මූලය අනුව දළ ජාතික ආදායම (2010 ස්ථාවර මිල අනුව) (අ)

රුපියල් මිලියන

ආර්ථික කටයුතු	2017	2018	2019 (ආ)	2020 (ආ)(ඇ)	2021 (ඇ)
කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය	**642,159**	**679,702**	**688,076**	**672,930**	**686,478**
1. ධාන්‍ය වගාව (වී හැර)	11,503	11,829	10,474	15,170	16,638
2. වී වගාව	48,648	70,380	74,169	79,388	74,047
3. එළවළු වගාව	55,240	55,230	54,539	58,669	57,201
4. උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග	2,044	1,820	2,000	2,386	2,209
5. පළතුරු වගාව	49,961	55,654	60,399	64,156	59,165
6. තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් ෆාම්)	53,773	57,577	67,742	60,705	67,481
7. තේ වගාව	66,879	67,170	66,329	61,621	66,178
8. වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී)	1,268	1,592	1,181	1,437	1,213
9. කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව	63,200	66,914	66,223	68,437	71,514
10. රබර් වගාව	24,165	25,158	22,779	23,831	23,428
11. වෙනත් බහුවාර්ෂික භෝග වගාව	16,717	16,303	16,380	16,647	15,851
12. කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන්	58,729	63,418	64,744	62,941	69,035
13. පැල බෝකිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන්	9,238	9,258	8,404	8,366	9,252
14. වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන	62,545	58,920	59,328	54,652	57,420
15. කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව	103,043	102,175	96,589	75,593	76,465
16. මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව	15,208	16,304	16,797	18,930	19,381
කර්මාන්ත	**2,509,421**	**2,541,186**	**2,608,189**	**2,427,872**	**2,556,998**
17. පතල් හා කැණීම් කර්මාන්තය	237,827	225,505	231,893	202,873	208,505
18. ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය	534,924	559,356	578,117	599,909	618,361
19. රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම් භාණ්ඩ නිෂ්පාදනය	304,090	324,565	333,530	287,856	327,616
20. ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	32,909	34,233	31,408	28,725	31,129
21. කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය	31,885	32,884	31,445	30,094	32,942
22. අඟුරු සහ ඛනිජ තෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන	29,743	27,312	33,694	30,026	20,869
23. රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන	93,552	97,851	101,949	101,312	105,348
24. රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන	86,202	85,933	81,070	68,334	82,013
25. ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන	77,821	81,764	81,399	81,844	95,617
26. ලෝහ සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන	43,862	48,491	47,120	45,017	46,767
27. යන්ත්‍රෝපකරණ නිෂ්පාදන	50,967	51,697	53,038	51,285	57,801
28. ගෘහභාණ්ඩ නිෂ්පාදනය	97,920	92,997	96,829	87,299	88,415
29. වෙනත් නිෂ්පාදන කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවිකිරීම	76,943	76,589	71,348	69,623	80,610
30. විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීම	94,803	100,382	104,437	102,758	109,049
